මෙම බැඳුම්කර ගැටලුව පිළිබඳව මුලින්ම කනිකාවතක් ඇති වූයේ 2015 මාර්තු මාසයේදීයි. මේ පිළිබඳව මා වෙත කරුණු වාර්තා වූ වහාම මා විසින් නීතිඥ ගාමිණී පිටිපන මහතාගේ සභාපතිත්වයෙන් නීතිඥවරුන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. [ඝෝෂා කිරීම්] 2015 මාර්තු 31 වැනි දින මා ඒ පිළිබඳව මේ සභාවට දැනුම් දුන්නා. [ඝෝෂා කිරීම්] පිටිපන කමිටුව කරුණු හොයා බලා මා වෙත වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණේ මේ පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු කිරීම අවශ්‍ය බවයි. [ඝෝෂා කිරීම්] මෙම වාර්තාව 2015 මැයි මස 19 වැනි දින මම පාර්ලිමේන්තුවේ සභාගත කළා. 2015 මැයි 21 වැනි දින මේ පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ විවාද කළා. ඉන් පසුව එය කෝප් කමිටුව වෙත යොමු කළා. [ඝෝෂා කිරීම්]

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මේ අතරතුර මේ පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටුව විමර්ශනය කිරීම ආරම්භ කළා. කෝප් කමිටුව හරහා ද මේ පිළිබඳව දීර්ඝ විමර්ශනයක් සිදු කළා. එම කෝප් කමිටු වාර්තාව 2016 ඔක්තෝබර් 28 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කළා. ඉන් අනතුරුව 2017 ජනවාරි මස 24 වැනි දින ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කළා.

[මේ අවස්ථාවේදී මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ සෝෂා කරන්නට වූහ.]

[இச்சந்தர்ப்பத்தில் உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]

[At this stage, some Members walked into the Well of the House and created an uproar.]

අර්ජුන මහේන්ද්‍රන් මහතා වග කිව යුතුද යන්නත්, එසේ නම් ඔවුන්ට විරුද්ධව ගත හැකි නීතිමය පියවර මොනවාද යන්නත් පිළිබඳව මා අග්‍රාමාත්‍ය ලේකම් මාර්ගයෙන් නීතිපතිවරයාගේ උපදෙස් විමසා සිටියා. [සෝෂා කිරීම්] එසේම නීතිපතිවරයා විසින් ඉල්ලා සිටින සියලුම වාර්තා හා ලිපි ලේඛන කථානායකවරයාගේ අවසරය මත නීතිපතිවරයාට යොමු කරන ලෙස පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට දැනුම් දුන්නා. [සෝෂා කිරීම්] සභානායක ලේකම්ගේ 2016 ඔක්තෝබර් 31 වැනි දින ලිපිය වාගේම අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2016.11.02 හා 2016.11.09 දිනැති ලිපිවල පිටපත් මා **සභාගත*** කරනවා.

ඒ අනුව නීතිපතිතුමා විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනම නීතිඥ මණ්ඩලයක් පත් කොට මේ පිළිබඳව කටයුතු කරමින් සිටිනවා. [සෝෂා කිරීම්] මේ බව නීතිපතිවරයා විසින් ලිඛිතව දන්වා එවා තිබෙනවා. [සෝෂා කිරීම්]

එසේම, සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් අවභාවිතයක් පිළිබඳව සැකයක් පවතින බවත් මහ බැංකුවේ අධිපතිවරයා මා වෙත දන්වා සිටියා. [සෝෂා කිරීම්] ඒ අනුව නීතිපති උපදෙස් ලබා ගෙන ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙස මා මහ බැංකු අධිපතිවරයාට නියෝග කළා. [සෝෂා කිරීම්] මහ බැංකු අධිපතිවරයා ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කොට එම වාර්තාව 2017 ජූනි මස 9වැනි දින විගණකාධිපතිවරයාට යොමු කර තිබෙනවා. [සෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, මීට අමතරව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමවේදය හා ක්‍රියා පටිපාටිය පිළිබඳවත්, මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීමෙන් අලාභයක් සිදුව ඇත්ද යන්න සොයා ගැනීම පිළිබඳවත් ලෝක බැංකුවෙන් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මා ලිඛිතව කරුණු විමසා සිටියා. [සෝෂා කිරීම්] ඔවුන් මා වෙත දන්වා සිටියේ පසුගිය බැඳුම්කර වෙන්දේසියක අලාභයක් තක්සේරු කිරීමේ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයක් පිළිබඳව ඔවුන් දැනුවත් නොමැති බවයි. [සෝෂා කිරීම්] ඔවුන් පවසා සිටියේ ලාභය හෝ අලාභය තීරණය වන්නේ බැඳුම්කර නිකුතුව සිදු වන දිනයේ පවතින වෙළෙඳ පොළ සාධක මත බවයි. [සෝෂා කිරීම්] ලෝක බැංකුවේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ විසින් මා වෙත එවූ 2016 දෙසැම්බර් 7වැනි දිනැති ලිපියේ පිටපතක් මා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, 2015 මාර්තු මස සිටම මේ ප්‍රශ්නය සම්බන්ධව අප රජය විසින් අඛණ්ඩවම නිසි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. [සෝෂා කිරීම්] සියලු කරුණු පාර්ලිමේන්තුවට, කෝප් කමිටුවට, නීතිපති දෙපාර්තමේන්තුවට වාර්තා කොට තිබෙනවා. [සෝෂා කිරීම්] ඉන් අනතුරුව ගරු ජනාධිපතිතුමා විසින්ද විශේෂ කොමිෂන් සභාවක් පත් කළා. [සෝෂා කිරීම්] එහිදී තවත් කරුණු හෙළි වුණා. [සෝෂා කිරීම්] දැන් ඒ වාර්තාවත් නීතිපතිවරයා වෙත යොමු කොට තිබෙනවා.

මේ අතරතුර 2016 නොවැම්බර් මස 7වැනි දින මුදල් මණ්ඩලය විසින් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මෙහෙයුම් කටයුතු සීමා කරමින් සහ සමාගම සතු මුදල් බැහැර කිරීම වළක්වාලමින් නියෝග නිකුත් කළා. [සෝෂා කිරීම්] 2017 ජූලි 6වැනි දින එම සමාගමේ සියලු ව්‍යාපාරික ක්‍රියාකාරකම් තහනම් කළා. 2018 ජනවාරි 5වැනි දින සිට එම තහනම තවත් මාස හයකට දීර්ඝ කර තිබෙනවා. ඒ අනුව එම සමාගමේ ගිණුම්ගත රුපියල් බිලියන 12ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව භාරයේ රඳවා ගෙන තිබෙනවා. [සෝෂා කිරීම්] ජනාධිපති කොමිෂන් වාර්තාව අනුව මෙම ගනුදෙනුව මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිදුව ඇති අලාභය රුපියල් බිලියන 11ක් බව සඳහන් වෙනවා. [සෝෂා කිරීම්] දැන් ඉතුරුව ඇත්තේ නීතිපතිවරයා විසින් කරුණු උසාවියට වාර්තා කොට නඩු කටයුතු මෙහෙයවා රජයට සිදුව ඇති අලාභය නැවත අය කර ගැනීමට කටයුතු කිරීමයි. [සෝෂා කිරීම්] එමඟින් රජයට අලාභයක් සිදුව ඇත්නම් එය පියවා ගැනීමටත් හැකියාව ලැබෙනවා. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙවැනි විමර්ශන ක්‍රියාවලියක් සාධාරණව, අපක්ෂපාතීව හා කඩිනමින් සිදුකළ ප්‍රථම අවස්ථාව මෙයයි. [සෝෂා කිරීම්] මෙය ඉතා සංකීර්ණ විමර්ශන ක්‍රියාවලියක්. [සෝෂා කිරීම්] 2015 ජනවාරි 8වන දින අප පිහිටෙවූ යහ පාලන රජයේ විශේෂ ජයග්‍රහණයක්. [සෝෂා කිරීම්] අවුරුදු 10කට පසුව රටේ මූල්‍ය පාලනය හා අධීක්ෂණය ආපසු පාර්ලිමේන්තුව වෙත ලබා දීමට අපට හැකි වුණා. [සෝෂා කිරීම්] පසුගිය කාලයේ මෙම ගනුදෙනු කිසිවක් පිළිබඳව පාර්ලිමේන්තුව දැන සිටියේ නැහැ. [සෝෂා කිරීම්] අවම වශයෙන් අමාත්‍යවරු හෝ වගකිව යුතු නිලධාරීන් දැන සිටියේත් නැහැ. [සෝෂා කිරීම්] නමුත් අපි එම තත්ත්වය වෙනස් කොට තිබෙනවා. [සෝෂා කිරීම්]

එසේම, 2008 වසරේ සිට 2014 දක්වා භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී සිදුව ඇති අවභාවිතයන් පිළිබඳව විමර්ශනය කළ යුතු බව ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර ඇති බව ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා. [සෝෂා කිරීම්] එම අවභාවිතයන් පිළිබඳව කඩිනමින් සෙවීමටද අදාළ අංශවලට මා උපදෙස් ලබාදී අවසන්. එම සියලුම වංචා සොයා බලා වැරැදිකරුවන්ට දඬුවම් දීමට අප කටයුතු කරනවා. [සෝෂා කිරීම්]

2008 සිට 2014 වසර දක්වා කාලය තුළ බහුතරයක් බැඳුම්කර නිකුත් කිරීම් සිදු කොට තිබෙන්නේ, පුද්ගලික ඍජු නිකුත් කිරීමය. [සෝෂා කිරීම්] මෙහි කිසිම විනිවිදභාවයක් තිබිලා නැහැ. [සෝෂා කිරීම්] මෙම කාලය තුළ රුපියල් බිලියන පන්දහස් එකසිය හතළිස්හතක බැඳුම්කර නිකුත් කර තිබෙන අතර ඉන් රුපියල් බිලියන භාරදහස් හත්සිය දෙකක බැඳුම්කර නිකුත් කර තිබෙන්නේ පුද්ගලික ඍජු නිකුත් කිරීමේ ක්‍රමය යටතේයි. [සෝෂා කිරීම්]

එනම්, මෙම කාලය තුළ මුළු බැඳුම්කර නිකුතුවලින් සියයට 90කට වඩා වැඩි ප්‍රතිශතයක් නිකුත් කර තිබෙන්නේ පෞද්ගලික ඍජු බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමය යටතේය. මේ කිසිවකට මුදල් මණ්ඩලයේ අනුමැතියක් ලැබී නැහැ. [සෝෂා කිරීම්]

එම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව භාරව සිටි මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් සිදු කළ යුතුය. [සෝෂා කිරීම්] මහජන නියෝජිතයන් වන අපත්, මේ රටේ ජනතාවත් මේ අභිරහස් පිළිබඳව දැනුවත් විය යුතුය. [සෝෂා කිරීම්]

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

2008 - 2014 කාලයේ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් මම පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කමිටුවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා. [සෝෂා කිරීම්] මෙම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා පසුගිය පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව විසින් අනුමත කිරීමත් පුදුමයක්. විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් සභාපති කිරීමේ වැදගත්කම මෙයින් පෙනෙනවා. [සෝෂා කිරීම්]

අද භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් වෙලා. විවිධ ජනමාධ්‍යවලට, දේශපාලන පක්ෂවලට මඩ ෆැක්ටරිවලට මේක හොඳ ඉල්ලමක් වෙලා. [සෝෂා කිරීම්] සමහරු මෙම බැඳුම්කර ප්‍රශ්නය නිසා පොලී අනුපාතය ඉහළ ගියා කියනවා; ඩොලරයේ අගය ඉහළ ගියා කියනවා. මේ ඔක්කෝම මඩ ප්‍රචාරවලට නොරැවටී අපි සත්‍යය සොයා ගනිමු. සත්‍යය සොයා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමු. [සෝෂා කිරීම්]

[කථානායකතුමාගේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[සභානායකගේ කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Speaker.]

ගරු කථානායකතුමනි, මම හැමදාමත් කියන පරිදි, ජනාධිපතිතුමාත්, මමත් නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරලීම සඳහා කැපවී කටයුතු කරනවා. [සෝෂා කිරීම්]

[කථානායකතුමාගේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[සභානායකගේ කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Speaker.]

මෙය අපේ රටට අලුත් අත්දැකීමක්. පක්ෂ භේදයෙන් තුළල් කා ගන්නා උදවියට තේරුම් ගන්නට බැරි තරම් සංකීර්ණ ක්‍රියාවලියක්. අත්දැකීම ආගන්තුක නිසා අඩු පාඩු, වැරදීම් සිදු වෙන්නට පුළුවන්. ඒවා අපි සකස් කර ගනිමු. [සෝෂා කිරීම්] නමුත්, පසුගිය ආණ්ඩු සමයේදී මෙන් වැරදි අඩු පාඩු සියල්ල පාපිස්සට යට කර, නීතියේ ආධිපත්‍ය පාගා දමන්නට අප සූදානම් නැහැ. [සෝෂා කිරීම්] සමාජ සාධාරණත්වය වළලා දමන්නට අප සූදානම් නැහැ. ජනවාරි 08වන දා අප භාර ගත්තේ ණය උගුලකට හසු වුණු රටක්; නීතිය ක්‍රියාත්මක නොවුණු රටක්; දූෂණයෙන් හා වංචාවෙන් පිරුණු රටක්; රාජ්‍ය ත්‍රස්තවාදයෙන් භීය වැද්දුණු රටක්. [සෝෂා කිරීම්]

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාත්, මමත්, අපේ සම්මුතිවාදී රජයත් මේ තත්ත්වය වෙනස් කිරීමේ මාර්ගයට අපේ රට අවතීර්ණ කර තිබෙනවා. [සෝෂා කිරීම්] ඒ ගමන් මග කටුකයි; දුෂ්කරයි. බොරු වළවල්වල නොවැටී, මංමුලා නොවී -

[කථානායකතුමාගේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[සභානායකගේ කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Speaker.]

ඒ ගමන් මඟ ඉදිරියටම ගොස්, ශීලාචාර ආණ්ඩුවක්, සාධාරණ සමාජයක්, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් බිහි කරලීම සඳහා අප ඇපකැප වන බව අවසන් වශයෙන් සඳහන් කරන්න කැමැතියි. [සෝෂා කිරීම්]

[කථානායකතුමාගේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[සභානායකගේ කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Speaker.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. සභාවේ වැඩකටයුතු තාවකාලිකව අත්හිටුවනවා. අපි දැන් පක්ෂ නායක රැස්වීමක් කැඳවනවා. [සෝෂා කිරීම්] කරුණාකර, වාඩි වෙන්න. We will suspend the Sitting for ten minutes. Now, we are going to have a Party Leaders' Meeting and then, we will decide.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, පූ.භා. 11.52ට නැවත පවත්වන ලදී.
අතන්පඩි, අමර්වු மு.ப. 11.52 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.
Sitting accordingly suspended till 11.52 a.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අතිගරු ජනාධිපතිතුමා විසින් මා වෙත එවන ලද ලිපියක් අද දින රැස්වීම පටන් ගත්තාට පසුවයි මට ලැබුණේ. මේ අවස්ථාවේදී මා එම ලිපිය කියවනවා:

"මගේ අංකය: PS/SP/Sec/Bonds
2018 ජනවාරි 10 දින

ධම්මික දසනායක මහතා
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

2015 පෙබරවාරි මස 01 දින සිට 2016 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පත් කරන ලද කොමිසමේ වාර්තාව

උක්ත කරුණට අදාළව ගරු කථානායකතුමන් විසින් වාචිකවත්, පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමාගේ ලේකම් විසින් ලිඛිතවත් මා හට ඉල්ලීම් කර ඇත. ලේකම්තුමන් විසින් එවන ලද ලිපිය 2018.01.09 දින ප.ව. 4.25ට මා වෙත ලැබුණි. එම ලිපියෙන් පහත සඳහන් වාර්තා පිටපත් ඉල්ලා තිබුණි.

1. ඉහත සඳහන් වාර්තාවේ පිටපත් 26
2. බරපතළ වංචා දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ පිටපත් 34

මෙම ශීර්ෂගත වාර්තාව ලද පසු 2018.01.02 දින එම වාර්තාව පිළිබඳව අප විසින් ගත යුතු පියවර පිළිබඳව මවිසින් ගරු නීතිපතිතුමාගෙන් උපදෙස් ඉල්ලා සිටින ලදී. එතුමා විසින් 2018.01.08 දාතමින් මා වෙත එවන ලද පිළිතුර මගේ කාර්යාලයට ඊයේ පෙරවරු 9.00ට ලැබුණි. මා හට ගරු නීතිපතිතුමාගෙන් ලැබුණු උපදෙස වී ඇත්තේ, වාර්තාවේ සඳහන් වන නිර්දේශ අදාළ නීතිරීති හා ක්‍රියාපිළිවෙත් අනුව ක්‍රියාවට නැංවීම සලකා බැලීම සඳහා වාර්තාවේ හඳුනාගත් බලධාරීන්/ආයතන වෙත මෙකී වාර්තාව සහ අදාළ ලේඛන ඉදිරිපත් කළයුතු බවය. තවද, නීතිපති දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති හා ක්‍රියාපිළිවෙත් පරිදි ගතයුතු පියවර ගරු නීතිපතිතුමා විසින් ගන්නා බවද එම ලිපියෙන් සහතික වී ඇත.

මෙම උපදෙස් යටතේ මවිසින් අද දින පෙරවරු මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතාටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මහතාටත් වාර්තාවේ පිටපත් දෙකක් පෞද්ගලිකවම භාර දෙන ලදී.

මීට අමතරව නීතිපතිතුමා විසින් ගරු සභානායකතුමාගේ ලේකම් වරයාගේ ලිපියට ගතයුතු පියවර පිළිබඳව මාගේ විමසීමට දන්වා ඇත්තේ, එම වාර්තාව නිකුත් කළ හැක්කේ අතිගරු ජනාධිපතිතුමාගේ අභිමතයට යටත්ව බවයි. එහෙයින් මවිසින් අතිගරු ජනාධිපතිතුමාගෙන් විමසන ලදුව 2018.01.17 දින වනවිට බැඳුම්කර කොමිසමේ වාර්තාවේ පිටපත් 26 පාර්ලිමේන්තුව වෙත ලබාදීමට එතුමා මා හට නියෝග කරන ලදී. ඒ අනුව මවිසින් ක්‍රියා කරනු ඇත.

ඉහත සඳහන් අනෙක් වාර්තා 34 ක් අප වෙත නොමැති අතර, ඒවා ලබාදෙන ලෙස මවිසින් එම කොමිෂන් සභාවේ සේවය කළ ලේකම්වරයාට අදම දැනුම් දෙන අතර, පිටපත් ලැබුණු විගස ඔබ වෙත ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇත.

මෙම කරුණු ගරු කථානායකතුමාගේ අවධානයට ගෙන එන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි. "

[ගරු කථානායකතුමා]

ගරු නීතිපතිතුමාටත්, ජනාධිපති ලේකම්තුමාටත් මම අද කථා කළා. ජනාධිපති ලේකම්තුමා කිව්වා, එතුමා මේ ලිපිය එව්වේ අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුවයි කියලා. ඒක එතුමාගේ පිළිතුරයි. ඒ වාගේම නීතිපතිතුමාත් අද තව ටික වෙලාවකින් මාව හම්බ වෙන්න එකඟ වුණා. මෙම රැස්වීම කැඳවීම සඳහා පක්ෂ තුනකින් ඉල්ලීමක් කළ අවස්ථාවේදී, ඒ පිළිබඳව මම වහාම ගරු අගමැතිතුමා දැනුවත් කළා. ඒ අනුව එතුමා දිනයක් නියම කළා. ඒ අනුව තමයි ඊයේ අපි කථා කළේ. මේ කැඳවීමට හේතු දක්වලා එතුමාත් අද මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරනවා. ඒකට මමත් එකඟ වුණා. අවශ්‍ය නම් පක්ෂ නායකයන්ටත් ඒ ගැන කථා කරන්න පුළුවන්. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, එම වාර්තාව අද ලැබෙයි කියා. මේ වාර්තාව ලබාදෙන්න කියා මම ඉල්ලීමක් කළා. පෙරේදාත් ඉල්ලීමක් කළා; ඊයේත් ඉල්ලීමක් කළා. මොකද, එය අවශ්‍ය බව මම පහදා දුන්නා. නමුත් නොලැබීම සම්බන්ධයෙන්,- මමත් පුළුවන් තරම් මහන්සි වුණා. එතැනදී ජනාධිපතිතුමා කරුණු දැක්වූයේ මෙතැනදී නීතිපතිතුමාගේ උපදෙස් අනුව ක්‍රියා කළ නිසා ඒ අනුව යනවා කියායි. නමුත් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය පිළිබඳව ඒ අවස්ථාවේ මම සඳහන් කළා. අදත් මම එය සඳහන් කර තිබෙනවා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා කියූ පරිදි මෙය විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයටත් යා යුතුයි. වෙන කොහේටවත් ඉදිරිපත් කරන්න පෙර මේ වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය කියන මතයේ එතුමාත් ඉන්නවා. අපිට අද පාර්ලිමේන්තුවේ යම් බාධා පැමිණුනා. ඒ නිසා ඊළඟ කටයුතු සම්බන්ධයෙන් ඉල්ලීමක් කර තිබෙනවා. අද ගරු අගමැතිතුමාත් ප්‍රකාශයක් කරනවා කිව්වා. ඊට පසුව අනික් පක්ෂවල අයට කථා කරන්න අවස්ථාව ලබාදෙන්න කියා ඉල්ලා තිබෙනවා. මම ඔස්ටින් ප්‍රනාන්දු මැතිතුමාත්, නීතිපතිතුමාත් හමු වුණාට පසුව, ඉතාම ඉක්මනින් මෙම වාර්තාව ලබාගන්න ක්‍රියා කරන්නම්. මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවත්, ජනාධිපතිවරයාත් අතර ගැටුමක් ඇති කිරීම අනවශ්‍ය බව මගේ හැඟීමයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.
ඉන් පසුව ගරු අගමැතිතුමා කථා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඊයේ අප එකඟ වූ පරිදි අවශ්‍යතා දෙකක් වෙනුවෙන් තමයි අපි අද පාර්ලිමේන්තුව කැඳෙව්වේ. එකක් තමයි, මෙම වාර්තා සභාගත කරන්න කියලා අපේ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ ඉල්ලීම. ආණ්ඩුව පාර්ශ්වයෙන් ඉල්ලා තිබුණා, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රකාශය කරන්න. පළමුකොටම අද පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ තිබෙන්නේ මෙම වාර්තා සභාගත කිරීම පිළිබඳවයි. ඒ නිසා එහි අවසන් නිගමනයකට ආ යුතුව තිබුණා. ඒ අවසන් නිගමනයෙන් පසුව තමයි අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශය කළ යුතුව තිබුණේ. හැබැයි, එවැනි අවසන් නිගමනයකට ඒමට පෙර -අපි ප්‍රශ්න කරමින් තිබුණා. - අපි ඊයේ එකඟ වූ කාර්යය ආරම්භයේදී සිදුවෙලා තිබුණේ නැහැ. ඒ කියන්නේ, එම වාර්තාව සභාගත කර තිබුණේ නැහැ. ඒක සභාගත කළා නම්, ඊට පස්සේ අගමැතිතුමාගේ කථාවට යන්න තිබුණා. හැබැයි, පළමුව අපි එකඟ වූ කාර්යය සිදු කර නොතිබුණු නිසා, ඒ කාර්යය පිළිබඳව අපි ඔබතුමාගෙන් විටින් විට ප්‍රශ්න ඇහුවා. අදාළ බලධාරීන් කැඳවන්න; මේ වාර්තා ඉදිරිපත් කරන්න; වෙනත් තැන්වලට ඉදිරිපත් කර තිබෙන තත්ත්වයක් ඇතුළේ පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් නොකරන්නේ ඇයි ආදී ප්‍රශ්න අපි ඔබතුමාගෙන් විමසා සිටියා. එතකොට අපි ඒ පළමු කරුණ නිරාකරණය කරගෙන තමයි අගමැතිතුමාගේ ප්‍රකාශයට යා යුතුව තිබුණේ. හැබැයි, ඔබතුමා කිසිසේත්ම උත්සාහ කළේ නැහැ, පළමු කරුණ නිරාකරණය කරන්න. ඒ නිසා තමයි, සිදු නොවිය යුතු බොහෝ දේ මේ පාර්ලිමේන්තුව තුළ සිදු වුණේ. මන්ත්‍රීවරු අතර ගහගැනීම් සිද්ධ වුණා. සමහර අයගේ ලේ හැළීම් සිදු වී තිබෙනවා. සමහර අය ලේඛනවලින් පහරදීම් සිදු කළා. ගරු කථානායකතුමනි, ඔබතුමාට මගේ ගෞරවය තිබෙනවා. ඔබතුමාට පාර්ලිමේන්තුව පිළිබඳව වගකීම කියන මේ සියල්ල තිබෙනවා. හැබැයි, මම ඔබතුමාට කියන්නේ ඔබතුමා නිසි පරිදි මේ සභාව මෙහෙයවා නොමැති වීමේ අඩුව නිසා තමයි අද මෙවැනි තත්ත්වයක් නිර්මාණය වුණේ කියන එකයි. අගමැතිතුමාගේ කථාව ඉදිරිපත් කරන අවස්ථාවේ මා දිගටම නැඟී සිටිමින් ඔබතුමාට රීති ප්‍රශ්නයක් මතු කළා. අවස්ථාවක් දෙන්න කිව්වා. එවැනි අවස්ථා තිබෙන්නේ මොකටද? එතුමාගේ කථාව කළ යුතු ද නැද්ද කියන එක ඔබතුමන්ලා තීරණය කරන්න ඕනෑ. හැබැයි, අපි ඉදිරිපත් කළ ප්‍රශ්නය නිරාකරණය කර ගෙන තමයි දෙවැනි පියවරට යා යුතුව තිබුණේ. ඒ නිසා පළමුවැනි කටයුත්ත නිරාකරණය කර ගන්න ඔබතුමා කිසිසේත්ම ඉඩ දුන්නේ නැහැ. මෙම වාර්තා සභාවට ඉදිරිපත් කර තිබුණේ නැත්නම් වහාම පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න තිබුණා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පක්ෂ නායක රැස්වීමක් කැඳවලා කියන්න තිබුණා, මේ වාර්තා සභාවට ඉදිරිපත් කර නැහැ; ඒ වෙනුවෙන් මන්ත්‍රීවරු මෙවැනි යෝජනා කරනවා; ඒ පිළිබඳව තීරණයක් ගැනීමෙන් අනතුරුව තමයි අග්‍රාමාත්‍යවරයාගේ කථාවට ඉඩ කඩ ලබා දිය යුතුව තිබුණේ කියලා. හැබැයි, ඔබතුමා මුළුමනින්ම කරපු දේ තමයි පළමුවැනි ප්‍රශ්නය නිරාකරණය කිරීමකට ලක් කිරීමට ඉඩ නොදීම. එම ප්‍රශ්නය සභාව හමුවේ තිබියදී; ඇයි එම වාර්තාව ඉදිරිපත් කර නැත්තේ, ලේකම්වරයා කැඳවනවාද, ලේකම්වරයාගෙන් ප්‍රකාශයක් ගන්නවාද, ආදී කරුණු සභාව හමුවේ තිබුණා. හැබැයි, ඔබතුමා ඊළඟ කොටසට ගියෙත් නැහැ. ඇත්තටම ඔබතුමා අග්‍රාමාත්‍යතුමාට කථාව කරන්න කියලා දැනුම් දුන්නෙත් නැහැ. එහෙම නම් න්‍යාය පත්‍රානුකූලව ඔබතුමාට කරන්න තිබුණේ දැන් අගමැතිතුමා ප්‍රකාශය ඉදිරිපත් කරන්නය කියන එකයි. නමුත් ඔබතුමා එවැනි ප්‍රකාශයක් කරන්නේත් නැතිව අගමැතිතුමා ප්‍රකාශයක් කරගෙන යන්න ගියා. එතකොට ඔබතුමාගේ වගකීම තමයි එය වහාම නතරකොට හෝ අපේ අවස්ථාව ලබා දීම. ඔබතුමා අද මේ සභාව හැසිරවූ ආකාරය නිසා තමයි අද ඔබතුමා විසින් කැඳවූ පක්ෂ නායක රැස්වීමට අපි සහභාගි නොවුණේ. මොකද, ඔබතුමාගේ අභිමතය පමණක් තිබෙන බව අපි පිළිගන්නා ගමන්, ක්‍රියාවට නහන්නේ එය පමණක් නම් අපි පක්ෂ නායක රැස්වීමට සහභාගීවීමෙන් ඵලක් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ඒ වාගේම මම යම් කිසි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ඊයේ පක්ෂ නායක රැස්වීමේදී අපි තීරණය කළේ, මෙම රැස්වීම කැඳවනවා; ඒ කැඳවන්නේ අගමැතිතුමාටත්

අදහසක්, ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නයි; ඊට පස්සේ පක්ෂ නායකවරුන්ටත් අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දීලා; ඊට පස්සේ පක්ෂ නායක රැස්වීමක් කැඳවනවාය කියන එකයි. ඒ අනුව තමයි මම ක්‍රියා කළේ. ඔබතුමා කිව්ව කාරණාවලට සම්පූර්ණයෙන්ම මම එකඟ වන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක දෙවැනි විසඳුම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ මතය කියන්න පුළුවන්. නමුත් මම ස්ථිර වශයෙන්ම කිව්වා පාර්ලිමේන්තුව රැස්වෙලා අවශ්‍ය කථා දීලා, අගමැතිවරයාගේ ප්‍රකාශයටත්, පක්ෂ නායකයන්ටත් අවස්ථාව දීලා ඊට පස්සේ අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවමු කියලා. අපි දැන් ඒක කළා. ඔබතුමන්ලා දෙදෙනෙක් හැර අනෙක් සියලු දෙනාම පක්ෂ නායක රැස්වීමට සහභාගි වුණා. මම ක්‍රියා කරන්නේ පක්ෂ නායකයින්ගේ තීරණය අනුවයි. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අද රැස්වීම කැඳවීම ගැන ඊයේ දිනයට පෙරාතුව ඔබතුමා නිවේදනයක් කරලා සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනුම් දුන්නා. ඒ වාගේම අද දින රැස්වීමට අදාළ කාරණාව ඊයේ පක්ෂ නායකයන් කැඳවලා සාකච්ඡා කරලා, අද අනුගමනය කරන පිළිවෙත - නැවතත් මම ඒක දීර්ඝව කියන්නේ නැහැ. කලිනුත් කිව්වා.- තීරණය කළා. ඒ අනුව පක්ෂ නායකයන්, විශේෂයෙන් විපක්ෂය කියා සිටියා භාණ්ඩාගාර බැඳුම්කර වාර්තාව ඉදිරිපත් කරන්නය කියලා. මේ විමර්ශන වාර්තාව ගැන ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශයකුත් තිබෙනවා. අපට කිව්වා, "ඒ වාර්තාව ඉංග්‍රීසි බසින් පමණයි තිබෙන්නේ." කියලා. අපි කිව්වා, "ඉංග්‍රීසි බසින් හෝ ඉදිරිපත් කරන්න." කියලා.

ඔබතුමා ඒකට එකඟ වුණා. එය ඔබතුමා පක්ෂ නායක රැස්වීමේදී තීරණයක් හැටියට ගත්තා නේ. සභානායකතුමා ඇතුළු සියලුදෙනා එහි හිටියා. එහෙම තීරණයක් ගත්තේ නැතිව නොවෙයි; තීරණයක් ගත්තා. අපි අද දින පාර්ලිමේන්තුවට පැමිණියේ ඒ ගත්ත තීරණය අනුව මේ වාර්තාව සභාගත කිරීම වෙනුවෙනුයි.

ඊළඟ තීරණය හැටියට තිබුණේ, පක්ෂ නායක රැස්වීමක් කැඳවලා ඉදිරි වැඩ කටයුතු පිළිබඳ තීරණය කිරීමයි. අගමැතිතුමාට ප්‍රකාශයක් කරන්න ඕනෑකම තිබෙනවා කියලා ඔබතුමා දැනුම් දුන් බව ඇත්ත. නමුත්, අපි ගත්ත තීරණය අනුගමනය කිරීමේ පිළිවෙතින් බාහිරව ගමන් කිරීම මත තමයි අද දින මෙම අර්බුදකාරී තත්ත්වය ඇති වුණේ. මම ඔබතුමාට ගෞරවයෙන් කියනවා, ගත්ත තීරණ අනුව කටයුතු කළා නම් මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ කියලා. විපක්ෂයේ අපි කිව්වෙත් එපමණයි; ඉල්ලා සිටියේත් එපමණයි. එහෙම වුණා නම් මේ අර්බුදය මේ තරම් උත්සන්න වෙන්නේ නැහැ; පාර්ලිමේන්තුව මේ තත්ත්වයට හැල්ලු වීමක් සිදු වෙන්නේ නැහැ. සභා ගර්භයට හෝ ඔබතුමාගේ කාර්යාලයට ඕනෑම නිලධාරියෙක් කැඳවන්න ඔබතුමාට බලයක් තිබෙනවා කියලා අපි ඉතා පැහැදිලිව කිව්වා.

දෙවැනි කරුණ, දැනට මේ වාර්තාව ආයතන රාශියකට භාර දීලා ඉවරයි කියලා ඔබතුමාම ප්‍රකාශ කළා. එම නිසා ආපහු කැබිනට් මණ්ඩලයට යාමේ වලංගුභාවයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ කමිටුවක් අවුරුදු දෙකක් මේ ගැන විමර්ශනය කළා කියලා ඔබතුමා දන්නවා. ඔබතුමා ඒ ගැන හොඳින් දන්නවා. හිටපු කථානායකතුමාත් දන්නවා. එම විමර්ශනය කරනකොට ඔය නිලධාරින් සියලුදෙනාම ඒ කාරක සභාවට කැඳෙව්වා. දැන් නිලධාරින් ගෙන්වා ගන්න බැහැ කියලා අනුගමනය කරන්න හදන දෙයින් පාර්ලිමේන්තුවම හැල්ලු වීමකට පත් වෙනවා. කනගාටුවෙන් වුණත් ඔබතුමාට ඒක කියන්න ඕනෑ. පාර්ලිමේන්තුව නම් හැල්ලු කරන්න එපා. මොකද, මූල්‍ය අර්බුදයේ උත්සන්නභාවය මත ඇති වී තිබෙන ප්‍රතිවිපාක අද ආණ්ඩුව හා මුළු රටම හොලවනවා. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මූල්‍ය බලය පාර්ලිමේන්තුවට තිබීම නිසායි. මෙතැන මූල්‍ය අර්බුදයක් තිබෙනවා. කඩා වැටෙමින් පවතින අර්බුදයක් තිබෙනවා; ඒක ආණ්ඩුවත් පිළිගන්නවා නේ. අපිත් කියලා තිබෙනවා. එම නිසා අපට වහන්න දෙයක් නැහැ. අපි මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ කෙසේද?

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව ප්‍රචණ්ඩත්වයට ගෙනැවිත්, විරුද්ධ පක්ෂයේ සීමාවට ඇතුළු වී කටයුතු කිරීම මේ ප්‍රශ්නයට විසඳුම නොවෙයි. Treasury Bonds සම්බන්ධ වාර්තාව දකින්න මුළු රටම බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුව කියන්නේ ජනතාවගේ නියෝජිතයෝ. ජනතාවගේ නියෝජිතයෝ ඒ වාර්තාව ලැබෙන තෙක් බලාගෙන ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව නවත්වන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම, සුමන්තිරන් මැතිතුමා සඳහන් කළා වාගේම අපිත් කලින් එය සඳහන් කළා. අපි යළිත් ඉල්ලා සිටිනවා, මේ වාර්තාව අරගෙන එන්න කියලා ඔය නිලධාරින් හතරදෙනාගෙන් කෙනෙකුට නියම කරන්න කියලා. ඔබතුමා කථානායකතුමා හැටියට පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, පිළිගත්තා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම නැතිව අගමැතිතුමාගේ කථාව අහන්න නොවෙයි දැන් තිබෙන්නේ. අගමැතිතුමාගේ කථාව අහන්න නොවෙයි; මේ වාර්තාව ඉදිරිපත් කරන්න ආණ්ඩුව ඉදිරිපත් වුණා. ඒක ඉදිරිපත් කිරීමයි කථානායකතුමා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඊළඟට ගරු රවුෆ් හකීම් මැතිතුමා.

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
ගරු කථානායකතුමනි, මේ සභා ගර්භයේ තිබෙන සම්ප්‍රදායයන් ගැන හොඳටම දන්නා කෙනෙක් හැටියට ඔබතුමාත් මේක පිළිගන්න ඕනෑ. මේ පිළිබඳ මේ රටේ ජනතාව අතරේ

[ගරු රවුෆ් හකීම් මහතා]

අනවශ්‍ය ප්‍රහේලිකාවක් ඇති කරන්නයි මෙතැන හැම කෙනාම වාගේ උත්සාහ කරන්නේ. මෙතැන කාටවත් කිසි දෙයක් වසන් කරන්න වුවමනාවක් නැති බවත් අපට පෙනී යනවා. නමුත්, කොමිෂන් සභා වාර්තාවක තිබෙන අන්තර්ගතයන් කොටස් වශයෙන් මාධ්‍යයට ප්‍රකාශ කරලා තිබෙනවා; මාධ්‍යවල ප්‍රචාරය වෙලා තිබෙනවා. එහෙම අවස්ථාවක සම්පූර්ණ වාර්තාව පාර්ලිමේන්තුවට ලබා දීම ප්‍රමාද කිරීම අසාධාරණයි. අපි මේකේ වෙනත් දේවල් ගැන බලන්න අවශ්‍ය නැහැ. අපි ඔක්කොම එකඟ වෙනවා. නමුත් අපි අතරේ සිදුවන විවාදය මහජනතාව දැක්කාම, ගමේ ආණ්ඩුව ඇති කරන්න මැතිවරණයක් පැවැත්වීමට නියමිත අවස්ථාවක මෙයින් අයුතු ප්‍රයෝජන ලබා ගන්න එක් එක් පාර්ශ්ව උත්සාහ කරන්න පුළුවන්. නමුත්, අපට වගකීමක් තිබෙනවා, නීතියට අනුකූලව මෙම වාර්තාව ලබා දෙන්න. ඒක වහාම කරන්න. කිසිම නිලධාරියෙකුට මේක අහක දමලා, නීතිය යටතේ හැංගි හොරා වැඩ කරන්න බැහැ. මෙතැන ව්‍යාංගයෙන්, වක්‍රාකාරයෙන් වෙන වැඩ පිළිවෙළක් යන්නේ. එහෙමයි අපට දැනෙන්නේ. එම නිසා කරුණාකරලා වහාම ඔබතුමාගේ බලය පාවිච්චි කරලා කළ යුතු උපරිමය කරන්න කියලායි අපි ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළේ නැත්නම් ඔබතුමාත් මමත් කථා කරලා, මම අද පාර්ලිමේන්තුව කැඳවන්නේ නැහැ. ඇත්තවශයෙන්ම මම පාර්ලිමේන්තුව කැඳවපු නිසා තමයි, මෙතැන මේ ගැන සාකච්ඡා කරන්නට අවස්ථාව ලැබී තිබෙන්නේ.

මගේ කථාව කරන්න ඉස්සෙල්ලා මම මෙය කියන්න කැමැතියි. අපි දැන් සාකච්ඡා කළ පරිදි, මම දන්නා හැටියට විශේෂයෙන්ම ඔබතුමන්ලා ඊයේ එකඟ වෙලා තිබෙනවා, වාර්තාව ඉදිරිපත් කරන්න, ඊට පසුව අගමැති ප්‍රකාශය ගන්න. වාර්තාව ඉදිරිපත් නොකරපු නිසා ඊළඟට, අගමැති ප්‍රකාශය ගන්න තිබුණා. නැත්නම් මේ දෙකම ඉවර කරලා, විවාදයකට යන්න තිබෙන්නේ. ඔබතුමා ජනාධිපති කාර්යාලයට ලියා දැනුම් දුන්නා, විශේෂයෙන්ම ඒ copies ලබා දෙන්න කියලා. ඔබතුමාත්, මමත් නීතිපතිතුමාට කථා කළාම, නීතිපතිතුමා ගත්තේ වෙන ස්ථාවරයක්. මේ වාර්තා දෙන්න ඕනෑ කිව්වා, මහ බැංකුවටයි, නීතිපතිටයි. මම එතුමාට කිව්වා, ඒක නීතියටත්, සම්ප්‍රදායටත් විරුද්ධයි කියලා. මොකද, නීතිය යටතේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට; සම්ප්‍රදාය හැටියට කැබිනට් මණ්ඩලයටයි. අනෙක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ මූල්‍ය බලය තිබෙන්නේ මෙතැනටයි. ඒ නිසා අපි විශේෂයෙන්ම නීතිපතිතුමාට දැන් එන්න කිව්වා, කථානායකතුමා මුණ ගැසෙන්න. ඒ අවස්ථාවේදී පක්ෂ නායකයන්ට නීතිපතිතුමා මුණ ගැහිලා එම කරුණු එතුමාට පැහැදිලි කරලා දෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවේ බලතල කුමක්ද කියලා. පාර්ලිමේන්තුව කිව්වොත්, "අපට මේ වාර්තාව වුවමනායි" කියලා එය වුවමනායි. ඒ වාර්තාව තියා ගෙන ඉන්න බැහැ. මේ අලුත් තත්ත්වය මතු වුණු නිසා, කොහොමත් මම බලාපොරොත්තු වුණේ -මම මීට ඉස්සෙල්ලාත් ප්‍රකාශ කළ පරිදි,- අතිගරු ජනාධිපතිතුමා මුණ ගැහිලා, පාර්ලිමේන්තුවේ මේ තත්ත්වය අද දැනුම් දීලා, පුළුවන් තරම් විගහට මේ කොමිෂන් සභා වාර්තාව ලබා දෙන්නයි. මේකේ රහපාන නළුවෙක් හැටියට මමත් දැන ගන්න ඕනෑ, මෙතැන තිබෙන්නේ මොකක්ද කියලා.

අද මම කොමිසමට ගියේ නැහැ. අපි පාර්ලිමේන්තුව වෙනුවෙන් අරගෙන තිබෙන පියවරයි මේ පෙන්වන්නේ. මේ පාර්ලිමේන්තුව ගතයුතු පියවර හැම එකක්ම කෙළින්ම සහ වක්‍රව අරගෙන තිබෙනවා. එච්චරයි මට පෙන්වන්න තිබෙන්නේ. ඉතුරු ටික; එනම්, නඩු දැමිය යුත්තේ කාටද, කරන්න ඕනෑ මොකක්ද, කියලා කොමිෂන් සභා වාර්තාවෙන් දැන ගන්න පුළුවන්.

2015 පෙබරවාරි 01 වැනිදා සිට 2016 මාර්තු 31 දක්වා කාල සීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා පත් කරනු ලැබූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව - [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අගමැතිතුමා මීට කලින් කළ කථාවට බාධා පැමිණුන නිසා, එතුමාට මේ කථාව කරන්න අවස්ථාව ලබා දීමට පක්ෂ නායකවරුන්ගේ රැස්වීමේදී ඒ අය අවසරය දුන්නා. [බාධා කිරීමක්] ඔව්, ඒකයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මොකක්ද, කියන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඒ වේලාවේ පක්ෂ නායක රැස්වීමට ආවා නම් හොඳයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එතැනදී තීරණයක් අරගත්තා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇවිල්ලා වැඩක් නැහැ. මෙතැනදී ලිහා ගන්නා එක හොඳයි. එතකොට මේක කාටත් පෙනෙනවා නේ. නැත්නම් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වේලාවේ විපක්ෂ නායකතුමා ඇතුළු අනෙක් පක්ෂ නායකයින් සියලුදෙනාම සිටියා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතැනදී තීරණ අරගෙන වෙන ඒවා කරනවා නම්, ඇවිල්ලා වැඩක් නැහැනේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මෙතුමාගේ කථාවට බාධා කරපු නිසා අවස්ථාව දිය යුතුයි. ඒ වාගේම විපක්ෂ නායකතුමාත් අදහස් ප්‍රකාශ කරන්න ඕනෑය කියලා කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් කියෙව්වේ ජනාධිපති ලේකම්තුමා එවපු නිවේදනය නේද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒකේ පැහැදිලිව කියා තිබුණා, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ වාගේම මම ජනාධිපති ලේකම්තුමාටත් අද කථා කළා. ජනාධිපතිතුමාට ඇමතුමක් ගන්න බැරි වුණා. ජනාධිපති ලේකම්තුමා කිව්වේ, එතුමා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ක්‍රියා කළා කියලායි. එතැනින් එහාට එතුමාට ජනාධිපතිතුමාගේ අදහස්වලින් පිට යන්න බැහැ. ඒකත් සාධාරණයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් විමසා සිටින්නේ මෙයයි. ජනාධිපති ලේකම්තුමා ඔබතුමාට එවන ලද ලිපියේ තිබෙනවා, මේ වාර්තාව 17 වැනි දා භාර දෙන බවත්, ඒ වාගේම අනෙකුත් වාර්තා නොමැති බවත්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒවාත් ඉල්ලුවා. මම වහාම ඒවාත් ඉල්ලුවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් ඒකට දිනයක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි කිව්වේ 17 වැනි දා භාර දෙන්න කියලායි. ඒ වෙනුවෙන් තමයි ඉල්ලීමක් කළේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක නොනිබෙන්න විධියක් නැහැ. පළමුවැනි කාරණය එයයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තිබෙන්නේ එක කොපියයි කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
17ක් භාර දුන්නේ, ජනවාරි 03 වැනි දා. ජනවාරි 03 භාර දීලා, ජනවාරි 10 වැනි දා වෙන කොට අස්ථානගත වෙනවා නම්, ඒක ජනාධිපති ලේකම් කාර්යාලයේත් -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එක කොපියයි තිබෙන්නේ කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
එක කොපියයිද, තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එක කොපියයි තිබෙන්නේ, අනෙක් ටික ඉල්ලුවාය කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කිව්වේ, "නැහැ" කියලායි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක 17 වැනි දාට ඉස්සෙල්ලා දෙනවාය කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
එම වාර්තාව නැහැ කියලා කියවුණු නිසායි -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. එක කොපියක් තිබෙනවා; ඒක පිළිගන්වන්න බැහැ කියා කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා අදාළ ලිපිය කියවන විට කිව්වේ, ඒක නැහැ කියලායි. බලන්නකෝ. ඔබතුමා එම ලිපිය කියවා අපට කියන්නකෝ. "නැහැ" කියලායි කිව්වේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඇහෙන්නේ නැහැ. ඔබතුමාට ඇහෙන්නේ වාසියට විතරයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වේ, "නැහැ" කියලායි. නැහැ කියලායි කිව්වේ!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉන්න, ඉන්න. මා කියන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කියන්නකෝ, ඔබතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමන්ලා හිතාගෙන ඉන්නේ -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි කොහොමත් හරි. අපි හරි, හැම දාම.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ, ඔබතුමන්ලා හිතාගෙන ඉන්න විධිය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, මේ කාරණය අවසන් වන කල් පොඩ්ඩක් ඉන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ කාරණය අවසන් කරන්න. ඊට පසුව අප -[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ කාරණය අවසන් කරලා ඉදිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න, මෙය බලා අවසන් කරන කල්. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ කාරණය අවසන් කරන්න දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කාරණය ගන්න -[බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, හොඳම එක -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙහි සඳහන්ව තිබෙනවා. "...ඉහත සඳහන් අනෙක් වාර්තා 34 අප වෙත නොමැති අතර..."

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. "අප වෙත නොමැති අතර" කියලායි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා, තේරුණාද සිංහල? ඔබතුමාට සිංහල තේරෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි එතුමා එක පිටපතක් තිබෙනවා කිව්වා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමන්ලා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉගෙනගෙන ඉන්න. [බාධා කිරීමක්] ඉගෙන ගෙන ඉන්න. අපි හැම දාමත් හරි තමයි. තේරුණාද?

ගරු කථානායකතුමනි, "අප අතර නොමැති නිසා" කියලායි තිබෙන්නේ. එහි කිසිසේත් සඳහන්ව නැහැ, "එක් පිටපතක් තිබෙනවා. වෙනත් පිටපත් නැහැ" කියා. මෙහි තිබෙන්නේ, "නොමැති අතර" කියලායි. ජනවාරි මාසයේ 3වන දා 17ක් බාර දුන්නා. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළමුවන දා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. පළමුවන දා 17ක් බාර දුන්නා. ඒ 17 ජනවාරි 10වන දා වන කොට එහෙම නැත්නම්, දින 10ක් යන කොට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාර්තා නැති වනවා නම් ඒක ජනාධිපති ලේකම් කාර්යාලයක් නොවෙයි, පිස්සන්කොටුවක් වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඉතිරි 17න් සමහර ඒවා බාර දී තිබෙන්නේ 2016 ඔක්තෝබර්වලයි; සමහර ඒවා බාර දී තිබෙන්නේ 2016 මැයිවලයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
හැබැයි මා ඉල්ලීමක් කළා, ඔක්කෝම අපට සුමානයෙන් දෙන්න කියලා. අපි බලමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඒ ඔක්කෝම ඕනෑ. ඒ ඔක්කෝම දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
රීති ප්‍රශ්නය නහන්න, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්ඩලික රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු අනුර කුමාර මන්ත්‍රීතුමනි, අර රැස්වීමට යන්න දැන්. මින් පස්සේ -[බාධා කිරීමක්] නීතිපතිතුමා එන එකට.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්ඩලික පන්තුල ගුණවර්ධන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මේ ප්‍රකාශය එහෙම පිටින්ම එක සැරයක් කළා. ඒ කරපු ප්‍රකාශය නැවත කිරීම සඳහා ඔබතුමා නැවත වතාවක් ඉඩ දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමේදී එතුමා සඳහන් කළා, එතුමාට බාධා පැමිණුණා, ඒ නිසා ඒ අවස්ථාව දෙන්න කියා. පක්ෂ නායකයන් එයට එකඟත්වය පළ කළා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්ඩලික පන්තුල ගුණවර්ධන)
(The Hon. Bandula Gunawardane)
එතුමා සම්පූර්ණ ප්‍රකාශය කළා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
එතුමාට බාධා පැමිණි නිසා අවස්ථාවක් දෙන්න කියා කිව්වා. පක්ෂ නායකයන් සියලුදෙනා එයට එකඟ වුණා. ඒ එකඟත්වය අනුවයි මා ක්‍රියා කරන්නේ. මට ඒ පක්ෂ නායක තීරණයට විරුද්ධව යන්න බැහැ. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් කතා කරනවා කිව්වා. තවත් පක්ෂ නායකයන්ට අවස්ථාව -[බාධා කිරීමක්] ඔබතුමන්ලාටත් අවස්ථාවක් දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා අප කරපු ඉල්ලීම් සියල්ල ප්‍රතික්ෂේප කරමින්, විසඳුම් ඇති අවස්ථාවකදීත් ඒ කිසිම විසඳුම් මාර්ගයක් අනුගමනය නොකොට සභාව කලබලකාරී තත්ත්වයකට පත් කළා, අගමැතිතුමාට කතා කරන්න ඉඩ දීලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ඒ, අප එකඟ වූ පරිදියි. ඊයේ එකඟ වූ පරිදියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
හරි ඉතින්. ඉන්න කෝ. මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ මෙයයි. අගමැතිතුමා කතාව කරලා ඉවරයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්ඩලික රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ, නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ඒක ගරු අගමැතිතුමාගේ තීරණය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
දැන් ආපහු අගමැතිතුමා කතා කරනවා කියන එක -[බාධා කිරීම්] ඔබතුමා අපේ පාර්ලිමේන්තුව විහිළුවෙන් විහිළුවට පරිවර්තනය කරනවා. විහිළුවෙන් විහිළුවට -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
එතුමා ඉල්ලීමක් කළා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බාධා කළා, ඒ නිසා-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
එතුමාගේ ඉල්ලීම ම නොවෙයි. එතුමාගේ ඉල්ලීම එකක්; කථානායකගේ තීරණය තවත් එකක්. කථානායකයි තීරණය කරන්න ඕනෑ. අගමැති නොවෙයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ඇයි, ඔබතුමන්ලා පක්ෂ නායක රැස්වීමට ආවේ නැත්තේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමායි තීරණය කරන්න ඕනෑ, ඔය පුටුවේ ඉඳලා. ඔය පුටුවට නිබෙන බලය අගමැති පුටුවට නැහැ. ගරු කථානායකතුමනි, මා එය ගෞරවයක් ඇතිව කියනවා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(මාණ්ඩලික නාමල් රාජපක්ෂ)
(The Hon. Namal Rajapaksa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් repeat එකක් යන්නේ. Now, it is a repeat that you are allowing to be made. It is a joke. It has never happened in the Parliament of Sri Lanka. මේක විහිළුවක්. ඔබතුමා කරන්නේ විහිළුවක්; අගමැතිතුමාත් විහිළුවට ලක් කරනවා; පාර්ලිමේන්තුවත් විහිළුවට ලක් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මා කතා කරපු අවස්ථාවේදී -මා කතා කරන්න පටන් ගත් අවස්ථාවේදී- කොළ අරගෙන මෙතැනට ඇවිල්ලා, සෙංකෝලය ගන්න ගිහින්, කෑ ගහලා, සටනක් ඇති කරගත්තා. [බාධා කිරීම්] ඒකයි අප කියන්නේ. [බාධා කිරීම්] මෙහෙම හැසිරෙන්න ඉඩ දෙන්න බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට එහෙම අසාධාරණ තීරණයක් දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපට ඒකට ඉඩ දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක පක්ෂ නායකයන් ගත් තීරණයක්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පක්ෂ නායකයන් ගත් තීන්දුව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා පක්ෂ නායක රැස්වීමට එන්නේත් නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මෙතුමන්ලා ආවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතැනට ඇවිල්ලා පාර්ලිමේන්තුවට බාධා කරනවා. පාර්ලිමේන්තුවට බාධා කරලා ඊට පස්සේ මෙතැනදී -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා වැරැදි තීරණයක් ගත්තා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට එන්න තිබුණා, පක්ෂ නායක රැස්වීමට.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හරි තීරණයක් ගන්න බැහැ ඔබතුමාට.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, අප මෙය ආරම්භ කළේ -[බාධා කිරීමක්] මෙතුමාගේ ඉල්ලීම අනුවයි මා පාර්ලිමේන්තුව කැඳවන්න කිව්වේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමා හුහක් වෙලා බලාගෙන සිටියා. කෙටියෙන් කියන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා හිතන විධියට මෙතැන වැරැදි මතයක් යනවා, මේ සභාවේ කඩාකප්පල්කාරී විධියට කටයුතු කළේ අපයි කියා. එතුමන්ලා තමයි සභාව මැදට ආවේ.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, අද දිනයේදී -[බාධා කිරීම්] ගරු අගමැතිතුමා, ඔබතුමා පාර්ලිමේන්තුව කැඳෙව්වේ -[බාධා කිරීම්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා -[බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, අද දිනයේදී පාර්ලිමේන්තුව කැඳෙව්වේ බැඳුම්කර කොමිසමේ වාර්තාව සභාගත කරන්නයි. අපි පාර්ලිමේන්තුවට ආවේ එහි copy එකක් ගන්නයි. හැබැයි ගරු අගමැතිතුමනි, අද -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Prime Minister speak.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එසේම ඒ පිළිබඳව ගරු ජනාධිපතිතුමා විසින් 2018 ජනවාරි 03වන දින විශේෂ ප්‍රකාශයක් ද සිදු කළා. [ඝෝෂා කිරීම්] අද දින මා මෙම ප්‍රකාශය කරන්නේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව හෙවත් කෝප් වාර්තාව පිළිබඳව අප ගත් පියවර මෙම ගරු සභාව වෙත තවදුරටත් පැහැදිලි කිරීම සඳහායි. [බාධා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Chandrasiri Gajadeera, what is your point of Order?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මේ කොමිසමේ වාර්තාව,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දුන්නා නේ. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
He cannot disturb me. - [*Interruption.*] Secretary-General, ask them to put my mike on. [*Interruption.*]

[කථානායකතුමාගේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[சபாநாயகரின் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Speaker.]

මෙම බැඳුම්කර ගැටලුව පිළිබඳව මුලින්ම කතිකාවතක් ඇති වූයේ 2015 මාර්තු මාසයේදීයි. මේ පිළිබඳව මා වෙත කරුණු වාර්තා වූ වහාම මා විසින් නීතිඥ ගාමිණී පිටිපන මහතාගේ සභාපතිත්වයෙන් නීතිඥවරුන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. 2015 මාර්තු 31වන දා මම ඒ පිළිබඳව මේ සභාවට දැනුම් දුන්නා. පිටිපන කමිටුව කරුණු සොයා බලා මා වෙත වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණේ මේ පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු කිරීම අවශ්‍ය බවයි. මෙම වාර්තාව 2015 මැයි 19වන දින මම පාර්ලිමේන්තුවේ සභාගත කළා. 2015 මැයි 21වන දින මේ පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ විවාද කළා. ඉන් පසුව එය කෝප් කමිටුව වෙත යොමු කළා.

මේ අතරතුර, මේ පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටුවේ විමර්ශනය කිරීම ආරම්භ කළා. කෝප් කමිටුව හරහා ද මේ පිළිබඳව දීර්ඝ විමර්ශනයක් සිදු කළා. එම කෝප් කමිටු වාර්තාව 2016 ඔක්තෝබර් 28 දින පාර්ලිමේන්තුවේ සභාගත කළා. ඉන් අනතුරුව 2017 ජනවාරි මස 24වන දින ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කළා.

මේ අතරතුර, 2016 ඔක්තෝබර් 31වන දින මෙම වාර්තාව හා විගණකාධිපතිවරයා විසින් කෝප් කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ විශේෂ විගණන වාර්තාව යන වාර්තා දෙකම මා විසින් පාර්ලිමේන්තුවේ සභානයක ලේකම් මාර්ගයෙන් නීතිපතිවරයා වෙත යොමු කළා. ඉන් අනතුරුව, කෝප් එකේ නිර්දේශ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් යම් වංචාවක් සිදුකර තිබේද යන්නත්, නියමිත කාර්ය පටිපාටියෙන් බැහැරව ක්‍රියාකර ඇත්ද යන්නත්, ඊට මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් මහතා වග කිව යුතුද යන්නත්, එසේ නම් ඔවුන්ට විරුද්ධව ගත හැකි නීතිමය පියවර මොනවාද යන්නත් පිළිබඳව මා අග්‍රාමාත්‍ය ලේකම් මාර්ගයෙන් නීතිපතිවරයාගෙන් උපදෙස් විමසා සිටියා. එසේම නීතිපතිවරයා විසින් ඉල්ලා සිටින සියලුම වාර්තා හා ලිපි ලේඛන කථානායකවරයාගේ අවසරය මත නීතිපතිවරයා වෙත යොමු කරන ලෙස පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට දැනුම් දුන්නා. සභානායක ලේකම්ගේ 2016 ඔක්තෝබර් 31 දිනැති ලිපිය, ඒ වාගේම අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2016 නොවැම්බර් 02 හා 2016 නොවැම්බර් 09 දිනැති ලිපිවල පිටපත් මා **සභාගත*** කරනවා.

ඒ අනුව නීතිපතිතුමා විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනම නීතිඥ මණ්ඩලයක් පත් කොට මේ පිළිබඳව කටයුතු කරමින් සිටිනවා. මේ බව නීතිපතිවරයා විසින් ලිඛිතව දන්වා එවා තිබෙනවා.

එසේම සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් අවභාවිතයක් පිළිබඳව සැකයක් පවතින බවත් මහ බැංකුවේ අධිපතිවරයා මා වෙත දන්වා සිටියා. ඒ අනුව නීතිපති උපදෙස් ලබාගෙන ඒ පිළිබඳ විමර්ශනයක් සිදුකරන ලෙස මා මහ බැංකු අධිපතිවරයාට නියෝග කළා. මහ බැංකුවේ අධිපතිවරයා ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කොට එම වාර්තාව 2017 ජූනි 09වන දින විගණකාධිපතිවරයාට යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මීට අමතරව, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමවේදය හා ක්‍රියාපටිපාටිය පිළිබඳවත් මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීමෙන් අලාභයක් සිදුව ඇත්ද යන්න සොයා ගැනීම පිළිබඳවත් ලෝක බැංකුවෙන් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මා ලිඛිතව කරුණු විමසා සිටියා. ඔවුන් මා වෙත දන්වා සිටියේ පසුගිය බැඳුම්කර වෙන්දේසියක අලාභයක් තක්සේරු කිරීමේ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයක් පිළිබඳව ඔවුන් දැනුවත් නොමැති බවයි.

ඔවුන් පවසා සිටියේ ලාභය හෝ අලාභය තීරණය වන්නේ බැඳුම්කර නිකුතුව සිදුවන දිනයේ පවතින වෙළෙඳ පොළ සාධක මත බවයි. ලෝක බැංකුවේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ විසින් එවන ලද 2016.12.07 දිනැති ලිපියේ පිටපතක් මා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, 2015 මාර්තු මස සිටම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අප රජය විසින් අඛණ්ඩවම නිසි ක්‍රියා මාර්ග

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අරගෙන තිබෙනවා. සියලු කරුණු පාර්ලිමේන්තුවට, කෝප් කමිටුවට, නීතිපති දෙපාර්තමේන්තුවට වාර්තාකොට තිබෙනවා. ඉන් අනතුරුව ගරු ජනාධිපතිතුමා විසින් ද විශේෂ කොමිෂන් සභාවත් පත් කළා. එහිදී තවත් කරුණු හෙළි වුණා. දැන් ඒ වාර්තාවත් නීතිපතිවරයා වෙත යොමු කොට තිබෙනවා.

මේ අතරතුර, 2016 නොවැම්බර් 07වන දින මුදල් මණ්ඩලය විසින් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මෙහෙයුම් කටයුතු සීමා කරමින් හා සමාගම සතු මුදල් බැහැර කිරීම වළක්වාලමින් නියෝග නිකුත් කළා. 2017 ජූලි 06 වන දින එම සමාගමේ සියලු ව්‍යාපාරික ක්‍රියාකාරකම් තහනම් කළා. 2018.01.05 වන දින සිට එම තහනම තවත් මාස හයකට දීර්ඝ කර තිබෙනවා. ඒ අනුව එම සමාගමේ ගිණුම්ගත රුපියල් බිලියන 12ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව භාරයේ රඳවාගෙන තිබෙනවා.

එනම්, රුපියල් බිලියන 12ක් දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතේයි තිබෙන්නේ. ජනාධිපති කොමිසමේ වාර්තාව අනුව මෙම ගනුදෙනුව මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුව ඇති අලාභය රුපියල් බිලියන 11ක් බව සඳහන් වෙනවා. දැන් ඉතිරිව ඇත්තේ, නීතිපතිවරයා විසින් උසාවියට කරුණු වාර්තා කොට නඩු කටයුතු මෙහෙයවා, රජයට සිදුව ඇති අලාභය නැවත අයකර ගැනීමට කටයුතු කිරීමයි. එමඟින් රජයට අලාභයක් සිදුව ඇත්නම් එය පියවා ගැනීමටත් හැකියාව ලැබෙනවා.

මේකට තමයි කෑ ගැහුවේ. මේ රුපියල් බිලියන 11 තවම තිබෙනවා, නැති වෙලා නැහැ. උසාවිය මාර්ගයෙන් ඒවා ආපහු ගන්න පුළුවන් කියලා කියනකොට, ඒක නවත්වන්න තමයි තමුන්නාන්සේලා කෑ ගැහුවේ. එහෙම නොකළොත්, "මුදල් නැති වුණා" කියලා තමුන්නාන්සේලාට ගිහිල්ලා දේශපාලනය කරන්න බැහැනේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙවැනි විමර්ශන ක්‍රියාවලියක් සාධාරණව, අපක්ෂපාතීව හා කඩිනමින් සිදුකළ ප්‍රථම අවස්ථාව මෙයයි. මෙය ඉතා සංකීර්ණ විමර්ශන ක්‍රියාවලියක්. මෙය, 2015 ජනවාරි 08වන දින අප පිහිටවූ යහ පාලන රජයේ විශේෂ ජයග්‍රහණයක්. අවුරුදු 10ට පසුව රටේ මූල්‍ය පාලනය හා අධීක්ෂණය ආපසු පාර්ලිමේන්තුව වෙත ලබාදීමට අපට හැකි වුණා. පසු ගිය කාලයේ මෙම ගනුදෙනු කිසිවක් පිළිබඳව පාර්ලිමේන්තුව දැන සිටියේ නැහැ. අවම වශයෙන් අමාත්‍යවරු හෝ වග කිවයුතු නිලධාරීන් දැන සිටියේත් නැහැ. නමුත් අපි එම තත්ත්වය වෙනස් කොට තිබෙනවා.

එසේම, 2008 වසරේ සිට 2014 වසර දක්වා භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී සිදුව ඇති අවභාවිතය පිළිබඳවත් විමර්ශනය කළ යුතු බව ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර ඇති බව ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා. එම අවභාවිත පිළිබඳව කඩිනමින් සෙවීමට ද අදාළ අංශවලට මා උපදෙස් ලබාදී අවසන්. එම සියලු වංචා සොයා බලා වැරදිකරුවන්ට දඬුවම් දීමට අප කටයුතු කරනවා.

2008 සිට 2014 වසර දක්වා කාලය තුළ බහුතරයක් බැඳුම්කර නිකුත් කිරීම් සිදුකොට තිබෙන්නේ පුද්ගලික ඍජු නිකුත් කිරීම් මඟින්. මෙහි කිසිම විනිවිදභාවයක් නිබිලා නැහැ. මෙම කාලය තුළ රුපියල් බිලියන පන්දහස් එකසිය හතළිස්හතක (රු. 5,147,751,210,000/-) බැඳුම්කර නිකුත් කර තිබෙන අතර, ඉන් රුපියල් බිලියන හාරදහස් හත්සියදෙකක (රු. 4,702,232,210,000/-) බැඳුම්කර නිකුත් කර තිබෙන්නේ පුද්ගලික ඍජු නිකුත් කිරීමේ ක්‍රමය යටතේයි. එනම්, මෙම කාලය තුළ මුළු බැඳුම්කර නිකුතුවලින් සියයට 90කට වඩා වැඩි ප්‍රතිශතයක් නිකුත් කර තිබෙන්නේ පෞද්ගලික ඍජු බැඳුම්කර නිකුතු ක්‍රමය යටතේයි. මේ කිසිවකට මුදල් මණ්ඩලයේ අනුමැතියක් ලැබී නැහැ.

ඒ කියන්නේ, රුපියල් බිලියන 4,702ක් මුදල් මණ්ඩලයේ අනුමැතිය නැතිව නිකුත් කරලා තිබෙනවා. ඒ කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව භාරව සිටි මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කළ යුතුයි. මහජන නියෝජිතයන් වන අපත්, මේ රටේ ජනතාවත් මෙම අබිරහස් පිළිබඳව දැනුවත් විය යුතුයි.

මට පුළුවන් නම් පාර්ලිමේන්තුවේදී නැඟිටලා එක අවුරුද්දක එක සිද්ධියක් ගැන කථා කරන්න, එතුමාට ශක්තියක් තිබෙන්න ඕනෑ ඒ කාල සීමාව ගැනම විස්තර පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න. ගරු කථානායකතුමනි, අප රජය හැම විටම කටයුතු කළේ පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය ශක්තිමත් කරලීම උදෙසායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී දිවා භෝජනය සඳහා ගරු පාර්ලිමේන්තුවේ කටයුතු දහවල් 12.30ට තාවකාලිකව නවත්වන්න ඕනෑ. මේ කටයුතු ඉක්මනින්ම අවසන් වන නිසා දිවා භෝජනය සඳහා සභාවේ වැඩ කටයුතු නවත්වන්නේ නැතිව ඉදිරියටම කරගෙන යන්න සභාවේ අනුමැතිය ලැබෙනවා ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, රටේ මූල්‍ය තත්ත්වය නිරන්තරයෙන් මම පාර්ලිමේන්තුවට වාර්තා කර තිබෙනවා. එම ප්‍රතිපත්තියම අනුගමනය කරමින් අද දිනත් මා සියලු කරුණු වාර්තා කළා. 2008 - 2014 කාලයේ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් මම පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා පසුගිය පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව විසින් අනුමත කිරීමත් පුදුමයක්. මෙයින් පෙනෙන්නේ මේ වැඩ කටයුතු ගැන නියම සෝදිසියක් ඇති කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කෝප් කොමිටියේ සභාපති කරන්න වුවමනා බවයි. ඒකයි අපි කරලා තිබෙන්නේ. අද භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් වෙලා. විවිධ ජනමාධ්‍යවලට, දේශපාලන පක්ෂවලට මඩ ෆැක්ටරිවලට මේක හොඳ ඉල්ලමක් වෙලා. සමහරු මෙම බැඳුම්කර ප්‍රශ්නය නිසා පොලී අනුපාතය ඉහළ ගියා කියනවා; ඩොලරයේ අගය ඉහළ ගියා කියනවා. මේ


ඔක්කෝම මඩ ප්‍රචාරවලට නොරැවටී අපි සත්‍ය සොයා ගනිමු. සත්‍ය සොයා ගෙන අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමු.

ගරු කථානායකතුමනි, මම හැමදාමත් කියන පරිදි, ජනාධිපතිතුමාත්, මමත් නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරලීම සඳහා කැපවී කටයුතු කරනවා. මෙය අපේ රටට අලුත් අත්දැකීමක්. පක්ෂ භේදයෙන් කුළල් කා ගන්නා උදවියට තේරුම් ගන්නට බැරි තරම් සංකීර්ණ ක්‍රියාවලියක්. අත් දැකීම ආගන්තුක නිසා අඩු පාඩු, වැරදීම් සිදු වෙන්න පුළුවන්. ඒවා අපි සකස් කර ගනිමු. නමුත්, පසුගිය ආණ්ඩු සමයේදී මෙන් වැරදි අඩු පාඩු සියල්ල පාපිස්සට යට කර, නීතියේ ආධිපත්‍ය පාගා දමන්න අප සූදානම් නැහැ. සමාජ සාධාරණත්වය වළලා දමන්නට අප සූදානම් නැහැ. 2015 ජනවාරි 08වැනි දා අප භාර ගත්තේ ණය උගුලකට හසු වුණු රටක්; නීතිය ක්‍රියාත්මක නොවුණු රටක්; දූෂණයෙන් හා වංචාවෙන් පිරුණු රටක්; රාජ්‍ය ත්‍රස්තවාදයෙන් බිය වැද්දුණු රටක්.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාත්, මමත්, අපේ සම්මුතිවාදී රජයත් මේ තත්ත්වය වෙනස් කිරීමේ මාර්ගයට අපේ රට අවතීර්ණ කර තිබෙනවා. ඒ ගමන් මග කටුකයි; දුෂ්කරයි. බොරු වළවල්වල නොවැටී, මංමුලා නොවී ඒ ගමන් මහ ඉදිරියටම ගොස්, ශීලාචාර ආණ්ඩුවක්, සාධාරණ සමාජයක්, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් බිහි කරලීම සඳහා අප ඇප කැප වන බව අවසන් වශයෙන් සඳහන් කරන්න කැමැතියි.

ස්තුතියි.

** සභාමේසය මත තබන ලද ලේඛන :*
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
** Documents tabled:*



පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
பாராளுமன்ற சபை முதல்வரின் அலுவலகம்
OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT


31st October, 2016

Hon. Jayantha Jayasuriya, PC
Attorney-General
Attorney General's Department
Colombo 12

Hon. Prime Minister has directed me to forward the under mentioned documents for your information and necessary action.

1. The Report of the Committee on Public Enterprises (COPE) Parliament Series No. 109 tabled in Parliament on 28th October, 2016.
2. The Special Report on Bonds Issued by the Central Bank between the period of February 2015 and May 2016 which was forwarded to the Committee on Public Enterprises.

Naufel Abdul-Rahman
Secretary to the Leader of the House of Parliament



අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE
58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

PMO/01/Misc. — 02.11.2016

Hon. Jayantha Jayasuriya, PC
Attorney General
Attorney General's Department
Colombo 12

Hon. Attorney General,

Bonds Issued by the Central Bank

I am instructed by the Hon. Prime Minister to seek your advice on the following matters raised in the COPE Report on the Issue of Central Bank Treasury Bonds which were forwarded to you by the Secretary to the Leader of the House of Parliament;

01. Are there officers of the CBSL or other persons who have contravened the law or involved in any financial malpractice in issuing the Treasury bonds? If so,
   a) what are such laws?
   b) what action can be taken against them?

02. What loss has been caused to the Government of Sri Lanka due to such malpractices? If so, what is the procedure to be followed to recover such loss?

03. Have the officers of the Central Bank acted in such a manner so as to afford an undue advantage to the primary dealer named Perpetual Treasuries thereby seriously affecting the transparency and public confidence in the monetary control of the Central Bank of Sri Lanka? If so, whether a comprehensive investigation should be initiated by a recognized agency with legal authority? If so, by what agency?


04. Whether the former Governor of the Central Bank, Mr. Arjuna Mahendran is directly responsible for the bond transaction in issue and if so, what legal action can be taken against him and other senior officials of the Central Bank who got involved in the bond issue in question.

Thank you
Yours sincerely

E M S B Ekanayake
Secretary to the Prime Minister

(Tel: 0112-575311 / Fax: 0112-575310)
(E-mail: secpm@pmoffice.gov.lk)

2575317, 2575318 | 2574143, 2575454 | secpm@pmoffice.gov.lk



අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE
58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

PMO/06/Misc/AG. — 09.11.2016

Mr. Dammika Dasanayake
Secretary - General of Parliament

Dear Sir

Bonds Issued by the Central Bank

On the instructions received from the Hon. Prime Minister, in his capacity as the Minister of National Policies & Economic Affairs, the following reports were referred to the Hon. Attorney General, to seek his opinion on the legality / validity of the bonds issued by the CBSL since 2008.

1. The Report of the Committee on Public Enterprises (COPE) Parliament Series No. 109 tabled in Parliament on 28thOctober, 2016.
2. The Special Report on Bonds Issued by the Central Bank between the period of February 2015 and May 2016 which was forwarded to the Committee on Public Enterprises.

Subsequently, Hon. Attorney General has requested the following materials recorded at the deliberations of the COPE with regard to the CBSL Bond issue.

- Annexures 7 to 25 of the COPE Report
- The report referred to in the first paragraph of page 24 of the COPE Report
- The communication of the Superintendent of Public Debt to the Tender Committee referred to in the first paragraph of page 27 of the COPE Report
- The investigation report by a retired Supreme Court Judge referred to at paragraph 2.1.4 of the Auditor General's Report

Accordingly, I have been instructed by the Hon. Prime Minister to request you to submit the copies of the above mentioned materials recorded at the deliberations of the COPE with regard to the CBSL Bond issue to the Hon. Attorney General with the permission of the Hon. Speaker.

Your cooperation and assistance in this regard will be highly appreciated.


Thank you
Yours sincerely

E M S B Ekanayake
Secretary to the Prime Minister
(Tel: 0112-575311 / Fax: 0112-575310)
(E-mail: secpm@pmoffice.gov.lk)

Copy: Hon. Jayantha Jayasooriya, PC, Attorney General – for info. Pl.

2575317, 2575318 | 2574143, 2575454 | secpm@pmoffice.gov.lk

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]



World Bank
IATIONAL BANK FOR RECONSTRUCTION AND DEVELOPMENT
IATIONAL DEVELOPMENT ASSOCIATION

Colombo Office.
1st Floor, DFCC Building,
73/5, Galle Road;
Colombo 3, Sri Lanka.

Telepl -2448070 / 2345281
Facsin 2440357 / 5561352
Cable / TBAFRAD COLOMBO
Mailing O. Box 1761, Colombo.

December 7, 2016

Mr. E.M.S.B. Ekanayake
Secretary to the Prime Minister
Prime Minister's Office
58, Sir Ernest de Silva Mawatha
Colombo 7


Dear Mr. Ekanayake:

Re: Development of Government Securities Market and Public Debt Management in Sri Lanka

We would like to commend the Government of Sri Lanka (GoSL) for the rec... steps taken to develop the government securities market and improve public debt management in Sri Lanka, as outlined in your letter dated November 18, 2016 (PMO/01/Misc.). The announced drafting of a new public debt law, creation of an independent Public Debt Office and formulation of a Medium-Term Debt Management Strategy are important steps in line with the best practices endorsed by the World Bank and IMF in the Revised Guidelines for Public Debt Management of 2014. We would like to convey our support to this effort by the GoSL.

Regarding your request for comments in the above-mentioned letter, we are not aware of international best practices to accurately calculate the potential loss in the case of the past bond auction. Accurately quantifying the loss would require knowledge of the actual cost of the bond placement under non-competitive allocations (a necessary counterfactual). In our view that counterfactual cannot be accurately calculated on an ex post basis as it depends on the market conditions on the auction date.

The World Bank hopes to effectively and immediately contribute to the design of auction rules and practices for issuing government debt in the upcoming joint mission with the IMF. This targeted mission will be further complemented with a range of technical assistance activities to support development of the government bond market and the capital market at large including the formulation of Medium-Term Debt Management Strategy. The technical assistance will also extend to the closely-related area of pension investment management.



Mr. E.M.S.B. Ekanayake -2- December 7, 2016

We are convinced that the GoSL's efforts and collaborative support from the World Bank, the IMF will help enhance transparency and competence of the government and corporate bond markets, improve public debt management and bring Sri Lanka in line with international good practice.

Sincerely,

Idah Z. Pswarayi-Riddihough
Country Director for Sri Lanka and Maldives

[මෙම ලේඛන පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[This document also placed in the Library.]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මා මේ පිළිබඳව යමක් සඳහන් කළ යුතුයි. අපේ රටේ සිදු වූ මහ බැංකු ගනුදෙනුව සම්බන්ධව ආන්දෝලනාත්මකව සමස්ත රටම අවධානය යොමු කළා. එහි ප්‍රතිඵලයක් විධියට පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කළ යුතුයි කියන ස්ථාවරයේ සිටියා. ඒ අනුව එදා ගරු ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් මේ පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනයක්, පරීක්ෂණයක් කළා. ඒ සභාපතිවරුන් දෙදෙනා යටතේම කාරක සභාවේ ක්‍රියාකාරී සාමාජිකයකු විධියට මමත් කටයුතු කළා.

ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට මේ පිළිබඳව වෙනම කමිටුවක් පත් කරලා, ඒ කමිටුව මඟින් පක්ෂයට දීර්ඝ වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ කමිටුවේත් ක්‍රියාකාරී කෙනකු විධියට මම කටයුතු කළා. මෙම සියලු පරීක්ෂණ වාර්තාවලින් අනාවරණ වුණේ, සාරාංශයක් විධියට ගන්න පුළුවන්කම තිබුණේ, ඒ සිද්ධිය පිළිබඳව දීර්ඝ වශයෙන් පරීක්ෂණයක් කළ යුතුයි කියන අදහසයි. ගරු ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, අග්‍රාමාත්‍යතුමාගේ කමිටුවත්, අපේ පක්ෂයේ කමිටුවත් ඇතුළු මේ කමිටු හතරම විවිධ නිර්දේශ ඉදිරිපත් කරලා තිබුණා. ඒ පරීක්ෂණ වාර්තා හතරේම තිබුණු එක දෙයක් තමයි, මේ පිළිබඳව දීර්ඝ වශයෙන් පරීක්ෂණ පැවැත්විය යුතුයි කියන එක. එහි ප්‍රතිඵලයක් විධියට ජනාධිපතිතුමා ජනාධිපති කොමිෂන් සභාව පත් කළා. ජනාධිපති කොමිෂන් සභාව පත් කළාම විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, "ජනාධිපති කොමිෂන් සභාව කියන්නේ මේ සිද්ධිය යට ගහන්න පත් කරපු එකක්." කියලා.

මෙහි පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතින අතරතුරදී, කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි කාලය දික් කළා. කාලය දික් කරනකොට ඇහුවා, "කාලය දික් කරන්නේ ඇයි? මේක යට ගහන්නද?" කියලා. ජනාධිපතිතුමා මෙම සිද්ධිය සම්බන්ධයෙන් කොමිෂන් සභාව පත් කරපු දිනයේ ඉඳලාම සමහර අය වපර ඇසින් තමයි මේ පිළිබඳ බැලුවේ. මෙම කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් වුණාට පසුව, පහුවදාම විවිධ දේශපාලන පක්ෂ ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහිල්ලා තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මෙම වාර්තාව ඉල්ලුවා. මේ ගැන කථා කළා. ඒ අනුව මේ පිළිබඳව ජනතාව තුළ ඇති වූ උනන්දුව නිසාම අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට අතිගරු ජනාධිපතිතුමා මේ පිටු 1400ක වාර්තාවේ තිබෙන කරුණු සම්පිණ්ඩනයක් ලෙස රට හමුවේ ඉදිරිපත් කළා. මේ පිළිබඳව පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළ යුතුයි කියලා අපේ පක්ෂයත් යම් ස්ථාවරයක සිටියා. අදත් ඉන්නවා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සමහර දේශපාලන පක්ෂත් ඒ ස්ථාවරයේ ඉඳගෙන කටයුතු කළා. ඒ අනුව, ඊයේ පක්ෂ නායක රැස්වීමක් පැවැත්වුවා. ඊයේ සවස 4.30ට ජනාධිපති ලේකම් කාර්යාලයට එම වාර්තාව එවන ලෙස ලිපියක් මඟින් ඉල්ලීමක් කරලා තිබෙනවා.

සාමාන්‍යයෙන් ඕනෑම රාජ්‍ය නායකයෙක්, -අග්‍රාමාත්‍යතුමා, අමාත්‍යවරයෙක්- මේ පිළිබඳව නීති උපදෙස් ලබාගත යුතුයි. ඒ අනුව එතුමා නීති උපදෙස් අරගෙන, අද ජනාධිපති ලේකම්වරයා විසින් මේ පාර්ලිමේන්තුවට ලිඛිත දැනුම් දීමක් කර තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ ඉල්ලීම පරිදි, ලබන 17 වනදා මෙම පාර්ලිමේන්තුවට ඒ සියලුම වාර්තා ලබා දෙන බව දන්වා තිබෙනවා. එම නිසා අතිගරු ජනාධිපතිතුමාවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයවත් එම වාර්තා යට ගැසීමට හෝ මෙම පාර්ලිමේන්තුවට එම වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍යතාවක් නැහැ කියන තැන ඉඳගෙන හෝ මොනම ආකාරයකින්වත් කටයුතු කරන්නේ නැහැ.

කලින් පරීක්ෂණවලදී එම කණ්ඩායම්වලට අනාවරණය නොවූ දැවැන්ත කරුණු කාරණා ගණනාවක් මේ කොමිෂන් සභාවෙන් අනාවරණය වුණා. මෙය සංකීර්ණ දෙයක්. එමනිසා තමයි විශේෂයෙන් මේ පිළිබඳව යම් කිසි ආකාරයක විධිමත් පරිදි කටයුතු කළ යුතුය කියන තැන ඉන්නේ.

ගරු කථානායකතුමනි, ලබන 17 වෙනිදා මෙම වාර්තාව ඉදිරිපත් කරනවාය කියා මෙම පාර්ලිමේන්තුවට ලිඛිතව දන්වා තිබෙනවා. ඒ අනුව ලබන 17 වෙනිදා මෙම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. වුවමනාවක් තිබෙනවා නම්, ලබන 17 වෙනිදා වනතුරු ඉන්න අවශ්‍යතාවක් නැහැ. මෙම වාර්තාව අද රාත්‍රී 12ට පෙර හෝ හෙට හෝ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය කියා ඒ පිළිබඳව තීන්දු තීරණයක් ගන්න මේ පාර්ලිමේන්තුවට අනිවාර්යෙන්ම පුළුවන්කම තිබෙනවා.

විශේෂයෙන් අප සියලු දෙනාම අවධාරණය කළ යුතු වන්නේ, මින් ඉදිරියටවත් මෙවැනි දේ මේ රට තුළ සිදු නොවිය යුතුය කියන එකයි. ඒ අනුවයි අප කටයුතු කළ යුතු වන්නේ. එසේ නැතිව යම් වාර්තාවක් අරගෙන එම වාර්තාව කියවා, එයින් පෞද්ගලිකව කෙටි කාලීන වාසි ලබා ගැනීම නොවෙයි කළ යුත්තේ. අපි රටක් විධියටයි කටයුතු කළ යුතු වන්නේ.

ගරු කථානායකතුමනි, අපි නිදහස ලබා අවුරුදු හැත්තෑවක් ගත වෙනවා. මේ අවුරුදු හැත්තෑව තුළ අපි ලබා ගත් ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපට ළඟා කර ගන්නට බැරි වුණු බොහෝ දේ තිබෙනවා. එම ලබා ගත් හොඳ දේවල් පිළිබඳව අපි දේශපාලන පක්ෂ වශයෙන් සියලු දෙනාම වග කිවයුතු වනවා වාගේම, නරක දේවල් සම්බන්ධයෙනුත් මා ඇතුළු අප සියලු දෙනාම වග කීම භාර ගත යුතුව තිබෙනවා. එම නිසා මින් ඉදිරියට රටක් විධියට මෙවැනි දේවල් රට තුළ ඇති නොවීම සඳහා මොන ආකාරයෙන් කටයුතු කළ යුතුද කියන කාරණය පිළිබඳව තීන්දු තීරණ ගැනීමේ අවශ්‍යතාවක් අද තිබෙනවා. එම නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බොහොම පැහැදිලිව එම ස්ථාවරය තුළ ඉන්නවා. පාර්ලිමේන්තුවට එම වාර්තාව ඉදිරිපත් කළ යුතුයි. ලබන 17 වෙනිදා එම වාර්තාව ඉදිරිපත් කරනවා. ඒ අතරතුර එම නිර්දේශයන්ට අදාළව එම ආයතනවලිනුත් යම් යම් උපදෙස් ලබා ගැනීම ගරු ජනාධිපතිතුමා කළ යුතුයි. ඒ අනුව උපදෙස් ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සෑම සිද්ධියක් සම්බන්ධයෙන්ම රාජ්‍ය නායකයා විධියට එතුමා වග කීම භාරගත යුතුයි. එම නිසා තමයි එතුමාටත් සාධාරණ කාලයක අවශ්‍යතාව ඇති වෙන්නේ. එම නිසා තමයි ඒ සඳහා සතියක කාලයක ඉල්ලීමක් කර තිබෙන්නේ. ඒ වාගේම සියලුම දේශපාලන පක්ෂ තවදුරටත් ඉල්ලීමක් කරනවා නම්, "මේ වාර්තාව කඩිනමින් ලබා ගත යුතුයි, මෙම වාර්තාවේ ඉදිරි කටයුතු පිළිබඳව අවශ්‍යතාවක් නැහැ" කියලා, ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට තීන්දුවක්, තීරණයක් ගැනීමේ හැකියාව තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළ කාරණා සම්බන්ධයෙන් වචනයක් කියන්නට ඕනෑ. මෙවැනි කරුණු අනාගතයේ දී නැවතත් සිදු නොවිය යුතුයි කියන එක අපි පිළිගන්නවා. මේ විතරක් නොවෙයි, මීට වඩා සිය ගුණයක කරුණු කාරණා 2008 වර්ෂයේ සිට සිදු වී තිබෙනවා. එයාර් ලංකා ගුවන් සමාගම, හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ අදාළව සිද්ධීන් තිබෙනවා. ඔබතුමන්ලාගේ ඇස් ඇරුණේ අපි ආණ්ඩුවක් ගෙනැල්ලා මේ කටයුතු කරනවිටයි. විශේෂයෙන්ම ගරු අගමැතිතුමා ඇතුළු සියලු දෙනා භය නැතිව මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා, මේ සම්බන්ධයෙන් පරීක්ෂණ හතරක් පවත්වා තිබෙනවා. වහන්නට දෙයක් නැති නිසා ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් රටේ සියලුම නීති ආයතන දැනුවත් කර; නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කර, මේ සම්බන්ධයෙන් ගන්නට තිබෙන සියලුම ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සභා ගැබේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ඇඟිල්ල දිගු කළා. මේ වාර්තාව සම්බන්ධයෙන් ඔබතුමා ඉල්ලීමක් කළා. එම ඉල්ලීම අනුව ඔබතුමාට වාර්තාව ලැබී තිබුණේ නැහැ. ඔබතුමා ඒ අනුව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අගමැතිතුමා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, පාර්ලිමේන්තුවේ මේ කාර්ය භාරය පටන් ගැන්ම සඳහා. අපි සියලු දෙනාම මේ වාර්තාව ඉල්ලුවා. මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන්න හේතුව මොකක්ද, එය මෙතරම් රහස්‍ය වාර්තාවක්ද කියලා මම දන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි දිගින් දිගටම කිව්වේ මේ වාර්තාව ඉදිරිපත් කරන්න කියලායි. මේ සම්බන්ධයෙන් රට දැනුවත් කරන්නය කියලායි. ඒකයි අපේ අවශ්‍යතාව. අපි ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳව ඔබතුමාට ඇඟිල්ල දිගු කර හරියන්නේ නැහැ. සභාවේ මන්ත්‍රීවරුන් ගහ ගන්නවා නම්, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා වැනි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් මේ සභා ගැබ තුළ කොළ විසි කරමින් රණ්ඩු- සරුවල් කරනවා නම්, ඒක ඔබතුමාගේ වරදක් නොවෙයි. මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැන මන්ත්‍රීවරුන් වග බල ගත යුතුයි. ගරු කථානායකතුමාට ඒ සම්බන්ධයෙන් ඇඟිල්ල දිගු නොකළ යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද අපි විවාදයට සූදානම් වෙලා ආවේ. විවාදය ඉල්ලුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, ඒකාබද්ධ විපක්ෂයයි, එක්සත් ජනතා නිදහස් සන්ධානයයි. මෙම විවාදය ඉල්ලපු අයම අද මෙතැන නැහැ. ඒකෙන් පෙනෙනවා, විවාදයක් ඉල්ලුවේ අපි නොදෙයි කියන බලාපොරොත්තුවෙන් බව. ඒගොල්ලෝ හිතුවා, විවාදයක් ඉල්ලුවොත් අපි දෙන එකක් නැහැ කියලා. ඊට පස්සේ TV එකට ගිහින් කියන්න පුළුවන් අපි විවාදයක් දුන්නේ නැහැ කියලා.

විවාදයක් ඉල්ලුවා; ගරු අගමැතිතුමා විවාදයක් දුන්නා. අගමැතිතුමා සූදානම් වෙලා ආවේ දවසම විවාදය කරන්න. නමුත්, විවාදය ඉල්ලපු අය මෙතැන නැහැ. මූලික වැරැද්ද තමයි, වාර්තාව නැතුව විවාදය ඉල්ලීම. වාර්තාවක් නැතුව ඇයි විවාදයක් ඉල්ලුවේ? වාර්තාවක් නැතුව විවාදයක් ඉල්ලලා මෙතැනට ඇවිල්ලා කියනවා, "වාර්තාව නැහැ" කියලා. ඇත්ත වශයෙන්ම ඒක අපට පිළිගන්න බැරි ක්‍රියා මාර්ගයක්.

ගරු සභාව තුළ අසංවර විධියට හැසිරිලා එක එක්කෙනාට ඇඟිල්ල දික් කරලා හරියන්නේ නැහැ. [බාධා කිරීම්] අසංවර විධියට හැසිරිලා එක එක්කෙනාට ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. අපි විවාදයට සූදානම්. අපි අද දවසම විවාද කරන්න ආවේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇතුළේ ගහ ගත්තා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ගරු සභාවේ කටයුතු අවසන් කරන්න යන්නේ. ඔබතුමා සඳහන් කරන්නේ මේ කාරණය සම්බන්ධයෙන්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මේ කාරණය සඳහන් කරන්න මට අවස්ථාව දෙන්න.

ඔබතුමාගේ නිවේදනයෙන් කියැ වුණා, 17වැනි දාට කොමිෂන් සභා වාර්තාව සභාගත කරනවා කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලනවා ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කියලා, ඒ වාර්තාව විතරක් නොවෙයි, ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරපු අනෙක් වාර්තාවත් ඉදිරිපත් කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වාර්තාවත් ඉල්ලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, just give me one more minute, please.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්න ඕනෑ, "පාර්ලිමේන්තුවට එවන්න අවශ්‍යතාවක් නැහැ" කියන නීතිපතිතුමාගේ තර්කය අපි පිළිගන්නේ නැහැ. It is absurd. ඉස්සෙල්ලාම එවන්න ඕනෑ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට එවන්නේ නැතුව Central Bank එකටයි, Department of National Archives එකටයි යවනවා. "පාර්ලිමේන්තුවට එවන්න එපා" කියලා නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා නම්, අපට ඒක පිළිගන්න බැහැ. මොකද, රාජ්‍ය මූල්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. නීතිපතිතුමාගේ තර්කය අපට පිළිගන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the proceedings be exempted at this day's sitting from the provisions of the Standing Order No. 7 of the Parliament and the motions agreed to by Parliament on 08.03.2016."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Tuesday, January 23, 2018."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 12.42ට, අද දින සභා සම්මතිය අනුව 2018 ජනවාරි 23 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 12.42 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2018 சனவரி 23, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 12.42 p.m. until 1.00 p.m. on Tuesday, 23rd January, 2018 pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

258 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 258 - இல. 2
Volume 258 - No. 2

2018 ජනවාරි 23වන අඟහරුවාදා
2018 சனவரி 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd January, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. එච්. එම්. සල්මාන් මහතාගේ ඉල්ලා අස්වීම

යෝජිත ස්ථාවර නියෝග කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම රීති සංග්‍රහයේ කෙටුම්පත

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා පිළිබඳ කරුණු පැහැදිලි කිරීම

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:

මූල්‍ය ආයතන මුහුණ දී තිබෙන අර්බුදය

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී

භාර (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

ශ්‍රී නාථ අහස්ථාන ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථාන කාර්ය සාධන සමීක්ෂණ කමිටුව (සංස්ථාගත කිරීමේ) – [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]- පළමුවන වර කියවන ලදී

නිමල් රූපසිංහ මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු ඉෂාක් රහුමාන් මහතා]- පළමුවන වර කියවන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எம்.எச்.எம். சல்மானினது இராஜினாமா

உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்

திறைசேரிப் பிணைமுறி விநியோகம் பற்றி விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் பாரிய மோசடி, ஊழல், அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் அறிக்கைகள் பற்றி விளக்கமளித்தல்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

நிதி நிறுவனங்கள் எதிர்நோக்கும் நெருக்கடி

புலமைச்சொத்து (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

ஸ்ரீ நாத அகஸ்தான சர்வதேச புத்த தியான நிலைய செயலாற்றுகைச் சங்கம் (கூட்டிணைத்தல்) –

[மாண்புமிகு ஜே.சீ. அலவத்துவல] - முதன்முறை மதிப்பிடப்பட்டது

நிமல் ரூபசிங்ஹ நட்புறவு மன்றம் (கூட்டிணைத்தல்) -

[மாண்புமிகு இஷாக் ரஹுமான்] - முதன்முறை மதிப்பிடப் பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Resignation of Hon. M.H.M Salman, Member of Parliament

Proposed Draft Standing Orders and Draft Code of Conduct for Members of Parliament

Clarification on Reports of Presidential Commission of Inquiry to Investigate and Inquire into the Issuance of Treasury Bonds and Presidential Commission on Serious Acts of Fraud, Corruption and Abuse of Power, State Resources and Privileges

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Crisis Faced by Finance Companies

INTELLECTUAL PROPERTY (AMENDMENT) BILL:
Read the First time

TRUSTS (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:

Sri Natha Ahasthana International Buddhist Meditation Centre Performance Society (Incorporation) - [The Hon. J.M. Ananda Kumarasiri] - Read the First time

Nimal Rupasinghe Friendship Foundation (Incorporation) - [The Hon. Ishak Rahuman] - Read the First time

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජනවාරි 23වන අඟහරුවාදා
2018 சனவரி 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd January, 2018

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. එච්. එම්. සල්මාන් මහතාගේ ඉල්ලා අස්වීම

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எம்.எச்.எம். சல்மானினது இராஜினாமா

RESIGNATION OF HON. M.H.M. SALMAN, MEMBER OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ආ) ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා විසින් දරමින් සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් මෙම ගරු සභාවට කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:

அதன்பிறகு, செயலாளர் நாயகத்தினால் பின்வரும் கடிதம் வாசிக்கப்பட்டது:

Whereupon the Secretary-General read the following letter:

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018.01.18

මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

මහ ලේකම්තුමනි,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරන මම, එම මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වන බව මෙයින් දන්වමි.

ඒතුතියි.

එම්.එච්.එම්. සල්මාන්
පාර්ලිමේන්තු මන්ත්‍රී

M.H.M. Salman
Member of Parliament

II

යෝජිත ස්ථාවර නියෝග කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම රීති සංග්‍රහයේ කෙටුම්පත

உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்

PROPOSED DRAFT STANDING ORDERS AND DRAFT CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අපගේ ව්‍යවස්ථාදායකයේ දැනට බලාත්මකව පවතින ස්ථාවර නියෝග 1993 අවසාන වරට සංශෝධනය වීමෙන් අනතුරුව වසර 25කට, අද තත්ත්වයට ගැළපෙන පරිදි වෙනසක් වී නොමැති බව අප කවුරුත් හොඳින් දන්නා කරුණකි. කෙසේ වෙතත්, මහත්වූ පරිශ්‍රමයක ප්‍රතිඵලයක් ලෙස අදට යෝග්‍ය පරිදි ප්‍රතිශෝධිත ස්ථාවර නියෝගවල අවසන් කෙටුම්පත් පිටපත සලකා බලා අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබුණ ද, එම වැදගත් කාර්ය නැවත වරක් 2018 පෙබරවාරි මස 19 වන සඳුදාට කල් දැමීමට සිදු විය. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලිය පෙබරවාරි 19 වන දින සමාප්ත කර ගැනීමට සහාය ලබා දෙන ලෙස මම ඉතාම ගෞරවයෙන් මෙම ගරු සභාවෙන් අවධාරණයෙන් යුතුව ඉල්ලා සිටිමි.

තවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂා කරනු ලබන අවශ්‍ය විශිෂ්ටතා මට්ටම සම්බන්ධයෙන් මහජන විශ්වාසය ඇති කිරීම පිණිසත්, පාර්ලිමේන්තුවේ කැපවීම සහතික කිරීම පිණිසත් අවශ්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහය ද පාර්ලිමේන්තුව විසින් අනුමත කර ගැනීම මඟින් ආදර්ශවත් පාර්ලිමේන්තුවක් ලෙස වැඩ කටයුතු කිරීමට අධිෂ්ඨාන කර ගනිමු.

III

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා පිළිබඳ කරුණු පැහැදිලි කිරීම

திறைசேரிப் பிணைமுறி விநியோகம் மற்றும் பாரிய மோசடி, ஊழல், அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுக்களின் அறிக்கைகள் பற்றி விளக்கமளித்தல்

CLARIFICATION ON REPORTS OF PRESIDENTIAL COMMISSION OF INQUIRY TO INVESTIGATE AND INQUIRE INTO THE ISSUANCE OF TREASURY BONDS AND PRESIDENTIAL COMMISSION ON SERIOUS ACTS OF FRAUD, CORRUPTION AND ABUSE OF POWER, STATE RESOURCES AND PRIVILEGES

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා විසින් ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කරන 2015 පෙබරවාරි මස 01 වැනි දින සිට 2016 මාර්තු මස 31 වැනි දින දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවල වාර්තා සම්බන්ධයෙන් මේ දක්වා සිදු වී තිබෙන ක්‍රියාදාමය මේ ගරු සභාවටත්, ශ්‍රී ලංකාවාසී ජනතාවටත් නිරවද්‍ය ලෙස කරුණු ගෙන හැර දැක්වීම පාර්ලිමේන්තුවේ කථානායකවරයා වශයෙන් මාගේ යුතුකමක් ලෙස මා සලකනවා.

මේ වසර ආරම්භයේදී මෙම කොමිෂන් සභා වාර්තා අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කිරීමෙන් අනතුරුව 2018 ජනවාරි මස 23 වැනි දින අපර භාග 1.00 දක්වා සාමාන්‍ය පරිදි කල් තබන ලද පාර්ලිමේන්තුව කලින් කැඳවනු ලැබිය යුතු බවට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්තුමා සහ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉල්ලීම් කර තිබුණු අතරම, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර දිසානායක මැතිතුමන් විසින් මේ පිළිබඳව සාකච්ඡා කිරීමට හැකි වන පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමක් කැඳවන ලෙසද ඉල්ලීමක් කර තිබුණි.

ඒ අනුව පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමන් සමඟ සාකච්ඡා කළ අතර, ජනවාරි මස 09 වැනි අඟහරුවාදා අපර භාග 2.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක්ද, මාගේ යෝජනා මත පසු දින, එනම් ජනවාරි මස 10 වැනි දින පාර්ලිමේන්තුව කලින් කැඳවන ලෙසට ස්ථාවර නියෝග 14 යටතේ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක්ද ලැබී තිබුණි.

ජනවාරි මස 10 වැනි දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කරන ලද පරිදි ස්ථාවර නියෝග 14 යටතේ පාර්ලිමේන්තුව කැඳවීම ගැන සභා ගර්භයේදී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව අනෙකුත් පක්ෂ නායකයන්ටද කථා කිරීමට අවස්ථාවක් ලබා දීමට එකඟතාව පළ කරන ලදී.

පාර්ලිමේන්තුවට බැඳුම්කර වාර්තාවේ සහ බරපතළ වංචා විමර්ශන වාර්තාවල පිටපත් ලබා දෙන ලෙස මා විසින් ඒ වන විටත් අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා තිබූ බවද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සඳහන් කරන ලදී. පසු දින පැවැත්වීමට තිබූ පාර්ලිමේන්තු රැස්වීමට ප්‍රථම එකී වාර්තා ලබා ගැනීම අවශ්‍ය බැවින්, එම ඉල්ලීම නැවත වරක් ඉදිරිපත් කරන ලෙස ගරු පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් එතුමාගේ ලේකම්වරයාටද උපදෙස් ලබා දී එකී වාර්තා පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා ජනාධිපති ලේකම්වරයාටද ලිඛිතව දන්වා තිබුණි.

ජනවාරි මස 10වෙනි දින පෙරවරු කාලයේදී අතිගරු ජනාධිපතිතුමන් විසින් නීතිපතිවරයාගේ උපදෙස් මත මහ බැංකුවේ අධිපතිවරයාටත්, අල්ලස් දූෂණ කොමිසමටත් පිටපත් යැවිය යුතු හෙයින් පාර්ලිමේන්තුවට අදාළ පිටපත් ජනවාරි මස 17වෙනි දින ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ජනාධිපති ලේකම්වරයා විසින් ලිඛිතව දන්වා එවා තිබුණි.

එමෙන්ම බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා - PRECIFAC - වාර්තාව සම්පූර්ණ වශයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ද එදිනම අප විසින් ඉල්ලීමක් කර තිබුණි. පාර්ලිමේන්තුවේ රැස්වීම පැවැත්වෙන අතරවාරයේදී ජනාධිපති ලේකම්වරයා විසින් මේ සම්බන්ධයෙන් මා වෙත එවන ලද ලිපිය ද මා විසින් ජනවාරි 10වෙනි දින සභාවට ඉදිරිපත් කරන ලදී.

අතිගරු ජනාධිපතිවරයා විසින් 2018 ජනවාරි මස 17වැනි දින, 2015 පෙබරවාරි මස 01 වෙනි දින සිට 2016 මාර්තු මස 31 වැනි දින දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ කොමිෂන් සභාවේ වාර්තාවේ පිටපත් 26ක් ද, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ අවසන් වාර්තාව සහ ඊට අදාළ වෙන් වෙන් වශයෙන් ගොනු කරන ලද පරීක්ෂණ වාර්තා 34ක් ද ජනාධිපති ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත එවන ලදී.

එකී වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීමට හැකි වන පරිදි ඒවා තිබෙන භාෂාවෙන් වහාම මුද්‍රණය කර ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට රජයේ මුද්‍රණාලයාධිපතිනිය මා විසින් පාර්ලිමේන්තුවට කැඳවා දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

එම වාර්තාවල පිටු ප්‍රමාණය අති විශාල වුවත්, කෙසේ හෝ මහත් පරිශ්‍රමයක් දරා 2018 ජනවාරි මස 23වන දින පාර්ලිමේන්තුවට එවීමට පොරොන්දු වූ පරිදි අද දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට බෙදා දීමට හැකි වන ආකාරයට මුද්‍රණය කර සභාවේ විශේෂ අවසරය පරිදි තිබෙන භාෂාවෙන් පිළිගැන්වීමට කටයුතු යොදා තිබේ.

තවද, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධ අවසාන වාර්තාවට අදාළ පරීක්ෂණ වාර්තා 34ක් පාර්ලිමේන්තුවේ විශේෂ අධීක්ෂණය යටතේ රජයේ මුද්‍රණාලයේදී scan කර එම වාර්තා CD තැටියක අන්තර්ගත කර සියලුම ගරු මන්ත්‍රීවරුන්ට හැකි විගස ලබා දීමට කටයුතු කරමින් පවතින බවද දන්වා සිටිමි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ වාර්තාවේ වෙළුම් තුනක් තිබෙන බවත්, සලකුණු ලේඛන සහ සාක්ෂි පාර්ලිමේන්තුවට භාරදී නොමැති බවත් සඳහන් කරමින් කැෆේ ව්‍යාපාරය විසින් මාගෙන් ලිඛිතව විමසන ලදුව, මාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් මේ පිළිබඳව ලිඛිතව විමසන ලදී.

ඊට පිළිතුරු වශයෙන් එකී වාර්තාවට වෙළුම් නොමැති බවත්, සලකුණු කළ වාර්තා සහ සාක්ෂි පාර්ලිමේන්තුවට එවන ලද වාර්තාවේ අන්තර්ගත කර තිබෙන බවත්, ජනාධිපති ලේකම්වරයා විසින් කැෆේ සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයාට ලිඛිතව දන්වා එවා තිබෙන බවත් මෙම ගරු සභාවට දන්වා සිටිමි. කරුණු මෙසේ හෙයින් මෙම වාර්තා සම්බන්ධයෙන් සාවද්‍ය මත සමාජගත කිරීම සුදුසු නොවන බවද අවසාන වශයෙන් දන්වා සිටිමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVIII කොටස;

2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV කොටස සහ තුන්වැනි කාණ්ඩයේ VIII කොටස;

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXII කොටස, තුන්වැනි කාණ්ඩයේ VIII කොටස සහ නවවැනි කාණ්ඩයේ VI කොටස; සහ

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ V, VI, VII, VIII, IX හා X කොටස් සහ තෙවැනි කාණ්ඩයේ III, IV කොටස් සහ නවවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම,

(i) 2016 වර්ෂය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් හා දූෂණ පිළිබඳ වාර්ෂික වාර්තාව; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මාධ්‍ය උපමාන ඉදිරිපත් කරමි.

එම වාර්තාව සහ මාධ්‍ය උපමාන නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තාව, නියෝග සහ පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂයේ තුන්වැනි කාර්තුව දක්වා මූල්‍ය කාර්ය සාධන වාර්තාව;

(ii) 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 6(2) වගන්තිය යටතේ ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති 2044/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2017.11.01 සිට 2017.12.29 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.

එම වාර්තාව, නියෝග සහ පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 සහ 2015 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2015 පෙබරවාරි 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා වූ කාලසීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව ඉංග්‍රීසි භාෂාවෙන්; සහ

බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන්. - [උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් නියමයන් ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ සවුත් ඒෂියන් ඉන්ස්ටිට්යුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් ආයතනයට පෙව පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සහ කලම්බු ඉන්ටර්නැෂනල් නෝට්කල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට සිල්ලර අළෙවිකරණ හා සන්නාමකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව හා සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන්; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) (ආ) වගන්තිය යටතේ සවුත් ඒෂියන් ඉන්ස්ටිට්යුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (SAITM) (ප්‍රයිවට්) ආයතනයට අදාළව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 සැප්තැම්බර් 26 දිනැති අංක 1829/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2011 අගෝස්තු 30 දිනැති අංක 1721/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය සංශෝධනය කරමින් 2017 දෙසැම්බර් 12 දිනැති අංක 2049/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්,

(i) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වගන්තිය යටතේ 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 04 දිනැති 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සහ නියෝග ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (මිල ඉහළ සීමා) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012, 2013, 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

එම නියෝගය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) මීරිගම, අඩවි වන කාර්යාලයේ සේවය කරන එම්. ඒ. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වැ උඩ, යටිවිල්ල, බෝගහ සෙවණ යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ. සෝමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මීරිගම, විජය රජදහන, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එස්.එන්. මහවෙලගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දහසය මම පිළිගන්වමි.

(1) කුරුවිට, මිල්ලවිටිය, කොළඹ පාර යන ලිපිනයෙහි පදිංචි ඒ.කේ. ඩබ්ලිව්. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අනුරාධපුර, රත්මල්ගහවැව, නෙලුගොල්ලාකඩ යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. පස්මියා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) මැදවච්චිය, උසාවිය පාර, නිවස අංක 3/10 දරන ස්ථානයෙහි පදිංචි ඩී. කේ. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) කෝට්ටේ, මාදිවෙල, සිගේරා පාර, අංක 245/3/ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. සේනාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කැකුණගොල්ල, නිතුල්ලගහපිටිය යන ලිපිනයෙහි පදිංචි ඉබුරා ලෙබ්බේ ආදම්පුල්ලේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) අගලවත්ත, බදුරලිය පාර, අංක 53 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) පිළියන්දල, මාම්පේ, පී.එස්. පෙරේරා මාවත, අංක 107 දරන ස්ථානයේ පදිංචි එල්. පී. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) නාත්තන්ඩිය, මාරවිල පාර, හෙට්ටිවත්ත යන ලිපිනයේ පදිංචි එම්.ජේ. මැන්දිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) මහනුවර, කුළුගම්මන, මාලගම්මන, අංක 1/29 දරන ස්ථානයේ පදිංචි එම්.පී.කේ. මාලගම්මන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) බොරලැස්ගමුව, පරෝපාකාර මාවත, රන්කෙත පෙදෙස, අංක 1/30 දරන ස්ථානයේ පදිංචි එම්.පී. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(11) මහ ඇලගමුව, හොරොපොළ ලිපිනයේ පදිංචි මුහම්මදු ඉක්මායිල් නබ්සා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(12) මහරගම, පිළියන්දල පාර, අංක 193/5 දරන ස්ථානයේ පදිංචි එන්.ඩී. හේරත් මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(13) ගම්පහ, නාරංවල, අංක 44/7 දරන ස්ථානයේ පදිංචි එන්.ඩබ්ලිව්.ඒ.ආර්.ඩබ්ලිව්. නානායක්කාර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(14) මතුගම, ඕවිට්ගල, අංක 582 දරන ස්ථානයේ පදිංචි පී.කේ. ප්‍රේමදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(15) මීගහතැන්න, මොරගල, පන්සල ඉදිරිපිට පදිංචි පී.එල්. උපුල් චන්දන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(16) කෙසෙල්වත්ත, ගොරකාන, ගල්කණුව පාර, අංක 126/5 දරන ස්ථානයේ පදිංචි ප්‍රේමසිරි සුවාරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු කථානායකතුමනි, මාවනැල්ල, දෙහිමඩුව, කන්දේහේන, අංක සී/111/6 දරන ස්ථානයේ පදිංචි ඒ.ඒ.ආර්. දමයන්ති අමරසිංහ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

ගරු කථානායකතුමනි, කඩවත, ගෝනහේන යන ලිපිනයේ පදිංචි ඩී.එන්.ආර්. නන්දසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, ගාල්ල, ඉහළකිඹිය, පහළවත්ත යන ලිපිනයේ පදිංචි ටී.වී. රොහාන් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-1187/'16 -(2), ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2-1330/'16 -(2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3-1404/'16 -(2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසන්නේ හීලෑ අලි ගැනද, වල් අලි ගැනද?

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. 1977 සිට විස්තර ඉල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] ඡන්දය නිසා නොවෙයි. පිළිතුර ලබා දීමට සති දෙකක කාලයක් ලබා දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 1977 සිට වාර්තා ඉල්ලා තිබෙනවා. වල් අලි සහ හීලෑ අලි සියල්ලෝම පිළිබඳව මෙම වාර්තාව ලබා දෙන එක ලෙහෙසි නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු ඇමතිතුමනි. ගරු මන්ත්‍රීතුමනි, පිළිතුර ලබා දීමට අපි සති දෙකක කාලයක් ලබා දෙමු.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4-1473/'16 -(2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5-1497/'16 -(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6-1504/'17 -(2), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7-1508/'17 -(2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

වැසීයාමේ තර්ජනයට ලක්ව ඇති ග්‍රාමීය පාසල් : විස්තර
மூடப்படும் அச்சுறுத்தலுக்குள்ளாகியுள்ள கிராமப் பாடசாலைகள்: விபரம்
RURAL SCHOOLS FACING THREAT OF CLOSURE: DETAILS

1625/'17

8. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ජනප්‍රිය පාසල් සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීමට උත්සාහ කිරීම මඟින් ග්‍රාමීය පාසල් විශාල ප්‍රමාණයක් වැසීයාමේ තර්ජනයට ලක් වී ඇති බව පිළිගන්නේද;

(ii) ශිෂ්‍යයන් 50ට අඩුවෙන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ, ගොඩකවෙල කොට්ඨාසය තුළ පිහිටි කෝම්පිටිය විද්‍යාලය දැනට වසා දමා ඇති බව දන්නේද;

(ii) මෙම පාසල වසා දැමීම පිළිබඳව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ අදාළ ආයතන දැනුවත් කර නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, තම අභිමතය පරිදි පාසල වසා දමා එහි තිබූ භාණ්ඩ ද හිතුමතේ බෙදා දීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයා ඇතුළු කොට්ඨාස සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයන් වගකිව යුතු බව පිළිගන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්සරෙක් කේට්ට වින්නා:

(அ) (i) இலங்கைப் பாடசாலை முறைமையினுள் பிரசித்தி பெற்ற பாடசாலைகளுக்குப் பிள்ளை களைச் சேர்க்க முயற்சிப்பதன்மூலம் அதிக அளவிலான கிராமப் பாடசாலைகள் மூடப்படும் அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ளதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஐம்பது மாணவ, மாணவிகளுக்குக் குறைவாக வுள்ள பாடசாலைகளின் எண்ணிக்கை யாதென் பதையும்;

[ගරු හේෂාන් විතානගේ මහතා]

(iii) மேலே (ii) இல் குறிப்பிட்டுள்ள எண்ணிக்கை, மாவட்ட வாரியாகத் தனித்தனியாக எவ்வள வென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இரத்தினபுரி மாவட்டத்தின், எம்பிலிப்பிட்டிய கல்வி வலையத்தில் கொடகவெல கோட்டத்தில் அமைந்துள்ள கோம்பிட்டி வித்தியாலயம் தற்போது மூடப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பாடசாலை மூடப்படுதல் தொடர்பாக மாகாண கல்வித் திணைக்களம் அல்லது தொடர்புடைய நிறுவனங்கள் விழிப்புணர் வூட்டப்படவில்லை என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், தன்னிச்சைப்படி பாடசாலையை மூடிவிட்டு அதிலிருந்த பொருட்களையும் தான்தோன்றித்தனமாகப் பகிர்ந்தளித்தமை தொடர்பாகப் பாடசாலை அதிபர் உட்பட கோட்ட மற்றும் வலயக் கல்விப் பணிப்பாளர்கள் பொறுப்புக்கூற வேண்டுமென்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iv) இது தொடர்பாக எடுக்கப்படும் எதிர்கால நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) a large number of rural schools have faced the threat of closure as a result of the efforts taken to admit students to the popular schools within the school system in Sri Lanka;

(ii) the number of schools that have less than 50 students; and

(iii) the number mentioned in (ii) above in respect of each district separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that the Kompitiya Vidyalaya in Godakawela Zone in Ambilipitiya Education Zone in the District of Rathnapura has been closed by now;

(ii) the Provincial Education Department or other relevant institutions have not been informed of the closure of this school;

(iii) if so, whether he admits that the principal, the Zonal and Divisional Directors of Education are responsible for the closure of the school and distribution of the goods that belong to the school at their discretion;

(iv) the steps that will be taken in this regard?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)

(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

ජනප්‍රිය පාසල් සඳහා වන ඉල්ලුම එක් හේතුවක් වන අතර, තවත් ආනුෂංගික කරුණු බොහෝමයක් ග්‍රාමීය පාසල් වැසී යෑමට හේතු වී ඇත.

ඒ අනුව,

- ග්‍රාමීය පාසල්වල පවතින විශේෂඥතාවෙන් යුත් ගුරු හිඟය
- භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම
- ග්‍රාමීය ප්‍රදේශවල සිට නගරයට යා හැකි පරිදි පරිවහන රටාව දියුණු වීම

යන කරුණු ද මේ සඳහා හේතු වී ඇත.

(ii) 1,455කි.

(iii)

	දිස්ත්‍රික්කය	පාසල් සංඛ්‍යාව
1	කොළඹ	15
2	ගම්පහ	19
3	කළුතර	41
4	මහනුවර	93
5	මාතලේ	63
6	නුවරඑළිය	75
7	ගාල්ල	46
8	හම්බන්තොට	31
9	මාතර	56
10	යාපනය	84
11	කිලිනොච්චිය	16
12	මන්නාරම	45
13	මුලතිව්	28
14	වව්නියාව	68
15	අම්පාර	48
16	මඩකලපුව	54
17	ත්‍රිකුණාමලය	36
18	කුරුණෑගල	112
19	පුත්තලම	19
20	අනුරාධපුරය	96
21	පොළොන්නරුව	22
22	බදුල්ල	108
23	මොණරාගල	45
24	කෑගල්ල	119
25	රත්නපුර	116

(ආ) (i) මෙම පාසල වසා දමා නැත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසලේ සිසුන් නොමැති වීම මත අක්‍රිය තත්ත්වයේ පවතී.

(ii) මෙම පාසල වසා දමා නැත. පාසලේ අවසානයට සිටි සිසුන් 04දෙනා (2015.01.30 දිනට) දෙමාපියන් විසින් පාසලින් ඉවත් කර ගැනීම මත එදින සිට සිසුන් නොමැති වීම මත පාසල අක්‍රිය වී ඇත. ඉන් අනතුරුව අවසන් වරට සිටි ගුරුවරිය ද ආසන්න පාසලක් වෙත ස්ථාන මාරු කර ඇති අතර, පාසලේ පැවැති බඩු බාහිරාදියෙහි වගකීම විදුහල්පති වෙත ඇති නිසා, නිසි පරිදි ඒවා වෙනත් පාසලක් වෙත භාර දීමෙන් පසුව විදුහල්පතිවරයා ද 2016.04.22 දින වෙනත් පාසලක් වෙත ස්ථාන මාරු කර යවා ඇත.

* අවසන් වසර 05 තුළ සිටි සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වර්ෂය	සිසුන් සංඛ්‍යාව					එකතුව
	1 ශ්‍රේණිය	2 ශ්‍රේණිය	3 ශ්‍රේණිය	4 ශ්‍රේණිය	5 ශ්‍රේණිය	
2011	1	1	0	0	0	2
2012	3	1	1	0	0	5
2013	0	3	1	1	0	5
2014	0	0	3	1	1	5
2015/01/30 දින වන විට	0	0	0	3	1	4

(iii) නැත.

සිසුන් නොමැති වීම නිසා අක්‍රිය තත්ත්වයේ තිබූ පාසලේ පැවති බඩු බාහිරාදිය වෙනත් පාසලක් වෙත විධිමත්ව භාර දෙන තෙක් වසරකට ආසන්න කාලයක් පාසලේ විදුහල්පතිවරයා ස්ථාන මාරු කර නොමැත. ප්‍රායෝගිකව අක්‍රිය පාසලක නිලධාරියකු දිගින් දිගටම රාජකාරියේ යෙදවීම නුසුදුසු බැවින් බඩු බාහිරාදිය සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව විදුහල්පතිවරයා ස්ථාන මාරු කර ඇත.

(iv) ඔව්.

මෙම පාසල වසා දැමීමක් සිදුකර නොමැත. ප්‍රදේශයේ පවත්නා දුෂ්කරතාවය නිසා මෙම පාසලට ළමුන් ඇතුළත් වීම ක්‍රමයෙන් නතර වී ඇත. අවසානයට සිටි සිසුන් දෙමාපියන් විසින් පාසලින් ඉවත් කර ගැනීම නිසා පාසල අක්‍රිය වී ඇති අතර, නැවත සිසුන් ඇතුළත් කිරීමට ඉල්ලීමක් ඇති වුවහොත් අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දී මෙම පාසල නැවත සක්‍රීය කිරීමට හැකියාව පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමා, ඇත්ත වශයෙන්ම 2015දී තමයි මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ. හැබැයි, දැන් අපි අනුගමනය කරන ක්‍රියාමාර්ගය වන, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පළමුවන වසරට ළමුන් ඇතුළත් කිරීමේදී 40 ප්‍රමාණය දැන් 35 දක්වා අඩු වෙමින් යනවා. ඒ වාගේම අලුතින් පන්ති ඇති කරන්න දෙන්නේ නැහැ, ව්‍යූහ කමිටුවේ අනුමැතිය නැතිව. ඒ නිසා දැන් තත්ත්වය වෙනස් වේගෙනයි යන්නේ. පාසල් 10,000න් පාසල් 9,000කට පහසුකම් දීලා තිබෙනවා. මොකද, හැම පාසලකම තත්ත්වය ඉහළට ගෙනෙන්න ඕනෑ නිසා. ඒ නිසා මේ තත්ත්වය දැන් වෙනස් වෙමින් යන්නේ. පරණ ආපු දේවල් ටික තමයි තවම මේ විධියට ක්‍රියාත්මක වන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න අහනවාද?

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා එක අතුරු ප්‍රශ්නයක් අහනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මෙම පාසල වසා දමා ඒ ගොඩනැඟිලි තුළ කොහු මෝලක් පවත්වාගෙන යන්න විදුහල්පතිවරයා අවසර දුන්නා කියා දැනගන්න ලැබී තිබෙනවා. එවැනි තත්ත්වයක් පිළිබඳව ඔබතුමා දන්නවාද? එහෙම අවසර දීමක් කරලා තිබෙනවා නම්, විදුහල්පතිවරයා සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද කියා දැනගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, කෙසේවත් එහෙම වෙන්න බැහැ. මොකද, පළාත් පාසල්වලත් ඉඩම් අයිතිය තිබෙන්නේ රේඛීය අමාත්‍යාංශයට. අපි එවැනි කිසිම අනුමැතියක් සඳහා යොමු වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව අතුරු ප්‍රශ්න තිබෙනවාද? දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
විදුහල්පතිවරයා ලිපියක් නිකුත් කරලා තිබෙනවා කියන කාරණය ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, විදුහල්පතිවරයාට එහෙම ලිපි නිකුත් කරලා පෞද්ගලික ආයතනයකට පාසල දෙන්න පුළුවන්කමක් නැහැ.

ඕනෑ නම් මට ඒ ගැන තවදුරටත් වාර්තාවක් කැඳවන්න පුළුවන්. කිසිම පාසලක් එහෙම දීමේ ක්‍රමවේදයක් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9-1631/'17-(2), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10-1728/'17-(1), ගරු බිමල් රත්නායක මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11-1744/'17-(1), ගරු විජිත හේරත් මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12-1752/'17-(1), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු ලකී ජයවර්ධන මහතා
(මාණ්පුමිකු ලක්කි ජූයවර්තන)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13-1778/'17-(1), ගරු අශෝක ප්‍රියන්ත මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14-1811/'17-(1), ගරු කනක හේරත් මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1-1187/'16-(2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4-1743/'16-(2), ගරු චමින්ද විජේසිරි මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්නය අහනවාද, ආණ්ඩු පක්ෂයෙන්? අහන්නේ නැහැ.

ප්‍රශ්න අංක 6-1504/'17-(2), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-1508/'17-(2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය : ආසියානු සංවර්ධන බැංකු ණය/ප්‍රදාන
புதுப்பிக்கத்தக்க சக்தியின் மேம்பாடு : ஆசிய அபிவிருத்தி வங்கியிடமிருந்தான கொடை/கடன்
PROMOTION OF RENEWABLE ENERGY: GRANTS/LOANS FROM ASIAN DEVELOPMENT BANK

9. ගරු ලකී ජයවර්ධන මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)
(මාණ්පුමිකු ලක්කි ජූයවර්තන - මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම සාර්පාක)
(The Hon. Lucky Jayawardana on behalf of the Hon. Ajith Mannapperuma)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මෙතෙක් ලැබී

ඇති සම්පූර්ණ ප්‍රදානයන් සහ ණය ප්‍රමාණයන් කොපමණද;

(ii) එම එක් එක් ණය/ප්‍රදාන ලැබුණු වර්ෂය සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය/ප්‍රදාන මඟින් පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා ලබාදී ඇති දායකත්වය පිළිබඳ සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මින්වලු මඳුම් හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා විසින් පිළිතුරු දෙනු ලැබේ.

(අ) (i) පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මෙතෙක් ලැබී ඇති,

සම්පූර්ණ ණය ප්‍රමාණය - ඇමෙරිකානු ඩොලර් මිලියන 394.1කි.

(ii) එම එක් එක් ණය/ප්‍රදාන ලැබුණු වර්ෂය සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 1හි* සඳහන් කර ඇත.

(iii) එම එක් එක් ණය/ප්‍රදාන මඟින් පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා ලබාදී ඇති දායකත්වය පිළිබඳ සෑහීමකට පත්වන අතර, එම එක් එක් ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ විස්තර ඇමුණුම 2හි* දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 1728/'17 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්ඩලික නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික ගයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 1744/'17 - (1), ගරු විජිත හේරත් මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්ඩලික නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු විජිත හේරත් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික ගයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මත්‍රොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 1778/'17 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** නූනිලෙයත්තිල් වෙක්කප්පට්ටුള්ළතු.*
** Placed in the Library.*

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු: විස්තර
தமிழ் மொழிமூல ஆசிரியர் வெற்றிடங்கள்: விபரம்
TAMIL MEDIUM TEACHER VACANCIES: DETAILS

1811/'17

14. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல குணவர்தன -மாண்புமிகு கனக ஹேரத் சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Kanaka Herath)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) දෙමළ මාධ්‍ය පාසල්වල උගන්වනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට පාසල්වල පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උසස් පෙළ) සමත් පුද්ගලයන්ට පුහුණුවක් ලබා දී දෙමළ මාධ්‍ය ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට ක්‍රියා නොකරන්නේ මන්ද;

(ii) දැනට ශ්‍රී ලංකාවේ පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විදෙස් රටවල්වලින් ගුරුවරුන් ගෙන්වීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එමඟින් දෙමළ මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලැබූ පුරවැසියන්ට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(அ) (i) இலங்கையில் தமிழ் மொழி மூலம் கல்வி கற்கும் மாணவர்களின் எண்ணிக்கை யாது? என்பதையும்;

(ii) தமிழ் மொழி மூலப் பாடசாலைகளில் கற்பிக்கும் ஆசிரியர்களின் எண்ணிக்கை யாது? என்பதையும்;

(iii) இன்றளவில் பாடசாலைகளில் காணப்படும் தமிழ் மொழிமூல ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) தமிழ் மொழி மூலம் க.பொ.த (உயர் தரம்) சித்தியடைந்தவர்களுக்குப் பயிற்சியை வழங்கி தமிழ் மொழிமூல ஆசிரியர்களாக ஆட்சேர்ப்புச் செய்ய நடவடிக்கை எடுக்காதிருப்பது ஏன்? என்பதையும்:

(ii) இன்றளவில் இலங்கையிலுள்ள தமிழ் மொழி மூலப் பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு வெளிநாடுகளி லிருந்து ஆசிரியர்களை அழைத்துவரத் திட்டமிடப்பட்டுள்ளதா? என்பதையும்;

(iii) ஆமெனின், அதனூடாகத் தமிழ் மொழிமூலம் உயர் கல்வி கற்ற பிரசைகளுக்கு அநீதி ஏற்படும் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of students studying in the Tamil medium schools in Sri Lanka;

(ii) the number of teachers teaching at Tamil medium schools; and

(iii) the number of vacancies for Tamil medium teachers presently existing at schools?

(b) Will he also inform this House -

(i) as to why action is not taken to give a training to those who have passed the G.C.E. (A/L) Examination in the Tamil medium and recruit them as Tamil medium teachers;

(ii) whether it has been planned to bring teachers from foreign countries in order to fill the vacancies currently existing in Sri Lanka for Tamil medium teachers; and

(iii) if so, whether he would admit that such action causes a great injustice for those who have completed higher studies in the Tamil medium?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1,044,806කි. (දසලක්ෂ හතළිස්හතරදහස් අටසිය හයකි.)

(ii) 65,024කි. (හැටපන්දහස් විසිහතරකි.)

(iii) 11,424කි. (එකොළොස්දහස් හාරසිය විසිහතරකි.)

(ආ) (i) 2017.07.12 දිනට වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල් සඳහා ගුරු සහායක පත්වීම් 2,804ක් ලබා දී ඇත.

කවද, ජාතික හා පළාත් පාසල්වල පවතින පුරප්පාඩු සඳහා අ.පො.ස. (උසස් පෙළ) සමතුන් ශ්‍රී.ලං.ගු.සේ. 3 - 11 ශ්‍රේණියට හා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී.ලං.ගු.සේ. 3 - 11 ඇ ශ්‍රේණියට බඳවා ගැනීමට නියමිතය.

ඒ අනුව දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උසස් පෙළ) සමත් පුද්ගලයන්ට ද ගුරු පත්වීම් ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23 (2) යටතේ පෞද්ගලික දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය.

ගරු අනුර කුමාර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මේ ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

මෙයට පිළිතුරු ලබා දෙන්නේ කවුද දන්නේ නැහැ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්නය විමසා තිබෙන්නේ කුමන අමාත්‍යවරයාගෙන්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමාගෙන් විමසා තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද පිළිතුරු දෙන්නේ නැහැ. යථා කාලයේදී පිළිතුරු දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා මෙම ප්‍රශ්නයට පිළිතුර හෙටවත් දෙනවා නම් මා සතුටු වනවා. ඒ මොකද දන්නවාද? මෙහි ඇති එක කරුණක් මට අතිශයින් වැදගත්. දැන්මම පිළිතුරක් නැත්නම්-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, ඒ මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ETIF ආයතනය පිළිබඳව. හෙටවත් පිළිතුරක් ලබා දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. නැත්නම් වැඩක් නැහැ. ගරු කථානායකතුමනි, අශ්වයා පැන ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, හෙට පිළිතුරු ලබා දෙන්න පුළුවන් වෙයිද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අමාත්‍යාංශය මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමාගේ. මහ බැංකුවට සම්බන්ධයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Does it come under the Ministry of National Policies and Economic Affairs?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මහ බැංකුවට - Central Bank - සම්බන්ධයි.

ගරු සභානායකතුමනි, මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. ඊට පස්සේ අපි කථා කරමු. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවාට අපි උත්තර දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බැඳුම්කරය ගැන නොවෙයි. ඒක වෙනම සාකච්ඡා කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපිත් දැන් ඒ ගැන අහගෙන ඉඳලා ඉගෙනගෙන තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ කාරණයට යමු. ගරු සභානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධ තත්ත්වය මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙතුමා කියනවා ඉදිරිපත් කරන්නේ මහ බැංකුව සම්බන්ධ ප්‍රශ්නයක් කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, මේ ප්‍රශ්නය මහ බැංකුවට සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කිව්වේ, Central Bank එක ගැන අපටත් දැන් හොඳට පළපුරුද්ද තිබෙනවා කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, හෙට පිළිතුරක් ලබා දෙන්න ඔබතුමාට පුළුවන් වෙයිද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will -

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මූල්‍ය ආයතන මුහුණ දී තිබෙන අර්බුදය
நிதி நிறுவனங்கள் எதிர்நோக்கும் நெருக்கடி
CRISIS FACED BY FINANCE COMPANIES

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ලංකාවේ මූල්‍ය ආයතනවල පවතින අර්බුදය පිළිබඳව ජනතාව තුළ මතුව ඇති ගැටලු පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ලංකාවේ මෑත කාලීනව මූල්‍ය ආයතනවල බිඳ වැටීම් ගණනාවක් සිදුවෙමින් පවතිනවා. මේ තත්ත්වය හේතුවෙන් මේ ආයතනවල මුදල් තැන්පත් කළ විශාල පිරිසක් අසරණභාවයට පත් වී ඇති අතර, තවත් විශාල පිරිසක් තමන්ගේ මුදල්වලට කුමක් සිදුවේද යන්න පිළිබඳව බරපතළ අවිනිශ්චිතභාවයකින් පසුවෙනවා. විශේෂයෙන් මෙම මූල්‍ය ආයතන මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පැවැති ඒවා වුවද, ඒවා බිඳ වැටීම නතර වී නැහැ.

මහ බැංකුව යටතේ තමයි එම ආයතන තිබෙන්නේ. මම හිතන විධියට පසු ගිය කාලයේ මහ බැංකුවට වෙනත් රාජකාරි ගොඩක් තිබුණු නිසා වෙන්න ඇති, මේවා ගැන අවධානය යොමු කරලා නැත්තේ.

2002 වසරේදී ප්‍රමුඛ ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකුව කඩා වැටීම මෑත කාලීනව මෙවැනි ප්‍රධාන ආයතනවල බිඳ වැටීමේ ආරම්භය සටහන් කළා. 2008 වසරේ 'සක්විති' පන්නයේ කූට මූල්‍ය ජාවාරම් බිඳ වැටීමෙන් අනතුරුව 2009 වසරේදී ගෝල්ඩන් කී ආයතනයෙන් ආරම්භ වී රුපියල් බිලියන 25ට වැඩි තැන්පතු තිබූ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයද බිඳ වැටුණා.

සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැටෙද්දී ඊට අයත් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි මූල්‍ය සමාගම ද අක්‍රිය තත්ත්වයට පත් වුණා. ඒ හේතුවෙන් මෙම සමාගමේ තැන්පත්කරුවන්ගේ තැන්පතු මුදල් ලබා ගැනීමට නොහැකි වී විශාල අසාධාරණයක් සිදු වුණා. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ කළමනාකරණ කටයුතු පළමුව මර්චන්ට් බැංකුව වෙතටත්, අනතුරුව යුනියන් බැංකුව වෙතටත් පවරනු ලැබුවා. යුනියන් බැංකුව විසින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ අයිතිය පවරා ගන්නා ලද අතර, යුනියන් බැංකුවේ අනුබද්ධිත සමාගමක් ලෙස යූ.බී. ෆිනෑන්ස් කොම්පැනි ලිමිටඩ් යනුවෙන් සමාගමක් ස්ථාපිත කළා. මහ බැංකුවේ උපදෙස් අනුව එම නව සමාගමේ කොටස් කලින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ තැන්පත්කරුවන්ට ලබා දෙන බවට යූඅබී ෆිනෑන්ස් සමාගම පොරොන්දු වුණා. එහෙත් මේ වන විට වසර පහක කාලයක් ගත වුණද, එම ආයතනය මහ බැංකුවේ උපදෙස් අනුව කටයුතු කිරීමට අසමත්ව තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම තැන්පත්කරුවන් හැත්තෑ දෙදෙනෙකුට ආසන්න පිරිසක්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒවා මේ ප්‍රශ්නයේ ලියැවිලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා තමයි ඔබතුමා අමතා මම ඒ ගැන කියන්න හැදුවේ. හැත්තෑ දෙනෙක් පමණ මිය ගිහිල්ලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

1. අදාළ තැන්පත්කරුවන්ට මේ වන විට වසර 10ක් පුරා තැන්පතු මුදල් හෝ පොලී මුදල් නොලැබුණු බව දන්නේද? දැන් වසර දහයක් ගත වෙලා තිබෙනවා. තැන්පතු මුදලුත් නැහැ, පොලී මුදලුත් නැහැ.

2. ඔවුන්ගේ තැන්පතු මුදල් සහ පොලී මුදල් ගෙවීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද? ඒ සඳහා වන කාල රාමුව කවරේද?

2013 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස පැවැති සීඅයිඑෆ්එල් - CIFL - බැංකුව වසා දැමීම නිසා එහි 4,000ට වැඩි තැන්පත්කරුවන්ට බරපතළ අර්බුදයකට මුහුණ පෑමට සිදු වුණා. ඔවුන්ට අද වන තෙක් සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ.

1. ප්‍රමාණයෙන් 4,159ක් වන ඒ තැන්පත්කරුවන්ගේ තැන්පතු ගෙවීමට ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග කවරේද?

2. ඒ සඳහා වන කාලරාමුව කුමක්ද?

අලුත්ම තොරතුරුවලට අනුව මෙම ජනවාරි මස මුල් සතියේ ඊටීඅයි ෆිනෑන්ස් - ETIF - සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් - SFSP - සමාගම ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දී ඇති බව පවසමින් මහ බැංකුව විසින් කළමනාකරණය පවරා ගනු ලැබුවා. මෙම සමාගම් දෙකෙහි තැන්පත්කරුවන් 35,300කගේ රුපියල් බිලියන 36ක මුදලක් තැන්පත්ව තිබෙනවා. දැනට මෙම මුදල් ඔවුනට ආපසු ලබා ගත නොහැකි ලෙසට නතර කරනු ලැබ තිබෙනවා. විශාල පිරිසක් තම මුදල්වලට කුමක් සිදුවේද යන්න පිළිබඳව බියකින් සිටින අතරම දැඩි අසරණභාවයකට පත්ව සිටිනවා. මේ අතර ඊටීඅයි ෆිනෑන්ස් ආයතනය යටතේ ඇති ඊඒපී සමාගම් සමූහය විදේශීය සමාගමකට විකුණා දැමීමට යන බවටද තොරතුරු ලැබී තිබෙනවා.

මා විශේෂයෙන්ම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු අගමැතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා. එතුමා අනෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙයි, එම ප්‍රශ්න විසඳන්නේ

කොහොමද කියලා. නමුත්, අඩුම තරමින් මේක වළක්වා ගන්නේ කොහොමද කියන එකවත් ගරු අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවට කිව යුතුව තිබෙනවා.

1. ඊටිඅයි ෆිනෑන්ස් - ETIF - සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් - SFSP - යන සමාගම්වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග කවරේද?

2. ඊඑපී සමාගම් සමූහය රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා සතුව ඇති මාධ්‍ය ජාලය විදේශීය සමාගමකට පැවරීමට යන්නේද? මාධ්‍ය ජාලයක් විදේශීය අයිතියකට පැවරිය හැකිද?

මා දන්නා පරිදි බැහැ. එම නිසා දැන් විදේශීය සමාගමක් වෙත මෙම සමූහ ව්‍යාපාරය පැවරීමට කටයුතු කරන්නේ සියලු කටයුතු උල්ලංඝනය කරමින්. මා දන්නවා, දේශීය සමාගම් විශාල ප්‍රමාණයක් මේ පිළිබඳව කැමැත්ත ප්‍රකාශ කර තිබෙන බව. එසේ තිබියදී ඊඑපී සමාගම් සමූහය රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා සතුව ඇති මාධ්‍ය ජාලය විදේශීය සමාගමකට පැවරීමට යන්නේද? මාධ්‍ය ජාලයක් එසේ විදේශීය අයිතියකට පැවරිය හැකිද කියලාත් මා ගරු අගමැතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

3. මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය වන අර්බුදකාරී තත්ත්වයන් පාලනය කිරීම සඳහා ආණ්ඩුවට ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු කථානායකතුමනි, අගමැතිතුමා අඩුම තරමින් මේ අවසන් ප්‍රශ්නවලටවත් හෙට පාර්ලිමේන්තුවේ දී පිළිතුරු ලබා දෙයි කියලා අවසාන වශයෙන් මා බලාපොරොත්තු වෙනවා. තැන්පත්කරුවන් වෙනුවෙන් මේ සම්බන්ධයෙන් සත්‍ය තත්ත්වය දැන ගන්න අපට අයිතියක් තිබෙනවා. මේ ආයතන ගණනාව පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිචාරය සහ ස්ථාවරය දැන ගැනීම සඳහා අග්‍රාමාත්‍යවරයා හෙට දිනයේ මේ පිළිබඳව පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මෙතුමා ෆිනෑන්ස් කොම්පැනි ගණනාවක් ගැන අසා තිබෙනවා. මා හිතන්නේ නැහැ, අගමැතිතුමාට හෙට මේ ප්‍රශ්න සියල්ලටම උත්තර දෙන්න පුළුවන් වෙයි කියලා. මොකද, සෙලින්කෝ සමාගමේ සිට තවත් ෆිනෑන්ස් කොම්පැනි ගණනාවක් ගැන අසා තිබෙනවා. හැබැයි, ඉතින් මේක අලුත් දෙයක් නොවෙයි. මොකද, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ආයතනය ඒ කාලයේ බංකොලොත් වුණු බව ඔබතුමාට මතක ඇති. කාලයෙන් කාලයට ෆිනෑන්ස් සමාගම් බංකොලොත් වනවා. හැබැයි, හොඳ ඒවාත් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්න පුළුවන් වන්නේ කවදාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු අගමැතිතුමාට මා දැනුම් දෙන්නම්. හැබැයි, හෙට උත්තරයක් දෙන්න බැරි වෙයි. මොකද, finance companies හතරක්-පහක් ගැන අසා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම මුලින් කියපු finance companies දෙකම දීර්ඝ කාලයක් තිස්සේ පවතින, මහ බැංකුවේ විශාල අවධානයක් තිබෙන ඒවා. ඒවා ගැන අද වුණත් උත්තර දෙන්න පුළුවන්. එහෙම නම් මහ බැංකුව මේ ගැන කිසිවක් නොකර ඉන්නට ඕනෑ. හැබැයි ඔවුන් මේ ගැන ක්‍රියා මාර්ග ගනිමින් සිටිනවා නම්, - [බාධා කිරීමක්] මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි. අද තැන්පත්කරුවෙක් ඒ ගැන ඇහුවොත් උත්තර දෙන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ.

දෙවෙනි ප්‍රශ්නය ඊට වඩා වෙනස්. මම මතු කරන ඊඑපී සමූහ ව්‍යාපාරයේ ඊටිඅයි ෆිනෑන්ස් සමාගම පිළිබඳව හරි පැහැදිලිව උත්තර දෙන්නට පුළුවන්, කල් යන්නේ නැහැ. අගමැතිතුමාට මතකයෙන් කියන්නට පුළුවන්, එතුමා මාධ්‍ය පිළිබඳව වැඩි උනන්දුවක් දක්වනවා නම්. අපේ රටේ මාධ්‍ය ජාලයක් විදේශීය සමාගම්වලට පවරන්නට පුළුවන්ද, එසේ පැවරීම සඳහා කටයුතු කරනවාද? ඒ වාගේ ඒවාට උත්තර දෙන්නට අග්‍රාමාත්‍යවරයාට ගෙදර ගිහින් කල්පනා කරන්නට ඕනෑ නැහැ. එය රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට දැනගත යුතු දෙයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මෙතුමාගේ අවසාන ප්‍රශ්නය ස්වර්ණමහල් සහ ඊටිඅයි ෆිනෑන්ස් සමාගම පිළිබඳවයි. ඒක මීලදී ගන්න දැන් සාකච්ඡා යනවා. ඒ බව අපි පුවත් පත්වලින් දැක්කා. There is a foreign investor who is interested in purchasing it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Will the Hon. Prime Minister be able to reply tomorrow or will you give another date?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇත්ත වශයෙන්ම මේ අයට මේක කරගෙන යන්නට බැරි නම් විදේශ ආයෝජකයෙක් හෝ ඇවිල්ලා තැන්පත්කරුවන්ගේ මුදල් ටික දෙනවා නම් හොඳයි. මොකද, මට ලැබුණු ආරංචියේ හැටියට ඊටිඅයිඑෆ් එකට සහ ස්වර්ණමහල් එකට තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවන්න වත්කම් තිබෙනවා. ඒ නිසායි ආයෝජකයෙක් ඇවිල්ලා ඒක ගන්නේ. වත්කම් නැත්නම් ගන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අගමැතිතුමාට එය යොමු කරන්නම්. එතුමා පිළිතුරු දෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ස්වර්ණමහල් ආයතනයේ මුදල් තැන්පත් කළ අය අපිවත් හම්බ වෙන්න එනවා. "අපි මුදල් තැන්පත් කරලා තිබෙනවා, එම මුදල් නැවත ලබා දෙන්න" කියලා කියන්න අපිවත් හම්බ වෙන්න එනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි මේක අගමැතිතුමාට යොමු කරමු. ඔබතුමා අවසාන වශයෙන් කියන්නේ මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිවරයා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්නේ එතුමාට ඇහුණු දේවල් හෝ දැකපු දේවල් නොවෙයි. එතුමා වගකීමෙන් පිළිතුරක් ලබා දෙනවා නම් මම කැමැතියි. මාධ්‍ය ජාලයන්, මාධ්‍ය ආයතනයන් සහිත සමාගමක් විදේශීය සමාගමකට පැවරීම සඳහා ප්‍රතිපාදන තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ ප්‍රශ්නය ගරු අගමැතිතුමාට යොමු කළා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රජයේ වගකීම තමයි තැන්පත්කරුවන්ට මුදල් ටික ලබා දීම. ඒක ගැන ඔබතුමා විරුද්ධ නැහැනේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත
புலமைச் சொத்து (திருத்தம்) சட்டமூலம்
IINTELLECTUAL PROPERTY (AMENDMENT) BILL

"2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 පෙබරවාරි 19වන සඳුදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 பெப்ரவரி 19, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Industry and Commerce; to be read a Second time upon Monday, 19th February, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II

භාර (සංශෝධන) පනත් කෙටුම්පත
நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்
TRUSTS (AMENDMENT) BILL

"(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 පෙබරවාරි මස 19වන සඳුදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சரும் நீதி அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 பெப்ரவரி 19, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Foreign Employment and Justice; to be read a Second time upon Monday, 19th February, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

I

ශ්‍රී නාථ අහස්ථාන ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථාන කාර්ය සාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஸ்ரீ நாத அகஸ்தான சர்வதேச புத்த தியான நிலைய செயலாற்றுகைச் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SRI NATHA AHASTHANA INTERNATIONAL BUDDHIST MEDITATION CENTRE PERFORMANCE SOCIETY (INCORPORATION) BILL

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී නාථ අහස්ථාන ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථාන කාර්ය සාධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයකින් ඉවත් කරන ලදී.

අතහරින ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයකින් ඉවත් කරන ලදී.

අතහරින ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

*වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාස

[ගරු අනුර දිසානායක මහතා]

වාගේම මහ බැංකු අධිපතිවරයාගේ මැදිහත්වීමේ ස්වභාවය සහ එම නිලධාරීන්ගේ ක්‍රියා පටිපාටියේ තිබෙන දුබලතාවන්. ඒ හේතු කොටගෙන විශේෂයෙන්ම සේවක අර්ථ සාධක අරමුදලේ රුපියල් කෝටි 850කට වඩා වැඩි ප්‍රමාණයකට සිදු වූ හානිය පෙන්නුම් කර තිබෙනවා. සේවක අර්ථ සාධක අරමුදල කියන්නේ, අපේ රටේ පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් විශ්‍රාම ගියාට පසුව හෝ සේවයෙන් ඉවත්ව ගියාට පසුව හෝ ඔවුන්ගේ ජීවිතයේ හවිහරණ වෙනුවෙන් තිබෙන මුදලයි. එම අරමුදලේ ඇති මුදල්වලින් තමයි රුපියල් කෝටි 850කට ආසන්න ප්‍රමාණයක් මෙම වංචාකරුවන් විසින් එක් රැස් කරගෙන තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එම නිසා අපේ රටේ වංචා දූෂණවලට මොන තරම් ප්‍රබලයින් සම්බන්ධ වී තිබෙනවාද, ඔවුන්ගේ අතු විහිදී තිබෙන්නේ කුමන ආකාරයටද කියා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ කොමිෂන් සභා වාර්තාවෙන් පෙන්නුම් කරනවා. ගරු කථානායකතුමනි, මේවා තමයි -මං කොල්ලකෑම්- white-collar robbery. ඒ නිසා අපේ රටේ පහළ සිටින මිනිසුන්ගේ මුදල් උඩ සිටින තන්ත්‍රයක් විසින් මොන තරම් ප්‍රමාණයකට අපහරණය කරනවාද කියන එක මෙයින් පෙන්නුම් කරමින් තිබෙනවා.

අපි බොහෝ දුරට වංචා, දූෂණ ගැන කථා කරමින් තිබෙනවා, ප්‍රාදේශීය සභාවෙන් ගමේ පාරක් හදනකොට; එහෙම නැත්නම් කඩයකට පැනලා රුපියල් ලක්ෂයක පමණ මුදලක් මං කොල්ල කනකොට. ඒවා තමයි අපේ රටේ මං කොල්ල ලෙස තිබුණේ. ඒවා තමයි රටේ ජනතාවට හොරකම් ලෙස අර්ථ කථනය වෙලා තිබුණේ. හැබැයි, අපේ රටේ ඉහළ දේශපාලන යන්ත්‍රණය සහ ඉහළ රාජ්‍ය යන්ත්‍රණය අපේ රටේ මහජන මුදල් මොන තරම් ප්‍රමාණයකින් හොරකම් කරනවාද, වංචා කරනවාද, අවභාවිතාවේ යොදවනවාද, ඒ සඳහා තමන් සතුව තිබෙන තනතුරු, තමන් සතුව තිබෙන බලය මොන ආකාරයට උපයෝගී කර ගන්නවාද කියන එක පිළිබඳව සංක්ෂිප්ත අදහසක් පළමුවන වතාවට මෙම බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවෙන් විධිමත් ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ සඳහා නැවත දඬුවම් ලබා දීමට ප්‍රතිපාදන තිබෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවට, අධිකරණයට, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට. අපි දන්නවා, නීතිපති දෙපාර්තමේන්තුවේ හැසිරීම්, පසුගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැසිරීම් පිළිබඳව. ඒ සියල්ල යම් දේශපාලන ආධිපත්‍යයකට නතු වී තිබෙනවා. ඒ නිසා දේශපාලන ආධිපත්‍යයකට යටත්වන ආයතනයන් විසින් එම දේශපාලකයන්ටම දඬුවම් ලබා දේවිය කියන මිථ්‍යාවට අපි යා යුතු නැහැ.

ගරු කථානායකතුමනි, කියමනක් තිබෙනවා, "හොරාගෙ අම්මාගෙන් ජේන අහනවා වගෙයි" කියලා. ඇත්තටම ඒක අපි කවදාවත් අත් දැකීමෙන් දැක්කේ නැහැ. හැබැයි මේ බැඳුම්කර කොමිසම හරහා අද අපට පෙන්නුම් කරමින් තිබෙනවා, හෙළිදරවු වෙමින් තිබෙනවා, හොරාගෙ අම්මාගෙන් ජේන අහන්නේ කවර ආකාරයකින්ද කියන එක පිළිබඳව.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. තවත් උපහැරණයක් තිබෙනවා, "නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ" කියලා. හැබැයි එහෙම උපහැරණයක් තිබුණාට ඒ උපහැරණය මොන ආකාරයේ අත් දැකීමක්ද කියා අපි දැකලා තිබුණේ නැහැ. හැබැයි දැන් නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ කියන එක පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට පක්ෂ නායක රැස්වීමේදී ගරු මන්ත්‍රීතුමාට මේ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, ගරු කථානායකතුමනි. අපි මේකට එකඟ වුණා.

ඊළඟ කාරණය තමයි, ඉදිරිපත් කර තිබෙන අනික් වාර්තාව. ඒ වාර්තාව ගත්තාමත් ගරු කථානායකතුමනි, පසුගිය පාලනය රාජ්‍ය ආයතන තමන්ගේ බලය -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි මේ සම්බන්ධයෙන් විවාදයකට සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මා කිව්වේ, ඒ ගැන හෙට කථා කරමුයි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි විවාදයකට සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන හෙට කථා කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අනික් කාරණය, දැන් මේ වාර්තාව නීතිපතිතුමාටත්, අල්ලස් කොමසාරිස්තුමාටත් යවා තිබෙනවා. වෙන මොනවාද කරන්න කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන අපි හෙට කථා කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නීතිපතිතුමාටයි, අල්ලස් කොමසාරිස්තුමාටයි මේ වාර්තාව යවා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට විනාඩි කිහිපයක් දෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. මේ ගැන හෙට කථා කරමු. ඊයේත් එකඟ වුණේ, මිනිත්තු කිහිපයක් තුළ අදහස්, යෝජනා ඉදිරිපත් කරන්නයි. ඔබතුමාගේ යෝජනාව අවසන් කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමා, රැස්වීමකදී ඉදිරිපත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. රැස්වීමේදී ඉදිරිපත් කරන්න බැහැ. ඔබතුමන්ලා ඉදිරියේ ඉදිරිපත් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. තව මිනිත්තු දෙකක් දෙන්නම්. මිනිත්තු දෙකකින් අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, රැස්වීමේදී මා ඉදිරිපත් කරනවා, අගමැතිවරයා එතැනට වෙලා ඉන්නවා නම්. මා ආසයි, එතුමා ඉදිරියේ රැස්වීමේදී මේ කරුණු ඉදිරිපත් කරන්න. කැබිනට් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා පත් කරපු කණ්ඩායම්, ඒ ගොල්ලන් ආරක්ෂා කරපු කණ්ඩායම් ඉදිරිපිට මේ කරුණු කියන්න ඕනෑ. ඒකයි මේ කරුණු පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ. රැස්වීමකදී කියන්නේ ජනතාව ඉදිරියේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට එකඟත්වයකට එමු, මොනවාද කරන්නේ කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි මේ මංකොල්ලකරුවන්, මේ අපරාධකරුවන් ඉදිරියේ මේ විවාදය කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ වංචා, දූෂණ,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙතුමා කියන දේවල් මේ වාර්තාවේ නැහැ.

මෙතුමා කියන දේවල් මේ වාර්තාවේ නැහැ. මේ ඔක්කොම ගොතන ඒවා. මේ කියන දේවල් මොනවාවත් වාර්තාවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට කථා කරන්න හුඟක් වේලාව ලබා දුන්නා. ඒ නිසා දැන් කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කරුණාකරලා විවාදයකට එන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය සූදානම්. හෙට අපි ඒ ගැන කථා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, සභානායකතුමා ඒ තරම් කලබල වෙන්න ඕනෑ නැහැ. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා කිව්වා, "මේක මහ ජනයා ඉස්සරහ කියන්න" කියලා. මහ ජනයා ඉස්සරහ ගොඩක් දේවල් කියන්න තිබෙනවා. මම කැමැතියි, මේක මේ මංකොල්ලකරුවන් ඉස්සරහම කියන්න. මේ අපරාධකරුවන් ඉස්සරහම මේක හෙළිදරව් කරන්න ඕනෑ. අපරාධකරුවන්ගේ මූණ බලාගෙන මේවා කියන්න ඕනෑ. සමහර අපරාධකරුවන් නැහැ. ඔවුන්ගේ මූණ බලාගෙන මේවා කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, තවත් වාර්තාවක් ඉදිරිපත් වී තිබෙනවා. හිටපු ජනාධිපතිවරයා තමන්ගේ බලය උපයෝගී කරගෙන තිබෙන ආකාරය, මැතිවරණවලට රාජ්‍ය දේපළ උපයෝගී කර ගෙන තිබෙන ආකාරය, ඇවන්ට් ගාර්ඩ් වැනි ගනුදෙනුවලදී රාජ්‍ය මුදල් අවභාවිතාව පිළිබඳ ප්‍රශ්නය, නිවාස අමාත්‍යාංශයේ ඇති වී තිබෙන ගැටලු වැනි සවිස්තරාත්මක ගනුදෙනු ගණනාවක් ඒ වාර්තාවේ තිබෙනවා. රාජ්‍ය මුදල් දේශපාලන අධිකාරීන් විසින් අවභාවිතාවේ යෙදීම, තමන්ගේ වුවමනාවට එක් රැස් කර ගැනීම, තමන්ගේ දේපළ බවට රාජ්‍ය ආයතන පත් කර ගැනීම පිළිබඳව ඉතාම වැදගත් වාර්තා ගණනාවක් ඉදිරිපත් වී තිබෙනවා. ඒ නිසා මේ වාර්තා පෙබරවාරි මාසයේ 10 වැනිදාට පෙර මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් විය යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හෙට මේ පිළිබඳව සාකච්ඡා කරමු. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා, අපි ඊයේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟ වුණේ "මේ ගැන අදහස් ප්‍රකාශ කිරීමක් කරන්නේ නැහැ. පක්ෂ නායකයන්ට විතරක් කථා කරන්න අවස්ථාව දෙනවා"ය කියායි. ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න මම අවස්ථාව ලබා දෙන්නම්. මේ පිළිබඳව දීර්ඝ විවාදයක් කරන්න පුළුවන් වන්නේ ඒ අවස්ථාවේදී විතරයි. පැහැදිලි කිරීමක් සඳහා විතරයි අවස්ථාව ලබා දෙන්න පුළුවන් වෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් දැනගන්න බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මොකද, පසු ගිය කාල පරිච්ඡේදය තුළදී මේ රටේ මහ දවල්, මහ බැංකුවේ ඇති වෙව්ව මහා මුදල් මංකොල්ලය පිළිබඳව වූ මේ වාර්තාවේ තිබෙන පිටු ගණන පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණා. එහිදී සමහර පාර්ශ්වයන් කිව්වා, තමන්ට මේ වාර්තාව ලැබුණා, එම වාර්තාව ලැබීම නිසා ඒ වාර්තාවේ සමහර කරුණු වෙනස් කරලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම මේ පිළිබඳව පැහැදිලි කරන්න ඕනෑ. මේ පිළිබඳව වාදයක් කළ යුතු වෙන්නේ නැහැ. ඉස්සෙල්ලාම ජනාධිපති කාර්යාලයෙන් Central Bank එකටයි, Attorney-Generalටයි මේ වාර්තාව යැව්වා. ඊට පස්සේ ආවේ මෙතැනට. වෙන කිසි කෙනෙකුට දුන්නේ නැහැ කියලා මට ජනාධිපති ලේකම්වරයා කිව්වා. එහෙම කථාවක් කියන එක වැරැදියි. අපි ඒ ගැන රණ්ඩු කරලා වැඩක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔබතුමා ඒ පිළිබඳව මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට සහතිකයක් ලබා දෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මට සහතික ලබා දෙන්න බැහැ. මට ජනාධිපති කාර්යාලයෙන් කියපු දේ තමයි කියන්න පුළුවන් වන්නේ. එහෙම නැතිව මට සහතික ලබා දෙන්න බැහැ. ජනාධිපති කාර්යාලයෙන් කියපු දේ මම විශ්වාස කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒ කියන්නේ එහෙන් ලබා දුන්නු මුළු වාර්තාව ලැබිලා තිබෙනවා?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වාර්තාව මම පිළිගන්නවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මෙහි ඉතා පැහැදිලි ලෙස චූදිතයන් හා ඔවුන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කරුණු දක්වලා තිබෙනවා. එසේ තිබියදී අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව ඉල්ලා සිටිනවා, දඬුවම් ලබා දීමට අවශ්‍ය පුද්ගලයන්ට එම දඬුවම් ලබා දෙන්න අවශ්‍ය ශක්තිය එතුමාට ලබා දෙන්න කියලා. පාර්ලිමේන්තුව -ඒකාබද්ධ විපක්ෂය- වශයෙන් මේ අයට වහාම දඬුවම් දීම සඳහා අවශ්‍ය සම්පූර්ණ ශක්තිය ජනාධිපතිතුමාට ලබා දෙන්න අපි සූදානම් කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ අදාළ පුද්ගලයන් වහාම අත් අඩංගුවට අරගන්න. අපේ ඒකාබද්ධ විපක්ෂයේ පක්ෂ නායකයන්ට කරපු දේවල් දැක්කා නේ. 'අවභාවිතයට අනුබල දීම' කියලා ඇප නැතුව තමයි බන්ධනාගාරගත කළේ. මේ සිද්ධියටත් අදාළ අය වහාම අත් අඩංගුවට ගන්න කියලා අපි කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊට පස්සේ ඔබතුමා කථා කරන්න. දැන්, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, මේ වාර්තාවේ අඩංගු පිටු ගණන ඉතාම නිවැරැදිව තිබෙනවාය කියන එක පිළිබඳව ගරු කථානායකතුමා සහතික වෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මට එක් දෙයක් ගැන සහතික වෙන්න පුළුවන්. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මට ලැබුණු පිටපත ඒ විධියටම බෙදුවා. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මාව දැනුවත් කළා, මේක තමයි එතුමන්ලාටත් ඒ කොමිසමෙන් ලැබුණේ කියලා. ඒ සහතිකය මට දෙන්න පුළුවන්. අනුන්ගේ ඒවාට සහතික දෙන්න අමාරුයි. නමුත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සහතිකයක් දුන්නාම අපි ඒක පිළිගන්න ඕනෑ. මම ඒක පිළිගන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ ගොල්ලන් මේ වාර්තාව පිළිගන්නේ නැත්නම් විවාදයක් දෙන්නේ කොහොමද? මේ වාර්තාව පිළිගන්නේ නැහැ කියලා කියනවා. පිළිගන්නේ නැත්නම් විවාදයක් දෙන්නේ කොහොමද? එක්කෝ මේක පිළිගන්න ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අවස්ථාවක් දුන්නාම -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
This is the stand.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ මොකක්ද? කැමේ සංවිධානය කියනවා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක මගේ කථාවේදීත් පැහැදිලි කළා. ගරු මන්ත්‍රීතුමනි, විවිධ අය කියන්න පුළුවන්. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කියලා තිබෙනවා, ලැබුණු එක තමයි දුන්නේ කියලා. එතැනින් එහාට දෙයක් කියලා වැඩක් නැහැ. වාද කරන්න එපා. ඔබතුමාත් බුද්ධිමත් නීතිඥවරයෙක්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, ඔබතුමා වග කියනවා, පාර්ලිමේන්තුවට. ඒක නිසා ඔබතුමා නිවැරැදිව අංග සම්පූර්ණ වාර්තාවක් සභාගත කළා කියලා අපට විශ්වාස කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ලැබුණු එක මම සභාගත කළා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
නමුත් එහි වෙනසක් වුණොත් වග කීම භාර ගන්නේ කවුද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මම දන්නේ නැහැ. ඒක මට අයිති දෙයක් නොවෙයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
දෙවැනි කාරණය. [බාධා කිරීමක්] මගේ කථාව අවසන් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම වුණොත් ජනාධිපති ලේකම් පාර්ලිමේන්තුවට කැඳවිය යුතුයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් නැහැ. මේ පාර්ලිමේන්තුව රැස් කරන්න මේ වරුවට ලක්ෂ 40ක් විතර වැය කරනවා. මේ ජනතාවගේ මුදල්. ඒක නිසා මේක නැවත නැවත එහාට මෙහාට දාන්නේ නැතුව, මේකේ යම් අඩුවක් තිබෙනවාද කියලා ඔබතුමා අධ්‍යයනය කරලා බලලා අංග සම්පූර්ණ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම සෑහීමකට පත් වෙලා තිබෙනවා. මට ලැබුණු දේ මම ඉදිරිපත් කළා.

Hon. Shritharan, you can go ahead.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, இங்கு வழங்கப்பட்டிருக்கின்ற பிணைமுறிகள் சம்பந்தமான அறிக்கையின் தமிழ் வடிவம் எப்பொழுது இந்தச் சபைக்கு வரும்? இந்த அறிக்கையின் ஆங்கில, சிங்கள வடிவங்கள் இன்று இங்கு வழங்கப்பட்டிருக்கின்றன. நாளைய தினம் இது பற்றிய விவாதம் நடைபெற்றால் இந்த அறிக்கை சம்பந்தமாக எங்களால் எப்படிப் பேசமுடியும்? இது பற்றிய விடயங்களை வெளிக்கொண்டு வருவது எவ்வாறு? பாராளுமன்றத்தில் இந்த அறிக்கையை மூன்று மொழிகளிலும் சம நேரத்தில் ஏன், சமர்ப்பிக்க முடியவில்லை?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Can I reply to that, Hon. Member?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Yes, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Government has started the process of translating the Report by the Department of Official Languages, but at the Party Leaders' Meeting, it was agreed that in the absence of the two copies in Sinhala and Tamil, we would table the Report. As soon as I get those translations from the Presidential Secretariat, I will table them. I fully agree with you that you must have both the Sinhala and the Tamil copies. Those copies will be made available to you as soon as we receive them.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Thank you, Hon. Speaker.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දැන් මම දැන ගන්න කැමැතියි, මේ විවාදය ඉල්ලපු අය මෙම වාර්තාව පිළිගන්නවාද, නැද්ද කියලා. මෙම වාර්තාව පිළිගන්නේ නැත්නම් විවාදයක් දෙන්න බැහැනේ. මේ වාර්තාවේ පිටු අඩුයි කිව්වානේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි හෙට සාකච්ඡා කරමු; we will discuss it tomorrow. දැන් අවසන් කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අසම්පූර්ණ වාර්තාවක් ගැන විවාද කරන්නේ කොහොමද? මේ අය විවාදයක් ඉල්ලනවා. විවාදය දුන්නාම එතුමන්ලා කියනවා වාර්තාවේ පිටු අඩුයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will decide it tomorrow. We do not want to go into arguments now. - [*Interruption.*] All the Party Leaders will be there and we will decide it tomorrow.

දැන් සභාව කල් තැබීම.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා ප්‍රශ්නයක් ඇහුවා, මෙම වාර්තාව පිළිගන්නවාද කියලා. වාර්තා දෙකක් තිබෙනවා. එකක්, පරීක්ෂණ 18ක් පිළිබඳව තිබෙන වාර්තාව. ඒක මුළුමනින්ම සම්පූර්ණයි. ඒක පිළිබඳ විවාදයක් මතු වුණේ නැහැ. අනෙක් වාර්තාව පිළිබඳව විවාදයක් මතු වුණා. සමහර අය ඒ වාර්තාවේ පිටු මෙච්චර නැහැ, මෙච්චර නැහැ කියලා එළියේ කිය කියා ගියා. නමුත්, ගරු කථානායකතුමනි, ඔබතුමා නිශ්චිත වශයෙන් දැනුම් දුන්නා, මේක සම්පූර්ණ වාර්තාවක් කියලා. ඒ විතරක් නොවෙයි. කොමිෂන් සභාව විසින් ජනාධිපති ලේකම්වරයාට ලබා දී තිබෙන වාර්තාව මෙය බව සඳහන් කරමිනුයි ජනාධිපති ලේකම්වරයා ඔබතුමාට මෙම වාර්තාව ලබා දී තිබෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, අපට මේක පිළිගන්න බාධාවක් නැහැ. හැබැයි, කොයි වෙලාවක හෝ වෙනත් කරුණු මත මේ වාර්තාවට අතිරේකව තිබෙන කරුණු හෙළිදරවු වුණොත් ඒකට වග කිව යුත්තේ ඔබතුමා නොවෙයි, ජනාධිපති ලේකම්වරයායි. ඒ වාගේ වෙලාවක පාර්ලිමේන්තුව නොමහ යැවීමේ, පාර්ලිමේන්තුවට සත්‍ය තොරතුරු නො සැපයීමේ වරද මත කරුණු විමසීමට ජනාධිපති ලේකම්වරයා පාර්ලිමේන්තුවට කැඳවිය යුතුයි. එපමණයි අපි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ වාර්තාව මේ සභාවේ පිළිගෙන තිබෙනවා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.


ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 1.56ට, 2018 ජනවාරි මස 24 වන බදාදා අ. භා. 1.00 තෙක් කල් ගියේය.
அதன்படி பி.ப. 1.56 மணிக்கு பாராளுமன்றம், 2018 சனவரி 24, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Parliament adjourned accordingly at 1.56 p.m. until 1.00 p.m. on Wednesday, 24th January, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

258 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 258 - இல. 3
Volume 258 - No. 3

2018 ජනවාරි 24වන බදාදා
2018 சனவரி 24, புதன்கிழமை
Wednesday, 24th January, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික ආණ්ඩුවේ අමාත්‍යවරු සංඛ්‍යාව
කතරගමදී සිදු වූ පොලිස් වෙඩි තැබීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දමිළ මාධ්‍ය තාක්ෂණ නිලධාරින්ගේ හිඟකම:
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

යිවර (විදේශීය යිවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

කල් තැබීමේ යෝජනාව:
"පාලම් දහස වැඩසටහන" යටතේ උතුරු පළාතේ ඉදි කරන ලද පාලම්

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
அரசியலமைப்பின் பிரகாரம், தேசிய அரசாங்க அமைச்சர்களின் எண்ணிக்கை
கதிர்காமத்தில் இடம்பெற்ற பொலிஸ் துப்பாக்கிச் சூட்டுச் சம்பவம்

வளிமண்டலவியல் திணைக்களத்தில் தமிழ்மொழி மூல தொழில்நுட்ப உத்தியோகத்தர்களின் பற்றாக்குறை:
அனர்த்த முகாமைத்துவ அமைச்சரின் கூற்று

கடற்றொழில் (வெளிநாட்டு மீன்பிடி வள்ளங்களை ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
"ஆயிரம் பாலங்கள் திட்டம்" இன்கீழ் வடக்கு மாகாணத்தில் அமைக்கப்படும் பாலங்கள்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Number of Ministers in the National Government as per the Constitution
Police Shooting at Kataragama

SCARCITY OF TAMIL MEDIUM TECHNICAL OFFICERS IN DEPARTMENT OF METEOROLOGY:
Statement by Minister of Disaster Management

FISHERIES (REGULATION OF FOREIGN FISHING BOATS) (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Bridges Constructed under "Thousand Bridges Project" in Northern Province

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජනවාරි 24වන බදාදා
2018 சனவரி 24, புதன்கிழமை
Wednesday, 24th January, 2018

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 ජනවාරි 24 වන බදාදා එනම්, අද දින අපර භාග 2.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XV හා XVI කොටස්;

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV හා XXV කොටස්, පස්වැනි කාණ්ඩයේ I කොටස සහ හයවැනි කාණ්ඩයේ XIII හා XIV කොටස්; සහ

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV හා V කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

[ගරු ජෝන් අමරතුංග මහතා]

එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2015 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යාතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාතුමා වෙනුවෙන් 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ගරු ජයන්ත සමරවීර මහතා - [*සභා ගර්භය තුළ නැත.*]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දහතුන මම පිළිගන්වමි.

(1) තිස්සමහාරාම, ලුකස්ගොඩ, අංක 197 දරන ස්ථානයෙහි පදිංචි ඒ.කේ.පී. මහින්ද මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, නාවිමන දකුණ, හුංගන්ගොඩ, "සමනල පියස" යන ලිපිනයෙහි පදිංචි ආදිත්‍ය බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, කොටුව, බරවා රෝග මර්ධන ඒකකයේ සේවය කරන ඩී.එච්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හක්මණ, දෙනගම, දෙනගම බටහිර, "චතුර" යන ලිපිනයෙහි පදිංචි ජේ.ජී. ගුණපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) ගාල්ල, මාම්පිටිය, ජය මාවත යන ලිපිනයෙහි පදිංචි,කේ.එම්.ජී.ටී.ආර්. වෛද්‍යරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) දික්වැල්ල, සැන්ඩිස් පාර යන ලිපිනයෙහි පදිංචි එම්.එම්.එම්. ඉන්සාෆ් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) ඉබ්බාගමුව, බක්මීගොල්ල, අංක 413/2 දරන ස්ථානයෙහි පදිංචි, පී.ජේ. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) පිටබැද්දර, තැන්නහේන, "ලහිරු" යන ලිපිනයෙහි පදිංචි, පී.වී. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) වැලිගම, සමරවීර පාර, අංක 5/8 දරන ස්ථානයෙහි පදිංචි, පද්මිනී නන්දසිරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(10) පාදුක්ක, වේරගල, ඩේල් එස්ටේට්, අංක 142/7/43ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්.පී. අමරදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(11) දෙණියාය, බටාදුර,අංක 49 දරන ස්ථානයෙහි පදිංචි සරත් වීරවර්ධන දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(12) අකුරැස්ස, මාරඹ,ගල්හේන, පන්සල පාර, යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. වී. දිමුතු සමීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(13) මාතර, දැල්කඩ පාර, අංක 45/1 දරන ස්ථානයෙහි පදිංචි, වයි.බී. මාගුට් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -124/'15- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -465/'16- (9), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, 2016 පෙබරවාරි 02වැනි දින ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය මා අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -1408/'16- (3), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1470/'16- (2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1579/'17- (2), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් : විදුහල්පති පත්වීම්
இரத்தினபுரி மாவட்டப் பாடசாலைகள்: அதிபர் நியமனங்கள்
SCHOOLS IN RATNAPURA DISTRICT: APPOINTMENTS OF PRINCIPALS

1617/'17

6. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම පාසල් අතරින් සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් කවරේද;

(iv) පසුගිය සමයේ දේශපාලනික හිතවත්කම් මත සුදුසුකම් නොමැති වැඩබලන විදුහල්පතිවරුන් විශාල ප්‍රමාණයක් පත්කර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் செயற்படும் தேசிய பாடசாலைகள் மற்றும் மாகாண சபைப் பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாவை;

(ii) இப்பாடசாலைகளில் தகுதிவாய்ந்த அதிபர்கள் இல்லாத பாடசாலைகளின் எண்ணிக்கை யாது;

(iii) அப்பாடசாலைகள் யாவை;

(iv) கடந்த காலத்தில் அரசியல் நட்பின் பேரில் தகைமையற்ற பதில் அதிபர்கள் பெருமளவில் நியமிக்கப்பட்டுள்ளனர் என்பதை ஏற்றுக் கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of National Schools and schools governed by the Provincial Council functioning in Ratnapura District separately;

(ii) out of them, the number of schools that do not have qualified principals;

(iii) what those schools are; and

(iv) whether it is admitted that a large number of unqualified acting principals had been appointed under the political influence during the past regime?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් 14ක්ද, පළාත් සභා පාසල් 587ක්ද ක්‍රියාත්මක වේ.

(ii) 232කි.

ස්ථිර විදුහල්පති තනතුරක් දැරීමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරුලාභීන් සිටිය යුතුය.

රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් 14 සඳහාම සුදුසුකම් ලත් විදුහල්පතිවරුන් පත් කර ඇත.

නමුත් සබරගමුව පළාත සඳහා ප්‍රමාණවත් පරිදි ඉහත සේවා දෙකට අයත් තනතුරුධාරී නිලධාරීන් නොමැති නිසා ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් ජ්‍යෙෂ්ඨ ගුරු භවතුන් වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත් කර ඇත.

ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ කලාප 04ක වැඩබලන විදුහල්පතිවරුන් ලෙස රත්නපුර කලාපයේ 77 දෙනෙක්ද, බලංගොඩ කලාපයේ 42 දෙනෙක්ද, නිවිතිගල කලාපයේ 78 දෙනෙක්ද, ඇඹිලිපිටිය කලාපයේ 35 දෙනෙක්ද පත් කරනු ලැබ ඇත.

ගරු කථානායකතුමනි, මෙම පිළිතුරේ සඳහන් ආකාරයට සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් නැහැයි කියන්නත් බැහැ. අපි 4,000ක් බඳවා ගත්තා. ඒ අය දැන් පුහුණු කිරීම් සංචිතයට දමලායි තිබෙන්නේ. මම තවදුරටත් ඒ ගැන බලන්නම්.

(iii) ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iv) දේශපාලනික හිතවත්කම් මත තනතුරු ප්‍රදානය සිදු කර නොමැත.

ජාතික පාසල් සඳහා සුදුසුකම් නොමැති විදුහල්පතිවරු පත් කර නොමැති අතර, සබරගමුව පළාතේ ජාතික පාසල් 5ක් සඳහා ස්ථිර විදුහල්පතිවරුද, පාසල් 9ක් සඳහා රාජකාරී ආවරණය කිරීමට විදුහල්පති ශ්‍රේණිධාරීන් ද පත් කර ඇත. රාජකාරී ආවරණය කිරීමට පත් කළ විදුහල්පතිවරු විධිමත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව පත් කර ඇත.

නමුත් පළාත් සභා පාසල් සඳහා ප්‍රමාණවත් පරිදි ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නොමැති වීම හේතුවෙන් පාසල්වල පරිපාලන කටයුතු විධිමත්ව කර ගෙන යාම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවෙතින් නම් කළ පාසලේ ජ්‍යෙෂ්ඨතම ගුරු භවතකු, ස්ථිර විදුහල්පතිවරයෙක් පත් කරන තෙක් පාසලේ පරිපාලන කටයුතු සිදු කර ගෙන යාම සඳහා පත් කර ඇත. දීර්ඝ කාලයක් විදුහල්පති සේවයේ හා අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු පුරවා නොතිබීම හේතුවෙන් ඉහත තත්ත්වය උද්ගතව ඇත. ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව විධිමත් පත්වීම් ලබා දීමට කටයුතු කරනු ඇත.

ජාතික පාසල්වලට විදුහල්පතිවරුන් විධිමත්ව පත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යෝජනා කළ "විදුහල්පති සංචිතයක් පිහිටුවා පුරප්පාඩු පවතින ජාතික පාසල්වලට විදුහල්පතිවරුන් පත් කිරීමේ ක්‍රමවේදය" රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කර ඇත.

ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වලද විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා තෝරා ගැනීම් සිදු කිරීමට අදාළ පුවත්පත් නිවේදනය ඉදිරියේදී පුවත්පත්වල පළ කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම පිළිතුරට තව කරුණු ස්වල්පයක් එකතු කරන්න ඕනෑ. සියලුම ජාතික පාසල්වල තිබෙන විදුහල්පති පුරප්පාඩු ගැසට් කරලා, සම්මුඛ පරීක්ෂණයකට අනුව බඳවා ගන්න කියලා මම උපදෙස් දුන්නා. ඒක ඉදිරි කාලයේදී සිදු වෙනවා. දැන් ගැසට් එක යවලා තිබෙන්නේ. මෙම පිළිතුරේ පොඩි අඩු පාඩුවක් තිබෙනවා. මම ඒ ගැන කනගාටු වෙනවා. ඔබතුමා අහනවා වාගේ, පළාත් පාසල්වල මෙපමණ පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙන්න විධියක් නැහැ. ශ්‍රේණිධාරීන් ඉන්නවා. අපි 4,000ක් ගත්තා නේ. මම පසුගිය දවස්වල මේ ගැන check කරලා බැලුවා. පළාත් සභා විසින් මේ ශ්‍රේණිධාරීන් 4,000න් විදුහල්පතිවරුන් ලෙස පත් කරලා තිබුණේ සුළු ප්‍රමාණයයි. අනෙක් පාසල්වල උපගුරුවරු වැඩ බලනවා. "මේක කරන්න එපා, මේක අපරාධයක්" කියලා මම කැබිනට් පත්‍රිකාවකුත් ගෙනාවා. අපි දේශපාලනය කිසිසේත් සම්බන්ධ කර ගන්නේ නැතිව විදුහල්පතිවරු 4,000ක් බඳවා ගත්තා. අධ්‍යාපන පරිපාලන සේවයේ 852ක් ගත්තා. අරගෙන පුහුණු කළා. අධ්‍යාපන පරිපාලන සේවයේ, විවෘත විභාගයේ අයට වසරක පූර්ණ කාලීන පුහුණුවක් ලබා දුන්නා. අනෙක් අයට මාස තුනක පුහුණුවක් ලබා දුන්නා. මේ වන විට ඒ අය පද්ධතියට දමලා තිබෙන්නේ. නමුත් පළාත් සභා විසින් එම ශ්‍රේණිධාරීන්ට විදුහල්පති තනතුරු දෙන්නේ නැතිව උපගුරුවරු වැඩ බලනවා කියන එක කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. සමහර වේලාවට දේශපාලනයත් මෙතැන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇත්ත තත්ත්වය වාර්තා කරන්න ඕනෑ නේ.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. ඇමැතිතුමනි, මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි ගුරු සේවයේ I ශ්‍රේණිය සහ විදුහල්පති සේවයේ III ශ්‍රේණිය අතර තිබෙන වැටුප් විෂමතාව. මේ නිසා විදුහල්පති සේවයට යන්න ගුරුවරු උත්සාහ කරන්නේ නැහැ. අමාත්‍යාංශය විධියට ඔබතුමා මේ වෙනුවෙන් ගොඩක් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ පවතින මේ ප්‍රශ්නයට පිළිතුරක් සෙවීමට කටයුතු කළ යුතුයි නේද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

එම වැටුප් විෂමතාව ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය මේ වන විට ලැබිලා තිබෙනවා.

ඉදිරියේදී එය ක්‍රියාත්මක කරනවා. ඔබතුමා කියපු කාරණය නිවැරැදියි. I ශ්‍රේණියේ ඉන්නා සමහර ගුරුවරුන් විදුහල්පති ශ්‍රේණිධාරීන් විධියට විදුහල්පති ශ්‍රේණියේ IIIට යන්න කැමැති නැහැ. එම ගැටලුව දැන් නිරාකරණය කරලා තිබෙනවා. එම නිසා ඉතා කෙටි කාලයකින් මෙම ප්‍රශ්නය විසඳෙනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ගොඩකවෙල රාහුල ජාතික පාසලට අවුරුදු දෙකක් තිස්සේ හරියාකාරව විදුහල්පතිවරයෙක් ලැබී නැහැ. ඔබතුමා ගැසට් කළත්, හරියාකාරව විදුහල්පතිවරයෙකු තෝරා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒක, මගේ ආසනයේ -ඒ පැත්තේ- තිබෙන ප්‍රධාන පාසල. මේ වෙනුවෙන් ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ජාතික පාසල් සෑහෙන ප්‍රමාණයක විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු තිබෙනවා. දැනට ඒ හැම එකකම ඉන්නා රාජකාරිය ආවරණය කරන අයත්, ශ්‍රේණිධාරීන්. හැබැයි, අපි එක එක විධියට දමන්න ගියාම, සමහර විට එම විදුහල්පතිවරුන්ගෙන් කොටසක් කැමැතියි, කොටසක් අකැමැතියි. ආදි ශිෂ්‍ය සංගම්, අරවා-මේවා ආදියෙන් ප්‍රශ්න තිබෙනවා. ගැටලුව ඒකයි. ඒ නිසාම අපි තීරණය කළා, මේ සියලුම ජාතික පාසල්වල විදුහල්පති පුරප්පාඩු සම්බන්ධයෙන් ගැසට් කරලා -විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ඒ ගොල්ලන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බලා වැඩිම සුදුසුකම තිබෙන කෙනා බැගින් තෝරා- මෙම පත්වීම් ලබා දෙන්න. ඇත්තටම ප්‍රමාද වුණේ ඒකයි. පාසල් කිහිපයකම පුරප්පාඩු තිබෙනවා. අපි ඒවා එකින් එක සම්බන්ධව කටයුතු කරන්නේ නැතුව එකවරම ඒ සියල්ල සම්බන්ධයෙන් කටයුතු කරන නිසා තමයි පොඩ්ඩක් ප්‍රමාද වුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න දෙකකට පමණයි අවස්ථාව දෙන්නේ.
ප්‍රශ්න අංක 7-1638/'17 -(2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ප්‍රශ්න අංක 8-1983/'17 -(2), ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ප්‍රශ්න අංක 9-2108/'17 -(1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ප්‍රශ්න අංක 10-2123/'17 -(1), ගරු ජයන්ත සමරවීර මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ප්‍රශ්න අංක 11-2128/'17 -(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - [*සභා ගර්භය තුළ නැත.*]
ප්‍රශ්න අංක 12-2146/'17 -(1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 13-2281/'17 -(1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 -2455/'17- (1), ගරු තාරක බාලසූරිය මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 15 -2458/'17- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය. ප්‍රශ්න අංක 4 -1470/'16- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. HeshanWithanage)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்தகருணாதிலக்க)
(The Hon. GayanthaKarunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொருதினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය: වන්දි
புரோட்லண்ட் நீர் மின் நிலையம்: இழப்பீடு
BROADLANDS HYDROPOWER PLANT: COMPENSATION

1579/'17

5. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Vasudeva Nanayakkara)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පසු ගිය රජය විසින් චීන ආධාර මත කිතුල්ගල, කළුකොහුතැන්න ප්‍රදේශයේ බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය ඉදි කිරීමට පියවර ගන්නා ලද බව දන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා රජයට පවරා ගන්නා ලද ඉහත සඳහන් ග්‍රාමයේ පදිංචිකරුවන්ගේ ඉඩම් සඳහා සුදුසු පරිදි වන්දි ලබා දෙන බවට පොරොන්දු වූ අතර, නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට වන්දි ලබාදුන් නමුත්, කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට ගෙවා ඇත්තේ ඉතාම සුළු වන්දියක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයා බලා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ටද ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கத்தினால் சீனாவின் உதவியுடன் கித்துல்கல, கலுகொஹுதென்ன பிரதேசத்தில் புரோட்லண்ட் நீர் மின் நிலையத்தை அமைக்க நடவடிக்கை மேற் கொள்ளப்பட்டது என்பதை அறிவாரா;

(ii) இக்கருத்திட்டத்துக்காக அரசாங்கத்துக்குச் சுவீகரிக்கப்பட்ட மேலே குறிப்பிடப்பட்டுள்ள கிராமத்தின் குடியிருப்பாளர்களின் காணி களுக்குத் தகுந்தவாறு இழப்பீடு வழங்கப் படுவதாக உறுதியளிக்கப்பட்டதுடன், நுவரெலியா மாவட்டத்துக்குரிய குடியிருப் பாளர்களுக்கு இழப்பீடு வழங்கப்பட்டபோதிலும் கேகாலை மாவட்டத்திற்குரிய குடியிருப்பாளர் களுக்கு மிகச் சிறியதொரு இழப்பீட்டுத் தொகையே வழங்கப்பட்டுள்ளது என்பதை ஏற்றுக்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இது தொடர்பாக விசாரித்து, கேகாலை மாவட் டத்துக்குரிய குடியிருப்பாளர்களுக்கும் போதியளவு இழப்பீட்டுத் தொகையை வழங்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) whether he is aware that steps were taken by the previous Government to construct the Broadlands Hydropower Plant in Kalukohutenna, Kitulgala with the Chinese aid; and

(ii) whether he admits that while pledges were made to pay suitable compensation for lands of the residents of the aforesaid village that were taken over by the

government for the said project, residents of Kegalle District have been paid a paltry sum as compensation even though compensation was paid to residents of Nuwara Eliya District?

(b) Will he also inform this House whether he would look into this and take steps to pay sufficient compensation to residents of Kegalle District as well?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்தகருணாதிலக்க)
(The Hon. GayanthaKarunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

එහෙත් මෙම ව්‍යාපෘතිය සිදු කරන්නේ චීන ආධාර මත නොව චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC - Industrial and Commercial Bank of China) මඟින් ලබාගත් ණය මුදලක් මඟිනි.

(ව්‍යාපෘතිය ගැන හැඳින්වීමක් ඇමුණුම 01*හි දක්වා ඇත.)

(ii) නැත. මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වූ, නුවරඑළිය සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක දෙකටම අයත් පාර්ශ්වකරුවන්ට, අනුමත පොදු ක්‍රමවේදයකට අනුව කිසිදු පාර්ශ්වයකට අගතියක් නොවන සේ වන්දි ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) මේ වන විට කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් බොහොමයක් පදිංචිකරුවන්ට නියමිත පරිදි වන්දි ගෙවා ඇති අතර, තවත් කිහිප දෙනකුට වන්දි ගෙවීමට නියමිතව ඇත. (ඇමුණුම 02* සහ ඇමුණුම 03* බලන්න.)

(ඇ) අදාළ නොවේ.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය : විශේෂිත අංශය

புதுப்பிக்கத்தக்க சக்தி அபிவிருத்தி: விசேட பிரிவு

DEVELOPMENT OF RENEWABLE ENERGY: DEDICATED DIVISION

1638/'17

7. ගරු හේෂාන් විතානගේ මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. Nalin Bandara Jayamaha)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහය තුළ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් වගකීම් පැවරූ අංශයක් නොමැති බව දන්නේද;

(ii) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා වෙන් වූ විශේෂිත අංශයක් නොමැතිව පුනර්ජනනීය බලශක්ති උපරිම ලෙස ජාතික විදුලි පද්ධතියට එකතු කිරීමේදී මතු විය හැකි තාක්ෂණික අභියෝග ජය ගත හැකිද;

(iii) පුනර්ජනනීය බලශක්ති පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය දක්වන පසුගාමී ආකල්පයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையின் கட்டமைப்புக்குள் புதுப்பிக்கத்தக்க சக்தி அபிவிருத்திக்காக விசேடமாகப் பொறுப்புகள் சாட்டப்பட்டுள்ள பிரிவொன்று இல்லையென்பதை அறிவாரா என்பதையும்;

(ii) புதுப்பிக்கத்தக்க சக்தி அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட விசேடமான பிரிவொன்று இல்லாமல் புதுப்பிக்கத்தக்க சக்தியை உச்ச அளவில் தேசிய மின்சார முறைமைக்குச் சேர்க்கின்றபோது தோன்றக்கூடிய தொழில் நுட்பச் சவால்களை வெற்றிகொள்ள முடியுமா என்பதையும்;

(iii) புதுப்பிக்கத்தக்க சக்தி சம்பந்தமாக இலங்கை மின்சார சபை காட்டும் பிற்போக்கான மனோ பாவத்திற்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) whether he is aware that a section specially vested with responsibility for developing renewable energy does not exist in the structure of the Ceylon Electricity Board;

(ii) whether technical challenges that may arise in adding renewable energy to the national electricity grid in an optimum manner can be overcome in the absence of a division dedicated for developing renewable energy; and

(iii) of the reason for the negative attitude shown by the Ceylon Electricity Board towards renewable energy?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்தகருணாதிலக்க)
(The Hon. GayanthaKarunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පුනර්ජනනීය බලශක්ති සහ අධීක්ෂණ කාර්යයන් සංවර්ධනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය තුළ ඉදි කරනු ලැබූ "පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්යසාධන අධීක්ෂණ අංශය" නමින් අංශයක් ස්ථාපිත කර ඇත.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්යසාධන අධීක්ෂණ අංශයේ කාර්යභාරය සහ ප්‍රගතිය:

* ඉදිකිරීම්, මෙහෙයුම් හා අයිතිය (BOO) පදනම යටතේ මෙගාවොට් 10 සූර්ය PV බලාගාර දෙකක් සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.

* BOO පදනම යටතේ මෙගාවොට් 1 සූර්ය බලාගාර 60ක් සඳහා ටෙන්ඩර් කැඳවූ අතර ඉන් බලාගාර 36ක් අවසාන ඇගයීමෙන් තෝරාගත් අතර එම සංවර්ධකයින් ව්‍යාපෘති පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.

* BOO පදනම යටතේ මෙගාවොට් 1 සූර්ය බලාගාර 90 ටෙන්ඩර් කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කරනු ලැබේ.

* BOO පදනම යටතේ ඇතිමලේ සහ පුනරින් ප්‍රදේශයේ මෙගාවොට් 100 සූර්ය බලාගාර 02ක් සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කෙරෙමින් පවතී.

* මෙගාවොට් 170ක සුළං බලාගාර පුනරින්හි ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කරමින් පවතී.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්යසාධන අධීක්ෂණ අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස ඉංජිනේරු බී.එම්.යූ.එස්. බණ්ඩා මහතා පත් කර ඇත. අංක 20, සුලෙයිමාන් ඇවනිව්, කොළඹ 05 ස්ථානයේ එම ශාඛා පිහිටුවා ඇත.

මෙම ශාඛාව යටතේ සංවර්ධනය කිරීමට නියමිත පුනර්ජනනීය බලාගාර ඉදි කිරීම්, මෙහෙයුම් හා අයිතිය (BOO) පදනම යටතේ සිදු කිරීමට නියමිතය. එබැවින්, ව්‍යාපෘතිවලට අදාළ ආයෝජන ව්‍යාපෘති සංවර්ධකයන් විසින් සිදු කරනු ලැබේ.

(ii) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීමට පමණක් නොව එම පුනර්ජනනීය බලශක්ති පද්ධති ලංකා විදුලිබල මණ්ඩල ග්‍රිඩ් වෙතට උකහා ගැනීමේදී ඇතිවන තාක්ෂණික දෝෂවලට පිළියම් යෙදීම සඳහා විසඳුම් ලබා දීමට ඉහත අංශය ස්ථාපනය කර තිබේ.

(iii) පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය කිසිසේත් පසුගාමී ලෙස කටයුතු කර නොමැත.

කරුණාකර ඇමුණුම 01* බලන්න.

(ආ) අදාළ නොවේ.

අලුත්ගම මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය : ටෙන්ඩර් පටිපාටිය

அளுத்கம பொது விளையாட்டு மைதான அபிவிருத்தி : கேள்விப்பத்திர நடைமுறை

DEVELOPMENT OF PUBLIC PLAYGROUND IN ALUTHGAMA: TENDER PROCEDURE

1983/'17

8. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு பியல் நிசாந்த த சில்வா சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Piyal Nishantha De Silva)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(2):

(අ) (i) බෙරුවල ප්‍රාදේශීය සභාවට අයත් අලුත්ගම මහජන ක්‍රීඩාංගණය එම සභාව මඟින් නඩත්තු කරන බවත්;

(ii) මීට වසරකට පෙර එම ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය කළ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය සහ වර්ෂය කවරේද;

(ii) ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නො එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(v) ව්‍යාපෘතිය සඳහා අනුමත වූ සම්පූර්ණ මුදලම එම ව්‍යාපෘතියට යොදවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) එම ක්‍රීඩාංගණය, උත්සවයක්/ක්‍රීඩා තරගයක්/ සාමාජීය කටයුත්තක් සඳහා වෙන් කර ගැනීමේදී බෙරුවල ප්‍රාදේශීය සභාවෙන් අවසර ගැනීම සඳහා එම ප්‍රදේශය නියෝජනය කරන අමාත්‍යවරයාගේ නිර්දේශය අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රදේශයේ ක්‍රීඩා සමාජවලට මෙම ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කිරීම තහනම් කර තිබේද;

(iv) එසේ නම්, එයට පදනම් වූ හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பேருவளை பிரதேச சபைக்குச் சொந்தமான அளுத்கம பொது விளையாட்டு மைதானம் மேற்படி சபையினால் பராமரிக்கப்படுகின்ற தென்பதையும்;

(ii) இற்றைக்கு ஓர் ஆண்டுக்கு முன்னர் அவ் விளையாட்டு மைதானம் மறுசீரமைக்கப்பட்டு அபிவிருத்தி செய்யப்பட்டதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அபிவிருத்திப் பணிகளுக்கு வழங்கப் பட்ட நிதி ஏற்பாட்டுத் தொகை மற்றும் ஆண்டு யாதென்பதையும்;

(ii) விளையாட்டு மைதான அபிவிருத்தியின்போது உரிய கேள்விப்பத்திர நடைமுறைகள் பின்பற்றப்பட்டனவா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தின் ஒப்பந்ததாரர்கள் யாவர் என்பதையும்;

(v) கருத்திட்டத்துக்காக அங்கீகரிக்கப்பட்ட முழுத் தொகையும் அக்கருத்திட்டத்துக்குப் பயன்படுத் தப்பட்டதா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(இ) (i) மேற்படி மைதானத்தை விழா / விளையாட்டுப் போட்டி / சமூகப் பணிக்காக ஒதுக்கிக் கொள்கின்றபோது பேருவளைப் பிரதேச சபையிடம் அனுமதி பெறுவதற்கு அப் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் அமைச்சரின் சிபார்சு தேவைப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) பிரதேசத்திலுள்ள விளையாட்டுக் கழகங்களுக்கு இம்மைதானத்தில் விளையாடுவதற்குத் தடை விதிக்கப்பட்டுள்ளதா என்பதையும்

(iv) ஆமெனில், அதற்கு அடிப்படையாயமைந்த காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Is he aware that-

(i) the public playground of Aluthgama belonging to the Beruwala Pradeshiya Sabha is maintained by the said Pradeshiya Sabha; and

(ii) the playground concerned was renovated and developed a year ago?

(b) Will he state-

(i) the amount of provision granted for the development activities and the year in which it was granted;

(ii) whether the specified tender procedure has been followed in developing the playground;

(iii) if not, the reasons for it;

(iv) who the contractors of the project are; and

(v) whether the total amount of money approved for the project has been utilized for the aforesaid project?

(c) Will he also state-

(i) whether the recommendation of the Minister representing the area is required for obtaining approval from the Beruwala Pradeshiya Sabha to book the playground for a festival/ sports event/ social event;

(ii) if so, the reason for it;

(iii) whether engaging in sports in this playground has been banned for sports clubs in the area; and

(iv) if so, the reasons underlying it?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்தகருணாதிலக்க)
(The Hon. GayanthaKarunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) 2016 වර්ෂයේ දී

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන - රු.4,000,000.00

ප්‍රාදේශීය සභා අරමුදල් - රු.2,687,191.97

මුළු ව්‍යාපෘතිය සඳහා - රු.6,687,191.97

(ii) ඔව්.

(iii) අදාළ නොවේ.

(iv) සමාධි කන්ස්ට්‍රක්ෂන්, නො.195, කොස්වත්තගොඩ, දර්ගා නගරය

(v) ඔව්.

(ඇ) (i) අවශ්‍ය නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9-2108/'17-(1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.
[සභා ගර්භය තුළ නැත.]

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු එම ප්‍රශ්නය අසනවාද? අසන්නේ නැති බවයි පෙනෙන්නේ.

ගංවතුර හා නායයෑම් නිසා ඇති වූ හානි: කලුතර දිස්ත්‍රික්කය

வெள்ளம் மற்றும் மண்சரிவு அனர்த்தங்களினாலான சேதம்: களுத்துறை மாவட்டம்

DAMAGE CAUSED BY FLOODS AND LANDSLIDES: KALUTARA DISTRICT

2123/'17

10. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Jayantha Samaraweera)

ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017.05.27 දින ඇති වූ ගංවතුර හා නායයෑමේ ආපදා තත්ත්වයෙන් කලුතර දිස්ත්‍රික්කයේ පූර්ණ, අර්ධ හා සුළු වශයෙන් හානි වූ නිවාස, වැසිකිළි සහ පානීය ළිං සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(ii) එම සංඛ්‍යාව, එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ පූර්ණ හානි වූ නිවසක්, වැසිකිළියක් හා ළිඳක් නැවත ඉදි කිරීමට සහ අර්ධ හා සුළු හානි වූ නිවාස, වැසිකිළි හා පානීය ළිං ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජයෙන් ලබා දෙනු ලබන්නේ, ආධාර මුදලක්ද නැතහොත් ණය මුදලක්ද යන්නත් එම ආධාර හෝ ණය මුදල කොපමණද;

(iv) මේ වන විට ආධාර හෝ ණය ලබා දී තිබෙන පූර්ණ, අර්ධ හා සුළු වශයෙන් හානි වූ නිවාස වැසිකිළි හා පානීය ළිං සංඛ්‍යාව කොපමණද;

(v) එසේ ආධාර හෝ ණය ලබා දී ඇති පවුල්වල නම, ලිපිනය, ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අනර්ත්ත මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) 2017.05.27ආම් තිකති ඒර්පට්ට වෙළ්ළම් මර්රුම් මණ්සරිවු අනර්ත්ත නිලෙමෙයිනාල් කලුත්තුරෙ මාවට්ටත්තිල් මුළුමෙයාක, පකුති යළවිල් මර්රුම් සිරිතළවු සේතමටෙන්තුළ්ළ වීටුකළ්, මලසලකූටංකළ් මර්රුම් කුටිනීර් කිණරුකළ් තනිත්තනියේ එව්වළවෙන්පතෙයුම්;

(ii) මේර්පටි එණ්ණික්කෙ ඔව්වොරු කිරාම අලුවලර් පිරිවු මර්රුම් පිරතේස සෙයලාළර් පිරිවුක්කු අමෙය තනිත්තනියේ යාතු එන්පතෙයුම්;

(iii) අව්වාරු මුළුමෙයාකච් සේතමටෙන්ත ඔරු වීට්ටෙ, මලසලකූටත්තෙ මර්රුම් කිණර්රෙ මීණ්ටුම් නිර්මාණික්ක මර්රුම් පකුතියළවිල් මර්රුම් සිරිතළවු සේතමටෙන්ත වීට්ටෙ, මලසලකූටත්තෙ මර්රුම් කුටිනීර් කිණර්රෙප් පුනරමෙප්පතර්කු අරසාංකත්තිනාල් වළංකප්පටුවතු උතවිත් තොකෙයොන්රා අල්ලතු කටන් තොකෙයොන්රා එන්පතෙයුම්, මේර්පටි උතවි අල්ලතු කටන් තොකෙ එව්වළවු එන්පතෙයුම් අවර් කුරිප්පිටුවාරා එන්පතෙයුම්;

(iv) තර්පොතු උතවි අල්ලතු කටන් වළංකප්පට්ටුළ්ළ මුළුමෙයාක, පකුතියළවු මර්රුම් සිරිතළවු සේතමටෙන්තුළ්ළ වීටුකළ්, මලසලකූටංකළ් මර්රුම් කුටිනීර් කිණරුකළින් එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(v) අව්වාරු උතවි අල්ලතු කටන් වළංකප්පට්ටුළ්ළ කුටුම්පංකළින් පෙයර්, මුකවරි, කිරාම අලුවලර් පිරිවු මර්රුම් පිරතේස සෙයලාළර් පිරිවු තනිත්තනියේ යාතු එන්පතෙයුම්;

අවර් ඉච්සෙයික්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Disaster Management:

(a) Will he inform this House-

(i) the number of houses, toilets and drinking water wells in the Kalutara District which were totally, partially and slightly damaged by the floods and landsides that occurred on 27.05.2017, separately

(ii) that number in relation to each Grama Niladhari Division and Divisional Secretary's Division, separately;

(iii) whether it is an aid or a loan that the Government provides to rebuild such totally damaged houses, toilets and drinking water wells and reconstruct partially and slightly damaged houses, toilets and drinking water wells and the amount of aid or loan;

(iv) the number of totally, partially or slightly damaged houses, toilets and drinking water wells for which loans or aid have been provided by now; and

(v) the names, addresses, Grama Niladhari Divisions and Divisional Secretaries' Divisions of the families for which such aid or loan have been provided, separately?

(b) If not, why?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අනුර පිරියතර්ෂන යාප්පා - අනර්ත්ත මුකාමෙත්තුව අමෙච්චර්)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(i)

දිස්ත්‍රික්කය	හානි වූ නිවාස	හානි වූ වැසිකිළි	යට වූ ළිං
කළුතර	8822	2411	1028

(ii)

	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	නිවාස			වැසිකිළි			ළිං			ග්‍රාම නිලධාරී වසම
		පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	
1.	අගලවත්ත	16	21	257	7	18					ඇමුණුම 03
2.	මණ්ඩාරගම	01	02	-							ඇමුණුම 04
3.	බෙරුවල		19								ඇමුණුම 05
4.	බුලත්සිංහල	199	1969		217	343	128	76	187		ඇමුණුම 06
5.	දොඩංගොඩ	41	235	628		202					ඇමුණුම 07
6.	හොරණ		84		01	02	16				ඇමුණුම 08
7.	කළුතර	29	776	4		863			637		ඇමුණුම 09
8.	මඳුරාවල		1795			151					ඇමුණුම 10
9.	මිල්ලනිය	77	209	1461	49	40	119				ඇමුණුම 11
10	බදුරලිය	85	268			207		වාර්තා වී නොමැත			ඇමුණුම 12
11	පානදුර		11								ඇමුණුම 13
12	මතුගම	09	103						83		ඇමුණුම 14
13	වලල්ලාවිට	48	48	88		11					ඇමුණුම 15
14	ඉංගිරිය	16	323			37			45		ඇමුණුම 16

(iii) වන්දි මුදලක් ලබා දේ.

ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වාභාවික ආපදාවන් හේතුවෙන් සිදුවන නිවාස හානියකදී රුපියල් මිලියන 2.5ක උපරිම රක්ෂණාවරණයක් හිමි වේ. ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරන ලද හානි තක්සේරු කමිටුවක් මඟින් පූර්ණ හෝ අර්ධ ලෙස හානියට පත් නිවාස තක්සේරු කර එම හානි තක්සේරු වටිනාකම අනුව වන්දි මුදල් ලබා දීම සිදු කරයි. නිවසට අදාළ වැසිකිළිය ද මෙම තක්සේරුවට ඇතුළත් වේ.

තවද අවදානම හේතුවෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ මත පදිංචි ස්ථානවලින් ඉවත් කර නැවත වෙනත් ස්ථානවල පදිංචි කරන පවුල් සඳහා ඉඩමක් සමඟ නිවසක් මිලදී ගැනීමට රුපියල් මිලියන 1.6ක් ද, ඉඩමක් මිලදී ගෙන එහි නිවස ඉදි කිරීම සඳහා ඉඩම සඳහා රුපියල් මිලියන 0.4ක් සහ නිවස ඉදි කිරීමට රුපියල් මිලියන 1.2ක් ද, රජයේ ඉඩම් ලබාදී ඇත්නම් එම ඉඩමෙහි නිවස ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 1.2ක් ද ලබා දේ.

(iv)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය		නිවාස			වැසිකිළි				ළිං			
		පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	වෙනත්	පූර්ණ හානි	අර්ධ හානි	සුළු හානි	වෙනත්
1.	අහලවත්ත	16	21	257	7	18		පූර්ණ හා අර්ධ හානි වූ වැසිකිළි 25 පළාත් සභා ව්‍යාපෘතියක් ලෙස අළුත්වැඩියා කර ඇත.	158			පිරිසිදු කරන ලද ළිං සංඛ්‍යාව 158ක් වන අතර ප්‍රාදේශිය සභාව හා ස්වේච්ඡා සංවිධාන මඟින් පිරිසිදු කර ඇති අතර මුදල් වැය වී නැත.
2.	බණ්ඩාරගම	01	02									
3.	බෙරුවල		19									
4.	බුලත්සිංහල	2168						සෞඛ්‍ය අමාත්‍යාංශය වැසිකිළි කිහිපයක් ඉදි කර ඇති අතර හානි වූ වැසිකිළි 228ක් සඳහා පළාත් සභා ආධාර ලබා දී ඇත. රාජ්‍ය නොවන ආයතන වැසිකිළි 287ක් සඳහා ආධාර ලබා දී ඇත. (රතු කුරුස සංවිධානය වැසිකිළි 83කටත් වර්ල්ඩ් විෂන් ආයතනය 204ක් සඳහාත්)				ගංවතුරට යට වූ මුළු ළිං ප්‍රමාණය 1556ක් වන අතර මේ වන විට සියල්ල පිරිසිදු කර ඇත. හානි වූ ළිං 60ක් සඳහා වර්ල්ඩ් විෂන් ආයතනයෙන් ආධාර ලබා දී යඇත.
5.	දොඩංගොඩ	1637			202				1453 (මෙම ළිං ගංවතුරෙන් යටවී ඇති අතර මේ වන විට ඉසිනලදී)			
6.	හොරණ	84										
7.	කළුතර	809			863				637			
8.	මදුරාවල	1795			22			වැසිකිළි සඳහා රු.7,893,330.00 ක මුදලක් ලබා දී ඇත.				
9.	මිල්ලනිය	1747			49	40	119					
10.	බදුරලිය	353			207 ඉදිකර ඇත.			හානි වූ වැසිකිළි අලුතින් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම රාජ්‍ය නොවන සංවිධාන හරහා සිදු කර ඇත.වැසිකිළි 207ක් ඉදිකර ඇත.	වාර්තා වී නොමැත			
11.	පානදුර		11									
12.	මතුගම	112							83			
13.	වලල්ලාවිට	182			11			වලල්ලාවිට ප්‍රාදේශිය සභාව විසින් හානි වූ වැසිකිළි සියල්ලම රු.94,500ක උපරිමයකට යටත්ව සැදීම සිදු කර ඇත.				
14.	ඉංගිරිය	339			37				45			

** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]*
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

[ගරු අනුර ප්‍රියදර්ශන යාප මහතා]

(v)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය		ග්‍රාම නිලධාරී වසම
1	අගලවත්ත	ඇමුණුම 03
2	බණ්ඩාරගම	ඇමුණුම 04
3	බේරුවල	ඇමුණුම 05
4	බුලත්සිංහල	ඇමුණුම 06
5	දොඩංගොඩ	ඇමුණුම 07
6	හොරණ	ඇමුණුම 08
7	කලුතර	ඇමුණුම 09
8	මදුරාවල	ඇමුණුම 10
9	මිල්ලනිය	ඇමුණුම 11
10	බදුරලිය - පාලින්දනුවර	ඇමුණුම 12
11	පානදුර	ඇමුණුම 13
12	මතුගම	ඇමුණුම 14
13	වලල්ලාවිට	ඇමුණුම 15
14	ඉංගිරිය	ඇමුණුම 16

(ආ) පැන නොනඟී.

රාජගිරියේ DPJ නැමැති ගොඩනැඟිල්ල ඉදි කිරීම: විස්තර

ராஜகிரிய DPJ கட்டிட நிர்மாணம்: விபரம்

CONSTRUCTION OF DPJ BUILDING IN RAJAGIRIYA: DETAILS

2128/'17

11. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)

(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)

(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අංක 288, ශ්‍රී ජයවර්ධනපුර පාර, කෝට්ටේ, රාජගිරිය දරන ස්ථානයේ පිහිටි උපාලි ජයසිංහ මහතාට අයත් DPJ නමැති ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, අනුමතිය ලබාගෙන ඇති දිනය කවරේද;

(iii) එම ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත් කළ කොන්දේසි කවරේද;

(iv) ඒවා ඉටු කර තිබේද;

(v) එසේ නොවේ නම්, අදාළ ආයතනයට එරෙහිව නාගරික සංවර්ධන අධිකාරිය ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මානගර மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலக்கம் 288, ஸ்ரீ ஜயவர்த்தனபுர வீதி, கோட்டே, ராஜகிரிய எனும் இடத்தில் அமைந்துள்ள திரு. உபாலி ஜயசிங்கவுக்கு உரித்தான DPJ எனும் கட்டிடத்தை நிர்மாணிப்பதற்கு நகர அபிவிருத்தி அதிகாரசபையின் அங்கீகாரம் பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அங்கீகாரம் பெற்றுக்கொள்ளப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) மேற்படி நிர்மாணிப்புக்கு நகர அபிவிருத்தி அதிகாரசபை சமர்ப்பித்துள்ள நிபந்தனைகள் யாவை என்பதையும்;

(iv) அவை நிறைவேற்றப்பட்டுள்ளனவா என்பதையும்;

(v) இன்றேல், மேற்படி நிறுவனத்திற்கு எதிராக நகர அபிவிருத்தி அதிகாரசபை மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House-

(i) whether approval of the Urban Development Authority has been obtained for the purpose of constructing the building named "DPJ" located at No. 288 Sri Jayewardenepura Road, Kotte, Rajagiriya, which belongs to Mr. Upali Jayasinghe;

(ii) if so, the date on which such approval has been obtained;

(iii) what conditions were put forth by the Urban Development Authority for its construction;

(iv) whether they have been complied with; and

(v) if not, what measures have been taken by the Urban Development Authority against the organization?

(b) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

අංක 05/02/190/60/2013 දරන ලිපිය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මූලික සැලසුම් නිරාකරණය ලබා දී ඇති අතර, එම මූලික සැලසුම් නිරාකරණයේ කොන්දේසිවලට අනුව ME/BA/N/112/2011 අංක යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව මඟින් සංවර්ධන බලපත්‍රය නිකුත්කොට ඇත.

(ii) 2014.12.12

(iii) 1. උපරිම මහල් සංඛ්‍යාව බිම් මහල් හා තවත් මහල් 09ක් විය යුතුය. (G+9)

2. යෝජිත ගොඩනැඟිල්ලේ පිටුපස අවකාශය හා පැති අවකාශය සම්බන්ධයෙන් වූ සියලු අවශ්‍යතා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශ සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ "C" ආකෘතිය පරිදි විය යුතුය.

3. ඉඩමෙන් අඩි 10ක ප්‍රමාණයක් රෝයල් ගාර්ඩිස් මාර්ගය සඳහා වෙන් කළ යුතුය.

4. මධ්‍යම පරිසර අධිකාරිය, ගිනි නිවාරණ සේවා දෙපාර්තමේන්තුව, රථ වාහන ඇගයීම් සම්බන්ධයෙන් වූ නිරවුල් සහතිකයන්හි කොන්දේසිවලට අනුගත විය යුතුය.

(iv) 1. නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කරන ලද මූලික සැලසුම් නිරාකරණයේ අංක 12 දරන කොන්දේසිය අනුව සංවර්ධන බලපත්‍රය නිකුත් කිරීමේදී රථ වාහන ඇගයීම පිළිබඳ නිරාකරණයක් ලබාගෙන නොමැත.

2. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව මඟින් 2014.12.24 දින අනුමත කරන ලද අංක BA/N/36/2014 දරන සැලැස්මට අනුව ගොඩනැඟිල්ලේ පිටුපස අවකාශය ලෙස මීටර 5.23ක ප්‍රමාණයක් තැබිය යුතු වුවද, පරීක්ෂණ අවස්ථාව වන විට එම ඉඩ ප්‍රමාණය තුළ විදුලි උත්පාදන යන්ත්‍රයක් සවි කර, වැසිකිළියක්ද ඉදි කරමින් පවතින බවට නිරීක්ෂණය වී ඇත.

3. අංක BA/N/36/2014 දරන සැලැස්මේ ගොඩනැඟිලි සීමාව නිසි අයුරින් සටහන් කර තිබුණද, ඉදි කිරීම් කිරීමේදී ගොඩනැඟිල්ලේ පා මහල, ගොඩනැඟිලි සීමාවද ඇතුළත් වන අයුරින් ඉදි කර ඇති බවට අනාවරණය විය.

4. 2015.01.20 දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ පැවති සැලසුම් කමිටුවේදී තීරණය කළ පරිදි පැති අවකාශය සකස් කළ යුතු බවට 2015.01.22 දින එම මහ නගර සභාව මඟින්ද 2014.12.12 දින අංක 05/02/190/68/2013 දිනැති ලිපිය මඟින් මෙම අධිකාරිය විසින්ද සංවර්ධනකරුට දැනුම් දී ඇති නමුත් මේ දක්වා එම පැති අවකාශ සකස් කර නොමැත.

කෙසේ වුවද, අයදුම්කරුගේ ඉල්ලීම සලකා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් C.O.C.No 1122 යටතේ 2015.02.20 වන දින අනුකූලතා සහතිකය වර්ග අඩි 94,324කින් යුත් ප්‍රදර්ශනාගාරයක් හා කාර්යාලයක් සඳහා නිකුත් කර ඇත.

(v) 2014.12.24 දින අනුමත සැලැස්මට අනුව ඉදි කරන ලද බවට, 2015.02.20 දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් අනුකූලතා සහතිකයක් ලබා දී ඇතත්, 2018.01.12 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයට අනුව අනුමත සැලැස්මට පටහැනිව සිදු කරන ලද ඉදි කිරීම් සියල්ල වහාම ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අයදුම්කරුට පිටපතක් සහිතව අධ්‍යක්ෂ (බලාත්මක) විසින් ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව වෙත දැනුම් දීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

බිත්තර පරිභෝජනය හා නිෂ්පාදනය: විස්තර
முட்டை நுகர்வு மற்றும் உற்பத்தி: விபரம்
PRODUCTION AND CONSUMPTION OF EGGS: DETAILS

2146/'17

12. ගරු හේෂාන් විතානගේ මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)

(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)

(The Hon. Heshan Withanage on behalf of the Hon. Ashoka Priyantha)

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාවේ බිත්තර පරිභෝජනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම අවශ්‍යතාව සපුරා ගන්නා ආකාරය කවරේද;

(iii) ලංකාවේ දේශීය බිත්තර නිෂ්පාදනය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් බිත්තර නිෂ්පාදනයේ නිරත වී සිටින බැවින්, ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கிராமியப் பொருளாதார விவகாரங்கள் பற்றிய அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கையின் முட்டை நுகர்வு ஒவ்வொரு வருடத்தின் பிரகாரம் தனித்தனியாக எத்தனை யென்பதையும்;

(ii) அத்தேவை பூர்த்திசெய்யப்படும் விதம் யாதென் பதையும்;

(iii) இலங்கையின் உள்நாட்டு முட்டை உற்பத்தி ஒவ்வொரு மாவட்டத்தின் பிரகாரம் தனித் தனியாக யாதென்பதையும்;

(iv) வடமேல் மாகாணத்தின் குருநாகல் மற்றும் புத்தளம் மாவட்டங்களைச் சேர்ந்த மக்களில் கணிசமான எண்ணிக்கையினர் முட்டை உற்பத்தியில் ஈடுபட்டுள்ளதனால், அவர்களின் வாழ்க்கைத் தரத்தினை மேம்படுத்துவதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவ டிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Economic Affairs:

(a) Will he inform this House -

(i) the consumption of eggs in Sri Lanka from 2010 up to now in relation to each year, separately;

(ii) the manner through which that need is met;

(iii) the production of eggs in Sri Lanka in relation to each district, separately; and

(iv) the steps the Ministry intends to take to enhance the standard of living of egg producers in the Kurunegala and Puttalam Districts in the North Western Province, as a significant portion of the people in these two districts are engaged in this business?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்தகருணாதிலக்க)
(The Hon. GayanthaKarunatileka)

ගරු කථානායකතුමනි, ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

වර්ෂය	2010	2011	2012	2013	2014	2015	2016
වසරකට ඒක පුද්ගල බිත්තර පරිභෝජනය	67.03	81.78	112.10	102.56	107.91	109.05	108.43

(ii) පූර්ණ වශයෙන්ම දේශීය නිෂ්පාදන තුළිනි.

(iii) දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ඉදිරිපත් කිරීම අපහසුය. සියයට 50ට වැඩි නිෂ්පාදනයක් වයඹ පළාත තුළ එනම් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල නිෂ්පාදනය වේ. සියයට 20ක් පමණ බස්නාහිර පළාත තුළ නිෂ්පාදනය වන අතර, ඉතිරි නිෂ්පාදනය අනෙකුත් දිස්ත්‍රික්කවලින් වාර්තා වේ.

(iv) පශු සම්පත් විෂය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා විෂයට අදාළ වුවද, පශු සම්පත් විෂය භාර පළාත් අමාත්‍යාංශයේ හා පළාත් සභා නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයකින් රේඛීය අමාත්‍යාංශය කටයුතු කරයි. එලෙසම කුකුළු පාලනයට අදාළ ජාතික වශයෙන් වැදගත් කරුණු, ප්‍රතිපත්ති හා උපායමාර්ග සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය කටයුතු කරන අතර කුකුළු රෝග නිවාරණය, රෝග වැළැක්වීම, අභිජනන අවශ්‍යතා, පර්යේෂණ සහ ආහාර නිෂ්පාදන නියාමනය හා අලෙවිය පිළිබඳව රේඛීය අමාත්‍යාංශය ජාතික වශයෙන් දායක වේ.

(ආ) පැන නොනඟී.

නීති විරෝධී මත්පැන් භාවිතය : විස්තර
கள்ளச் சாராயப் பாவனை : விபரம்
CONSUMPTION OF ILLICIT LIQUOR: DETAILS

2281/'17

13. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ටී. රංජිත් ද සොයිසා මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. T. Ranjith De Soyza)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසු ගිය වර්ෂ කිහිපය තුළ මෙරට කසිප්පු භාවිතය වාර්ෂිකව වැඩි වී තිබේද;

(ii) සිදු කරනු ලබන කසිප්පු වැටලීම් සංඛ්‍යාව මේ වන විට අඩු කර තිබේද;

(iii) 2015, 2016 වර්ෂවලදී සහ 2017 මුල් මාස 06 තුළ වටලන ලද කසිප්පු විකුණන ස්ථාන සංඛ්‍යාව සහ අත් අඩංගුවට ගත් කසිප්පු ලීටර් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙරට කසිප්පු නිෂ්පාදනය වැළැක්වීමට අමාත්‍යාංශය ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தென் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த சில ஆண்டுகளினுள் இந்நாட்டில் ஆண்டுக்கு ஆண்டு கள்ளச் சாராயப் (கசிப்பு) பாவனை அதிகரித்துள்ளதா என்பதையும்;

(ii) மேற்கொள்ளப்படுகின்ற கள்ளச் சாராய (கசிப்பு) சுற்றிவளைப்புகளின் எண்ணிக்கை குறைக்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) 2015, 2016ஆம் ஆண்டுகளிலும் மற்றும் 2017ஆம் ஆண்டின் முதல் 06 மாதங்களிலும் சுற்றிவளைக்கப்பட்டுள்ள கள்ளச் சாராயம் (கசிப்பு) விற்பனை செய்யப்படுகின்ற இடங் களின் எண்ணிக்கை மற்றும் கைப்பற்றப்பட்ட கள்ளச் சாராய லீட்டர்களின் அளவு ஆண்டு வாரியாக தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iv) நாட்டில் கள்ளச் சாராயம் (கசிப்பு) உற்பத்தியை தடுக்க அமைச்சு மேற்கொள்ளும் எதிர்கால நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House-

(i) whether the consumption of illicit liquor (Kasippu) has increased annually within the last few years;

(ii) whether the number of raids to seize illicit liquor (Kasippu) being carried out has been reduced;

(iii) the number of places raided that were selling illicit liquor (Kasippu) and the amount of litres of illicit liquor seized in the years of 2015, 2016 and within the first six months of the year 2017 separately in each year; and

(iv) the future measures that the Ministry will take to prevent illicit liquor (Kasippu) production?

(b) If not, why?

ගරු පියසේන ගමගේ මහතා (නීතිය හා සාමය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியசேன கமகே - சட்டமும் ஒழுங்கும் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyasena Gamage - State Minister of Law and Order)

ගරු කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා පොලිසිය විසින් කසිප්පු භාවිත කරන පුද්ගලයන් පිළිබඳව දත්ත පවත්වාගෙන යනු නොලැබේ.

(ii) නැත.

(iii)

වර්ෂය	වටලන ලද කසිප්පු විකුණන ස්ථාන සංඛ්‍යාව	අත් අඩංගුවට ගත් කසිප්පු ලීටර් සංඛ්‍යාව
2015	27,230	470,268.936
2016	28,775	579,382.891
2017.01.01 සිට 2017.06.30	16,382	271,346.997

(iv) * ශ්‍රී ලංකා පොලීසිය මඟින් පොලිස් ස්ථාන මට්ටමින් පිහිටුවා ඇති ප්‍රජා පොලිස් සුපරීක්ෂණ කමිටු මඟින් කසිප්පු නිෂ්පාදකයන්, ප්‍රවාහනය කරන්නන්, බෙදා හැරීම සිදු කරන්නන් කැඳවා මෙහි ආදීනව පහදා දෙමින් මෙම නීති විරෝධී ක්‍රියාවලින් වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පොලිස් වසම් අනුව ක්‍රියාත්මක කිරීම.

* අත් අඩංගුවට ගන්නා මෙම පුද්ගලයන් අධිකරණයට ඉදිරිපත් කිරීමේදී මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ පවත්නා පෙර වැරදිද ඉදිරිපත් කරමින් වැඩි දඩයකට යටත් කිරීමට කටයුතු කරනු ලබන අතර, එසේ දඩය වැඩි වීම තුළින් මෙම නීති විරෝධී කාර්යය කිරීමට ඔවුන් අධෛර්යවත් කෙරේ.

* මෙම නීති විරෝධී ක්‍රියා සිදු කරන ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශ ආවරණය වන පරිදි ජංගම සංචාර, දිවා/ රාත්‍රී/ සන්ධ්‍යා මුර සංචාර අඛණ්ඩව යෙදවීම.

* මෙම ස්ථාන වැඩි වශයෙන් වැටලීම් කරමින් නීති විරෝධී ක්‍රියාවේ යෙදෙන්නන් අත් අඩංගුවට ගැනීම හා ඔවුන් සම්බන්ධයෙන් මහ ජනතාව වෙතින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කිරීම සිදු කරන අතර, ඒ සඳහා තොරතුරු ලබා දීමට මහ ජනතාව දිරිමත් කිරීමට තොරතුරු සඳහා ත්‍යාග ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සිදු වේ.

(ආ) පැන නොනඟී.

කටුපොල් වගාව ව්‍යාප්ත කිරීම : ගෙන ඇති ක්‍රියාමාර්ග

தாவர எண்ணெய்க்கான பயிர்ச்செய்கையை விரிவுபடுத்துதல் : நடவடிக்கை

PROPAGATION OF PALM OIL CULTIVATION : ACTION TAKEN

2455/17

14. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු තාරක බාලසූරිය මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு தாரக்க பாலசூரிய சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon.Tharaka Balasuriya)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය තුළ කටුපොල් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය ආසන්න වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ කටුපොල් වගාව ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද;

(iii) කටුපොල් වගාවත්, ජල ධාරණය සහ පාංශු හායනයත් අතර සහසම්බන්ධතාවක් ඇති බවට අමාත්‍යාංශය විසින් හඳුනාගනු ලැබ තිබේද;

(iv) එසේ නම්, මේ වන විට ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாவட்ட ரீதியாக இலங்கையில் தாவர எண்ணெய்க்கான பயிர்ச்செய்கையில் பயன் படுத்தப்படும் நிலப்பரப்பு எவ்வளவு என்பதையும்;

(ii) இலங்கையில் தாவர எண்ணெய்க்கான பயிர்ச் செய்கையை விரிவுபடுத்துவது தொடர்பில் அரசாங்கத்தின் கொள்கை என்ன வென்பதையும்;

(iii) தாவர எண்ணெய்க்கான பயிர்ச்செய்கைக்கு நீரைத் தேக்கிவைத்தல் மற்றும் மண் சிதைவு ஆகியவற்றுக்கிடையிலான தொடர்பினை அமைச்சு இனங்காணுகின்றதா என்பதையும்;

(iv) அவ்வாறாயின், இதுவரையில் எடுக்கப்பட்ட நடவடிக்கை என்னவென்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House-

(i) approximate extent of Palm Oil cultivation in Sri Lanka, district wise;

(ii) government's policy regarding the propagation of palm oil cultivation in Sri Lanka;

(iii) whether the Ministry identifies a correlation between Palm Oil cultivation and water retention and soil disintegration; and

(iv) if so, what action has been taken so far;

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்தகருணாதிலக்க)

(The Hon. GayanthaKarunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කය තුළ කටු පොල් වගා කර ඇති ප්‍රමාණය පහත පරිදි වේ. 2016.12.31 දිනට

දිස්ත්‍රික්කය	භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර)
ගාල්ල	5,214,09 (පන්දහස් දෙසිය දාහතරයි දශම බින්දුවයි නවය)
මාතර	569.07 (පන්සිය හැටනවයයි දශම බින්දුවයි හත)
කෑගල්ල	480.51 (හාරසිය අසූවයි දශම පහයි එක)
රත්නපුරය	194.53 (එකසිය අනූහතරයි දශම පහයිතුන)
කළුතර	3,081.29 (තුන්දහස් අසූඑකයි දශම දෙකයි නවය)

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) 2016 ජනවාරි 16 දිනැතිව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව මඟින් ගෙන ඇති හා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති තීරණය පරිදි දැනට වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 20,000 (විසිදහස)ක උපරිමයට යටත්ව තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.

(iii) නැත.

(iv) මධ්‍යම පරිසර අධිකාරියේ මූලිකත්වයෙන් විද්‍යාත්මක අධ්‍යයනයක් මේ වන විට සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

පදවිය ග්‍රාමීය රෝහල: ප්‍රතිසංස්කරණය
பதவிய கிராமிய வைத்தியசாலை : புனரமைத்தல்
PADAVIYA RURAL HOSPITAL: RESTORATION

2458/'17

15. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துலகுணவர்தன - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Ishak Rahuman)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 1972 වර්ෂයේදී ආරම්භ කරන ලද පදවිය ග්‍රාමීය රෝහල මේ වන විට කිසිදු පහසුකමක් නොමැතිකමින් මධ්‍යම බෙහෙත් ශාලාවක් බවට පත් වී ඇති බව එතුමා දන්නේද?

(ආ) මෙම රෝහල යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1972ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்ட பதவிய கிராமிய வைத்தியசாலை தற்சமயம் எந்தவித வசதியுமற்ற நிலையில் மத்திய மருந்துச்சாலையாக மாறியுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி வைத்தியசாலையை வழமை நிலைமைக்குக் கொண்டுவருவதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that the Padaviya Rural Hospital which has been established in the year 1972 has no facility as at today and become a central dispensary?

(b) Will he inform this House of the date on which arrangements would be made to reinstate this hospital?

(c) If not, why?

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) එවැනි තත්ත්වයකට පත්ව නැත.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික ආණ්ඩුවේ අමාත්‍යවරු සංඛ්‍යාව
அரசியலமைப்பின் பிரகாரம், தேசிய அரசாங்க அமைச்சர்களின் எண்ணிக்கை
NUMBER OF MINISTERS IN THE NATIONAL GOVERNMENT AS PER THE CONSTITUTION

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙමින් ස්ථාවර නියෝග 23(2) යටතේ මා මේ ප්‍රශ්නය අහන්නේ මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා පාර්ලිමේන්තුවට සම්බන්ධ වැදගත් කාරණාවක් වන නිසායි.

2015 අගෝස්තු මස 17 වන දින තේරී පත් වූ පාර්ලිමේන්තුව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවීමේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කෙරිණි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 ව්‍යවස්ථාව සහ **උප** ව්‍යවස්ථා අනුව කටයුතු කරන බව අගමැතිතුමා විසින් දන්වන ලදී.

මේ අනුව,

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ව්‍යවස්ථා අනුව පත් කළ හැකි කැබිනට් අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව නිශ්චිත කර ඇති බව පිළිගන්නේ ද? අද දිනය වන විට මෙම සංඛ්‍යාවන් උල්ලංඝනය කර ඇති බව පිළිගන්නේ ද?

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යතුමා විසින් එම පත්වීම් නිර්දේශ කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (3) ව්‍යවස්ථාවේ පැහැදිලිව මෙසේ කියැවෙනවා:

" (අ) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මඟින්, ඉවත් කරනු ලැබුවහොත්; හෝ..."

ඊට අදාළ අනෙකුත් කරුණුත් එහි දක්වා තිබෙනවා.

මම ඒ සම්බන්ධවයි අහන්නේ. පසුගිය මස තුළ පත් කළ රාජ්‍ය අමාත්‍යවරුන් වන ශ්‍රියානි විජේවික්‍රම සහ පියසේන ගමගේ මන්ත්‍රීවරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඔබ නිර්දේශ කර තිබේද? [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්නත් කලින් සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා හරියට කලබල වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් තුන්වැනි කරුණ කියවන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත වගන්තිය අනුව පාර්ලිමේන්තුවට ගෙන ආ යෝජනාව දැන් වූ පරිදි එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්සන් ගිවිසුම 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී ඇති බව පිළිගන්නේද? ඒ අනුව, කැබිනට් අමාත්‍යවරු සංඛ්‍යාව 30ක් දක්වා අඩු විය යුතු බව පිළිගන්නේද?

ගරු කථානායකතුමනි, මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාව අනුව ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවකින් මතු වෙන බරපතළ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් අහන්න කැමතියි, ඔබතුමා ශ්‍රියානි විජේවික්‍රම මැතිනියට විරුද්ධ ඇයි කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ශ්‍රියානිව ඔබතුමා ළඟින් තියා ගන්න. ශ්‍රියානිව යූඑන්පිය ළඟින් තියා ගත්තාට කමක් නැහැ. හැබැයි, ආණ්ඩු ක්‍රමය අනුව කැබිනට් ඇමතිවරු ප්‍රමාණය අඩු විය යුතුයි කියලායි මම කියන්නේ. ඒක හරිද, නැද්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ යූඑන්පී ගිවිසුම අවසන් ද, නැද්ද? මේකයි ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister will reply later.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
This is a very serious issue. -[*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. (Mrs.) Sriyani Wijewickrama is from Hon. Dinesh Gunawardena's -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is outside this matter.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Those are all subsidiary matters. [*Interruption.*] The major issue is that Hon. (Mrs.) Sriyani Wijewickrama has done a somersault. [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා එම ප්‍රශ්නයට පිළිතුරු දෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට ගරු අගමැතිතුමා යථා කාලයේදී පිළිතුරු දෙයි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මෙතැන නෛතික ප්‍රශ්නයක් නැහැ. ඔය පැත්තේ කට්ටිය මේ පැත්තට එන්න සූදානම් නම්, අපි භාර ගන්න සූදානම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක නොවෙයි ප්‍රශ්නය. ප්‍රශ්නය ඒක නෙවෙයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will tackle it.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියට නියෝජ්‍ය ඇමතිකම දෙන්න එපා කියන එකද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියන්නේ, මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමිය ආපහු ඔය පැත්තට එවන්න කියලාද කියන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමිය තියා ගන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Prime Minister reply.

ඊළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ පක්ෂ දෙකේ ගිවිසුම ගරු කථානායකතුමනි, දෙසැම්බර් 31වැනි දාට අවසන් වනවා. මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව ජාතික ආණ්ඩුවක් ගොඩනහනවා යැයි කියන පදනම මත තමයි අමාත්‍ය ධුර සංඛ්‍යාව 48 දක්වාත්, නියෝජ්‍ය සහ රාජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව 45 දක්වාත් වැඩි කරනු ලැබුවේ. ගරු අග්‍රාමාත්‍යවරයා එදා ජාතික ආණ්ඩුව කියන්නේ මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට, එක්සත් ජාතික පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය අතර එළැඹුණු ගිවිසුමක් ගැන කිව්වා. ඒ ගිවිසුම අනුව මේ ජාතික ආණ්ඩුව ගොඩනැඟුවේ අවුරුදු දෙකකට කිව්වා. ඒ අවුරුදු දෙකේ කාලය ඉක්මවා යනු ලැබුවේ පසුගිය සැප්තැම්බර් මස 02වැනි දා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, දෙසැම්බර් 31 නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙය එතුමා අහපු ප්‍රශ්නයම නේ. අපි එතුමාට අවස්ථාව දෙමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. මම මීට පෙර මේ පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවකදීම මේ පිළිබඳව ඇහුවා. නමුත්, මේකට පිළිතුරක් ලබා දීලා නැහැ. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඔබතුමාට නව ගිවිසුමක් ලබා දුන්නාද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ලබා දීලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉතින් ඒක නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජාතික ආණ්ඩුව- ඒක අපේ ප්‍රශ්නයක්. මෙතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. මේක රටේ ප්‍රශ්නයක්, අමාත්‍ය ධුර පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
ඒක අපේ ප්‍රශ්නයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අගමැතිතුමා ඊළඟ දිනයේදී-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන්කොට තිබෙනවා, ජාතික ආණ්ඩුවක් නම් අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කරගත හැකි බව. [බාධා කිරීමක්] නැහැ. මේකට කිව්වා, අවුරුදු දෙකයි කියලා. හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න. අවුරුදු දෙකක් සඳහා තමයි මේ ජාතික ආණ්ඩුව පිහිටුවන්නේ කියලා කිව්වා. ඊට පසුව තමුන්නාන්සේලා නැවතත් සලකා බලා ගිවිසුම දීර්ඝ කරලා තිබෙනවා නම්, දැන් ගිවිසුම දීර්ඝ කරලා තිබෙනවා කියලා ගරු කථානායකතුමාට භාර දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎල්ල)
(The Hon. Lakshman Kiriella)
මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා ජාතික ආණ්ඩුවට විරුද්ධද කියලා. ඔබතුමන්ලා ජාතික ආණ්ඩුවට විරුද්ධද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තමුන්නාන්සේලාට අයිතිය තිබෙනවා, ගිවිසුම දීර්ඝ කරන්න. හැබැයි කථානායකතුමාට දැනුම් දුන්නේ අවුරුදු දෙකක් සඳහා කියලායි. දැන් අවුරුදු දෙකකට වඩා වැඩි කාලයක් වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට දැනුම් දීලා තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. මට එහෙම ලිපියක් ලැබී නැහැ. ගරු අගමැතිතුමා ඒ සම්බන්ධයෙන්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉතින් ඒක නේ. තමුන්නාන්සේලා ඒ ගැන මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජාතික ආණ්ඩුව- ඒක අපේ වැඩක්. It is an internal issue.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. තමුන්නාන්සේලාගේ වැඩක් වෙන්න ඇති. නමුත් මේ පාර්ලිමේන්තුවට-

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා ගිවිසුමක් අත්සන් කරලා ඔබතුමාට භාර දුන් බව මීට ප්‍රථම ඔබතුමා අපටත් දැනුම් දීලා තිබෙනවා; මේ සභාවටත් දැනුම් දීලා තිබෙනවා. ඒ ගිවිසුමේ කාල සීමාව අවසන් වන දිනයක් තිබුණා නේද, 2017 දෙසැම්බර් 31 කියලා?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. ඒක දැන් කියැවුණා නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මේ සභාවෙන් මහජන මුදල් අනුමත කරලා, වැඩි ප්‍රමාණයක් ඇමතිවරු නඩත්තු කිරීම නීත්‍යානුකූල වන්නේ නැහැ, ඒ ගිවිසුම අවසන් වෙලා නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ ගැන ගරු අග්‍රාමාත්‍යතුමා පිළිතුරක් ලබා දෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. අපට ඊළඟ ප්‍රශ්නයටත් යන්න තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ කාරුණික අනුග්‍රහයෙන් අපට ඊයේ බැඳුම්කර කොමිසමේ වාර්තාව ලැබුණා. අතිගරු ජනාධිපතිතුමා ඊයේ දිනයේදී ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළා, එහි පිටු හයදහස් ගණනක් තිබෙන බවට. ඔබතුමා අපට ලබා දුන් වාර්තාවේ එලෙස පිටු හයදහස් ගණනක් නැහැ. ඒ නිසා ජනාධිපතිතුමා කියන ආකාරයට පිටු හයදහස් ගණනක් සහිත සම්පූර්ණ වාර්තාව නොවෙයි අපේ පාර්ලිමේන්තුවට ලැබී තිබෙන්නේ. එම නිසා අපි මේ විවාද කරන්න සූදානම් වන්නේ ඒ වාර්තාවේ කොටසක් සම්බන්ධයෙනුයි. ගරු කථානායකතුමනි, ඔබතුමා ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා මෙම වාර්තාවේ පිටු හයදහස් ගණනක් තිබෙනවා නම්, එම පිටු හයදහස් ගණනම පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාට ලබා දෙන්න කටයුතු කරන්න කියලා අපි ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්න කැමැතියි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Can I reply to that?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා එවූ වාර්තාව පාර්ලිමේන්තුවක් හැටියට අපි පිළිගන්න ඕනෑ. [බාධා කිරීම්] පිටු අඩු නම්, විවාදයක් නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let me explain that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
You cannot have the cake and eat it too. පිටු අඩු ප්‍රශ්නය විසඳා ගන්නා තෙක් විවාදයක් නැහැ. පිටු අඩු නම්, විවාදයක් දෙන්නේ කොහොමද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාත් කියන්නේ පිටු අඩුයි කියලාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
"පිටු අඩු නම්" කියලායි මම කිව්වේ. ඔබතුමන්ලා නේ කියන්නේ පිටු අඩුයි කියලා. පිටු අඩු නම්, විවාදයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. මේ සම්බන්ධයෙන් මට අද උදේ කීප දෙනෙකු කථා කළා. ඊට පස්සේ මම ජනාධිපති ලේකම්තුමාට කථා කළා. ඊයේත් අපි මේ සම්බන්ධයෙන් සඳහන් කළා, අපට ලැබුණේ ජනාධිපතිතුමාගේ warrant එක අනුව ලැබුණු official වාර්තාව කියලා. අද පුවත්

[ගරු කථානායකතුමා]

පත්වල වාර්තා බැලුවාට පස්සේ මම ජනාධිපති ලේකම්තුමාට කථා කළා. එතුමා මට ලිපියක් එවා තිබෙනවා. මට ඒ ලිපිය කියවන්න ඉඩ දෙන්න.

එම ලිපියේ මෙසේ සඳහන් වනවා:

"භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවන් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව

අද දින ඔබතුමා මා සමඟ කරන ලද දුරකථන සාකච්ඡාව හා බැඳේ.

ඔබතුමාට දුරකථන සාකච්ඡාවෙදී දැනුම් දුන් පරිදි හා පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතාට 2018 ජනවාරි 17 වන දින මගේ සමාංකිත ලිපියෙන් දැනුම් දුන් පරිදි බැඳුම්කර කොමිසමේ ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා පිටපත් 26ක් ඔබතුමා වෙත භාර දීම සඳහා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීමේදී කොමිසම අතට පත් වුනු ලිපිලේඛන රාශියක් ඇත. ඒවා සුරක්ෂිතව තබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇත. මීට වලින් හෝ පෙට්ටි ගොනු - box file - මගින් මා වෙත ඉදිරිපත් වූ ලේඛන, බඳින ලද පොත් මගින් මා වෙත ඉදිරිපත් කරන ලෙස කොමිසමේ හිටපු ලේකම්වරයාට ඒ නිසා මවිසින් දැනුම් දෙන ලදී. ඒ අනුව, දින කිහිපයක සිට එම ලේඛන පොත් බැඳීමට ඔහු විසින් රජයේ මුද්‍රණාලයාධිපතිනිය සමඟ ක්‍රියා කරයි. එසේ බඳින ලද පොත් මා වෙත තවමත් ලැබී නැත.

මට අද දින දැනගන්නට ලැබුණු පරිදි එයින් තොග තුනක් භාරදීමට ඔහුට හැකිවනු ඇත. එසේ වුවහොත්, පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට එම ලිපිලේඛන නීති ක්‍රියාත්මක කරන අංශවලට ප්‍රමුඛතාවය මත ලබා දෙන ලෙසට හිටපු ලේකම්වරයාට දැනුම් දී ඇත.

එමෙන්ම, මේ පිළිබඳව ගරු නීතිපතිවරයා විසින් මා හට දී ඇති උපදෙස් පරිදි එම පොත් තොග මා වෙත ලද පසු අවශ්‍යතාවය මත නිකුත් කිරීමට අපේක්ෂා කරමි.

මෙම කරුණු පිළිබඳව ක්‍රියා කිරීමේදී ඔබතුමාට සිදුවන අසීරුතාවය ගැන කනගාටු වන අතර, මෙම තත්ත්වය පිළිබඳව ගරු පක්ෂ නායකතුමන් සහ අනෙක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද මෙම තත්ත්වය අවබෝධ කර ගනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි."

දැන් මේක හදිසියේ priority දීලා හදනවා. එම නිසා මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙන්න තිබෙන එකත් දැන් නවත්වලා තිබෙන්නේ. ජනාධිපති කාර්යාලය විසින් ඉල්ලා තිබෙන නිසා දැන් එතැන කරගෙන යනවා. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී අතිගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව රටට ප්‍රකාශයක් කළා, "පිටු 6,000 ගණනක වාර්තාවක් තමයි මට ලැබුණේ" කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ එතුමාට ලැබුණු මුළු වාර්තාව අපට ලබාදෙන්න කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක තමයි ජනාධිපති ලේකම්තුමා කියන්නේ, "දැන් ඒවා copy කරනවා, ඉන් පසුව ලබා දෙන්නම්" කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ පාර්ලිමේන්තුවේ ඊයේත් මේ ප්‍රශ්නය පැන නැඟුණා. ඊයේ මේ ප්‍රශ්නය පැන නැඟුණු වෙලාවේදී ඔබතුමා මේ පාර්ලිමේන්තුවට කිව්වා, ජනාධිපති ලේකම්වරයා වෙත ලැබී තිබුණු සියලු වාර්තා ලබා දුන් බව.

හැබැයි, අද දිනයේ ආපසු කියනවා, ඒ වාර්තාවට අමතරව තවත් සමහර දේවල් තිබෙන බව. මේ වාර්තාව පිළිගන්නවාද කියලා ඔබතුමා අපෙන් ඇහුවා. ඔබතුමා කිව්වා, ඊයේ ජනාධිපති ලේකම්වරයාගෙන් විමසා සිටියා. ඔහු කිව්වා, ඔහුට ලබාදුන් සියලු දේ ඉදිරිපත් කොට තිබෙනවා කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, mandate එක අනුව දාපු වාර්තාව.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එම නිසා අපි පිළිගන්නවා කියලා කිව්වා. ඔබතුමාට මතක ඇති මම කිව්වා, "ඉදිරිපත් කොට තිබෙන ඒවාට අමතරව යම් කරුණු තිබේ යැයි හෙළිදරව් වුවහොත්, පාර්ලිමේන්තුවට අසත්‍ය තොරතුරු ලබාදීම මත ජනාධිපති ලේකම්වරයා වහාම පාර්ලිමේන්තුවට කැඳවිය යුතුයි" කියලා. ඊයේ "ඔක්කෝම ලබාදුන්නා" කියලා, ඊට පස්සේ අද ඔබතුමාට ලියුමක් එවලා කියනවා, "තව කොටසක් තිබෙනවා" කියලා. එම නිසා ජනාධිපති ලේකම්වරයා හරි පැහැදිලි ලෙස තමන්ගේ වගකීම නිසි පරිදි ඉටු කරලා නැහැ ගරු කථානායකතුමනි. ඒ අවස්ථාවේ ජනාධිපති ලේකම්වරයාට කියන්න තිබුණා, "මේක තමයි අපි දැනට ඉදිරිපත් කරන්නේ, තව කොටස් තිබෙනවා, ඒවා පසුව දෙන්නම්" කියලා. ඔබතුමාගේ ප්‍රකාශයට එකඟ වෙමින් තමයි අපිත් මෙම වාර්තාව පිළිගත්තේ. ඒ නිසා ඔබතුමා වහාම ජනාධිපති ලේකම්වරයා විමසන්න. එතුමා ඔබතුමාත් එක්ක ලිපි හුවමාරු කරගන්නවා. පක්ෂ නායක රැස්වීමට ජනාධිපති ලේකම්වරයා කැඳවන්න. අපට එතුමාගෙන් මේක අහන්න ඕනෑ. මොකද, ඔබතුමා අතරමැදියෙක් ලෙස එතුමා කියන එක අපට කියනවා. ආපසු පහුවදා ඇවිල්ලා එතුමා කිව්වා කියලා ඔබතුමා වෙන එකක් අපට කියනවා. එම නිසා අපට මේ ප්‍රශ්නය නිශ්චිත ලෙස ජනාධිපති ලේකම්වරයාගෙන් විමසීම සඳහා ඔබතුමා විසින් ජනාධිපති ලේකම්වරයා අද දිනයේ වහාම පාර්ලිමේන්තුවට කැඳවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද පුළුවන් වෙයිද කියලා මම දන්නේ නැහැ. මම උත්සාහ කරන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඹී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පක්ෂ නායක රැස්වීමේදී අපි මුලින්ම මේ කාරණය ඔබතුමාගේ අවධානයට ගෙනාවා. දැන් මේ ප්‍රශ්නය යළිත් මතුවෙලා තිබෙනවා. මොකද, ඔබතුමාට එවන ලද වාර්තාව ඔබතුමා ඉදිරිපත් කළා. නමුත්, එහි අඩු පාඩුවක් තිබෙන බව දැන් විවෘත

රහසක්. ඊයේ MTV, "සිරස" ඇතුළු channels සියල්ලේම ජනාධිපතිතුමාගේ කථාව සජීවී ලෙස විකාශය කළා. එහිදී ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, මෙම වාර්තාවේ පිටු 6,000කට අධික ප්‍රමාණයක් තිබෙනවා කියලා. එතකොට අපට ලබාදෙන ලද වාර්තාවේ ඒ තරම් පිටු ගණනක් නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මුදල් බලය තිබෙන පාර්ලිමේන්තුවට මේ බරපතළ වංචාව පිළිබඳ විමර්ශනයේ තොරතුරු සොයා බලන්න තිබෙන්නේ මේ හිඩැස මත තමයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු දෙයට මා එකඟ වනවා. අපි එදාත් කිව්වා, ඒ නිලධාරීන් අප ඉදිරියට කැඳවා, ඒ තීරණ පැහැදිලි කරගෙන, ඒ තීරණ අනුව කටයුතු කළා නම් මේ ප්‍රශ්නය අවසානයි කියලා. ඕනෑම නිලධාරියකු ගෙන්වීමේ බලය ගරු කථානායකතුමාට තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගෙන්වන්න පුළුවන්. මා බලන්නම්. ලිපි ලේඛන රාශියක් කියලායි මෙහි සඳහන් කරලා තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමා තමයි පාර්ලිමේන්තුවට වග කියන්නේ. මා ඊයේ මෙම ප්‍රශ්නය මතු කළ වෙලාවේ, "මෙය අංග සම්පූර්ණ වාර්තාවද?" කියා විමසුවාම, ඔබතුමා කිව්වේ, "මා වෙත භාර දුන්න ඒ සම්පූර්ණ වාර්තාව තමයි සභාගත කළේ" කියලායි. එහි වරදක් නැහැ. "මේක තමයි සම්පූර්ණ වාර්තාව" කියා ඔබතුමාට ලැබුණා නම්, එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එය mandate එක අනුව දීපු වාර්තාව කියා මා විශේෂයෙන්ම සඳහන් කළා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ වෙලාවේ මා විමසීමක් කළා, "මෙහි කිසියම් අඩු පාඩුවක් තිබෙනවා නම් ඔබතුමා මෙහි වගකීම භාර ගන්නවාද?" කියලා. එතකොට ඔබතුමා කිව්වා, "මෙය මට දීපු වාර්තාව. මට එහෙම වගකීම භාර ගන්න පුළුවන්කමක් නැහැ" යි කියලා. ඔබතුමා එහෙමයි කිව්වේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, හරි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඇත්ත වශයෙන්ම අංග සම්පූර්ණ වාර්තාවක් මේ සභාවේ නැතුව අපි කොහොමද විවාදයක් කරන්නේ? මේ ප්‍රශ්නය මතු කළාම සභානායකතුමා කියනවා, "මේ වාර්තාව පිළිගන්නේ නැත්නම් විවාදයක් අවශ්‍ය නැහැ"යි කියලා. අංග සම්පූර්ණ තොරතුරක් නැතුව වාර්තාවේ කෑල්ලක් දීලා, සාර්ථක විවාදයක් කරන්නේ කොහොමද? මෙය රටේ ජනතාවගේ ප්‍රශ්නයක්. ඒ නිසා අවශ්‍ය වන්නේ සාර්ථක විවාදයක් කරන එකයි.

මේ ගරු සභාවේ මෙහෙම උත්තර දෙන එකත් හොඳ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා ඔබතුමා වගකීමකින් යුක්තව ඒ වාර්තාවේ ඉතිරි කොටස් ටිකත් සභාවට ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ලේකම්තුමාත් සඳහන් කරලා තිබෙනවා නේ, ඒ ඉතිරි කොටස් ටිකත් ලබා දෙනවා කියලා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අපි සෑහීමකට පත් වනවා ඒ ඉතිරි කොටස් ටිකත් ලබා දෙනවා නම්.

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
මේ කාරණය සම්බන්ධව කෙරෙන තර්ක-විතර්කවල අවසානයේ සිද්ධ වන්නේ මොකක්ද කියලා මම දන්නවා. ජනාධිපතිතුමා හිතාමතා මේ කටයුත්ත අධෛර්යය කරන්න උත්සාහයක් දරනවා වාගේ හැඟීමක් අද රාත්‍රියේ රූපවාහිනිය තුළින් ඉදිරිපත් වෙයි. නමුත් මම ඉතාම වගකීමෙන් කියන්න කැමැතියි, ඒ ලබා දෙන්න තිබෙන වාර්තා ලබා දීමට අපි සූදානමින් සිටින බව. ඒ වාර්තාවේ සමහර කොටස්, සමහර annex ලබා දීම තුළ, සමහර වෙලාවට යම් යම් අයට නඩු පැවරීමේදී අවාසි සහගත තත්ත්ව පවා ඇති වීමේ හැකියාවක් තිබෙන බව අපට දැනගන්නට තිබෙනවා. ඒ කෙසේ වෙතත්, ජනාධිපති ලේකම්තුමා ඔබතුමාට බාර දුන්නු ආකාරයට -වාර්තා කළ ආකාරයට- අවශ්‍ය සියලු වාර්තා මේ පාර්ලිමේන්තුවට ලබා දෙනවා. අපි ඒ කිසිදු දෙයක් සඟවන්න ඉඩ තියන්නේත් නැහැ; කිසිදු ප්‍රශ්නයක් යට ගහන්න ඉඩ තියන්නේත් නැහැ. බැඳුම්කර කොමිසම සම්බන්ධ ලැබුණු සියලු වාර්තා මෙතැනට ඉදිරිපත් කරනවා වාගේම, ජනාධිපතිතුමාගේත්, අපේත් මතය වෙලා තිබෙන්නේ ඒ සඳහා වග කිව යුතු සියලුදෙනාට එරෙහිව කටයුතු කිරීමයි. ඒ වෙනුවෙන් ගන්න තිබෙන සියලු ක්‍රියාමාර්ගවලට අපි යොමු වෙනවා. කිසිදු ආකාරයකින් ඒවා යටපත් කිරීමක් සිද්ධ වෙන්න ඉඩ තියන්නේ නැහැ කියන එක මම ඉතා පැහැදිලිව සඳහන් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නීතිපතිගේත් උපදෙස් පිට ඒවා එවනවා කියලාත් එතුමා කියා තිබෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මම තව කාරණයක් කියන්න තිබෙනවා. ඒ අවශ්‍ය නිලධාරීන් පක්ෂ නායක හමුවකට ගෙන ඒමට අවශ්‍ය පියවර ගන්න කියලා අපිත් දැනුම් දෙන්නම්. එතකොට ඒ පැහැදිලි කිරීම කරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ සඳහා උත්සාහ කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අද හවස ප්‍රවෘත්තිවල මොනවා ගියත්, ඒවායින් මොනවා හැහෙනවාද කියන එක අපට අදාළ නැහැ.

ඒ ජනාධිපති ලේකම්වරයාම ඊයේ නිශ්චිත වශයෙන් කථානායකවරයාට දැනුම් දුන්නා, "මේ තමයි සමස්ත දේ" කියලා. ඒ ජනාධිපති ලේකම්වරයාම අද දැනුම් දෙනවා, "තව තිබෙනවා" කියලා. ඔබතුමාට මතක ඇති, මම ඊයේ කිව්වා, "එතුමා කිව්වා නම්, මේ වාර්තාව අපි පිළිගන්න ලැස්තියි" කියලා. මම එහෙම කියලා තිබෙනවා.

මහින්ද අමරවීර ඇමතිතුමනි, ඔබතුමා ඊයේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. අපි ඊයේ කිව්වා, "බැරි වෙලාවත් මේ තොරතුරුවලට අමතර තොරතුරු තිබෙන බව හෙළිදරව් වුවහොත් ජනාධිපති ලේකම්වරයා වග කිව යුතුයි" කියලා. එතුමා පාර්ලිමේන්තුවට එක දවසක කියනවා, "ඔක්කෝම තිබෙනවා" කියලා. ඊළඟ දවසේ කියනවා, "තව තිබෙනවා" කියලා. ඒකයි අපි ප්‍රශ්න කරන්නේ.

අද රෑ 7ට යන ප්‍රවෘත්ති, අද රෑ 9ට යන ප්‍රවෘත්ති අපට අදාළ නැහැ. ඒවායෙන් මොන හැඟීම් ඇතිවෙනවාද කියන එකත් අපට වැඩක් නැහැ. අපි නිශ්චිත ලෙස මේ ප්‍රශ්නය අහන්නේ අද නොවෙයි, ගරු කථානායකතුමනි. පසු ගිය 10වැනි දා සිට මේ ප්‍රශ්නය පැන නැහෙමින් එන්නේ. අඩුම තරමින් මේ වාර්තාව එවන කොට කිව්වා නම් හරි, "මේ වාර්තාවේ කොටසක් පමණයි; තව තිබෙනවා; ඒ කොටස මේ දිනය වෙනකොට දෙන්න කටයුතු කරනවා." කියලා. එහෙම මොකක් හරි විධිමත් බවක් තිබෙන්න ඕනෑනේ. එහෙම නැතිව එක කොටසක් එවලා, ඒක සම්පූර්ණ එක නොවෙයි කියලා හෙළිදරවු වෙලා, ඒ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළාට පස්සේ කියනවා, "ඉතුරු කොටස එවනවා" කියලා. එහෙම නොවෙයි නේ නිලධාරියෙක් වැඩ කරන්න ඕනෑ. වාර්තාවෙන් කොටසයි නම් එතුමාට ඒ වෙලාවේ එවන්න පුළුවන් වුණේ, "තව මෙච්චර ප්‍රමාණයක් තිබෙනවා. ඒ කොටස අහවල් දිනයේ මම එවනවා." කිව්වා නම් හරි. එහෙම විධිමත් විධියට කටයුතු කරන්න ඕනෑනේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. එතුමා කොළඹ ඉන්නවා නම් මම කථා කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා දැන් කථානායකතුමා තමයි අපහසුතාවට පත් වෙලා තිබෙන්නේ. දැන් කථානායකතුමා තමයි අතරමැදි කෙනා. ලේකම්වරයා කියන දේ ඔබතුමා අපට කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන කථා කර ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ලේකම්වරයා කියන එක ඔබතුමා අපට කියලා, ඔබතුමා තමයි දැන් අමාරුවේ වැටිලා තිබෙන්නේ. ඒ නිසා දැන් අපි ඒ ලේකම්වරයාගෙන් ප්‍රශ්න කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඒ අවස්ථාව ලබා දෙන්නම්. මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු අමරවීර ඇමතිතුමා දැන් ප්‍රකාශ කරපු ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. මේ වාර්තාව ඉදිරිපත් කළේ සභානායකතුමා. මේ ගරු සභාවට මේ වාර්තාව ලැබෙන්න කලින් එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් අයට මේ වාර්තාව සම්පූර්ණයෙන් ලැබුණු බව ප්‍රසිද්ධියේ රටට ප්‍රකාශ කළා. ඉතින් මේ සභාවටත් කලින් සම්පූර්ණ වාර්තාව වෙනත් අයට ලැබුණා නම්, එහි යම් යම් අවාසිදායක කොටස් ඉවත් කළාය කියන සාධාරණ හා යුක්ති සහගත සැකය අප තුළ තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ ප්‍රශ්නය වඩා වගකීමෙන් මතු කරන්නේ. මේ වාර්තාව පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා ජනාධිපති ලේකම්තුමා වෙන කාට හෝ දුන්නා නම් ඒක බරපතළ වරදක් නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අවස්ථාවේදී මම පැහැදිලි කිරීමක් ඉල්ලුවාම කිව්වේ, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඒ ඔක්කෝම දුන්නේ මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව කියලයි. මට කිව්වේ එහෙමයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම නොවෙයි නේ රටට කිව්වේ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, කවුරු කොහොම කිව්වත් මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම වෙනත් දේශපාලනඥයකුට ලබා දීලා නැහැ. අඩුම වශයෙන් ආණ්ඩු පක්ෂයේ ඉන්න කෙනකුටවත් ලබා දීලා නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා වගකීමෙන්ද ඒක කියන්නේ?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔව්. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම කිසිම දේශපාලනඥයකුට මේ වාර්තාව දීලා නැහැයි කියන එක මා වගකීමෙන් යුතුව කියනවා. පාර්ලිමේන්තුවට තමයි එය ප්‍රථමයෙන් ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 23/2 යටතේ පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

II

කතරගම දී සිදු වූ පොලිස් වෙඩි තැබීම
கதிர்காமத்தில் இடம்பெற்ற பொலிஸ் துப்பாக்கிச் சூட்டுச் சம்பவம்
POLICE SHOOTING AT KATARAGAMA

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පිළිතුරු බලාපොරොත්තුවෙන් ස්ථාවර නියෝග 23(2) යටතේ මා මෙම ප්‍රශ්නය නඟනවා.

කතරගම පොලිස් වෙඩි තැබීම ආශ්‍රිතව උද්ගත වූ මහජන නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

පසුගිය 20වැනි දින රාත්‍රියේ කතරගම පොලිසියට අනුයුක්ත පොලිස් කොස්තාපල්වරයකු විසින් යතුරුපැදිකරුවකුට කරන ලද වෙඩි තැබීමක් හේතුවෙන් කතරගම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කතරම ප්‍රදේශයේ 44 හැවිරිදි පුද්ගලයකු මිය ගියා. මේ සිදුවීමෙන් අනතුරුව පොලීසිය වෙත පැමිණි ප්‍රදේශවාසීන් සහ පොලීසිය අතර ඇති වූ ගැටුම්කාරී තත්ත්වය අවසානයේ කාන්තාවන්ද ඇතුළු පුද්ගලයන් 50කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගනු ලැබුවා.

මෙහිදී පොලීසිය විසින් යතුරුපැදිකරුට වාහනය නතර කරන ලෙසට දුන් අණ නොතකා ධාවනය කළ නිසා වෙඩි තැබීම සිදුව ඇති බව ප්‍රකාශ කරද්දී, යතුරුපැදියේ පසුපසින් ගමන් කළ තැනැත්තා සහ ප්‍රදේශවාසීන් කියා සිටින්නේ නතර කිරීමට ගිය යතුරුපැදියට සිදු කළ වෙඩි තැබීම හේතුවෙන් යතුරුපැදිකරුගේ හිසට වෙඩි වැදුණු බවයි.

මෙය මෙවැනි ආකාරයේ පළමු වෙඩි තැබීම නොවන අතරම, සිදුවූ පළමු මරණයද නොවේ. මෙවැනි සිදුවීම් ගණනාවක් පසුගිය කාලයේ වාර්තා වුණා. කෙසේ වුවත්, මෙලෙස මරණ සිදුවීම් අතිශය කනගාටුදායකයි. ඉන් අසරණ වන දරු පවුල්වලට අත්වන ඉරණම පිළිබඳව අමුතුවෙන් පෙන්වා දිය යුතු නැහැ.

හුදු නැවැත්වීම සඳහා දෙන ලද සංඥාවක් නිසි ලෙස හඳුනා ගැනීම හෝ නැවැත්වීම සඳහා වන සූදානම නිසි ලෙස හඳුනා නොගැනීම වැනි සරල හේතුවක්, මිනිස් ජීවිතයක් අහිමි වන තරමේ බරපතළ සිදුවීමක් වී තිබෙනවා. ජීවිතයක් අහිමි වන අන්දමේ සිදුවීමකින් තොරව මෙවැනි සිදුවීමක් කළමනාකරණය කර ගත නොහැකිද යන්න ගැටලු සහගතයි.

ගරු කථානායකතුමනි, පොලිස් නිලධාරීන් වාහන නතර කිරීමේදී විධිමත් ක්‍රමයක් නැති බව මා දැකලා තිබෙනවා. හිටපු ගමන් අතක් දික් කරනවා; හිටපු ගමන් ටෝච් එකක් ගහනවා; තව වෙලාවක පාරට පනිනවා. ඒ සඳහා තිබෙන විධිමත් ක්‍රමය මොකක්ද? පාරට පනින කොට හිතනවා වල් ඌරෙක් පැන්නා කියලා. එහෙම හිතලා වාහනය පැත්තකින් දමා ගෙන යනවා. ඒ නිසා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, වාහන නතර කිරීම සඳහා විධිමත් ක්‍රමයක් පොලීසියට කියන්න කියලායි. මේ තත්ත්වය නිසා විශාල ගැටලුවක් මතුවී තිබෙනවා. ඒ නිසා තමයි මේ විධියට මිනිස් ජීවිත හානි වන විධියට කටයුතු සිද්ධ වී තිබෙන්නේ.

මේ තත්ත්වය තුළ පැනනඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. පොලිස් වෙඩි තැබීමේ සිදුවීම සම්බන්ධ පරීක්ෂණවල ප්‍රගතිය කවරේද? අත් අඩංගුවට ගන්නා ලද ප්‍රදේශවාසීන් සියලු දෙනා නිදහස් කරනු ලැබ තිබේද?

   මොකද, ප්‍රදේශවාසීන් පාරට බහින එක සාධාරණයි. කිසිදු වරදක් නොකළ තමන්ගේ ගමේ පුරවැසියෙක් වෙඩි තබා ඝාතනය කළාම, ඒ සිද්ධිය නිසා ප්‍රදේශවාසීන්ගේ, ඥාතීන්ගේ, හිතවතුන්ගේ නොසන්සුන්තාව පොලීසියකට සහ ආණ්ඩුවකට තේරුම් ගන්න බැරි නම්, ඒ ආණ්ඩුවත්, පොලීසියත් මේ රටේ ජීවත් වන මිනිසුන්ගෙන් සමන්විතයි කියලා හිතන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දෙවැනි ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

2. රැස්වූ ජනතාව සමඟ ගැටලුව සාමකාමීව විසඳා ගැනීම සඳහා පොලීසියේ පාර්ශ්වයෙන් උත්සාහ ගන්නා ලද්දේද? එසේ නම් ඒ කුමක්ද?

3. මෙවැනි අවාසනාවන්ත සිදුවීම් වළක්වා ගැනීම සඳහා ආණ්ඩුව විසින් ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියා මාර්ග කවරේද?

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු පියසේන ගමගේ මහතා (නීතිය හා සාමය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியசேன கமகே - சட்டமும் ஒழுங்கும் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyasena Gamage - State Minister of Law and Order)
ගරු කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක මහතා ඉදිරිපත් කළ ප්‍රශ්නය සඳහා වූ පසුබිම් වාර්තාව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

01. 2018.01.20 වන දින කතරගම නගරයේ රාත්‍රී බීට්ටු රාජකාරී යෙදවා සිටි පො.කො. 70481 පුෂ්පකුමාර, සිවිල් ආරක්ෂක බලකායේ 029815 චමින්ද යන නිලධාරීන් රාජකාරියේ යෙදී සිටියදී, පැය 22:55ට පමණ කතරගම නගරය දෙස සිට පරන වැඩසිටිකන්ද පාර දෙසට ධාවනය වූ යතුරු පැදියක් නැවැත්වීම සඳහා සංඥා කර ඇත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද සංඥාව? අත දමලාද?

ගරු පියසේන ගමගේ මහතා
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)
අද දමා තමයි සංඥා කරන්නේ. ලයිට් එකක් තිබෙන්නේ. ඒක දමලා තමයි සංඥා කරන්නේ.

ඒ අවස්ථාවේදී අංක UP - BDG - 0710 දරන TVS මෝෆෙඩ් වර්ගයේ යතුරු පැදියේ ගමන් ගත් දෙදෙනෙක් කෑ ගසමින් යතුරු පැදිය නොනවත්වා ධාවනය කිරීම හේතුවෙන් පො.කො. 70481 පුෂ්පකුමාර නිලධාරියා විසින් ඔහුට නිකුත් කර තිබූ අංක: 640308 දරන රිවෝල්වරයෙන් වෙඩි තැබීමෙන් එක් පුද්ගලයෙකු තුවාල ලබා ඇති අතර, පැමිණි දෙදෙනාම කතරගම රෝහල වෙත රැගෙන යාමට කටයුතු කර ඇත.

මෙම සිද්ධියෙන් යතුරු පැදියේ පැදිකරු වන අංක 101/1, 4වන පෙළ, නාගහවීදිය, කතරගම යන ලිපිනයේ පදිංචිව සිටි පතිරණගේ නිරෝෂන් - වයස අවුරුදු 25යි - යන අය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මිය ගොස් ඇති අතර, පසුපැදිකරු වන පනයන්දුවගේ නුවන් බුද්ධික, (වයස අවුරුදු 27 යි) අංක 41, නාගහවීදිය, කතරගම. යන අය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු එදිනම රෝහලෙන් පලා ගොස් ඇති අතර, පසුව 2018.01.21 වන දින නැවතත් කතරගම රෝහලට ඇතුළත් වී ප්‍රතිකාර ලබා ඇත. මොහුගේ එක් අතක් සහ එක් කකුලක දණහිස පමණක් තුවාල වී ඇත.

මෘත දේහය සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු දේහය ඥාතීන් වෙත භාරදී ඇති අතර, 2018.01.23 වන දින සවස් කාලයේදී දෙවන පෙළ, නාගහවීදිය, කතරගම. ලිපිනයේ පිහිටි පොදු සුසාන භූමියේදී අවසන් කටයුතු සිදු කර ඇත.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද "පොලිස් වෙඩි තැබීමේ සිදුවීම සම්බන්ධ පරීක්ෂණවල ප්‍රගතිය කවරේද? අත්අඩංගුවට ගන්නා ලද ප්‍රදේශවාසීන් සියලු දෙනා නිදහස් කරනු ලැබ තිබේද?" යන ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

මෙම වෙඩි තැබීම වාර්තා වූ විගස තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පො.ප. කේ.කේ. රංගජීව නිලධාරියා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් යොදවා සිද්ධියට අදාළව පරීක්ෂණ පවත්වා වෙඩි තබා පුද්ගලයකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් කතරගම පොලිස් ස්ථානයට අනුයුක්ත පො.කො. 70481 නායලාගේ අසංක ජානක පුෂ්පකුමාර නිලධාරියා 2018.01.21 වන දින කතරගම පොලිස් ස්ථානයේදී අත් අඩංගුවට ගෙන නඩු අංක: 47409/18 යටතේ තිස්සමහාරාම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, සැකකරු 2018.01.30 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පොලිස් අධිකාරී නුවන් අසංක මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් ඉදිරි විමර්ශන පවත්වනු ලබන අතර, තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක, කේ.කේ. රංගජීව ඇතුළු කණ්ඩායම විසින් සිදු කළ විමර්ශන මගින් ලබා ගත් තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ලබා දී ඇති අතර, තංගල්ල කොට්ඨාස අපරාධ අංශ නිලධාරීන් විසින් සිදු කළ පරීක්ෂණ නතර කිරීමට පියවර ගෙන ඇත.

මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු 2018.01.21 වන දින පැය 00:45 ට පමණ කතරගම ප්‍රාදේශීය සභාවට පොදුජන පෙරමුණෙන් තරග වදින හිටපු ප්‍රාදේශීය සභා සභාපති වානක අමිල් රංගන මහතා සහ ඔහුගේ ආධාරකරුවන් පිරිසක් එක්ව කතරගම පොලිස් ස්ථානයට ගල් මුල් ප්‍රහාරයක් එල්ල කර ඇති අතර, එම ප්‍රහාරයේදී කතරගම පොලිසියට අයත් අංක WP KO - 0343 දරන ස්කෝපියෝ ජීප් රථයට හා අංක WP XS - 6947 දරන යතුරු පැදියට දැඩි අලාභහානි සිදු වී ඇත. තවද, පොලිස් ස්ථානයේ නාම පුවරුවට, ප්‍රධාන පරිපාලන ගොඩනැඟිල්ලේ ජනේල 06කට සහ තනිකඩ භට නිවාසයේ ජනේල 07කට දැඩි අලාභහානි සිදු කර ඇත. මීට අමතරව ස්ථානයේ නඩු බඩු ලේඛන අංක 1647/18 යටතේ රඳවා තිබූ DAD-2692 දරන ලොරි රථයට ද අලාභ සිදු කර ඇත.

මෙලෙස පොලිස් ස්ථානයට පහර දී අලාභහානි කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් තංගල්ල දිස්ත්‍රික් 1 සහකාර පොලිස් අධිකාරී එන්. සී. අතුල ද සිල්වා මහතාගේ අධීක්ෂණය යටතේ නිලධාරීන් කණ්ඩායම් 02ක් යොදවා විමර්ශන ආරම්භ කර ඇති අතර, පොලිස් ස්ථාන ගොඩනැඟිල්ලට හා රජයේ දේපළ වලට සිදුව ඇති අලාභයන් සම්බන්ධයෙන් කත්සේරු වාර්තා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇතත්, මෙතෙක් තක්සේරු වාර්තා ලැබී නොමැති අතර, තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසු සිද්ධිය සම්බන්ධයෙන් පොදු දේපළ පනත යටතේ ඉදිරි නීතිමය පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කරනු ඇත. මෙම සිද්ධියෙන් පසුව 2018.01.21 වන දිනද කතරගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති වානක අමිල් රංගන හා කතරගම ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් ජයතිලක ඇතුළු පිරිසකගේ ප්‍රධානත්වයෙන් පැය 10:00 පමණ සිට පැය 14:10 දක්වා කතරගම තිස්ස මාර්ගයේ පොලිසිය අසළ ඉන්ධන පිරවුම් හල අසළට රැස්වී උද්ඝෝෂණයක් පවත්වා අවසානයේ පොලිසියට ගල් මුල් ප්‍රහාර එල්ල කරන ලදි.

එම උද්ඝෝෂණය මැඩ පැවැත්වීම සඳහා පොලිසිය විසින් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ අතර, මෙහිදී කලහකාරී ලෙස හැසිරුණු පිරිමි සැකකරුවන් 45ක් හා කාන්තා සැකකාරියන් 13ක් වශයෙන් සැකකරුවන් 58දෙනකු සහ නඩු භාණ්ඩ වශයෙන් යතුරුපැදි 36ක්, ත්‍රී රෝද රථ 08ක්, පාපැදි 07ක් අත් අඩංගුවට ගෙන තිස්සමහාරාම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත් අඩංගුවට ගත් සැකකරුවන් එදිනම තිස්සමහාරාම මහෙස්ත්‍රාත් උසාවියේ නඩු අංක බීආර් 47413/18 යටතේ, පහත සඳහන් චෝදනා යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත.

1. ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 323 (රජයේ සේවකයකු තම යුතුකම ඉෂ්ට කිරීමෙන් වැළැක්වීම සඳහා කැමැත්තෙන්ම තුවාල සිදුකිරීම.)
2. ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 140 (නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වීම.)
3. ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 183 (නිල කටයුතු ඉටු කිරීමේදී රජයේ සේවකයකුට බාධා කිරීම.)
4. ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 314 (කැමැත්තෙන්ම තුවාල සිදුකිරීම.)
5. ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 344 (රජයේ සේවකයකුට සාපරාධී බලහත්කාරය පෑම.)
6. 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 55:1 වගන්තිය.

ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ සියලුම සැකකරුවන් එක් අයකුට රුපියල් 200,000/- බැගින් වූ ශරීර ඇප මත නිදහස් කර, පහත සඳහන් ඇප කොන්දේසි පනවා ඇත.

1. 2018.01.28වන ඉරු දින සිට සෑම මසකම අවසන් ඉරු දින පැය 09:00ත් 12:00ත් අතර කතරගම පොලිස් ස්ථානයේ පෙනී සිටීම;
2. මිය ගිය තැනැත්තාගේ මෘත දේහයේ අවසන් කටයුතු සිදු වන තෙක් කිසිදු කලහකාරී සිදුවීමක් ඇති නොවීමට වගබලා ගැනීම;
3. නැවත මෙලෙස කලහකාරී ලෙස හැසිරුණහොත් ඇප අවලංගු කර රක්ෂිත බන්ධනාගාරගත කරන බවට අවවාද කිරීම.

මෙම නඩුව නැවත නිස්සමහාරාම අධිකරණයේ 2018.02.07වන දින කැඳවීමට නියමිතව ඇති අතර, අත් අඩංගුවට ගත් සියලුම සැකකරුවන් ඇප මත නිදහස් කර ඇත.

02. 2018.01.21වන දින පැය 10:00ට කතරගම සම්බුද්ධ ජයන්ති විහාරස්ථානයේදී ප්‍රදේශයේ ආගමික නායකයන්, ප්‍රභූවරුන්, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක කමිටු සාමාජිකයන් කැඳවා සාකච්ඡාවක් පැවැත්වූ අතර, පොලිස් නිලධාරියා විසින් සිදු කළ වෙඩි තැබීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන හෙයින්, ප්‍රදේශයේ සාමය ආරක්ෂා කිරීමට සියලුදෙනාගේම සහාය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එහිදී මෙම ප්‍රශ්නය සාමකාමීව විසඳා ගැනීමට සියලුම පාර්ශ්වයන් එකඟතාව පළ කළ අතර, ඉන් අනතුරුව කිසිදු මහජන කැළඹීමක් ඇති නොවීය.

03. මෙවැනි අවාසනාවන්ත සිදුවීම් වැළැක්වීම සඳහා ඉදිරියේදී පොලිස්පතිවරයා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට අමාත්‍යාංශ නිවේදනය, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දමිළ මාධ්‍ය තාක්ෂණ නිලධාරීන්ගේ හිඟකම : ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வளிமண்டலவியல் திணைக்களத்தில் தமிழ்மொழிமூல தொழில்நுட்ப உத்தியோகத்தர்களின் பற்றாக்குறை: அனர்த்த முகாமைத்துவ அமைச்சரின் கூற்று

SCARCITY OF TAMIL MEDIUM TECHNICAL OFFICERS IN DEPARTMENT OF METEOROLOGY: STATEMENT BY MINISTER OF DISASTER MANAGEMENT

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, 2017.12.07 වැනි දින ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ අසා තිබෙන ප්‍රශ්නයට අනුව, "මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් දෙමළ නිලධාරීන් පත් කිරීමටත්, කාලගුණ වෙනස්වීම් පිළිබඳව සැනින් අවණ්ඩව විස්තර ලබා දීමටත්, ඉහත දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ තොරතුරු විධිමත් කිරීමටත් ක්‍රියා කළ හැකිද, ක්‍රියාමාර්ග ගන්නේ කවදාද යන්න පැහැදිලි කළ හැකිද?" කියා විමසා තිබෙනවා.

ගරු කථානායකතුමනි, දිස්ත්‍රික්ක 25 සඳහා දවසට දෙවරක් (උදෑසන 05.30ට සහ දහවල් 12.00ට) විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වෙත මහජනතාව සඳහා දෙමළ භාෂාවෙන් කාලගුණ අනාවැකි නිකුත් කිරීම සඳහා 2017 සැප්තැම්බර් 01 වැනිදා සිට විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලද නමුත්, විවිධ හේතු නිසා එය නිසියාකාරව ක්‍රියාත්මක කළ නොහැකි විය.

අයහපත් කාලගුණ තත්ත්වයන් පිළිබඳ අනතුරු ඇඟවීම අවශ්‍ය ස්ථානයට විස්තර සහිතව ඕනෑම මොහොතක නිකුත් කිරීමට ඇති අපහසුතාව තරමක් දුරට අඩු කිරීමට රූපමය ආකාරයට එය ඉදිරිපත් කිරීමට මේ වන විට කටයුතු යොදා ඇත.

දෙමළ භාෂාවෙන් අනාවැකි වෙබ් පිටුව මහින් යාවත්කාලීන කිරීමට දැනට දෙපාර්තමේන්තුව සතුව පවතින සීමිත සම්පත් යොදා ගනිමින් උපරිම ආකාරයෙන් සිදු කරමින් පවතී.

මෙහිදී පැය 24 තුළම රාජකාරි කළ යුතු බැවින් භාෂා පරිවර්තකවරුන්ද සේවා මුර රාජකාරියක නියුතු විය යුතුය. ඒ සඳහා අවම වශයෙන් 4 දෙනෙක්වත් සේවය කළ යුතුය.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් දෙමළ භාෂා පරිවර්තක නිලධාරීන් ඉල්ලා දිගින් දිගට කරන ලද ඉල්ලීමට අනුව මෙම බලවත් අවශ්‍යතාව සලකා එම දෙපාර්තමේන්තුව තාවකාලිකව (2017.12.20 දින සිට) පමණක් දෙමළ භාෂා පරිවර්තක මහතකු අනුයුක්ත කර ඇත. 2017.12.21 දින සිට එම මහත්මා විසින් සතියේ දිනවල පමණක් පරිවර්තන කටයුතු කරනු ලබයි.

එම දෙපාර්තමේන්තුව සතුවද නිලධාරීන් ප්‍රමාණවත් නොමැති හෙයින්, පරිවර්තක නිලධාරීන්ගේ සංචිතයෙන් සේවය ලබා ගන්නා ලෙසද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව යෝජනා කර ඇත. එලෙස හෝ ලබා ගෙන මෙම පරිවර්තන කටයුතු නොකඩවා කරගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. නමුත් අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම දවසේ ඕනෑම වේලාවකදී එනම් රාත්‍රී සහ සති අන්තවලදීද, නිකුත් කිරීමට සිදු වේ. එවිට දිවා රාත්‍රී මුර සඳහා භාෂා පරිවර්තකයකු යෙදිය යුතුය. ස්ථිර විසඳුමක් ලෙස දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු දෙමළ භාෂා පරිවර්තක තනතුරු කඩිනමින් ස්ථිරවම පිරවීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ කටයුතු කර ඇත. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු දුමින්ද දිසානායක මහතා - [*සභා ගර්භය තුළ නැත.*]

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, I will finish this and give you the Floor later.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament, and the motions agreed to by Parliament on 08.03.2016, the Parliament shall sit on Monday, February 19 , 2018 and the hours of sitting of Parliament this day shall be 10.00 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.00 a.m. on Monday, February 19, 2018. "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මැතිතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, it was before the days' Business started that I wanted to raise this point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is it about?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
As you are quite well aware, Sir, either under Personal Explanations or Questions of Privilege which come under Standing Order No. 19, I gave you a document.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Subsequently, you spoke to me and said that it does not fall within both. I do not understand as to how this Parliament does not provide its Members an opportunity to explain when their privileges are impacted. I have been very clearly, emphatically mentioning that I would be making a statement today and on that basis, it was known what was the reason for. I have given a very detailed statement to you. So, I am lost for an answer. After 24 years in Parliament, I see an absolute case of injustice that is being meted out. On the preliminary basis, I must be told as to why it is not considered and the answer that was given was a flimsy answer. Apparently, that is what your staff has mentioned. So, I am ready to read out my statement on Privileges and I would greatly appreciate if you could give me the opportunity to go forward.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙම කරුණ සම්බන්ධයෙන් අද උදේ මම ඔබතුමාට පැහැදිලි කළා. ඒක ඔබතුමා කියූ පරිදි, it does not fall within Questions of Privilege or Personal Explanations. It is very clear. ඒ හේතුව නිසායි අපි කිව්වේ අද දවසේ ඒක දෙන්න අමාරුයි කියලා. ඒක වෙන අවස්ථාවක ගන්න පුළුවන්. කොහොම වුණත් එම කරුණ ගැන අද - [බාධා කිරීමක්] නැකැත්භාවයක් නොවෙයි. ඔබතුමාගේ ජොෂ්ඨත්වයට අපි ගෞරව කරනවා. නමුත් පාර්ලිමේන්තුවේ Standing Orders අනුව - ඔබතුමා ඉල්ලුවේ Privilege matter එකක් වශයෙන් - it does not fall within Questions of Privilege.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිලධාරී මණ්ඩලයට ඒක කොයි ආකාරයෙන් වුණත් පාවිච්චි කරන්න පුළුවන්. ආණ්ඩුවල පාට වෙනස් වුණාම නීන්දු වෙනස් වෙන්න බැහැ නේ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ මල්ලි සම්බන්ධව 2014 ඔක්තෝබර් මාසයේ මෙතැන වරප්‍රසාද ප්‍රශ්නයක් මතු වුණා. එවලේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ මල්ලි ගැන කථා කරන්න පුළුවන් වුණා. මම වැනි පාර්ලිමේන්තුවේ අවුරුදු 24ක් හිටපු මන්ත්‍රීවරයෙකුට එම වරප්‍රසාදය ලබා ගැනීමට බැරි වෙන්නේ ඇයි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙය පාර්ලිමේන්තුවෙන් පිටත වුණු සිදුවීමක්. මම ඔබතුමාට දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කළා. එම නිසා මේ ගැන දීර්ඝ වශයෙන් විවාද කරන්න අමාරුයි. මම ඔබතුමාට කරුණු පැහැදිලි කරලා දුන්නා. පාර්ලිමේන්තුවේ තීරණය පිළිගන්න කියලා මම ඔබතුමාගෙන් බොහොම කරුණාවෙන්, ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කියන්න Privileges අනුව, මට කථා කරන්න බැරි අවස්ථාවක් තිබෙන්නේ කොතැනද කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, it does not come within Questions of Privilege.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොතැනද එහෙම එන්නේ නැත්තේ කියලා මට කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is all. That is the explanation I can give you.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි මේ යහ පාලනය ගෙනාවේ දේශපාලනය කරන්න නොවෙයි. මම යහ පාලනය ගෙනාපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අකුරටම කටයුතු කරනවා. අපි ආදර්ශයෙන් ක්‍රියා කරලා තිබෙනවා කියලා ඔබතුමා දන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද Bonds issue එක ගැන කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක මුවාවෙන් වෙන දේවල් වෙන්න ඉඩ දෙන්න බැහැ. මම අහනවා මේක මීට පෙර precedence එකක් යටතේ, 2014 ඔක්තෝබර් මාසයේ පළමුවැනි සතියේ පාර්ලිමේන්තු රැස්වීම් පැවැති දිනකදී මහින්දානන්ද අලුත්ගමගේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන සොයා බලන්නම්. මට දැන් ඒ ගැන මතක නැහැ.

නමුත් මේ කරුණ සම්බන්ධයෙන් මේ අවස්ථාවේ ඉඩක් ලබා දෙන්න මට අමාරුයි, ගරු මන්ත්‍රීතුමනි. කනගාටුවෙන් වුණත් මට ඒ ගැන කියන්න වෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, Right to Information Act එක යටතේ රුපියල් 5,000ක් දීලා පොතකුත් ලබා ගත්තා. ඒ ගත්ත පොත මට මෙතැන කියවන්න බැරි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කියන්නේ ඒකට අවස්ථාව අද නොවෙයි කියන එකයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක මට අවශ්‍ය නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට අවස්ථාව අද නොවෙයි. අපි Bonds පිළිබඳ විවාදය යම් දවසක ගනිමු.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, you have to protect our rights.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Of course. Definitely, I am doing that.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, you must listen to what we are saying.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, I am fully listening to you; I respect you. But today is not the opportune time and I cannot allow you to make that statement under Standing Orders.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I very respectfully and humbly ask you, where does it not fall within the purview of Privileges? If you tell me which page and what substance, I will eradicate that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It will not fall within the issue of Privileges. That is the reason.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Does it affect me only?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You wanted it to come under Privileges.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
No, I did not write it under Privileges. I had it open.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
But your letter clearly states that it is a Privilege issue. මට ලියා තිබෙන්නේ "Privilege issue" කියලා. අද ඒක කරන්න අමාරුයි. මම ඔබතුමාට ඒ සම්බන්ධව කිහිපවිටක්ම පහදා දුන්නා. අපිට මේ ගැන පැය ගණන් argue කරන්න පුළුවන්. නමුත් Standing Orders තුළ මට මේක දිගටම allow කරන්න අමාරුයි. මම හිතනවා ඔබතුමා ඒක පිළිගනියි කියලා.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඒක පිළිගන්නා නිසා, මේ වාගේ හැම වේලාවේම නම්‍යශීලිව ඉන්නා නිසා තමයි මෙහෙම වෙන්නේ. දරදඬු මතයෙන් ඉන්නවා නම්, අවස්ථාව දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ. එහෙම නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
එහෙම තමයි පාර්ලිමේන්තුවේ තිබෙන්නේ. පාර්ලිමේන්තුවේදී මට කියවන්න බැරි මේක -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව ලැබෙයි.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒ සඳහා මට මේ අවස්ථාව දුන්නේ නැත්නම්, මම මේකම ගෙන ගිහින් මාධ්‍යයට දෙනවා, මේක තමයි මට දුන්නේ; කියවන්න ගියේ කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක ඔබතුමාගේ අයිතියක්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මේ පාර්ලිමේන්තුවේදී අවස්ථාව දෙන්නේ නැති එක ගැන මම මුද්‍රිත සහ සියලු මධ්‍යයට කියනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒකට ඔබතුමාට පූර්ණ අයිතිය තිබෙනවා. නමුත් පාර්ලිමේන්තුව තුළ මට අද අවස්ථාවක් දෙන්න බැහැ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
එතකොට ජනතාවට දැන ගන්න පුළුවන්, මගේ වරප්‍රසාද කඩ කරලා පර්ලිමේන්තුවේ කථා කරන්න බැරි වීම ගැන.

මේ වාගේ කරන්න එපා, ගරු කථානායකතුමනි. මේ වාගේ දෙයක් ඔබතුමාගෙන් මම පිළිගන්නේ නැහැ. පසු ගිය ආණ්ඩු තුළ වුණත්, විපක්ෂයේ ඉන්නා මන්ත්‍රීවරුන්ට කථා කරන්න ඉඩ දුන්නා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ස්ථාවර නියෝග අනුවයි ක්‍රියා කරන්නේ. ස්ථාවර නියෝග අනුව අවශ්‍ය නීති උපදෙස් ගන්න ඕනෑ; මගේ නිලධාරීන් ගන්න ඕනෑ. නිලධාරීන්ට ඒකට දොස් කියලා වැඩක් නැහැ. එම වගකීම මම ගන්නවා. එම තීරණය ගැනීමේ වගකීම මගේයි. අවසානයේදී මගේ වගකීම මම -

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
"මම පාර්ලිමේන්තුවේදී කථා කළේ නැහැ. මම ගියේම කථා කරන්නයි." කියලා මම මේක ප්‍රසිද්ධ කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක ඔබතුමාට අයිති කාරණයක්. බොහොම ස්තුතියි. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ඉතාම වැදගත් ප්‍රකාශයක් මේ අවස්ථාවේදී කරනු ලැබුවා. එතුමාට තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ දැන ගන්නට ලැබුණු, බැදුම්කර කොමිසම හා සම්බන්ධ වැදගත් කරුණු ටිකක් තමයි එතුමා හෙළිදරව් කරන්න යන්නේ. එතුමා මේ කියන ප්‍රකාශය අනුව තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ලබා ගත්ත තොරතුරක් අපිටත් දැන ගන්න ලැබෙනවා නම්, ඒකට අවස්ථාව දීම සාධාරණයි කියලා තමයි අපි හිතන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි තීරණයක් ගත්තා. ස්ථාවර නියෝග යටතේ මට allow කරන්න බැහැ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
What is your point of Order, Hon. Member?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට පුදුම හිතුණා බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් මට එක පාරටම ආදරයක් ලැබීම සම්බන්ධයෙන්. මේ දක්වා චරිතය ඝාතනය කරලා, රුපියල් 2,500කට කවන්න හදලා, මා දෙමළ ද සිංහල ද ඉංග්‍රීසි ද කියා නොදන්නා පුද්ගලයෙක් මේ පාර්ලිමේන්තුවේදී මිනිත්තු තුනෙන් වෙනස් වෙලා දැන් අනුකම්පාවක් ඇති කරගෙන තිබෙනවා. එය මට ඔබතුමාගෙන් ලබා ගන්න ඕනෑ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මා එය අභිංසක ජනතාවගෙන් ලබා ගන්නවා. කොමිසමට ගිහින් සමාව ඉල්ලා එළියට ආ එකම මන්ත්‍රීවරයා බන්දුල ගුණවර්ධනයි. අපි ඒක දන්නවා. ඒවා මේ කොමිෂන් සභා වාර්තාවේ නැහැ. [බාධා කිරීම්] මා මේ අවස්ථාවේ කියන්නේ මෙයයි. අද එතුමාට කතා කරන්න වෙලාව දී තිබෙනවා නම් කරුණාකර ඒ වෙලාව මට දෙන්න. මා කතා කරන්නම් එතුමාගේ වෙලාවේදී වුණත්. [බාධා කිරීම්] මේ අවස්ථාවේ - [බාධා කිරීම්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඉල්ලාගෙන කනවා කියන්නේ ඔකට තමයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා ඔය නිකම් බොරුවට- [බාධා කිරීම්] අපට ඕනෑ සැබෑ තත්ත්වය ඇති කරන්නයි. ඒක තමයි හෙළිදරවු කරන්න හදන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 සිට 3 දක්වා, ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, today we are moving Item No. 1 only.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Are you not moving other two Items?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. අද ගන්නේ යෝජනා අංක 1 පමණයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
கடற்றொழில் (வெளிநாட்டு மீன்பிடி வள்ளங்களை ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம்
FISHERIES (REGULATION OF FOREIGN FISHING BOATS) (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.02]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවනවර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනතට සංශෝධනයක් එකතු කිරීමකුයි සිදු වන්නේ. පසු ගිය කාලය පුරාවටම විදේශීය ධීවර යාත්‍රා අපේ මුහුදු තීරයට ඇතුළු වී භාවිත කරන අනවසර පන්න ක්‍රමයන්ට, ඒ වාගේම අපේ මසුන් අල්ලා ගෙන යෑමට එරෙහිව පවතින නීති රීති ප්‍රමාණවත් නැති බව හැඟී ගිය හෙයින් මේ පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන කණ්ඩායම්, අපේ අමාත්‍යාංශයට අයිති ආයතන වාගේම මේ පිළිබඳව උනන්දුවක් දක්වන අනෙකුත් සියලු අංශවල අදහස් අරගෙන මම කමිටුවක් පත් කළා. ඒ කමිටුව මහින් නිර්දේශ ගණනාවක් ලබා දී තිබෙනවා. ඒ නිර්දේශ අනුව අපට මේ වෙලාවේ ගත හැකි ක්‍රියා මාර්ග කීපයක් පිළිබඳ ප්‍රධාන කාරණා කීපයක් කිව යුතු වනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ මුහුදු සීමාව තුළ ධීවර කර්මාන්තය කිරීම සම්බන්ධයෙන් අදාළ වන දඩ මුදල් වාගේම තිබෙන නීති රීති ප්‍රමාණවත් නැති නිසා විදේශීය ධීවරයන් නිරන්තරයෙන්ම එම කාර්යයන්ට ප්‍රවේශ වෙනවා. අපේ මුහුදු තීරයේ, ඒ වාගේම අනන්‍ය කලාපය තුළ සිදු කරන පන්න ක්‍රමය නිසා, අපට ලබා ගත හැකිව තිබෙන මත්ස්‍ය අස්වැන්නේ අඩුවීමක් ඇති වන හෙයින් ඒ සඳහා ප්‍රධාන අංශ කීපයක් කෙරේ අප අවධානය යොමු කරලා දැඩි නීති රීති පනවපු බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. රටක් විධියට ගත්තොත්, අපේ රට ධීවර ක්ෂේත්‍රයේ අද ලබා ගෙන තිබෙන ප්‍රගතිය තුළ, මේ තත්ත්වය තුළ, මේ නීති රීති වෙනස් කිරීම තුළ තවත් ඉස්සරහට යන්න පුළුවන් වේවි කියා මම විශ්වාස කරනවා.

විදේශීය ධීවර යාත්‍රා අපේ කලාපය තුළට ආවාම මූලිකව රුපියල් ලක්ෂ 15කට නොවැඩි දඩ මුදලක් අය කර ගන්න තමයි

[ගරු මහින්ද අමරවීර මහතා]

අපට බලය තිබුණේ. රුපියල් ලක්ෂ 15ක් කියන්නේ ඉතාම සුළු මුදලක්. මේ නිසා කිසිදු විදේශීය යාත්‍රාවකට අපේ කලාපය තුළට ඒමට බයක් තිබුණේ නැහැ; සැකයක් තිබුණේ නැහැ. වරින්වර ඇවිල්ලා, මේ කටයුතුවලට සම්බන්ධ වුණා. දැන් අපි රුපියල් ලක්ෂ 15ක උපරිමයක තිබූ දඩ මුදල වැඩි කරලා තිබෙනවා, අවමය රුපියල් ලක්ෂ 60 සිට රුපියල් ලක්ෂ 1,750 දක්වා. තව විධියකට ගත්තොත්, රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 175 දක්වා දඩ මුදල් අය කරන්න පුළුවන් විධියට අපි පනතට සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. මේ යාත්‍රා තමන්ගේ දැල් ආම්පන්න ගබඩා තුළ රඳවා ගන්නේ නැතුව ආවොත් මේ දඩයට අතිරේකව දඩයක් අය කරනවා. මීට පෙර තිබුණේ රුපියල් 750,000ක දඩයක්. ඒ දඩ මුදල අපි වැඩි කරලා තිබෙනවා, රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 150 දක්වා. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 40 සිට රුපියල් ලක්ෂ 1,500 දක්වා අපි ඒ දඩ මුදලත් වැඩි කරලා තිබෙනවා. ඉදිරියේදී විදේශීය යාත්‍රා ඇවිත් අපේ මුහුදු තීරයට ඇතුළු වුණොත් මේ දඩ මුදල් දෙකටම යටත් වෙන්න සිද්ධ වෙනවා. අපි දන්නවා, දැනටත් සමහර රටවලින් -මම නම් කියන්න යන්නේ නැහැ.- මේ සම්බන්ධව විරෝධතා දක්වා තිබෙන බව. මේ සම්බන්ධව ඒ රටවල විරෝධතා පවත්වා තිබෙනවා; පෙළපාළි ගිහිල්ලා තිබෙනවා; මගේ රුව සහිත පඹයන් හදා පුළුස්සා තිබෙනවා. නමුත් ඒ කිසිම දෙයක් අපට වැදගත් වන්නේ නැහැ. අපට වැදගත් වන්නේ අපේ ධීවර ජනතාව ආරක්ෂා කර ගැනීමයි. අපේ ධීවරයාට නිසි ආදායමක් ලබා දීම තමයි අපේ බලාපොරොත්තුව වන්නේ. වෙන රටවලට ඕනෑ විධියට අපේ රටේ නීතිරීති පනවන්න අපට පුළුවන්කමක් නැහැ. අනවසර කටයුත්තක් සිද්ධ වෙනවා නම්, ඒකට එරෙහිව අපි දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පියවර ගන්නවා කියන එකත් මම ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි. පසුගිය කාලයේ ධීවර ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති කරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම තව කාරණයක් එකතු කරන්න කැමැතියි. අපේ අනන්‍ය ආර්ථික කලාපය තුළදී සිදුවෙන කටයුතුවලටත් අපි වෙනම දඩ මුදල් පනවනවා. එහෙම මීට පෙර තිබුණේ නැහැ. ඒ අනුව රුපියල් මිලියන 10කට නොඅඩු සහ රුපියල් මිලියන 220කට නොවැඩි ඉතාම විශාල දඩයක් අපි පනවනවා, අපේ අනන්‍ය ආර්ථික කලාපයට විදේශීය යාත්‍රා ඇතුළු වුණොත්. ඒ වාගේම විදේශ යාත්‍රා ඇතුළු වෙලා මාළු ඇල්ලීමක් සිද්ධ කරන්න ඒ අයගේ ආම්පන්න ගබඩාවෙන් අරගෙන තිබුණොත් ඒකටත් වෙනම අතිරේක දඩයක් පනවනවා, රුපියල් මිලියන 5කට නොඅඩු සහ රුපියල් මිලියන 160ට නොවැඩි කියන දඩයක්.

සමහර වෙලාවට මේ දඩයේ ප්‍රමාණය අරගෙන බැලුවොත් සිය ගුණයකට වඩා වැඩි වෙන්න පුළුවන්. ඔව්, ඊටත් වඩා වැඩියි. නමුත්, අපට ඒකේ ප්‍රශ්නයක් පෙනෙන්නේ නැහැ. මොකද, නීත්‍යානුකූල නොවන දෙයකට අපි ඒ ආකාරයෙන් දඬුවම් ලබාදීම් පිළිබඳව කාටවත් විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. මේ සම්බන්ධව අපි අධිකරණ කටයුතුවලට යනවා. මේ බෝට්ටු, ආම්පන්න වැනි දේ රාජසන්තක කිරීමක් හෝ මේ අයට යම් ඇප ලබා දීමක් සිදුවෙනවා නම් ඒ කටයුතු සිදුවන්නේත් මහෙස්ත්‍රාත්වරුන් මාර්ගයෙනුයි. කිසිම රාජ්‍ය මැදිහත්වීමකින් මේ අයට නිදහස් වෙන්න තිබෙන අවස්ථා අපි අත්හිටුවලා තිබෙනවා.

මම දන්නවා, මෙම පනත් කෙටුම්පත පිළිබඳව අද අපේ රටට වැඩිය වෙනත් රටවල් විශේෂ උනන්දුවක් දක්වනවා; බලා ඉන්නවා කියලා. අපට ඒ අය යම් යම් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපට අපේ රට වාගේ 8 ගුණයක මුහුදු තීරයේ අයිතිය තිබෙනවා; ජාත්‍යන්තර මුහුදේ අයිතිය තිබෙනවා; අභ්‍යන්තර ජලාශ 10,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා; කළපු 116ක් මේ රට තුළ තිබෙනවා. නමුත්, මේ රටට තවමත් මාළු, උම්බලකඩ, කරවල, ටින්මාළු, හාල්මැස්සන් විශාල ප්‍රමාණයක් ගෙන්වනවා. මේ ආනයනික ප්‍රමාණය අඩු කර ගන්න අපි දැවැන්ත උත්සාහයක් දරනවා. ඒකට ගත් එක ක්‍රියාමාර්ගයක් තමයි, අද මේ පනත් කෙටුම්පත මඟින් දඩ මුදල් වැඩි කිරීම සිදු කරන්නේ කියන එක මම සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම මත්ස්‍ය ආනයනය අඩු කරලා අපනයනය වැඩි කළ හැකි තවත් ක්‍රියාමාර්ග රාශියකට අපි යනවා.

මම ඔබතුමාට සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි, මේ රජය බලයට පත් වුණාට පසුව අපි ලබපු පළමුවෙනි ආර්ථික ජයග්‍රහණය තමයි යුරෝපා වෙළෙඳ පොළේ අපේ මත්ස්‍ය අපනයනය සම්බන්ධයෙන් තිබුණු තහනම ඉවත් කර ගැනීම. ඊට අතිරේකව, GSP තහනම ඉවත් කර ගැනීම හරහා අද ධීවර ක්ෂේත්‍රයට විශාල වාසි එන්න පටන් ගෙන තිබෙනවා. මේ මත්ස්‍ය කර්මාන්තය තුළ 2016ට සාපේක්ෂව 2017 වර්ෂයේ අපනයනය වැඩිවීම සියයට 44ක් වෙලා තිබෙනවා. මේ අවුරුද්දේදී අප ඉලක්ක කරනවා, ඊටත් වඩා එහාට මේ ප්‍රමාණය ළඟා කර ගන්න පුළුවන්කම ලැබෙයි කියලා. එහිදී මුහුදෙන් ලබා ගන්නා මත්ස්‍ය අස්වැන්න වාගේම, අභ්‍යන්තර ජලාශවල මසුන් වගා කිරීම තුළින් වැඩි ආදායමක් ලබා ගැනීමත් අපේ බලාපොරොත්තුවක් බවට පත් වෙනවා.

ධීවර අංශයේ ව්‍යාප්ත කිරීම සඳහා ධීවර වගා කලාප තුනක් එනම් අභ්‍යන්තර කර්මාන්ත පුර - Aquaculture Industrial Parks - තුනක් අපි දැනටමත් සැලසුම් කරලා තිබෙනවා. අපි ඒවාත් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි දැනටමත් උතුරු ප්‍රදේශයේ ඉඩම් වෙන් කර ගෙන තිබෙනවා. අපි ඉදිරියේදී, කෙටි කාලයක් තුළ, ඒ කටයුත්ත සිදු කරනවා. අපි පසුගිය අවුරුද්දේ මන්නාරම ප්‍රදේශයේ එම ව්‍යාපෘතිය පටන් ගන්න ගියා. එහිදී අපට ගැටලුවක් ඇති වුණා. අපට වනජීවී අංශයෙන් යම් යම් බාධා එල්ල වුණා. දැන් ඒවා නිරාකරණය වෙලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ බලාපොරොත්තු වනවා, අක්කර 3,000ක ජලජීවී වගා කර්මාන්ත පුරයක් ආරම්භ කරන්න. ඒ වාගේම මඩකළපුවේත් මෙවන් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා. අපි ඒ සඳහා 2015, 2016 ඉඳලා උත්සාහ දරනවා. නමුත්, එම ප්‍රදේශයේ එක කොටසක විරෝධතාව මත ඒ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යම් පසුබෑමක් තිබෙනවා. ඒ ව්‍යාපෘතිය මහා පරිමාණයෙන් නොවුණත්, කුඩාවට පටන් ගන්න දැන් යම් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව අපි කටයුතු කරනවා.

අපි මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ Crab City එකක් පටන් ගෙන තිබෙනවා. ලංකාවේ පළමුවැනි Crab City එක තමයි අපි හම්බන්තොට පටන් ගෙන තිබෙන්නේ. දෙවැනි එකත් අපි මේ අවුරුද්දේ පටන් ගන්නවා. මේ සෑම ව්‍යාපෘතියක් තුළින්ම අපි බලාපොරොත්තු වන්නේ, විශාල මත්ස්‍ය අස්වැන්නක් ඇති කර ගැනීම සහ අපනයනය කිරීම සඳහා මසුන් නිෂ්පාදනය කිරීමයි.

ගරු කථානායකතුමනි, දැන් අපේ මත්ස්‍ය අපනයනයට හිමි වෙලා තිබෙන්නේ අපනයන ක්ෂේත්‍රයේ 12වැනි තැනයි. අපි පසුගිය අවුරුද්ද වන කොට 11වැනි ස්ථානයට ආවා. ලංකාවේ අනෙකුත් අපනයන අංශවලින් ඉස්සරහට ඇවිල්ලා 2020 වන කොට මෙම ක්ෂේත්‍රය 3වැනි තැනට ගෙනෙන එක තමයි අපේ ඉලක්කය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ සඳහා අපි දැඩි උත්සාහයක් දරනවා. මෙය අසීරු ඉලක්කයක් බව අපි පිළිගන්නවා; මෙය අමාරු දෙයක් බව අපි පිළිගන්නවා. නමුත්, එය සාර්ථක කර ගැනීම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කරනවා. මෙයට එන බාධා අවම කර ගත්තොත්, විවිධ අංශවලින් ලැබෙන අනුමැතියන් අපට කඩිනම් කර ගන්න පුළුවන්කම

ලැබුණොත් අපට මේ ඉලක්කය පහසුවෙන් ළඟා කර ගන්න පුළුවන්කම ලැබෙනවා. දැනටමත් අපි විදේශ මත්ස්‍ය වෙළෙඳ පොළේ අපට හිමි තැන කරා කෙමෙන් ළඟා වෙමින් පවතිනවා. විදේශ වෙළෙඳ පොළේ, විශේෂයෙන්ම යුරෝපා මත්ස්‍ය වෙළෙඳ පොළේ තීරකයා බවට අතීතයේදී පත් වෙලා තිබුණේ, ශ්‍රී ලංකාව. නමුත්, ඒ තැන පසුගිය කාලයේ මාලදිවයිනට ලැබිලා තිබෙනවා. නැවතත් අපි -ලංකාව- ඒ තීරකයා බවට පත් වෙන්න ක්‍රමානුකූලව උත්සාහ දරනවා. 2019 පමණ වන විට අපට ඒ තත්ත්වය ළඟා කර ගන්න පුළුවන් වෙයි කියලා මට විශ්වාසයක් තිබෙනවා. ඒ සඳහා අපි දැනටමත් වැඩසටහන් රාශියක් ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ කළපු 116ක් තිබෙනවා. මේ කළපු 116 සංවර්ධනය කිරීම සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් සකස් වෙලා තිබුණේ නැති බව මම ඔබතුමාට සඳහන් කරන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ අපි අපේ අමාත්‍යාංශයේ වෙනම කළපු සංවර්ධන අංශයක් පටන් ගත්තා. මම සතුටු වෙනවා, මේ වතාවේ මුදල් ඇමතිතුමා අපට රුපියල් මිලියන 1,000ක මූල්‍ය ප්‍රතිපාදන කළපු සංවර්ධනය කිරීම සඳහා ලබා දී තිබීම ගැන. අපි පළමුව කළපු 10ක් හඳුනා ගෙන තිබෙනවා. මුළු කළපු සංඛ්‍යාවම වුණත් සංවර්ධනය කරන්න මුදල් ප්‍රතිපාදන ලබා දීම සඳහා මුදල් ඇමතිතුමාත්, මුදල් අමාත්‍යාංශයත් එකඟතාව පළ කරලා තිබෙනවා. අපේ ධාරිතාව අනුව, අපට ඉන්න සේවකයින් සංඛ්‍යාව අනුව ලබන අවුරුද්ද වන විට වෙනම අංශයක් මඟින් මේ කාර්යය ක්‍රමානුකූලව, මීට වඩා ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමටයි අපි බලාපොරොත්තු වෙන්නේ. අපි මේ කළපු 116 සංවර්ධනය කර ගත්තොත්, අපේ අභ්‍යන්තර ජලාශවලට අවශ්‍ය සම්පූර්ණ මසුන් ප්‍රමාණය ඒ ජලාශවල තැන්පත් කරන්න ගත්තොත්, මුහුදේ මසුන් අල්ලා ගන්න තිබෙන බාධක ඉවත් කර ගත්තොත්, 2020 වසර වන විට අනිවාර්යයෙන්ම ලංකාවේ තුන්වන ස්ථානයට අපනයන ආදායම ලබන කර්මාන්තය බවට ධීවර කර්මාන්තය පත් කර ගැනීමේ ඉලක්කය පහසුවෙන් ළඟා කර ගන්නට අපට පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන ධීවරයින් වෙනුවෙන් නවීන තාක්ෂණය හඳුන්වා දීම අපි දැනටමත් පටන් ගෙන තිබෙනවා. අලුත් තාක්ෂණය සහිත ලොකු ප්‍රමාණයේ බෝට්ටු සකස් කර ගැනීම සඳහා අපි සියයට 50ක සහනාධාරයක් දීම ආරම්භ කළා. මූල්‍යමය වශයෙන් මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය තවත් පොඩ්ඩක් වැඩි කරලා, ඊටත් වඩා පහසුකම් සහිත බෝට්ටු මුහුදට යැවීම සඳහා -සියයට 50ක මූල්‍යමය ආධාරයක් සහිතව- ධීවරයින් පොළඹවන්න අපි කටයුතු කරනවා. මොකද, අද අපි ගෙනෙන ධීවර සම්පතෙන් සියයට 40ක් නාස්ති වෙනවා. අපේ පසු අස්වනු තාක්ෂණයේ තිබෙන දුර්වලකම් නිසා අපි මුහුදෙන් අල්ලාගෙන එන මාළු ප්‍රමාණයෙන් සියයට 40ක් මාළු විධියට පරිභෝජනය වෙන්නේ නැහැ. ඒක මහා අපරාධයක්. මුහුදටත් නැහැ, අපටත් නැහැ. ඒ තත්ත්වය වෙනස් කරන්න තමයි අපි මේ නවීන තාක්ෂණය හඳුන්වා දෙන්නේ. ඒ හරහා අපේ ධීවරයින් ගෙනෙන මාළු ප්‍රමාණයෙන් අඩුම ගණනේ සියයට 90ක්වත් මාළු විධියට පරිභෝජනය කරන්නත්, අපනයනය සඳහා යොදා ගන්නත් පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ධීවරයින්ට නවීන පන්නයේ බෝට්ටු ලබා දීමට විතරක් නොවෙයි, තිබෙන බෝට්ටු නවීකරණය කර ගැනීම සඳහාත් සියයට 50 සහනාධාර ක්‍රමයක් මත ඒ අයට මූල්‍ය සහයෝගයක්, ආධාරයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අද වන විට අපේ අමාත්‍යාංශයේ හැම ක්ෂේත්‍රයක්ම ඉදිරියට ඇවිල්ලා තිබෙන බව මම කියන්න කැමැතියි. අපනයන ක්ෂේත්‍රයෙන් අපි ඉදිරියට යනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ පාඩුවට තිබුණු ආයතනවලින් අද ලාභ එන්න පටන් ගෙන තිබෙනවා. ඒ අනුව අවුරුදු ගණනාවක් පාඩු පිට තිබුණු ලංකා ධීවර සංස්ථාවෙන් දැන් ලාභ එන්න පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම Cey-Nor Foundation Limited එක බෝට්ටු නිෂ්පාදනය වැඩි කරලා ස්ථිර තැන්පතුවක් වශයෙන් තබා ගන්න පුළුවන් මට්ටමට දැන් ඇවිල්ලා තිබෙනවා. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ඉහළ ප්‍රගතියක් අපි අත් කර ගෙන තිබෙනවා. අපි ජලජීවී අංශය ව්‍යාප්ත කරලා ඉහළ කළමනාකාරිත්වය තුළින් මත්ස්‍ය අස්වැන්න වැඩි කර ගෙන තිබෙනවා. ඒ වාගේම මසුන් තැන්පත් කිරීමත් අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම නාරා ආයතනය විවිධ පර්යේෂණ මඟින් ලොකු කාර්ය භාරයක් සිදු කරනවා, ඒ අංශය වඩා ප්‍රචලිත කරන්න. මේ සියල්ල දිහා බැලුවාම අපට පුළුවන්කම ලැබෙනවා, අපේ ඉලක්ක කරා ළඟා වන්න. ඒ අතර අපට යම් යම් චෝදනාත් එල්ල වනවා.

පසුගිය කාලයේ අපට කිව්වා, ලංකාවේ තිබෙන වරායන් ටික විකුණන්න යනවා කියලා. මම තමුන්නාන්සේලාට ඉතාමත් පැහැදිලිව හා ඉතාමත් වග කීමෙන් කියනවා, ලංකාවේ තිබෙන කිසිදු ධීවර වරායක් කිසිදු විදේශයකට හෝ කිසිදු දේශීය කෙනෙකුට විකුණන්න අපි කටයුතු කරන්නේ නැහැයි කියන එක. ඒ වාගේම වරායන්වල ප්‍රයෝජනයට නොගන්නා සම්පත් තිබෙනවා නම්, අපි ඒවා ප්‍රයෝජනයට ගන්නත් කටයුතු කරනවා. ඊට අදාළ කැබිනට් පත්‍රිකාව උපයෝගී කර ගෙන තමයි මේ වැරදි ප්‍රචාරය ගියේ. වරායට එන රළ මඟින් විදුලිය නිෂ්පාදනය කිරීමේ කටයුත්ත ගැන සාකච්ඡා කරන්න අදත් අපි කණ්ඩායමක් මුණ ගැසුණා. මම හිතන්නේ නැහැ, ඒකට කවුරුවත් විරුද්ධ වෙයි කියලා. ඒකට අවශ්‍ය අනුමැතිය අපි ලබා දෙනවා. ඒ වාගේම වරායන් තුළ තිබෙන ඉඩම් ප්‍රයෝජනයට අරගෙන කවුරු හරි මාළු සැකසුම් මධ්‍යස්ථානයක් හදන්න යනවා නම්, එහෙම නැත්නම් ශීතාගාරයක් හදන්න යනවා නම්, අපි හවුල් ආයෝජනයක් විධියට ඒකත් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම මත්ස්‍ය ක්‍රීඩාවලට - sportfishingවලට- කවුරු හරි යෙදෙන්න බලාපොරොත්තු වනවා නම්, ඒකට අපි බද්ධ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට අදාළ දේවල් සිද්ධ වනවා නම්, අපි ඒවාත් ක්‍රියාත්මක කරනවා. හැබැයි, ඒ සියලු දේවල් ක්‍රියාත්මක කරන්නේ ධීවරයාගේ කැමැත්ත මතයි. එසේ නැතිව ධීවරයා විරුද්ධ වන කිසිම කටයුත්තක් අපි කරන්නේ නැහැ. ධීවර ජනතාවත් එක්ක සමීපව මිසක් ධීවර ජනතාවට පටහැනිව, ඒ අයගේ විරෝධතාව මත ඒ කිසිම දෙයක් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල සමහර අංශවල websitesවලින් ආපසු ප්‍රචාරයක් ගියා, ලංකා ධීවර සංස්ථාව කොරියානු සමාගමකට දෙනවා කියලා. මේක සම්පූර්ණ පට්ටපල් බොරුවක්. කිසිදු ආකාරයකින් එවැනි සිද්ධියක් ඇති වන්නේ නැහැ. පාඩු ලබපු ලංකා ධීවර සංස්ථාවට යෝජනාවක් ආවා, පෞද්ගලීකරණය කරන්න කියලා. එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාර්ග ගන්න කියලා. නමුත්, අපි ඒ කිසිම දෙයක් නොකර ධීවර සංස්ථාව ලාභ ලබන මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. අද ලාභ ලබන ධීවර සංස්ථාව කිසිදු ආකාරයකට වෙනත් රටකට හෝ අපේ රටේ පෞද්ගලික අංශයට ලබා දීමට සූදානමක් නැහැ.

අපි හෙට අනිද්දාට පුවත් පත් මඟින් ප්‍රසිද්ධ කරන්නට බලාපොරොත්තු වෙනවා ධීවර සංස්ථාවේ විධිමත් ක්‍රමවේදය සහිතව, -ධීවර සංස්ථාව මාළු ආනයනය කරන්නේත් නැහැ, ධීවර සංස්ථාව මාළු අපනයනය කරන්නේත් නැහැ- අපේ ඉඩ කඩම් ප්‍රයෝජනයට අරගෙන කටයුතු කරන්නට කවුරුන් හෝ ඉදිරිපත් වෙනවා නම් අපි එවැනි බද්ධ ව්‍යාපාර පටන් ගන්නට අවසර දෙන බවට. අපි තවම කිසිම කෙනෙක් තෝරාගෙන නැහැ. එවැනි ක්‍රියාමාර්ග ගන්නවා මිස මාළු මිලදී ගැනීම්, මාළු අලෙවි කිරීම් ආදී සියල්ලම රජය, -ධීවර සංස්ථාව- මඟින් තමයි සිදු කරන්නේ. ඒ

[ගරු මහින්ද අමරවීර මහතා]

තුළින් ධීවර ජනතාවට වාසියක් වන ආකාරයෙන් ඉහළ මිලකට මාළු මිලදී ගන්නත්, ධීවර පාරිභෝගිකයාට සාධාරණ මිලකට හොඳ තත්ත්වයේ මාළු ලබා දෙන්නත් අපි කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, අපේ ධීවර සංස්ථාවට යම් අපකීර්තිමත් කාල පරිච්ඡේදයක් ඇති වුණු බව අපි දන්නවා. මීට පෙර මේ පාර්ලිමේන්තුවට මාළු සැපයුවේ ධීවර සංස්ථාව. පසු කාලීනව ඒ මාළු සැපයීම වෙන කෙනෙකුට ලබා දීලා තිබුණා. අපි ඒකට විරුද්ධව ඔබතුමාට පැමිණිලි කළේ නැහැ. පාර්ලිමේන්තුවට මාළු දීමෙන් අපට ලාභයක් ලැබුණා. දැන් අපට ඒ ලාභයත් නැහැ. ඒ වාගේම විදේශ යාත්‍රාවලින් අපට මාස්පතා මිලියන 35ක් ලැබුණා, විදේශ යාත්‍රා එන විට. අපි ඒකත් සම්පූර්ණයෙන් නැවැත්වූවා. ඒකත් නවත්වලා, රාජ්‍ය ආයතනවලින් එන ආදායමත් නැතිව තමයි අද අපි ධීවර සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කරලා තිබෙන්නේ. ලාභ ලබමින් පවත්වාගෙන යන විට යම් යම් ප්‍රශ්න ඇති වෙන බව අපි දන්නවා.

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායක් විධියට වෙනදා දෙසැම්බර් මාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාට මාළු පෙට්ටි 225ක් වෙන් කළා. ඒ වාගේම මම දන්නා විධියට පාර්ලිමේන්තුවේ නිලධාරීන්ටත් යම් ප්‍රමාණයක් ලබා දුන්නා. ඒ විධියට සාමාන්‍යයෙන් මාළු පෙට්ටි 1,000ක් විතර අවුරුද්ද අගදී පාර්ලිමේන්තුවට ලබා දීමේ සම්ප්‍රදායක් තිබුණා. ඒක අවුරුදු 20ක විතර සිට තිබුණු සම්ප්‍රදායක්. නමුත් මට කනගාටුවෙන් වුණත් ඒ කාර්යය නතර කරන්නට සිද්ධ වුණා. ඒ වාගේම ධීවර සංස්ථාවට දන්සලක්, පෙරහැරක් සම්බන්ධයෙන් ඉල්ලීමක් ආවාම මාළු කිලෝ සීයක්, දෙසීයක්, තුන්සීයක් නොමිලයේ දෙන ක්‍රමවේදයක් තිබුණා. මම ඒක සම්පූර්ණයෙන් නතර කළා. මොකද නතර කළේ? අපේ සංස්ථාවේ තත්ත්වය යහපත් මට්ටමකට ගේන්නයි. ඒකට මට චෝදනා එල්ල වුණා. අපේ ස්වාමීන් වහන්සේ කෙනෙක්ම චෝදනා කළා, ඇමති ධුරයට බෞද්ධයෙක් ඇවිල්ලාවත් පන්සලේ කටයුත්තකට මාළු ටිකක් දෙන්න කටයුතු කළේ නැහැයි කියලා. නමුත් මට ඕනෑ වුණේ මුලින්ම මේ සංස්ථාව හොඳ තත්ත්වයකට ගේන්න: ලාභදායී මට්ටමකට ගේන්න. මොකද, මේ සංස්ථාව විකුණන්නට තිබෙන අවදානමෙන් බේරා ගන්නට. ඒ තත්ත්වයට ගෙනැල්ලා ජනතාවට බරක් නොවන, රජයට බරක් නොවන ආයතනයක් බවට ධීවර සංස්ථාව පත් කර ගැනීම තමයි අපේ අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි මේ අවුරුද්දේ රට පුරා ධීවර ක්ෂේත්‍රයට විශාල ආයෝජනයක් කරනවා. වරායවල් ගණනාවක් අලුතින් හදනවා. උතුරේ මන්ත්‍රීවරු නිරන්තරයෙන්ම අපට කියන කථාවක් තමයි, උතුරට සාමය ඇති වුණාට එහි වාසිය ධීවරයාට ලැබුණේ නැහැ කියලා. මම එය සියයට 100ක් පිළිගන්නවා. ඒකට හේතු කිහිපයක් තිබෙනවා. එකක් තමයි ඉන්දියානු ධීවරයින්ගේ ගැටලුව. අපි දැන් ඒ ගැටලුව විසඳාගෙන යනවා. මේ වෙනකොට සෑහෙන මට්ටමකට විසඳලා තිබෙනවා. මේ අවුරුද්ද අග වෙන්න ඉස්සෙල්ලා අපට එම ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකින් විසඳාගන්න පුළුවන් තත්ත්වයක් දැන් ළඟාවෙමින් පවතිනවා.

අනික් කාරණය තමයි, උතුරේ ධීවරයින්ට තිබෙන්නේ පරණ බෝට්ටු වීම. ඒ අයට මුහුදු යන්න නවීන තාක්ෂණය නැහැ. මීට අවුරුදු 15කට ඉස්සෙල්ලා දකුණේ පාවිච්චි කරපු ක්‍රමවේදයන් තමයි දැන් උතුරේ තිබෙන්නේ. මේ සම්පත් සඳහා අපට උතුරට සහනාධාරයක් ලබාදෙන්න බැරි වුණා. ගිය අවුරුද්දේ මම ඒ සඳහා ලොකු උත්සාහයක් දැරුවා. නමුත් කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. ඒ අයට තාක්ෂණය පිළිබඳව තවමත් ලොකු අවබෝධයක් නැහැ. අපි ඉදිරි කාලයේදී ඒ අයට ඒ අවශ්‍ය පුහුණුව ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම උතුරේ ජනතාවට වරායවල් නැහැ; නැංගුරම් පොළවල් නැහැ; අවශ්‍ය පහසුකම් නැහැ. එම නිසා අපි මේ අවුරුද්දේ උතුරේ තිබෙන එම තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබෙනවා. උතුරු ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ සඳහා අපට සහයෝගය ලබාදෙන්න කියලා. පේදුරුතුඩුව ප්‍රදේශයේ තමයි ලංකාවේ ලොකුම ධීවර වරාය හදන්න අපි සැලසුම් කර තිබෙන්නේ. එයට පොඩි පොඩි බාධක තිබෙනවා. උතුරු ප්‍රදේශය නියෝජනය කරන ඔබතුමන්ලාත් මැදිහත් වෙලා අපට සහයෝගය ලබා දුන්නොත්, උතුරේ ආර්ථිකයම වෙනස් වන ආකාරයේ සංවර්ධන වැඩ පිළිවෙළක් එතැනින් ඇති කරන්න අපට පුළුවන්. ඒ වාගේම උතුරේ තිබෙන අනෙකුත් වරායවල් සංවර්ධනය කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම, රුපියල් මිලියන 300කට ආසන්න මුදලක් වියදම් කරලා මේ වෙනකොට අපි කරෙයිනගර්වල යාත්‍රා අලුත්වැඩියා කරන මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබෙනවා. ඉදිරි මාස දෙක තුන ඇතුළත අපි එය විවෘත කරනවා. ඒ වාගේම අපි ගුරුනගර්වල අංග සම්පූර්ණ වරායක් අලුතෙන් හදනවා. එහි කටයුතු අපි මේ අවුරුද්දේ ආරම්භ කරනවා. ඊට අතිරේකව තව වරායවල් ගණනාවක්, ඒ වාගේම නැංගුරම් පොළවල් ගණනාවක් උතුරු ප්‍රදේශය වෙනුවෙන් ආරම්භ කරන්න යනවාය කියන එකත් මම සඳහන් කරන්න කැමැතියි.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

නැළී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාට mike එක දෙන්න.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் வடக்கில் 3 மீன்பிடித் துறைமுகங்களை அமைப்பதாகக் கூறியிருந்தீர்கள். அதாவது, மன்னாரிலுள்ள பேசாலையில் ஒன்றும் யாழ்ப்பாணத்திலுள்ள குருநகரில் ஒன்றும் பருத்தித்துறையில் ஒன்றும் அமைப்பதாகக் கூறியிருந்தீர்கள். இவற்றை அமைப்பது நல்ல விடயம். அதேநேரத்தில், வடக்கிலிருக்கின்ற மீனவர்களுக்குத் தொழில்நுட்ப வசதிகளைக் கொண்ட படகுகளை வழங்குவதற்கு நீங்கள் முயற்சி செய்வதாக இதற்கு முன்னர் குறிப்பிட்டிருந்தீர்கள். ஆனால், வடக்கிலிருக்கின்ற மீனவர்கள் 30 வருடங்களுக்கு முன்னர் எவ்வாறு மீன்பிடியில் ஈடுபட்டார்களோ, அதேபோன்றுதான் தற்போதும் அதே படகுகள்மூலம் தொழில்நுட்ப வசதிகள் இல்லாது மீன்பிடியில் ஈடுபடுகின்றார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்களே, வடக்கிலிருக்கின்ற மீனவர்களுக்குத் தொழில்நுட்ப வசதிகளைக் கொண்ட படகுகளை வழங்குவதன்மூலம் அவர்களது மீன்பிடி முறைமையை மாற்றியமைத்து அதனூடாக அவர்களுடைய வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு நீங்கள் நடவடிக்கை எடுக்கவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඔබතුමා කියන කාරණය මා පිළිගන්නවා. අපි ඔවුන්ට අදාළ තාක්ෂණයත් ලබා දෙනවා. ඒ වාගේම සියයට 50 සහනාධාරයත් ලබා දෙන්න අපි ලෑස්තියි. ඒ සඳහා ඔබතුමන්ලාත් මැදිහත් වන්න. අපි ඒ සඳහා කටයුතු කරන්නම්. ඒ වාගේම ඔවුන්ට වෙනත් උදවු උපකාර අවශ්‍ය නම් ඒවාත් ලබා දෙන්න අපි කැමැතියි. මොකද, අවංකවම කල්පනා කළොත් අපි උතුරේ ධීවරයන්ට මෙතෙක් යමක් කළාය කියා මා නම් සතුටු වන්නේ නැහැ. අපි යම් යම් දේවල් කරලා තිබෙනවා. නමුත් ඒවා ප්‍රමාණවත් නැහැයි කියලා මා හිතනවා. යුද්ධය අවසාන වුණාට පස්සේ පසුගිය කාලයේම සැලකිය යුතු ප්‍රමාණයක යමක් ඒ අය වෙනුවෙන් කරන්න අපට බැරි වුණා. ඒ ටිකටත් හරි යන්න මේ අවුරුද්දේ සිට ඔබතුමන්ලාට යමක් ලබා දෙන්න අපි සූදානමින් ඉන්නවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, මෙම පනත් කෙටුම්පතේ "නීතිය බලපෑමේ ප්‍රකාශය" යටතේ 3 වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "... පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලාත්මක කිරීමේ බලතල පැවරී ඇති තැනැත්තන් වශයෙන් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යවරයා විසින් ලිඛිතව නමින් හෝ ධුරයෙන් පත්කරනු ලබන වෙනත් යම් තැනැත්තකු ඇතුළත් කිරීම ය."

ගරු ඇමතිතුමනි, මේ පුද්ගලයා මොන තරාතිරමක, මොන වාගේ බලතල පැවරෙන කෙනෙක්ද කියලා ඔහු පිළිබඳව යම් අර්ථ දැක්වීමක් කරන්න ඔබතුමාට පුළුවන්ද? ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරනවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මා ඒ ගැන පසුව සම්පූර්ණ විස්තරයක් කරන්නම්.

ගරු කථානායකතුමනි, මා මීට වඩා වෙලාව ගන්නේ නැහැ. අවශ්‍ය වුණොත් විවාදය යන අතර වාරයේදී පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම මා කරනවා. මේ පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කළේ රට ගැන හිතලායි. තමුන්නාන්සේලා සියලුදෙනාම මේ සම්බන්ධයෙන් අදහස් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් මා ඔබතුමන්ලාට ගරු කරනවා. මේ සඳහා සියලු පක්ෂ ලබා දුන් අදහස් සැලකිල්ලට ගෙන තමයි මේ කාර්යය කළේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න සහයෝගය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරනවාද?

[අ.භා. 2.27]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ඉතා සතුටු වනවා. මෙහිදී මා මුලින්ම කියන්න අවශ්‍යයි, මෙම අමාත්‍යාංශයට වැඩට ඉතාම දක්ෂ ඇමතිවරයෙක් සිටින බව. මා මුදල් අමාත්‍ය ධුරය දරන අවස්ථාවේදී මට පෙනුණා, වැටී තිබුණු අංශයකට පුනර්ජීවයක් ලබා දීමට ඉතාම උනන්දුවකින් සහ ඉදිරි දැක්මක් සහිතව එතුමා කටයුතු කරන බව. මා හිතන හැටියට මෙය අපේ ආණ්ඩුවට ලැබුණු වරප්‍රසාදයක්. GSP සහනය ලබා ගැනීමේදී එක කොන්දේසියක් වූයේ, මෙවැනි නූතන කටයුතු සම්බන්ධයෙන් වැඩ කරන්න ඕනෑය කියන එකයි. මා හිතන හැටියට නෛතිකභාවය මෙතැන දෙන එකයි -

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. මට අමතක වීමක් වුණා. මා කලින් කරපු කථාවලදී මේ ගැන කියලා තිබෙනවා.

ලංකා ධීවර සංස්ථාව ලාභදායි මට්ටමට ගෙනෙන්නත්, මේ සහනාධාර ක්‍රමය මුලින්ම හඳුන්වා දෙන්නත් කටයුතු කළේ ඒ වෙලාවේ මුදල් අමාත්‍යතුමා විධියට හිටපු රවි කරුණානායක මැතිතුමායි. ඒ නිසා විශේෂයෙන්ම එතුමාට ස්තුති කරන්න මා මේ අවස්ථාව යොදා ගන්නවා. ඒ වැඩ පිළිවෙළ තුළ තමයි අපි තවම ගමන් කරන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි. මේ ඡන්ද කාලයනේ. ඒවා අමතක වෙන එක ප්‍රශ්නයක් නොවෙයි. ඒ ආකාරයෙන්ම ඔබතුමා ඉදිරියටත් කටයුතු කිරීම මම අගය කරනවා. අපේ රටේ අපනයන ආදායම අතින් ධීවර අංශය තුන්වැනි ස්ථානය ගන්නවා කියලා ඇමතිතුමා කිව්වාට මම හිතන විධියට වැඩි කල් යන්න ඉස්සෙල්ලා අපට දෙවැනි ස්ථානයට යන්න පුළුවන් වනවා. ඒ වාගේම, inland fisheries සම්බන්ධයෙන් මම මෙතැනදී වචන කීපයක් කථා කරන්න කැමැතියි. ඒ සංකල්පය තුළින් රැකීරක්ෂා ලක්ෂයක් විතර ලංකාවේ හඳන්න පුළුවන් වනවා කියලා ඇමතිතුමා කිව්වා. ඒක ඒ ආකාරයෙන්ම ඉදිරියට ගෙන යනවාද කියන කාරණය මා මේ අවස්ථාවේදී අහනවා. අපි මේ අවස්ථාවේදී බලන්න ඕනෑකම තිබෙන්නේ මේ දුපතෙන් අපට වැඩියෙන්ම වාසිදායක තත්ත්වයක් ඇති කරගන්න පුළුවන් වන්නේ කොහොමද කියන කාරණයයි.

ඉංග්‍රීසි කියමනක් තිබෙනවා, "Fish die in Sri Lankan waters of old age; not being caught by fishing activities" කියලා. මේ තත්ත්වය නවීකරණය කිරීම තමයි අපට කරන්න අවශ්‍ය වන්නේ. නායිලන්තය, නායිවානය වාගේ රටවල ධීවර අංශය තුළ ශීඝ්‍ර සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපිත් එක්ක කථා කරලා, ඉදිරි දැක්මක් සහිතව, නූතන ලෝකයේ පාවිච්චි කරන ඒ ක්‍රමවේද ලංකාවටත් ගෙනැල්ලා දෙන්න කියන කාරණය මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට කියනවා.

මම තවත් දෙයක් ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මම හිතන විධියට මාළු පිට රටින් ආනයනය කිරීම නැවැත්වීම නොවෙයි අවශ්‍ය වන්නේ. මේ රටේ මාළු ඇල්ලීම තව ලෙහෙසි කරලා, ඒ මාළු අපනයනය කරන්න පුළුවන් වන විධියේ තත්ත්වයක් අපි ඇති කරන්න ඕනෑ. බැරි වෙලාවත් අපි මාළු ආනයනය කිරීම නැවැත්වුවොත්, නිකම්ම මාළු මිලේ ඉහළ යෑමක් ඇති වෙනවා. ඒ තත්ත්වය අපි පසු ගිය කාලයේ දැක්කා. නමුත් මිල පාලනය නැති කරන්න පටන් ගත්තාට පස්සේ ඒ තත්ත්වය කඩාගෙන වැටෙන්න

[ගරු රවි කරුණානායක මහතා]

පටන් ගත්තා. මම හිතන විධියට එතුමාට ඒ ගැන හොඳ දැනුවත්කමක් තිබෙනවා. ඒ නිසා මම ඒ ගැන තවත් කියන්න ඕනෑ නැහැ.

මට කියන්න අවශ්‍ය මෙකයි. මේ පුංචි ලංකාවේ අපි ඩොලර් බිලියන 20ක අපනයන target එකක් තියාගෙන යනවා. නමුත් තවම ඩොලර් බිලියන එක හමාරක ප්‍රමාණයක් තමයි ධීවර අංශය තුළින් අපි ලබන්නේ. මේ ප්‍රමාණය මීට වඩා විධිමත් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ කාරණය පිළිබඳව සුළුවට හිතන්නේ නැතිව මහා පරිමාණ කටයුත්තක් ලෙස හිතා කටයුතු කරන්න අවශ්‍යයි.

Ttrawlers කිව්වාම එහි වර්ග ගණනාවක් තිබෙනවා. නමුත් අපි බලන්නේ පොඩි trawlers සම්බන්ධයෙන්. ලොකු ව්‍යාපාරික ධීවරයන් ඇවිත් පොඩි ධීවරයන්ගේ අවස්ථාව ගිලිහී ගියොත් දේශපාලන අවාසියක් ඇති වේවිද කියලා හිතනවා. නමුත් මම හිතන විධියට අපි බය නැතිව ඒ කටයුතු තුළින් ඉදිරියට යන්න අවශ්‍යයි. Deep sea fishing කළාට ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මේ තිබෙන සංශෝධන ඔක්කොම නිවැරැදියි. නමුත් අපේ රටේ පරිපාලනයේ තිබෙන ලොකුම දුර්වලතාව තමයි, හැම දෙයම රජයේ නිලධාරීන් ළඟ හිර වීම. අන්න ඒක තමයි අපි නැති කරන්න අවශ්‍ය වන්නේ. මේ රටේ ත්‍රස්තවාදයට වඩා වැඩිය ලොකු ප්‍රශ්නයක් තමයි රජයේ නිලධාරිවාදය. දේශපාලන පක්ෂ වෙනස් වුණත් මේ නිලධාරීන් වෙනස් වෙන්නේ නැහැ. ඒ ගොල්ලන් එම තැනම ඉඳගෙන සින්දුව වෙනස් කරමින් නැටිල්ල විතරයි වෙනස් කරන්නේ. මම හිතන විධියට අලුතින් හිතන්න තිබෙන අවස්ථාව තමයි දැන් උදා වෙලා තිබෙන්නේ.

මේ අවස්ථාව මම උපයෝගි කර ගන්නවා, GSP එකෙන් ලැබී තිබෙන වාසිය ගැන කියන්න. ගිය අවුරුද්දේ මාස අටකදී ධීවර අංශයේ විතරක් අපනයනය සියයට 200න් වැඩි වුණා. ඉතින් මේ අවුරුද්දේ ඊට වැඩිය හාත්පසින්ම වෙනස් ගමනක් යන්නයි තිබෙන්නේ. ධීවර ක්ෂේත්‍රයේ අපනයන සියයට 400ක, 500ක ගුණයකින් වැඩි වෙන්න අවශ්‍යයි. නමුත් තවම ඒ නිලධාරීන් තීන්දු ගන්නේ බොහොම හෙමින්.

තායිලන්තයෙන්, සිංගප්පූරුවෙන් සහ මාලදිවයිනෙන් මේ රටට ඇවිල්ලා මේ පිළිබඳව යම් යම් අදහස් ඉදිරිපත් කළා. නමුත් ඒ ගැන තීන්දුවක් ගන්න මාස අටක් ගියා. ඊට පස්සේ ඇමතිතුමා ඒ ගැන යමක් කරන්න හැදුවා. නමුත් බැරි වුණා. මේ කටයුතු විවෘත කරන්න අවශ්‍යයි. ත්‍රිකුණාමලයේ prawn farming ව්‍යාපෘතියත් එතුමාගේ මැදිහත් වීම තුළ ටිකක් ඉක්මන් ස්වරූපයක් අරගෙන තිබෙනවා. නමුත් ඒ ව්‍යාපෘතිය අවුරුදු තුනක්, හතරක්, පහක් හිර වෙලා තිබුණා. තවම හරි මාර්ගයේ යන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාව උපයෝගි කරගෙන වෙනසක් ඇති කරන්න පුළුවන් විධියට අපේ අපනයන ක්ෂේත්‍රය තව දියුණු කරන්න ඕනෑ. ඒ සඳහා අපි සියලුදෙනාම එකට වැඩ කරන්න ඕනෑය කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

මා හිතන විධියට ධීවර සංස්ථාවෙත් මීට වඩා වාණිජකරණයක් ඇති කළොත් හොඳයි. ඇමතිතුමා ඒක හරි මාර්ගයක ගෙන යනවා. එතුමා භාර ගන්න කොට එහි මිලියන 180ක විතර අලාභයක් තිබුණා. නමුත් දැන් මිලියන 20ක, 30ක විතර ලාභයක් ඇති වෙලා තිබෙනවා කියලා මම දැනුවත් වෙලා තිබෙනවා. මා හිතන විධියට ඒක වැඩිදියුණු කරන්න ඊට වඩා හුඟක් අවස්ථාව තිබෙනවා. අනවශ්‍ය සේවක පිරිස විවිධ වැඩවලට යොමු කරලා තිබෙනවා. බලාපොරොත්තු වන ඉලක්කයට යන්න අපි සියලුදෙනාම අත්වැල් බැඳගෙන වැඩ කරන්න ඕනෑය කියන එක මතක් කරමින්, ඇමතිතුමාට ශුභාශිංසනය කරමින් මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

We have the Party Leaders' Meeting at 2.30 p.m.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[பி.ப. 2.34]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடற்றொழில் சம்பந்தமான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு அனுமதித்ததற்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையிலே மீன்பிடித் துறையானது மிகவும் முக்கியத்துவம் வாய்ந்ததாக இருக்கின்றது. இந்த நாட்டிலே கூடுதலான கடல் வளங்கள் காணப்படுகின்றன. இந்தக் கடல் வளங்களைச் சரியான முறையில் பயன்படுத்துகின்றபொழுது, இந்த நாட்டின் ஏற்றுமதியில் அதிக பங்கினைக் கடற்றொழில் துறை வகிக்கக்கூடிய ஒரு வாய்ப்பு இருக்கின்றது. அந்த வகையில் இந்த நாட்டின் ஏற்றுமதியில் மூன்றாவது இடத்துக்கு வரும் வகையில் இந்தத் துறையை ஊக்குவிக்க முடியுமென்று அமைச்சர் அவர்கள் சொன்னார். அதேநேரம், கடல் வளங்கள் குறைவாக இருக்கின்ற நாடுகள் கடல் வளங்களை ஏற்றுமதி செய்வதில் முன்னணி வகிப்பதை நாங்கள் அண்மைக் காலமாகக் கண்டுவருகின்றோம். அந்தவகையில், இலங்கையில் இருக்கின்ற கடல் வளங்களைச் சரியான முறையிலே பயன்படுத்தி, அந்தச் செயற்பாடுகளின்மூலம் அதிகளவான ஏற்றுமதியைச் செய்தால், இத்துறைக்கான ஏற்றுமதியில் முதனிலை பெறுவதற்கான சந்தர்ப்பமும் சூழ்நிலையும் உருவாகும். அத்துடன், புதிய தொழில் நுட்பங்களைக் கூடுதலாக உள்வாங்கி மீனவர்களுக்கு அதிக வசதிகளைச் செய்துகொடுத்தால் ஏற்றுமதியையும் ஊக்கு விக்கக்கூடியதாக இருக்கும்.

இன்று இலங்கையைச் சுற்றிவர இருக்கின்ற கடல் நீர்ப்பரப்பிலே வெளிநாட்டவர்கள் மீன்பிடிக்கின்ற நிலைமை காணப்படுகின்றது. அவர்கள் ஏன், இந்த இடங்களுக்கு வந்து மீன் பிடிக்கின்றார்களென்றால், அங்கு கடலுணவுப் பொருட்கள் கூடுதலாக இருப்பதனால்தான். அதாவது, இந்த இடங்களிலே கடல் சார்ந்த ஏற்றுமதிப் பொருட்கள் கூடுதலாகக் காணப்படுகின்றன. அதனால்தான் இந்திய

மீனவர்கள் இலங்கைக் கடற்பரப்புக்குள் அத்துமீறி நுழைந்து இலங்கை மீனவர்களுக்குச் சொந்தமான மீன்வளங்களைச் சூறையாடுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, இந்த நிலைமையைத் தடுத்து நிறுத்தவேண்டும். அங்கு "ரோலர்" படகுகள் அல்லது தடை செய்யப்பட்ட வலைகள் போன்ற மீன்பிடி உபகரணங்கள் பயன்படுத்தப்படுகின்ற பொழுது, இந்தப் பிரதேசத்தில் இருக்கின்ற கடல்சார் வளங்கள் அழிவடைகின்றன. அதுமட்டுமல்ல, அங்கிருக்கின்ற மீனவர்களின் தொழிலும் பாதிப்படைகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. ஆகவே, இந்த அரசு தொழில்நுட்ப வசதிகளுடன்கூடிய மீன்பிடிப் படகுகள், வலைகள் மற்றும் ஏனைய மீன்பிடி உபகரணங்களை இந்த மீனவர்களுக்கு வழங்க வேண்டும். விசேடமாக, அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள மீனவர்கள் தற்பொழுதும் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழுகின்றவர்களாக இருக்கின்றார்கள். அவர்கள் பழைமையான அதாவது 20-30 வருடங்களுக்கு முற்பட்ட வலைகள், தோணிகள் முதலிய மீன்பிடி உபகரணங்களைப் பயன்படுத்துகின்ற நிலைமைதான் தற்பொழுதும் காணப்படுகின்றது. இப்படியான நிலை தொடருமானால், அந்த மீனவர்கள் தங்களது வாழ்க்கைக்கு - ஜீவனோபாயத்துக்குத் தேவையான வருமானத்தைப் பெறமுடியாத நிலைமை ஏற்படும்.

இன்று விசேடமாக அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற விநாயகபுரம் கிராமத்தை எடுத்துக்கொண்டால், அங்கு மீனவர்கள் அதிகமாகக் காணப்படுகின்றார்கள். ஆனால், இன்று அவர்கள் தொழில்செய்து வந்த இடத்தைக்கூட, தனிநபர்கள் அத்துமீறிப் பிடித்துவைத்திருப்பதை நாங்கள் பார்க்கின்றோம். அதுமட்டுமல்லாமல், அந்த மீனவர்கள் அடிப்படை வசதிகள் இல்லாத நிலையில் தத்தளித்துக் கொண்டிருப்பதையும் கண்கூடாகப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அந்த மீனவர்கள் காலாகாலமாகத் தொழில் செய்துவந்த இடமானது அதாவது, அவர்கள் தங்களது தோணிகள், வள்ளங்கள் என்பவற்றை நிறுத்திவைப்பதற்கும் வலைகளைப் பழுது பார்ப்பதற்கும் பயன்படுத்துகின்ற கரையோரப் பகுதியானது இன்று தனியாரால் ஆக்கிரமிக்கப் பட்டிருக்கிறது. அத்துடன், அந்தக் கடலோரப் பகுதியில் முள்வேலிகளை இட்டு, அந்த மீனவர்களின் வாழ்வாதாரமான தொழிலுக்கும் அவர்கள் தடையாக இருந்துவருவதை நாங்கள் பார்க்கின்றோம். இப் பிரச்சினையைப் பற்றி இந்த உயரிய சபையிலும் பல தடவைகள் முன்வைத்திருக்கின்றேன். இதனைத் தீர்த்துத் தருவதாக அமைச்சர் அவர்களும் சொல்லியிருக்கிறார். ஆனால், இன்னமும் அது தீர்க்கப்பட வில்லை.

கரையோரப் பாதுகாப்புத் திணைக்களமானது, கடற்கரையோர எல்லைகளைச் சரியாக வரையறுத்துக் கொடுக்கவேண்டும். ஆனால், Coast Conservation Department அங்குள்ள கடற்கரையோரங்களில் சரியாக எல்லையிடாத தால், கரையோரப் பகுதியை ஆக்கிரமித்தவர்கள் கடலோரமாக முள்வேலிகளை அமைத்திருக்கின்றனர். இந்த முள்வேலியானது மீனவர்கள் அந்த இடத்தில் மீன்பிடியை மேற்கொள்வதற்குத் தடையாக இருக்கின்றது. எனவே, இந்தச் செயற்பாட்டை உடனடியாகத் தடுத்து நிறுத்துவதுடன், அந்த மக்களுக்குத் தேவையான, புதிய தொழில்நுட்ப வசதிகளுடன்கூடிய இயந்திரங்கள், தோணிகள் முதலிய மீன்பிடி உபகரணங்களையும் வழங்கவேண்டும். அது மட்டுமல்லாமல், அவர்களுக்குரிய வீட்டுத் திட்டங்களையும் வழங்கவேண்டும். கூடுதலாக மானிய அடிப்படையிலேதான் இந்த மீனவர்களுக்கு உதவிகளைச் செய்யவேண்டும். இன்று கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார், "நாங்கள் மீனவர்களுக்கு அதிகளவு உதவிகளை வழங்கியுள்ளதோடு, அதிகளவு வசதிகளையும் செய்துகொடுத்திருக்கின்றோம்" என்று. ஆனால், அந்தப் பகுதியில் இருக்கின்ற மீனவர்களுக்கு எந்தவித உதவியும் இற்றைவரை கிடைக்கவில்லை. ஆகவே, மிகவும் வறுமைக்கோட்டின்கீழ் வாழுகின்ற அந்த மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துவதற்குத் தேவையான வசதிகளை நீங்கள் செய்துகொடுக்க வேண்டும். அதாவது, நவீன தொழில்நுட்ப வசதிகளுடன்கூடிய தோணிகள் மற்றும் boat கள், வலைகள் முதலிய மீன்பிடி உபகரணங்களை வழங்குவதுடன் ஏனைய வசதிகளையும் செய்துகொடுக்க வேண்டும். இது சம்பந்தமாக நாங்கள் பல தடவைகள் கோரிக்கை விடுத்தும் இந்த அரசாங்கம் இன்னமும் அதனை நடைமுறைப்படுத்தாமல் இருப்பதானது, மிகவும் வேதனை அளிக்கின்ற விடயமாக இருக்கின்றது.

அதேபோல் காரைதீவுப் பிரதேசத்தில் வாழுகின்ற மீனவக் குடும்பங்களுக்கும் இதே அடிப்படை வசதிகளை வழங்கவேண்டியதாக இருக்கின்றது. குறிப்பாக, இந்த இரண்டு பிரதேசங்களிலும் கூடுதலான மீனவர்கள் இருக்கிறார்கள். எனவே, அவர்களுக்குத் தேவையான நவீன மீன்பிடி உபகரணங்களை வழங்கி, அவர்களின் வாழ்க்கைத்தரத்தை உயர்த்துவதில் இந்த அமைச்சு கூடுதலாகப் பங்களிப்புச் செய்ய வேண்டும். அவ்வாறான செயற்பாடுகளை முன்னெடுக்கின்றபொழுதுதான் இந்த நாட்டிலிருந்து அதிகளவான மீன்பிடி உற்பத்திகளை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யக்கூடியதாக இருக்கும். மேலும், அந்தப் பிரதேசங்களிலே பிடிக்கப்படுகின்ற மீன்களைப் பழுதடையாமல் பாதுகாத்து வைப்பதற்கான குளிரூட்டப்பட்ட வசதிகளையுடைய எந்தவிதமான பாதுகாப்பு அறைகளும் அங்கு இல்லை. ஏனைய பிரதேசங்களிலே இந்த வசதிகள் செய்துகொடுக்கப்பட்டாலும், அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற தமிழ்ப் பிரதேசங்களிலே இந்த வசதிகள் செய்யப்படாமலிருப்பது கவலையளிக்கின்ற ஒரு விடயமாக இருக்கின்றது.

வடக்கிலே மூன்று மீன்பிடித் துறைமுகங்களையும் தெற்கிலே பல மீன்பிடித் துறைமுகங்களையும் அமைப்பதற்கு அரசு திட்டமிட்டிருந்தாலும், கிழக்கிலே அம்பாறை மாவட்டத்திலிருக்கின்ற விநாயகபுரம், திருக்கோவில் மற்றும் காரைதீவு போன்ற பிரதேசங்களுக்கிடையே மீன்பிடித் துறைமுகமொன்று கட்டாயமாக உருவாக்கப்பட வேண்டும். ஏனென்றால், விநாயபுரம் பிரதேசத்திலே அதிகளவானோர் மீன்பிடித்தொழிலை மேற்கொள்பவர்களாக இருக்கிறார்கள். அவ்வாறிருந்தும் இற்றைவரையிலும் ஒரு மீன்பிடித் துறைமுகம் அங்கு அமைக்கப்படவில்லை. அவர்களுக்குத் தேவையான வசதிகளை வழங்குகின்ற பட்சத்தில், இந்த நாட்டின் மொத்த மீன்பிடி உற்பத்தியிலே மிக முக்கியமான பங்கை அவர்களால் வகிக்க முடியும். இதன்மூலமாக மீன்பிடித்துறையின் ஏற்றுமதி வருமானத்தை மூன்றாமிட மல்ல, முதலாமிடத்திற்கே கொண்டுசெல்லக்கூடிய ஒரு சந்தர்ப்பமும் சூழ்நிலையும் ஏற்படும்.

"களப்புகளை அபிவிருத்தி செய்வதனூடாக மீன்பிடித் துறையை அபிவிருத்தி செய்யலாம்" என்று அமைச்சர் அவர்கள் சொன்னார். எமது மாவட்டத்தைப் பொறுத்தளவிலே, அங்கு அதிகளவான களப்புகள் மற்றும் நீர்நிலைகள் காணப்படு கின்றன. சரியான முறையிலே நீர்வள முகாமைத்துவத்தினை மேற்கொண்டு அந்த நீர்நிலைகளில் காணப்படும் நீரினைத் தேக்கி வைத்து, அவற்றில் மீன்குஞ்சுகளை விடுவதன்மூலம் அங்கு கூடுதலான மீன்வளங்களைப் பெற்றுக்கொள்ளலாம்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

இதன்மூலமாக கூடுதலான மீன் ஏற்றுமதியை மேற்கொள்ளக் கூடியதாக இருக்குமென்று இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர் அவர்கள் அம்பாறை மாவட்டத்திலே இருக்கின்ற கரையோரப் பிரதேசங்களில் கூடுதலான கவனம் செலுத்த வேண்டும். ஏனெனில், அங்கு யுத்தத்தினால் பாதிக்கப்பட்ட, கூடுதலான அனர்த்தங்களையும் இழப்புக்களையும் சந்தித்த மக்களில் தமிழ் மக்களே அதிகமாகக் காணப்படுகிறார்கள். அந்த வகையில் அவர்களின் வாழ்வாதாரத்தை - ஜீவனோபாயத்தை உயர்த்துவதற்கான அடிப்படை வசதிகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டும். அரசாங்கத்தால் வழங்கப்படுகின்ற எந்த உதவியும் அந்த மக்களுக்குக் கிடைப்பதில்லை. இதனால் இன்றும்கூட அவர்கள் மிகவும் வறுமை நிலையிலேயே காணப்படு கின்றார்கள். எனவே, அந்த மக்களுக்குக் குறித்த உதவிகள் கிடைப்பதை உறுதிப்படுத்தி, அவர்களது முன்னேற்றத்திலே பங்குதாரராக இருந்து செயற்பட வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 2.46]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගෙන තිබෙන මේ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අපේ ගරු මහින්ද අමරවීර ඇමතිතුමාගේත්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේත් අවධානය යොමු කිරීම සඳහා කරුණු කිහිපයක් සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාලයේ යුද ගැටුම් පැවැති වාතාවරණය තුළ මේ රටේ මුහුදු වෙරළෙන් තුනෙන් දෙකකත්, මහපොළොවෙන් තුනෙන් එකකත් දශක තුනක විතර දීර්ඝ කාලයක් තිස්සේ තිබුණේ, යකඩ ගැටෙන අමිහිරි ශබ්දයත්, උණ්ඩයේ අමිහිරි සුවඳවත්, දුක වේදනාව හා මර ළතෝනියත්. මහින්ද රාජපක්ෂ යුගයේදී ත්‍රස්තවාදය පිටුදැකලා මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු ජනතාවට නිදහසේ ජීවත් වෙන්න හා ජීවනෝපාය සලසා ගන්න අයිතිය ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස රටේ මුහුදු සම්පත නිදහසේ වැඩිපුර පාවිච්චි කරන්න අවස්ථාව ලැබුණා. දිවයිනක මුහුදු ප්‍රදේශය නිදහස් කර ගැනීම ඉතා වැදගත් වෙනවා, ඒ දිවයින තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා. එය අපි කවුරුත් දේශපාලන පක්ෂ පාට හා මතිමතාන්තරවලින් තොරව පිළිගත යුතු වෙනවා. මුහුදු ප්‍රදේශයේ පමණක් නොවෙයි, අපේ රට වාගේ කුඩා රටවලට ඉන්දියානු සාගර කලාපයේම සාමය පැවතීම අත්‍යවශ්‍ය වෙනවා, ජනතාවගේ ජීවිතවල තත්ත්වය උසස් වීම සඳහා.

අපි දන්නවා, 2009න් පසු කාල පරිච්ඡේදයේදී උතුරු නැගෙනහිර ප්‍රදේශවල ධීවරයින්ට නිදහසේ ජීවනෝපාය කරගෙන යාම සඳහාත් වාරකන් කාලවලට දකුණේ ධීවරයින්ට ඒ ප්‍රදේශවලට යන්නත් අලුත් ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය වුණු බව. නමුත්, අද වන විට විදේශීය ධීවර යාත්‍රා මඟින් ගැඹුරු මුහුදේ මේ රටට අයත් ධීවර සම්පත මංකොල්ල කෑමක් සිදු වෙනවායි කියන එක අපි කවුරුත් දන්නා කරුණක්. එය අද තිබෙන ප්‍රධාන ගැටලුවක්.

එසේ ගැඹුරු මුහුදේ කරන කාර්යයට අතිරේකව, විශේෂයෙන් ඉන්දියානු ධීවරයන් උතුරු, නැගෙනහිර ප්‍රදේශවල මුහුදු සීමාව තුළ ආක්‍රමණශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තුළින් ඉන්දියාව හා ලංකාව අතර නිරන්තරයෙන් ඇති වන ගැටුම්කාරී තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා ජාතික වශයෙන් සුවිශේෂ අවධානයක් යොමු කළ යුතුයි කියලා අපි කල්පනා කරනවා. මක්නිසාද යත්, විවිධ කට කථා පැතිරීම තුළින් පවා අසල්වැසි රාජ්‍යය සමඟ වෙනත් ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය කරන්න ඇතැම් විදේශ බලවේගවලට පුළුවන්කම තිබෙනවා.

උදාහරණයක් වශයෙන්, මෑත කාලයේ ලංකාවේ නාවික හමුදාව විසින් ඉන්දියානු ආක්‍රමණික ධීවරයන්ට වෙඩි තබලා ඝාතනය කළාය කියලා තමිල්නාඩුව ප්‍රදේශයේත් විශාල කැළඹීමක් ඇති වීමේ සූදානමක් තිබුණා. අසත්‍ය ප්‍රකාශ, කට කථා යනාදිය තුළින් මෙවැනි දේ ඇති නොවෙන්න, මේ දෙරාජ්‍ය අතර වඩා හොඳ අවබෝධයකින් අපේ මුහුදු සීමාව ආරක්ෂා කර ගැනීම සඳහා වන විධිමත් ජාතික වැඩ පිළිවෙළකට යොමු වෙන්න කියන කරුණ ඒකාබද්ධ විපක්ෂය වශයෙන් මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැති වෙනවා.

දෙවනුව, පසුගිය කාලයේ අපේ රට රැක්ක නාවික හමුදා භටයන්, කුමන හෝ හේතු මත රාජ්‍ය අංශ විසින් ඉතා විශාල පීඩනයකට ගොදුරු කරලා තිබෙනවා. මෑත කාලීන සිද්ධිය තමයි, මුහුදු කොටින්ට මුහුණ දීලා, මුහුදු ආරක්ෂා කිරීමේ කටයුතු කළ නාවික හමුදාවේ රණ විරුවෝ විවිධ චෝදනා මත බන්ධනාගාර ගත කරලා, ඇප නොදී තබා ගෙන සිටියා. අපි කවුරුත් දන්නවා; රට දන්නවා, සමුද්‍ර ආරක්ෂාව සඳහා විශාල සේවයක් කළ කොමදෝරු දසනායක මහතා ඇතුළු නාවික හමුදා රණ විරුවෝ පිරිසක් අත් අඩංගුවට අරගෙන, විවිධ චෝදනා එල්ල කරමින්, ඇප දෙන්නේ නැතිව බන්ධනාගාර ගත කරලා තිබුණා. මේ රට වෙනුවෙන්, රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් වැඩ කළ ඒ අය බන්ධනාගාර ගත කරලා, තුට්ටු දෙකට දමලා රණ විරුවන්ට එහෙම වධ දෙන කොට, ඒ තත්ත්වය උසුලාගත නොහැකිව ඒ රණ විරු පවුලක මේරි නැමති එක අම්මා කෙනෙක් ළිඳට පැනලා සියදිවි නසා ගත්තා. එහෙම චෝදනා තිබුණත්, නඩු විභාග කරලා වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒ වැරදිවලට දඬුවම් කිරීම පිළිබඳ අපේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, රට වෙනුවෙන් කැප වෙලා සම්මාන දිනපු රණ විරුවන් වැයූ මෑණිවරු මෙලෙසින් සියදිවි නසා ගන්නා තත්ත්වයක් රට තුළ උදා වෙනවා නම්, ඒක මහා ජාතික ඛේදවාචකයක්. ඒ නිසා, නාවික හමුදාව සම්බන්ධයෙන් හා අනෙකුත් රණ විරුවන් සම්බන්ධයෙන් රජය හෝ කුමන පාර්ශ්ව විසින් හෝ ගෙන යන දඩයම් පිළිවෙත නැවැත්වීම සඳහා ධීවර අමාත්‍යතුමා මැදිහත් වීමකුත් කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ඊට අතිරේකව, අද සමස්ත ධීවර ප්‍රජාවත්, අනෙකුත් අඩු ආදායම්ලාභීන් මෙන්ම ඉහළ ආදායම්ලාභීනුත් පොදුවේ මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, මේ දැවැන්ත මූල්‍ය අර්බුදය. රටේ සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය පාලනය කරන, මුදල් නෝට්ටු අච්චු ගසන ශ්‍රී ලංකා මහ බැංකුවේ ලංකා ඉතිහාසයේ කිසිම දිනක නොවුණු මහා දැවැන්ත වංචාවන් දෙකක් 2015 පෙබරවාරි මාසයේ 27 වැනිදා සහ 2016 මාර්තු මාසයේ සිද්ධ වුණා. මෙයින් ඇති වෙච්ච අලාභය බිලියන 12යි. මේ බිලියන 12 අය කර ගන්න පුළුවන් වාගේ කියමින් සමහර අය මෙය ලඝු කරන්න දරන උත්සාහය අපි පිළිකුලෙන් හෙළා දැකිය යුතු වෙනවා. මක්නිසාද යත්, මේ බැඳුම්කර හොරකමේ අලාභය ධීවරයන්, කම්කරුවන්, ගොවීන් ඇතුළු සමස්ත ලාංකීය ජනතාවම අසාමාන්‍ය ලෙස විඳ ගන්න ඕනෑ. ඇයි? මේ සිද්ධියෙන් පසු ඇති වුණු පළමුවැනි ප්‍රතිඵලය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ ණය පොලී අනුපාතය කරටි කඩලා යන්නට තරමට ඉහළ යාම.

මහින්ද රාජපක්ෂ යුගයට වඩා වර්තමානයේදී ණය පොලී අනුපාතය සියයට සියයකින් වැඩියි. භාණ්ඩාගාර බිල්පත් වේවා, භාණ්ඩාගාර බැඳුම්කර වේවා, බදු සංචිත සහතික පත් වේවා, වාණිජ බැංකුවල හරිත සාමාන්‍ය බර තැබූ ණය පොලී අනුපාත වේවා, සියලුම පොලී අනුපාතයන් වැඩි වෙලා තිබෙනවා. ආර්ථික ප්‍රගතියේ එක ලක්ෂණයක් තමයි රටක් දියුණු වෙන්න නම්, ඒ රටේ පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් වෙන්න ඕනෑ කියන එක. ජපානය, ස්විට්සර්ලන්තය, ස්වීඩනය, එංගලන්තය, ඇමෙරිකාව, සිංගප්පූරුව, මැලේසියාව ආදී දියුණු වෙච්ච ඕනෑම රටක් තිබෙනවා නම්, ඒ රට දියුණු වෙලා තිබෙන්නේ පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් වෙච්ච නිසයි. දියුණු වෙච්ච සමහර රටවල ණය පොලිය එක්කෝ සියයට දෙකයි. නැත්නම් සියයට පහයි. නැත්නම් සියයට හයයි. යුද්ධය නිම වුණාට පස්සේ දීර්ඝ කාලයක් කාර්යක්ෂම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ පොලී අනුපාතය single digit interest rate එකකට ගෙනැල්ලා තිබුණා. ඒක තමයි මහ පොළොවේ ප්‍රායෝගික ඇත්ත. ඒ ඇත්ත අනුව සියයට 8.5යි, 9යි, 9.5යි, 9.75යි වැනි මට්ටම්වල තමයි අපේ රටේ පොලී අනුපාතය තිබුණේ. අද වන විට පොලී අනුපාතය සියයට 28යි, සියයට 30යි, සියයට 32යි යනාදී වශයෙන් වැඩි වෙලා තිබෙන නිසා ණය ගත්ත සියලු දෙනාටම ඒ ණය ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මීට කලින් ණය අරගෙන තිබෙන රජයේ සේවකයන්ට දැන් අලුතින් ලිපි එනවා පොලිය වැඩි කරලා ගණන් හදලා.

ඊළඟට, මෝටර් වාහනයක් ලීසිං කරලා, ෆිනෑන්ස් කරලා ගත්ත අයටත් ඒ විධියට එනවා. නිවාස ණය ගත්ත අයටත් ඒ විධියට පොලිය වැඩි කරලා එනවා. කන කර උගස් කරපු අයටත් ඒ විධියට පොලිය වැඩි කරලා එනවා. ධීවරයන්ටත්, ගොවියන්ටත්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ටත් ණය පොලිය හා වාරික ගෙවන්න බැරිවීමෙන් සියදිවි නසා ගැනීමේ ප්‍රමාණය විශාල ලෙස වර්ධනය වෙමින් පවතිනවා. මහ බැංකු සොරකම මත පදනම් වුණු පොලිය ඉහළ යාම නිසා ඇති වෙච්ච ආර්ථික කඩා වැටීම් තුළ ණය වාරික හා පොලී ගෙවීම් සිදු කිරීමට නොහැකිවීම නිසා සියදිවි නසා ගැනීම් වර්ධනය වෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සිද්ධිය සිදු වුණේ යාපනයේ ඔබතුමාත් දන්නා ප්‍රදේශයක වෙන්න පුළුවන්. පුවත්පත් වාර්තා කරලා තිබුණ ආකාරයට යාපනය ප්‍රදේශයේ ව්‍යාපාරික මහත්මයෙක් ණයකරුවන් ණය ඉල්ලාගෙන එනකොට ඔහු සියදිවි නසා ගෙන තිබෙනවා. ඔහුටත්, ඔහුගේ බිරිඳටත් ඉතාම ලස්සන ද්‍රවිඩ දරුවන් තුන්දෙනෙක් හිටියා. ඒ සිද්ධිය සිදු වෙලා ටික දිනකට පසුව සියදිවි නසා ගත් ව්‍යාපාරිකයාගේ බිරිඳ අයිස්ක්‍රීම්වලට වස දාලා තමන්ගේ දරුවන් තුන්දෙනාට කන්න දීලා, තමනුත් වස කාලා මිය ගියා. ඒ මිය ගිය හතර දෙනාත්, ඊට කලින් මිය ගිය ව්‍යාපාරිකයාත් කියන පස්දෙනාම මිය ගියේ ණය පොලිය නිසයි. මේ නිසා මුළු පවුලක්ම විනාශ වුණා. මේ ප්‍රදේශවලත් ඒ ගැටලුව තිබෙනවා. උතුරෙයි, දකුණෙයි කියලා වෙනසක් නැහැ. අපේ පළාත්වලත් සමහර ව්‍යාපාරික මහත්වරු මේ හේතුව නිසා සියදිවි නසාගෙන තිබෙනවා. පසුගිය දිනෙක කිරිබත්ගොඩදීත් මෝටර් රථයෙන් පැමිණි ව්‍යාපාරික මහත්මයෙක් ණය වාරික ගෙවා ගන්න බැරිව කැලණි ගඟට පැනලා මැරුණා. ඊට ඉස්සර දිනෙකදීත් මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට කිට්ටුව ලයිට් කණුවකට තමන්ගේ යතුරු පැදිය හේත්තු කරලා, ඒ පුද්ගලයා කැලණි මිටියාවතේ දුම්රිය මාර්ගයේ නිදා ගත්තා.

අද තිබෙන අර්බුදයේ ස්වභාවය මේ සභාවේ පැහැදිලි වෙන්නේ නැහැ. ඒ පිළිබඳව හඬක් නඟන්න බැරි අසරණ මිනිස්සුන්ගේ හඬ නැහෙන්නේ නැහැ. විපක්ෂයක් නැති පාර්ලිමේන්තුවක් අද තිබෙන්නේ. ඒ තුළ මේ රටේ එක පිරිසකට තිබෙන ප්‍රශ්නය ගැන නොවෙයි, දේශපාලන පුද්ගල අවලාද සඳහා පමණයි වැඩි කාලයක් යෙදවෙන්නේ. මෙහෙම සිදු වන සියදිවි නසා ගැනීම්වලට, ණය පිළිබඳ මූල්‍ය අර්බුදයට මේ ගරු සභාවේ යම්කිසි ජාතික වැඩ පිළිවෙළක් හදා ගන්න ඕනෑ. ධීවරයන්ටත් මේ ප්‍රශ්නය බරපතළ ලෙස තිබෙනවා. තමන්ගේ ආදායමෙන් ණය වාරිකයි, පොලියයි ගෙවා ගන්න බැරි වෙනකොට, එය නොකළ යුතු දෙයක් වුණත් සියදිවි නසා ගැනීම විසඳුමක් ලෙස සිතන රටකයි අපි ජීවත් වෙන්නේ. ඒ නිසා ධීවරයන්ගේ ණය ප්‍රශ්නය ගැනත් අවධානය යොමු කරන්න කියලා මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, බැඳුම්කර සොරකම නිසාවෙන් රට සතු විදේශ ආයෝජකයන් ආපසු ගියා. රජයේ සුරැකුම්පත්වල තිබුණු මුදල් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4කට වඩා වැඩි ප්‍රමාණයක් අරගෙන ගියා. රුපියල මස්තබාල්දු වුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා රජය බාර ගන්න අවස්ථාවේදී ඩොලරයකට ගෙව්වේ රුපියල් 101යි. එතුමා අවුරුදු 10ක් ආණ්ඩු කරලා ඉවර වෙනකොට ඩොලරයකට ගෙව්වේ රුපියල් 131යි. අවුරුදු 10කටම ඩොලරයකට වැඩිපුර ගෙව්වේ රුපියල් 30යි. අවුරුද්දකට සාමාන්‍යයෙන් වැඩි වෙලා තිබෙන්නේ ඩොලරයක් වෙනුවෙන් රුපියල් 3යි. නමුත් දැන් ඩොලරය රුපියල් 156යි. මේකේ ඉදිරි සතිවලදී බරපතළ ලෙස නාය යෑමක් වෙනවා. මොකද, මේ වන විටත් අපේ රටේ දැවැන්තම මූල්‍ය අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මොකද, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර හා ලංකාණ්ඩුවේ බැඳුම්කර පිළිබඳ සැකය, අවිශ්වාසය සහ ඉතාම බරපතළ තත්ත්වයක් ඇතිවීමෙන් "මෝදි" නැමැති ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය මෑත සමීක්ෂණයෙන් ප්‍රකාශ කළා, ආසියා පැසිපික් කලාපයේ රටවල් 24කින් ණය අවදානම අතින් ශ්‍රී ලංකාව 24 වන ස්ථානයට ඇද වැටී තිබෙනවාය කියා.

ඒ විතරක් නොවෙයි. ආයෝජකයන්ට ඒම සඳහා සලකා බලන "බ්ලූම්බර්ග්" කියන දර්ශකය ලකුණු සියයකින් පටන් ගන්නේ. අවදානම අඩුම රටක් ලෙස වැඩිම ලකුණු ප්‍රමාණය ලැබී තිබෙන්නේ නෝර්වේ රටට. ලංකාවට සියයෙන් ලකුණු 12යි ලැබී තිබෙන්නේ. ලෝකයේ වැඩිම අවදානම තිබෙන රටක් ලෙස අන්තර්ජාතික වශයෙන් වර්ගීකරණය සිද්ධ වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ ඇතිවන සැකය තව වර්ධනය වෙලා තිබෙනවා. අග්‍රාමාත්‍යතුමා මෙම පාර්ලිමේන්තුව විශේෂයෙන් කැඳවා පාර්ලිමේන්තුවේදී කිව්වා, "2008 සිට 2014 දක්වා ලංකාණ්ඩුව නිකුත් කර තිබෙන සුරැකුම්පත්වල පිරමීඩවලටත් වඩා වංචා සිද්ධ වෙලා තිබෙනවා"ය කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඒකාබද්ධ විපක්ෂය වශයෙන් වගකීමෙන් කියනවා; එක කොමිසම නොවෙයි, කොමිෂන් සභා හතක් හෝ ඉක්මනින් පත් කර මේ රටේ බැඳුම්කර වෙළෙඳපොළේ ප්‍රතිරූපය කඩා වැටීම නවත්වන්න කියා. එසේ නැත්නම් කාගේ ආණ්ඩුවකට හෝ ණය ගන්න සිදු වුණාම බැඳුම්කරය නිකුත් කරනවා. බැඳුම්කරය ගැන අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේ කියා තිබෙනවා හොරකම් කර, වංචාකර, දූෂණය කරලාය කියා. තමන්ගේ වරද වසා ගැනීම සඳහා එය දේශපාලනික වශයෙන් වෙන පක්ෂ මත පටවන්න ගියාම, එහි ප්‍රතිඵලය ලෙස අද ලංකාවේ බැඳුම්කර වෙළෙඳපොළ කඩා වැටෙනවා. ඒ අතරම භයානක තත්ත්වයක් ගැන මම මේ ගරු සභාවේ අවධානය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පෙරේදා පනත් කෙටුම්පතක් ගැසට් කර තිබෙනවා. ඒ පනත් කෙටුම්පත ඉංග්‍රීසි භාෂාවෙනුයි තිබෙන්නේ." Active Liability Management Bill " කියායි. "සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත".

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

එම පනත් කෙටුම්පත;"ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතු කර ගැනීමට බලය ලබා දීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධි විධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි." කියා සඳහන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පනත් කෙටුම්පත කෙරෙහි මම ඔබතුමාගේත් අවධානය යොමු කරනවා. මෙය, ලංකා ඉතිහාසයේ පාර්ලිමේන්තුවට තිබෙන බලය සම්පූර්ණයෙන් උදුරා ගෙන ගිහිල්ලා පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම බුල්ඩෝස්කරණය කිරීම සඳහා මූල්‍ය බලය එළියට ඇදලා තමන්ට රිසිසේ ජාත්‍යන්තරයෙන් පවා ණය එකතු කර ගන්න ඉඩ ප්‍රස්ථා ලබා දෙන භයානක පනත් කෙටුම්පතක්.

1989 වර්ෂයේ සිට -මගේ පාර්ලිමේන්තු කාලය තුළ- මෙවැනි වගන්තියක් ඇතුළත් පනතක් මම දැකලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ 5වන වගන්තිය කෙරෙහි මම තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කරනවා. එම වගන්තියේ තිබෙනවා, "රාජ්‍ය ණය ප්‍රතිමූල්‍යනය හා පූර්ව මූල්‍යනය කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව සඳහා හෝ ආණ්ඩුව වෙනුවෙන් එකතු කරනු ලබන යම් ණයක් 2017 අංක 30 දරන විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තිය යටතේ විධිවිධාන අදාළ වීමෙන්ද, එසේම 2017 අංක 30 දරන විසර්ජන පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනෙන් පසු පනවනු ලබන යම් වාර්ෂික විසර්ජන පනතක විධිවිධාන අදාළ වීමෙන් නිදහස් විය යුතුය. " මේ පාර්ලිමේන්තුව අය වැය ලේඛනය තුනෙන් දෙකකින් සම්මත කළත්, අය වැය ලේඛනයේ මොනවා තිබුණත්, ඒවායින් නිදහස්ව මේ පනත යටතේ ඕනෑතරම් ණය ගන්න මුදල් ඇමතිවරයාට බලය දෙනවා. මේක මහ පුදුම පනත් කෙටුම්පතක්. මෙම පනත් කෙටුම්පත 2017 වර්ෂයට බලපානවා. 2017 වර්ෂයට බලපානවා කියන්නේ අතීතයට බලපාන නීතියක් වෙනවා. අතීතයට විතරක් නොවෙයි. අනාගතයේ මින් ඉස්සරහටත් බලපාන විධියට නීතියක් ගෙනෙනවා. පාර්ලිමේන්තුවට තිබෙන වැදගත්ම පනත තමයි විසර්ජන පනත. විසර්ජන පනත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, පාර්ලිමේන්තුවේ මාසයකටත් වඩා වැඩි කාලයක් විවාද කර, දෙවන වර කියවා, තුන්වන වර කියවා ඡන්දය විමසා, තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත වෙලා මෙන්න මෙච්චරයි ණය ගන්න පුළුවන්, මේ විධියටයි ණය ගන්න පුළුවන්. ණය පිළිබඳ උපරිමය මෙච්චරයි කියා මේ ගරු සභාව සම්මත කළත් මේ වගන්තිය නිසා, පර්ලිමේන්තුව නිකම් රබර් මුද්‍රාවක් බවට පත් වෙනවා.

මේක ඉතාම භයානක තත්ත්වයක්. ඉතිහාසයේ කිසි දිනක නොවූ විරූ ආකාරයට ලංකාවේ පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් වෙලායි තිබෙන්නේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, සම්ස්ත ණය ක්‍රමය, සම්ස්ත බැංකු ක්‍රමය, සම්ස්ත මුදල් ක්‍රමය සම්පූර්ණයෙන් හෙල්ලිලා, පමණට වඩා රත් වුණු -overheated වුණු- මුදල් වෙළෙඳ පොළක්; ප්‍රාග්ධන වෙළෙඳ පොළක් තමයි අපේ රටේ තිබෙන්නේ. ඒ ඇවිලෙන ගින්නට පිදුරු දමනවා වාගේ, ඒ ඇවිලෙන ගින්නට පෙට්‍රල් වත්කරනවා වාගේ පනත් කෙටුම්පතක් තමයි මේ සම්මත කරන්න සූදානම් වෙන්නේ. ඒකාබද්ධ විපක්ෂය ඉතාම පිළිකුලෙන් යුතුව මේ පනත් කෙටුම්පත හෙළා දකිනවා. පාර්ලිමේන්තුවේ තිබෙන බලය ඇදගෙන යාමට; බුල්ඩෝස්කරණයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. මේක කාගේ වුවමනාවට කරන්න යන දෙයක්ද කියා මට වටහා ගන්න අමාරුයි. "විසර්ජන පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වීම" කියා මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව කියා තිබෙනවා. විසර්ජන පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වෙනවා කියන්නේ, අය වැය කියන්නේ කඩදාසි කොළ ටිකක් විතරයි කියන එකයි. මේ පනත අනුව ණය කළමනාකරණය කරන විට විසර්ජන පනතේ කිසියම් නීතියක් අදාළ වීමෙන් නිදහස් වෙනවා. එයින් කරන්න බලාපොරොත්තු වන දෙය මොකක්ද? "ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතු කරගැනීමට බලය දීම සඳහාද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද වූ පනත් කෙටුම්පතකි" කියා එහි සඳහන් වෙනවා. මේ පනත් කෙටුම්පත තවම පාර්ලිමේන්තුවට පිළිගන්වා නැහැ. ඒකාබද්ධ විපක්ෂයේ ආර්ථික පර්යේෂණ ඒකකයෙන් මේ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවලා, එම පනත් කෙටුම්පත ඉදිරිපත් වෙන්න කලින් එය එන එක නවත්වා ගැනීම සඳහා අපි මැදිහත් විය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාටත් ඒ පිළිබඳව විශාල වගකීමක් තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

මෙන්න මේ කාරණයත් මේ දිනවල නිතර සඳහන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ මේ පාර්ලිමේන්තුවට මුදල් පිළිබඳව ඇති නීතිමය බලය පිළිබඳව බරපතළ ගැටලු මතුවෙලා තිබෙනවා. මුදල් පිළිබඳ බලය පාර්ලිමේන්තුවට තිබුණත්, අපේ රටේ සමස්ත මූල්‍ය හසුරුවන බලය තිබෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට සිංගප්පූරු පුරවැසියෙක් පත් වෙනවා. එහෙම කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය එතකොට මතු වෙනවා. ඒ ප්‍රශ්නය මතු වන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165වන ව්‍යවස්ථාව අනුවයි. එහි එක කොටසක් මම දැන් කියන්නම්. එම ව්‍යවස්ථාවේ මාතෘකාව, "රජයේ නිලධරයන් සහ වෙනත් අය ප්‍රතිඥාව හෝ දිවුරුම් දිය යුතු බව" යන්නයි.

"... සෑම පළාත් පාලන ආයතනයක ම සහ සෑම රාජ්‍ය සංස්ථාවක ම සේවයෙහි නියුක්ත සෑම තැනැත්තකු ද හතරවන උපලේඛනයෙහි දැක්වෙන ප්‍රතිඥාව, නැතහොත් දිවුරුම දී ඊට අත්සන් කළ යුත්තේය. එසේ ප්‍රතිඥා දීම, නැතහොත් දිවුරුම් දී ඊට අත්සන් තැබීම නොකළහොත්, එම රජයේ නිලධාරියා හෝ අධිකරණ නිලධාරියා හෝ තැනැත්තා හෝ ධුරයක් දරන්නා සේවයෙන් හෝ නිලයෙන් හෝ පහ වන්නේය" කියා ඒ යටතේ ඇති ඡේදයේ එක් කොටසක සඳහන් වෙනවා.

සිංගප්පූරු ජාතික අර්ජුන මහේන්ද්‍රන් ඒ දිවුරුම දෙන්නේ නැතිවයි සල්ලි කොළයට අත්සන් තැබුවේ. ඔහු එම දිවුරුම දුන්නා නම්, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවැනි උපලේඛනය අනුව ඔහු දිවුරන්න ඕනෑ මෙහෙමයි:

"...වන මම ... ධුරයෙහි කාර්යය හා කර්තව්‍යය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට අනුකූලව අවංකව ඉටු කරන බවට ද, ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවට ද, මගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි. / දිවුරුම් දෙමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිංගප්පූරු පුරවැසියකුට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවට ගෞරව බහුමානයෙන් දිවුරන්න බැහැ. එහෙම දිවුරන්න බැරි නිසා ඔහු දිවුරුවේ නැහැ. බැදුම්කරය පිළිබඳ කොමිසම, COPE එක නිසි ආකාරයට, වගකීමෙන් මෙහෙයවීමේ ගෞරවය අපේ නිටපු අමාත්‍යවරයකු හා මන්ත්‍රීවරයකු වන ගරු ඩිව් ගුණසේකර මැතිතුමාට හිමි වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය ඇහුවාම, "මුදල් නෝට්ටුවට අත්සන් තබන මහ බැංකු අධිපතිවරයා මේ දිවුරුම දුන්නේ නැහැ" කියා එතුමා බොහොම පැහැදිලිව කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට රජයේ ආයතන සංග්‍රහයේ 7.2 වගන්තිය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

"රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාළ අමාත්‍යවරයා පනවන නියමයන් හා කොන්දේසි යටතේ ද, ඔහුගේ අනුමැතිය ද ඇතිව මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන පුද්ගලයෙක් රාජ්‍ය සේවයට පත් කළ නොහැකිය."

ඒ, රජයේ ආයතන සංග්‍රහයේ 7.2 වගන්තියයි. එතකොට රාජ්‍ය පරිපාලන ඇමතිවරයා මේ ගරු සභාවට ඇවිල්ලා උත්තර දෙන්න ඕනෑ, අර්ජුන මහේන්ද්‍රන් කියන මේ රටේ පුරවැසියකු නොවන කෙනෙකුට මේ තනතුර දෙන්න එතුමා එකඟ වුණාද කියන එක ගැන. ඒ නිසා අද වන විට අපේ රටේ මුදල් නෝට්ටුව පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් මතු වෙනවා. එතුමා සිංගප්පූරු පුරවැසියෙක්. මම හිතන විධියට ඊයේ දින සිට සිංගප්පූරු අගමැතිවරයා මේ රටේ ඉන්නවා. මේ රටේ ඇති වෙලා තිබෙන විශාල බැංකු මංකොල්ලයට සම්බන්ධ වී තිබෙන්නේ සිංගප්පූරු පුරවැසියෙක් නම් එතුමා අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරන කොට, ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරන කොට ඇසිය යුතු පළමුවැනි ප්‍රශ්නය විය යුත්තේ "ලංකා ඉතිහාසයේ කවදාවත් නැතිව ශ්‍රී ලංකා මහ බැංකුවට අකුණු ගහලා ඉවරයි, ඒ නිසා ඒ සම්බන්ධයෙන් දඩුවම් දීම සඳහා ඔබේ රටේ පුරවැසියා එවනවාද?" කියන එකයි. ඒක තමයි මේ රජයේ නායකයන් විසින් එතුමාගෙන් ඇසිය යුතුව තිබුණේ. අපේ තිබෙන කනගාටුදායක තත්ත්වය මේකයි. සිංගප්පූරු අගමැතිවරයා ලංකාවට ආපු වෙලාවේ අපට වඩා හොඳට අර 'ලංකාදීප' පුවත්පතේ කාටූන් ශිල්පියකු වන දාස මහත්තයා මේ ප්‍රශ්නය මතු කර තිබෙනවා. අඩු ගණනේ මේ ගරු සභාවට වඩා කාටූන් ශිල්පියකුට හැඟෙනවා, මේ වාගේ ජාත්‍යන්තර මට්ටමේ සොරකමක්; රටේ ප්‍රතිරූපය කෙළෙසීමක්; රටේ බැංකුව කඩා වැටීමක් සිද්ධ වුණාම ඒ පුරවැසියාට අදාළ රටේ රාජ්‍ය නායකයා රටට ඇවිල්ලා ජනාධිපතිතුමා මුණගැසෙන කොට, අග්‍රාමාත්‍යතුමා මුණගැසෙන කොට රට පැත්තෙන් අහන්න ඕනෑ මොකක්ද කියන එක. එතුමන්ලා අහන්න ඕනෑ, "මෙයාට දඩුවම් දෙන්න ඕනෑ, තමුන්නාන්සේ එයාව එවනවාද?" කියන එකයි. එහෙම දඩුවම් දෙන ලකුණක් පෙනෙන්න නැහැ. ඒ නිසා මේ ගරු සභාවට විශාල වගකීමක් පැවරෙනවා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විනාඩියකින් අවසන් කරනවා.

මේ ගරු සභාවට මේ පිළිබඳව විශාල වගකීමක් පැවරෙනවා. 2018 වර්ෂය අපි හිතනවාට වඩා නරක ලෙස සමස්ත බැංකු, මූල්‍ය ආයතන, ණය දෙන ආයතන සියල්ල කඩා වැටිලා; බැඳුම්කර වෙළෙඳ පොළ, කොටස් වෙළෙඳ පොළ, ප්‍රාග්ධන වෙළෙඳ පොළ කඩා වැටිලා. එහි පීඩනය ජනතාවට දැනෙන තත්ත්වයක්. ජනතාවට දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මෙය තාක්ෂණික කරුණක් වන නිසා දේශපාලනයෙන් තොරව මේ පාර්ලිමේන්තුවත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් ශාස්ත්‍රීය වශයෙන් කටයුතු කරමින් එයට අදාළ නිවැරදි, බුද්ධිමය දායකත්වයකින් මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

[අ.භා. 3.12]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දකුණු ඉන්දීය ධීවරයින් මේ රටේ මුහුදු සීමාව උල්ලංඝනය කරමින් නීති විරෝධීව මත්ස්‍ය කර්මාන්තයේ යෙදීම තුළින් අපේ රටේ ධීවර කර්මාන්තයට වාගේම අපේ රටේ ජාතික ආර්ථිකයට, අපේ රටේ ස්වෛරීත්වයට, භෞමික අඛණ්ඩතාවට මරු පහරක් එල්ල වුණා. එය නතර කරන්න තියුණු අසිපතක් බදු වූ "1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත" අපට තිබුණා. නමුත් මේ රටේ මෙතෙක් බලයට පත්වෙලා හිටපු රාජ්‍ය නායකයෝ ඒ පනත හමස් පෙට්ටියට දමලා; කුණු බක්කියට දමලා; නීතිය ක්‍රියාත්මක නොකර පැත්තකට වෙලා මුණිවත රැක්කා; අහක බලාගෙන හිටියා. ඒ නිසා මෙතෙක් බලයට පත් වුණු මේ රටේ රාජ්‍ය නායකයන් වාගේම එයට අදාළ විදේශ කටයුතු, මුදල්, ආරක්ෂක, ධීවර ඇමතිවරු, ඒ අංශවල නිලධාරීන් පවා, අමාත්‍යාංශ ලේකම්තුමන්ලා, ලේකම්තුමියන්ලා පවා මේවා සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ක්‍රියා මාර්ගයක් නොගෙන ඉන්දියානු මධ්‍යම ආණ්ඩුවේ තර්ජනවලට, ගර්ජනවලට වාගේම තමිල්නාඩු ප්‍රාන්ත ආණ්ඩුවේ දේශපාලන අධිකාරියේ තර්ජන, ගර්ජනවලට යටවෙලා කල් ගෙවීමක් තමයි කරනු ලැබුවේ. ඒ වාගේම මා කියන්න ඕනෑ, වර්තමාන යහ පාලන ආණ්ඩුවේ නායකයන්ට වාගේම විදේශ කටයුතු, මුදල්, ආරක්ෂක සහ ධීවර යන විෂයයන් භාර අමාත්‍යවරුන්ටත් තම ආණ්ඩුව පිහිටුවලා වසර දෙකහමාරක් යන තෙක් මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගැනීමට නොහැකිව, අතේ අසිපත තියාගෙන එය ක්‍රියාත්මක නොකර මුනි වත රැකීමට සිද්ධ වුණු බව.

ඒක ඉතිහාසයේ සරදමක් වාගේම, රටට ඉතා බරපතළ ඛේදවාචකයක් කියා මා විශ්වාස කරනවා. එයාලා කල් ඇද්දා. එවන් තත්ත්වයක් තුළ, කුමන අඩු පාඩුකම් තිබුණත්, කුමන බලපෑම් තිබුණත් අවසානයේ රටේ ජනතාවගේ, ධීවර සංගම්වල, ධීවර ජනතාවගේ සුවිශේෂී මැදිහත්වීම සහ බලපෑම තුළ වර්තමාන ධීවර අමාත්‍යවරයාට අමාරුවෙන් හෝ මේ කටයුත්තට මැදිහත් වෙලා මේ කාරණය ඉෂ්ට කරන්න සිද්ධ වුණා. අපි කොන්දේසි විරහිතව හොඳ දෙයට හොඳයි කියන්න ඕනෑ; නරක දෙයට නරකයි කියන්න ඕනෑ. එම නිසා මේ කටයුත්තට මැදිහත් වෙලා අද මේ පනත් කෙටුම්පත කරළියට ගෙන ඒම සම්බන්ධයෙන් වර්තමාන ධීවර අමාත්‍යවරයාටත්, එම අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමියටත් විශේෂ ස්තුතියක් පිරිනමන්න අපි බලාපොරොත්තු වෙනවා. භූමියේ අඛණ්ඩතාව, ස්වෛරීභාවය, ජාතික ආරක්ෂාව, මුහුදු සීමාවල අයිතිය වෙනුවෙන් ඕනෑම රාජ්‍ය නායකයෙක්, ඕනෑම රටක් සෘජුව පෙනී සිටිනවා පමණක් නොව, යම් රටක ධීවරයන් හෝ වෙනත් අය ඇවිත් ඒවා උල්ලංඝනය කරනවා නම්, ඒවාට නිසි ක්‍රියාමාර්ග ගැනීමට එම රටවල ව්‍යවස්ථා ශක්තිමත් කර ගෙන තිබෙන බව අපි දන්නවා. ඒ අය ඒ විධියේ ක්‍රියාමාර්ග ගන්නවා. නමුත් අවාසනාවට අපේ රටේ මෙතෙක් බලයට පත් වුණු රාජ්‍ය නායකයන්ට මෙන්න මේ කාරණය ඉෂ්ට කිරීම සඳහා කොන්ද තිබුණේ නැහැ කියන එක මා මේ මොහොතේ මතක් කර දෙන්න ඕනෑ. මේ වාගේ සිද්ධීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණු 1948 ආගමන විගමන පනත මෙතෙක් කල් ක්‍රියාත්මක වුණේ මොට්ට කඩුවක් විධියටයි. එම නිසා මේ නීති විරෝධී ධීවර පන්න ක්‍රමය ඉන්දියානු ධීවරයා භාවිත කිරීම වෙනුවෙන්, වෙනත් අය භාවිත කිරීම වෙනුවෙන් ඒ පනත යටතේ කිසිදු ආකාරයක ක්‍රියාමාර්ගයක් ගන්න හැකියාවක් තිබුණේ නැහැ කියා මා විශ්වාස කරනවා. එම පනත මේකට අදාළත් නැහැ. එම නිසා මේ පනත හරියට මුවහත නැති මොට්ට කඩුවක් වාගෙයි. ඒකෙන් තමයි මෙතෙක් කල් මේ අය කොපුව නැතිව සටන් කළේ.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

මේ මොහොතේ හෝ මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර අපේ රටේ ජාතික ආර්ථිකයට, භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට, ධීවර සම්පත ආරක්ෂා කර ගැනීමට, ධීවරයා ආරක්ෂා කර ගැනීමට, විශේෂයෙන් උතුරේ ධීවර කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට මැදිහත් වුණු සියලු දෙනාට අපේ කෘතවේදීභාවය පළ කරන්න කැමැතියි. මෙතෙක් කල් කිසිදු ආකාරයක නීතියක් ක්‍රියාත්මක කිරීමට බැරි වුණු නාවික හමුදා නිලධාරින්ට, මේ පනත ක්‍රියාත්මක වීම තුළින් ඉතාම තියුණු විධියට, විධිමත් විධියට එම ආක්‍රමණිකයන් අත් අඩංගුවට ගෙන නීතිමය කටයුතු කිරීමට, ඒ අයට නිසි දඬුවම් ලබා දීමට ශක්තිය ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

මෙතෙක් කල් නිලධාරින්ගේ අත් දෙක බැඳලා, ඇස් දෙක බැඳලා තමයි තිබුණේ. ඒ නිසා තමයි අපි ඔවුන්ගෙන් ප්‍රශ්න කරන කොට, අපි ඉදිරියේ ඔවුන් නිරුත්තර වෙලා හිටියේ. ඒ නිසා ඒ බාධාව මේ තුළින් ඉවත්වීම ඉතාම ඵලදායකයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් 2016.07.08වන දින "දිවයින" පුවත් පතට අගමැතිවරයා කර තිබුණු ප්‍රකාශයක් මට මතකයි. "ඉන්දියානු ධීවරයින්ට මෙහේ ඇවිත් මාළු අල්ලන්න ඉඩ දෙන්නේ නැහැ. යුද්ධයක් නොකර මෙය විසඳා ගත යුතුයි" කියලා අගමැතිවරයා ප්‍රකාශ කර තිබුණා. අගමැතිවරයාගේ මෙම ප්‍රකාශය පිළිබඳව මම මීට පෙරාතුවත් -පාර්ලිමේන්තුවේ ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාද කරන කාරක සභා අවස්ථාවේදීත්, ඒ වාගේම මේ සම්බන්ධයෙන් කල් තැබීමේ යෝජනාවක් ගෙනා අවස්ථාවේදීත්- උපුටා දැක්වුවා. නමුත් ඔහුගේ එම ප්‍රකාශය සීමා වුණේ කථාවට විතරයි. ක්‍රියාවට කිසිම ආකාරයකින් ඔහු මැදිහත් වුණේ නැහැ.

අපි දන්නවා, ඉන්දියානු මධ්‍යම ආණ්ඩුව විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් විධිමත් විධියට සැලකිල්ල දක්වා තිබුණු බව. ඒ අයට වුවමනා වුණේ දිගින් දිගටම මේ ආක්‍රමණය සිදු කරලා අපේ ජාතික ආර්ථිකයට බලපෑම් කරමින්, උතුරේ ධීවර සම්පත් අත්තනෝමතිකව කොල්ල කමින් ඒ අයගේ ජාතික ආර්ථිකය ශක්තිමත් කර ගන්නයි. ඒ නිසා වරින් වර අපේ මැනි-ඇමතිවරුන්, නිලධාරින් දිල්ලියට කැඳවා කථාබහ කරලා, තමන්ගේ වාසිය අත්පත් කර ගන්න, තමන්ට ඒ අවශ්‍ය සාධක තබා ගන්න ඒ අය හැම තිස්සේම පරිස්සම් වුණා. ඒ නිසා තමයි ඔවුන් එහේ ගියපු අපේ ඒ මැනි-ඇමතිවරුන්ට, නිලධාරින්ට, සමහර අවස්ථාවල ප්‍රකාශ කරලා තිබුණේ, "ඔව්, මධ්‍ය ආණ්ඩුව මැදිහත් වෙලා භාරතයේ නැහෙනහිර, බටහිර, දකුණු ඉන්දියාවේ නැහෙනහිර, බටහිර සහ දකුණේ මේ කර්මාන්තයට බලපෑම් ඇති නොවන විධියට ධීවර වරාය කිහිපයක් ස්ථාපිත කරනවා" කියලා. මේ සම්බන්ධයෙන් කෝටි 1,000ක් විතර වෙන් කරනවායි කියලාත් තිබුණා. නමුත් අපි දන්නවා වරායක් හදන්න කොයි තරම් කාලයක් යනවාද කියලා. ඒ නිසා ඒ අය උත්සාහ කළේම වෙන මොකකටවත් නොවෙයි. අපේ රටෙන් ගිය මැනි-ඇමතිවරුන්ට, ඒ වාගේම නිලධාරින්ට යම් යම් ආකාරයේ වහසි බස් කියමින්, ඒ විධියේ උපක්‍රම භාවිත කරලා මේ වැඩේ කල් දමාගෙන අර ඉන්දියානු ආක්‍රමණික ධීවරයින් කරන කටයුත්ත දිගටම පවත්වා ගෙන යාමට තමයි ඔවුන් කටයුතු කළේ. ඒ විතරක් නොවෙයි, "අපි බහුදින යාත්‍රා - multi-day boats - 500ක් විතර නිෂ්පාදනය කරලා විශේෂයෙන්ම දියඹ මුහුදේ මත්ස්‍ය කර්මාන්තයට යවනවා. අපි ඒ කටයුත්ත කරනවා" කියලා ඔවුන් අපේ අයට කිව්වා. ඒකෙන් ඔවුන් බලාපොරොත්තු වුණේ මොකක්ද? ඒකෙන් බලාපොරොත්තු වුණේත් අපේ මේ කටයුත්තට යම් ආකාරයක බාධාවන් පමුණුවමින් "අපි මේ නීතිවිරෝධී වැඩෙන් ඇත් වෙනවා" කියන එක කථා කරමින් මේ කර්මාන්තය දිගටම පවත්වාගෙන යාමට අවකාශ ලබාගැනීමයි කියන එක මා විශ්වාස කරනවා. ඒ නිසා ඉන්දියානු මධ්‍යම ආණ්ඩුව පැත්තෙනුත්, ඒ වාගේම තමිල්නාඩු ප්‍රාන්තය පැත්තෙනුත් ඒ දේශපාලන අධිකාරිය සහ බලධාරින් දිගින් දිගටම කරගෙන ගියේ කල් මැරීමක් තමයි කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නිසා තමයි අපි අපේ පැත්තෙන් මේ සම්බන්ධව අවධානය යොමු කරලා, මේ කටයුත්තෙන් අපට මහා දැවැන්ත පාඩුවක් දෙනිකව, ඒ වාගේම මාසිකව, ඒ වාගේම වාර්ෂිකව සිද්ධ වෙනවාය කියන එක ඔබතුමන්ලාගේ අවධානයට යොමු කළේ. අපි මේ සම්බන්ධයෙන් ඇති තරම් මේ පාර්ලිමේන්තුවේ කථා කරලා, අදාළ අමාත්‍යවරයාගේ අවධානයට යොමු කළාය කියන එක සැලකිල්ලට ගත යුතුයි. අන්න ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත ඉතාම ඉක්මනින් සංශෝධනය කර සම්මත කරන්න අපේ පැත්තෙන් අනිවාර්යයෙන්ම අපේ සහයෝගය පළ කරනවාය කියලා අපි කියා සිටියේ.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානය පිණිස අප මේ කාරණයත් කියන්න ඕනෑ. නීති විරෝධීව මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රාවලින් -දිගින් මීටර 15ට වඩා අඩු ට්‍රෝලර් යාත්‍රාවලින්- අය කරන දඩ මුදල මේ සංශෝධනය මඟින් වැඩි කර තිබෙනවා. එය අපේ යෝජනාවක්. අමාත්‍යවරයා එය පිළිගෙන තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි ඒ යෝජනාව කරන්න හේතුව මොකක්ද? මීටර 15ට වඩා අඩු යාත්‍රා තමයි උතුරු මුහුදු ප්‍රදේශයට වැඩිපුර එන්නේ; ආක්‍රමණය කරන්නේ. දළ වශයෙන් එක් දිනකට ධීවර යාත්‍රා 1,500ක් ගණනේ සතියකට යාත්‍රා 6,000ක් එනවා. එහෙම ඇවිල්ලා ඒ අය ට්‍රෝලිං ක්‍රමය -ඒ නීති විරෝධී පන්න ක්‍රමය- උපයෝගි කරගෙන ඉස්සන්, කකුළුවන්, මත්ස්‍යයන් විශාල වශයෙන් අල්ලා ගනිමින්, මත්ස්‍ය ආහාර, මත්ස්‍ය පැළෑටි විශාල වශයෙන් විනාශ කරමින් දැවැන්ත විනාශයක් අපට අත් පත් කර දෙනවා. ඒ මඟින් ඔවුන් වාර්ෂිකව උපයා ගන්නවා අපේ ශ්‍රී ලාංකීය මුදලින් දළ වශයෙන් රුපියල් කෝටි 5,000ට වඩා. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කතා බහ කරමින් කිව්වා, 'පය බරවායට පිටකර බෙහෙත් බඳිනවා' වාගේ කටයුතු කරන්නේ නැතිව අදාළ පනත් කෙටුම්පත ඉක්මනින් ගෙනැල්ලා, ඒ කරන විනාශය වළක්වා ගෙන අපේ ජාතික ආර්ථිකය, අපේ ධීවරයාගේ සම්පත, උතුරේ ධීවරයා ආරක්ෂා කරගන්න කටයුතු කරන්නය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ අනන්‍ය ආර්ථික කලාපය තුළට විශාල යාත්‍රා එනවා. දිගින් මීටර 15ට වඩා වැඩි යාත්‍රා දිගින් දිගටම එනවා. ඒ අය ඇවිල්ලා අපේ අනන්‍ය ආර්ථික කලාපය තුළින් ඉතාම විශාල මත්ස්‍ය අස්වැන්නක් නීති විරෝධීව නෙළා ගැනීම කරනවා. එහෙම කරන්නේ FAD කියන සුවිශේෂී පන්න ක්‍රමය උපයෝගි කරගෙනයි. දළ වශයෙන් මාස එකහමාරකට දෙකකට වතාවක් FAD ක්‍රමය උපයෝගි කරගෙන ඔවුන් ඒ මත්ස්‍ය අස්වැන්න එක් වතාවකට කිලෝ ලක්ෂ 3 සිට 5 දක්වා නෙළා ගන්නවා. ඒක බරපතළ කාරණයක්. ඒ නිසා, අපේ අනන්‍ය ආර්ථික කලාපයට ඇවිත් මත්ස්‍ය සම්පත මේ විධියට කොල්ල කනවා නම්, ඒ අයටත් දැඩි දඬුවම් පමුණුවන්න දඩ මුදල වැඩි කරන්න කියන ඉල්ලීම අපි අමාත්‍යවරයාගේ අවධානයට යොමු කළා. ගරු අමාත්‍යතුමා එය පිළිගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ දැවැන්ත මත්ස්‍ය සංහාරය මඟින් ඉන්දීය ධීවරයන් එක වසරකට රුපියල් කෝටි 5,000ක් උපයා ගැනීම මේ පනත ක්‍රියාත්මක කරලා හෙට සිට නවත්වා ගන්න අපට පුළුවන්කම තිබෙනවා නම්, ඒක රටේ ජාතික ආර්ථිකයට, රටේ භෞමික අඛණ්ඩතාවට,

ධීවරයාගේ ජීවිත ආරක්ෂා කරගන්න, මත්ස්‍ය සම්පත ආරක්ෂා කරගන්න අත්වැලක් වනවාය කියන එක මම විශ්වාස කරනවා.

ධීවර අමාත්‍යාංශයේ 2016, 2017, 2018 වර්ෂවල පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් කොපමණද? පුනරාවර්තන වියදම් දළ වශයෙන් ගත් විට රුපියල් කෝටි 536යි; ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 1,604යි; ඔක්කෝම, රුපියල් මිලියන 2,140යි. 2016, 2017, 2018 කියන වසර තුනට වෙන් කරපු පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් මෙන් දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයක් වාර්ෂිකව අපට අහිමි කරනවා, ඒ ධීවර ආක්‍රමණය නිසා. අපට ඒ සියල්ල නතර කර ගන්න පුළුවන්. එහිදී කිසිදු ආකාරයක ගැටලුවක් මතු වන්නේ නැහැ. 2016 වර්ෂයේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන බදු ප්‍රමාණය රුපියල් කෝටි 433යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ 11 ගුණයකට වැඩි මුදලක් අපට අහිමි වනවා, ඉන්දියානු ධීවරයන් කරන ඒ නීති විරෝධී ආක්‍රමණය නිසා.

ඒ ආක්‍රමණය නැති කර ගත්තොත් ධීවරයාට විශාල වශයෙන් සහන සලසන්න මේ මුදල් යොදා ගන්න පුළුවන්කම තිබෙනවා. ධීවර සහ ධීවර නිෂ්පාදන අපනයනය කරලා දැනට වාර්ෂිකව ලබා ගන්න ආදායමට වඩා වැඩි ආදායමක් -විසි තිස් ගුණයක ආදායමක් - මෙන්න මේ ආක්‍රමණය නිසා නැති වෙනවා. මේ ආක්‍රමණය නැවත්තුවොත් අපට ඒ ආදායමත් ආරක්ෂා කරගන්න පුළුවන්. ඒ වාගේම මේ කර්මාන්තය වැඩිදියුණු කර ගන්නත් පුළුවන්.

අපේ රටේ ධීවර වරායන් 20ක් තිබෙනවා. නැංගුරම් තොටුපොළවල් 58ක් තිබෙනවා. තොටුපොළවල් 860ක් තිබෙනවා. ධීවරයාට ගැළපෙන විධියට මේ සියල්ල නවීකරණය කරලා, ඒවායේ අඩුපාඩු සම්පූර්ණ කරලා, ධීවර සම්පත්ත් ආරක්ෂා කරගෙන, ධීවරයාත් ආරක්ෂා කරගෙන, රටේ ආර්ථිකයට යම් ආකාරයක මැදිහත්වීමක් සඳහා මෙහෙයුමක් කරන්න පුළුවන්කම තිබෙනවා. මේ ආක්‍රමණය නතර කරලා, ඒ විනාශය නතර කරලා, මේ සම්පත තුළින් ආදායම ලබා ගත්තොත් මේ කටයුතු දියුණු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා මේ කටයුත්ත අපි වහාම ක්‍රියාත්මක කළ යුතුයි කියලා.

මේ මොහොතේ අපට මේ කටයුත්ත කරන්න පුළුවන්කම තිබෙන්නේ පැහැදිලිවම මේ ධීවර පනතේ සංශෝධන හෙට සිටම ක්‍රියාවට නැගීම තුළින් පමණයි කියන කාරණය මා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න අවශ්‍ය ඒ ශක්තිය අපි අපේ අත් දෙකම උස්සලා ලබා දෙනවා. ඒ කවුරුවත් වෙනුවෙන් නොවෙයි, අපේ රටේ ජාතික ආර්ථිකයට, අපේ රටේ භෞමික අඛණ්ඩතාවට, අපේ රටේ ජාතික ආරක්ෂාවට සහාය වන අපේ රටේ ධීවරයාට, ඒ ධීවර පවුල්වල සංවර්ධනයට සහ ධීවර කර්මාන්තයේ වර්ධනය වෙනුවෙන්.

විශේෂයෙන්ම උතුරේ ධීවරයන් එක්ලක්ෂ පනස් දහසක් විතර ඉන්නවා. ඒ අයගේ සංවර්ධනය තමයි අපේ බලාපොරොත්තුව. ඒ නිසා මේ කාරණයට මැදිහත් වෙලා, සහයෝගය දීලා ඒ ප්‍රතිඵලය ලබා ගන්න. අපි අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා, ඉතාම ඉක්මනට මේ කටයුත්තට අත ගහලා, මෙතෙක් ක්‍රියාත්මක නොකරපු පනත ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක කරලා මම ඒ කියපු කාරණා ඉෂ්ට කිරීමට මැදිහත් වෙන්න කියලා.

මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා තවත් කාරණයක්. ත්‍රිකුණාමලයේ මාදැල්වලට ඩොල්ෆින් මසුන් අසුවුණාය කියන කාරණයට දැන් මාස නවයක් වෙනවා. ඒ මාදැල් තොටුපොළට මම ගියා. දැන් ඒ මාදැල් තොටුපොළේ මාදැල් පහක් අක්‍රිය කරලා තිබෙනවා; ඒ මාදැල් පාඩුව තහනම් කරලා තිබෙනවා. මා එතැනට ගිහිල්ලා බැලුවා. එස්පී කාර්යාලය -නාවික හමුදාවේ කාර්යාලය- ඉස්සරහමයි ඒ තොටුපොළ තිබෙන්නේ. ඒ නිසා ඒ අයට මොනම ආකාරයකින්වත් නීති විරෝධී කටයුත්තක නිරත වෙන්න කිසිම අවකාශයක් නැහැ. අහම්බෙන් වෙච්ච සිද්ධියක් තමයි මෙතැන තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා සමඟ මා කථා බහ කළා. ඒ අවස්ථාවේ එතුමා මට පොරොන්දු වුණා, ඉතාම ඉක්මනින් අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කරලා, මාස දහයක් අක්‍රිය වෙලා තිබෙන මේ මාදැල් පාඩුවේ ක්‍රියාකාරිත්වය නැවත ඇති කරනවා කියලා. අද මේ රාජ්‍ය නිලධාරීන්ගේ කුටියේ ඒ අධ්‍යක්ෂතුමා ඇවිල්ලා ඉන්නවා නම් මා එතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, හෙට සිට ඒ මාදැල් පාඩුව ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙන්න කියලා. මේ මාදැල් පාඩුවේ මාදැල් පහක් තිබෙනවා. මම හිතන හැටියට පවුල් සියයකට වඩා ඒ මාදැල් පාඩුවෙන් ජීවත් වෙනවා. අද ඒ අයට ලොකු ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා මම එතුමාගේ අවධානයට යොමු කරනවා, ඇමතිතුමාත් එක්ක කථා බහ කරලා හෙට සිට ඒ මාදැල් පාඩුව ක්‍රියාත්මක කරන්න කියලා.

මම අමාත්‍යතුමාගේ අවධානයට තවත් කාරණයක් යොමු කරනවා. කුඩාවැල්ල ධීවර බල ප්‍රදේශයේ එස්. එස්. සමන්ති මහත්මියගේ IMULA 0855 TLE අඩි හතළිස් එකහමාරක් දිග බහුදින යාත්‍රාව 2018.01.19 වන සෙනසුරාදා උදේ මාලදිවයින් border එක දිගේ අරාබි මුහුදු පැත්තට යනකොට මාලදිවයිනේ බලධාරීන් විසින් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. දැන් මේ බෝට්ටුව මාලදිවයිනේ වරායට අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ අය කිසිම ආකාරයකින් නීති විරෝධී කටයුත්තක -මත්ස්‍යයන් ඇල්ලීම හෝ ඒ ආශ්‍රිත කර්මාන්තයක- නිරත වෙලා නැහැයි කියලා කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ගැන අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා; විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා. එම නිසා අමාත්‍යතුමාත්, ඔබතුමන්ලාත් මේ කටයුත්ත සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඒ අයට සහන සලසන්නත්, මේ යාත්‍රාව මුදා ගන්නත් කටයුතු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. එම බෝට්ටුවේ ගිය අයගේ පවුල්වල අය සහ එම බෝට්ටුවේ අයිතිකාර කොටස් අද ලොකු ඛේදවාචකයකට මුහුණ දීලා තිබෙනවා. එම නිසා ඉතාමත් ඉක්මනින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමනි, මෙම කාරණය පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාගේ කථාවේ දී පැහැදිලි කළා, 2016 වසරේ දී ධීවර කටයුතුවල මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර තිබෙන බව. 2015ට සාපේක්ෂව 2016 මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් පන්ලක්ෂ තිස්දහස් නවසිය විසි එක දක්වා සියයට දෙකකින් වර්ධනය වෙලා තිබෙනවා කියලා ඔබතුමා සඳහන් කළා. ඉන්දියානු ආක්‍රමණිකයන් කරන මේ නීතිවිරෝධී කටයුත්ත නතර කළෝතින්; උතුරු මුහුදේ සිදු වන මේ කටයුත්ත නතර කළොත්, අපේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මීටත් වඩා වැඩි ප්‍රමාණයක දායකත්වයක් ලබා ගන්න පුළුවන් වන බව අපි දන්නවා. ඒ වාගේම 2008 වසරේ අය වැය යෝජනා අනුව, බහුදින යාත්‍රාවල මසුන් අස්වනු කල්තබා ගැනීමට අවශ්‍ය ශීතාගාර වෙනුවෙන් යන වියදමෙන් සියයට 50ක් රජය විසින් දරනවා කියලා එතුමා පැහැදිලි කළා. ඒ වාගේම අඩි 55ට වඩා දිග බහුදින යාත්‍රාවලට වැයවන වියදමෙන් සියයට 50ක් රජය දරනවා කියලා එතුමා පැහැදිලි කළා. ඒ වාගේම හලාවත, මීරිස්ස, කරෙයි නගර් හා පුරාණ වැල්ල ධීවර වරායන් වැඩිදියුණු කිරීමට රුපියල් මිලියන 1,750ක් වෙන් කරනවා කියලා එතුමා සඳහන් කළා. උතුරේ සිදුවන මේ ආක්‍රමණය නවත්වන්න පුළුවන් නම්, රුපියල් කෝටි 5,000ක පමණ මුදලක් වාර්ෂිකව අපට ඉතිරි කරගෙන එම මුදල

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

මෙම කටයුත්තට යොදවා එය යථාර්ථයක් බවට පත් කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා කියන එකත් මම සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම වෙරළබඩ ප්‍රදේශවල ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම සඳහා ආරම්භ කර තිබෙන වැඩසටහන දිගටම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 450ක් වෙන් කරලා තිබෙන බව ගරු ඇමතිතුමා සඳහන් කළා. මෙම පනත් කෙටුම්පත සම්මත වී මෙම පනතේ ක්‍රියා මාර්ග හෙට සිට ආරම්භ කළොත්, අපට මෙතෙක් අහිමි වුණු එම රුපියල් කෝටි 5,000ක මුදලත් ලබා ගෙන ඒ මඟින් ධීවරයාට සහන සලසන්න, ධීවර කර්මාන්තය වැඩිදියුණු කරන්න, වෙරළ බඩ ප්‍රදේශවල ගම්මාන වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව කරගෙන යන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

ගන්දර ධීවර වරාය, හම්බන්තොට, මන්නාරම, මඩකලපුව දිස්ත්‍රික්කවල ජලජීවී වගා කර්මාන්ත කලාප පිහිටුවීම කළ යුතු වනවා. ඒ වාගේම හම්බන්තොට, මඩකලපුව, යාපනය ඇතුළු වෙරළාසන්න දිස්ත්‍රික්ක 10ක ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම, ඒකාබද්ධ මිරිදිය ගම්මාන පිහිටුවීම යන ව්‍යාපෘති ආරම්භ වෙලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත සම්මත වී එය ක්‍රියාත්මක කිරීම තුළින් ඉන්දියානු ආක්‍රමණිකයන් විසින් අපට අහිමි කරන රුපියල් කෝටි 5,000ක පමණ මුදල ආරක්ෂා කරගෙන කිසිම ගැටලුවකින් තොරව ධීවර කර්මාන්තයට අවශ්‍ය පදනම යොදාගනිමින් මුළු රටේම ධීවර ජනතාවට සහන ලබා දීමට එම මුදල් යොදවා ගන්න පුළුවන් කියන එක මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන්, මම එක ඉල්ලීමක් කරන්න කැමැතියි. පනත් කෙටුම්පත් ගෙනැවිත් ඒවා සම්මත කර ගත්තාට වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක වන්නේ නැත්නම්. එම නිසා මෙම පනත් කෙටුම්පත සම්මත වූවාට පසුව එය භාවිතයට නහලා, ආරක්ෂක අංශවලට අදාළ බලතල ලබා දීම තුළින් නීති විරෝධී ලෙස අපේ රටට එන ආක්‍රමණිකයන්ගේ කටයුතු වහාම නැවැත්වීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්න පුළුවන්. එසේ වුණොත්ින් අපට මෙම මුදල් ප්‍රමාණය ඉතිරි වනවා වාගේම, එම මුදල ලබා ගෙන අපේ ජාතික ආර්ථිකයට, රටේ ආරක්ෂාවට, අපේ රටේ භෞමික අඛණ්ඩතාවට, ධීවර කර්මාන්තයේ දියුණුවට සහ ධීවර කර්මාන්තයෙන් යැපෙන ජනතාවගේ දියුණුවට යොදා ගන්න හැකි වේවි කියා මා විශ්වාස කරනවා. එම නිසා මේ කටයුත්ත ඉතාමත්ම ඉක්මනින් භාවිතයට නහන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

[පි.ප. 3.39]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! கடற்றொழில் (வெளிநாட்டு மீன்பிடி வள்ளங்களை ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலத்தை நிறைவேற்று வதற்கான பிரேரணையைக் கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர் அவர்கள் இன்று இந்தச் சபையில் முன்வைத்திருக்கின்றார். வெளிநாட்டுப் படகுகள் வருவதன்மூலம் எங்களுடைய மீனவர்களுடைய வாழ்வாதாரங்கள் தொடர்ந்தும் பாதிக்கப்பட்டு வருகின்றன. அந்த வகையில் இந்தச் சட்டமூலம் நிறைவேற்றப்படுவது மட்டுமல்லாமல், அதனை நடைமுறைப்படுத்துவதற்குரிய நடவடிக்கைகளைத் திணைக்கள அதிகாரிகள் எடுக்க வேண்டும். ஏனெனில் பல விடயங்களில் சட்டங்கள் உருவாக்கப்பட்டுள்ள போதிலும் அவை வெறுமனே வரைவு எழுத்துகளாகவே தொடர்ந்தும் இருக்கின்றன. ஒருசில அரசியல் காரணங்களினாலும் அதிகார வர்க்கத்தினர் சிலரின் செயற்பாட்டினாலுமே குறித்த சட்டங்கள் கிடப்பில் கிடக்கின்றன. இன்று வெளிநாட்டு மீன்பிடி வள்ளங்களின் வருகையால் எமது உள்ளூர் மீனவர்களின் வாழ்வாதாரம் பாதிக்கப்படுகின்றது. அதனைத் தடுப்பதற்காகவே இந்தச் சட்டமூலம் இங்கே கொண்டுவரப்பட்டுள்ளது. அந்த வகையில் அந்நியப் படகுகளின் வருகையைத் தடுத்து, எங்களுடைய மீனவர்களின் வாழ்வாதாரத்தை உயர்த்த நடவடிக்கையெடுக்க வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களையும் திணைக்கள அதிகாரிகளையும் கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரத்தில், கடற்றொழில் அமைச்சு சார்ந்த பல விடயங்களை முன்னெடுப்பது மிகவும் கடினமாக இருக்கின்றது. மன்னாரில் ஒரு பண்ணையை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டிருப்பதாகக் கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். ஆனால், "அதற்குரிய 1,200 ஹெக்டேயர் நிலம், Wildlife Conservation திணைக்களத்திற் குரியதென்று gazette மூலம் அறிவித்தல் வெளியிடப் பட்டிருக்கின்ற காரணத்தினால் அந்த வேலை தாமதமாகிக் கொண்டிருக்கின்றது" என்று கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். ஆனால், இது மட்டும்தான் மன்னாரில் Wildlife Conservation திணைக்களத்தினால் ஏற்பட்ட பிரச்சினை என்று கருத முடியாது. அங்கு மீனவர்களின் வாழ்வாதாரத்தைப் பாதித்திருக்கின்ற Wildlife Conservation திணைக்களத்தின் நடவடிக்கைகளுக்கு எதிராக ஏன், கடற்றொழில் அமைச்சு நடவடிக்கை எடுக்கவில்லை? குறிப்பாக, மன்னார் மாவட்டத்தில் Wildlife Conservation திணைக்களம் தொடர்பான அதிகமான பிரச்சினைகள் இருக்கின்றன. அங்கு மீன்பிடிப் படகுகள் சென்று வருவதற்குரிய 11 ஓடைகளை வெட்டுவதற்கு ஆசிய அபிவிருத்தி வங்கியின் நிதியொதுக்கீட்டில் எற்பாடுகள் நடைபெற்றபோதிலும், Wildlife Conservation திணைக் களத்தின் அனுமதியைப் பெற்று அந்த வேலையைச் செய்வதற்குக் கடற்றொழில் திணைக்களத்தின் பணிப்பாளர் எந்தவிதமான முயற்சியையும் எடுக்கவில்லை. அந்தப் பணிப்பாளர் தற்போது இல்லையென்று நான் நினைக்கின்றேன்.

இதேபோன்று வேறு மாவட்டங்களில், குறிப்பாக தென்பகுதியிலிருக்கின்ற மாவட்டங்களில், ஏன் அமைச்சர் அவர்களுடைய சொந்த மாவட்டத்தில்கூட மீனவர்களுக்கு இப்படியான ஒரு பிரச்சினை வந்திருந்தால், கடற்றொழில் திணைக்களம் இரண்டு - மூன்று நாட்களில் அதற்குத் தீர்வு கண்டிருக்கும். ஆனால், மன்னார் மாவட்டத்திலிருக்கின்ற மீனவர்களுக்குப் பிரச்சினை வந்தால், மன்னாரில் இருக்கின்ற குறித்த அதிகாரி, பணிப்பாளருக்கு அது சம்பந்தமாக ஒரு கடிதத்தை அனுப்பிவைப்பார்; அத்துடன், அந்தப் பிரச்சினையைத் தீர்த்துவைப்பதற்கான நடவடிக்கைகள் நிறுத்தப்பட்டுவிடும். அந்த அடிப்படையில் அங்கு பாப்பாமோட்டை, கோந்தம்பிட்டி, பனங்கட்டிக்கொட்டு, பள்ளிமுனை, கத்தாளம்பிட்டி, இலுப்பைக்கடவை, அந்தோனியார்புரம், மூன்றாம்பிட்டி, தேவன்பிட்டி ஆகிய கிராமங்களில் மீன்பிடிப் படகுகள் சென்றுவருகின்ற ஓடைகளை வெட்டுவது சம்பந்தமாக Wildlife Conservation திணைக்களத்தின் அனுமதியைப் பெறுவதில் மீன்பிடித் திணைக்களத்திற்கு ஒரு வருடத்துக்கு மேலான காலம் தேவைப்படுகின்றது. எனவே, இவ்வளவு காலமும் பணிப்பாளர் நாயகம் அங்கு என்ன செய்துகொண்டிருந்தார்? கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சு

எங்களுடைய மாவட்டத்திலுள்ள மீனவர்களுடைய பிரச்சினைகளைத் தீர்த்துவைப்பதற்குரிய நடவடிக்கைகளை எடுப்பதற்குத் தவறிவிட்டது என்பதுதான் என்னுடைய கருத்து.

மேலும், தங்களுடைய காலத்தில் தாங்கள் தீடைக்குச் சென்று மீன்பிடியில் ஈடுபட்டுவந்ததாகத் தலைமன்னார் கிராமத்தில் இருக்கின்ற 60 வயது முதிர்ந்த மீனவர் ஒருவர் கூறியிருக்கின்றார். பல மீனவர்கள் அந்தத் தீடைக்குச் சென்று மீன்பிடியில் ஈடுபட்டு வந்ததை நானும் கண்டிருக்கின்றேன். ஆனால், கடந்த ஒன்றரை வருடங்களாக மீனவர்கள் அந்தத் தீடைக்குச் சென்று மீன்பிடியில் ஈடுபடுவதற்கு அனுமதி மறுக்கப்பட்டிருக்கிறது.Wildlife திணைக்களம்தான் அதற்கும் காரணம்! மீனவர்கள் சார்ந்த இந்தப் பிரச்சினை பற்றிக் கடற்றொழில் அமைச்சின் செயலாளர் அவர்கள் Wildlife திணைக்களத்தின் பணிப்பாளருடன் கதைத்து அதற்குரிய அனுமதியை எங்களுடைய மீனவர்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, Please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

විසින් සිරිත කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවතට වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய மன்னார் மாவட்டத்தில் இருக்கின்ற மீனவர்கள் நிருவாக ரீதியாக - அமைச்சு ரீதியாகப் பல விடயங்களை முன்னெடுக்க முடியாமல் இருக்கின்றார்கள். சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் தற்பொழுது இங்கு இல்லாவிட்டாலும் அமைச்சினுடைய மற்றும் திணைக்கள அதிகாரிகள் இங்கு இருக்கின்றார்கள். அவர்கள் அங்கு குறித்த அபிவிருத்திப் பணிகளை மிக விரைவில் மேற்கொள்வதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். நான் மன்னாரில் இருக்கின்ற மாவட்டக் கடற்றொழில் அதிகாரியுடன் கதைத்தபோது அவர் பணிப்பாளர் நாயகத்திற்கு அது சம்பந்தமாகக் கடிதம் அனுப்பியிருப்பதாகக் கூறுகின்றார். "அதற்கு என்ன பதில் வந்திருக்கின்றது?" என்று நானும் ஒரு வருடமாகக் கேட்டுக்கொண்டிருக்கின்றேன். அதற்கு இன்னமும் பதில் கிடைக்கவில்லை. அந்தவகையில், மன்னார் மாவட்டத்தில் இருக்கின்ற மீனவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளில் அதிகமானவை Wildlife Conservation திணைக்களம் சார்ந்தவையாகும். ஆகவே, அங்கு அந்த ஓடைகளைப் புதிதாக அமைப்பதற்குரிய அனுமதியை மட்டும்தான் அந்தத் திணைக்களத்திடமிருந்து பெற்றுத்தர வேண்டும். இவ்விடயம் தொடர்பில் Wildlife Conservation திணைக்கள அதிகாரிகளுடன் நான் கதைத்தேன். அதற்கு அவர்கள், "கடற்றொழில் திணைக்களப் பணிப்பாளர் எங்களுக்கு எழுத்துமூலம் கடிதமொன்றை அனுப்பினால், அதற்கான அனுமதியை வழங்குவோம்" என்று கூறினார்கள். இதற்கான அனுமதியை மிக விரைவில் பெற்றுத்தருமாறு நானும் பல தடவைகள் முன்னாள் பணிப்பாளரிடம் கோரிக்கை விடுத்திருக்கிறேன். அதுபோலவே, காலாகாலமாக தீடையில் மீன்பிடியில் ஈடுபட்டு வந்த தலைமன்னார் கிராமத்தில் உள்ள மீனவர்கள் அங்கு மீண்டும் மீன்பிடியில் ஈடுபடுவதற்குரிய அனுமதியையும் பெற்றுத்தரவேண்டும். கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த காலத்தில் கடற்றொழில் திணைக்களத்தில் பணிபுரிந்த அதிகாரிகளின் அக்கறையற்ற செயற்பாடுகள் காரணமாகவே எங்களுடைய மீனவர்கள் இவ்வளவு தூரம் பாதிக்கப்பட்டிருக்கிறார்கள் என்பதை எடுத்துக்காட்டவே இந்த விடயத்தைக் குறிப்பிடுகின்றேன். தற்பொழுது கடற்றொழில் அமைச்சுக்குப் புதியதொரு செயலாளர் நியமிக்கப்பட்டிருக்கிறார். புதிய பணிப்பாளர் ஒருவர் அங்கு நியமிக்கப்பட இருக்கின்றார். எனவே, இந்த அதிகாரிகள் எங்களுடைய மீனவர்களுக்குச் சரியான முறையில் பணி செய்வதற்கு முழுமூச்சுடன் செயற்படவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

1983ஆம் ஆண்டுக்கு முன்னர் முல்லைத்தீவு மாவட்டத்தில் கொக்கிளாய் முதல் கருநாட்டுக்கேணி வரை தமிழர்களுடைய 15 கரைவலைப்பாடுகள் இருந்தன. ஆனால், அந்த மீனவர்களை அங்கிருந்து வலுக்கட்டாயமாக அனுப்பியதற்குப் பின்னர், இந்தக் கரைவலைப்பாடுகள் தென்பகுதியைச் சேர்ந்த சிலருக்கு வழங்கப்பட்டது. அவை மட்டும்தான் தென்பகுதியைச் சேர்ந்தவர்களுக்கு வழங்கப்பட்டது. ஆனால், அவர்கள் அங்குள்ள பிரதேச செயலகக் காணிக்கு உட்பட்ட இடத்தில் தங்களுடைய நிரந்தரக் கட்டிடங்களை நிர்மாணித்திருந்தார்கள். இது தொடர்பில் கரைதுறைப்பற்றுப் பிரதேச செயலாளர் உரிய நடவடிக்கையை எடுக்கவேண்டு மென்று மாவட்ட அபிவிருத்திக் குழுக்கூட்டத்தில் நாங்கள் வலியுறுத்தியிருந்தோம். அந்த வகையில் கரைதுறைப்பற்றுப் பிரதேச செயலாளர், "ஏன், நீங்கள் அனுமதி இல்லாமல் அங்கு கட்டிடங்களைக் கட்டினீர்கள்" என்று குறித்த நபர்களிடம் விளக்கம் கோரியதுடன், அங்கிருந்து அந்தக் கட்டிடத்தை அகற்றும்படியும் கேட்டுக்கொண்டார். அதன் அடிப்படையில், அங்கிருக்கின்ற 03 பேரிடம் அந்த நிரந்தரக் கட்டிடங்களை அகற்றும்படி நீதிமன்றம் உத்தரவிட்டிருந்தது.

தற்பொழுது மகாவலி "L" வலயத்துக்குப் பொறுப்பாக இருக்கின்ற ஜகத் என்பவர், தென்பகுதியிலிருந்து வந்து அங்கு கரைவலையில் ஈடுபடுகின்ற முதலாளிமாருக்கு மகாவலிக்குரிய காணியை வழங்குவதற்கு அனுமதிகோரி, மகாவலிப் பணிப்பாளர் நாயகத்துக்கு கடிதமொன்றை அனுப்பியிருக்கின்றார். இதனால் அங்கு மகாவலித் திட்டம் செயற்படுவது மக்களுக்கு மிகவும் அச்சமாக இருக்கின்றது! "மகாவலியை மன்னாருக்குக் கொண்டுவந்து தண்ணீரைப் பெற்றுத்தாருங்கள்" என்று மன்னார் மாவட்டத்தில் இருக்கின்ற

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

විවසායිකළ් කූරුකින්රාර්කළ්. අතර්කු නාන් කූරිනේන්, "මුල්ලෛත්තීවු මාවට්ටත්තිර්කු මකාවලි අපිවිරුත්තිත් තිට්ටම් වන්ත පින්පු, අංකිරුන්ත විවසායිකළ් ඉල්ලෛ; අන්ත මක්කළුක්කු ඉරුන්ත නිලංකළ් ඉල්ලෛ; ඉන්රු අංකිරුන්ත විවසායිකළ් එල්ලോරුම් අන්ත නිලංකළිලිරුන්ත අකර්රප්පට්ටිරුක්කිරාර්කළ්; අංකු තෙන්පකුතියිලිරුන්ත අෆෛත්තුවරප්පට්ට විවසායිකළ්තාන් තර්පොළුතු වාළ්කිරාර්කළ්; අවර්කළුක්කු උරිය අනුමතිප්පත්තිරමුම් වළංකප්පට්ටිරුක්කින්රතු; ඉප්පටි ඔරු සූළ්නිලൈ මන්නාරිල් නිලവුවතර්කු නීංකළ් විරුම්පුවීර්කළායින්, මකාවලි අපිවිරුත්තිත් තිට්ටත්තൈ මන්නාරුක්කුක් කොණ්ටුවර මුටියුම්" එන්රු. මකාවලි අපිවිරුත්തි අමൈච්චානതු, ඉන්ත නාට්ටු විවසායිකළ් උට්පට අනൈත්තු මක්කළුක්කුම් වාළ්වාතාරත්തൈ වළංකුකින්ර ඔර් අමൈච්චර්? අල්ලතු ඔරිනත්තුක්කු මට්ටුම් වාළ්වාතාරත්തൈ වළංකුකින්ර අමൈච්චර්? එන්පතිල් සන්තേකമාක ඉරුක්කින්රതු. අතേනേරම් කටර්රොළිලുක්කුප් පොරුප්පාන ක්රව අමൈච්චර් අවර්කළ්තාන් මකාවලි අපිවිරුත්തි ඉරාජාංක අමൈච්චරාකවුම් ඉරුක්කින්රාර්. තෙන්පකුතියිලිරුන්ත වන්ත කරුනාට්ටුක්කේණි මුතല් කොක්කිළായ් වරൈ ඉරුක්කින්ර මීනවර්කළ් අංකු නිරන්තරක් කට්ටිටම් අමൈප්පතാක ඉරුන්තാല්, අවර්කළ් අංකිරുක්කින්ර පිරതേച චെයലකത්තිර්කු විණ්ණപ්පිත්තු, අතන්මූලම්තාන් අතර්කාන අනුමതിയൈപ් පെරවේණ්ටුම්. මුල්ലൈත්තീවිල් පූර්වීකമാක වാഴ്കින්ර මීනවර්කළുක්කോ අല්ലതු මක්කළുක්කോ එപ්පോതാവതු මකාවලි අපිවිරුත්തි අතිකാරචപൈ කാණි වළංකුම්පടි චිපාරිചුක් කടිതම් කൊටුත්තതാ? ඉല්ලൈ! ආകවේ, උරිය අනුමതි ඉല්ලാමല් අංකු කට්ටිටම් අමൈක්කින්ර නടවടික්කൈකളൈ නිරුත්ත වේණ්ටුම්. අංකු කුරිත්ත කට්ටිටങ්කളൈ අමൈප්පතර්කු මකාවලි අපිවිරුත්തි අතිකാරචപൈයിන් පණിප්පාළර් අනුමതි කൊටുක්කക්කූටාතු. ආകවේ, චම්පන්තപ්පට්ටවර්කළ් මුල්ലൈත්තීවු මාවට්ටත්තිල් නිරන්තරක් කට්ටිටම් අමൈප්පതാක ඉരുන්තാල්, උරිය පිරതേච චെයലാළരිටම් අතර්කുරිය අනුමതിയൈක් කේට්ටුප් පെറ්රුක්කොළ්ള වේණ්ටුම්. ඉතු තൊටර්පාක ක්රව කටර්රොළිල් අමൈච්චර් අවර්කළുක්කුත් තെളිවූට්ට වේණ්ටුම්. ඉන්ත විටයත්තිල් කටර්රොළිල් අමൈච්චු පක්කච් චාර්පිල්ලාමල් චെයර්පටවේණ්ටුම්.

කටන්ත වරුටම් මන්නාර් මාවට්ටක් කටර්රොළිල් තිණൈක්කළත්තිල් කූට්ටමොන්රු නടൈපെර්රතු. අන්තක් කූට්ටත්තිර්කුප් පාරാළുමන්ර උරුප්පිනර් එන්ර වകൈයිල් නാනුම් චെන්රිරുන්තേන්. අതാവതු, චිലാപത්තුറை කටර්කരൈයිල් ඔව්වොරු මීනවර් චංකത්තිනതුම් පයන්පාට්ටුක්කാක එත්තനൈ මීර්රර් නීළමුටൈය කටර්කരൈප් පകුതි ඔතුක්කප්පට්ටුළ්ළതු එන්පതු තൊටර්පිල් මුරණ්පാටු ඉരുන්තതු. අതනാල්, අන්තప් පිරതേചත්තිලිරുක්කින්ර අනൈත්තු මීනවර් චංකප් පිරතිනිතිකളൈයුම් අමൈත්තු, එන්තെන්ත මීනවර් චංකത්තുක්කු එත්තനൈ මීර්රර් නීළമാන කටර්කരൈප් පകුതි ඔතുක්කുවතු එන්පතු තൊටර්පාක මන්නාරිලිරുක්කින්ර උതවිප් පණിප්පාළරിන් තലൈමൈයිල් කූට්ටමොන්රൈ නടත්തි, ඔරු තීර්මാනම් එടുක්කപ්පට්ටതු. ආනാල්, අතේ උതවිප් පණിප්පාළර් අන්තත් තීර්මാනത്തൈ මාර්රුම්පടි ඔරුචිල මීනවර් චංකങ්කළുක්කුත් තර්පോതු කോරික්කൈ විටുක්කින්රാර්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලൈමൈතාങ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ක්රව උරුප්පිනර් චිறීතරන් අවර්කළതු නේරත්තිලිරුන්ත චිறිතු නේරත්තൈප් පെර්රුක්කොළ්කින්රേන්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
I will give him some time from my time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලൈමൈතාങ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Okay.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මන්නාර් මාවට්ට උතවිප් පණിප්පාළරුක්කු අන්රെටුත්ත අන්තත් තීර්මානത്തൈ නടൈමුറൈප්පടුත්තුවතර්කු ඒන්, මුටියවිල්ලൈ? ඉതිල් අරචියල් අතිකാරම් අල්ලതු ඒതാവතු පණම් ආතික්කම් චെലുත්තുකින්රതා? එන්පതිල් එංකളുක්කුච් චන්තേකම් ඉරുක්කින්රതු. ඒනെනිල්, එත්තනൈ මීර්රර් කටර්කරൈප් පകුതි කුරිත්ත මීනවර් චංකങ්කළුක්කු ඔතുක්කප්පට වේණ්ටුම් එන්ර විടයම් චම්පන්තമാක, අවර් කලන්තුකොණ්ට කූට්ටත්තිලേ එടുක්කപ්පට්ට තීර්මානത്തുක්කු මාර්රමාක අවරේ ඉප්පോතු අතනൈ විට්ටුක්කොටുක්කුමාറു චම්පන්තప් පට්ටවර්කළുක්කු ආලോචනൈ කූරියිරുක්කින්රාර්. ක්රව අමൈච්චර් අවර්කළേ, ඉප්පടියාන පල විടයങ්කළ් අංකු නടൈපെറുකින්රන. එංකളുടൈය මීනවර්කළ් තങ්කളുടൈය පිරච්චිනൈകളൈ මාවට්ටත්තිලිරുක්කින්ර අතිකാරිකළිടම් තൊටර්ന්තු තെරිවිත්තුවන්තാലුම්, අවර්റുක්කුරිය නടවටික්කൈകළ් එടുක්කപ්පടුවතිල්ලൈ. එනවේ, ඉප්පടියාන විടයങ්කളිල් තුරිතമാක නടවටික්කൈ එടුත්තු, එංකളുടൈය මීනවර්කළിන් වාഴ്වාතාරത്തൈ වළංකුවතර්කු ආවන චെය්යවේණ්ටුම් එන්රු කටර්රොළිල් අමൈච්චින් පුതිය චെයലാළරිටමුම් කටර්රොළිල් තිණൈක්කළත්තිර්කුප් පുතිතාක නියමික්කപ්පටවුළ්ළ පණිප්පාළරිටමුම් කේට්ටුක්කොළ් කින්රേන්.

මේලුම්, මන්නාර් මාවට්ටත්තිල් කිට්ටත්තට්ට 30 කිලോමීර්රර් නීළමාන කටර්කരൈ වීതිකළ් ඉන්නමුම් පුනരමൈක්කප්පටාමල් ඉරුක්කින්රන. ක්රව අමൈච්චර් අවර්කළിടම් ඉන්රුකූട ඉതු තൊටර්පිල් නാන් කේට්ටිරුන්තേන්. ඉන්රු පේචාലൈ කාට්ටාස්පත්තිරිപ් පිරතേචත් තිලිරുක්කින්ර මීනවර්කළ් ඔරු කිලോමීර්රරുක්කප්පාල් ඉරുක්කින්ර කටර්කരൈක්කුච් චെල්ලുම්පോතු තമതු පടകുකළുක්කුරිය ඉයන්තිරങ්කളൈත් තോළිල් චുමන්තු කොණ්ടുතාන් චെල්ලවේණ්ටියිරുක්කින්රതු. ඒනെනිල්, අංකු මුච්චක්කරවණ්ටියോ වේറു වാകනങ්කളോ චെල්ല මුටියാතുළ්ළതු. ආകවේ, ඉන්තක් කാට්ටාස්පත්තිරි පිරතേචත්තිලിරുක්කුම් ඔරු කිලോමීර්රර් තൂර වීതിയൈයාවතු තුරිතമാകప් පുනരමൈත්තුත් තരවේණ්ටුම් එන්රු අමൈච්චර් අවර්කළിടම් නාන් කේට්ටිරുන්තേන්. අවර් අතනൈච් චെය්තු තരുවതാകච් චൊල්ලിയിරുන්තാර්. ආകවේ, තයවුචെය්තු අන්ත වීതിയൈప් පുනരමൈප්පതර්කുරිය නടවටික්කൈകളൈ එടුක් කුම්පടි අතිකാරිකළിടම් කේට්ටුක්කොළ්කින්රേන්. තර්පോතු ඉන්තച් චപൈයිල් කൊරව අමൈච්චර් අවර්කළ් ඉല්ලාවිට්ටാലුම්, නാන් කූරිය විടයങ්කළ් අනൈത്തൈයුම් ඉන්තప් පാරാළുමන්රත්තිල් එංකිරുන්තാවතු අවതാනිත් තිරුප්පാර් එන්ර නම්පික්කൈ එනක්කිරുක්කින්රതු.

இறுதியாக, எங்களுடைய மீனவர்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் தொடர்ந்தும் நடவடிக்கை எடுக்கவேண்டும் என்று கேட்டு, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

[பி.ப. 3.59]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கடற்றொழில் சார்ந்த, மீனவர்களுடைய பிரச்சினைகள் தொடர்பாகப் பேசப்படுகின்ற நேரத்தில், நேற்றைய தினம் பாராளுமன்றத்திலே நடைபெற்ற ஒரு விடயத்தை இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, பதுளை மாவட்டத்திலுள்ள ஒரு தமிழ் மகளிர் மகாவித்தியாலயத்தின் அதிபர் ஆர். பவானி அவர்கள் ஊவா மாகாண முதலமைச்சர் அவர்களால் அச்சுறுத்தப் பட்டிருக்கிறார். அவருடைய காலிலே அந்த அதிபர் மண்டியிட வேண்டிய அளவுக்குக் குறித்த சம்பவம் இடம்பெற்றது பற்றி இன்று நாடு பூராவும் பேசப்பட்டு வருகின்றது. மிகமுக்கியமாக, அவர் ஒரு பெண் அதிபர்! அதிலும் மலையகப் பகுதியில் கல்வி கற்று அதிபர் பதவியை அடைவதென்பது இந்த நாட்டிலே எட்டாக்கனியான ஒரு விடயமாகும். அவ்வாறான ஒரு பின்தங்கிய பிரதேசத்தில் - தான் பிறந்து வளர்ந்த பிரதேசத்தில் - பிள்ளைகளுக்கான கல்விப் போதனைகளை மேற்கொண்டு வந்த ஓர் அதிபரை, தன்னுடைய அலுவலகத்துக்கு அழைத்து மிக மோசமான முறையிலே திட்டிப் பேசிய அந்த முதலமைச்சரிடமிருந்த மாகாணக் கல்வி அமைச்சு இன்று பறிக்கப்பட்டிருப்பதை நாங்கள் வரவேற்கின்றோம். என்றாலும், அந்த முதலமைச்சருடைய செயற்பாடுகள் இந்த நாட்டுக்கு மட்டுமல்ல, இந்த உலகத்திற்கே அபகீர்த்தியைத் தரக்கூடிய ஒரு விடயமென்பதை இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகின்றேன். மிக முக்கியமாக, ஆர். பவானி என்னும் அந்தப் பெண் அதிபருடைய செயற்பாட்டை இந்த நாடு மதிக்க வேண்டும். அந்த முதலமைச்சருக்குச் சரியான தண்டனையை வழங்கி அந்த அதிபருக்கான நீதியைப் பெற்றுக்கொடுக்க ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் மற்றும் இந்த நாட்டினுடைய துறைசார்ந்தவர்களும் நடவடிக்கை எடுக்க வேண்டும். நேற்றைய தினம் அவர் இந்தப் பாராளுமன்றத்துக்கு வந்து தன்னுடைய கதையைக் கண்ணீர்விட்டுக் கூறியிருக்கிறார். இன்றைய விவாதத்தின் தலையங்கம் வேறாக இருந்தாலும் அந்தச் சம்பவம் மிகவும் துயரமானதாக இருப்பதால் அவருக்கு நீதி கிடைக்க வேண்டும் என்பதற்காகவே நான் இந்த இடத்திலே இதனைக் குறிப்பிடுகின்றேன். இங்கு பேசப்படுகின்ற விடயங்களைச் செவிமடுப்பதற்குச் சம்பந்தப்பட்ட அமைச்சரோ இராஜாங்க அமைச்சரோ இந்தச் சபையிலே இல்லை. இன்று அரச தரப்பிலே இருக்கின்ற கதிரைகள் அனைத்தும் வெறுமையாக இருக்கின்றன. இவ்வாறானதொரு நிலையில்தான் நாங்கள் இந்தப் பாராளுமன்றத்திலே பேசுகின்றோம். இந்த நாட்டின் பாராளுமன்ற ஜனநாயகம் எவ்வளவுதூரம் செழிப்பற்றிருக்கின்றது என்பதற்கு இதை ஒரு நல்ல உதாரணமாக நான் பார்க்கின்றேன்.

இன்றைய தினம் கொண்டுவரப்பட்டிருக்கின்ற சட்ட மூலமானது கடற்றொழில் சார்ந்த, மீனவர்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகள் தொடர்பானதாகும். அந்த வகையில் இரண்டு - மூன்று நாட்களுக்கு முதல் முல்லைத்தீவு மாவட்டத்திலே நடந்த ஒரு சம்பவம் சம்பந்தமாகக் குறிப்பிட விரும்புகின்றேன். அந்த மாவட்டத்தில் தமிழர்கள் பாரம்பரியமாக, பரம்பரை பரம்பரையாக வாழ்ந்துவந்த நாயாறு, கொக்கிளாய், கொக்குத்தொடுவாய் போன்ற பிரதேசங்களிலே 1980களில் சிங்களக் காடையர்களும் இராணுவத்தினரும் இணைந்த வகையிலே மேற்கொண்ட நடவடிக்கையின்போது அங்கு வாழ்ந்த மக்கள் சுடப்பட்டும் கொலை செய்யப்பட்டும் கலைக்கப்பட்டார்கள். அவ்வேளை யில் பாதிக்கப்பட்ட மக்கள் அன்று அந்த இடங்களை விட்டு இடம்பெயர்ந்து முல்லைத்தீவு மாவட்டத்தின் பல பகுதிகளிலும் குடியேறி வாழ்கின்றார்கள். அங்கிருக்கின்ற கந்தசாமிமலை, தாமரைக்குளம், ஆமையன்குளம், கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாட்டுக்கேணி போன்ற இடங்களிலே வாழ்கின்ற அந்த மக்களுடைய காணிகள் மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டின் தலைவராக இருந்தபொழுது பறிக்கப்பட்டன. அதாவது, தமிழ் மக்களுடைய உறுதிக் காணிகளைப் பறித்து 2014ஆம் ஆண்டளவிலே. சிங்கள மக்களுக்கு அவர் வழங்கியிருந்தார். அந்த இடங்களைத் தவிர, தமிழர்கள் பரம்பரையாக கடற்றொழிலில் ஈடுபட்டு வந்த கரையோரப் பிரதேசங்களை யும் தென்பகுதிகளிலிருந்து வந்த சிங்கள மீனவர்கள் வலுக்கட்டாயமாகப் பிடித்து அந்த இடங்களிலே குடியேறி வந்தார்கள். அந்த இடங்களில் கரைவலை மீன்பிடித் தொழிலிலே ஈடுபட்ட தமிழர்களைக் கலைத்துவிட்டு அவர்கள் அங்கு குடியிருந்து அந்த தொழிலைச் செய்தார்கள். ஆனால், இப்பொழுது நல்லிணக்கம் பேசுகின்ற அரச துணையோடு அந்த இடத்திலே இருக்கின்ற காணிகளைப் பறித்து அவற்றைச் சிங்கள மக்களுக்கு அளந்து கொடுப்பதற்காக மூன்று நாட்களுக்கு முன்னர் சம்பந்தப்பட்டவர்கள் அங்கே ஒன்றுகூடியிருக்கிறார்கள். அதனைத் தடுக்க முனைந்த தமிழர்கள் மீது தாக்குதல் நடத்தவும் அவர்கள் முனைந்திருக் கிறார்கள். பொலிஸார் மற்றும் இராணுவத்தினருடைய துணையோடு இவ்வாறு சிங்கள மீனவர்கள் நடந்து கொள்வதானது, ஓரினத்தின் அடையாளமாக அவர்கள் வாழ்ந்த பிரதேசத்தைப் பறிக்க முயலுகின்ற ஒரு காரியமாகும். பரம்பரையாக - பூர்வீகமாக வாழ்ந்துவந்த அந்தத் தமிழ் மக்களுடைய சொந்த நிலங்கள் அவர்களிடமே வழங்கப்பட்டிருக்க வேண்டும் என்பதையே நான் இந்தச் சபையிலே குறிப்பிட விரும்புகின்றேன். அந்த இடங்களிலே வலுக்கட்டாயமாக, அடாத்தாக மீன்பிடித் தொழிலிலே ஈடுபடுகின்ற தென்னிலங்கை மீனவர்கள் அங்கிருந்து முதலிலே அகற்றப்பட வேண்டும்.

குறிப்பாக, இன்று இங்கு இந்தியாவிலிருந்து வருகின்ற இழுவைப் படகுகள் பற்றிப் பேசப்படுகின்றது. அதேநேரம் தென்னிலங்கை மீனவர்கள் முல்லைத்தீவு மாவட்டத்தின் முழுக் கடற்பிரதேசங்களிலும் மன்னார் மாவட்டத்தின் பெரும்பாலான கடற்பிரதேசங்களிலும் மீன்பிடியில் ஈடுபடுகின்றார்கள். அந்த வகையில் இன்று தென்னிலங்கை மீனவர்களால் தமிழர்கள் நசுக்கப்படுகின்றார்கள்; அவர் களுடைய இடங்கள் பறிக்கப்படுகின்றன; அவர்களுடைய தொழில்கள் பறிக்கப்படுகின்றன. எனவே, முதலில் உள்நாட்டிலே இவற்றுக்கான தீர்வை அடையப் பாருங்கள்! அதன் பிறகு இந்திய மீனவப் படகுகள் பற்றிப் பேசலாம்! ஆனால், இன்று இந்த விடயங்கள் இந்தியப் படகுகள் என்ற ஒரு மாயைக்குள் முழுமையாக வேறு திசைக்குத் திருப்பப்படுகின்றன. ஆகவே, தென்னிலங்கையிலிருந்து வருகின்ற மீனவர்களால் முல்லைத்தீவில் மேற்கொள்ளப்படு கின்ற செயற்பாடுகளுக்கு ஒரு முடிவுகட்ட முதலில் இந்த அரசாங்கம் முயற்சிக்க வேண்டுமென்பதை இந்த இடத்திலே வலியுறுத்திக்கூற விரும்புகின்றேன். இதனைவிட, 1992ஆம் ஆண்டு கிளிநொச்சி மாவட்டத்திலே பூநகரியிலுள்ள முழங்காவிலில் இரணைமாதாநகர் என்ற இரணைதீவுக்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பாராளுமன்றத்தைக் கூட்டல்

05.02.2018 அன்று பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுவில் எடுக்கப்பட்ட தீர்மானம்

ஒத்திவைப்புப் பிரேரணை:

திறைசேரிப் பிணைமுறி விநியோகம் பற்றி விசாரணை செய்யும்
ஜனாதிபதி ஆணைக்குழுவினதும் பாரிய மோசடி, ஊழல் மற்றும்
அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக
விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் அறிக்கைகள்

PRINCIPAL CONTENTS

AFFIRMATION:

Hon. Ahamadulebbe Mohamadu Nazeer

ANNOUNCEMENTS:

Summoning of Parliament
Decision Taken at Committee on Parliamentary Business on 05.02.2018

ADJOURNMENT MOTION:

Reports of Presidential Commission of Inquiry to Investigate and Inquire into the Issuance of Treasury Bonds and Presidential Commission on Serious Acts of Fraud, Corruption and Abuse of Power, State Resources and Privileges

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 පෙබරවාරි 06 වන අඟහරුවාදා
2018 பெப்ருவரி 06, செவ்வாய்க்கிழமை
Tuesday, 06th February, 2018

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ප්‍රතිඥාව: ගරු අහමදුලෙබ්බේ මුහම්මදු නසීර් මහතා
உறுதிப்பிரமாணம்: மாண்புமிகு அகமதுலெப்பை முஹம்மது நசீர்
AFFIRMATION: HON. AHAMADULEBBE MOHAMADU NAZEER

ගරු අහමදුලෙබ්බේ මුහම්මදු නසීර් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මෙසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.

மாண்புமிகு அகமதுலெப்பை முஹம்மது நசீர், சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.

Hon. Ahamadulebbe Mohamadu Nazeer made and subscribed the Affirmation required by Law, and signed the Book at the Table.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

පාර්ලිමේන්තුව කැඳවීම
பாராளுமன்றத்தைக் கூட்டல்
SUMMONING OF PARLIAMENT


ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභාපතිතුමා/ අවර්කළ්)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව කැඳවීමේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් දැන් සභාවට කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී.

அதன்மேல் பாராளுமன்றச் செயலாளர் நாயகம் பின்வரும் வர்த்தமானி அறிவித்தலை வாசித்தார்;

Whereupon the Secretary-General of Parliament read the following Gazette Notification:



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2056/15 - 2018 ජනවාරි මස 30 වැනි අඟහරුවාදා - 2018.01.30

(රජයේ බලයෙන් ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය
රජයේ නිවේදන

කථානායකතුමාගේ නිවේදනය

2018 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාද පූර්ව භාග 10.30ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 14 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව 2018 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාද පූර්ව භාග 10.30ට රැස්වන ලෙස පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක කරු ජයසූරිය වන මම මෙයින් දනුම් දෙමි.

කරු ජයසූරිය,
කථානායකයා.

2018 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී ය.

02- 521

1A - G 27046 — 362 (2018/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම පනත් පිටපත් ඇසට පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් නොමිලයේ බාගත කළ හැක.

II

2018.02.05 දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ඵළඹී තීරණය
05.02.2018 இல் பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுவில் எடுக்கப்பட்ட தீர்மானம்
DECISION TAKEN AT COMMITTEE ON PARLIAMENTARY BUSINESS ON 05.02.2018

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභාපතිතුමා/ අවර්කළ්)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ඊයේ දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව - CBSL - විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම විමර්ශනය කිරීම -PRECIPAC - සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාව යටතේ විවාදය පැවැත්වීමට අදාළ කරුණු සාකච්ඡා කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 78හි විධිවිධානවලට අනුකූලව මන්ත්‍රීවරුන් එකිනෙකාට පෞද්ගලිකව අපහාස වන ආකාරයෙන් දෝෂාරෝපණය කර නොගනිමින්, පාර්ලිමේන්තුවේ අභිමානයත්, සියලු මන්ත්‍රීවරුන්ගේ ගෞරවයත් ආරක්ෂා වන ආකාරයට සෑම මන්ත්‍රීවරයෙකුම ඉතාම සංයමයෙන් යුතුව මෙම විවාදයට සහභාගි වන ලෙස ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිමි.

එමෙන්ම, PRECIFAC වාර්තාවට අදාළ සංයුක්ත -CD- තැටිය අද උදැසන පාර්ලිමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙන බව ද දන්වා සිටින්නට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting this day shall be10.30 a.m. to 4.00 p.m. At 10.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 4.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.00 a.m. on Monday, February 19, 2018."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා
திறைசேரிப் பிணைமுறி விநியோகம் பற்றி விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் பாரிய மோசடி, ஊழல் மற்றும் அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் அறிக்கைகள்
REPORTS OF PRESIDENTIAL COMMISSION OF INQUIRY TO INVESTIGATE AND INQUIRE INTO THE ISSUANCE OF TREASURY BONDS AND PRESIDENTIAL COMMISSION ON SERIOUS ACTS OF FRAUD, CORRUPTION AND ABUSE OF POWER, STATE RESOURCES AND PRIVILEGES

[ප.භා. 10.38]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේ විශේෂ රැස්වීමක් පවත්වනවා. මම කැමැතියි, ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරලා කරුණු පැහැදිලි කරන්න. මේ රැස්වීම කැඳවලා තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තා දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්නයි. එයින් පළමුවැනි එක තමයි, 2015 පෙබරවාරි 1වැනි දා සිට 2016 මාර්තු 31වැනි දා වනතෙක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව සොයා බලන්න පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව. දෙවැනි එක තමයි, රටේ වෙලා තිබෙන බරපතළ වංචා - දූෂණ පිළිබඳව සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව. මේ වාර්තා දෙක තමයි අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මේ පළමුවැනි වාර්තාව -බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව- දෙසැම්බර් 30වැනි දා ජනාධිපතිතුමාට ඒ කොමිසමේ කොමසාරිස්වරු භාර දුන්නා. ඊට පස්සේ ඉල්ලීමක් තිබුණා, මේ සභාව රැස්විය යුතුයි කියලා. එබැවින් ඔබතුමා එක්කත් සාකච්ඡා කරලා මම ලිපියක් එව්වා, ජනවාරි 10වැනි දින මේ සභාව කැඳවන්න කියලා.

ජනවාරි 10වැනි දා මේ සභාව කැඳවූ අවස්ථාවේ විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ නායක, මේ සභාවේ විපක්ෂයේ ප්‍රධාන

සංවිධායකතුමා, "මේ පිළිබඳව වාද කරන්න නම් වාර්තාව ඉදිරිපත් කළ යුතුයි. ඒ වාර්තාව සභාවට ලැබිලා නැහැ" කියලා ප්‍රශ්නයක් මතු කළා. මම එදා කෙටි ප්‍රකාශයක් කළා. ඒකට බාධා කරපු නිසා, එදා එතැනින් ඒ සාකච්ඡාව අවසන් වුණා.

ඊට පස්සේ, 2018 ජනවාරි 23වැනි දා මේ වාර්තා මේ සභාවට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව පක්ෂ නායකයන් ඔබතුමා එක්ක සාකච්ඡා කළා. පෙබරවාරි 19වැනි දායින් පටන් ගන්න සතිය තුළ මේ වාර්තා පිළිබඳව වාද කරන්න තීරණය කළා. ඒත්, ඊට පස්සේ පැන නැඟුණු තත්ත්වය අනුව ඔබතුමා මට ලිපියක් එව්වා. ඒ ලිපියේ සඳහන් කළේ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර කුමාර දිසානායක මැතිතුමා පාර්ලිමේන්තුව වහාම කැඳවන්න කියා ඉල්ලා සිටිනවා කියලා. මම ඔබතුමාට ඒ රාත්‍රියේම දැනුම් දුන්නා, අපි 8වැනි දා පාර්ලිමේන්තුව කැඳවන්නම් කියලා.

මම දෙපැත්තේම මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් එක්ක ඒ ගැන සාකච්ඡා කරද්දී ඒ මන්ත්‍රීවරු කිව්වා, "7වැනි දා වෙන කල් ඡන්ද රැස්වීම් තිබෙනවා. ඒ නිසා 8වැනි දා රැස්වෙන එක වඩා සුදුසුයි" කියලා. ඒ අවස්ථාවේදී මැතිවරණ කොමිසමේ සභාපතිතුමා දැනුම් දුන්නා, "8වැනි දා පාර්ලිමේන්තුව රැස් වෙනවා නම්, මේ ඡන්දය කල් දාන්න වෙයි" කියලා. විවාදයට තව වැඩි පුර දවස් දෙකක් ඕනෑ නිසා ඡන්දය කල් දාන්න සිදු වෙයි කිව්වා. මම ඒ ලිපිය ඔබතුමාට එව්වේ නැහැ. ඒ වෙනුවට ඔබතුමාට යෝජනා කළා, පක්ෂ නායකයන් මුණ ගැහිලා අපට දින දෙන්න කියලා. පසුව ඔබතුමා මට දැනුම් දුන්නා, "පක්ෂ නායකයන්ගේ එකඟත්වයක් තිබුණේ නැහැ. ඔබතුමාටයි, මටයි සාකච්ඡා කරලා දිනයක් දෙන්න කිව්වා" කියලා. 2වැනි දා -සිකුරාදා- මම කොළඹ සිටියේ නැහැ. විශේෂයෙන්ම 6වැනි දා කැබිනට් මණ්ඩල රැස්වීම නොතිබෙන නිසා මම ඔබතුමාට යෝජනා කළා, 6වැනි දා පාර්ලිමේන්තුව කැඳවන්නම් කියලා. ඒ අනුවයි 6වැනි දා -අද- කැඳවලා තිබෙන්නේ.

පක්ෂ නායකයන්ට මේ ගැන සාකච්ඡා කරන්න වුවමනා වුණා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ දිනය තමයි ප්‍රශ්නය වුණේ. ඇත්ත වශයෙන්ම මට බලය තිබෙන්නේ පාර්ලිමේන්තුව කැඳවන්න විතරයි. කැඳෙව්වාට පස්සේ, දවස් කීයක් -පැයක්ද, දවසක්ද, දවස් දෙකක්ද, හතරක්ද, පහක්ද- පාර්ලිමේන්තුව රැස්වෙනවාද කියන එක පක්ෂ නායකයන්ගේ තීරණයක්. ඒ අනුව පක්ෂ නායකයන් තීරණය කර තිබෙනවා, අද මේ විවාදය ආරම්භ කරලා, ඊට පසුව නැවත මේ මාසයේ 20, 21 දිනවල විවාදය පවත්වන්න. මා හිතනවා, එම යෝජනාව හොඳයි කියලා. මොකද, මන්ත්‍රීවරුන් ගණනාවක් අද පැමිණ නැහැ. ඒ අය අපට කියලා තිබෙනවා, ඒ අයටත් මෙම විවාදයට සහභාගි වෙන්න අවශ්‍යයි, නමුත් ඡන්ද වැඩ කටයුතු තිබෙන නිසා අද දින සහභාගී වෙන්න විධියක් නැහැ කියලා. ඒ නිසා අද මේ විවාදය ආරම්භ කරලා අපේ අදහස් ප්‍රකාශ කරනවා. අනෙක් අයට පසුව සාකච්ඡා කරන්න අවස්ථාව ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභා වාර්තා පිළිබඳ මා දීර්ඝ වශයෙන් මෙතැන කථා කරන්නේ නැහැ. වුවමනා වුණොත් පසුව ඒ ගැන කථා කරන්නම්. භාණ්ඩාගාර බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් දැනට පියවර අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සාක්ෂි සටහන් කරගෙන තිබෙනවා; උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා; නියෝග අරගෙන තිබෙනවා. සමහර සැකකරුවන් දැන් අත් අඩංගුවේ ඉන්නවා. දෙවනුව පත් කළ කොමිෂන් සභා වාර්තාවට අදාළ පියවර ගන්න තිබෙනවා. මා හිතන විධියට මේ සභාවේ සාමාජිකයන්ව සිටින අයගෙනුත් තිස්ගණනකට පමණ විරුද්ධව චෝදනා තිබෙනවා. විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් වන අධිකරණ ක්‍රියා මාර්ගවලට අමතරව මේ සභාවට සලකා බැලීමට තවත් යෝජනා තිබෙනවා. එකක් තමයි මහ බැංකුවට අදාළ නීති කිහිපයක් සංශෝධනය කිරීම. අපි දැනට අලුත් නීති කිහිපයක් සකස් කරගෙන යනවා. ඊට අමතරව, තවත් වුවමනා ඒවා අපි සකස් කරගෙන යනවා. 2016 සිට බලපාන පරිදි මහ බැංකුව සඳහා අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න බලාපොරොත්තු වන්නේ මූල්‍ය පනතකින් මහ බැංකුවේ ප්‍රතිසංවිධානය ඇති කරන්නයි. ඒක සකස් කරලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් එක්කත් අපි සාකච්ඡා කරන්නම්. මොකද, මුදල් පාලනය පාර්ලිමේන්තුවට අයිති වැඩ කටයුත්තක්. අපි දැන් පොදු මූල්‍ය කමිටුවක් ඇති කරලා අලුත් පනත් කෙටුම්පතක් සකස් කරන්න තිබෙනවා, පාර්ලිමේන්තුවේ අය වැය පරීක්ෂා කිරීමේ කාර්යාලයේ.

දෙවැනි වාර්තාවෙන් පසුව ක්‍රියාත්මක කරන්නත් නීති කිහිපයක් යෝජනා කරලා තිබෙනවා. නීතිවලට අමතරව ව්‍යවස්ථාවේ 81වැනි වගන්තිය සංශෝධනය කරනවාද, නැද්ද කියලා මේ ගරු සභාවට සලකා බලන්න වෙයි. මොකද, ඒ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට පමණයි. ඒක ගැනත් මේ ගරු සභාවේ අවධානයට යොමු කරවනවා. මීට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන පියවර ගැනත් මා කියන්න කැමැතියි. ඊට අමතරව කෝප් වාර්තාව පිළිබඳව දැනට නීතිපතිතුමා ගෙන තිබෙන පියවර සම්බන්ධයෙන් මා ඊයේ වාර්තාවක් ඉල්ලුවා. මට ඒක ලැබුණා. ගරු කථානායකතුමනි, මා ඔබතුමාට දැන් ඒකත් භාර දෙන්නම්. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම. ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.44]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපි පොඩි කාලයේ තහනම් වචනය භාවිත නොකොට විවාද කළා. එහිදි තහනම් වචනය ප්‍රකාශ නොකර වෙනත් කථා ගොඩක් කියනවා. මා දැන් දැක්කෙත් ඒ වාගේ දෙයක්. ඒ කියන්නේ, මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේත්, බරපතළ මූල්‍ය වංචා පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේත් ඉතා පැහැදිලි ලෙස සඳහන්ව තිබෙන මේ රටේ මහ ජනයාගේ දේපොළවලට සිදු වී තිබෙන අලාභ හානිය, ඒවාට ගත යුතු ක්‍රියා මාර්ග, ඒවායේ ප්‍රමාණය, ඒවාට වගකිව යුත්තන් පිළිබඳව යම් සාකච්ඡාවක් මේ පාර්ලිමේන්තුවේ සිද්ධ විය යුතුව තිබුණත්, අගමැතිතුමා බොහොම ප්‍රවේසම් වුණා ඒ තහනම් වචනය පාවිච්චි නොකොට එතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, දැනට පර්පවුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ බිලියන 12ක් අපි රඳා පවත්වාගෙන තිබෙනවා. ඒ මුදල් තිබෙනවා කියලා ඊයේ මහ බැංකුවේ අධිපතිතුමාත් මට කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අපේ රටේ මහ ජනයාගේ ධනය සොරකම් කිරීම, නාස්ති කිරීම, අවභාවිතාව පිළිබඳව විශාල සංවාදයක් දැන් රටේ මතු වී තිබෙනවා. හැබැයි, එවැනි වංචා, දූෂණවලට එරෙහි සංවාදයක් තිබුණාට කිසි සේත්ම එහි තිබෙන බරපතළකම, එයින් අපේ රටේ සමාජයට ඇති කර තිබෙන බලපෑම, අපේ රටේ ඈත ගම්වල ජීවත්වන දුවා දරුවන්ගේ අධ්‍යාපනයට, රැකියාවට, කෘෂි කර්මාන්තයට, ජන ජීවිතයට ඇති කොට තිබෙන බලපෑම ඒ හා බරින් යුක්තව සාකච්ඡාවට බඳුන් වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ නිසා බැඳුම්කර කොමිෂන් සභා වාර්තා සහ අනෙකුත් වාර්තා පිළිබඳ අවධානය යොමු කරන්නට පෙර, මෙය මොන තරම් අපේ රටේ ආර්ථිකය සහ සමාජ දේහයේ පිළිලයක්ද යන්න කෙරෙහි මා අවධානය යොමු කරවන්නට කැමැතියි.

2008 වසරේ පැවැති පාලනය විසින් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය පවරා ගත් බව අපි දන්නවා. ඒ හැම එකක්ම කළේ ආර්ථික ප්‍රතිපත්තියක් මත නොවෙයි. පෞද්ගලික හේතූන් මත පවරා ගෙන, 2018 දක්වා මේ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය පාලනය කරනවා. මේ අවුරුදු දහය තුළ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ පාඩුව රුපියල් කෝටි 12,500යි.

ඒ විතරක් නොවෙයි. එයාර් ලංකා ආයතනය VVIP කාමර සහිත ගුවන් යානා හතරක් ප්‍රංශයෙන් මිලදී ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කොට තිබුණා. ඒ ගුවන් යානා අපට යෝග්‍යද, නැද්ද යන්න වෙනම කථාවක්. ඒ ගිවිසුම් හතර cancel කිරීම සඳහා පසුගියදා එයාර් ලංකා ආයතනය රුපියල් කෝටි 1,800ක් -ඩොලර් මිලියන 115ක්- ගෙවා තිබෙනවා. ඒ, එම ගිවිසුම් හතර cancel කිරීම සඳහා.

ලෝකයේ ආර්ථිකය පිළිබඳව යම් හෝ අවබෝධයක් තිබෙන කෙනෙක් ඒ මොහොතේ ගිහිල්ලා ග්‍රීසියේ බැඳුම්කර මිලදී ගන්නේ නැහැ. හැබැයි, අපේ මහ බැංකුවේ හිටපු අධිපතිවරයකු වන කබ්‍රාල්, ඩොලර් මිලියන 52ක බැඳුම්කර ග්‍රීසියෙන් මිලදී ගෙන තිබෙනවා. නමුත්, අද සතයකට වෙච්ච දෙයක් නැහැ. එහි පාඩුව මේ වන විට රුපියල් කෝටි 806යි. ඒ වාගේමයි, ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව. විශේෂයෙන්ම රාජ්‍ය වෙත ලැබී තිබුණු ධනය පෞද්ගලික ආයතනයන්ට පැවරීම හේතුකොටගෙන ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුවෙන් සිදුවූ පාඩුව වන රුපියල් කෝටි 1,140ක් සම්බන්ධයෙන් දැන් මහාධිකරණයේ නඩු ගොනු කරලා තිබෙනවා.

ඊළඟට, තෙල් මිලදී ගැනීම. විශේෂයෙන්ම, පසුගිය අගෝස්තු මාසයේ තෙල් මිලදී ගැනීම පිළිබඳ නියමිත පරිදි ටෙන්ඩරය කැඳවා තිබෙනවා. එම ටෙන්ඩරය නියමිත පරිදි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් නොකොට, ක්ෂණික තෙල් මිලදී ගැනීම් නිසා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ පාඩුව එම ටෙන්ඩරයට අනුව සහ ක්ෂණිකව මිලදී ගත් ඒවා අතර වෙනස රුපියල් කෝටි 1,400යි. ඒ වාගේම, හෙජින් ගිවිසුම හරහා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,020යි. ඒ වාගේම, දැන් මේ සාකච්ඡාවට බඳුන් වන බැඳුම්කර ගනුදෙනුව නිසා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,100යි. ඒ කියන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? මේ රට පාලනය කරන ලද මේ පාලක කණ්ඩායම මහ ජනයාගේ ධනය තමන්ට සිතූ සිතූ පරිදි, රිසි සේ අවභාවිත කරපු; හොරකම් කරපු; නාස්ති කරපු ඉතිහාසයක් තිබෙනවා. මෙහි භයානකම තත්ත්වය මේකයි, ගරු කථානායකතුමනි.

2015 ජනවාරි මාසයේ 8වැනි දා එම මැතිවරණ වේදිකාවේ විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වුණේ, එවකට පැවති පාලනයේ වංචා සහ දූෂණ පිළිබඳව; එහි අකාර්යක්ෂමතාව පිළිබඳව; එහි මුදල් අවභාවිතාව පිළිබඳවයි. ඕනෑවටත් වඩා සංඛ්‍යා දත්ත, තොරතුරු, සාක්ෂි සහිතව ඒවා සමාජයේ සාකච්ඡාවට බඳුන් වෙමින් තිබුණා. ගරු කථානායකතුමනි, ඒ නිසාම ජනවාරි මාසයේ 8වැනි දා මේ පාලනයට ලැබුණු ජන වරමේ පිටුපස තිබුණු හරය අන් කවරක්වත් නොවෙයි, මේ වංචනිකයන්ට දඬුවම් දීම, වංචා කරන ලද දේපොළ අත් පත් කර ගැනීම සහ වංචාවෙන් වැළැක්වීමයි. හැබැයි, ආණ්ඩුව ගොඩනහා කෙටි කාලයක් ඇතුළත වංචනිකයන්ට දඬුවම් දෙනවා වෙනුවට, වංචනිකයන් ආරක්ෂා කිරීමේ පිළිවෙතකට තමුන්නාන්සේලා අවතීර්ණ වුණා. වංචා කරපු දේපොළ පවරා ගන්නවා වෙනුවට, ඒ දේපොළවලින් යම් පංගුවක් තමන්ටත් අත් පත් කර ගත හැකිද කියන සාකච්ඡාවට අවතීර්ණ වුණා. ඒ නිසා සමහර අමාත්‍යවරු ඉතාමත් ඍජු ලෙස මැදිහත් වෙමින්, එම වංචා කරන ලද ධනයෙන් කොටසක් තමන් වෙත අත් පත් කර ගැනීම සඳහා, අදාළ පරීක්ෂණ යට ගැන්වීම්, පරීක්ෂණ ඉදිරියට ගෙන යාමට බාධා කිරීම් සිදුවූ බව මේ පාර්ලිමේන්තුවේ ඕනෑවටත් වඩා වැඩියෙන් හෙළිදරවු වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඇති වුණු විවාදයක් හේතුකොටගෙනම, එම වංචනිකයන් පිළිබඳව ඉදිරිපත් කරන ලද කරුණු මත හිටපු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාට තම අමාත්‍ය ධුරයෙන් පවා ඉල්ලා අස් වෙන්න සිදුවී තිබුණා. ඒ නිසා, වංචාවට දඬුවම් දෙන්න එන අය වංචනිකයන්ගේ දේපොළ පවරා ගන්නවා වෙනුවට වංචනිකයන් ආරක්ෂා කර, වංචා කරන ලද දේපොළ බෙදා ගැනීම සඳහා වූ සාකච්ඡාවකට අවතීර්ණ වුණා.

ඊටත් වඩා භයානකම තත්ත්වය තමයි, තමුන්නාන්සේලාත් මහා පරිමාණ වංචා, දූෂණවලට හවුල් වෙන්න පටන් ගැනීම. ඒකේ සංකේතාත්මක ගනුදෙනුව තමයි, පෙබරවාරි මාසයේ 27වැනිදා සිදුවූ මේ බැඳුම්කර ගනුදෙනුව. බැඳුම්කර ගනුදෙනුව කිසිසේත්ම මේ අවුරුදු තුනක වංචා, දූෂණ ධුරාවලිය නොවෙයි. 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා සිදුවුණු බැඳුම්කර ගනුදෙනුව මෙම වංචා, දූෂණවල සංකේතයයි. නමුත්, මුළු ධුරාවලියම නොවෙයි. ඒ ධුරාවලිය පිළිබඳව වෙනත් දවසක සවිස්තරාත්මකව මෙම පාර්ලිමේන්තුවේ විවාද කරන්න අප ලැහැස්තියි. හැබැයි මේ එහි සංකේතයයි. ගරු කථානායකතුමනි, 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා මේ ගනුදෙනුව සිද්ධ වුණාට පසුව 2015 මාර්තු මාසයේ 9වැනි දා මාධ්‍ය සාකච්ඡා පවත්වා අපි මේ කරුණු හෙළිදරවු කළා.

ගරු කථානායකතුමනි, 2015 මාර්තු මාසයේ 17වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මවිසින් 23(2) යටතේ ප්‍රකාශයක් කරලා මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉල්ලා සිටීමත්, ගනුදෙනුවේ ස්වභාවයත් හෙළිදරවු කිරීමත් කළා. ඒ පිළිබඳව 2015 මාර්තු මාසයේ 17වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා. එදින 23(2) යටතේ අවසානයේදී මා අසා සිටි ප්‍රශ්න කිහිපය මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වෙලා දින 20කට පසුවයි මා මේ පිළිබඳව හෙළිදරවු කරන්නේ. 2015 පෙබරවාරි 27වැනි දා බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වුණා. 2015 මාර්තු 17වැනි දා පාර්ලිමේන්තුවේදී මා මේ පිළිබඳව හෙළිදරවු කළා. මේ ගනුදෙනුව සිද්ධ වෙලා

අවුරුදු තුනක් වෙන්න තව පොඩි කාලයයි අඩු. හැබැයි, මේ ගනුදෙනුව සිද්ධ වෙලා දින 20ක් ගියාට පසුව මම මේ පාර්ලිමේන්තුවේදී ඇහුවේ මොකක්ද? ගරු කථානායකතුමනි, 2015 මාර්තු 17වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන් එම කොටස මා උපුටා දක්වන්නම්. එහි මා මෙසේ අසා තිබෙනවා:

"1. 2015 පෙබරවාරි මාසයේ 27වැනි දින බැදුම්කර නිකුතුවේ වටිනාකම දස ගුණයකින් ඉහළ දැමීමට හේතුව කුමක්ද?"

බිලියනයක් ඉල්ලා බිලියන 10ක් දක්වා වර්ධනය කිරීමට හේතුව කුමක්ද?

"2. හදිසි මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන් වෙනත් වෙන්දේසියක් අදාළ කොන්දේසි පූර්වයෙන් ප්‍රකාශ කර නැවත කැඳවීමට පියවර නොගත්තේ ඇයි?"

මොකද, ආණ්ඩුව කිව්වා, හදිසි මුදල් අවශ්‍යතාවකට මේක වැඩි කරන්න කියලා. ඊට පෙර දිනයේ එවකට අගමැති උපදේශක ලෙස කටයුතු කළ මලික් සමරවික්‍රම මැතිතුමාත්, මුදල් අමාත්‍යවරයාත්, කබීර් හාෂිම් අමාත්‍යවරයා ඇතුළු කණ්ඩායමක් සාකච්ඡාවක නිරත වුණා. ඒ සාකච්ඡාවෙන් එවකට මාර්ග ඉදිකිරීම් සඳහා තිබෙන බිලියන 79ක් ගෙවීම් සඳහා හදුනාගෙන තිබුණා. ඒක හරි. හැබැයි, ඒ සඳහා මුදල් අවශ්‍යව තිබුණා නම් මා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනවා, "හදිසි මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන් වෙනත් වෙන්දේසියක් අදාළ කොන්දේසි පූර්වයෙන් ප්‍රකාශ කර නැවත කැඳවීමට පියවර නොගත්තේ ඇයි? මුදල් අවශ්‍ය නම් පූර්ව කොන්දේසි සහිතව ඉතා ඉක්මනින් නැවත වෙන්දේසියක් කැඳවන්න තිබුණා." කියලා. හැබැයි, ඒ වෙන්දේසිය නොකැඳවා බිලියන එක බිලියන 10 දක්වා වැඩි කරගත්තේ ඇයි?

තුන්වැනි ප්‍රශ්නයෙන් එදා මම අසා තිබෙන්නේ මෙයයි.

"3. මිලියන 1,000ක් වැනි මුදලක් කල්පිරීම සඳහා අවුරුදු 30ක කාලයක් ලබා දුන්නේ කුමන හේතුවක් මතද? ඒ වෙනුවෙන් සියයට 12.5ක ඉහළ පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ඇයි?"

මිලියන 1,000ක් වැනි මුදලක් අවුරුදු 30ක කල්පිරීමක් සඳහා සියයට 12.5ක පොලී අනුපාතයක්,- එවකටත් බැදුම්කර ද්විතීයික වෙළෙඳ පොළේ සියයට 9.3ක පොලී අනුපාතිකයක් තිබියදී 12.5 දක්වා ඉහළ අනුපාතිකයක්- ගත්තේ ඇයි කියලා මා අසා තිබෙනවා.

ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

"4. පෙබරවාරි 26වැනි දින පැවැති රැස්වීම හා, -ඒ කියන්නේ, මම කලින් කියපු අමාත්‍යවරුන්ගේ රැස්වීම- පසු දින බැදුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම අතර සම්බන්ධයක් තිබෙද?"

මේ රැස්වීම හා මේ බැදුම්කර ඉහළ දැමීම සඳහා තිබුණු මේ සම්බන්ධය මොකක්ද?

ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

"5. බැදුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම නිසා ඉහළ පොලී අනුපාතයක් යටතේ වූ ලංසු පිළිගැනීමට සිදු වූයේද? එසේ නම් එමඟින් මහ බැංකුවට අලාභයක් සිදු වී තිබෙද? එසේ නම් ඒ කොපමණද?"

මේ අහන්නේ දින 20කට පසුවයි. පෙබරවාරි මාසයේ 27වැනි දා සිදු වූ සිදුවීම පිළිබඳව 2015 මාර්තු 17වැනි දායි මේ විධියට මා අසන්නේ.

ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

"6. පෙබරවාරි මස 27වැනි දින බැදුම්කර නිකුතුව සඳහා එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රමාණය සහ එක් එක් ආයතනයට බැදුම්කර නිකුත් කරන ලද ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් සභාවට ඉදිරිපත් කරනු ලබන්නේද?"

ඒ මොකවත් සඳහා නොවෙයි, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙත විශේෂ අවස්ථා ලබාදී තිබෙනවා ද කියලා දැන ගන්නයි.

ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

"7. මේ ගනුදෙනුව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයක් සාධාරණ හා අපක්ෂපාති වනු පිණිස මහ බැංකුවේ සභාපතිවරයා තාවකාලිකව ඉවත් කරනු ලබන්නේද?"

ගරු කථානායකතුමනි, මේවා තමයි පෙබරවාරි මාසයේ 27වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මා ඇසූ ප්‍රශ්න. ගරු කථානායකතුමනි, මෙහි අවසානාවන්ත තත්ත්වය මෙයයි. 2015 මාර්තු මාසයේ 17වැනි දා මේ අසා තිබෙන ප්‍රශ්නවලට 2018 ජනවාරි මාසයේ පළමුවැනි දා බැදුම්කර කොමිෂන් සභා වාර්තාව නිසි පරිදි ඉදිරිපත් වන තෙක් නියමිත පරිදි පිළිතුරු මේ රටට ලැබුණේ නැහැ. එහි සැලකිය යුතු පංගුවක් "කෝප්" සභාව හරහා ඉදිරිපත් කරලා තිබුණත්, පෞද්ගලික සමාගමක් වන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මේ මැදිහත්වීම පිළිබඳව මේවාට පිළිතුරු ලබා දුන්නේ නැහැ ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ කුමකට ද? සිදුවීම සිදු වන මොහොතේදීම ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරන කොට විශේෂයෙන්ම මහ බැංකුව බාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු අග්‍රාමාත්‍යවරයා නිසි බරින් සහ නිසි වගකීමෙන් යුතුව මේ ප්‍රශ්න පිළිබඳව සොයා බැලිය යුතුව තිබුණා. මම නොවෙයි, බැදුම්කර කොමිෂන් සභා වාර්තාවම සඳහන් කොට තිබෙනවා, අග්‍රාමාත්‍යවරයා මෙහිදී පිළිතුරු ලබාදීමේදී ඒ අවශ්‍ය බර සහ සැලකිල්ල තබා නොගත් බව. ඒකයි පෙන්නුම් කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ විනාශය දික් ඇදෙන්න පෙර, මහ ජනයාගේ මහා ධනස්කන්දයක් නාස්ති වෙන්න පෙර වළක්වා ගත හැකිව තිබුණු, අපරාධකරුවන් සොයා ගත යුතුව තිබුණු අපරාධකරුවන්ට දඬුවම් ලබා දිය යුතුව තිබුණු අවස්ථාවක්.

හැබැයි, ඒ අවස්ථාව අවුරුදු තුනක් පස්සට ඇදගෙන ගියේ ඇයි? තමුන්නාන්සේලාගේ යහ පාලනය පිළිබඳ සුන්දර වැකි අද වැඩක් නැහැ. අද තමුන්නාන්සේලාගේ සියලු ක්‍රියා මාර්ග අන්තිමට බිත්තියට හේත්තු වූවාට පසුව ගනු ලබන ක්‍රියා මාර්ග. මේ වාගේ ක්‍රියා මාර්ග අපි ඕනෑතරම් දැක තිබෙනවා, ගරු කථානායකතුමනි. මේවා අවසානයේදී බිත්තියට හේත්තුවූවාට පසුව, කර කියාගත නොහැකි තත්ත්වයක් ඇති වුණාට පසුව ගනු ලබන ක්‍රියාමාර්ග. එසේ නැත්නම්, අපේ ගම්වල කියනවා වාගේ කරවටක් ගිලුණු පසු බේරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග. එම නිසා ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිසිසේත්ම අවංකභාවයෙන් කරන ලද ප්‍රකාශ නොව, වංක භාවය - බිත්තියට හේත්තු වූවාට පසුව ආරක්ෂා වීම සඳහා කරනු ලබන ප්‍රකාශ. එතැන් සිට ඇතිවෙච්ච දියත්වීම් සියල්ල; මාරපන කමිටුව, රවි කරුණානායක උප නායකයා පිළිබඳ තීරණ මේ සියල්ල බිත්තියට හේත්තුවූවාට පසුව ඉන් මිදීම සඳහා දරන ලද ඉතාමත් අසාර්ථක, අසරණ තිරණ. ඇයි, මම එහෙම කියන්නේ? එදා මේ පාර්ලිමේන්තුවේ අගමැතිතුමාගේ ප්‍රකාශය කුමක්ද? මා ඒකත් උපුටා දක්වන්නම්. මම ඉතා පැහැදිලිව කිව්වා, මහ බැංකු අධිපතිවරයා පිළිබඳව මේ ප්‍රශ්නය ඇහුවාය කියා. එතුමා මෙහෙම දෙයක් කියනවා. පිළිතුර; "ඒ ටෙන්ඩර් එක දීලා තිබෙනවා. මහ බැංකු අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියා කරුණු නැහැ. එය සත්‍යයෙන් තොරයි. මම දෙවැනි වරටත් කොමිටියට කිව්වා, 'ආපසු මේ ගැන සොයා බලන්න' කියා. ඔහු ඒ උපදෙස් ලබා දුන්නේ, නියෝජ්‍ය අධිපතිවරුන් දෙදෙනෙක් ඉදිරියේදීයි. මහ බැංකු අධිපතිවරයා ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතුවලට මැදිහත් වූවාය කියන චෝදනාව පදනමින් තොරයි." ගරු කථානායකතුමනි, 2017 මාර්තු මාසයේ 17 වෙනිදායින් දින විස්සකට පසුව අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට කියනවා නම්, මහ බැංකු අධිපතිවරයාගේ මුළු මැදිහත්වීම සද්භාවයෙන් සහ ඔහුට එල්ල කරන ලද චෝදනා පදනමින් තොරයි කියා මේකට විවාදයක් ඇති වුණේ නැහැ. එතැනින් එහා මේකට

[ගරු අනුර දිසානායක මහතා]

කරන්න ක්‍රියා මාර්ගයක් නැහැ. හැබැයි අද බැඳුම්කර කොමිෂන් වාර්තාව මොකක්ද කියන්නේ? ඒ වාර්තාවේ කියනවා, "මහේන්ද්‍රන් මහතා රුපියල් මිලියන දහ දහස් පණස් අටක වටිනාකමක් ඇති බැඳුම්කර නිකුත් කරන ලෙසට නියෝග කර ඇති අතර, එමඟින් සාවද්‍ය ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට වෙන්දේසියේදී වැඩි අගයක් ලබා ගැනීමට හැකි වී ඇත. පෙබරවාරි 27වෙනි දින වෙන්දේසියෙන් ලාභ ලැබීම සඳහා මහේන්ද්‍රන් මහතා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අභ්‍යන්තර තොරතුරු ලබා දී ඇත." කියලා.

අද මොකක්ද කියන්නේ? එදා මේ පාර්ලිමේන්තුවේදී මහේන්ද්‍රන් ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතම කාර්ය භාරය අග්‍රාමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට ඔබතුමා ඉදිරිපත් කළා. ඒක තමයි බැඳුම්කර කොමිසමත් ඔබතුමාගෙන් ප්‍රශ්න කරන්නේ, විශ්වාස තැබීම පිළිබඳ ප්‍රශ්නය. මා කියන්නේ මේක විශ්වාසය නොවෙයි. "ගජමිතුරුකමක්" ය කියායි මම විශ්වාස කරන්නේ. ගජමිතුරුකමක්.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, තවත් මෙහෙම කියනවා, 2015 පෙබරවාරි මාසයේ 27 වන දින බැඳුම්කර ගනුදෙනුවේදී අර්ජුන මහේන්ද්‍රන් මහතාගේ මැදිහත් වීමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රජයට සිදු වී ඇති වළක්වා ගත හැකිව තිබූ පාඩුව මිලියන 688 කි. මෙම පාඩුවට මහේන්ද්‍රන් මහතා වගකිව යුතුය." කොහොමද කියන්නේ? "ඒ විතරක් නොවෙයි, මෙය ඔහුගෙන් අය කර ගැනීමට නිර්දේශ කරමි." කියලත් කියනවා. එසේනම් මොකක්ද වී තිබෙන්නේ? පාර්ලිමේන්තුවේදීම අග්‍රාමාත්‍යවරයා ගනුදෙනුව ආරක්ෂා කිරීම වෙනුවෙන් මහේන්ද්‍රන් මහතා ඍජු ලෙස ආරක්ෂා කොට තිබෙනවා. හැබැයි මාර්තු මාසයේ 17 වෙනිදා අග්‍රාමාත්‍යවරයා මෙම පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය සාවද්‍ය බව මෙම බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව තහවුරු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, මෙකට පිටිපන කමිටුව පත් කළා. ඒ පිළිබඳ ඡේද ගණනාවක් තිබෙනවා. මම ඒ ඡේද ගණනාවම උපුටා දක්වන්නට සූදානම් වෙන්නේ නැහැ. හැබැයි මේ පිටිපන කමිටුව පිළිබඳව අග්‍රාමාත්‍යවරයා විශේෂ අවධානයක් යොමු කරනවා, මේ පිටිපන කමිටුව ඉතාමත් නිරවුල් කමිටුවක්ය කියා. ඒ සඳහා වන එක වගන්තියක් මම ඔබතුමාට උපුටා දක්වන්නම්. "මේ සඳහා ආර්ථික විශේෂඥයින් ඕනෑ කියලා සමහර අය කියනවා. මම අහන්නේ එක ප්‍රශ්නයයි. නඩු දැම්මොත් නඩු අහන්නේ කවුද? අපි ආර්ථික විශේෂඥයින් නඩුකාරයින් කරනවාද? පත් කරන්නේ සාමාන්‍ය නීතිඥවරු. මේකට අපට නඩු දමන්න බැහැ. නැත්නම් ව්‍යවස්ථාව වෙනස් කරලා විශේෂඥයින් ගෙන්වන්න ඕනෑ. නැත්නම් ජූරියකට primary dealers දමන්න ඕනෑ. මතක තියා ගන්න. නඩුවක් දැම්මත් නඩුව අහන්නේ මේ සුදුසුකම් තියෙන අය මිසක් වෙන කවුරුවත් නොවෙයි. මහාධිකරණ, දිස්ත්‍රික් අධිකරණ නඩු අහන්නේ මේ අය. මොකක් හෝ විධියකට නීතිය කඩ කර තිබෙනවා නම්, මේක උසාවි ඉදිරිපත් කරන්න බැහැ. ඉස්සර වෙලාම ඒ ගැන අහන්න, මේ නීතිඥයන් තුන්දෙනා. ඉන් පස්සේ කටයුතු කරන්න. මේකේ නීතිඥයන් තුන්දෙනා පත් කිරීම ගැන." මේ පිටිපන කමිටුව ගැන එතුමා ප්‍රකාශ කළ ආකාරයයි.

මෙම වංචාව සොයා බැලීම සඳහා තිබෙන ඉතාම විධිමත් සහ පැහැදිලිම කමිටුව පිටිපන කමිටුව බව අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පුන පුනා ප්‍රකාශ කළා. හැබැයි කනගාටුවට කාරණය මේකයි, ගරු කථානායකතුමනි. බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා, පිටිපන කමිටුවට ඊට අවශ්‍ය වන පරිචය හෝ ඊට අවශ්‍ය වන දැනුම හෝ එවැනි කාර්ය භාරයක් කිරීමට සුදුසුකම් නොමැති බව. ජ්‍යෙෂ්ඨ සහ ප්‍රකට නීතිඥවරු තිදෙනෙකුගෙන් යුත් පිටිපන කමිටුවේ සාමාජිකයන් රජයේ සුරැකුම් සහ රාජ්‍ය ණය වැනි සාපේක්ෂ, සංකීර්ණ විෂය පථයක් පිළිබඳව තාක්ෂණික දැනුමක් හෝ ප්‍රායෝගික අවබෝධයක් සහිත වූවන් නොවූ බව එම කොමිසමේ අදහසයි; මෙම කමිටුවට තමන් පරීක්ෂාවට ලක් කරන්නා වූ කරුණේ තාක්ෂණික සහ ප්‍රායෝගික පැතිකඩ පිළිබඳව දැනුම සහ අත් දැකීම් ඇති සාමාජිකයන් සිටියේ නම්, පරීක්ෂණ කමිටුව කාර්යක්ෂම විය හැකිව තිබූ බව කොමිසමේ අදහසයි. එම නිසා පිටිපන කමිටුව, මේ සිද්ධිය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා තිබෙන සුදුසුම හා ශක්තිමත්ම කමිටුව ලෙස එදා අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී වගන්ති ගණනාවකින් තහවුරු කර තිබුණත්, එම කමිටුවට ඒකට කිසිදු සුදුසුකමක් නොමැති බව බැඳුම්කර පිළිබඳව සොයා බැලීමට පත් කළ කොමිෂන් සභාව ඉතා පැහැදිලිව නිර්දේශ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ගනුදෙනුව සිදුවූ මොහොතේ සිට විෂයය භාර අමාත්‍යවරයා හැටියට අග්‍රාමාත්‍යවරයා, එය ආන්දෝලනයට තුඩු දුන්නාට පසුව පාර්ලිමේන්තුවට වග කිවයුත්තා ලෙස අග්‍රාමාත්‍යවරයා, ඒ වාගේම වංචා, දූෂණවලට එරෙහිව 2015 ජනවාරි මාසයේ 8වැනි දා ප්‍රතිඥා දුන් අග්‍රාමාත්‍යවරයා ලෙස එතුමාගේ සමස්ත හැසිරීමම, දූෂිතයාට දඬුවම් දීම හෝ දූෂණ එළිදරවු කිරීම වෙනුවට, ඉතා පැහැදිලිව දූෂිතයා ආරක්ෂා කිරීම සහ දූෂණය වසන් කිරීම දෙසට යොමු වී තිබුණා. එය නොකියා තමයි බැඳුම්කර කොමිසම -මා දන්නේ නැහැ, අගමැතිවරයාට ඒ ඍජු චෝදනාව කරන්න කොමිසම ඒ තරම් ප්‍රබල තැනකට යයි කියා.- හැබැයි, ජනාධිපති කොමිෂන් සභාව ව්‍යංගයෙන්- මා හිතනවා ඒක එහෙම තමයි කියලා. ඒක තමයි සිංහල භාෂාව.- කියනවා, අග්‍රාමාත්‍යවරයා, මහ බැංකුවේ අධිපතිවරයා සහ ඔවුන් විසින් දෙන ලද තොරතුරු මත මුළුමනින්ම විශ්වාසය නොතැබිය යුතුය තිබුණාය කියලා. එයින් කියන්නේ මොකක්ද? ඔවුන් ආරක්ෂා නොකළ යුතුව තිබුණා. මේකේ අනික් පැත්ත. කියන්නේ negative පැත්තයි. Positive පැත්ත මොකක්ද? ආරක්ෂා නොකළ යුතුව තිබුණාය කියන එකයි. ඒකයි මේ කියන්නේ. ඒ නිසා බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව මඟින් විෂයය භාර අමාත්‍යවරයා ලෙසත්, අග්‍රාමාත්‍යවරයා ලෙසත් නිශ්චිත ලෙස එල්ල වී තිබෙන චෝදනා කිසිසේත්ම බැහැර නොකළ යුතු චෝදනාය කියා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ පරීක්ෂණය ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, නීතිපති දෙපාර්තමේන්තුවට,- මා කියන්නේ නැහැ ඒවා කවදාවත් ස්වාධීන ආයතන බවට පත් වෙයි කියලා. ඒවා හැම දාමත් දේශපාලන හස්තයන්ගේ වුවමනාවලට කටයුතු කර තිබෙන ඉතිහාසයක් තිබෙනවා. File ලාව්වු යටට යන විධිය අපි දන්නවා; චෝදනා වෙනස් වන විධිය අපි දන්නවා; චෝදනාවලින් ගැලවෙන්න චෝදනා ගොනු කළ ඉතිහාසයක් තිබෙන බව අපි ඉතා හොඳින් දන්නවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමන්ගේ නිමිත්ත කලින් හොයා ගන්නවා. එක්කෝ දූෂිතයා නම් කර ගන්නවා. දූෂිතයා නම් කරගෙන පරීක්ෂණ පෙළ ගස්වනවා. එක්කෝ නිවැරදිකරු නිමිත්ත කරගෙන පරීක්ෂණ පෙළ ගස්වනවා. එහෙම දේශපාලන ඉතිහාසයක් මේ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබෙන බව අපි විශ්වාස කරනවා. එම නිසා අපිට ඒ පරීක්ෂණ පිළිබඳව සියයට සියයක විශ්වාසයක් නැහැ. හැබැයි, අපි මේ කාරණය විශ්වාස කරනවා. අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා අපේ රටේ පාර්ලිමේන්තුව විසින් සකස් කරන

ලද නීති සහ පිහිටුවා තිබෙන ආයතන දේශපාලන හස්තයන්ගේ මුළු අධිකාරිත්වයට යට වී තිබෙනවා නම්, අවසානයේදී අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා විශාලම වගකීම තිබෙන්නේ මේ රටේ ජනතාව අතේයි, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ රටේ ජනතාව තමන් අතේ තිබෙන බලය උපයෝගි කරගෙන මෙම අපරාධකරුවන්ට දඬුවම් දෙයි කියන දැඩි විශ්වාසය අපි තුළ තිබෙනවා. සමාජයවත් අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා පෙලඹෙන්නේ නැත්නම්, ඒ සඳහා නායකත්වය දුන් අය වංචනිකයන් සහ දූෂිතයන් නම්, ඒ සඳහා තිබෙන ආයතන අකාර්යක්ෂම වෙලා දේශපාලන හස්තයන්ට මැදිවී තිබෙනවා නම්, අවසානයේදී මේ අවනඩුව තිබෙන්නේ කා ඉදිරිපිටද? ගරු කථානායකතුමනි, අවසානයේදී මේ අවනඩුව තිබෙන්නේ මහ ජනයා ඉදිරිපිටයි. මහ ජනයා මේ අවනඩුවට හොඳ තීන්දුවක් ගත්තේ නැත්නම් ගරු කථානායකතුමනි අපි මහ ජනයා ගැනත් කල්පනා කර බලන්න ඕනෑකම තිබෙනවා. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව අපිට කියන්න තිබෙන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, ඊළඟට බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව මා අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම වාර්තාව ලබා දුන් දින වකවානු සහ ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින වකවානුත් එක්ක සන්සන්දනය කර බලන විට එම වාර්තා ටිකක් නිදාශීලීයි; ඒ වාර්තාව එළියට එන්න කලින්ම හමස් පෙට්ටියට ගියාදෝ කියන සැකය අපට ඇති වනවා. මෙතෙක් කාලයක් එම වාර්තාවට සිදු වුණු සිදුවීම් දිහා බැලුවාම අපට එහෙම තමයි හිතා ගන්න වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව අනුව ආයතන 34ක් පරීක්ෂා කර තිබෙනවා. මේ පරීක්ෂණ 34 තමයි, ඒ වකවානුව පිළිබඳව කරන ලද මහා වංචා දූෂණ 34 කියලා මා කිසිසේත්ම කියන්නේ නැහැ. දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සාකච්ඡාවට බඳුන් වන්නට විශාල කරුණු ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම බරපතළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පරීක්ෂණයට භාජනය වී ගොනු කර තිබෙන නඩු ගණනාවක් තිබෙනවා. එසේම විගණකාධිපති දෙපාර්තමේන්තුවෙත් එවැනි පරීක්ෂණ ගණනාවක් තිබෙනවා. ඒ වාගේම විනිමය පාලන පනතට අනුව කොටස් වෙළෙඳ පොළේ ඇති කරන ලද "ගේම්" පිළිබඳව පරීක්ෂණයක් සිදු වේ යයි අපි විශාල බලාපොරොත්තුවකින් ඉන්නවා.

විශේෂයෙන්ම තිලක් කරුණාරත්න මහතා කොටස් වෙළෙඳ පොළේ ප්‍රධාන නිලයට පත් වුණාට පසුව එතුමා එම ක්ෂේත්‍රයේ ඇති වී තිබුණු වංචා, දූෂණ සහ "ගේම්" පිළිබඳ පරීක්ෂණ වඩාත් කාර්යක්ෂමව ඉදිරියට ගෙන යයි කියලා අපේ විශාල බලාපොරොත්තුවක් තිබුණා. නමුත් දැන් මා තුළ තිබෙන අවබෝධය අනුව එවැනි කිසිදු පරීක්ෂණයක් සිදු නොවන බව තමයි වාර්තා වී තිබෙන්නේ. එවැනි පරීක්ෂණ සිදු කරන්න බැරි හේතු අපට ඉතා පැහැදිලියි, ගරු කථානායකතුමනි. "කලකදි වහ කලකදි රහ වෙනවා ලු." ඒ නිසා 2015ට කලින් වහ වෙලා හිටපු බොහෝ අය 2015 ජනවාරි මාසයේ 08වැනි දායින් පස්සේ රහ වීමේ ප්‍රතිඵලය නිසා තමයි අද විනිමය පාලන පනත අනුව ඒ දේවල් ඉස්සරහට යන්නේ නැත්තේ. එදා "වහ" අද "රහ" වෙච්ච විධිය, අවශ්‍ය නම් ඒවාට අදාළ නම් ගම්, තොරතුරු ඕනෑම වෙලාවක කියන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙම බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ආයතන 34ක් පරීක්ෂණයට භාජනකොට තිබෙනවා. ඒ ආයතන 34න් රුපියල් මිලියන 3,172ක් අවභාවිත වී ඇති බව දැනට වාර්තාකොට තිබෙනවා. මහ ජනයාගේ ධනය රුපියල් කෝටි 317ක්; 317,24,00,000ක් අවභාවිත වී හෝ නාස්ති වී හෝ සොරකම් වී තිබෙන බවට වාර්තාකොට තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒවා එකින් එක විස්තර කරන්නේ නැති වුණාට, දැන් ආන්දෝලනයට තුඩු දී තිබෙන ස්වාධීන රූපවාහිනියේ ගනුදෙනුව පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා සූදානම් වෙනවා. විශේෂයෙන්ම ස්වාධීන රූපවාහිනී ආයතනයත් එම වකවානුවේදී මෙම දැන්වීම් ප්‍රචාරණය කිරීම, මුළුමනින්ම රූපවාහිනී ආයතනය මැනිවරණය සඳහා උපයෝගී කර ගැනීම ආදී කරුණු හේතු කොටගෙන ඇති වී තිබෙන පාඩුව පිළිබඳව මෙහෙම දක්වා තිබෙනවා. ඒ ජනාධිපතිවරණයේදී මීඩියා ෆැක්ටරි නියෝජිත ආයතනයේ දැන්වීම්වලින් -මම රවුම් අගය කියන්නම්.- රුපියල් මිලියන 101ක්; වික්ටරි ඇඩ්වර්ටයිසින් නියෝජිත ආයතනයේ දැන්වීම්වලින් රුපියල් මිලියන 08ක්, Rate Card මඟින් රුපියල් මිලියන 112ක්, මෛත්‍රීපාල මහත්මයාගේ දැන්වීම් ප්‍රචාරය නොකිරීම පිළිබඳව රුපියල් මිලියන 09ක් ආදී වශයෙන් රුපියල් මිලියන 235ක්; රුපියල් 23,52,00,000ක් ITN නාළිකාවේ මුදල් අවභාවිත වූ බව සඳහන් වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ITN නාළිකාවට රුපියල් කෝටි 23ක්. ඉතින්, නාළිකාවක් ඉතිරි වෙයි කියලා මම හිතන්නේ නැහැ. එවැනි කුඩා ආයතනයකින් රුපියල් මිලියන 235ක් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මගේ කාලය දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොච්චර වෙලාවක් ගන්නවාද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමාගේ කාලය ඔක්කොම ගන්නවා.

ගරු කථානායකතුමනි, මේ පරීක්ෂණ වාර්තාවේ සඳහන් ආකාරයට මේ ආන්දෝලනයට තුඩු දුන් කාරණාව සම්බන්ධයෙන් භය වැනි වගඋත්තරකරුවා ලෙස හිටපු ජනාධිපතිතුමා නම් කර තිබෙනවා. නම් කිරීමට අමතරව මෙසේ සඳහන් කර තිබෙනවා:

> "දැන්වීමලත් පාර්ශ්වය වන මහින්ද රාජපක්ෂ යන අය අල්ලස් පනතේ 70 වන වගන්තියෙහි විස්තර කර ඇති "දූෂණය" වරද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද, දූෂණයට අනුබල දීමේ වරද යන මෙම වැරදි එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කර ඇති බව මෙම කොමිෂන් සභාවේ තීරණයයි."

[ගරු අනුර දිසානායක මහතා]

හැබැයි, ඊට පස්සේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව සාකච්ඡාවක් ගොඩනැඟිලා තිබුණා මම දැක්කා. කිසි කෙනෙකුට දේශපාලන "ගේම්" වෙනුවෙන් පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය කිරීමට අපි ඉඩ දෙන්නේ නැහැයි කියලා මම කියනවා.

එය සාධාරණ නැහැ. පාර්ලිමේන්තුව දඬුවම් ලබා දෙන ස්ථානයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව දඬුවම් දීපු, කැත ඉතිහාසයක් තිබෙනවා. ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමියට එරෙහිව මේ පාර්ලිමේන්තුවේ නඩු අහලා - නඩුකාරයෝ කවුද කියන්නත් දැන් ලජ්ජයි- දඬුවම් දුන්නා. ඒ වාගේම මීට ඉහත ඉතිහාසයේදීත් නඩු අහලා දඬුවම් ලබා දුන් අවස්ථා අපි දැකලා තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුව කිසිසේත්ම දඬුවම් දීමේ ආයතනයක් බවට පරිවර්තනය නොවිය යුතුයි. ඒ නිසා දේශපාලන තීරණයකට අනුව තමන්ට අවශ්‍ය අය සොයා බලා දඬුවම් කිරීම සඳහා කෙරෙන ක්‍රියාවලියකට මේ පාර්ලිමේන්තුව යටත් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. එවැනි ක්‍රියා මාර්ගයකට අපේ පාර්ශ්වයෙන් කිසිදු සහායක් ලබා නොදෙනවා පමණක් නොවෙයි, එවැනි ක්‍රියා මාර්ග අපි පරාදත් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාවේ ඉතා පැහැදිලි කථාවක් තිබෙනවා. මේ හරහා කියන්නේ අන් කවරක්වත් නොවෙයි. අපේ රටේ නීතියේ තිබෙන අඩුවක් ගැන කොමිෂන් සභාව පෙන්නුම් කරනවා. කොමිෂන් සභාව මොකක්ද කියන්නේ? දූෂණයට හෝ වෙනත් අපරාධ නඩුවකට අධිකරණයකදී වරදකරු වී දඬුවම් ලැබූ අයෙකු මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත්වීම නුසුදුසු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89වැනි ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒ කියන්නේ, අවුරුදු දෙකකට නොඅඩු කාලයක් දඬුවම් ලබා දිය හැකි වරදකට මාස හයකට වඩා වැඩි සිර දඬුවමක් ලැබුණොත්, ඔහුට ජනාධිපතිවරණයකට හෝ තෝරා පත් කර ගන්නා මැතිවරණයකට අවුරුදු හතක් ගත වන තෙක් ඉදිරිපත් වෙන්න බැහැ. මේක තමයි දැන් තිබෙන නීතිය. හැබැයි කොමිෂන් සභාව කියනවා, මෙම නීතිය සාධාරණ නැහැ කියලා. මේ කොමිෂන් සභා වාර්තාවේ 147 වන පිටුවේ එය මෙසේ සඳහන් වනවා:

"වරදකට වැරදිකරු කිරීමෙන් මහජන නියෝජිතයෙකු වශයෙන් පත් කිරීමට නුසුදුසු වන ඉහත සීමාවන් සලකා බැලීමේදී පෙනී යන්නේ සිර දඬුවම් විඳි දේශපාලනඥයෙකුට වුවද සත් වසරකින් පසුව නැවත මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත් වීමට අවස්ථාව ඇති බවයි."

ඒ කියන්නේ, දැන් තිබෙන නීතියේ අඩුවක් පෙන්වලා දෙනවා. වංචා කරලා සිර දඬුවම් ලැබූ කෙනෙකුට හෝ අවුරුදු 7කට පසුව නැවත මහජන නියෝජිතයෙකු බවට පත් විය හැකියි.

මෙම වාර්තාවේ 147 වන පිටුවේ වැඩිදුරටත් මෙසේ සඳහන් වනවා:

"නමුත් මෙම කොමිෂන් සභාවේ අදහස වන්නේ අපරාධ ක්‍රියාවකට විශේෂයෙන් 'දූෂණය' වැනි වරදකට වරදකරු වූ දේශපාලනඥයෙකු සත් වසරකින් පසුව වුවද මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත්වීම නුසුදුසු බවයි."

එච්චරයි. ඒක හරි නැද්ද? කවුරු හරි තනි පුද්ගලයෙක් ඉලක්කකොට ගෙන පාර්ලිමේන්තුව දඩයම් කිරීමේ, දඬුවම් කිරීමේ මධ්‍යස්ථානයක් වෙනවාට අපි එකඟ නොවන්නා සේම, මහ ජනයාගේ දේපළ හොරකම් කිරීම, නාස්ති කිරීම, දූෂණය කිරීමේ වරදට වරදකරුවෙක් වුණොත් ඔහු මහජන නියෝජිතයෙක් හැටියට තෝරා පත් කර යැවීමට තිබෙන අයිතිය මුළුමනින්ම අවලංගු කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අපි සියයට 100ක් පක්ෂපාතියි. මේ සංශෝධනය ගෙනෙන්න ලැස්තිද කියලා මම ආණ්ඩු පක්ෂයෙන් දැන ගන්න කැමැතියි. මෙය සිදු කළ යුතු සංශෝධනයක්.

ගරු කථානායකතුමනි, මහ ජනතාවගේ ධනය තමන් සිතූ සිතූ පරිදි දූ කෙළියේ යෙදවීමට තාවකාලිකව බලයට එන කණ්ඩායමකට අපි ඉඩ ලබා දිය යුතුද? නැවත අවුරුදු හතෙන් එනවා. ඔය තරම් හොරකම් කළාට පසුව තවත් බලයේ ඉන්න බැහැ. කොහොමත් අවුරුදු හතක් විතර එළියේ ඉන්න වෙනවා. නැවත එනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දූෂණය කියන වරදට වරදකරුවෙකු වී සිර දඬුවම් ලබා යළි මහජන නියෝජිතයෙකු හැටියට තෝරා පත් කර ගැනීම සඳහා තිබෙන අවස්ථාව නැති කිරීමේ නීති ප්‍රතිසංවිධානය වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන යෝජනාවට මා යට කී කොන්දේසියට යටත්ව පක්ෂපාතියි. පාර්ලිමේන්තුව දඬුවම් කිරීමේ ආයතනයක් නොවෙයි, පාර්ලිමේන්තුව නීති සම්පාදනය කිරීමේ ආයතනයක් කියන පැත්තෙන් ඒ යෝජනාවට අපි අපේ පක්ෂපාතිත්වය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ බලය ගන්න අය ඒ බලය හසුරුවන්නේ බලයෙන් විදින්න; බලයෙන් ජොලි කරන්න. රට පිළිබඳව, මහ ජනයා පිළිබඳව, මහ ජනයා විසින් තමන්ගේ දෙවුර මත පටවන ලද වග කීමක් ලෙස නොවෙයි බලය පිළිබඳව ඔවුන් සලකන්නේ. මහ ජනතාව පාර්ලිමේන්තුවට වේවා, ජනාධිපතිවරයෙකුට වේවා මහා බලයක් අත්පත් කර දෙන්නේ කුමක් වෙනුවෙන්ද? ගරු කථානායකතුමනි, එම බලය අත්පත් කර දෙන්නේ මහ ජනයා පිළිබඳවත්, රට පිළිබඳවත් මහත් වග කීමකින් යුතුවයි. හැබැයි, මෑත ඉතිහාසය පුරාම මේ පාලකයන් හැසිරී තිබෙන්නේ ජනතාවගේ බර, රටේ වගකීම තමන්ගේ දෙවුර මත පටවා ගන්නා ලද පාලකයන් ලෙස නොවෙයි. ඔවුන් හැසිරී තිබෙන්නේ තමනට සිතූ සිතූ පරිදි මහ ජනයාගේ ධනය නාස්ති කරමින්, හොරකම් කරමින්, දූ කෙළියේ යෙදෙන්න පුළුවන්, enjoy කරන්න පුළුවන් බලයක් ඇති කණ්ඩායමක් ලෙසයි. ඒක මෙම කොමිෂන් සභා වාර්තාවේ ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. එය මොන තරමේද කියා මම පෙන්වන්නම්, ගරු කථානායකතුමනි.

බැසිල් රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා පිළිබඳව මෙම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුගේ අභ්‍යන්තර ගුවන් ගමන් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ගෙවා තිබෙනවා, රුපියල් මිලියන 155ක්. ඊට පසුව 'ගම නැගුම' ව්‍යාපෘතියෙන් ගුවන් ගමන් සඳහා යොදවා තිබෙනවා, රුපියල් මිලියන 161ක්. ඔහුට නියමිත වාහනවලට වඩා ඔහුගේ අතිරේක වාහන පාවිච්චිය වෙනුවෙන් රුපියල් මිලියන 612යි; ඔහුට නියමිත ආරක්ෂාවට වඩා අතිරේක ආරක්ෂාව වෙනුවෙන් රුපියල් මිලියන 264යි. ඒ නිසා ඔහු සිදු කොට තිබෙන පාඩුව රුපියල් මිලියන 1,200ක් බව මෙම වාර්තාවේ සඳහන් වී තිබෙනවා. රුපියල් මිලියන 1,200ක්! මොකක්ද, මේ පෙන්නුම් කරන්නේ? මෙයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත්ද? ගරු කථානායකතුමනි, මේ ගුවන් වියදම් දිහා බැලුවාම, බොහෝ දුරට එතුමා පොළොවට වඩා වැඩියෙන් උඩ ඉන්න ඕනෑ. පොළොවට වඩා වැඩියෙන් උඩ ඉන්න ඕනෑ, මේ අවුරුදු පහට! ඒ නිසා ගරු කථානායකතුමනි, මහ ජනයාගේ ධනය රුපියල් මිලියන 1,200ක් තමන්ගේ පෞද්ගලික සුඛවිහරණ වෙනුවෙන්, ජොලි කිරීම වෙනුවෙන්, enjoy කිරීම වෙනුවෙන් වැය කරන පාලන තන්ත්‍රයක් වෙනස් විය යුතු නැද්ද? වෙනස් විය යුතු නැද්ද, එම දේශපාලන සංස්කෘතින්? ඒක අපි තමුන්නාන්සේලාගෙන් අහනවා.

ගරු කථානායකතුමනි, මේ වාර්තා පළ වෙන වේලාවේ කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලද සාක්ෂි මා දැක්කා.

එම සාක්ෂිවලින් ඉතා මැනවින් පෙන්නුම් කරමින් තිබුණේ මොකක්ද? සමහර නාවික හමුදා සෙබළියන් තබා ගෙන හිටියේ නෝනාගේ හැටියේ ආය කටුව ගහන්න; එහෙම නැත්නම් සපත්තු දෙක පොලිෂ් කරන්න, සාරිය අන්දවන්න, පොට හරිද කියලා බලන්න. මේ මොකක්ද, වෙලා තිබෙන්නේ? මේ රටේ මහ ජනයාගේ ධනය තමන්ට සිතූ-සිතූ පරිදි විනාශ කිරීම සඳහා අවශ්‍ය වන 'ජොලි කිරීමේ' බලයක් තමයි තමුන්නාන්සේලාගේ පාලනය. ගරු කථානායකතුමනි, මෙම කොමිෂන් සභා වාර්තාවේ ඒ පිළිබඳවත් ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, නියමිත පරිදි එක්රැස් කොට තිබෙන, වියදම් කිරීම සඳහා අනුබලය දී තිබෙන ධනය, වක්‍රාකාරයෙන් තමන්ගේ හිතවතුන් වෙත අදින්නේ කොහොමද, හිතවතුන් වෙත මහ ජනයාගේ ධනය ඇදලා දෙන්නේ කොහොමද කියන එක මෙම වාර්තාවේ ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. ඒක තමයි හම්බන්තොට වරාය විවෘත කිරීමේ උත්සවය.

ගරු කථානායකතුමනි, එක මොහොතකදී තමන්ගේ දේශපාලන කඳවුර මහත් උත්කර්ෂයට නංවන්න, ඒ වෙනුවෙන් පොත-පත ලියන්න, ඒ වෙනුවෙන් චිත්‍රපට හදන්න, ඒ වෙනුවෙන් මහා ප්‍රාඥ වගන්ති කියන්න, ස්තෝත්‍ර ගායනා කරන්න කණ්ඩායම් හදනවා. එම කණ්ඩායම්වල නඩත්තුව මේ ආයතන හරහාම විවිධ ව්‍යාපෘතිවලින් ලබා දෙන බව පැහැදිලියි. එම සිද්ධාන්තයත් මෙම කොමිෂන් සභා වාර්තාවේ පෙන්නුම් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

වරාය අධිකාරිය, හම්බන්තොට වරායේ උත්සව වියදම් - 2010 වර්ෂයේ 08වැනි මාසයේ 15, 'කරදියවර මංගල්‍යය' සැරසිලි වියදම රුපියල් මිලියන 49යි; නැතහොත් රුපියල් හාරකෝටි අනූදෙලක්ෂයයි. එම උත්සවයේ සංවිධාන වියදම රුපියල් තුන්කෝටි තිස්හතරලක්ෂයයි. 2010.11.18වැනි දින එම වරාය විවෘත කිරීමේ උත්සවයේ වියදම රුපියල් හයකෝටි හතළිස්ලක්ෂයයි. එම උත්සවයට යෙදවූ වරාය අධිකාරියේ සේවක වැටුප් බිල රුපියල් දෙකෝටි හතළිස්හත්ලක්ෂයයි. ඒ කියන්නේ වරාය අධිකාරියේ හම්බන්තොට වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ වියදම දාහත්කෝටි දාහතරලක්ෂයයි. මම අහනවා, මේ දාහත්කෝටි දාහතරලක්ෂය ඇදෙන්නේ කොහොමද කියලා. කවුරු වෙතද, මේවා ලබා දෙන්නේ? මේවා තමන්ගේ ස්තෝත්‍ර ගායනා වෙනුවෙන් පෙනී හිටින කණ්ඩායම් වෙත සල්ලි අදින මාවත බව පෙන්නුම් කරනවා, මේ රාජ්‍ය ධුරාවලියේ. එයත් මෙම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ පෙන්නුම් කරන එක නිදර්ශනයක්. මේ මහ ජනයාගේ ධනය තමන්ගේ හිතවතුන් වෙත අයථා පාරවලින් අදින්නේ කොහොමද කියන සංඥාව මේකෙන් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම වංචා, දූෂණවලට ලක් වූ අය කවරාකාරයෙන්ද දේශපාලන බලය සමඟ යැපෙන්නේ, ආරක්ෂා වෙන්නේ කියන පණිවුඩයත් මෙම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ කොමිෂන් සභා වාර්තාවෙන් ඉදිරිපත් වී තිබෙනවා.

මෙම වාර්තාවේ සඳහන් වෙන ආකාරයට විශේෂයෙන්ම එවකට අම්පාර දිස්ත්‍රික්කයේ නගරාධිපතිවරයා 'දැයට කිරුළ' කියන ව්‍යාපෘතියේ තාවකාලික වැසිකිළි පද්ධතියෙන් පවා - ලජ්ජයි!- මහ ජනයාගේ මුදල් හොරකම් කරපු කෙනෙක්. ඔහු එවකට පැවති පාලනයේ ඉතාම සුවව, කීකරු, ශක්තිමත් ගෝලයෙක්. හැබැයි, එම ගෝලයාට අද වෙලා තිබෙන්නේ මොකක්ද?

මෙම බැදුම්කර කොමිෂන් සභා - සමාවන්න! මෙම බරපතළ අපරාධ විමර්ශනය කිරීම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිගන්නා ලද ජනාධිපතිවරයාගේ ම මාතර නගරාධිපති අපේක්ෂකයා බවට ඔහු පත් වන්නේ කොහොමද? ඒකෙන් පෙන්වන්නේ මොකක්ද? මෙහි ඉතා හොඳ නිදර්ශන තිබෙනවා. බලය තිබෙන පැත්තට "හෝයියා!" කීමෙන් මේ වංචාවලින් සැහවෙන්න පුළුවන් කොහොමද කියන සංඥාවත් මෙම කොමිෂන් සභා වාර්තාවෙන් දෙනවා. ඒ වාගේම ඇවන්ට් ගාර්ඩ් මුදල් තමන්ගේ මැතිවරණ ව්‍යාපාරයට පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කෝට්ටේ නගර සභාවේ ජනක රණවක කියන ප්‍රධාන අපේක්ෂකයාගේ ක්‍රියා කලාපය පසුගිය කාලයේ අපි දැක්කා. හැබැයි, හිටි හැටියේ ඔහු වෙනත් දේශපාලන වෙසක් ගන්නේ ඇයි; වෙනත් කඳවුරුවලට එකතු වන්නේ ඇයි? ඒ, ආරක්ෂාව වෙනුවෙන්. දේශපාලන රැකවරණය සඳහා මෙම කණ්ඩායම් පැති හුවමාරු කිරීමේ නිදර්ශන ද මෙම බැදුම්කර කොමිෂන් සභා වාර්තාවෙන් පෙන්නුම් කරමින් තිබෙනවා. සමාවන්න! බරපතළ වංචා, දූෂණ විමර්ශනය කිරීම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන්. කොමිසම කිව්වොත්, බැදුම්කරය ම තමයි මතක් වෙන්නේ. එහෙම නේද? [බාධා කිරීමක්] ඒ ගැන කියල කියලාමයි එහෙම වෙන්නේ. මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක මේ වාර්තාවෙන් පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මැත කාලයේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගන්න කොටම සිදු වූ දේ අපි දැක්කා. මධ්‍යම පළාත් සභාවේ සිටින නිමල් ප්‍රේමචංශ කියන මන්ත්‍රීවරයා, ඒ වාගේම හිටපු අමාත්‍යවරයකු වන පියසිරි විජේනායක මහතා හිටි හැටියේ ස්ථාන මාරු වෙනවා; සිටින බල කඳවුරෙන් වෙනත් බල කඳවුරකට යනවා. ඇයි ඒ? කොමිෂන් සභා වාර්තාවේ චෝදනා තිබෙනවා. ඒ නිසා දැන් අපට ඉතා හොඳින් පෙන්නුම් කරන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභා වාර්තාවලින් අපේ රටේ මූල්‍ය අපරාධ පිළිබඳව, අපරාධකරුවන් සැඟවීම පිළිබඳව, අපරාධකරුවන් රාජ්‍ය බලය යොදාගෙන මහජන ධනය තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් උපයෝගි කරගන්නා ආකාරය පිළිබඳව, ඒ මහජන ධනය තමන්ට ස්තෝත්‍ර ගායනා කරන පුද්ගලයන්ට අදින ආකාරය පිළිබඳව සහ මහ ජනයාගේ ධනය හොරකම් කරලා ආරක්ෂා වන ප්‍රමාණය පිළිබඳව යම් සාධනීය පැතිකඩක් පෙන්නුම් කරමින් තිබෙනවා. එය ඉතාම හොඳයි කියා අපි කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, කසුන් පලිසේනලා, අර්ජුන් ඇලෝසියස්ලා කොහෙන් යාවිද දන්නේ නැහැ. මම කියනවා, ඊයේ දිනයේ කසුන් පලිසේන හා අර්ජුන් ඇලෝසියස් බලන්න ගිය අයගේ නාම ලේඛනය පොඩ්ඩක් පරීක්ෂා කරන්න කියා. එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මා වග කීමෙන් කියනවා, එය පෙන්වන්න කියා. [බාධා කිරීමක්] අද පෙන්වන්න. අපි කැමැතියි. එවිට අපට දැන ගන්න පුළුවන්, ඒ අය කවුද කියා.

ගරු කථානායකතුමනි, ඉතිහාසය පුරාවටම අපි දැක තිබෙනවා, දූෂණය වංචාව පිළිබඳව කර වටක් හිර වෙන කොට පැනි මාරු කළ ඉතිහාසය; බලය පැත්තට පිනුම් ගහපු ඉතිහාසය. ඒ නිසා ඒ පිළිබඳවත් ඉතාම සාධාරණ පැනි කඩක්, -මා කියන්නේ නැහැ මෙහි සමස්තය තිබෙනවා කියා- නිදර්ශන ගණනාවක් මෙම කොමිෂන් සභා වාර්තා හමුවේ අපට පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමාන දේශපාලනයේ මහා සක්‍රිය අය තමන්ගේ අමාත්‍යාංශ මෙහෙයවීමේදී ඥාතීන්ට සලකන ලද ආකාරයන්, -කියන්න ලජ්ජයි!- මහ ඇමතිවරුන් මහජන මුදල් අවභාවිත කරපු ආකාරයන්, තමන්ගේ ඥාතිවරුන් "එයාර් ලංකා" එකට දාලා එහි මුදල් තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් උපයෝගි කර ගන්නා ලද ආකාරයන්, තමන්ගේ පළාතේ ඉඩම්

[ගරු අනුර දිසානායක මහතා]

තමන්ගේ හිතවතුන්ට බෙදා දෙන ලද ආකාරයන් පිළිබඳ කරුණු මෙම ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මෙම බැදුම්කර කොමිෂන් සභා වාර්තාවෙනුත්, මෙම බරපතළ මූල්‍ය අපරාධ විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවලිනුත් පෙන්නුම් කරන්නේ අපේ රටේ දේශපාලනයේ දූෂ්‍යභාවයේ ඉතාම පැහැදිලි පැති කඩක්. එහි ඉතාම පැහැදිලි පැති කඩක් මෙයින් පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2015 ඔක්තෝබර් මාසයේ 16වන දායි. මහියංගන ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2016 අප්‍රේල් මාසයේයි. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සම්බන්ධ වාර්තාව ගැන මා කලින් කිව්වා. එය භාර දුන්නේ 2016 අප්‍රේල් 28වන දායි. මේ අප්‍රේල්වලට අවුරුදු 2යි. ඊට පසුව සීමාසහිත රක්නා ලංකා ආරක්ෂක සමාගම පිළිබඳ වාර්තාව භාර දී තිබෙනවා, 2016 සැප්තැම්බර් මාසයේ. දැනට අවුරුදු එකහමාරකට කිට්ටුයි. උතුරුමැද පළාතේ හිටපු මහ ඇමති එස්.එම්. රංජිත් මහත්මයා හා සම්බන්ධ වාර්තාව භාර දී තිබෙන්නේ, 2016 ඔක්තෝබර් 27වන දායි. අවුරුදු එකහමාරකට කිට්ටුයි. එහෙම නම් ඒ සමහර වාර්තා බාර දීලා අවුරුදු එකහමාරකට, දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 23(2) යටතේ අවස්ථා කීපයකදී මා ඉල්ලා සිටියා, මෙම වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියා. හැබැයි වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කෙරුණේ නැහැ.

ඊට පසුව වාර්තාවලට සෘජු ලෙස වග කිව යුතු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතට මේ වාර්තා ලබා දුන් නිසා පසුගිය අය වැයේ කාරක සභා අවස්ථා විවාදයේදීත් මම එතුමාට දිගින් දිගටම කියා සිටියා, කරුණාකරලා මේ වාර්තා අපට ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, අඩුම තරමේ ඒකට පිළිතුරක්වත් මේ පාර්ලිමේන්තුවේ ලැබුණේ නැහැ. එතකොට අපට සාධාරණ සැකයක් පැන නඟිනවා, මේ වංචා දූෂණයන්ට එරෙහිව තිබෙන විරෝධය යම් දේශපාලන රංගනයක පැතිකඩක් ද පෙන්නුම් කරන්නේ කියලා. ඒකත් අපි නිරාකරණය කර ගත යුතුව තිබෙනවා. මොකද, ඒ වාර්තාව තමන්ගේ අතේ තියාගෙන ඒ දූෂිතයන් එක්ක ආණ්ඩු හදන්න කථා කරනවා නේ. කොහොමද එහෙම වෙන්නේ? අපි අහන්නේ, ඒක කොහොමද වෙන්නේ කියලායි. ඒ නිසා වාර්තාව එළි දැක්වෙන්නේ තමන් සමඟ එකඟතාවකට ආවේ නැතිවුණාම ද කියන සාධාරණ සැකය අපට පැන නඟිනවා. මොකද, ඒ වාර්තාව අතේ තබාගෙන තමයි එකට ඡන්ද කරන්න සාකච්ඡා කළේ. මේ අවංකව අහන්නේ.

ගරු කථානායකතුමනි, අද දූෂණය පමණක් නොවෙයි, දූෂණයට එරෙහි සටන ද දූෂණය වෙමින් තිබෙනවා. ඒකයි මෙහි තිබෙන භයානකම තත්ත්වය. ඒ නිසා ව්‍යාජ දූෂණ විරෝධී කණ්ඩායම් කරළියට එමින් තිබෙන කාලවකවානුවක් බවට මේ මැතිවරණ කාලවකවානුව පත්වී තිබෙනවා. ගරු කථානායකතුමනි, දූෂණයට එරෙහි සටන කිසිසේත්ම දූෂණය වීමට ඉඩ නොදිය යුතුයි කියන ස්ථාවරයේ ජනතා විමුක්ති පෙරමුණේ අපි ඉන්නවා. ගරු කථානායකතුමනි, මේ දූෂණ වළල්ල, මේ දූෂණ යන්ත්‍රණය හුදු තනි පුද්ගලයෙකුගේ, දෙන්නෙකුගේ තනි හිතුවක්කාර ක්‍රියා මාර්ගයක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේක දූෂිත වළල්ලක්. දැන් මේ වළල්ල දශක ගණනාවක් තිස්සේ අපේ රටේ ස්ථාවරව පවතිනවා. ඒ වළල්ල ඇතුළේ දේශපාලන කණ්ඩායමක් ඉන්නවා. මම කියන්නේ නැහැ සියලු දෙනාම කියලා. හැබැයි, ඒ දේශපාලන කණ්ඩායම සියලු දෙනාටම වැඩියෙන් බලවත් කණ්ඩායම. ඒකයි භයානකකම තියෙන්නේ. මැදවච්චියෙන් එන මන්ත්‍රීවරයා එහි හිටියා කියලා, තණමල්විලෙන් එන මන්ත්‍රීවරයා එහි හිටියා කියලා මොකුත් වෙන්නේ නැහැ. හැබැයි, මේ දූෂිත වළල්ලේ හැමදාම ඉන්නේ කවුද? හැමදාමත් පාලන බලය ජනතාව විසින් මැතිවරණයකදී ලබාදී තිබුණත්, ජනතාව විසින් ලබා දෙන ඒ බලය හැම ආණ්ඩුවකදීම තුන් හතර දෙනෙකු අතර කේන්ද්‍රගත වෙනවා. ඒ තුන් හතර දෙනා මේ දූෂණ වළල්ලේ හරි හරියට අසුන්ගත වෙනවා; ස්ථානගත වෙනවා. ඒ එක කණ්ඩායමක්. ගරු කථානායකතුමනි, ආණ්ඩු මාරුවේදී ඒ දූෂිත වළල්ලේ දේශපාලකයන් කණ්ඩායමක් එළියට එනවා. එක්කෙනෙක්, දෙන්නෙක් ඉතුරුත් වෙනවා සහ තව දූෂිත කණ්ඩායමක් ඒකට ඇතුළු වෙනවා. ආණ්ඩු මාරු වෙලා කෙටි වේලාවකදී ඒ දූෂිත වළල්ලේ දේශපාලන කොටස ස්ථාවර වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ දූෂිත වළල්ලට රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළ කණ්ඩායමක් ඉන්නවා. පරිපාලන සේවයේ සිටින්නේ 2,400ක් වුණාට, ඒ 2,400ම නොවෙයි, ඉතා කුඩා කණ්ඩායමක් මේ දූෂිත වළල්ලේ ඉන්නවා. ඒ ගොල්ලන් තමයි මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙන්නේ; ඒ ගොල්ලන් තමයි ජනාධිපති ලේකම් වෙන්නේ; ඒ ගොල්ලන් තමයි TRC එකේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට පත් වෙන්නේ. ඒ කියන්නේ මොකක්ද? ඒ ගොල්ලන් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙන්නේ නැහැ; කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙන්නේ නැහැ. ඒවා අදාළ වෙන්නේ නැහැ. ඒ අය ඉතා බලගතු තැන්වල ස්ථානගත වෙනවා. ඒ විධියට දේශපාලන ස්ථානගතවීමත් එක්කම නිලධාරි යන්ත්‍රණයත් ස්ථානගත වෙනවා.

ගරු කථානායකතුමනි, මේකට පොලීසිය ඇතුළු ආරක්ෂක වළල්ලක් තිබෙනවා. 84,000ක් වන සමස්ත පොලීසිය නොවෙයි. ඒ ගොල්ලන් ගමේ පොඩි පොඩි දේවල් කරනවා. ඒවා ගණන් ගන්නවත් එපා. එහෙම නොවෙයි. හැබැයි, මේ 84,000ක් සේවයේ නියුතු පොලීසියේ ඉතා වග කිව යුතු කණ්ඩායම් මෙහි හරියට ස්ථානගත වෙනවා. ඒ නිසා තමයි හිටපු පොලිස්පති බාලසූරිය වෙලේ සුදාගෙන් ගෙවල් සහ ඉඩම් කප්පම් වශයෙන් අරගෙන තිබෙන්නේ. මම වග කීමෙන් කියන්නේ. එහෙම නැත්නම් සිටින පොලිස්පති පූජිත ජයසුන්දර මහත්මයාට ප්‍රකාශ කරන්න කියන්න, හිටපු පොලිස්පති බාලසූරිය වෙලේ සුදාගෙන් කැලණියෙන් ගෙවල් සහ ඉඩම් ගත්තේ නැහැ කියලා. ගත්තා. ඒ පොලිස්පතිවරයා කටුනායක වෙඩි තැබීමේ සිද්ධියට පසුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති හැටියට යැවුවා. ජනාධිපතිවරණය එනකොට වහාම ඉලංගකෝන් පොලිස්පතිතුමාට වඩා උඩින් අමාත්‍යාංශයේ ලේකම් කරලා තිබ්බා. ඒ විධියට පොලීසියේ ඉතා කුඩා කොටසක් මේ දූෂිත වළල්ලේ සිටිනවා.

ඊළඟට, හමුදා යන්ත්‍රණයෙත් කුඩා කණ්ඩායමක් සිටිනවා. ලක්ෂ තුනකට අධික හමුදාවේ 50, 60ක කණ්ඩායමක් මෙහි සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම ව්‍යාපාරික වළල්ලක් ඉන්නවා. ඔවුන් අපේ රටේ කර්මාන්තකරුවන්, අපේ රටේ නිෂ්පාදන වර්ධනය කරන්නන් නොවෙයි. ව්‍යාපාරික වළල්ලක් ඉන්නවා; සුදු කරපටි මංකොල්ල කාරයන් ටිකක් ඉන්නවා. ඒ ගොල්ලන් නිකම් dealersලා. හවසට ලොකු ලොකු හෝටල්වලට ගියාම ඒ අය බලා ගන්න පුළුවන්. ඒ කණ්ඩායම එක එක ඇමතිවරයා වටේ කැරකි කැරකි ඉන්නවා, අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. මේ dealersලාට මොකද වෙන්නේ? මේ අය ව්‍යාපාරිකයන් නොවෙයි. මේ අය ඇවිල්ලා රටේ නිෂ්පාදනය වැඩි කරන, රටේ ආර්ථිකයට මහා දායකත්වයක් සපයන අය නොවෙයි. මහ ජනයාගේ ධනය එහේට මෙහේට ගනුදෙනු කිරීම හරහා -බ්‍රෝකර් වැඩේ කිරීම හරහා- එක්රැස් කර ගන්නා ව්‍යාපාරික පෙළැන්තියක් ඉන්නවා. ඉතා කුඩා කණ්ඩායමක්. ඒ කණ්ඩායමත් මේ වළල්ලේ ඉන්නවා.

ඊට අමතරව, මේ වළල්ලේ පරීක්ෂණ නිලධාරින් ඉන්නවා; අධිකරණ නිලධාරින් ඉන්නවා. ඒ නිසා මේ දූෂිත වළල්ල ශක්තිමත්. ගරු කථානායකතුමනි, ආණ්ඩු පරිවර්තනයකදී මොකක්ද වෙන්නේ? ආණ්ඩු පරිවර්තනයකදී කෙටි කාලයකට මේ දූෂිත වළල්ල බොඳ වෙනවා; අපහැදිලි වෙනවා; එහෙට මෙහෙට වලනය වනවා. හැබැයි, මාස හත අටක් යන විට නැවත ඒ දූෂිත වළල්ල ස්ථානගත වෙනවා. ඒ දේශපාලකයන් වෙනුවට අලුත් දේශපාලකයන් එතැන ස්ථානගත වෙනවා. හිටපු අයගෙනුත් දෙන්නෙක්, තුන්දෙනෙක් එතැන ඉතිරි වෙනවා. හිටපු පොලිස් නිලධාරින් වෙනුවට අලුතින් පොලිස් නිලධාරින් දෙන්නෙක්, තුන්දෙනෙක් එතැනට ඇතුළු වෙනවා. පරණ දෙන්නෙක්, තුන් දෙනෙකුත් එතැන ඉතිරි වෙනවා. හමුදාවේත්, රාජ්‍ය යාන්ත්‍රණයේත්, ව්‍යාපාරික යාන්ත්‍රණයේත් එහෙමයි. අද තමුන්නාන්සේලා හොයලා බලන්න, තමුන්නාන්සේලාගේ ව්‍යාපෘති පිටුපස ඉන්න dealersලා කවුද කියලා. ඒ තැන්වල ඉන්නේ පැරණි අයමයි. ඒ ගොල්ලනුත් හරියටම ස්ථානගත වෙනවා.

ගරු කථානායකතුමනි, මට කියන්න අමතක වුණා. මේ වළල්ලේ මාධ්‍යවේදියෝත්, මාධ්‍ය හිමිකරුවෝත් ඉන්නවා. අවශ්‍ය නම් මම ඒ ගැන සංඛ්‍යා දත්තත් එක්කම, ඒ නම් එක්කම කවදා හරි කියන්නම්. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් කියන්නම්. ඒ අතර මාධ්‍ය හිමිකරුවන් ඉන්නවා. ඒ අයත් ඒ මොහොතේ ඒ වළල්ලේ ස්ථානගත වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපේ රටේ මහ ජනයාගේ ධනය කෝටි-ප්‍රකෝටි ගණනක් හොරකම් කරන නාස්ති කරන, අවභාවිත කරන දූෂිත වළල්ලක් තිබෙනවා. අපි මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න ඕනෑ. මේ දූෂිත වළල්ල පරාජයට පත් කිරීම හුදු පුද්ගලයෙකුගේ "ගනු කඩුව-එනු සටනට" කියනවා වාගේ සටනක් නොවෙයි. මේ දූෂිත වළල්ල එහෙම පරාජයට පත් කරන්න බැහැ. ඒක ව්‍යාජයක්. මේ දූෂිත වළල්ල පරාජය කළ හැකි වන්නේ, ඒ දූෂිත වළල්ලට එරෙහිව ප්‍රබල මහජන ව්‍යාපාරයක් ගොඩනැඟීමෙන් පමණයි. එසේ නැතිව මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න බැහැ. හැම දාම සිද්ධවෙන දේ තමයි, මේ දූෂිත වළල්ල ඒ ආකාරයෙන්ම ස්ථාපිත වෙලා නව දූෂිතයන්ගෙන් පිරෙන එක. ඒකයි සිද්ධ වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙහි තිබෙන බෙදවාචකය මොකක්ද? මෙහි බෙදවාචකය ගැන අපේ ඇත ගම්වලට ගිහිල්ලා බලන්න. ඒ දරුවන්ට ඉගෙන ගන්න පාසලක් නැහැ; ඒ දරුවන්ට අධ්‍යාපනයක් නැහැ; හරිහමන් ආහාර වේලක් නැහැ; ගමේ පාරේ යන්න විධියක් නැහැ; ගැබිණි මවට පෝෂ්‍යදායී ආහාර වේලක් නැහැ. මුළුමනින්ම ඒ අයගේ සමාජ ජීවිතය කඩා වැටිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, මේ දූෂිත වළල්ල මහා අපරාධවලට හවුල් වී තිබෙනවා.

සමාජ අපරාධ පිටුපස දේශපාලකයන් ඉන්නවා යැයි විපක්ෂයේ මන්ත්‍රීවරු කියන කොට, සමෘද්ධි අමාත්‍යවරයා, එස්.බී. දිසානායක අමාත්‍යවරයා නුවරඑළියේදී කියනවා මම පළමුවතාවට දැක්කා, "ඇමති මණ්ඩලයේ අමාත්‍යවරයෙක් තමයි නුවරඑළියට කුඩු ගෙනෙන්නේ" කියලා. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? "අද නුවරඑළියේ ඡන්දවලට විසි කරන්නේ කුඩු සල්ලි" කියලා දැන් රජයේ අමාත්‍යවරයෙකුටම කියන්න සිදු වී තිබෙනවා නම්, කවුරු ගැනද මේ කිව්වේ? මේ කිව්වේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අමාත්‍යවරයා ගැනයි. පසුව දා රාධක්‍රිෂ්ණන් අමාත්‍යවරයා කිව්වා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කුඩු ගෙනෙන්නේ නැහැ" කියලා. ඒකෙන් තමයි අපි දැන ගත්තේ 'මෑන්'

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කියලා. ඉතින් මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයෙක් තව අමාත්‍යවරයෙකුට කියනවා, "ඔහු කුඩු ව්‍යාපාරිකයෙක්. නුවරඑළිය මුළු වතුකරයම කුඩුවලින් ගිල ගත්තා" කියලා. හැබැයි, තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද? ඒ අමාත්‍යවරයා කොතැනද ඒ ගැන පැමිණිල්ලක් දාලා තිබෙන්නේ? පරීක්ෂණයක් සඳහා කොතැනටද යොමු කරලා තිබෙන්නේ? එහෙම වෙන්නේ නැහැ. ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

එතුමාගේ වේදිකාවේ සිටියා නම් ඔහු එතුමාගේ අතිජාත මිත්‍රයෙක්. අද එතුමාගේ වේදිකාවේ නැති නිසා ඔහු 'කුඩු' ඇමතිවරයෙක්. මේක තමයි සිද්ධ වී තිබෙන්නේ? ගරු කථානායකතුමනි, අපරාධවලට අනුබල දෙන, සමාජ අපරාධ ආරක්ෂා කරන, සමාජ අපරාධවල නියැළෙන දේශපාලන සංස්කෘතියක් තිබෙනවා. මේ දේශපාලන සංස්කෘතිය තමයි අපේ රට විනාශකාරී ගමනකට ඇදගෙන යමින් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ මේකයි. පැවති දශක ගණනාවක කාල පරිච්ඡේදය තුළ මහා විනාශකාරී ලෙස කොල්ලකරුවන්ගේ, රැවටිලිකාරී දේශපාලකයන්ගේ ග්‍රහණයට අපේ රට හසු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, අපේ රටේ ජනතාව පව්! ගරු කථානායකතුමනි, දශක ගණනාවක් අපේ රටේ ජනතාව මේ අපරාධකරුවන්ගේ කොල්ලකරුවන්ගේ, රැවටිලිකාරයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. මේ රටේ ජනතාව කවදාද ඒ අපරාධකරුවන්ගේ, මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මිදෙන්නේ? ඒ නිසා ජනතාවට සුවිශේෂී වග කීමක් තිබෙනවා, මේ අපරාධකරුවන්ගේ, කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘභූමිය මුදවා ගන්න. නැවක් සෝමාලියාවේ මුහුදු මංකොල්ලකරුවන්ට අහුවුණා වාගේ, ශ්‍රී ලංකාව කියන දූපත හැත්තෑ වසරක් මේ මං කොල්ලකරුවන්ගේ, පාඩඩයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම මං කොල්ලකරුවන්ගෙන් ශ්‍රී ලාංකික දූපත මුදා නොගන්නා තාක්කල් අපට ඇසෙයි, ඇත ගමක කන්න දෙයක් නැතිව කෝවක්කා ගෙඩි කාලා මැරෙන දරුවන් ගැන; ණය ගෙවා ගන්න බැරිව වහ බීලා මැරෙන ගොවියෝ ගැන; මාතර ගහට ගිහිල්ලා කිඹුලා කාපන් කියලා දරුවෝ විසි කරන අම්මලා ගැන. ගරු කථානායකතුමනි, මෙම බෙදවාචකය අවසන් කිරීම සඳහා වන මහඟු වග කීමක් අපට තිබෙනවා.

ඒ වගකීම ඉටු කිරීමේදී මේ රටේ පුරවැසියන්ට, සමාජ සංවිධානවලට, මාධ්‍යයට, මේ රටේ දේශපාලන ව්‍යාපාරවලට විශාල කාර්ය භාරයක් තිබෙන බව අප විශ්වාස කරනවා. මේ

[ගරු අනුර දිසානායක මහතා]

තත්ත්වය කොතැනකින් හෝ අවසන් කළ යුතුව තිබෙනවා. තවදුරටත් මෙවැනි භේදවාචකවලට අපේ රටත්, අපේ රටේ ජනතාවත් ගොදුරු වීමට කිසිසේත්ම ඉඩ ලබා නොදිය යුතුයි. ඒ නිසා ගරු කථානායකතුමනි, දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි අපේ මුළු ව්‍යායාමයම, මුළු බර යොදවමින් තිබෙනවා මේ අපරාධකරුවන්ගේ, මේ කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘ භූමියත්, මේ මාතෘ භූමියේ වෙසෙන ජනතාවත් මුදා ගැනීමට. ඒ සඳහා අපි සාර්ථක පියවරක් අරගෙන තිබෙනවා. සාර්ථක පියවරක්!

ගරු කථානායකතුමනි, අවුරුදු තුනකට පසුව හෝ මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ කරුණු හෙළිදරවු වී තිබෙනවා. සාමාන්‍යයෙන් සිදු වන දේ තමයි අවුරුදු තුනක් යනකොට කාලයේ වැලි තලාවෙන් මේ කරුණු යට යන එක. හැම දාමත් මෙවැනි අපරාධවලට සිද්ධ වුණේ ඒක තමයි. හැබැයි, මේ බැඳුම්කර ගනුදෙනුවට අවුරුදු තුනක් ගිහිල්ලාත් කාලයේ වැලි තලාවට යට වෙන්න ඉඩ නොදුන්නේ ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි ඒ සඳහා විශාල කාර්ය භාරයක් කළ නිසායි. අපට ඒ ගැන ආඩම්බරයක් සහ සතුටක් තිබෙනවා. අපි විතරක් නොවෙයි, තවත් දේශපාලන පක්ෂ, සමාජ සංවිධාන සහ මාධ්‍ය ව්‍යාපාරත් කාලයේ වැලි තලාවෙන් මෙය යට යන්න ඉඩ නොදී ඉදිරියට ගෙන ඒම සඳහා විශාල ප්‍රයත්නයක් දැරුවා. අපි ඒ හැම දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ, මෙවැනි විවාදයකින් අවසන් වීමෙන් තොරව, මේ කොල්ලකරුවන්ගේ, මේ අපරාධකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘ භූමිය මුදා ගැනීම දක්වා මේ අරගළය, මේ සටන ඉදිරියට දියත් කරමු කියන එකයි. ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න, දායකත්වය සපයන්න කියලා සියලුදෙනාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

[පූ.භා. 11.38]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ගැන සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට කරුණු විමසා බැලීමට පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවල වාර්තා පිළිබඳව වන විවාදයේදී මගේ අදහස් දක්වන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අද පවත්වන මේ විවාදයටත් වඩා වැදගත් වන්නේ, වැරදි කරපු අයට දඬුවම් දෙන එකයි. ඒ වැරදිකරුවන්ට එරෙහිව අධිකරණ ක්‍රියා මාර්ග ශීඝ්‍ර කරලා, අධිකරණ ක්‍රියා මාර්ග ගන්න එක තමයි රටේ පුරවැසියා ඇත්තටම බලාපොරොත්තු වන්නේ. මේ සමහර කරුණු අපි සෑහෙන කලක සිට මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරලා තිබෙනවා.

පසුගිය මැතිවරණය අවස්ථාවේදී අපි පොරොන්දු වුණා, විපක්ෂයේ පුද්ගලයෙක් "කෝප්" කමිටුවේ සභාපති කරනවා කියලා. අගමැතිතුමා ඒ දුන්න පොරොන්දුව පාර්ලිමේන්තුව පිහිටෙව්වාට පස්සේ ඉෂ්ට කළා. විශේෂයෙන්ම මේ බැඳුම්කර පිළිබඳ "කෝප්" වාර්තාව නිකුත් වුණාට පස්සේ, 2016 ජනවාරි 01වැනි දා අගමැතිතුමාගේ මහ පෙන්වීම අනුව සභානායකතුමාගේ ලේකම් ඒ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්යාලයෙන් ඒ වාර්තාව යැව්වේ ජනවාරි මාසයේ 26වැනි දා. නීතිපති ජයන්ත ජයසූරිය අත්සන් කරපු, නීතිපති නිල මැදිරියෙන් ලැබුණු ඒ ලිපිය මා ළඟ තිබෙනවා. එම ලිපිය මම **සභාගත*** කරන්න කැමැතියි.

ඒ "කෝප්" වාර්තාව ගැන අපි වහාම ක්‍රියා කළා. අපි කිව්වේ, මේ සම්බන්ධයෙන් ඉක්මනට ක්‍රියා කරන්න කියලායි. නමුත්, ඇත්තටම ඒ ක්‍රියාව සිද්ධ වුණේ නැහැ. ඒක තමයි තිබුණු ගැටලුව. එතකොට, ජනාධිපතිතුමා මේ ගැන ජනාධිපති කොමිසමක් පත් කළා. ඒ ජනාධිපති කොමිසම පත් කළා, 2017 ජනවාරි මාසයේ. ඒ වාර්තාව 2018 ජනවාරි 03වැනි දා තමයි අපට ලැබුණේ. ඒ කොමිෂන් සභාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් දෙදෙනෙක් හිටියා. හිටපු විගණකාධිපතිවරයෙකුත් හිටියා. ඒ නිසා ඒ වාර්තාව ගැන දැඩි විශ්වාසයක් තිබෙනවා කියලා අපි හිතනවා, ඒ පත් කරලා තිබෙන සාමාජිකයන් දිහා බැලුවාම. ඒ වාර්තාවත් අපි එළියට දැම්මා. එම වාර්තාව ගැන සාකච්ඡා වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, හොරු හැම තැනම ඉන්නවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ "වංචාව" කියන එක අපේ සංස්කෘතියේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. "හොරු" කියන අය හැම තැනම ඉන්නවා. පක්ෂවලත් ඉන්නවා. ඒක ජනතා විමුක්ති පෙරමුණේ අයත් දන්නවා. කලින් කලට ඒවා එළි දැක්වීමයි සිදු වන්නේ. ගරු කථානායකතුමනි, නමුත් දැන් තිබෙන වෙනස මේකයි. පසුගිය කාලයේ වාගේ නොවෙයි. ජනාධිපති කොමිසමක් පත් කළාම ඒ කොමිසමේ වාර්තා අපි සභාගත කරනවා විතරක් නොවෙයි, ඒ වාර්තා අපි මුළු රටටම එළි දක්වනවා. මේ රටේ පුරවැසියන්ට අයිතිය තිබෙනවා, ඒ කොමිෂන් සභා වාර්තාවලින් ඇත්තටම කියා තිබෙන්නේ මොනවාද කියා බලන්න. ගරු කථානායකතුමනි, වෙනස මේකයි.

පසුගිය කාලයේ මේ වාර්තා ඉදිරිපත් වුණාම, චෝදනාවක් තිබෙනකොට කිසිවක් සිදු වුණේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ වාර්තාවල විස්තරවත් ලබා ගන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න මා කැමැතියි. පසුගිය වසර දහය තුළ -2010 වසරේ ඉඳලා- ජනාධිපති කොමිෂන් සභා තිබුණා. අතිගරු ජනාධිපතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, ඒ වාර්තා සියල්ල සභාගත කරලා, ඒ වාර්තා සියල්ල මහ ජනයාට දෙන්න කියලා. මම මේ ගැන හොයා බලනකොට මට ආරංචි වුණා, ජනාධිපති නිල කාර්යාලයේවත් මේ සමහර වාර්තා නැහැ කියලා. මම කියන්නේ, ඒ ගැනත් අපි හොයා බලන්න ඕනෑ කියලායි. හොයා බලා ඒ වාර්තා සියල්ලම මේ රටේ පුරවැසියන්ගේ දැන ගැනීම සඳහා සභාගත කරන්න ඕනෑ. මේවා වහන්න බැහැ. මේක තමයි ඇත්තටම වෙලා තිබෙන වෙනස.

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බැඳුම්කර සිද්ධිය ගැන පොලිසියේ අපරාධ අංශය B report එකක් ඉදිරිපත් කරලා, දැනටමත් සමහර පුද්ගලයන් අත් අඩංගුවට ගෙන තිබෙනවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, මේක ප්‍රමාද කරලා, මේක යට ගහන්න වෑයමක් තිබෙනවාය කියලා. ඒ, පසුගිය කාලයේදී. මේ රටේ ඉතිහාසය අනුවයි එතුමා කථා කරන්නේ. නමුත් අපට ඊට වඩා බලාපොරොත්තුවක් තිබෙනවා. එම වාර්තාවේම සඳහන් කර තිබෙනවා, 2015 වසරේ ඉඳලා විතරක් නොවෙයි, 2008 වසරේ ඉඳලාම බැඳුම්කරය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පිළිබඳව තිබෙන මේ දූෂිත වළල්ල ගැන සොයා බලන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, 2008 වසර තෝරා ගත්තේ ඇයි කියලා මා දන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා කොමිසමක් පත් කරනවා නම්, 1990 වසරටම ගිහිල්ලා මේ ගැන සොයා බලන්න කියලා මා යෝජනා කරනවා. මොකද, මේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදු වෙලා තිබෙනවා. මේවා ගැන දිගටම චෝදනා තිබෙනවා. මහ බැංකුවේ භිටපු ජොෂ්ඨයින්නුත් මේවාට සම්බන්ධයි. ඒ නිසා 1990 වසරටම ගිහිල්ලා මේවා ගැන සොයා බලන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි. දැනට අපි දඬුවම් දෙන්නට ඕනෑ. නමුත් මේ ක්‍රමවේදය ගැන කථා කරනකොට පසුගිය ආණ්ඩුව කාලයේ දී -අවුරුදු දහය තුළ දී- කිසිම ඇමති කෙනෙකුගෙන්, මන්ත්‍රී කෙනෙකුගෙන් ප්‍රශ්න කළාද කියලා මම අහන්න කැමැතියි. සොයා බැලීමක් කළාද? ප්‍රශ්න කළාද? කවුරුවත් අත් අඩංගුවටවත් ගත්තාද? කිසිවකු රිමාන්ඩ් බන්ධනාගාරගත කළාද? ඒ කිසිවක් සිදු වුණේ නැහැ.

අපේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරු තිදෙනෙක් චෝදනා තිබූ පමණින්ම අයින් වෙලා තිබෙනවා. විමසුම් අවසන් වෙනකල් අයින් වෙලා තිබෙනවා. මට ඉස්සර වෙලා කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පාර්ලිමේන්තුව අධිකරණයක් නොවෙයි. අපට කවුරුවත් වරදකරුවෙක් විධියට නම් කරන්න බැහැ. ඒක අධිකරණයට අයිති කාරණාවක්. නමුත් අපි ඇති කරලා තිබෙන වෙනස, අපි ඇති කරලා තිබෙන සංස්කෘතිකමය වෙනස බලන්න. අපේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුනුත් අඩියක් පස්සට අරගෙන තිබෙනවා. ඒකයි තිබෙන විශාල වෙනස. ගරු කථානායකතුමනි, එදා අධිකරණයට ඉඩ දුන්නේ නැහැ. මේ රටේ ජනාධිපතිතුමා අධිකරණයට ගියා. ගිහිල්ලා අධිකරණයෙන් උපදෙස් ගත්තා, තමන්ට බලයේ සිටින්න පුළුවන්කම තිබෙන්නේ අවුරුදු පහක්ද, හයක්ද කියලා. අධිකරණය ඒකමතිකව කිව්වා, අවුරුදු පහයි කියලා.

පසුගිය ආණ්ඩුව කාලයේදී භිටපු ජනාධිපතිතුමා ඔය වාගේ ප්‍රශ්නයක් ඇහුවා නම් කොයි වාගේ තීරණයක්ද දෙන්නේ කියලා අපට හිතා ගන්න පුළුවන්. එදා ජනාධිපති යකඩ සපත්තුවට අධිකරණය යට කරලායි තිබුණේ. අපට අද වාගේ මතකයි, එදා ශිරාණි බණ්ඩාරනායක මැතිනිය පාර්ලිමේන්තුවට කැඳවූ සිද්ධිය. එතුමියව පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරයකට කැඳවා, මන්ත්‍රීවරුන් එතුමියගෙන් ප්‍රශ්න කළා.

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමිය පශ්චාත් උපාධියක් තිබෙන කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක්. එතුමිය පසුව තමයි විනිසුරු මණ්ඩලයට ආවේ. ඊට පස්සේ තමයි, එතුමිය මේ රටේ අග විනිසුරුවරිය වුණේ. මේ ප්‍රශ්න කරන අපටවත් එතුමියගෙන් ප්‍රශ්න කිරීම ගැන දැනුමක් තිබුණාද කියලායි එතුමා ඇහුවේ. ඒ විතරක් නොවෙයි. එතුමියට නින්දා අපහාස කරලා එතුමියව නෙරපා දැම්මා. පාර්ලිමේන්තුව අධිකරණයක් හැටියට සලකා එතුමියව නෙරපා දැම්මා. එදා ඒ යකඩ සපත්තුවට තමයි අධිකරණය යටපත් කළේ. ඒ විතරක් නොවෙයි. එදා මොනවාද කළේ? පාර්ලිමේන්තුවත් ඒ යකඩ සපත්තුවට යට කරන්න වෑයම් කළා.

ගරු කථානායකතුමනි, එදා අපි පාර්ලිමේන්තුවට එනකොට අපේ මේස උඩ පොත් රාශියක්ම තිබුණු බව ඔබතුමාටත් මතක ඇති. අපි බැලුවා, ඒ මොනවාද කියලා. එහි තිබුණා, රටේ ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනෑය කියලා; ජනාධිපතිතුමාගේ ධුර කාල දෙක අහෝසි කරන්න ඕනෑය කියලා. අපි කිව්වා, "මේක ව්‍යවස්ථාව වෙනස් කිරීමක්. ඒ නිසා මේ ගැන වාද විවාද කරන්න කල් දෙන්න" කියලා. ගරු කථානායකතුමනි, අපට වෙලාව දුන්නේ නැහැ. අපට කිව්වා, "තව පැය හයකින් ඡන්දය ගන්නවා. ඡන්දය දෙනවා නම් දෙන්න, නොදෙනවා නම් නොදෙන්න" කියලා. අද අපි සාකච්ඡා කරන්නේත් ව්‍යවස්ථාව වෙනස් කිරීමක් ගැනයි. වසර දෙකකට පාර්ලිමේන්තුවේ කමිටු පත් කරලා ඒ සාකච්ඡාව වසර දෙකක් දක්වා යනවා. ඒ සාකච්ඡාව යනකොට අපට කියනවා, "මෙන්න බලන්න, රට විකුණන්න හදනවා. රට බෙදන්න හදනවා. නොයෙකුත් දේ කරන්න හදනවා." කියලා. මේ අය මේවා කියන්නේ දේශ ද්‍රෝහීත්වයක් මවාගෙනයි. නමුත්, අපි ඒක කරන්නේ සද්භාවයෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා නම්, රට තුළ සාකච්ඡාවක් තිබෙන්න ඕනෑ. එපමණක් නොවෙයි. කවදාවත් සිදු නොවන දෙයක් තිබෙනවා. ඒක පාර්ලිමේන්තුව අනුමත කළත්, ජනතාවටත් අවස්ථාව දෙන්න ඕනෑ. ඒ සඳහා ජන මත විචාරණයක් තබන්න ඕනෑය කියන ස්ථාවරයේ තමයි මුල සිටම අප සිටින්නේ. අපි මේක හංගලා කරන ක්‍රියාවලියක් නොවෙයි. මේක රටේ ශුභ සිද්ධිය සඳහා කරන ක්‍රියාවලියක්. නමුත්, එදා අපට අවස්ථාව දුන්නේ නැහැ. එදා අපට කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැය හයකින් වෙනස් කරන්න ඕනෑය කියලා. ගරු කථානායකතුමනි, ඒවා මේ රටේ ඉතිහාසයේ තිබෙන කළු පැල්ලම්. ඒ වාගේ දේවල් කවදාවත් සිදු වෙන්න ඉඩ දෙන්න බැහැ. ගරු කථානායකතුමනි, එදා තිබුණේ එවැනි පාලනයක්. නමුත්, අද හැම එකක්ම විවෘතව තිබෙනවා. සමහර අයට සැකයක් තිබෙනවා, ඇත්තටම සාධාරණයක් වෙයිද, නැද්ද කියලා. නමුත්, සාධාරණයක් කිරීමට තමයි අපි කටයුතු කර ගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව අපට දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභාවේ සාමාජිකයන් කවුද? මේ කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු වන්නේ වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මහතා. එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක්. අද මේ රටේ අග විනිසුරු එතුමායි. එතුමාට විරුද්ධව කවුරුත් වචනයක්වත් කියලා නැහැ. ඒ කියන්නේ එතුමා සුපිරිසිදු පුද්ගලයෙක්. මේ කොමිෂන් සභාවේ ඉන්නවා, අනිල් ගුණරත්න මහතා. ඒත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක්. ඒ වාගේම මේ කොමිෂන් සභාවේ ඉන්නවා, කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් කුලතුංග මහතා. එතුමාත් උසස් අධිකරණයේ විනිසුරුවරයෙක්. ඊට අමතරව සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මහතා ඉන්නවා. එතුමා විශ්‍රාමලත් විගණකාධිපතිවරයෙක්. මේ අය හැමෝගේම ප්‍රසාදයට ලක් වූ පුද්ගලයන්. ඒ වාගේම අයියතුරෙයි ඥානදාසන් කියන විශ්‍රාමලත් අතිරේක සොලිසිටර් ජනරාල්තුමාත් මේ කොමිෂන් සභාවේ ඉන්නවා. මේ පුද්ගලයන් මේ රටේ හැමෝම දන්නා; හැමෝම පිළිගන්නා පුද්ගලයන්. ජනාධිපතිතුමා විසින් මේ අය තමයි මේ කොමිෂන් සභාවට පත් කළේ. ඔවුන් දැන් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වාර්තාවේ තිබෙන කරුණු බොහොමයි. අගමැතිතුමා සඳහන් කළ ආකාරයට මේ වාර්තාව තුළ මන්ත්‍රීවරු 34දෙනෙක් සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබෙනවා. නමුත් අපි සඳහන් කළ යුතු කරුණු කීපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම මැතිවරණවලට එනකොට රාජ්‍ය සම්පත් භාවිතය ගැන අපි සඳහන් කළා. මේ රාජ්‍ය සම්පත් භාවිතය විශාල ලෙස සිදු වුණා. මේක අපි නතර කරන්නට ඕනෑ. මේකට දඬුවම් දෙන්නට ඕනෑ. මේ කොමිෂන් සභා වාර්තාවේම සඳහන් කරනවා, අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රවර්ධන ප්‍රචාරක දැන්වීම් මීඩියා ෆැක්ට්‍රි ආයතනය මහින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ආයතනය වෙත යොමු කර නොමිලේ විකාශනය කිරීම තුළින් රුපියල් කෝටි 10ක්, නැත්නම් රුපියල් මිලියන 101ක් අවභාවිත වෙලා තිබෙනවා කියලා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඊට පස්සේ, 2015 ජනාධිපතිවරණයේදී එතුමායි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි ජනාධිපති ධුරයට තරග වදින විට සමාන අපේක්ෂකයන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුට අසමාන ලෙස සැලකීමට බඳුන් කර වැඩිපුර මුදලක් ස්වාධීන රූපවාහිනී පාලන අධිකාරිය මඟින් ලබා ගැනීමට කටයුතු කිරීම සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට සිදු වී ඇති රුපියල් කෝටි 11ක, -එහෙම නැත්නම් රුපියල් මිලියන 112ක- මූල්‍යමය පාඩුවක් ගැන අනාවරණය වෙලා තිබෙන බව කියනවා. ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභාවේ සාමාජික හිටපු විගණකාධිපතිවරයා සඳහන් කරලා තිබෙනවා මේවා සම්බන්ධයෙන් අපරාධ නඩු දාන්නට ඕනෑ කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙහි SriLankan Airlines එකේ SriLankan Catering Limited එක ගැන බලය හා අධිකාරිය අයුතු ලෙස පාවිච්චි කිරීම ගැන සඳහන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, SriLankan Airlines එකේ හිටපු සභාපතිතුමාත් හිටපු ජනාධිපතිතුමාගේ නෑදෑයෙක්. මේ රට ඉදිරියට ගන්න නම් අපි මේ පවුල් සම්ප්‍රදායෙන් අයින් වෙන්නට ඕනෑ. මේ රටේ හුඟක් උගතුන් සිටිනවා, වෘත්තීයවේදීන් ඉන්නවා, අපි මේ අයට තැනක් දෙන්නට ඕනෑ; මේ අය ඉදිරියට ගේන්නට ඕනෑ. පාර්ලිමේන්තුව, පළාත් පාලන ආයතන, නගර සභා ඇතුළු සෑම තැනකදීම උගතුන්ට, වෘත්තීයවේදීන්ට ඉදිරියට එන්නට අවස්ථාවක් දෙන්නට ඕනෑ; පවුල් වාදයෙන් අයින් වන්නට ඕනෑ. අපි හුඟක් වෙලාවට ඥාති සංග්‍රහය නිසා වැදගත් තැන්වලට නෑදෑයන්ව පත් කරනවා. ඒකෙන් රටට වන පාඩුව කියලා නිම කරන්නට බැහැ. ඒ පත් කරන්නේ සුදුසු අයත් නොවෙයි. පවුලේ අය වුණත් කමක් නැහැ සුදුසු කෙනෙක් පත් කරනවා නම්. සුදුසු අය නම් ක්‍රමවේදය අනුවවත් පත් කරන්නට පුළුවන්. නමුත් පවුලේ අය පත් කිරීම කොහොමත් නුසුදුසුයි. සුදුසු කෙනෙක් පත් කළත් ක්‍රමවේදය අනුව පත් කළ යුතුයි. කිසිම සුදුසුකමක් නැති අය පත් කළාම රටට වන අවාසිය ගැන හිතලා බලන්න. මෙහිදී ඒ අය වරප්‍රසාද ගත්තා විතරක් නොවෙයි. ඒවා සම්බන්ධව මේ කොමිෂන් සභා වාර්තාවේ පිටු සිය ගණන් තිබෙනවා, ඒවා ඔක්කොම ගැන කියන්නට බැහැ. නමුත් ඒ වරප්‍රසාද පෞද්ගලිකව පාවිච්චි කළා විතරක් නොවෙයි මෙහිදී තවත් කාරණයක් සඳහන් කරනවා.

2014 ජනවාරි මාසයේ 22වෙනි දා මලයාසියාවේ ක්වාලාලම්පූර් සිට කටුනායක දක්වා පියාසර කිරීමට නියමිතව තිබූ UL 319 ගුවන් යානය එතැනින් කෙළින්ම කටුනායකට එවන්නේ නැතිව සිංගප්පූරුව හරහා කටුනායකට එවන්නට නියෝග දීලා තිබෙනවා. ඇයි ඒක ඇරියේ? ගුවන් සභාපතිතුමාගේ පෞද්ගලික ගමනක් සම්පූර්ණ කරන්නට රජයේ, ශ්‍රී ලංකා ගුවන් ආයතනයේ ගුවන් යානයක් හැරෙව්වා කියලා සඳහන් කරනවා. ගරු කථානායකතුමනි, මම මේ කාරණයක් දෙකක් පමණක් උපුටා ගත්තේ ඊට වඩා විශාල ප්‍රශ්නයක් ගැන කථා කිරීමටයි. පෞද්ගලික වරප්‍රසාද ගන්නට පුළුවන්. වාහන අවභාවිතය වාගේ දේවල් හැම තිස්සේම සිදු වෙනවා, ඒවා හරි ගස්සන්නට පුළුවන්. නමුත් හිතලා බලන්න අපේ රටේ ගුවන් යානාවක්, -ගුවන් සේවාව - ගුවන් සමාගමේ සභාපතිතුමාගේ පෞද්ගලික ගමනකට යොදා ගන්නවා. ගරු කථානායකතුමනි, එතකොට හිතලා බලන්න පුළුවන් මේ රටට කොපමණ වැරදි වෙලා තිබෙනවාද කියලා. ඒ විතරක් නොවෙයි, මේවා මුදල්වලින් ගණනය කරන්නට බැහැ. ඒ ගුවන් ගමන නිසා සිදු වූ පාඩුව මුදලින් පමණක් ගණනය කරන්නට බැහැ, මේ තුළින් සිදු වුණේ මූල්‍යමය අලාභයක් විතරක් නොවෙයි. ගුවන් සමාගමේ කීර්ති නාමයට වන හානිය ගැනත් හිතන්නට ඕනෑ. එවැනි දෙයක් වුණාම ඉන් පසුව කවුරුන් හෝ ටිකට් පතක් අරගෙන ඔය ගුවන් යානයේ යනවාද? යන්නේ නැහැ. මොකද, ටිකට් පත ගත්තේ ක්වාලාලම්පූර් ඉඳලා කොළඹ එන්න. නමුත්, ගුවන් යානය යන්නේ වෙන ගමනක්. එතකොට ටිකට් පතක් ගනීද? මෙවැනි දේවලින් සමාගමේ කීර්තිනාමයට වන හානිය ගණනය කරන්නට බැහැ. එපමණ විශාල පාඩුවක් සිදු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ වාර්තාවේ "නිර්දේශිත නෛතික ක්‍රියා මාර්ග" යටතේ කෙළින්ම කියලා තිබෙනවා, "....වග කිව යුතු පුද්ගලයන්ට විරුද්ධව අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් ගනු ලබන නිර්දේශ..." කියලා. මේ ගැනත් අපි සොයලා බලන්නට ඕනෑ.

මෙම වාර්තාවේ රාජ්‍ය මුදල්, සම්පත්, වරප්‍රසාද අයුතු ලෙස අවභාවිතය කිරීම පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඒ සම්බන්ධයෙන් එක කාරණයක් උපුටා ගෙන කියවන්නට කැමැතියි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් ආදියත් විශාල ලෙස අවභාවිත කර තිබෙනවා. මම උපුටා ගත් කොටසේ අන්තිමට කියලා තිබෙනවා, මේවා පාවිච්චි කළාට පසුව මේවාට ගෙවන්නට ඕනෑ කියලා.

> "නව ද, පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ හා ලුතිනන් යෝෂිත රාජපක්ෂ විසින් ලබාගෙන ඇති ගුවන් ගමන්වලට අදාළ මුදල යුද හමුදාවට අනුයුක්ත සෙබල අංක එස්/553862 ඩබ්.ජේ.ආර්. ඥානසිරි වන කෝප්‍රල් නිලයෙන් යුත් නිලධාරියෙක් රුපියල් ලක්ෂ 260කට අධික මුදලක් ජනාධිපති කාර්යාලය නමින් ගෙවීමක් සිදු කර ඇති බව."

ගරු කථානායකතුමනි, මම මොහොතකටවත් විශ්වාස කරන්නේ නැහැ, කොමිෂන් සභා වාර්තාවේ මන්ත්‍රීවරයෙකුගේ හෝ ඇමතිවරයෙකුගේ නම තිබෙනවා කියලා ඒ පුද්ගලයා වරදකාරයෙක් කියලා. මේක අධිකරණ ක්‍රියා මාර්ගයක් නොවෙයි. මම ඒක විශ්වාස කරන්නේත් නැහැ. ඒ වාගේම මම ඒක ප්‍රසිද්ධියේ සඳහන් කරන්නත් ඕනෑ. මොකද, එතුමා ඒ ගුවන් යානාවේ ඉඳගෙන සිටියාට එතුමා දන්නේ නැහැනේ වෙන කවුරු හෝ තීරණයක් අරගෙන වැරදි දෙයක් කරනවා කියලා. මේක ඒ වාගේ සිදුවීමක්. ඇමති කෙනෙක් වුණත්, ඒ ඇමතිවරයා යටතේ වැඩ කරන සභාපතිවරු ඉන්නවා නේ. ඒ අය වැරදි තීරණ ගන්නවා. ඇමතිවරයා ඒ හැම එකම දන්නේ නැහැ. අපි මේවා දිහා සාධාරණ ලෙස බලන්න ඕනෑ. ගරු කථානායකතුමනි, නමුත් මම මෙතැනදී මතු කරන්නේ වෙනත් ප්‍රශ්නයක්. මේ වාර්තාවේ කියනවා, මුදල් ගෙවන්න කියලා කිව්වාම, ඒ කෝප්‍රල්වරයා ඇවිල්ලා රුපියල් ලක්ෂ 260කට අධික මුදලක් ජනාධිපති කාර්යාලය නමින් ගෙවීමක් සිදු කළා කියලා. මේක මම කියන දෙයක් නොවෙයි. මම කියන්නේ මේ වාර්තාවේ තිබෙන දේවල්. පරීක්ෂණයක් පවත්වන්න කියලා තමයි මේකෙන් කියන්නේ. පරීක්ෂණයක් පවත්වලා එම නිලධාරියාට මෙම මුදල් කෙසේ ලැබුණේද යන්න පිළිබඳව වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කළ යුතු බවද මෙම කොමිෂන් සභාවේ මතය විධියට සඳහන් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ මේ විධියට විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න පුළුවන් නම්, ඇත්තටම ඒ මුදල් ප්‍රමාණය ගෙවිවේ කොහොමද කියන එක තමයි මේ අහන්නේ. ගරු කථානායකතුමනි, කෝප්‍රල්වරයාට මාසයකට රුපියල් ලක්ෂයක මුදලක් ලැබුණත්, අවුරුද්දකට ලැබෙන්නේ රුපියල් ලක්ෂ 12යි. එතකොට ඔහු අවුරුදු 30ක් වැඩ කළත් රුපියල් මිලියන 30ක්, 40ක් වාගේ මුදලක් තමයි ලැබෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නවලට පිළිතුරු තිබෙන්නට ඕනෑ. මේ පිළිතුරු ගැන අපි සොයා බලන්න ඕනෑ. කොහොමද මේවා සිදුවෙලා තිබෙන්නේ කියලා සොයා බලන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, තව හුඟක් දේවල් තිබෙනවා. ඉඩම් පිළිබඳව හුඟක් ප්‍රශ්න තිබෙනවා. රජයේ ඉඩම් තිබෙනවා. ඒ කියන්නේ මේ රටේ වටිනාම සම්පත. මේ රටේ ජීවත් වන පුරවැසියන්ගෙන් සියයට 80කට ඉඩමක අයිතිය නැහැ. නමුත්, රජයේ ඉඩම් අවභාවිතය සිදු වෙනවා. ගරු කථානායකතුමනි,

සමහර විට අපේ නමින්, එහෙම නැත්නම් වෙනත් නම්වලින් අපි යෝජනා කරන පදනම් රාශියක්ම මේ පාර්ලිමේන්තුවට එනවා. මේක අද-ඊයේ එන එකක් නොවෙයි, වසර ගණනාවක් තිස්සේම සිදුවන දෙයක් ගරු කථානායකතුමනි. ඒකේ වරදක් නැහැ. නමුත්, ඒ සමහර පදනම් විසින් රජයේ ඉඩම් අරගෙන තිබෙනවා. රජයේ ඉඩම් අරගෙන තිබෙන බව මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. රජයේ ඉඩම් අරගෙන ඒවා පදනම්වලට හරවාගෙන තිබෙනවා. මම ඒවා ඔක්කෝම ගැන සඳහන් කරන්න යන්නේ නැහැ. ඒ වාගේම සමහර ඉඩම් අවතක්සේරු කරලා -අඩු වටිනාකමක් පෙන්වලා- අරගෙන තිබෙනවා. එයිනුත් රජයට අවාසියක් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේ විශාල හොර බොරු, වංචා පිළිබඳ තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි අද කථා කරන්නේ දූෂණය ගැනයි. දූෂණය ගැන කථා කරන කොට මූල්‍ය දූෂණය ගැන කථා කරන්න වෙනවා. මම දැක්කා පත්තරේක තිබෙනවා, මේ අත් අඩංගුවට ගැනීම රහපෑමක් කියලා. ගරු කථානායකතුමනි, ඉතිහාසය ගැන බලන කොට එහෙම අවිශ්වාසයක් තියන්න පුළුවන්. නමුත්, මේ අත් අඩංගුවට ගැනීම රහපෑමක් නොවෙයි. මේ කටයුතු සිදුවීගෙන යනවා. තව කෙනෙක් සඳහන් කර තිබෙනවා, උදයංග වීරතුංග ඩුබායිවලදී අත් අඩංගුවට ගත්ත එකත් රහපෑමක් කියලා. ගරු කථානායකතුමනි, මේක විහිළුවක්. ඩුබායි ජාත්‍යන්තර ගුවන් තොටුපළ වාගේ ලෝකයේ විශාලම ගුවන් තොටුපළක් හරහා ගමන් කරන කෙනෙකුගේ ගමන නතර කරන්න අපේ රජයට බලයක් තිබෙනවාද? එහෙම නොවෙයි ගරු කථානායකතුමනි, ගුවන් යානයකට නඟින්න යනකොට ජාත්‍යන්තර පොලීසියෙන් - INTERPOL එකෙන් - නතර කරලා ප්‍රශ්න කරලා තිබෙන්නේ ඒ අයට තිබෙන වාර්තා අනුවයි.

ගරු කථානායකතුමනි, මූල්‍ය දූෂණ තිබෙනවා. නමුත්, මිනී මැරුම් තමයි මූල්‍ය දූෂණයට වඩා බරපතළ වන්නේ ගරු කථානායකතුමනි. පසුගිය වසර 10 තුළදී මිනී මැරුම් සිදු වුණා, අතුරුදහන්වීම් සිදු වුණා. මට අද වගේ මතකයි, එදා ලසන්ත වික්‍රමතුංගයන් කිව්වා, මිග් යානා මිලදී ගැනීමේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් පෞද්ගලික සමාගමකට යාමෙන් දූෂණයක් සිදු වුණාය කියලා. එතුමා ඒ කාරණය සඳහන් කළ නිසා හිටපු ආරක්ෂ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා නඩුවක් දැම්මා. එතකොට ලසන්ත වික්‍රමතුංගයන් මොනවාද කළේ? එතුමා කිව්වා, "හරි, මම අධිකරණයට ගිහිල්ලා මේ විස්තර ඔක්කෝම දෙන්නම්, අධිකරණයෙන් සොයා බලන්න" කියලා සඳහන් කළා. නමුත් ගරු කථානායකතුමනි, ඒ දවස දකින්නට ලසන්ත වික්‍රමතුංගයන්ට අවස්ථාවක් තිබුණේ නැහැ. ඊට දවස් දෙකකට, තුනකට ප්‍රථමයෙන් රත්මලානේදී ලසන්ත වික්‍රමතුංගයන්ව අමු-අමුවේ ඝාතනය කළා. මේවා විහිළු දේවල් නොවෙයි. මේවා මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්න. මේවා සාමාන්‍ය මිනිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න. [බාධා කිරීම්] මැති ඇමතිවරුනි, මේවා අහගෙන ඉන්න. මැති ඇමතිවරුනි, මේවා අහගෙන ඉන්න. අපි පිළිගන්න කැමැතියි, ඉතිහාසය කියන්නේ ඉතිහාසය කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද, point of Order එක? ස්ථාවර නියෝග 78 යටතේ එතුමාට කථා කරන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යවරයා මීට පෙර මේ සභාවේදී පවසා තිබෙනවා, ලසන්ත වික්‍රමතුංග ඝාතනය සරත් ෆොන්සේකාගේ හමුදා කණ්ඩායමේ වැඩක් කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමාට අවස්ථාව දෙන්න. එතුමාගේ කථාවට ඉඩ දෙන්න. එතුමා ස්ථාවර නියෝග 78 යටතේයි කථා කරන්නේ. Let him continue.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මා කලින් කිව්වා වාගේ, මේ විවාදය ඉල්ලපු නිසා අවසානාවට ඉතිහාසය මතක් කරන්න සිදුවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි අලුත් පිටුවක් හරවන්න අවශ්‍යයි. මෙය අපේ ඉතිහාසයේ පමණක් කළ යුතුයි. කවුරු මොනවා කිව්වත් අපේ රජය වෙනසක් කරලා තිබෙනවා. දූෂණය පිළිබඳව අපට චෝදනා තිබුණත්, අපේ රජය සර්ව සම්පූර්ණ රජයක් නොවෙයි කියන එක අපි පිළිගන්නවා. නමුත්, මිනී මැරුම් සම්බන්ධයෙන් අපේ රජයට විරුද්ධව කිසිම චෝදනාවක් නැහැ. ගරු කථානායකතුමනි, මේ මිනී මැරුම් ගැනත් සොයා ගෙන යනවා. මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වීගෙන, ක්‍රියාත්මක වීගෙන ඉදිරියට ගියොත් තමයි, මේ රටේ මන්ත්‍රීවරුන්ට, කැබිනට් ඇමතිවරුන්ට පළමුවන වතාවට හිරගෙවල්වලට යන්න වෙන්නේ; උසස් නිලධාරීන්ට හිරගෙවල්වලට යන්න වෙන්නේ. මේ ක්‍රමවේදය ඉදිරියට ගියොත් සමහර අයට මරණ දණ්ඩනය ලැබෙයි. මා ආඩම්බරයෙන් කියනවා, අද මේ රටේ ස්වාධීන අධිකරණයක් තිබෙනවාය කියලා. ඒ නිසා තමයි, ජනාධිපතිතුමා අහපු ප්‍රශ්නයට වුණත් ඒ අයට ඒකමතිකව තීරණයක් දෙන්න පුළුවන් වුණේ. ගරු මන්ත්‍රීවරුනි, අපි විපක්ෂයේ සිටියත්, ආණ්ඩු පක්ෂයේ සිටියත්, ඇත්තටම අපට සතුටු වන්න පුළුවන් හේතුවක් තමයි ඒක. මේ රටේ වෙනසක් වීගෙන යනවා. ඒ වෙනස අපි ආරක්ෂා කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මේ කරුණු කියන්න සිදු වුණේ මේ අවස්ථාවේදී මූල්‍ය වංචාවන් ගැන කථා කරන නිසායි, ගරු කථානායකතුමනි. අද කථා කරනකොට කිව්වා, මේ ආර්ථිකයේ විශාල ගැටුමක්, ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. අවුරුදු 50කට පස්සේ අපේ අය වැය තුළ පළමුවන වතාවට ධනාත්මක අතිරික්තයක් තිබෙනවාය, ප්‍රාථමික අතිරික්තයක් තිබෙනවාය කියලා සඳහන් කරන්නට ඕනෑ. කවදාවත් අතිරික්තයක් තිබිලා නැහැ. පළමුවන වතාවට ඇති වී තිබෙන මේ විශාල අතිරික්තයෙන් පෙනෙන්නේ Balance Sheet එක ශක්තිමත් කියන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! I wish to announce that this House cordially welcomes the Russian Delegation led by Mr. A.M. Chernеckiy, Member of the Organizing Committee of the Eketerinburg World Expo 2025, now present at the Speaker's Gallery. We welcome all of you. Thank you.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, අවුරුදු 15කට ප්‍රථමයෙන් අපේ රටේ තිබුණු අපනයනය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 34යි. අපි රජය භාර ගන්නකොට එය සියයට 12ක්, සියයට 13ක් දක්වා පහළට බැහැලායි තිබුණේ. ගරු කථානායකතුමනි, 2015, 2016 අපි භාර ගත් ඉතා අසතුටුදායක ආර්ථිකය, ක්‍රම-ක්‍රමයෙන් තමයි එදා මුදල් ඇමතිතුමාට හරවා ගන්න සිදු වුණේ. එයට ඉඩකඩක් තිබුණේ නැහැ, විශාල ණය කන්දරාවක් තිබුණු නිසා. නමුත්, 2017දී හැරවුම් ලක්ෂණ තිබෙනවා. අපනයනය සියයට 10කින් වැඩි වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි. යුරෝපයේ මත්ස්‍ය තහනම ඉවත් කිරීම නිසා එක අවුරුද්දක් තුළ මත්ස්‍ය අපනයනය පමණක් සියයට 38යි දශම ගණනකින් ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම GSP Plus සහනය දිනා බැලුවොත්, එහි ලාභයත් 2018දී, 2019දී, 2020දී අපට ලබා ගන්න පුළුවන්, ගරු කථානායකතුමනි. සෘජු විදේශීය ආයෝජනය -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! What is the point of Order? Do not disturb his speech.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා ආර්ථික වර්ධනය ගැන කිව්වා. මේ කාර්තුවේ ආර්ථික වර්ධනයේ ප්‍රමාණය කොපමණද? සියයට 3.3යි. ඉලක්කය සියයට 4.5ක් වශයෙනුයි තිබුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය පිළිබඳව ඔබතුමාගේ කථාවේදී කියන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමා ඒ කාරණය පෙන්වලා දුන්නාට ස්තුතියි. හිතුවාට වැඩිය ආර්ථික වර්ධනය අඩුවෙලා තිබෙනවා. ඒකට හුඟක් හේතු බලපා තිබෙනවා. එක හේතුවක් තමයි, 2017 අවුරුද්දේ ඇති වූ කාලගුණ විපර්යාසය. මේ රටේ දිස්ත්‍රික්ක 25න්, දිස්ත්‍රික්ක 20කට වතුර තිබිලා නැහැ. එම දිස්ත්‍රික්කවල නියඟයක් තිබිලා තිබෙනවා. ඒ වාගේම ජල ගැලීම් තිබිලා තිබෙනවා. ඊට නොයෙකුත් හේතු බලපා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, 2016 අවුරුද්දේ කෝටි 80ක් වූ සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය, 2017 අවුරුද්දත් එක්ක සසඳා බැලුවොත් එය කෝටි 160 දක්වා වැඩිවෙලා තිබෙනවා. අවුරුද්දක් තුළදී සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය දෙගුණයක් වෙලා තිබෙනවා. 2018, 2019 සහ 2020දී සෘජු විදේශීය ආයෝජනය තවත් ඉහළ යනවා කියලා සඳහන් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම ඒ කිව්වේ ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසය වනතුරු දත්ත පිළිබඳවයි.

ගරු කථානායකතුමනි, ගිය සතියේ ජනශක්ති රක්ෂණ සමාගමේ එක ආයෝජනයකින් ඩොලර් මිලියන 100ක් රටට ලබා ගන්න පුළුවන් වුණා. මූල්‍ය පාලනයක් අද තිබෙනවා. අලුත් ආදායම් බදු පනතක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක අද යම්කිසි මූල්‍ය පදනමකට අනුවයි ක්‍රියාත්මක වෙන්නේ. නීතිමය පදනමකට අනුවයි අද මෙය ක්‍රියාත්මක වෙන්නේ. පිට රටින් ණය අරගෙන සංවර්ධනය පෙන්වන්න පුළුවන්. නමුත්, අපි ඒක ප්‍රමුඛ කරන්නේ නැහැ. අපි ප්‍රමුඛ කරන්නේ ප්‍රාග්ධනය වර්ධනය කිරීමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා.

පියා රියදුරෙක් නම් ඔහු වාහනය පැදවූවේ මඩ පාරේ. ඊට පස්සේ අපට කියනවා, "මේ මඩ පාර සංවර්ධනය කරන්න ඕනෑ. පාරට කොන්ක්‍රීට් ටිකක් දාලා දෙන්න." කියලා. අපි -දේශපාලනඥයන්- ගිහිල්ලා ඒ පාරට කොන්ක්‍රීට් ටිකක් දමනවා. අවුරුදු 15කට පස්සේ පුතාත් රියදුරෙක් වනවා. පුතාත් වාහනයක් පදවනවා. පුතා වාහනය පදවන්නේත් කොන්ක්‍රීට් පාරේ, ගරු කථානායකතුමනි. පියා වාහනය පදවාගෙන ගියේ මඩ පාරේ. පසුගිය රජය "සංවර්ධනය" කියලා කිව්වේ ඒකටයි, ගරු කථානායකතුමනි. නමුත්, අපි "සංවර්ධනය" කියන්නේ ඒකට නොවෙයි. පියා කළේ ගෞරවනීය රැකියාවක්. මොකද, වෙන විකල්පයක් තිබුණේ නැහැ. නමුත්, පාරට කොන්ක්‍රීට් දාලා පුතාව රියදුරෙක් කරන්න අපි ලෑස්ති නැහැ. අපිට ඊට වැඩිය ආර්ථික දර්ශනයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

මානව සම්පත ගොඩ නැඟීම තමයි අපේ ආර්ථික දර්ශනය. අපි රට බාර ගන්නකොට අධ්‍යාපනය කප්පාදු කරලා තමයි තිබුණේ. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.9 වියදම් කළේ. දැන් අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 2.37ක් මංගල සමරවීර ඇමතිතුමා වෙන් කරලා තිබෙනවා. හැම දාම අපි ඇවිල්ලා කථා කරන්නේ විශ්වවිද්‍යාලයට යන ශිෂ්‍යයා ගැනයි. සිසුන් 350,000ක් උසස් පෙළ හදාරනවා. 125,000ක් විශ්වවිද්‍යාලවලට යන්න වරම් ලබනවා. ගරු කථානායකතුමනි, නමුත් අපි විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නේ 30,000ක් වාගේ ප්‍රමාණයක්. අනික් 100,000 ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. අග්‍රාමාත්‍යතුමා කිව්වා, "විශ්වවිද්‍යාලයට යන දරුවාට විතරක් නොවෙයි, හැම දරුවෙකුටම අවුරුදු 13ක අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ"ය කියලා. ඒ නිසා අපි Ceylon-German Technical Training Institute එක වාගේ ආයතන 10ක් පටන් ගන්නවා. එම නිසා තමයි මුදල් ඇමතිතුමා අවුරුදු 13ක අධ්‍යාපනයක් ලබා දෙන්න මුදල් වෙන් කරලා තිබෙන්නේ, ගරු

කථානායකතුමනි. අපි මානව සම්පත ගොඩ නහන්නේ එහෙමයි. මේ රටේ සිටින අවුරුදු 5 - 19 අතර හැම ශිෂ්‍යයෙකුටම රක්ෂණයක් අපි ලබා දීලා තිබෙනවා. මානව සම්පතට මුල් තැන දෙන රජයක් තමයි අපේ රජය. අපි අනික් අයගේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව නොවෙයි කටයුතු කරන්නේ. අපේ රජයට සංවර්ධන න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ න්‍යාය පත්‍රයේ අපි ගමන් කරනවා. අපි දූෂණය නැති රටක් හදමු. අපි එකතුවෙලා මේ කටයුත්ත කරමු. වැරැදි කරපු අයට දඬුවම් දෙමු. එතකොට අපටත් ප්‍රවේශම් වෙන්න සිදු වනවා. ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

ඊට ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 12.10]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයේදී අදහස් දක්වන්න ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වනවා. මොකද, මේ පැමිණිල්ල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ප්‍රථමයෙන්ම ඉදිරිපත් කරලා, මේ පිළිබඳව යම් මතයක් රට තුළ ගොඩ නහන්න අපට හැකියාව ලැබුණා. මාර්තු මාසයේ මුලදී අපිට මේ තත්ත්වය පිළිබඳව වාර්තා වුණා. ඒ වාගේම මහ බැංකුවේ නිලධාරීන් කීප දෙනෙකු පෞද්ගලිකවම මාව හමු වෙලා, අවශ්‍ය තොරතුරු ලබා දෙමින් මේ කාරණය මගේ අවධානයට යොමු කළා. මා විශේෂයෙන්ම එතුමන්ලා සියලු දෙනාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වන්න ඕනෑ.

ඉන් අනතුරුව මමත්, ජගත් පුෂ්පකුමාර හිටපු ඇමතිතුමාත්, එරික් වීරවර්ධන මැතිතුමාත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට මේ පැමිණිල්ල අරගෙන ගියා. මේ පැමිණිල්ල අරගෙන යන්න තව කට්ටියට කථා කළාම, මේ අලුතම පත් වෙච්ච ආණ්ඩුවට විරුද්ධව පැමිණිල්ලක් දැමීමට එන්න සමහර මන්ත්‍රීවරුන්ට පොඩි මැළිකමක් තිබුණා. නමුත්, එවන් අවස්ථාවක අපි මේ සම්පූර්ණ අවදානම අරගෙන ඒ පැමිණිල්ල ඉදිරිපත් කළා. එතැනින් පස්සේ තමයි රටේ ජනමතයක් ගොඩ නැඟුණේ, මෙහි වංචාවක්, දූෂණයක් සිදු වුණා කියලා. ඒ දිනය වන තෙක් කිසිම කෙනෙකුගෙන්, කිසිම ජනමාධ්‍යයක හෝ පාර්ලිමේන්තුවේ හෝ කිසිම තැනක මේ සම්බන්ධයෙන් කිසිම අදහසක් ප්‍රකාශ වුණේ නැහැයි කියන එක මම ඉතාමත් වග කීමෙන් කියන්න කැමැතියි.

මේ සම්බන්ධව පළමුවැනි වතාවට ජනමාධ්‍යය වාර්තා කළේ, අපි පැමිණිල්ල ගෙන ගිය දවසේ රාත්‍රියේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එතැනින් නිකම් ඉන්නේ නැතුව ඊට පසුව එවකට විපක්ෂ නායකවරයා විධියට හිටපු නිමල් සිරිපාල මැතිතුමා සමඟ එකතු වෙලා අපේ කණ්ඩායම ගිහිල්ලා මහ බැංකුව ඉදිරිපිට විරෝධතා පවත්වමින් ජනතාව දැනුවත් කළා. ඒ එක්කම පාර්ලිමේන්තුවේදී ජනතා විමුක්ති පෙරමුණ මේ පිළිබඳව ප්‍රශ්න ඇහුවා; ඒ වාගේම විවිධ මණ්ඩපවල මේ පිළිබඳව කථා කරන්න ගත්තා; ජනමාධ්‍ය තුළ කථා කරන්න ගත්තා. ඒ වාගේම පසුගිය කාලය තුළ දිගින් දිගටම මටත් චෝදනා එල්ල කළා, "කෝ, පැමිණිල්ලක් කළා. දැන් ආණ්ඩුවට ඇවිල්ලා ඇමතිකම් ගත්තාම කට වැහෙයි. මේ පිළිබඳව ඉදිරියට කටයුතු සිදු වෙන්නේ නැහැ. ආණ්ඩුවේ ඉන්න නිසා ඔතැනින් ඕක යටපත් වෙනවා" කියලා. නමුත්, ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ ප්‍රශ්නය දිගටම ගෙන යන්න අපට හැකියාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන් අනතුරුව මහ බැංකු අධිපතිවරයා ඉවත් කිරීමේ වැඩ පිළිවෙළ සිදු වුණා. ජනාධිපතිතුමා ඔහු නැවත පත් කිරීමෙන් වැළකුණා. ඉන් පසුව COPE වාර්තාව මේ සභාවට ඉදිරිපත් කළා. COPE එක සොයා ගත්තා, මෙතැන මූල්‍ය වංචාවක් සිදු වුණා කියලා. අපි ලබා දුන්නු තොරතුරු එයින් තවත් තහවුරු කළා. කවුරු හෝ කියන්න යනවා නම් මෙතැන හොරකමක් සිදු වුණේ නැහැ කියලා ඒක සම්පූර්ණ අසත්‍යයක්.

මහ බැංකු බැඳුම්කර සිද්ධිය, මේ රටේ ඉතිහාසයේ සිදුවුණු ලොකුම හොරකම කිව්වොත් ඒක නිවැරැදියි. වෙන හොරකම්වල එකතුව ගණන් හදන්න පුළුවන්. නමුත් එක් වතාවකදී, කෙටි කාලයක් ඇතුළත, සිදු වුණු ලොකුම හොරකම තමයි මහ බැංකු වංචාව. මේක ගණන් හදන්න බැහැ. ගණන් විධියට එක එක සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් මූල්‍යමය වශයෙන් ඒ ගණන් පෙන්වුවත් ඊට වැඩිය බරපතළ හානියක් රට තුළ ඇති වෙලා තිබෙන බව අපි හොඳටම දන්නවා. මූල්‍ය වෙළෙඳ පොළේ අස්ථාවරභාවය, ජාත්‍යන්තරයේ විශ්වාසය, ඒ එක්කම පොලී අනුපාත වැඩි වීම ආදිය මේ මහ බැංකු බැඳුම්කර සිද්ධියත් සමඟ විශාල බලපෑමට ලක් වුණා කියන එක අපි පැහැදිලිව කියනවා.

මම එක පැත්තකින් ආඩම්බර වෙනවා, මෙතෙක් තිබුණු සම්ප්‍රදායයන් වෙනස් කරලා අපි කටයුතු කරපු එක ගැන. COPE වාර්තාව ඉදිරිපත් වුණාම ජනාධිපතිතුමා විශේෂ කොමිසමක් පත් කළා, මේ පිළිබඳව සොයා බලන්න. ඒකට හේතුව වුණේ මෙයයි. ප්‍රථමයෙන් නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. ඒ කමිටුව වාර්තාවක් ලබා දුන්නා, ජනාධිපති කොමිසමක් පත් කරලා මේ පිළිබඳව පුළුල්ව විමර්ශනය කරන්න ඕනෑය කියලා. ඒ අනුව පුළුල් විමර්ශනයක් වෙන කොට COPE එකේ හෙළි නොවුණු තොරතුරු විශාල ප්‍රමාණයක් හෙළිදරව් වෙන්න පටන් ගත්තා. මෙතෙක් ඉතිහාසයේ කිසිම ආකාරයක නැති තරම් තොරතුරු ප්‍රමාණයක් මේ කොමිසම විසින් ඉතාම ගවේෂණාත්මකව, පර්යේෂණාත්මකව විමර්ශනය කළා. ඒ පිළිබඳව කොමිසමේ සාමාජිකයන්ටත්, ඒ සඳහා සහාය දැක්වූ සියලුමදෙනාටත් අපේ ප්‍රශංසාව හිමි වෙන්න ඕනෑ.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පළමුවැනි මූල්‍ය වංචාවත් නොවෙයි. මේ වාර්තාවේම සඳහන් වෙනවා, 2008 ඉඳලා මේක සිද්ධ වුණා කියලා. අපි කියන්නේ මේ කාලයේද, ඒ කාලයේද කියන එක ප්‍රශ්නයක් නැහැ; කොයි කාලයේ හෝ වෙලා තිබෙනවා නම් හොරකමට, වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කිරීමේ වගකීම අපි සියලුදෙනාටම තිබෙන බවයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගම්මන්පිල මහත්තයා, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා සඳහන් කළා, 2008 සිට මේ වංචාව මේ විධියටම සිදු වෙලා තිබෙනවා කියලා වාර්තාවේ සඳහන් වෙනවා කියලා. ගරු ඇමතිතුමනි, කරුණාකර සඳහන් කරන්න පුළුවන්ද, එසේ සඳහන් කරලා තිබෙන පිටු අංකය මොකක්ද කියලා?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
එතුමාට උත්තර දෙන්න මට වෙනම වෙලාවක් ඔබතුමාගෙන් හම්බ වෙන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ පිළිබඳව වෙනම විවාදයක් කරමු. [බාධා කිරීමක්] බැඳුම්කර සිද්ධියට අදාළ ජනාධිපති විමර්ශන කමිටුව පත් කළ වෙලාවේ එතුමා පුවත් පතකට කියාපු දෙයක් මා කියන්නම්. "බැඳුම්කර සිද්ධියේ ජනපති කොමිසමට මම විරුද්ධයි". කවුද මේ කියන්නේ? මන්ත්‍රී උදය ගම්මන්පිල. මේ තියෙන්නේ; තවත් බොහෝ අය පත්තරවලට කියාපු ඒවා තිබෙනවා. අවස්ථා ගණනාවකදී මේ වාගේ ඒවා කිව්වා. ඊළඟට, මේ වාර්තාව ඉදිරිපත් කළාමත් එතුමා පුවත් පතකට කිව්වා, "මේ වාර්තාව සියවසේ ලොකුම විහිළුවයි" කියලා. ගම්මන්පිල මැතිතුමා දිගින් දිගටම මේ ගැන හැල්ලු කරමින් කථා කළා. දැනුත් මේ සිද්ධියට අදාළව යම් යම් අය අත් අඩංගුවට ගැනීම පිළිබඳව පවා එතුමා ඉතාමත් සැහැල්ලුවෙන් කථා කරනවා. මට පෙනෙන්නේ නැහැ, එතුමා මොන කඳවුරේද ඉන්නේ කියලා. මට ඒ ගැන පැහැදිලි කර ගන්න ඕනෑ. එතුමා ඉන්නේ යූඑන්පී විරෝධී කඳවුරේද, එහෙම නැත්නම් යූඑන්පී එකත් එක්ක එකතු වෙලා කථාන්දර හදනවාද කියන එක පිළිබඳව මට ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීම්] කොහොම වුණත්, එතුමා ගන්නේ නැහැයි කියන එක පිළිබඳව මම සතුටු වෙනවා. [බාධා කිරීම්] මගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. මේ මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධව මේ රටේ ජනතාව තුළත්, රට තුළත් ඇති වුණු මතය පිළිබඳව අපි ආඩම්බර වෙනවා.

ඒ විතරක් නොවෙයි. ජනමාධ්‍යය මේ පිළිබඳව කථා කළා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. අද මේ සිද්ධිය පිළිබඳව වාගේම තවත් සිද්ධීන් ගණනාවක් හෙළිදරවු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2008 සිට බැඳුම්කර සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුයි කියලා වාර්තාවේ සඳහන් වෙනවා. එතුමාට ඒක හොඳට කියවා ගන්න කියන්න. මේ බැඳුම්කර වෙන්දේසිය ආරම්භ වෙලා තිබෙන්නේ 2008 ඉඳලයි. නමුත්, අද දඩුවම් නියම වෙන්නේ, මේ කණ්ඩායම විමර්ශනය කරලා තිබෙන්නේ, 2015 සිදුවීම, එහෙම නැත්නම් මෑත භාගයේ සිදුවීම සම්බන්ධයෙන්ය කියන එක අපි පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා COPE කමිටුවේ සාමාජිකයකු විධියට අවුරුදු ගණනාවක් හිටියා. COPE කමිටුව විවිධ වංචා, දූෂණ හොයා දුන්නා. විජයදාස රාජපක්ෂ මැතිතුමා, ඩිව් ගුණසේකර මැතිතුමා COPE වාර්තා ඉදිරිපත් කළා. ඊට පෙර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේ COPE වාර්තා ගණනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අප සිටි COPE කමිටුවෙන් එක වතාවක් වාර්තාවක් ඉදිරිපත් කළා, රුපියල් මිලියන තිස්දහසක වංචා, දූෂණ සිදු වුණා කියලා. හැබැයි, අද වන තුරු මේ COPE කමිටු වාර්තා කොහේද තිබෙන්නේ කියලා අපි දන්නේ නැහැ. ඒවාට ගත්ත තීන්දුවක් අපි අද වන තුරු දැක නැහැ. ඉතිහාසයේ පළමු වතාවට, COPE වාර්තාවක් හමස් පෙට්ටියට යන්න දෙන්නේ නැතිව, එහි දුවිලි බැඳෙන්න දෙන්නේ නැතිව ජනාධිපතිතුමා ජනාධිපති කොමිසමක් පත් කරලා මේ පිළිබඳව හෙළිදරවු කිරීමක් කළා.

ජනාධිපති කොමිෂන් වාර්තා ගැනත් කථා කළා. මේ රටේ ඉතිහාසයේ ජනාධිපති කොමිෂන් කීයක් පත් කළාද කියලා ඔබතුමන්ලා සොයා බලන්න. අනන්තවත් පත් කළා. ප්‍රශ්නයක් මතු වන කොට, ජනතාව ඒ ගැන කථා කරනකොට, ජනමාධ්‍යය කථා කරන්න ගත්තාම කරන්නේ ජනාධිපති කොමිසමක් පත් කරන එකයි. පසුගිය කාලය පුරාවටම සිද්ධ වුණේ ඒකයි. කොමිසමක් පත් කරනවා. හැබැයි, කොමිෂන් සභා වාර්තාවට වෙච්ච දෙයක් නැහැ. ඒ පිළිබඳව ගත්තු තීන්දුවකුත් නැහැ. නමුත්, ඉතිහාසයේ පළමු වතාවට අද ජනාධිපති කොමිසමක වාර්තාවක් ක්‍රියාත්මක වෙලා විතරක් නොවෙයි, ඒ පිළිබඳව තීන්දු ගන්න මට්ටමටත් ඇවිල්ලා තිබෙනවා. ඒවායේ නම් සඳහන් වන කොට අමාත්‍යවරු අයින් වන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ වාර්තාව පිළිබඳව ක්‍රියාත්මක වීම අද ආරම්භ වෙලා තිබෙනවා; නීතිපති දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවා තිබෙනවා. ඒවා පිළිබඳව කිසිම ප්‍රමාදයක් ඇති නොවී කටයුතු කරන්න සූදානමින් ඉන්න බව මම ඉතාම පැහැදිලිව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීන යුද සටන් න්‍යායවාර්යවරයකු වන සුන් බින්තුමාගේ "සොරුන් ඇල්ලීමට පෙර දොර වසා දමන්න" කියන සංකල්පය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හරියටම කරනවායි කියන එක මට භය නැතිව කියන්න පුළුවන්. එතුමා වංචා, දූෂණවලට එරෙහිව ගෙන යන ක්‍රියා මාර්ගවල කිසිම අඩුවක් නොවෙන්න ඒ වගකීම භාර ගෙන, ඒක ඒ පැත්තේද, මේ පැත්තේද, මොන පැත්තේද කියන එක අදාළ කර ගන්නේ නැතිව, සියලුදෙනාටම දඩුවම් ලබා දෙන්න ගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධව රට තුළ ප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා. අද සමහරු කියනවා, මේක ටෙලි නාට්‍යයක් කියලා; මේක රංගනයක් කියලා. මේ තරම් හැල්ලු කරලා මේ වාගේ දේවල් කථා කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා. මේක ඡන්දයක් ඉලක්ක කරලා කරන දෙයක් නොවෙයි. මේ විධියට බැලුවොත්, ඡන්දය තියන නිසා තවත් කවුරු හෝ ගන්න හිටියත් ගන්න බැහැ. එහෙම නම් මේ කියන විධියට, ඡන්දයෙන් පස්සේ ගන්න ඒවා නවත්වන්න ඕනෑ. ඒ නිසා මේ වාගේ හැම එකම හැල්ලුවෙන් කථා කරන්නේ නැතිව කරන හොඳ වැඩේ අගය කරන්න. වැරැද්ද පෙන්වන්න. වැරැද්ද භාර ගන්න මේ ජනාධිපතිතුමාත්, අපිත් හැම වෙලාවේම සූදානම්. හැම වෙලාවේම අපහාසාත්මකව කථා කරලා මෙය හැල්ලු කිරීමේ ක්‍රමවේදයෙන් බැහැර වෙන්න කියලා, මේ පිළිබඳව කථා කරන සියලුම දෙනාට මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමහම තව වාර්තාවක් එළිදැක්වුවා. ඒ වාර්තාව සම්බන්ධවත් කියනවා මම දැක්කා, බැඳුම්කර වාර්තාව යටපත් කරන්න අවුරුදු දෙකහමාරක් පහුවුණු වාර්තාවක් හදිසියේම කල එළියට ගෙනාවා කියලා. ගම්මන්පිල මැතිතුමාත් -අපේ මිත්‍රයා- ඒ ගැන කියලා තිබෙනවා. එතුමාගෙන් අහලා බලන්න, එතුමා කී සැරයක් ඒක කිව්වාද කියලා. [බාධා කිරීමක්] ඔබතුමා කිව්වා. ඔබතුමා කිව්වා, මේ කොමිසම හැල්ලු කරන්න -ඒ සම්බන්ධ පුවත් පත් වාර්තා මම ඊයේ රූපවාහිනී විවාදයට අරගෙන ගියා. මම ඔබතුමාට පෙන්වන්නම්.- එහෙම නැත්නම් මෙහි බර අඩු කරන්න තමයි දෙවැනි වාර්තාව වන බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ගෙනැල්ලා ඉදිරිපත් කළේ කියලා. ඔබතුමා එහෙම කිව්වේ නැහැයි කියා දැන් කියපු නිසා, ඒ ගැන ඔබතුමා කරුණු සඳහන් කළ පුවත් පත් වාර්තාව මම ඔබතුමාට එවන්නම්; මම ඒක මාධ්‍යයටත් දෙන්නම්. ඒක මා සතුව තිබෙනවා. ඊයේ රූපවාහිනී විවාදයට මම ඒක අරගෙන ගියා. මට ප්‍රශ්නයක් නැහැ, එතුමාට ඒක කියන්න අයිතිය තිබෙනවා. ඕනෑ දෙයක් කියපුවාවේ. හැබැයි, එහෙම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු දෙකහමාරක් තිස්සේ පරීක්ෂණ කරපු වාර්තාවක් තමයි එළිදැක්වූවේ. ඒ එළිදැක්වූ වාර්තාවේ නම් ගොඩක් තිබෙනවා. ඒ සමහර අය අපට සම්බන්ධ අය වෙන්න පුළුවන්; අපේ හිතවත් අය වෙන්න පුළුවන්; අපේ මිත්‍රයින් වෙන්න පුළුවන්. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි; අපට ඒක අදාළ වෙන්නේ නැහැ. කවුද වංචාව කළේ, කවුද දූෂණයන් සිදු කළේ කියන එක අපට අදාළ වෙන්නේ නැහැ. වැරැද්ද කරලා තිබෙන්නේ අපේ ළඟ ඉන්න කෙනාද, එහා පැත්තේ ඉන්න කෙනාද කියන එක නොවෙයි ප්‍රශ්නය. වැරැද්ද කරපු කෙනාට දඬුවම් ලබා දීම තමයි අපේ බලාපොරොත්තුව. එහෙම නොවුණොත් මේ රට ඉස්සරහට ගෙන යන්න කවදාවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැයි කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම වාර්තාවේම සඳහන් වෙලා තිබෙන ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව මාධ්‍යවලත්, වේදිකාවලත් කථා කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්න යනවා; තව කණ්ඩායම්වල ප්‍රජා අයිතිය අහෝසි කරන්න යනවාය කියලා කථා කරනවා. මම ඒ සම්බන්ධව යමක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කිසිම කෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව කටයුතු කරන්න අපේ කැමැත්තක් නැහැ. මේ රටේ එහෙම අතීතයක් තිබුණා. මේ පාර්ලිමේන්තුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. ඒ වෙලාවේ ගාමිණී දිසානායක මැතිතුමා ඒ ආණ්ඩුවේ ඉඳගෙන ඒකට විරුද්ධව කථා කළ බව අපි දන්නවා. නමුත්, සාමූහිකව ඒකට කැබිනට් අනුමැතිය දුන්නා. නැවත එතුමියට ප්‍රජා අයිතිය දෙන කොට එතුමා පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳව ප්‍රකාශයක් කළා. එවැනි අමිහිරි අත් දැකීම් අපට තිබෙනවා. හිටපු ජනාධිපතිතුමාගේ හෝ කිසිම කෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කරන යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරනවාට අපේ එකඟතාවක් නැහැ. හොරකම් කරලා තිබෙනවා නම්, වංචා කරලා තිබෙනවා නම්, දූෂණයක් කරලා තිබෙනවා නම්, අධිකරණ පද්ධතිය තුළ දඬුවම් දීමේ අයිතිය ඒ ආකාරයෙන්ම තිබෙනවා. ඒවා වළක්වන්න කියලා අපි කිසිසේත් කියන්නේ නැහැ. ඒ සඳහා දැනට පවතින නීතිරීති ප්‍රමාණවත් නැත්නම්, නීතිරීති පැනවීමේ හැකියාව මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. මේ කාල පරාසය තුළම සිද්ධ වුණු මේ විශාල මුදල් කන්දරාව,- ඒක සිදු වුණේ පසුගිය ආණ්ඩුව කාලයේ වෙන්න පුළුවන්; මේ ආණ්ඩුව කාලයේ වෙන්න පුළුවන්-

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ගේ point of Order එක මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද අමරවීර මැතිතුමා කියපු කාරණය නිවැරැදියි. මෙම බරපතළ වංචා, දූෂණ, විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ, අපරාධ චෝදනා ගොනු කරලා, මහාධිකරණයේ නඩු පවරලා, එසේ නඩු පැවරීමෙන් පස්සේ, වරදට දඬුවමක් විධියට ප්‍රජා අයිතිය අහිමිවීමේ කාල සීමාව දැනට අවුරුදු හතක් වශයෙනුයි තිබෙන්නේ. නමුත්, ඒක ප්‍රමාණවත් නැහැ. එය ජීවිතාන්තය දක්වා කිරීම නිර්දේශ කරන්නට ඒ වෙනුවෙන් අලුත් නීතියක් අවශ්‍යයි කියන එකයි. ඒ කියන්නේ, අල්ලස් පනත සංශෝධනය කරන්න ඕනෑ කියන කාරණයයි. ඒ නිසා ඔබතුමා කියන කාරණය නිවැරැදියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ නීති පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. නමුත්, පාර්ලිමේන්තුවේ පරණ ක්‍රමවේදයට අපේ තිබෙන අකැමැත්ත පිළිබඳව තමයි අපි කරුණු ඉදිරිපත් කළේ. මොකද, ඒ අමිහිරි අතීතය පිළිබඳව අපි කිසිදු කැමැත්තකින් නොවෙයි ඉන්නේ. ඒ වාගේම, මේ රටේ ජනතාවත් ඒ පිළිබඳව කිසිදු කැමැත්තක් නැහැ.

අනුර දිසානායක මැතිතුමා කිව්වා, බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තා වරින්වර ඉදිරිපත් වුණා; ප්‍රමාද වෙලායි වාර්තාව දුන්නේ කියලා. මම ඒ සම්බන්ධයෙන් යමක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රමාද වීමක් නොවෙයි. ඒ සම්බන්ධව වෙනම ක්‍රියාත්මක වන ආයතන දෙකක් තිබුණා.

FCID එක තිබුණා. ඒ වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබුණා. ඒවාටත් මේ පැමිණිලි ගියා. ඒවායින් ක්‍රියාත්මක වෙන්න කිසිම බාධාවක් තිබුණේ නැහැ. මේ පැමිණිලි ඉදිරිපත් වුණේ ජනාධිපති කොමිසමට විතරක් නොවෙයි. ජනාධිපති කොමිසම පැමිණිලි එක්දහස් ගණනක් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එයින් බරපතළම කොටසක් විතරක් තමයි තෝරලා තිබෙන්නේ. සියලුම දෙනාට මේ කොමිසමට පැමිණිලි ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබුණා. හැබැයි, ඒවායින් අවසාන වශයෙන් ඔප්පු වෙන කාරණා ප්‍රමාණයක් තමයි තෝරාගෙන තිබෙන්නේ. ඒවායේත් යම් යම් වංචා තිබෙනවා නම්, දූෂණ තිබෙනවා නම් ඒවාට විරුද්ධව කටයුතු කිරීමේ කිසිම බාධාවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරදක් කරලා තිබෙනවා නම් දඬුවම් දෙන්න ඕනෑ කියන මතයේ තමයි අපි ඉන්නේ.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, දැන් තව කොමිෂන් සභා පත් කරනවා. මේක එක පුද්ගලයෙක්, එක පක්ෂයක් ඉලක්ක කරගෙන කරන කටයුත්තක් නොවෙයි. මම ඒ බව ඉතාමත් පැහැදිලිව කියනවා. සමහර වෙලාවට එක්සත් ජාතික පක්ෂය හිතනවා, "මේ බැදුමිකර කොමිසම පත් කළේ එක්සත් ජාතික පක්ෂය ඉලක්ක කරගෙනයි" කියලා. එහෙම කථා කරපු අය ඉන්න බව මම දන්නවා. නමුත්, එවැනි ආකාරයට කිසිම කෙනෙක් ඉලක්ක කරගෙන නොවෙයි මේ කොමිෂන් සභා පත් කළේ. මේ කොමිෂන් සභා පත් කළේත්, ඒ වාගේම ඒ පිළිබඳ වාර්තා නිකුත් වෙන්නේත්, ඒ පිළිබඳව ඉදිරියේදී ක්‍රියාත්මක වෙන්නේත් අපේ රට ඉලක්ක කරගෙනයි. ඒ වාගේම, ඊට පෙර පත් කරපු කොමිෂන් සභා පිළිබඳව කියනවා, ඒවා පත් කළේ තවත් පාර්ශ්වයක් ඉලක්ක කරගෙනයි කියලා. එහෙම එකකුත් නොවෙයි මෙතැන සිදු වෙලා තිබෙන්නේ.

මේ රටේ සාමාන්‍ය පවුලක ඉපදිලා දේශපාලනයට ප්‍රවේශ වෙච්ච කෙනෙක් විධියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හිතනවා, "මේ රටේ වංචාවට, දූෂණයට විරුද්ධව ගන්න තිබෙන සියලු ක්‍රියා මාර්ග ගන්න ඕනෑ" කියලා. ඒකට ආණ්ඩු බලය ප්‍රශ්නයක් නැහැ. එතුමාගේ තනතුර ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අපේ තනතුරු ප්‍රශ්නයක් වෙන්නෙත් නැහැ. අපි ඒ වෙනුවෙන් ගන්න තිබෙන සියලුම ක්‍රියා මාර්ග ගන්නවා. ඒ වාගේම මම කියන්න ඕනෑ, මේක මහත් අභියෝගයක් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ කාරණා මේ ආකාරයෙන් එළිදැක්වෙන කොට, ක්‍රියාත්මක වෙනකොට කියනවා, "නිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් අත් අඩංගුවට ගන්නේ නැහැ" කියලා. ඒත් ගන්න වෙනවා. ඒක නවතින්නේ නැහැ. එයාට රට ගිහිල්ලා හැංගිලා ඉන්න හම්බවෙන්නේ නැහැ. උදයංග වීරතුංග හැංගිලා හිටියා. ඔහු මිග් යානා ගනුදෙනුවට සම්බන්ධ වෙච්ච කෙනා; රුසියාවේ හිටපු තානාපතිවරයා. ඔහුත් අත් අඩංගුවට ගත්තා. ජාත්‍යන්තරයේ කොහේ හිටියත් අර්ජුන් මහේන්ද්‍රන්වත් අත් අඩංගුවට ගැනීමේ කටයුත්ත අනිවාර්යයෙන්ම සිදු වෙනවා. ඒ සම්බන්ධයෙනුත් දඬුවම් දීම අනිවාර්යයෙන්ම සිදු වෙනවා කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ඊට වැඩිය තව කවුරු හරි සම්බන්ධ නම්, තනතුර අදාළ වෙන්නේ නැහැ. මේ කාරණයේදී තනතුර අදාළ නැහැ. මේ වංචාවට, මේ දූෂණයට සම්බන්ධ වෙලා තිබෙන්නේ කවුද, ඒ කෙනාට අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දෙනවා කියන එක පිළිබඳව අපි ඉන්නේ දැඩි ස්ථාවරයකයි. ඒ වාගේම, තව කාරණා කිහිපයක් පිළිබඳව කිව්වා.

දැන් SriLankan Airlines එක පිළිබඳවත් නැවත කොමිසමක් පත් කරනවා, ඒ පිළිබඳව කටයුතු කරපු ආකාරය ගැන සොයා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SriLankan Airlines ආයතනය අපි පවරා ගත්ත මුල් කාලයේ ලාභ ලැබූ ආයතනයක්. ඒ වෙලාවේ Emirates එකත් එක්ක යන කොට අපේ ආණ්ඩුව රුපියල් කෝටි 600 ගණනක් ලාභ ලැබුවා. ඉන් අනතුරුව මේ ආයතනය පවරා ගත්තාට පස්සේ පසුගිය කාලයේ රුපියල් කෝටි 12,500ක් පාඩු ලැබුවා. ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ. ඒ වාගේම, මේ ආණ්ඩුව ආවාමත් යම් යම් සිදුවීම් පිළිබඳව ජනතාව තුළ සැකයක් ඇතිවෙලා තිබෙනවා. එතකොට පසුගිය ආණ්ඩුවේ වෙච්ච දේයි, මේ ආණ්ඩුවේ වෙච්ච දේයි දෙකම පිළිබඳව සොයා බැලීමේ කටයුතු කරන්න අවශ්‍යයි. ඒ පිළිබඳව ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු වෙනවා. එක කණ්ඩායමක් හෝ එක පුද්ගලයෙක් ඉලක්ක කරගෙන නොවෙයි මේ කටයුත්ත කරන්නේ. ඒ වාගේම, මේක නර්තනයකුත් නොවෙයි; රංගනයකුත් නොවෙයි; ජනතාව ඇන්දවීමකුත් නොවෙයි. අපේ රටේ ජනතාව අන්දවන්න බැරිය කියන එක පසුගිය මැතිවරණ ගණනාවකදීම මේ රටේ ජනතාව ඔප්පු කරලා හමාරයි. ඒ නිසා ගන්න තිබෙන තීන්දු ජනතාව ගන්නවා. ඒ වෙනුවෙන් ඔවුන් සියලුම මැතිවරණවලදී තීන්දු කරාවි කුමක් කළ යුතුද කියලා. ඒ වාගේම, මේ කාරණා සම්බන්ධව ගන්න තිබෙන තීන්දුවලට ප්‍රවේශවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒත් එක්කම මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මේ කාරණා සම්බන්ධව කටයුතු කරනකොට වෙනම සන්ධානයක් ගොඩ නැඟෙනවා. ඒ සන්ධානය තමයි, හොරු-හොරු එකතු වෙන සන්ධානය. ඒක තමයි බරපතළම සන්ධානය. මේ කාරණය සම්බන්ධයෙන් අපේ රටට මහා හානිකර සන්ධානයක් දැන් ගොඩනැඟිලා තිබෙනවා. ඔය අලුතින් පිහිටුවා ගත්ත පක්ෂයේ දෙවැනි සාමාජිකයා පසුගිය දිනවල එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල පුද්ගලයෙක් හම්බවෙනවා. අපි ඒ පිළිබඳව ඉදිරියේදී හෙළිදරව්ව කරනවා. පසුගිය දිනවල බොරැල්ලේදී මුණ ගැසීමක් සිද්ධ වෙනවා. මේ පිළිබඳව අපි ඉදිරියේදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරනවා. මොකක්ද මෙතැන කථා වෙන්නේ? මෙතැන කථා වෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා හොරු ඇල්ලීමේ වැඩ පිළිවෙළ දියත් කරනවා; ඒ වෙනුවෙන් ගන්න තිබෙන තීන්දු ගන්නවා. එතකොට අපි දෙගොල්ලටම වදිනවා. ඒ නිසා ඔහු දුර්වල කරන්න අපි එකතු වෙන්න ඕනෑය කියන සාකච්ඡාවක් තමයි මෙතැන වෙන්නේ. මේකට මේ රටේ ජනතාව එකඟ වෙනවාද? මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව ඒකද? එළියේදී කෑ ගැහුවාට වැඩක් වෙන්නේ නැහැ, වෙනම හමුවෙලා මේ වාගේ සාකච්ඡා කියනවා නම්. ඒ වාගේම, ගම්පහ ප්‍රදේශයේ ඉන්න තව දේශපාලනඥයෙක් -ඒත් එහා පැත්තේම ඉන්න කෙනෙක්- එක්ක තවත් හමුවීමක් සිද්ධ වෙනවා. මෙයට හොඳම නිදර්ශනයක් තමයි, සමහර නඩු. ඒ පැත්තේ ඉන්න සමහර අයගේ නඩු මාස දෙක තුන ඇතට දින දානවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

මහින්දානන්ද මන්ත්‍රීවරයාගේ නඩුව ගැන මම දන්නවා. එතුමා ඊයේත් ඒ ගැන රූපවාහිනී ආයතනයකදී කිව්වා. ඒ නඩුව එක දිගට අහනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ නඩුව අහන්න ඕනෑ. එතුමා වරදක් කළා නම් දඬුවම් දෙන්න ඕනෑ. ඒ පිළිබඳව නොවෙයි ගැටලුව තිබෙන්නේ. හැබැයි, තව සමහර නඩු තිබෙනවා, අවුරුදු ගණන් කල් යන ඒවා. අවුරුදු ගණන් කල් යන නඩු තිබෙනවා. මේවා වෙන්නේ කොහොමද? රූපවාහිනියට ගියාම, රැස්වීමකට ගියාම මෛත්‍රීපාල ජනාධිපතිතුමාටයි ඒ අය බණින්නේ. ඒ අය බණින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. ඒ අය කථා කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව. එහෙම කථා කරන අයගේ නඩු අවුරුදු ගණන් කල් යනවා. අර අනෙක් අයගේ නඩු එක දිගට අහගෙන යනවා; දඬුවම් ලබාදීම් සිද්ධ වෙනවා. මේ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මේ පිළිබඳව අපි කථා කරන්න ඕනෑ. මම හිතන හැටියට ඒ පැත්තේ ඉන්න පිරිසිදු මන්ත්‍රීවරු ඉදිරිපත් වෙන්න ඕනෑ මේවා හොයා බලන්න. එතුමන්ලා මේවා වෙනුවෙන් කථා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] දෙපැත්තේම ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ඉන්නවා, එක්සත් ජාතික පක්ෂයේත් ඉන්නවා. ඔබතුමන්ලාගේ ඒකාබද්ධ විපක්ෂයේත් ඉන්නවා පිරිසිදුවට දේශපාලනය කරන්න කැමැති අය; වංචාවට, දූෂණයට විරුද්ධ අය. ඒ වාගේම, මේ රට ගොඩ නහන්නට වුවමනාවක් තිබෙන අයත් ඉන්නවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අවංකව මේ හොරුන්ට, වංචා කරපු අයට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න යන මේ මොහොතේ, බොරුවට මඩ ගහන්නේ නැතිව, එක දේශපාලන කෝණයකින් බලන්නේ නැතිව, ඡන්ද ලැබෙන්නේ කොහොමද කියලා බලන්නේ නැතිව ඒ සියලුදෙනා එකතුවෙලා එතුමාට ඒ භයිය ලබා දෙන්න ඕනෑ; පාර්ලිමේන්තුවේ ශක්තිය ලබා දෙන්නට ඕනෑ; ඒ අවශ්‍ය අණපනත් අපි සම්මත කර දෙන්න ඕනෑ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, එතුමන්ලා ඒ අණ පනත් සම්මත කරන්නට කැමැතියි කියලා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපිත් බලාගෙන ඉන්නවා, අත් දෙකම උස්සලා ඒවා සම්මත කර දෙන්න. අපට අවශ්‍ය නැහැ පුද්ගලයෙක් ඉලක්ක කරගෙන කටයුතු කරන්න. ඒ වාගේම, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම කෙනෙක් ආරක්ෂා කරන්නත් අපට අවශ්‍ය නැහැ; අපේ එහෙම බලාපොරොත්තුවකුත් නැහැ.

මේකෙන් මොකක්ද අපේ පක්ෂයට වෙන හානිය, එසේ නැත්නම් මෙයින් අපේ අයට වෙන හානිය පිළිබඳව කල්පනා කරන්නේ නැතිව අපි අවංක වෙමු, රටට. අපි අවංක වෙමු, ජනතාවට. අපට ඕනෑතරම් මඩ ගහන්න පුළුවන්. හැම කෙනෙකුටම මඩ ගහන්න පුළුවන්. හැබැයි, මඩ ගහන දේශපාලනයෙන් ඔබ්බට ගිහින් මේ රටේ වංචාවට දූෂණයට විරුද්ධව අපි පෙළ ගැසෙමු. ඒකට පක්ෂ භේද ඕනෑ නැහැ. සියලු පක්ෂ භේද අමතර කරලා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න, හොරකමට දූෂණයට වංචාවට විරුද්ධ කණ්ඩායම් එකතු වෙලා ඒ සටන ආරම්භ කරමු. ඒ සඳහා එන බාධක, ඒ සඳහා එන විවිධ අභියෝග ජය ගන්න අපි එකතු වෙමු. ඒකයි මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව.

මම තව එක කාරණයක් කියලා මගේ කථාව අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා ගත් මේ තීන්දු, මේ රජය ගත් තීන්දු නිසා අනාගතයේදී මේ රටේ බලයට පත් වන කිසිම රාජ්‍ය නායකයෙක්, කිසිම ආණ්ඩුවක් එක වරක් දෙවරක් නොවෙයි, සත් වරක් සිතාවත් වංචාවක් දූෂණයක් කරන්න භය වෙනවා. අද ඒ තරමට වංචාවට දූෂණයට විරුද්ධව ජනතා පෙළ ගැස්මක් ඇති වෙලා තිබෙනවා. ඒවා ගැන රටේ හෙළිදරවු වෙනවා. ඒ වාගේම ඒවා වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වෙනවා. අධිකරණ පද්ධතියත් ඒ වෙනුවෙන් කැප වෙනවා. ඒ පිළිබඳව අපට තිබෙන්නේ ඉමහත් ආඩම්බරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.35]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ සිදුවූවායැයි සඳහන්වන සියලු වංචා තරාදියක එක පැත්තකටත්, මහ බැංකු බැඳුම්කර වංචාව විසින් සිදු කරන ලද අලාභය තරාදියේ අනෙක් පැත්තටත් දැම්මොත් ඔබතුමා දන්නවා, මේ බැඳුම්කර වංචාවෙන් වෙච්ච බලපෑමේ බර විශාල වශයෙන් වැඩි බව. මේක සැලසුම් සහගත හොරකමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය සැලසුම් සහගත හොරකමක් බව කියන්න අද වන විට ඕනෑ තරම් කරුණු අනාවරණ වෙලා තිබෙනවා. ඒ සැලසුම් සහගත හොරකම විසින් මේ රටේ ආර්ථිකය හිරිවට්ටලා තිබෙනවා. බැංකු පොලී අනුපාතය ඉහළ අගයකට ගෙන ගිහින් තිබෙනවා. බැංකු පොලී අනුපාතය ඉහළ අගයකට ගෙන යෑම විසින් මිනිසුන් බැංකුවලින් ණය අරගෙන වියදම් කරන, ආයෝජනය කරන, එහෙම නැත්නම් තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මුදල් යොදවාගන්නා ප්‍රවණතාව බිඳ වැටිලා තිබෙනවා. සල්ලි තිබෙන මිනිහා බැංකුවට සල්ලි දමලා ඒ සඳහා ලැබෙන අධික පොලියෙන් ජීවත් වෙන්න පුරුදු වෙලා තිබෙනවා. ඒ අනුව බැංකු ලාභ ලබනවා. මහජනයා අතේ තිබෙන සල්ලි බැංකුවල තිබෙන්නේ. රටේ මුදල් සංසරණය හීන වෙලා තිබෙනවා. ඒ නිසා ව්‍යාපාරිකයා කියනවා,"මිනිසුන් අතේ සල්ලි නැහැ, බිස්නස් නැහැ" කියලා. සමස්ත ආර්ථික දේහයටම බලපෑ ප්‍රමුඛතම, බරපතළම හොරකම ගැනයි අද අපි මේ සාකච්ඡා කරන්නේ.

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වෙච්ච හොරකම් ගැන කෙනෙක් කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැන හොරකමක් වෙලා තිබෙනවා නම්, ඒකේ බලපෑම තිබෙන්නේ ඒ සමාගමේ සීමාවට පමණයි. නමුත්, මේ කාරණය එහෙම නොවෙයි. මේක සමස්ත ආර්ථික දේහයටම බලපෑවා; සාමාන්‍ය ජන ජීවිතයට බලපෑවා. මේක මිනිසුන්ගේ අගහිඟකම් වැඩිවෙන්න හේතු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න යන මේ කාරණය ගැන ඔබතුමාත් දන්නවා. මේක මම නොවෙයි කියන්නේ. ඉන්දියානු හමුදාවේ ජනරාල් කල්කට් කියන නිලධාරියා ලංකාවේ යුද්ධය ගැන පොතක් ප්‍රකාශයට පත් කළා. ඒ පොතේ ඔහු කියනවා, ශ්‍රී ලංකාව යුද්ධය සඳහා අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් වියදම් කළා කියලා. ඇමෙරිකන් ඩොලර් බිලියන 6ක්! මේක සුළුපටු ගණනක් නොවෙයි. ඒ අතරම ඔහු ඒ පොතේ සඳහන් කරනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා අවුරුද්දකට ඩොලර් බිලියන 6ක්වූ ඒ වියදම නැති කරගත්ත නිසා තමයි ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යද්දී, ලෝක ආර්ථිකය කඩා වැටෙද්දී ශ්‍රී ලංකා ආර්ථිකය දක්ෂ ලෙස හසුරුවාගන්න සමත් වුණේ; එතුමාට ආර්ථිකය කළමනාකරණය කරගන්න පුළුවන් වුණේ කියලා. අපි නොවෙයි එහෙම කියන්නේ. ජනරාල් කල්කට් මහත්මයා ලියපු පොතේ තමයි එහෙම සඳහන් වන්නේ.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතුමන්ලාට බලය ලැබෙන කොට යූඑස් ඩොලර් බිලියන 6ක් වියදම් කරන්න ඕනෑ වුණේ නැහැ. මොකද, ඒ වනවිට යුද්ධය අවසාන නිසා. ඒ නිසා ඒ ගණන ඉතුරුයි. ඒ වාගේම, ලෝක වෙළෙඳ පොළේ ඩොලර් එකකිය ගණනට නැහලා තිබුණු තෙල් බැරලය ඩොලර් 27, 30 දක්වා පහළ බැස තිබුණා. ඒ නිසා තෙල්වලට ඒ අසීමිත විදේශ විනිමය ගලායෑමත් නතර වුණා. ඒ ඔක්කොම පහසුකම් ලැබිලාත් ඇයි මේ ආර්ථිකය මේ විධියේ කඩා වැටීමකට ලක් වුණේ? ඇයි සියයට 3.7ක වර්ධන වේගයක් ඇති වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට ප්‍රමුඛතම හේතුව මේ මහ බැංකු බැඳුම්කර හොරකමයි. මේ බැඳුම්කර හොරකම වුණේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා හොරු ඇල්ලීමේ කමිටුවේ, ජාතික විධායක සභාවේ සාමාජිකයකු හැටියට ප්‍රමුඛ කාර්යයක් කරමින් සිටින වෙලාවේයි. "රාජපක්ෂලා හොරු" කියාගෙන ආපු කට්ටිය තමයි මේ හොරකම කළේ. අද වන විට මේ ආණ්ඩුවට අවුරුදු තුනක් ගත වෙලා තිබෙනවා. තිබුණු ආණ්ඩුවට විරුද්ධව කොමිෂන් සභා වාර්තාවක තිබෙන මොකක් හෝ නිර්දේශයක් ගැන කියනවා ඇරෙන්න, හැම දාම කියපු බොරු ටික කියනවා ඇරෙන්න, අවුරුදු තුනක් ඇතුළත තමුන්නාන්සේලා කියපු කිසි චෝදනාවක් ඔප්පු කර පෙන්වා නැහැ. තමුන්නාන්සේලාගේ අතේයි බලය තිබෙන්නේ; තමුන්නාන්සේලාගේ අතේයි ආණ්ඩුව තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් කොමිෂන් සභා වාර්තාවේ තිබෙන්නේ අවභාවිත පිළිබඳ බොහෝ උදාහරණ.

[ගරු විමල් වීරවංශ මහතා]

ඒකයි මේකයි සමාන කරලා, සංසන්දනය කරලා බැඳුම්කර හොරකමින් වුණු බලපෑම සුළු කොට තකන්න හදනවා නම්, ඒ තරම් තක්කඩිකමක් තවත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ හොරකම වුණේ කොහොමද? මේක නිකම් වුණු හොරකමක්ද? බලය අරගෙන දවස් 20කදී වුණු හොරකමක් මේක. මේ හොරකම නිකම් වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳටම දන්නවා මේ හොරකම වෙන්නේ ඉතාම සැලසුම් සහගතව බව. මලික් සමරවික්‍රම මැතිතුමා අද අමාත්‍යවරයෙක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ සභාපති. උපනායක රවි කරුණානායක -එතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා- ලේකම් කබීර් හාෂිම් කියන අය හදිසි මුදල් අවශ්‍යතාවක් පිළිබඳව මහ බැංකුවේ අධිපතිවරයා සමඟ සාකච්ඡා කරන්න මහ බැංකුවට ගියා. මේවා මම කියන දේවල් නොවෙයි, කොමිසමේ පරීක්ෂණවලදී අනාවරණ වූ දේවල්. ඇයි එහෙම සාකච්ඡාවකට යන්නේ? මොන ආණ්ඩුවක් මේ රටේ බලයට ආවත් එහෙම කරන්න ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සභාපති මහ බැංකු අධිපතිට උපදෙස් දෙන්න යන්න ඕනෑ නැහැ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, එවකට මුදල් ඇමති හැටියට තමුන්නාන්සේ එතැනට ගිය එකේ යම්කිසි තර්කයක් තිබෙනවා කියමු. හැබැයි තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි මහ බැංකුව ගැසට් කළේ. ඉතිහාසයේ හැම දාම මහ බැංකුව ගැසට් කළේ මුදල් අමාත්‍යාංශය යටතේ. ඇයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට අග්‍රාමාත්‍යවරයාට අයත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු කියන අමාත්‍යාංශය යටතේ මහ බැංකුව ගැසට් කර ගත්තේ? මොකක්ද, ඒකේ රහස? මොකක්ද, ඒකට හේතුව? ඒ ගැසට් නිවේදනයෙන් හැමදාම මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණු මහ බැංකුව අගමැතිවරයා යටතට ගෙනාවේ මේ හොරකමේ, සැලසුමේ මූලාරම්භක පියවර ලෙසයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කරනවා, මම බලාගෙන සිටියා. එතුමා මේ කරුණු මොකුත් කියන්නේ නැහැ. පසුගිය ආණ්ඩුවේ සිල් රෙද්දක් ගැන හරි මොකක් හරි ගැන ටිකක් උස්සලා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හේතුව මේකෙන්ම පැහැදිලියි. මහ බැංකුව තමන් යටතේ ගැසට් කර ගත්තා. පක්ෂ සභාපති මලික් සමරවික්‍රම, ලේකම් කබීර් හාෂිම්, උප නායක රවි කරුණානායක, -මට මතක හැටියට එතුමා ඒ වෙලාවේ මුදල් ඇමති වෙන්න පුළුවන්.- ගිහිල්ලා මහ බැංකු අධිපතිත් එක්ක සාකච්ඡා කළා. ඊළඟට, මෙතෙක් කලක් මහ බැංකුව බැඳුම්කර නිකුත් කළ ක්‍රමවේදය වෙනස් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුවෙන් පොලී අනුපාතය සියයට 1ක වෙනසක් වුණොත් ඒකෙන් වන බලපෑම බිලියන 40කට වඩා වැඩියි. ඒ කියන්නේ මත්තල ගුවන් තොටුපොළ වාගේ ඒවා කීයක් හදන්න පුළුවන්ද? හම්බන්තොට වරාය වාගේ වරායවල් කීයක් හදන්න පුළුවන්ද? අධිවේගී මාර්ග කීයක් හදන්න පුළුවන්ද? ඒ නිසා පොලී අනුපාතය සියයට 1ක් නොවෙයි වෙනස් වුණේ. සියයට 1කින් නොවෙයි වෙනස් වුණේ. සියයට 1ක වෙනසේ බලපෑම බිලියන 40කට වැඩියි. එනකොට මේක වෙන්නේ කොහොමද? අග්‍රාමාත්‍යවරයා යටතේ ගැසට් වෙනවා. පක්ෂයේ සභාපති, ලේකම්, උප නායකලා ගිහින් මහ බැංකු අධිපතිට උපදෙස් දෙනවා. ඊට පස්සේ ඒ උපදෙස් අනුව මහ බැංකු අධිපති එතෙක් කල් බැඳුම්කර නිකුත් කළ ක්‍රමවේදය වෙනස් කරනවා. ඊට පස්සේ බැඳුම්කර වෙන්දේසියේදී පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගමට අධික පොලියට මුදල් දෙන්න රුපියල් බිලියන 10ක් ලංකා බැංකුව එක මොහොතින් ලබා දෙනවා; තත්පරයෙන් ලබා දෙනවා. එහෙම වගකිව යුතු ක්‍රමවේදයකින් තොරව පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගමට රුපියල් බිලියන 10ක් දෙන්න ලංකා බැංකුවට පුළුවන්කමක් නැහැ. දෙන්නේ කොහොමද? මුදල් ඇමතිතුමා හැටියට එතුමා දන්නවා ඇති, දීපු ක්‍රමය. රවි කරුණානායක හිටපු ඇමතිතුමා දන්නවා ඇති, දීපු ක්‍රමය. ඒ විධියට රුපියල් බිලියන 10ක් පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගමට දෙනවා. මේක තමයි සැලැස්ම. මේක සැලසුම් සහගතවයි සිදු වුණේ.

ඒ විතරක් නොවෙයි, විදේශ පුරවැසියෙක් වුණු අර්ජුන මහේන්ද්‍රන්ව මහ බැංකු අධිපති කළේ මොකටද? ඔහු විදේශ පුරවැසියෙක්. මේ රට වෙනුවෙන් වැඩ කරනවාය කියලා දිවුරුම් දුන්නේ නැහැ. තමන්ගේ ගජ මිත්‍රයා; අගමැතිතුමාගේ ගජ මිත්‍රයා. 2015 ජනවාරි 08වැනි දා සිදුවුණු බල පෙරළියට එදා තිබුණු ආණ්ඩුවෙන් පැනපු කට්ටිය සිංගප්පූරුවට ගිහිල්ලා අර්ජුන මහේන්ද්‍රන්ගේ ගෙදර තමයි සාකච්ඡා කළේ. මුදල් හුවමාරු වුණේ ඒ ගෙදරදීයි. ඒ නිසා අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ එදා ඇති වුණු බල පෙරළියටත් තිරය පිටුපස ඉඳගෙන සල්ලි පොම්ප කරපු කෙනෙක්. ඊට පස්සේ අර්ජුන මහේන්ද්‍රන් කියන විදේශිකයාව ගෙනැල්ලා මහ බැංකුවේ අධිපති කළා. තමන්ගේ ගජ මිතුරාව මහ බැංකුවේ අධිපති කළා; අගමැතිතුමාගේ ගජ මිතුරාව මහ බැංකුවේ අධිපති කළා. ඒ විතරක් නොවෙයි, මේ නව ක්‍රමවේදය හඳුන්වා දුන්නා. නව ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න අගමැතිතුමා නියෝග කළාය කිව්වා. නව ක්‍රමවේදය නිසා තමයි පොලී අනුපාතය කෘත්‍රිම ලෙස ඉහළ දමලා, පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගමට අධික ලාභයක් ලබා ගන්න පුළුවන් වුණේ. පැරණි ක්‍රමවේදයට ගියා නම් මේ හොරකම කරන්න බැහැ. පැරණි ක්‍රමවේදයට ගියා නම් මේ අලාභය කරන්න බැහැ. පැරණි ක්‍රමවේදයට ඒක කරන්න බැරි නිසා තමයි හොරකමට හරියන අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ හොරකම ගැන කාරණා මතු වුණා. දැන් බලාගෙන ගියාම මහින්ද අමරවීර ඇමතිතුමා තමයි මේ හොරකම ගැන මුලින්ම අනාවරණය කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළාට කිසි පරීක්ෂණයක් වුණේ නැහැ. මොකක්වත් වුණේ නැහැ. අඩු ගණනේ ඇයි මේ පරීක්ෂණ නොකරන්නේ කියලා අහන්නවත් එතුමා නැවත ගියේ නැහැ. අද කොමිෂන් සභා වාර්තාව ගැන කථා කරන නිසා එතුමා මෙතැනට ඇවිල්ලා වීර කථාවක් කරලා ගියා. මම කියන්නේ මේකයි. ඊට පස්සේ රටේ විරෝධය ආවා, මේ තොරතුරු හෙළි වුණා. මහජන විරෝධය එන කොට අගමැතිතුමා මොකක්ද කළේ? එක්සත් ජාතික පක්ෂයට හිතවත් නීතිඥයෝ තුන් දෙනෙක් දමලා "පිටිපන කමිටුව" කියලා කමිටුවක් හැදුවා. "මෙතැන යම් කිසි දෝෂයක් සිදු වී ඇත" කියලා පිටිපන කමිටුවෙන් දුන්නා, බොහොම සුළුකොට තකන වාර්තාවක්. අග්‍රාමාත්‍යතුමා 2015 මාර්තු 17වැනිදා අර්ජුන මහේන්ද්‍රන් ආරක්ෂා කරමින් මේ සභාව තුළ කථා කළා. අනුන්ට දොස් පවරමින් කථා කළා. අර්ජුන මහේන්ද්‍රන් ගැන වගකීම තමන් ගන්නවාය කිව්වා. අර්ජුන මහේන්ද්‍රන් දක්ෂ කළමනාකරුවෙක් කියලා කිව්වා. ඊළඟට, ඩිව් ගුණසේකර මැතිතුමා කෝප් කමිටුවෙන් මේ පිළිබඳව විමර්ශන වාර්තාවක් සකස් කළා. ඩිව් ගුණසේකර මැතිතුමා කෝප් කමිටු වාර්තාව සකස් කරලා එළිදක්වන්න දවසක් තිබෙද්දී පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ කෝප් කමිටු වාර්තාවට අත්සන් කරන්න කියලා එදා කෝප් කමිටුවේ හිටපු සභාපති ඩිව් ගුණසේකර මැතිතුමා එදා කෝප් කමිටුවේ සාමාජිකයකු වුණු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටියාම, එතුමා කෑගල්ලේ රැස්වීමකට යන්න තිබෙනවාය කියලා ඒකට අත්සන් තබන එකෙන් කොහොම හරි සීරු මාරුවට ඇත් වුණා.

මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. සිදු වුණු දේයි මම මේ කියන්නේ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒ වේලාවේ කෝප් එකේ සාමාජිකයෙක්. ඩිවි ගුණසේකර මහත්මයාගේ "කෝප්" වාර්තාව එළියට එන්න දවසකට කලින් පාර්ලිමේන්තුව විසුරුවා හැරලා රටේ ජනාධිපතිවරයා ඒ "කෝප්" වාර්තාව එළියට එන එක වැළැක්වුවේ නැත්නම්, මේ තොරතුරු මීට කලින් අනාවරණය වෙලා දෙවැනි, තෙවැනි වතාවටත් බැඳුම්කරවලින් සිදු කරපු මහා පරිමාණ හොරකම් නතර කරන්න තිබුණා. හොරකම නතර කරන්න සැබෑ වුවමනාවක් තිබුණා නම්, එදා පාර්ලිමේන්තුව විසුරුවා හරින්නේ නැහැ. ඒ වාර්තාව එළි දැක්වුවාට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තිබුණා. නමුත්, එම වාර්තාවෙන් මේ හොරකමේ දිග පළල, බරපතළකම, විමර්ශනයේ කරුණු හරි හැටි අනාවරණය වුණු නිසා තමයි වාර්තාව එළියට එන්න කලින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ. එමඟින් මේ හොරකම නිසි මොහොතේ දී අනාවරණයකොට, එය වළක්වාලීමට ගත යුතු පියවර නොගෙන ඒක ආරක්ෂා කරන්න, රටේ ජනාධිපතිවරයාත් පියවර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි මේ වන විට මේ ප්‍රශ්නය ඉතා බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඩිවි ගුණසේකර මහත්මයාගේ කෝප් වාර්තාව ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීම වළක්වන්න සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අධිකරණයට ගිහින් වාරණ නියෝගයක් ඉල්ලුවා. එම "කෝප්" වාර්තාව පිළිබඳව ප්‍රසිද්ධියේ සාකච්ඡා කරන එක වළක්වන්න වාරණ නියෝගයක් ඉල්ලුවා. ඒ විතරක් නොවෙයි, බැඳුම්කර වංචාව සුද්ධ කරමින් සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පොතකුත් ලිව්වා. බැඳුම්කර වාර්තාව සුද්ධ කරමින් ඒ ගැන පොතකුත් ලිව්වා. එහෙම හොරකමක් සිදු වෙලා නැහැ කියලා කිව්වා. ඒ පොත ලිව්ව නිසාම, ඊළඟ පාර්ලිමේන්තු වාරය ආරම්භ වෙලා, අලුත් "කොප්" එක පත්වෙලා මේ ගැන විමර්ශනය ආරම්භ වුණාට පසුව එහි හිටපු යූඑන්පී මන්ත්‍රීවරයකු ඉල්ලා අස්කරවලා සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාව "කෝප්" එකේ සාමාජිකයකු හැටියට පත් කළා. අර සුදුසුකම නිසා. මේ සල්ලි හතර අතට විහිදුණා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අධික ලාභ සෙව්වා. ඒකෙන් විශාල ධනයක් විශාල පිරිසක් අතරේ බෙදී ගියා. එම නිසා හැමෝම මේ හොරකම ආරක්ෂා කරන්න එකතු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් දන්නවා ඇති, අර්ජුන මහේන්ද්‍රන් මහත්මයාව දෙවැනි වතාවට මහ බැංකු අධිපති තනතුරට පත් කිරීමෙන් වැළකුණාට පසුව, අග්‍රාමාත්‍යතුමා එතුමාගේ අමාත්‍යාංශයේ විශේෂ උපදේශකයකු හැටියට, රැකියා දසලක්ෂයේ ව්‍යාපෘතියේ උපදේශකයා හැටියට අර්ජුන මහේන්ද්‍රන් මහත්මයාව නියාගෙන සිටි බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සියලු දෙයින් පෙනෙනවා මෙය තවත් කොහේ හෝ සිදු වුණු හොරකමක් පෙන්වලා වහන්න පුළුවන් කථාවක් නොවෙයි කියලා. පසුගිය ආණ්ඩුවේ හොරකම් තිබුණා නම්, තමුන්නාන්සේලාට බලය තිබෙනවා නීත්‍යානුකූල ක්‍රියා පටිපාටියට අනුව ඒවා ගැන හොයන්න; හොයලා ඔප්පු කරලා පෙන්වන්න; වැරැදි කරලා තිබෙනවා නම් නීතියේ ක්‍රමවේදයට අනුව දඬුවම් කරන්න. ඒකට තමුන්නාන්සේලාට අයිතිය තිබෙනවා; බලය තිබෙනවා. ඒක වළක්වන්න අපට පුළුවන්කමක් නැහැ. ඒක කරන්න. හැබැයි, ඒවා ගැන කියමින්, කථා කරමින්, ඒවා පතුරු ගහමින් ඒවා මේ මහා පරිමාණ හොරකම වහන සළුව බවට පත් කර ගන්න තමුන්නාන්සේලා අද කටයුතු කරනවා. ඒකයි තිබෙන තක්කඩිකම. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා කොහොමත් දන්නවා, මේ හොරකමේ දිග පළල කොහොමද කියලා. 2015 ජුනි මාසයේ 03වැනි දින තමයි මහ බැංකු අධිපති ලෙස අර්ජුන මහේන්ද්‍රන් පත් කරන එකට විරෝධය පාලා ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම් නායකතුමා; දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ගරු සභාවේ කථා කළේ. 2015 ජුනි මාසයේ 3වැනි දින.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන විරෝධයත් එක්ක ජනාධිපතිවරයාට සිදුවුණා, මේ ගැන කොමිසමක් පත් කරන්න. කොප් එකේ වාර්තාව ආවා. ජනාධිපතිවරයාට කොමිසමක් පත් කරන්න සිදු වුණා. "කෝප්" එකෙනුත් මේකේ මහ මොළකරු කවුද කියලා හැඳින්වුවේ නැහැ. කොමිෂන් වාර්තාවෙනුත් මේකේ මහ මොළකරු කවුද කියලා හඳුන්වන්නේ නැහැ. රවි කරුණානායක මැතිතුමා පිටින් මේ ඔක්කොම පව් ටික යවලා මහ මොළකරුවෝ අත සෝදා ගන්න උත්සාහ දරන බවක් තමයි දැන් අපට නම් පෙනෙන්නේ. එහෙම හිතනකොට එතුමා ගැන දුකකුත් ඇති වෙනවා, අම්මපා!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක සැලසුම් සහගත සොරකමක්. මේක සැලසුම් සහගත හොරකමක්. මේක සිද්ධ කළේ සැලසුමකට අනුවයි. මලික් සමරවික්‍රම, කබීර් හාෂිම්, රවි කරුණානායක යන අමාත්‍යවරුන් මහ බැංකුවට ගිහින් මහ බැංකු අධිපති එක්ක කථා කළේ ඒක ගැන. මහ බැංකු අධිපතිව ගෙනාවේ ඒකටයි. ඒකෙන් මේ රටේ ආර්ථිකයට හෙන ගැහුවා වාගේ වුණා. මේ හොරකමින් ඇති වුණු පාඩුවේ බලපෑම ගැන තමුන්නාන්සේ දන්නවා. මේ අවභාවිත වූ මුදල් ඉතුරු කර ගන්න ලැබුණා නම්, මේ රටේ එක පවුලකට කාර් රථය බැගින් දෙන්න පුළුවන්කම ලැබෙනවා. මේ රටේ එක පවුලකට කාර් රථය බැගින් දෙන්න පුළුවන්. ඒ තරම් අතිවිශාල ධනයක් මේකෙන් ගසා කාලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ඇති වුණු බලපෑම අති විශාලයි. රුපියල අවප්‍රමාණ වෙන්න මේක බලපෑවේ නැද්ද? මූල්‍ය වෙළෙඳ පොළ ගැන සැක සංකා මතු වුණේ නැද්ද? කොටස් වෙළෙඳ පොළේ මුදල් ආයෝජනය කරපු විදේශ ආයෝජකයෝ දමලා යන්න පටන් ගත්තේ නැද්ද? ඩොලර් හිඟයක් ඇති වුණේ නැද්ද? එමඟින් රුපියල අවප්‍රමාණ වුණේ නැද්ද? එමඟින් විදේශ රටවලින් ගෙනෙන භාණ්ඩවල මිල ඉහළ ගියේ නැද්ද?

මුළු මහත් ආර්ථිකයම කඩා වැටීමට මේ හොරකම ප්‍රධාන බලපෑම් ඇති කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේක වෙනත් හොරකම් එක්ක සංසන්දනය කරලා මේ මහා පාපයෙන් ගැලවෙන්න තමුන්නාන්සේලාට බැහැ. බැඳුම්කර හොරකමේ සල්ලි තමයි අද රූපවාහිනී නාළිකාවල එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක දැන්වීම් හැටියට යන්නේ. රූපවාහිනී නාළිකාවල දැන්වීම් පුරවාගෙන ප්‍රචාරක කටයුතු කරන්නේ බැඳුම්කර හොරකමෙන් උපයන ලද සල්ලිවලින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හොරකම මේ රටේ ජන ජීවිතය කඩා වැටිටුවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල අහිංසක දරුවෙක් බඩගින්න ඉවසා ගන්න බැරිකමට කෝවක්කා ගෙඩියක් කෑවා. කෝවක්කා ගෙඩිය කාලා, ඇඟේ සීනි මට්ටම නැති වෙලා එම දරුවා මියැදෙනවා. අද මේ රටේ ගම්බද දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න සිද්ධ වෙලා තිබෙනවා. කිලිනොච්චියේ, අම්මා කෙනෙක් ණය ගෙවා ගන්න බැරුව අයිස්ක්‍රීම්වලට වස දමා දරුවන්ටත් කවලා, අම්මාත් කාලා දරුවොත් එක්ක මැරෙනවා; තාත්තා වෙනම මැරෙනවා. දැන් තමුන්නාන්සේලා අර්ජුන ඇලෝසියස්වයි, තව පලිසේනද, කවුද සේන කෙනෙකුයි අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අත් අඩංගුවට අරගෙන ඔන්න සජීවීව එක රූපවාහිනී නාළිකාවක මේක පෙන්වාගෙන යනවා. අත් අඩංගුවට ගත්තා. 10වැනි දාට මෙහා තමුන්නාන්සේලා මෙහෙම දෙයක් කරලා පෙන්වන්න ඕනෑ. එහෙම නොකළොත් පටි රෝල් කියලා සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දීලා තිබෙනවා. ජනාධිපතිවරයාගේ

[ගරු විමල් වීරවංශ මහතා]

පැවැත්ම ආරක්ෂා කර ගන්නත්, එක්සත් ජාතික පාක්ෂිකයා ඡන්ද පොළට ගෙනෙන්නත් මේ මහා හොරකටම එරෙහිව පියවර ගත් බව පෙන්වන්න තමුන්නාන්සේලාට සිද්ධ වෙලා තිබෙනවා. මට ආරංචි විධියට නම් රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙනුත් අහලා තිබෙනවා, "ටික දවසකට රිමාන්ඩ් එකේ ඉඳලා 10 වැනිදායින් පසුව එන්න පුළුවන්. කැමැතිද?" කියලා. මා දන්නා විධියට ඔබතුමා "අකමැතියි" කිව්වා. ඇමතිකමත් අත හැරියා. "මට ඊට වඩා නම් කැප වෙන්න බැහැ" කියලා ඔබතුමා කිව්වා කියලයි මට ආරංචි. බැලුවේ, ඔබතුමාවත් පටලවා දමන්නයි. මේක ඇත්ත කථාව. මහ මොළකරුවාව මේකේදී ඉලක්ක කරන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා මේ ගරු සභාවේදී කථා කළා, මහ මොළකරුගේ මේකට තිබෙන සම්බන්ධය ගැන වචනයක් කිව්වේ නැහැ. මේ අග්‍රාමාත්‍යවරයා තමන්ගේ බලය මේ හොරකම සඳහා පාවිච්චි කරපු විධිය කොහේවත් සඳහන් කළේ නැහැ. කොමිෂන් සභා වාර්තාවේත් කියලා නැහැ. ඇවිච්චෝ-පැවිච්චෝ ටික නිකම් හිරේ දමලා තමුන්නාන්සේලාට අත සෝදා ගන්න බැහැ. ඇවිච්චෝ-පැවිච්චෝ හිරේ දමා අත සෝදා ගන්න බැහැ. මේ රටේ දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න වුණේ මේ හොරකමින් මේ රටේ ආර්ථිකය වට්ටපු හින්දායි. දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න වෙලා තිබෙන්නේ මේ හොරකමින් මේ රටේ ආර්ථිකය වට්ටපු හින්දායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි එකහමාරක, දෙකක පමණ කාලයක් තිබෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගණනේ මට තව විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව විතරක් නොවෙයි, මෙතැනින් එහාට වෙන්නේ මොකක්ද? මේකේ මහ මොළකරු ප්‍රකාශයක් දෙන්න කොමිෂන් සභාවට යන කොට, එදාට ප්‍රශ්න කරන්න නීතිපතිතුමා යනවා. එතැන හිටපු අනෙක් සොලිසිටර් ජනරාල්ලා -යසන්ත කෝදාගොඩලා, දප්පුල ද ලිවේරලා- නැහැ. දැන් ඒ ගොල්ලන් මේ ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන් අයින් කරලා. නීතිපති දෙපාර්තමේන්තුවේ එම එඩිතර නිලධාරීන් මේකෙන් එළියට දමලා. ඒ වෙනුවට එන්නේ නීතිපතිතුමා. නීතිපතිතුමා පත් කරන්නේ ජනාධිපතිතුමා. ඉතින් නීතිපතිතුමා බොහොම අභිංසක විධියට එක ප්‍රශ්නයක්, දෙකක් අහලා, 'බයනැති-අගමැති'ව එළියට එවනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වගකිව යුත්තා කවුද කියලා කථා නොකර, එහෙන් මෙහෙන් ඇවිච්චෝ-පැවිච්චෝ ටිකක් අල්ලා හිර කූඩුවේ දමා හරියන්නේ නැහැ. පර්පවුවෙල් ට්‍රෙෂරීස්වලට ගත් අධික ලාභය ගියේ කාගේ අතටද, ඒක පසුගිය මහ මැතිවරණයේදී මොන-මොන අපේක්ෂකයන්ටද බෙදුවේ, අගමැති ගාව කීයක් තිබෙනවාද, එම සල්ලි බෙදා ගත් අනෙක් ඇමතිලා කවුද? ගෙවල් අරගෙන දීලා, ඒවා හෙළි වී තිබෙනවා. ඒවාට විරුද්ධව නීතිමය පියවර කෝ? වාහන අවභාවිත කළාය කියලා තමුන්නාන්සේලා මාව මාස තුනක් හිරේ දමා ගෙන හිටියා. දැන් ඔය කියන මහා පරිමාණ හොරකමේ වගකිව යුතු කිසිවෙකුට දඬුවමක් නැහැ. කාටද තමුන්නාන්සේලා නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ? පලිසේනයි, පර්පවුවෙල් ට්‍රෙෂරීස්කාරයායි, ඇවිච්චෝ-පැවිච්චෝයි දමලා හරි යන්නේ නැහැ. ලජ්ජාවක්, බයක් තිබෙනවා නම් මේකේ මහ මොළකරුගේ සිට තනතුරුවලින් ඉල්ලා අස් වෙන්න ඕනෑ. බය නැත්නම් මේ රටේ නීතියට, අධිකරණමය ක්‍රියා මාර්ගයට ඉදිරිපත් වෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මලික් සමරවික්‍රම මහත්මයා, පක්ෂයේ සභාපති හැටියට තමුන්නාන්සේට මහ බැංකු අධිපති හම්බ වෙන්න යන්න අයිතියක් නැහැ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I rise to a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මගේ වේලාව ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මලික් සමරවික්‍රම මැතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I was summoned by the Bond Commission as a witness. I gave evidence. The Commission very clearly said that there was no discussion about issuing a Bond at that meeting.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
බොරු කියන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වේලාව ලබා දෙන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නිකම් බොරුවට කෑ ගහන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට මේවා දීලා විපක්ෂ සංවිධායකයා ආම්බාන් කර ගන්න පුළුවන් වුණාට,- [බාධා කිරීමක්] අපිව ආම්බාන් කර ගන්න

බැහැ. මේවා දීලා විපක්ෂ සංවිධායකයාව ඔබතුමාට ආම්බාන් කර ගන්න පුළුවන්. ඔබතුමාගේ නමවත් එතුමා කියන්නේ නැහැ.

එතුමා ඔබතුමාගේ නමවත් කියන්නේ නැහැ. අපි නම කිව්වාම ඔව්වර කිපෙන්න එපා. එතුමාව ආම්බාන් කර ගත්තාට මේවා දීලා අපව ආම්බාන් කරගන්න බැහැ. [බාධා කිරීමක්] දන්නවා නම් නීතිය මාර්ගයෙන් යන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි අල ගිය, මුල ගිය, වැල ගිය තැන් එළිවෙලා ඉවරයි. බොරු කරන්න අයිතියක් නැහැ. "Footnote" කල්ලිය ඉන්නවා. "Footnote" කල්ලිය ගිහින් සල්ලිවලට නොවෙයිද footnotes දැම්මේ; COPE එකේ රැස්වීමේදී කලබල කළේ? ඊයේ රූපවාහිනී සංවාදයකදී COPE එකේ සභාපති හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා පිළිගත්තා කථානායකතුමා මහ බැංකු අධිපති COPE එකට ගෙන එන්න එපා කියා ඉල්ලීම කළ බව. ඒවා පිළිගත්තා. ඕනෑ නම් එතුමාගෙන් අහන්න. මේ හැමෝම මේ හොරකම වහන්නයි හැදුවේ. නමුත්, වහන්න බැරි වුණා. තමුන්නාන්සේලා පටන් ගත්තේ ඉංග්‍රීසියෙන් හොරකම් කරන්නයි. මහ බැංකු බැඳුම්කරය හොරකම් කළාම මිනිසුන්ට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේක ඉංග්‍රීසියෙන් කරපු හොරකමක්. මේකෙන් මේ රටේ ආර්ථිකය පතුලටම වැටුණා. මේ රටේ දරුවන් කෝවක්කා ගෙඩි කාලා මැරෙන තත්ත්වයට පත් කළා. ඒ නිසා මේ හොරකම කරපු අයට එරෙහිව නීතිය නිවැරැදිව ක්‍රියාවට නංවන්න. ඇවිල්ලා-පැවිල්ලා නිරේ දාලා "ඔන්න අපි වැඩේ දුන්නා" කියලා තමුන්නාන්සේලා සිහිති ආතල් ගන්න ගියාට මේ රටේ ජනතාව ඒකට රැවටෙන්නේ නැහැ කියන එක අපි අවධාරණය කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා. එතුමාගේ කතාවට කලින් කිව යුතු දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන කොට ඒ අය මෙහි නැත්නම් ඒ අයට කතා කරන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන කොට ඒ කොටස් හැන්සාඩ් වාර්තාවලින් ඉවත් කරන්න වෙනවා. ඒ වාගේම සාධාරණ අවස්ථාවක් දෙන්නත් පුළුවන්, ඒ අයට නැවත ඇවිල්ලා ඒ පිළිබඳ ප්‍රකාශයක් කරන්න ඉඩ දීම තුළින්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ මන්ත්‍රීවරුන් අද මේ ස්ථානයට ඇවිත් නැත්නම්, තවත් දවස් දෙකක් මේ විවාදය පැවැත්වෙන නිසා මේ වැදගත් විවාදයේදී ඔවුන්ට පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා ඒ Reportsවල තිබෙන නම් ගම් මෙතැනදී සඳහන් කරන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම්, මෙතැන විවාදයක් කරන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාරණය පැහැදිලියි.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.59]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Malik Samarawickrama, you were away when your name was mentioned.

ගරු මලික් සමරවික්රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමාගේ නමවත්, මගේ නමවත් මේ බැඳුම්කරයට කිසිසේත් සම්බන්ධ වෙලා නැහැ. ඒ වාර්තාවේ එවැන්නක් කිසිසේත් නැහැ. මඩ ගහනවා පමණයි. බොරුවට ඒ ගැන කතා කරන්න අවශ්‍ය නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
සාක්කි දීලා නැද්ද?

ගරු මලික් සමරවික්රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
සාක්කි දීලා- ඒ සාක්කියේ කියා තිබෙනවා, ඒ සාකච්ඡාවේ බැඳුම්කරය ගැන කතා කළේවත් නැහැ කියා. ඒක නේ එහි කියා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මගේ වෙලාව. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා. [බාධා කිරීමක්] Order please! The Hon. (Dr.) Harsha De Silva is on his feet. Let him speak.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි. මම අද "DailyMirror" පුවත් පතේ "Business" Section එකේ මුල පිටුව **සභාගත*** කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙහි කියනවා, "EPF gets zero returns from majority of private equity investments" කියා; සේවක අර්ථ සාධක අරමුදලේ 2014 වන කල් කරපු ආයෝජනවලින් ලැබී තිබෙන return එක "0" කියා. මා කියවන්නම් මෙය. මෙහි මෙසේ සඳහන් වනවා:

> "According to a Right to Information disclosure the Central Bank made to Mirror Business - following significant delays in processing the inquiry, due to the scope of the data requested - the pension fund had provided in total Rs. 10.8 billion in private equity funding to seven firms during the period in question."

It further states, I quote:

> "…. (EPF), which is under the custodianship of the Central Bank, has to this day not generated any returns for the Rs. 9.3 billion in private equity investments made up to 2014."

මෙන්න මේක තමයි වැදගත්. 2014 වන කල් වූ මගඩිය පිළිබඳව සොයන්න අවශ්‍යයි කියන තැනට අප එන්න ඕනෑ.
It goes on to state, I quote:

> "The figure in comparison is a little more than the moneys the state is said to have lost during the infamous treasury bond scams in 2015 and 2016."

මොකක්ද මේ කියන්නේ? මා අහගෙනයි, කවුදෝ -ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාද කොහේදෝ- අහනවා, "2015 වර්ෂයට කලින් මේ මගඩිය වෙලා තිබෙනවා. එහි අලාභය -පාඩුව- මේ අලාභයට වඩා වැඩියි කියා කියන්නේ කවුද?" කියා. තොරතුරු දැනගැනීමේ පනත හරහා මහ බැංකුවෙන් ලබාගත් තොරතුරු අද "DailyMirror" පුවත් පතෙහි වාර්තා කර තිබෙනවා. ඒ තොරතුරුයි මේ තිබෙන්නේ. මෙහි කියනවා, මහ බැංකු ගනුදෙනුවෙන් වූ පාඩුවට වඩා විශාල පාඩුවක් මේ වෙළඳ පොළ හරහා, transactions 7කින් පමණක් සිදු වෙලා තිබෙනවා කියා. මා සභාගත කළ ලිපියේ ඒ බව සඳහන් කර තිබෙනවා. පසුව ඒ පිළිබඳව සාකච්ඡා කරමු.

අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ මැතිතුමා ඊයේ අධිකරණයට ඉදිරිපත් කරපු යෝජනා අද "ඩේලි නිවුස්" පත්තරයේ ඉදිරිපත් කරලා තිබෙනවා. එහි මෙසේ සඳහන්ව තිබෙනවා.

I quote:

> "Meanwhile, ASG Kodagoda explained that this magisterial inquiry was not solely based on the Bond Commission report but a complaint made by Central Bank Governor Indrajith Coomaraswamy."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ගම්‍ය වන්නේ මේ වෙලා තිබෙන ගනුදෙනුව සම්බන්ධයෙන් කමිටු වාර්තාවක් ඉස්සෙල්ලා ඉදිරිපත් වුණා; පිටිපන කමිටු වාර්තාව. COPE එක ඒ දිහා බැලුවා. COPE වාර්තාවේ 10 වන පිටුවේ තිබෙනවා, "ඉහත කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් නිසි රාජ්‍ය අධිකාරියක් මඟින් පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු බව ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පත් කරන ලද ඉහත කී ත්‍රි පුද්ගල කමිටුව විසින් ද නිගමනයකොට තිබුණි." කියලා. එතකොට COPE වාර්තාවෙන් පිළිගන්නවා, අගමැතිතුමා නියම කරපු ආකාරයට මේ පිළිබඳව පූර්ණ අධීක්ෂණයක් කළ යුතුයි කියලා මේ කමිටුව මඟින් නියම කරලා තිබෙන බව.

ඊළඟට, Naufel Abdul Rahman, Secretary to the Leader of the House of Parliament, in November 2016 writes to the Attorney General, Jayantha Jayasuriya and says, "Hon. Prime Minister has directed me to forward the undermentioned documents for your information and necessary action". අවශ්‍ය කටයුතු සඳහා අපි මේක යොමු කරනවා කියලා. මොකක්ද යොමු කරන්නේ? Report of the Committee on Public Enterprises - COPE - Parliament Series No. 109 tabled on 28th October, 2016. ගරු නියෝජ්‍ය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කථානායකතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ මෙතැන යම්කිසි හුටපටයක් තිබුණු බව, වංචාවක් තිබුණු බව ඒ අවස්ථාවේදීම අපට සාක්ෂිවලින් ඔප්පු වුණේ නැති වුණත් පිටිපස වාර්තාව හා ඊටපස්සේ COPE වාර්තාවෙන් ලැබුණු නිර්දේශ අනුව වහාම නීතිපතිවරයාට දන්වලා තිබෙනවා, "විමර්ශන පටන් ගන්න." කියලා. ඒ වාගේම අපි සතුටු වෙනවා, නීතිපතිවරයා විසින් නඩු ගොනු කරලා අර්ජුන් ඇලෝසියස් සහ කසුන් පලිසේන අත් අඩංගුවට ගන්නා ලෙස කරපු ඉල්ලීම ගැන. ඒ අය අත් අඩංගුවට ගන්න අධිකරණයෙන් නියෝගය ලැබිලා තිබෙනවා. ඔවුන්ව අත් අඩංගුවට අරගෙන තිබෙනවා.

තව කාරණයක් මම කියන්න කැමතියි, සමහරු කියනවා, අර්ජුන් මහේන්ද්‍රන් පිළිබඳව ඉල්ලීමක් කරලා නැහැ, ඔහුට නිදැල්ලේ ඉන්න පුළුවන් කියලා. නමුත් මෙහි සඳහන්ව තිබෙනවා, "ඉහත නම් සඳහන් පළමුවෙනි සැකකරු ලක්ෂ්මන් අර්ජුන් මහේන්ද්‍රන් මේ වන විට සිංගප්පූරුවේ පදිංචිව සිටින බවට බුද්ධි තොරතුරු ලැබී ඇත. ඉහත සඳහන් අපරාධ වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කිරීමට අවශ්‍යයි. එසේ හෙයින් ඔහුව ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍යතාවක් පවතී. එබැවින් ජාත්‍යන්තර පොලිසිය -INTERPOL- හරහා ඔහුට බාරදීම පිණිස 2018.02.15 දිනට පෙර ශ්‍රී ලංකාවට පැමිණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කරන ලෙසට නිවේදනයක් ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන්න." කියලා. එහෙම නම් කිසි කෙනෙක් ඉවත් කරලා නැහැ. කවුද කිව්වා වාගේ තෝරු මෝරු ඇරලා පොඩි හාල්මැස්සන් අල්ලන්න නොවෙයි, උත්සාහ කරන්නේ. වරදක් වෙලා තිබෙන බවට දැන් සාක්ෂි තිබෙන නිසා ඔවුන්ව අත් අඩංගුවට අරගෙන නිසි පිළිවෙළට අධිකරණයට ඉදිරිපත් කරලා වැඩකටයුතු ආරම්භ කරන්න කියලා රජය විසින් නීතිපතිවරයා හරහා අධිකරණ ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ පළමු වතාවට තමයි COPE වාර්තාවක් මෙච්චර දුර ගිහිල්ලා තිබෙන්නේ. මේ COPE වාර්තාවෙන් සියලුම වැරදිකරුවන්ට දඬුවම් කරන්න නිර්දේශ කරලා තිබෙනවා. ඒකත් ඉස්සරහට අරගෙන යනවා. මා හිතන්නේ ලොකු පරිශ්‍රමයක් දරලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් කිසිම විධියක දේශපාලන න්‍යාය පත්‍රයකට හෝ පෞද්ගලික න්‍යාය පත්‍රයකින් තොරව මේ වැඩ කටයුත්ත කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඉස්සෙල්ලාම මේ පුද්ගලයන්ට මේ පිළිබඳව දැනුවත් කරන්න අපි 2012දී කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇලෝසියස්ලත් එක්ක කිසිම විධියකට අල්ප මාත්‍රයකින්වත් සම්බන්ධකමක් අපට නැහැ, අපි දැකලත් නැහැ, කිසිම දවසක කථා කරලත් නැහැ කියලා මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි. ඒවා මේ වාර්තාවල සක්සුදක් සේ පැහැදිලි වෙනවා. අපි පෞද්ගලිකවම ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් තමයි කරන්නේ. නිවැරදි දේට නිවැරදි කියන්නත්, වැරදි දේට වැරදියි කියන්නත් අපට ශක්තිය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සම්බන්ධයෙන් කොයි ආකාරයට ද හැසිරිලා තිබෙන්නේ කියලා මම විනාඩි කිහිපයක් අරගෙන මේ රටට පෙන්වන්න කැමතියි. COPE වාර්තාවේ 53 වන පිටුවේ මෙහෙම සඳහන් වෙනවා:

> "...එවකට මහ බැංකුවේ අධිපතිව සිටි අර්ජුන මහේන්ද්‍රන් මහතා මැදිහත්වීමක් හෝ බලපෑමක් සිදු කළ බවට සාධාරණ සැකයක් ඇති විය හැකි ආකාරයේ සාක්ෂි හා කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බවට කාරක සභාව නිරීක්ෂණය කරයි..."

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "අර්ජුන මහේන්ද්‍රන් කිසි විධියකට බැඳුම්කර ගනුදෙනුවට මැදිහත්වීමක් වෙලා තිබුණේ නැහැ." කියලා අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා කියලා. එතුමා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි සටහනක් ඉදිරිපත් කරමින් කියලා තිබුණේ, අර්ජුන මහේන්ද්‍රන් සහ එවකට හිටපු නියෝජ්‍ය අධිපතිවරුන් තුන්දෙනා වන බී.ඒ.ඩබ්ලිව්. ආනන්ද සිල්වා, ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ සහ පී. සමරසිරි කියන නිලධාරින් තුන්දෙනා එතුමාව දැනුවත් කරපු ආකාරයටයි. නමුත්, ඒ වෙලාවේ නොතිබුණු සාක්ෂි COPE එකේදී අපට අනාවරණය වුණා. ඒ නිසා තමයි COPE එකේ සියලුම සාමාජිකයන් වාගේම සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාම ඒ වෙලාවේ ඒ දේ කිව්වේ.

ඒකෙන් අර්ථකථනය වන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් යම් වෙලාවට තිබුණේ නැති සාක්ෂි පසුව ලැබෙනකොට, පසුව ලැබුණු සාක්ෂි අපි පාවිච්චි කරලා කළ යුතු දේ මොකක්ද කියලා නිර්දේශ කරලා, ඒ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකේ සාමාජිකයෙක් හැටියට මම කාරණයක් කියන්න කැමැතියි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමක් හිටියා. මේ මන්ත්‍රී කණ්ඩායම අපට කිව්වා, "COPE එක වංචාකරුවන් ආරක්ෂා කරන්න උත්සාහ කරලා තිබෙනවා." කියලා. මම කැමැතියි මෙම ජනාධිපති පරීක්ෂණ කොමිසන් වාර්තාවෙන් ඉදිරිපත් වෙන නිර්දේශවලින් මෙහි ඇත්ත වශයෙන්ම එවැනි දෙයක් සිදු වෙලා තිබෙනවාද කියලා පෙන්වන්න. ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාවේ 656 සිට 672 වන පිටුවල ඔය කියන පාදසටහන් ගැන සඳහන් වෙලා තිබෙනවා. එහි 671 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "... this Commission of Inquiry has found that, the Footnotes made by nine members of COPE .....are, in the main, limited to factual observations and that these Footnotes are not incorrect or unreasonable. We also note that, these ... members of COPE .... have recommended, by way of Footnote 26, that, an investigation is held to ascertain whether Perpetual Treasuries Ltd has made large profits by the sale of Treasury Bonds in the Secondary Market to the EPF or other State owned institutions."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාව අනුව සමස්තයක් විධියට මෙම පාදසටහන් අසත්‍ය හෝ අසාධාරණ නොවන බවයි. එසේම මෙම පාදසටහන් මඟින් මෙම පරීක්ෂණය තවදුරටත් පුළුල් කරන්න ඉල්ලා තිබෙන බව මෙම ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාවේ සඳහන් කරනවා.

සමහරු මඩ ගැසීම සඳහා පාවිච්චි කරන බොරුවට වඩා ඇත්ත මොකක්ද කියන එක ගැන මම විනාඩි කිහිපයක් අරගෙන ජනතාව දැනුවත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ පාද සටහන් 32ක් තිබෙනවා. මෙන්න මෙහෙමයි ඒ සම්බන්ධයෙන් කියා තිබෙන්නේ. පාද සටහන් අංක 1, 2, 3 කෝප් වාර්තාවේ 4.1.1, 4.1.2 යන ඡේද සමඟ සම්බන්ධ වේ. මෙම පාද සටහන් මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 4, 5, 6 කෝප් වාර්තාවේ 4.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 7 කෝප් වාර්තාවේ 4.6 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම පාද සටහන මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව සාක්ෂි අනුව සනාථ වී ඇති බව කොමිසම සඳහන් කරයි. පාද සටහන් අංක 8 කෝප් වාර්තාවේ 5.1.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම නිරීක්ෂණ නිවැරදි බව සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 9 කෝප් වාර්තාවේ 5.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කෝප් වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් වන්නේ,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

බැඳුම්කර නිකුතු දිනයට පෙර සතියේ ද්විතීයික වෙළෙඳ පොළ තුළ වසර තිහක බැඳුම්කර සඳහා 9.48ක සාමාන්‍ය ඵලදා අනුපාතයක් පැවැති බවයි. ජනාධිපති කොමිසම පවසා තිබෙන්නේ, මෙම සටහන මඟින් එය නිවැරදිව නිරීක්ෂණය වන බවයි. පාද සටහන් අංක 10, 11, 12 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. පාද සටහන් මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 14 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම පවසා තිබෙන්නේ, හත්වන පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව විසින් කෙටුම්පත් කළ අතුරු වාර්තාවේ උපුටනයක් ලෙස එය පෙනෙන බවයි. පාද සටහන් අංක 15 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම සඳහන් කරන්නේ, ප්‍රධාන කෝප් වාර්තාවේ මේ සම්බන්ධයෙන් තිබෙන කොටස නිවැරදි නොවන බවයි. මේ නිසා පාද සටහන නිවැරදි නොවන බව කොමිසම පෙන්වා දී ඇත. ඒ කියන්නේ, කෝප් වාර්තාවේ ගැටලුවක් තිබෙනවා කියන එකයි මේ කොමිසමෙන් ඉදිරිපත් කරන්නේ. ඒක පාද සටහනේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක වාර්තාවේ තිබෙන ගැටලුවක්. පාද සටහන් අංක 16 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. මේ සම්බන්ධයෙන් කෝප් කමිටුවට සාක්ෂි නොතිබුණු බව සඳහන් කරනවා. පාද සටහන් අංක 17 මඟින් කරන නිරීක්ෂණ නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 18 කෝප් වාර්තාවේ 5.7 ඡේදය සමඟ සම්බන්ධ වේ. එම පාද සටහන මඟින් කරන නිරීක්ෂණ නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 19 කෝප් වාර්තාවේ 6වන ඡේදය සමඟ සම්බන්ධ වේ. ජනාධිපති කොමිසම පවසා තිබෙන්නේ, මෙම පාද සටහනේ තිබෙන්නේ, මෙම ප්‍රශ්නය පිළිබඳව සලකා බැලීමේදී ආචාර්ය අසීම් ලබා දුන් සාක්ෂි වැදගත් බවයි; නිවැරදි බවයි. පාද සටහන් අංක 20 කෝප් වාර්තාවේ 6.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහනේ ඇතුළත් වන්නේ, අවාසිය ගණනය කිරීමේදී ඍජු ක්‍රමය භාවිත කළ හැකි හෝ යුතු බව උපකල්පනය කිරීම නිවැරදි නොවන බවයි. එතැනදී ගැටලුවක් මතු වෙනවා. මොකද, direct placement කරන්න කාලයක් තිස්සේ සිට මොවුන්ට official sanction එකක් තිබුණේ නැති වුණත්, 2008 වසරේ ඉඳලා 2014 වසර වෙනකල් ඍජු ක්‍රමය - direct placement - පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක තමයි කොමිසම කියා තිබෙන්නේ, 2008 වසරේ ඉඳලා මේ ගැන හොයන්න කියලා.

පාද සටහන් අංක 21 කෝප් වාර්තාවේ 6.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන නිවැරදි බව සඳහන් කර ඇත. පාද සටහන් අංක 22 කෝප් වාර්තාවේ 6.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම විසින් සඳහන් කර තිබෙන්නේ, අදාළ කාරණාව මෙම පාද සටහන මඟින් නිවැරදිව නිරීක්ෂණය කර තිබෙන බවයි. පාද සටහන් අංක 23 කෝප් වාර්තාවේ 6.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 24 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. කෝප් කමිටුව ඉදිරියේ මේ සම්බන්ධව ඉදිරිපත් වූ සාක්ෂි පිළිබඳව කොමිසම දැනුවත් නැති බව මෙහිදී සඳහන් කර තිබේ. පාද සටහන් අංක 25 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන මඟින් බැඳුම්කර නිකුතුව පිළිබඳව, 2016 මාර්තු 29වන දා නිකුතුව පිළිබඳව, සවිස්තරාත්මක පරීක්ෂණයක් අවශ්‍ය වන බව නිවැරදිව කාරක සභාවට පෙනී යන්නේ යයි සඳහන් වන බව ජනාධිපති කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 26 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ.

කොමිසම පවසා තිබෙන්නේ, පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගම ද්විතීයික වෙළෙඳ පොළේ විශාල ලාභයක් ලබා ගත් බව මෙම පාද සටහන මඟින් නිවැරදිව සඳහන් කර තිබෙන බවයි. ඊට අමතරව, අධික පොලියක් සහිත බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළේදී පර්පෙවුවල් ට්‍රෙෂරීස් සමාගම මිලදී ගත්තේ රජයට අයිති සේවක අර්ථ සාධක අරමුදල වැනි අරමුදල්වලින් ද යන්න සොයා බැලීම සඳහා පුළුල් පරීක්ෂණයක් කළ යුතු බව දන්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හරහා තමයි මේ මුළු මගඩියම එළියට ආවේ. මේක ඉතාමත්ම වැදගත්. මම ඒ 26 වන පාද සටහන ගැන නැවත කියන්න කැමැතියි. මේ 26 වන පාද සටහනේ තමයි, වැදගත්ම කාරණාව තිබෙන්නේ. ඒ ගැන තමයි බැඳුම්කර නිකුතුවට අදාළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 671 වන පිටුවේ මෙසේ සඳහන්ව තිබෙන්නේ. I quote:

> "... have recommended, by way of Footnote 26, that, an investigation is held to ascertain whether Perpetual Treasuries Ltd has made large profits by the sale of Treasury Bonds in the Secondary Market to the EPF or other State owned Institutions."

සමහර වෙලාවට මේවායේ තිබෙන කාරණා සම්බන්ධයෙන් නොදැනුවත්ව සමහර අය නොයෙකුත් කථා කියනවා. නමුත්, මේ රුපියල් බිලියන 8.5ක වංචාව පිළිබඳව සඳහන් වන මේ පාද සටහන හරහා තමයි කෝප් වාර්තාව නිවැරදි වෙලා තිබෙන්නේ කියලා කොමිසම ඉදිරිපත් කරන නිර්දේශවල තිබෙනවා. වෙන කවුරුත් මේක දැකලා නැහැ.

27වන පාද සටහන 8.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම සඳහන් කර තිබෙන්නේ මෙම පාද සටහන මඟින් 2008 සිට 2016 දක්වා සිදු වූ බැඳුම්කර නිකුතු ගැන පරීක්ෂණයක් කළ යුතු බවත්, සාක්ෂි විමසීමේදී වෝහාරික විගණනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා තිබෙන බවයි.

මෙන්න මේ පාද සටහනට තමයි විපක්ෂයේ සමහර අය භය වෙලා තිබෙන්නේ. මම ඊයේ-පෙරේදා දැක්කා, රාජපක්ෂලාගේ කට්ටිය කරපු ප්‍රකෝටි ගණන් හොරකම් හොයන්න ජනාධිපතිවරයාත් ඉතාම තදින් ක්‍රියාත්මක වනවා කියලා කියනවා. ඒ මේ පාද සටහන නිසායි.

28වන පාද සටහන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 8.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. එම පාද සටහන අදාළ කාරණාව නිවැරදි නිරීක්ෂණය කර තිබෙන බව කොමිසම සඳහන් කර ඇත.

29වන පාද සටහන, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 9.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. ජනාධිපති කොමිසම සඳහන් කර තිබෙන්නේ සේවක අර්ථසාධක අරමුදල සතු අරමුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කිරීම ගැන විශේෂ ප්‍රතිපාදන සකස් කළ යුතු බව මෙම පාද සටහන මඟින් කියා තිබෙන බවයි. එසේ කියා මේක අනුමත කරනවා. බලන්න, ඇත්ත වශයෙන්ම අපි එකතු කරලා තිබෙන වැදගත් කාරණා මේවා තමයි.

30වන පාද සටහන ගැන කියා ඇත්තේ වෙන්දේසිය ගැන ප්‍රකාශයට පත් කළ දැන්වීමේ 12.5% පොලී අනුපාතය සඳහන් කර තිබුණේ යම් සමීක්ෂණයක් සඳහා සම්කරණයක් අනුව බව මහ බැංකු නිලධාරීන් විගණකාධිපතිවරයාට පවසා තිබූ බව මෙම සටහනේ ඇතුළත් වන බවයි. එය අනුමත කර තිබෙනවා.

31වන පාද සටහන 9.4 ඡේදයට අදාළවයි. 9.4 ඡේදයේ මානෘකාව වෙනස් කිරීම ගැන අදහස් පළ කර තිබෙනවා. එය පිළිගෙන තිබෙනවා. 32වන පාද සටහන නිවැරදි බව ජනාධිපති කොමිසම පිළිගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කථාව කිව්වේ, මේ ජනාධිපති කොමිෂන් වාර්තාව නොකියවා සමහර පුද්ගලයෝ මේ

පිළිබඳව නොයෙකුත් මත සමාජගත කරන්න උත්සාහ කරන නිසායි. මේ වාර්තාවේ පාද සටහන් එකක් හෝ දෙකක් හැරෙන්න -පිළිනොගැනීමටත් හේතු දීලා තිබෙනවා,- අනික් කරුණු සියල්ල ජනාධිපති කොමිසම පිළිගෙන තිබෙනවා. එහෙම නම්, අපට කියන්න වෙන්නේ මේ කොමිසම පිළිගෙන තිබෙන්නේ මේ සියලු පාද සටහන් සහිත වාර්තාව බවයි.

එතැනදි මම තව එක දෙයක් කියන්න කැමැතියි. ජනාධිපති කොමිෂන් වාර්තාවේ 657 වන පිටුවේ සඳහන් වන පරිදි කෝප් එකේ සභාපති වූ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීවරයාගෙන් කොමිසම මෙසේ විමසනවා:

"In this connection, when the Commission of Inquiry asked Mr. Handunnetti, whether there were different opinions ["මත"]', ..."

එතුමාගෙන් අහනවා, "මේ පාද සටහන්වලින් අදහස් කරන්නේ මොකක්ද, මත පිළිබඳව වෙනසක්ද තිබෙන්නේ?" කියලා. එතකොට හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මෙසේ උත්තර දෙනවා. මා එම කොටස කියවනවා:

"ඇත්තටම ගරු සභාපතිතුමනි, ඒකේ මත වලට වඩා පැහැදිලි කිරීම්වල වෙනස්කම තිබුනෙ.".

ඒ පිටුවේම මෙසේත් සඳහන් වෙනවා:

"Mr. Handunnetti emphasized that all 24 members of COPE who actively participated in the inquiry, unanimously agreed to all the Recommendations set out in the Report."

මොකක්ද මේ කියන්නේ? මේකේ කියනවා, එක්සත් ජාතික පක්ෂය කියලා නොවෙයි, අනික් පක්ෂය කියලා නොවෙයි, මේකට සම්බන්ධ වුණු 24දෙනාම ඒකමතිකව කියලා තිබෙන බව "මේ වැරදි කරපු කට්ටියට දඬුවම් දෙන්න" කියලා. අර්ජුන මහේන්ද්‍රන් මහත්තයා මැදිහත් වෙලා තිබෙනවා; බලපෑම් කරලා තිබෙනවා; ඔහු වැරැද්දක් කරලා තිබෙන බව මේකෙන් පෙනෙනවා; එම නිසා ඔහුට දඬුවම් කරන්න කටයුතු කළා කියලා ඒකමතිකව මේකේ කියලා තිබෙනවා.

මෙතැන ඉතාමත්ම වැදගත් කාරණාව තමයි, සමහරු එල්ල කළ විවේචනවලට මේ ජනාධිපති කොමිෂන් සභාවේ හිටපු විනිශ්චයකාරවරුන් දෙදෙනා සහ retired Deputy Auditor-General මාස ගණනාවක් සාකච්ඡා කරලා උත්තර දීලා තිබීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම "Report of The Commission of Inquiry to Investigate, Inquire and Report on the Issuance of Treasury Bonds During the Period from 1st February 2015 to 31st March 2016"හි පාද සටහන් සම්බන්ධයෙන් ඇති අංක 661 සිට 671 දක්වා පිටු **සභාගත*** කරනවා.

එහෙම නම් කාටවත් කියන්නට බැහැ අපි හොරු රකින්නට උත්සාහ කළා කියලා. අපිට හොරු රකින්නට කිසිම අවශ්‍යතාවක් නැහැ. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ හොරු රකින එක නොවෙයි; හොරුන්ට දඬුවම් දෙන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළේ 2012 ඉඳලා.

මම 2012 පෙබරවාරි මාසයේ "Sri Lanka BRIEF" වෙබ් අඩවියට කළ ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමායි, වසන්ත සමරසිංහ මැතිතුමායි, මමයි Laugfs Holdings එක manipulate කළ හැටි ගැන කොහොමද කියලා තිබෙන්නේ කියලා බලන්න. වසන්ත සමරසිංහ මැතිතුමා අපිත් එක්ක ඉන්න වෙලාවේ කියූ දේ ඉහත වාර්තාව සඳහන් කළේ, "He also charged that the share price of Laugfs Holdings was also manipulated…" යනුවෙනුයි. උදේ 10.00ට එහි share price එක රුපියල් 38ට තිබුණා. උදේ 11.00 වන විට රුපියල් 48ට ගියාම කොටස් ලක්ෂයක් වික්කා. ඒක එක පුද්ගලයෙක් ගත්තා. ඒ නම මෙතැන සඳහන් වෙනවා. ඒ ගත්තේ රුපියල් 48 ගණනේ. ඉන් පසුව හවස 2.00 වන විට ඒක ආයෙත් රුපියල් 40ට අඩු වුණා. මේ පුද්ගලයා අර්ථ සාධක අරමුදලට රුපියල් කෝටි ගණනක අලාභයක් වන විධියට මේ වැඩසටහන ක්‍රියාත්මක කළා. ඒ වෙලාවේ අජිත් නිවාඩ් කබ්‍රාල්ගෙන් මාධ්‍යවේදියා අහන විට එතුමා කියලා තිබෙනවා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, අර්ථ සාධක අරමුදල ඉතාමත්ම හොඳට කළමනාකරණය වෙනවා" කියලා.

මම 2012 ජූනි මාසයේ 28වෙනි දා අර්ථ සාධක අරමුදලේ රුපියල් බිලියන 12ක වංචාවක් සම්බන්ධව කථා කළා. මේ බිලියන 12 හැදුණු හැටි කියා තිබෙනවා, the largest losses are from the investments in Laugfs, රුපියල් බිලියන 1.8යි; in Vallibel One, රුපියල් මිලියන 740යි; in Lighthouse Hotels, රුපියල් මිලියන 87යි; in LOLC and Browns, රුපියල් බිලියන 1.9යි; in Ceylon Grain Elevators, රුපියල් මිලියන 713යි; in Galadari Hotel, රුපියල් මිලියන 470යි. නමුත්, එදා මේවා ගැන කිසිම පරීක්ෂණයක් කළේ නැහැ.

2012 නොවැම්බර් මාසයේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සහ මම කොයි ආකාරයටද මේ හොරකම් සිද්ධ වෙන්නේ කියලා කළ සාකච්ඡාවක්, blatant manipulations ගැන තවත් ලේඛනයක් මම **සභාගත*** කරනවා.

ඊළඟට, 2014 මැයි 31වෙනි දා "The Island" පුවත් පතට මම කියනවා, "I am very disappointed with the Public Accounts Committee" කියා. මොකද එදා Public Accounts Committee එකට - COPA එකට - බැරි වුණා අර්ථ සාධක අරමුදල වෙනුවෙන් මහ බැංකුවේ අධිපතිවරයාව අවුරුදු 6ක් යනකම්ම, -2007 ආවාට පසුව 2013 වෙනකම්- ගෙන්වා ගන්නට. එදා මහ බැංකුවේ පුද්ගලයන් අර්ථ සාධක අරමුදල හූරාගෙන කාලා, දූෂණය කරලා, වංචා කරලා COPE එකට ආවේවත් නැහැ; COPA එකට ආවේවත් නැහැ. එහෙමද මේ වැඩ කටයුත්ත වෙන්නට ඕනෑ? එහෙම නොවෙයි. එදා වැන්දා. මෙතැනදී එම පුවත් පතට මම තවදුරටත් මෙහෙම කියනවා. I quote:

"After one and half years the Public Accounts Committee (PAC) has failed to summon the Governor of the Central Bank and the Secretary of Labour (Ministry) following the abrupt adjournment of the EPF examination by the Committee on February 6, 2013".

ඊට පස්සේ 2013 පෙබරවාරි 06වෙනි දා Committee එකට ඇවිල්ලා ටික වෙලාවකින් නැඟිටලා ගියා. ඉන් පසුව එම වාර්තාවේම තවදුරටත් කියනවා, "I have initiated more than a dozen reminders" යනුවෙන් මා සඳහන් කළ බව. 12 වතාවකට වඩා මම මේ පාර්ලිමේන්තුවට දන්වලා තිබෙනවා මහ බැංකුවේ අධිපතිවරයාට කථා කරන්නට කියලා. නමුත්, මේ පාර්ලිමේන්තුවට එදා බැරි වුණා පටන් ගත්ත meeting එක මාස

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

13ක් යනකම් ඉවර කරන්න. එහෙමයි එදා රාජපක්ෂලා මේ පාර්ලිමේන්තුව, -ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා වාගේ- යකඩ බූට් එකට යට කරගෙන හිටියේ. එදා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වාගේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් COPE එකේ සභාපති හැටියට හිටියේ නැහැ. එතුමාට අපේ ලොකු ගරුත්වයක් තිබෙනවා. එතුමා ඒ වැඩ කටයුත්ත හරියට කරගෙන ගියා. යම් යම් අවස්ථාවල එතුමාටත් ආතතියට මුහුණ දෙන්නට සිදු වුණා; ප්‍රශ්න පැන නැඟුණා; නොයෙකුත් හේතූන් ඇති වුණා. නමුත් ඊට කලින්, කිසිම විධියකට ඒ කට්ටිය ගැන සොයන්නට බැරි වුණා.

ඔය ඇලෝසියස්ලා ගැන මම 2017 ජූනි මාසයේ 5වැනි දා පාර්ලිමේන්තුවේදී කථා කරලා තිබෙනවා. මම කියනවා, Ceylon Grain Elevators එකේ රුපියල් 50ට තිබුණු කොටස රුපියල් 250 දක්වා උස්සලා EPF එකට රුපියල් 187ට අතහැරියේ කොයි ආකාරයෙන්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් එදා කිසිම විධියකට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න අපට හැකියාවක් තිබුණේ නැහැ. දේශපාලනඥයන්ගේ බලය අපි දැන් ජනතාවට ලබාදී තිබෙනවා. එදා දේශපාලනඥයන්ට පුළුවන් වුණා, අයුතු ලෙස බලය පාවිච්චි කරලා තමන්ට ඕනෑ විධියට වැඩ කරන්න. 2015 ජනවාරි 08වැනි දා ඇති වුණු වෙනසින් මොකක්ද සිද්ධ වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බලය ජනතාවට හම්බවෙලා තිබෙනවා. ජනතාව තමයි දැන් ඒ බලය පාවිච්චි කරන්නේ. ජනතාවට පුළුවන්, හරි දේ කරන්න කියලා පාර්ලිමේන්තුවට බල කරන්න; නීතිපතිවරයාට බල කරන්න; අධිකරණයට බල කරන්න; ජනාධිපතිවරයාට බල කරන්න. එම නිසා තමයි දැන් මේ කට්ටිය භයවෙලා මේ බලය නැවත උදුරාගන්න උත්සාහ කරන්නේ. අපි අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරලා තිබෙනවා. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවට අනුව පරණ හොරුන් අල්ලන්න වෙනවා. ජනාධිපතිතුමාට ඒක ඉතාමත්ම ඕනෑකමින් කියන්න අපට සිද්ධ වෙනවා. මිනිස්සු අපෙන් අහනවා, "අවුරුදු 3ක් පොල් ගෑවාද, ඇයි හොරු අල්ලන්නේ නැත්තේ" කියලා. පරණ හොරුන්ට දඬුවම් දෙන්න කියලා අපි නැවතත් ඉල්ලනවා. අපි පසුගිය කාලයේ දිගින් දිගටම ඉල්ලුවේ ඒකයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළේ නැත්නම් අපටත් තීරණයක් ගන්න වෙනවා. ඒ හොරු අල්ලන්න බැරි නම්, මේ ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු මේ රජය ගැන අපටත් තීරණයක් ගන්න වෙනවා, මොකක්ද අපි කරන්නේ කියලා. මොකද, හොරු අල්ලන්න තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. හොරු ඇල්ලීම සඳහා අපි සියලු වැඩ කටයුතු කරලා තිබෙනවා. අපි කිසිම හොරෙක්, වංචනිකයෙක් ආරක්ෂා කරන්න කිසිම තැනක වැඩ කරලා නැහැ. නොයෙකුත් කට්ටිය නොයෙකුත් මඩ ප්‍රචාර අරන් ගියාට ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ සටහන්වලිනුත් පෙන්වා දී තිබෙනවා, අපි කිසිම කෙනෙක් සෝදන්න ගිහිල්ලා නැහැ, එම නිසා මෙම වාර්තාව තව දුරටත් ශක්තිමත් වෙලා තිබෙනවා කියලා. බලන්න, මේ PRECIFAC වාර්තාවේ තිබෙනවා, "හොරු, පට්ටපල් හොරු කොයි ආකාරයටද හොරකම් කළේ" කියලා. දූෂණය නමැති හොරකම ගැන කථා කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දූෂණය නමැති හොරකම පිළිබඳව නිටපු ජනාධිපතිවරයාටත් චෝදනා එල්ලවෙලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂට චෝදනා එල්ලවෙලා තිබෙනවා. ඒ වාගේම අපට විරුද්ධව ඡන්දය ඉල්ලන කෝට්ටේ හිටපු නගරාධිපති ජනක රණවකලාට, දෙහිවල - ගල්කිස්ස හිටපු නගරාධිපති ධනසිරි අමරතුංගලාට විරුද්ධවත් දූෂණය පැත්තෙන් බොහෝ චෝදනා එල්ලවෙලා තිබෙනවා. ඔවුන්ට දඬුවම් ලබා දෙන්න කියලා නිර්දේශ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට ලැබුණු කාලය අවසන් නිසා මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා.

අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, දූෂණය නමැති වරදට වරදකාරයෙක් වුණොත් වසර 7කට පසු නැවත පාර්ලිමේන්තුව නියෝජනය කරන්න බැරි වන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ඔවුන් එකඟයි කියලා. කවුරුත් ඒ යෝජනාවට එකඟයි. එදා කළා වාගේ දේශපාලන හේතූන් නිසා පුද්ගලයෙකුට විරුද්ධව තීන්දු ගන්න, ඔවුන් වැරදිකාරයන් කරන්න පාර්ලිමේන්තුවට බැහැ. එදා ශිරාණි බණ්ඩාරනායක ගෙදර යැව්වා වාගේ එහෙම කරන්න බැහැ. ඒකට අපිත් විරුද්ධයි. මහින්ද රාජපක්ෂ වෙන්න පුළුවන්, ගෝඨාභය රාජපක්ෂ වෙන්න පුළුවන්, ඔවුන්ට පාර්ලිමේන්තුවෙන් දඬුවම් දෙන්න බැහැ. ඒකට අපි විරුද්ධයි. නමුත් කවුරු හෝ කෙනෙක් වැරදිකරුවෙක් කියලා අධිකරණයෙන් ඔප්පුවෙලා තිබෙනවා නම්, අවුරුදු 7කට නොවෙයි, ජීවිත කාලයටම ඡන්දය ඉල්ලන්න බැරි විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81, 87 සහ 89 ව්‍යවස්ථා සංශෝධනය කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව සහ බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ වාර්තාව පිළිබඳව විවාදයට ගැනෙන මේ අවස්ථාවේ ඊට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මගේ ප්‍රාර්ථනය -පැතුම- නැවත වතාවක් අපේ රටේ මෙවැනි විවාද නොපැවැත්වේවා කියලායි. ඒ මට්ටමට මේ රට තුළ කටයුතු කිරීම අද මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන වගකීම විධියට මා පෞද්ගලිකව දකිනවා.

අපි බලන්න ඕනෑ, අලුත් හොරුද, පරණ හොරුද කියන එක නොවෙයි, වැරැද්ද, වංචාව හා දූෂණය පිළිබඳවයි. මෙතැනදී අලුත්ද, පරණද කියන එක අදාළ විය යුතු නැහැ. වංචාව, වැරැද්ද, දූෂණය සදහටම මේ රටින් තුරන් විය යුතුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපට ඒ පිළිබඳව අමිහිරි අත් දැකීම් තිබෙනවා. මා ඇතුළුව අද ආණ්ඩුව තුළ සිටින අපේ පක්ෂයේ බොහෝ පිරිසකුත් 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වෙනුවෙන් තමයි කටයුතු කළේ. විශේෂයෙන්ම අපේ පක්ෂයේ සභාපතිවරයා වූ එතුමා වෙනුවෙන් එදා අපි පෙනී සිටියා. නමුත්, මේ රටේ ජනතාව එදා එතුමා ප්‍රතික්ෂේප කළා. ඒ ප්‍රතික්ෂේප වීම පිළිබඳව විවිධ අය විවිධ අර්ථකථන කරනවා. නමුත්, අපි එදා පරාජයට ලක් වුණේ ඇයි කියන එක පිළිබඳව වර්තමානයේදී පක්ෂයක් විධියට අපි ස්වයං විවේචනයක් කරලා තිබෙනවා. එසේ පරාජයට ලක් වීමට හේතු එක පිරිසකට විතරක් සීමා වන්නේ නැහැ. කොටස්කරුවන් විධියට අපිත් ඒ හේතුවලට සම්බන්ධ වුණාය කියන එක නිහතමානීව අපි පිළිගන්නවා.

පසුගිය රජය මඟින් එදා අපි දැවැන්ත සංවර්ධනයක් කරලා තිබුණා. මේ රටේ යුද්ධය නිම කරලා සාමය ඇති කරන්න දේශපාලන නායකත්වය ලබා දුන්නා. වීරෝදාර රණ විරුවන් ජීවිත පූජා කරලා ඒ කටයුතු කළත්, මේ රටේ ජනතාව එදා ලබා දුන් ප්‍රතිඵලය, ඒ පාඩම පක්ෂයක් විධියට අපි අද ඉතාම හොඳින් ඉගෙන ගෙන තිබෙනවා. එම නිසා තමයි අපේ පක්ෂයේ වර්තමාන සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ විධායක ජනාධිපතිවරයා විධියට ඒ තත්ත්වය නැවත වතාවක් අපේ පක්ෂයටත්, මේ රටටත් ඇති නොවිය යුතුයි කියන තැන ඉඳගෙන වංචාවට, දූෂණයට විරුද්ධව අද ඒ දැඩි ක්‍රියා මාර්ග ගන්න ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල විවිධ දේශපාලන පක්ෂ සමීක්ෂණ කරනවා. මේ රටේ පොදු සංවිධාන, ස්වේච්ඡා සංවිධාන ජන මතය විමසනවා. එහිදී අහන ප්‍රශ්නවලදී, "ඔබ මේ තීරණය ගන්නේ ඇයි?" කියන ප්‍රශ්නයට සෑම සමීක්ෂණ වාර්තාවලම වැඩිම ප්‍රතිශතයක් ලැබී තිබෙන්නේ, "වංචාවට, දූෂණයට විරුද්ධව තමයි" කියන පිළිතුරට බවයි ඒ ලැබී තිබෙන තොරතුරු අනුව අනාවරණ වෙලා තිබෙන්නේ. අද මුළු රටේම පක්ෂ භේදයකින් තොරව -සියලු භේදවලින් තොරව- වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කිරීම පිළිබඳව ප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා වංචාවලට විරුද්ධව ගෙන යන කටයුතුවලදී අපටත් විශාල යුතුකමක්, වග කීමක් තිබෙනවා. මේ අවස්ථාවේදී මේ ක්‍රියාදාමය තුළ අපි මොනම ආකාරයකටවත් දේශපාලන වාසි ලබා ගත යුතු වන්නේ නැහැ. ඒ දේශපාලන වාසි ලබා ගැනීම කුමන හෝ පාර්ශ්වයක් විසින් සිදු කරනවා නම්, එය මේ රටේ වංචාවට, දූෂණයට විරුද්ධව සැබෑ ලෙස කටයුතු කිරීමක් විධියට මා දකින්නේ නැහැ.

වංචාවට, දූෂණයට විරුද්ධව ගන්නා වූ ක්‍රියා මාර්ග ගැන විවිධ මාධ්‍ය තුළින් විවිධ දේවල් අපට දකින්න ලැබෙනවා. සමහර ඒවා ගැන කනගාටුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා දෙකකින් විමර්ශනය කරලා, ඩිව් ගුණසේකර මැතිතුමාත්, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාත් වාර්තා ලබා දුන්නා. ඒ කාරක සභා දෙකෙහිම මමත් ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් සිටියා. මා හිතන හැටියට මේ වන විට මේ නිම වුණු සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වගකීම ඉටු කරලා අවසානයි.

දැන් පාර්ලිමේන්තුවට තිබෙන වගකීම මෙයයි. නැවත වතාවක් මේ රටේ මෙවැනි දේවල් ඇති නොවීම සඳහා පාර්ලිමේන්තුව තුළින් ඉටු විය යුතු කටයුතු අපි අනිවාර්යයෙන්ම ඉටු කළ යුතුව තිබෙනවා. ඒ වගකීම අපි අවබෝධ කර ගත යුතුයි.

අතිගරු ජනාධිපතිතුමා මේ බැඳුම්කර කොමිසම පත් කරපු දිනයේ මාධ්‍යවල පළ වූ දේවල් පිළිබඳව මම සොයා බැලුවා. ඒ වෙලාවේදී බොහෝ දේශපාලන පක්ෂවල අය කිව්වේ, "ප්‍රශ්නය යට ගහන්න මේ බැඳුම්කර කොමිසම දානවා" කියලායි. මේ කොමිසමේ විනිසුරුවන්ට සැබෑ ලෙස, අවංකව මේ පරීක්ෂණය කිරීමේ අවශ්‍යතාවක් තිබුණු නිසා ඔවුන් අවස්ථා තුනකදී කල් ඉල්ලුවා. කල් ඉල්ලපු දවසට පසුව දා මාධ්‍ය සාකච්ඡා තියලා කිව්වේ, "කාලය දිගු කරලා මේ ප්‍රශ්නය යට ගහන්න උත්සාහ කරනවා" කියලායි. නමුත්, ඒ වාර්තාව එළි දැක්වූවා. වාර්තාව එළි දැක්වූවාට පස්සේ මේ වාර්තාවේ පිටු පිළිබඳව විශාල සංවාදයක් මේ රට තුළ ඇති වුණා. වැරැදිකරුවන් අත් අඩංගුවට ගන්නේ නැහැ කිව්වා. නමුත්, මීට සම්බන්ධ වැරැදිකරුවන් අත් අඩංගුවට ගත්තා. වැරැදිකරුවන් අත් අඩංගුවට ගන්න දින කීපයට පෙර ඉඳලාම ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් කිව්වා, "ඉතාම හොඳ ටෙලි නාට්‍යය මේ මැතිවරණයට පෙර ක්‍රියාත්මක වේවි" කියලා. මේ ආකාරයේ අදහස් සහ යෝජනා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

මේ අවස්ථාවේදී, මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මහතාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අත් අඩංගුවට ගැනීම හෙළා දැකලා තමයි විශේෂයෙන්ම කටයුතු කළේ. එම නිසා අපි ඉතාම කාරුණිකව මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. අපි සැබෑ ලෙස වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කරනවා නම්, මේ ආකාරයෙන් පටු දේශපාලන වාසි ලබා ගැනීම වෙනුවෙන් අදහස් සහ යෝජනා ඉදිරිපත් කළ යුතු වන්නේ නැහැ. මම සියලු දේශපාලන පක්ෂවලින් අවංකව, හදවතට එකඟව ඉල්ලීමක් කරනවා, නැවත වතාවක් මෙවැනි විවාද මේ පාර්ලිමේන්තුව තුළ ඇති නොවන්නට මේ රට තුළ අවශ්‍ය පරිසරය ගොඩ නැඟීම සඳහා අපි සියලු භේද අමතක කරලා කටයුතු කළ යුතුයි කියලා. එලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව තමයි අද මේ රට හමුවේ තිබෙන්නේ කියන කාරණය අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

මේ බැඳුම්කර සිද්ධිය පිළිබඳව තවමත් අපේ රටේ ජනතාව හරි හැටි දන්නේ නැහැ කියලා කියන්න පුළුවන්. අපටත් මේ පිළිබඳව හරි අවබෝධයක් නැහැ කියලා කියන්න පුළුවන්. නමුත්, මේ

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ක්‍රියාවලිය තුළ වංචාවක් සිද්ධ වුණාය කියලා අපි කවුරුත් -ඕනෑම කෙනෙකු- දන්නවා. මේ වංචාව මොකක්ද? විශේෂයෙන්ම අපේ රටට අවශ්‍ය මුදල් අපි කලින් හොයා ගත්තේ භාණ්ඩාගාර බිල්පත්වලින්. 1997දී ආසියාවේ ඇති වුණු තත්ත්වය එක්ක බැඳුම්කරවලින් මුදල් සොයා ගැනීමේ ක්‍රමය හඳුන්වා දුන්නා. 2008 අවුරුද්දේ ප්‍රථම වතාවට මේ බැඳුම්කර ක්‍රමය යටතේ අපේ රටේ රජයට අවශ්‍ය මුදල් ලබා ගැනීම ආරම්භ වුණා. ක්‍රම දෙකක් යටතේ මේ මුදල් ලබා ගැනීම සිද්ධ කරන්න පුළුවන්. එයින් එකක් සෘජු ක්‍රමය. අනික් එක වෙන්දේසි ක්‍රමය. පෞද්ගලික අංශයේ තිබෙන මුදල් පාඩුවක් නොවන පරිදි ආණ්ඩුවට ලබා ගැනීම සඳහා තමයි වෙන්දේසි ක්‍රමය මේ බැඳුම්කර නිකුත් කිරීමේදී භාවිත කරන්න නියමිතව තිබුණේ. මේ කථා බහට ලක් වෙලා තිබෙන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම 2013 වර්ෂයේ මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුවලට සම්බන්ධ වීමට ලියා පදිංචි වුණා. ලියා පදිංචි වුණු දවසේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ප්‍රාග්ධනය මිලියන 300යි.

මේ වාර්තාවේ තිබෙනවා, 2015 මාර්තු 31වැනි දාට ලාභය බිලියන පහයි; 2016 මාර්තු 31ට ලාභය බිලියන 6යි දශම ගණනයි; මේ අවුරුදු දෙකේ ශුද්ධ ලාභය බිලියන 12යි කියලා. මේ ලාභය ලබා තිබෙන්නේ වෙනත් ගනුදෙනු කරලා නොවෙයි. මේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම බැඳුම්කරවලට අදාළ ගනුදෙනු කරලා තමයි මෙච්චර ලාභයක් මේ කෙටි කාලය තුළදී ලබාගෙන තිබෙන්නේ. වෙන්දේසි ක්‍රමය තිබෙන්නේ පෞද්ගලික අංශයේ මුදල් ලබා ගන්න. මේ, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම කළේ මොකක්ද? සේවක අර්ථසාධක අරමුදල්, රජයේ බැංකුවල අරමුදල් ලබාගෙන ආණ්ඩුවටම ණය දුන්නා. ඒ ආයතනවලටත් විශාල පාඩුවක් සිදු වුණා. රජයටත් විශාල පාඩුවක් සිදු වුණා. මේකේ පාඩුව හරි හැටි ගණන් කරන්න පුළුවන්කමක් නැහැ. ඒක ඇත්ත. දැවැන්ත ආර්ථික ප්‍රශ්න, ගැටලු ගණනාවකටම මුහුණ දුන්නා. මිලියන 300කින් ආරම්භ කරපු පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අවුරුදු දෙකක් තුළ ප්‍රකාශයට පත් කළ ශුද්ධ ලාභය විතරක් බිලියන 12යි. එම බිලියන 12ත් ඔවුන් උපයා ගත්තේ රාජ්‍ය ආයතනවල තිබෙන සල්ලිවල අතරමැදියෙක් විධියට කටයුතු කිරීම තුළින් පමණයි. ඒ අය මේ ලාභය ලබා ගන්න නීත්‍යානුකූල ක්‍රමවලට පරිබාහිරව විශාල වශයෙන් විවිධ දේශපාලන වාසි, මහ බැංකුවේ අධිපතිවරයාගේ තිබුණු සම්බන්ධතාවන් උපයෝගී කර ගත්තා. මහ බැංකු අධිපතිවරයාගේ සම්බන්ධතාවන් මතින් තොරතුරු ලබා ගෙන, මහ බැංකුවේ තිබුණු නීති-රීති සියල්ලක්ම පසෙක තබලා; සම්ප්‍රදායයන් පසෙක තබලා, අයථා වාසි අරගෙන තමයි මේ මුදල් උපයා ගෙන තිබෙන්නේ. මේක තමයි සිදුවුණු ක්‍රියාවලිය. විශේෂයෙන්ම රටක් විධියට නැවත මෙවැනි ආකාරයේ තත්ත්වයන් ඇති නොවීම සඳහා අප වග බලා ගත යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් මේ කොමිෂන් සභාවේ නිර්දේශයන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිර්දේශයන් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි.

පාර්ලිමේන්තුවටත් මේ පිළිබඳව යම් යම් වගකීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. දැනට තිබෙන නීති-රීති අනුව කටයුතු සිදු කළ යුතු වාගේම, ඒ සඳහා නව නීති-රීතිත් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නව නීති-රීති අවශ්‍ය වෙලා තිබෙන්නේ, පෙර සිදු වුණු සිද්ධීන්වලට අවශ්‍ය දඬුවම් ලබා දීමටත්, නැවත මෙවැනි තත්ත්වයක් මේ රට තුළ ඇති නොවීම සඳහාත් කියන කරුණු මුල් කරගෙනයි. ඒ අනුව මේ පාර්ලිමේන්තුව ඒ වගකීම ඉටු කළ යුතුව තිබෙනවා. එම නිසා අපි එම වගකීම ඉටු කළ යුතුයි.

අපි වර්තමානයේ දී මේ සෑම දෙයක් පිළිබඳවම සුබවාදීව දැකිය යුතුයි. මේ දිනවල මැතිවරණයක් පැවැත්වෙනවා. මේ මැතිවරණ ක්‍රමය තුළ හොඳ ලක්ෂණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. තමන්ගේ කොට්ඨාසයේ අය සම්බන්ධ වෙලා අනවශ්‍ය ගැටීම් නැතුව අද මේ මැතිවරණ ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අද රාජ්‍ය දේපළ අයථා විධියට මේ මැතිවරණයට යොදවා ගන්නේ නැහැ. රටක් විධියට ගත්තාම, මේවා ඇති විය යුතු හොඳ ලක්ෂණ. විශේෂයෙන්ම වංචාව, දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ අපි තව තවත් මේ වැඩ පිළිවෙළවල් ශක්තිමත් කරමින් කටයුතු කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම විගණන පනත් කෙටුම්පත කඩිනමින් මේ පාර්ලිමේන්තුවට ගෙන ආ යුතුව තිබෙනවා. ඒක රටක් විධියට අවශ්‍යයි. කිසිදු පාර්ශ්වයක් එයට බිය විය යුතු වන්නේ නැහැ. දේශපාලනඥයන්වත්, නිලධාරීන්වත් ඒකට බිය වෙන්න දෙයක් නැහැ. අපි හරියට වැඩ කරනවා නම්, ඕනෑම නීතියක් අනුව, ඕනෑම දෙයක් කරන්න අපට පුළුවන්කමක් තිබෙනවා. එම නිසා විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒම ගැන අද මේ රටේ විවිධ පාර්ශ්වයන් විශාල අපේක්ෂාවකින් කථා කරන මානෘකාවක් වාගේම, එය අවශ්‍ය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ දී පොරොන්දු වුණා, විගණන පනත් කෙටුම්පත කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනෙනවා කියලා.

එම නිසා මෙම මැතිවරණය අවසන් වුණු වහාම අපිත් ඒ වෙනුවෙන් පෙනී සිටිනවා; කටයුතු කරනවා. අපි සියලුම දෙනාම එකතු වෙලා විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කඩිනමින් සම්මත කරලා මෙවැනි ආකාරයේ සිද්ධීන් මේ රට තුළ ඇති නොවීම සඳහා අනිවාර්යයෙන්ම වගබලා ගත යුතුව තිබෙනවා.

මහ බැංකුවේ සිද්ධිය සම්බන්ධයෙන් වාගේම අනෙකුත් බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙනුත් නීතිය, සාධාරණත්වය ඉටු විය යුතුයි. ඒ පිළිබඳව අපේ මොනම ආකාරයකවත් මතවාදයක් නැහැ. වංචාවට, දූෂණයට පැරණි, අලුත් කියලා වර්ග දෙකක් නැහැ. වර්තමාන, අනාගත කියලාත් නැහැ. වංචාව, දූෂණය නම් වංචාව, දූෂණයම තමයි. එම නිසා අතිගරු ජනාධිපතිතුමා අද වංචාව, දූෂණයට විරුද්ධව එතුමාට ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම අවංකව ගන්නවා. රජය විධියට, පාර්ලිමේන්තුව විධියට අපි අපේ සහයෝගය, දායකත්වය එතුමාගේ ක්‍රියාදාමය වෙනුවෙන් ලබා දීම තමයි මහජන නියෝජිතයන් විධියට අපට පැවරී තිබෙන යුතුකම සහ වගකීම කියන එක අපි අනිවාර්යයෙන්ම අවබෝධ කරගත යුතුව තිබෙනවා.

විගණන පනත ගෙනෙනවා වාගේම, මේ ක්‍රියා දාමය තුළ රාජ්‍ය අංශයත් තව තවත් ශක්තිමත් කළ යුතුව තිබෙනවා. නවීන තාක්ෂණය භාවිත කරලා, නිලධාරීන්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දීලා, නිලධාරීන්ගේ ගුණාත්මකභාවය ඉහළ දැමීමට කටයුතු කළ යුතුයි. මේ කොමිෂන් සභා වාර්තාව අධ්‍යයනය කළාම එම ක්‍රියාවලිය තුළ අඩු පාඩුකම් විශාල ප්‍රමාණයක් තිබුණු බව අපට පෙනී ගියා. මහ බැංකුවේ තිබුණු නීති රීති සංශෝධනය කළ යුතුව තිබෙනවා. නව නීති රීති හඳුන්වා දිය යුතුව තිබෙනවා. මේ ආකාරයෙන් ඒ අදාළ අංශ ඉතාම අවංකව කටයුතු කළ යුතුව තිබෙනවා.

මේ කොමිෂන් සභාවේ හිටපු විනිසුරුවරුන් සහ නිලධාරීන් අද මේ රටේ කාගේත් විශ්වාසයට පාත්‍ර වෙලා තිබෙනවා. කිසිදු භේදයකින් තොරව, අපක්ෂපාතීව මේ පරීක්ෂණ කටයුතු සිදු කිරීම පිළිබඳව අපි ඒ අයට අපේ ගරුත්වය පිරිනමන්න ඕනෑ. අනෙකුත් සියලුම නිලධාරීනුත් ඒ ආදර්ශය ලබා ගත යුතුව තිබෙනවා.

නීතිපති දෙපාර්තමේන්තුවේ, අධිකරණ ක්ෂේත්‍රයේ, පොලීසියේ මේ සෑම නිලධාරියකුම මේ ආදර්ශය අනිවාර්යයෙන්ම ලබා ගත යුතුව තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ආදර්ශය ලබා ගෙන අතීතයේ සිදු වුණු සිද්ධීන් සඳහා සාධාරණය, යුක්තිය ජනතාවටත්, රටටත් ඉටු කළ යුතුයි. ඒ වාගේම මින් ඉදිරියට නැවත වතාවක් මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අප සියලු දෙනාම ඒක රාශී වෙලා කටයුතු කරමුයි කියන ආරාධනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු රවි කරුණානායක මහතා.

[අ.භා. 1.50]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවක මට කථා කරන්න ලැබීම මා ඉතා අගය කොට සලකනවා.

මහ ජනතාවට හා රටට අහිමි වෙමින් පැවති ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස හා ආර්ථික දියුණුව ස්ථාපිත කරන්න ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ දේශපාලනඥයකු හැටියටත්, ඒ වෙනුවෙන් මහා පරිත්‍යාගයක් කළ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ වාගේම 2015 ජනවාරි මාසයේ අලුත් ජනාධිපතිවරයකු, 2015 අගෝස්තු මාසයේ සම්මුතිවාදී, යහ පාලන ආණ්ඩුවක් බිහි කරන්න මුල්වූ කෙනෙකු හැටියටත් අද මේ ගරු සභාව අමතා මට කථා කරන්න ලැබීම සතුටක්.

තෝරා ගත් යම් දූෂණ කිහිපයක් පිළිබඳව කරන ලද විමර්ශන පදනම් කරගෙන ඉදිරිපත් කර ඇති කොමිෂන් සභා වාර්තා දෙකක් පිළිබඳව අපි අද විවාදයට ගෙන තිබෙනවා. කුමන තත්ත්වයක් යටතේ වුවත් මෙසේ යහ පාලන මූලධර්ම අඩු පාඩු සහිතව හෝ ක්‍රියාත්මක වීම ගැන මා සතුටු වෙනවා.

මා මුලින්ම මේ ගරු සභාවේ අවධානයට ලක් කරන්න කැමැතියි, අප සිටින මේ සමාජයේ අර්බුද නිර්මාණය වීම ගැන වාගේම යහ පාලනයක අවශ්‍යතාව පිළිබඳව. 1971 - 1989 කාලය තුළ දකුණේ අර්බුද වාගේම 1983 ඉඳලා අවුරුදු 30ක් උතුරේ අර්බුදවලට ලක් වෙලා සමස්ත සමාජයම භයානක තත්ත්වයකට පත් වුණා. මේ නිසා සමාජය තුළ ප්‍රචණ්ඩත්වය, දූෂණය, වංචාව, නාස්තිය, අපේක්ෂා භංගත්වය, අවිනිශ්චිතභාවය වාගේම සමාජයට අහිතකර බොහෝ දේවල් සමාජගත වුණා. හිංසනය, ප්‍රචණ්ඩත්වය සමාජයේ කොටසක් බවට පත් වුණා.

මේ යුගය තුළ මහ ජනතාවගේ දුප්පත්කම නැති කරන්න, රටේ ආර්ථික සමෘද්ධිය ඇති කරන්න, යටිතල පහසුකම් බිහිකරන්න තිබූ වටිනා අවස්ථා අපට අහිමි වුණා. මේ තත්ත්වය සමඟ පටු දේශපාලන චින්තනයන් හා ක්‍රියාකාරිත්වයන් බලවත් වෙලා සමාජය ඉතාම භයානක හා විනාශකාරී තත්ත්වයකට පත්වෙලා තිබුණා. ඒ වාගේම, අපි නොහිතපු විධියට අපේ මැතිවරණ ක්‍රමයත්, ඒ තුළ ඇතිවූ අනවශ්‍ය ව්‍යදම් වාගේම තරගයත් අපේ සමාජය තවදුරටත් නරක තැනකට ගෙන ආවා. යුද ජයග්‍රහණ සමඟ නිර්මාණය වූ ඒකාධිපති හා පවුල් පාලනය මේ තත්ත්වය තවදුරටත් භයානක හා නරක තැනකට ගෙන ගියා. මේ තත්ත්වය වෙනස් කරන්න අභීත නායකත්වයක් වාගේම ජීවිත පූජාවෙන් අරගළ කරන්න අවශ්‍ය වුණා. අපි එහි පුරෝගාමීන් වුණා. එය පහසු කටයුත්තක් වුණේ නැහැ. ඒ දුෂ්කර අරගළය අවසානයේ අපි ජයගත්තා.

මේ සමාජය තුළ යුක්තිය හා සාධාරණත්වය ඇති කරන්න, සංහිඳියාව ඇති කරන්න, දූෂණ හා වංචා නැති කරන්න, අර්ථිකය දියුණු කරලා රටේ කීර්තිනාමය ගොඩනඟන්න අපි නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරන්න 2015 ජනවාරි මාසයේ 8වැනි දා අත්තිවාරම් දැම්මා. ඒ ගැන අපි අභිශයින්ම සතුටු වෙනවා. එය මුල් පියවර පමණයි. අප විසින් ඉටුකළ යුතු බොහෝ දේවල් තිබෙනවා. එම ජනතා අපේක්ෂා අපි කෙසේ හෝ ඉටුකළ යුතුයි. අඩුම වශයෙන්, පොරොන්දු වූ දේ ඉටු කිරීම ජනතාව අපේක්ෂා කරන යහ පාලනයයි. එය අප ක්‍රියාවෙන් ඉටුකළ යුතුයි.

ගරු ජනාධිපතිතුමා, -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- 70වන නිදහස් දින සමරුවේදී ඉතාමත් වැදගත් ප්‍රකාශයක් කළා. දූෂණ විරෝධී මත ශක්තිමත් කිරීම හා ඒ මතය ක්‍රියාත්මක කිරීම රටක අනාගත සංවර්ධනයේ ආත්මාරක්ෂාව බවත්, මූල්‍ය විනයක් ඇති කිරීමට පුළුල් ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වී තිබෙන බවත් එතුමා ජාතිය අමතා තවදුරටත් ප්‍රකාශ කළා.

සෞභාග්‍යයේ නිදහස අත් පත් කර ගැනීම සඳහා දූෂණය, අල්ලස, හොරකම සහ නාස්තිය පිටුදැකීමට තම මාතෘ භූමිය පෙළගස්වමින් සිටින බවද එතුමා ප්‍රකාශ කළා. මමත්, ඒ වාගේම අපේ පක්ෂයත් මේ ප්‍රකාශය ඉතා ඉහළින් අගය කරනවා.

මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවත් එයමයි. අවුරුදු 70ක් පුරා මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් සිටින්නේ, බොරුව රජකරවන දේශපාලනය වෙනුවට, ඇත්ත දිනවන, සාධාරණත්වය දිනවන දේශපාලනයක්. ඒ සඳහා ජනාධිපතිතුමා ප්‍රකාශ කළ විධියට, රට දිනවන සමාජ ව්‍යාපාරයක් බිහි කරන්න අපි සියලුදෙනා එකතුවෙලා කටයුතු කරන්න අවශ්‍ය වෙනවා.

බැදුම්කරය පිළිබඳ ගැටලුව මේ ආණ්ඩුවේ හෝ පසුගිය ආණ්ඩුවේ ගැටලුවක් නොවේ. මා කලින් පැවසූ හේතු නිසා, දූෂණය සංස්කෘතියක් වූ රටක් වෙනස් කිරීම පිළිබඳ අර්බුදයකි.

යහ පාලනය ක්‍රියාත්මක වීම:

ඒ වාගේම මම සතුටු වෙනවා, රාජපක්ෂ සමයේ සිදුවූ බරපතළ ගණයේ දූෂණ, වංචා පිළිබඳ සෙවීමට අදාළ කොමිෂන් වාර්තාවට සීමා නොවී, යහ පාලන ආණ්ඩුව වෙත එල්ලවූ චෝදනාවක් සම්බන්ධව ජනාධිපති කොමිසමක වාර්තාවක් ඉදිරිපත් කරමින් විවාද කිරීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදයක් ලබා දීමට හැකිවීම ගැන; ඒ වාගේම භාවිතය තුළ එය ඔප්පු කිරීමට හැකිවීම ගැන. කොහොම නමුත්, මේ බැදුම්කර අර්බුදය මැතිවරණ සමයකදී පවා රට එක තැනක නවත්තන්න, පල්කරන්න යොදා ගන්න සිදුවීම සැබවින්ම කනගාටුදායක තත්ත්වයක්. ඇත්තටම අවුරුදු තුනක් බැදුම්කර ගනුදෙනුවකට රට නැවතුණා වාගේ බවකුයි පෙනෙන්න තිබෙන්නේ. බිලියනයට හරි ට්‍රිලියනයට හරි බිංදු කීයද කියලා

[ගරු රවි කරුණානායක මහතා]

නොදන්නා අය පවා අද බැඳුම්කරයේ සිදුවූ පාඩු ගැන බිලියනවලින් හා ට්‍රිලියනවලින් කියවනවා. ඒ සමහරු බැඳුම්කරයක් කියන්නේ මොකක්ද, මොකක්ද ඒ ක්‍රියාවලිය, එහි රජයේ කොටස මොකක්ද, ප්‍රාථමික වෙළෙඳ පොළ හැසිරෙන්නේ කොහොමද, ද්විතියික වෙළෙඳ පොළ තුළ සිදුවන්නේ මොකක්ද, මේ වාගේ මූලික කාරණා පවා නොදන්නා බව පැහැදිලියි.

මම පැහැදිලිව කියනවා, දූෂණ තිබෙනවා නම්, බැඳුම්කරයේ පමණක් නොවෙයි සියලු දූෂණ ගැන හොයන්න ඕනෑ, දඬුවම් කරන්න ඕනෑ. ඒක නොවෙයි අර්බුදය. මේ සියලු මාධ්‍ය සංදර්ශනවලින් අපි ලබා ගන්නේ කුමක්ද කියලායි.

දූෂණවලට එරෙහිවීම පසුගිය මැතිවරණවල ලංකාවේ පමණක් නොව දියුණු නැති බොහෝ රටවල ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේත් පසුගිය දශක කිහිපයක්ම ප්‍රධාන මාතෘකාව වුණේ දූෂණය. නමුත්, දූෂණය දිගටම තිබෙනවා. ඒත් හැමෝම, හැම මට්ටමින්, හැමවිටම දූෂණ ගැන පමණක් කථා කරලා, ඒ මත අපේ දේශපාලනය කරන එකයි අර්බුදය. ඒ තුළ නිර්මාණය කරනු ලබන මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයයි ගැටලුව.

දූෂණ ගැන කථා කරලා පමණක් යහ පාලනය ලබා ගන්න, සංහිඳියාව ඇති කරන්න, යටිතල පහසුකම් ලබා දෙන්න, රැකියා උත්පාදනය කරන්න, සෘජු ආයෝජන - FDIs - ලබා ගන්න, ජාත්‍යන්තරය දිනා ගන්න, ආර්ථික සමෘද්ධිය ලබා ගන්න බැහැ.

හැබැයි දූෂණ අඩු කරන එක යහ පාලනයයි. එය මේ සියලු දේ ලබා ගන්න වැදගත් වනවා. හැබැයි දූෂණ නැති කළ පමණින් රටේ සියලු ගැටලු විසඳන්න බැහැ. අපි දූෂණ හොයන එක ඒ අදාළ ආයතනවලට භාර දීලා, මේ අපේ දුක් විඳින මිනිසුන්ගේ ගැටලු විසඳන්න, 70 වසරක් අපි මුහුණ දුන් අර්බුද විසඳා ගන්නේ කොහොමද කියලා හොයලා බලන්න ඕනෑ. ඒ වාගේම සමාජය මෙතරම් ප්‍රචණ්ඩ ඇයි, දූෂිත ඇයි කියලා, ඒවාට හේතු හොයලා පිළියම් යොදන්න ඕනෑ. එහෙම නැතිව "දූෂණ, දූෂණ" කියලා කථා කර කර හිටියාට මේ අර්බුද විසඳන්න බැහැ. මෙකට විද්‍යාත්මක වූ කළමනාකරණ ප්‍රවේශයක් අවශ්‍ය වෙනවා.

සාධනීය දේශපාලන ප්‍රවේශයක්:

පසුගිය මාසයේ පත්තර, රූපවාහිනී බලන්න. මොනවද කථා කරලා තිබෙන්නේ? මොනවාද සාධනීය constructive දේවල් කථා කරලා තියෙන්නේ? අපට නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කර ගන්න ඕනෑ වෙලා තිබෙනවා. මේ destructive politicsවලට තිත තියන්න ඕනෑ. අලුතෙන් හිතන්න ඕනෑ. සංවර්ධනය පිළිබඳ ප්‍රවේශයක් අවශ්‍යයි. නායකයින් විනාශ කරන කුහක දේශපාලනය වෙනුවට නායකයින් තනන යහපත් දේශපාලනයක් බිහි කරන්න ඕනෑ. කොටින්ම constructive political approach එකක් - සාධනීය දේශපාලන ප්‍රවේශයක් - අද අපට අවශ්‍ය කර තිබෙනවා. මන්ත්‍රීවරයෙක් හැටියට, පුද්ගලයෙක් හැටියට මට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ විශාල අර්බුදයකටයි. ඒ තමයි මේ විනාශකාරී දේශපාලනය තුළ ලංකාවේ ඉන්න එකම පව්කාරයා, එකම අපරාධකාරයා බවට මාව පත් කරන්න හදන දේශපාලනයක් පසුගිය කාලයේ ක්‍රියාත්මක වීම. එය අදටත් ක්‍රියාත්මක වෙන්න හදනවා. යහ පාලන සම්මුති ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වකරුවකු ලෙස එක්සත් ජාතික පක්ෂයටත් මේ තුළින් පහර දෙන්න කුමන්ත්‍රණ සිදු වෙලා තිබෙනවා. මට කොතරම් මඩ ගැහුවත්, එක්සත් ජාතික පක්ෂයට කොතරම් අවලාද නැගුවත් මම හිතනවා, මේ තත්ත්වය මොන අඩු පාඩු තිබුණත් යහ පාලනය වෙනුවෙන් අපි ගත් උත්සාහයේ ප්‍රතිඵල කියලා. මේ තුළ රටේ දේශපාලකයින්, රටේ නිලධාරින් වාගේම ජනතාව යහ පාලනය වෙත වඩාත් නැඹුරු වෙනවා. වැරදි කරපු අයට දඬුවම් ලැබෙනවා. වැරදි කරන්න භය වෙනවා. ඒ වාගේම වැරදි අඩු පාඩු වාගේම හොරකම් කරන්න අමාරු වෙන පද්ධති හා ක්‍රමවේද සකස් කරන්න අපි සියලුදෙනා උත්සාහ ගන්නවා.

බැඳුම්කර අර්බුදය:

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කොමිසම් වාර්තා දෙකම ගැන අපි කථා කළ යුතු වෙනවා. මුලින්ම බැඳුම්කර කොමිසම ගැන හා ඒ තුළ මා සම්බන්ධ කර ගැනීම ගැන කථා කරන්න කැමතියි. බැඳුම්කර කොමිසමේ කටයුතුවලට මාගේ නම පටලවපු දවසේ සිට මෙම කොමිසමේ වාර්තාව ද එළි දකිනතුරු මම සිටියේ නොඉවසිල්ලෙන්. මම නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරමින් ඇමැතිකමින් ඉල්ලා අස් වුණේ මේ රටේ දේශපාලනයට නව ප්‍රවේශයක් ලබා දෙන්නයි. බොහෝ අය මෙවැනි අවස්ථාවල බලවතුන්ගේ රැකවරණය ලබා ගෙන පක්ෂ මාරු කරලා ආරක්ෂා වෙනවා. මගේ ප්‍රවේශය වුණේ අභියෝගයට මුහුණ දීමයි. සත්‍ය කවදා හෝ ජය ගන්නවා. බොරුවට ආයුෂ නැහැ. ඒ හින්දා මම තනිවම මේ යුක්තිය වෙනුවෙන් සටන් කරන්න තීරණය කළා. අද එහි යම් ජයග්‍රහණයන් අපි ලබා ගනිමින් සිටිනවා. සත්‍ය යම් පමණකට හෙළිදරව් වෙමින් පවතිනවා. මම එකින් එක ඒ ගැන පෙන්වා දෙන්නම්. ජනාධිපතිවරයා විසින් ප්‍රශ්නගත බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසම පත් කරනු ලැබුවේ 2017 ජනවාරි 27වන දා. එහි විමර්ශන කටයුතු එම වසරේ පෙබරවාරි මාසයේ ආරම්භ කෙරුණා. පසුව එම කොමිසම මාස 10ක පමණ කාලයක් සිදු කළ විමර්ශන කටයුතුවලින් අනතුරුව සකස් කළ වාර්තාව, 2017 දෙසැම්බර් මස 30වන දින ජනාධිපති වෙත බාර දෙනු ලැබුවා. එම වාර්තාව ඇසුරෙන් සකස් කළ කෙටි වාර්තාව -විශේෂයෙන් මා දේශපාලන වශයෙන් විනාශ කිරීමට ඉලක්ක සහිත මේ වාර්තාව- 2018 ජනවාරි මස 3වැනි දින ජනාධිපතිවරයා විසින් ජාතිය අමතා ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ විශේෂ ප්‍රකාශයක් ලෙස කියවනු ලැබුවා. මේ ප්‍රකාශය පිළිබඳව මමත්, මගේ පවුලත්, හිතවත් පාක්ෂිකයිනුත් අතිශය විමතියට හා කම්පාවට පත් වුණා. ඒ සමහම අපට මේ විකෘති කළ කරුණු පරදවලා සත්‍ය ජය ගැනීමට සටන් කරන්න පුදුම ශක්තියක් ලැබුණා. මේ අනුව මේ වාර්තාවේ නිර්දේශ හා උක්ත ප්‍රකාශය අතර පරතරය පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුවත් කළා. ඊළඟට, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න උත්සාහ කළා. එයත් කිසියම් නොපෙනෙන බලවේගයක් වැන්නක් හමුවේ වැළකී ගියා.

ජනාධිපතිතුමාගේ ප්‍රකාශය:

ජනාධිපති ජාතිය අමතා කළ එම ප්‍රකාශයෙහි මා සම්බන්ධව කරන ලද කොටස තුළ මෙසේ සඳහන් වෙනවා:

"ඇලෝසියස් පවුලට අයත් වන ඔවුන්ගේ පාලනයට නතුව තිබූ වෝල්ට් ඇන්ඩ් රෝ සමාගම විසින් පෙන්ට් හවුස් තට්ටු නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම් වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ කොමිෂන් සභාවට ඔහු අසත්‍ය සාක්ෂි දීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත් මෙම වාර්තාවේ සඳහන් වෙනවා."

මූලික කරුණු කිහිපයක් එම වාර්තාවේ අඩංගු වෙනවා. "නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම" යනුවෙන් ද වාර්තාවේ

සඳහන් වෙනවා. "ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත්, ඔහු අසත්‍ය සාක්ෂිදීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත්" මෙම වාර්තාවේ ඇතුළත් වෙනවා. එම නිසා මෙම වාර්තාව පිළිබඳ සත්‍ය තත්ත්වය දැන ගන්න මට ඕනෑ වුණා. තොරතුරු අයිතිය යටතේ මෙම වාර්තාවේ පිටපතක් ඉල්ලුවා. ඒ නිසා මා විසින් 2018 ජනවාරි මස 5වන දින තොරතුරු අයිතිය යටතේ මෙම කොමිෂන් සභා වාර්තාව ජනාධිපති කාර්යාලයෙන් ඉල්ලා සිටියා. ඒ අනුව 2018 ජනවාරි මස 17වන දින මා හට ජනාධිපති කාර්යාලයෙන් මෙම වාර්තාවේ පිටපතක් ලබා ගන්නට හැකි වුණා.

වාර්තාවේ සඳහන් කරුණු මොනවාද කියා අපි බලමු. මුදල් ඇමති ලෙස රාජ්‍ය බැංකුවලට උපදෙස් දීමේදී කිසිදු වරදක් කර නොමැති බව බැඳුම්කර කොමිසම පිළිගෙන තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුවලදී මා මුදල් ඇමති ලෙස කටයුතු කරමින් රාජ්‍ය බැංකුවලට උපදෙස් දීමෙන් රජයට විශාල පාඩුවක් කළ බවට සමහර දේශපාලනඥයින් හා මාධ්‍ය විසින් විශාල ප්‍රචාරයක් ගෙන ගියා. කරුණාකර බලන්න, කොමිෂන් සභා වාර්තාව ඒ ගැන කියා ඇති දෙය. මම එම වාර්තාවේ පිටු අංක 838 වෙත ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

මගේ මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මෙතැන සිටිනවා. එතුමා මෙම වාර්තාවේ පිටු අංක 838 වෙත අවධානය යොමු කළොත් අවබෝධ වේවි කොමිෂන් සභා වාර්තාවේ මා නිදොස් කර තිබෙන බව.

එහි මෙසේ සඳහන් වෙනවා:

"We have earlier, concluded that, in view of the undesirably high Yield Rates which then prevailed, it was reasonable and justifiable for Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance, to wish to bring these Yield Rates down at these Treasury Bond Auctions. We have also taken the view that, since successive Governments have been known to use the state-owned People's Bank, National Savings Bank and Bank of Ceylon to implement some policy measures and it is not per se irregular for a Government to do so, we cannot find fault with Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance for convening these meetings and giving the aforesaid instructions to the three State Banks."

මේ මහින් මුදල් ඇමති ලෙස මා අනුපාත අඩු කිරීම සාධාරණ හා නීත්‍යානුකූල බව කොමිසම මෙන්න මෙහෙම පිළිගෙන තිබෙනවා.

" .....it was reasonable and justifiable for Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance, to wish to bring these Yield Rates down at these Treasury Bond Auctions."

මීට පෙර තිබූ රජයෙන්ද මෙම ප්‍රතිපත්තිය ලෙස ගෙන ඇති බව කොමිසම තවදුරටත් පිළිගෙන තිබෙන බැවින් මගේ කිසිදු වරදක් නොමැති බව කොමිසම මේ ආකාරයෙන් තහවුරු කර තිබෙනවා.

" ....to implement some policy measures and it is not *per se* irregular for a Government to do so, we cannot find fault with Hon. Ravi Karunanayake .."

එමෙන්ම මා හෝ මුදල් අමාත්‍යාංශය මේ ගනුදෙනුවලදී මහ බැංකුවට උපදෙස් දුන් බවට කිසිදු සාක්ෂියක් නොමැති බවත් කොමිසම පිළිගෙන තිබෙනවා.

"However, we have also earlier concluded that, there is no evidence before us which suggests that, Hon. Ravi Karunanayake, MP or the Ministry of Finance advised the Central Bank of Sri Lanka that the aforesaid instruction had been given to the three State Banks."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වාර්තාවේ 838 පිටුවේ මහ බැංකුව සහ බැඳුම්කර ගනුදෙනුව මා යටතේ ක්‍රියාත්මක වන හෝ මගේ බලපෑම් යටතේ ඇති ආයතනයන් නොවන බව පිළිගෙන තිබෙනවා. මහ බැංකුව මා යටතේ තිබුණේ නැහැ. අගෝස්තු මාසයෙන් පසුව වාණිජ බැංකුත් මා යටතේ නොවෙයි තිබුණේ. ඒ අනුව මගේ නීතිඥයන් විසින් මෙම වාර්තාව පරිශීලනය කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන නිගමනවලට එළඹී තිබෙනවා.

පර්පෙචුවල් ට්‍රෙෂරීස් හෝ වෙනත් අයකුට බැඳුම්කර මිලදී ගැනීම හා විකිණීම මහින් ලාභ ගැනීම සම්බන්ධයෙන් මගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව බැඳුම්කර කොමිසම තහවුරු කර ඇති බව;

මහ බැංකුව විසින් බැඳුම්කර විකිණීම හෝ ප්‍රාථමික වෙළෙඳුන් විසින් බැඳුම්කර මිලදී ගැනීමේදී කිසිදු ආකාරයක නීති විරෝධී හෝ නුසුදුසු ක්‍රියාවක මා නිරත වී වරදකරුවකු වී ඇති බවට කිසිදු සාක්ෂියක් බැඳුම්කර කොමිසම වාර්තා කර නොමැති බව දැනුවත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වාර්තාවේ පරිච්ඡේද 33 නිර්දේශවලට වෙන්කොට තිබෙනවා. එහි පිටු අංක 911 සිට 922 දක්වා නිර්දේශ 30ක් දක්වා තිබෙනවා. ඉන් නිර්දේශ අංක 24 හා 25 පිටු අංක 920-921 මා හා සම්බන්ධයි. ඒ තුළ ඉංග්‍රීසි භාෂාවෙන් පහත දැක්වෙන නිර්දේශ 24 හා 25 තිබෙනවා. මා පිටු අංක දුන්නේ, මෙය අධීක්ෂණය කරන්නට පහසු වෙන්නටයි. පිටු අංක 920හි මෙසේ සඳහන් වෙනවා:

"As stated earlier in Chapter 24, we recommend that, the Commission to Investigate Allegations of Bribery or Corruption should consider whether Hon. Ravi Karunanayake, MP, while he was Minister of Finance, derived a substantial benefit from the Lease Payments made by Walt and Row Associates (Pvt.) Ltd [which is an Associate Company of Perpetual Treasuries Ltd and which is owned and controlled by the same persons who own and control Perpetual Treasuries Ltd] for the lease of apartment occupied by Hon. Ravi Karunanayake, MP and his family and, if so, determine whether appropriate action should be taken against Hon. Ravi Karunanayake,..."

එහි සිංහල පරිවර්තනය මෙසේයි:

24වැනි පරිච්ඡේදයේ කලින් ප්‍රකාශ කර ඇති පරිදි, මන්ත්‍රී ගරු රවි කරුණානායක මුදල් ඇමතිවරයාව සිටියදී ඔහු සහ ඔහුගේ පවුල පදිංචිව සිටි නිවාසය සඳහා බදු මුදල් ගෙවීම පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම හිමි සහ පාලනය කරන පුද්ගලයන්ටම අයත් අනුබද්ධිත සමාගමක් වන වෝල්ට් සහ රෝ ඇසෝසියේට්ස් (පෞද්ගලික) සමාගම විසින් සිදු කිරීම මහින් ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයාට සැලකිය යුතු ප්‍රතිලාභයක් අත්වූයේ දැයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සලකා බැලිය යුතු බවට අපි නිර්දේශ කර සිටින අතර, ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයාට එවැනි සැලකිය යුතු ප්‍රතිලාභයක් අත් වූයේ නම්, අල්ලස් පනත යටතේ ඔහුට එරෙහිව සුදුසු පියවර ගත යුතු දැයි තීරණය කරන ලෙසටද නිර්දේශ කර සිටිමු.

නිර්දේශ අංක 25, පිටු අංක 921 සඳහන් වෙනවා:

"As stated earlier in Chapter 24, we also recommend that, the Hon. Attorney General and other appropriate authorities consider whether some of the evidence given by Hon. Ravi Karunanayake,

[ගරු රවි කරුණානායක මහතා]

MP before us is shown to have been incorrect and, if that is the case, whether Mr. Karunanayake should be prosecuted under Section 179 and/or Section 188 of the Penal Code or other relevant provision of the Law, read with Section 9 of the Commission of Inquiry Act No. 17 of 1948;"

එහි සිංහල පරිවර්තනය මෙසේයි:

24වන පරිච්ඡේදයේ කලින් ප්‍රකාශ කර ඇති පරිදි, ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයා අප ඉදිරියේ ලබාදුන් සාක්ෂිවලින් සමහර සාක්ෂි සදොස් සහිත බව පෙනී යන්නේ දැයි ගරු නීතිපතිවරයා සහ අනෙකුත් අදාළ බලධාරීන් සලකා බැලිය යුතු බවට අපි නිර්දේශ කර සිටින අතර, එම සමහර සාක්ෂි සදොස් සහිත බවට පෙනී යන්නේ නම්, දණ්ඩනීති සංග්‍රහයේ 179 සහ/හෝ 188 යන ඡේද අනුව හෝ අන් කිසියම් නීතිමය ප්‍රතිපාදන, සහ 1948 අංක 17 දරන විමර්ශන කොමිෂන් සභා පනතෙහි 9වැනි ඡේදය හෝ යටතේ රවි කරුණානායක මහතාට එරෙහිව නීතිමය පියවර ගත යුතු දැයි තීරණය කරන ලෙසටද නිර්දේශ කර සිටිමු.

ඉහත අංක 1 ලෙස මේ ප්‍රකාශයේ මා දක්වා ඇති ජනාධිපතිවරයාගේ විශේෂ ප්‍රකාශයේ මා පිළිබඳව කරන ලද සිංහල භාෂාවෙන් සඳහන් කිරීමට පදනම් විය යුත්තේ, කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ අඩංගු ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිච්ඡේද 33 හා විශේෂයෙන් එහි අංක 24 හා 25 විය යුතුයි.

ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරයාගේ මෙම ප්‍රකාශයට පදනම් වූ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් වාර්තාවේ සඳහන් වන්නේ අංක 24, 25 අංක දරන ඡේද තුළ පමණයි. එම ඡේදයන්හි මාහට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම යටතේ නඩු පැවරිය යුතු බව හෝ අසත්‍ය සාක්ෂි දීමක් සම්බන්ධව නඩු පැවරිය යුතු බව කිසිම තැනක සඳහන් වී නැහැ. ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි, ජනාධිපතිවරයා විසින් කොමිසම පත් කිරීමට අදාළව නිකුත් කළ අභිනියෝගය -mandate එක-අනුවත් මේ කාරණා කොහෙත්ම අදාළ නැති බව. නමුත් අපව කොමිසමෙන් කැඳවනු ලැබුවා. යහ පාලන සම්මුති ආණ්ඩුවේ නියම උරුමක්කාරයන් ලෙස අපි ඊට සම්පූර්ණ සහයෝගය දැක්වූවා. අපි කිසි විටෙකත් කොමිසමට බලපෑම් කළේ නැහැ. සම්පූර්ණ සහාය දුන්නා. ඒ අපි වැරැදි කරලා නැති නිසායි. ඒකයි අපි බය නැතිව ඉදිරියට ගියේ.

ඒ අනුව ඔප්පු වන්නේ කුමක්ද?

එනම්, ජනාධිපතිවරයාගේ ප්‍රකාශයේ සඳහන්, "ඇලෝසියස් පවුලට අයත් සහ ඔවුන්ගේ පාලනයට නතුව තිබූ වෝල්ට් ඇන්ඩ් රෝ සමාගම විසින් පෙන්ටිහවුස් තට්ටු නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත්, දණ්ඩ නීති සංග්‍රහය යටතේ කොමිෂන් සභාවට ඔහු අසත්‍ය සාක්ෂි දීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත් මෙම වාර්තාවේ සඳහන් වෙනවා." යනුවෙන් සඳහන් වූ කොටස සම්පූර්ණයෙන් සත්‍යයෙන් තොර බවයි මට කියන්න තිබෙන්නේ. ඒ වාගේම පැහැදිලි වන කරුණක් තමයි, මෙතරම් විශාල වාර්තාවක් දින තුනක් වැනි කෙටි කාලයක් තුළ හැදෑරීම සඳහා ජනාධිපතිවරයාට කාලයක් නොමැති බව. එවැනි පසු බිමක සත්‍යයෙන් තොර, විකෘති ප්‍රකාශ එතුමාගේ ප්‍රකාශයට ආවේ කොහොමද? ජනාධිපති කියන්නේ මේ රටේ රාජ්‍ය නායකයායි. ඒ රාජ්‍ය නායකයා, ඔහු විසින්ම පත් කළ කොමිසමේ නිර්දේශ ඇතුළත් වාර්තාවක කරුණු මේ ආකාරයට විකෘති කර ඉදිරිපත් කිරීමේ අපේක්ෂාව මොකක්ද? ජනාධිපතිතුමා මේ විධියට හිතුමතේ කාරණා ප්‍රකාශ කර නැති බව මම හොඳින්ම දන්නවා. මේක කරන්න බලපෑම් කළේ කියන කවුද එක තමයි තිබෙන ප්‍රශ්නය.

ඒ කෙසේ වුවත්, මේ මොහොතේ මට කියන්න තිබෙන්නේ, ජනාධිපතිතුමා විසින් කරනු ලැබූ මෙම ප්‍රකාශය මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මාගේ කීර්තිනාමයට, දේශපාලන ජීවිතයට, අතිශය හානි සිදු වී තිබෙන බවයි. විශේෂයෙන්ම මා කෙරෙහි විශ්වාසය තැබූ ජනතාවට, ඒ වෙනුවෙන් මට ඉඩ හසර විවර කළ ආදරණීය එක්සත් ජාතික පක්ෂයට විශාල හානියක් සිදුව තිබෙනවා.

මා මේ අවධාරණය කරන්නේ හුදු හිතලුවක් නොවෙයි. හේතු ඇතිවයි මා මේ කාරණයත් මතු කරන්නේ. ඒ වෙනුවෙන් බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව මෙතෙක් සිදු වූ සාකච්ඡා පිළිබඳව ඔබේ අවධානය යොමු කරවමි.

අගමැතිතුමා විසින් පත් කරන ලද පිටිපන කොමිසමේදීත්, ඉන් පසුව ඩිව් ගුණසේකර මහතා යටතේ කෝප් කමිටුවේ මේ පිළිබඳව කරුණු විභාග කෙරුණා. ඉන්පසුව නැවත මේ පිළිබඳව සුප්‍රීම් උසාවියේ කරුණු විභාග කෙරුණා. පසුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හමුවේ නැවත වතාවක් විභාග කෙරුණා. අනතුරුව සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටුවෙහි මෙම බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව විමර්ශනයක් සිදු වුණා. මේ එකදු අවස්ථාවක හෝ මාගේ නම සම්බන්ධ වුණේ නැහැ. ඉන්පසුව නැවතත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසම හරහා මෙම ගනුදෙනුව ගැන විමර්ශන කටයුතු ආරම්භ කෙරුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන් සිට මෙම පරීක්ෂණවල තත්ත්වය වෙනස් වුණා. මේ සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කළ අවස්ථා පහේදීම නොනිබුණු මගේ නම මේ ප්‍රශ්නයට ඇදී ආවා. මීට ඉහත මේ සම්බන්ධ පරීක්ෂණ කළ ආයතන මා මේ ගැටලුවට සම්බන්ධ කර නොගත්තේ මහ බැංකුව මා යටතේ තිබූ ආයතනයක් නොවූ බව පැහැදිලි ලෙස දැන සිටීම නිසායි.

පසුගිය පරීක්ෂණ සිදු වුණු විවිධ ආයතන, විවිධ පැතිවලින් මෙම ගනුදෙනුව පිළිබඳව පරීක්ෂණ පැවැත්වූවා. ඒ සියලුම ආයතන කිසිදු අයුරකින් මගේ නම සම්බන්ධ කර නොගෙන තිබුණත් පැත්තක තිබූ මගේ නම ජනාධිපති කොමිසම හමුවේ, මේ ගනුදෙනුවට සම්බන්ධ කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාස දහසක් තිස්සේ මටත්, පවුලේ උදව්යටත්, එක්සත් ජාතික පක්ෂයත් පව්කාරයා ලෙස සලකා ගල් ගැසුවේ මේ ටික කියන්නද? මාව පව්කාරයා කරලා, කුරුසිය කරේ තියලා, කල්වරි කන්ද නග්ගන විධියට මාධ්‍ය සංදර්ශන පැවැත්වූයේ මේ ටික කියන්නද? ඇත්තටම මේ තුළ සිදුව ඇත්තේ, "කන්දක් විළි ලා මීයෙක් වැදුවා" වැනි දෙයක් නොවේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පුදුම එළවන ප්‍රකාශයක් නොවේද? මොවුන් මාස 10ක් බලා සිටියේ මේක කියන්නද?

I believe resurrection is after crucifixion. අනෙක් අතට මා කොමිසමට සහාය දැක්වීමට ස්වේච්ඡාවෙන් ගොස් පැය දෙකහමාරක් පුරා සාක්ෂි ලබා දුන්නා. නමුත් මා සාක්ෂි දුන් පසු චෝදනා ඉදිරිපත් කළ පාර්ශ්වයෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමකට

ඉඩ දුන්නේ නැහැ. එවැනි පසුබිමක මෙසේ අභූත චෝදනා කිරීම තේරුම් ගැනීමට අපහසුයි. මේ තුළ තිබෙන හාස්‍ය ජනක කරුණක් වනුයේ මට එරෙහිව සාක්ෂියක් කර ගන්න ගෙන ආ කාන්තාවට රජයේ ප්‍රභූ ආරක්ෂකයින් හයදෙනකු ලබා දීම, ඒ වාගේම ඇයගේ සහෝදරයා වෙත ප්‍රභූ ආරක්ෂකයින් දෙදෙනකු ලබා දීමයි. එහෙත් යහ පාලනය ගෙන ඒම වෙනුවෙන් කැපවීම් කර ඒ නිසාම බැට කමින් සිටින මේ කථා කරන මා හට කිසිදු ආරක්ෂකයකු ලබා දී නැහැ. තිබුණු ඒවාත් මම හාර දුන්නා. ඒ වාගේම මම කියපු බොරු සාක්ෂි මොනවාද කියා දැන ගන්න මට අයිතියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවේ බොරු ප්‍රකාශයක් කළා නම් Commissions of Inquiry Act එකේ Section 10 යටතේ ඒ අවස්ථාවේදීම මට එරෙහිව කටයුතු කිරීමට කොමසාරිස්වරුන්ට හැකියාවක් තිබුණා. ඒ සඳහා බලයක්ද ඔවුන් සතුව තිබුණා. නමුත් මාස 5ක් ගත වී, ඊට අදාළව කිසිදු පියවරක් නොගෙන මෙසේ මා හට චෝදනා නැඟීම තේරුම් ගන්නේ කොහොමද? මා ඒ පිළිබඳව නැවතත් අවධාරණය කරන්නේ මේ දේශපාලන කුමන්ත්‍රණයක් බවයි. ඒ විතරක් නොවෙයි, නීතිපති දෙපාර්තමේන්තුවේ අය බොහොම සටන්කාමී ස්වරූපයකින් තමයි එතැන සිටියේ. ඒක මාස පහකට පස්සේ ඒ අයට කියන්න අවශ්‍යතාවක් නැහැ. එතැන බොරු සාක්ෂි කියනවා කියලා තිබුණා නම්, ඊට පසුවදා ගන්න තිබුණා. මම මේ අභියෝගය කරන්නේ මෙතැන පුදුමාකාර තත්ත්වයක් ඇති වී තිබෙන නිසායි.

ඇත්ත වශයෙන්ම මා දුන් සාක්ෂි හරිද, වරදිද තීරණය කරන බලයක් එම කොමිසමට තිබුණා. ඒවා නිවැරදිද සෙවීමට යන්ත්‍රණයක් ඒ කොමිසමට තිබුණා. ඒ කිසිවක් සිදු නොකොට අද මෙවැනි තීරණයක් නැති ප්‍රකාශයක් වාර්තාවට ඇතුළත් කරන්නේ කාගේ වුවමනාවටද? නමුත් මේ කටයුතු හරහා මාව දේශපාලනිකව ඝාතනය කිරීමට කවරෙකුට හෝ තිබූ වුවමනාව ඉතා හොඳින් පෙනී ගියා. එසේම එය අදටත් සිදු වන බව මේ සිදුවීම් පෙළ කියා පානවා.

අන්තිමේදී මෙම කොමිසමට ප්‍රශ්නයක්ව ඇත්තේ, මාගේ දියණිය කුලියක් ගෙවීම පිණිස ලබා ගෙන ආපසු ගෙවූ රුපියල් මිලියන 11 ගැන පමණද? මම අද ඒ කුමන්ත්‍රණකාරයන්ගෙන් අහනවා, "මේකද, බැඳුම්කරයේ ලොකුම චෝදනාව?" කියා. අන්තිමට ඒ චෝදනාවටත් මොකද වුණේ?

මීළඟට මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා, බැඳුම්කර නිකුතුව සම්බන්ධ ජනාධිපති කොමිෂන් වාර්තාවේ Chapter 24, page 827 වෙත.

මුදල් ප්‍රතිපූරණය -reimbursement- පිළිබඳ රිසිට් පත්වලට අවධානය යොමු නොකිරීම ගැනයි මා මේ පෙන්වා දීමට සූදානම් වන්නේ.

වෝල්ට් ඇන්ඩ රෝ ඇසෝසියේට්ස් සමාගමට මාගේ පවුල විසින් මුදල් ප්‍රතිපූරණය -reimbursement- කළ බව, එනම් ලබා ගත් මුදල් ආපසු ගෙවූ බව මා හට ඔප්පු කිරීමට නොහැකි වූ බව, එනම් කිසිදු සාක්ෂියක් පෙන්වීමට නොහැකි වූ බව - "...Mr. Karunanayake did not produce any evidence to show that any such reimbursements had,..." - කොමිසම් වාර්තාවේ පිටු අංක 827හි දක්වා තිබෙනවා.

එහෙත් පිටු අංක 832දී දක්වා ඇති පරිදි මාගේ පිළිතුරේදී, "I got the receipt here that the reimbursement has taken place" යනුවෙන් "ප්‍රතිපූරණය සිදුවූ බව පෙන්වන රිසිට් පත් මෙන්න" යනුවෙන් ප්‍රකාශ කළ බව වාර්තාවේ සඳහන් වෙනවා.

එම රිසිට් පත් එදා එලෙස ඉදිරිපත් කළත්, එය බැලීමට හෝ ඒ පිළිබඳ තවදුරටත් සොයා බැලීමට කිසිදු උත්සාහයක් එදා ගෙන තිබුණේ නැහැ. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. ඒ කොහොම වුණත් අදාළ රිසිට් පත් ඉදිරිපත් කරන විට ඒ ගැන නොසලකා සිට දැන් මෙලෙස චෝදනා නැඟීම ඉතාම කනගාටුදායකයි. මම දන්නේ නැහැ, මේ ජනාධිපති කොමිසමක විධියද කියලා. ඒත් කොමිසමේ විධිය මේක නම් මගේ දියණිය විසින් ප්‍රතිපූරණය කළ, මා විසින් කොමිසම හමුවට ඉදිරිපත් කළ රිසිට් පත් පිළිබඳ අවධානය යොමු නොකොට කටයුතු කිරීම නිසා මට අගතියක් වූ බව සඳහන් කරන්න ඕනෑ.

එදා යහ පාලන සම්මුති ආණ්ඩුව වෙනුවෙන් මම තීරණයක් ගත්තා. මම එවකට දරපු සියලු අමාත්‍ය ධුරවලින් ඉල්ලා අස්වුණා. මම එදා පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් සිදු කරමින් සඳහන් කළා, ඉතිහාසය සහ කාලය මට හිමි තැන තීරණය කරනු ඇති බව.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මේ වාර්තාව දිහා බැලුවාම එකක් ඉතා පැහැදිලියි. ඒ, අපි 2015 දුන් පොරොන්දු ඉටු වී නොමැති බව. අපි කිසිදාක හොරු අල්ලන්න බාධා කළේ නැහැ. කොහොම හරි තෝරා ගත්ත හොරු ටිකක් අල්ලාගෙන තිබෙනවා. ඒ අය අතර රජයේ නිලධාරීන් තමයි වැඩිපුර ඉන්නේ. ඒ වාගේම තෝරා ගත්ත හොරු ටිකක් ප්‍රජාතන්ත්‍රවාදය රිසි ලෙස නමන්න ආරක්ෂා කරගෙන ඉන්න බවත් අපට දකින්නට පුළුවන්. මෙහෙම යහ පාලනය ස්ථාපිත කරන්න අමාරුයි.

යහ පාලනය යනු සිය දේශපාලන බලය හා මාධ්‍ය බලය පාවිච්චි කරලා බොරුව ඇත්ත කරලා දේශපාලන ඝාතන කිරීම නොවෙයි. දෙවෙයේ සරදමකට වාගේ යහ පාලනය වෙනුවෙන් සටන් කරපු අපට මෙසේ සිදු වීම කනගාටුදායකයි. මම හිතනවා, විරුද්ධ පක්ෂයේ අයටවත් මෙලෙස කටයුතු නොකළ යුතු බව. යහ පාලනය කියන්නේ සාධාරණ දේශපාලනයක් කරන්න සමබිමක් නිර්මාණයකොට සැමට අවස්ථාව ලබා දීමයි.

එදා ප්‍රජාතන්ත්‍රවාදය තුළ නිර්මාණය වුණේ නායකයින්; දක්ෂ නායකයින්. ඒත් මේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවත් සමඟ අද බිහි වෙලා තිබෙන්නේ මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක්. ඒ තුළ දක්ෂ නායකයන් වෙනුවට ජනප්‍රිය පුද්ගලයින්, රටේ නායකත්වයට, පාර්ලිමේන්තුවට එනවා. මේක යුරෝපයේත් අද සිදු වෙනවා. ඒ එක්කම නව මාධ්‍ය සංස්කෘතිය තුළ, සමාජය තුළ ලෝකයේ යථාර්ථයන් යම් විකෘතියකට ලක් වෙලා සමාජගත වෙනවා. මේ මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේත්, නව මාධ්‍ය භාවිතයේත් ගොදුරක් බවට මාව පත් කරන්න බලය වාගේම මුදලුත් පසුගිය කාලයේ යොදා ගත්ත බව මම මේ ගරු සභාවට කියන්න ඕනෑ. අතීතයේ ඉඳලා අපේ නායකයෝ විනාශ කරන්න කටයුතු කළා. එදා තුවක්කුවෙන්, බෝම්බයෙන් අපේ නායකයන් විනාශ කළා. අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහතාට එරෙහිව පිස්තෝලය යොදා ගත්තා. ජනාධිපති ප්‍රේමදාස මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා, ගාමිණි දිසානායක මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා, ලලිත් ඇතුලත්මුදලි මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා. ඒ හැම අවස්ථාවකම මඩ ගහන්න මාධ්‍යයත් යම් ප්‍රමාණයකට යොදා ගත්තා.

එදා තුවක්කුවෙන්, බෝම්බයෙන් කළ දේට වඩා භයානක ලෙස දේශපාලකයින් විනාශ කරන්න මාධ්‍ය නිදහසත්, මාධ්‍ය

[ගරු රවි කරුණානායක මහතා]

සංදර්ශනත් යොදා ගන්නවා. මට මේ සියල්ලටම වඩා වෙනස් අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙලා. බැදුම්කර කොමිසම් වාර්තාවේ මා සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට පත් කළ මාරපන කමිටුව කැකිල්ලේ තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඔවුන් බැදුම්කර වාර්තාවට අනුව එක්සත් ජාතික පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකු වරදක් කර නැති බව පවසනවා. ඒ සමඟම මා සම්බන්ධව කරුණු සොයා බලා කටයුතු කරන ලෙස කියා ඇති නිර්දේශ උපුටා දක්වමින් එම පරීක්ෂණ කවදා හෝ අවසන් වනතුරු මාගේ දේශපාලන කටයුතු අඩාළ කරන්න යෝජනා කර තිබෙන බවට මා දැනුවත් කර තිබෙනවා. මෙය මොන තරම් විහිලුවක්ද?

ඉදිරියේදී අපේ පක්ෂයේ නායකයන්ට කිසියම් හෝ කොමිසමකින් හෝ වෙනත් ආයතනයකින් චෝදනා එල්ල කළහොත් මා සම්බන්ධයෙන් මාරපන කමිටුවේ නිර්දේශ ඒ සියලුදෙනා සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු යැයි ඔබ සිතනවාද? එසේ නම් අපේ පක්ෂයේ ඉදිරි ගමන නැවැත්වීමට විපක්ෂය කළ යුත්තේ ඉතා සුළු කටයුත්තයි. ඒ, අපේ පක්ෂ නායකයින්ට එරෙහිව බොරු චෝදනා ඉදිරිපත් කිරීම පමණයි. මෙය කොතරම් යුක්ති සහගතද? සාධාරණද?

මේ රටේ දේශපාලනඥයින්ට නරක ජාතික පුරුද්දක් තිබෙනවා. ඒ තමයි තමන්ට එරෙහිව කිසියම් චෝදනාවක් එල්ල වුණාම, ජනාධිපති පස්සේ ගිහින් හෝ පක්ෂ නායකයා පස්සේ හැංගිලා ඒ චෝදනාවන්ගෙන් බේරෙන එක. ඒක රාජපක්ෂ පාලනය යටතේත් සිදුවුණා; අදත් සිදු වෙන බව පෙනෙනවා. ඒකේ හංගන්න දෙයක් නැහැ. කොහොමටත් ඉවුර බිඳින්නේ ගඟ නම්, අපිට වැලි කොට්ටවලින් ලොකු වැඩ කරන්න විධියකුත් නැහැ.

තවමත් කරන්න ආව දේ නොකර අපේ ඇඟේ එල්ලි-එල්ලී ගොඩ යන්න හදන අයට කියන්න දෙයක් තිබෙනවා. අද මේ ජනාධිපති පස්සේ හැංගීම නිසා නඩු නැතිව ඉන්න, එහෙත් දූෂණ වංචාවලට නම කියැවුණු කී දෙනෙක් ඉන්නවාද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිසා නඩු නැති කී දෙනෙක් ඉන්නවාද? ඒකාබද්ධ විපක්ෂයේ සිටියත් පක්ෂය balance කරන වැඩේට මුවා වෙලා කී දෙනෙක් කිසිම ප්‍රශ්නයක් නැතුව ඉන්නවාද? අද ඒ හැමෝම එක පෙළට තියලා මම මෙහෙම කියනවා. "රවි කරුණානායකගේ පොතේ ඔය දේවල් කරලා හැංගිලා බේරෙන තියරියක් නැහැ. රටේ අධිකරණයට, සමාජ යුක්තියට වෙවිටු දමන වැඩ අපි ළඟ නැහැ. ඉස්සරහට කරන්නේත් නැහැ. මොකද, හැංගෙන්න ඕනෑ වැරදි කරපු අය විතරයි. වැඩිය එපා, ඔය අද කපුරුහාමිලා වාගේ ඉන්නා සමහරු 2015 ජනවාරි 08වැනි දා රාජපක්ෂ වේදිකාවේ ඉඳගෙන කරපු කථා ටික අහන්න. ඒ එක්කම අද කියන කථා ටික අහන්න. ඔය කපුරුහාමිලාගේ වචන විතරයි, වැඩ අන්තිමයි." එදා අපේ ජනාධිපති පොදු අපේක්ෂක, මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති බවට පත් කරන්න කොතරම් අමාරුවක් තිබුණාද? ඒ අය ඒ වේදිකාවේදී කිව්වේ මොනවාද, අද කියන්නේ මොනවාද කියන එක ගැන තමයි අපට දුක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා වැනි පෘථග්ජන පුද්ගලයෙකුට මෙහෙම දේ සිදුවීම ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. මොකද, බුදුරජාණන් වහන්සේටත් මේ වාගේම වුණා. එදාත් නගර සෝභිනියක් වූ විංචි මානවිකාවගේ කුසේ දරමීටියක් බැඳලා එව්වා. විංචි මානවිකාවත් කිව්වා, කුසේ ඉන්නා දරුවා බුදුන් වහන්සේගේ කියලා. අද වාගේම එදාත් ඇතැමුන් බුදුන්ව අවිශ්වාස කළා. තවත් අය බුදුන්ව විශ්වාස කළා. තවත් අය සිදු වන්නේ කුමක් දැයි නිහඬ විශ්මයෙන් යුතුව බලාගෙන සිටියා. නමුත් එදා ශක්‍ර දෙවියන් පැමිණ දරමීටිය ලිහා නිවැරදි බව ඔප්පු කළා. නමුත්, අද ශක්‍ර දෙවියන් නැහැ. ඒ නිසාම කොමිසමත් හරි ලස්සනට කියනවා, මේ ලිහා පෙන්නපු දරමීටිය -ඇස් ඉදිරිපිට තිබෙන දරමීටිය- ඇත්තටම දරු ගැබක්ද කියලා පරීක්ෂා කරන්න කියලා. දරමීටිය දරු ගැබක් නම්, ඊට අදාළ පියාට එය භාර දෙන්න කියනවා. ඒ තල්ලුවෙන් ආණ්ඩුව බිඳ වටිටන්න මාන බලන විංචි මානවිකාවන් තවදුරටත් ඒ සෙල්ලම ඉස්සරහට ගෙනියන්න හදනවා.

"යහ පාලනය" තිබෙන්නේ සත්‍ය කුමක්දැයි සෙවීමට මිස, බොරුව ඇත්ත කිරීමට නොවන බව ජනතාව හොඳින් දන්නවා. එයට ජනතාව නිසි පිළිතුරු ලබා දෙන බව අපේ විශ්වාසයයි. පාලනයක් සිදු කරනවිට, වැරදි, අඩු පාඩු සිදු වෙන්න පුළුවන්. අපි ඒ වැරදි සහ අත් දැකීම් ගුරුවරුන් කර ගන්න ඕනෑ. තවදුරටත් බාල ජනප්‍රිය දේ සඳහා ජනතා ආකර්ෂණය ලැබෙයි කියලා හිතන්න නරකයි. මම කියන දේ අපේ ආණ්ඩුව බරපතළ විධියට ගත යුතුයි. බොරු නම් ඒ ඇත්ත නැත්ත මැතිවරණ ප්‍රතිඵල හරහා ලැබෙයි. ඒ නිසා ඡන්ද ප්‍රතිඵලයෙන් පසුවවත් අපි ආපසු හැරිලා බලමු. මේ ජනවරම තිබෙන්නේ 2015 ජනවාරි මාසයේ 08වැනි දා ලබා දුන් පොරොන්දු ඉටු කරන්නයි. ඒ සඳහාම පමණයි. බලගතු ශ්‍රී ලංකාවක්, පොහොසත් රටක් හදන්න නොහැකි වුණොත් මේ බලය අපට නැති වෙනවා. ඒ නිසා දැන්වත් අපි වැඩ කරමු; මේ රට හදමු; රටේ සංවර්ධනයට, මූල්‍ය ප්‍රතිපත්තියට අවශ්‍ය නීති නැත්නම් අලුත් නීති ගෙනෙමු. එයයි කළ යුත්තේ. එයයි අපේ වගකීම, එයයි අපි ජනවරමට ලබාදෙන වගවීම.

මගේ දරුවන්ට, පවුලට වාගේම මම ආදරය කරන්නේ අපේ පක්ෂයට; මේ රටට බොහෝ යහපත් දේ දායාද කළ එක්සත් ජාතික පක්ෂයට. අපේ නායකයින්ට -ඩඩ්ලි සේනානායක අගමැතිතුමාට, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස වැනි ජනපතිවරුන්ට, ලලිත්, ගාමිණී වාගේ නායකයින්ට, අපේ වත්මන් නායක රනිල් අගමැතිතුමාට- හැම විටම මේ කුහක මිනිසුන් වැරදි චෝදනා කළා. එහෙත් කවදාවත් ඒ චෝදනාවලින් ඒ ඇත් රාජයන්ට හානි කරන්න බැරි වුණා. අද මේ වෙනත් ස්වරූපයකින් කරන්නේත් එදා කළ දේමයි. අද අපිට අවශ්‍ය වන්නේ නායකයින් විනාශ කිරීම නොව, බිහි කිරීම බව අපේ පාක්ෂිකයින් තේරුම් ගෙන තිබෙනවා.

අවසානයේදී, මා රටේ සිටින අපේ යූඑන්පී පාක්ෂිකයන්ගෙන් ආදරයෙන් ඉල්ලන්නේ, 2018 පෙබරවාරි මාසයේ 10වන දින උදෙන්ම ඡන්ද පොළට ගිහින් ඔබේ ගම, ප්‍රදේශය දියුණු කළ හැකි යූඑන්පී ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් පත් කරන්න, එමඟින් එක්සත් ජාතික පක්ෂය දිනවන්න, යහ පාලන ආණ්ඩුව ශක්තිමත් කරන්න ඔබේ වටිනා ඡන්දය පාවිච්චි කරන්න කියලායි.

අපේ පොදු අපේක්ෂක ජනාධිපතිතුමාටත්, අපේ අගමැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂයටත්, සත්‍යයට යුක්තියට කැප වන ජනතාවටත් ජය වේවා! සත්‍යය සැඟවිය හැක්කේත්, පරාජය කළ හැක්කේත් කෙටි කාලයකට පමණයි. කවදා හෝ සත්‍යය හෙළිදරවු වනු ඇත; ජය ගනු ඇත. අප සැම උත්සාහ කළ යුතු වන්නේ සත්‍යය ඉක්මනින් ජයග්‍රහණය කරවීමටයි. සත්‍ය මේව ජායතේ! බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා.

[අ.භා. 2.27]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලන්න ආ ආණ්ඩුව 2015 ජනවාරි 09වන දා බලයට පත් වෙලා හරියටම දින 49කින් මහ බැංකුවේ මහා කොල්ල කෑම 2015 පෙබරවාරි 27වන දා සිදු කළා. එතැන් පටන් මේ වංචාව දිගින් දිගටම සිදු වූ බව තමයි මේ වාර්තාවෙන් පැහැදිලි වන්නේ. මෙවැනි මහා අපරාධයක් කරන්න විදේශිකයකු වූ අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකාවට ගෙනැල්ලා මහ බැංකුවේ අධිපති තනතුරෙහි වාඩි කරවන්නේ අගමැතිතුමායි. ඉතිහාසය පුරා මුදල් අමාත්‍යවරයාට හිමි වූ මහ බැංකුව අගමැතිවරයා යටතේ ගැසට් කරවාගන්න කටයුතු කරන්නේ අගමැතිතුමායි. ඒ අනුව මේ මහා මංකොල්ලය සැලසුම් කරන්නේ අගමැතිතුමායි කියන කාරණය ඉතාම හොඳින් තහවුරු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය මා විතරක් නොවෙයි කියන්නේ. ජනාධිපතිතුමා ම ප්‍රකාශ කරනවා, "මම මේකට විරුද්ධ වුණා. ඒ අවස්ථාවේ 'මේ පත්වීම පිළිබඳ වගකීම මම භාර ගන්නවා' කියා අගමැතිතුමා එම වගකීම භාර ගත්තා" කියලා. එහෙම නම් මේ මහා මංකොල්ලය සැලසුම් කළ මහා මොළකරු අගමැතිතුමා නොවන්නේද යන ප්‍රශ්නය අපට මතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ප්‍රථම වතාවට තමයි මෙවන් දෙයක් රටේ අගමැතිවරයාගේ මැදිහත් වීමෙන් සිද්ධ වන්නේ. මා හිතනවා එය ගිනස් වාර්තාවක් බවටත් පත් වෙලා ඇති කියා. අපට මතකයි අගමැතිතුමා ප්‍රකාශ කළා, "අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ විශ්වාසවන්ත පුද්ගලයෙක්; මගේ හිතවතෙක්. සිංගප්පූරුවේ විවාහ උත්සවයකට ගියේත් මගෙන් අහලායි. ඕනෑම අවස්ථාවක මට ඔහු ගෙන්වා ගන්න පුළුවන්" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අධිකරණයට අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා ඕනෑ වෙලා තිබෙනවා. එහෙම නම් ජනාධිපතිතුමා දැන් තමන්ගේ අගමැතිවරයාට අණ කරන්න ඕනෑ සිංගප්පූරුවට ගිහින් හෝ වහාම අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට අරගෙන එන්න කියා. ඒ වාගේම එතුමා අණ කරන්න ඕනෑ ඔහු අරගෙන එන්න බැරි නම් ඔබතුමා සිංගප්පූරුවේ ම නතර වන්න කියා. එහෙම වුණොත් ජනාධිපතිතුමාගේ නව අගමැතිවරයකු පත් කරගැනීමේ සිහිනයත් සැබෑ කරගන්න පුළුවන් වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැඳුම්කර පිළිබඳ ජනාධිපති කොමිසම ආවරණය කරන්නේ 2015 පෙබරවාරි 01වන දා ඉඳන් 2016 මාර්තු 31 දක්වා සිදු වූ වංචා සොයා බැලීමයි. නමුත් අර්ජුන මහේන්ද්‍රන් තවත් මාස තුනක් -ඒ කියන්නේ 2016 ජූනි මාසයේ 30වන දා දක්වා- මහ බැංකු අධිපති විධියට කටයුතු කළා. එහෙම නම් 2016 අප්‍රේල් 01වන දා සිට 2016 ජූනි 30 දක්වා අර්ජුන මහේන්ද්‍රන් කළා වූ ක්‍රියාකාරකම් පිළිබඳව මේ වාර්තාවෙන් ආවරණය වන්නේ නැහැ. ඒ නිසා මම හිතනවා, මහ බැංකුවේ සිදු වූ මේ මහා වංචාවේ දිග හැරුම ගැන අවබෝධයක් ලබා ගන්න නම් ජනාධිපතිතුමා එම කාලය ද ආවරණය වන පරිදි දෙවන ජනාධිපති විමර්ශන කොමිසම අනිවාර්යයෙන්ම පත් කළ යුතුය කියා. වඩාත් හොඳයි 2016 අප්‍රේල් 01වන දා සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය ම ආවරණය වීමට දෙවන ජනාධිපති කොමිසම පත් කරනවා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වාර්තාවට හසු නොවන කාලය තුළදී 2016 අප්‍රේල් මාසයේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ලැබූ ලාභය රුපියල් මිලියන 4,120යි; මැයි මාසයේදී රුපියල් මිලියන 790.8යි; ජූනි මාසයේදී රුපියල් මිලියන 409.4යි. මෙවැනි අසාමාන්‍ය ලාභයක් ලැබීමට නම් අනිවාර්යයෙන්ම වංචාව මාර්තු 31න් නොනැවතී ඉදිරි කාලයටත් ක්‍රියාත්මක වී තිබිය යුතුයි. ඒ නිසා දෙවන ජනාධිපති කොමිසම පත් කිරීමෙන් පමණයි, මේ යුගයේ මෙවැනි අසාමාන්‍ය ලාභ ලැබීමට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට පුළුවන් වුණේ කෙසේද, ඒ සඳහා රජයේ ඉහළ තනතුරු දරන එක් එක් පුද්ගලයන්ගේ දායකත්වය කුමක්ද කියන එක සොයා ගැනීම කරන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මා ඉදිරිපත් කරන ඉලක්කම්. අපි කියන විධියට ඒ මාස තුනට රුපියල් මිලියන 5,320ක ලාභයක් ලබා තිබෙනවා. මාස තුනට රුපියල් මිලියන 5320ක්! මේ ඉලක්කමත් නිවැරදිද, ඊටත් වඩා වැඩිවිය හැකිද කියන කාරණය පිළිබඳව මූල්‍ය පාලන අධිකාරිය හැටියට මේ පාර්ලිමේන්තුව මහ බැංකුවෙන් සහතිකයක් ලබාගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට වචන හරඹ කරන්න පුළුවන්. අද හැමෝම කරුණු මතු කරනවා, එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තු මැතිවරණයේදී නොමසුරුව වියදම් කළේ මේ බැඳුම්කර වංචාවෙන් උපයාගත් ලාභය කියලා. එහෙම නම් ඒ මාස තුනේදී උපයා තිබෙන රුපියල් මිලියන 5,200ට අධික ලාභය මේ පුංචි මැතිවරණයේදීත් එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කිරීම සඳහා සෑම තැනම වියදම් වෙනවා වෙන්න පුළුවන්. ඒ නිසා වහාම මේ මුදල් රජයට පවරා ගැනීමට යුහුසුළුව ක්‍රියාත්මක වීමේ වගකීම පාර්ලිමේන්තුවටත්, සැබෑ යහ පාලනයක් බලාපොරොත්තු වන සෑම දෙනාටත් තිබෙනවාය කියන එක මම මේ ගරු සභාවට සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 ජනවාරි 03වන දා ජාතිය අමතමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, මේ වාර්තාවේ පිටු 1,257ක් තිබෙන බව. අන්තර්ජාලයට මුදා හැරි අවස්ථාවේ මා ගණන් කළාම පිටු තිබුණේ 1,154යි. මුද්‍රිත වාර්තාවේ තිබෙන්නේ 1,152යි. ඒ අනුව පිටු 103ක් හෝ 105ක් අතුරුදහන් වෙලාය කියලා අපි රට ඉදිරියේ කිව්වාම, ආණ්ඩුවේ ඇමතිවරු කිව්වා, ජාතිය නොමඟ යවන්න එපා කියලා. නමුත් මා කී දේ නිවැරදියි, ඇමතිවරු වැරදියි කියා අතිගරු ජනාධිපතිතුමන් පිළිගෙන, තිබෙන සංවේදීභාවය, රහස්‍යභාවය සලකා එතුමා විසින් යම් යම් ලේඛන ප්‍රමාණයක් ඉවත් කළ බව සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට CD තැටියක් ලැබුණා. ඒ CD තැටියේ අන්තර්ගතය මොකක්ද කියලා ලේඛලයක්වත් අලවා නැහැ. සමහරු අපට කියනවා, ජනාධිපතිතුමා විසින් සභාවාගත් ලේඛන ටික තමයි එහි තිබෙන්නේ කියලා. ඒක එහෙමද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. අපට ඒක කියවන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා මේ විවාදයේදී ඒ ගැන කථා කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ CD පටය අධ්‍යයනය කිරීමෙන් පසු මෙහි අන්තර්ගත ගැන, මෙතෙක් සභාවාගෙන තබා සිටි, අප විසින් මහත් පරිශ්‍රමයෙන් හෙළිකර ගත් ඒ ලේඛන පිළිබඳ තවත් පාර්ලිමේන්තු විවාදයක් පැවැත්විය යුතුයි කියා අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කොමිෂන් සභා වාර්තාවේ 860වන පිටුවේ සඳහන් වෙනවා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම පිළිබඳව මහ බැංකුව මඟින් සිදු කරන ලද විමර්ශන වාර්තාවක්. ඒ වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ; Report of the Examination of Perpetual Treasuries Limited. ඒ වාර්තාව අංක 01 ලෙස නම් කරමින් මම **සභාගත*** කරනවා.

එම වාර්තාවේ 10වන පිටුවේ 'ඩී' කොටසේ අර්ජුන මහේන්ද්‍රන් තම බලතල භාවිත කරමින් තම බෑණා වන අර්ජුන් ඇලෝසියස්ගේ සමාගමට මහ බැංකුවේ දෛනික ද්‍රවශීලතා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

පහසුකම් අවභාවිත කරමින් රුපියල් බිලියන 41.98ක මුදලක් ලබාදී තිබෙන බව සඳහන් වෙනවා. Sir, let me quote Item (d) (ii) on page No. 10 of the Report:

"On 01.04.2016 PTL participated at the OMO auction to borrow Rs.22 bn at 8% to cover the shortfall to settle the T bonds received (Rs.36 bn) at the auction for settlement on 01.04.2016. Further PTL used the Intra Day Liquidity Facility (ILF) to borrow Rs.19.98 bn throughout the day (01.04.16). However, the company was unable to provide the required securities to secure the funding from the OMO auction amounting to Rs.11.1 bn. and was fined a penalty of Rs.7.6 mn....."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙහි ඉතා පැහැදිලිව සාක්ෂි සඳහන් වනවා, මාමා විසින් මහ බැංකු අධිපති තනතුර තමන්ගේ බෑණාගේ සුගතිය වෙනුවෙන් කොහොමද පාවිච්චි කළේ කියලා. දෙවැනි කොමිසමක් පත් කළොත්, අනිසි ලෙස උපයාගත් ලාභය රජයට අය කර ගැනීමට පමණක් නොවෙයි, මේ මහා වංචාව සම්බන්ධයෙන්ද අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දීමට කටයුතු කරන්න පුළුවන් වන බව අපි කල්පනා කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ 19 වන පිටුවේ 2 වගන්තියේ මෙසේ කියනවා:

"Outright Dealings of PTL with Perpetual Capital Holdings (Pvt) Ltd"

මේ මහ බැංකු වංචාව පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ගණනය කරන ලද, පර්පෙචුවල් ට්‍රෙෂරීස් උපයා ගත්ත ලාභය කියන එක ඇත්තෙන්ම අවතක්සේරු කරන ලද ලාභයක්. එහෙම වෙන්නේ, පර්පෙචුවල් ට්‍රෙෂරීස් අපූරු වැඩක් කරන නිසා. ඔවුන් මිලදී ගන්නා බැඳුම්කර ඔවුන්ගේ මව් සමාගමට ලාභයක් රහිතව, පාඩු පිට විකුණනවා. ඉන්පසු මව් සමාගම ඒ බැඳුම්කර ඉහළ මිලකට විකුණලා ලාභ ලබනවා. දැන් මේ ලාභය තිබෙන්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස්වල නොවෙයි, පර්පෙචුවල් ට්‍රෙෂරීස්වල මව් සමාගමේ. එතකොට, මේ බැඳුම්කර සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමට ඒ මුදල හෙළි වෙන්නේ නැහැ, මේ කියන ආකාරයට. This is what Item 2(i) on page 19 states:

"PTL has carried out sell and buy deals with its holding company, Perpetual Capital Holdings (Pvt) Ltd (PCHL) which has resulted in capital gain of Rs. 323.6 million to PCHL during the period from 01.06.2015 to 31.05.2016."

මේ වංචනික ක්‍රියාවලිය පිළිබඳව දෙවන ජනාධිපති කොමිෂන් සභාවේ අවධානය යොමු කරනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වනවා.

මේ වාර්තාව මහ බැංකු අධිපතිවරයාට ලැබෙන්නේ 2015 දීයි. දැනට මේ වාර්තාව ලබා දීලා වසර දෙකකට වැඩියි. මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ග මොනවාද කියන එක පිළිබඳව වත්මන් මහ බැංකු අධිපතිවරයා මේ ගරු සභාවට ගෙන්වලා ප්‍රශ්න කරනු ඇතැයි කියලා අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාර්තාවේ මගහැරුණු පිටු ගැන කථා කරද්දී, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධිපති අර්ජුන් ඇලෝසියස් සමඟ අසාමාන්‍ය ආකාරයෙන් දුරකථනයෙන් රහසේ උකුළු මුකුළු කරපු මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් වුණා. මම කැමැති නැහැ ඒ නම් සඳහන් කරන්න. මොකද, එතුමන්ලා වැරදිකරුවන් නොවී එතුමන්ලාට ප්‍රශ්නයක් ඇති කරන්න මම කැමැති නැහැ. නමුත්, අද සමාජයේ ප්‍රබල මතයක් තිබෙනවා එම මන්ත්‍රීවරුන්ට වාහන, ඉඩම්, නිවාස ලැබුණාය කියලා. ඒ පිළිබඳ විස්තරද ජනාධිපතිතුමා විසින් රඳවා තබා ගත්තාද කියන කාරණය මම දන්නේ නැහැ. පළමුවෙනි කොමිසමෙන් ඒ පිළිබඳ විමර්ශනයක් සිදු නොවුණා නම්, ඒ මන්ත්‍රීවරුන්ටත් සාධාරණයක් වෙන්න, ඊටත් වඩා මේ මුදල්වල සැබෑ අයිතිකරුවන් වන රටේ ජනතාවට සාධාරණයක් වෙන්න, පාද සටහන් යොදපු, දුරකථන ඇමතුම් ගත් මන්ත්‍රීවරුන්ට එරෙහිව එන චෝදනා පිළිබඳව විමර්ශනයක් දෙවැනි කොමිසම විසින් සිදු කිරීම අනිවාර්යෙන්ම විය යුතුයි කියලා අපි කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ජුන මහේන්ද්‍රන්ගේ නිල කාලය තුළදී කරන ලද වියදම් පිළිබඳ සම්පූර්ණ අභ්‍යන්තර විගණන වාර්තාවක් වත්මන් මහ බැංකුවේ අධිපතිතුමාට 2016.08.01 වන දා භාර දෙනවා. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - Internal Audit Department - හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන්ගේ විදේශ ගමන් ඇතුළුව අනෙකුත් වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව -"Review of the Procedures Adopted on Foreign Travel and Other Expenses of the Former Governor" - අංක 02 යනුවෙන් සඳහන් කරමින් මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව අනුව අවස්ථා 163කදී රාජ්‍ය මුදල් අවභාවිත කරමින් රුපියල් මිලියන 66.28ක වංචාවක් අර්ජුන් මහේන්ද්‍රන් සිදු කළ බවට ඔහුගේම යටතේ තිබුණු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වාර්තා කරලා තිබෙනවා. මේ වාර්තාව දෙන්නේ 2016 අගෝස්තු මාසයේ 01 වන දා, මීට මාස 16කට කලින්. වර්තමාන මහ බැංකු අධිපතිතුමා මාස 16ක් පුරාවට මේ වාර්තාව පිළිබඳ ගත් පියවර මොනවාද කියන එක ඔහු විසින් රටටත්, මේ ගරු සභාවටත් හෙළි කළ යුතුමයි. එහෙම නැත්නම් දූෂණයක් යටපත් කිරීම, දූෂණයට අනුබලදීම සම්බන්ධයෙන් වත්මන් මහ බැංකු අධිපතිවරයාද නීතිය ඉදිරියට ගෙන යෑමට සිදු වන බව අපි එතුමාට ඉතාම කනගාටුවෙන් සඳහන් කරනවා. මොකද, එතුමාත් අපේ අගමැතිතුමාගේ පන්තියේ හිටපු මිත්‍රයෙක් වාගේම, අපේ හිතවත් මලික් සමරවික්‍රම ඇමතිතුමාත් සමඟ එකට රගර් ක්‍රීඩාවේ යෙදුණු මිත්‍රයෙක් බවට තමයි අපට ආරංචි තිබෙන්නේ. එම නිසාද දන්නේ නැහැ, වයස අවුරුදු හැටඅටක් වෙලත් එතුමාට මහ බැංකු අධිපති තනතුර ලැබුණේ.

ඒ විතරක් නොවෙයි, අද වන තුරු පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව ඉදිරියටවත් එතුමා පැමිණ නැහැ. එතුමාට එම විශේෂ වරප්‍රසාදය ලැබුණේ, අගමැතිතුමාගේ සමීප මිතුරෙක් වීම නිසාද, ඒ වාගේම අපි සඳහන් කරන මේ වංචාව පිළිබඳව කිසිම පියවරක් නොගෙන සිටින්නේත් ඒ නිසාද? අප වාගේම සමස්ත ජාතියම, තමන්ගේ අරමුදල්වලට මොකද වෙන්නේ කියලා ඝාතීශය කම්පාවට පත් වෙලා ඉන්න මේ රටේ බහුතර ජනතාවම එම ප්‍රශ්නය නහනවාය කියන එක මෙම ගරු සභාවට මා සිහිපත් කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ගැනත් පොඩ්ඩක් ප්‍රශ්න සහිතව නේ අපි මේ වැඩේ පටන් ගන්නේ. කුප්‍රකට, අපරාධ සම්බන්ධයෙන් ඉහළ නමක් දරන රාජ් රාජරත්නම්ගේ Galleon Research Services Limited කියන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරයෙක් තමයි ඉන්ද්‍රජීත් කුමාරස්වාමී මැතිතුමා. ඒ බව සනාථ කරන්නට, සමාගමේ අධ්‍යක්ෂවරයෙක් විධියට එතුමා -

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා- අත්සන් කරලා, ඒ සමාගම ඇමෙරිකා එක්සත් ජනපදයේ සක්‍රිය සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කරන මෙන් දන්වා යවපු, "DS01: Striking off application by a company" කියන ලියවිල්ල අංක 03 ලෙස නම් කරමින් **සභාගත*** කරනවා.

ඒ වාගේම එතුමා එතැන සේවය කරන කාලයේ -යුතු අයුතු කෙසේ වුවත්- දැවැන්ත ධනයක් උපයලා, එංගලන්තයේ ඉතාම අධික වටිනාකමකින් යුතු නිවසක් මිලදී ගන්නවා. එම, 1A Elm Tree Court, Elm Tree Road, London, England, NW8 9JT. දරන නිවස මිලදී ගැනීම තුළ විදේශ විනිමය විශුද්ධිකරණය වීමක් සිදු වී තිබෙන බවට බරපතළ සැකයක් මතු වන නිසා මේ පිළිබඳව විමර්ශනයක් පැවැත්විය යුතුයි. හැබැයි විදේශ විනිමය පාලක සිටින්නේ එතුමා යටතේ නිසා "හොරාගේ අම්මාගෙන් ජේන අහනවා වාගේ" දෙයක් බවට එය පත් වේදැයි කියන සාධාරණ බිය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු මුදල් රාජ්‍ය අමාත්‍ය, ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා ප්‍රසිද්ධියේ සඳහන් කළ ආකාරයට මෙම මහා වංචාවෙන් ආර්ථිකයට සිදු වුණු පාඩුව රුපියල් බිලියන 1,000ක්. ඒ කියන්නේ රුපියල් ට්‍රිලියනයක්. ට්‍රිලියනය කියන්නේ මේ රටේ ජනතාව මේ වංචාවට කලින් අසා තිබුණු ඉලක්කමක් නොවෙයි. ට්‍රිලියනය කියන්නේ ලක්ෂයේ ඒවා නම් කෝටියක්; කෝටියේ ඒවා නම් ලක්ෂයක්. අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ගණන් බැලීම අනුව ඒක ට්‍රිලියන දෙකටත් වඩා වැඩියි. ඒ කෙසේ වෙතත් ජාතියට මේ මහා වංචාව, මේ දැවැන්ත හානිය සිදු කිරීම පිළිබඳ වගකීම අගමැතිතුමා භාර ගත යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩු පක්ෂයෙන් කියැවෙන්නේ මේ වාර්තාවේ අගමැතිතුමාට කිසිම චෝදනාවක් නැහැ, එතුමා නිදොස් කරලා තිබෙනවා කියලායි. එහෙම වෙන්න ඉඩ තිබෙනවා. ඇයි ඒ? අපි දන්නවා, මේ සිදු වීමේදී අගමැතිතුමා කොමිසම ඉදිරියට ගිය දවසේ ඉතාම දක්ෂ ලෙස, ඉතාම තීක්ෂණ ලෙස හරස් ප්‍රශ්න අසමින් සිටි අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ඉවත් කරලා, ඒ වෙනුවට ප්‍රශ්න ඇසීම සඳහා නීතිපතිවරයාව යොමු කළා. ඒ පිළිබඳව මේ ගරු සභාවේදී මම ප්‍රශ්න කළාම අපේ ගරු සභානායකතුමා සඳහන් කළේ, "ඒක තමයි සම්ප්‍රදාය, අගමැතිවරයා එනවා නම් නීතිපති තමයි ප්‍රශ්න කරන්නේ" කියලායි. මම උගත් නීතිය අනුව අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) අනු ව්‍යවස්ථාවේ සඳහන් වනවා, "නීතිය ඉදිරියේ සියලු දෙනා සමානය" කියලා. අගමැතිට එක ක්‍රමයකුත්, අනෙක් අයට තවත් ක්‍රමයකුත් තිබෙන්න බැහැ. විශේෂයෙන්ම අගමැතිතුමාගෙන් ප්‍රශ්න අහන්න තෝරා ගත් නීතිපතිවරයා, ජ්‍යෝෂ්ඨයන් ගැන නොසලකා අගමැතිතුමා විසින්ම නීතිපති තනතුරට පත් කර ගත් කෙනෙක්. අගමැතිතුමා ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු විධියට වත්මන් නීතිපතිවරයා පත් කර ගැනීම සඳහා සහාය පළ කළ බව මුළු රටම දන්නා කාරණයක්. ඉතින් එවැනි අනිසි සම්බන්ධයක් තිබෙද්දී, බැඳියාවන් අතර ගැටුමක් තිබෙද්දී, නීතිපතිතුමා තමයි එතුමාගෙන් හරස් ප්‍රශ්න ඇහුවේ.

මුදල් අමාත්‍යාංශය යටතේ තිබිය යුතු මහ බැංකුව අගමැති යටතට ගත්තේ ඇයි? ඊළඟට, විදේශිකයකු බව දනිමින් අර්ජුන මහේන්ද්‍රන් මේ තනතුරට යෝජනා කළේ ඇයි? ගරු අගමැතිතුමනි, අමාත්‍ය මණ්ඩලය විසින් විරෝධතාව පළ කරද්දී, අර්ජුන මහේන්ද්‍රන්ට මේ තනතුර දෙන්න එපා කියද්දී, "ඒ පිළිබඳව වගකීම මා භාර ගන්නවා" යනුවෙන් ඔබතුමා ප්‍රකාශ කළාද? එසේ ප්‍රකාශ කළා නම්, එයින් ඔබතුමා අදහස් කළේ කුමක්ද? වංචාව හෙළි වීමෙන් පසුව ඒ පිළිබඳ වගකීම භාර ගත් පුද්ගලයා විධියට, වගකීම භාර ගැනීමේ ප්‍රතිඵලයක් විධියට ඔබතුමා ගත් ක්‍රියා මාර්ගය කුමක්ද?

සාමාන්‍යයෙන් වගකීම දැරූ කෙනා ඉල්ලා අස්වනවා නේද? ඊළඟට ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, එතුමාට පාර්ලිමේන්තුව හදිසියේ විසුරුවා හරින්න සිදු වුණේ, ඩිව් ගුණසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු "කෝප්" එකේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන එක වළක්වා ගන්න අගමැතිතුමා කළ ඉල්ලීම මතයි කියලා. ඔබ එවැනි ඉල්ලීමක් කළාද? ඇයි, වාර්තාව එනවාට භය වුණේ? මේ කිසි ප්‍රශ්නයක් කොමිසම ඉදිරියේ මතු නොවුණු නිසා කොමසාරිස්වරුන්ට අගමැතිවරයා සම්බන්ධයෙන් ගත යුතු නිගමනය ගැනීමේ අවස්ථාව අහිමි වුණා. එම නිසා අසාධාරණ විධියට විමර්ශනය සිද්ධ කරලා අගමැතිතුමා නිර්දෝෂී වුණාය කියලා සඳහන් කිරීම ඒ කොමසාරිස්වරුන්ට කරන අසාධාරණයක් විධියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවට අලි ගහලා මේ වනකොට අවුරුදු 3යි. අවුරුදු 3ක් තිස්සේ අපි මේ ගැන කථා කළා; සංවාද කළා; උද්ඝෝෂණ කළා; සම්මන්ත්‍රණ පැවැත්වුවා; පෙළපාළි ගියා. ගරු අගමැතිතුමනි, ඔබතුමා "කවුද, හොරා" කියලා මේ ගරු සභාවේ ඇහුවාම, මුළු රටම දැන් දන්නවා, "කවුද, හොරා" කියන එක. එම නිසා මේ ගැන කථා කරමින් සිටීමෙන් එලක් නැහැ. අදටත් මහ බැංකුව හොරා කාපු අය ඒ මහා මුදල කිසි හිරිකිතයක් නැතිව ප්‍රසිද්ධියේ භුක්ති විඳිමින් සිටිනවා. හොරු අල්ලනවා කියන නාඩගමක් පමණක් රට ඉදිරියේ දකින්න ලැබෙනවා. වෙනත් අය බිලිදීමෙන් සැබෑ හොරුන්; වංචාවේ මහා මොළකරුවන් සඟවා ගැනීමට, යටපත් කිරීමට මේ රටේ ජනතාව ඉඩ දෙන්නේ නැහැ. අමරවීර ඇමතිතුමා සඳහන් කළා, මේක මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි, ජනාධිපතිතුමා ගැන විශ්වාසය තබන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
හොඳයි. එහෙම නම්, මම ඉතිරි ටික වේගයෙන් කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එතුමා කෙරෙහි විශ්වාසය තබන්න බැරි බව අපි දන්නවා. වැටක් පැනලා පොල් ගෙඩි දෙකක් හොරකම් කළාම අල්ලා ගෙන ගිහිල්ලා රක්ෂිත බන්ධනාගාරයේ දමනවා. පොල්ලකින් ගහලා අඹ ඉත්තක් කඩා ගත්තාම අල්ලා ගෙන ගිහිල්ලා රක්ෂිත බන්ධනාගාරයේ දමනවා. මේ බැදුම්කර ගනුදෙනුව සම්බන්ධ වරදට පළමුවෙනි පුද්ගලයා අත් අඩංගුවට ගන්න අවුරුදු තුනක් ගත වුණා. මෙවැනි අපරාධයක් මීට කලින් වාර්තා වෙලා තිබෙනවාද? ජනාධිපතිතුමා මුල් යුගයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ මේ සඳහාය කිව්වා. රටේ ඉල්ලීමක් තිබුණා, මහ බැංකු අධිපති ඉවත් කරන්න කියලා. නමුත්, ඔහුගේ ධුර කාලය අවසන් වන තුරු ඒ ඉල්ලීම ඉටු වුණේ නැහැ. එම නිසා ජනාධිපති කොමිසම දිහා සැකයෙන් බලන්න අපට අනිශයින්ම සාධාරණ හේතු තිබුණා.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මා කියන්න ඕනෑ. ජනාධිපතිතුමා දැන්වත් හරියට කඩුව වනා හොරුන්ට දඬුවම් නොකළොත්, මේ රටේ ජනතාව පෙබරවාරි 10වැනි දා හොරුන්ට වාගේම ජනාධිපතිතුමාටත් දඬුවම් කරන්න කඩු වනාගෙන; කඩු අමෝරාගෙන බලාගෙන සිටිනවා කියන එක සිහිපත් කරවන්න කැමැතියි.

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන විනාඩියේ මේ කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ. චෝදනා 34ක් තිබෙන බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ කිසිම මුදල් සොරකමක් පිළිබඳව නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව වාගේ සැලසුම්සහගතව මුදල් සොරකම් කිරීමක් පිළිබඳව මේ චෝදනා 34ම නැහැ. මෙහි තිබෙන්නේ අයථාකාරී ආකාරයෙන් සිදු වුණාය කියන ගනුදෙනු පිළිබඳව චෝදනා. හැබැයි, මා නීතිඥයකු විධියට මේ වාර්තාව ලිව්වාය කියන විනිශ්චයකාරවරුන්ගේ නඩු තීන්දු කියවා තිබෙනවා. එම නඩු තීන්දුවල තමන් නිගමනයට එළඹීමට හේතුව ලිඛිත හා වාචික සාක්ෂිවලින් උපුටා දැක්වීමක් සිදු කරනවා. හැබැයි, මේ වාර්තාවේ එහෙම කිසි දෙයක් නැහැ. චෝදනාව විස්තර කරනවා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් අදාළ නීතිය විස්තර කරලා, ඒ නීතිය යටතේ නඩු පැවරීමට සලකා බලන මෙන් නිර්දේශ කරනවා. හැබැයි, මහ බැංකු බැඳුම්කර වාර්තාවේ ලිඛිත සහ වාචික සාක්ෂි උපුටා දක්වමින් තමන්ගේ නිගමනයට හේතු දක්වනවා. ඕනෑම නඩු තීන්දුවක් එහෙමයි. උගත් විනිසුරුවරු ඒ වාර්තාව ලිව්වා නම්, එතුමන්ලාගේ පරිවය අනුව අනිවාර්යයෙන්ම ලියන්නේ එහෙමයි. එම නිසා මට සාධාරණ සැකයක් තිබෙනවා, විනිසුරුවරුන් ලිවූ වාර්තා වෙනුවට ව්‍යාජ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවාද කියලා. මා උදාහරණ කීපයක් දෙන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මේ කරුණ ඉතා වැදගත්.

දැන් බලන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමාට චෝදනාවක් තිබෙනවා, ස්වාධීන රූපවාහිනියේ දැන්වීම්වලට රුපියල් මිලියන 102ක මුදලක් ගෙව්වේ නැහැයි කියලා. හැබැයි, මේ කොමිසම ඉදිරියේ යම් කරුණක් හෙළිවනවා. මට ඒ දිනය පොඩ්ඩක් බලා ගන්න ඕනෑ. ජනාධිපති නීතිඥ ගාමිණී මාරපන මැතිතුමාගේ හරස් ප්‍රශ්නවලදී පිළිගන්නවා, ITN ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාව බරපතළ ලෙස අඩු පාඩු තිබෙන වාර්තාවක් කියලා. නමුත්, ඒ ගැන සඳහනක් නැහැ. ඒ වාගේම මේ දැන්වීම් ලබා දුන් කෙනා වන Media Factory (Pvt) Limited කියන ආයතනය - වැරදිකරු වනවා නම්, විය යුතු කෙනා- සඳහන් කරනවා, "අපි මිලියන 65ක් දැන්වීම්වලට ගෙව්වා. මිලියන 65ක් දැන්වීම්වලට ගෙවපු නිසා තමයි අපට තවත් දැන්වීම් ප්‍රමාණයක් නොමිලේ ලැබුණේ" කියලා.

දත් බුරුසුවක් ගන්න ගියාමත් කියනවා නේ, "Buy one and get one free." කියලා. මිලියන 65ක් ගෙවලා දැන්වීම් දැම්මෙන් ඒ අයට දැවැන්ත මුදලක් ලැබුණ නිසා, අපටත් නොමිලේ ප්‍රසාද දැන්වීම් ලැබිලා තිබෙනවා පෞද්ගලික නාළිකාවලින්. ඒ Media Factory (Pvt) Limited ආයතනය කියනවා, "අනෙක් ආයතනවලට වඩා අඩුවෙන් තමයි අපට ප්‍රසාද දැන්වීම් ලැබුණේ." කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මේ කාරණය කිසිසේත්ම වාර්තාවේ සඳහන් වෙන්නේ නැතුව එක පාරට කියනවා. අවසාන වාක්‍ය බලන්න. Media Factory (Pvt) Limited ආයතනය කොමිසමට දැනුම් දෙනවා, "තව ගෙවීමට ඇත්තේ මිලියන 10ක්." කියලා. මිලියන 10යි ගෙවන්න තිබෙන්නේ කියලා ITN ආයතනය දැනුම් දුන් බව Media Factory (Pvt) Limited ආයතනය ලිඛිත සාක්ෂි සහිතව කොමිසම ඉදිරියේ හෙළි කර තිබෙද්දී මේ කරුණු යටපත් කරලා, ශතයක්වත් ගෙවන්නේ නැතුව මිලියන 102ක දැන්වීම් දා ගත්තාය කියන චෝදනාව ඉතාම අතාර්කිකයි. එය මා දන්නා ඒ උගත් විනිසුරුවරුන් ලිවිය නොහැකියි. මේ වාර්තාවේ තිබෙන චෝදනා 34 ගැනම ඒ ආකාරයෙන් පැහැදිලි කරත හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය නොමැති නිසා අවසාන වශයෙන් මා කියන්නේ, මේ රටේ ජනතාවගේ මුදල් වංචාවෙන්, දූෂණයෙන් සොරකම් කර තිබෙන අයට වසර තුනක් පුරාවට නිසි පිළිතුරු, නිසි දඬුවම් ලබා දීම අධිකරණයෙන් සිදු නොවුණ නිසා, ජනතා අධිකරණයෙන් දඬුවම් ලබා දිය යුතුයි කියලා. ඒ යෝජනාව කරමින් මා නිහඬ වනවා. බොහොම පින්.

[අ.භා. 2.53]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. එතුමා අද උදෑසන ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථා කරන වෙලාවේ ඉතා වලංගු ප්‍රශ්නයක් ඇහුවා. ඒ තමයි, 2008 සිට 2014 දක්වා කාලය තුළ එනම්, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරය සහ මුදල් ඇමතිකම දරපු, ඒ වාගේම මහ බැංකුව මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේ තිබුණු, ඒ වාගේම අජිත් නිවාඩ් කබ්‍රාල් මහ බැංකුවේ අධිපති ධුරය දරපු කාල සීමාව තුළ අයථා ලෙස බැඳුම්කර ගනුදෙනු සිදු වූ බවට කොහේද තිබෙන්නේ කියලා අභියෝගයක් කිරීම. ගරු මහින්ද අමරවීර මැතිතුමා ඒ වෙලාවේ ඒකට පිළිතුරක් දුන්නේ නැහැ. එතුමා කිව්වා, "මම දන්නවා. දැන් කියන්න බැහැ." කියලා. මම කියනවා වාර්තාවේ 447 වන පිටුවේ 3 වන ඡේදයේ පැහැදිලිව තිබෙනවා, "2008 සිට 2015 දක්වා කාල සීමාව තුළ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි - adequate evidence - තිබෙනවා, අයථා ලෙස මේ ගනුදෙනු සිදු වුණා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව නිර්දේශ කරනවා, "මෙම කාලයට අදාළව forensic audit එකක් කරලා තවත් ඉස්සරහාට යන්න." කියලා. ඒ කියන්නේ, මේ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා - [බාධා කිරීමක්]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට කථා කරන්න ඉඩ දෙන්න කෝ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා, කාරණය කියන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා මගේ නම සඳහන් කරමින් යමක් සඳහන් කළා. මම දැන් තවත් රැස්වීමකට සහභාගී වෙන්න පිටත් විය යුතු නිසා මේකට උත්තරයක් දීලා යන්න ඕනෑ. නැත්නම් හැන්සාඩ් වාර්තාවට අසාධාරණයක් වනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, වාර්තාවේ ඔබතුමා කියපු 3වන ඡේදය මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "In these circumstances, there is adequate evidence to form the view that, there is a likelihood that some irregularities have taken place in the acceptance of Direct Placements, prior to 2015."

තුන්වන ඡේදය ඒක නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
එතකොට දැන් ගරු අගමැතිතුමා වේදිකාවේ කියනවා වාගේ, මෙතැන බිලියන 4,000ක කතන්දරයක් නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක නොවෙයි ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මෙතැන කියන්නේ, දැන් මේ හෙළි වෙලා තිබෙන කරුණු අනුව, - [බාධා කිරීමක්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ වෙලාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කථාව කරන්න අවස්ථාව දෙන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
එහෙම නම් එළියේදී තමයි - [බාධා කිරීමක්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එළියට ඇවිල්ලා කථා කරන්න දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ වෙලාව. මේවා වේදිකාවල පදනමක් නොමැතිව කියන තවත් කථා පමණයි. 2008 සිට 2015 දක්වා වූ ගනුදෙනු පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක් සහ හිටපු විගණකාධිපතිතුමා සාමාජිකත්වය දරන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකින් විස්තරාත්මකව විශ්ලේෂණය කරලා, පැහැදිලිව නිගමනය කරලා, අවසානයේ කියනවා, "අයථා බැඳුම්කර පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇත." කියලා. ඒ කියන්නේ, ඒ කාලයේ; අජිත් නිවාඩ් කබ්‍රාල්ගේ කාලයේ සිදු වූ බවට. ඒක නිසා, ඒ පිළිබඳව චෝදාරික විගණනයක් කළ යුතුයි කියලා. මේක තමයි අපි කෝප් කමිටුවේ කිව්වේ; මේක තමයි අපි පාර්ලිමේන්තුවේ කිව්වේ. මේ හොරකම 2008 ඉඳලා 2015 වනතෙක් ආවා. 2015න් පස්සෙත් දිගට ආවා. ඒක තමයි අපි කිව්වේ. මේ හොර කණ්ඩායමට දේශපාලනයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙතැන වෙලා තිබෙන දේ මේකයි. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ මතය තමයි 2015න් එහා පැත්ත සුදුයි, 2015 පහු වුණු ගමන් කළුයි කියන එක. මෙච්චර වෙලා කිව්වේ, "ඔහොම පිටුවක් නැහැ, එහෙම එකක් නැහැ"යි කියලා. එතුමාට ඉංග්‍රීසි තේරෙනවා. එතුමා රෙද්ද ඇන්දාට ඕස්ට්‍රේලියාවේ ඉගෙන ගත්ත, සුදු ජාතික ව්‍යාපාරිකයන් සමඟ ව්‍යාපාරික කටයුතු කරපු, හොඳට ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය දන්න මහත්තයෙක් නේ. එතුමාට මම 447වෙනි පිටුව පෙන්වලා කියලා දුන්නාම 2008 ඉඳලා 2015 දක්වා මහ විශාල හොරකමක් තිබෙනවා කියලා, දැන් එතුමා කියනවා, "ඔය කියපු තරම් ගණනක් නැහැ"යි කියලා. උදෑසන අපේ අභිංසක ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට අභියෝග කළේ කොහොමද? "එහෙම එකක් නැහැ"යි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම වාර්තාවෙන් උපුටා අරගෙන ඡේදය සමඟ කියන විට කියනවා, "නැහැ, ඔය තරම් ගණනක් නැහැ"යි කියලා. මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව, මේ රටේ ජාතිය නොමඟ යවන මේ වැඩ පිළිවෙළ?

හොරකමක් තිබෙනවා. එදාත් හොරකම් වුණා, අදත් හොරකම් වෙනවා. ඒක තමයි ප්‍රශ්නය. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. එදා හොරකමක් නැහැයි කියලා මේක පටන් ගත්තොත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ඒක තමයි තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම එතුමාට තවත් පිළිතුරක් දෙන්නට ඕනෑ. එතුමාත්, හිටපු අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාත් පුරුද්දට වාගේ කියාගෙන යනවා "කෝප්" එකේ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් නව දෙනා "කෝප්" එකෙන් කළ පරීක්ෂණ වාර්තාවට පාද සටහන් තබලා හොරු ආරක්ෂා කළා කියලා, තවම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක් සහ හිටපු විගණකාධිපතිවරයෙක් එකතු වෙලා අවුරුද්දකට වැඩි කාලයක් සාක්ෂි විභාග කරලා හදපු මේ වාර්තාව මොකක්ද කියන්නේ? මේ පාද සටහන් එකින් එක, එකින් එක විශ්ලේෂණ කරලා කියනවා, -ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ඒවා විස්තර කළා- සමස්තයක් වශයෙන් ගත් කල පාද සටහන් සාක්ෂිවලට අනුකූලය; පාද සටහන් නිවැරදිය; පාද සටහන් නීත්‍යානුකූලය; පාද සටහන්වලින් සිදු කර ඇත්තේ වඩාත් නිවැරදි නිගමනයකට එළැඹීමට "කෝප්" එකට උපකාර වීමය කියලා. ඒ අනුව මේ කොමිෂන් සභාව කියනවා "කෝප්" එකේ සියලු දෙනාම එකඟ වුණු නිගමනයන්, -නිගමනයන් ගැන පරස්පරතාවක් නැහැ- සලකා බැලිය යුත්තේ පාද සටහන්ද එකතුවය කියලා. ඒ වාගේම විගණකාධිපතිතුමා විසින් ආර්ථික විද්‍යාව අනුව යම් යම් කාරණා වැරදියි කියලා කියන විට, අපි පෙන්වලා දුන්නා ඒවා වැරදියි කියලා. විගණකාධිපති වැරදි නම් වැරදියි. ඒ වාගේම "කෝප්" එකේ හිටපු නීතිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳව එපමණක් නොදන්නා ගරු මන්ත්‍රීතුමන්ලා වැරදි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කරුණු කියන විට අපි ඒවා වැරැදියි කියලා පෙන්වලා දුන්නා. අපි කිව්වේ නැහැ හොරකමක් වුණේ නැහැයි කියලා. අපි කිව්වේ, හොරාව අල්ලද්දී හරියට අල්ලන්න, හරි ගණන කියන්න කියලා. මේ හොරකමට වග කිව යුතු පුද්ගලයන්ට දඬුවම් කරන්නට මේ තිබෙන සාක්ෂි හොඳටම ඇති. සත්‍ය තත්ත්වය කිව්වාම හොඳටම ඇති. හැබැයි මේ අය උත්සාහ කළේ හොරු වෙනුවට දේශපාලන වශයෙන් ඉලක්කයන් කරා යන්නට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අද මොකක්ද කියන්නේ? අද ගරු විමල් වීරවංශ මැතිතුමාත්, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමාත් කියනවා, මේ වාර්තා පිළිබඳව විශ්වාසයක් නැහැ කියලා. මේ රටේ පවතින නීතිය අනුව ගරු ජනාධිපතිතුමා, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරලා, රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විතව ඒ කමිටුව පත් කරලා මේ රටේ පිළිගත් නීතිය සහ කාර්ය පටිපාටිය අනුව සාක්ෂි විභාග කරලා තීන්දුවක් දුන්නාට පස්සේ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා කියනවා, "අපිට ඒක විශ්වාස කරන්න බැහැ" කියලා. ගරු විමල් වීරවංශ මැතිතුමාත් කියනවා, "අපිට ඒක විශ්වාස කරන්න බැහැ" කියලා. එතකොට කාවද විශ්වාස කරන්නේ? කාවද විශ්වාස කරන්නේ? පළමුවෙනි වතාවටයි විස්තරාත්මක, විශ්ලේෂණාත්මක, නීත්‍යානුකූලව අවශ්‍ය කරුණු මැනවින් අධ්‍යයනය කරන ලද වාර්තාවක් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ කොමිෂන් සභාව පත් කිරීමේදී තිබුණු චේතනාව කුමක් වුණත් අවසානයේ දී අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සහ විගණකාධිපතිවරයෙකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් විසින් සම්පාදනය කළ මේ වාර්තාව තුළින් අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිසිදු වරදකට වරදකරු නොවන බව සඳහන් කරලා තිබීම ගැන. අද ඒක ඔවුන් පිළිගන්නට ලැහැස්තියි. හැබැයි කියනවා, "එහෙම වෙලා තිබෙන්නේ මෙහෙම මෙහෙම නිසා" කියලා. කලින් කිව්වේ එහෙම එකක් නැහැයි කියලා. අද පිළිගන්නවා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිවැරදියි, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කිසිම චෝදනාවක් නැහැයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන් පසුව අද ගරු කබීර් හාෂිම් ඇමතිතුමාගේත්, ගරු මලික් සමරවික්‍රම මැතිතුමාගේත් නම් සඳහන් කරලා අයථා චෝදනා ඉදිරිපත් කළා. බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා ගරු කබීර් හාෂිම් මැතිතුමාත්, ගරු මලික් සමරවික්‍රම මැතිතුමාත් සහභාගි වුණු උදෑසන රැස්වීම ඉතාම නීත්‍යානුකූල මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය වන මුදල් ලබා ගැනීම උදෙසා වූ සාකච්ඡාවක් පමණයි; බැදුම්කර නිකුතුව හෝ ඒ හා සම්බන්ධ කිසිම දෙයක් කථා වුණේ නැහැ; ඒ සාකච්ඡාව රහස් සාකච්ඡාවක් නොවෙයි; ඒක ඉහළ නිලධාරීන් සියලුදෙනාම සහභාගී වුණු විවෘත සාකච්ඡාවක්. එය හෙළිදරව් වෙලා, ඒ පිළිබඳව කොමිෂන් සභාව නිගමනය කරලා, කොමිෂන් සභා වාර්තාව නිකුත් කළාට පස්සේ, කොමිෂන් සභා වාර්තාව මේස උඩ තියාගෙන අද කියනවා, "එහෙම නොවෙයි." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාටද මේ කථාව කියන්නේ? මේ රටේ ජනතාව තවත් දිගින් දිගටම නොමඟ යවන්නයි මේ උත්සාහ කරන්නේ.

මේ කොමිෂන් සභාව පත් කිරීම ගැන අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. එක්සත් ජාතික පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයත් මේ බැදුම්කර ගිවිසුම පිළිබඳ කිසිදු ආකාරයක වග කීමක් නොමැති බව මේ කොමිෂන් සභාව මඟින් ඉතාමත් පැහැදිලිව දක්වා තිබෙන බව අපි වග කීමෙන් කියනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කරුණු හොයලා බලලා, සියලුම සාක්ෂි විශ්ලේෂණය කරලා, අදාළ නීතිය හා ආර්ථික විද්‍යාව පිළිබඳ මූල ධර්ම අධ්‍යයනය කරලා, COPE එකේ ක්‍රියාකාරීව සහභාගී වෙච්ච මන්ත්‍රීවරුන්ට ඉතාම බරපතළ විධියට මේ සභාවේදීත්, ඉන් පිටතදීත් අපහාසවලට මුහුණ දෙන්න සිදු වුණා. මොකක්ද කිව්වේ? අපි හොරු ආරක්ෂා කළාය කිව්වා. දැන් බැදුම්කර කොමිෂන් සභාවේ වාර්තාව කියනවා, "අනෙක් සාමාජිකයන්ට වඩා නීතිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ මූල ධර්ම කාරණා පිළිබඳව නිවැරදිව විශ්ලේෂණ ඉදිරිපත් කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු නවදෙනා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉතාම විශේෂ සිද්ධියක් පිළිබඳව සඳහන් කරන්නට ඕනෑ. ඒ විශේෂ සිද්ධිය පුවත් පත්වලත් වාර්තා වුණා, "ලොකු විවාදයට ලක් වෙලා, බොහොම උණුසුම් තත්ත්වයක් COPE එකේ ඇති වුණා." කියලා.

විගණකාධිපතිවරයාගේ ගණන් මිනුම්වල වැරදි අපි පෙන්වා දෙනකොට විගණකාධිපතිට වැරදෙන්න බැහැ. විගණකාධිපති කියන දේ එලෙසම පිළිගන්න ඕනෑය කියලා ලොකු තර්කයක් ඇති වුණා. අපේ මිත්‍ර හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, "එහෙම බැහැ. විගණකාධිපති කිව්වොත් කිව්වා." කියලා. අපි කිව්වා, "එහෙම නොවෙයි. විගණකාධිපතිට වැරදිලා නම්, ඒක වැරදිලා." කියලා. මොකද, විගණකාධිපතිවරයා කලින් පිළිඅරගෙන තිබුණා, ඔහුට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයට ආර්ථික විද්‍යාව පිළිබඳව විශේෂඥතාවක් නැහැ. ඔවුන්ට සුදුසුකම් තිබෙන්නේ ගණකාධිකරණය පිළිබඳවයි; විගණනය පිළිබඳව පමණයි කියලා. ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් ඇති, ආචාර්ය උපාධිය හෝ වෙනත් පශ්චාත් උපාධි සුදුසුකම් සහිත කිසිවෙක් ඔවුන්ගේ නිගමනවලට දායක වුණේ නැහැයි කියලා ඔවුන් පිළිගත්තා. එය ඔවුන්ගේ වාර්තාවට ඇතුළත් කරලා තිබුණා. ඒ නිසා ඔවුන් පිළිගත්තා, ඔවුන්ට වැරදීමක් වෙලා තිබෙනවා කියලා. හැබැයි ඒ අවස්ථාවේදී, ඒ වාර්තාව එලෙසම තිබිය යුතුයි; දැන් කළ හැකියමක් නැහැ කියන ස්ථාවරය මතු වුණා. අපි කිව්වා, "අපේ ඒ වෙනස් අදහස වාර්තා කරන්න." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ 662වන පිටුවේ ඉතාමත් පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා, අජිත් පී. පෙරේරා හා ගරු අශෝක් අබේසිංහ ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ COPE එකේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු මේ අලාභ ගණනය පිළිබඳ ඒ ආර්ථික විද්‍යා මූල ධර්මය නිවැරදියි. ඒක තමයි මේ ගණනය කිරීම් පිළිබඳව තිබුණු හරය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්මා හෝ තාත්තාවත් මේ තරම් පිරිසිදු චරිත සහතික අපට දෙන්නේ නැහැ. කට තිබුණු පළියට මිනිසුන්ගේ චරිත ඝාතනය කරන්න නැන් තැන්වල කියවන විවේචකයන්ට මම කියනවා, පාර්ලිමේන්තුවේ අපි වගකීම් ඉෂ්ට කරනකොට කිසිම දවසක හොරු ආරක්ෂා කරන්න කටයුතු කරලා නැහැ. කිසිම දවසක හොරු වෙනුවෙන් අපි පෙනී ඉඳලා නැහැ. අපි හැම වෙලාවේම පෙනී ඉඳලා තිබෙන්නේ, හොරුන්ට එරෙහිවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අර්ජුන ඇලෝසියස්ට එරෙහිව COPE එකේදී කිසිදු නිගමනයකට එළඹෙන්න සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා හෝ ඔවුන් සමඟ එකඟ වෙච්ච අනෙක් මන්ත්‍රීවරු කිසිවෙකු කටයුතු කළේ නැහැ. ඔවුන්ගේ ස්ථාවරය වුණේ, ඇලෝසියස්ට එරෙහිව සාක්ෂි නැහැ කියන එකයි. මමයි ඉදිරිපත් කළේ, ඇලෝසියස්ට එරෙහිව අපරාධ පරීක්ෂණයක් කළ යුතුයි; පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂකවරුන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ කළ යුතුයි කියලා. ඒ ස්ථාවරය මමයි ඉදිරිපත් කළේ. බහුතරයක විරෝධතාව නිසා ඒ ස්ථාවරය ඇතුළත් කර ගන්න අපට බැරි වුණා.

අන්තිමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හරහා, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නියමය පිට පොලිස් පරීක්ෂණ කරලා තමයි මේ කටයුතු අනාවරණය කර ගන්න පුළුවන්කම ලැබුණේ. හැන්සාඩ්ගත වීම සඳහා මම ඉතා වග කීමෙන් කියනවා, මේ කමිටුවට ක්‍රියාකාරීව, සත්‍යවාදීව හා නිවැරදිව, නිවැරදි නීතිය මත, නිවැරදි ආර්ථික විද්‍යා මූල ධර්ම මත සහභාගී වෙච්ච එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු COPE එකේ සාමාජිකයන් නවදෙනාගේ ක්‍රියාව සියයට සියයක් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව අනුමත කරලා තිබෙන බව. අපට ඉතා ඉහළ චරිත සහතිකයක් ලබා දීලා තිබෙනවා. ඉතුරු මන්ත්‍රීවරුන් ගැන අපේ අගෞරවයක් නැහැ. නමුත්, අපි ඔවුන්ට කියනවා, ඔබතුමන්ලා වගකීම් විරහිතව ක්‍රියා කළා. කමිටුවෙන් නැඟිටලා ගියා. සාක්ෂි විශ්ලේෂණය ප්‍රතික්ෂේප කළා. ඒකයි සිදු වූ දේ.

සත්‍ය ලෙස බැලුවා නම්, ඉදිරිපත්ව ඇති සාක්ෂි විශ්ලේෂණය කළා නම්, මීට කලින් මේ හොරුන්ට එරෙහිව නඩු පැවරිය හැකිව තිබුණා. එදායින් පසුව ගරු අගමැතිතුමා මේ පිළිබඳව නඩු පැවරීම සඳහා COPE වාර්තාව සමඟ නීතිපතිතුමා වෙත වාර්තා කළා. ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා පියවර ගත්තා. නමුත්, නඩු පැවරීම ප්‍රමාද වුණේ මෙම බැදුම්කර කොමිසම පත් කරපු නිසයි. මෙතරම් ප්‍රමාදයක් සිදුවීම ජනතාවගේ පැත්තෙන් බලන විට අසාධාරණ බව පෙනුණත්, මේ ක්‍රියාවලිය දීර්ඝව ගත වුණු නිසයි මේ ප්‍රමාදය සිදු වුණේ. ඊළඟට, අපි හඳුන දුෂණ විරෝධී මහාධිකරණ තුන ක්‍රියාත්මක කරලා, ළඟ ළඟ දිනවල නඩු අහලා -එක දිගට නඩු අහලා- එම අධිකරණ හරහා මේ රටේ පරණ හොරුන්ටත්, අලුත් හොරුන්ටත් දෙගොල්ලන්ටම නීතිය ක්‍රියාත්මක කරන බව අපි වග කීමෙන් කියනවා. ඔවුන්ට නියමිත තැන සිපිරි ගෙයයි. ඒ සිපිරි ගෙයට ගෙනයෑම සඳහා වූ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමට එක්සත් ජාතික පක්ෂය හැටියටත්, රජය හැටියටත් අපි කටයුතු කරනවා. පෞද්ගලිකවත් අපි ඒ වෙනුවෙන් මහන්සි වෙනවා, කැප වෙනවාය කියන කාරණය අපි ජනතාවට කියන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකු බැදුම්කර කාරණය ගැන මම ඊට වඩා කියන්න උත්සාහ කරන්නේ නැහැ. බැදුම්කර කොමිසම පත් කිරීම ගැනත්, එයට ඉතා දක්ෂ හා ප්‍රවීණ විනිශ්චයකාරවරුන් සහ විගණකාධිපතිවරයකු පත් කිරීම ගැනත් මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මතභේදයට තුඩු දී ඇති ඒ එක් එක් කාරණා පිළිබඳව ඒ හරහා ඔවුන් විසින් නිගමනයන්ට එළැඹීම පිළිබඳවත්, ඒ හරහා එක්සත් ජාතික පක්ෂයත්, ඒ ශ්‍රේෂ්ඨ අභිමානවත් පක්ෂයේ ගෞරවයත් ආරක්ෂා කිරීම පිළිබඳවත් මගේ බලවත් කෘතඥතාව පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ගම්මන්පිල මහත්මයා ඔහුගේ කථාවේදී, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පිළිබඳව සඳහන් කරමින් කියනවා, එතුමාගේ නායකයා,- පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ කියලා තමයි මේ වාර්තාවේ සඳහන් වෙන්නේ. අපි කවුරුත් දන්නවා, පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාට කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 6වන වගඋත්තරකාරයා, ඒ 6වන වගඋත්තරකාර මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන සඳහන් කරනකොට මේ වාර්තාවේ විශේෂයෙන් සඳහන් කරනවා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, PCI/95/2015 කියන පරීක්ෂණය පිළිබඳවයි මම කථා කරන්නේ. එහි 6වැනි වගඋත්තරකාරයා තමයි කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ, හිටපු ජනාධිපති. ලිපිනය තමයි අංක 117, විජේරාම පාර, කොළඹ 7. එතුමා තමයි අපි දන්නා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඔහුට තිබෙන චෝදනා මොනවාද? අනුර සිරිවර්ධන යන අය නීති විරෝධී ලෙස ස්වාධීන රූපවාහිනීයේ සභාපති හැටියට පත් කිරීම. ඊට පස්සේ නීති විරෝධී ලෙස පත් කරපු අනුර සිරිවර්ධන සමඟ එකතුවෙලා රුපියල් 101,700,000ක් පාඩු කිරීම, රුපියල් 2,467,000ක් පාඩු කිරීම, රුපියල් 8,663,000ක් පාඩු කිරීම. ඒ වාගේම රුපියල් 112,900,000ක් පාඩු කිරීම. මේ කාරණා පිළිබඳව තිබෙන නිගමනය මොකක්ද? මොකක්ද කියන්නේ? අපේ මිත්‍ර උදය ගම්මන්පිල මහත්මයාට මේවා තේරෙන්නේ නැහැ. "6වන දැන්වීම් ලත් පාර්ශ්වය වන මහින්ද රාජපක්ෂ යන අය අල්ලස් පනතේ 70වන වගන්තියේ විස්තර කර ඇති දූෂණය නැමැති වරද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද, දූෂණයට අනුබල දීමේ වරද යන මේ වැරදි එකක් හෝ වැඩි ගණනක් සිදු කර ඇති බව මේ කොමිෂන් සභාවේ තීරණයයි." කවුද මේ තීරණය ගන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තීරණය ගන්නේ සාමාන්‍ය පුද්ගලයෝ නොවෙයි; අපි වාගේ දේශපාලනඥයෝ නොවෙයි. කවුද මේ තීරණය ගන්නේ? ගරු ජනාධිපතිතුමා විසින් පත් කරපු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව තමයි මේ තීරණය ගන්නේ. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන්නේ කවුද? ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා, අභියාචනාධිකරණ විනිශ්චයකාරතුමා.

අමේන්ද්‍ර සෙනෙවිරත්න මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, ගිහාන් කුලතුංග මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, අතුල කළුආරච්චි මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, පී.ඒ. පේමතිලක මැතිතුමා- විශ්‍රාමික විගණකාධිපති යන අය කොමිෂන් සභාවේ සාමාජිකයන් වනවා. ඉතාම ඉහළ, ඉතාම ශ්‍රේෂ්ඨ, නීති ක්ෂේත්‍රයේ ඉතාම ගෞරවයට ලක්වුණු ඉහළම මට්ටමේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විනිශ්චයකාරවරුන් සහ විශ්‍රාමලත් විගණකාධිපතිවරයෙක් තමයි මේ ක්‍රියාවලියට සම්බන්ධවෙලා තිබෙන්නේ; මේ තීරණ ගෙන තිබෙන්නේ. මොකක්ද, ඒ තීරණය? පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ, 6වන වගඋත්තරකරු -6වන දැන්වීමලත් පාර්ශ්වය- දූෂණය නමැති වරදට වරදකරු කියලා තීරණය කර තිබෙනවා. එතුමා කියනවා, ඒ දූෂණය නමැති වරදට වරදකරු කිරීම පිළිබඳ හේතු මේ වාර්තාවේ නැහැයි කියලා. එතුමාට උදේ CD තැටියක් දුන්නාය කිව්වා නේ. අන්න ඒ CD තැටියේ තිබෙනවා, ඒ පිළිබඳ අතුරු වාර්තාව. සාක්ෂි විශ්ලේෂණය කරලා, එකින් එක ගෙන මහින්ද රාජපක්ෂ රුපියල් තිස් කෝටියකට අධික දැවැන්ත මුදලක් රටට අහිමි කිරීම සහ දූෂණය කිරීමේ වරද සිද්ධ කරලා තිබෙන්නේ කුමන හේතු මතද කියලා ඒ අතුරු වාර්තාවේ තිබෙනවා. එතුමා මහෙස්ත්‍රාත් උසාවියක හෝ මහාධිකරණයක රාජකාරි කරපු නීතිඥ මහත්මයෙක් නොවෙයි. එතුමා අභියාචනාධිකරණයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මයකු සමඟ කාලයක් වැඩ කළා. එතුමාට අපි ගරු කරනවා. හැබැයි හොරකම කියලා කියන්නේ, කොහෙන් හෝ මුදලක් හොරකම් කරගෙන පැනලා යන එක විතරක් නොවෙයි. බැඳුම්කර වංචාව කියන්නේ එහෙම එකක්ද? ඒ වාගේම තමයි, බැලූ බැල්මට රජයට අත්වෙන්න තිබුණු රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් මුදල් අහිමි කරපු එක. එච්චරයි මේ වාර්තාවේ තිබෙන්නේ. මෙහි වැදගත්කම මෙයයි. පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, 6වන දැන්වීමලත් පාර්ශ්වය, කරලා තිබෙන වරද මොකක්ද? තමන්ගේම ආත්ම ලාභයට තමන් අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වී සිටි ජනාධිපතිවරණයෙන් තමන්ට අයුතු ලාභයක් ලබා ගන්නත්, තමන්ගේ විරුද්ධවාදියා වන මෛත්‍රීපාල සිරිසේන, එවකට ජනාධිපති අපේක්ෂකතුමාට අයුතු පාඩුවක් සිදු කරන්නත් තමයි මේ ක්‍රියාවලිය සිද්ධ කරලා තිබෙන්නේ. "අපි නොදැන", "වෙන කෙනෙක්", "අපේ සේවකයෙක්" එහෙම කථාවක් කියන්න බැහැ. කුමන්ත්‍රණය එතැන තිබෙන්නේ. ඒ නිසා කිසිම ගැලවීමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ පාලනය දූෂිතයි කියලා. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ සහෝදරයන් දූෂිතයි කියලා. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ නිලධාරීන් දූෂිතයි කියලා. හැබැයි, කවුරුත් මීට කලින් පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා පෞද්ගලිකව දූෂිතයකු බවට නිගමනය කරලා තිබුණේ නැහැ. අර්ධ අධිකරණමය බලයක් ඇති, -අපි කියනවා, quasi-judicial කියලා- විශිෂ්ට වූ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත ආයතනයක් විසින් තමයි මේ 6වන වගඋත්තරකාර, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දූෂිතයකු බවට තීරණය කරලා තිබෙන්නේ.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බැසිල් රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම නාමල් රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ සභාවේ මන්ත්‍රීතුමෙක් ඉන්නවා. එතුමා මේ වෙලාවේ නිදි. එතුමාත් දූෂිතයකු බවට තීරණය කරලා එතුමාගේ නමත් මෙහි තිබෙනවා. මා එතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමාට තේරෙනවා, ඒ මන්ත්‍රීතුමා කවුද කියලා. දැන් එතුමා අවදියෙන් ඉන්න බව පෙනෙනවා. අපි එතුමාට ස්තුතිවන්ත වනවා, අඩු ගණනේ අපි කියන දේවල් අහගෙන ඉන්නවත් එතුමා මේ සභාවේ සිටීම ගැන. මොකද, සමහරුන්ට මේවාට මුහුණ දෙන්නවත් ශක්තියක් නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා සම්බන්ධයෙන් මේ කොමිෂන් සභාව තීරණය කරලා තිබෙන්නේ මොකක්ද? "මෙතැන බරපතළ වරදක් වෙලා තිබෙනවා. අල්ලස් පනතේ 70වන වගන්තියට වැටෙන දූෂණය යන වරද සිද්ධ කරලා තිබෙනවා. ඒ නිසා එතුමාට විරුද්ධව මහාධිකරණයේ නඩු පවරනු" කියලා සඳහන් කර තිබෙනවා. ඒ පළමුවන කාරණයයි.

ඊට පස්සේ කොමිසම තව ඉදිරියට විශ්ලේෂණය කරනවා. ඒ වාර්තාවේ කියනවා, මෙවැනි වරදකට වරදකරු වුණොත් ලැබෙන සිර දඬුවමට අමතරව අවුරුදු 7ක සිවිල් අයිතිවාසිකම් -ප්‍රජා අයිතිවාසිකම්- අහිමි වනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ බොහොම පැහැදිලිව කාරණා කිහිපයක් සඳහන් වනවා. මොකක්ද, ඒ කියන්නේ? මා එය උපුටා දක්වන්නම්. මේ කාරණා සඳහන් පිටුව මේ වාර්තාවේ තිබෙනවා. දැන් style එකට වාගේ අහනවා, "පිටුව තිබෙනවාද?" කියලා. "පිටුව තිබේද?" කියන එක දැන් අලුත් කථාවක්. මේ කොමිෂන් සභා වාර්තාවේ 148වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"මෙම පරීක්ෂණයට අදාල සිද්ධියේදී 6 වන දැන්වීමලත් පාර්ශ්වකරු ...."

ඒ කියන්නේ මහින්ද රාජපක්ෂ.

"... විසින් පත් කරන ලද සභාපතිවරයා වන 1 වන දැන්වීම් පාර්ශ්වකරු...."

අනුර සිරිවර්ධන.

"...100%ක් රජයේ කොටස් ඇති ස්වායත්ත රූපවාහිනී ආයතනය තමන්ගේ පුද්ගලික දේපලක් ලෙස සලකා රජයට පාඩු කරමින් මෙම දූෂණය නමැති වරද සිදු කර ඇති බව පෙනීයයි."

මේ, වෙන කවුරුවත් ගැන කියනවා නොවෙයි. මේ කියන්නේ, අපේ හිටපු ජනාධිපති, වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රීතුමා ගැනයි.

මේ වාර්තාවේ 148 සහ 149 වන පිටුවල තවදුරටත් මෙසේ සඳහන් වනවා:

" 6 වන දැන්වීමලත් පාර්ශවය ද ඒ ආකාරයෙන්ම දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කර ඇත. 3 සහ 4 වන දැන්වීමලත් පාර්ශවයන් ද දූෂණය නමැති වරද සහ දූෂණයට අනුබලදීමද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමද, විවිධ අවස්ථා යටතේ සිදු කර ඇති බව පෙනී යයි. මෙවැනි වැරැදි සිදු කළ අය රට වෙනුවෙන් සහ රටේ ජනතාව වෙනුවෙන් සේවයක් සිදු කෙරෙතැයි අපේක්ෂා කළ නොහැක."

මේ කොමිෂන් සභාවේ, විනිශ්චයකාරවරු මේ කියන්නේ කවුරු ගැනද? මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඇතුළු මේ වගඋත්තරකරුවන් හය දෙනා ගැනයි මේ කියන්නේ. මොකක්ද, කියන්නේ? "මෙවැනි වැරැදි සිදු කළ අය රට වෙනුවෙන් සහ රටේ ජනතාව වෙනුවෙන් සේවයක් සිදු කෙරෙතැයි අපේක්ෂා කළ නොහැක."

එම වාර්තාවේ 149වන පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් කරනවා:

"ඒ අනුව වසර 07 කින් පසුව හෝ එවැනි වරද වලට වරදකරු වූ දේශපාලනඥයින්ට...."

මේ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන.

"... ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් වශයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් පත්වීමට අවස්ථාව ලබා දීම නුසුදුසු බව මෙම කොමිෂන් සභාවේ අදහසයි."

මේක එතුමාගේ විරුද්ධ පක්ෂයේ ඉන්න අපි හෝ එතුමාට පෞද්ගලිකව අහිතවත් අය හෝ කියන කථාවක් නොවෙයි. මේ, ගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් පත් කරපු වර්තමානයේ ධුර දරන අභියාචනාධිකරණයේ සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සහ විගණකාධිපතිවරයෙකුගෙන් සමන්විත උත්තරීතර වූ විනිශ්චය මණ්ඩලයක් විසින් තමයි මෙහෙම කියන්නේ. මොකක්ද, කියන්නේ? මෙවැනි අයට

තවදුරටත් ධුර දරන්න දෙන්න එපා කියලා කියනවා. එය මේ වාර්තාවේ මෙසේ සඳහන් වනවා:

" ඒ අනුව මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන්නේ ඉහත ව්‍යවස්ථාවල දක්වා ඇති ලෙසට වැරදිකරුවන් වූ අය එසේ වරදකරු කිරීමෙන් පසු කිසිම අවස්ථාවක ...."

ඒකයි ජීවිත කාලයටම කියලා මේ මාධ්‍යයවල පළ වන්නේ.

"... මහජන නියෝජිතයින් වශයෙන් පත්වීම හෝ මහජන නියෝජිතයන් වශයෙන් පත්වීම සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වීම...."

ඒ කියන්නේ, අපේක්ෂකයෙකු වෙන්නත් දෙන්න එපා කියන එක.

"... නුසුදුසු බවට වන නීති සම්පාදනය කිරීම අවශ්‍ය බවයි."

අද උදෑසන මහින්ද අමරවීර මැතිතුමා කිව්වා, "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි කළා වාගේ අපි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි කරන්න දෙන්නේ නැහැ" කියලා. ඇත්ත වශයෙන්ම අපි එතුමා සමඟ එකඟ වනවා. ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම සඳහා වූ මාර්ගය. ඒ කියන්නේ, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂා කරලා, නිගමනවලට එළැඹිලා, ඒ නිගමන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුව සම්මත කරලා, පාර්ලිමේන්තුව හරහා ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම කියන ක්‍රියාදාමය තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හා සම්බන්ධව ගත් ක්‍රියා මාර්ගය. අපි විශ්වාස කරන්නේ නැහැ, ඒ ක්‍රියා මාර්ගය. ඒක සුදුසු අවස්ථා තිබෙන්න පුළුවන්. නමුත් මේ අවස්ථාවේදී අපි එය පාවිච්චි කරන්නේ නැහැ. අපේ -එක්සත් ජාතික පක්ෂයේ- ස්ථාවරය මෙයයි. මේ කාරණා සම්බන්ධව අද ඉතාම පැහැදිලිව සාක්ෂි ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඉතාම පැහැදිලිව නිර්දේශ ඉදිරිපත් වෙලා තිබෙනවා. වරදකරු කියලා ඉර හඳ වාගේ පෙනෙන විධියට අභියාචනාධිකරණයේ සහ මහාධිකරණ විනිශ්චයකාරවරු මණ්ඩලයක් විසින් නිශ්චිත නිගමන ඉදිරිපත් කරලා තිබෙනවා. එවැනි අවස්ථාවක දැන් කළ යුතු වන්නේ වහාම අපි අලුතින් පිහිටුවන දූෂණ විරෝධී මහාධිකරණයෙන් ළඟ ළඟ දිනවල මේ නඩු අහලා, මේ නඩුව විභාග කරලා තීන්දුවක් දෙන එකයි. එතුමා අභිංසක නම් නිදහස්; වරදකරු නම් සිර දඬුවම්. මේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. දේශපාලනඥයෙකු වාගේම රජයේ නිලධාරියෙකු මේ ආකාරයෙන් දූෂණය වරදකට වරදකරු නම් වසර හතකට ඔහුගේ සිවිල් අයිතිවාසිකම් අහිමි කිරීම ප්‍රමාණවත් නැති බව අපිත් පිළිගන්නවා. දූෂණ වරදකට දේශපාලනඥයන් වරදකරු වනවා නම් ඔහු ජීවිත කාලයම මහජන ධුරයක් දැරීමෙන්, දේශපාලනයෙන් ඈත් කර තැබිය යුතුමයි. ඒ සඳහා අල්ලස් පනත සංශෝධනය වෙන්න ඕනෑ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සුදුසු ප්‍රතිපාදන සංශෝධනය වෙන්න අවශ්‍යයි.

ඒ අනුව අපි මෙහෙම යෝජනා කරනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන හිතලා නොව, එවැනි බොහෝ දෙනෙක් සිටින නිසා, එවැනි අය අනාගතයේ බිහි වන්න පුළුවන් නිසා, ඒ සියලු දෙනාටම අදාළ වන පරිදි, එවැනි වරදකට අසු වුවහොත් අවුරුදු හතක කාලයක් සඳහා නොව ජීවිත කාලය දක්වාම ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම සඳහා වූ නව නීති පැනවීමට මේ පාර්ලිමේන්තුව වහාම කඩිනමින් කටයුතු කළ යුතුය කියලා අපි කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතැන තව ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන ලොකු චෝදනාවක් තිබෙනවා. මේ චෝදනාව එල්ල වන්නේ රාජපක්ෂ කෙනෙකුට විරුද්ධව නම්, ඒ චෝදනාව එල්ල වන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය ගැනයි. ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව සම්බන්ධව ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ වරදකරු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගෝඨාභය සහ මහින්ද රාජපක්ෂ දෙදෙනාට විරුද්ධව අපරාධ චෝදනාවක් එල්ල වනකොට නීතිය අමුතුයි; නීතිය නැවෙනවා. ගෝඨාභය රාජපක්ෂ අනිවාර්යයෙන්ම අත් අඩංගුවට ගන්න කියලා මේ රටේ නීතිපතිවරයා ඉතාම සැලකිල්ලෙන් යුතුව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ රටේ කවුරුත් දන්න කෙනෙක්. එතුමා මේ රටේ ඉහළ ධුරයන් දරපු කෙනෙක්; ඒ වාගේම මේ රටේ දේශපාලන ක්‍රියාදාමය තුළත් ඉතා වැදගත් චරිතයක්. කවදාවත් නීතිපති දෙපාර්තමේන්තුව එතුමා සම්බන්ධව නිගමනයක් ගනිද්දී නොසැලකිල්ලෙන් නිගමනයක් ගන්නේ නැහැ.

වහාම අත් අඩංගුවට ගන්න කියලා නීතිපතිවරයා, රටේ පොලිස්පතිවරයාට නියම කරලා තිබෙද්දී නීතිය නැවෙනවා. සාමාන්‍ය අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් -වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාටත්- එහෙමයි. අපේ ගම්මන්පිල මැතිතුමා කියලා තිබුණා, හිටපු ජනාධිපතිවරයාට රටේ අපරාධ නීතිය අදාළ වෙන්නේ නැහැ කියලා. මට එතුමාට මේවා තේරුම් කරලා දෙන්න නම්, අපරාධ නීතිය ඉගෙන ගන්න නීති විද්‍යාලයේ පළමුවැනි වසරේ සිට යවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයෙක් ධුර දරන කාලය තුළ ඔහුට විරුද්ධව නඩු පවරන්න බැහැ. නමුත්, ධුර දරන කාලය තුළ වැරැද්දක් කළොත් ධුරය අහිමි වීමෙන් පස්සේ හෝ දෝෂාභියෝගයෙන් අයින් කළාට පස්සේ හෝ ධුරයෙන් ඉවත් වුණාට පස්සේ හෝ ඒ කරපු වරදට ඔහුට විරුද්ධව රටේ නීතිය අනුව දඬුවම් කරන්න පුළුවන්. සිවිල් සහ අපරාධ කියන වග කීම් දෙකම පැවරෙනවා.

මීට කලින් චෝටර්ස් ඒජ් සිද්ධිය සම්බන්ධ නඩුවේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය පිළිබඳව මේ ප්‍රශ්නය සාකච්ඡාවට ලක් වුණා. ඒ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය හා සම්බන්ධව අපරාධ පරීක්ෂණ කරන්න අවශ්‍යයි කියලා. එතුමියට විරුද්ධව නඩු පැවරුවේ නැහැ. එතුමියට විරුද්ධව සාක්ෂි තිබුණා නම් ඒ අවස්ථාවේ නඩු පවරනවා. ඒ නිසා හිටපු ජනාධිපති වුණත් වරදක් කරලා තිබෙනවා නම්, ඒ වරදට නිසි ලෙස දඬුවම් ලැබිය යුතුමයි. මේ රටේ අදහසක් තිබෙනවා, රාජපක්ෂවරුන් සම්බන්ධව විශේෂයෙන්ම ගෝඨාභය සහ මහින්ද රාජපක්ෂ යන දෙදෙනා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක වීමේදී යම් ආකාරයක ආපස්සට ඇදිල්ලක් තිබෙනවා කියලා. මම බොහොම වග කීමෙන් කියනවා, එහෙම ආපස්සට ඇදිල්ලක් තිබෙනවා නම් ඒ ඇදිල්ලට එක්සත් ජාතික පක්ෂයවත්, අගමැතිතුමාවත්, නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාවත් කිසිම සම්බන්ධයක් නැහැ කියලා. එහෙම ඇදිල්ලක් තිබෙනවා නම් තිබෙන්නේ වෙනත් තැනකිනුයි. ඒ නිසා මේ රටේ ජනතාව ඒක තේරුම් ගත යුතුයි. මේ රටේ ජනතාව මේ අපරාධකරුවන් කවුද කියන ප්‍රශ්නය තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිග් යානා සිදුවීම සම්බන්ධව වග කිව යුතු, කට්ටි පනිමින් ඉන්න ප්‍රධාන පුද්ගලයා අද වෙන කොට අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහු මේ ගනුදෙනුවේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අතරමැදියා. යුක්රේනයේ අධ්‍යාපනය ලබපු, යුක්රේනයේ ලිපිනය තිබෙන, යුක්රේනයේ පුරවැසිකම තිබෙනවාය කියන ඒ සම්බන්ධව වග කිව යුතුම පුද්ගලයා අපට අද එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී අත් අඩංගුවට ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ, අපේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ඥාතියා. ඒ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඥාතියා. අද රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ඒ රෝද කරකැවෙනවා. හැබැයි, අපේ ලසන්ත වික්‍රමතුංග ජීවිතය පිටුවේ, ලසන්ත වික්‍රමතුංග මහා පාරේ, මහ දවල් මරලා දැමීමේ ඔය මිග් යානා වංචාව පිළිබඳව එළිදරවු කරපු නිසා. ඒක තමයි සත්‍ය තත්ත්වය. රුසියාවේ හිටපු තානාපතිවරයා තමයි මේ සිදුවීම පිළිබඳව අතරමැදියා. ඔහු තමයි මේකේ මොළකාරයා. ඒ නිසා ඔහුව අත් අඩංගුවට ගත්තාට පස්සේ ලසන්තගේ මිනීමැරුම පිළිබඳවත් නිවැරැදි තොරතුරු, සත්‍ය තොරතුරු අපට එළිදරවු කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කිසිම අපරාධකරුවෙකුට ලෝකයේ සැඟවී ඉන්න පුළුවන්කමක් නැහැ. එක් පැත්තකින්, නීතියේ ක්‍රියාදාමය ක්‍රියාත්මක වෙනවා. අනෙක් පැත්තෙන්, මොන තරම් අඩු පාඩු තිබුණත්, කොච්චර ප්‍රමාද වුණත් එදා අපි 2015 වෙච්ච පොරොන්දුව වන නීතිය සැමට එක ලෙස ක්‍රියාත්මක වෙනවා කියන කාරණය අපි පෙන්නුම් කරලා තිබෙනවා. රටේ ඉහළම ධුර දරන නිලධාරීන් අධිකරණ ක්‍රියාදාමයට අවනත බව පෙන්නුම් කරලා තිබෙනවා. ඒ නිසා දැන් අපි කළ යුතු වන්නේ, මේ රටේ අපරාධ හා සම්බන්ධව ඉන්න දේශපාලනඥයන්, දේශපාලනඥයන් නොවන පුද්ගලයන්, ව්‍යාපාරිකයන් ඒ සියලු දෙනාම නීතිය ඉදිරියට ගෙනැල්ලා ඒ සියලු දෙනාටම නීතියෙන් දඬුවම් පමුණුවන එකයි. ඒක නිසා අපි මේ bond සිද්ධිය සම්බන්ධව සොයා බැලීමට පත් කළ කොමිසමේ වාර්තාවට වාගේම ප්‍රමාණවත් වැදගත්කමකින් මේ බරපතළ අපරාධ, දූෂණ සොයා බැලීමට පත් කළ කොමිසමේ වාර්තාව පිළිබඳවත් කටයුතු කළ යුතු වෙනවා. තමන්ගේ අය මෙතැන ඉන්නවා, තමන්ගේ යාළුවෝ, එකට කාපු-බීපු මිනිස්සු කියලා බලන්නේ නැතුව ඒ සියලු දෙනාටම විරුද්ධව එක හා සමානව නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි දැඩි ලෙස කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ නිසා මේ කාරණය කිසිම ආකාරයකින් පසු පසට අදින්න අපි ඉඩ දෙන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ ප්‍රධාන පංගුකාර පක්ෂය අපි. මේ රටේ නායකත්වය, මේ රටේ ජනවරම අපටයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ජනවරම ලබා දුන්නු මේ රටේ ජනතාව එක දෙයක් දන්නවා. මේ රට තුළ යහ පාලනයක් ඇති කරන්න එක්සත් ජාතික පක්ෂයේ කැප වීම පිළිබඳව මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබෙනවා. අද මේ මොහොතේ ක්‍රියාකාරී දේශපාලනය තුළ ප්‍රතිපත්ති ගරුක, ප්‍රතිපත්තියක් තිබෙන, එක ස්ථාවරයක ඉන්න, කට කැපුවත් බොරු කියන්නේ නැති නායකයෙක් ඉන්න පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. ඒ එක්සත් ජාතික පක්ෂයට අද ගම් මට්ටමේ, බිම් මට්ටමේ දැවැන්ත බලයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ දැවැන්ත බලය හරහා, ඒ මහ ජනතාවගේ අනුමතිය හරහා මේ රටේ යහ පාලන ක්‍රියාදාමය තවත් ශක්තිමත් කරලා, ආර්ථිකය ශක්තිමත් කරලා මේ රට ගොඩගන්න අපි ක්‍රියා කරනවා. ඒ වාගේම මේ රටේ දුප්පත් පොඩි මිනිහා වාගේම මධ්‍යම පාන්තිකයා ඇතුළු සියලු දෙනාගේම අපේක්ෂාව නීතිය ඉක්මනින් ක්‍රියාත්මක කිරීමයි.

අපි කනගාටු වෙනවා, සිදු වී ඇති ප්‍රමාදයන් පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ ආධිපත්‍යය නොමැතිව තිබූ රටක, නීතියේ ආධිපත්‍ය ඇති කරන එක ලෙහෙසි වැඩක් නොවෙයි. ඒ හොරකම්වලට සම්බන්ධ මිනිස්සු මේ රටේ ඉහළ ධුර දරන කොට, හොරකමට සම්බන්ධ මිනිස්සු මේ රටේ දේශපාලන බලඅධිකාරිය තුළ ඉහළ තැන්වල ඉන්න කොට නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කරන රජයේ නිලධාරීන්ට, නීතිපතිතුමාට, විනිශ්චයකාරවරුන්ට ඇතිවෙන පීඩනය අපට තේරුම් ගන්න පුළුවන්.

නමුත්, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අවශ්‍ය කරන වාතාවරණය, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නිර්භීතව ප්‍රශ්න කරන්නට, පැමිණිල්ල මෙහෙයවන්නට අවශ්‍ය කරන වාතාවරණය අපි අද වන විට ඇති කර තිබෙනවා. මේ රටේ විනිශ්චයකාරවරුන්ට ස්වාධීනව තීන්දු දෙන්නට අවශ්‍ය පසුබිම ඇති කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ පුරවැසියාට භය නැතිව ඇවිල්ලා මේ රටේ ඕනෑම තරාතිරමක කෙනකුට විරුද්ධව කථා කරන්න අවශ්‍ය පසුබිම ඇතිකර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මාධ්‍ය නිදහස අපි තහවුරු කර තිබෙනවා. සමහර වෙලාවට අපට හිතෙනවා, මාධ්‍ය නිදහස ඕනෑවට වඩා වැඩිද කියලා. සමහර වෙලාවට අපි කෙරෙහි අසාධාරණ විවේචන කරනවා. එසේ වුවත්, අපි ඒවා ගැන උපේක්ෂාවෙන් බලමින් අද සිදු වී ඇති ආකාරයටම සත්‍යය කවදා හෝ හෙළිදරවු වනවායි කියන ප්‍රතිපත්තිය මත ක්‍රියා කළ නිසා අද අපට හොඳ කලක් ඇවිල්ලා තිබෙනවා. බැඳුම්කර කොමිසම මඟින් එක්සත් ජාතික පක්ෂයත්, අපේ නායකයින්වත් සියයට සියයක් නිදහස් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. බරපතළ වංචා, දූෂණ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මඟින් පසුගිය ආණ්ඩුවේ හිටපු, අද ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න බොහෝ දෙනකුගේ අවසාන නවාතැන සිපිරි ගෙය බවට පත් කරන තැනට අද මේ පාර විවෘත කර තිබෙනවා. ඒ නිසා මා ජනතාවට කියන්නේ බලාපොරොත්තු තබාගෙන ඉන්න, බලාපොරොත්තු සහගතව ඉන්න කියලායි. අපි ජනතාවට 2015දී පොරොන්දු වූ දේ ප්‍රමාද වූ නමුත් ඉටු කරන බවත්, ඒ වෙනුවෙන් අපි පෙනී ඉන්න බවත් වග කීමෙන් කියමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 33ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වීමේ වරප්‍රසාද පාවිච්චි කරලා අපට ඕනෑම ජාතික වීරයකුට, ඕනෑම මනුෂ්‍යයකුට පහර දෙන්න පුළුවන්. ඒක දියුණු, ශීලාචාර පාර්ලිමේන්තුවක සිද්ධ වන දෙයක් නොවෙයි. අපි 1815දී කන්ද උඩරට ගිවිසුමෙන් බ්‍රිතාන්‍යයන්ට යටත් වුණා. සුද්දන් විසින් අපේ රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, සදාචාරය, මනුස්සකම කියන මේ සියල්ල නාය යැව්වා. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ නායක ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රමුඛ විවිධ ජාතිකවාදී බලවේග විසින් අධිරාජ්‍ය විරෝධී සටන ආරම්භ කළා. ඒ අවස්ථාවේදී හික්කඩුවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ, වැලිවිටියේ සෝරත හාමුදුරුවෝ, කොල්ලුපිටියේ

දීපදුත්තාරාමයේ වැඩසිටි මිගෙට්ටුවත්තේ ගුණානන්ද නායක හාමුදුරුවෝ, අනගාරික ධර්මපාලතුමා වැනි අය ජාතික ප්‍රබෝධය සඳහා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරන විට අමද්‍යප ව්‍යාපාරයේ නායකයන් ලෙස කටයුතු කළේ ඩී.එස්. සේනානායක, එෆ්.ආර්. සේනානායක වැනි සේනානායකවරුනුයි.

ඊළඟට, 1915දී -හරියටම අවුරුදු සියයකට පස්සේ- මුස්ලිම්, සිංහල කෝලාහලයක් ඇති වුණා. ඒ කෝලාහලයට මේ නායකයින් කවුරුත් සම්බන්ධ නැහැ. කෝලාහලයට මේ නායකයින් සම්බන්ධ නැති වුණත් මේ සියලුම නායකයින් එදා සුද්දන් විසින් යටත් කරලා වැලිකඩ බන්ධනාගාරයට යැව්වා. ඩී.එස්. සේනානායක, එෆ්.ආර්. සේනානායක, පියදාස සිරිසේන කොළඹ නගරයේ ආරක්ෂාව භාරව සිටි හෙන්රි පේදිස්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සීයා වන ජාකෝලිස් රාළහාමි යන අය සිර භාරයට ගත්තා චෝදනා දාලා. මේවා ඉංග්‍රීසිකාරයින් පුවත් පත්වල පළ කළා. ඊට පස්සේ හෙන්රි පේදිස්ව වෙඩි තියලා මරලා පුටුව ගෙනැවිත් ඩී.එස්. සේනානායක මැතිතුමාට පෙන්වා කිව්වා, "මේ ලේ තැවරුණු විධියටම උඹලාවත් යවනවා" කියලා. නමුත්, Privy Council එකේ තීන්දුවක් අනුව සේනානායක මැතිතුමා වැනි අය නිදහස් වුණා. අනගාරික ධර්මපාලතුමාවත් අවුරුදු හයකට සිර කළා. හෙන්රි පේදිස් වීරයා සිය දිවි පිදුවා. Havelock Town එකේ ඉසිපතනය ළඟ හෙන්රි පේදිස් පිළිරුවක් තබා තිබෙනවා.

ඊට අවුරුදු සියයකට පස්සේ -2015දී- තමයි මේ ගැහිල්ල පටන් ගත්තේ. 1815දී අපි යටත් වුණා. ඊට පස්සේ අවුරුදු සියයකට පස්සේ -1915දී- අනගාරික ධර්මපාලතුමා, සේනානායක මැතිතුමන්ලා වැනි අය සිර කළා. ඊළඟට, 2015 ඉඳන් දැන් මේ යන්නේ, රට බේරා ගත්ත, රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව සිංහල, දෙමළ, මුස්ලිම් සියලු මිනිසුන්ට ජීවත් වීමේ අයිතිය ලබා දුන්නු, ජනතාව මරණයෙන් බේරා ගත්ත සේනාධි නායක මහින්ද රාජපක්ෂ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු හාමුදුරුවරුන්ට, බුද්ධි අංශයේ නිලධාරීන්ට එළවා එළවා පහර දෙන යුගයයි. දැන් ඒ යුගය තමයි ඉතිහාසයට එකතු වන්නේ. මේ ගැන ඒ තරම් පුදුම වෙන්න දෙයක් නැහැ. මේක අවුරුදු සියයෙන් සියයට මේ රටේ සිදු වෙනවා. ඒකට අපි මුහුණ දෙන්න ලැහැස්තියි කියන ටික විතරක් මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි.

දැන් නීතිය, සාධාරණය බොහොම අකුරට ක්‍රියාත්මක වෙන හැටි කිව්වා. "අපි යුක්තිය පසිඳලනවා, අධිකරණ පිහිටුවනවා, දෙන්නම් බැටේ" කියලා වණ්ඩි පාට් දමලා තමයි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා කථා කරන්නේ.

මිනීමරු කොටි සංවිධානය අවුරුදු නිහක් මේ රටේ පැවතුණා. සිංගප්පූරුවේ තිබෙන්නේ වර්ග කිලෝමීටර් 1,000යි. උතුරු, නැඟෙනහිර තිබෙන්නේ වර්ග කිලෝමීටර් 18,800යි. ඒ අනුව, සිංගප්පූරුව වාගේ රටවල් 18ක අණසක පිහිටුවලා, කාත්තන්කුඩි පල්ලියේ යාඥා කරමින් සිටි මුස්ලිම් මිනිස්සු සමූල ඝාතනය කරපු, ශ්‍රී මහා බෝධිය ළඟ සිල් අරගෙන හිටිය උපාසක අම්මලාගේ සුදු සිල් රෙදි රතු රෙදි බවට පත් වෙන්න ඔවුන්ට වෙඩි තියපු, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මහනුවර භාරව හිටපු කාලයේ දළදා මාළිගාවට බෝම්බ ප්‍රහාර එල්ල කරපු, තර්ජිත ගම්මානවල නිදි පැදුරුවල හිටපු මිනිස්සු කීතු කීතුවලට කපලා මරපු, ඉන්දියාවට ගිහිල්ලා රජීව් ගාන්ධි මරපු, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ආමර් වීදියේදී කුඩු කරලා මරපු, ලලිත් ඇතුලත්මුදලි සහ ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමන්ලා මරපු, අජ්පාපිල්ලෙ අමිර්තලිංගම් සහ ලක්ෂ්මන් කදිරගාමර් මැතිතුමන්ලා මරපු, සී.වී. ගුණරත්නලා, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේලා මරපු එල්ටීටී සංවිධානයේ ත්‍රස්තවාදයට එක ආණ්ඩුවකටවත් විසඳුමක් දී ගන්න බැරිව ඉන්නකොට, සේනාධිනායකයා ලෙස එකතු කළ හැකි සියලු බල වේග එකතු කරලා ප්‍රභාකරන්ට ගහලා රටේ මිනිසුන්ට ජීවත් වෙන්න අයිතිය ලබා දුන්න ජාතික වීරයාගේයි ප්‍රජා අයිතිය අහෝසි කරන්න ඕනෑ කියන්නේ, ITN එකට සල්ලි ගෙවිවේ නැහැ කියලා. මේක පුදුම රටක්! මේක තමයි ඉතිහාසය පුරාම අපට වෙලා තිබෙන නස්පැත්තිය. කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව, මාතෘ භූමිය -රට- බේරා ගත්ත මිනිස්සු තුට්ටු දෙකට දමලා, ඒ මිනිසුන්ගේ ආත්මවලට මෙවැනි ප්‍රහාර එල්ල කරන රටක තමයි අවාසනාවට අපි ඉපදිලා තිබෙන්නේ. එවැනි රටක පාර්ලිමේන්තුවක් තමයි අපට නියෝජනය කරන්න ලැබිලා තිබෙන්නේ.

එදා මේ රට ආරක්ෂා කරනවා කියලා දිවුරලා ජනාධිපති ධුරය ගත්ත රණසිංහ ප්‍රේමදාස යුගයේ, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හැටියට හිටපු ආර්. පාස්කරලිංගම් මහත්මයා, බදු ගෙවන ජනයාගේ මුදල් කෙළින්ම කොටියාට දුන්නා. එතකොට කොහොමද නීතිය? බදු ගෙවන ජනයාගේ මුදල් එලෙස ගෙවීමට සම්බන්ධ රහසිගත ලේඛන තිබෙනවා. ආර්. පාස්කරලිංගම්, ST. ඔහු තමයි වියදම් අනුමත කරන නිලධාරියා. ඔහු අත්සන් කරනවා. අත්සන් කරලා, එසේ ගෙවන ලද මුදල් පිළිබඳ සියලු රිසිට් පත් මා සතුව තිබෙනවා.

"හදිසි - රහස්‍ය වියදම් ගෙවීම් (මහා භාණ්ඩාගාරය)

(මුදල් ලේකම් - ආර්. පාස්කරලිංගම් නමට)

1989.08.09. ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.09.15 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.09.27 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.11.01 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.11.30 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

මේ විධියට මුදල් ගෙවපු රිසිට් පත් මම **සභාගත*** කරනවා.

අද කෝ ඒ, ආර්. පාස්කරලිංගම්? ඒ, ආර්. පාස්කරලිංගම් තමයි, සුපිරිසිදු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක. ඒ කාලයේ සිදුවූ දේ මම කියවන්නම්.

"රජය කොටින්ට අවි දීම වැරදියි"

-ඉන්දීය අගමැති.

"ශ්‍රී ලංකා රජය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට 'අවි සැපයීම' වැරදි සහගත ක්‍රියාවක් බව ඉන්දීය අගමැති නරසිංහ රාඕ මහතා 'මලයාල මනෝරාමා' 'ද වීක්' සහ 'මැගසින් ටුඩේ' යන පුවත් පත් සමඟ පවත්වා ඇති සාකච්ඡාවකදී පවසා ඇත."

මේ තමයි ආයුධ දීම සම්බන්ධව සඳහන් දේ.

එතකොට අග්‍රාමාත්‍යතුමා මොකක්ද කිව්වේ? ඒ සම්බන්ධ ඉතිහාසය දන්නේ නැතිනම් දැනගන්න.

"අවි දුන්නේ ජ.වි.පෙ හා ද්‍රවිඩ හමුදා මර්දනය කරන්න"

-රනිල් වික්‍රමසිංහ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

"දෙමළ කොටි සංවිධානයට ආයුධ ලබා දීම රහසක් නොවන බවත්, ජ.වි.පෙ. ත්‍රස්තවාදය මර්දනයට ශ්‍රී ලංකා හමුදාව දකුණේ තබා ගන්නා අතරතුර කොටි සංවිධානය ලවා දෙමළ ජාතික හමුදාවට පහර දීම අරමුණ වූ බවත්, සභානායක, කර්මාන්ත විද්‍යා හා තාක්ෂණ ඇමති රනිල් වික්‍රමසිංහ මහතා කැලණිය, පෙතියාගොඩ සමුපකාර ප්‍රජා ශාලාවේදී පැවැති කැලණිය එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩල රැස්වීමකදී ප්‍රකාශ කළා."

එතකොට, ඒ කාරණය අගමැතිතුමා පිළිගත්තා.

ලංකාවේ පුවත් පත්වල පමණක් නොවෙයි. මුළු ලෝකයේම පුවත් පත්වල මේවා සඳහන් වෙනවා.

මේ පිළිබඳව පුවත් පතක මෙසේ සඳහන් වුණා:

"කොටින්ට අවි ආයුධ ලබා දීමෙන් ව්‍යවස්ථාවේ 6වන සංශෝධනය කඩා ඇත.

ලලිත් ඇතුලත්මුදලි."

මේ තමයි, කොටින්ට ආයුධ දීපු, සල්ලි දීපු මිනිහා. ඔහු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධාන ආර්ථික උපදේශකයා වෙලා අදත් යහතින් ඉන්නවා. නමුත්, මහින්ද රාජපක්ෂයි, ගෝඨාභය රාජපක්ෂයි හිරගෙට යවනකම් නින්ද යන්නේ නැහැ කියන මිනිස්සු ඉන්න රටක තමයි අපි ඉන්නේ. මේක තමයි රට!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ දේශපාලන කොමිෂන් දාලා ගත්ත ඕනෑ තරම් නිර්දේශ තිබෙනවා. බටලන්ද කොමිසමේ වාර්තාව මම අද ගෙනාවේ නැහැ. මේ අභියෝගය නිසා මම අනෙක් දවසේ මේ පාර්ලිමේන්තුවට බටලන්ද කොමිසමේ වාර්තාව ගෙනැල්ලා ඒක සම්පූර්ණයෙන්ම කියවනවා. ඒක මතක තියා ගන්න. බටලන්ද කොමිසම පිළිබඳ රජයේ මුදලින් මුද්‍රණය කරලා තිබෙන වාර්තාව මම පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ මෙතැනට ගෙනැල්ලා කියවනවා. මේ කරන කුප්පිදු දේශපාලනයට උත්තරයක් දෙන්න ඕනෑ. ඒ නිසා ඊළඟ විවාදය තිබෙන්නේ කුමන මාතෘකාවක් යටතේ වුණත්, ඒ විවාදයේදී බටලන්ද කොමිසමේ වාර්තාව මම සම්පූර්ණයෙන්ම කියවනවා. පුළුවන් නම් ඊට ඉස්සෙල්ලා මා මරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 ජූලි 04වැනි බ්‍රහස්පතින්දා "දිනමිණ" පත්තරේ මුල් පිටුව කියවන්න. එහි මෙහෙම සඳහන් වෙනවා:

"කෝටි 247ක වාහන ගැන කථා බහින් කැබිනට් රැස්වීම උණුසුම් වෙයි.

ගෙන්වා අතුරුදන් වූ වාහන දහ අට ගැන ඇමතිවරු ජනපතිනියගෙන් ප්‍රශ්න කරති."

ඒ යටතේ වැඩි දුරටත් සඳහන් මෙසේ වෙනවා.

"චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ පරිහරණය සඳහා පසුගිය රජයේ අවසන් දෙවසර තුළ ගෙන්වන ලද රුපියල් කෝටි 247කට ආසන්න වටිනාකමින් යුතු වෙඩි නොවදින වාහන 48ක් ගැනද, ඉන් අතුරුදන් වූ වාහන 13 පිළිබඳවද පැන නැඟුණු වාද විවාදවලින් ඊයේ රාත්‍රී පැවැති ඇමති මණ්ඩල රැස්වීම දැඩි උණුසුම් ස්වභාවයක් ගත් බව කැබිනට් මණ්ඩල ආරංචි මාර්ග සඳහන් කරයි."

එතකොට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග කෝටි 247ක වාහන ගෙන්වපු එකට දඬුවම් දුන්නාද? ඒ යුක්තිය ඉෂ්ට වුණාද? සාධාරණයක් ඉටු කළාද? ඒ වාහන කෝ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අනගාරික ධර්මපාලතුමාටත් මේ විධියටම රටේ මිනිස්සු හොරා, වංචාකාරයා, දූෂිතයා කියලා දිගින් දිගටම මාධ්‍යවලින් එළව එළවා බොරුවට ගැහුවා. එහෙම ගැහුවත් බොහෝ දේ දරාගෙන සිටි අනගාරික ධර්මපාලතුමා ඉන්දියාවට ගියා. ගිහින් එතුමා බුද්ධගයාව බේරා ගත්තා; මූලගන්ධ කුටි විහාරය හැදුවා. එතුමා සිරි දේවමිත්ත නමින් පැවිදි වෙලා සිටියදී අත් අකුරෙන් ලිව්වා, "මා මළ පසු මාගේ මෘත කලේබරයේ හිසවත් ශ්‍රී ලංකාව පැත්තට දාන්න එපා." කියලා. අපි ඒ තරම් අකෘතඥ මිනිස්සු කියලා උන්වහන්සේ දැනගෙන හිටියා. ඒ තමයි අනගාරික ධර්මපාලතුමාට කරපු දේ. ජීවතුන් අතර සිටියදී එතුමාට ඒ විධියට ගහලා, ගහලා මැරුණාට පස්සේ එතුමාගේ පිළිරූ රට පුරාම හදලා තිබෙනවා. මේ අපේ ජාතික වීරවරයෙක් කියලා දළදා මාලිගාව ළඟ, විහාරමහාදේවී උද්‍යානයේ එතුමාගේ පිළිරූ හදලා තිබෙනවා. ඒ නිසා එවැනි ජාතික වීරයන්ට ගහන්න එපා. රටක ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කරපු මිනිසුන්ට ගහන්න එපා. මිනිස්සු අතර අඩු පාඩු තිබෙන්න පුළුවන්; වැරැදි තිබෙන්න පුළුවන්. අපි හැමෝම වැරැදි තිබෙන "black and white" මිනිස්සු. අපි හැමෝම අත වැරැදි තිබෙන්න පුළුවන්. රටක ඉතිහාසයක ගමන් මඟ වෙනස් කරපු මිනිස්සු තුට්ටු දෙකට දාලා ප්‍රහාර එල්ල කිරීමේ නින්දිත ප්‍රයත්නයෙන් අඩු තරමින් උත්තරීතර සභාව කියන මේ පාර්ලිමේන්තුවේදීවත් මිදිය යුතුයි කියලා තමයි මම විශ්වාස කරන්නේ. මොකද, මේ රටේ ජාතික නායකයෝ විවිධ අඩු පාඩු, දුෂ්කරතා යටතේ වුණත් යම් දෙයක් කළා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා කොටින්ට ආයුධ දුන්නා; කොටින්ට මුදල් දුන්නා. නමුත්, එතුමා මේ රටේ දුප්පත්කම නැති කරන්න, දුප්පත් මිනිසුන්ට මොකක් හරි කරන්න ඒ කාලයේ යමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි 2008 -2014 කාලය තුළ සිදුවූ බැඳුම්කර වංචා සොයනවාය කියන එක. "අත්තනෝමතික තීන්දුවලට බැඳුම්කර නිකුතු සිදු කරලා. එය පිරමීඩ වංචාවකට සමානයි." මෙකනේ මේ අය කියන්නේ. 2015දී සිදු වූ බැඳුම්කර සොරකම වහන්න, 2008 සිට 2014 දක්වා සිදු කළ බැඳුම්කර පිළිබඳවත් සොයනවා කියලා අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී කියනවා. එයින් ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය මොකක්ද? ලංකාව නිකුත් කරන බැඳුම්කරවලට මෙච්චරකල් කිව්වේ, "ස්වෛරීත්ව බැඳුම්කර" - Sovereign Bonds - කියලායි. දැන් ලෝකය පුරාම කියන්නේ "Black Bonds" කියලායි; "කළු බැඳුම්කර" කියලායි කියන්නේ. ඒවා කවුරුවත් ගන්නේ නැහැ. ලබන අවුරුද්දේ ඇති වෙන මූල්‍ය අර්බුදය මොකක්ද කියලා බලන්න. ආණ්ඩුවම කියනවා, "රජය වෙනුවෙන් මේ බැඳුම්කර නිකුත් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව" කියලා. ශ්‍රී ලංකා මහ බැංකුව තමයි රජයේ බැංකුකරු; මුදල් නියෝජිතයා; මූල්‍ය උපදේශකයා. දේශපාලනඥයෝ නොවෙයි බැඳුම්කර නිකුත් කරන්නේ. එතකොට ඒ නිකුත් කරපු බැඳුම්කර හොරට නම් නිකුත් කරලා තිබෙන්නේ, රජය වෙනුවෙන් භාණ්ඩාගාරය, මේ මහා බැංකුව මොකක්ද කරලා තිබෙන්නේ? ඒ ආයතන තමයි මුදල් නෝට්ටු අච්චු ගහන තැන; මුදල් නෝට්ටු අච්චු ගහන්න ඒකාධිකාරී බලය තිබෙන තැන; සියයට සියයක් සම්පූර්ණ මහජන විශ්වාසය රඳන තැන. එසේ තිබියදී දේශපාලනඥයෝ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, "2008 සිට 2014 දක්වා ලෝකයේ ගනුදෙනුවෙමින් තිබෙන ලංකාවේ බැඳුම්කර හොර ඒවා." කියලා.

ලංකා ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ කියනවා නම්; ඒ රටේ අග්‍රාමාත්‍යතුමා, ඒ රටේ ඇමතිවරු කියනවා නම් 2008 සිට 2014 දක්වා ගනුදෙනු වෙලා තිබෙන්නේ හොර බැඳුම්කර කියලා, මේ බැඳුම්කරවලට දාපු සියලුම මුදල් විදේශිකයෝ ආපසු ඉවත් කර ගෙන යනවා. මහ බැංකුවේ මහ දවල් සිදු වූ මහ මුදල්

මංකොල්ලයෙන් පස්සේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක් අරගෙන ගියා. අරගෙන යනකොට ඒක නවත්වන්න හිටපු මුදල් අමාත්‍ය, රවි කරුණානායක මහතා අය වැය යෝජනාවක් ගෙනාවා. විදේශිකයන්ට සියයට 12ක් බැඳුම්කර ගන්න පුළුවන්කම තිබුණු එක එතුමා සියයට 10ට අඩු කළා. මොකද, ඔක්කොම ටික ගෙඩිය පිටින් ඇද්දොත් ජාත්‍යන්ත සංචිත - Foreign-Exchange Reserves- ටික කඩාගෙන වැටෙනවා. එහෙම කඩාගෙන වැටුණොත් රට වැටෙනවා. දැන් මේකෙන් වෙන්නේ මේ ආර්ථිකය ගෙනයන්න බැරි වෙන එකයි. ගෙනයන්න පුළුවන් එකම ක්‍රමය මේකයි. 2008-2014 දක්වා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ මේ බැඳුම්කර වංචාව සිදු වුණාය කියා උඩ පැන පැන කියනවා නම්, පාර්ලිමේන්තුවේ අනෙක් සියලු කටයුතු වහාම නතර කර, මේ පිළිබඳව විතරක් තේරීම් කාරක සභාවක් පත් කර මෙය නිවැරදි කළ යුතුයි. එහෙම නැත්නම් ආර්ථිකය ගෙනයන්න බැහැ. අනෙක් වැඩ සියල්ල නතර කර, මාසයක් ඇතුළත මේ වැඩේ කරන්නය කියලා කියන්න මේ කොමිසමටම පුළුවන්. ලංකාව 2008 සිට 2014 දක්වා ලෝකය පුරා නිකුත් කර තිබෙන බැඳුම්කර වංචා සහගත ඒවාද, නැද්ද කියා ප්‍රකාශ කරන්න කියලා කියන්න මේ කොමිසමට පුළුවන්. ඒ සඳහා තේරීම් කාරක සභාවක් පත් කරන්න. පාර්ලිමේන්තුව හා රට වෙනුවෙනුයි මා මෙම ඉල්ලීම කරන්නේ. රටේ මුදල් ක්‍රමය කඩාගෙන වැටුණොත් අපි කාටවත් ගොඩ ගන්න බැහැ. පොඩි ගණනක් ගැන නොවෙයි මේ කියන්නේ.

මම නැවතත් එම කරුණු පෙන්වන්නම්. රුපියල් බිලියන 4,702ක ගනුදෙනු විනිවිද නැහැ කියලා අග්‍රාමාත්‍යතුමා කියා තිබෙනවා. බිලියන 4,702ක් කියන්නේ කෝටි හාරලක්ෂයක්. කෝටි හාරලක්ෂයක් ගැන කියන්නේ. මහින්ද රාජපක්ෂ යුගයේ මේ භාණ්ඩාගාර බැඳුම්කර වැරැදි නම්, එයට මමත් වග කියන්නට ඕනෑ. මොකද, මමත් ඒ කාලයේ කැබිනට් ඇමතිවරයෙක්. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් ඒ කාලයේ කැබිනට් ඇමතිවරයෙක්. එතුමාත් එයට වග කියන්නට ඕනෑ. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමාත් එදා කැබිනට් ඇමතිවරයෙක්. එහෙම නම් එතුමාත් එයට වග කියන්නට ඕනෑ. ඒ වාගේම ගරු සරත් අමුණුම ඇමතිතුමාත් වග කියන්නට ඕනෑ; ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් වග කියන්නට ඕනෑ; අපි ඔක්කොම වග කියන්නට ඕනෑ. මොකද, එහෙම වග කියන්නට බැරි ඇමතිවරු සාමූහික වග කීම යටතේ කැබිනට් මණ්ඩලයක ඉඳලා වැඩක් නැහැ නේ. මේ බිලියන 4702ක මුදල මහින්ද රාජපක්ෂගේවත්, බන්දුල ගුණවර්ධනගේවත්, රවි කරුණානායකගේවත් පෞද්ගලික මුදල් නොවෙයි නේ. මේවා ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කර තිබෙන්නේ. ලංකා ආණ්ඩුවේ බැඳුම්කර මහ බැංකුව හොරට නම් නිකුත් කර තිබෙන්නේ, මේ ගරු සභාවේ අපි ඉතාම උස් හඬින් ඉල්ලා සිටිනවා, වහාම මේ ගැන තේරීම් කාරක සභාවක් පත් කරන්නය කියා. අනෙක් සියලුම කටයුතු නතර කර මේ ගැන විතරක් හොයන්න. ගෙන්වන්න පුළුවන් හැම කෙනෙකුම ගෙන්වන්න. දෙන්න පුළුවන් හැම දඩුවමක්ම දෙන්න. මේකේ ශත පහක් හෝ වංචා කර තිබෙනවා නම්, මුළු කැබිනට් එකේම ඉන්න ඔක්කොම හිරේ දමන්න කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරනවා. මේ ඒකට දීපු උත්තරය.

දෙවන කාරණය. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. (Dr.) Harsha De Silva.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් මට තත්පර තිහක කාලයක් දෙන්න කියා ඉල්ලා සිටිනවා. වැදගත් කාරණයක් - [බාධා කිරීමක්] මට කරුණාකර තත්පර තිහක කාලයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ නැති පුද්ගලයකු වන ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතා ගැන කිව්වා. ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතා කළු සල්ලිවලින් එංගලන්තයේ මහ ලොකු බිල්ඩිමක් අරගෙන තිබෙනවාය කියලා කිව්වා. මම එතුමාට දැන් කථා කළා. එතුමා කිව්වා, ඒක සම්පූර්ණ අසත්‍යයක් බව. ඒක නිවැරදි නැහැ. එතුමාට මෙතැනට එන්න විධියක් නැති නිසා ඒක නිවැරදි කරන්න කියලා එතුමා මට කිව්වා. එහෙම මිනිසුන්ට අපහාස කරන එක සම්පූර්ණයෙන්ම වැරැදියි. එතුමා Commonwealth Secretariat එකේ, Deputy-Director of the Secretary-General වශයෙන් සිටි කාලයේ එතුමාට දීලා තිබුණු ගෙයක්. එතුමා ඒ මුළු බිල්ඩිමේම නොවෙයි ඉඳලා තිබෙන්නේ. එතුමා ඒ බිල්ඩිමේ එක flat එකක ඉඳලා තිබෙන්නේ. දැන් එතුමා Finchleyවල පොඩි flat එකක සිටින බව සඳහන් කරන්න කියලා එතුමා මට කිව්වා. මොකද, එය අසාධාරණ ප්‍රකාශයක්, ඒ ගැන පැහැදිලි කරන්න එතුමාට මෙතැනට එන්න බැරි නිසා. බොහොම ස්තුතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම එහෙම තොරතුරක් ගැන කියලා නැහැ. මම යම් තොරතුරක් පිළිබඳව සඳහන් කරනවා නම් එහෙම කරන්නේ අදාළ ලේඛන සියල්ල අතේ තියාගෙනයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා එහෙම කිව්වේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, ඒක එතුමාත් එක්ක බේරා ගන්න.

ඊළඟට, මහ බැංකුවේ මෙම බැඳුම්කර සිද්ධියට අදාළව ප්‍රශ්නය පටන් ගත් දවසේ සිටම මම පාර්ලිමේන්තුව වෙනුවෙන් මුදල් පිළිබඳ යුතුකම ඉෂ්ට කිරීම විතරයි කළේ. පෞද්ගලිකව කිසිදු ඇමතිවරයකු හෝ අග්‍රාමාත්‍යතුමා සමඟ මගේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේ රටේ හැම දාම ශ්‍රී ලංකා මහ බැංකුව තිබුණේ මුදල් ඇමතිවරයා යටතේ බව අපි දන්නවා. මුදල් ඇමතිවරයා සහ මහ බැංකුවේ අධිපති තමයි මුදල් නෝට්ටුවලට අත්සන් කරන්නේ. මූල්‍ය නීති පනත අනුව මේ සියලුම වගකීම් පැවරෙන්නේ මුදල් විෂය භාර අමාත්‍යවරයාට.

ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට, මේ මුදල් අමාත්‍යවරයාගෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අරගෙන අග්‍රාමාත්‍යතුමා යටතේ ගැසට් කළා. ඒක කළේ අග්‍රාමාත්‍යතුමායි. එතුමා දෙවනුව

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මහ බැංකු අධිපති ධුරයට විදේශිකයකු පත් කළා. ලංකාව කියන්නේ ආර්ථික විද්‍යාව පිළිබඳව, ගණකාධිකරණය පිළිබඳව, මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳව, බැංකු පිළිබඳව පළපුරුදු නිලධාරීන්, බුද්ධිමතුන් දස දහස් ගණනක් සිටින රටක්. එදා ජෝන් එක්ස්ටර් මේ බැංකුව හදන කොට ලංකාවට බැංකුවක් තිබුණේ නැහැ. මුදල් තිබුණේ නැහැ. අපේ රුපියල ඉන්දියානු රුපියලත් එක්ක සම්බන්ධ කරලා තිබුණේ. ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයෙන් තමයි මුදල් නිකුත් කළේ. ඇමෙරිකානු ජාතික ජෝන් එක්ස්ටර් තමයි මුදල් ක්‍රමය පිළිබඳ මේ මූල්‍ය නීති පනත හැදුවේ. එය හදපු අවස්ථාවේ ඔහු මහ බැංකු අධිපති වුණා. ඒ කාලයේ අපි පූර්ණ නිදහස් රටක් නොවෙයි. අපිට හමුදාවක් තිබුණේ නැහැ. නාවික හමුදා කඳවුර ත්‍රිකුණාමලයේ තිබුණා. ගුවන් හමුදා කඳවුර කට්ටුනායක තිබුණා. අපි බ්‍රිතාන්‍යයට යටත්ව හිටියේ. අපට පූර්ණ නිදහස ලැබුණේ 1956දී ඒ කඳවුරු අයින් කළාට පසුවයි. ඊට පසුව කවදාවත් මහ බැංකුවට විදේශිකයකු පත් කරන්න ඕනෑ වුණේ නැහැ.

අපි හිතමු, එහෙම කෙනෙක් පත් කළාය කියලා. එහෙම පත් කරන කොට ඔහු අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165වන ව්‍යවස්ථාව අනුව දිවුරුම් දීමක් කරන්න ඕනෑ. අගමැතිතුමාට තිබුණා, ඔහුට දිවුරුම් දෙන්න කියලා කියන්න. නමුත්, කිව්වේ නැහැ. මොකද ඔහුට දිවුරුම් දෙන්න බැහැ. ඇමෙරිකන් පුරවැසියකුට -ගෝඨාභය රාජපක්ෂට- පුළුවන් වුණා ලංකාවට ඇවිත් ආරක්ෂක ලේකම් ධුරය දරන්න. ඇයි? ඇමෙරිකා එක්සත් ජනපදය dual citizenship කියන එක අනුමත කරනවා. නමුත්, සිංගප්පූරුවේ dual citizenship කියන එක පිළිගන්නේ නැහැ. සිංගප්පූරු පුරවැසියාට කිසිම වෙලාවක වෙනත් රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකිනවා කියා දිවුරුම් දීමක් කරන්න බැහැ. එම නිසා ඔහු දිවුරුවේ නැහැ. අපි විදේශිකයකුගේ සේවය ලබා ගන්නවා නම්, රජයේ ආයතන සංග්‍රහයේ 7.2 වගන්තිය යටතේ ඒ සඳහා ඇමතිවරයාගේ ලිඛිත අනුමැතියක් තියෙන්න ඕනෑ. මා හිතන විධියට වජීර අබේවර්ධන අමාත්‍යවරයා එහෙම ලිඛිත අනුමැතියක් දීලාත් නැහැ. මහ බැංකු අධිපතිවරයා පත් කිරීම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165වන ව්‍යවස්ථාව අනුව නීත්‍යානුකූල නැහැ. ඔබතුමන්ලා 165වන ව්‍යවස්ථාව කියවා බලන්න. ඒකට වෙන කාගේවත් නමක් කියලා -වෙන රටක dual citizenship ගන්න පුළුවන් ගෝඨාභය රාජපක්ෂ වැනි කෙනෙකුගේ- උදාහරණ ඉදිරිපත් කළාට වැඩක් නැහැ. මොකද සිංගප්පූරු පුරවැසියාට විතරයි තවත් රටක පුරවැසිකම ලබන්න බැරි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකිනවා කියලා කියන්න බැරි මනුස්සයෙක් කොහොමද සල්ලි කොළයට අත්සන් තබන්නේ? ඒ මුදල් නීත්‍යානුකූලද? මේ ප්‍රශ්නය ගැන කවුරු හෝ කථා කරන්න ඕනෑ නේද? ඒ අනුව 2015 ජූනි මාසයේ 3වැනි දා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ප්‍රශ්නය අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කළා. අපිට විපක්ෂයක් නැහැ නේ. මෙහි තිබෙන්නේ හීන විපක්ෂයක් හා "deal විපක්ෂයක්". ජනතාවගේ විපක්ෂය වශයෙන් 2015 ජූනි මාසයේ 03වැනි දා අපි මේ පිළිබඳව ඇහුවාම, අගමැතිතුමා මෙසේ කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජූනි 03වැනි දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 388හි මෙසේ සඳහන් වෙනවා:

> "සමහරු දැන් තමන්ට හිතවත් මාධ්‍ය උපයෝගි කර ගනිමින්, අර්ජුන මහේන්ද්‍රන් මහතා නිසා ජාත්‍යන්තර ප්‍රශ්න ඇති වී ඇති බවට ප්‍රචාර යවනවා. නමුත්, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සිදු කෙරෙන මහ බැංකු ගනු-දෙනු විමසීමේදී ඒ බවක් පෙනී යන්නේ නැහැ. රාජපක්ෂ රෙජීමයේ හෙංචියලා ලංකා බැංකුවට හා මූල්‍ය ආයතනවලට බලපෑම් එල්ල කරන බව අප දන්නවා. නමුත්, ඒ කිසිවක් සාර්ථක වී නැහැ.... විදේශ පුරවැසියන් සම්බන්ධ කර ගෙන රාජ්‍ය සම්පත් මං කොල්ල කෑදි, කොමිස් කුට්ටි ගණන් ගසා කෑදි, දූෂණයේ යෙදෙද්දි, වංචා කරද්දි ඔබතුමන්ලා කට පියාගෙන සිටියා. එහෙත් විදේශ පුරවැසියෙක් යොදාගෙන දූෂණ වංචා තුරන් කරද්දි, මූල්‍ය විනයක් ඇති කරද්දි, රාජ්‍ය සම්පත් ආරක්ෂා කරද්දි ඔබතුමන්ලා ඊට විරුද්ධයි."

අන්න, අගමැතිතුමා මේ හොරු රැක්ක විධිය. "දූෂණයේ යෙදෙද්දි, වංචා කරද්දි ඔබතුමන්ලා කට පියාගෙන හිටියා" කියලා එතුමා කිව්වා. එහෙත් විදේශ පුරවැසියකු -විදේශ පුරවැසියා කියන්නේ අර්ජුන මහේන්ද්‍රන් - යොදාගෙන දූෂණ වංචා තුරන් කරද්දි, මූල්‍ය විනයක් ඇති කරද්දි, රාජ්‍ය සම්පත් ආරක්ෂා කරද්දි ඔබතුමන්ලා ඊට විරුද්ධයි කියලාත් අගමැතිතුමා කිව්වා.

එතුමා කියන්නේ, දූෂණ නැති කරන්න ආපු එක්කෙනා අර්ජුන මහේන්ද්‍රන් කියායි. ඉතිහාසයේ පළමුවැනි වතාවට අභ්‍යන්තර තොරතුරු තමන්ගේ බෑනාට දීම තුළින් අර්ජුන මහේන්ද්‍රන් වැරැද්දක් කර තිබෙනවා. මේක නේ, අපරාධ වැරැද්දක් වෙන්නේ. අභ්‍යන්තර තොරතුරු, වෙළෙඳ පොළේ ප්‍රාථමික ගැනුම්කරුවකුට - primary dealer කෙනෙකුට- දීලා ඒ තුළින් කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත ලාභ ලබන්න හදනවා. එතකොට ඒ අය ඒ මූල්‍ය විනය ඇති කරන හැටි. ඒවාට අනෙක් ඔක්කොම අයත් පැටළුණා. එහෙම පැටළුණාට පස්සේ අගමැතිතුමා මේ ගරු සභාවේදී මෙහෙම කියනවා.

2015 මාර්තු 17 වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 66හි මෙසේ සඳහන් වෙනවා:

> "... මුදල් අමාත්‍යවරයා, මහාමාර්ග අමාත්‍යවරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති හා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ඇතුළු නිලධාරීන් පෙබරවාරි 26 වැනිදා රැස් වී මේ ගැන සාකච්ඡා කළා. බිලියන 15ක් කඩිනමින් අවශ්‍ය බවට ඒගොල්ලන් එදා තීරණය කළා. ඒ වන විටත් රුපියල් බිලියන එකක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වෙනුවෙන් මහ බැංකුව දැන්වීම් පළ කර තිබුණා."

ඒ කියන්නේ මුදල් අමාත්‍යවරයායි, මහාමාර්ග අමාත්‍යවරයායි, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයායි, මහ බැංකු අධිපතියි. මුදල් අමාත්‍යවරයා විතරක් නොවෙයි. තව කට්ටිය තමයි පෙබරවාරි 26 වැනිදා හම්බ වෙලා රුපියල් බිලියන 15ක් ඕනෑ කියලා කිව්වේ.

අගමැතිතුමා තවදුරටත් මෙහෙම කියනවා:

> " රුපියල් බිලියන 20කට අධික භාණ්ඩාගාර බිල්පත් සඳහා මිල ගණන් ඉදිරිපත් කර අනතුරුව බිලියන 10ක් දක්වා මිල ගණන් තෝරා ගන්නා ලෙස ඔහු ප්‍රසිද්ධ ණය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට උපදෙස් දුන්නා. ඒ ටෙන්ඩර් එක දීලා තිබෙනවා. මහ බැංකුවේ අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියලා කරුණු නැහැ."

අග්‍රාමාත්‍යතුමා තමයි මෙහෙම කියන්නේ. එතුමා 2015 මාර්තු 17වැනි දා මේ ගරු සභාවට බොහොම පැහැදිලිව කියනවා, මහ බැංකු අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියලා කරුණු නැහැයි කියලා. කරුණු නැත්නම් මේ පිටු ගණන්වල කියලා තිබෙන්නේ ඍජුවම මේ තොරතුරු අරගෙන කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත අලාභ කරන්න චූදිතයා තමන්ගේ බෑණාට ඉඩ ප්‍රස්ථා ලබා දුන්නා කියන එකයි. ඒ චූදිතයා ගැන අගමැතිතුමා කියනවා, "නැහැ, නැහැ එහෙම එකක් කරලා නැහැ"යි කියලා. එතුමා ඒක කරන්නේ නැහැ. අපටයි කියන්නේ.

ගරු අගමැතිතුමා තවදුරටත් මෙහෙම කියා තිබෙනවා. එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 69හි මෙසේ සඳහන් වෙනවා:

> "ඔබතුමන්ලා කී දෙනෙක් bond market එක ගැන දන්නවාද? කී දෙනෙක් "Brooke Bond" ගැන දන්නවාද? කී දෙනෙක් "James Bond" ගැන දන්නවාද? ඉතින් එහෙම නම් අපි සුදුසු නැහැ. එහෙම නම් අපි

Primary Dealersලා මෙතැනට දමන්න ඕනෑ . ඔබතුමන්ලාට ඕනෑ නම් අපි විශේෂඥ දැනුම ලබා දෙන්නම්. ඔබතුමන්ලා ඒ දැනුම අර ගන්න, අපි ඒකට උදව් කරන්නම්. මට ඕනෑ, Parliamentary Budget Office එකකුත් පටන් ගන්න. ඉතින් මේ මොකක්වත් වහන්න වුවමනා නැහැ.

ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අදටත් COPE එකේ වැඩ කටයුතු හොඳට කර ගෙන යනවා. ඒ කමිටුවේ සභාපති වෙන්න ඔබතුමාට තිබුණ විශේෂ දැනුම මොකක්ද? පාර්ලිමේන්තුවේ ඉන්න අපි දන්නවා, කොහොමද මේ වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා."

එතකොට එතුමා බොහොම පැහැදිලිව ඩිව් ගුණසේකර මහත්තයාගෙන් අහනවා, ඔබතුමා Bonds ගැන දන්නේ මොනවාද කියලා. මේ මොනවාවත් කරලා නැහැ. මම නොවෙයි, අග්‍රාමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේදී මෙහෙම කියලා තිබෙන්නේ. මේ හැන්සාඩ් වාර්තා කියවන්න.

ඊට පස්සේ කොමිසම ඉදිරියේ සාක්ෂි දෙනවා. එතැන බිලියන 15ක් කියනවා.

2017 සැප්තැම්බර් 25 වැනි සඳුදා "ලංකාදීප" පුවත්පතේ මෙසේ සඳහන් වෙනවා:

"බිලියන 75ක් ඉල්ලා හිටපු ඇමති රවි ඉදිරිපත් කළ ලිපිය නිල ලිපියක්. ව්‍යාජ ලිපියක් බවට කරන චෝදනාව මා ප්‍රතික්ෂේප කරනවා."

බිලියන 15ක් කියලා අගමැතිතුමා පාර්ලිමේන්තුවට කියනවා. මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් කියනවා, බිලියන 75ක් අවශ්‍යයි කියලා රවි කරුණානායක මැතිතුමා ලියුමක් දුන්නාය කියලා. මම නොවෙයි, මේ කොමිසමට දිවුරලා කියන සාක්ෂි. අපි දන්නේ නැහැ.

"අන්තෝ ජටා - බහි ජටා" කියනවා වාගේ මේ ඔක්කොම ඇවිල්ලා කියනවා, "බිලියන 12ක අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා තමයි කියන්නේ. දැන් ඒකේ ප්‍රශ්නයක් නැහැ, ඒ මුදල් බැංකුවේ තිබෙනවා"ය කියලා. ඒවා අමු බොරු. එහෙම කොහොමද බැංකුවේ මුදල් තිබෙන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිලියන 12ක් නම් -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා ඒ විධියට කථා කරන්න එපා. මොකද, දැන් පොඩ්ඩකට කලින් ගරු අගමැතිතුමා කිව්වා, ඒ මුදල් freeze කරලා තිබෙනවා කියලා මහ බැංකු අධිපතිතුමා කිව්වා කියලා. ඒවා තිබෙනවා. මහ බැංකුවේ තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මහ බැංකුවේ ඒ මුදල් තියා ගෙන මොකටද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ තර්කය ඒක නොවෙයි. මම අහන්නේ මේ හොරකමේ අලාභය බිලියන 12ක් නම් ඒ ගනුදෙනුව ඉවර වුණු දවස 2016 -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක නොවෙයි නේ, ඔබතුමා කිව්වේ. බිලියන 12 නැහැයි කියලා නේ. ඔබතුමා කිව්වා බිලියන 12 නැහැ කියලා. මම කියන්නේ බිලියන 12 තිබෙනවාය කියලා මහ බැංකු අධිපතිවරයා සනාථ කර තිබෙනවා කියන එකය. එච්චරයි මම කියන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, බිලියන 12ක් තිබෙනවා. අහවල් එකටද, බිලියන 12ක්. අය වැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට බිලියන 203ක් වෙන් කළා. වියදම් කළේ කීයද? බිලියන 65යි. ඉතිරි කීයද? බිලියන 138යි. එහෙම නම් බිලියන 138ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන්නේ. මේ බිලියන 12 මොකක්ද? ඒක කුණු කූඩයට දමන්න බැරියැ. අර බිලියන 138ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන්නේ. බිලියන 203ක් වෙන් කළා, 65ක් වියදම් කළා, ඉතිරි 138යි.

සියයට 32යි වියදම් කළේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ බිලියන 138ක් තිබෙනවා. ඒක ගන්න බැරියැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2016 වර්ෂයේ මාර්තු මස 31වැනි දිනෙන් පසුව, කොමිසම වැහුවාට පසුව මෙම සමාගම රුපියල් බිලියන 5,729ක ප්‍රාග්ධන ලාභ ලබලා තිබෙනවා. රුපියල් බිලියන 6,365ක ලාභ ලබලා තිබෙනවා. එතැන විතරක් රුපියල් බිලියන 12,094ක ලාභයක් තිබෙනවා. මේ කොමිසම වැහුවාට පස්සේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සිදුවී තිබෙන අලාභය කොපමණද කියලා මම ගණනය කරලා තිබෙනවා. භාණ්ඩාගාර බිල්පත් පොලී චක්‍රය වෙනස් වීමෙන් වූ පාඩුව රුපියල් බිලියන 144.5යි. විදේශිකයන් ආපසු රැගෙන ගිය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4යි; එනම් රුපියල් බිලියන 360යි. කොටස් වෙළෙඳ පොළේ සිදුවූ අලාභය රුපියල් බිලියන 369යි. විදේශ විනිමය අනුපාතය නිසා සිදු වූ අලාභය රුපියල් බිලියන 450යි. රාජ්‍ය ණය පැටව් ගැසීමෙන් රුපියල් බිලියන 571යි. ණය පොලි අනුපාතය, රාජ්‍ය ණය පොලී වැඩි වීමෙන් වූ අලාභය රුපියල් බිලියන 289යි. ඍජු විදේශ ආයෝජන අඩු වීම රුපියල් බිලියන 271යි. ඔක්කොම අලාභය, ආවස්ථික අලාභය - opportunity loss එක - ඒ කියන්නේ ලබා ගත හැකිව තිබී නැතිවූ අලාභය රුපියල් බිලියන 2,000යි. ගණනය කරපු ආකාරය සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා. ඒ සියල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මට සඳහන් කරන්න තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය තුළ අභ්‍යන්තර අර්බුදයක් එළියට ඇවිත් තිබෙනවා කියන එකයි. 2018 පෙබරවාරි මස 05වැනි දින "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

"..... "අර්ජුන් ඇලෝසියස් හා තමා අතර පුද්ගලික හෝ ව්‍යාපාර හෝ නිල වශයෙන් හෝ සම්බන්ධයක් නොතිබුනු" බවට කරුණානායක කළ දිවුරුම පදනමේ සිට ඔහුට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන ලෙස අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවට ද උපදෙස් ලැබී ඇත. මෙසේ උපදෙස් ලැබී ඇත්තේ "සාවද්‍ය සාක්ෂි" ලබා දීම අරඹයා කරුණානායකට එරෙහිව පියවර ගන්නා ලෙසට නීතිපති දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු උපදෙස්වලට අමතරවය.

පසු ගිය අහඹරුවාදා එක්සත් ජාතික පක්ෂ නායක, අගමැති රනිල් වික්‍රමසිංහ, අරලියගහ මන්දිරයේ පැවැති සාකච්ඡාවකට කරුණානායක කැඳවුයේය. අඩුම තරමින් මෙම ගැටලු විසඳා ගන්නා තෙක් පක්ෂයේ උපනායක තනතුරින් ඉල්ලා අස් වන ලෙසට ඔහු කරුණානායකගෙන් ඉල්ලා සිටියේය. සන්ඩේ ටයිම්ස් හට....."

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද මේ කරන්නේ? බොරුවට පත්තරවල තිබෙනවා කියලා බොරු කථා කියනවා. මොනවාද මේ කියන්නේ? මේ වාගේ මොකුත් කරලා නැහැ. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පුවත් පතක තිබෙන දෙයක් මේ සභාවේ කියන්න මට අයිතියක් නැද්ද? [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමා පුවත් පත කියවන්න. ඒ එක්කම කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මම පුවත් පත කියවන්නේ. ගරු මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. මම මේ පුවත් පතින් කියවන්නේ.

"සන්ඩේ ටයිම්ස් හට දැන ගැනීමට හැකි වූ ආකාරයට, පක්ෂ නායකයාගේ ඉල්ලීම කරුණානායක මුලින්ම ප්‍රතික්ෂේප කර තිබේ. මෛත්‍රීපාල සිරිසේන බලයට පත් කිරීමටත්, පක්ෂ නැවත බලයට ගෙන ඒමටත් තමා අතිශයින් වෙහෙස වූ බවත්, ඒ නිසා මේ අවස්ථාවේ -"

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මේකේ හොඳ ටිකක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කරන්න දෙයක් නැහැ. ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට තේරෙන්නේ නැහැ. සිංහල තේරෙන්නේ නැද්ද, දෙමළ තේරෙන්නේ නැද්ද, ඉංග්‍රීසි තේරෙන්නේ නැද්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මම "ලංකාදීප" පුවත් පතේ මෙම කොටස ඇතුළත් ඡායා පිටපතක් **සභාගත*** කරනවා. එතකොට බලන්න පුළුවන්. පත්තරයකින් කියවන්න බැහැ කියලා කොහේද තිබෙන්නේ? කොහේද තිබෙන්නේ පත්තරයකින් කියවන්න බැහැ කියලා. මොකක්ද තිබෙන Standing Order එක?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
රටක් බේරා ගත්ත ජාතික නායකයාට එළවා එළවා ගහන්න මෙතුමන්ලාට පුළුවන්. රටක් වෙනස් කරපු මිනිසුන්ට ගහන්න පුළුවන්. හොරකම් කරලා, වංචා කරලා, දූෂණ කරලා, අක්‍රමිකතා කරලා ජනාධිපතිතුමාටයි, ඔක්කොමලාටයි නැඟිටින්න පුළුවන් නම්, එහෙම කොහොමද? තමුන්නාන්සේට තිබෙන අයිතියමයි මටත් තිබෙන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට. [බාධා කිරීමක්]

එකල්හි වේලාව අ.භ. 4.00 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව රීට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2018 පෙබරවාරි මස 19වන සඳුදා පූ.භ. 10.00වන තෙක් කල් ගියේ ය.

අප්පොழුතු පි.ප. 4.00 මණියාකිවිடவே, මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ් විනා විடுக්කාමலேயே පාරාளුමන්ත්‍රත්තෛ ඔත්තිවෛත්තාර්.

අතන්පඩි පාරාளුමන්ත්‍රම්, අතනුඩ ඉන්ත්‍රෛය තීර්මානත්තිර් කිණංක 2018 පෙப්රුවරි 19, තිංකට්කිழමෛ මු.ප. 10.00 මණි වරෛ ඔත්තිවෛක්කප්පට්ටතු

It being 4.00 p.m., THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*


Parliament adjourned accordingly until 10.00 a.m. on Monday, 19th February, 2018 pursuant to the Resolution of Parliament of this Day.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

258 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 258 - இல. 5
Volume 258- No. 5

2018 පෙබරවාරි 19 වන සඳුදා
2018 பெப்ருவரி 19, திங்கட்கிழமை
Monday, 19th February, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන

කථානායකතුමාගේ සහතිකය

ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පත

විගණකාධිපතිවරයාගේ වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදි

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදි

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව:
විවාදය කල් තබන ලදි

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය:
විවාදය කල් තබන ලදි

කල් තැබීමේ යෝජනාව:
ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇති දේශපාලන අර්බුදය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

சபாநாயகரது சான்றுரை

உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

கொழும்பு பங்குத்தொகுதிப் பரிவர்த்தனையை பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை:
விவாதம் ஒத்திவைக்கப்பட்டது

பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை:
விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
இலங்கையில் எழுந்துள்ள அரசியல் நெருக்கடி

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Revised Draft Standing Orders and Code of Conduct for Members of Parliament

AUDITOR-GENERAL'S REPORT

PERFORMANCE REPORT OF FINANCE COMMISSION

PERFORMANCE REPORT OF AUDIT SERVICE COMMISSION

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ACTIVE LIABILITY MANAGEMENT BILL:
Read the First time

DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL:
Read the First time

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS:
Debate Adjourned

CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT:
Debate Adjourned

ADJOURNMENT MOTION:
Political Crisis Arisen in Sri Lanka

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 පෙබරවාරි 19 වන සඳුදා
2018 பெப்ருவரி 19, திங்கட்கிழமை
Monday, 19th February, 2018

පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I
කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 පෙබරවාරි මස 08වැනි දින මා විසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන)

II
ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පත
உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்
REVISED DRAFT STANDING ORDERS AND CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අපගේ ව්‍යවස්ථාදායකයේ දැනට අප විසින් භාවිත කරනු ලබන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 1993 අවසන් වරට සංශෝධනය වීමෙන් පුරා වසර 25කට පසුව, අද තත්ත්වයට ගැළපෙන පරිදි වසර 2ක පමණ කාලයක් අවශ්‍ය සංශෝධන සිදු කරමින්, සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් ද විමසා එකඟත්වයෙන්, පාර්ලිමේන්තුවේ ප්‍රතිශෝධිත ස්ථාවර නියෝගත්, ඒ සමඟම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයත් අද දිනම සම්මත කර ගැනීමට ඔබ සියලු දෙනාගේම කාරුණික සහයෝගය අපේක්ෂා කරන බව මෙම ගරු සභාවට දැන්වීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XI කොටස සහ අටවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF FINANCE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017.10.01 දින සිට 2017.12.31 දින දක්වා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT OF AUDIT SERVICE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2017.07.01 දින සිට 2017.09.30 දින දක්වා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ පානීය නොවන ස්ප්‍රිතු ආනයනය සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 19 දිනැති අංක 2050/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 1005 දරන සුරාබදු නිවේදනය); සහ

(iv) 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2018.01.01 සිට 2018.01.22 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන් කිරීම් පිළිබඳ සටහන.

එම වාර්තා, නිවේදනය සහ පරිපූරක වෙන් කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව යාපනය විශ්වවිද්‍යාලයේ වවිනියා මණ්ඩපයේ ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 18 දිනැති අංක 2050/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2008, 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සතොස හි වාර්ෂික වාර්තා; සහ

(ii) 2016 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Excise (Amendment) Bill;

(ii) Notes on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates;

(iii) Financial Performance of the Third Quarter of 2017;

(iv) Regulations under the Finance Act;

(v) Resolution for Revision of Remuneration of the Chairman and the Vice Chairman and the Allowances of the Members of the National Education Commission; and

(vi) Resolution for Determination of Salaries and allowances to Mr. H.M. GaminiWijesinghe, the Auditor General

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු එස්.බී. දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් හය මම පිළිගන්වමි.

(1) බණ්ඩාරගම, වීදාගම, රේරුකාන පාර, නිව්සිටි, අංක 34/ඩී දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජේ.එම්. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) බෙන්තොට, හබුරුගල, මහගොඩ, රසගවත්ත, අංක 43 ඒ දරන ස්ථානයෙහි පදිංචි ගල්ඔලුව ආරච්චිගේ සෝමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) වාද්දුව, මොල්ලිගොඩ, ගාලුපාර, අංක 768 දරන ස්ථානයෙහි පදිංචි එච්.සී.එම්. අමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) නවදගල, අටකොහොට, සපුමල් උයන යන ලිපිනයෙහි පදිංචි එම්. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) පානදුර, දිබ්බැද්ද, අංක 24 සී දරන ස්ථානයෙහි පදිංචි එම්.අයි.එස්. ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) පානදුර කළුදෑවල, මොරවින්න පාර, අංක 3 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ. ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு பாலித தெவரப்பெரும - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගෝවින්න, පහළ නාරගල යන ලිපිනයෙහි පදිංචි වාන්දනී වෙත්තසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විජිත හේරත් මහතා

(மாண்புமிகு விஜித ஹேரத்)

(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මීරිගම, පල්මඩ, අංක 55 දරන ස්ථානයෙහි පදිංචි අයි.කේ. සිසිර විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වාසුදේව නානායක්කාර මහතා

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)

(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) මොරටුව, කොරළවැල්ල, දෙවන පටුමග, අංක 49/2බී දරන ස්ථානයෙහි පදිංචි නිමල් වීරක්කොඩි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අඹකොටේ, දැදුරුනදීගම, අංක 4/10 දරන ස්ථානයෙහි පදිංචි ටී.ඒ.ජී. තංගල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු රංජිත් අලුවිහාරේ මහතා

(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)

(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) උකුවෙල, රයිතලාවල, කහටගහකුඹුර, අංක 01 දරන ස්ථානයෙහි පදිංචි මල්ලිකා ප්‍රනාන්දු මෙනවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, ලැලිඅඹේ, උඩංගමුව, අංක 101 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජී.ජී. ඉන්ද්‍රා කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කනක හේරත් මහතා

(மாண்புமிகு கனக ஹேரத்)

(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, අරණායක, කෑගල්ල, මාවනැල්ල, මානදී ප්‍රාථමික විද්‍යාලයේ ගුරු නිවාසයේ පදිංචි ජී.කේ. සුනීතා නාලනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)

(The Hon. Imran Maharoof)

Hon. Speaker, I present a petition from Mr. S.M. Moujood of Nadutheevu, Mutur 07.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)

(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු කථානායකතුමනි, අවිස්සාවේල්ල, තල්දූව, අංක 345/3 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්.එම්. ජෙමාල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.

எழுந்தார்.

rose.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත
தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்
ACTIVE LIABILITY MANAGEMENT BILL

"ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතුකර ගැනීමට බලය ලබා දීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්තු 06 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්තු 06, අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 06th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත
கொழும்பு பங்குத்தொகுதிப் பரிவர்த்தனையை பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்
DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL

"ඇපයෙන් සීමිත සමාගමක් වන කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්තු මස 06වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්ච් 06, අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 06th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්ච් 06, අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 06th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අද ශ්‍රී ලංකාවේ උද්ගතවී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසාවෙන් රට අරාජික තත්ත්වයකට පත්ව ඇති බැවින්, එය ජාතික වැදගත්කමකින් යුතු කරුණක් වශයෙන් ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කිරීම සඳහා අද දින මෙම ගරු සභාවේ විවාදයක් ලබා දෙමින් ඒ ගැන සුවිශේෂ අවධානය යොමු කරලීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ස්ථාවර නියෝග 17 යටතේ ඉල්ලා සිටිනවා. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගේ සහයෝගය තිබෙන බවත් මා සඳහන් කරනවා.

[මේ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සිය අසුන්වලින් නැඟී සිටියහ.]

[இச்சந்தர்ப்பத்தில் கூட்டு எதிரணியைச் சேர்ந்த உறுப்பினர்கள் எழுந்து நின்றனர்.]

[At this stage, the Members of the Joint Opposition rose from their seats.]

මොකද, මෙය මුළු රටෙම අවධානය යොමුවී තිබෙන ප්‍රශ්නයක්. එම නිසා අපට එම අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මේ ගැන අපට විතරක් නොවෙයි, ආණ්ඩුවටත් එම විවාදයේ දී කථා කරන්න පුළුවන්. මේ බරපතළ අර්බුදකාරී තත්ත්වය යටතේ මේ පිළිබඳව විවාදයක් ඉල්ලා ඔබතුමා වෙත නිවේදනයක් භාරදී තිබෙනවා. අද උදේ පැවති පක්ෂ නායක රැස්වීමේදීත් මම මේ ගැන සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙන ලෙසට ඉල්ලා සිටියා. මෙම යෝජනාවට පක්ෂව අපේ මන්ත්‍රී කණ්ඩායම සහයෝගය දක්වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි ගරු මන්ත්‍රීතුමා, මේ කරුණ ගැන සාකච්ඡා කරන්න අවශ්‍ය බවට ඔබතුමා අද උදේ ඉල්ලීමක් කළා. අපි ඒ ගැන සාකච්ඡා කරලා, අද දින විවාදයට නියමිතව තිබෙන මෙම කාරණයත් වැදගත් කරුණක් නිසා මෙම විවාදය කරගෙන යන්න අපි කල්පනා කළා. ඒ නිසා මට මේ අවස්ථාවේදී තීරණයක් දෙන්න අමාරුයි. අපි අද දින පස්වරු 3.00ට පැවැත්වෙන පක්ෂ නායක රැස්වීමේ දී මේ ගැන සාකච්ඡා කරමු. අද දින අවස්ථාව ලබා දීමට හැකි වන්නේ නම් අද දින අවස්ථාව ලබා දෙන්නම්. එහෙම නම් සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවා - [බාධා කිරීම්]

නැහැ. කරුණාකරලා පොඩ්ඩක් ඉන්න. වාද කරන්න අවශ්‍ය වන්නේ නැහැ, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න. මෙතැන රණ්ඩු කරන්න අවශ්‍ය නැහැ. අපි මේ ගැන උදේ සාකච්ඡා කළා. පාර්ලිමේන්තුව අත්හිටුවලා, නැවත පක්ෂ නායක රැස්වීමක් පවත්වා අපට මේ ගැන තීරණයක් ගන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 17. (2)(අ) ස්ථාවර නියෝග යටතේ එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම පටන් ගැනීමට පෙර එම යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, ඔහුගේ එකඟත්වය ලබා ගැනීම අවශ්‍ය වන බව සඳහන් වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පක්ෂ නායක රැස්වීම අවසන් වෙලා, කථානායක නිල ඇඳුම ඇඳගෙන සභාවට එන්න හදනකොටම එම ලිපිය මට භාර දුන්නා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා එකඟත්වයක් පළ කරලා නැහැ නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැනට එකඟත්වය පළ කරලා නැහැ. එහෙම නම් අපි තාවකාලිකව සභාව අත්හිටුවා, මේ ගැන සාකච්ඡා කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා එයට එකඟ වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ අවස්ථාවේ දී එකඟ වුණේ නැහැ. සාකච්ඡා කරලා අවස්ථාව දෙන්නම් කියලා මම කිව්වා. ඕනෑ නම් නැවත පක්ෂ නායක රැස්වීමක් කැඳවා අපට තීරණය කරන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද දින පැවැති පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සඳහනක් කළේ නැහැ, මෙවැනි ඉල්ලීමක් ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වෙලාවේ ලිඛිතව ලැබිලා තිබුණේ නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා නම් අපි ඒ ගැන සාකච්ඡා කරනවා. පක්ෂ නායක රැස්වීමේදී එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ ගැන ඉල්ලීමක් කළා. අපට අවශ්‍ය නම් නැවත පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න පුළුවන්. අපි පක්ෂ නායක රැස්වීමක් පවත්වා ඒ ගැන තීරණය කරමු. [බාධා කිරීම්] එහෙම නම් පාර්ලිමේන්තු රැස්වීම තාවකාලිකව අත්හිටුවා, පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගනිමු. [බාධා කිරීම්] හැබැයි, හොඳම ක්‍රමය තමයි මේ විවාදය අවසාන කරලා, ඊළඟට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. [බාධා කිරීම්] ඔබතුමන්ලාට එහෙම කරන්න බැරි නම් මෙතැන වාදයක් ඕනෑ නැහැ, අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවා ඒ ගැන සාකච්ඡා කරමු. [බාධා කිරීම්] හොඳයි, පක්ෂ නායක රැස්වීම සඳහා සභාවේ කටයුතු අපි විනාඩි 15කට අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, පූ.භා. 10.45ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, மு.ப. 10.45 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 10.45 a.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ පරිදි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 17 යටතේ ජාතික වැදගත්කමකින් යුතුව අසන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් අද දින පැය තුනක සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් ලබා දීමට එකඟ වූ බව දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, අද දින පාර්ලිමේන්තුවේ කටයුතු පස් වරු 7.00 දක්වා දීර්ඝ කිරීමටද, අදාළ යෝජනාව පිළිබඳ විවාදය අපර භාග 4.00ට ආරම්භ කිරීමටද පක්ෂ නායකයන් එකඟත්වය පළ කරන ලදී.

ගරු සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. විෂය අංක 1, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සලකා බැලීම. විෂය අංක 2, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය අවසාන කෙටුම්පත අනුමත කිරීම.

කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා.

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

[පූ.භා. 10.46]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07වැනි අභහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුවට අද විශේෂ දවසක්. මෙම පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම්ව සකස් වී ඇති පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මත රඳා පවතිනවා. ඒ වාගේම වර්තමාන යහ පාලන රජය බලයට පත් වීමේදී පොරොන්දුවක් වුණා, පාර්ලිමේන්තුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය වන ඉදිරි පියවරක් ලෙස ආචාර්ය ධර්ම සංග්‍රහයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හඳුන්වා දෙනවා කියලා. ඒ අනුව පාර්ලිමේන්තුවේ සංශෝධිත ස්ථාවර නියෝග හඳුන්වා දීම, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහය අනුමත කරවා ගැනීම කියන කාරණා අද දින විවාදයට නියමිතව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම ක්‍රියාවලිය පිළිබඳ ඉතිහාසය විශේෂයෙන්ම සඳහන් කිරීම අවශ්‍යයි. 1992න් පසු ස්ථාවර නියෝග සංශෝධනය වී තිබුණේ නැහැ. ඒ නිසාම ඇතැම් විට පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යෑමේදී ප්‍රශ්න ගණනාවක් මතු වුණා. ඒ අනුව 2015 දෙසැම්බර් මස 16වැනි දින ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වූ ක්‍රියාවලිය මෙම පාර්ලිමේන්තුව විසින් ආරම්භ කළා. එහිදී ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුතුව, ගරු නිලංග සුමතිපාල මැතිතුමා, ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මැතිතුමා, ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා, අජිත් පී. පෙරේරා, ගරු විජිත හේරත් මැතිතුමා, ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමා, ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා සහ ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මැතිතුමාගෙන් යුතු කාරක සභාවක් පත් කළා. ඉන් අනතුරුව මෙම කාරණයට අදාළව විශේෂ කරුණු සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සිව්දෙනෙකුත් මෙම කමිටුවට පත් කළා. ඒ අනුව ගරු රවුෆ් හකීම් මැතිතුමා, ගරු ආර්. සම්පන්දන් මැතිතුමා, ගරු වමල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමාද මෙම කමිටුවට සම්බන්ධ වුණා. මෙම කමිටුවට සම්බන්ධ වුණු එම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත අපේ කෘතඥතාව පළ කළ යුතුයි. මොකද, ඉතාම සංකීර්ණ සංශෝධන ගණනාවකින් සමන්විත වුණු, වසර තුනක පමණ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වුණු මෙම ක්‍රියාවලිය සඳහා එතුමන්ලා විසින් විශාල කාලයක් කැප කරමින් තමන්ගේ දැනුම සහ අවබෝධය අනුව දායක වුණා. ඒ වාගේම මෙම කමිටුවෙන් පරිබාහිරව වෙනත් ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ පක්ෂවල නායකයන් මාර්ගයෙන් මෙම කමිටුවට අදහස් ඉදිරිපත් කළා. මෙම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වීම පිළිබඳව එම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත අපේ ස්තුතිය පළ කළ යුතුයි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යාවත්කාලීන කිරීම පිළිබඳ අවශ්‍යතාව දිගින් දිගටම ඇති වුණා. දිගින් දිගටම ඇති වුණු ඒ අවශ්‍යතාව පිළිබඳ ක්‍රියාදාමයේදී විවිධ අදහස් ඉදිරිපත් වුණා; ඒ වාගේම විවිධ මත ගැටුම් ඇති වුණා. හැබැයි, අවසානයේදී අපට මෙම කාරණා පිළිබඳව එකඟතාවලට පැමිණීමට හැකියාව ලැබුණා. එම නිසා රටේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කටයුතු ගෙන යාම සඳහා අවශ්‍ය කරන මෙම ක්‍රියාදාමය නිසි ලෙස පවත්වාගෙන යාමට ඉහල්වන පරිදි පුළුල් වූ, ඉතා වැදගත් වූ, ඒ වාගේම නවීන කාලයට අනුකූල වූ, මේ සංශෝධන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධන සියල්ලම සහිත අදාළ කෙටුම්පත සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම ලබා දී තිබෙනවා. එම කෙටුම්පතේ රතු පාටින් තිබෙන්නේ, අප විසින් යෝජනා කරනු ලබන නව සංශෝධන. ඒ අනුව ඒ පිළිබඳව කරුණු දැක්වීමට ගරු මන්ත්‍රීතුමන්ලාට හැකියාව තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම සෑම සංශෝධනයක් පිළිබඳවම කරුණු දැක්වීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් රජය වෙනුවෙන්, මෙම වාර්තාවේ ඇති ඇතැම් වැදගත් කරුණු පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට මා බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 7 යටතේ සඳහන්ව තිබෙනවා, ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීම පිළිබඳ කාරණය. මෙය වැදගත් වන්නේ, අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පත් කර ගැනීම පිළිබඳවයි. මේ පිළිබඳව මීට කලින් අපට අත් දැකීමක් තිබෙනවා. මෙම පාර්ලිමේන්තුව මීට කලින් අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පත් කර ගෙන තිබෙනවා. නමුත් ඒ පිළිබඳව විශේෂිතව ස්ථාවර නියෝගවල සඳහන්ව නොතිබීම නිසා අප අංක 7 යටතේ එය ඇතුළත් කළා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40. (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීමේදී රහස් ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ අනුගමනය කළ යුතු බව සඳහන් කර තිබෙනවා. මම හිතන විධියට කවුරුවත් එයට විරුද්ධ වන එකක් නැහැ.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන වෙලාව පිළිබඳව සඳහන් වෙලා තිබුණේ, කලින් තිබුණු තත්ත්වය අනුවයි. නමුත් අපි දැන් දීර්ඝ කාලයක් තිස්සේ ඒ වෙලාව වෙනස් කරලා පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වුවා. ඒ අනුව අලුත් තත්ත්වයට ගැළපෙන පරිදි අදාළ ස්ථාවර නියෝගය වෙනස් කිරීමට අපි කටයුතු කළා. ඒ අනුවයි 7 වන ස්ථාවර නියෝගය සංශෝධනය වන්නේ.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නායකත්වය ඇතුව අපි මේ පාර්ලිමේන්තුව ඉදිරි පියවරකට ගෙන ගියා. ඒ තමයි, පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු රූපවාහිනියෙන් සජීවීව පෙන්වීමට

අපි කටයුතු කිරීම. ඒ වාගේම ගුවන් විදුලිය සහ වෙනත් විද්‍යුත් මාධ්‍ය මඟින් මෙම පාර්ලිමේන්තු රැස්වීම් විකාශය කිරීමට අපි දැන් කටයුතු කරලා තිබෙනවා. නමුත් ඒ සඳහා වූ අවකාශය හෝ අවසරය ස්ථාවර නියෝගවල සඳහන් කර තිබුණේ නැහැ. ඒ නිසා ඊට අදාළව අපි 14වන ස්ථාවර නියෝගය විධියට අලුත් ස්ථාවර නියෝගයක් හඳුන්වා දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය ඉතා වැදගත් දෙයක්. පාර්ලිමේන්තු රැස්වීම්වලදී සිදු වන කටයුතු සංස්කරණය කරලා තමයි රූපවාහිනියේ, ගුවන් විදුලියේ ප්‍රවෘත්තිවල විකාශය වන්නේ. ඒ වාගේම පුවත් පත් ආයතන තමන්ගේ මතය සහ අදහස අනුව, තමන් දෙන ප්‍රමුඛත්වය අනුව, පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු අතරින් තෝරා ගත් කටයුතු තමයි වාර්තා කරන්නේ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට ප්‍රධාන මාධ්‍යවල ඉඩකඩක් ලැබුණේ නැහැ. ඒ වාගේම දවස අවසානයේදී පාර්ලිමේන්තුවේ කථා කරන මන්ත්‍රීවරුන්ට ප්‍රධාන මාධ්‍යවල ඉඩකඩක් ලැබුණේ නැහැ. හැබැයි ඒ තත්ත්වය වෙනස් කරලා, ඔබතුමා මේ පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු අඛණ්ඩව, ඉහළ ප්‍රමිතියකින් යුක්තව, බාධා කිරීම්වලින් තොරව මේ රටේ පුරවැසියන්ට දැන ගැනීමට අවකාශය සලසා දීම නිසා පාර්ලිමේන්තු රැස්වීම්වල සිදු වන කාරණා පිළිබඳව දැන් සවිස්තරව දැන ගැනීමට අවකාශයක් ගොඩ නැඟී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මේ සඳහා දායක වුණු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාට විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීලා, ඒ සඳහා අවකාශය සලසා දීම ගැන. ඒ සඳහා නීතිමය අවසරය ලබා දීමයි 14වන ස්ථාවර නියෝගය සංශෝධනය හරහා සිදු කෙරෙන්නේ. මෙය ඉතාම ප්‍රගතිශීලී සංශෝධනයක්; ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමක්. මෙය රටේ අනාගතය වෙනුවෙන් නිවැරදි තීරණ ගැනීමට දැනුවත් පුරවැසියන් පිරිසක් බිහිවීමට හේතුවක් වෙනවා.

ඊළඟට, මම විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 20 පිළිබඳව. සභාව කල් තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න පිළිබඳව ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබුණේ නැහැ. අපි ඒ පිළිබඳව අලුත් ප්‍රතිපාදන ඇතුළත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ශෝක ප්‍රකාශ යෝජනාවල අනුපිළිවෙළ කුමක්ද යන්න පිළිබඳව සඳහන් වෙලා තිබුණේ නැහැ. අපි ඒ පිළිබඳවත් ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමාගේ කාලයේදී ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඉක්මනින් කටයුතු කිරීමට ඉඩකඩ සලසා තිබුණා. අපි ඒ පිළිබඳව අගය කරනවා.

ගරු කථානායකතුමනි, අපි මේ පාර්ලිමේන්තුවට නව සම්ප්‍රදායයක් හඳුන්වා දුන්නා. ඒ තමයි, අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව. අපි ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවක් ඇති කර ගත්තා, විධායක ජනාධිපති ධුරය අහෝසි කරමින්, පාර්ලිමේන්තුවට වග කියන පාලන ක්‍රමයක් ඇති කිරීමට. අපට එක වරම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගන්න නොහැකි වුණත්, විධායක ජනාධිපති ක්‍රමය සතු ඇතැම් බලතල ඉවත් කිරීමටත්, ඒ වාගේම ඇතැම් සංවරණයන් සහ තුලනයන් ඇතුළත් කර ගැනීමටත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා හැකියාව ලැබුණා. ගරු කථානායකතුමනි, ඒ වාගේම පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට අපට අවස්ථාව ලැබුණා. පාර්ලිමේන්තුවට වටිනාකමක් ලැබුණා. පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට වටිනාකමක් ලැබුණා. ඒ හරහා සමාජය තුළ පාර්ලිමේන්තුවේ වටිනාකම ඉහළ ගියා. ඒ තුළ අග්‍රාමාත්‍ය ධුරය, වග කිව යුතු, වග විය යුතු, ඒ වාගේම නීතිපතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පිළිතුරු දිය යුතු ධුරයක් බවට පත් වුණා.

ඒ අනුව අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න පිළිබඳව අලුත්ම ප්‍රතිපාදන අපි ඇතුළත් කළා, ගරු කථානායකතුමනි. ඒ අනුව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 38 ප්‍රකාරව සෑම මාසයකම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන් කර ඇති කාලයෙන් මිනිත්තු 30ක කාලයක් අපි අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් වෙන් කරනවා. ඒ හරහා කෙළින්ම අග්‍රාමාත්‍යවරයාගෙන්ම පිළිතුරු ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා. මෙහි වැදගත්කම වන්නේ අග්‍රාමාත්‍යවරයාව සෘජුව ප්‍රශ්න කිරීමටත්, ඒ වාගේම අග්‍රාමාත්‍යවරයාට මේ ප්‍රශ්නවලින් මඟ හැර සිටීමට ඇති අවකාශය ඉවත් කිරීමටත් අපි කටයුතු කර තිබීමයි. ඒ අනුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ඇති ඒ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදාය අපේ පාර්ලිමේන්තුවට අපි අනුයුක්ත කර ගෙන තිබෙනවා. ඒ හරහා අග්‍රාමාත්‍ය ධුරය දරන්නාගේ වටිනාකම ශක්තිමත් කර තිබෙනවා; අග්‍රාමාත්‍ය ධුරයට වටිනාකමක් ලබා දී තිබෙනවා; ඒ වාගේම මේ පාර්ලිමේන්තුවත් ඒ තුළින් ශක්තිමත් කර තිබෙනවා; පුරවැසියාත් එයින් ශක්තිමත් වනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 38 ඉතා විප්ලවීය ස්ථාවර නියෝගයක්. එම සම්ප්‍රදාය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආරම්භ කළා. අනාගතයේ කවුරුන් මේ ධුරයට පත් වුණත්, මේ සම්ප්‍රදාය ආරක්ෂා කර ඉදිරියට ගෙන යෑමට එම පුද්ගලයාට බල කෙරෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව ඉතා වැදගත් සම්ප්‍රදායක් ඇති කිරීමේ ගෞරවය ගරු අග්‍රාමාත්‍යතුමාට හිමිවන අතර, එය නීතියට එකතු කරලා ආපසු හැරවිය නොහැකි තත්ත්වයකට පත් කිරීම පිළිබඳව ඔබතුමාටත්, මහන්සි වෙලා මේ යෝජනා සකස් කරපු සියලු දෙනාටත් අපි ස්තුතිය පිරිනමන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඡන්දය දීමේ ක්‍රමවේදය පිළිබඳව අපි අලුත් නීති සකස් කළ යුතුව තිබුණා. පාර්ලිමේන්තුවේ ඉලෙක්ට්‍රොනිකව ඡන්දය දීමේ ක්‍රමය බොහෝ කාලයකට කලින් හඳුන්වා දුන්නත්, එය ක්‍රියාත්මක වුණේ නැහැ. එක් වරක් ක්‍රියාත්මක කොට අසාර්ථක වූ තැන එම ක්‍රමය අත්හැර දැමීමා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ධුර කාලය තුළ ප්‍රායෝගිකව ඉලෙක්ට්‍රොනිකව ඡන්දය පාවිච්චි කිරීමේ හැකියාව අපට දැන් ලැබී තිබීම පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අප එය විශ්වාසවන්තව වැදගත් ඡන්ද විමසීම්වලදී භාවිත කර තිබෙනවා. ඒ වාගේම විනිවිදභාවයෙන් යුතුව ඡන්දය පාවිච්චි කිරීමටත්, ඡන්දය පාවිච්චි කිරීමේදී ඇති වන්නා වූ අවිනිශ්චිතතා ඉවත් කිරීමටත්, ඒ වාගේම මොන බාධා සිදු වුණත් ප්‍රායෝගිකව ඡන්දය ලබා ගැනීමේ හැකියාව ඇති කිරීමත් ඒකෙන් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව එක පැත්තකින් ඉලෙක්ට්‍රොනිකව පාර්ලිමේන්තුව තුළ ඡන්දය භාවිත කිරීමට අවකාශය සලසා දෙන අතර, ඒ සඳහා වූ නීතිමය ප්‍රතිපාදන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 47 මඟින් ඇති කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධිත ස්ථාවර නියෝග තුළ තවත් බොහෝ කාරණා ඇතුළත් කර තිබෙනවා. නමුත්, ඉතාම වැදගත් දේ තමයි, ආංශික අධීක්ෂණ කාරක සභා හා සම්බන්ධ ස්ථාවර නියෝගය. මේ ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව බොහෝ අය අතර වැරදි අවබෝධයක් තිබෙනවා. මම නියෝජ්‍ය ඇමතිවරයෙකු හැටියට ආංශික අධීක්ෂණ කාරක සභා කීපයක සාමාජිකයෙකු හැටියට කටයුතු කරනවා. මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් වටිනාකමක් තිබුණේ නැහැ.

විශේෂයෙන්ම විධායක ජනාධිපති ක්‍රමයක් තුළ පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමති ධුර නොදරන මන්ත්‍රීවරුන්ට හඬක් තිබුණේ නැහැ. ඔවුන්ට ප්‍රතිපත්තිමය කරුණුවලට මැදිහත් වන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඉතාම වැදගත් කරුණ තමයි, ආංශික අධීක්ෂණ කාරක සභා හරහා පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට වටිනාකමක් ලබා දීලා, ප්‍රතිපත්ති සම්පාදනය තුළ ඔවුන්ට ශක්තියක් ලබා දීලා තිබීම. එම නිසා ඇතැම් ආංශික අධීක්ෂණ කාරක සභා ඉතා ඉහළින් කටයුතු කරලා තිබෙනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නමුත්, සමහර ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව අපට විවේචන තිබෙනවා. හැබැයි, ඒ කාරක සභාවේ නායකත්වය නිසි ලෙස ලැබෙනවා නම්, සාමාජිකයින්ගේ ශක්තිය ලැබෙනවා නම්, ඒ හරහා ඒ අවශ්‍ය කටයුතු කිරීමේ හැකියාව ලැබෙනවා. ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රියාත්මක කිරීම තුළ විෂය භාර අමාත්‍යවරයා සහ ආංශික අධීක්ෂණ කාරක සභාව අතර ගැටීමක් ඇති නොවන ආකාරයට අපි යම් සංස්කෘතියක් ඇති කර ගත යුතු වනවා. කාලය ගත වීමත් සමඟ ඒ අවබෝධය ගොඩ නැඟෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම සංශෝධිත ස්ථාවර නියෝග මඟින් සකස් කර තිබෙනවා. එය ඉතාම වැදගත් තීරණයක්.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ උපදේශක කාරක සභා ඉවත් කිරීම පිළිබඳව ලොකු විවේචනයක් තිබුණා. ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ගෙන් වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් නිරතුරුව විවේචන ආවා. මේ කාරණය සම්බන්ධව අපි අද දින එකඟතාවක් ඇති කර ගත්තා. ඒ සංශෝධනයේ පිටපත් ඔබතුමන්ලාට ලැබේවි. ඒ අනුව ආංශික අධීක්ෂණ කාරක සභාවලට අමතරව අපි අද එකඟතාවක් ඇති කර ගෙන තිබෙනවා, උපදේශක කාරක සභා නැවත හඳුන්වා දෙන්න. ඒ අනුව එය ක්‍රියාත්මක වනවා. ඒ පිළිබඳව වූ සංශෝධනය අද ඉදිරිපත් කරනවා. ඒ පිළිබඳවත් මා කියන්නට අවශ්‍යයි. ඒ පිළිබඳව වෙනස් අදහස් පළ කර ඒ වෙනුවෙන් පෙනී සිටි ගරු ඇමතිවරුන්ට, ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වනවා. අපි ඔවුන්ගේ අදහස් පිළිගන්නවා. ඒ අනුව උපදේශක කාරක සභා නැවත හඳුන්වා දීමට අපි කටයුතු කරනවා. ඒ පිළිබඳ සංශෝධනය අද දින ඔබතුමන්ලාට ලැබෙයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම වැදගත් කාරණාවක් තමයි ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයකු ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳ කාරණය. මේ පිළිබඳව සඳහන් කරලා තිබෙන්නේ යෝජිත 84වන ස්ථාවර නියෝගයේ.

ගරු කථානායකතුමනි, උපරිමාධිකරණ විනිශ්චයකාරවරු, ඒ කියන්නේ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු, අග්‍රවිනිශ්චයකාරතුමා, අභියාචනාධිකරණයේ සභාපතිතුමා ඇතුළු ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව කලින් තිබුණු ප්‍රතිපාදන ඉතා බරපතළ විවේචනයට ලක් වෙලා තිබුණා. මේක අලුත් තත්ත්වයක් නොවෙයි. පසුගිය අවුරුදු තිහක් තිස්සේම මේ විවේචන තිබුණා. එක්සත් ජාතික පක්ෂ රජයන් තිබෙන විටත්, සන්ධාන රජයන් තිබෙන විටත් මේ තත්ත්වය ඇති වුණා. ඒ වාගේම, මෙහිදී ලොකුම විවේචනය ඇති වුණේ අධිකරණයට ඇඟිලි ගැසීම සඳහා පාර්ලිමේන්තුව මෙම ක්‍රියාවලිය භාවිත කරනවා කියන කාරණය සම්බන්ධයි. ඒ විවේචනවල සත්‍ය අසත්‍යතාව කෙසේ වෙතත්, මෙතැන ගැටලුවක් තිබුණා, ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයෙකු ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය තුළ ඔහු වරදක් කළාද කියන කාරණය විමර්ශනය කිරීමට බලය ඇත්තේ කාටද කියන කරුණ ගැන. ශිරාණි බණ්ඩාරනායක නිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව තිබුණු නඩුවලදී, ඒ පිළිබඳව සිවිල් සමාජය තුළ ඇති වුණු කථිකවලදී වාගේම, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට ලැබූ අත් දැකීම් තුළදී අප දුටුවා, යම් විනිශ්චයකාරවරයෙකු යම් වරදක් කර තිබේද යන කාරණය විනිශ්චය කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ යම් ආකාරයක ස්වාධීන මණ්ඩලයක් විසින් නඩු විභාගයක ආකාරයෙන් කටයුතු කළ යුතු බව.

මේ කරුණ අප තේරුම් ගත යුතුයි. ජනාධිපතිවරයාට එරෙහි දෝෂාභියෝගයක් විමර්ශනය කිරීමේදී එහි බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ජනාධිපතිවරයා ඉවත් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයෙක් ඉවත් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ගරු කථානායකතුමනි, කිසිම ලෙසකින් මේ ඉවත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන බලය අයින් කරලා නැහැ. නමුත් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ දෝෂාභියෝග ක්‍රියාදාමයේදී ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38වන ව්‍යවස්ථාව ප්‍රකාරව වැරදි කර තිබේද යන්න පිළිබඳව, අපරාධ වරදක් කරලා තිබෙනවාද, රාජද්‍රෝහී වීමේ වරද කරලා තිබෙනවාද, චේතනාන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවාද යනාදී වශයෙන් නිශ්චිතව සඳහන් කර ඇති ඒ වරදක් කර තිබේද යන්න හෝ එහෙම නැත්නම් ජනාධිපතිවරයාගේ මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ධුරයේ කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් නොහැකි බවට පත් වෙලා තිබෙනවාද යන්න පරීක්ෂා කරන්නේ පාර්ලිමේන්තුව විසින් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පස් දෙනෙකුගෙන් යුක්ත මණ්ඩලයක් විසින්. ඒක තමයි සුදුසුම ක්‍රමය. සීමිත කාලයකදී ඒ පරීක්ෂණය අවසන් වෙන්නට ඕනෑ. ඒ පරීක්ෂණය අවසානයේදී ඔවුන්ගේ නිගමනය කියන්නට ඕනෑ; ඒ නිගමනයට හේතු දක්වන්නට ඕනෑ; නිගමනය සහ නිගමනයට හේතු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ හරහා පාර්ලිමේන්තුවට පුළුවන්කම තිබෙනවා ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ කටයුතු කරගෙන යන්නට. ඒක තමයි හරි ක්‍රමය; නිවැරදි ක්‍රමය. එවිට යම් ආකාරයක විධිමත් විනිශ්චයක් කිරීමට අවකාශය ලැබෙනවා.

විශේෂයෙන්ම ශිරාණි බණ්ඩාරනායක මැතිනිය හා සම්බන්ධ කාරණයේදී විශේෂයෙන් මේ ප්‍රශ්නය මතු වුණා. මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවේ ආපු හඬ තමයි, පාර්ලිමේන්තුවට මේ බලය තිබිය යුතුයි, මේ බලය පාර්ලිමේන්තුවෙන් ඉවත් විය යුතු නැහැයි කියන එක. නමුත්, යම් වරදක් සිදු කර තිබේද යන කාරණය සාක්ෂි මත තමයි තීරණය වෙන්නේ. අදාළ විනිශ්චයකාරවරයා වරදක් කර තිබේද කියන කාරණය හෝ එම විනිශ්චයකාරවරයා ධුරය දැරීමට නොහැකි තරම් බරපතළ රෝගී තත්ත්වයට පත් වී තිබේද යන කාරණා විනිශ්චය කිරීමට හැක්කේ, අදාළ වෛද්‍ය වාර්තා, අදාළ සාක්ෂිකරුවන්, අදාළ ලේඛන සහ අදාළ නීතිය පිළිබඳව විධිමත් ලෙස විමර්ශනය කිරීමෙන් පසුවයි. මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට ඉමහත් ගෞරවය සහිතවයි මම කියන්නේ, ඇතැම් කාරණා පිළිබඳව විනිශ්චය කිරීමට -යම් කෙනෙක් වරදකරුද කියන කාරණය විනිශ්චය කිරීමට- අප තුළ ඇති පක්ෂකම් සහ බලය පිළිබඳව අප තුළ ඇති ආකල්ප නිසා අප සුදුසු නැති බව. ඒ නිසා වඩාත් සුදුසු වන්නේ ස්වාධීන මණ්ඩලයක් විසින් ඒ පරීක්ෂණ කිරීමයි.

ජනාධිපතිවරයා සම්බන්ධ දෝෂාභියෝගයකදී පරීක්ෂා කිරීමේ බලය අපි දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයට දීලා තිබෙනවා. එහෙම නම්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙක් හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක් ඉවත් කිරීමේ ක්‍රියාවලියේදී ඒ බලය ස්වාධීන මණ්ඩලයකට ලබා දීම තර්කානුකූලයි.

ගරු කථානායකතුමනි, අපි අනුගමනය කරන්නේ පොදු රාජ්‍ය මණ්ඩලයේ සම්ප්‍රදායයි. පාර්ලිමේන්තු ක්‍රමය අපට ලැබිලා තිබෙන්නේ බ්‍රිතාන්‍ය අත් දැකීම් හරහායි. පොදු රාජ්‍ය මණ්ඩලයේ ලැටිමර් මූලධර්ම - Latimer Principles - අනුව සඳහන් කරලා තිබෙනවා මෙවැනි අවස්ථාවකදී ස්වාධීන මණ්ඩලයක් විසින් මේ පරීක්ෂණ කළ යුතුයි කියන කාරණය. ගරු කථානායකතුමනි, ඒ අනුව, ඉතාම දීර්ඝව, දින ගණනාවක වාද විවාදවලින් පසුව, මේ පිළිබඳව විශේෂඥයන්ගේ අදහස් සලකා බැලීමෙන් පසුවයි අපි මේ 84වන ස්ථාවර නියෝගය එකතු කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් වෙන්නේ මේ ආකාරයටයි:

"84. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, විෂම පැවැත්ම හෝ අබලතාව -විෂම පැවැත්ම කියන්නේ, යම් වරදක් කර තිබෙනවාද කියන එක. අබලතාව කියන්නේ රෝගී තත්ත්වයක්- යන හේතු මත අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරයකු, අභියාචනාධිකරණයේ සභාපතිවරයා, සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු එම ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා අමතා යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම සඳහා දැනුම් දීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයාට භාර දී ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

(2)(අ) ඉහත (1) වැනි ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබ තිබෙන අවස්ථාවක දී, කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා විමසා-

මෙහි වැදගත් කාරණයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත්, දෙපැත්තෙන්ම මේ පිළිබඳව විමසනවා. කථානායකතුමා හිතුවක්කාර විධියට මේ කටයුතු කරන්නේ නැහැ.

-එම යෝජනා සම්මතයේ දක්වා ඇති විනිශ්චයකාරවරයාගේ විෂම පැවැත්ම හෝ අබලතාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරයන් තිදෙනෙකුගෙන් සමන්විත විමර්ශන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුත්තේ ය."

රටේ ඉහළම මට්ටම ඒකයි.

අපි විවිධාකාර කොමිෂන් සභා පත් කරනවා. අපට පත් කරන්න පුළුවන් ඉහළම මට්ටම වන ශ්‍රේෂ්ඨාධිකරණ මට්ටමෙන් ඒවා පත් කරනවා. එතැනදීත් හිතුවක්කාර ලෙස ඒවා පත් කරන්න බැහැ. විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත්, දෙපැත්තේම මත -විපක්ෂ නායකතුමාගේත්, අගමැතිතුමාගේත් මත- විමසා තමයි ගරු කථානායකතුමා විසින් ඒ සභාවලට නම් කිරීම කරන්නේ. ඒ නිසා සාධාරණ සහ ස්වාධීන පත් කිරීමක් සිදුවෙයි කියලා අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා විසින් එම මණ්ඩලයේ එක් සාමාජිකයකු සභාපති වශයෙන් පත් කරනවා. ඊට පස්සේ අපි මේ කටයුතු අනවශ්‍ය ලෙස ඇදගෙන යෑම වැළැක්විය යුතුයි. අපි දන්නවා, මීට කලින් එක් අවස්ථාවක හිටපු අග්‍ර විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා වූ ක්‍රියාවලිය දීර්ඝ ලෙස ඇදගෙන යෑමක් සිද්ධ වුණා. එසේ නොවීම සඳහාත් මෙහි කියනවා;

"(3) එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින් මාස දෙකක කාල සීමාවක් ඇතුළත දී විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු" යි. යනුවෙන්.

ඒකත් වැදගත් දෙයක් ගරු මන්ත්‍රීවරුනි. මාස දෙකක් ඇතුළත මේ පරීක්ෂණය අවසන් කරන්න ඕනෑ. එම නිසා අනවශ්‍ය ලෙස ඇදගෙන යෑමක් කරලා, ඒ හරහා රට තුළ හෝ නීති ක්ෂේත්‍රය තුළට බලපෑමක් ඇති කරන්නට හැකියාවක් ඇතිවෙන්නේ නැහැ. "මාස දෙකක නිශ්චිත කාල සීමාවක්" කියලා මෙහි සඳහන්ව තිබෙනවා.

ඒ සඳහා අවශ්‍ය කාර්ය පටිපාටිය සහ නීතිපති ප්‍රතිපාදන පිළිබඳවත් සඳහන් කරලා තිබෙනවා:

"කෙසේ වුවද, කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලයේ ඉල්ලීම මත එම කාල සීමාව එක් වරකට මාසයක් නොඉක්මවන්නා වූ වැඩිදුර කාල සීමාවකට දීර්ඝ කරනු ලැබිය හැකි ය."

ඒ කියන්නේ, තව මාසයක් කල් ගන්න අවශ්‍ය විශේෂ තත්ත්වයක් තිබෙනවා නම්, එම කාලය දීර්ඝ කිරීමත් කථානායකතුමාගේ අවසර ඇතිවයි කළ යුතු වෙන්නේ.

ඒ වාගේම,

"විමර්ශනයේ වැඩකටයුතු අවසන් කරනු ලැබීමෙන් අනතුරුව, එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින්, එකී මණ්ඩලය ඉදිරියේ සටහන් කර ගන්නා ලද සාක්ෂි සම්බන්ධ කාර්යසටහන් ද සමඟ එහි තීරණය කථානායකවරයාට වාර්තා කරනු ලැබිය යුතු අතර, එම විමර්ශන මණ්ඩලය විසින් අදාළ චෝදනා ලත් විනිශ්චයකාරවරයා විෂම පැවැත්ම හෝ අබලතාවට වරදකරු බව තීරණය කරනු ලැබ තිබේ නම් පමණක් කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලය විසින් වාර්තා කරන ලද කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. අදාළ විනිශ්චයකාරවරයා වරදකරු නොවන බව විමර්ශන මණ්ඩලය විසින් සොයාගනු ලැබ ඇත්නම්, කථානායකවරයා විසින් ඒ බව පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුතු අතර, එම යෝජනා සම්මතය සම්බන්ධ සියලු වැඩකටයුතු අවසන් කරනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, දැනටමත් අපි පිළිගෙන තිබෙන, ජනාධිපතිවරයකු දෝෂාභියෝග ක්‍රියාදාමයකින් ඉවත් කිරීමේ ක්‍රියාදාමයමයි මේ. ජනාධිපතිවරයා සම්බන්ධයෙන් කටයුතු කරන කොට, ධුර දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු 5දෙනෙක් සම්බන්ධ වෙනවා. උපරිමාධිකරණ විනිශ්චයකාරවරයෙක් සම්බන්ධයෙන් වුණාම, විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනෙක් සම්බන්ධ වෙනවා. ඒ හැර ඉතුරු ක්‍රියාදාමයම එක හා සමානයි; අපි දැනටමත් පිළිඅරගෙන තිබෙන ක්‍රියාදාමයමයි. එනම්;

"(5) විමර්ශන මණ්ඩලය විසින් අදාළ විනිශ්චයකාරවරයාට එරෙහිව ඇති විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බවට තීරණය කරනු ලැබ තිබේ නම්, කථානායකවරයා විසින් එය පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එම යෝජනාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන්ගේ බහුතරයකින් සම්මත වුවහොත්, -ගරු කථානායකතුමනි, ඒ කියන්නේ 113දෙනෙක් අවශ්‍යයි; 113ක බහුතරයක් අවශ්‍යයි- කථානායකවරයා විසින්, එසේ ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව මත අදාළ විනිශ්චයකාරවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා එය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය."

ඒ වාගේම තවත් වැදගත් කරුණක් තිබෙනවා:

"(6) පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම හෝ විසුරුවා හැරීම නොසලකා විමර්ශන මණ්ඩලය විසින් සිය වැඩකටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය හැකිය."

ඒකත් වැදගත් දෙයක්. මොකද, මෙවැනි ක්‍රීඩායාමයක් තුළින් මෙම පරීක්ෂණ ක්‍රියාදාමය අඩාල කිරීම සඳහා පාර්ලිමේන්තුව කල් තැබීම වැනි උපක්‍රම භාවිත කිරීමට ඇති ඉඩකඩ මෙයින් බැහැරකොට තිබෙන නිසා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, ඒ අනුව ඉතාම විස්තරාත්මක, ඉතාම සාධාරණ ක්‍රියාදාමයක් අපි හඳුන්වා දී තිබෙනවා වාගේම, මෙමඟින් අපේ රටේ නීති ක්ෂේත්‍රය පිළිබඳව විශ්වාසයත් ඇති වෙනවා.

මේ රටේ නීති ක්ෂේත්‍රයට, අධිකරණයේ ස්වාධීනත්වයට, ව්‍යවස්ථාදායකය සහ විධායකය විසින් අනවශ්‍ය ලෙස ඇඟිලි ගසනවාය කියන චෝදනාවක් තිබුණා. ඇතැම් අවස්ථාවල ඒක සත්‍ය බව අපි ඇඟින් දැක්කා. ඇතැම් අවස්ථාවල ඒ කරුණු අපට පිළිගන්න බැරි වුණා. නමුත් දැන් අපි මෙවැනි නිශ්චිත ක්‍රියාදාමයක් ස්ථාවර නියෝග මඟින් හඳුන්වා දීලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ එය ගැළපීම තුළින් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා වනවා. මොකද, ශිරාණි බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රශ්නය ඇති වුණු වෙලාවේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ගැන අපි කථා කථා. එම උත්තරීතරභාවය තවමත් අපි රකිමින් තිබෙනවා. හැබැයි ඒ උත්තරීතරභාවය රැකෙන්නේ පාර්ලිමේන්තුව විනිවිදභාවයෙන් යුතුව සහ නිසි කාර්ය පටිපාටියකින් කටයුතු කළොත් පමණයි, ගරු කථානායකතුමනි. ඒ අනුව මෙම ප්‍රතිපාදන මඟින් ස්ථාවර නියෝගවල කලින් තිබුණු බරපතළ අඩු පාඩුවක් සම්පූර්ණ වෙනවා. විටින් විට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගවලදීත්, ඒ වාගේම සිවිල් සමාජය තුළදීත්, දේශපාලන වේදිකාවන් තුළදීත් දිගින් දිගටම සාකච්ඡා වුණු අවිනිශ්චිතතාවක් මේ තුළින් අපි ඉවත් කර තිබෙනවා. මීට වඩා හොඳ විකල්පයක් නැති බවයි, මා ඉතාම ගෞරවයෙන් ඔබතුමාට සඳහන් කර සිටින්නේ. අපේ විවිධ පක්ෂවල සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවකින් තමයි මේ පිළිබඳව සලකා බැලුවේ. අවසානයේ සියලුදෙනාගේම එකඟතාව වුණේ, මෙය තමයි අපට යා හැකි උපරිම දුර කියලායි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ඇසීම පිළිබඳව අපි සංශෝධන කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රශ්න ඇසීමේදී කලින් අතුරු ප්‍රශ්න තුනක් අසන්න හැකියාව තිබුණා. එය අතුරු ප්‍රශ්න දෙකකට සීමා කර තිබෙනවා. ඒ පිළිබඳව අපට අත් දැකීමක් තිබෙනවා. අතුරු ප්‍රශ්න තුනක් ඇසීම නිසා මුලින් ප්‍රශ්න අසන ලද ගරු මන්ත්‍රීතුමන්ලා විශාල කාලයක් වැය කරනවා. සමහර විට ඇමතිවරුන් විශාල කාලයක් වැය කරනවා. ඒ නිසා අවසානයේ අසන ප්‍රශ්නවලට ඇති ප්‍රමුඛතාව නැති වනවා. ඒ වාගේම වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු දීමේ අවස්ථාව නැති වනවා. ඒ නිසා අතුරු ප්‍රශ්න ප්‍රමාණය දෙකක් බවට පත් කර තිබෙනවා.

විශාලතම අවකාශය ඉදිරිපත් වන්නේ ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳවයි. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ 111 වන වන්තියේ එය දීර්ඝ ලෙස සඳහන් කර තිබෙනවා. ඒ වාගේම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හරහා අලුත් සම්ප්‍රදායක් හඳුන්වා දීලා තිබෙනවා, නීති සම්පාදනය පිළිබඳව. මේ කාරණා ඉතාම වැදගත්. මේ කාරණා පිළිබඳව ලොකු විවාදයක් තිබෙනවාය කියලා මා හිතනවා.

ගරු කථානායකතුමනි, විශේෂ කාර්යයන් සඳහා අලුතින් කාරක සභා කිහිපයක් නම් කර තිබෙනවා. විශේෂ කාර්යයන් සඳහා අලුතින් කාරක සභා කිහිපයක් එකතු කර තිබෙනවා. විශේෂ කාර්යයන් සඳහා කාරක සභා හැටියට ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව අපි අලුතින් එකතු කරලා තිබෙනවා. උසස් නිලතල පිළිබඳ කාරක සභාව කලින් තිබුණත්, අපි එය විශේෂ කාර්යයන් සඳහා කාරක සභා ගොනුවට එකතු කිරීමෙන් එහි තත්ත්වය වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව අපි ශක්තිමත් කරනවා. ගරු කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කර තිබෙන ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව මේ රටේ සමාජයේ විශාල අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. මේ ආචාර ධර්ම පද්ධතිය හරහා මන්ත්‍රීවරුන් සාමාන්‍ය පුරවැසියන්ටත් වඩා ආදර්ශවත්ව කටයුතු කළ යුතු බව අපි පෙන්වා දී තිබෙනවා. යම් මන්ත්‍රීවරයකු මහජන නියෝජිතයකු විධියට ජන වරමක් ලබා ගෙන මේ පාර්ලිමේන්තුවට එනවා නම්, ඒ මන්ත්‍රීවරයාට වග කීමක් තිබෙනවා; ජනතාව කෙරෙහි වග වීමක් තිබෙනවා. ජනතාවට අයිතියක් තිබෙනවා, ඒ මන්ත්‍රීවරයා පිළිබඳව දැන ගන්න; ඒ මන්ත්‍රීවරයාගේ හැසිරීම පිළිබඳව ප්‍රශ්න කරන්න. තමන් පෞද්ගලික පුරවැසියකුගේ තත්ත්වයෙන් මහජන නියෝජිතයකු බවට පත් වනවා නම්, එය තමන් ස්වේච්ඡාවෙන් කරන දෙයක්. ඒ නිසා මන්ත්‍රීවරුන්ට හැකියාවක් නැහැ, "අපේ පෞද්ගලිකත්වය ගැන සොයන්නේ ඇයි? අපේ වත්කම් ගැන සොයන්නේ ඇයි? අපේ ආදායම් ගැන සොයන්නේ ඇයි? අපේ පවුලේ සාමාජිකයන්ගේ වත්කම් ගැන සොයන්නේ ඇයි?" කියලා ප්‍රශ්න කරන්න. අපි ඒවා අත් හැරලායි මේ ධුර භාර ගන්නේ.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු හැටියට අපි අද සමාජය තුළ බරපතළ ලෙස විවේචනයට ලක් වනවා. දේශපාලනඥයන් හැටියට අද සමාජයේ පිළිකුලට ලක් වනවා. අද පාර්ලිමේන්තුව සමාජයේ වෛරයට, ක්‍රෝධයට ලක්වෙලා තිබෙනවා. අද පුරවැසියා අපේ මුළු රාජ්‍ය ව්‍යුහයම පිළිකුල් කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එහෙම සිද්ධ වෙලා තිබෙන්නේ, පුරවැසියා සහ මහජන නියෝජිතයා අතර ඇති සම්බන්ධය දුරස්වීමත්, මහජන නියෝජිතයාගේ කාර්යය පිළිබඳව සමාජය දැනුවත් නොවීමත්, මහජන නියෝජිතයන් ආදර්ශවත් ලෙස කටයුතු නොකිරීමත් නිසායි. ඒ නිසා අද අපි ඉදිරිපත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ඉතාම වැදගත් එකක්. එහි තිබෙන කරුණු එකින් එක කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව යම් ආකාරයක විවේචනයක්, අදහසක් ඉදිරිපත් කළොත් ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට හැකියාව තිබෙනවා. අපි ඉතාම සතුටු වනවා, චර්යා ධර්ම සංග්‍රහය ඉදිරිපත් කරන්නට ලැබීම පිළිබඳව. මේ ගැන ඉතාම දීර්ඝ කාලයක් සමාජයේ කථා වුණා; මැතිවරණ වේදිකාවල කථා වුණා. අපේ යහ පාලන රජය ප්‍රතිපත්තියක් වශයෙන් මෙය හඳුන්වා දුන්නා. නමුත් අපටත් මෙය ඉදිරිපත් කරන්න වසර තුනක් ගත වුණා. ප්‍රමාද වෙලා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ලැබීම ලොකු සතුටක්, ගරු කථානායකතුමනි. එය ඔබතුමාගේත් ජයග්‍රහණයක් බව මා කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ඔබතුමා මේ කාරණා පිළිබඳව උනන්දු වුණා.

ගරු කථානායකතුමනි, මා අනෙකුත් කාරණා පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම මෙම රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම පැවරී තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවටයි. එම රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ ශක්තිය පාර්ලිමේන්තුවට ලබා දීම සඳහා වූ ප්‍රතිපාදන අපි මීට ඇතුළත් කළා. වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ ප්‍රතිපාදන ඇතුළත් කළා; ක්‍රියාත්මක කළා. දැනටමත් ක්‍රියාත්මක වන ඒ රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම, පරීක්ෂාව, අය වැය පිළිබඳ පරීක්ෂාව, පාර්ලිමේන්තුවට ලබා දෙන්නා වූ ක්‍රියාවලියක් තමයි අපි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ රටේ පුරවැසියන්ගේ අයිතිය නියෝජනය කරන උත්තරීතර ආයතනය මේ පාර්ලිමේන්තුවයි. ඒ උත්තරීතර ආයතනය තුළ අපි වග වීමෙන් යුතුව කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඒ උත්තරීතර ආයතනය තුළ අපි දැනුවත්ව කටයුතු කළ යුතුව තිබෙනවා. උත්තරීතර ආයතනය තුළ මේ රටේ පුරවැසියන් වෙනුවෙන් වූ ඒ යුතුකම ඉටු කිරීම සඳහා වූ යම් ක්‍රියා පිළිවෙතකට අපි බැඳී සිටිනවා. ඒ අනුව මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සංග්‍රහය සහ කාලයට

ගැළපෙන ලෙස නවීකරණය කරන ලද -යාවත් කාලීන කරන ලද- අපේ ස්ථාවර නියෝගත් සමඟ අපේ පාර්ලිමේන්තුවේ ශක්තිය තවත් වැඩි වන බව කියමින්, මේ සඳහා දායක වෙච්ච සියලු දෙනාට මගේ ස්තුතියත් පිරිනමමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, I would like to quote from today's "Daily Mirror." In the front page it states, I quote:

"UPFA quits National Government - UPFA General Secretary Mahinda Amaraweera sent a letter in this regard to the President."

Last night we had a statement from the Deputy Speaker also on behalf of the UPFA that they have quit the Government. Now there is no National Government. I had raised this matter a couple of times and Hon. Speaker gave a reply. Hon. Leader of the House also said nothing like that has happened. But, now it has happened. So there is no Government. ඒ නිසා ජාතික ආණ්ඩුව කියන එක හමාර බව ප්‍රකාශයට පත් වී තිබෙනවා. ගරු කථානායකතුමා හැටියට ඔබතුමා සහ අපි මොන පක්ෂවල හිටියත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දැන් ජාතික ආණ්ඩුව කියන දේ නැහැ. ඒ කාරණයට සභානායකතුමාත් එකඟ වෙයි. අපි ප්‍රශ්න අහනකොට එතුමා කිව්වා, "එහෙම එකක් වෙලා නැහැ" කියලා. දැන් එහෙම එකක් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා. අනෙක් කාරණය, මෙහි කියලා තිබෙනවා, "ගරු කථානායකතුමාට දැනුම් දීලා තිබෙනවා"යි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I have no official intimation.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම අහන්නේ මේකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම ලියුමක් ලැබිලා නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
"තවදුරටත් මේ සභාගය නැත" කියලා දැන් රටටම ප්‍රකාශ කරලා තිබෙනවා. "සභාගය නැත" කියලා රටටම ප්‍රකාශ කරලා තිබියදී ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, පොඩ්ඩක් මට ඉඩ දෙන්න. ඔබතුමා ඊට පස්සේ කියන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව කටයුතු කිරීමේදී බොහොම ප්‍රවේශමෙන් අපේ ගෞරවය ආරක්ෂා කරගෙන කටයුතු කළ යුතුයි. ඒකයි මේ කියන්නේ. එහෙම දෙයක් සිදුවෙලා තිබෙන බව ප්‍රකාශයට පත් වී තිබෙන නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආණ්ඩුවට කියන්න, ඒගොල්ලන් වෙනම දිවුරුම් දෙනවා නම් දිවුරුම් දීලා එන්න කියලා. එහෙම නැත්නම් මෙතැන ආණ්ඩුවක් නැති බව තමයි අපට හැඟෙන්නේ. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ගැන අපිට කනගාටුයි. මොකද, හරි නම් ඇමති ධුර සංඛ්‍යාව 50 ඉඳලා 30 දක්වා අඩු වෙන්න ඕනෑ. එහෙම තත්ත්වයක් යටතේ මේ අයට ඉඳගෙන ඉන්න බැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් මේ ඉල්ලීම කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන හොයලා බලන්නම්. මට නිල වශයෙන් - officially - දැනුම් දීමක් කරලා තිබුණේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා කථා කරන්න.

ඊළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පත්තරේ තිබෙන දේකට ඔබතුමාට උත්තර දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක් කාරණය මෙයයි. යහ පාලන ආණ්ඩුවට -ජාතික ආණ්ඩුවට- දෙපැත්තක් තිබෙනවා. අපි තවම එම යහ පාලන ආණ්ඩුවේ ඉන්නවා. [බාධා කිරීම්] අපි තවම ඒකේ ඉන්නවා. දෙපැත්තක් තිබෙනවා නේ. [බාධා කිරීම්] අපි තවම යහ පාලන ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. පුවත් පත් ලිපියක් අල්ලාගෙන මෙතැන ප්‍රශ්න කරන්න බැහැ. Sir, there are two parties in the agreement.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අනෙක් පාර්ශ්වය කෝ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
One party cannot depute it unilaterally. There are two parties. But this is only a newspaper article.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, I will also seek some clarification on this. Thank you very much. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ඊට පසුව, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමාගෙන් මම අවස්ථාව ලබාගෙන තිබෙන්නේ, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාව වනවිට අපේ රට තුළ එක්තරා දේශපාලන අර්බුදයක් උද්ගත වෙලා තිබෙන බව ලංකාවේ ඉන්න මිනිසුන් හැටියට අපි කවුරුත් දන්නවා. ඒ වාගේම ලෝකයත් දන්නවා.

මේ දේශපාලන අර්බුදය ආණ්ඩුව ඇතුළේ අර්බුදයක් වී තිබෙනවා. ආණ්ඩුව තවමත් පවතිනවාය කියලා කියනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් ආණ්ඩුවට ඇතුළත්ව ඉන්නා වූ පාර්ශ්වයේ ප්‍රධානියෙක් නැතිටලා කියන්නට ඕනෑ, "අපි තවමත් ආණ්ඩුව තියාගෙන ඉන්නවා" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැන් ඉල්ලීමක් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අහන ප්‍රශ්නය මේකයි. පාර්ශ්ව දෙකක් එකතු වී හදා ගත්තු ආණ්ඩුවක තනි පාර්ශ්වයකට වෙන් වෙන්න බැහැ කියන නීතිය, කැලේ නීතියක් විනා රටවත්, ලෝකයේවත් නීතියක් නොවෙයි. පාර්ශ්ව දෙකක් එකතු වුණාම, එක පාර්ශ්වයකට ඉවත් වෙන්න පුළුවන් කියන එක ස්වභාව ධර්මයේ නීතියක්. මොනවාද මේ කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා. - [*Interruption.*] Hon. Wimal Weerawansa, I will give you the Floor later.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ නායක වශයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ප්‍රශ්නය මේ ගරු සභාවේදී අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා, මේ ගරු සභාවේ අවධානයට කිහිප විටක්ම -දෙවරක්ම- යොමු කළා. එයට උත්තරයක් නොදී ඉන්නවා. ඉතා පැහැදිලි ලෙස එවැනි සන්ධානයක් නැති බව ලෝකයටම ප්‍රකාශ කර තිබෙද්දී, එවැනි නැති ආණ්ඩුවක් පවතින වෙලාවක විවාද කිරීමෙන් අපි දැන් කරන්නේ විහිළු සහගත වැඩක්. මේ කැබිනට් මණ්ඩලය නීති විරෝධී වෙනවා නම්, කැබිනට් මණ්ඩලයක් නැත්නම්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නම් ඇයි අපි මේ විධියට හැසිරෙන්නේ? මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් රජයේ අනෙක් පාර්ශ්වයේ කවුරු හරි කෙනෙක්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ ගැන ඉල්ලීමක් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට, ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, රටේ මූලික නීතිය ආරක්ෂා කරන්න මේ ගරු සභාව බැඳිලා ඉන්නවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කර ගත්තේ, ඔය ජාතික ආණ්ඩුවක් කියලා ප්‍රධාන යැයි කියන පක්ෂ දෙක එකට එකතු වුණාට පස්සේ විශාල කැබිනට් මණ්ඩලයක් හදා ගන්න අනුමැතිය ගත්ත එකයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා -මහින්ද අමරවීර මහතා- නිල වශයෙන් රටට නිවේදනය කරලා තිබෙනවා, "තවදුරටත් ඒ ජාතික ආණ්ඩුව තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය වෙන්නේ නැහැ" කියලා. මේ රටේ මුද්‍රිත මාධ්‍යවල, විද්‍යුත් මාධ්‍යවල මේක ප්‍රචාරයට පත් වුණා. එහෙම කියලා තිබෙන තත්ත්වයක් යටතේ, මොකක්ද තිබෙන නීතිමය බලය, නොතිබෙන ජාතික ආණ්ඩුවක ඇමතිකම් ටිකක් තියාගෙන ඉන්න? දැන් ජාතික ආණ්ඩුවක් කියලා එකක් යථාර්ථයේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක හොයලා බලන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතා ප්‍රතිචාරයක් ඇවිල්ලා තිබෙනවා. සදාචාරාත්මක අයිතියක් නැහැ, අගමැතිතුමාට අගමැති පුටුවේ ඉන්න. සදාචාරාත්මක අයිතියක් නැහැ, ජනාධිපතිතුමාට ජනාධිපති පුටුවේ ඉන්න. [බාධා කිරීම්] සදාචාරාත්මක අයිතියක් නැහැ, විපක්ෂ නායක සම්පන්දන් මහත්තයාට තවදුරටත් ඔය පුටුවේ වාඩි වෙලා ඉන්න. ලජ්ජාවක් තිබෙනවා නම්, විපක්ෂ නායකකම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා කිව්වේ, ජන මාධ්‍යයක තිබෙන ප්‍රවෘත්තියක් පිළිබඳව අපේ අවධානය යොමු කරන්න ඕනෑ නැහැය කියලා. ගරු කථානායකතුමනි, සභානායකතුමනි, සන්ධානයේ මහ ලේකම්වරයාගේ නිවේදනයට අමතරව මේ ප්‍රවෘත්තිය ඉදිරිපත් කරලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකතුමා. එය, හුදු ජනමාධ්‍ය ප්‍රවෘත්තියක්ම පමණක් නොවෙයි. ඒ පිළිබඳව නියෝජ්‍ය කථානායකතුමා තමන්ගේ නමින් නිකුත් කරපු නිවේදනයක් අපට බැහැර කරන්න බැහැ. ඒක පළමුවැනි කාරණාව.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණාව මෙයයි. ඔබතුමා දන්නවා, අගෝස්තු මාසයේ 21වැනි දා ජාතික ආණ්ඩුවකට අවුරුදු දෙකකට ගිවිසුමක් අත්සන් කරපු බව. අගෝස්තු මාසයේ කිව්වා, 2017 දෙසැම්බර් 31වැනි දා දක්වා මේක වලංගුය කියලා. දෙසැම්බර් මාසයේ 31වැනි දා කල් ඉකුත් වෙලා අද පෙබරවාරි 19වැනි දා, ගරු කථානායකතුමනි. මෙතැන ගැටලුව තිබෙන්නේ, ජාතික ආණ්ඩුව පවත්වාගෙන යනවාද, නැද්ද කියන කාරණාවට වඩා වැඩි දෙයක්. අපි අත ඔසවලා අනුමත කරපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 46.(1) (අ) ව්‍යවස්ථාව අනුව කැබිනට් මණ්ඩලය 30කට සීමා වුණා. 46.(1) (ආ) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය හා නියෝජ්‍ය ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 40කට සීමා වුණා, ගරු කථානායකතුමනි. දෙකේ එකතුව 70යි. දැන් ජාතික ආණ්ඩුව නිසා කැබිනට් අමාත්‍ය ධුර සංඛ්‍යාව 30 සිට 45 දක්වාත්, රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 40 සිට 55 දක්වාත් වැඩි වුණා. 70ට තිබුණු එක 100 වුණා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
වැරදියි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
වැරදි නැහැ. මම වග කීමෙනුයි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක විවාදයකට ගන්න අවශ්‍ය නැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
විවාදයක් නොවෙයි, ගරු කථානායකතුමනි. මට මගේ කථාව අවසන් කරන්න දෙන්න. මැතිවරණය අවසන් වෙලා මේ මොහොත වෙන කොට දවස් හතක් ගත වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, දේශපාලන අර්බුදයක් තිබෙනවා කියලා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මැතිවරණය ඉවර වෙලා දවස් හතක් ගත වෙන කල් මැතිවරණ ප්‍රතිඵල නිකුත් කරන්න බැරි වෙලා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළ ගිලා බසිමින් පවතිනවා. රුපියල අවප්‍රමාණය වෙමින් පවතිනවා. ඒ නිසා විශාල අර්බුදකාරී තත්ත්වයක් රටේ ඇති වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ කොමිසම - [බාධා කිරීම්] හම්බවෙන්න ඕනෑ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අපි හදන්නේ මේකට මැදිහත් වෙන්නයි; උදව් කරන්නයි. කරුණාකර, මේක තේරුම් ගන්න ගරු කථානායකතුමනි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(2) ව්‍යවස්ථාව අනුව අගමැති ධුරය පුරප්පාඩු වන එක් කාරණයක් තමයි ඇමති මණ්ඩලය විසුරුවා හැරීම. ජාතික ආණ්ඩුවෙන් එක් පාර්ශ්වයක් ඉවත් වුණා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(1)(අ) ව්‍යවස්ථාව යටතේ ඇමති මණ්ඩලය 30 දක්වා අඩු විය යුතුයි. එහෙම වුණා නම් ගරු කථානායකතුමනි, මේ ඇමති මණ්ඩලය පවතින්න බැහැ. අගමැති ධුරය නැති වුණායි පස්සේ ආණ්ඩුවක් පවතින්නට -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි සවසට විවාද කරමු. [බාධා කිරීම්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඔබතුමාට ස්තුතියි, ගරු කථානායකතුමනි. කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. විශේෂයෙන් ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කියාපු කාරණාව වැරදියි. ජාතික ආණ්ඩුවක ඉන්න පුළුවන් 93දෙනාටයි. අනෙක, මේ පැවැත් වූයේ පළාත් පාලන මැතිවරණයක්. පළාත් පාලන මැතිවරණයක ප්‍රතිඵලවලින් ජාතික ආණ්ඩුව වෙනස් වෙන්නවත්, පාර්ලිමේන්තුව වෙනස් වෙන්නවත් ඕනෑ නැහැ. එහෙම නම් 2015 මහ මැතිවරණයෙන් අපි දිනුවාට පස්සේ මේගොල්ලන් ප්‍රාදේශීය සභාවලින් ඉල්ලා අස්විය යුතුව තිබුණා. ගරු කථානායකතුමනි, අද මේගොල්ලන් ජාතික දේශපාලනය ගැන කථා කරන්න පළාත් පාලන මැතිවරණය යොදා ගෙන තිබෙනවා. අද මේගොල්ලන්ට ප්‍රශ්නයක් නැහැ, ජාතික ආණ්ඩුව හදන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි ජාතික ආණ්ඩුව හදන්න සූදානම් නම් මේගොල්ලන් කරදර වෙන්න ඕනෑ නැහැ. මේගොල්ලන් අද ආවේ 113 පෙන්වන්නයි. අද 113 පෙන්වන්න ආපු අයට 13 පෙන්වා ගන්න බැරිවයි ඉන්නේ. ඒ නිසා 113 පෙන්වන්න ඇවිල්ලා අද නෝන්ඩි වෙලායි ඉන්නේ. [බාධා කිරීම්] පුළුවන් නම් ඔබතුමන්ලා 113 පෙන්වන්න. ආණ්ඩුවක් හදනවා කිව්වා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, පැය 48න් ආණ්ඩුවක් හදනවා කියලා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඒක කරන්න. එහෙම නැතිව ජාතික ආණ්ඩුව ගැන ප්‍රශ්න කරන්න එන්න එපා. ඔබතුමන්ලා 113 පෙන්වන්න. 113 තියා **තුන** හොයා ගන්නවත් බැරිවයි ඔබතුමන්ලා ඉන්නේ. ඒකයි ඇත්ත තත්ත්වය. ඔබතුමන්ලා 113 පෙන්වන්න යාම තුළ අද රට විහිළුවක් බවට පත් වෙලායි තිබෙන්නේ . [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා. [බාධා කිරීම්] අපි දැන් ප්‍රධාන කටයුතුවලට යන්න අවශ්‍යයි. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පස් වරු 4.00ට විවාද කරන්න පුළුවන්. මා ඔක්කෝටම අවස්ථාව දෙන්නම්. ඉතා වැදගත් කරුණක් දැන් සාකච්ඡා කරන්න තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, පස් වරු 4.00ට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, පස් වරු 4.00ට සාකච්ඡා කරමු. දැන් සභාවේ වැඩකටයුතු කරගෙන යන්න තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You will be given a three-hour Debate. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය? [බාධා කිරීම්] I cannot give you the Floor now. We have to continue with this Debate. රීති ප්‍රශ්නයක් නම් අවස්ථාව දෙන්නම්. ඊට පස්සේ සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ. [බාධා කිරීම්] මොකක්ද, රීති ප්‍රශ්නය?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, microphone එක දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Microphone එක දීලා තිබෙන්නේ. ඔබතුමා රීති ප්‍රශ්නය මතු කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව පළාත් පාලන මැතිවරණයකින් ආණ්ඩුවට මෙහෙම බඩ ගියා නම් මහ ඡන්දයක් ආවොත් කොහොම - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්] The Hon. Leader of the Opposition, this is your turn to speak on the Debate on the Standing Orders.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා point of Order එකක් raise කර තිබෙනවා. ඒකට පිළිතුර දීලා අවසානයි ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසානයි. දැන් අපි ප්‍රධාන කටයුතුවලට යනවා. මේ කරුණ සම්බන්ධයෙන් විවාදය තිබෙනවා, පස් වරු 4.00 සිට පස් වරු 7.00 දක්වා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

දැන් භය වෙලාද ඉන්නේ?

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

නැහැ, නැහැ. අපට කිසි භයක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පස් වරු 4.00ට මේ සම්බන්ධයෙන් පැය තුනක විවාදයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. පැය තුනක විවාදයක් තිබෙනවා.[බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
There is an Adjournment Debate at 4.00 p.m. So, we can debate at that time.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, රටේ තිබෙන වාතාවරණය ගැනයි මෙතැනදී කථා කරන්නේ. දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා point of Order එකක් raise කළා. ඔබතුමාගෙන් ඒකට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මොනවත් ලිඛිතව දැනුම් දීලා නැහැ.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් නැඟුවා. ඒ පිළිබඳව මාධ්‍යයට දැනුම් දීලා තිබෙන්නේ නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමායි. ඔබතුමා එතුමාගෙන් ඇසුවා නම් උත්තරයක් දේවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මා ගන්න හදන්නේ. මම දැනටමත් කියා තිබෙනවා, හොයා බලා වාර්තා කරන්නම් කියලා. Okay.

(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
එහෙම බලාපොරොත්තු වන්නේ නැහැ නේ.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
එය නොවෙයි මා මෙතැනදි කියන්නේ. එහෙම නම්, මෙය වෙනස් කරන්න වුවමනාවක් නැහැ නේ. නමුත් මෙය වෙනස් කර තිබෙනවා, කථානායකතුමා දෙන නියෝගයක් Serjeant-at-Arms අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා. එහෙම නම් මන්ත්‍රීවරුන් එළියට දමන්න තමයි මෙයින් උත්සාහ දරන්නේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)
සභාවේ හරියාකාරව හැසිරෙන්න ඕනෑ.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
සභාවේ හැසිරීම කියන එක වෙනම කතාවක්. යම්කිසි සාධාරණයක් වන්නේ නැත්නම් මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා කොහොම හරි හඬක් නහලා ඒ අයගේ හඬ ඉදිරිපත් කරන්න. මේ පාර්ලිමේන්තුවේ දේවල් දිගින් දිගටම විකෘති කළාට පසුව අපට නිහඬව ඉන්න කියලාද කියන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේලා හොඳින් තේරුම් ගන්න. අප විතරක් නොවෙයි විපක්ෂයේ ඉන්නේ. තමුන්නාන්සේලාත් කවදා හෝ විපක්ෂයේ ඉන්නවා. එතකොට මේ නීති රීතිම තමුන්නාන්සේලාට එරෙහිව පාවිච්චි කරන්න පුළුවන්. මේක නොවෙයි අපේ රටට වෙන්න ඕනෑ, ගරු රාජ්‍ය අමාත්‍යතුමා. අප ඔක්කෝම එක්කාසු වෙලා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ. එයයි අපේ රටට වෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, විනාඩිය ඉවරයි.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීමක්] මට මෙතුමන්ලා බාධා කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, what is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා සඳහන් කළා එතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සලකා බැලීමක් සිද්ධ වුණේ නැහැ කියා. මම කලිනුත් සඳහන් කළා ඒ ගැන. එතුමා මට කිව්වා, එවැනි සලකා බැලීමක් කර තිබෙනවා නම් එය සොයා දෙන්න කියා. අද අපට ලබා දී තිබෙන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ 19වන පිටුවේ සිට 27වන පිටුව දක්වා ඒ පිළිබඳව සඳහන් කර තිබෙනවා. ඒ යෝජනා එකින් එකට වෙන වෙනම සලකා බලා, පිළිගන්නවා නම් පිළිගන්න හේතුවත් ප්‍රතික්ෂේප කරනවා නම් ප්‍රතික්ෂේප කරන්න හේතුවත් එහි දක්වා තිබෙනවා. ඒ කමිටුවට පක්ෂ කීපයක සාමාජිකයන් සහභාගි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, "ඔබතුමන්ලාගේ යෝජනා එකක්වත් පිළිගෙන නැහැ." කියා. එම වාර්තාවේ අංක 8(2) බලන්න. ඔබතුමාගේ යෝජනාව අනුව "අමාත්‍ය මණ්ඩලයේ" යන වචන උක්ත සඳහනට ඇතුළත් කිරීමට කාරක සභාව නිර්දේශ කළා. එය ඔබතුමාගේ ඉල්ලීමක්. ඒ වාගේම අංක 82(2) සම්බන්ධයෙන් ඔබතුමා කළ අවධානය යොමු කරවීම -concern එක- සලකා බලා, එයට ගරු කරලා මෙම ස්ථාවර නියෝගවලින් පසුව විනිශ්චයකරුවන් ඉවත් කිරීමේ පනත් කෙටුම්පත සම්මත කරන්න -ඒ කියන්නේ මීට සමාන්තරව වෙනම නීතියක් සම්මත කිරීමට- අපි එකඟතාවක් ඇති කර ගත්තා. ඒ වාගේම, අංක 111 බලන්න. ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳ සලකා බැලීමේදී උපදේශක කාරක සභා ඇතුළත් කිරීම පිළිබඳව ඔබතුමා ඉල්ලීමක් කළා. අපි ඒකට එකඟ වුණා. අද දින උපදේශක කාරක සභා පිළිබඳ සංශෝධනය ඇතුළත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය පැහැදිලි කරන්න අවශ්‍ය වන නිසා මට අවස්ථාව දෙන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා දැන් මගේ වෙලාව අරගෙන-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා වෙලාව ගන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආණ්ඩුවට වෙන් කළ කාලයෙන් කොටසක් එතුමාට දෙන්න. මා මෙය කියන්න අවශ්‍යයි. අංක 132වන -

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු කතා කරන වෙලාවේ මට මෛක්‍රෝෆෝනයවත් දෙන්නේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් මේක අහන්න කෝ. [බාධා කිරීමක්] මට විනාඩියක් දෙන්න, මේ කාරණය සම්පූර්ණ කරන්න. අංක 132 සඳහා "අමාත්‍ය මණ්ඩල ලේකම් විසින්" යන වචන එකතු නොකර "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු" යන වචන- [බාධා කිරීමක්] ඒ සම්බන්ධවත් ඔබතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ විධියට ගත්තාම අපි ඔබතුමාගේ යෝජනා සලකා බලා තිබෙනවා.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය point of Order එකක් නොවෙයි. මෙතුමාගේ තර්කය මට තේරුණා. මා මෙහිදී කිව්වේ, Standing Ordersවලට දාපු points 31ක් ප්‍රතික්ෂේප කර තිබෙනවා කියන එකයි. වැදගත්ම දේවල් ප්‍රතික්ෂේප කර තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ හරියාකාර සම්ප්‍රදායයක් ගෙන යන්නේ නැති නිසා තමයි මේ වාගේ ගැටලුවකට අද මුහුණ පාන්න සිදු වෙලා තිබෙන්නේ. මා මෙහිදී නියෝජ්‍ය අමාත්‍යතුමාට පැහැදිලි කළේ එයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "මෙය යහ පාලන ආණ්ඩුවක්." කියා කියනවා. "මෙය සම්මුතිවාදී ආණ්ඩුවක්." කියා කියනවා. ඉන් පසුව කිව්වා, "අවුරුදු දෙකකට ගිවිසුමක් අත්සන් කළා." කියා. අද පාර්ලිමේන්තුවේදී ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා මේ ගැන කතා කළා. හැබැයි, දැන් ඒ අවුරුදු දෙක ඉවරයි. ගරු කථානායකතුමා අද පාර්ලිමේන්තුවේදී කිව්වා, "කිසිම දැනුම් දීමක් කර නැහැ." කියලා. එහෙම නම් ගරු කථානායකතුමා දැනුම් දීමක් කරන තුරු තවදුරටත් බලාගෙන ඉන්නේ නැතිව කුමක් හෝ තීන්දුවක් ගන්න ඕනෑ. දැනුම් දීම තවත් අවුරුදු 3ක් පරක්කු වුණොත්, මේ විශාල ඇමති මණ්ඩලයත් එක්ක මෙය මෙහෙම ඉදිරියට ගෙන යනවාද කියන එක ගැන අප ප්‍රශ්න කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙහිදී අවසන් වශයෙන් කියන්නේ මෙයයි.

මේ Standing Orders නැත්නම් ස්ථාවර නියෝගවල එක එක දේවල් ලියන්න පුළුවන්. හැබැයි, අද රටේ ජනතාව ගොනාට අන්දවන්න බැහැ. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවේ වෙලාව වෙන් කිරීමේ කාරණයේ සිටම බලා ගන්න පුළුවන්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවාද කියන කාරණය. යහ පාලන ආණ්ඩුව ආපු දවසේ සිට තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය දෙනවා කියා ඒ හැම පැත්තෙන්ම බැලුවේ මොකක්ද? මේ කට්ටිය බැලුවේ මර්දනයක් ගෙනෙන්නයි. ඉතින් මම විශ්වාස කරනවා, ඉදිරි මැතිවරණවලදීත් මේ යහ පාලන ආණ්ඩුවට අනිවාර්යෙන්ම රටේ ජනතාව හොඳ උත්තරයක් දේවි කියා.

[අ.භා. 1.40]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැන විවාද කෙරෙන අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මට ප්‍රථමයෙන් කථා කළ ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමාගේ සමහර කරුණුත් සමඟ මම එකඟ වෙනවා. නමුත් අපේ ආණ්ඩුව මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න සෑහෙන වැඩ පිළිවෙළක් කරලා තිබෙනවා කියන එකත් කියන්න ඕනෑ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වා. අද පොලිස්, රාජ්‍ය සේවා, මැතිවරණ කොමිෂන් සභාව යනාදිය පිහිටුවා ඒවා ශක්තිමත් කරලා තිබෙනවා; ඒවායේ ක්‍රියාවලීන් ශක්තිමත් කරලා තිබෙනවා. අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්, අපි මැතිවරණයක් සම්පූර්ණ කළා; එය අවම දූෂණ තිබුණු, අවම ලෙස හිරිහැර වුණු මැතිවරණයක් කියලා. මම හිතන්නේ කවුරුත් පිළිගත යුතුයි, ඒක සිදුවුණේ මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය නිසායි කියන එක.

ඒ විතරක් නොවෙයි, අපේ රජය මේ කෙටි කාලය තුළදී පුරවැසියාගේ අයිතීන් ශක්තිමත් කරලා තිබෙනවා. පුරවැසියාගේ අයිතීන් ශක්තිමත් කරලා, පුරවැසියාට තොරතුරු දැනගැනීමේ අයිතිය ලබා දුන්නා. මේ අයිතිය ඉන්දියාව, පාකිස්තානය, බංග්ලා දේශය වාගේ ආසියාවේ සෑම රටකම පාහේ කලක සිට තිබිලා තිබෙනවා. සමහර යුරෝපීය රටවල මේ අයිතිය පුරවැසියාට අවුරුදු දෙසීයකට පෙර සිට තිබිලා තිබෙනවා. නමුත් ලංකාවේ මේ තත්ත්වය ඇති වුණේ අපේ ආණ්ඩුව කාලයේ කියන එකත් අපි අමතක නොකළ යුතුයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ ගැන වාද විවාද කිරීම තවත් ජයග්‍රාහී පිම්මක් කියලා කියන්නට පුළුවන්. අපේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එතුමාගේ මැතිවරණ පොරොන්දුවේ ප්‍රකාශ කළා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම පද්ධතියක් ගෙනෙනවා කියලා. ඒක අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, 2016 දෙසැම්බර් මාසයේ 10 වෙනිදා. ඉන්පස්සේ නැවතත් 2017 අගෝස්තු මාසයේ 08 වෙනි දා එය සංශෝධන සමඟ ඉදිරිපත් කළා. වග කිවයුතු රජයක් හැටියට දූෂණය අවම කරන්න, ඳාති සංග්‍රහය හා බලය අනිසි ලෙස භාවිත කිරීම වළක්වන්න, විනිවිදභාවය වැඩි කරන්න, ඒ වාගේම පාර්ලිමේන්තුවේ නිසි හැසිරීමක් ඇති කිරීම සඳහා තමයි මේ චර්යා ධර්ම පද්ධතිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. මේ පාර්ලිමේන්තුවේ බොහෝ ගැටලු, ප්‍රශ්න තිබෙනවා. ඒ හැම එකක්ම නිරාකරණය කරලා නැහැ. නිරාකරණය කරන්නේ නැති දේවලුත් තිබෙනවා. නමුත් මම හිතන්නේ ඔබතුමාත් පිළිගන්න ඕනෑ, මේ සංස්කෘතිය වෙනස් කරන්න අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ බොහොම හොඳ දෙයක් බව. මේ අලුත් පාර්ලිමේන්තු සංස්කෘතිය ස්ථාපිත කිරීම සඳහා ඔබතුමාගේ දායකත්වය ලැබිලා තිබෙනවා. ඒ වාගේම මම හිතනවා, අනාගතයේදීත් ඒ දායකත්වය ලැබෙයි කියා. අපි බලන්න ඕනෑ, මේ ඉදිරිපත් කරලා තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම පද්ධතිය ජාත්‍යන්තර චර්යා ධර්ම පද්ධතීන් එක්ක සසඳනකොට එහි මොනවාද තිබෙන අඩුපාඩු කියලා. ඇත්තටම අපි කියන්නේ නැහැ, මේ චර්යා ධර්ම සංග්‍රහය අංග සම්පූර්ණයි කියලා. නමුත් කවදාවත් නොනිබුණු දෙයක් තමයි අපි කරලා තිබෙන්නේ, අලුත් දෙයක් කරලා තිබෙන්නේ. අපි දන්නවා, අවුරුදු විසිපහකට එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපතිවරයෙක් මේ රටේ ඉඳලා නැහැ කියන කාරණය. ඒ වාගේම ඒ අවුරුදු විසිපහෙන් විසිතුනකට පමණ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයකුත් මේ රටේ තිබිලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අහන්න කැමැතියි පසුගිය දශක දෙක සම්බන්ධයෙන් වැඩියෙන් වගකීම ගත යුත්තේ කොයි පක්ෂද කියලා. අපි පසුගිය වසර දෙකේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයක් පිහිටුවලා තිබෙනවා. අපේ ඒ කාලය තුළදීම තමයි මේ චර්යා ධර්ම සංග්‍රහයත් ඉදිරිපත් කරගෙන යන්නේ. අපි මේ චර්යා ධර්ම පද්ධතිය සඟළා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමය සකස් කරන ලද චර්යා ධර්ම පද්ධතියත් සමඟ. අපි ඒක මිනුම් දණ්ඩක් හැටියට භාවිත කරලා බැලුවොත්, මෙහි තිබෙන අඩු පාඩු සහ අප තවදුරටත් එහි සලකා බැලිය යුතු තැන් මොනවාද කියලා බලන්නට පුළුවන් වනවා. මම ඒවායේ කරුණු කිහිපයක් මෙතැනදීම පෙන්වලා දෙන්න කැමතියි. එකක් තමයි, අපි - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - උනන්දුව දක්වන දේවල් ගැන ලේඛන ඉදිරිපත් කර නොතිබීම. - Verité Research ආයතනයෙන් මේ ගැන කථා කරලා තිබුණා. මේ ගැන පත්තරවලත් පළ කරලා තිබුණා. - ඒක අපි සඳහන් කරලා නැහැ. අපට බොහෝ දේවල් ගැන උනන්දුව දක්වන්න පුළුවන්. සමහර අයට ඒ අයගේ දෙමව්පියන්ගෙන්, පවුලෙන් සමහර විට දේපළ ලැබෙනවා. අනෙක් අය වෘත්තියක් කරලා, හම්බ කරලා ඒ ගොල්ලන්ට නිවාස අරගෙන, ඒ අයගේ දරුවන්ට අධ්‍යාපනය දීලා අවසන් කර පාර්ලිමේන්තුවට එන අය ඉන්නවා. ඒ වාගේම ඒ අභියෝග තියා ගෙන පාර්ලිමේන්තුවට එන අයත් ඉන්නවා. එතකොට එක එක හේතූන් නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමහර දේවල් ලබා ගැනීමට පෙළඹෙනවා. එතකොට ඔවුන් අනෙක් දේවල් සඳහා දක්වන උනන්දුව ප්‍රසිද්ධ කළ යුතුයි. නමුත්, අපේ මේ දැනට ඉදිරිපත් කරලා තිබෙන චර්යා ධර්ම පද්ධතිය තුළ ඒක ප්‍රසිද්ධ කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා සමහර විට මේ උනන්දුව ඉඩම්-දේපළ ගැන වෙන්නට පුළුවන්; කොටස් වෙළෙඳ පොළේ තිබෙන කොටස් ගැන වෙන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අය විදේශ සංචාරවල යෙදෙනවා. ඒ විදේශ සංචාරවලට මුදල් ලැබෙන්නේ කොහෙන්ද, ඒ ටිකට පත අරගෙන දෙන්නේ කවුද කියන එක සම්බන්ධව බොහෝ වෙලාවට සඳහන් වෙන්නේ නැහැ. එක එක පාර්ශ්වවලින් ආදායම් ලැබෙනවා. මේ ආදායම් ලැබෙන්නේ කොහෙන්ද කියන එක එළි දක්වන්න අවශ්‍යතාවක් නැහැ. ඊට අමතරව අනුබද්ධයන් තිබෙනවා. සමහර අය එක එක දේවල්වලට අනුබද්ධ වෙනවා. ඔහු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට ක්‍රියා කරනකොට ඒවා අදාළ වෙන්නේ, අදාළ නොවෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් එක එක්කෙනාට සෝදිසි කරලා බලන්න පුළුවන්. මම හිතන්නේ මේ කාරණය අත්‍යවශ්‍යයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ පැමිණිලි ලැබුණු විට යම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් එහි සත්‍ය විමර්ශනය කළ යුතුයි. අපේ පාර්ලිමේන්තුවේ චර්යා ධර්ම පද්ධතිය තුළ තිබෙන්නේ ඒකට කමිටුවක් පාර්ලිමේන්තුවෙන්ම පිහිටුවලා පාර්ලිමේන්තුවෙන්ම හොයලා බලන්න ඕනෑ කියලායි. නමුත් පොදු රාජ්‍ය මණ්ඩලයේ චර්යා ධර්ම පද්ධතිය තුළත්, සමහර අනෙක් රටවල තිබෙන චර්යා ධර්ම පද්ධති තුළත් ඒක පාර්ලිමේන්තුවට විතරක් සීමා කරලා නැහැ. ඒවා ගැන හොයා බලා මහජනයා වෙනුවෙන් පෙනී සිටින්න, මහජනයාට සාධාරණයක් වෙන විධියට ස්වාධීන පුද්ගලයන් පත් කරන්න පුළුවන්.

මන්ත්‍රීවරයකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් වුණොත්, ඒ පැමිණිල්ල ඉදිරිපත් කරන ඒ පුද්ගලයාටයි එය ඔප්පු කිරීමේ වගකීම තිබෙන්නේ. The burden of proof lies with the complainant. සමහර චර්යා ධර්ම පද්ධතිවලට අනුව ඒ පුද්ගලයාම ඒක ඔප්පු කරන්න ඕනෑ නැහැ. පුද්ගලයාට ඒක ඉදිරිපත් කරන්න පුළුවන්. ඉදිරිපත් කළාට පසුව ඒක පාර්ලිමේන්තුව තුළින් සෝදිසි කර බලා ඒක ඔප්පු වෙනවාද, නැද්ද කියා හොයා බලන්න වෙනවා. මේක අපේ චර්යා ධර්ම

පද්ධතිය තුළත් නැහැයි කියන එක පෙන්වලා දෙන්න අවශ්‍යයි. ඒ වාගේම වරදක් වෙලා තිබෙනවා කියලා කවුරු හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළොත්, ඒ පැමිණිල්ල ඉදිරිපත් කළ පුද්ගලයා ආරක්ෂා වෙන්න විධිවිධාන මේ තුළ නැහැ. මොකද, කවුරු හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් ඒ පුද්ගලයා ආරක්ෂා වෙන්න ඕනෑ. මොකද, ජනාධිපති කෙනකුට තිබෙන බලයට වැඩිය, ඇමති කෙනකුට තිබෙන බලයට වැඩිය, මන්ත්‍රී කෙනකුට තිබෙන බලයට වැඩිය සාමාන්‍ය පුරවැසියෙක්ට තිබෙන බලය අඩුයි.

මේ සියල්ලෙන්ම ශක්තිමත් වෙන්න ඕනෑ පුරවැසියායි. "ප්‍රජාතන්ත්‍රවාදය" කියමින් අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කරනවා කියලා කිව්වාම, අන්තිමට පුරවැසියා තමයි ශක්තිමත් වෙන්න ඕනෑ. හැබැයි, පුරවැසියාව ආරක්ෂා කරන්නත් මෙහි තිබෙන විධික්‍රම අඩුයි කියලා කියන්න පුළුවන්.

ලෝකයේ සමහර රටවල පාර්ලිමේන්තුවල චර්යා ධර්ම පිළිබඳව උපදේශකවරු පත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් තීරණ ගැනීමේදී ඒ ගන්න තීරණය සදාචාරාත්මක තීරණයක් ද කියලා ඔවුන්ට ගිහිල්ලා සාකච්ඡා කරලා මහ පෙන්වීමක් ලබා ගන්න පුළුවන්. අපිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංස්කෘතියක් ඇති කරනවා නම්, එවැනි සුදුසු පුද්ගලයෙකු පත් කරන්න පුළුවන්. පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන චර්යා ධර්ම පද්ධතියේ ඒක සඳහන් වනවා. නමුත්, එහෙම එකක් අපේ පද්ධතියට ඇතුළු කරලා නැහැ. අපි මේ පාර්ලිමේන්තුව තුළ චර්යා ධර්ම සංස්කෘතියක් පෝෂණය කරන්න ඕනෑ. මොකද, සමහර වෙලාවට නීතියට අනුව අපි නිවැරදි වෙන්න පුළුවන්. එය technical කරුණක් වෙන්න පුළුවන්. අපි උසාවියකට ගිහිල්ලා කරුණු කියලා උසාවියෙන් බේරෙන්න පුළුවන්. නමුත් උසාවියෙන් බේරුණා කියලා, අපි වරදක් කළාද, නැද්ද කියන එක පැහැදිලි වෙන්නේ නැහැ. චර්යා ධර්ම කියන්නේ, උසාවියේ නීති රීතිවලට එහා ගිය හැසිරීම අගය කරන සංස්කෘතියක්. එවැනි පාර්ලිමේන්තු සංස්කෘතියක් ස්ථාපිත කිරීම අවශ්‍යයි කියන එක තමයි කියන්නේ. ශ්‍රී ලංකාවේ අපටත් එහෙම චර්යා ධර්ම සංස්කෘතියක් පෝෂණය කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා සඳහන් කළ යුතුයි. ඡන්දදායකයා බලාගෙන ඉන්නේ ක්‍රියාවෙන් ගෞරවය දිනා ගන්න පුළුවන් අයව පත් කර ගැනීමටයි. ඒකයි ඡන්දදායකයාගේ කැමැත්ත. ඒ වාගේම මන්ත්‍රීවරුන් හැටියට පත් වුණු අපට තිබෙන වගකීම තමයි, ඡන්දදායකයා අප තුළ තැබූ විශ්වාසය කඩ නොකර චර්යා ධර්ම පද්ධතිය අනුව ක්‍රියා කිරීම. ඒකයි අපට තිබෙන වගකීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ අද ඇති වෙලා තිබෙන අර්බුදය පිළිබඳව මම වචනයක් කියන්න කැමැතියි. අර්බුදයක් තිබෙන මේ වෙලාවේ තමයි චර්යා ධර්ම පද්ධතිය ගැනත් අප සාකච්ඡා කරන්නේ. රටේ අර්බුදයක් තිබෙන වෙලාවක මේ කරුණ සාකච්ඡාවට යෙදුණු එක මම හිතන හැටියට එක අතකින් හොඳයි. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනාධිපති ලෙස මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජන වරමක් ලැබුණ බව අපි දන්නවා. අවුරුදු පහක් ජනාධිපති හැටියට ක්‍රියා කරන්න එතුමාට වරම ලැබුණා. ඒ වාගේම 2015 අගෝස්තු මාසයේ අපේ රජයට විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට -එක්සත් ජාතික පෙරමුණට- ආසන 106ක් එක්ක ජන වරමක් ලැබුණා, මේ රට පාලනය කරන්න. එම මැතිවරණයේදී වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත්ත අනෙක් පක්ෂත් එක්ක හවුල් වෙලා තමයි අපි මේ රජය ගෙන යන්නේ. ඒ ජන වරමත් අපට ලැබිලා තිබෙන්නේ ව්‍යවස්ථානුකූලවයි. ව්‍යවස්ථාවේ සඳහන් වන කාල සීමාවට තමයි ඒ ජන වරම ලැබිලා තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, a Question was raised by our Leader, the Hon. Dinesh Gunawardena, whether this Government which was formed two years ago still continues to be in power or is presently not in power. The Hon. State Minister is speaking about the Government which was formed unitedly. Whether it is still continuing is a question because of a news headline published today. So, the Hon. Speaker said that he will have it verified from the persons concerned.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා එතුමාගේ අදහස ප්‍රකාශ කළා. එතුමාට ස්තුතියි. එතුමාට පුළුවන් තමන්ගේ අදහස ප්‍රකාශ කරන්න.

ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ කථානායකතුමාගෙන්. කථානායකතුමා ඒ ගැන සෝදිසි කරලා, ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙයි කියලා මමත් බලාපොරොත්තු වනවා. ඒ ප්‍රශ්නය තිබෙන අතරේදී මටත් මගේ මතය කියන්න පුළුවන්. පාර්ලිමේන්තුව තුළ මටත් මගේ මතය කියන්න පුළුවන්. ව්‍යවස්ථාව අනුව, අපේ රජයට යම් කාල සීමාවකට ජන වරමක් ලැබී තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Member?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, a point of Order was raised and the Hon. Speaker said -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
At 4.00 p.m., ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළ Debate එක පටන් ගන්න ඕනෑ නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Yes, the Debate will be held at 4.00 p.m.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I am asking whether the Hon. Speaker has been able to get it verified.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you may continue with your speech.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ළඟදී ප්‍රාදේශීය සභා, නගර සභා ඡන්දයක් තිබුණා. ඒ ප්‍රාදේශීය සභා, නගර සභා ඡන්දයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණටත්, ඒ වාගේම අනෙක් පක්ෂවලටත් ජනතාව ජන වරමක් ලබා දුන්නා, එක එක පළාත්වල නගර සභාවල, ප්‍රාදේශීය සභාවල කටයුතු කරගෙන යන්න. ඒකට තමයි "ජන වරම" කියන්නේ. ඒ ජන වරම ලබා දීලා තිබෙන්නේ, ව්‍යවස්ථානුකූලව -ව්‍යවස්ථාවේ තිබෙන පරිදි- ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන යන්නයි. ඒ නිසා ඒ මුළු කාල පරිච්ඡේදයේම අපේ ආණ්ඩුව පවත්වාගෙන යනවා කියන එක මා නැවතත් මතක් කරන්න කැමතියි. අද අපට තිබෙන ගැටලුව, මේ අවදානම ගැන සඳහන් කරලා මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද මේ තිබෙන අවදානම, අද පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන අවදානම, පක්ෂයකට තිබෙන අවදානමක් නොවෙයි. අද මේ ඇති කරන අවදානම, අර්බුදයක් - ඒකට කියන්න පුළුවන්, මවපු අර්බුදයක් කියලා- මඟින් ඇති කරන්න හදන මේ ගැටලුව, පක්ෂයකට තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ඇති කරන අවදානමක් කියන එක සඳහන් කරන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට මෙවැනි පහරක් ගැහුවාම, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට -විධායකයට නොවෙයි, පාර්ලිමේන්තුවට- තමයි ඒ පහර වදින්නේ. අනෙක් සමහර රටවල පාර්ලිමේන්තුවලට ඒ පහර වැදිලා තිබෙනවා. ඒකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් වග කියන්න ඕනෑ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා අපි බොහොම වග කීමෙන් ක්‍රියා කරන්න ඕනෑ. අපේ ලංකාවේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය අනුව පක්ෂ තුනකට වරම් තුනක් ලැබෙන්න පුළුවන්. ජනාධිපතිතුමා එක පක්ෂයකින් පත් වෙන්න පුළුවන්. ආණ්ඩුව තවත් පක්ෂයක ප්‍රමුඛත්වයෙන් පත් වෙන්න පුළුවන්. ඒ වාගේම පළාත් සභා, ප්‍රාදේශීය සභා තවත් පක්ෂයක ජන වරමකින් පත් වෙන්න පුළුවන්. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන විධියට තමයි සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ම ක්‍රියා කළ යුත්තේ කියන එකත් මතක් කරමින්, මා නිහඬ වෙනවා. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. Next, the Hon. Vijitha Herath.

[අ.භා. 1.57]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ දැනට තිබෙන්නේ යල් පැන ගිය ස්ථාවර නියෝග. ඒ නිසා ඒ ස්ථාවර නියෝග අලුත් කිරීම ඇත්තටම පාර්ලිමේන්තුවේ කාලීන අවශ්‍යතාවක් වෙලා තිබුණා. ඒ අනුව තමයි ස්ථාවර නියෝග නැවත සකස් කිරීම පිළිබඳ කමිටුව හරහා අද මේ වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එහි බොහෝ සාධනීය කරුණු ගණනාවක් අඩංගු වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ස්ථාවර නියෝග වෙනස් කිරීමේදී අපි සාකච්ඡා කරලා එකඟ වුණු කරුණු කිහිපයක් අද දවස තුළ වෙනස් කරන්න සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඉන් ප්‍රධාන එකක් ගැන මම කියන්නම්. මන්ත්‍රීවරයෙක් තමන්ගේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ අතුරු ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව තිබෙනවා. නමුත් සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, ඒක අවස්ථා දෙකක් වෙන්න ඕනෑ කියලා. ඉතා පැහැදිලිව, එහෙම එකකට කමිටුව එකඟ වුණේ නැහැ. මම ඒ කමිටුව නියෝජනය කළා. එහිදී අපි මේ පිළිබඳව සාකච්ඡා කළා. අපි පැහැදිලිව කිව්වා, විශේෂයෙන්ම නවක මන්ත්‍රීවරුන්ට තිබෙන අවස්ථාවක් වන අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව අහිමි කරන්න එපා කියලා. තාවකාලික අත්හදා බැලීමකට තමයි පසුගිය කාලය තුළ එකඟතාවකට ආවේ, අතුරු ප්‍රශ්න දෙකක් විතරක් අහන්න අවස්ථාව දෙනවා කියලා. නමුත් අද සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, එය මුළුමනින්ම මේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කිරීමට. ඒකට අපි එකඟ නැහැ. ඒ නිසා දැනට අපි එකඟ වුණු කාරණාව එහෙමම තිබිය යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. මොකද, මන්ත්‍රීවරු අගමැතිවරයාගෙන් ප්‍රශ්න අසන අලුත් සම්ප්‍රදායයකුත් ඇති වුණා. එහෙම තැනකට ඇවිල්ලා තිබෙද්දී මන්ත්‍රීවරයාට ප්‍රශ්න අහන්න තිබෙන අවස්ථාව අහිමි කළොත්, ඒක වැරදියි. මොකද, මන්ත්‍රීවරයෙකුට තිබෙන එකම හා ප්‍රධානතම අවස්ථාවක් තමයි, ප්‍රශ්නයක් අහන එකත්, ඒ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න කීපයක් අහන එකත්. ඒ නිසා අතුරු ප්‍රශ්න තුනක් ඇසීමේ අවස්ථාව ඒ විධියටම තිබිය යුතුයි කියන එක මා නැවත අවධාරණය කරනවා.

ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව විවිධ අදහස් තිබුණා. එදා මේ ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවීමේදී අපි ඉතා පැහැදිලිව අවධාරණය කළා, යුරෝපයේ තිබෙන දේශපාලන සංස්කෘතියත් -විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ තිබෙන දේශපාලන සංස්කෘතිය- අපේ රටේ තිබෙන දේශපාලන සංස්කෘතියත් වෙනස්, එම නිසා මේ ක්‍රමය එක පාරටම අපේ රටට ආදේශ කරන්න ගියොත් ප්‍රායෝගිකව සාර්ථක වන්නේ නැහැයි කියන එක. නමුත්, එදා ආණ්ඩුව පැත්තෙන් කරුණු ඉදිරිපත් කළා, මේ ක්‍රමය අපි අත් හදා බලමු, ක්‍රියාවට නඟමු කියලා. කෙසේ වෙතත්, අවසානයේ ආපසු උපදේශක කාරක සභා පිහිටුවිය යුතුයි කියලා ඔබතුමන්ලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාව මොන පාර්ශ්වයෙන් ආවාද කියන එක මම දන්නේ නැහැ. නමුත්, ඒ පිළිබඳ විවිධ අදහස්, විවිධ සංවාද තිබෙන්න පුළුවන්. බ්‍රිතාන්‍යයේ තිබෙන ආංශික අධීක්ෂණ කාරක සභාවල

විපක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු සභාපතිත්වය දරනවා; විවිධ පක්ෂවල සාමාජිකයෝ ඉන්නවා. ඒ කමිටුවට ඇමතිවරයා වුණත් ගෙනැල්ලා ප්‍රශ්න කරන්න පුළුවන්. එය සම්පූර්ණයෙන් මාධ්‍යයට විවෘතයි. ඒ නිසා අදාළ විෂය භාර ඇමතිවරයා ඒ ආංශික අධීක්ෂණ කමිටුව ඉදිරියට ඇවිල්ලා තමන්ගේ විෂය පිළිබඳව, ඒ විෂය හරහා ජනතාවට ලබා දෙන සේවාව පිළිබඳව ඒ කමිටුවේ මන්ත්‍රීවරු විසින් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතුයි. එය මුළු රටටම දැක ගන්නත් පුළුවන්; මාධ්‍යයට විවෘතයි. නමුත්, අපේ රටේ එහෙම සංස්කෘතියක් නැහැ. අපි ආංශික අධීක්ෂණ කමිටුවට අදාළ විෂය භාර ඇමතිවරයා ගෙනැල්ලා ප්‍රශ්න කළොත් ඇමතිවරයා අනෙක් අතට කුණුහරුපයෙන් බනියි, "තමුසෙලා කවුද මගෙන් ප්‍රශ්න අහන්න" කියලා. එවැනි සංස්කෘතියක් තමයි අපේ රටේ තිබෙන්නේ. ඒ නිසා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් තිබීම හොඳයි. හැබැයි, අපේ රටේ මේ විධියේ දේශපාලන සංස්කෘතියක් තියා ගෙන මොන චර්යා ධර්ම සංග්‍රහයක් හදුන්වා දුන්නත්, අපි බලාපොරොත්තු වන සාධනීය ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ. කොහොම වුණත් එය නොකළ යුත්තක් කියලා අපි දකින්නේ නැහැ, එය කළ යුත්තක්. නමුත්, මේ ආංශික අධීක්ෂණ කාරක සභා සහ උපදේශක කාරක සභා පිළිබඳව තිබුණු සංවාදයේදී ආණ්ඩුවත් එකඟතාවකට ඇවිල්ලා නැහැයි කියලා මා හිතනවා. ආණ්ඩුවේ විවිධ පාර්ශ්ව අතර විවිධ මත තිබෙනවා. කෙසේ වෙතත්, ඒ පිළිබඳව අපේ ලොකු විරෝධයක් නැහැ. ඔබතුමන්ලා අවසානයේ එන එකඟතාව උපදේශක කාරක සභාවලට නම්, ඒ සම්බන්ධයෙන් අපට කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ උපදේශක කාරක සභා ක්‍රමයටත් අපේ එකඟතාව තිබෙනවා. මම ඒ කරුණත් මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම දැනට සම්පාදනය කර තිබෙන මේ ස්ථාවර නියෝගවල විපක්ෂ නායක ධුරය පිළිබඳව එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මැතිවරණයට ඉදිරිපත් වුණු දේශපාලන පක්ෂ කථානායකතුමා මඟින් පාර්ලිමේන්තුවේ පිළිගැනීමට ලක්වනවා. ඒ අනුව තමයි විපක්ෂයේ බහුතරය නියෝජනය වන විපක්ෂ නායකවරයා තේරීම කරන්නේ. ඊට වෙනස් ක්‍රමවේදයක් පාවිච්චි කරන්න ගියොත් ඇත්තටම විකෘති තත්ත්වයක් නිර්මාණය වන්න පුළුවන්. උදාහරණයක් විධියට කිව්වොත්, ආණ්ඩු පක්ෂයටම පුළුවන් ස්වාධීන කණ්ඩායමක් විපක්ෂයට එවා, ඒ ස්වාධීන කණ්ඩායමෙන් විපක්ෂ නායකවරයෙක් තෝරන්න. පසුගිය කාලයේ අපි ඒක දැක්කා. මේ ආණ්ඩුව බලයට පත් වූ මුල් අවස්ථාවේදී විපක්ෂ නායක ආණ්ඩු පක්ෂයත් නියෝජනය කළා, විපක්ෂයත් නියෝජනය කළා. විපක්ෂ නායකත් ආණ්ඩු පක්ෂයේ. මේක ක්‍රමයක් විධියට ගැළපෙන එකක් නොවෙයි. මොකද, තමන්ගේ පැත්තෙන් කණ්ඩායමක් විපක්ෂයට එවා විපක්ෂයේ වාඩි කරවා විපක්ෂ නායක ධුරයත් ආණ්ඩුවටම ගන්න ඕනෑම මොහොතකදී ආණ්ඩුවට පුළුවන්. එතැනදී විපක්ෂ නායක කියන තනතුරේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රශ්නය තිබෙන්නේ එවිට ඇතිවන විකෘති තත්ත්වයේයි. එතකොට, ආණ්ඩුවට ඕනෑ දේ විපක්ෂ නායකවරයා හරහා කරන්න පුළුවන්. එම නිසා ඒ ක්‍රමවේදය කොහෙත්ම ගැළපෙන්නේ නැහැයි කියලායි අපි හිතන්නේ. ඒ නිසා දැනට ස්ථාවර නියෝගවල තිබෙන ක්‍රමය ඒ සඳහා සුදුසුයි කියන එකයි මා අවධාරණය කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම ස්ථාවර නියෝග සියල්ලම සම්පූර්ණ නොවූ තත්ත්වයක් දැනට තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අවසාන තීන්දුවක් දුන්නාට පස්සේ ඒ කාරක සභාවේ තීන්දුව ක්‍රියාත්මක කිරීම අනිවාර්යය වනවා.

නමුත් අපි දන්න, හැම දාම සිද්ධ වෙන දේ තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් තීන්දුවක් ලබා දුන්නාට පසුව, එය ඒ විධියටම ක්‍රියාත්මක නොවීම. කලින්, පාර්ලිමේන්තුවෙන් දෙන තීන්දුවක්, ගරු කථානායකතුමාගේ සභාපතිත්වයෙන් යුතු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දුවක් ක්‍රියාත්මක කරන්නට රාජ්‍ය සේවයේ සියලු නිලධාරීන් බැඳී සිටියා; ක්‍රියාත්මක කළා. නමුත් පසුගිය කාලයේ ඒක එහෙම වුණේ නැහැ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දු විවිධ අමාත්‍යාංශ ලේකම්වරුන් දිගින් දිගටම පැහැර හැරීමට ලක් කළා. සමහර වෙලාවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඒවා ක්‍රියාත්මක කරන්නේත් නැහැ. අන්න ඒකට උත්තරයක් තවම මේ සථාවර නියෝගවලින් ලැබිලා නැහැ. අධිකරණමය බලයක් නැති වුණාට, පාර්ලිමේන්තුව උත්තරීතරයි කියන නාමකරණයට යටත් වෙලා තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දුව ක්‍රියාත්මක කළ යුතුයි. එවැනි තීන්දුවක් ක්‍රියාත්මක නොකළොත් කළ හැක්කේ කුමක්ද, එතැනින් එහාට යන්නේ කොහේටද කියන ප්‍රශ්නයට උත්තරයක් මේ ස්ථාවර නියෝගවලින් අදත් ලැබිලා නැහැ. එම නිසා ඒ ප්‍රශ්නය තවමත් එහෙමම තිබෙනවා. යම්කිසි අසාධාරණයකට ලක් වුණු කෙනෙකුට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් තීන්දුවක් ලබා දුන් පසු එය ක්‍රියාත්මක නොවන්නේ නම්, එතැනින් එහාට ඔහුට පිළිසරණක් නැති වෙලා තිබෙනවා. ඒකට උත්තරයක් සපයා ගන්න තවම අසමත් වෙලා තිබෙනවාය කියන කාරණයත් මා අවධාරණය කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝග වෙනස් කිරීම හරහාත්, ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම හරහාත් පාර්ලිමේන්තු ක්‍රියාවලිය යම් මට්ටමකට වෙනස් කිරීම තමයි අපේක්ෂා කරන්නේ. විශේෂයෙන් පසුගිය කාලයේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන වෙලාවේ යම් යම් සංශෝධන ඉදිරිපත් වෙලා තිබුණා. එහිදී විශේෂයෙන්ම අපේ පැත්තෙන් සංශෝධනයක් ඉදිරිපත් කළා, "යම්කිසි දේශපාලන පක්ෂයක් නියෝජනය කරලා මහ ජනතාවගේ ඡන්දයෙන් යම්කිසි මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පසුව ඔහුට පැහි මාරු කරන්නට අයිතියක් නැහැ. පැහි මාරු කළොත් ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි කළ යුතුයි" කියලා. ඒ යෝජනාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කරලා අවසන් කෙටුම්පතත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. එදා, අධිකරණ ඇමතිවරයා හැටියට සිටි ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අන්තිම මොහොතේ, ඒ යෝජනාව කියවන අවස්ථාවේ තමයි වෙනස් කළේ. මට හිතෙන විධියට අද කාටත් පැහැදිලියි ඒ ව්‍යවස්ථාව තිබුණා නම් කොපමණ හොඳද කියලා.

අද මේ රටේ අස්ථාවරත්වයක්, අරාජිකත්වයක් ඇති වෙලා තිබෙනවා. කොයි වෙලාවේද මන්ත්‍රීවරුන් එහාට මෙහාට මාරු වෙන්නේ කියලා හිතා ගන්නට බැහැ. අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒක. හැම පැත්තෙන්ම ඇහෙන්නේ, මන්ත්‍රීවරුන් කියන්නේ, ඇමතිවරුන් කියන්නේ, "අච්චර දෙන්නම් කිව්වා, මෙච්චර දෙන්නම් කිව්වා, එන්න කිව්වා, ඇමතිකම් දෙන්නම් කිව්වා, සල්ලි දෙන්නම් කිව්වා, මේ පැත්තට එන්න කිව්වා, අර පැත්තට එන්න කිව්වා" කියලා. අද වෙන්දේසියක් ඇවිල්ලා තිබෙන්නේ. තවමත් ඒ අවිනිශ්චිතතාව තිබෙනවා. මල් වටිටි වෙන්දේසිය වාගේ මන්ත්‍රීවරුන් වෙන්දේසියට ලක්වෙලා තිබෙන්නේ ඒ යෝජනාව එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ නිසායි. දැන් ඇවරයි, දෑවරයි කියලා ඉවරයි. තවම තුන් ඇවරයි කියලා නැහැ. "තුන් ඇවරයි" කියනතෙක් බලාගෙන ඉන්නවා. මධ්‍යාහ්න 12.00ට රැස්වීම් තිබ්බා. ඒ රැස්වීම ඉවර වෙලා එන පණිවුඩය මොකක්ද කියලා බලාගෙන ඉන්නවා. ඒ වාගේම හවස 4.00න් පසුව මොකක්ද වෙන්නේ කියලා බලාගෙන ඉන්නවා. ඒ අස්ථාවරත්වය ඇති වෙලා තිබෙන්නේ එවැනි පැහි මාරු කිරීමේ ඉඩක් ලබා දීම

[ගරු විජිත හේරත් මහතා]

හරහායි. එසේ පැති මාරු කිරීම ජනතාව ලබා දුන් ජන වරමටත් පටහැනියි. යම්කිසි ප්‍රතිපත්තියක් නියෝජනය කරන පක්ෂයක් හරහා ජන වරමක් මඟින් මන්ත්‍රීවරයෙක් පත් වුණොත්, ඔහුගේ පෞද්ගලික වුවමනා එපාකම් වෙනුවෙන් ඒ ප්‍රතිපත්තියට, පක්ෂයට, ජනතාවගේ ජන වරමට පයින් ගහලා යන්න අයිතියක් නැහැ. එම නිසා එදා ඒ යෝජනාව ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීමේ අඩුව, එහි ඵල විපාකය අද මුළු රටම දකිනවා. එම නිසා නැවත අවධාරණය කරනවා එදා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කිරීමට නොහැකි වූ ඒ යෝජනාව අනාගතයේදී හෝ ඇතුළත් කළ යුතුයි කියලා. මොකද, ඒකෙන් තමයි ලබා දුන් ජන වරම, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟන්නට තමන්ගේ නියෝජිතයා ක්‍රියා කරනවාය කියන සහතිය ජනතාවට ලබා ගන්නට පුළුවන් වෙන්නේ. ඒ අඩු පාඩුව නැවත මතක් කරමින්, මේ ඉදිරිපත් කර තිබෙන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පතේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පතේ සාධනීය ලක්ෂණවලට එකඟ වෙමින්, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලදී අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට තිබෙන අවස්ථාව අහෝසි නොකළ යුතුයි කියන කාරණය දැඩිව අවධාරණය කරමින්, - කලින් පැවති ආකාරයට අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ඇති අයිතිය පැවතිය යුතුයි කියන කාරණය අවධාරණය කරමින්- මාගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[2.09 p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Bismillahir Rahmanir Raheem.

Mr. Deputy Chairman of Committees, I am pleased to be associated in adding my comments to the two documents that we placed for approval of the House today - one relating to a new set of Standing Orders for the conduct of Business in this House, as well as the Code of Conduct for Members of Parliament. In my opinion, this effort has gone through almost for the last three years. I have had the privilege of serving in that committee under the Chairmanship of the Hon. Speaker.

First of all, I must thank the Hon. Speaker for having taken his precious time to give leadership to this important effort in drafting amendments to the Standing Orders, which had not been attended to since 1980s. Therefore, very important groundbreaking changes have been incorporated and I would say that particularly, the concept of Sectoral Oversight Committees, which goes to empower the backbenchers in this House, to have an oversight role over the executive functions of the government is a very, very salutary feature. But then, we must understand that certain functions of the High Posts Committee as well as the other financial oversight committees such as the Committees on Public Enterprises and Committee on Public Accounts, may also get overlapped by provisions that we have included in the Sectoral Oversight Committees. Since even the suitability of candidates to institutions that are appointed under each Ministry can once again come under scrutiny by the Sectoral Oversight Committee, and also the accounts and financial matters concerning the enterprises coming under different Ministries could also be examined all over again by the Sectoral Oversight Committees in addition to the Committee on Public Enterprises and the Committee on Public Accounts. So while these overlapping oversight issues can become somewhat confusing I feel that continuous oversight of the executive by the legislative arm is a very welcome feature and we must all agree that these are important changes that have been made.

I would like to venture into another area which had somewhat been ignored and sometimes been purposely ignored by even the Presiding Members of this House. I beg your pardon for saying this. I have, in fact, taken very strong objection to the way in which the Bills are presented to the House. Quite recently we observed that conduct of entertaining Bills for approval in this House has happened in violation of constitutional provisions. Now, I speak in particular - we have had in the recent past two such instances. One particularly -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order please! Hon. Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක් කාරණයක් කෙරෙහි ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරන්න කැමැතියි. අද අපට වැඩ කටයුතු රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම අද පස් වරු 3.00ට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාත්, නීතිපතිතුමාත්, ඒ වාගේම පළාත් පාලන ඇමතිතුමා ඇතුළු කණ්ඩායමක් පැමිණෙනවා. ඒ නිසා සභානායකතුමාත්, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, විශේෂයෙන්ම මෙයට සම්බන්ධ කමිටු සාමාජිකයිනුත් සමඟ සාකච්ඡා කරලා දැන් එකඟත්වයකට පැමිණියා, අපි මෙම විවාදය අද දින පස් වරු 4.00 දක්වා පවත්වාගෙන ගොස් අවසන් කරලා, Committee Stage එක සඳහා ඊළඟ සැසිවාරයේ දවසක් යොදා ගන්න. ඒ සඳහා සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Ayes.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අතරතුර සාකච්ඡා කිරීම සඳහා එක් අවස්ථාවක් ලබා දෙනවා. දැන් ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Thank you, Mr. Speaker. I am glad that you have come to the Chair at a time when I am raising a very important issue.

We are dealing with the new Standing Orders and we have also made provision for the presentation of Bills. We have made a few changes but some of these changes do not go as far as desirable.

Mr. Speaker, I have in particular taken objection to the way in which certain Bills have been submitted to Parliament in a manner so as to deny the constitutional right of a citizen to petition the Supreme Court against such a Bill. What has happened is, very surreptitiously amendments have been introduced, which are totally different to the content of the Bill that has been presented. The Provincial Councils Elections (Amendment) Bill was presented in such a manner and I took very strong objections to that both in the Party Leaders meeting as well as in this House. There was a subterfuge that was used and this type of incident must be avoided. As a matter of fact, this issue is before the Supreme Court today. We are all awaiting a judgment of the Supreme Court on this issue so that there will be a closure and we will not resort to such ways in which we will deny the constitutional right of a citizen. - [*Interruption.*] Indeed it is! It is a shame.

Now it has come to a situation after the experience we had in the last Local Government elections that the electoral system that we introduced is full of so many lacunas and contradictions that it has finally resulted in total instability. Of course, all of us are responsible for having enacted this piece of legislation. I think, it is very prudent for us to now erase what we did in such a surreptitious manner and revert back to the old system of elections, so that we will be in a position to conduct the Provincial Council elections as soon as possible.

But my point here is in the presentation of Bills we have to be quite responsible. We should not simply rely on the certificate of the Attorney-General to say that the Bill is not inconsistent with the Constitution, but the primary right of every citizen to challenge a Bill should not be denied by very surreptitiously introducing a whole new piece of legislation as amendments. This is what happened. It was such an embarrassing situation. We took strong objection to it. Everything was ignored and it was pushed through. Such things should never be repeated and I hope the Supreme Court should pronounce on the objections that have been made. I know the former Chief Justice went before the Supreme Court and argued this matter since this is a matter of serious concern for legislating in this House.

In addition to that, I believe that our effort to introduce Sectoral Oversight Committees as well as the decision to refer to the Legislative Committees once Bills are presented is commendable. They must come before the Sectoral Oversight Committees as well be referred to the Standing Committees to be examined and then a report be obtained before they are passed in this House. That is a very welcome feature. Particularly, when it comes to Bills which contradict, which are not in consonant with the Devolution Chapter of the Constitution they are referred to the Provincial Councils. There again, I think some welcome features have been incorporated so that the concerns of the Provincial Councils could be also addressed by the relevant Ministries as well as legislative subcommittees in the House.

These are welcome features. Of course, we have also introduced some new Standing Orders to provide for situations such as an impeachment of the Chief Justice. In keeping with the Latimer House Principles, what happened in the recent past prompted all of us to include some important provisions to ensure that principles of fair play, particularly relating to due process, is afforded to any superior court judge who may face an issue of impeachment in the House. So, that will prevent the Hon. Members of the House sitting in judgment without affording sufficient opportunity for a superior court judge, not being able to have a fair trial. Therefore, the issue of incorporating the Latimer House Principles in keeping with the Commonwealth practice in providing for a three-member panel to examine and report to the House before the House takes a decision whether to impeach or not is a very welcome feature and I believe a lot of time has been taken to introduce such important amendments.

Similarly, we have also introduced other features like the Prime Minister's Question Time as well as the rules relating to broadcasting and telecasting of Parliamentary Proceedings. Of course, the issue relating to abuse of the Parliamentary Privileges by Members sometimes brings out allegations in contravention of the Standing Orders. While we have simultaneous broadcast or telecast, once something is said, it could not be expunged or taken away because whatever damage would have been done before the public. So, these issues need to be addressed properly. A responsible - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Minister, you have only four more minutes.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Okay, Hon. Speaker. It was just a matter of concern that I thought should be added.

Coming back to the situation that we are currently faced within the country, a sense of instability has come about because of the disagreements between Parties in deciding on the issue of governance in the country. But I must say that there is a mandate and that mandate is for the National Government to continue and if the National Government cannot continue, I do not think, we should have a Government which is unstable and which is being run by a remote control by somebody else. I know, I have had this kind of an experience once in the past. When I was removed from the Cabinet all of a sudden in 2001, I believe, I crossed over to the Opposition. Then there was

[ගරු රවුල් හකීම් මහතා]

a brief period in which there was a "Probationary Government" - the "*Pariwasa Anduwa*" concept. A Similar "*Pariwasa Anduwa*" cannot continue in this country. I believe some steps are being taken; some are being spoken about. But, if all Parties who are supposed to be forming an administration, they must in the first place be prepared to take the Executive Office. If one Party is not taking the Executive Office and if we are going to run by proxy or by having a minority Government, we are violating our own mandate that we got.

So, I must say very categorically to those who have decided to form a Government that as far as the Sri Lanka Muslim Congress is concerned, we would only be part of a stable Government. If we are going to have a Government which is not going to have a substantial majority, it will be a total violation of the mandate that we got to serve the people. So, it is a very important thing. In fact, together with some of our minority Members who met with us, we very clear decided that we would insist on our national leaders to see that they respect the mandate that they have got in forming an administration and that decision should be taken in that spirit without resorting to unnecessary dilatory tactics and they must also see that the confidence that the people have reposed in our national leaders would be respected.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. The next speaker is the Hon. Douglas Devananda.

[பி.ப. 2.24]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பான நடத்தைக் கோவையின் இறுதி வரைவு அங்கீகாரத்திற்கென முன்வைக்கப்பட்டுள்ள நிலையில், அதுதொடர்பில் எனது கருத்துக்களையும் இங்கு முன்வைக்க விரும்புகின்றேன். நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பான பொறுப்புகள், கடமைகள், நடத்தைகள் குறித்ததான, நாடாளுமன்றத்திற் குள்ளும் தேர்தல் தொகுதியிலும் பொதுமக்களிடத்திலுமான செயற்பாடுகள் பற்றிய கருத்துக்கள் கடந்த பல வருடங்களாக இந்தச் சபையிலே பல்வேறு சந்தர்ப்பங்களில் முன்வைக்கப் பட்டிருந்தும் இன்றைய நிலையில் அந்த விடயமானது ஓர் இறுதி வரைவாக இந்தச் சபையின் அங்கீகாரத்திற்கு வருவதையிட்டு, இதற்கென முன்முயற்சிகளுடன் வெகு அக்கறைகொண்டு உழைத்துள்ள கௌரவ சபாநாயகர் கரு ஜயசூரிய அவர்களுக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நாடாளுமன்ற உறுப்பினர்களது பொறுப்புகள், கடமைகள், செயற்பாடுகள் தொடர்பிலான விளக்கமின்மை பொது மக்களிடையே பெருமளவில் காணப்படுகின்றது. நாடாளுமன்ற உறுப்பினர்கள் ஒருசிலரிடையேயும் அந்த நிலைமை காணப்படுவதை நாம் அறியக்கூடியதாக உள்ளது. இது அவர்களது தவறு என்று கூறமுடியாது. பொறுப்புகள், கடமைகள் மற்றும் நடத்தைகள் தொடர்பிலான ஒழுங்கமைந்த ஒரு கோவையின் தேவையிலேயே இது தங்கியிருக்கின்றது. நாட்டின் நிறைவேற்று அதிகாரமுடையவரை ஒரு பக்கத்திலும் பொதுமக்களை மறுபக்கத்திலும் வைத்துப் பார்க்கின்றபோது, இதன் மத்தியில் உள்ளவர்கள் யாப்பியலாளர்களாக இருக்கின்ற நாடாளுமன்ற உறுப்பினர்களே என்பதையும் நாம் அவதானத்திற்கொள்ள வேண்டும். சுதந்திரத்திற்குப் பின்னரான எமது நாட்டில் கொள்கைகள் வகுப்பதில் மற்றும் கொள்கை ரீதியிலான தீர்மானங்களை எடுப்பதில் துறைசார்ந்த சட்ட உருவாக்கத்தினது முக்கிய தீர்மான சக்தியாக இருப்பவர்கள் நாடாளுமன்ற உறுப்பினர் களேயாவர். பிரித்தானிய நாடாளுமன்ற சம்பிரதாயத்தின் தொடர் என்ற வகையில் ஆரம்பிக்கப்பட்டிருந்த எமது நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பிலான விடயங்களைப் பொறுத்த மட்டில், தேர்ந்தெடுக்கப்படுகின்ற நாடாளுமன்ற உறுப்பினர் யார்? என்பதற்கே எமது மக்கள் முக்கியத்துவம் வழங்குகின்றார்களேயன்றி, அவரது கடப்பாடுகள் யாவை? என்பது தொடர்பில் முக்கியத்துவம் வழங்குவதில்லை. யாப்பினை உருவாக்குகின்றவர் என்பதாலும் அந்த யாப்புக்கு உட்பட்ட வகையில் சட்ட உருவாக்கங்களின்போது மக்களின் பிரதிநிதியாக இருப்பவர் என்பதாலுமே நாடாளுமன்ற உறுப்பினர் யாப்பியலாளர் என இனங்காட்டப்படுகின்றார் என்பதனை பொதுமக்களில் பெரும்பாலானவர்களும் நாடாளுமன்ற உறுப்பினர்களில் ஒருசிலரும் அறிந்திராத நிலைமை இல்லாமலில்லை. குறிப்பாக, 1978ஆம் ஆண்டின் அரசியல் யாப்புக்கிணங்க விருப்புவாக்கு முறைமைக்கு அமைய தேர்ந்தெடுக்கப்படும் நாடாளுமன்ற உறுப்பினர்களது வருகையின் பின்பாக இத்தகையதொரு நிலைமை எழுந்துள்ளதென அரசியல் விமர்சகர்கள் கூறுகின்றதையும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேநேரம், நாட்டில் நிறைவேற்று ஜனாதிபதி முறைமையை மாற்றியமைப்பது குறித்தும் பல்வேறுமட்ட கலந்துரையாடல்கள் இடம்பெறுவதை நாம் கண்டுவருகின் றோம். அவ்வாறு நிறைவேற்று ஜனாதிபதி முறைமையில் மாற்றங்கள் கொண்டுவரப்படுமானால், அதற்கேற்ற வகையில் மக்கள் நலனில் அக்கறையுள்ள, அறிவார்ந்த உறுப்பினர் களைக் கொண்டதாக நாடாளுமன்றத்தை மேலும் பலப் படுத்திக்கொள்வதற்கும் மேற்படி நடத்தைக் கோவையானது உறுதுணையாக அமையும் என எண்ணுகின்றேன். அத்துடன், நாட்டில் ஸ்திரமான ஓர் ஆட்சி அமைய வேண்டியது மிகவும் அவசியமாகும். அது பொருளாதாரம், சட்டம், ஒழுங்கு போன்ற அனைத்துத் துறைகள் சார்ந்து பலமிக்கதாகவும் நிலையானதாகவும் இருக்கும் பட்சத்திலே தமிழ்பேசும் மக்களது அன்றாட, அடிப்படை மற்றும் அரசியல் உரிமைப் பிரச்சினைகள் போன்றவற்றைத் தீர்த்துக்கொள்ள வழிவகுப் பதாக அமையும். எமது மக்கள் கடந்தகால யுத்த மற்றும் தொடர் காலநிலை மாற்றங்களினால் பாதிக்கப்பட்டிருக்கின்ற நிலையில் அம்மக்களது வாழ்க்கையின் மீள்எழுச்சிக்காக ஒரு நிலையான ஆட்சியின் தேவையை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

அரச நிர்வாகத்தின் உரிமையானது அந்த அரசினது மக்களுக்குரியதாகும் என்ற அடிப்படை எண்ணக்கருவானது, எமது நாடாளுமன்ற ஆரம்ப நிலையிலிருந்து அது ஒரு நிறுவனமயமாக்கல் என்ற பிரித்தானிய நாடாளுமன்ற வழிமுறைக்கேற்ப வகுக்கப்பட்டிருப்பதைக் காணலாம்.

அதாவது, மக்கள் தாங்கள் சார்ந்த தீர்மானங்களை எடுப்பதற்கான வாய்ப்பினை உருவாக்கிக்கொள்வதே இதன் நோக்கமாகின்றது. அதேநேரம், பிரித்தானியரின் பாராளுமன்றக் கொள்கைக்கிணங்க இந்தச் சபையானது 'பாராளுமன்றம்' எனத் தமிழில் குறிப்பிடப்பட்டாலும் இச்சபையானது தமிழ் மொழியில் 'நாடாளுமன்றம்' என்றே குறிப்பிடப்படல் வேண்டும் என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். கௌரவ சபாநாயகர் அவர்கள் இதனைக் கருத்தில் எடுத்துக்கொள்வார் என நினைக்கின்றேன். பாராளுமன்றம் என்பது உலகத்தை ஆளுகின்ற மன்றம் எனும் கருத்துடைய பிரித்தானியருடைய சொல். நாடாளுமன்றம் என்பது நாட்டை ஆளுகின்ற மன்றம் எனும் கருத்துடையதால், அந்தப் பெயர் மாற்றத்தையும் கௌரவ சபாநாயகர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். மக்களால் தெரிவு செய்யப்பட்டு இங்கு அனுப்பி வைக்கப்படுகின்ற உறுப்பினர்களுக்கு வழங்கப்படுகின்ற விசேட பொறுப்புக்கள் உண்டு. இந்த விசேட பொறுப்பானது நாட்டினது அரசியல் யாப்பினூடாகச் சட்டமாக முன்வைக்கப்படுகின்றது. இத்தகைய நிலைமைகளைக் கருத்திற்கொண்டு பார்க்கின்றபோது, மக்களுக்கும் தமக்கும் இடையிலான சமூகப் பிணைப்பினை மதித்துச் செயலாற்ற வேண்டிய நிலையில், ஈழ மக்கள் ஜனநாயகக் கட்சியினராகிய நாம் ஆரம்பந்தொட்டு அதனைச் செவ்வனே நிறைவேற்றுவதில் உறுதியாகவே இருந்துவருகின்றோம் என்பதையும் இந்தச் சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, 1994ஆம் ஆண்டில் நாம் இந்த உயரிய சபையிலே காலடி எடுத்து வைத்தோம். அக்காலம் தொடக்கம் இன்றுவரை தொடர்ந்தும் இந்தச் சபையினை எமது மக்கள் சார்பில் நான் பிரதிநிதித்துவப்படுத்தி வருகின்றேன். இந்தக் காலகட்டத்தில் அமைச்சராகவும் பொறுப்பு வகிக்கக்கூடிய சந்தர்ப்பங்கள் எனக்குக் கிடைத்திருந்தன. நாடாளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் அமைச்சர் என்ற வகையிலும் நான் எனது கடமைகளையும் பொறுப்புக்களையும் மிகவும் நியாயமான முறையில் இந்த நாட்டிலே வாழுகின்ற அனைத்து மக்கள் சார்பாகவும் என்னால் இயன்ற வரையில் நிறைவேற்றியுள்ளேன் என்றே கருதுகின்றேன். அந்த வகையில், நாடாளுமன்ற உறுப்பினர்கள் தத்தமது பொறுப்புக்களையும் கடமைகளையும் உணர்ந்துகொள்வது மிகவும் அவசியமாகும். எமது நாட்டில் தொடர்ந்தும் நிகழ்ந்து வருகின்ற பல்வேறு சம்பவங்கள் இதனை எடுத்துக்காட்டுகின்றன என்பதையும் இங்கு தெரிவித்தாக வேண்டும். குறிப்பாக, எமது நாட்டைப் பொறுத்தவரையில் அரச பாடசாலைகளில் பிள்ளைகளைச் சேர்த்துக் கொள்வதிலிருந்து அரச நிறுவனங்களுக்கு பணியாளர்களைச் சேர்த்துக்கொள்வது வரையில் அரசியல்வாதிகளின் தலையீடுகள் தொடர்வதாகவே நாளாந்த ஊடகங்களில் செய்திகள் வெளியாகிக் கொண்டிருக்கின்றன. இவ்வாறான அரசியல் கலாசாரங்கள் மாற்றப்பட வேண்டும். எங்களைத் தெரிவு செய்கின்றவர்களாக எமது மக்களே உள்ளனர். எனவே, நாங்கள் எமது மக்களின் நலன்களிலிருந்தே தீர்மானங்களை எடுத்துச் செயற்பட வேண்டுமேயன்றி, எமது மக்களை மறந்துவிட்டல்ல என்பதனை நாம் நினைவில் இருத்திக்கொள்ள வேண்டும்.

கடந்த காலங்களில் எமது மக்களால் தெரிவு செய்யப்பட்டதன் பின்னர் அம்மக்களை மறந்து செயற்பட்ட பலர் இன்று தமது எதிர்கால அரசியல் இருப்பு தொடர்பில் சிந்திக்கவே இயலாத நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். இத்தகையவர்களால் எமது மக்களுக்கென ஏற்படுத்தப்பட்ட பயன்பாடுகள் எதுவுமற்ற நிலையில், வீணடிக்கப்பட்ட காலகட்டத்துக்குள் தள்ளப்பட்ட எமது மக்கள் வெறும் எதிர்பார்ப்புக்களை மட்டுமே சுமந்தவர்களாக இன்னமும் வாழ்ந்துவருகின்றனர். மக்களுக்கும் நாடாளுமன்ற உறுப்பினர் களுக்கும் இடையிலான சமூகக் கடப்பாட்டு இடைவெளியானது அதிகரித்துள்ள நிலையில், அம்மக்கள் சார்பில் தேர்ந்தெடுக்கப்பட்டு அனுப்பப்படுகின்ற பிரதிநிதிகள் என்ற வகையில் இந்தப் பிரதிநிதிகள் ஊடாக நிறைவேற்றப்பட வேண்டிய அம்மக்களின் தேவைகள், தீர்க்கப்பட வேண்டிய பிரச்சனைகள் என்பன தேங்கிக் கிடக்கின்ற நிலைமை யினையும் அவதானத்திற்கொள்ள வேண்டும். இத்தகைய நிலைமைகள் எமது மக்கள் மத்தியில் ஏற்படக்கூடாது என்பதற்காகவே ஈழ மக்கள் ஜனநாயகக் கட்சியினராகிய நாங்கள் எமது மக்கள் மத்தியிலேயே வாழ்ந்து வருகின்ற கொள்கையைத் தொடர்ந்தும் கடைப்பிடித்து வருகின்றோம். இந்தக் கொள்கை வழியானது, எமது மக்களையும் எமது மக்களது தேவைகள் மற்றும் பிரச்சினைகளையும் தெளிவுறப் புரிந்துகொள்வதற்கும் அந்தப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் எமக்கு உறுதுணையாக இருக்கின்றது.

இத்தகையதொரு நிலையில்தான் மீண்டும் வரக்கூடிய தேர்தல்களில் எமது மக்களின் வாக்குகளைப் பெறுவதற்காக இனவாதக் கருத்துக்கள் சம்பந்தப்பட்டவர்களால் மிகவும் இலகுவாக முன்னெடுக்கப்படுகின்றன. ஆனால், அவற்றினது பாரதூரமான விளைவுகள் பற்றி அக்கறை கொள்ளப்படாத காரணத்தினால் எமது மக்களிடையே அவ்விதமான மனிதாபிமானமற்ற கருத்தியல்கள் பதியப்பட்டு விடுகின்றன. இவ்வாறான நிலையில், இனவாதம் கதைத்து மக்களது வாக்குகளை ஒரு தரப்பினர் பெற்றுக்கொள்கின்ற நிலையில், அத்தரப்பினரைத் தோற்கடித்து எமது மக்களின் வாக்குகளைப் பெற எண்ணுகின்ற மற்றையை தரப்பினர் முன்னைய தரப்பினரைவிட அதிகளவில் இனவாதம் கதைக்கவே முற்படுகின்றனர். இந்த நிலை வடக்கில் மட்டுமன்றி, நாட்டின் ஏனைய பகுதிகளிலும் தொடர்ச்சியாக இடம்பெற்று வருவதால் யுத்தத்திற்குப் பின்னரான எமது நாட்டில் தேசிய நல்லிணக்கம் என்பது எமது மக்கள் மத்தியில் இன்னமும் அடிப்படைச் சாத்தியமற்ற விடயமாகவே இருந்துவருகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கைத் தீவில் பல தசாப்தங்களுக்கு மேலாகக் கூர்மையடைந்திருக்கும் பிரதான பிரச்சினையாக இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினையே இருந்துவருகின்றது. ஆனாலும், இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினையாகிய தமிழ் பேசும் மக்களின் அரசியலுரிமைப் பிரச்சினை என்பது இன்றுவரை தீராப் பிரச்சினையாகவே நீடித்துவருகின்றது. ஆட்சி அதிகாரங்களைக் கைப்பற்றுவதும் ஆட்சி மாற்றங்களை உருவாக்குவதும் தென்னிலங்கையின் பிரதான கட்சிகளின் அக்கறையாக இருந்துவருவதை நான் தவறென்று கூறவில்லை. எந்தவோர் அரசியல் தரப்புக்கும் இந்த விருப்பம் இருந்தேயாகும். அதேபோல், தமிழ் பேசும் மக்களின் அரசியலுரிமைப் பிரச்சினைக்குத் தீர்வு காணும் விடயத்திலும் அக்கறை காட்டப்பட வேண்டுமென்றே நான் விரும்புகின்றேன். தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் விடயத்தில் இனிவரும் காலத்தில் தமிழர் தரப்பிலிருந்து தவறுகள் ஏதும் நடக்காது என்றே நான் நம்புகின்றேன். இது குறித்து, விரைவில் ஒன்றுபட்ட உடன்பாட்டுக்கு வருமாறு நான் தமிழர் தரப்பில் உள்ள அனைத்துக் கட்சிகளுக்கும் பகிரங்க அழைப்பு விடுக்கத் தீர்மானித்திருக்கின்றேன். அரசியல் முரண்பாடுகளுக்கப்பால் தமிழ் பேசும் மக்களின் அரசியல் உரிமையென்ற பொது உடன்பாட்டில் அனைத்துத் தமிழ்க் கட்சிகளின் தலைமைகளோடும் நான் பேசவும் தயாராக இருக்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

இலங்கைத்தீவின் இறைமைக்கு எதிராக நான் எதையும் கேட்கவில்லை. ஆனாலும், அந்த இறைமைகள் தமிழ் பேசும் மக்களுக்கும் பகிரப்பட வேண்டும் என்பதையே நான் கேட்கின்றேன். பகிரப்படும் இறைமைகள் பறிக்கப்படக் கூடாது என்பதையும் அதில் மத்திய அரசின் தலையீடுகள் தவிர்க்கப்பட வேண்டும் என்பதையும் நான் வலியுறுத்த விரும்புகின்றேன். "மத்தியில் கூட்டாட்சி! மாநிலத்தில் சுயாட்சி!" இதுவே எங்கள் அரசியல் கோட்பாடு. அதை அடைவதற்கு நாம் தெரிவு செய்திருக்கும் வழிமுறை என்பது உங்கள் எல்லோராலும் ஏற்றுக்கொள்ளப்பட்டிருக்கும் ஒன்றாகும். 13வது திருத்தச் சட்டத்தை முழுமையாக அமுல்படுத்தி, அதை மேலும் பலப்படுத்தி, அதிலிருந்து முன்னோக்கிச் செல்வதே எமது விருப்பமாகும். இதுவே நடைமுறைச்சாத்தியமான அணுகுமுறையும் ஆகும். நான் கூறும் இந்த வழிமுறை ஊடாக இலங்கைத் தீவின் தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் திசை நோக்கி நாம் செல்ல முடியும். தமிழர் தரப்பிலிருந்து இன்று உரிமைக்குக் குரல் கொடுக்கும் நாம், அரசின் உறவுக்கும் கரம் கொடுக்கத் தயாராகவே இருக்கின்றோம். இவை வரலாறு எமக்குக் கற்றுத்தந்த பாடங்கள். இந்த அணுகுமுறை அடுத்துவரும் சந்ததிக்குத் தெரியாமல் போகலாம். ஆகவே, வரலாற்று அனுபவங்களின் ஊடாக நாம் எடுத்திருக்கும் நிலைப்பாடு எமது காலத்திலேயே வெற்றியாக்கப்பட வேண்டும். இல்லையேல், இனிவரும் தமிழ் பேசும் சந்ததி போதிய அனுபவமின்றி வேறு விதமாகச் சிந்திக்கும். அது மறுபடியும் எமது மண்ணில் இனக்குரோதங்களுக்கும் இன முரண்பாடுகளுக்கும் வித்திட்டுவிடும். ஆகவே, நீண்ட- நெடிய அனுபவம்மிக்க எமது காலத்திலேயே இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினைக்குச் சுலபமாகத் தீர்வு காணும் வாய்ப்பை நாம் பயன்படுத்த வேண்டும். தென்னிலங்கை அரசியல் தலைமைகளோ அன்றித் தமிழ் பேசும் அரசியல் தலைமைகளோ இந்தத் தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் பொறுப்பை அடுத்த சந்ததிக்குச் சுமத்திவிட்டுச் சென்றுவிடுவது மாபெரும் வரலாற்றுத் தவறாகும். இந்தத் தலைமுறையிலேயே நாம் அனைவரும் ஒன்றுபட்டுத் தீர்வு காணவேண்டும். சமாதானப் புறாக்களைக் கையிலேந்தி வந்தவர்கள் நாம்! எங்கள் கைகளில் உரிமைகளைத் தந்து கைகுலுக்கிக் கொள்ளுங்கள்!

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த அரசு ஆரம்பந்தொட்டு வலியுறுத்தி வருகின்ற தேசிய நல்லிணக்கம் குறித்த விடயத்தில் நாம் வெற்றிகாண வேண்டும். அதற்காக அரசியல் உரிமைப் பிரச்சினைக்கான தீர்வு உட்பட எமது மக்களின் உணர்வு ரீதியிலான பல பிரச்சினைகளுக்கான தீர்வுகள் காணப்பட வேண்டும். காணாமற்போனோரைக் கண்டறிவதற்கான உறவுகளின் போராட்டமானது கிளிநொச்சிக் கந்தசுவாமி கோவில் முன்றலில் ஆரம்பித்து, இற்றைக்குச் சரியாக ஒரு வருடம் பூர்த்தியாகின்றது. இந்த உறவுகளுடன் பேச்சுவார்த்தைகள் நடத்தப்படுகின்றனவே அன்றி, இதுவரையில் இவர்களது பிரச்சினைக்கு எந்தவொரு பதிலும் வழங்கப்படவில்லை. தங்களது சொந்தக் காணி - நிலங்களை விடுவிக்கக் கோரி, கேப்பாபுலவு மக்கள் இன்றுடன் 355 நாட்களாகப் போராடி வருகின்றார்கள். தமிழ் அரசியல் கைதிகளின் விடுதலை குறித்துச் சாத்தியமான ஏற்பாடுகள் இன்னமும் முன்னெடுக்கப்பட்டதாக இல்லை.

மீள்குடியேற்றப்பட்டுள்ள மக்கள் அடிப்படை வசதிகள்கூட இல்லாமை காரணமாகப் பல்வேறு பகுதிகளைவிட்டு வெளியேறுகின்ற நிலைமைகள் காணப்படுகின்றன. வலிகாமம் வடக்கு மக்களில் கணிசமான தொகையினர் இன்னமும் மீள்குடியேற்றப்படாத நிலையில், முகாம்களில் உள, உடல் ரீதியில் அனுபவித்து வருகின்ற துன்பதுயரங்கள் ஏராளமாகும். இந்த மக்கள் தங்களைப் பாதித்து வருகின்ற விடயங்களிலிருந்து மீள்வதற்காகவே தமது பிரதிநிதிகள் என்ற ரீதியில் வாக்களித்து, நாடாளுமன்றத்திற்கு உறுப்பினர்களை அனுப்பியுள்ளனர். அந்தவகையில், அந்த மக்களுக்கு உதவ முடியாதபோது நாடாளுமன்ற உறுப்பினர் பதவி என்பது தேவைதானா? என்கின்ற நிலையே எமது மக்கள் மத்தியில் உருவாகின்றது. இது நியாயமான நிலைப்பாடு என்பதில் சந்தேகமில்லை. மக்களிடம் பெறுகின்ற வாக்குகள் அந்த மக்களின் பணிகளுக்காக மாற்றீடு செய்யப்பட வேண்டும். அதனைச் சொந்த அரசியல் நலன்களுக்காக அல்லது கட்சி அரசியல் நலன்களுக்காக மாத்திரம் பயன்படுத்தப்படுகின்ற நிலைமைகள் எப்போது தவிர்க்கப்படுமோ, அப்போதுதான் எமது மக்களுக்கு விமோசனம் கிடைக்கும் என்பதை இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

இனவாதம் தூண்டப்பட்டு அதனால் பெறப்படுகின்ற மக்களது வாக்குகள் இன்னோர் இனத்தை அழிப்பதற்கே என அர்த்தப்படுத்திக்கொள்வது கொலைக்குச் சமமானது. வாக்குக் கேட்பவர்கள் எந்தளவுக்கு இனவாதத்தைக் கக்கி மக்களை உசுப்பேத்தினாலும் தூண்டினாலும் அம்மக்கள் திடீர் உணர்ச்சி மேலீட்டால் வழங்குகின்ற வாக்குகள் இன்னோர் இனத்தை அழிப்பதற்கானதாக இராது. தம் இனத்தைப் பாதுகாப்பதற்கான வாக்குகளாகவே அவை கருதப்படல் வேண்டும். அவ்வாறு ஓர் இனத்தைக் காப்பது என்பது அந்த இனத்தின் - மக்களின் அடிப்படை உரிமைகள் முதற்கொண்டு அரசியல் உரிமைகள் வரையிலான ஏற்பாடுகளைப் பெறுவதாகவும் பேணிப் பாதுகாப்பதாகவும் அமைதல் வேண்டும். இது இன்னோர் இனத்தின் மீதான இனவாதமாக இருக்க முடியாது. அந்த வகையில் இங்கு இனவாதமென்பது ஒருசிலரது சுயலாபம் கருதிய பேசுபொருளாக மாத்திரம் கொள்ளப்படுகின்றதே அன்றி, அது செயற்படுபொருளல்ல. இதனை நன்கு உணர்ந்துகொள்கின்ற நிலையில், எமது மக்களின் உணர்வுபூர்வமான பல்வேறு பிரச்சினைகளைத் தீர்த்துக்கொள்வதற்கு எந்தவொரு தரப்பினரும் தடையாக இருக்கப்போவதில்லை என்பதை இங்கு தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம், இத்தகைய குறுகிய இனவாதம் பேசித்தான் எமது மக்களின் வாக்குகளைப் பெறவேண்டும் என்ற கொள்கை ஈழமக்கள் ஜனநாயகக் கட்சியினராகிய எம்மிடம் இல்லை. எனவே, எமது வெற்றியானது மனிதாபிமானத்தைக் கொண்டது என்பதையும் தோல்விகள் இனவாதத்தை நோக்கியது என்பதையும் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

[අ.භා. 2.39]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කරලා, අලුත් ස්ථාවර නියෝග ඇති කිරීම පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ මෙම කාරණය පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව පළමු කොටම අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඉන් අනතුරුව කාරක සභා අවස්ථාවට පිවිසීම ඉතාම වැදගත්. එයට හේතුව අප විසින් ඉදිරිපත් කරන ලද කරුණු රාශියක් පිළිබඳව යළිත් සැලකිල්ලට ගැනීමට අපි බලාපොරොත්තු වන නිසායි.

පසුගිය කාල පරිච්ඡේදය තුළ -හැත්තෑ වසරක් තුළ- එනම් අපි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙන් නිදහස් වුණු දවසේ සිට අපේ ස්ථාවර නියෝග සකස් කරලා තිබෙනවා. ඒ, සෝල්බරි ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව, පළමුවැනි ජනරජ ව්‍යවස්ථාව හා දෙවැනි ජනරජ ව්‍යවස්ථාව යටතේ. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව මුල් පාර්ලිමේන්තුවට වඩා දෙගුණයකට වඩා වැඩි සංඛ්‍යාවක් දක්වා අද වනකොට පරිවර්තනය වී තිබෙනවා. මේ නිසා ස්ථාවර නියෝග සකස් කිරීමේදී පාර්ලිමේන්තුව කටයුතු කරන ආකාරය පිළිබඳව අලුතින් සිතීමට අවතීර්ණ විය යුතුයි. එසේ නැතිව අපි අනුකරණවාදී පිළිවෙතක් අනුගමනය කළොත් අපට ගැටලුවලට මුහුණ දෙන්න සිදු වනවා. මම ඒ සම්බන්ධයෙන් උදාහරණයක් කියන්න කැමැතියි.

පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව ගැන මෙහි සඳහන් වනවා. මෙහි අටවැනි කාරණයේ සඳහන්ව තිබෙනවා, බ්‍රහස්පතින්දා හා සිකුරාදා දිනවල දී පූර්ව භාග 10.30ට පාර්ලිමේන්තුවේ රැස්වීම් පටන් ගන්නවා කියලා. අනික් දිනවල අපර භාග 1.00ට පාර්ලිමේන්තු රැස්වීම් පටන් ගන්නවා. මේ කාරණා දෙක අතර කිසිම සාධාරණතාවක් නැහැ. ලංකාවේ සියලුම කාර්යාල උදේ පටන් ගන්නවා. මන්ත්‍රීවරු වැඩි වීම නිසා පාර්ලිමේන්තුවේ කටයුතු වැඩි වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවට පවරන කටයුතු පසුගිය ව්‍යවස්ථාවන් රාශිය තුළදී වැඩිවෙලා තිබෙනවා. රටට ආදර්ශයක් ලබා දෙමින් දැනට දවස් දෙකකට සීමා කර තිබෙන උදේ රැස් වී සවස විසිරී යෑම, සියලු දවස්වලට යොදා ගැනීම ඉතාම යෝග්‍ය යැයි කියා මා හිතනවා. ඒ තුළින් මහජන නියෝජිතයන් හැටියට වාගේම ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් හැටියට අපට තිබෙන වගකීම් රාශිය ඉෂ්ට කරන්න පුළුවන් වනවා.

පාර්ලිමේන්තුව ඉෂ්ට කරන කාර්ය භාරයේදී රජය හා විපක්ෂය කියලා දෙකක් තිබෙනවා. එය ඉතිහාසගතව පාර්ලිමේන්තු සම්ප්‍රදායයේ තිබෙනවා. පාර්ලිමේන්තුවේ කථානායකතුමාට පිටු පස්සේ දොරටුවෙන් තට්ටු කළත් "මට ඇසෙන්නේ නැහැ" කියලා කියපු දවසේ ඉඳලා පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ඇති වුණු බව ඔබතුමා දන්නවා. රජතුමාටවත් තට්ටු කළාට දොර ඇරියේ නැති පාර්ලිමේන්තුවේ ගැටුම තමයි අද දක්වා ශත වර්ෂ ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවතින්නේ. අදත් දෝංකාර දෙමින් පවතින්නේ එවැනි ගැටලුවක්. ආණ්ඩුවත්, විපක්ෂයත් අතර යම්කිසි කාරණාවක් පිළිබඳ සාකච්ඡා කිරීමට මහජන මන්ත්‍රීවරුන්ට තිබෙන අවකාශය පිළිවෙතකට සකස් කර දීමට ස්ථාවර නියෝග අවශ්‍ය වනවා.

මම තව උදාහරණයක් කියන්න කැමැතියි. අපි බලමු, Committee on High Posts ගැන. ගරු කථානායකතුමනි, මා කලිනුත් මේ ගැන කිව්වා. අපි යළිත් ඒ පිළිබඳව කියනවා. High Posts Committee එක ඇති කිරීමෙන් පස්සේ මේ පත් වීම් ලබන රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් එන්නේ එම ආයතනය විනාශ වුණාට පසුවයි. අපි ඒ නිසා මේ ස්ථාවර නියෝගය වෙනසකට භාජන කරන්න ඕනෑ. මෙය United States Congress එකෙන් ගත් දෙයක්. ඔවුන් පත් වීම ලැබුවාට පස්සේ ඉක්මනට ඇවිල්ලා එම කාරක සභාව ඉදිරියේ පෙනී සිට, ඔහු එම පත්වීමට සුදුසුද නැද්ද, ඔහුට ඒ සඳහා හැකියාවක් තිබෙනවාද නැද්ද, ඔහු සම්බන්ධයෙන් මහජන පෙත්සම් තිබෙනවාද නැද්ද කියලා සොයා බලා ඉක්මනින් එය අනුමත කර දීම වඩා සුදුසුයි. පත්වීම් ලබා අවුරුද්දක් විතර ගත වී ඒ ආයතනය විනාශයට පත් වුණාට පස්සේ මේ අය ගෙන්වීමේ කාර්යයට තමයි අද අපි ගොදුරු වෙලා සිටින්නේ. එහි ඵල විපාක තමයි වෙනත් ආකාරයේ කොමිෂන් සභා, කමිටු, විගණකාධිපති වාර්තා හරහා එන්නේ. නමුත් මේ මහජන ආයතන, මහජන දේපළ, මහජන මුදල්.

මම මේ කාරණා ටික ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ පිළිබඳ සාකච්ඡා කළ අවස්ථාවලදී අපි මෙවැනි කරුණු රාශියක් ඉදිරිපත් කළා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ විධියට තිබෙනවා. දැනුත් තිබෙන විවාදය ඒකයි. පළාත් පාලන මැතිවරණයක් පැවැත්තුවා. ගරු කථානායකතුමනි, ඔබතුමායි, මමයි මේ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඒ කාලයේ ඉඳලා දිගටම කරපු උත්සාහයේ ප්‍රතිඵලයක් හැටියට ඡන්ද ක්‍රමය වෙනස් කළා. රවුන් හකීම් ඇමතිතුමා සමඟ මම එකඟ වෙන්නේ නැහැ. ඡන්ද ප්‍රතිඵලයෙන් පස්සේ දැන් එතුමා කියනවා, නැවත පරණ ක්‍රමයට යන්න ඕනෑ කියලා. නැහැ, අපි ඇති කරපු ඡන්ද ක්‍රමය ඉතා හොඳට සකස් වෙලා, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව තුළ ඒකඡන්දයෙන් සම්මත වුණා. ජය පරාජය කෙසේ වුණත්, ඒ සම්මත කරපු පනතට, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙත උල්ලංඝනය කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කියන ලද කරුණු උල්ලංඝනනය කරමින් පාර්ලිමේන්තුව හදිසියේ සම්මත කළ වගන්ති රාශියක් නිසා -විවිධ කැලි හදිසියේ එකතු කිරීමේ ප්‍රතිඵලය නිසා- පළාත් පාලන ආයතනත් අද අර්බුදයකට මුහුණ දෙනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුගමනය කරන්න ඕනෑ. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග එලෙස සකස් කරගන්නට ඕනෑ. ඒ වාගේම, දුර්වලතා තිබෙන තැන් ශක්තිමත් කරන්නට ඕනෑ. වැරදි ආකාරයේ කටයුතු කරන්න කුමන අවස්ථාවක හෝ ඉඩක් නොලැබෙන ආකාරයට ඒවා සකස් විය යුතුයි කියා සඳහන් කරන්න කැමැතියි.

අග්‍රාමාත්‍යවරයා පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන වගන්තිය තමයි, "පාර්ලිමේන්තුවේ බහුතරයක් දිනාගත හැකි පුද්ගලයා අග්‍රාමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ" කියන වගන්තිය. විරුද්ධ පක්ෂයේ නායකයා පත් කරනකොට එහෙම වගන්තියක් නැහැ. දැන් ඒවා වෙනස් වෙන්න ඕනෑ. ඒකයි අපි සාධාරණව කියන්නේ. පුද්ගලයෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු 55දෙනෙක් මෙතැන ඉන්නවා. ඊට වඩා ඉතාම අඩු සංඛ්‍යාවක් තමයි විපක්ෂයේ නායකතුමා සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නියෝජනය කරන්නේ. කොහොමද, ඒක සාධාරණීකරණය කරන්නේ? දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ව්‍යවස්ථා මණ්ඩලයක් පත්වෙනවා. ඔබතුමා තමයි එහි සභාපති. ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු කරන්නේ විපක්ෂය; විරුද්ධ පක්ෂයේ නායකයා. නමුත්, විරුද්ධ පක්ෂයේ නායකයාගෙන් විරුද්ධ පක්ෂය නියෝජනය වෙන්නේ නැහැ. ඒ නිසා සංඛ්‍යා ලේඛන බැලීම නොවෙයි වඩා හොඳ. "පාර්ලිමේන්තුවේ බහුතරයක් දිනාගත හැකි කෙනා අග්‍රාමාත්‍යවරයා විය යුතුයි" යන වගන්තිය වගේ වගන්තියක්, ඒ කියන්නේ, "විරුද්ධ පක්ෂයේ බහුතරය නියෝජනය කරන කෙනා විපක්ෂ නායක විය යුතුයි" කියන වගන්තිය ඇතුළත් කිරීම ඉතාම වැදගත්. අද මොන ප්‍රශ්න තිබුණත් අපි මේ යථාර්ථයට පැමිණිය යුතුයි. යථාර්ථයට පැමිණෙන්නේ නැත්නම් අපි මෙම ස්ථාවර නියෝග ඇති කළත්, මහ ජනයා එය සැලකිල්ලට භාජන කරන්නේ අපි මහ ජනතාවට නොසලකනවාය, ජනතා නියෝජිතයන්ට නොසලකනවාය යන හැඟීම ඇතිවයි. අපි හිතනවා නම්, ජනතාව තුළ එහෙම එකක් නැහැ කියලා, ඒක වැරැදියි. මොකද, අවුරුදු කිහිපයක් රට පාලනය කරපු අයට දැන් ජනතාවගෙන් කෙළින් තීන්දුවක් ලැබුණා. ඒ ජනතා තීන්දුව පළාත් පාලන මැතිවරණයේදී ලැබුණත්, පළාත් පාලනයටත් වඩා ජාතික වූ මැතිවරණයක් හැටියට පරිවර්තනය වීමෙන් ඇති කළ ප්‍රතිඵලයයි එයින් කියාපාන්නේ. ජනතාව කියන දේට අපි සවන් දෙන්න ඕනෑ. අපි සවන් නොදී ඇති කරන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට තව සුළු කාලයයි වෙන්ව තිබෙන්නේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මේ වාගේ කරුණු රාශියක් තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සාකච්ඡා කරලා මේ විධියට සුළු වශයෙන් හෝ වෙනසකට භාජන විය යුතු කාරුණු රාශියක් ඉදිරි දවස් තුළදී ඔබතුමාට ලිඛිතව භාර දෙන්න බලාපොරොත්තු වෙනවා. එයින් පසු ඒ පිළිබඳව කාරක සභාවක් පවත්වලා, කාරක සභා අවස්ථාවට පිවිසීමේ කාර්ය සිදු කරන ලෙස අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ආරම්භයේ සිට අපි ඉල්ලා සිටියා, මහජන මන්ත්‍රීවරුන්ට අවශ්‍ය උපදේශක කාරක සභාවන් දිගටම පවත්වාගෙන යන්න කියලා. අද වන විට ආණ්ඩුව එකඟවෙලා තිබෙනවා; -මෙතෙක් කල් එකඟ වුණේ නැහැ- අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟ වුණා, උපදේශක කාරක සභා යළි ඇති කරන්න. මේ සම්බන්ධව ඇති කරපු කාරක සභාවලට අතිරේකව මේ කාරක සභාවන් ඇති කිරීම සඳහා වූ කාර්යයේ වැදගත් වෙනස වන්නේ, උපදේශක කාරක සභාව සඳහා අමාත්‍යවරයා සිටිය යුතු වීමයි, ගරු කථානායකතුමනි. අමාත්‍යවරයා නොමැතිව නිලධාරීන් හා ආයතන ගන්නා වූ තීරණ ක්‍රියාත්මකවෙලා නැති නිසාත්, මහජන මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් ඉෂ්ට වෙලා නැති නිසාත් තමයි මේ ප්‍රශ්නය වඩාත් මතු වී තිබෙන්නේ. එම නිසා මේ ගැන සැලකිලිමත් විය යුතුයි.

අනික් කාරණය තමයි, මන්ත්‍රීවරුන් සභාවෙන් පිට කිරීම. මන්ත්‍රීවරුන් සභාවෙන් පිට කිරීමේ වගන්තිය සංශෝධනය වනවා. සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව තහනම් කර සභාවෙන් පිට කරන්නේ එක් කෙනා, එක් කෙනා වශයෙනුයි. නමුත් මට පෙනෙන විධියට මේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කරලා තිබෙනවා, මන්ත්‍රීවරුන් තොග වශයෙන් පිට කිරීමේ වගන්තියක්. ඒක කාලෝචිත නැහැ. එයින් අදහස් කරන්නේ කුමක්ද? එක් මන්ත්‍රීවරයකු පිට කරන්න හැකියාව තිබෙනවා නම්, 10 වරකට 10 දෙනකු පිට කරන්න පුළුවන්. නමුත් 10 දෙනාම එකට පිට කරන්න එකම කාරණය නොවෙන්න පුළුවන්. මෙය බරපතළ කාරණයක්. මහ ජනයා වෙනුවෙන් කරුණු කියන්න, තර්ක කරන්න, වාද කරන්න මහජන මන්ත්‍රීවරයකුට තිබෙන අයිතිය -යම් යම් අවස්ථාවලදී ඒවා ගැටුම්කාරී වාද බවට පත් වන්න පුළුවන්. ඒ මන්ත්‍රීවරයාට කරුණක් පාර්ලිමේන්තුවට කියන්න තිබෙන අයිතිවාසිකම- මෙලෙස මන්ත්‍රී කණ්ඩායමකට යටපත් කිරීමේ ක්‍රියාවලියකට පත් කිරීම සඳහා ස්ථාවර නියෝග සකස් විය යුතු නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධව ඇති කරන වෙනස්කම් ගැන අපේ අදහසුත් පළ කළා. තව අදහස් කිහිපයකුත් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍ර විනිශ්චයකාර නෙවිල් සමරකෝන් මහතා මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් ඔහුව ඉවත් කිරීම සඳහා වූ කාරක සභාවේ මන්ත්‍රීවරුන් හැටියට සරත් මුත්තෙට්ටුවෙගම මැතිතුමාත්, මමත්, "අනුගමනය කළ යුතු පිළිවෙත" කියලා අදහස් මාලාවක් ඉදිරිපත් කළා. එය තවමත් පාර්ලිමේන්තු වාර්තාවේ තිබෙනවා. ඒ පිළිවෙත් අනුගමනය කරන්න, ඒ වෙනස්කම් කරන්න ඉඩ ලැබුණේ නැහැ. මේ තත්ත්වය ගැන දැන් ඇති වී තිබෙන සාකච්ඡාව පොදු එකඟතාවකට පරිවර්තනය වන සාකච්ඡාවක් බවට පත් කළොත්, මා හිතන හැටියට ඒ තුළින් පාර්ලිමේන්තුවට රටේ ජනතාවගේ තිබෙන ගෞරවය තහවුරු කර ගැනීමට හැකි වීම හා මන්ත්‍රීවරුන්ට කටයුතු කිරීම වඩාත් පහසු වනවා. ඒ පිළිබඳව ලිඛිතව අදහස් ඉදිරිපත් කරන්න ඔබතුමා අපට තවත් කාල වේලාව දී තිබෙනවා. ඒ පිළිබඳව අපි ඉදිරිපත් කරන කරුණු සැලකිල්ලට ගනියි කියලා අපි බලාපොරොත්තු වනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත. අද මේ විවාදය සවස 4.00 දක්වා පැවැත්වීමට අපි බලාපොරොත්තු වනවා.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES took the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ajith Mannapperuma, you may start your speech.

[අ.භා. 2.52]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, දැන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවෙලා තිබෙනවාය, පාර්ලිමේන්තු රැස්වීම් අඟහරුවාදා සහ බදාදා දිනවලදී සවස 1.00ටත්, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවලදී උදේ 10.30ටත් ආරම්භ වනවාය කියලා. නමුත් හැම දාම උදේ 10.30ට රැස්වෙන්න කියලායි එතුමා යෝජනා කළේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වැඩි වුණේ මේ ආණ්ඩුව තිබුණු කාලයේ නොවෙයි. එදා ඉඳලාම මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවෙලා තිබුණා. ඒ කාලය තුළ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට කර ගන්න බැරි වුණු දේ මේ රජය ලවා කර ගැනීම තුළත් සතුටු වන්න පුළුවන් කාරණයක් තිබෙනවා. මොකද, එතුමන්ලා කියන දේ එදා ජනාධිපතිවරයා ඇහුවේ නැහැ. අද අපට කියනවා, අවුරුදු 20ක් රට පාලනය කරලාත් කර ගන්න බැරි වුණු දේ කරලා දෙන්න කියලා.

ඒ විතරක් නොවෙයි. එතුමා හැම තිස්සේම උත්සාහ කරන්නේ පසුගිය පළාත් පාලන මැතිවරණය අගමැති තෝරන මැතිවරණයක් කර ගන්නයි. හැම දාම ජනතාව මුළාවට පත් කරන දේ තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම කළේ.

එදා විදුලි පුටුවක් පෙන්න-පෙන්නා ඡන්දය ඉල්ලුවා. එක පාරක් ජනතාව රැවටුණා. දෙවැනි වතාවට ජනතාව රැවටුණේ නැහැ. අද වෙන කල් අපට ඒ විදුලි පුටුව හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම මෙතුමන්ලා, 'මහින්ද අගමැති කරමු' කියලා තමයි ඡන්ද ව්‍යාපාරය ගෙනිව්වේ. ගමේ ජනතාව මහින්දත් එක්ක සංසන්දනය කළේ, අපි දාපු ගුරුවරයායි; එහෙම නැත්නම් අපි දාපු වෛද්‍යවරයායි; එහෙම නැත්නම් අපි දාපු සමාජ සේවකයායි. එහෙම කරලා මහින්දව අගමැති කරන එක හොඳයි, මේ ඉන්න ගුරුවරයාව අගමැති කරනවාට වඩා; මේ ඉන්න සමාජ සේවකයාව අගමැති කරනවාට වඩා කියලා හිතාගෙන ජනතාව කතිරය ගැහුවා. බලපුවාම මහින්ද අගමැති වෙන්නේත් නැහැ. අන්තිමට

පිස්තෝලකාරයෙක්, කිණිසිකාරයෙක්, කුඩුකාරයෙක් තමයි ගමේ දේශපාලනය කරන්න, ගමෙන් මතු වෙලා තිබෙන්නේ. ජනතාව ගොනාට අන්දපු දේ නැවත කරන්න එපා. දිගින් දිගටම කරන්නේ ලොකු බරපතළ වැරැද්දක්. එදා, 'විදුලි පුටුව' ගැන කිව්වා වාගේ ඔය කථාව ඔවුන්ට ආපහු කියන්න බැරි වෙයි. නමුත්, ඊළඟ මැතිවරණයේදීත් ජනතාව ගොනාට අන්දවන්න තවත් උප්පරවැට්ටියක් ලැහැස්ති කරගෙන එයි.

මහින්ද අගමැති කරනවාද, ගමේ වෘත්තිකයා අගමැති කරනවාද එහෙම නැත්නම් මහින්ද අගමැති කරනවාද, ගමේ ඉන්න සමාජ සේවකයා අගමැති කරනවාද කියලා තීරණය කරපු ගමේ ජනතාවට අන්තිමට වෙන්නේ මොකක්ද? මහින්ද අගමැති වෙන්නේ නැහැ. අර කොහේවත් ඉන්න කුඩුකාරයෙක්, මංකොල්ලකාරයෙක්, තක්කඩියෙක් තමයි ගමේ මන්ත්‍රීවරයා වෙලා තිබෙන්නේ කියන එක ජනතාව තේරුම් ගත්තාම ඔය ගෙනයන ජනතා ව්‍යාපාරයට මොකක්ද වෙන්නේ කියන එක අපට හිතාගන්න පුළුවන්. ඒ වාගේම එතුමා හැම දාම කියනවා, "ඒකාබද්ධ විපක්ෂයෙන් මන්ත්‍රීවරුන් 40 ගණනක් ඉන්නවා. ඒක තමයි ලොකුම විපක්ෂය. ඒක හින්දා ඒකට විපක්ෂ නායකකම දෙන්න ඕනෑ" කියලා. මම හිතනවා, ඒකෙනුත් කරන්නේ ජනතාව නොමඟ යැවීමක් කියලා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් ඒ තරම් අඥාන නැහැ. මොකද, 'ඒකාබද්ධ විපක්ෂය' කියලා කණ්ඩායමක් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා නැහැ. මේක ඇතුළේ කල්ලියක් හදාගෙන, ඒ ගොල්ලන්ම 'ඒකාබද්ධ විපක්ෂය' කියලා නම් කරගෙන ඒකට විපක්ෂ නායකකම ඉල්ලනවාය කියන එකත් විහිළුවට කාරණාවක් වෙනවා. මොන චර්යා ධර්ම පද්ධතිය හැදුවත් මේ වාගේ විහිළුකාරයන්ව, මේ වාගේ ජනතාව රවටටන අයව කොහොමද හදන්නේ කියන එක විශේෂයෙන්ම හිතන්න වෙනවා.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මන්ත්‍රීවරුන් අතුරු ප්‍රශ්න තුනක් අහන එක ගැන. එතුමා ප්‍රශංසා කළා, "ස්ථාවර නියෝග වෙනවස් වීම හොඳයි. ඒ වාගේම යම් තරමින් හෝ මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම හොඳයි" කියලා. නමුත් එතුමාට ප්‍රශ්නයක් තිබුණා, ඇමතිවරයෙකුගෙන් තමුන් ඇසූ ප්‍රශ්නය පැහැදිලි කරගැනීම සඳහා මන්ත්‍රීවරයෙකුට අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට තිබූ අවස්ථාව අතුරු ප්‍රශ්න දෙකට අඩු කිරීම සම්බන්ධයෙන්. මේ පාර්ලිමේන්තුවේ අපට තිබුණු අත් දැකීම් අනුව දන්නා දෙයක් තමයි, ඇත්තටම තුන්වැනි අතුරු ප්‍රශ්නය බොහෝ විට අහන්නේ වැඩක් නැති දෙයක් ගැන කියන එක. ප්‍රශ්නයක් අහලා ඒක පැහැදිලි කර ගන්න බොහෝ විට අතුරු ප්‍රශ්න තුනක් මන්ත්‍රීවරුන්ට නැහැ. තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ, කඩාකප්පල්කාරී නැත්නම් කාවහරි අපහසුතාවට පත් කරන ප්‍රශ්නයක්; එහෙම නැත්නම් 'කොහේද යන්නේ - මල්ලේ පොල්' වාගේ ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමන්ලාගේ, පාර්ලිමේන්තුවේ වටිනා කාලය තුන්වැනි අතුරු ප්‍රශ්නයක් වෙනුවෙන් වැය කරන එකත් සුදුසු වෙන්නේ නැහැ කියන එකයි මේ පාර්ලිමේන්තුවේ අවුරුදු තුනක, හතරක අපට තිබෙන අත් දැකීම් එක්ක බැලුවාම තේරෙන්නේ. ඒ ප්‍රශ්නය වැදගත් විධියට අහනවා නම් කමක් නැහැ. සමහර විට ඒක සුදුසු වෙන්න පුළුවන්. නමුත් අපි අත් දැකීම් තුළින් දැකපු දෙයක් තමයි, ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඒක පැහැදිලි කර ගැනීමට නොවෙයි අතුරු ප්‍රශ්න තුනම අහන්නේ කියන එක. ප්‍රශ්නයක් අහලා ඒ ප්‍රශ්නය පැහැදිලි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න දෙකකට සීමා වීම කාලෝචිතයි කියන එකයි මම කියන්නේ.

මේ රටේ ඉතිහාසයේ කවදාවත් නැති විධියට ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න තුනක් ඇසීමේ අවස්ථාව මේ රජය යටතේ ලබා දීලා තිබෙනවා. මේ ප්‍රජාතන්ත්‍රවාදී ගමන් මහම අපට පාරාවළල්ලක් වුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අගමැතිතුමාගෙන් සෘජුව මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න තුනක් ඇසීමේ කාලය මේ රටේ ඉතිහාසයේ කිසිම දවසක තිබුණේ නැහැ. ඒක අපි ඇති කළා. ආංශික අධීක්ෂණ කාරක සභා හරහා අමාත්‍යාංශය පිළිබඳව සොයා බලන්න මන්ත්‍රීවරුන්ට භාර දුන්නා; විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් භාර දුන්නා. "කෝප්" කමිටුව වාගේ එකක සභාපතිකම විපක්ෂයට භාර දුන්නා. ඒ භාර දීපු එකෙනුත් සමහර වෙලාවට අවශ්‍ය දේ වුණාද කියන එකත් ප්‍රශ්නයක්. අන්තිමට මඩ ගැහිල්ලකට ඒ කමිටුවේ සභාපතිකම පාවිච්චි කළාද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුව කොච්චර හොඳ ගමනක් යන්න උත්සාහ කළත්, ඒ හොඳකම අපට පාරාවළල්ලක් වෙලා තිබෙනවා.

ඒ නිසා මේ ගැන හිතන්න ඕනෑ; සැලකිල්ලට ගන්න ඕනෑ. මොකද, යහ පාලනයක් ඇති කරලා, චර්යා ධර්ම පද්ධතියක් ඇති කරලා, ස්ථාවර නියෝග නැවත සංශෝධනය කරලා අපි උත්සාහ කරන්නේ හොඳ රටක් හදන්නයි. නමුත්, බොහෝ අය මේ කරුණු පාවිච්චි කරන්නේ තමන්ගේ පක්ෂය ශක්තිමත් කර ගන්නයි; තමන්ගේ පක්ෂය ජනප්‍රිය කර ගන්නයි. ඒක යහ පාලනයට, යහ පාලනය අගය කරන අයට බෙදනීය අවස්ථාවක්, පහරක් කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම 2015 ජනවාරි 08වැනි දා අපි දීපු එක පොරොන්දුවක්. ඊට පස්සේ ඒ ගැන කෙමෙන් කෙමෙන් සාකච්ඡාවට බඳුන් වුණා. විශේෂයෙන් ගරු කථානායකතුමා විපක්ෂයේ ඉන්න කාලයේ පවා කථා කළා, මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් සකස් කරන්න ඕනෑය කියලා. ගරු අගමැතිතුමාගේත්, ගරු ජනාධිපතිතුමාගේත් මහ පෙන්වීම තුළ සහ අපේ ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාගේ විශේෂ අවධානය තුළ අපට අද මේ වාර්තාව එළිදක්වන්න පුළුවන්කම ලැබුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විවාද කරලා සැලකිල්ලට ගැනීම විශේෂයෙන් යහ පාලනය බලාපොරොත්තු වන මේ රටේ ජනතාවට, 2015 ජනවාරි 08වැනි දා විප්ලවයට එකතු වුණු ජනතාවට සුවිශේෂී අස්වැසිල්ලක් වෙනවා ඇතැයි කියා අපි හිතනවා.

2015 ජනවාරි 08වැනි දා මේ රජය පිහිටුවන කොට මේ රටේ ජනතාවට අපි පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු කිසිවක් අප අමතක කරන්නේ නැතිව කෙමෙන් කෙමෙන් ඉටු කරමින් යනවා. මොකද, ඒකාධිපති පාලනයක් යහ පාලනයට වෙනස් කරන්න එක ලෙහෙසි වැඩක් නොවෙයි. ඒකට ගල් මුල් ප්‍රහාර එනවා; විවිධ මැර ප්‍රහාර එනවා; විවිධ චෝදනා එල්ල වෙනවා. නමුත්, අපි ජනතාවට දුන් පොරොන්දු අමතක නොකර ක්‍රම ක්‍රමයෙන් ඒවා ඉටු කරන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව කියන්නේ රටේ තිබෙන උත්තරීතර ආයතනය. මේ ආයතනයට විවිධ පුද්ගලයන් එනවා මන්ත්‍රීවරුන් බවට පත් වෙලා. සමහර විට ඒ අය උගත් පිරිස නියෝජනය කරන අය වෙන්න පුළුවන්; නූගත් පිරිස නියෝජනය කරන අය වෙන්න පුළුවන්; කෘෂිකර්මයේ යෙදෙන අය නියෝජනය කරන අය වෙන්න පුළුවන්; කම්කරුවන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; එහෙම නැත්නම් වෛද්‍යවරුන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; විවිධ වෘත්තිකයන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; විවිධ සමාජ ස්ථර නියෝජනය කරන අය වෙන්න පුළුවන්. ඒ විවිධත්වය තුළ තමයි මේ පාර්ලිමේන්තුවේ වටිනාකම තිබෙන්නේ. නමුත්, කෙනකු කියනවා නම් ඉගෙන ගත්තු අයගෙන්ම මේ පාර්ලිමේන්තුව පිරිලා ඉන්න ඕනෑය කියලා, මේ පාර්ලිමේන්තුවේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වටිනාකමක් නැහැ. මේ 225 දෙනා විවිධ අදහස් දක්වන, විවිධ සමාජ ස්ථර නියෝජනය කරන පුද්ගලයන්ගෙන් සමන්විත වන විටයි පාර්ලිමේන්තුවේ වටිනාකම තිබෙන්නේ. මේ මන්ත්‍රීවරුන්, විවිධ ඇදහිලිවල, විවිධ විශ්වාසවල, විවිධ සංස්කෘති තුළ විවිධ ප්‍රදේශවලට නායකත්වය දරන අය. මේ පාර්ලිමේන්තුව තුළ ඒ අයගේ හැසිරීම් රටාව දිහාව බලලා ඒ අයගේ ප්‍රදේශ ගැන රටේ මිනිස්සු තීරණය කරනවා. ඒ ප්‍රදේශය මෙවැනි ප්‍රදේශයක් කියන එක ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයාගෙන් කැඩපතකින් වාගේ පෙනෙනවා.

ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනාම එකතු වෙලා කරන කථා බහ අනුව, කරන වැඩ කටයුතු අනුව, හැසිරීම් රටාව අනුව තමයි ලෝකය ලංකාව මනින්නේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැසිරෙන ආකාරය අනුව තමයි ලෝකය මේ රට දිහා බලන්නේ. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කරන එක අපි විශේෂයෙන්ම අගය කළ යුතුයි.

සමහර අය රට හදන්න කියලා, ගම හදන්න කියලා පාර්ලිමේන්තුවට ආවාට, තමන්ගේ පක්ෂය තුළ ඉස්මතු වෙන්න දහලන අවස්ථා අපි දැකලා තිබෙනවා. එහෙම නැත්නම්, එකම පක්ෂයේ හිටියත් මනාප ක්‍රමය තුළ වඩාත් ඉස්මතු වෙන්න චර්යා ධර්ම පද්ධති කඩාගෙන කටයුතු කළ අවස්ථා අප දැකලා තිබෙනවා. නමුත්, මේ දේවල්වලින් හැල්ලුවට පත් වෙන්නේ රටයි. එහෙම නැත්නම් රටේ උත්තරීතර ආයතනය වන මෙම ආයතනයයි.

ගරු අග්‍රාමාත්‍යතුමාටත්, අනිගරු ජනාධිපතිතුමාටත් වාගේම මේ යෝජනා ගැන විශාල උනන්දුවක් දැක්වූ ගරු කථානායකතුමාටත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළට මේ චර්යා ධර්ම පද්ධතිය ඇතුළත් කරලා ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීමේ ඉහළම තලය නිර්මාණය කිරීමට, සකස් කිරීමට ගත්ත පියවර ගැන.

අද වන කොට මන්ත්‍රීවරයකු කිව්වාම සමහර වෙලාවට චාරයක් නැති පුද්ගලයකු, හොරෙකු, වංචාකාරයකුය කියන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙමත් නැත්නම් පාර්ලිමේන්තුව කියන්නේ මොන්ටිසෝරියක්ය කියන තැනට පත් වෙලා තිබෙනවා. මේක එක දවසකින් වුණු දෙයක් නොවෙයි. කාලයක සිට ක්‍රම ක්‍රමයෙන් ඒ තැනට මේ පාර්ලිමේන්තුව පත් වුණා. නමුත්, එහි හැරවුම් ලක්ෂ්‍යයක් වශයෙන් අද මේ ගන්නා තීන්දුව, අද මේ සාකච්ඡා කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සම්මත කරලා මේ රටේ ගමන් මාර්ගය වෙනස් කිරීමට ගන්නා උත්සාහය විශේෂයෙන්ම අගය කරනවා.

යහ පාලනය කියන කොට චර්යා ධර්ම සංග්‍රහය විශේෂයෙන්ම සඳහන් වෙන්න ඕනෑ; අගය කරන්න ඕනෑ. හිටපු ජනාධිපතිවරයාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් සාක්ෂියක් දෙන්න කිව්වාම, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු බුදියා ගත්ත හැටි අපි දැක්කා. ඒක ලෝකයම දැක්කා. ඒ නිසා අපේ පාර්ලිමේන්තුව කොච්චර හැල්ලුවට ලක් වුණාද?

ඒ වාගේම, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා 1993දී ගොවිජන සේවා පනත ගැන මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරද්දී, එවකට ආණ්ඩු පක්ෂයේ හිටපු ඇමතිවරයෙක් එතුමාට පෙරළා ගෙන ගැහුවා. අද ඒ දෙගොල්ලෝම එක්කාසු වෙලා ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නවා. එවැනි ඉතිහාස අපට තිබෙනවා.

පසුගිය දවස්වල මන්ත්‍රීවරු හැසිරුණු විලාශය, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය අපි දැක්කා; ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දීපු හැටි දැක්කා. ඒ අය හැසිරුණු විලාශය මුළු රටම දැකගත්තා. මේවා පිළිකුලට ලක් වෙනවා. එහෙම පිළිකුලට ලක් වෙන්නේ එක මන්ත්‍රීවරයෙක් නොවෙයි, සමස්ත මන්ත්‍රීවරුන්ම පිළිකුලට ලක් වෙනවා. පාර්ලිමේන්තුව විතරක් නොවෙයි පිළිකුලට ලක් වෙන්නේ. ලෝකය ඉදිරියේ මුළු රටම පිළිකුලට ලක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමාට අපේ මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා පහර දීපු හැටි අපි දැක්කා. ඒ වාගේම, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් බෑන් කී මූන් මහත්මයා මේ රටට ආවා. ආණ්ඩුව වීසා දෙනවා බෑන් කී මූන් මහත්මයාට මේ රටට එන්න කියලා. එතුමා ආපුවාම එතුමාට විරුද්ධව ඇමතිවරයෙක් ගිහිල්ලා පාරේ බුදියා ගත්තවා. ඒ නිසා අපි හැල්ලු වෙලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානයේ මහ කොමසාරිස්තුමිය වන නවනීදන් පිල්ලේ මැනිනියට වීසා දීලායි මේ රටට ගෙන්වා ගත්තේ. එහෙම ආරාධනා කරලා ගෙන්වා ගත්තාම ඇමතිතුමෙක් ගිහිල්ලා, "මම කැමැතියි ඔයා කසාද බඳින්න" කියලා මඟුල් යෝජනා කරනවා. එවැනි දේ නිසා රට කොපමණ අපහසුතාවකට පත් වුණාද?

මේ රටේ බුද්ධිමතුන් මේ රට හැර දාලා ගියා. පාර්ලිමේන්තුවේ සංස්කෘතියක් නැත්නම්, රටේ ප්‍රධාන ස්ථානයේ සංස්කෘතියක් නැත්නම්, ඒක නියෝජනය කරන මන්ත්‍රීවරයාගේ සංස්කෘතියක් නැත්නම්, අපට කොහෙන්ද සංස්කෘතියක් තිබෙන්නේ, අපට කොහොමද රටේ සාධාරණයක් ඉෂ්ට වෙන්නේ කියලා මේ රටේ උගතුන්, බුද්ධිමතුන් රට හැර දමා ගිය කාලයක් තිබුණා. ලංකාව දිහා ලෝකය බලන කොට මිලේච්ඡ රටක්, ගෝත්‍රිකයන් ඉන්න රටක් කියන හැඟීම තුළ මේ රටට තිබුණු වාසි අහිමි වෙලා ගියා. GSP plus වාගේ සහන මේ රටට නැති වෙලා ගිහිල්ලා අපේ රටේ රැකී රක්ෂා ප්‍රශ්න ඇති වුණා. එදා ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා 200ක් මේ රටේ හදලා ගමේ ඉන්න තරුණ තරුණියන්ට රැකී රක්ෂා හදලා දුන්නත්, මෙවැනි මන්ත්‍රීවරුන් තුළ තිබුණු සංස්කෘතිය නිසා ඒවායින් 180කට වැඩි ප්‍රමාණයක් වැහිලා ගියා.

ඒ විතරක් නොවෙයි, ධීවරයන්ට තිබුණු ලොකුම දෙයක් වූ, අපේ රටෙන් යුරෝපයට මත්ස්‍ය අපනයනය කිරීමට තිබුණු අවස්ථාව තහනම් වුණා. එමඟින් රටේ ආර්ථිකය කඩා වැටුණා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට චර්යා ධර්ම සංග්‍රහයක් ඇති කරලා, රටට කීර්තියක් වෙන විධියට හැසිරෙන විලාශය ගැන දැනුවත් කිරීම අද ආරම්භ කිරීම ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා.

මේ සියලු වැරදි කරපු මන්ත්‍රීවරු, වැරදි කරපු ඇමතිවරු වැරැද්ද කරලා උසාවියට යනවා. වැරැද්ද කරලා පොලීසියට යනවා. ගිහිල්ලා කටඋත්තර දෙනවා. පසුව, වීරයෝ වාගේයි, වීර කැප්පෙටිපොළලා වාගේයි එතැනින් එළියට එන්නේ. කට්ටිය මල් මාලා දමලා ඒ අය පිළිගන්නවා. නීතිය ක්‍රියාත්මක කරන පොලිස් නිලධාරියාට පහර දීපු කෙනාට මල් මාලා දමලා උස්සා ගෙනයි අරගෙන යන්නේ. අන්න ඒ සංස්කෘතිය මේ රටේ නැති කරන්න වෙනවා. මන්ත්‍රීවරුන්ට චර්යා ධර්ම සංග්‍රහයක් ඇති කළා වාගේ රටටත්, රටේ ජනතාවටත් කවුද ගැළපෙන කෙනා, කවුද අගය කරන්න ඕනෑ කෙනා, කවුද අපේ විශ්වාසවන්තයා වෙන්න ඕනෑ කෙනා කියන එකත් හඳුන්වා දීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

මේ රජය කොමිෂන් සභා ඇති කරලා රාජ්‍ය සේවකයා ශක්තිමත් කළා. දේශපාලකයන්ගේ අතකොළුවක් නොවී, තමන්ගේ බුද්ධිය මෙහෙයවා වැඩ කරන්න පුළුවන් රාජ්‍ය සේවයක් පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මේ රටේ ඇති කළා. ඒ චිතරක් නොවෙයි, ඉතිහාසයේ වැඩිම පඩි වැඩි කිරීමක් රජයේ සේවකයන්ට ලබා දුන්නා. නමුත්, අන්තිමට රාජ්‍ය සේවකයා ඡන්දය දුන්නේ කාටද? යහ පාලනයටද මේ කැමැත්ත? රටේ ජනතාවට තවමත් අවශ්‍ය වෙන්නේ සපත්තුවට පෑගෙන පාලනයක්ද, ජනතාවට අවශ්‍ය වෙන්නේ ඒකාධිපති පාලනයක්ද කියන එක ගැන පසුගිය මැතිවරණයේ ප්‍රතිඵල දිහා බැලුවාම අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි යහ පාලනයක් ඇති කරනවා, අපි සමාජය ශක්තිමත් කරනවා, අපි සාධාරණ සමාජයක් ඇති කරනවා, අපි ආචාර ධර්ම පද්ධතිය ඇති කරනවා කියනවා.

නමුත්, ඒවා අගය කරන ජනතාවක් නිර්මාණය කිරීම අපට වඩාත් වැදගත් වෙනවා. එහෙම නැතිව මේ දේවල් කරලා හරියන්නේ නැහැ. ඒ නිසා චර්යා ධර්ම සංග්‍රහය ගැන වගේම මේ ගැනත් හිතන්න ඕනෑ කියන එක මා විශේෂයෙන්ම කියන්න කැමැතියි. කවුරු හරි මන්ත්‍රී අපේක්ෂකයකු ගිහිල්ලා පොලීසියට ගහලා හිරේට ගියොත්, ඔහු අනිවාර්යෙන්ම ඡන්දයෙන් දිනලා මන්ත්‍රීවරයකු වෙනවා. එහෙම සංස්කෘතියක් මේ රටේ තිබෙන්නේ. එහෙම නම් අපි චර්යා ධර්ම සංග්‍රහය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මේ රටේ සංස්කෘතිය නිර්මාණය කරන්න ඕනෑ; සංස්කෘතිය හැඩගස්සන්න ඕනෑ. නැත්නම් අපි තව තවත් පස්සට යන එක තමයි සිද්ධ වෙන්නේ. අපි හරි දේ කරන්න ගිහිල්ලා, හරි දේ හඳුන්වා දෙන්න ගිහිල්ලා අපි අන්තිමට පිටුපස්සට විසි වෙන පක්ෂයක්, පිටුපස්සට විසි වන ආණ්ඩුවක් බවට පත් වෙනවා කියන එකත් විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. එම නිසා මම කියනවා, මෙතැනින් නවතින්න එපා. අද රටේ හැමදේම පිරිහිලා තිබෙනවා. මන්ත්‍රීවරයා පිරිහිලා තිබෙනවා. වෛද්‍යවරයා වෘත්තියෙන් පිරිහිලා තිබෙනවා. එදා එහෙම පිරිහිලා තිබුණේ නැහැ. ගුරුවරයා අද වෘත්තියෙන් පිරිහිලා තිබෙනවා. සියලු වෘත්තිකයන්, ආගමික නායකයන් අද පිරිහිලා තිබෙනවා. එදා තත්ත්වයට වඩා සමාජ ගෞරවය අද අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මේ රට තුළ සංස්කෘතික විපර්යාසයක් කරන්න ඕනෑ. නැත්නම් අපි තනියම යහ පාලනයක් හදන්න ගිහිල්ලා, අපි තනියම සංස්කෘතියක් නිර්මාණය කරන්න ගිහිල්ලා, අපි තනියම මේ රට ලෝකයේ ඉහළ තලයට උස්සලා තියන්න ගිහිල්ලා අවසානයේදී අපි තනි වෙන එක මිසක් වෙනත් දෙයක් සිදු වන්නේ නැහැ කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ හින්දා නීති හදනවා වාගේම, ක්‍රමවේද සකස් කරනවා වාගේම, යහ පාලනය ගැනත් ජනතාවට අවබෝධ කරගැනීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කරන එක අපේ වගකීමක් කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

පසුගිය කාලයේ මන්ත්‍රීවරු පළාත් පාලන ආයතනවලට ආවේ කොන්ත්‍රාත් කරන්නයි. ඒ බව අපි කවුරුත් දන්නවා. ඒ හින්දා තමයි පසුගිය ඡන්දයේදී මන්ත්‍රීවරයා පෙන්වන්නේ නැතිව "මහින්ද අගමැති කරමු" කියලා පෝස්ටර් ගැහුවේ. පත් වෙන මන්ත්‍රීවරයා කවුද කියලාවත් මිනිස්සු දන්නේ නැහැ. පෝස්ටරයේ තිබෙන පත් වෙන මන්ත්‍රීවරයාගේ ෆොටෝ එක බොහොම පොඩියි. ඒ පෝස්ටරයේම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ලොකු ෆොටෝ එකක් ගහලා තිබෙනවා. තව මාසයකින් තමයි ගමට පත් වෙච්ච මන්ත්‍රීවරයා කවුද කියලා ගමේ ජනතාව දැනගන්නේ; රටේ ජනතාව දැනගන්නේ. එතකොට පසුතැවිලි වුණාට වැඩක් නැහැ. එතකොට වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. ඒ සංස්කෘතිය නැති කරන්න ඕනෑ. ඒ හින්දා පළාත් සභාවට, පළාත් පාලන ආයතනවලට, මාධ්‍ය ආයතනවලට මේ හැම තැනකටම මේ චර්යා ධර්ම සංග්‍රහයක් නිර්මාණය කිරීම සඳහා අපි කටයුතු කරන්නට ඕනෑ කියන එකත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

මේ ආකාරයෙන් කටයුතු කළාට විතරක් මදි. ජනතාවට මේ චර්යා ධර්ම සංග්‍රහය අගය කරන්න, ජනතාවට මේ චර්යා ධර්ම සංග්‍රහය ගැන පැහැදිලි කරලා දෙන්න, අපි ඉන්නේ කොතැනද කියලා පැහැදිලි කරන වැඩ පිළිවෙළකුත් මේ හා සමාන්තරව ඇති කරන්න ඕනෑ. මොකද, යහ පාලනයට වඩා අර යකඩ සපත්තුවට පෑගෙන සමාජය ජනතාව අගය කරන බව පසුගියදා සිදුවීම්වලින් අපි දැක්කා. රජයේ සේවකයාට ලැබුණු නිදහසට වඩා, රජයේ සේවකයාට නිදහසේ වැඩ කටයුතු කරන්න ලැබුණු අවස්ථාවට වඩා, රජයේ සේවකයා දේශපාලන අතකොළුවක්වීමට කැමැතියි කියන එක පසුගිය මැතිවරණ ප්‍රතිඵලවලින් අපි දැක්කා. ඒ නිසා අපි අපි මීට වඩා එහාට ගිය පුළුල් වැඩසටහනක් මේ සඳහා ඇති කළ යුතුයි කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

පසුගිය ආණ්ඩුව කාලයේ රතුපස්වල මගේ ගමේ වතුර ඉල්ලපු ජනතාවට සිදු වූ දේ අපි දැක්කා. පසුගිය ආණ්ඩුවේ නරුමයෝ ගිහිල්ලා වතුර ඉල්ලපු ජනතාව වෙඩි තියලා මැරුවා. අමු අමුවේ ජනතාව මරා දැම්මා. පාසල් දරුවෝ මැරුවා. නමුත්, රතුපස්වල ජනතාවත් පසුගිය මැතිවරණයේ දී ඡන්දය දුන්නේ කාටද? ඒ මිනී මරුවන්ටමයි. කටුනායක රොෂේන් චානක වැනි තරුණයන් මරා දැමුවා. නමුත් ඒ, කම්කරුවන් ඡන්දය දුන්නේත් එම මිනී මරුවන්ටමයි. හලාවත ධීවරයෝ ඉන්ධන මිල අඩු කරන්න කියලා කෑ ගහලා උද්ඝෝෂණය කළා. ඒ අයව අමු අමුවේ ඝාතනය කළා. හැබැයි, ඒ ප්‍රදේශයේ මිනිස්සු ඡන්දය දුන්නේත් ඒ මිනී මරුවන්ටමයි. එහෙම නම් ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකුත් මේ සමාන්තරව යන්න ඕනෑ. ජනතාවට මේ යහ පාලනය මොකක්ද කියන එක කියලා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි. ඒ නිසා මුලින්ම චර්යා ධර්ම සංග්‍රහයක් තුළ ශිෂ්ට සම්පන්නව වැඩ කරන, නීතියට අනුව වැඩ කරන මන්ත්‍රීවරුන් සහිත පාර්ලිමේන්තුවක් නිර්මාණය කළොත් තමයි රජයේ සේවකයාත්, අනෙකුත් ආයතනත් හරියට හැදෙන්නේ. එහෙම නම් මේ ගත්ත ක්‍රියා මාර්ගය අත් දෙකම උස්සලා අනුමත කරමින්, අප ගෙනයන මෙම වැඩ පිළිවෙළ ජනතාව හා එකතු වෙලා කරමු කියන එකත් යෝජනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.13]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සාකච්ඡාවට ගැනෙන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධනය සහ චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව කථා කරන්නට ලැබීම සතුටට කරුණක්.

විශේෂයෙන්ම මෙම ස්ථාවර නියෝග ප්‍රතිශෝධනය සහ චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව ගරු කථානායකතුමා සුවිශේෂී උනන්දුවක්

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

දැක්වූ බව අපි දන්නවා. අපි එම කාරක සභාවේ සාමාජිකයන් නොවුණත්, අපේ අදහස් ප්‍රකාශ කරන්න සමහර අවස්ථාවලදී අපිත් එම කාරක සභාවට සහභාගි වුණා. අපේ තිබෙන සමහර ස්ථාවර නියෝග වෙනස් කරන්න, ඒවා ගැන අලුතින් සලකා බලන්න අවශ්‍ය කාරණා ගැන සාකච්ඡා කළා. ඒ වාගේම හොඳ චර්යා ධර්ම පද්ධතියක් මේ රටට අවශ්‍යයි; පාර්ලිමේන්තුවට අවශ්‍යයි; දේශපාලනයට අවශ්‍යයි කියන එක ගැන සමාජයේ කතිකාවතක් තිබුණා. මේ කාරණා දෙකම ඉතාම වැදගත්. රටේ අනාගතය ගැන කල්පනා කරන, රටේ උන්නතිය ගැන කල්පනා කරන දේශපාලනඥයන් පිරිසක් බිහි කරන්න දරන උත්සාහයක ප්‍රතිඵලයක් හැටියට තමයි අපි මෙය දකින්නේ. හැබැයි සමහර වෙලාවට මේ උත්සාහය ගහට කැපූ ඉනි වාගේ වෙයිද කියන ප්‍රශ්නය අපිට මතු වෙනවා. මොකද, අපි කොයි වාගේ අපේක්ෂකයන්ටද ඡන්දය දෙන්නේ කියන එක ගැන මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. කොයි තරම් ආචාර ධර්ම සහිත දේශපාලනඥයන් හිටියත්, චර්යා ධර්ම පද්ධතියක් සහිත දේශපාලනඥයන් හිටියත්, දිනන පිරිස විවිධ මංකොල්ලකෑම් කළ හොරු, වංචාකාරයෝ පිරිසක් නම්, මෙවැනි චර්යා ධර්ම සහිත ජන සමාජයක් හදන්නේ කොහොමද කියන කාරණය ලොකු ප්‍රශ්නාර්ථයක් සමඟ මේ රටේ නැවත සාකච්ඡාවට බඳුන් විය යුතු වෙනවා. ඇත්තටම මෙය අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ යුතු කාරණයක්. රටේ අනාගතය ගැන, අපේ දූ දරුවන්ගේ අනාගතය ගැන කල්පනා කරන විට මෙවැනි චර්යා ධර්ම පද්ධතියක් රටකට අවශ්‍යයි කියා අපිට පෙනෙනවා. ඒක ඉතාම වැදගත්.

ඊළඟ කාරණය තමයි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග රැකිය යුතු, එහෙම නැත්නම් පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් රැකිය යුතු මේ කාරණා සියල්ල ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් අපි වෙන දාට වඩා අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද මේ දෙස බලාගෙන සිටින රටේ සමස්ත ජනතාව, අනාගතයේ දී දේශපාලනඥයන් වෙන්න සිතාගෙන සිටින අය ආදර්ශයට ගන්නේ මෙතැනයි. ඒ නිසා තමයි අද මේ කථා කරන මාතෘකා දෙකම අපිට වැදගත් වන්නේ. මේ පාර්ලිමේන්තුව ලෝකයේ අනෙක් පාර්ලිමේන්තු එක්ක යන, සැබෑ දේශපාලනඥයන් බිහි කරන, රටට හිතකර දේශපාලනඥයන් බිහි කරන හිතකර පාර්ලිමේන්තුවක් බවට පත් කළයුතු වෙනවා. ඒ සඳහා තමයි අද අපි මේ කථා කරන කාරණා දෙක වැදගත් වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී මම කාරණා කිහිපයක් ගැන කථා කරන්න කැමැතියි. ඉන් පළමුවැනි කාරණය තමයි දැනට ක්‍රියාත්මක වන ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය. මෙම ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය මේ 8වන පාර්ලිමේන්තුවේ ඉතාම වැදගත් ක්‍රියාවලියක්. 2015දී අපි මෙම පාර්ලිමේන්තුවට පත් වුණාට පසුව, සුවිශේෂී කාරක සභා ක්‍රමයක් හැටියට, නැත්නම් වෙන දා පාර්ලිමේන්තුවේ නොතිබුණු අලුත් අත්දැකීමක් විධියට තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට මෙය දකින්නට ලැබුණේ. මෙම ක්‍රමය ලෝකය අත්හදා බැලූ දෙයක්. එය දැනටත් ක්‍රියාත්මක වෙනවා. ඇමෙරිකාව, එංගලන්තය වැනි රටවල මෙම ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. එංගලන්තය වැනි රටවල මේ කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කොහොමද, තීරණ ගන්නේ කොහොමද, එම තීරණ රටට බලපාන්නේ කොහොමද, ඒවා රටට බලපෑම් තුළ වෙනස්වීම් වන්නේ කොහොමද කියන කාරණය අපි දැක්කා. නමුත් මෙම ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය තුළ ඇති වැදගත්කම අපේ මන්ත්‍රීවරු සියලුදෙනාම අවබෝධ කරගත්තේ නැහැ කියන හැඟීම අපට තිබෙනවා. ඒකට හේතුව මෙකයි. මෙම ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන කොට එම කාරක සභා රැස් කර ගන්න අවශ්‍ය අවම ගණ පූරණයවත් සම්පූර්ණ කරගන්න බැරි වන අවස්ථා තිබෙනවා. අනුකාරක සභාවක් නම් මන්ත්‍රීවරු දෙදෙනෙක්, කාරක සභාවක් නම් මන්ත්‍රීවරු තිදෙනෙක් වශයෙන් ඒ අවශ්‍ය ප්‍රමාණය සමහර වෙලාවට ලබාගන්න අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරු මේ ගැන දැඩි අවධානය යොමු කළ යුතු වෙනවා. මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය කියන්නේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ට ලැබුණු දුර්ලභ අවස්ථාවක්. විශේෂයෙන්ම අපි ගරු අගමැතිතුමාට මේ ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමා දැඩි උනන්දුවකින් යුතුව මේ කාරක සභා ක්‍රමය ඉදිරිපත් කරලා, අදහස් ඉදිරිපත් කළා. ඒ අනුව පාර්ලිමේන්තුවට මේ කාරක සභා ක්‍රමය හඳුන්වා දීලා, ඒ යටතේ අලුතින් කාරක සභා 15ක් පිහිටුවන්න අපිට හැකියාව ලැබුණා. මෙම කාරක සභා හරහා මන්ත්‍රීවරුන් වන අපට අත් දැකීම් රාශියක් ලබාගන්න පුළුවන්. අමාත්‍යාංශ සමඟ කටයුතු කිරීමේදී ඇති වන අවශ්‍යතාවන් අනුව එම ප්‍රතිපත්ති සකසා ගැනීමේ අත්දැකීම් මේ හරහා මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි වෙනවා. එය මීටත් වඩා උනන්දුවෙන් ලබාගත යුතුය කියා මා පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

මෙම ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන කොට අපි දැකපු තවත් කාරණයක් තිබෙනවා. මේ කාරක සභා ක්‍රමවේදය ඉතාම හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් දැනට ඉන්න ලේකම් මණ්ඩලයට - නිලධාරි මණ්ඩලයට - වැඩ රාජකාරි ඉතාමත් අධිකයි. ලෝකයේ අනෙක් රටවල් එක්ක ගත්තොත් මේ එක කාරක සභාවකට අවම වශයෙන් පස් දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර වෙලාවට එක නිලධරයකු හෝ නිලධාරිනියක කාරක සභා පහක විතර වැඩ කටයුතු කරන අවස්ථා අපි දැක තිබෙනවා. මේක තමයි තත්ත්වය. ඒ නිසා මේ ගැන ගරු කථානායකතුමාගේත්, පාර්ලිමේන්තුවේත් දැඩි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. දැන් අපි මේ පාර්ලිමේන්තුවේ තුන්වැනි අවුරුද්ද යන්නේ. මේ කාරක සභා ක්‍රමය සාර්ථක වෙන්න නම් ඉතාමත් ඉක්මනට නිලධාරි මණ්ඩලය වැඩි කිරීමට අවශ්‍ය වෙනවා. ඒ නිලධාරි මණ්ඩලය හරහා කාර්යක්ෂමතාව වැඩි කර ගෙන මේ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් උපරිම සේවය ලබා ගත හැකි විධියේ පුහුණුවක් ලබා දිය යුතුයි. නිලධාරි මණ්ඩලය වැඩි කිරීම තුළින් විතරයි මේ කාරක සභාවල ප්‍රතිඵල ගන්න පුළුවන් වන්නේ. එහෙම නැත්නම්, අපි කාරක සභා රැස්වෙලා, මන්ත්‍රීවරු යම් යම් තීරණ අරගෙන අමාත්‍යාංශවලට, ලේකම්වරුන්ට යම් යම් directives දුන්නාට, ඒවා ක්‍රියාත්මක වීමේදී, ඒ ඒ අමාත්‍යාංශවලට යොමු කරවීමේදී ප්‍රමාද සිදු වන්නේ ලේකම් මණ්ඩලයේ නිලධාරිනියන්ගේ අඩු පාඩුවක් නිසා නොවෙයි, ඔවුන්ට තිබෙන වැඩ රාජකාරි ප්‍රමාණය ඉතාමත් ඉහළ නිසායි. එක නිලධාරි මහත්මයකුට හෝ මහත්මියකට සිදු වෙනවා, කාරක සභා තුන හතරක් අධීක්ෂණය කරන්න; කාරක සභා තුන හතරකට අවශ්‍ය කළමනාකරණ කටයුතු සියල්ලම කරන්න. මම හිතන විධියට කර ගන්න බැරි තරමට වැඩ වැඩිවෙලායි තිබෙන්නේ. සමහර වාර්තා ඉදිරිපත් කරන විට දිවා රාත්‍රී වෙහෙසිලා කොහොම හරි අපි ඒ වාර්තා එළිදක්වනවා. නමුත් ඒ වාර්තාවේ ප්‍රමිතිය - productivity එක - ගැන අපි නැවත නැවතත් සිතා බැලිය යුතු වෙනවා. නැත්නම් වැඩ රාජකාරි රාශියක් තිබෙන නිසා එවැනි දේවල් සිදු කිරීමේදී අතපසුවීම් සිදු විය හැකි වෙනවා. එවැනි අතපසුවීම් සිදු නොවන ආකාරයෙන් මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය ගැන නැවත සිතා බලා ඒවා ක්‍රමානුකූල කර ගත්තේ නැත්නම්, ඉතාමත් වටිනා යෝජනාවක් හැටියට ආපු පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්නට තිබෙන මේ කාරක සභා ක්‍රමය ටිකෙන් ටික අපෙන් ඈත් වීමට ඉඩකඩ තිබෙනවා. ඒ වාගේම නැවතත් උපදේශක කාරක සභා ඇති කිරීමත් හොඳයි.

නමුත් අපි යෝජනා කරනවා, උපදේශක කාරක සභාවත් යම්කිසි විධියකින් ආංශික අධීක්ෂණ කාරක සභා හා බද්ධ වන ක්‍රමයක් ඇති කර ගන්න පුළුවන් නම්; වෙනත් වචනවලින් කිව්වොත් ආංශික අධීක්ෂණ කාරක සභාවලින් ගන්නා තීරණ ඇමතිවරයා හරහා - උදාහරණයක් විධියට අපි ප්‍රතිපත්ති ඉදිරිපත් කරනවා නම් ඒ ප්‍රතිපත්ති පිළිබඳව- මීට වඩා සලකා බැලීමක් සිදු විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, සමහර වෙලාවට අපි හිටපු ආංශික අධීක්ෂණ කාරක සභාවලදී කළ යෝජනා අමාත්‍ය මණ්ඩලයේ සමහර ඇමතිවරුන් තුළින් ඒ ආකාරයෙන්ම සලකා බැලීමක් සිදු වූයේ නැහැ. ඒ නිසා ඒ ඇමතිවරු මීට වඩා මේ ගැන සැලකිලිමත් වෙලා රටේ අනාගතය ගැන හිතලා නිර්මාණශීලීව අදහස් දක්වන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ටිකත් මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය හරහා ලබා ගන්නවා නම් තමයි මේ කාරක සභාවල ඇත්ත වගකීම ජනතාව අතරට යන්නේ. ඒක ඉතාමත් වැදගත් කාරණයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කාරක සභා පිළිබඳ රැස්වීම්වලදී ගරු කථානායකතුමාටත් අපි මේ ගැන මතක් කළ යුතු වෙනවා. මොකද, එහෙම නැති වුණොත් වන්නේ අපි තවත් කාරක සභාවක් විතරක් රැස්වෙනවා; රැස්වෙලා තීරණ ගත්තාට ඒ තීරණ ක්‍රියාත්මක වන්නේ නැති තවත් කල් මරණ ක්‍රමවේදයක් බවට පත් වෙන එකයි. එහෙම කල් මරණ ක්‍රමවේදයක් බවට පත් වුණොත් අපට රටේ අනාගතය පිළිබඳව තීරණ ගන්න පුළුවන් ඉඩ කඩ ඇහිරෙනවාය කියන කාරණය මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුතින් ඇති වන ස්ථාවර නියෝග හරහා පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවක් ඉදිරිපත් කර තිබෙනවා. මේක ඉතාමත් හොඳයි. පසුපෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන ප්‍රශ්න, පසුපෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන අවශ්‍යතා වැඩි කරන්න, ඒ හැකියාවන් ඉදිරියට ගේන්න තිබෙන ඉඩකඩ වැඩි කරන්න විපක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ටත් සියලු දෙනාටම හැකියාවක් ලැබෙන ආකාරයට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාරක සභාවේ සභාපතිවරයා හැටියට යෝජනා කර තිබෙන්නේ ඇමතිවරයෙක්. ඒ පිළිබඳව සලකා බලා පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවේ සභාපතිවරයා හැටියට පසුපෙළ මන්ත්‍රීවරයකුම පත් වෙනවා නම්, පසුපෙළ මන්ත්‍රීවරු හැටියට පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු දෙගොල්ලන්ටම එකතු වෙලා අනාගතයේ පාර්ලිමේන්තුව ගැන මීට වඩා කථා කරන්න හැකියාවක් ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැන කථා කළා. මට මතක විධියට 2014 අග භාගයේ තමයි මෙය පටන් ගත්තේ. ඊට පස්සේ ලංකාවේ දේශපාලන ව්‍යාපාර තුළ, දේශපාලනයේ නියැලී සිටින බහුජන සංවිධාන තුළ, සිවිල් සංවිධාන තුළ මේ චර්යා ධර්ම පද්ධතිය, පිරිසිදු දේශපාලනඥයන් බිහි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණා. ඒ හරහා තමයි "මාර්තු 12 ව්‍යාපාරය" වැනි ව්‍යාපාර ඇති වුණේ. "මාර්තු 12 ව්‍යාපාරය" කෙලින්ම සම්බන්ධ වුණේ, අපි කථා කරන චර්යා ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කරන දේශපාලන පරිසරයක් නිර්මාණය කරන්නේ කොහොමද, සමාජය තුළ එවැනි පරිසරයක් නිර්මාණය කර අනාගතයේ රටට අවශ්‍ය විනයගරුක දේශපාලනඥයන් බිහි කරන්නේ කොහොමද කියන කාරණයටයි. සිවිල් සංවිධාන, බහුජන සංවිධාන සියලු දෙනා එකතු වී "මාර්තු 12 ව්‍යාපාරය" ආරම්භ කළේ ඒ ගැන කථා කිරීම සඳහායි. ඒ හරහා අපට හැකියාවක් ලැබුණා, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් විසිපහක, තිහක පමණ පිරිසක් එකතු කර ගෙන මේ ගැන සාකච්ඡා කරන්න; මේ ගැන හඬක් නහන්න. මේ ගැන කොච්චර හඬ නැඟුවත්, පිරිසිදු විනයගරුක දේශපාලනඥයෙකුට ප්‍රාදේශීය සභාවක සිට පාර්ලිමේන්තුවට එන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මේ ඡන්ද ප්‍රතිඵල දැක්කාම අපට මතුවනවා. එම නිසා ඡන්දදායකයින්ගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටින්නේ, මේ ගැන දැඩිව කල්පනා කළ යුතුය කියායි. අපි ඡන්දය පාවිච්චි කරන්නේ මෙහෙම නම්, මේ රටේ අනාගතය ගැන සිතා කොච්චර දේවල් කිව්වත්, ලෝකය යන විධිය, ලෝකය ආදර්ශයට අරගෙන ඉදිරියට යන එක ගැන අපි කොච්චර කථා කළත් ලැබෙන්නේ අපි නොසිතන වෙනත් කෙනෙක් නම් ප්‍රතිඵලය සාර්ථක නැහැ. උදාහරණයකට කියනවා නම් අපි දැක්කා, මහරගම ප්‍රදේශයේ දිනපු කණ්ඩායමට අපේ දිවුලපිටිය මන්ත්‍රීතුමාගේ ගමේ අයත් ඉන්නවා. එසේ නැත්නම් බඩල්ගම ප්‍රදේශයේ අය තමයි හිටියේ. ඒ කණ්ඩායමේ විවිධ පක්ෂවල අය හිටියා. නමුත් ඡන්දය දීලා. කවුරුත් දන්නේ නැහැ, ඒ එක් එක් කොට්ඨාසයේ මන්ත්‍රීවරු හැටියට කවුද පත් වුණේ කියා. කවුද මන්ත්‍රීවරයා කියා අදටත් දන්නේ නැහැ, මේ සමාජයීය බෙදවාචකය ගැන අපි කල්පනා කළ යුතුයි. තනි පුද්ගල ප්‍රතිරූපයකටද මේ ලංකාවේ ජනතාව ඡන්දය දෙන්නේ, එසේ නැත්නම් තමන්ගේ ප්‍රදේශය ගැන හිතලා තමන්ගේ ප්‍රදේශය සංවර්ධනය කරන්න පුළුවන් දේශපාලන පක්ෂයක බිම් මට්ටමක ඉන්න නායකයෙකුටද කියන කාරණය අපි හිතන්න ඕනෑ. මේක තමයි චර්යා ධර්ම ඇතුළු මේ සියලු දේවල් හරහා අපි ගොඩ නැඟිය යුතු දේශපාලන නිර්ණායක වෙන්න ඕනෑ; දේශපාලන නායකත්වය වෙන්න ඕනෑ. එසේ නැති වුණොත් වෙන්නේ මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන, තරුණයෝ බලාපොරොත්තු වෙන දේශපාලන ව්‍යාපාරයෙන් ඈතට ගිහින් පුද්ගල චරිතයක් විතරක් හැදිලා, ඒ වටා ගොඩ නැඟුණු ඕනෑම කෙනෙකුට -ස්ත්‍රී දූෂකයෙකුට, වංචා කාරයෙකුට, මිනීමරුවෙකුට, හොරෙකුට- ඡන්දය දෙන ක්‍රමවේදයක් හැදෙන එකයි. එය ඉතාමත්ම අවාසනාවන්ත සිද්ධියක් වෙනවා. එම නිසා රටේ බුද්ධිමත් ජනතාව මෙවර පාඩමක් ඉගෙන ගෙන මෙන්න මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුළුවන් කතිකාවතක් මේ රටේ ආරම්භ කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. එසේ නැත්නම් ජරාජරා වූ දේශපාලන ක්‍රමවේදයකට මේ රට ඉස්සරහට යනවා. එයයි අපි මේ අත් දකිමින් ඉන්නේ. මේක ඉතාමත් දරුණු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට මුහුණ දෙන සියලුම දේශපාලන පක්ෂ කල්පනා කළ යුතුයි, කොහොමද දක්ෂ නායකයන් ඉදිරියට එන ක්‍රමවේදයක් හදන්නේ කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එක උදාහරණයක් ගන්නම්. ඒ තමයි, ප්‍රංශයේ වර්තමාන අධ්‍යාපන අමාත්‍යවරිය. මොරොක්කෝ ජාතික තරුණියක් තමයි ප්‍රංශයේ අධ්‍යාපන ඇමතිවරිය හැටියට පත් වෙන්නේ. එතුමියගේ පියාණන් කම්කරුවෙක්. එහෙම ඉඳගෙන එතුමිය කුඩා කාලයේ ප්‍රංශයට ඇවිත් ඉගෙන ගෙන එතුමියගේ දක්ෂතාව නිසා ඉදිරියට එනවා. මෙවැනි තත්ත්වයක් මේ රටේ නිර්මාණය විය යුතුයි. එහෙම නැති වුණොත් වෙන්නේ මේ රටේ දක්ෂ තරුණ තරුණියන්ට කිසිම දවසක මේ ප්‍රාදේශීය සභා ක්‍රමවේදය තුළ, පළාත් සභා ක්‍රමවේදය තුළ, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් දක්වා එන ක්‍රමවේදය නැති වෙනවා. පියාගේ, මවගේ උරුමයෙන් එන දේශපාලනඥයෝ තමයි තවමත් මේ රටේ ඉන්නේ. එසේ නැත්නම් වණ්ඩිකම්වලින් ඉදිරියට එන දේශපාලනඥයෝ, සල්ලි තිබෙන පවුලකින් එන දේශපාලනඥයෝ තමයි තවමත් ඉන්නේ. එසේ නොවෙයි විය යුත්තේ. රටක් දියුණු කරන්න නම් බලාපොරොත්තු විය යුත්තේ දක්ෂයෝ ඉදිරියට එන ක්‍රමවේදයක්. එයයි අද මේ අපි කථා කරන චර්යා ධර්ම සංග්‍රහයේ තිබෙන වටිනාකම. නමුත් මේ වටිනාකමට තැනක් ලැබේවිද කියන ප්‍රශ්නාර්ථය මේ රටේ තිබෙනවා. මා නැවත නැවතත් ඒ ගැන ප්‍රශ්න කරනවා. මා ප්‍රශ්න කරන්නේ රටේ ජනතාවගෙන්. හෘදය සාක්ෂියක් තිබෙන රටේ ජනතාව නැත්නම් ඡන්දදායකයෝ තමන්ගේ හදවතට තට්ටු කරලා ප්‍රශ්න කර ගත යුත්තේ, අපි මේ හදන්නේ රටට ගැලපෙන දේශපාලනඥයන්ද, එසේ නැත්නම් පුද්ගල චරිත වටේ යන, මංකොල්ල කන හොරු රැලක්ද කියන

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

එකයි. මේක නම් උත්තරය මේ රට ඉදිරියට යන්නේ නැහැ. මේ රට ඉදිරියට යන්න නම් බිහිවිය යුත්තේ පරමාදර්ශී දේශපාලනයේ යෙදෙන චරිත. එවැනි චරිත නිර්මාණය කර ගන්නට දේශපාලන වටපිටාවක් සැකසිය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවසක අපි කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයින් පිරිසක් සමඟ කථා කළා, මේ රටට දේශපාලන විද්‍යා පීඨයක් අවශ්‍යයි කියා. ඒ දේශපාලන විද්‍යා පීඨය අවශ්‍ය වෙන්නේ මේ නිසායි. කාන්තා දේශපාලන නියෝජිත ප්‍රතිශතය වැඩි කරන්න, කාන්තා දේශපාලනඥවරියන් ඉදිරියට ගේන්න, තරුණ දේශපාලනඥයෝ ඉදිරියට ගේන්න දැන් අපේ ලොකු දැක්මක් තිබෙනවා.

එහෙම නම් එවැනි දේශපාලනඥයින්ට පුහුණු විය හැකි තැනක් මේ රටට අවශ්‍යයි. දැනට ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රය පාර්ලිමේන්තුව සමඟ එක්ව කටයුතු කරනවා. කලින් එක්සත් ජාතික පක්ෂය මේ ගැන විශේෂ ඇල්මකින් කටයුතු කළා. ගරු අගමැතිතුමාට මේ ගැන විශේෂ දැක්මක් තිබෙනවා. විශේෂයෙන් දේශපාලන විද්‍යාව, දේශපාලනය ගැන හදාරන පිරිසට අවශ්‍ය පහසුකම් සහිත තැනක් හදන්න එතුමාට ලොකු දැක්මක් තිබෙනවා. ඒත් එක්කම කොළඹ විශ්වවිද්‍යාලය සමඟ එකතු කරලා මේ ගැන කථා කරන, මේ ගැන කල්පනා කරන සුවිශේෂී දේශපාලනඥයින් පිරිසක් බිහි කිරීමට හැකියාව ලැබෙන තැනක් හැටියට දේශපාලන කේන්ද්‍රයක්, එහෙම නැත්නම් දේශපාලන පීඨයක් අපට ආරම්භ කරන්න පුළුවන් නම් ප්‍රාදේශීය මට්ටමේ සිට දේශපාලනඥයින් පුහුණු කරගෙන ඇවිත් අපි ප්‍රාර්ථනා කරන, අපි දකින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අපට බිහි කරන්න පුළුවන්. ඒක අපේ සිහිනයක්. ඒ සිහිනය සැබෑ කර ගන්න නම්, හෘදය සාක්ෂියක් ඇති දේශපාලනඥයින් සියලු දෙනා එකතු වෙලා මේ ගැන සාකච්ඡා කළ යුතු වෙනවා. එහෙම නොවුණොත් හැමදාම මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදය තුළ රැඳී සිටින්නයි අපට සිදු වෙන්නේ.

මේ ජරාජීර්ණ, බලලෝභී, තමන්ගේ පදවි තානාන්තර රැක ගන්න කාලකණ්ණි ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද මේ බල අරගලය ඇති වෙලා තිබෙන්නේ. බලය වෙනත් විධියකට ලබා ගන්න උත්සාහ කරනවා. ප්‍රජාතන්තවාදී විධියට 2020 වසර දක්වා ලැබුණු ප්‍රතිඵලය වෙනස් කරලා වෙනත් විධියකට බලය ලබා ගන්න උත්සාහ කරනවා. මෙවැනි ක්‍රමවේදයක ආදීනව තමයි අපි මේ අත් විඳින්නේ. මේවා වෙනස් විය යුතුයි. මේවා වෙනස් වුණේ නැත්නම් අපේ අනාගත දූ දරුවන් මේ රටේ ජීවත් වෙන එකක් නැහැ. මොකද, ලෝකයත් එක්ක ඒ දූ දරුවන් හිතන විධිය වෙනස් වෙනවා. මේ system එක ඇතුළේ සිදු වෙන්නේ කොල්ලකාරී දේශපාලනඥයින් බිහි වීම නම් කවදාවත් මේ රට හැදෙන්නේ නැහැ. දේශපාලන ක්‍රමවේදය තුළ මෙවැනි දේවල් හිතන පතන, සමාජයට ගරු කරන පිරිසක් ඇති වුණේ නැත්නම් අපට අපේ රටට වග කියන දේශපාලනඥයින් බිහි කර ගන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මේ කථා කරන මාතෘකාව ඉතාම කාලෝචිත, අවශ්‍යම මාතෘකාවක්. නමුත් අවාසනාවට මේ ගැන වාද විවාද කරන්න සභා ගර්භයේ ඉන්නේත් හතර පස් දෙනායි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිදි. මේක තමයි ඇත්ත කථාව. එම නිසා මේ කාරණාව ගැන සාකච්ඡා කරන අද දිනයේවත් අපට මන්ත්‍රීවරු ටික අල්ලා ගන්න බැරි වෙලා තිබෙනවා. අපි මන්ත්‍රීවරු ගැනයි මේ කථා කරන්නේ. අපි චර්යා ධර්ම සංග්‍රහයක් ගැනයි කථා කරන්නේ. නමුත්, මේක තමයි යථාර්ථය. එම නිසා මාධ්‍යවේදී සහෘදයන්ගෙන් ඉල්ලා සිටින්නේ, අපි කථා කළ යුත්තේ මෙන්න මේ දේවල් ගැනයි. එහෙම නැතිව නීත්‍යානුකූලව තිබෙන ආණ්ඩුවක් කොහොමද පෙරළන්නේ කියන එක උදේ ඉඳන් රෑ වනතුරු කථා කරන එක නොවෙයි. අද තිබෙන එවැනි රූපවාහිනී නාලිකා නිසා තමයි මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදයම ඉදිරියට යන්නේ. මොකද, නීත්‍යානුකූලව පත් වුණු දේශපාලනඥයින්ට, විනය ගරුක දේශපාලනඥයින්ට මේ රටේ ඉඩක් නැති තරමට ජනමාධ්‍ය හැසිරෙන්නේ එම කාරණය නිසායි. එම නිසා ජනමාධ්‍ය ශිල්පීන්ගේ ස්වයං විනයක් ඇති විය යුතුයි කියලා අපි කල්පනා කරනවා. මේ රටේ තිබෙන තමන්ගේ නාලිකාවේ අයිතිකාරයාගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින මජර ක්‍රමවේදය වැරැදියි. මේ ක්‍රමවේදයෙන් මිදිලා ප්‍රජාතන්ත්‍රවාදීව, නිදහස්ව, නිවහල්ව කල්පනා කරන මාධ්‍යවේදීන් පිරිසක් මේ රටේ බිහි විය යුතුයි. එහෙම නැතිව පයිප්ප බාස් කෙනෙකුගේ channel එකක, පයිප්ප බාස්ට අවශ්‍ය විධියට යන channel එකක, පයිප්ප බාස්ට අවශ්‍ය විධියට වැඩ කරන මාධ්‍යවේදීන් නොවෙයි අපට අවශ්‍ය වන්නේ. කෙළින්ම කිව්වොත් පයිප්ප බාස්ගේ channel එක. පයිප්ප බාස්ගේ channel එකේ උදේ ඉඳන් හවස් වනතුරු අපි දකින්නේ මොකක්ද? කොහොමද අගමැතිවරයා ඉවත් කරන්නේ? ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ පත් වුණු අගමැතිවරයා ඉවත් කරන්න කියලා උදේ ඉඳන් හවස් වනතුරු කථා කරනවා. මේ රටේ දේශපාලන න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන්ම නිර්මාණය කරන්නේ මේ පයිප්ප බාස්. මේ රට වෙනස් කරන්න මේ පයිප්ප බාස්ට හැකියාවක් තිබෙනවාද? මේ රටේ ජනතාව මීට වඩා බුද්ධිමත් විය යුතුයි. තමන්ගේ නිවසේ තිබෙන රූපවාහිනියෙන් මෙවැනි නාලිකා නරඹන්නේ නැති තැනට ගෙන යන වැඩ පිළිවෙළක් මේ රටට අවශ්‍යයි. එහෙම වුණොත් විතරයි මේ පයිප්ප බාස්ලාගේ channelsවල වැඩ කරන බත් බැළයෝ ටික තමන් කොතැනටද යා යුත්තේ කියලා නිවැරදි තීරණයක් ගත යුතු වෙන්නේ. එහෙම නැත්නම් මේ රටට ලැබෙන්නේ වැරැදිම වැරැදි ක්‍රමවේදයන්. එම නිසා මම බොහොම කරුණාවෙන්, බොහොම ආදර බරිතව සියලු ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා, තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න තමන් කරන දේ හරිද කියලා. හරි දේ කරනවා නම් ඔබ සතුටු විය යුතුයි.

මේ රටේ එවැනි පරිසරයක් ඇති කරන්න පුළුවන් දේශපාලනඥයෝ පිරිසක් බිහි කරන්න නම්, ජනමාධ්‍යවල කාර්ය භාරය මීට වඩා වැඩි දියුණු විය යුතුයි කියලා මම යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබා දුන් කාලය සම්බන්ධයෙන් මා ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අද දින සාකච්ඡාවට ගැනුණු ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව තුළත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය තුළත් ඉතාම වැදගත් කරුණු රාශියක් තිබෙනවා. අපි අලුතින් කල්පනා කරන කාරක සභා ගැන, ආංශික අධීක්ෂණ කාරක සභා ගැන සහ පාර්ලිමේන්තුවේ අනෙක් සියලුම කාර්යයන් ගැන මෙහි සඳහන් වෙනවා. මෙම චර්යා ධර්ම පද්ධතිය මෙම පොතට සීමා නොවී පිළිපදින චර්යා ධර්ම පද්ධතියක් වේවා! මෙම පාර්ලිමේන්තුව අපි කල්පනා කරන, අපේ ලෝකයේ පරමාදර්ශී චරිත හැටියට අපි දකින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පිරි පාර්ලිමේන්තුවක් වේවා! කියන ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා.

[අ.භා. 3.34]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව හමුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වර්යා ධර්ම සංග්‍රහයත් ඉදිරිපත් කළ මේ අවස්ථාවේ වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ඇතුළේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතු විධිමත්ව කළමනාකරණය කරන්න අපි පසුගිය කාලය පුරාම ස්ථාවර නියෝග භාවිතයට ගත්තා. එය යම් සංශෝධන සහිතව අද අලුතින් මෙම කාරක සභා වාර්තාවෙන් ඉදිරිපත් කළත්, ස්ථාවර නියෝග අනුව- කඩදාසිවල මොන මොන සංශෝධන ගෙනාවත් ඇති වැඩක් නැහැ.- පාර්ලිමේන්තුව ක්‍රියා කරලා තිබෙනවාද, ඒක මෙහෙයවන කථානායකතුමාගේ ඉඳලා, පාර්ලිමේන්තුවට නායකත්වය දෙන අගමැතිතුමාගේ ඉඳලා ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුව ක්‍රමවත්ව ගෙන ගියාද කියන එක ගැන ආපසු හැරී බැලීම වැදගත්.

පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අසා පිළිතුරක් ලබා ගැනීමේදී, එම පිළිතුර විද්වත් විධියට ලබා ගැනීම තුළ තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සෑහීමකට පත් වෙන්නේ කියලා මම කියන්න කැමැතියි. අපි පසුගිය කාලයේ දැකපු දෙයක් තමයි, අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කරනකොට, ඒ සම්බන්ධව රීති ප්‍රශ්නයක් මතු කළාම, ගරු කථානායකතුමා එම රීති ප්‍රශ්නයට කන් දෙන්නේ නැහැ කියන එක. මේ, මම ප්‍රායෝගිකව අත්දැකපු දෙයක්. ගරු අගමැතිතුමා එම ප්‍රකාශය කරලා ඉවර වනතුරු ඉන්නවා. නමුත් එම ප්‍රකාශය තුළ මතු වෙන රීතිය පිළිබඳ කාරණයක් තමයි අපි මතු කරන්නේ. ඒ වාගේම ප්‍රශ්නයක් මතු කරනකොට, මේ පාර්ලිමේන්තුවේදී අග්‍රාමාත්‍යවරයා ඒකට ගැළපෙන උත්තරය නොවෙයි දෙන්නේ. වෙනත් කෙනෙකුට දෝෂාරෝපණයක් ඇති වෙන්න, පාර්ලිමේන්තුවට නොගැළපෙන උත්තරයක් දීලා ඇත්ත වශයෙන්ම ඒක මහ හරින්න උත්සාහ කරනවා. ඒක, අපි අත්දුටු දෙයක්. එම ආදර්ශය තමයි සමහර ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් අරගන්නේ. ඒ නිසා මෙවැනි තත්ත්වයක් තුළ මෙම පාර්ලිමේන්තුවේ විනය පිරිහී ගියා. මේ තුළ විද්වත් සභාවක ස්වභාවය නැති වෙලා, මල්ලවපොර පිටියක ස්වභාවයට පත් වුණු අවස්ථා තිබුණා. අපි මහ ජනතාවගේ සල්ලි වියදම් කරනවා. පාර්ලිමේන්තුව රැස් කරන්න එක දවසකට ලක්ෂ 40ක් විතර වැය කරනවාය කියලා මම අසා තිබෙනවා. එහෙම මුදලක් වැය කළත්, මේ සභාව ඇතුළත විද්වත් සංවාදයක් ගෙන යන්න, ආචාරශීලී විධියට සභාව හසුරුවන්න, ඒ වාගේම අන්‍යයන්ගේ අදහසට කන් දෙන්න හැකියාවක් නැත්නම්, මේවා කොයි තරම් පොත්පත්වලට සීමා වුණත් ඇති වැඩක් නැහැ. මේක අලුත් එකක් නොවෙයි, අපට යම් සංශෝධන විතරයි මේක ඇතුළත තිබෙන්නේ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළත අපි දැකපු දෙය අනුව, ලෝකයේ පාර්ලිමේන්තුවලින් ලබපු අත්දැකීම අනුව ඒවායේ සභා දිහා බැලුවාම, මේකත් පාර්ලිමේන්තුවක්ද කියලා හිතෙනවා. ඒ නිසා ඇත්තවශයෙන්ම මෙම තත්ත්වය වෙනස් කරන්න නීති රීතිවලින් බැහැ.

නායකත්වයෙන් විනයගරුකව පාර්ලිමේන්තුවට මහ පෙන්වන තත්ත්වයක් හරිහැටි නිර්මාණය වුණේ නැත්නම්, ඒ මට්ටමට ශීලාචාර වුණේ නැත්නම් මේවා සියල්ලම හිස් කඩදාසි විතරක් වේවි. මා ඒ ගැන මීට වඩා කතා කරන්නේ නැහැ. පසුගිය කාලයේ, ස්ථාවර කාරක සභාවලට ඉදිරිපත් වුණු කරුණු සුළු සංශෝධනයන්ට යටත්ව සකස් කරලායි මෙම වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම වාර්තාවට විරුද්ධ වන්න අපට පදනමක් නැහැ. මොකද, අපි කැමැතියි, පාර්ලිමේන්තුව රීතිවලට එකඟව, විනයගරුකව, ආචාරශීලීව, සංවාදාත්මකව ඉස්සරහට යනවා දකින්න. ඒ සඳහා අපේ කැමැත්තක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව දිහා රට බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුවේ හැසිරීම දිහා රට බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුවේ විද්වත් සංවාද ගැන යමක් ඉගෙන ගැනීම සඳහා පාසල් ශිෂ්‍යයෝ මේ පාර්ලිමේන්තුවට එනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම විද්වත් සංවාදයක් නැති වුණාම පාර්ලිමේන්තුව කෙරෙහි තිබෙන විශ්වාසය නැති වෙලා යනවා.

අනෙක් කාරණය මේකයි. ආචාර ධර්ම ගැන කතා කරන කොට මේ රටේ ඡන්දය ගැන කතා කළා. කිව්වා, පුද්ගලයා දන්නේත් නැතිව සමහර අයට ඡන්දය දී තිබෙනවා කියලා. මේ විධියේ නොයෙක් කාරණා කතා කළා. ඇත්ත තමයි! දේශපාලන බල තුලනයේ වෙනසක් අවශ්‍යයි කියන එක ගැන මිනිසුන්ට තිබෙන විශ්වාසය මත පසුගිය මැතිවරණයේදී පිළිතුරක් දුන්නා, මේ ගෙන යන පාලනයට. එහි යම් වරදක් මිනිස්සු නිවැරැදි කළා. මිනිස්සු පුද්ගලයන් දිහා බැලුවේ නැහැ. ඒ වෙනස වෙනුවෙන් සුදුසු ජාතික නායකත්වයක් මතු කරන්න ඕනෑ කියන එක ගැන කල්පනා කරලා, අවශේෂ කරුණු අමතක කරලා ක්‍රියා කළා. එයින් මේ වෙනස ඇති වෙලා තිබෙනවා. මේ ගැන යථාර්ථවාදීව බලනවා මිසක් මෙයට ගරහන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම, සදාචාරසම්පන්න, විනයගරුක පාර්ලිමේන්තුවක් ආචාර ධර්මවලින් හදන්න බැහැ කියා අපි කියන්න කැමැතියි. ආචාර ධර්ම රකින්නේ නැත්නම් ආචාර ධර්මවලින් පාර්ලිමේන්තුව මෙහෙයවන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. ඒකට බලපෑ සාධක මේ සමාජය ඇතුළේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද තිබෙන්නේ සම්පූර්ණයෙන්ම වර්යා ධර්ම විනාශ වූ, ආචාර ධර්ම විනාශ වූ සමාජයක්; සමාජ ක්‍රමයක්; ධනය අගය කරන සමාජයක්. ධනය තිබෙනවා නම්, සල්ලි තිබෙනවා නම් ඕනෑම විකෘති වැඩක් කරන්න පුළුවන් සමාජයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ, සමාජ ආර්ථික ප්‍රතිපත්තිය නිසායි. අද තිබෙන මේ තත්ත්වය වෙනස් කරන්න, පාලන තන්ත්‍රයේ යහපත් වෙනසකට රට පරිවර්තනය කරන්න ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේ සමහර අවස්ථාවල උසස් විවාද පැවැත්වෙනවා. ඒවා නොවෙයි මාධ්‍යවල පළ වන්නේ. ඒවා ජනමාධ්‍යවල පළ වන්නේ නැහැ. දැන් රට පුරාම මාධ්‍ය ජාලා කරන්නේ මොකක්ද? සමාජ සංස්කෘතිය විනාශ කරන සමහර දර්ශන, රූපරාමු තමයි අද ඇත්ත වශයෙන්ම සමාජගත වන්නේ. සමාජය ඇතුළේ වර්යා ධර්ම රැකෙන්නේ නැත්නම්, ආචාර ධර්ම පිරිහෙනවා නම්, සමාජ විකෘතියක් ඇති වනවා නම් ඒ විකෘතිය මේ පාර්ලිමේන්තුවේ පිළිබිඹු වේවි. ඒක ස්වභාවයක්. ඒකට වග කියන්න ඕනෑ ඒ සමාජ විකෘතියට ඉඩ සලසන අනෙකුත් සමාජ බලවේගයි. ඒ නිසා මම කියනවා, සමාජ ආදර්ශයක් දීමේ ලොකු වගකීමක් මේ වෙලාවේ අපට තිබෙන බව. සම්පූර්ණ සමාජයේ මේ පවතින වර්යා ධර්ම විරෝධී, ආචාර ධර්ම විරෝධී, සංස්කෘතික විරෝධී ක්‍රමවේදයන් පරාජය කරන්න පුළුවන් ආකාරයේ යම්කිසි පරිවර්තනයකට සමාජය ගෙනෙන්න අප කටයුතු කරන ප්‍රමාණයට මේ පාර්ලිමේන්තුවේ උසස් නියෝජනයන් ඇති වේවි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ සඳහා දෙපැත්තටම වගකීමක් තිබෙනවා; සමාජමය වගකීමක් තිබෙනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් සමාජයට ආදර්ශයක් දීමේ වගකීමකුත් තිබෙනවා. මේ දෙක අතර සම්බන්ධතාව ඇත්ත වශයෙන්ම මේ සමාජයටත්, ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවේ කටයුතුවලටත් ප්‍රබලව බලපාවි. ඒ ගැන කතා කරන්න මීට වඩා වෙලාව මම ගන්නේ නැහැ.

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

අපට ජාතික වගකීමක් තිබෙනවා. මුළුමහත් රට පුරා දැනටමත් දේශපාලන වශයෙන් තිබෙන අර්බුදකාරිත්වය දිහා බැලුවාම එක පැත්තකින් දැන් මේක දේශපාලන සුදුවක් බවට පත්වෙලා තිබෙනවා. උසස් සංවාදයක් වෙනුවෙන් හෝ රට ගැන හිතන, රටේ ආර්ථිකය ගැන හිතන, රටේ අනාගතය ගැන හිතන, ඒ සඳහා වූ බල මාරුවක් ගැන හිතන, ඒ සඳහා වූ මහ පෙන්වීමක් ගැන හිතන බලයකට නොවෙයි අද කවුරුත් කථා කරන්නේ. අද සංඛ්‍යා ලේඛන එකතුවක් ගැනයි කථා කරන්නේ. කාටද වැඩියෙන් තිබෙන්නේ, කාටද අඩුවෙන් තිබෙන්නේ කියන කාරණායි අද සංවාදයේ තිබෙන්නේ. ඒ නිසා එහෙම සංවාදයක් ඇතුළේ මම දකින්නේ නැහැ, මොන බල හුවමාරු ආවත් රටේ අනාගතයට සේවයක් ඇති වෙයි කියලා. රටේ ජනතාවට ඒකෙන් වාසියක් ඇතිවෙයි කියා අපට හිතන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා රට ඇතුළේ පීඩනය ඇති වෙන්න, ඇති වෙන්න; දුප්පත්කම ඇති වෙන්න, ඇති වෙන්න; සමාජ ව්‍යසනය ඇති වෙන්න, ඇති වෙන්න අනික් පැත්තෙන් මහජන විරෝධය මතුවීමත්, ඒ තුළ සමාජ විරෝධී ක්‍රියාවලට සමාජය පෙලඹවීමත් ස්වාභාවිකයි. ඒ නිසා අපි මේ වෙලාවේ මතු කළ යුතු කාරණය තමයි හැම ප්‍රශ්නයක් දෙසම නිවැරදිව, යථාර්ථවාදීව බැලිය යුතු බව. කළ යුත්තේ දෙපැත්තේ ඉඳගෙන ගහ මරා ගන්න එක, කොටා ගන්න එක නොවෙයි; සමාජයට අවශ්‍ය නිවැරදි උත්තර සපයන උත්තරීතර ආයතනයක් විධියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න අපි ක්‍රියා කිරීමයි. එය අප කාගේත් වගකීමක් බව ප්‍රකාශ කරමින් මට කෙටි වේලාවක් ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[අ.හා. 3.45]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳ කරන සාකච්ඡාවේදී ඊට සම්බන්ධවීමට අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ - කලින් කථා කරපු අපේ මන්ත්‍රීවරු ඒ ගැන පැහැදිලි කළා,- මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් එහෙම නැත්නම් චර්යා ධර්ම පද්ධතියක් හඳුන්වා දිය යුතුයි කියන කාරණය සාකච්ඡා කළා. විශේෂයෙන්ම ඒ ගැන මැතිවරණ කාලවලදී අපට සාකච්ඡා කිරීමට සිද්ධ වුණේ මේ රටේ දේශපාලන සංස්කෘතිය තුළ මන්ත්‍රීවරයා ගැන තිබෙන ජනතා හැඟීම හා ජනතා අදහස ඒ තරම් හොඳ අදහසක් නොවුණු නිසායි. අපි දන්නවා මේ සමාජය තුළ, සමාජ කථිකා තුළ, මහජනයා තුළ, විශේෂයෙන්ම ජනමාධ්‍ය තුළ 'මන්ත්‍රීවරු' කියලා කියන්නේ දරදඬු, දූෂිත, එහෙම නැත්නම් යම් යම් අපරාධවලට සම්බන්ධ වුණු, තමන්ට ඕනෑම දෙයක් කරන්න පුළුවන් යැයි සිතන මානසික මට්ටමින් වැඩ කරන උදවියයි කියන එක. අපේ සමාජය ඉදිරියේ තිබෙන මතය එයයි. නමුත් මැතිවරණයක් ආවාම ජනතාව ඡන්දය දීලා පත් කරන්නෙත් ඒ මන්ත්‍රීවරුන්ම තමයි. ඒ මානසික මට්ටමේ සිටිනවාය කියා ජනතාව හිතන ඒ උදවියටම තමයි බහුතර ඡන්ද ලැබෙන්නෙත්. මැතිවරණ කාලවලදී අපි සාකච්ඡා කළ පරිදි එවැනි චර්යා ධර්ම පද්ධතියක් හඳුන්වා දීම හරහා යම් රීති පද්ධතියකට මන්ත්‍රීවරුන් එකඟ කරවා ගැනීම හා ඔවුන්ගේ ක්‍රියාකලාපය ඉදිරියට ගෙන යන්න පුළුවන් යම් වැඩසටහනක්, යම් ක්‍රියාදාමයක් අද අපි ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, මීට කලින් අපට එහෙම චර්යා ධර්ම පද්ධතියක් තිබුණේ නැහැ කියලා. මන්ත්‍රීවරු හැටියට අපි බොහෝ දුරට වැඩ කරගෙන ආවේ පාර්ලිමේන්තුව තුළ සම්ප්‍රදාය අනුවයි. අද ඒ සම්ප්‍රදායෙන් පමණක් සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියන එක මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාම පිළිගෙන තිබෙනවා. ඒ නිසා සම්ප්‍රදායට එහා ගිය යම් චර්යා ධර්ම සංග්‍රහයක් එහෙම නැත්නම් චර්යා ධර්ම පද්ධතියක් අවශ්‍යයි කියන මතය අද පාර්ලිමේන්තුව තුළින්ම ඇවිල්ලා, ඒක ගැන යම් ලියවිල්ලක් ඉදිරිපත් කරලා, අපට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන් තත්ත්වයට අපි මෙය ගෙනැල්ලා තිබෙනවා. අපට එහෙම දෙයක් අවශ්‍ය වුණේ ඇයි කියන කාරණය ගැන සාකච්ඡා කළොත්, පසුගිය කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතිය තුළ වූ ඒ පිරිහීම නිසාම තමයි අප විසින් චර්යා ධර්ම සංග්‍රහයක් හදා ගන්න ඕනෑ කියන අවශ්‍යතාව ඇති වුණේ කියලායි මම හිතන්නේ.

මොකද, පසුගිය කාලය පුරාම "මන්ත්‍රීවරයා" කියන පුද්ගලයාගේ පිරිහීම කොයි තරම් දුරට බලපෑවා ද කිව්වොත්, අන්තිමට අපි සියලු දෙනාම එකතු වෙලා අපි වෙනුවෙන්ම චර්යා ධර්ම පද්ධතියක් හදා ගන්න ඕනෑ කියන තැනට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225ම අද තල්ලු වෙලා තිබෙනවා. අපි අද අලුතින් හිතන්න ඕනෑය කියන තැනට අද පැමිණිලා තිබෙනවා. අද අපි ඉන්න තැන හොඳ තැනක් නොවුණත්, අපි යන්න ඕනෑ කොතැනටද කියන එක සියලු දෙනාටම පිළිගන්න පුළුවන් විධියට සියලු දෙනාම ඒක ස්වයං විවේචනය කරමින් ඉදිරියට යන්න ඕනෑ කියන අදහසට අද අපි ඇවිල්ලා තිබෙනවා. ඒ අදහස මත අද මෙම ලියවිල්ල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන ගරු කථානායකතුමාටත්, ඒ වාගේම මේ කමිටුවේ සිටි සියලුම මන්ත්‍රීවරුන්ටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මම හිතනවා, මේ තුළ විශේෂ දේවල් තිබෙනවා කියලා. "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය" තුළ VII වන කොටසේ "මන්ත්‍රීවරුන් විසින් පොදු දේපළ පාවිච්චි කිරීම හා පෙළඹවීම්" කියන කාරණය ගැන විග්‍රහයක් කරලා තිබෙනවා. එහි 23වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "මන්ත්‍රීවරුන් විසින් යම් පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් හුදෙක් මහජන බැදියාවක් සම්බන්ධයෙන් පමණක් නීතියෙන් අවසර දී ඇති පරිදි පාවිච්චි කළ යුතු ය. එම පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් ඒ සඳහා නීතියෙන් විශේෂිතව විධිවිධාන සලසා ඇත්නම් මිස පක්ෂ දේශපාලන කටයුතුවලට පාවිච්චි නොකළ යුතුය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි, අප සියලු දෙනාටම තිබෙන චෝදනාව තමයි, මහජන මුදල් -පොදු දේපළ- අනිසි ලෙස පාවිච්චි කිරීම සහ ඒවා අවභාවිත කිරීම කියන එක. අද මේ ඉදිරිපත් කරලා තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය තුළ, පොදු දේපළ මන්ත්‍රීවරුන් පාවිච්චි කළ යුත්තේ කොහොමද කියන එක ගැන යම් අර්ථ දැක්වීමක් කරලා තිබෙනවා. ඒ අර්ථ දැක්වීම පවා කරන්න සිද්ධ වුණේ, පසුගිය කාලය පුරාම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ට දූෂණ, වංචා සහ මහජන මුදල් අවභාවිත කිරීම යනාදී කරුණු ගැන චෝදනා රාශියක් එල්ල වුණු නිසායි. අද මේ ඉදිරිපත් කරපු ලියවිල්ල තුළ, මහජන මන්ත්‍රීවරුන් පොදු දේපළ පාවිච්චි කරන්න ඕනෑ කොහොමද, මහජන මුදල් පාවිච්චි කරන්න ඕනෑ කොහොමද කියන ආකාරය සම්බන්ධයෙන් යම් අදහසක් ඉදිරිපත් කරලා තිබෙනවා. මන්ත්‍රීවරයෙකුගේ චර්යාව, ඒ වාගේම මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික කටයුතු යනාදී සියලු දේවල් පිළිබඳ මේ ලියවිල්ල තුළ කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි මෙය තව ඉස්සරහට ගෙන යන්න ඕනෑ. මන්ත්‍රීවරුන් හැටියට අපි දකින දෙයක් තිබෙනවා. මන්ත්‍රීවරයා කියන්නේ, මේ විධියට සිටිය යුතු කෙනෙක්; ඔහුගේ හැඟීම්, ඔහුගේ ක්‍රියාකලාපය මේ සමාජයේ සියලු කාරණාවලට බලපාන දෙයක් කියන එක අපි සියලු දෙනාම පිළිගන්නවා. ඉදිරියේදී මේ දේශපාලන සංස්කෘතිය තුළ, මේ සමාජය තුළ ඉන්න අනෙකුත් සියලු දෙනාටම ආදර්ශයක් වන හැටියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉන්න ඕනෑ කියන දේ අප සියලු දෙනාම පිළිගන්නා දෙයක්. ඒ සම්බන්ධයෙන්

අපි කවුරුවත් වෙනත් අදහස්වල නැහැ. අපි එවැනි ආදර්ශවත් පුද්ගලයන් වෙන්න ඕනෑ. මේ රට තුළ, මේ සමාජය තුළ අපි සියලු දෙනාටම -අපේ ඡන්ද දායකයන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අනෙකුත් අය වෙන්න පුළුවන්- ආදර්ශවත් නොවී ඉඳීමම තමයි චර්යා ධර්ම සංග්‍රහයක් පවා අපට අද ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි අද හොඳ ආරම්භයක් ලබා දීලා තිබෙනවා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වටිනාකම තවත් ඉස්සරහට ගෙන යන්න පුළුවන් ලියවිල්ලක් අද මේ සභාවට ඉදිරිපත් කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලයත් එක්ක අද අපි ස්ථාවර නියෝග නවීකරණය කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ තිබෙන ස්ථාවර නියෝග විතරක් නොවෙයි, මේ තිබෙන අලුත් තත්ත්වයන් එක්ක අපේ රට තුළ තිබෙන යම් යම් නීති රීති, ආයතන සංග්‍රහය පවා ඉදිරියේදී නවීකරණය වෙන්න ඕනෑ. මොකද, තිබෙන හුඟක් දේවල් නවීන ලෝකයට, පවතින තත්ත්වයට ඔබින්නේ නැති බව අප දන්නවා. ඒවාත් එක්ක අද මේ සමාජය, මේ රට ඉස්සරහාට ගෙන යන්න බැහැ. ඉස්සරහාට ගෙන යන්න ඕනෑ නම්, අනිවාර්යයෙන්ම ඒවා අලුත් වෙන්න ඕනෑ; අලුත් අදහස් එන්න ඕනෑ; අලුත් නීති රීති එන්න ඕනෑ; අලුත් දේවල් එකතු කරන්න ඕනෑ.

උපදේශක කාරක සභා නැවත ක්‍රියාත්මක කිරීම අපි මේ කෙටුම්පතට එකතු කර තිබෙනවා. මම හිතන හැටියට ඒක ඉතාම හොඳ දෙයක්. මොකද, පාර්ලිමේන්තුව තුළ අපි වාද විවාද සහ අදහස් ඉදිරිපත් කිරීම පමණක් නොවෙයි සිදු කරන්නේ. උපදේශක කාරක සභා කියන්නේ, පාර්ලිමේන්තුව තුළ තිබුණු වැදගත්ම කොටසක්. විශේෂයෙන්ම අපේ එදිනෙදා කටයුතු, තිබෙන දේවල් ක්‍රියාත්මක කිරීම හා ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා වූ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වුණු උපදේශක කාරක සභා නැවත පණ ගන්වා ක්‍රියාත්මක කිරීම මේ තුළට ඇතුළත් කිරීම අපි ඉතාම අගයන්න ඕනෑ දෙයක්. ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභාත් එලෙසම පවත්වාගෙන යාමට ගත්ත ඒ තීන්දුවත් ඉතාම හොඳ දෙයක්. මොකද, පසුගිය කාලය තුළ ආංශික අධීක්ෂණ කාරක සභා තුළිනුත් යම් කාර්ය භාරයක්, - විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල කාර්ය භාරයක්- අපට කරන්න පුළුවන් වුණා. පාර්ලිමේන්තුව තුළ සිටින ගරු මන්ත්‍රීවරු 225ම එය නොදැක්කාට ඒවාට සහභාගි වුණු හා එම කාරක සභාවල සිටින මන්ත්‍රීවරු දැක්කා. විශේෂයෙන්ම යම් යම් ක්ෂේත්‍රවල කාලයක් තිස්සේ විසඳා ගන්න බැරිව තිබුණු ප්‍රශ්න අපට එම කාරක සභා තුළින් විසඳා ගන්න පුළුවන් වුණා. අලුත් අදහස් ඉදිරිපත් කරමින් යම් යම් ක්ෂේත්‍ර තුළ වෙනස්කම් කරන්න, තීන්දු තීරණ ගන්න පුළුවන් හැකියාව පවා අපට ලැබුණා. ආංශික අධීක්ෂණ කාරක සභාත් පවත්වාගෙන යමින්, නැවත උපදේශක කාරක සභා ක්‍රියාත්මක කිරීමත් අපේ පාර්ලිමේන්තු ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ගත් උත්සාහයක්. ඒ තීන්දු ගැන ස්තුතිවන්ත වෙමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටද ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
This Debate will be continued on a future date.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
The Debate stood adjourned accordingly.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය
பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை
CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07වැනි අහඹරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
This Debate will also be continued on a future date.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
The Debate stood adjourned accordingly.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Adjournment Motion is to be moved by the Hon. Dinesh Gunawardena. Before that, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇති දේශපාලන අර්බුදය
இலங்கையில் எழுந்துள்ள அரசியல் நெருக்கடி
POLITICAL CRISIS ARISEN IN SRI LANKA

[අ.භා. 3.56]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින වන විට ශ්‍රී ලංකාවේ උද්ගත වී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසාවෙන්, රට අරාජික තත්ත්වයට පත්ව ඇති බැවින් ඒ හා සම්බන්ධිත මෙම ගරු සභාවේ විවාදයක් අද දින ලබා දෙමින්, ජාතික වැදගත්කමකින් යුත් මෙම අර්බුදයට සුවිශේෂ අවධානය යොමු කරවීමට අවස්ථාව ඉල්ලා සිටිමු."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු දෙක හමාරකට පසුව පෙබරවාරි මාසයේ 10වන දින පළාත් පාලන ඡන්දය රට පුරාම පැවැත්වුණා. රටේ හැම දෙනාටම ඡන්දය දීමේ අවස්ථාව උදා වුණා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා සම්බන්ධ දේශපාලන පක්ෂ එකමුතුවෙන් විශාලතම ජයග්‍රහණයක් උදා කර ගත්තා. රජයට එරෙහිව ජනතා තීන්දුව ප්‍රකාශ වුණා. ඒ පිළිබඳව මා විශේෂයෙන් අවධානය ගෙනෙන්න කැමැතියි. එය බෙදී යන්නේ මෙසේය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 4,941,952යි; ආසන ප්‍රමාණය 3,369යි. එක්සත් ජාතික පක්ෂය ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 3,612,259 -[බාධා කිරීම්] ඔව්, 36 ලක්ෂ -[බාධා කිරීම්] ඒක තමයි. බොහොම සතුටුයි, 36 ලක්ෂය කියලා කියා ගන්න. පොඩ්ඩක් ඉන්න. දැන් වෙලා තිබෙන දේ ඉවසීමෙන් අහගන්න. ඔබතුමන්ලා ලබා ගත් ආසන සංඛ්‍යාව 2,385යි. -[බාධා කිරීමක්] ඔව්. වැටුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානය නොහොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 989,821යි; ආසන සංඛ්‍යාව 674යි. ජනතා විමුක්ති පෙරමුණ ලබාගත් ඡන්ද සංඛ්‍යාව 693,875යි; ආසන සංඛ්‍යාව 431යි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව 1,481,656යි; ආසන සංඛ්‍යාව 358යි.

දෙමළ ජාතික සන්ධානය -ITAK- ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 339,675යි; ආසන සංඛ්‍යාව 407යි. ඒ අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සියයට 44.65ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන ඇති අතර, එක්සත් ජාතික පක්ෂය ලබා ගෙන ඇති ඡන්ද ප්‍රතිශතය සියයට 32යි. එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ කවදාවත් මෙවැනි අන්ත පරාජයකට පත් වෙලා නැහැ. ඒ දේශපාලන තීන්දුව, මුළු රටම ප්‍රකාශ කළ තීන්දුව අනුව පළාත් පාලන ආයතන විශාල සංඛ්‍යාවක -239ක- ජයග්‍රහණය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට හිමි වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට හිමි වී තිබෙන්නේ, පළාත් පාලන ආයතන 41ක බලය පමණයි. දැන් දේශපාලන අර්බුදයක් මතු වෙලා, ජාතික අර්බුදයක් මතු වී තිබෙනවා. මේ සමඟම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළ අසාර්ථක වී තිබෙනවා; රාජ්‍ය පාලනය අසාර්ථක වී තිබෙනවා. ඒ වාගේම යහ පාලනය නමින් සිදු කළ මහ බැංකු Bond නිකුතුවෙන් ඇති වී තිබෙන මහා මූල්‍ය අර්බුදය හා වංචාව මුළු රටම ඉදිරියේ හෙළිදරව් වී හමාරයි. මේ හේතුසාධක මත අවුරුදු තුනක් ආණ්ඩු කරපු මේ ආණ්ඩුව ජනතාව විසින් අන්ත පරාජයකට පත්කොට, ප්‍රතික්ෂේප කර තිබෙනවා.

ජනතාව තීන්දුවක් දීලා තිබෙද්දී ආණ්ඩුව බලයේ එල්ලී සිටීමට තවත් උත්සාහ දරනවා. මේ ප්‍රශ්නය නිසා ඉදිරියේදී ඇතිවන්නේ දේශපාලන, ජනමත ගැටුමක්. එය ඉදිරියේ ආණ්ඩුවට පසු බහින්න සිදු වෙනවාමයි. ඔබ කෙරෙහි විශ්වාසයක් නැහැ. ඔබ කෙරෙහි විදේශ ආයෝජකයන්ගේ විශ්වාසයක් නැහැ. ඔබ කෙරෙහි කොටස් වෙළෙඳ පොළේ විශ්වාසයක් නැහැ. කඩා වැටෙන ආණ්ඩුවක් බවට පත්ව තිබෙන ඔබ කෙරෙහි විශ්වාසයක් නැති නිසා ලංකාවේ ධනේශ්වර ව්‍යාපාරයේ සිට සුළු ධන ව්‍යාපාර දක්වා අලුතෙන් ආයෝජන නොකර බලා සිටිනවා. මේක තමයි ඉදිරියේදී අපි මුහුණ දෙන දේශපාලන, ආර්ථික අර්බුදය. ඔබේ විසඳුම් රට පිළිගන්නේ නැහැ. ඔබේ විසඳුම් රට ප්‍රතික්ෂේප කර තිබෙනවා. සංඛ්‍යාත්මකව, සත්‍යයේ තොරතුරු මත ඔබ අසාර්ථකයි. ඔබ විසින් ප්‍රකාශ කළ මිත්‍යා තොරතුරු මතත් ඔබ අසාර්ථකයි. ඉතින් එවැනි ආණ්ඩුවකට ප්‍රජාතන්ත්‍රවාදීව රටක් ගෙන යෑමට බැරි නිසා තමයි අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් මේ මහා ජයග්‍රහණය ලබා ගත්තේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ තිබෙන වැරදි නියෝජනය නිවැරදි කරලා, මහජන මතයට සවන් දී මහා මැතිවරණයක් පවත්වලා, නිවැරදි මහජන මතයට අපේ රටේ පාලන තන්ත්‍රය නියෝජනය කිරීමේ අවස්ථාව ලබා දෙන්න. ඊට එරෙහිව දරදඬු වී කටයුතු කිරීමෙන් දේශපාලනික වශයෙන් ඔබට තාවකාලික තෘප්තියක් ලබන්න පුළුවන්. නමුත් එයින් අපේ රටේ සෑම ආර්ථික අංශයක්ම, රාජ්‍ය ක්ෂේත්‍රය, අපේ රටේ සියලු ජනතාව බරපතළ අර්බුදයකට මුහුණ දෙන තත්ත්වයක් ඇති වනවා. එක්සත් ජාතික පක්ෂය හා එක්සත් ජාතික පක්ෂයේ මිත්‍ර අමාත්‍යවරු මේ අවුරුදු තුන තුළ ගමන් කළ මාවත අසාර්ථක බව පෙන්වා, රටට එරෙහිව ගත් ක්‍රියා මාර්ග ජනතාව ප්‍රතික්ෂේප කර තිබෙනවා.

තමුන්නාන්සේලාට කියන්න පුළුවන්, මේක පළාත් පාලන මැතිවරණයක් කියලා. ගරු අග්‍රාමාත්‍යතුමා කියනවා, මේක පළාත් පාලන මැතිවරණයක් කියලා. එහෙම නම් පළාත් පාලන මට්ටමෙන් ඡන්දය පවත්වන්න ඉඩ තියන්න තිබුණා නේ. රාජ්‍ය නායකයෝ ඒකට සම්බන්ධ වුණේ මොකටද? ජනාධිපතිතුමා

ඡන්ද ව්‍යාපාරයට ගියා; අගමැතිතුමා ඡන්ද ව්‍යාපාරයට ගියා; මුළු ඇමති මණ්ඩලයම ගියා. ඒ ඉදිරිපත් කළ අභියෝගයට අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන මන්ත්‍රී කණ්ඩායම මුහුණ දීලා, ඔබතුමන්ලා ජාතික වශයෙන් අන්ත පරාජයකට පත් කරලා තිබෙනවා. ඉතින් මේ රජය අපේ රටේ ඇති කර තිබෙන විසඳුමක් නැති අර්බුදය -දේශපාලන ප්‍රශ්නය- වැඩි නොකොට ඉවත් විය යුතුයි. ඒ නිසා තමයි අපි ප්‍රකාශ කළේ, එක්සත් ජාතික පක්ෂයට තවදුරටත් ආණ්ඩු කරන්න බලයක් නැහැ කියලා. ඒ සන්ධානය දැන් කැඩිලා ඉවරයි. දැන් සන්ධානයක් නැති බව ප්‍රකාශ කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව ජාතික ආණ්ඩුවකට දුන් වරම ඉවරයි.

දැන් අලුත් ආණ්ඩුවක් පිහිටුවන බව එක්සත් ජාතික පක්ෂයේ අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කරනවා. හොඳයි. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවනවා කියන්නේ, අලුත් ආණ්ඩුවක්. ඒකට ජනාධිපතිවරයාට අවසර දෙන්න වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මිස වෙන විධියකට නොවෙයි කියන එක අපි ඉතාම වග කීමෙන් බරපතළව ප්‍රකාශ කරනවා.

දැන් මේ කිසිම ඇමතිවරයකු අවලංගු වූ ආණ්ඩුවේ අමාත්‍ය ධුර දරන්නේ නැහැ. අලුත් ආණ්ඩුවක් පිහිටුවන තුරු ඒ කිසිම ක්‍රියාවක් වලංගු වන්නේ නැහැ. සම්පූර්ණ රාජ්‍ය යන්ත්‍රණයම අද අඩ පණ වී බලා සිටිනවා. ඔබතුමන්ලාට රටට ඔක්සිජන් දෙන්නත් බැහැ. ඔබතුමන්ලාට ඔක්සිජන් දෙන්න රටටත් බැහැ. ඒ නිසා දැන් තිබෙන්නේ "ආයුබෝවන්" කියා ගෞරවයෙන් ගෙදර යෑමයි. [බාධා කිරීම්] මේ ප්‍රශ්නයට අලුතින් විසඳුමක් සෙවීමට රටට අවස්ථාව දෙන්න. මේ, රටේ කිසිම ප්‍රශ්නයකට විසඳුමක් සොයා ගන්න බැරි වුණු ආණ්ඩුවක්. අලුත් විසඳුමක් ගෙනෙන තීන්දුවක් ප්‍රකාශ කරන්න රටේ ජනතාවට වරම දෙන්න.

[අ.භා. 4.04]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් විසින් ගෙන එන ලද මේ යෝජනාව මා ස්ථීර කරනු ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා දීර්ඝ කාලයක් ප්‍රමාද කරලා තටමලා තටමලා ඉතාම අමාරුවෙන් තමයි පළාත් පාලන මැතිවරණය මේ රටේ මහ ජනතාවට දිනා දෙන්න පුළුවන් වුණේ කියලා ඔබතුමාත් දන්නවා ඇති. පැරදුණත් පාලන බලය අල්ලා ගන්න පුළුවන් වන විධියට තාක්ෂණ ක්‍රමවේද යොදලා, මැතිවරණ ක්‍රමයේ අසාමාන්‍ය වෙනස්කම් කරලා තමයි තමුන්නාන්සේලා මැතිවරණ ක්‍රමයත් හදා ගත්තේ. මේ ඔක්කෝම කරලා තමුන්නාන්සේලා මැතිවරණය පැවැත්වුවා. නමුත්, මැතිවරණ කොමිසම තවම තටමනවා, මැතිවරණ ප්‍රතිඵල අවසාන වශයෙන් නිකුත් කරන්න විධියක් නැතිව. මා හිතන හැටියට ස්වාධීන මැතිවරණ කොමිසම ඔවුන් කරපු පළමුවැනි මැතිවරණයෙන්ම කොමිසමේ කලිසම ගලවා ගෙන ඉවරයි. ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මහ ජනයාට දීපු විශ්වාසය, කියපු පුරාජේරු කථා සියල්ලම කොමිසමේ සභාපතිවරයා විසින් නැත්තටම නැති භංග කර ගෙන ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩ බැරි ආණ්ඩුව වාගේම වැඩ බැරි කොමිසමක් බවට අද ඒ කොමිසමත් පත් වෙලා ඉවරයි. තමුන්නාන්සේලා මේ පළාත් පාලන මැතිවරණයට ගියේ, මේක ගමේ පාලම, බෝක්කුව, පාර පිළිබඳව තීරණය කරන මැතිවරණය හා ගමේ නායකයා කවුද කියලා තීරණය කරන මැතිවරණය කියලා, මේ මැතිවරණයට තිබෙන අර්ථය ප්‍රාදේශීයකරණය කරමින්.

තමුන්නාන්සේලාගේ විශ්වාසවන්ත රක්ත මිත්‍රයා, ජනතා විමුක්ති පෙරමුණේ නායකයා කියනවා මම අහගෙනයි, "මහරගම බයිසිකලය කොහොමද දිනුවේ, ඒ බයිසිකලයෙන් ඡන්දය ඉල්ලූ ලැයිස්තුවේ වැඩි දෙනෙක් ඉන්නේ කුලියාපිටියේ, අපේක්ෂකයා කවුද කියලාවත් දන්නේ නැතිව පොහොට්ටුවට කතිරය ගැහුවේ කොහොමද" කියලා. මේ රටේ තිබුණේ පළාත් පාලන මැතිවරණයක් වුණාට, මේක ජන මත විචාරණයක් හැටියට සලකා ඡන්දය පාවිච්චි කරන්නයි අපි මුල සිටම මේ රටේ මහ ජනතාව පෙලඹෙව්වේ කියන එක ඒ අයට අපි කියන්න ඕනෑ. ජනාධිපතිවරයා කිව්වා, අගමැතිතුමාගේ පාර්ශ්වයෙන් කිව්වා, ගමේ පාර, බෝක්කුව ඇතුළුව ගම හදන්න ප්‍රාදේශීය සභාවට සල්ලි ටික ලැබෙන්නේ බලය තිබෙන අයට ඡන්දය දුන්නොත් පමණයි කියලා. නමුත්, මිනිස්සු ඡන්දය දුන්නේ ගමේ පාලම, බෝක්කුව, ලයිට් කණුව දිහා බලා නොවෙයි. රටත්, ජාතියත් පසුගිය අවුරුදු තුන ඇතුළේ ඇද ගෙන ගිය විනාශකාරී මාර්ගය දිහා බලා, ඒ මාර්ගයෙන් මේ රට එළියට ගන්න ඕනෑ නිසායි මේ මැතිවරණයේදී සියයට 80කට ආසන්න පිරිසක් ඡන්ද පොළට ගිහිල්ලා ඡන්දය දුන්නේ. එපමණක් නොවෙයි. බිහි කරලා ඉතා කෙටි කාලයක් ඇතුළත තරග වැදුණු මේ දේශ මාමක බලවේගයන්ගේ එකතුව -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- ජයග්‍රහණය කරවන්න මේ රටේ පොදු ජනතාව තීරණය කළා. ඒ මැතිවරණ ප්‍රතිඵලයට අනුව එක්සත් ජාතික පක්ෂය ලබා ගෙන තිබෙන ඡන්ද ගණන් කරලා පාර්ලිමේන්තු මැතිවරණයකට මාරු කරලා බලන්න. මේ මැතිවරණය පාර්ලිමේන්තු මැතිවරණයක් හැටියට සලකා ගත්තොත් එක්සත් ජාතික පක්ෂයට ලැබුණේ ආසන 67යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පැත්තෙන් අපට තිබෙන අමාරුම මැතිවරණයටයි අපි මුහුණ දුන්නේ. තමුන්නාන්සේලා පළාත් සභා මැතිවරණ කල් දැම්මා.

තමුන්නාන්සේලා දන්නවා, පළාත් සභා මැතිවරණ දිනන එක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඉතාම පහසුයි කියා. එම නිසා තමුන්නාන්සේලා ගෙනාවා, අලුත් මැතිවරණ ක්‍රමයක්. අපි ගෙනාපු මැතිවරණ ක්‍රමය ව්‍යාකූල තත්ත්වයකට පෙරළුවා. එහෙම කරලා "ආ! මේ පිට්ටනියේ පුළුවන් නම් තරග වැදිලා බලමු" කියන අභියෝගයත් එක්කයි තමුන්නාන්සේලා මේ මැතිවරණයට ආවේ. මේක අමාරුම පිට්ටනියක්. මැතිවරණයට අපේක්ෂකත්වය නොලැබෙන විශාල පිරිසක් අමනාප වනවා; ස්වාධීන ලැයිස්තු එනවා; ඥාතිකම, කුලය, මිත්‍රකම වාගේ එක එක කාරණා නිසා ඡන්ද වෙනස් වනවා; ජාතික දේශපාලන අරමුණුවලට වඩා ප්‍රාථමික දේශපාලන අරමුණු උඩට එනවා. මේ මැතිවරණය තමයි, අපට මුහුණ දෙන්න තිබුණු අවාසිදායකම මැතිවරණය. හැබැයි, මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට අපි හිස නමා ආචාර කරනවා, මේ මැතිවරණය ජාතික මැතිවරණයක් හැටියට අරගෙන, මේ ජාතික මැතිවරණයේදී තමන්ගේ ජාතික යුතුකම ඉටු කරන්න ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ඉහළම ජයග්‍රහණයක් ගෙනැල්ලා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ, අපට මුහුණ දෙන්න තිබුණු අමාරුම මැතිවරණය. මේ මැතිවරණය අමාරු නිසා තමුන්නාන්සේලා මුලින්ම අපට අභියෝගය භාර දුන්නා, "ආ! එන්න, ක්‍රිඩා කරලා පෙන්වන්න" කියලා. නමුත්, ඒ මැතිවරණය මහින්ද රාජපක්ෂ මැතිදුන්ගේ නාමයට විශිෂ්ට ජයග්‍රහණයක්. ඒ තුළින් එතුමා ගැන තිබෙන විශ්වාසය අලුත් වුණා.

මේ ආණ්ඩුව අවුරුදු තුනක් ගෙන ගිය තමුන්නාන්සේලා මොකක්ද කළේ? බන්ධනාගාර බස් රියයි, පොලීසියයි, උසාවියයි, රාජපක්ෂලයි, අපියි නැත්නම් පසුගිය අවුරුදු තුනට රූපවාහිනී නාලිකාවලට, පත්තරවලට ප්‍රවෘත්ති නැහැ. තමුන්නාන්සේලා ඔව්වරයි කළ් ආපු දවසේ ඉඳලා. අද එක් කෙනෙක් ගෙනියනවා බන්ධනාගාර බස් එකේ, හෙට තව කෙනෙක් ගෙනියනවා, එක්කෙනෙක් ඇප පිට එළියට එනවා, තව හාමුදුරු නමක් අලි

[ගරු විමල් වීරවංශ මහතා]

පැටියෙක් හින්දා හිරේ දානවා, තව මොකක් හෝ කියලා රණ විරුවෙක් හිරේ දානවා. බන්ධනාගාර බස් එකයි, බන්ධනාගාරයයි, අධිකරණයයි, පොලීසියයි, FCID එකයි, CID එකයි නොතිබුණා නම් පසුගිය අවුරුදු තුනට තමුන්නාන්සේලා කරලා තිබෙන කෙංගෙඩියක් නැහැ. මේ රටේ ජාතික මනස හඳුනන්නේ නැති පාලනයක් තමුන්නාන්සේලා අරගෙන ආවේ. තමුන්නාන්සේලාගේ අගමැතිවරයා මේ රටේ ජාතික මනස හඳුනන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ අගමැතිවරයා එංගලන්තය ගැන කථා කරන්නේ.

පසුගිය දවස්වල බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත් වෙනවාද, නැද්ද කියන එක තීරණය කිරීම සඳහා එහි ජනමත විචාරණයක් තිබුණා. එම ජනමත විචාරණයේ ප්‍රතිඵල අනුව ඩේවිඩ් කැමරන් අගමැතිවරයා, "මේක ජනමතවිචාරණයක්, මගේ පටටම ගැන තීරණය කරන ඡන්දයක් නොවෙයි" කියලා තනතුරින් ඉවත්ව නොගිහින් හිටියේ නැහැ, තනතුරෙන් ඉල්ලා අස් වුණා. තමන් දරපු මතය ජනමත විචාරණයේදී ප්‍රතික්ෂේප වුණු නිසා ඔහු ආණ්ඩු බලය අතහැරියා. එංගලන්තය ගැන, වෙස්මිනිස්ටර් සම්ප්‍රදාය ගැන බොරුවට ඉංග්‍රීසියෙන් කථා කළාට වැඩක් නැහැ, ඒ සම්ප්‍රදායේ තිබෙන යහපත් දේ ආරක්ෂා කර ගන්නට බැඳෙන්නේ නැත්නම්.

තමුන්නාන්සේලා දන්නවා, 2015 ජනවාරි මාසයේ 08 වෙනිදා හිටපු අගමැතිවරයාව වෙනස් කළේ කොහොමද? 2015 ජනවාරි 08 ලැබුණු ජන වරම ජනාධිපතිවරණ ජන වරමක්. මහ මැතිවරණ ජන වරමක් නොවෙයි. ජනාධිපතිවරණ ජන වරම පාවිච්චි කළා, හිටපු දි.මු. ජයරත්න අගමැතිවරයා ඉවත් කරලා ඒ වන විට හතළිස් ගණනක සුළු පිරිසක් සිටි එක්සත් ජාතික පක්ෂය තමන්ගේ අගමැති කෙනෙක් ගෙනෙන්න. වෙනත් ජන වරමක් පාවිච්චි කළා, බල පෙරළියට. අද මේ පළාත් පාලන මැතිවරණයෙන් ජාතියක් විධියට තීන්දුව දීලා තිබෙනවා. ඒ තීන්දුව සැලකිල්ලට ගන්න තමුන්නාන්සේලාට ඥානයක් නැද්ද? දැන් මේ ආණ්ඩුව මළ කුණක් වෙලා ඉවරයි.

තමුන්නාන්සේලා මේක තව දුරටත් තියාගෙන ඉන්න ගියොත් තව අවුරුද්දක් විතර යන විට ඕජස් ගලන, සැරව ගලන, පිළිකුල් සහගත මළ කුණක් විධියට තමයි මේක ඉවත් කර දමන්න වෙන්නේ.

මේ ආණ්ඩුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්නවා. එතුමන්ලා මේ ආණ්ඩුව ඇතුළේ ලැහලා පසුගිය අවුරුදු තුනේ ගත කළ ජීවිතයට අදාළ ප්‍රතිඵල එතුමන්ලාට ලැබිලා තිබෙනවා. බොහොම අමාරුවෙන් රාජ්‍ය බලය පාවිච්චි කරලා, දන්න කියන සෙල්ලම් ඔක්කොම දාලා, යූඑන්පී විරෝධයකුත් තමන්ට ආරෝපණය කරගෙන තමයි එතුමන්ලා කටයුතු කළේ. ජනාධිපතිවරයා කිව්වා නේ, පසුගිය අවුරුදු තුන තුළ යූඑන්පී එක මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා කියලා. අපි නොවෙයි නේ කිව්වේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කැබිනට් එකේ ප්‍රධානියා කිව්වේ, යූඑන්පී එක මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා කියලා. ඒ විධියට යූඑන්පී විරෝධී කථා පවත්වමින්, ඒ ඔක්කොම කරලාත් ගන්න පුළුවන් වුණේ ලක්ෂ 14ක පමණ ඡන්ද ප්‍රමාණයක්. ඒ ඔක්කොම කරලාත් ගත්තේ ලක්ෂ 13කට මදක් වැඩි ඡන්ද ප්‍රමාණයක්. එතකොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිතිවාසිකම් කියන්නට පුළුවන්ද? මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් නොවෙයි. නමුත් ඒ ප්‍රශ්නය අපි නියෝජනය කරන කඳවුරට අදාළ ප්‍රශ්නයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පොළොන්නරුවත් පරාදයි. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ සිටිනකොට දිනපු ප්‍රදේශත් මේ පාර පරාදයි. එම නිසා මේ හැම දෙයකින්ම පෙන්වන්නේ මොකක්ද?

තමුන්නාන්සේලාගේ මරු ක්‍රමනේ තිබෙන්නේ. පළමුවෙනියා වෙච්ච මිනිහාට වඩා ලොකුයි ලු දෙවෙනියායි, තුන්වෙනියායි, හරතවෙනියායි ගත්ත ඡන්ද ටික. උදාහරණයක් හැටියට මම ඉස්කොලේ පන්තියේ පළමුවෙනියා වෙනවා ලකුණු වැඩියෙන් අරගෙන. දෙවෙනියාට ලකුණු ගත්ත කෙනාගේ සහ තුන්වෙනියාට ලකුණු ගත්ත කෙනාගේ ලකුණු එකතු කරලා කියනවා, එයාට වඩා ලකුණු වැඩියි කියලා. මේ වාගේ ප්‍රාථමික තර්ක දාලා පරාජයේ හෙලුව වහ ගන්න හදන්න එපා. තමුන්නාන්සේලා දන්නවා පරාජයේ ඇත්ත හේතුව මොකක්ද කියලා. මේ ගෙනාවේ තිස්වෙනි පරාජය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමනි, අග්‍රාමාත්‍යතුමනි, තමුන්නාන්සේලාට ඔය තනතුරුවල ඉන්න අයිතියක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අතේ තියාගෙන ඉන්න මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට දැන් කිසිම හේතුවක් නැහැ. පක්ෂයේ ඡන්ද ප්‍රමාණය ලක්ෂ 13ට බස්සපු නායකයෙකුට එම පක්ෂය අතේ තියාගෙන ඉන්න කිසිම හේතුවක් නැහැ. අග්‍රාමාත්‍යවරයා පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් - අපි දන්නවා, හිත යටින් නම් වෙනත් ප්‍රාර්ථනාවක් තිබෙන්නේ. එතුමා කොයි වෙලාවේ ඉවත් වෙලා යයිද කියලා තමයි තමුන්නාන්සේලා හිත හිතා ඉන්නේ. හැබැයි ඇතුළු වෙන කොටම කුට්ටියක් හම්බ වුණා, ඉන් පසුව හිත ලොක් වුණා. ලොකු ගාණක් හම්බ වුණා. බැදුම්කර සල්ලි එහේ මෙහේ ගියා. ඡන්දයේ දීත් ගියා; ඡන්දයෙන් පස්සෙත් ගියා. අපේ දිලිප් වෙදආරච්චි රාජ්‍ය ඇමතිතුමා උඩු රැවුලත් පෙන්වාගෙන හීනි හිනාවක් දානවා. සමහර අයට pocket money ලොකු මිටියක් හම්බ වුණා. ඒ නිසා සල්ලිවලින් හිතේ තිබෙන ආවේගය යට වුණා. "ඉවසපාන් පපුව" කියලා යන්තම් සල්ලිත් එක්ක මේක බැලන්ස් කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ප්‍රශ්නයක් නැහැ තමුන්නාන්සේලාට හොඳ නම් අගමැතිවරයාව තියා ගන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ ආණ්ඩුවට මෙහෙම යන්න කිසිම අයිතියක් නැහැ. ජනතාව මේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා ඉවරයි. ජනතාව ප්‍රතික්ෂේප කළ ආණ්ඩුවකට, ජන බලයක් නැති ආණ්ඩුවකට, ජන වරමක් නැති ආණ්ඩුවකට මේ රට ගැන තීරණ ගන්නට අයිතියක් නැහැ. තමුන්නාන්සේලා ඉන්න හැම තත්පරයකම රුපියල කඩාගෙන වැටෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද රුපියල කඩාගෙන වැටෙනවා. දැන් ඇමෙරිකානු ඩොලරය රුපියල් 158යි. එය තවදුරටත් රුපියල් 180 දක්වා ඉහළ යනවා. කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා. ආයෝජකයන් එන එක නතර වෙනවා. තමුන්නාන්සේලා ඩීසල්, පෙට්‍රල් මිල ඉහළ දමන්න යනවා. බදු ආදායම වැඩි කරගන්න කියලා බදු පෝරියල් එක පටවනවා. පාර්ලිමේන්තුවේ අනුමැතිය නැතිව දැන් ණය ගන්නත් අලුත් ක්‍රමයක් පාවිච්චි කරන්න බලනවා. අග්‍රාමාත්‍යවරයාට හිතෙන හිතෙන තැනින් ණය ගන්න පුළුවන් වන විධියේ පනතකුත් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. මේ ඔක්කෝම කරලා ඉවර වුණාට පස්සේ රටක්

ඉතුරු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා කාලා ඉවර කළාට පස්සේ මේ රට බේරාගන්න පුළුවන් තත්ත්වයකට එන්නේ නැහැ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියනවා, පවු නොදී, තව දුරටත් වාචාලකම් දොඩවන්නේ නැතුව, දෙකයි තුනයි එකතු කළාම එකට වඩා ලොකුයි කියන මෝඩ, අමන, තර්ක දමන්නේ නැතිව, අඩු ගණනේ ඇඳිවත හෝ රැකගෙන ගෙදර යන්න ඕනෑය කියලා හිතනවා නම්, මේ රටේ මහජන මතය පිළිගෙන, මහජන මතයට ඇහුම් කන් දීලා, මහජන මතයට යටත් වෙලා තමුන්නාන්සේලාට බැහැලා යන්න පුළුවන්. එහෙම නැතුව තව දුරටත් ඉන්න හදනවා කියන්නේ,- [බාධා කිරීමක්] ඇයි, දත් දොස්තර මහත්තයෝ? ඇයි, නැව් මහත්තයෝ? අනේ! යනවා "නැවෝ" යන්න. නැව් හතයි. මේ කම්බ හොරු ටික "හොරු, හොරු" කියලා කෑ ගහනවා. රාජිත සේනාරත්න මහත්තයෝ! ඔය කම්බ හොරු ටික "හොරු, හොරු" කියලා කෑ ගහලා අවුරුදු තුනේ නාටකයක් කළා. දැන් ඒ නාටකය ඉවරයි. කම්බ හොරුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. මහ බැංකුව හොරා කාපු හොරුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. රට විකුණාගෙන කන එවුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. ඒ නිසා තවත් මෙතැන වාචාලකම් දොඩවන්න එපා. නැටීවේ හිටං ගොම, නැටීවේ හිටං ගොම. යන්න, යන තැනකට පාර කපාගන්න. දැන් යන තැනකට පාර කපාගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
දැන් යන තැනකට පාර කපාගන්න. දෙයියෝ බුදුන් අදහනවා නම්, අදහන්න පටන් ගන්න. ලජ්ජා නැද්ද? ලජ්ජා නැද්ද රාජිත මහත්තයෝ. දත් ගලවලා නැව් ගත්ත නැව්පතියා. මෙහෙම නැව්පතියෝ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය වාචාලකම්වලට මේ රටේ ජනමතය යටත් කරන්න බැහැ. මේ මව් පොළොව තමුන්නාන්සේලාව ප්‍රතික්ෂේප කරලා ඉවරයි. තවත් රටට වද දෙන්න එපා. මේ රටට තවත් වද දෙන්න එපා. තවත් මේ රටේ ආර්ථිකය කන්න එපා. මේ රට තවත් විනාශ කරන්න එපා. ඒ නිසා මහජන මතයට ඇහුම් කන් දීලා කරුණාකරලා බැහැලා යන්න. පව් නොදී යන්න, පීවං නොවී යන්න, අකුළාගෙන යන්න. එහෙම නැත්නම් වෙන්නේ, කුදලලා යවන්නයි. එහෙම නැත්නම් වෙන්නේ, හැඳි ගෑවෙන විධියට යවන්නයි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමා. [බාධා කිරීම්]

[අ.භා. 4.16]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය අද උදේ මහ ලොකුවට කිව්වා, දැන් ජාතික ආණ්ඩුව නැහැයි කියලා. දැන් ජාතික ආණ්ඩුව නැද්ද? "ලංකාදීප" පත්තරේ ලිපියක් තිබෙනවා. මේ අය ඒ පත්තර කැල්ලත් අරගෙන ඇවිල්ලා. මහින්ද අමරවීර මැතිතුමා විසින් කළ ප්‍රකාශයක් කියලා ලිපියක් "ලංකාදීප" පත්තරේ තිබෙනවා. මහින්ද අමරවීර මැතිතුමා දැන් නිවේදනයක් නිකුත් කරලා කියනවා, "ඒක අමූලික බොරුවක්" කියලා. "අමූලික බොරුවක්, ඒ විධියේ කිසිම ප්‍රකාශයක් මම කළේ නැහැ" කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කෝ, ඒ ප්‍රකාශය?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ තිබෙන්නේ. මගේ ළඟ තිබෙනවා. මට ආපු "මැසේජ්" එකක තිබෙනවා. [බාධා කිරීමක්] ඔහොම ඉන්න, ඔහොම ඉන්න. "අලුත් අගමැතිවරයෙක් පත් කරන්න කියලා මම ලියුම් ලිව්වේ නැහැ. පත්තරේ තිබෙන කථාව බොරු. මහින්ද අමරවීර 'සියක' ට කියයි."

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Point of Order එකක් නොවෙයි. මම මේක **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක සභාගත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි ලේඛනයක් ගැන කියනවා නම් කරුණාකර ඒක සභාගත කරන්න ඕනෑ. පෝන් එක දිහා බලාගෙන; චිත්‍රපටයක් දිහා බලාගෙන බොරු කියන්න එපා. මේ අප්පයි, පුතායි දෙන්නම ඔහොමයි. කට ඇරියොත් පව කෙළින්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා තාක්ෂණය දන්නේ නැහැ. නව තාක්ෂණය ගැන දන්නේ නැහැ. පරණ කොළ කැලි ගැන විතරයි දන්නේ. මොකද, මෙතුමා GCE O/L විභාගය fail.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඒකයි වුණේ. GCE O/L විභාගය fail. පුළුවන් නම් තමුන්නාන්සේ අ.පොස. (සාමාන්‍ය පෙළ) සහතිකය පෙන්වන්න. මෙතුමා තිස්ස මහා විද්‍යාලයට ගියාට විභාගය pass වුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් ප්‍රකාශක ගරු රාජිත සේනාරත්න මැතිසඳ කියනවා, මම GCE O/L විභාගය fail කියලා. එතුමා ඒක ඔප්පු කළොත් මම හෙට මේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයෙන් අයින් වෙනවා. පුළුවන් නම් ඔප්පු කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
A/L කළේ නැත්තේ ඇයි? [බාධා කිරීම්] A/L කළේ නැත්තේ ඇයි? [බාධා කිරීම්] O/L විෂයයන් 6ක් පාස්. O/L විෂයයන් 6ක් පාස් වුණාම ඕනෑ කෙනෙක් පාස්. විෂයයන් හයයි ඕනෑ.[බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
විෂයයන් හයයි ඕනෑ, O/L පාස් වෙන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, එකම කැරැල්ලට සහභාගිවෙලා, ඔබතුමන්ලා ඉගෙන ගන්නකොට, උපාධිධාරීන් වනකොට එතුමා කොහේද? එතුමා ඕනෑ නම් O/L විෂයයන් හයක් පාස් වෙන්න ඇති. A/L කරන්න බැරි වුණේ ඇයි? එතුමාට තාක්ෂණය තේරෙන්නේ නැහැ. මා එය **සභාගත*** කරනවා.

තව කාරණා තිබෙනවා. මෙන්න තිබෙනවා, "අද දෙරණ" ප්‍රවෘත්ති. මෙහි තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු වෙනත් කිසිම පක්ෂයකට සහයෝගය දෙන්නේ නැහැයි කියලා. [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේලාගේ "ගේම" ඉවරයි නේ. [බාධා කිරීම්] "ගේම" ඉවරයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] බෙරුවල එක ඡන්දයයි. මතක තබා ගන්න. [බාධා කිරීම්] මේ බලන්න. මෙවරත් මහින්ද රාජපක්ෂට ඡන්ද කීයද තිබෙන්නේ? මෙවා සභා. මේ සභාවලින් දිනපු ප්‍රතිඵලය විතරයි. නමුත් ප්‍රතිශතය ගත්තාම කීයද? පොහොට්ටුවට ලැබී තිබෙන ඡන්ද ප්‍රතිශතය සියයට 44.65යි. එතකොට මහින්ද රාජපක්ෂ ඉතුරු ටික ගන්නේ කොහෙන්ද? ලබන සැරේ ජනාධිපතිවරණ - [බාධා කිරීම්] කීයද? සියයට 44.65යි. ආසන කීයද? ආසන -කොට්ඨාස- 3,369යි. එක්සත් ජාතික පක්ෂයේත්, ජනාධිපතිතුමාගේ කණ්ඩායමේත් - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය - ඡන්ද සංඛ්‍යාව එකතු කළාම ප්‍රතිශතය සියයට 46.01යි. [බාධා කිරීම්] අපට ආසන - කොට්ඨාස - 3,417ක් තිබෙනවා.

2010 දී මහින්ද රාජපක්ෂ ගත්ත ඡන්ද සංඛ්‍යාව කීයද? 2010 දී සියයට 57.88ක ඡන්ද ප්‍රතිශතයක් ගත්තා. එදා ලබා ගත් සියයට 57.88 ප්‍රතිශතය 2015 වනකොට කීයක්ද අඩු වුණේ? ඒ ප්‍රමාණය සියයට 47.58 දක්වා අඩු වුණා. පරදින අවස්ථාවේ තිබුණේ, සියයට 47.58ක ප්‍රතිශතයක්. 2018 ලබා ගත් ඡන්ද ප්‍රතිශතය කීයද? සියයට 44.65යි. එන්න-එන්නම අඩු වෙනවා; එන්න-එන්නම වැටෙනවා. [බාධා කිරීම්] ජනාධිපතිවරණය දිනන හැටි කියන්න. [බාධා කිරීම්] මහින්ද රාජපක්ෂයට විරුද්ධ ඡන්ද සංඛ්‍යාව කීයද කියලා බලන්න. 2010 දී සියයට 40.15යි; 2015 දී සියයට 51.28යි; 2018 දී සියයට 55.35යි. [බාධා කිරීම්] මෙන්න තිබෙනවා, ප්‍රමාණය; මහින්ද විරෝධය වැඩිවෙනවා; මහින්ද ඡන්ද අඩුවෙනවා. [බාධා කිරීම්] ඔය "චූන්" එක දමාගෙන ඉන්නකෝ. [බාධා කිරීම්] තව "චූන්" එක දමාගෙන ඉන්නවා. මේ ගොල්ලෝ මහ ලොකුවට කියනවා, "දිනුවා"ය කියලා. දිනුවේ මොනවාද? ඡන්ද නොවෙයි, සභා දිනුවේ. ඡන්ද ප්‍රතිශතය ගත්තාම දිනලා නැහැ. මේ ආණ්ඩුවේ නරකම කාලය මෙයයි. [බාධා කිරීම්]

ඕනෑම ආණ්ඩුවක් පත්වෙලා අවුරුදු 3කට පස්සේ තමයි තමන්ගේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නේ. 2005 දී මහින්ද රාජපක්ෂ මහත්මයා දිනුවාම එතුමා 2005 දී වැඩ පටන් ගත්තේ නැහැ නේ. ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ 2008, 2009 වනකොටයි. [බාධා කිරීම්] ඔය කෑ ගහන කට්ටිය එදා හතර මායිමක සිටියේ නැහැ. තමුන්නාන්සේලාත් සිටියේ නැහැ; දන්නේත් නැහැ. තමුන්නාන්සේලා ගම් සභාවේ සිටියේ. තමුන්නාන්සේලා ඒ කාලයේ සිටියේ ගම් සභාවේ; පළාත් සභාවේ. තමුන්නාන්සේලා කොහේද සිටියේ? ඒ ආණ්ඩුවේ හිටියේ අපි. මතක තියා ගන්න. එදා යුද්ධය පැවති වෙලාවේදී ඒ ආණ්ඩුව ආරක්ෂා කරන්න මෙතැන කථා කළේ තමුන්නාන්සේලා නොවෙයි, අපි. මතක තියා ගන්න. ඒ වෙලාවේ මේ අයියලා කොහේද හිටියේ? මේ අයියලා හිටියා, ගම් සභාවල; ප්‍රාදේශීය සභාවල. මේගොල්ලන් ඒ කාලයේ පාර්ලිමේන්තුවේ වැසිකිළියටවත් ගිහිල්ලා නැහැ. [ඝෝෂා කිරීම්] තව අවුරුදු දෙකක් ඉතුරුවෙලා තිබෙනවා. අපිට ජනතාව හොඳ පාඩමක් උගන්වලා තිබෙනවා. [ඝෝෂා කිරීම්] ඒ කාරණය අපි පිළිගන්නවා. නමුත් ආණ්ඩුව එහෙම පරාද කරලා නැහැ. [ඝෝෂා කිරීම්] පැහැදිලිව එය මතක තියා ගන්න. එදා -ජනවාරි මාසයේ 08 වැනිදා- අපේ බලවේගය ගත්ත ඡන්ද ප්‍රමාණයට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් අපි අද අරගෙන තිබෙනවා. අපි වැඩි ඡන්ද ප්‍රතිශතයක් අරගෙන තිබෙනවා. අපේ ඡන්ද ප්‍රතිශතය සියයට 51 ඉඳලා සියයට 55 පන්නලා තිබෙන බව මතක තියා ගන්න. මේ ප්‍රතිශතයත් එක්ක තමයි අපි ඊළඟට එන ජනාධිපතිවරණයට යන්නේ.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය "චූන්" එක එතකොට කොහොමද වෙන්නේ කියලා අපි බලා ගනිමු. දැන් තමයි කට්ටියගේ නඩු හබ අවසන්වෙලා එළියට එන්නේ. මේගොල්ලන් රජ ගෙදර නොව හිර ගෙදර යන කාලය තමයි දැන් උදාවෙලා තිබෙන්නේ. ඊළඟ මැතිවරණය එනකොට දැන් මෙතැන ඉන්න කී දෙනෙකු සිටීවිද කියන එකයි අපිට ගණන් හදා ගන්න තිබෙන්නේ. අන්න එදාට "චූන්" එකද, "මෝඩ චූන්" එකද කියලා ඔබතුමන්ලාට තේරේවි. මේ කාරණා මතක තියා ගන්න. හරිද? [සෝෂා කිරීම්] ගිය සැරේ ආණ්ඩුවට එක්කහු වෙලා, ආණ්ඩුවේ බලය පාවිච්චි කළා. මේ රටේ ධනය විශාල වශයෙන් මංකොල්ල කාපු අය; මිනී මරපු අය. තාජුඩීන්ගේ මරණයට අදාළ වාර්තා ඔක්කොම දැන් සකස් කරලා අවසානයි. දැන් නඩු දාන්න තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට විනාඩි පහක් මම ලබා දෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ලසන්ත වික්‍රමතුංගගේ මරණයට අදාළ නඩුව, එක්නැලිගොඩව අතුරුදහන් කරපු සිද්ධියට අදාළ නඩුව - ඔක්කොම- හෙට දවස වනකොට එනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාත් එක්ක තමයි ඉදිරි මැතිවරණවල ඡන්ද ප්‍රතිඵල නිකුත් වෙන්නේ කියන කාරණය මතක තියා ගන්න. මම ආණ්ඩුවට කියන්නේ ඉක්මන් කරලා, වෙනදා වාගේ මන්දගාමී නැතිව මේ වැඩ කටයුතු කරන්න කියලායි. එතකොට අපිට බලා ගන්න පුළුවන්, ඡන්ද ප්‍රතිඵල කොහොමද කියලා. යාළු මිත්‍රකම් අනුව එක් කෙනෙකුවත් බේරා ගන්නේ නැතිව මේ වැඩ කටයුත්ත කරන්න.

තමුන්නාන්සේලා අද උදේ වරුවේ "චූන්" වුණා. අද උදේ වරුවේ චූන් වුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානය එළියට ඇවිල්ලා, ආණ්ඩුව කැඩිලා ඔක්කොම සිදු වෙයි කියලා. අනේ! දවල් බත් කාලා ඉවර වනකොට ඒ "චූන්" එක ඉවරයි. [සෝෂා කිරීම්] දැන් තව "චූන්" එකක් තිබෙනවා. හරිද? හොරකම් ගැන කථා කරනවා. තමන්ගේ ආයතනයේ සල්ලි අරගෙන ගිහිල්ලා, තමන්ගේ අක්කාගේ දුවගේ මහුල් කාපු ඇමතිවරු ලංකා ඉතිහාසයේ කවදාවත් ඉඳලා තිබෙනවාද? [සෝෂා කිරීම්] මේ වාගේ හිහන ඇමතිවරු ලංකා ඉතිහාසයේ ඉඳලා තිබෙනවාද? ආණ්ඩුවේ සල්ලිවලින් අක්කාගේ දුවගේ මහුල් කෑව ඇමතිවරු ලංකා ඉතිහාසයේ ඉඳලා තිබෙනවාද? [සෝෂා කිරීම්] එදා සජිත් ප්‍රේමදාස ඇමතිතුමා එතුමාට අභියෝග කළා. බොරු නම් කියන්න. කට ඇරියාද? නැහැනේ. කට ඇරියේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නම කියන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එදා නම කියලා කිව්වේ. [සෝෂා කිරීම්] "විමල් වීරවංශ". මෙතුමාගේ නම කියලා කිව්වේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැන්සාඩ් වාර්තාවේ මේ පිළිබඳව සඳහන්ව තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණ අසත්‍යයක් රාජිත සේනාරත්න ඇමතිවරයා කරන්නේ. මම අභියෝග කරනවා, පුළුවන් නම් හෙට ඒක ඔප්පු කරලා පෙන්වන්න කියලා. එහෙම ඔප්පු කරලා පෙන්වුවොත් මම මන්ත්‍රී ධුරයෙන් ඉවත් වෙනවා. පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න. තමුන්නාන්සේලා අවුරුදු තුනක් පව කෙළියා. [සෝෂා කිරීම්] පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න; පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න. [සෝෂා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාද වුණු දවසේ නිවාස හා ඉදිකිරීම් ඇමති සජිත් ප්‍රේමදාස මහත්මයා ඊට අදාළ සියලු ලිපි ලේඛන සභාගත කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මෙතුමාගේ හිටපු NHDA එකේ සභාපති ජයන්ත සමරවීර මෙතැන හිටියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් රකින්නයි තමුන්නාන්සේ ඉන්නේ. මෙතුමා ඉතාමත් අසත්‍ය චෝදනාවන් තමයි කරන්නේ. ඔය එකක් ඔප්පු

[ගරු විමල් වීරවංශ මහතා]

කරලා පෙන්වන්න. ඔය කියන ඥාතියෙකුගේ wedding එකකට සල්ලි වියදම් කළා කියලා හෙට ඔප්පු කරලා පෙන්වන්න. හෙට ඔප්පු කරලා පෙන්වන්න. හෙට ඔප්පු කරලා පෙන්වන්න. [බාධා කිරීමක්] හෙට ඔප්පු කරලා පෙන්වන්න. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
හැන්සාඩ් වැඩක් නැහැ. ඔප්පු කරලා පෙන්වන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, හෙට ඔප්පු කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒක කියනකොට NHDA එකේ හිටපු සභාපති ජයන්ත සමරවීර කට පියාගෙන හිටියා. මෙතුමා ලිපි ලේඛන ඉදිරිපත් කරනකොට ජයන්ත සමරවීර කට පියාගෙන මෙතැන හිටියා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරලා පෙන්වන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එදා ඔප්පු කරලා පෙන්නුවා. NHDA එකේ හිටපු සභාපති අතන හිටියා. නැහැයි කියලා කිව්වේ නැහැ. NHDA එකේ හිටපු සභාපති මෙතැන හිටියා. එතුමා කියනකොට තමුන්නාන්සේ එදා පැනලා ගිහිල්ලා. ජයන්ත සමරවීර හිටපු සභාපති කට පියාගෙන හිටියා. මෙතුමා ඉදිරිපත් කළා, ලේඛනයෙන් ලේඛනයට. සල්ලි කීයද? විසිතුන් ලක්ෂ ගණනක්. මට තවම මතකයි. මුදල් අරගෙන මහුල් කෑවා. අක්කාගේ දුවගේ මහුල කෑවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔප්පු කළා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔප්පු කළා. ඒක හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. හැන්සාඩ් වාර්තාව කියවන්න. [ඝෝෂා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේ හැන්සාඩ් වාර්තාව අරගෙන කියවන්න. ඒකට NHDA එකේ හිටපු සභාපති වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත සමරවීර මහත්මයා උත්තර දුන්නාද කියලා හැන්සාඩ් වාර්තාව අරගෙන බලාගන්න. මෙතුමාට වඩා එතුමා දන්නවා. මෙන්න මේ වාගේ අයියලා තමයි අද ඇවිල්ලා ශෝභන දාන්නේ. මේ වාගේ නිහන වැඩ කරපු ඇමතිලා තමයි අද ඇවිල්ලා ආණ්ඩු පෙරළන්න හදන්නේ. මේ මොකටද? තමන්ගේ නඩු ටික බේරා ගන්න. ඉක්මනට ආණ්ඩුව අරගෙන- [ඝෝෂා කිරීම්] පසු පෙළ මන්ත්‍රීවරු කෑ ගහන්න එපා. තමුන්නාන්සේලාට නොවෙයි නඩු තිබෙන්නේ, මේ මිනිස්සුන්ට. තමුන්නාන්සේලාගේ ඒවා පස්සේ කියන්නම්. මේ ගොල්ලන් මේවා කාල ඉවර වෙලා දැන් ඒවායේ නඩු එනවා. ඊට ඉස්සෙල්ලා කොහොම හරි හදන්නේ දේශප්‍රේමයේ නාමයෙන් ආණ්ඩුව වටිටගන්න.

හැම හොරාම අන්තිමට එල්ලෙන සටන් පාඨය තමයි දේශප්‍රේමය. ඒක මතක තියා ගන්න. ඒක නිසා තමයි අයින්ස්ටයින් කිව්වේ, "දේශප්‍රේමය වනාහි රෝගයකි. ඒක නිකම් රෝගයක් නොවෙයි. මුළු ඇඟ පුරා දුවන රෝගයක්. ඒවායේ බිබිලි දානවා මුළු ඇඟ පුරාම." කියලා. අයින්ස්ටයින් කිව්වේ මෙන්න මේ අයියලාට. ඒක මතක තියා ගන්න. ඔය හැම හොරාම අන්තිමට එල්ලෙන්නේ දේශප්‍රේමයේ. ඒක මතක තියා ගන්න. මම වමේ මිනිස්සු දැකලා තිබෙනවා. වාමාංශික මිනිසුන්ගේ වැරැදිත් දැකලා තිබෙනවා. වාමාංශික ව්‍යාපාරයේ ඉන්න මේ වාගේ හොරු මම දැකලා නැහැ. මේ වාගේ හොරා කාපු එවුන් නොවෙයි එදා වමේ ව්‍යාපාරයේ හිටියේ. මම ඇන්.එම්. පෙරේරා එක්ක හිටියා. කොල්වින් ආර්. ද සිල්වා එක්ක හිටියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ලක්ෂ්මන් ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වමේ ව්‍යාපාරය ගෙනාපු පිලිප් ගුණවර්ධන මැතිතුමා මෙතැන නැති වුණත් එතුමාගේ පුතාලා මෙතැන ඉන්නවා. පිලිප්ලාගේ ඉඳලා ඒ වාමාංශික ව්‍යාපාරයේ එක ගුණයක් තිබුණා. ඒ මිනිසුන්ට තිබුණේ කැපවීම සහ අවංකභාවයයි. අනෙක් ඒවා ගැන අපට ප්‍රශ්න තිබුණේ නැහැ. ප්‍රතිපත්ති ප්‍රශ්න විතරයි අපට තිබුණේ. නමුත් මෙතැන තිබෙන්නේ ඒවා නොවෙයි. හොරාකෑම. මෙන්න මේකයි මෙතැන තිබෙන වෙනස. මේ වාගේ වමේ නායකයෝ ලංකාවේ කොහේවත් හිටියේ නැහැ. ඒක මතක තියා ගන්න. මෙතුමා කවදා හෝ දවසක මහින්ද රාජපක්ෂත් ඉවර කරනවා. ඒකත් මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂවත් ඉවර කරනවා. හරිද? ඒකයි මම තමුන්නාන්සේලාට කියන්නේ.

මෙතැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ගමේ ඡන්දයක් පැරදුණා කියලා මේ ගොල්ලන් කියනවා, "ආණ්ඩුවට අස් වෙන්න." කියලා. මේක පුදුම කථාවක් නේ. ගමේ ඡන්දයට ආණ්ඩුව අස්වෙන්නේ කොහේද? ලෝකයේ කොයි රටේද ආණ්ඩුවක් වෙනස් වෙන්නේ ගමේ ඡන්දයට? ගමේ ඡන්දයට ආණ්ඩුව අස්වෙන්න කියලා කියන මේ වාගේ මෝඩ, තකතීරු අයියලා ඉන්න එකම රට ලංකාව තමයි. මේ වාගේ මෝඩ, තකතීරුවෝ පාර්ලිමේන්තුවට යවලා තිබෙන එකම රට ලංකාව. වෙන කිසිම රටක් නැහැ. ඉන්දියාවේ මෝදි තමන්ගේම ප්‍රාන්තය වුණු ගුජරාටය නූලෙනුයි දිනුවේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
තව විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බලමු කාගේ කටේද දමන්නේ කියලා. තමුසෙලාගේ කටේ- [බාධා කිරීම්] තමුන්නාන්සේලා ජංගිය ගහගෙන යනකොට අපි බලමු කෝ, මොකද වෙන්නේ කියලා. [බාධා කිරීම්] තමුන්නාන්සේත් පණ්ඩිතකම් කථා කර කර ඉන්න කෝ. තමුන්නාන්සේට මොකද වෙන්නේ කියලා- [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, ජනවාරි 08 වැනිදා අපි මේ රටේ යහ පාලනය ඇති කරන්නට බෙල්ල දීලා කැප වෙලා ආවා. අපි ඒ ගමන නවත්වන්නේ නැහැ. අපේ සියලු මිත්‍ර බලවේගත් එක්ක ඇවිල්ලා, අපේ වැරදි අඩු පාඩු හදාගෙන අපි ඒ ගමන යනවා. ඒ ගමන අපි ජයග්‍රහණය කර ගන්නවා. ඒ ගමන ජයග්‍රහණය කරලයි අපි එන මහ මැතිවරණවලට, ජනාධිපතිවරණවලට මුහුණ දෙන්නේ. ඒක මතක තියා ගන්න. [බාධා කිරීම්] කලබල වෙන්න එපා. අපට අවුරුදු දෙකක් කාලය තිබෙනවා. අපි මේ අවුරුද්ද මේ සියලු ප්‍රතිඵල අනෙක් පැත්තට හරවන අවුරුද්ද බව මතක තියා ගන්න. අපට ඒකට ආත්ම ශක්තිය තිබෙනවා. ඒ ආත්ම ශක්තිය යටතේ, මේ නායකයින් දෙදෙනා යටතේ අපි ඒ ගමන යනවා. මේ රටේ ජනතාවට අපි පොරොන්දු වෙනවා, ජනවාරි 08 වැනිදා අපට ලබා දුන්නු ඒ ජනවරමත් එක්ක, අපි ජනතාවට ලබා දුන් පොරොන්දු ඒකාන්ත වශයෙන්ම මේ රටේ ක්‍රියාත්මක කරනවායි කියන එක. බොහොම ස්තුතියි.[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please!

මා පළමුවෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, මේ විවාදය ගරුත්වයෙන් වාගේම විනයානුකූලව කරගෙන යන්නය කියන එක. [බාධා කිරීම්] අවස්ථාව දෙන්නම්. පොඩ්ඩක් ඉන්න. මේක පහදා දීලා අවස්ථාව දෙන්නම්. චර්යා ධර්ම පද්ධතියක් ගැන සාකච්ඡා කරපු අද දවසේ ආදර්ශවත්ව හැසිරෙමු.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා වන මහින්ද අමරවීර මැතිතුමා 2018.02.13වැනිදා නිකුත් කරපු නිවේදනය.

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ.

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍ය ධුරය සහ පාලන බලය ලබා ගැනීම.

පසුගිය මහ මැතිවරණයෙන් පසුව එක්සත් ජාතික පක්ෂය හා එක්සත් ජනතා නිදහස් සන්ධානය සම්මුතිවාදී රජයකට එකහ වූයේ වර්ෂ දෙකක් සඳහාය."

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
It is not a point of Order. ඔය කරුණ ගැන දැනට - [බාධා කිරීම්]

Hon. Leader of the Opposition, please.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
මේකේ අවසානයේ කියනවා, "එම නිසා එක්සත් ජාතික පක්ෂය ලද ඡන්ද සංඛ්‍යාව මත ගරු අග්‍රාමාත්‍යතුමා එම තනතුරේ තව දුරටත්..."

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
It is not a point of Order. මේ කරුණ ගැන නියෝජ්‍ය කථානායක, ගරු තිලංග සුමතිපාල මැතිතුමා පහදා දෙනවා ඇති. He is going to explain. He is on the way. මේ කරුණ ගැන උදේ කථා කළා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට මේක කියලා ඉවර කරන්න දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ මේ ගැන කථා කළා. ඔය කරුණ ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමා පහදා දෙනවා. It is not a point of Order.

Hon. Leader of the Opposition, you may speak now.

[4.36p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Speaker.

I thought I would say a few words on this debate. The people have delivered a verdict and, in a democracy, the people's verdict must be respected. The Hon. Member who moved the Motion and the Hon. Member who seconded the Motion have referred to various matters. I think, Sir, I will primarily do a brief analysis of the result of the Local Authorities Election held on 10th of February.

The Sri Lanka Podujana Peramuna polled 44.69 per cent of the votes cast at that election. The United National Party polled 32.61 per cent. The United People's Freedom Alliance polled 8.90 per cent. The Sri Lanka Freedom Party polled 4.48 per cent. If one was to add the percentage of the votes polled by the United National Party, the United People's Freedom Alliance and the Sri Lanka Freedom Party, those three parties put together polled 45.99 per cent, almost 46 per cent. The Sri Lanka Podujana Peramuna polled 44.69 per cent, that is almost 2 per cent less than the other three parties put together.

The People's Liberation Front - JVP - polled 6.26 per cent and the Illankai Tamil Arasu Kachchi polled 3.06 per cent. If one was to add the percentage of votes polled by those two parties together with the percentage of votes polled by the United National Party, the United People's Freedom Alliance and the Sri Lanka Freedom Party, the total would be 55.31 per cent. So, in other words, parties opposed to the Sri Lanka Podujana Peramuna have polled 55.31 per cent and the Sri Lanka Podujana Peramuna has polled only 44.69 per cent. This is indisputable. [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please, do not disturb him. Everybody has the right to speak.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Former President Mahinda Rajapaksa at the Presidential Election held in 2015 polled 47.58 per cent. The votes he polled at the Presidential Election in January, 2015 were more than the votes he polled now. There have been three elections in recent times; the Presidential Election in 2015, the Parliamentary Election in 2015 and the Local Authorities Election held this month. In none of these elections has former President Mahinda Rajapaksa been able to obtain more than 50 per cent.

His vote has always been below 50 per cent at the Presidential Election, at the Parliamentary Election and at the Local Authority Election. So, there is nothing to get excited about: elections are held; parties win; parties lose. The Local Authority Elections have been held and you have won. One does not dispute that fact, but the fact of the matter is that you have polled only 44.69 per cent as opposed to 55.31 per cent cast against you. So, what is there to get excited about? Nothing at all. Parliament is not constituted on the basis of votes cast at the Local Authority Elections. Parliament is constituted, -the President is elected, on the basis of votes cast at the Presidential Election - at a Parliamentary Election held for that purpose in keeping with the Constitution and the laws of this country. The Constitution and the laws of this country cannot be subverted by your claiming benefits under the Local Authority Elections to your advantage in the way you please.

I want to make a few comments, Mr. Speaker, if you permit me in regard to the nature of the propaganda that was carried on at this election. I do not want to do something controversial. But, I must refer to the fact that I was quite alarmed when, quite early in the campaign, former President Mahinda Rajapaksa, in the course of an election rally, said that sometimes this election would result in Tamil Eelam blooming after the election is over. The reason he gave was that there was a new Constitution being framed which might result in that happening. Sir, ever since the Thirteenth Amendment was enacted in 1987 - 1988, there had been continued efforts on the part of different Presidents and different Governments to improve the Thirteenth Amendment in such a manner as to bring about a political resolution acceptable to all the citizens in this country. During President Premadasa's time, there was the Mangala Moonesinghe Parliamentary Select Committee Proposals which made recommendations which went far beyond the Thirteenth Amendment. During President Chandrika Bandaranaike Kumaratunga's time, there were the 2000 Constitutional Proposals brought to Parliament by no less a person than Prof. G.L. Peiris which went far beyond the Thirteenth Amendment and contained various new features. That proposed Constitution had been brought as a Bill to Parliament.

Thereafter President Mahinda Rajapaksa assumed office. If he will recall his speech that he made at the initial meeting, the inaugural meeting of the All Party Representatives Committee (APRC) and the Experts Committee, he talked of maximum possible devolution. He appointed an Experts Committee that came up with the reports. There was the Prof. Tissa Vitharana Committee which came up with their own report which took the Constitutional proposals much beyond the Thirteenth Amendment and that was the position. After the assumption of office of this Parliament, this

Parliament was evolved into a Constitutional Assembly to frame a new Constitution. As per a Resolution adopted unanimously in this Parliament with all the Joint Opposition Members being supportive of that Resolution, - none of you opposed it - there was a Steering Committee appointed. You participated in the proceedings of the Steering Committee. None of you opposed it. None of you talked of Eelam in this Parliament. None of you talked of Eelam at the Steering Committee. You accepted it; you went along with the process. Suddenly, Mr. Mahinda Rajapaksa says, "There Eelam is likely to bloom after the Local Authority Elections if the people are not careful."

I have information, Sir, that this message was propagated amongst the innocent Sinhala people in this country. They were told, "This is a referendum for an Eelam. If you vote for the Government or if you vote for the UNP, it will result in an Eelam being created. So, do not vote for them. Vote for the 'Lotus Bud' ". I am told, Sir, that particularly this propaganda was very virulently carried out in all the temples, in all the villages in the Sinhala South. This, I think, is unfortunate, Sir. I want to put on record that my Party at this Election, in our manifesto, talked of a political solution within the framework of an undivided, indivisible, single country.

There was no campaign carried on, anywhere, in the North and East which talked of division of the country. We only talked of a solution that is acceptable to our people, that is reasonable, with substantial power-sharing within the framework of a united, undivided, indivisible single country. That was the propaganda we carried out in all our areas and when we did that, how dare President Rajapaksa say that Eelam could bloom after the election. This is not merely deception of the people in the South, innocent Sinhala people in the South, but it is the deception of everyone including himself.

I would like to put this on record because I want everybody in this country to know that it was a malicious, vicious, fallacious, false propaganda on the part of President Mahinda Rajapaksa and the Sri Lanka Podujana Peramuna and if you proceed with this agenda, I want to tell you, Eelam will bloom, not on account of us, but on account of your "Lotus Bud". Your "Lotus Bud" will bloom into an Eelam. That is what will happen. Therefore, please resist your temptation to achieve cheap political gain by carrying on such false propaganda.

Thank you, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තිලංග සුමතිපාල මැතිතුමා. ඔබතුමාගේ පැහැදිලි කිරීම කරන්න.

ගරු තිලංග සුමතිපාල මහතා (නියෝජ්‍ය කථානායකතුමා)
(மாண்புமிகு திலங்க சுமதிபால - பிரதிச் சபாநாயகர்)
(The Hon. Thilanga Sumathipala -Deputy Speaker)
ගරු කථානායකතුමනි, අද උදෑසන මම පාර්ලිමේන්තුවේ නොසිටි අවස්ථාවේ මාගේ නම සඳහන් කර තිබුණු නිසායි මේ පැහැදිලි කිරීම සිදුකරන්නේ.

ඊයේ රාත්‍රියේ නිකුත් කරන ලද නිවේදනයක් සම්බන්ධයෙන් ජනමාධ්‍යය මගෙන් ඇසුවා. ඒ ප්‍රකාශනය සත්‍යයක්. ජාතික රජයේ හවුල්කාර පක්ෂයක් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික රජයක් සෑදීමට සහාය වුණා. එයින් ඉවත් වෙන්න ජනාධිපතිතුමාගෙන් අපි අවසරයක් පැතුවා. අපේ පක්ෂයේ සභාපති හැටියට එතුමාගෙන් අපි එවැනි අවසරයක් ඉල්ලුවේ, පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් දේශපාලන වශයෙන් දරන මත අනුවයි. ජනාධිපතිතුමා අපට කියා සිටියේ, මෙම පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් 03 වැනි දින ප්‍රකාශ කළ ජාතික රජයෙන්, එක්සත් ජනතා නිදහස් සන්ධානය ඉවත් වුණොත් ඒත් සමඟ මේ රජයේ ස්ථාවරභාවයටත්, රටේ ස්ථාවරභාවයටත් යම් කිසි විධියේ බලපෑමක් ඇති විය හැකි බවත්, එම නිසා එයට නීතිමය උපදෙස් ලබා ගත යුතු බවයි. ඒ නිසා එතුමා නීතිපතිතුමා එක්ක සාකච්ඡා කරලා, එවැනි අවස්ථාවක් ඇති වුණොත් ක්‍රියාත්මක කළ යුතු ආකාරය ගැන සඳහනක් කරන ලෙස ඉල්ලා සිටියා. ඒ වෙලාවේ නීතිපතිතුමාගේ උපදෙස වූයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන මත මෙවැනි අවස්ථාවක් ගැන පැහැදිලි කිරීමක් කිරීමට අපහසු බවත්; ජාතික රජයක් පවත්වලා, එය ජාතික රජයක් නොවන අවස්ථාවකට පැමිණියොත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් නීතිපතිතුමාට කළ නොහැකි බවත් ය. ඒ නිසා නීතිපතිතුමා ගරු ජනාධිපතිතුමාට ප්‍රකාශ කර තිබෙනවා, "මේ පිළිබඳව සුප්‍රිම් උසාවියෙන් මත විමසුමක් ලබා ගැනීමේ හැකියාව තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමාට පමණයි; ඒ අනුව මේ ගැන ජනාධිපතිතුමා සුප්‍රිම් උසාවිය දැනුවත් කරන්න" කියා. එයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේත් ඊයේ රාත්‍රියේ පැවැති තත්ත්වය වුණේ.

රජය පැත්තේ සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන් අද දහවල් කැඳවලා මේ පිළිබඳව නැවතත් සාකච්ඡා කළා. ඒ අනුව, සුප්‍රිම් උසාවියෙන් මේ ගැන ජනාධිපතිතුමා දැනුවත් කරන තෙක් රටෙත්, රජයේත් ස්ථාවරභාවය පවත්වා ගෙන යන්නත්, දින කිහිපයක් යනතුරු රජයේ වර්තමාන තත්ත්වය පවත්වා ගෙන යන්නත් ජනාධිපතිතුමා ඉල්ලීමක් කර තිබුණා.

ගරු කථානායකතුමනි, ඒ අනුව ඊයේ රාත්‍රියේ කළ ප්‍රකාශයේ සත්‍යතාවත්, අද වන කොට ඒ සාකච්ඡාව ඉදිරියට ගිය බවත්, මගේ නමින් නිකුත් කළ SMS පණිවුඩයත් මම සනාථ කරනවා. ඒ වාගේම, අද සාකච්ඡාවෙන් පසු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැති ඇමතිවරුන් කිසිවෙක් පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. ඒකට හේතුව වුණේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තුවේ රජයේ පාර්ශ්වයත් එක්ක ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට එක කණ්ඩායමක් හැටියට කටයුතු කරමින් ඉදිරියට යන ලෙසට උපදෙස් ලබා දීමයි. මේ ගැන මට කියන්න තිබෙන්නේ එපමණයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා පසුගිය සතිය පුරාම රටේ දේශපාලනයේත්, ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතුවලත් ස්ථාවරභාවය පවත්වා ගෙන යාමට දරපු උත්සාහය ගැන මම දන්නවා. ඒ නිසා මේ ගැන මීට වඩා සඳහන් කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. ඔබතුමාට විනාඩි හතක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මැතිවරණය ගැන වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ගැන සතුටු වනවා.

අපි කවුරුත් දන්නවා, මේ මැතිවරණය එකවර මුළු රටේම පැවැත්වුණු පළාත් පාලන මැතිවරණයක් බව. සමහර දේශපාලන පක්ෂ විසින් මෙය ජනමත විචාරණයක් බවට එහෙමත් නැත්නම් ආණ්ඩුවට විරෝධය පාන මැතිවරණයක් බවට පත් කර ගත්තා. මෙය පළාත් පාලන මැතිවරණයක් නම් මේ පළාත් පාලන මැතිවරණයේ පරාජය භාර ගන්න අපි සූදානම්. බහුතරයක් පළාත් පාලන ආයතන පොහොට්ටුව ලකුණ යටතේ ජයග්‍රහණය කර තිබෙනවා. හැබැයි, මේක ජනමත විචාරණයක් නම් ජනමත විචාරණයක ජයග්‍රහණය සඳහා සියයට 50ක් ඉක්මවූ ඡන්ද ප්‍රතිඵලයක් අවශ්‍යයි කියන එක හොඳට මතක තියා ගන්න. එහෙම නම් මේක ජනමත විචාරණයක් කියලා කියන අයට මා කියන්න කැමැතියි, ඒ අයට අත් වෙලා තිබෙන්නේ පරාජයක් බව. මොකද, සියයට හතළිස් ගණනක් අරගෙන ජනමත විචාරණයක් ජයග්‍රහණය කරන්න බැහැ. අපි පළාත් පාලන මැතිවරණයේ පරාජය භාර ගන්නවා. මේක ජනමත විචාරණයක් විධියට සලකා කටයුතු කරපු අයට අපි කියනවා, ජනමත විචාරණයේ පරාජය භාර ගන්නය කියන කාරණය. මේකයි ඇත්ත.

මේ පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ මේ රටේ ආණ්ඩුව පෙරළන්න සමහරුන් සූදානම් වෙනවා. මේකේ හොඳම විහිළුව තමයි ඊයේ පෙරේදා ජනාධිපතිතුමා කට්ටියට "ඉජු, ඉජු" කියලා "ආණ්ඩුව හදන්න එන්න" කිව්වා. කට්ටිය නැට්ට වනාගෙන ආවා, ඉක්මනට ආණ්ඩුව හදා ගන්න. මොකද, මේගොල්ලන්ට ඕනෑකම තිබෙන්නේ ආණ්ඩුවක් හදලා තමන්ගේ files ටික අයින් කර ගන්නයි. හැබැයි, ඒ නැට්ට වනාගෙන ආපු අයට අද නැට්ට පස්ස පැත්තේ ගහ ගන්න වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා මේගොල්ලන්ව හොඳට කඩේ ඇරියා. ජනාධිපතිතුමාත් බැලුවා මේගොල්ලන් මොනවාටද එන්නේ කියලා. අනේ! කට්ටියක් බොහොම උනන්දුවෙන් හිටියා ආණ්ඩුවක් හදන්න. අද මේගොල්ලන් හත් පොළේ ගාගෙන ඉන්නවා. ඇමතිකම් ගන්න බලාගෙන හිටපු අයට ආණ්ඩුත් නැහැ, මොනවත් නැහැ. සමහරු නම් කිව්වා, ඇමතිකම් ගන්නේ නැහැ, විපක්ෂයේ ඉඳගෙන ස්වාධීනව ආණ්ඩුවට උදව් කරනවායි කියලා. ඒ කෙසේ වෙතත් "ජනාධිපතිතුමා දුන්නු ලණුව නම් කෑවා" කියන කථාව අපට පොහොට්ටු පක්ෂයේ අයට කියන්න වෙනවා.

මේ ගොල්ලන්ගේ ඉලක්කය මොකක්ද කියලා අපට පැහැදිලියි. දේශපාලනිකව නම් මේ ගොල්ලන්ට ආණ්ඩුවට එන්න අවශ්‍යතාවක් නැහැ. මේක දේශපාලනය ගැන දන්නා ඕනෑම කෙනෙකුට තේරෙනවා. මොකද, තව අවුරුදු එකහමාරකින්, දෙකකින් ජනාධිපතිවරණය එනවා. එහෙම නම් මේ පළාත් පාලන ආයතන ජයග්‍රහණයත් එක්ක ඒ ගොල්ලන් දේශපාලනිකව ඉස්සරහට යනවා මිසක්, ආණ්ඩුවකට එකතු වෙන්න වුවමනාවක් නැහැ. හැබැයි, අපට පැහැදිලිවම පේනවා මේ ගොල්ලන්ට ආණ්ඩුවකට එකතුවීමේ අවශ්‍යතාව තිබෙන්නේ දේශපාලනිකව නොවෙයි කියලා. තමන් වටා විශාල නඩු ගොනු ප්‍රමාණයක් තිබෙනවා; ගොනු වෙව්ව වැරැදි තිබෙනවා; ක්‍රියාත්මක වෙන නඩු තිබෙනවා. ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා ආණ්ඩුවක් හදලා මේවා ටික හංගා ගන්න මේ මැතිවරණ ප්‍රතිඵලය උපායක් විධියට භාවිතා කරන්න මේ අය උත්සාහ කළා. මේකයි ඇත්ත. මේකයි ජනතාව තේරුම් ගන්න ඕනෑ. දැන් මීට ඉස්සෙල්ලා කථා කරපු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, "මට විරුද්ධව කිසිම චෝදනාවක් නැහැ; පුළුවන් නම් ඔප්පු කරන්න." කියලා. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව දැන් මා ළඟ තිබෙනවා. ඇහෙන පෙනෙන මානයේ ඉන්නවා නම් විමල් වීරවංශ මහත්මයාට මේ සභාවට එන්න කියලා මම කියනවා. මෙන්න තිබෙනවා බඩු. එතුමා දැන් රාජිත සේනාරත්න ඇමතිතුමාට කිව්වා, "පුළුවන් නම් ඔප්පු කරන්න." කියලා. ඔප්පු කරන්න මෙන්න මා ළඟ සාක්ෂි තිබෙනවා. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කඩසාප්පු සහ මහල් නිවාස 2012 දේපළ කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ලබාදීම සහ එකී අමාත්‍යාංශය යටතේ තිබූ ආයතනවල සේවය කරන ලද නිලධාරීන් වෙත නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව පොලිස් නිලධාරීන්ගේ ආරක්ෂාව ලබාදීම සම්බන්ධ පෙත්සම-"

ගරු කථානායකතුමනි, මේකේ වගඋත්තරකරුවන් විධියට අංක එකට ඉන්නේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමායි. විමල් වීරවංශ මහත්මයාට විරුද්ධව අනාවරණය වූ වැරැද්ද මෙන්න මෙසේ සඳහන්ව තිබෙනවා:

> "2010 මැයි මස සිට 2015.01.09 දින දක්වා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයා ලෙස සිටිමින් අමාත්‍යාංශය යටතේ තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කඩසාප්පු වන මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ E1/G1 - අනුෂා නිරෝෂනී නානායක්කාර, දෙහිවල මහල් නිවාස යෝජනා ක්‍රමයේ C2 - හේවාවසම් මදුරාවිචි පද්මිණි, C3 - ඊෂ්රාවරී ගුණවති; C4 - වාදාරවිවිගේ ලලිත් පුෂ්පකුමාර, ඩයස් පෙදෙස, F/G/13 - ලියනආරච්චි ඉන්ද්‍රානි,....."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මේ කඩසාප්පු අවභාවිත කිරීම නිසා රුපියල් එක්කෝටි තිස්හයලක්ෂ අසූපන්දහසක අලාභයක් රජයට සිදුව තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වාර්තාවේ එක තැනෙක තිබෙනවා, "ලක්ෂ 70ක් වටිනා කඩ සාප්පුවක් ලක්ෂ 5කට ආසන්න මුදලකට දීලා තිබෙනවා." කියලා. මේකට හේතුව විධියට දක්වා තිබෙන්නේ, "වද කළ නොහැකි කෘමීන් විශේෂයක් ඉන්න නිසා අඩුවට දුන්නා." කියලායි. වද කළ නොහැකි කෘමීන් විශේෂයක් ඉන්නවා කියලා ලක්ෂ 70ක කඩේ ලක්ෂ 5කට දීලා තිබෙනවා. කෘමියෙක් ඉඳලා ලක්ෂ 5කට දුන්නා නම්, කැරපොත්තෙක්, මීයෙක් හිටියා නම් මේ කඩසාප්පු ලක්ෂයකට, දෙකකට ගන්න තිබුණා. ඒ වාගේ කම්බ හොරු තමයි මේ ජයග්‍රහණයත් එක්ක උඩ පැන පැන දැන් තප්පුලන්නේ. වෙන මුකුත් නොවෙයි. මේ ජයග්‍රහණය භාවිත කරන්න හදනවා මේ බරපතළ ලිපි ගොනු -අපේ ගරු ඇමතිතුමා දැන් මෙතැන ඉන්නවා. ඇමතිතුමා මේවාට සාක්ෂි. නැත්නම් "නැහැ" කියයි- හංගා ගන්නයි. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවයි මම මේ කියන්නේ. මඩ ගහන්න බොරුවක් කියනවා නොවෙයි. මේ ලිපි ගොනු යට ගස්ස ගන්න තමයි මේ ජයග්‍රහණය භාවිතා කරන්න හදන්නේ. ඊළඟ මැතිවරණයට අවුරුදු එකහමාරක්, දෙකක් තිබියදී අපේ අඩු පාඩුකම් හදා ගන්න ජනතාව අපට රතු එළියක් දී තිබෙනවා. ජනතාව අපට දුන්න වරමක් විධියටයි අපි ඒක සලකන්නේ. මොකද, අපට හැදෙන්න කල් තිබෙනවා. අපට හැදෙන්න ඕනෑ තරම් කල් තිබෙනවා. අපෙන් අඩු පාඩු සිද්ධ වුණා. මොකද, ජනතාව ඉල්ලුවේ යහ පාලනය නොවෙයි. ජනතාව ඉල්ලුවේ කන්න බොන්නයි. අපි දුන්නේ යහ පාලනයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ජනතාව අපෙන් ඉල්ලපු දේ නොවෙයි අපි ඔවුන්ට දුන්නේ. රතුපස්වල ජනතාව ගිහිල්ලා තමන්ට වෙඩි තියපු පොහොට්ටුවේ අයට පසුගිය මැතිවරණයේදී ඡන්දය දුන්නා. අපි ජනතාවට ඉල්ලපු දේ දුන්නේ නැහැ. එම නිසා අපි දැන් සූදානම් ඉදිරි අවුරුදු දෙකේදී ජනතාව ඉල්ලන දේ දෙන්න. ඊළඟ මැතිවරණයට තවත් අවුරුදු දෙකක් තිබියදී අපේ අඩු පාඩුකම් හදාගන්න ජනතාව අපට දීපු වරමට අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ හරහා අපට 2019 අග තිබෙන ජනාධිපතිවරණයට යන්න අවශ්‍ය පාර කපා ගන්න පුළුවන්. මේ මැතිවරණ ප්‍රතිඵලය ජනාධිපතිවරණයකට පරිවර්තනය කෙරුවොත් ජයග්‍රහණය තිබෙන්නේ පොහොට්ටුවට නොවෙයි, අනෙක් පැත්තෙන් ඉල්ලන අපේක්ෂකයාටයි. එහෙම නම් ඒ අපේක්ෂකයා සූදානම් කරලා අපි සූදානම් ඒ මැතිවරණ ජයග්‍රහණය කරා යන්න. එම නිසා රටේ ජනතාව අපට හොඳ අවස්ථාවක් දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අවස්ථාව තමයි අපි පසුගිය කාලයේ කරපු වැරැදි තේරුම් අරගෙන, ගිය මාර්ගය අවබෝධ කරගෙන හරි මාර්ගයට යන්න කියන එක. අපි දැක්කා සම්පන්දන් මැතිතුමා කියනවා, "මේ මැතිවරණය භාවිතා කළේ කොහොමද?" කියලා. ජාතිවාදය වැපුරුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට අවසාන වශයෙන් විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

මේ අය ජාතිවාදය වැපුරුවා. එසේ කරමින් ගම් ගානේ ගිහිල්ලා තමයි මේ අය ඡන්දය ගත්තේ. එහෙම නැතිව ගමේ පාලම, බෝක්කුව හදනවා කියලා නොවෙයි ඡන්දය ගත්තේ. අපි සම්පන්දන් මැතිතුමාට ගරු කරනවා.

එතුමා කිව්වා, "ඒකීය රටක් තුළ කටයුතු කරන්න සූදානම්" කියලා. ඒක කියද්දී, කියද්දී, දිගින් දිගටම-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා දැන් අවසාන කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ජාතිවාදය වැපුරූ අයට අපි කියනවා, 2020 ජනාධිපතිවරණයේදී මුළු රටේම අය ඒකට උත්තරය දෙයි කියලා. ඔබතුමාට බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 5.00]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමාත් සභාවේ නැහැ. එතුමාගේ කාලයත් තිබෙනවා, අවශ්‍ය වුණොත් ගන්නම්.

ගරු කථානායකතුමනි, අද්‍යතන ශ්‍රී ලංකාවේ උද්ගතවී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසා රට අරාජික තත්ත්වයකට පත්ව ඇති බැවින් ඒ පිළිබඳව විවාදයක් පවත්වන්නට ඕනෑ කියලා තමයි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විවාදයක් ඉල්ලුවේ. ඒ කියන්නේ මේ මොහොතේ රටේ තිබෙන අරාජික තත්ත්වය පිළිබඳව. අද රටේ දැවැන්ත දේශපාලන අර්බුදයක් තිබෙනවා. මේ අර්බුදය පිළිබඳව අද අපේ පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්විය යුතුයි කියලා තමයි මේ හදිසි විවාදය පවත්වන්න තීරණය කළේ.

මේ විවාදය තුළ විවිධ අර්ථකථන වෙමින් තිබෙන බව අපි දැක්කා. එක් පාර්ශ්වයක් උත්සාහ කරමින් තිබෙනවා, මේ මැතිවරණය ජනමත විචාරණයක් ලෙස අර්ථකථනය කරන්න. ගරු කථානායකතුමනි, ජනමත විචාරණයකින් පැහැදිලි වෙන්නේ කරුණු දෙකයි. මෙම මැතිවරණය ජනමත විචාරණයක් යැයි ප්‍රකාශ කරන්නට උත්සාහ කළ කඳවුර දෙස බැලුවොත්, ඒ කඳවුර ජනමත විචාරණයේදී "ෆේල්" වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ජනමත විචාරණයකදී "ඔව්"ද, "නැහැ" ද කියලා තමයි අහන්නේ; "හා" ද, "බෑ" ද කියලා තමයි අහන්නේ. එතැන කඳවුරු දෙකයි තිබෙන්නේ. එම නිසා මෙය ජනමත විචාරණයක් ලෙස කවුරු හෝ අර්ථකථනය කරන්නට හදනවා නම්, මේ මැතිවරණය ජනමත විචාරණයක් යැයි කියන කණ්ඩායම පරාජයට පත් වී තිබෙනවා. එම නිසා අපි කිසිසේත්ම මෙම මැතිවරණය ජනමත විචාරණයක් ලෙස සලකන්නේ නැහැ. මෙම මැතිවරණය ජනමත විචාරණයක් ලෙස සැලකීමම තමයි ආණ්ඩුවට වාසිසහගත තත්ත්වයක් නිර්මාණය කරන්නේ. ඒ නිසා ඔවුන්ට අර්ථකථනය කරන්නට පුළුවන්කම තිබෙනවා, ජනමත විචාරණයක් නම් ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන කණ්ඩායම් දෙක එකතුවුණාට පසුව ඡන්ද ප්‍රමාණය වැඩි නිසා ඔවුන් ජයග්‍රහණය කොට තිබෙන බව.

මේ මැතිවරණය ජනමත විචාරණයක් නොවෙයි. මේ මැතිවරණයට එක් එක් දේශපාලන ධාරා තමතමන්ගේ දේශපාලන මත එක්ක ඉදිරිපත් වුණා. එක් දේශපාලන ධාරාවක් ආණ්ඩුව පවත්වා ගෙන යෑම වෙනුවෙන් -මේ බලය දෙන්න ඕනෑ ආණ්ඩුවටමයි, ආණ්ඩුව තමයි රට පාලනය කරන්නේ. රට පාලනය කරනවා වාගේම ගම පාලනය කරන්නත්, රට හදන්නත්- බලය ඉල්ලුවා. ඒක එක දේශපාලන ධාරාවක්.

තව දේශපාලන ධාරාවක් කියනවා, මේ ආණ්ඩුව අනුගමනය කළ ක්‍රියාමාර්ග කිසිසේත්ම සාධනීය නැහැ, වැරදියි. අපි කරපු දේවල් තමයි හරි. එම නිසා නැවත අපට පාලනය දෙන්න කියලා. ඒ වාගේම අපිත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට මේ මැතිවරණයට ඉදිරිපත් වුණා." ඔබතුමන්ලා අවුරුදු හැත්තෑවක් රට පාලනය කර තිබෙනවා. ආණ්ඩුව තිබෙද්දීත් පළාත් පාලන ආයතන පාලනය කර තිබෙනවා. මේ පළාත් පාලන ආයතන දීර්ඝ කාලයක් ඔබතුමන්ලායි පාලනය කළේ. නමුත් ඔබතුමන්ලා අසමත්. ඒ නිසා අපට බලය දෙන්න" කියන ආරාධනය අපි කළා.

[ගරු අනුර දිසානායක මහතා]

දෙමළ ජාතික සන්ධානය උතුරේ දේශපාලනය කේන්ද්‍ර කරගෙන දේශපාලන ධාරාවක් හැටියට කටයුතු කළා කියලා මම හිතනවා. මෙම මැතිවරණයේ ප්‍රතිඵල පෙන්නුම් කර තිබෙන්නේ, එක් එක් දේශපාලන වුවමනා අනුව පෙළ ගැසුණු දේශපාලන ධාරාවලට. ඒ නිසා මේ මැතිවරණය කොටස් දෙකකට බෙදීම වැරදියි. ආණ්ඩුව පැත්තෙනුත් උත්සාහ කර තිබෙනවා, මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදන්න. අනෙක් පාර්ශ්වයත් උත්සහ කර තිබෙනවා, මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදන්න. මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදා මේ සංඛ්‍යා විග්‍රහ කිරීම වැරදියි.

විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණවල ඉතිහාසය ගෙන බැලුවොත්, පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය කරන්න වැඩි විභවයක්, වැඩි ඉඩක්, වැඩි අවස්ථාවක් තිබෙන්නේ ආණ්ඩුවට. එසේ වැඩි අවස්ථාවක් තිබෙන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි, තමන්ට තිබෙන ආණ්ඩු බලය පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය කරන්න හිතකර තත්ත්වයක් නිර්මාණය කරන නිසා. හැබැයි, ඒ වාසිසහගත දේශපාලන තත්ත්වය හා සංසන්දනය කර බලනවිට, ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන කණ්ඩායම් විශාල පසු බැසීමකට භාජන වී තිබෙනවා. විශේෂයෙන් මෑත ඉතිහාසයේ මැතිවරණ කිහිපයක් හා සංසන්දනය කර බැලුවොත්, ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වයක් වූ එක්සත් ජාතික පක්ෂය තනි පක්ෂයක් ලෙස ඉතාම බරපතළම කඩා වැටීමකට ලක් වී තිබෙනවා. එය කිසිසේත්ම සැහවිය යුතු කරුණක් නොවෙයි. ඒ වාගේම තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එම පක්ෂය දීර්ඝ ඉතිහාසයක් තිබෙන පක්ෂයක්. එම පක්ෂය අද ජනාධිපති ධුරය හොබවනවා. ඒ පක්ෂයේ යම් කොටසක් ආණ්ඩුව නියෝජනය කරමින් තිබුණා. ඒ කොටසත්, ජනාධිපති ධුරයත් අතේ තියාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙම මැතිවරණ ව්‍යාපාරයට අවතීර්ණ වුණා. හැබැයි, මොකක්ද සිදු වී තිබෙන්නේ? ඒ මැතිවරණ ව්‍යාපාරය තුළදී කිව්වා වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඩාලි පාරේ නොවෙයි, වෙන තැනක තිබෙන බව මෙම මැතිවරණ ප්‍රතිඵලයෙන් ඔප්පු කර තිබෙනවා. ඒවා අපි පිළිගත යුතු කරුණු.

දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපේ පැත්තෙන් බැලුවොත්, අපි අපේක්ෂා කළ ප්‍රතිඵලයක් තිබුණා. අපි අපේක්ෂා කරන ලද ඒ ප්‍රතිඵලය අපට අත්පත් වී නැහැ. නමුත් මෑත කාලයේ -2006න් පසු - ලබාගන්නා ලද වැඩිම ඡන්ද ප්‍රතිශතය සහ වැඩිම ඡන්ද ප්‍රමාණය අපි ලබාගෙන තිබෙනවා. නමුත් එය අපි අපේක්ෂා කරන ලද ප්‍රතිඵලය නොවෙයි.

උතුරු පළාතේ මැතිවරණ ප්‍රතිඵල දිහා බැලුවාම අපට පෙනෙන්නේ මොකක්ද? විශේෂයෙන්ම දෙමළ ජාතික සන්ධානය යම් උත්සාහයක් දරමින් තිබුණා යම් දේශපාලන ප්‍රතිසංස්කරණ යෝජනාවක් සඳහා. ඒ යෝජනාවට එරෙහිව යම් කඳවුරක් උතුරේ ගොඩනැහෙමින් තිබුණා. දැන් මේ මැතිවරණ ප්‍රතිඵලවලින් අපට යම් ප්‍රමාණයකට පැහැදිලි කරමින් තිබෙනවා, ඒ කඳවුරත් යම් ප්‍රමාණයකට ශක්තිමත් වෙමින් තිබෙන බව. එම නිසා මේ මැතිවරණයෙන් උතුරේ ඇති වී තිබෙන දේශපාලන ප්‍රතිඵලය දිහාත් අපේ රටේ ජනතාව බැලිය යුතුව තිබෙනවා. අන්ත ජාතිවාදී කණ්ඩායම් අතට උතුරේ දේශපාලන මතය ගලාගෙන යෑමේ අනතුරක් මෙම මැතිවරණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කරමින් තිබෙනවා. එම නිසා මේ මැතිවරණ ප්‍රතිඵල හැම දේශපාලන ව්‍යාපාරයකටම තමන්ගේ භූමිකාව, තමන්ගේ කාර්ය භාරය දෙස නැවත හැරී බලන්න බල කරන මැතිවරණ ප්‍රතිඵලයක්. අපි හැමදෙනාම ඒක පිළිගන්න ඕනෑ. තමන්ගේ දේශපාලන භූමිකාව සහ තමන්ගේ දේශපාලන ක්‍රියාමාර්ග පිළිබඳව නැවත හැරී බලන්න මේ ප්‍රතිඵලයෙන් අපි හැමදෙනාටම බල කරමින් තිබෙනවා.

මෙම මැතිවරණයෙන් පසුව රටේ අරාජික තත්ත්වයක් නිර්මාණය වුණේ කුමක් නිසාද? එය කිසිසේත්ම මැතිවරණ ප්‍රතිඵලයට සම්බන්ධ කාරණයක් නොවෙයි කියා මා විශ්වාස කරනවා. මැතිවරණයේ සංඛ්‍යා, දත්ත මත නොවෙයි ඒ ප්‍රශ්නය පැන නැඟුණේ. මේ රටේ දේශපාලන ගැටුමක් තිබුණා. මැතිවරණ ව්‍යාපාරය තුළත් ඒ දේශපාලන ගැටුම අපි දැක්කා. ඒ දේශපාලන ගැටුමේ ප්‍රතිඵලයක් විධියට තමයි ආණ්ඩුව ඉතා නිශ්චිත ලෙස කණ්ඩායම් දෙකක් ලෙස මැතිවරණ ව්‍යාපාරයේ නිරත වුණේ. මැතිවරණ ව්‍යාපාරයේදී කණ්ඩායම් දෙකක් ලෙස තමයි ඔවුන් කටයුතු කළේ. ඒ ගැටුම කොයි තරම් තීව්‍ර වුණාද කියනවා නම්, මැතිවරණයෙන් පසුව එකට ඉදිමට බැරි තත්ත්වයක් නිර්මාණය වුණා. ඇයි එහෙම වුණේ? මැතිවරණ ව්‍යාපාරය ඇතුළේ කණ්ඩායම් දෙකක් ලෙස බෙදීම දක්වා වූ දේශපාලන තත්ත්වයක් වර්ධනය වන්නේ මොකක් නිසාද? ඒ අන් කවරක්වත් නිසා නොවෙයි, ගරු කථානායකතුමනි.

2015 ජනවාරි 08වැනි දා මේ රටේ ජනතාව විශාල ජන වරමක් දුන්නා, මේ ජනාධිපතිවරයාට සහ අග්‍රාමාත්‍යවරයාට. ඒ වෙලාවේදී කවුරු හෝ මෙන්න මෙහෙම හිතන්න ඇති. මා හිතනවා එහෙම හිතන්න ඇති කියලා. ජනාධිපතිවරයාගේ පැත්තෙන් කල්පනා කළා, එය එතුමාට ලැබුණු අනභිභවනීය බලයක් කියලා. එම නිසා එතුමාට බලය ලබාදුන් මුල් අවුරුදු පහ තුළ ජනාධිපති ධුරය අහෝසි කරනවා වෙනුවට, නැවත වතාවක් එම පුටුවේ වාඩි වෙන්න පුළුවන්ද කියන දේශපාලන සිතියම එළන්න එතුමා පටන් ගත්තා. ඒකයි ඇත්ත.

අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාත් ඒ වාගේමයි හිතුවේ. එතුමා විධායක ජනාධිපති ධුරය යටතේ අගමැති ධුරය දරා තිබුණාට, විධායක ජනාධිපති ධුරය යටතේ අමාත්‍ය ධුර දරා තිබුණාට, එතුමාගේ මුළු දේශපාලන ඉතිහාසයේම විධායක පුටුවේ වාඩි වෙන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, ජනවාරි මාසයේ 8වැනි දා ප්‍රතිඵලයෙන් පසු, මේ විධායක පුටුවේ වාඩි වෙන්න එතුමා නැවතත් සැලසුම් හැදුවා. ඒකයි ඇත්ත. හැබැයි, 2015 ජනවාරි මාසයේ 08වැනි දා දුන්නේ කවර ආකාරයේ ප්‍රතිඵලයක්ද? ඒක මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ හාස්කමක් හෝ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ දැවැන්ත ප්‍රතිරූපයකට ලැබුණු ප්‍රතිඵලයක් නොවෙයි. පැවති පාලනයට එරෙහිව වර්ධනය වෙමින් තිබුණු විරෝධය විසින් තමයි එම ප්‍රතිඵලය නිර්මාණය වුණේ. නමුත් එය තේරුම් ගන්න ඒ දෙදෙනාම අසමත් වුණා. ඒ ප්‍රතිඵලය පිටුපස තිබුණු සැබෑ ජන වරම, ඒ ප්‍රතිඵලය පිටුපස තිබුණු ජනතාවගේ සැබෑ වුවමනාව ඒ දෙදෙනාම අමතක කළා. එම නිසා පසු ගිය අවුරුදු තුනේම දෙදෙනාට හොරෙන් හොර ගල් අහුලමින් කටයුතු කළා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කල්පනා කරනවා, ඊළඟට එම පුටුවේ වාඩි වෙන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයා කල්පනා කරනවා, ඊළඟ ජනාධිපතිවරණයේදී ජනාධිපති පුටුවේ වාඩි වෙන්න. එළැඹෙන ජනාධිපතිවරණයකදී පුටුවේ වාඩිවීම සඳහා කරන දේශපාලන දායු කෙළියක් එම අවුරුදු තුන ඇතුළත මේ දෙදෙනාම ගෙන ගියා. එහෙම කටයුතු කිරීම නිසා මොකක්ද වුණේ? ගරු කථානායකතුමනි, එසේ කටයුතු කිරීම නිසා තමයි ජනවාරි මාසයේ 08වැනි දා ලැබුණු ජන වරම මේ ඡන්දයේදී ප්‍රතික්ෂේප වුණේ. ඔවුන් ඒ ජන වරමට පිටුපස හැරෙව්වා. ඒකයි සිද්ධ වුණේ. ඒකෙන් මොකක්ද වුණේ? තමන්ට ප්‍රතිපාක්ෂික කඳවුරේ කණ්ඩායම් තමන්ට දිනා ගැනීම වෙනුවෙන් කටයුතු කළා. වංචාවලට, දූෂණවලට එරෙහිව කටයුතු කරන ආයතන අඩපණ කළා.

ගරු කථානායකතුමනි, වංචා දූෂණ සහ නාස්තිය පිළිබඳ විශාල සාකච්ඡාවක් මේ රටේ තිබුණා. ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිටට විරුද්ධව දමපු නඩුව තමයි මේ ආණ්ඩුවෙන් දමපු පළමුවැනි නඩුව. විභාග කරලා අවසන් කළ පළමුවැනි නඩුව

ඒකයි. එම නිසා ඒ නඩුවේ තීන්දුව රටට අතිශය වැදගත් වුණා. ඒ මොකක් නිසාද? දූෂිතයන් පිළිබඳව ගොඩනඟා තිබෙන මතය, ජනතාවගේ මූල්‍ය අවභාවිත පිළිබඳව රටේ ගොඩනඟා තිබෙන මතය සැබෑවක්ද, නැද්ද යන්න තහවුරු කිරීමේ නඩුවක් බවට එම නඩුව පත් වුණා.

ඒ නඩුව අතිශය වැදගත් නඩුවක් වුණා. හැබැයි, මොකක්ද වුණේ? මම අහන්න කැමැතියි, අඩුම තරමින් ඒ නඩුව වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන්වලා ඔවුන්ට ප්‍රශංසා කළේ ආණ්ඩුවේ මොන ඇමතිවරයාද කියලා. ඒ නඩුව ගොනු කිරීම වෙනුවෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය -FCID- එකේ මොන නිලධාරියාටද තමුන්නාන්සේලා සහතිකයක් ප්‍රදානය කළේ? නැහැ, තමුන්නාන්සේලාට ඒවා ඕනෑ නැහැ. තමුන්නාන්සේලා කටයුතු කළේ බේරා ගන්නයි. ඒකයි ඇත්ත. ඒ නිසා තමයි ලලිත් වීරතුංග සහ අනුෂ පැල්පිට සිරගත වූ වහාම මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයා මුණ ගැසුණේ. මා දැක්කා, මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා "ඒ නඩු තීන්දුව ගැන අගමැතිවරයා පුදුම වුණා"යි කියලා. පුදුම වෙන්න දෙයක් නොවෙයි. "පුදුම වුණා" කියන්නේ මොකක්ද? තමන් අපේක්ෂා නොකරන ලද තීන්දුවක් ලැබුණා. අගමැතිවරයා ඉන්නේ එතැන.

ඊළඟට මොකක්ද වුණේ? ඊළඟට අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළා. High Court එකට ගිහිල්ලා ඇප ඉල්ලුවා. "මේක වංචාවක්, මේකට දඬුවම් ලබා දිය යුතු"යි කියලා එදා අධිකරණයේදී තර්ක කළ තුසිත මුදලිගේ කියන ජ්‍යෙෂ්ඨ නීතිඥතුමා ඇප ඉල්ලන දවසේ අධිකරණයට ගියේ නැත්තේ ඇයි? ඇයි, ගියේ නැත්තේ? තමුන්නාන්සේලාගෙන් orders ආවා. ඇප ඉල්ලනවාට විරුද්ධ වෙන්න එපා කියලා නියෝග ආවා. ඇප ඉල්ලන එකට විරුද්ධ වෙන්න එපා නම් මොකක්ද කරන්න ඕනෑ? එම නීතිඥවරයා ගිය සතියේ ගිහිල්ලා ඒ අය හිරේ දමන්න කියලා තර්ක කරලා, මේ සතියේ ඇඳුම් ඇඳගෙන අධිකරණයට ගිහිල්ලා කියන්න වෙනවා, ඇප දෙනවාට විරුද්ධ නැහැ කියලා. ඒ නිසා කණිෂ්ඨ නීතිඥවරයෙක් අධිකරණයට යැව්වා. මොකක් වෙනුවෙන්ද? තමුන්නාන්සේලා මේ අයව ආරක්ෂා කර ගන්න උත්සාහ කළා. ඒ අන් කවරක් සඳහාවත් නොවෙයි, තමුන්නාන්සේලාගේ දේශපාලන දායකෙළිය නිසා. ඇයි? පුටුවේ වාඩිවෙන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට යළි එම පුටුවේ වාඩිවෙන්න, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ජීවිතයටම වාඩිවෙන්න බැරි වුණු පුටුවේ වාඩිවෙන්න. මෙහෙමයි සැලසුම් හැදුවේ. ඒ සැලසුමට අනුව මොකක්ද කළේ? වංචාවට දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන අඩපණ කළා; අධෛර්යට පත් කළා. සමහර නිලධාරීන් භීතියට පත්වෙලා තිබෙනවා. මේකයි ඇත්ත කථාව. නීතිපති දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් ඇහුවා "ඇමතිවරු දූෂිතයන් රකිනවා නම්, අපි නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා නඩු මෙහෙය වන්නේ කොහොමද?" කියලා. ආණ්ඩුව දූෂිතයන් රකිනවා නම්, අපි නඩු මෙහෙයවන්නේ කොහොමද කියලා ඇහුවා. තමුන්නාන්සේලා සමස්ත ක්‍රියාදාමය දියත් කළේ වංචනිකයන් ආරක්ෂා කරන්නයි. තමුන්නාන්සේලා වංචනිකයන්ට දඬුවම් ලබාදෙයි කියලා, ඒ පිළිබඳව ජනතාව තුළ මහත් බලාපොරොත්තුවක් තිබුණා. ඒ බලාපොරොත්තුව මුළුමනින්ම ප්‍රතික්ෂේප කළා. තමුන්නාන්සේලා ඒ වෙනුවට ඊට ප්‍රතිපක්ෂව කටයුතු කළා. වංචනිකයන්, දූෂිතයන් රකින පාලනයක් බවට තමුන්නාන්සේලා පාලනය පත් වුණා. ඒ සංඥව තමයි මේ මැතිවරණයෙන් ලබා දී තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දීම සඳහා ලැබුණු ජනවරමින් තිබුණු සදාචාරයට හානි කර ගත්තා. තමුන්නාන්සේලා ප්‍රබල වංචා දූෂිතයන්ගේ හවුල්කරුවන් බවට පත් වුණා.

ගරු කථානායකතුමනි, වංචා, දූෂණ මැඩපැවැත්වීම සඳහා එන ලද පාලනයක් මහා විශාල වංචා දූෂණවල හවුල්කරුවන් බවට පත් වුණාම තවදුරටත් වංචනිකයන්ට සහ දූෂිතයන්ට දඬුවම් දෙන්න ඔවුන්ට සදාචාරාත්මක අයිතියක් නැති වුණා. ජනතාවගේ බලාපොරොත්තුවලට භාත්පසින්ම වෙනස් පාලනයක් තමුන්නාන්සේලා දියත් කරමින් තිබුණා. එහි ප්‍රතිඵල තමයි මේ මැතිවරණයෙන් පෙන්නුම් කර තිබෙන්නේ.

වංචා දූෂණ පිළිබඳව විතරක් නොවෙයි, ඝාතන, අපරාධ පිළිබඳවත් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, සමහර අපරාධ වළක්වන්න බැරි විධියටම, සමහර අපරාධ සඳහා දේශපාලන මැදිහත්වීම් තිබුණාට ක්‍රියා මාර්ග අරගෙන තිබුණේ සමහර හමුදා නිලධාරිනුයි. ඒක වළක්වන්න බැහැ. මොකද, දේශපාලනඥයෝ අරගෙන ගිහිල්ලා වෙඩි තියන්නේ නැහැ. හැබැයි, ඒ සමහර අය පිළිබඳව ක්‍රියාත්මක වන විට ඒවා අඩපණ කළා. ගරු කථානායකතුමනි, මම අදත් අහනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය මාරු කළේ ඇයි කියලා. මේ ආණ්ඩුව ඒක නවමත් මේ පාර්ලිමේන්තුවට කියලා නැහැ. එතුමිය මාරු කළේ ඇයි? ආණ්ඩුවට එන ලද මුදල් රුපියල් කෝටි 1,140ක් ඇවන්ට්ගාර්ඩ් සමාගමට හැරෙව්වා කියලා ගෝඨාභය රාජපක්ෂටත්, හිටපු නාවික හමුදාපතිවරු තිදෙනාටත් විරුද්ධව ප්‍රධාන නඩුවක් දැම්මා. මොකක්ද වුණේ? පසුවදා අයින් කළා. ගරු කථානායකතුමනි, මේගොල්ලෝ හිටියේ කොතැනද? මේගොල්ලෝ හිටියේ මොකක් වෙනුවෙන්ද? තම තමන්ට හිතවාදී කණ්ඩායම් ප්‍රතිපක්ෂයෙන් හදා ගන්න උත්සාහ කළා. ඒ නිසා අග්‍රාමාත්‍යවරයාත් යම් කණ්ඩායම් ආරක්ෂා කළා; මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් යම් කණ්ඩායම් ආරක්ෂා කළා. ආරක්ෂා කළේ නැහැයි කියලා ඒ දෙදෙනාම මෙතැනට ඇවිල්ලා අභියෝග කළොත් ආරක්ෂා කළ විධිය, රැක ගත් විධිය නම් ගම් එක්ක කියන්න මා ලැහැස්තියි. එහෙම රැක ගත්තා විතරක් නොවෙයි, නැවත වංචා, දූෂණවල යෙදුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් කාලය ඉවරයි. ඔබතුමන්ලාට තව විනාඩි 10ක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. ඒ වාගේම ඝාතන පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම ගැන මහ ජනතාව තුළ බලාපොරොත්තුවක් තිබුණා. නමුත් එක ඝාතකයකුවත් තමුන්නාන්සේලාට අල්ලන්න බැරි වුණා. අල්ලන්න බැරි වුණේ පරීක්ෂණ ආයතන අඩපණ නිසා නොවෙයි.

පරීක්ෂණ ආයතන ශක්තිමත්ව තිබුණා. හැබැයි, ඒ පරීක්ෂණ ආයතනවලට බාධා කරන ආණ්ඩුවක් තිබුණා. ඒකයි හේතුව.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. හර්ෂ ද සිල්වා ඇමැතිවරයා විපක්ෂයේ සිටින විට පසු ගිය ආර්ථික ක්‍රමවේදය පිළිබඳ විවේචනය කළා මට මතකයි. සමාජ ආර්ථික වෙළෙඳ පොළක් ගැන කථා කළා. හැබැයි, තමුන්නාන්සේලා දියත් කළේ ඒ ආර්ථිකය නොවෙයි. තමුන්නාන්සේලාට කඩිමුඩියේ, හදිසියේ මහා බලයක් ලැබුණු ලෙස කල්පනා කරලා සියල්ල වෙනස් කරන්න පටන් ගත්තා. ගොවි ජනතාවගේ ජීවිත විශාල ලෙස විනාශයට පත් වෙමින් තිබුණා. ඔවුන්ගේ පොහොර සහනාධාරය කප්පාදු කළා. ගම්මිරිස් වගාව පිළිබඳව ප්‍රශ්නයක් එනකොට ආණ්ඩුව ඒ ගැන අවධානය යොමු කළේ නැහැ. අමාත්‍යවරයා යම්

[ගරු අනුර දිසානායක මහතා]

උත්සාහයක් දැරුවා කියලා මම දන්නවා. හැබැයි, ඒ උත්සාහයට මුදල් අමාත්‍යාංශය සල්ලි දුන්නේ නැහැ. ඒක නේ වුණේ. තමුන්නාන්සේ ගම්මිරිස් ගොවීන්ට කිව්වා, රුපියල් 950 ගණනේ -[බාධා කිරීමක්] මට නියමිත කාලය සීමිත නිසා අවස්ථාව දෙන්න බැහැ. එම නිසා මොකද කළේ? සාමාන්‍ය පතුලේ ජනතාවගේ වුවමනාවන් තමුන්නාන්සේලා නියෝජනය කළේ නැහැ. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ ඔළු පුරවාගෙන තිබුණු මනස්ගාත ලිබරල් අදහස් මේ රටේ ප්‍රකට කරන්න පටන් ගත්තා.

ගරු කථානායකතුමනි, අපි දැන් පසු ගිය අය වැය ලේඛනය ගැන බලමු. අපේ රටේ තට්ටු තුනට අඩු නිවාස මිලදී ගැනීමට විදේශිකයන්ට බාධාවක් තිබුණා. හැබැයි, තමුන්නාන්සේලාගේ අය වැය ලේඛනයේ කියනවා, තට්ටු තුනට අඩු නිවාසත් සුද්දන්ට ගන්න පුළුවන් කියලා. තමුන්නාන්සේලා රට පාලනය කළේ කවුරු වෙනුවෙන්ද?

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපේ රටේ ඉඩම් නීති ශක්තිමත්. ඉඩම් නීතිවල ශක්තිමත් බව නිසා තමයි අද අපේ රටේ ගම්වල මිනිසුන් සතුව තවමත් ඉඩම් තිබෙන්නේ. අපේ රටේ සක්‍රීය ඉඩම් වෙළඳ පොළක් නැහැ. ඒක හොඳයි. එම නිසා තමයි අපි අනුරාධපුරයේ ගෙදරකට ගියොත්, ඒ ගෙදර විශාල දේපොළ නැති වුණාට ඔවුන්ට කුඹුරක් තිබෙන්නේ. ඒ මේ ඉඩම් නීති නිසා. හැබැයි, තමුන්නාන්සේලා මේ අය වැය ලේඛනයෙන් යෝජනා කරනවා, ඉඩම් නීති සංශෝධනය කරන්න; කුඹුරු පනත සංශෝධනය කරන්න. ඒ විතරක් නොවෙයි. අපේ රටේ නාවික සේවා සැපයීමේ ක්ෂේත්‍රයට විදේශිකයන්ගේ පැමිණීමට බාධා ඇති කරලා තිබුණා. විදේශිකයෙක් එනවා නම් සමාගමේ ඔහුගේ කොටස් පංගුව සියයට 40ට වඩා වැඩි වෙන්න බැහැ කියලා තිබුණා. හැබැයි, තමුන්නාන්සේලා පසුගිය අය වැය ලේඛනයෙන් යෝජනා කරනවා, විදේශ සමාගම්වලට අපේ නාවික සේවා ක්ෂේත්‍ර සපයන්න සූදානම් කියලා. අපේ රටේ දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමේ දී, අපේ තාක්ෂණය දුබලයි, අපේ නිෂ්පාදනය පොඩියි. එම නිසා අපේ රටේ නිපදවන භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය වැඩියි. ඒ නිසා අපේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමට නම්, අනිවාර්යෙන්ම විවිධ බදු හරහා පමණයි අපේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමට පුළුවන් වන්නේ. හැබැයි, තමුන්නාන්සේලා අය වැයෙන් යෝජනා කරනවා, ඉදිරි වසර තුන ඇතුළත භාණ්ඩ 1,500ක තීරු බදු නොවන බදු සියල්ල ඉවත් කරනවා කියලා. ඒ කියන්නේ මොකක්ද? අපේ කර්මාන්ත කඩා වට්ටන්න සැලසුමක් හැදුවා. තමුන්නාන්සේලා මුළු ආර්ථික ප්‍රතිපත්තියම වෙනස් කළා. එදා විපක්ෂයේ ඉන්නකොට කියපු කථාව නොවෙයි ක්‍රියාත්මක කළේ. ඊට ප්‍රතිපක්ෂ ලෙස ඔළුවේ තැන්පත් කර ගන්නා ලද, ලෝකයේත් අසාර්ථක ක්‍රමවේදයක් තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කළේ. 2008 වර්ෂයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාස වෙළෙඳ පොළෙන් පටන් ගත් අර්බුදය මූල්‍ය වෙළඳ පොළ දක්වා වර්ධනය වන විට එවකට සිටි ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "ඉතිහාසයේ මුහුණ දී තිබෙන දැවැන්ත අර්බුදය, නිවාස වෙළඳ පොළෙන් පටන් ගන්නා ලද අර්බුදය ඩොමිනෝ ආකාරයෙන් පැතිරිලා යනවා, දසලක්ෂ ගණනකට රැකියා අහිමි වෙලා තමයි මේක නතර වෙන්නේ" කියලා. හැබැයි, තමුන්නාන්සේලාත් ඒ ගමනම යන්න පටන් ගත්තා. එංගලන්තයේ මහ බැංකු අධිපතිවරයා කිව්වා, 1929 වසරෙන් පසුව එංගලන්ත රාජ්‍යය, ඇය මුහුණ දී තිබෙන දරුණුතම අගාධයට මුහුණ දී තිබෙනවා කියලා. සෞඛ්‍ය රක්ෂණය කපන්න වෙනවා, අධ්‍යාපන පහසුකම් කපන්න සිදු වෙනවා, ඇයගේ ඉතිහාසයේ දැවැන්තම ආර්ථික අර්බුදය නිර්මාණය වෙලා තිබෙනවා, කියලා කිව්වා. ලෝකය පුරා අසාර්ථක වෙමින් තිබුණු ආර්ථික ගමනම තමුන්නාන්සේලා දියත් කරමින් තිබුණා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ගොවි ජනතාවගේ වුවමනාවන්, සාමාන්‍ය ජනතාවගේ වුවමනාවන්, කර්මාන්ත කරුවන්ගේ වුවමනාවන්, තරුණයන්ගේ වුවමනාවන් සියල්ල අත්හරිමින්, බලයෙන් හිස උදුම්මාගත්, කිසි කෙනෙකුට ඇහුම් කන් නොදෙන කණ්ඩායමක් හැටියට තමුන්නාන්සේලා කටයුතු කළා. ඒ කණ්ඩායමට නිසි පාඩම මේ මැතිවරණයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ සංඛ්‍යා ලේඛනවල හැංගෙන්න බැහැ. මේක තමයි සමාජ මතය. මේක තමයි මැතිවරණ ප්‍රතිඵලය. හැබැයි, මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුව මොකක්ද වුණේ? මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුව පළාත් පාලන ආයතනවල ආණ්ඩු හදා ගනියි; තිබෙන ආණ්ඩුව යයි. ඒක වෙනම දෙයක්. හැබැයි, සිද්ධ වුණේ මොකක්ද? මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුවත් මෙම පරාජයේ වගකීම එකිනෙකා පිට පටවා අනෙකා නිදහස් වීමේ උපක්‍රමයකට ගියා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අතර නම් ඊළඟ ජනාධිපති පුටුවේ තරගය තිබුණේ, මැතිවරණ ප්‍රතිඵල ඇතුළේත් උත්සාහ කළේ අන් කවරක්වත් නොවෙයි, එක් අයෙක් පරයා අනෙක් කෙනා නැවත පුටුවේ වාඩි වෙන්නයි. මෙකටයි සැලසුම හැදුවේ. ඒ නිසා තමයි එක් අයෙක් පිට මුළු දෝෂාරෝපණයම පටවා තමන් සුද්ධවන්තයෙක් බවට පත් වෙන්න උත්සාහ කරන්නේ. එම නිසා තමයි තව කෙනෙක්, අනෙකා පිට මුළු විවේචනයම පටවා තමන් හරි කෙනෙක් බවට පත් වෙන්න උත්සාහ කරන්නේ. එම උත්සාහය පිටු පස තිබෙන්නේත් නැවත ජනාධිපති පුටුවේ වාඩිවීමේ සිහිනයයි. එම නිසා මේ පළාත් පාලන මැතිවරණයෙන් පසුව ආණ්ඩුවක් නොමැති තත්ත්වයක් නිර්මාණය වුණා. රුපියල කඩා වැටෙන්න පටන් ගත්තා. කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙන්න පටන් ගත්තා. ඒ වාගේම ගිවිසුම් අත්සන් කර නැති, සාකච්ඡා මට්ටමේ තිබුණු විදේශ ආයෝජන පැත්තකට ගලාගෙන යන්න පටන් ගත්තා. ආණ්ඩුවේ යම් අරාජිකත්වයක් නිර්මාණය වෙන්න පටන් ගත්තා. මේ අරාජිකත්වය නිර්මාණය කළේ මැතිවරණ ප්‍රතිඵලය විසින් නොවෙයි.

තමුන්නාන්සේලා 2015 ජනවාරි මාසයේ 08 වැනි දා සිට දියත් කරන ලද දේශපාලන "ගේම්" එක, මැතිවරණයෙන් පසුවත් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. එකිනෙකා මත වරද පටවමින් එක් අයෙකු යට කර, නැවත තමන්ගේ කොඩිය ඔසවා ගැනීමේ තරගය තිබුණා. එම තරගය තමයි මේ අරාජිකත්වය නිර්මාණය කළේ, දින 10ක් පමණ.

අද ආණ්ඩුවක් තිබෙනවාද? මොන ඇමතිවරයාද, වගකීමෙන් කටයුතු කරන්නේ? මොන නිලධාරියාද, ඇමතිවරයෙකුගේ නියෝගයක් පිළිගන්නේ? අද වනවිට මේ බල පොරය මුළු රටම අරාජිකත්වයට ගෙනැවිත් තිබෙනවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට කියන්නේ මෙයයි. මේ බල පොරයෙන් මිදෙන්න තමුන්නාන්සේලා සූදානම් නැත්නම්, මේ අරාජිකත්වය හැම දාමත් තිබේවි. මේක තිබෙනවා. ඒ නිසා දැන් තේරුම් ගන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයා ආයෙත් සිහින මවන්න එපා, ජනාධිපති පුටුවේ වාඩිවෙන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් ආයෙත් සිහින මවන්න එපා, ජනාධිපති පුටුවේ වාඩිවෙන්න. එහෙම බැහැ, හරිද? 2015 ජනවාරි මාසයේ 08 වැනි දා එකතු වුණු බලවේග ආයෙත් කවදාවත් එකට එකතු වෙන්නේ නැහැ. මතක තබා ගන්න. ආයෙත් කවදාවත් එකට එකතු වෙන්නේ නැහැ. එය ජනවාරි මාසයේ 08 වැනි දාට පමණයි. හරිද? "මෙහෙම ගියාට පසුව එයි, මෙහෙ ගියාට පසුව සහාය දෙයි, පසුව එකතු වෙයි" කියලා හිතන්න එපා. එහෙම වෙන්නේ නැහැ. මතක තබා ගන්න. මේ ජනාධිපති පුටුව ඉදිරියෙන් තබා ගෙන මේ දෙදෙනා කරන බල සූදුව මේක විනාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා මේ බල සූදුව නතර කරන්න ඕනෑ.

2015 ජනවාරි මාසයේ 08 වැනි දාට ආපසු යන්න. ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම තමයි ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව වුණේ. හැබැයි, තමුන්නාන්සේලා ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව වෙනුවෙන් කටයුතු කරනවා වෙනුවට ඊට පටහැනිව තමයි කටයුතු කරමින් තිබෙන්නේ. එසේ පටහැනිව කටයුතු කිරීම තමයි මෙවැනි විනාශකාරී තැනකට, විනාශකාරී බලවේගයන්ට යළි අපේ රටේ දොරටු විවෘත කරමින් තිබෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි තමුන්නාන්සේලාට එක දෙයයි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි එක දෙයයි කියන්නේ. මේ ජනතාවගේ අභිලාෂ, වුවමනා මත තමුන්නාන්සේලා පෙළ ගැහෙන්නේ නැත්නම්, මේ ඔළු මාරුව කර ගන්න පුළුවන්. එහෙන් ඔළු ගන්න පුළුවන්; මෙහෙන් ඔළු ගන්න පුළුවන්. මම මීට කලිනුත් මේ ගරු සභාවේදී මේ ගැන කියලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ නිකම් කුණු මාළු වාගේ විකිණෙන අය ගොඩාක් ඉන්නවා. නිකම් කඳන්. එහෙම නේද? සමහර විට බුරුත කඳන් වාගේ තමයි ශරීර කඳන්. කොස් කඳන්, බුරුත කඳන්, පාර්ලිමේන්තු මන්ත්‍රී කඳන්. කොට විකිණෙනවා වාගේ, ලී විකිණෙනවා වාගේ වර්ග අඩි ගණනට විකිණෙන, ඝන අඩි ගණනට විකිණෙන කණ්ඩායමක් ඉන්නවා. මේ කණ්ඩායම්වලින් ඕනෑ තරම් වට අඩි ප්‍රමාණයට විකිණෙන කණ්ඩායම් ඉන්නවා. ගහ පැරණිද, ගහ අලුත්ද කියලා බලන්නේ නේද? ගහ පැරණි නම් අරටුව හොඳයි. දැන් නම් ගොඩාක් අයගේ අරටු දිරලා. ඔහොම තිබෙනවා. හැබැයි, එහෙම වැඩක් නැහැ. මේ විකිණෙන කඳන් තබා ගෙන ආණ්ඩුවක් ස්ථාවර කර ගන්න බැහැ. ආණ්ඩුවක් ස්ථාවර කරගත හැකි වන්නේ ජනවාරි මාසයේ 08 වැනි දා ජනතාව දෙන ලද එකඟතාවන්ට අනුව තමුන්නාන්සේලා කටයුතු කරන්න සමත් වුණොත් විතරයි. එසේ සමත් නොවන තාක්කල්, මේක අරාජිකත්වයෙන්. ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී ඔළු විතරක් එකතු කරගෙන ආණ්ඩුවක් පවත්වාගෙන යන්න පුළුවන් කියලා කවුරුහරි කල්පනා කරනවා නම්, ඒක ඉතිහාසයට අයිතියි. ඇයි? අද ජනතාව වෙනදාට වඩා සක්‍රීයයි. වෙනදාට වඩා ඔවුන්ට අවබෝධයක් තිබෙනවා. ඔවුන් දේශපාලනය නිරීක්ෂණය කරලා ගනු ලබන තීරණ වැරදි වෙන්න -නිවැරදි නොවෙන්න- පුළුවන්. හැබැයි, ජනතාව දේශපාලනය පිළිබඳව නිරීක්ෂණයක ඉන්නවා. ඒකයි තේරුම් ගත යුත්තේ. එම නිරීක්ෂණයෙන් එන තීන්දු හොඳද, නරකද කියන එක වෙනම දෙයක්. හැබැයි, ජනතාව තුළ අන් කවරදාටත් වඩා වැඩියෙන් අපේ රටේ දේශපාලනය පිළිබඳව කියවීමක් තිබෙනවා. ඔවුන් නිරීක්ෂණයකින් ඉන්නවා. ඒ ගැන තමුන්නාන්සේලා හොඳට මතක තබා ගන්න.

තමුන්නාන්සේලා ඇඳුම් මාරු කරනවා තමයි. තමුන්නාන්සේලා හිතනවා ඇඳුම් මාරු කර ගන්නේ, දොරගුළු ලා ගත් කාමරයක් තුළ කියලා. හැබැයි, තමුන්නාන්සේලා ඇඳුම් මාරු කර ගන්නේ වීදුරු කාමරයක ඉඳන්. මතක තබා ගන්න. තමුන්නාන්සේලා වීදුරු කාමරයක ඉඳන් තමයි මෙතෙක් කල් ඇඳුම් මාරු කර ගත්තේ කියන එක කල්පනා කරලා බලන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳමයි, ගරු කථානායකතුමනි. දැන් සමහර අය හිතනවා, යටි ගේම්වලින්, යටි දේවල්වලින් මේවා වෙනස් කර ගන්න පුළුවන් කියලා. වෙනස් කර ගන්න බැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, 2015 ජනවාරි මාසයේ 08 වැනි දා ලබා දුන් ජනවරම, මොන ආකාරයෙන් පිහිටා කටයුතු කරන්න සූදානම්ද කියන පණිවුඩය තමයි මේ පණිවුඩයෙන් දීලා තිබෙන්නේ. ඔළු ගෙඩි මාරු කරමින් කට්ටියක් එළියට ඇවිල්ලා, තව කට්ටියක් එකතු වෙලා, ඊට ප්‍රතිපක්ෂව තව කට්ටියක් අරගෙන කරන ඔළු ගෙඩි සෙල්ලම්වලින් ඒක හරි යන්නේ නැහැ. එය තමන්ගේ බල පොරය සඳහා පමණයි. මේකයි තිබෙන්නේ. දැන් එය මුළුමනින්ම අමතක කරපු - මම නම් දන්නේ නැහැ, නැවත ප්‍රතිසංස්කරණය කර ගන්න පුළුවන්ද කියලා. හැබැයි, අපි එක සහතිකයක් දෙනවා. එම ජනවරම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටිනවා. ඒ සඳහා අවශ්‍ය වෙන ඕනෑම ක්‍රියාමාර්ගයකට මේ රටේ ජනතාවත් එක්ක පෙළ ගැහෙන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු නවින් දිසානායක ඇමතිතුමා.

[අ.භා. 5.24]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, මෙවැනි අවස්ථාවක -නොයෙක් අදහස් හා මත තිබෙන වේලාවක- ජනවරම කියන්නේ මොකක්ද කියන එක ඉතාම වැදගත් කියා අපි විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි. එම නිසා දේශපාලනය කරලා තිබෙන පුද්ගලයෙක් වශයෙන්, දේශපාලනය දැනුත් කරන පුද්ගලයෙක් වශයෙන් සහ අනාගතයේත් දේශපාලනය කරන පුද්ගලයෙක් වශයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණය ගැන මම එම පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මාගේ සතුට ප්‍රකාශ කරනවා. ඒ මක් නිසාද කියා මා කියන්නම්. මා තරුණයකු හැටියට දේශපාලනය කරන කොට මගේ දිවංගත පියාණන් හා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අලුත් දේශපාලන ව්‍යාපාරයක් පටන් ගත්තා. එය "රාජාලියා" ලකුණ දරන "ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ" කියා හැඳින්වූ පක්ෂයයි. එතුමන්ලා මාස 18ක් මහන්සි වුණා; වැඩ කළා. එතුමන්ලා පැය 24න් පැය 18ක් ම දේශපාලනයයි කළේ. ප්‍රේමදාස මහතා කියන දැවැන්තයා එක්කයි සටන් කළේ. මාස 18ක් මැතිවරණවලට ලෑස්ති වෙලා අන්තිමට ඡන්ද ලක්ෂ 10යි හම්බ වුණේ. නමුත් තමුන්නාන්සේලා ඉතාම සුළු කාලයකින් "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ" නමින් දේශපාලන ව්‍යාපාරයක් අලුතින් පටන් ගෙන ලබපු මේ ඡන්ද ප්‍රතිශතය ඉතාම ප්‍රශංසනීයයි කියා මම සිතනවා. ඒ වාගේම තමුන්නාන්සේලා සිතන්න එපා එය බහුතරයයි කියා. මා ඒකත් කියන්න ඕනෑ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. මට කතා කරන්න ඉඩ දෙන්න කෝ. සියයට 44.65 කියන්නේ සියයට 50 නොවෙයි. හිටපු ජනාධිපතිතුමා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ චරිතයට, බාගවේලාවට එතුමාගේ ආකර්ෂණ බලයට ඒ ඡන්ද ටික ලැබෙන්න ඇති. අපගේ අඩු පාඩු නිසාත් ජනතාව ප්‍රතිචාර දක්වා

[ගරු නවීන් දිසානායක මහතා]

තිබෙනවා. ඒ සියලු දේ ම මේ ප්‍රතිඵලය ඇතුළේ තිබෙනවා. මෙය තමුන්නාන්සේලා ලබපු විශාල ජයග්‍රහණයක් හැටියට හිතන්න එපා. මේ විධියටම අනෙක් පැත්තට ගහන්නත් පුළුවන්. ඒ මක් නිසාද කියා මා කියන්නම්. අපගේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය 32.63යි; එක්සත් ජනතා නිදහස් සන්ධානය, සියයට 8.94යි; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සියයට 4.44යි; JVP එක, සියයට 6.27යි; ITAK එක, සියයට 3.07යි; මේ ඔක්කෝම ගෙන බැලුවාම, සියයට 55ක ඡන්ද ඔබතුමන්ලාට වැටිලා නැහැ. ඔහොම සතුටු වන කොට කරුණාකර ඒකත් පොඩ්ඩක් ඔළුවේ තියාගන්න.

විශේෂයෙන්ම නුවරඑළිය ජනතාවට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. එම නගර සභාවේ කොට්ඨාස 13 ම අපි -එක්සත් ජාතික පක්ෂය- ජයග්‍රහණය කළා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා -විශේෂයෙන්ම සිංහල කොට්ඨාස- බහුතරයක් අපි ජයග්‍රහණය කළා. එතැනදීත් ඡන්දය විශ්ලේෂණය කරන කොට මා දැකපු දෙයක් තිබෙනවා. නුවරඑළියේ කඳපොළ හා සමර්හිල් ප්‍රදේශ ගැන ඔබතුමාත් දන්නවා, ගරු සී.බී රත්නායක මන්ත්‍රීතුමනි. එය, මාගේ දිවංගත පියාණන්ට ඉතාම කිට්ටු, මමත් අතිශයින්ම වැඩ කර තිබෙන කොට්ඨාසයක්. අපි එයට ඉතාම දක්ෂ තරුණයකු ඉදිරිපත් කළා. නමුත් ඔහු ඡන්ද 50කින් පැරදුණා, තමුන්නාන්සේලාට. ඒ වාගේ ධාරාවන් ගොඩක් තිබෙන මැතිවරණයක් හැටියට මෙවර මැතිවරණය හඳුන්වන්න පුළුවන්.

කරුණාකර මේ කාරණයත් මතක තබා ගන්න. ඇමෙරිකාවේ තිබෙනවා, - අනෙක් රටවලත් තිබෙනවා - midterm elections. ඒවා තමයි ආණ්ඩුව මනින මැතිවරණ. බොහෝ අවස්ථාවල midterm election එකේ ජය විපක්ෂයට යනවා; ඇමෙරිකාවේත් එහෙමයි. නමුත් හිටපු ජනාධිපතිවරයා ආයෙත් ජනාධිපතිවරණය ජයග්‍රහණය කරනවා. මේ වාගේ දේවලුත් වෙනවා. තමුන්නාන්සේලාගේ ජන වරම අපට තිබෙන මේ ජන වරම අහෝසි කරන ජන වරමක් හැටියට කරුණාකර මොහොතකටවත් හිතන්න එපා. එහෙම හිතන එක වැරදියි; සදාචාරසම්පන්න නැහැ. ඔබතුමන්ලා ජයග්‍රහණයක් ලබාගත්තා; පළමුවන පාර්ශ්වය බවට පත් වුණා.

ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමා ඉදිරිපත් වූ ජනාධිපතිවරණය ගැන නොයෙකුත් සමාජ විශ්ලේෂණයන් කර තිබුණා; opinion polls කර තිබුණා. එතුමා පැහැදිලිවම පරාජය වන බව තමයි ප්‍රකාශ කළේ. නමුත් ජනතාව දුන් තීන්දුව මොකක්ද? ජනතාවගේ කැමැත්ත තිබුණේ හිලරි ක්ලින්ටන් පරාජය කරලා ඩොනල්ඩ් ට්‍රම්ප් ජයග්‍රහණය කරවීමයි. ඔබතුමන්ලාත් එහෙමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ඔබතුමන්ලා සිතුවේ ජනාධිපතිවරණයෙන් රාජපක්ෂ මහතා අනිවාර්යයෙන්ම ජයග්‍රහණය කරනවා කියලායි. නමුත් අන්තිමට මොකක්ද වුණේ? ජනතාව තුළ තිබෙන හැඟීම්, ජනතාවගේ සිතුම් පැතුම් හරියටම මනින්න අපට අමාරුයි. නමුත් එකක් කියන්න පුළුවන්. අපේ මේ ඡන්ද බහුතරය පැහැදිලිව තමුන්නාන්සේලාට ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. ඉතින්, රටේ බහුතරයක් ඉන්නේ තමුන්නාන්සේලාත් එක්කයි කියා තමුන්නාන්සේලා කියන එක සදාචාරසම්පන්න නැහැ. ඒක වැරදියි. නොයෙකුත් කාරණා නිසා, නොයෙකුත් හේතු නිසා තමුන්නාන්සේලාට මේ ඡන්ද ප්‍රමාණය ලැබී තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න අවශ්‍යයි, අප නීතිය අනුව ක්‍රියා කරනවා කියා. අපි හිතනවා අපගේ අගමැතිතුමාට බහුතරයක් තිබෙනවා කියා. අදත් එහෙමයි. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) ව්‍යවස්ථාව යටතේ එතුමා අයින් කරන්න පුළුවන් වන්නේ, එතුමා එතුමාගේ කැමැත්තෙන් ඉල්ලා අස් වුණොත් හෝ එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහෝසි වුණොත් පමණයි. පැහැදිලිවම බහුතරයක් තිබෙන අගමැති හැටියට ජනාධිපතිතුමා එතුමාව පත් කර තිබෙනවා.

බහුතරය නැහැ කියලා ඔබතුමන්ලා පෙන්වනතුරු එතුමා අගමැති. මේක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ. ඊයේ රෑ අපට ආරංචියක් ආවා, කැබිනට් මණ්ඩලය අහෝසි කරනවා කියලා ගැසට් එකක් ගහනවා කියලා. එහෙම ව්‍යවස්ථාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැහැ. අද මම ඒක check කළා. එහෙම දෙයක් නැහැ. පැහැදිලිවම අපි හිතනවා, මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යන්න අපට සදාචාරය තිබෙනවා; ජන වරම තිබෙනවා; අපි ඒක කරනවා. අපගේ තිබෙන ගැටලු -ප්‍රශ්න- අපි විසඳනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය දැවැන්ත ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. අපි එහෙම කළේ නැත්නම් දේශපාලන වශයෙන් අපට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, මේ පරාජය විශිෂ්ට පරාජයක් කියලා. නමුත් 2010 අපි සියයට 29ට බැස්ස පක්ෂයක්. ඊට පසුව අපි පක්ෂය දවසින් දවස වැඩි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා වේලාව අවසානයි. ඔබතුමාගේ කථාව දැන් අවසාන කරන්න.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
අපි හිතනවා, අපේ එක්සත් ජාතික පක්ෂයට තිබෙන ඡන්ද ප්‍රමාණය සියයට 35ක 40ක ඡන්ද ප්‍රතිශතයක් කියා. නොයෙකුත් කාරණා නිසා එක්සත් ජාතික පාක්ෂිකයන් අපේ පක්ෂයට මේ අවස්ථාවේ ඡන්ද ප්‍රතිශතය ලබා දුන්නේ නැත්තේ අපේම අඩු පාඩුකම් නිසා. අපි මේවා හදා ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවක. අපි ඉදිරියට යන ආණ්ඩුවක්. අපි කිසි දේකට බය නැහැ. අපි විශ්වාස කරනවා, බහුතරය අපට තිබෙනවා කියලා. අපි මේ සතියේම අපගේ බහුතරය තමුන්නාන්සේලාට ඔප්පු කරන්න ක්‍රියා කරනවා කියන එක මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.31]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ගරු නවීන් දිසානායක ඇමතිතුමාගේ කථාව අනුව අපේ කොට්ඨාසවලින් කවුරුවත් දිනලා නැහැ. ඇයි?

ඒ දිනපු අයට වැඩිය අනික් අයට ඡන්ද තියෙනවා. ඔක නම් තර්කය, ඡන්දයක් වුණාම ඒ ඡන්දයේදී දිනන අය ඊළඟට දිනන්න බැරිවුණු අනික් අයගේ ඡන්ද එකතු කරලා දිනපු එක්කෙනා පරාදයි කියනවා. ඔය ගණිත ක්‍රමය,- [බාධා කිරීමක්] නවීන් දිසානායක ඇමතිතුමනි, මට විනාඩි 8යි තිබෙන්නේ. - [*Interruption.*] Help me out. I have to finish my speech. ඉතින් මම කියන්නේ ඔබතුමාගේ ගණිත ක්‍රමයයි, රාජිත සේනාරත්න ඇමතිතුමාගේ ගණිත ක්‍රමයයි ටිකක් එක වාගෙයි. මේක බලන්නේ ඉස්සරහ පැත්තේ ඉඳලා නොවෙයි, පස්ස පැත්තේ ඉඳලා. [බාධා කිරීම්] ඒකයි තමුන්නාන්සේලාගේ ක්‍රමය.

ඊළඟට මම කැමතියි, - [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඉස්සර කථා එපා. රාජිත සේනාරත්න ඇමතිතුමනි, තමුන්නාන්සේ පැත්තෙන් පැත්තට පැන පැන ගිහිල්ලා තිබෙන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේ ලෝකේ වටේ ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේ ට්‍රම්ප්ගෙන් පටන්ගෙන ඉවර වෙන්නේ කෘෂොප්ගෙන්. ඒකයි තමුන්නාන්සේගේ දේශපාලන ඉතිහාසය. අපේ එහෙම ඉතිහාසයක් නැහැ. [බාධා කිරීම්] අපි පැනපු ඉතිහාසයක් නැහැ. [බාධා කිරීමක්] අපි පැනපු ඉතිහාසයක් නැහැ. නින්දිතයි. [බාධා කිරීම්] අපි දෙන්නා ගැන කථා කර ගන්නේ නැතුව ප්‍රශ්නය ගැන කථා කරමු. දැන් මේ ගොල්ල කියනවා, හොරකම් අල්ලන්න බැරුව ආණ්ඩුව ටිකක් ඔතැනිව සිටි නිසා තමයි මහජනයා ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දුන්නේ කියලා. හොරකම් අල්ලන්නට ඔතැනිවීම නිසා ප්‍රයෝජනයක් වූ හොරුන්යැයි නම් කරපු අය, ඒ අය දිනලා. [බාධා කිරීම්] ඒ අය දිනලා. අර හොරකම අල්ලන්නට ඔතැනි වූ අය, උන් පැරදිලා.[බාධා කිරීම්] මේක තවත් න්‍යායක්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න මන්ත්‍රීතුමා. Do not disturb.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඊළඟට, මම එන්න කැමැතියි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවට. එතුමා කියනවා, "අනේ! මේ අස්ථාවරභාවය. අහෝ! මෙය අවසන් කරන්න; මේ ආණ්ඩුව අස්ථාවරභාවයෙන් මිදෙන්න; දෙගොල්ල එකතු වෙන්න." කියා. අනේ! ඒක තමයි කියන්නේ. අපි නම් කියන්නේ ඒක නොවෙයි. අහෝ! මේ ආණ්ඩුව වැටෙන්න; මේ ආණ්ඩුව කැඩෙන්න; රට ස්ථාවර කරන්න; රට ස්ථාවර කරන්න ඕනෑ නම් මේ ආණ්ඩුව කැඩෙන්න ඕනෑ. මේ ඡන්ද ප්‍රතිඵලයෙන් මේ ආණ්ඩුවට අපි කියන්නේ කරුණාකරලා පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. අපි එකතුවෙලා තුනෙන් දෙකක යෝජනාවක් සම්මත කරලා මහ මැතිවරණයකට යමු. පුළුවන් නම් හාරකාර ආණ්ඩුවක් යටතේ. ඕනෑ නම් ඔයගොල්ලන්ගේම ආණ්ඩුව යටතේ වුණත් මහ මැතිවරණයකට යමු. ඒකයි අපේ ඉල්ලීම. ඒකයි අපි යෝජනා කරන්නේ. මම දන්නේ නැහැ, මේ ආණ්ඩුව සමාදාන කරන්න තියෙන රුදාව මොකක්ද කියලා.

අපට මේ ආණ්ඩුව කිව්වා, "අපේ එක මන්ත්‍රීවරයෙක් සිරිසේන මහත්තයාගේ ආණ්ඩුවට 'ජැක්' එක ගහන්න ගියා" කියලා. අනේ! නැහැ. We wanted to divide the enemy and isolate the worst enemy -මේ අපේ සතුරා හැටියට හඳුනන මේ කඳවුර බෙදන්නත්, ඒ අතර පරම හතුරා තනිකරන්නත්- අන්න ඒ න්‍යාය අනුව තමයි අපි සිරිසේන මහත්තයාට කිව්වේ, "UNP නොවන ආණ්ඩුවක් ඔබතුමා පිහිටුවනවා නම්, අපේ සහයෝගය දෙන්න ලැහැස්තියි." කියලා. ඒක අපි අදත් කියනවා.

තිලංග සුමතිපාල මහත්තයා රාජිත සේනාරත්න ඇමතිතුමාට කට උත්තර නැති වෙන්න කිව්වා. ඇවිල්ලා කටේ උලලත් ගියා. එහෙම නේද? අපේ නියෝජ්‍ය කථානායක තිලංග සුමතිපාල මැතිතුමා අවංකව, ඍජුව යථා තත්ත්වය ප්‍රකාශ කිරීම ගැන අපි සතුටු වනවා. ඒ එක්කම අපි කියන්නට ඕනෑ, ඒ තත්ත්වයට මුහුණ දෙන්න බැරිව ගලේ පහරපු බළල්ලු වාගේ මේක වහ ගන්න හදන දැහලිල්ල අපට ඉතාම පැහැදිලියි කියා. ඒ වුණාට කමක් නැහැ. දැන් ඉතින් පරාජය වෙලා, පොට්ට වෙලා ඉන්න තත්ත්වය තුළ මොකක් හෝ කරන්න ඕනෑ. දත් කූරු විකන්නවත් ඕනෑ. අද ඒක තමයි තමුන්නාන්සේලා කරමින් ඉන්නේ.

ගරු කථානායකතුමනි, "ජනවරම" කියන එකට තිබෙන්නේ එක අර්ථයයි. ඒ තමයි "mandate". ජනවරමක් නැති ආණ්ඩුවක් තිබෙන්න පුළුවන්ද? මේ ජනවරම 2015 වර්ෂයේ දී ලැබුණේ. 2015 වර්ෂයේදී ලැබුණු ජනවරම නැවත පරීක්ෂණයට ලක් වුණේ, 2018 වසරේදී. ඒ පරීක්ෂණයේදී ජනවරමට මොකද වුණේ? ජනවරම හැලුණා. දැන් ඒ හැලුණු ජනවරම ඉදිරියේ මේ ආණ්ඩුවට පවතින්න තිබෙන පදනම කුමක්ද? ඒකයි අප අහන්නේ. අපට කමක් නැහැ පවතින්න පුළුවන් නම්, පුළුවන් හැටියට try කරලා බලන්න. නමුත්, මේ රටේ මේ සා විශාල ජනබලයක් විරුද්ධව සිටිද්දි මේ ආණ්ඩුව පවත්වාගෙන යන්න උත්සාහ කළොත් මේ රටත් අස්ථාවරයි කියලා මතක තියා ගන්න. මේ ආණ්ඩුවට ඒ අනතුර අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊළඟ කරුණට එන්න මම කැමැතියි. පළාත් පාලන ආයතනවල වැඩ කරවා ගන්න නම්, "අපට ඡන්දය දෙන්න." කියලා කිව්වා. අපි කවුරුත් දන්නවා ආණ්ඩු බලය තිබෙන අය පළාත් පාලන ඡන්දත් දිනනවා කියලා. ඒ කොහොමද? ආණ්ඩුවත් එක්ක හිටියොත් තමයි අපට අපේ පළාතේ වැඩ කර ගන්න පුළුවන් කියලා, එහෙම හිතා ඡන්දය දෙන්න ජනතාව පොලඹවා ගන්න කොච්චර කැස කැවුවාද? ආණ්ඩු බලය තිබෙද්දිත් පළාත් පාලන ඡන්දයක මේ විධියට නිර්භීතව ඡන්දය දුන්නු ජනතාවට අපේ ප්‍රණාමය අපි පළ කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මාත් එක්ක මගේ නෝනා තරහා වෙලා යනවා. දික්කසාද නඩුවට ගියාම මම කියනවා, "අපේ නෝනා මාත් එක්ක හිටියේ නැති කාලයත් මාත් එක්ක හිටියා වාගේ සලකන්න." කියලා. ඉතින් මේක නේ මේ වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වේලාව අවසන්වී ගෙන එනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පක්ෂයට දුන්නු ඡන්ද; ආණ්ඩුවට විරුද්ධව දුන්නු ඡන්ද ආණ්ඩුවට දුන්නු ඡන්ද හැටියට සලකන්න ලු. මේ කියන්නේ, නෝනා පිට ගිය කාලයත් මාත් එක්ක හිටපු කාලය හැටියට සලකන්න කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේක ජාතික විශ්වාසභංගයකින් ඉල්ලා අස්වෙලා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

මීළඟට, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට කථාව කරන්න ඉඩ දෙන්න. Order, please! මේ ගරු සභාවේ කාටත් කථා කිරීමේ අයිතිය තිබෙනවා.

[අ.භා. 5.39]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, පැවැති පළාත් පාලන මැතිවරණයේදී ජනතාව පණිවුඩ දෙකක් දීලා තිබෙනවා. එක පණිවුඩයක් දීලා තිබෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට; අනෙක, මේ රජයට. මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජනතාව දීපු පණිවුඩය තමයි, "ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි" කියන එක. [බාධා කිරීම්] ඇයි ඒ? [බාධා කිරීම්] කොහොමද, ඒ පණිවුඩය දීලා තිබෙන්නේ? එදා ජනාධිපතිවරණයේදී එතුමා ලබාගත් ඡන්ද ප්‍රතිශතය 47.6යි. හැබැයි, මෙම පළාත් පාලන මැතිවරණයේදී එතුමාගේ පක්ෂය ලබාගත් ඡන්ද ප්‍රතිශතය 44.6යි. සියයට තුනක් අඩු වෙලා. ඒ කියන්නේ, "ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි" කියන එක. එතුමා එදා ජනාධිපතිවරණයේදී 47.6ක ඡන්ද ප්‍රතිශතයක් අරගෙන, මේ මැතිවරණයේදී සියයට 44.6ක් ගත්තා. සියයට 3ක් අඩුයි. ඒක තමයි ඒ පණිවුඩය. හැබැයි, එලෙසම පණිවුඩයක් දීලා තිබෙනවා, අපටත්. ඒ මොකක්ද? 2015 ජනවාරි 08වැනි දා අපි ජනතාවට පොරොන්දු වුණා, "දූෂිතයන්ට දඬුවම් දෙනවා, හොරුන්ට දඬුවම් දෙනවා" කියලා. අන්න ඒක අපට කරන්න බැරි වුණා. [බාධා කිරීම්] ජනතාව අපට පණිවුඩය දීලා තිබෙන්නේ ඒ කටයුතු ඉක්මන් කරන්න කියලා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කථා කිරීමේ අයිතිය නැති කරන්න එපා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඒ කටයුතු ඉක්මන් කරන්න කියන පණිවුඩය අපට දීලා තිබෙනවා. අද "ලංකාදීප" online edition එකේ සඳහන්ව තිබෙනවා, "අල්ලස් කොමිසමෙන් විමල්ට නඩු පවරයි" කියලා. කෝටි 71ක් කොහොමද හම්බ කර ගත්තේ කියලා හොයා ගන්න බැරිව, මෙන්න නඩු පවරලා. මෙන්න මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න තමයි ජනතාව ඉල්ලන්නේ. අපට ජනතාව දීපු පණිවුඩය තමයි, "ඔයගොල්ලෝ අපට දුන්නු පළමුවැනි පොරොන්දුව ඉෂ්ට කරලා නැහැ. මෙන්න මේක ඉෂ්ට කරන්න" කියා ජනතාව අපට මේ දීපු පණිවුඩය, අපි ඉක්මනින් ඉෂ්ට කරනවා. ඒක නිසා ඊළඟ රැස්වීම් සතියේ මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් වනවා, අලුත් උසාවි තුන පිහිටුවන්න. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙලා උසාවි තුන පිහිටෙව්වාට පස්සේ මේ කටයුතු ඉක්මන් වනවා. මේ කටයුතු කරන්න කියලා තමයි ජනතාව ඉල්ලන්නේ. මේ, ජනතාව බලාපොරොත්තු වන දේවල්.

මම පසුගිය දිනක "හිරු" නාළිකාවේ වැඩසටහනකට සහභාගි වුණා. ඒකට ඇවිල්ලා සිටිය ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයා කිව්වා මට මතකයි, "මේක ජනමත විචාරණයක් බවට පත් කර ගන්නවා" කියලා. මම කිව්වා, "බොහොම හොඳයි. ජනමත විචාරණයක් බවට පත් කර ගන්න. සියයට 50කට වැඩිය ඡන්ද ගන්න. එතකොට අපට පුළුවන් ජනතාව කොයි පැත්තේද ඉන්නේ කියලා දැන ගන්න" කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ජනමත විචාරණයක් බවට පත් කර ගත්තොත් දෙපැත්තක් තිබෙනවා. කට්ටියක් කියනවා, "ඔව්" කියලා. අනෙක් කට්ටිය කියනවා, "නැහැ" කියලා. ඒ ජනමත විචාරණයේ ඡන්ද ප්‍රතිශතය 47.3යි. සියයට 50යි එක ඡන්දයක් ගත්තද? මේක තේරුම් ගන්න බැරි නම්,- [බාධා කිරීම්] මොකද මේ කෑ ගහන්නේ? [බාධා කිරීම්] කොයි රටෙද, කොයි ලෝකයේද, පළාත් පාලන මැතිවරණයක් පැරදිලා ආණ්ඩු වෙනස් වනවා කියලා තිබෙන්නේ? කොයි ලෝකයේද, එහෙම තිබෙන්නේ? දැන් කියනවා, ආණ්ඩුවට යන්න ලු. මේගොල්ලෝ ව්‍යවස්ථාව දන්නේත් නැහැ. ආණ්ඩුවට යන්න කියනවා නම්, අගමැතිතුමා ඉවත් වන්න ඕනෑ නම් ව්‍යවස්ථානුකූලව ක්‍රියා කරන්න තිබුණා නේ. අගමැතිතුමා අයින් කරන්න ක්‍රම තුනයි තිබෙන්නේ. ඒ තමයි, අගමැතිතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ; එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ; එහෙමත් නැත්නම්, අය වැය පරදින්න ඕනෑ. මේ ක්‍රම තුනෙන් තමයි අගමැතිතුමා හෝ ආණ්ඩුව වෙනස් වෙන්නේ. ඇයි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ නැත්තේ? අද ගෙනෙන්න තිබුණා නේ. අද ගෙනැල්ලා පරාජය කරන්න තිබුණා නේ. ආණ්ඩුව ඉවත් වන්න ඕනෑ කියනවා. හැබැයි, විශ්වාස භංගය ගෙනෙන්නේ නැහැ. විශ්වාස භංගය ගෙනෙන්නේ නැහැ; භයයි. ඒක ගැන කථා කරන්නේ නැහැ. දැන් ගොළුවෝ වාගේ ඉන්නවා. ඔය කෑ ගහන අය කෑ ගහලා කියන්න එපායැ, "අපි විශ්වාස භංගයක් ගෙනෙනවා. හෙට අනිද්දා ගෙනෙනවා" කියලා. කෝ? ඒක කරන්න බැහැ.

අද එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු ජනධිපතිතුමාත් එක්ක තීන්දුව දුන්නා. දැන් ඊට පස්සේ කරන්න දෙයක් නැහැ. වෙන මුකුත් නොවෙයි, මේ රට අස්ථාවර කරන්න යන්නේ. අපි දන්නවා, මෙතුමන්ලා කවදාකවත් ආණ්ඩුව ගන්න හදන්නේ නැහැ. මෙතුමන්ලාට ආණ්ඩුව ගන්න බැහැ; අරගෙන කරන්නත් බැහැ. අපි කෙරුවාට එතුමන්ලාට ඒක කරන්න බැහැ. ඒගොල්ලෝ ඒක දන්නවා. ඒක නිසා මේ ආණ්ඩුව ගන්නේ නැහැ. ඒ ගොල්ලෝ බලාපොරොත්තු වනවා, 2020දී ආණ්ඩු බලය ගන්න. 2020දී මොකද වෙන්නේ කියලා අපි බලමු. මේ ප්‍රතිඵලය මීට වඩා වැඩි වෙන්නේ කොහොමද කියලා අපි බලමු. එදා ජනාධිපතිවරණයේදී අපත් සමඟ සිටි ලක්ෂ 62 අදත් අපත් සමඟ ඉන්නවා. ඡන්ද ටික එකතු කරලා බලන්න. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? "මේ රට ස්ථාවර කරන්න. ආණ්ඩුව ස්ථාවර කර ගන්න" කියලායි. අපි ආණ්ඩුව ස්ථාවර කරමින් යනවා. 2015දී අපට ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙනවා. මෙතුමන්ලාට විරුද්ධව මෙවරත් ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙනවා. මේ පළාත් පාලන ආයතන 340න් හෙට අනිද්දා වෙද්දි ඔබතුමන්ලාට පිහිටුවන්න පුළුවන් කීයද කියලා බලන්න. ඔබතුමන්ලාට තනියෙන් පිහිටුවන්න පුළුවන් වන්නේ, 150කටත් අඩු ප්‍රමාණයක්. අපි දෙගොල්ලෝ එකතු වෙලා ඊට වැඩි ප්‍රමාණයක් පිහිටුවනවා. එතකොට ඔබතුමන්ලාට තේරෙයි මේ රටේ ජනතාව දුන් පණිවුඩය මොකක්ද කියලා. මාර්තු මාසය

වෙද්දි පළාත් පාලන ආයතන 200කට ආසන්න ප්‍රමාණයක් අපි අනිවාර්යයෙන්ම පිහිටුවනවා. [බාධා කිරීම්] එහෙම වුණාම, "ජන බලයට මොකක්ද වෙලා තිබෙන්නේ?" කියයි. ඊට පස්සේ කියයි, "මේ ඡන්ද ක්‍රමය වැරදියි" කියා. මේ ඡන්ද ක්‍රමයට පාර්ලිමේන්තුවේ සියල්ලම එකතු වෙලා ඡන්දය දුන්නා. ඡන්දය දීලා, මේ මැතිවරණ ක්‍රමය අනුමත කර ගත්තා. දැන් කියනවා, "ඡන්ද ක්‍රමය වැරදියි" කියලා. මේක හොඳට මතක තබා ගන්න. ජනතාව අපට යම්කිසි සංඥාවක් දීලා තිබෙනවා. ඒ තමයි, "මේ ආණ්ඩුව හරියට හදාගෙන යන්න. මේ ආණ්ඩුව හරියට හදාගෙන ගියොත් 2020 ජනාධිපතිවරණයේදී අපි ඔබලාගේ ජනාධිපතිවරයෙක් පත් කරනවා" කියලා අපට සංඥාවක් දීලා තිබෙනවා.

මේ මැතිවරණයේදී මෙහෙම වුණු එක හොඳයි. මොකද, එවිට අපට අපේ වැරදි හදා ගන්න පුළුවන්; වැරදි හදාගෙන ඉදිරියට යන්න පුළුවන්. ජනතාව මේවා ගැන හොඳට දන්නවා. 2015 ජනවාරි 08 වන දා සහ අගෝස්තු 17 වන දා පැවැති මැතිවරණ දෙකම අපි දිනුවා. හැබැයි, අපි කවදාවත් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පින්තූරය තිබෙන බෝඩ් ගැලෙව්වේ නැහැ; දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීකමක් නැති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පින්තූරය තිබෙන බෝඩ් ගැලෙව්වේ නැහැ. නමුත් මේ මැතිවරණය දිනුවා කියලා, අන්න දැන් නුවරඑළියේ අපේ දෙමළ ජනතාවට ගහනවා; කලවානේ ජනතාවට ගහනවා. අපේ ආසනවල බෝඩ් කඩනවා, මේ සුළු ජයග්‍රහණය නිසා. පළාත් පාලන ආයතනයක් ජයග්‍රහණය කරලා, අපි අර සංවර්ධන කටයුතු වෙනුවෙන් ගහලා තිබෙන බෝඩ් ටික කඩනවා; ගිනි තියනවා. නුවරඑළියේ දෙමළ මිනිසුන්ට ගහනවා; ජනතාවට ගහනවා. මේ, පොඩි මැතිවරණයක් ජයග්‍රහණය කළා කියලා. මහ මැතිවරණයක් ජයග්‍රහණය කළොත් කොහොම වෙයිද? මේ පණිවුඩය ජනතාව දැන ගන්න ඕනෑ. අපි මැතිවරණ දෙකක් ජයග්‍රහණය කරලා, මේ රටේ යම් කිසි දේශපාලන සංස්කෘතියක් ඇති කළා. දැන් ඒ දේශපාලන සංස්කෘතිය නැති කරන්න හදනවා. ජනතාව මේවා හොඳට හිතේ තියාගෙන ඉන්නවා. ජනතාව ඒ අවස්ථාව ලබා දෙයි. ජනතාව හොඳ අවස්ථාවක් ලබා දුන්නා, මේ මැතිවරණයේ ප්‍රතිඵල තුළින්.

2020 ජනාධිපතිවරණයේදී අනිවාර්යයෙන්ම එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ රජයේ අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේ ප්‍රතිඵලයක් තමයි මේ ලැබී තිබෙන්නේ. ඒ නිසා ජනතාව අපට හොඳ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගන්න ඕනෑ. ඒ නිසා අපි ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ. පළමුවන පොරොන්දුව තමයි දූෂිතයින්ට දඬුවම් කිරීම. මේ මන්ත්‍රීතුමාගේ නඩුව කල් ගිහිල්ලා තිබෙන්නේ, මැයි මාසයට. එහෙම වෙන්නේ මොකද? අපට අවශ්‍යයි, මේ නඩු ටික අවුරුද්දක් ඇතුළත අවසන් කරන්න. අවුරුද්දක් ඇතුළත අවසන් කළාම, ජනතාව බලාපොරොත්තු වූ දේ අපි ලබා දුන්නා වෙනවා. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. ඒ වාගේම අපි අපේ රටේ ජනතාවට ලබා දුන් ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා පිළිබඳව ජනතාවට සන්නිවේදනය වීමේදී යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය ගැනත් අපි බලන්න ඕනෑ. අපි ගරු අග්‍රාමාත්‍යතුමා සමඟත්, අතිගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා, ඒ සන්නිවේදනය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වෙලාව අවසන් වෙමින් පවතිනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
හොඳට මතක තබා ගන්න, මේ මැතිවරණයෙන් ලබා දුන්නේ, ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි කියන පණිවුඩය බව. ඒ වාගේම අනිවාර්යයෙන්ම මතක තබා ගන්න, ඊළඟ ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්නේ අපේ රජයේ මූලිකත්වයෙන් බව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.47]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මෙවර මැතිවරණයේදී නොයෙක් බාධක මධ්‍යයේ, මැතිවරණ අල්ලස් මධ්‍යයේ පොහොට්ටුවට ඡන්දය දීපු සියලුදෙනාට අපි ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද අපි දැක්කා, අපේ ගම්වල ජනතාවට නොදීපු දෙයක් නැති බව. -දිලිප් වෙදආරච්චි මැතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ ඉන්නවා.- ඒ ජනතාවට නොදීපු දෙයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයා වංගෙඩියක් දුන්නාම, ඒක බලාගෙන ඉඳලා එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරයා මෝල් ගහක් ගිහිල්ලා දුන්නා. ඒක ආරංචි වුණාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනාට පහුවදාට මෙට්ටයක් ගිහිල්ලා දෙනවා. ඒක ආරංචි වුණාම එක්සත් ජාතික පක්ෂයේ කෙනාට කොට්ටයක් ගිහිල්ලා දෙනවා. අන්තිමට ඊට පහුවදා උදේ ඇවිල්ලා කියනවා, "නැන්දේ, දැන් ඩෙංගු තිබෙනවා, මෙන්න නෙට් එකක්" කියලා. ඉතින් මේක තමයි ලංකා දේශපාලන ඉතිහාසයේ මැතිවරණ නීති රීති වැඩිපුරම උල්ලංඝනය කළ මැතිවරණය; මැතිවරණ නීති අමු අමුවේ උල්ලංඝනය කළ මැතිවරණය. හැබැයි, බහුතරයක් ජනතාව ඔප්පු කළා, බඩු බෙදලා, සල්ලි දීලා ඡන්ද ගන්න බැහැයි කියන එක.

ගරු කථානායකතුමනි, මට දැන් මේ ආණ්ඩු පක්ෂය - විපක්ෂය මොකක්ද කියලා හොයා ගන්න බැරුවයි ඉන්නේ. මොකද, දැන් මේ කොනෙන් පටන් ගත්තාම, දෙමළ ජාතික සන්ධානයෙන් පටන් ගත්තාම, මේ සියලු දෙනාගේම ඡන්ද ටිකයි, ස්වාධීන කණ්ඩායමේ ඡන්ද ටිකයි, අහම්බෙන් එහෙන් මෙහෙන් ආපු, reject වුණු ඡන්ද ටිකයි සියල්ලම එකතු කරලා කියනවා, "මෙන්න අපේ කණ්ඩායම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමට වඩා ඡන්ද ගත්තා" කියලා. හරි, ඔබතුමන්ලාගේ තර්කය ඒක. දැන් බලනකොට මෙතැන ඉඳලා මේ වටේම ඉන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. එහෙම ඉඳලා කියනවා, "ඔන්න අපි සියල්ලෝම එකතු වෙලා මහින්දට වඩා, පොහොට්ටුවට වඩා ඡන්ද ගත්තා" කියලා. මෙයින් අනෙක් පැත්තෙන් පෙන්වන්නේ මොකක්ද? අද වනකොට ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, ඔබට විරුද්ධව ජනමතය පාවිච්චි වුණේ ඇයි කියන එක තේරුම් ගන්න. රාජිත සේනාරත්න ඇමතිතුමා අපට චෝදනා කරනවා, අපි ආණ්ඩුවක් ගන්න ලැහැස්ති වුණා කියලා. නැහැ. මේ ජැක් ගහන -මුක්කු ගහන- ආණ්ඩුවලට සම්බන්ධ වෙන්න අපි ලැහැස්ති නැහැ. අපි ඒ ගැන පළමුවන

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

දවසේම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. හැබැයි මේ ජනමතය, ආණ්ඩු පෙරළන ජනමතයක් නොවෙයි කියලා ඔබ කියනවා. මතක තබා ගන්න, ජනතාවගෙන් සියයට 80ක් ඡන්දය පාවිච්චි කළා. සියයට 80ක්! ගරු කථානායකතුමනි, ඉතිහාසයේ කවදාවත් ප්‍රාදේශීය සභා මැතිවරණයකදී සියයට 80ක් ඡන්ද භාවිත වෙලා නැහැ. ඉතිහාසයේ පළමු වතාවට ප්‍රාදේශීය සභා මැතිවරණයකදී ආණ්ඩුවට විරුද්ධව ජනතාව ඡන්දය පාවිච්චි කළා.

එහිදී විපක්ෂය ජයග්‍රහණය කළා. එහෙම නම්, මේ සභා ගර්භයේ සිටින තමුන්නාන්සේලා ඇතුළු සියලුම ආසන සංවිධායකවරුන්ගේ ඡන්ද ටික ගණන් කරලා මහින්දට වඩා අපේ ඡන්ද වැඩියි කියලා හිත හදා ගන්න පුළුවන් කාරණයක් නොවෙයි, මේ ජන මතය. ඔබතුමන්ලා දැන්වත් මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරයි කියලා අපි විශ්වාස කළා. හැබැයි, මොකක්ද වුණේ? මැතිවරණ ප්‍රතිඵලය ඇවිල්ලා පැය 24ක් යන්න කලින් එක්සත් ජාතික පක්ෂය කිව්වා, අපි දැන් අපේ නායකයා මාරු කරන්න ඕනෑය කියලා. අපට ප්‍රශ්නයක් නැහැ, ඔබතුමන්ලා නායකයාත් එක්ක ඕනෑ සෙල්ලමක් කර ගන්න. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාවත් වාඩි කරවා ගෙන එක්සත් ජාතික පක්ෂයේ නායකයාට කියනවා, "ඔබතුමා දැන් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් අයින් වෙන්න" කියලා. අනික් පැත්තෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වාඩි වෙලා කියනවා, "එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය වෙනස් වන්න ඕනෑ"ය කියලා. එක්සත් ජාතික පක්ෂයේ අය කියනවා, "සියයට 13ක්, 15ක් ඡන්ද ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වන ඔබතුමා කොහොමද කියන්නේ අපේ නායකයා අයින් කරන්න" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
හොඳයි, ගරු කථානායකතුමනි.

මේ ජන මතය කියන දේ ඔබතුමන්ලාට දැනුණා නම්, මේක පක්ෂයක් ඇතුළත බල අරගලයක් බවට පරිවර්තනය කර ගත්තේ ඇයි? මැතිවරණ කාල සීමාව තුළ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා මොකක්ද කිව්වේ? "96දෙනා එන්න, මගේ දොරකඩ හිටගන්න, මා ආණ්ඩුව හදනවා" කිව්වා. ඔන්න අපි කිව්වා, "අපට තනතුරු -යානාන්තර- එපා" කියලා. විපක්ෂයක් කවදාවත් ආණ්ඩුවකට මෙහෙම කියනවාද? තනතුරු -යානාන්තර- මොකුත් එපා, ඔබතුමන්ලා ආණ්ඩුවක් පිහිටුවනවා නම්, රට ගැන හිතා අපි අවශ්‍ය වෙලාවට සහයෝගය දෙනවා කියන යෝජනාව අපි ඉදිරිපත් කළා. හැබැයි, අපි ඒ ආණ්ඩුවට ජැක් ගහන්න ගියේ නැහැ. අපි කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හදන්න කියලා. මොකද, කරු ජයසූරිය මහත්තයා අගමැති කරනවාද, එක්සත් ජාතික පක්ෂයෙන් වෙන කෙනෙකු අගමැති කරනවාද කියන එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාගේ කාර්යයක් නොවෙයි. අපි කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කෙනෙකු අගමැති කරන්න, අපි කොන්දේසි විරහිතව විපක්ෂයට වෙලා උදව් කරන්නම් කියලා. හැබැයි, ඒකෙන් කියන්නේ නැහැ, අපි ආණ්ඩුවට ගිහිල්ලා මුක්කු ගහනවා කියලා. හැබැයි, අද වනකොට දවස් 10ක් ගත වෙලාත් මේ රටේ ආණ්ඩුව කරන්නේ කවුද කියන එක පිළිබඳව තීන්දුවක් ගන්න බැරිව ආණ්ඩුව දෙපැත්තට වෙලා ඉන්නවා.

දැන් බලන්න, තිලංග සුමතිපාල මහත්තයා ඊයේ රෑ එකක් කියනවා. ඒක එනවා, SMS එකකින්. අද උදේ පාන්දර මහින්ද අමරවීර ඇමතිතුමා තව එකක් කියනවා. අනික් පැත්තෙන් එක්සත් ජාතික පක්ෂයෙන් තව එකක් කියනවා. මා දැක්කා, රාජිත ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවකට ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නාම යෝජනා දීපු කෙනෙකුට පොහොට්ටුවෙන් නාම යෝජනා දුන්නා කියලා කෑ ගහනවා. මාධ්‍යවේදියා කියනවා, "නැහැ, එම පුද්ගලයා පොහොට්ටුවේ නොවෙයි, බුලත් කොළයේ" කියලා. ගරු කථානායකතුමනි, මේ දෙගොල්ලන්, තුන්ගොල්ලන් දෙපැත්තකට තුන්පැත්තකට ඇද ගත්තාම මේ රට කොහේද යන්නේ?

විපක්ෂ නායකවරයා කියනවා, පොහොට්ටුව ජාතිවාදය ඇවිස්සුවා කියලා. පොහොට්ටුව ජාතිවාදයක් ඇවිස්සුවේ නැහැ. ජාතිවාදය ඇවිස්සුවේ දෙමළ ජාතික සන්ධානය. දෙමළ ජාතික සන්ධානය තමයි යාපනයට ගිහිල්ලා කිව්වේ ව්‍යවස්ථාවේ තිබෙනවාට වඩා එහාට ගිහිල්ලා අපි බලය බෙදා ගන්නවා කියලා. ඒක federal කිව්වා. ඒකට ආණ්ඩුව එකඟ වුණාය කියලා කිව්වේ කවුද? අපි නොවෙයි, ගරු කථානායකතුමනි. ඒක කිව්වේ සුමන්තිරන් මන්ත්‍රීතුමා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ඒක කිව්වේ සුමන්තිරන් මන්ත්‍රීතුමා. ඒකට පිළිතුරක් දෙන්න අපට වග කීමක් තිබෙනවා. අපි ඒකට පිළිතුරක් දුන්නා. හැබැයි, ඒකට පිළිතුර දීම ජාතිවාදය ඇවිස්සීම නොවෙයි, ගරු කථානායකතුමනි. අපි ආණ්ඩුවට යෝජනා කරන්නේ මේකයි. ජැක් ගහමින්, මුක්කු ගහමින් තව දුරටත් ඔබතුමන්ලාට ඔය ආණ්ඩුව කර ගෙන යන්න බැහැ. අවුරුදු 10ක් රුපියල් 350ට පොහොර දීපු මහින්ද රාජපක්ෂ මහත්තයා හිරේ දමපු නැති හින්දා තමයි ගොවියා ඔබතුමන්ලාට ඡන්දය නොදුන්නේ කියලා ඔබතුමන්ලා හිතනවා නම්, අවුරුදු 30ක යුද්ධයක් අවසන් කරපු මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පවුලේ අය හිරේ දමපු නැති හින්දා තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය නොදුන්නේ කියලා ඔබතුමන්ලා හිතනවා නම්, ඔබතුමන්ලාට වැරදිලා. ජන මතය තේරුම් ගන්න. ඔව්වර අපට අභියෝග කරන්න දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, සංඛ්‍යා ලේඛන අනුව අපට ජන මතය වැඩි නම්, පාර්ලිමේන්තුව විසුරුවා මහ මැතිවරණයකට ගිහිල්ලා බලමු, ජන මතය කොහේද තිබෙන්නේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ.භා. 5.53]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

අද අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා, වර්තමානයේ දැවැන්ත දේශපාලන අර්බුදයක් තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, මේ දැවැන්ත අර්බුදය ඇති වුණේ කොහොමද? පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලයත් එක්ක ඒකාබද්ධ විපක්ෂයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කණ්ඩායම බහුතර ඡන්ද ප්‍රමාණයක් ගත්තාම මේ ගොල්ලන් ඒක නිර්වචනය කළා, දැන් ඔවුන්ට ආණ්ඩු බලය ලබා ගන්න පුළුවන් කියලා. ඒ ආණ්ඩු බලය ලබා ගැනීමේ ක්‍රියා පරිපාටිය උඩ තමයි මේ අර්බුදය නිර්මාණය කළේ. 2015දී ජන මතය ලැබුණු ආණ්ඩුවක් පාර්ලිමේන්තුව තුළ ඔළු ගෙඩි මාරු කරලා වෙනස් කරන්න පුළුවන්ද කියලා උත්සාහයක් කළා. පාර්ලිමේන්තුව තුළ ඔළු ගෙඩි මාරු කරලා මන්ත්‍රීවරුන්ට මුදල් දීලා එහෙම නැත්නම්, වෙනත් යම් යම් දේවල් ලබා දීලා තමන්ගේ පැත්තට මන්ත්‍රීවරු ටික හරවා ගෙන බලය අල්ලන්න පුළුවන්ද කියන යම් අදහසක් මත සතියක කාලයක් ගෙව්වා. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, මේ දේශපාලන අර්බුදය නිර්මාණය කළේ. මේ අර්බුදය නිර්මාණය කළේ අපි නොවෙයි. මේ දැවැන්ත අර්බුදය නිර්මාණය කළ අයම තමයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නැත්නම් මේ යෝජනාව ගේන්න ඕනෑ නැහැ. පළාත් පාලන ඡන්දය තිබ්බා; ප්‍රතිඵල ආවා. ඒ ප්‍රතිඵලය අපි සියලුදෙනාම පිළිගන්නවා. ඒ තුළින් පාර්ලිමේන්තුවේ සංයුතිය වෙනස් වෙලා නැහැ; පාර්ලිමේන්තුවට දීපු ජන මතය වෙනස් වෙලා නැහැ. මේ පාර්ලිමේන්තුව අවුරුදු පහක් දුවනවා. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අනුමැතිය තිබෙනවා. පාර්ලිමේන්තුවේ කාලය අවසාන වෙලා නැති නිසා කිසිම අර්බුදයක් නැහැ. අර්බුදය නිර්මාණය කළේ කවුද? අර්බුදය නිර්මාණය කළේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා කෙටි මාර්ගයකින් බලය ලබාගන්නට ගියා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ හොරා කාපු සල්ලි දීලා, සන්තෝසම් දීලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව බිලි බා ගන්නට බැලුවා. ඒ තුළ තමයි මේ අර්බුදය නිර්මාණය වුණේ.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය තමයි මැතිවරණය. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා මැතිවරණය ගැන කථා කරමින් කිව්වා, "බඩු බෙදුවා" කියලා. ගරු කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගත්තේ කොහොමද? මැතිවරණ ව්‍යාපාරය පටන් ගත්තේම එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සමෘද්ධි නිලධාරින්ට, ග්‍රාම නිලධාරිවරුන්ට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සියලුම බඩු භාණ්ඩ බෙදලායි.

ඒ විතරක් නොවෙයි, ඔක්කොම සමෘද්ධි නිලධාරින් ඡන්ද වැඩවලට යනවා. ග්‍රාම නිලධාරිවරුන් ඡන්ද වැඩවලට ගියා. එදා ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ යටතේ තමයි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තිබුණේ. ඒ දෙපාර්තමේන්තුවේ හිටපු මිනිසුන්වත් ඡන්ද වැඩවලට යෙදවුවා. එහෙමයි එදා ඡන්ද ව්‍යාපාරය කළේ. අද එහෙම කළේ නැහැ. අද අපි සමෘද්ධි නිලධාරින් ඡන්ද වැඩවලට දැම්මේ නැහැ; ග්‍රාම නිලධාරින් ඡන්ද වැඩවලට දැම්මේ නැහැ; බඩු බෙදන්නට ගියේ නැහැ. හැම ගෙදරකටම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා බඩු බෙදලා තමයි එදා ඡන්ද ව්‍යාපාරය පටන් ගත්තේ. අද එහෙම එකක් නැහැ. ලංකාවේ තිබුණු මැතිවරණවලින් අවම ප්‍රචණ්ඩත්වයක් තිබුණු මැතිවරණය හැටියට පසුගිය දා පැවති මැතිවරණය චාර්තාවෙලා තිබෙනවා. පසුගිය සෑම මැතිවරණයකටම වඩා මෙවර මැතිවරණයේ දූෂණ, මැරකම් අඩු වෙලා තිබුණා.

ගරු කථානායකතුමනි, ඊළඟට ජනමතවිචාරණය ගැන කථා කළා. ඒගොල්ලන් පසුගිය කාලයේ මැතිවරණ පැවැත්වුවේ කොහොමද? ගරු කථානායකතුමනි, ඌව පළාත් සභා මැතිවරණය එක දවසක පැවැත්වුවා. බස්නාහිර පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. දකුණු පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. මධ්‍යම පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. එහෙමයි මේගොල්ලන් මැතිවරණ පැවැත්වුවේ. අඩුම තරමින් අද ජනමතවිචාරණය කියලා කියන්නට හෝ මුළු රටේම එක දවසක මැතිවරණය තියන්නට අපට පුළුවන්කම ලැබුණා. අපි එකම දවසේ මැතිවරණය තිබ්බ නිසා තමයි අඩුම තරමින් ජනමතවිචාරණයක් ගැන හෝ කථා කරන්නට මෙතුමන්ලාට හැකියාව ලැබුණේ. එහෙම නැතිව එදා මෙහෙම මැතිවරණ තිබුණේ නැහැ. එදා මැතිවරණ තිබ්බේ කඩ - කඩ සලාක ක්‍රමයට. රටේ එක එක තැන්වල එක එක දවසට මැතිවරණ තිබ්බේ. අපිට පුළුවන් වුණා මැතිවරණය එක දවසක තියන්නට.

ගරු කථානායකතුමනි, අද අපි ජනමතය ගැන කථා කරනවා. මේ ඡන්ද ක්‍රමය තුළ මේ රටේ බහුතර ජනතාවගේ ඡන්ද ප්‍රතිශතය මේගොල්ලන්ට හම්බ වෙලා තිබෙනවා කියලා අද මේගොල්ලන් කියනවා නම්, මේ රටේ ජනතාවගෙන් මේ මැතිවරණයට ඡන්දය පාවිච්චි කළේ සියයට 65 - 70 අතර ප්‍රමාණයක් බව අපි කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගත්තාට වඩා ඡන්ද ප්‍රමාණයක් අනෙකුත් දේශපාලන පක්ෂවල ඡන්ද ඔක්කෝම එකතු කළාම තිබෙනවා. එහෙම නම් අපි ජන මතය කියලා ගන්නවා නම්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට විරුද්ධව තිබෙන ජනමතය තවම අඩු වෙලා නැහැ. තවම ඒ ජන මතය සියයට 55කට ආසන්න ප්‍රමාණයකට තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මේ මැතිවරණ ප්‍රතිඵල තුළින් අපට යම් පණිවුඩයක් ලබා දෙනවා. ඒ පණිවුඩය තමයි, යහ පාලන ආණ්ඩුව තුළ අපි ලබා දීපු පොරොන්දු මතක් කර දීම.

ගරු කථානායකතුමනි, එක මන්ත්‍රීවරයෙක් ඇහුවා ඒගොල්ලන්ව හිරේ දැම්මේ නැහැ, ඒගොල්ලන්ව ඇල්ලුවේ නැහැ, ඒගොල්ලන්ට දඬුවම් දුන්නේ නැහැ, ඒ හින්දාද අපට ඡන්දය නොදුන්නේ කියලා. හරියට හරි. ඒකත් එක කාරණයක් තමයි. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා අපේ කාලයේ අපි පෙන්වුවේ බන්ධනාගාරයයි, උසාවියයි, හිර ගෙදරයි විතරයි කියා. ඒක ඇත්ත. අගමැතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි එතුමා අර පාස්පෝට් නඩුවෙන් බේරුණේ. එහෙම නැත්නම් එතුමා අද වන විට මීගමුව හෝ මහර බන්ධනාගාරයේ ඉන්න ඕනෑ. ඒ අය අද ඇවිල්ලා මේ විධියට කථා කිරීම ගැන ඇත්තටම ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, ආණ්ඩුවක් හැටියට පසුගිය කාලයේ වංචා, දූෂණවලට දඬුවම් දෙන්න වාගේම ජනතාවගේ යම් යම් බලාපොරොත්තු ඉෂ්ට කර ගන්නට බැරි වීම තුළ ජනතාව අපට යම් සංඥාවක් ලබා දීලා තිබෙනවා; යම් අනතුරු හැඟවීමක් ලබා දීලා තිබෙනවා.

ඒ අනතුරු ඇඟවීම ආශීර්වාදයක් හැටියට අපි ලබා ගන්න ඕනෑ. ඒ නිසා 2015 ජනවාරි 08 වන දා ජනමතයට අනුව අපි නැවත පටන් ගන්න ඕනෑ. ඒ ක්‍රියාදාමය නැවත ඉදිරියට ගෙන යන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ මැතිවරණය තුළ මේ

[ගරු මුජීබුර් රහුමාන් මහතා]

රටේ ජාතිවාදී, පැසිස්ට්වාදී බලවේගවලට විරුද්ධව කඳවුරු දෙකක් තිබෙනවා. ඒ එක කඳවුරක් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැසිස්ට්වාදී, ජාතිවාදී ක්‍රියාදාමයට විරුද්ධ කඳවුර. අනික් කඳවුර තමයි ජාතිවාදී කඳවුරට විරුද්ධ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මේ මැතිවරණය පටන් ගත්ත දවසේ සිටම මේ රටේ ජාතිවාදය, ආගම්වාදය අවුස්සන්න පුළුවන්ද කියලා බැලුවා. එදා අපි ඒක පරාජය කළා. මේ ලබා දුන්නු තීන්දුව ආගීර්වාදයක් හැටියට අරගෙන, මේ රටේ ජාතිවාදයට, ආගම්වාදයට විරුද්ධව එක්සත්භාවයෙන් අපේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යා යුතුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

[අ.භා. 6.00]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ඇමෙරිකාවේ සිටි සුප්‍රකට ජනාධිපතිවරයකු වන ඒබ්‍රහම් ලින්කන් වරක් මෙසේ පැවසුවා:

> "You can fool some of the people all the time, and all the people some of the time, but you cannot fool all the people all the time."

පසුගිය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් ජනතාවට බොරු කියමින් ජන වරමක් ලබාගෙන, ඒ ජන වරම රැක ගැනීම උදෙසා වසර තුනක් තිස්සේ අඛණ්ඩව ජනතාවට බොරු කීම නිසා ජනතාවගේ පපු කැනැත්තේ එකතු වුණු කේන්තිය, කලකිරීම දෝරෙ ගලා යෑමක් -පිටාර ගැලීමක්- විධියටයි මේ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය අපි දකින්නේ.

ගරු කථානායකතුමනි, මේ තමයි ශ්‍රී ලංකා ඉතිහාසයේ පුංචි ඡන්දයකින් ආණ්ඩුවක් පරාජය වුණු පළමුවන අවස්ථාව. ආණ්ඩුවක් පළාත් සභා මැතිවරණ පැරදිලා තිබෙනවා, ජනාධිපතිවරණ පැරදිලා තිබෙනවා, පාර්ලිමේන්තු මැතිවරණ පැරදිලා තිබෙනවා. ඒත් ඉතිහාසයේ කවදාකවත් ආණ්ඩුවක් පුංචි ඡන්දයක් පැරදිලා නැහැ. ආණ්ඩුවකට ජයග්‍රහණය නියත එකම මැතිවරණය විධියටයි ඉතිහාසය පුරාම පුංචි ඡන්දය සැලකුවේ. ඒ නිසා තමයි විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්න කළේ, "මේ පුංචි ඡන්දයකින් මොකටද ආණ්ඩුවක් පෙරළෙන්නේ? එහෙම නම් ඡන්දයක්, ඡන්දයක් ගානේ ආණ්ඩුව පෙරළන්න සිදු වෙයි නේ" කියලා. අපි එතුමාගෙන් පෙරළා ප්‍රශ්න කරනවා, "ඉතිහාසයේ පුංචි ඡන්දයකින් ආණ්ඩුවක් පැරදුණේ කවදාද?" කියලා. ආණ්ඩුවක් අනිවාර්යයෙන් ජය ගත යුතු ඡන්දයත් පරදිනවා නම්, අනික් ඡන්ද ගැන කවර කථාද?

ගරු කථානායකතුමනි, පැරණි සිංහල කියමනක් තිබෙනවා, "යකඩ මල්ලට ගුල්ලෝ ගහලා නම්, වී මල්ල නොබලාම විසි කරන්න"යි කියලා. ආණ්ඩුවේ යකඩ මල්ල තමයි මේ පුංචි ඡන්දය. ඒ යකඩ මල්ලටයි පෙබරවාරි 10 වන දා ගුල්ලෝ ගැහුවේ. එහෙම නම් පළාත් සභා මැතිවරණ ගැන, පාර්ලිමේන්තු මැතිවරණ ගැන, ජනාධිපතිවරණ ගැන කවර කථාද? ඒ වී මල්ලට නම් ගුල්ලෝ ගහනවා ගහනවාමයි.

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයෙන් මේ සභාවේ මතු වුණු තර්ක ටිකට පිළිතුරු දීම සඳහා මගේ විනාඩි 8 පාවිච්චි කළ යුතුයි.

මූලික වශයෙන් තර්කයක් මතු වුණා, ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්ද ලක්ෂ 58ක් ගත්තාය, එය සියයට 48ක ඡන්ද ප්‍රමාණයක් වුණා කියලා. ගරු කථානායකතුමනි, ඒක හරියට මේ වාගෙයි. නිවාඩුන්තර මළල ක්‍රීඩා උළෙලක පළමුවන දවසේ මා දුර පනිනවා, මීටර් 5ක්. ඊළඟ දවසේ උස පනිනවා, මීටරයක්. ලෝකයේ උස පැනීමේ වාර්තාව තිබෙන්නේ මීටර් 2.45යි. දුර පැනීමේ වාර්තාව තිබෙනවා, මීටර් 8.9ක්. දුර පැනීමයි, උස පැනීමයි සංසන්දනය කරන්න බැහැ. දුර පනින තරම් උස පනින්න බැහැ. ඒ වාගේම ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කරන, වැඩිම ප්‍රමාණයක් ඡන්ද ගන්න ජනාධිපතිවරණයයි, අඩුම ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කරන පළාත් පාලන මැතිවරණයයි කිසිසේත්ම සංසන්දනය කරන්න බැහැ. ඒක හරියට උස පැනීමයි, දුර පැනීමයි සංසන්දනය කරනවා වාගෙයි. හැබැයි, මේ කාරණය මතක තබා ගන්න. 2011 පුංචි ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ ඉඳලා ලබාගත් ඡන්ද ප්‍රතිශතය සියයට 32.7යි. මෙදා පාර ලබාගෙන තිබෙන්නේ සියයට 33.6යි. ආණ්ඩුවේ පසුබෑම නේද මේ ජයග්‍රහණයක් කියලා කියන්නේ? රාජ්‍ය බලය තමන්ගේ අතේ තබාගෙන වැඩි කර ගන්න පුළුවන්වෙලා තිබෙන්නේ දශම 9ක ඡන්ද ප්‍රතිශතයක්. ජනාධිපතිතුමා සියයට 13ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, අගමැතිතුමා සියයට 33ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, විපක්ෂ නායකතුමා සියයට 4ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සියයට 6ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, රාජ්‍ය බලය කිසිත් නැති, ජනාධිපතිතුමාගේ පක්ෂයේත් නොවන, අගමැතිතුමාගේ පක්ෂයේත් නොවන, අඩුම ගානේ විපක්ෂ නායකතුමාගේ පක්ෂයේත් නොවන, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකගේ පක්ෂයේත් නොවන, මන්ත්‍රී ධුරයක්වත් නැහැයි කියා හැමදෙනාම කියපු, ජී.එල්. ගේ පොහොට්ටුව පක්ෂය -ඒ දවස්වල එහෙම නේ කිව්වේ- සියයට 46ක ඡන්ද ප්‍රතිශතයක් ගැනීම ආශ්චර්යයක් නොවෙයිද, විශ්වකර්ම වැඩක් නොවෙයිද, ඉතිහාසය යළි ලිවීමක් නොවෙයිද කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා.

ගරු කථානායකතුමනි, දැන් මේ ගරු සභාවේ තර්ක කරනවා, "මොනවා කිව්වත් මහින්ද රාජපක්ෂ මහත්තයාට තිබුණේ සියයට 46යි නේ. එතුමාට සියයට 54ක් විරුද්ධයි නේ"' කියලා. අපි ඒකත් පිළිගනිමු කෝ. මහින්ද රාජපක්ෂ මැතිතුමාට සියයට 54ක්

විරුද්ධ නම්, ජනාධිපතිතුමාට ලැබුණේ සියයට 13ක් නිසා එතුමාට සියයට 87ක් විරුද්ධයි. අගමැතිතුමාට ලැබුණේ සියයට 33ක් නිසා එතුමාට සියයට 67ක් විරුද්ධයි. විපක්ෂ නායකතුමාට ලැබුණේ සියයට 4ක් නිසා එතුමාට සියයට 96ක් විරුද්ධයි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ලැබුණේ සියයට 6ක් නිසා එතුමාට සියයට 94ක් විරුද්ධයි. එහෙම බලද්දී මේ රටේ අඩුම විරෝධය තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාටයි කියන එක ඉතාම පැහැදිලිව ජනතාව ප්‍රකාශ කරලා තිබෙනවා.

අපට පුංචි ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එදා ජනාධිපතිවරණයේදී මේ පක්ෂ සියල්ල එකට එකතුවෙලායි ලක්ෂ 62ක ඡන්ද ගත්තේ. ඒ නිසා "හංස පූවට්ටුව" හරි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩි තුනක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මේ ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂය අපට එරෙහිව මැතිවරණ ව්‍යාපාරය කළා විතරක් නොවෙයි, ජනාධිපතිතුමාට එරෙහිවත්, ජනතා විමුක්ති පෙරමුණට එරෙහිවත් මැතිවරණ ව්‍යාපාරය කළා. අපට ඒවා මතකයි නේ. ජනාධිපතිතුමාට "පික් පොකට්කාරයා", "නයා" කියලා කිව්වා. අපි එහෙම කිව්වේ නැහැ නේ, දෙවියනේ! ඒ විධියට එකිනෙකාට එරෙහිව තරගකාරිව ගත් ඡන්ද එකතු කරලා, "අපේ ගොඩ ලොකුයි - ඔබේ ගොඩ පොඩියි" කියන න්‍යාය අපට නම් තේරෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපෙන් අහන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. හොරු ඇල්ලුවේ නැති නිසා ජනතාව කෝපය ප්‍රකාශ කළා කියලා අපේ ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා කිව්වා. හොරු ඇල්ලුවේ නැති එකට එජාපයත් එක්ක තරහයි නම්, හොරුත් එක්ක කොහොම තරහා වෙලා ඉන්න ඕනෑද? හොරු අල්ලපු නැති එක වැරැදියි කියපු ජනතා විමුක්ති පෙරමුණ ජන වරමක් ඉල්ලුවා. ජනවාරි මාසයේ 08 වැනිදා ජන වරම වෙනුවෙන් ඔවුන් පෙනී හිටියා. ඒ අයට සියයට 6යි; හොරු අල්ලපු නැති අයට සියයට 33යි; හොරුයි කියපු අපට සියයට 46යි! මොන ලෝකයේද ගරු කථානායකතුමනි, හොරු අල්ලපු නැති කේන්තිය පෙන්වන්න හොරාට ඡන්දය දෙන්නේ? ඒ නිසා මෙවැනි අතාර්කික විහිළු සහගත දේවල් මෙවැනි ගරු සභාවක ප්‍රකාශ කිරීමෙන් මේ ගරු සභාව හෑල්ලුවනවා කියන එකයි අපට ප්‍රකාශ කරන්න වෙන්නේ.

ඊළඟට තවත් තර්කයක් ගෙනාවා, "ජනමත විචාරණයක් වුණා නම් මේක පරාදයි නේ. ලැබුණේ සියයට 46යිනේ" කියලා. අපි මොකක්ද කිව්වේ? "මේ මැතිවරණය ජනමත විචාරණයක් සේ සලකන්න" කියලා තමයි අපි ජනතාවට කිව්වේ. ඒ ගැන අපට මෙහෙම කියන්න පුළුවන්. අපි කිව්වේ, කවුරු හෝ කෙනෙකු ත්‍රී වීලරයේ නැඟලා යනවා නම්, කාර් එකේ නැග්ගා කියලා හිතාගෙන මේ ගමන යන්න කියලායි. කාර් එකේ නැඟලා යන කොට දැනෙන දෙයයි, කාර් එක කියලා හිතාගෙන ත්‍රී වීලර් එකේ යනකොට දැනෙන දෙයයි දෙකක්. "මෙය ජනමත විචාරණයක් සේ සලකන්න" කියලා අපි ජනතාවට කියපු නිසා තමයි සාමාන්‍යයෙන් සියයට 55ක් ඡන්දය දෙන පුංචි ඡන්දය සියයට 80ක් දක්වා වර්ධනය වුණේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති වේලාව අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
එහෙම කිව්වේ නැත්නම්, මේ පුංචි ඡන්දය කානු, බෝක්කු ඡන්දයක් කියලා ජනතාව ඡන්දය දෙන්න එන්නේ නැහැ. තව කියන්න දේවල් නම් බොහොමයි. නමුත් මේ කාරණය කියලා මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මේ විවාදය ඓතිහාසිකයි. මේ විවාදයෙන් ඉතා වැදගත් දෙයක් මතු වුණා. විපක්ෂ නායකතුමා ජනාධිපතිතුමායි, අගමැතිතුමායි එකට වැඩ කිරීමේ අවශ්‍යතාව ගැන හිතලා "අනේ! එහෙම කරන්න" කියලා ඉල්ලුම් කළා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, "ජනාධිපතිතුමායි, අගමැතිතුමායි, ජනාධිපති සිහිනයක් නිසා රණ්ඩු කරනවා. එහෙම කරන එක වැරැදියි. ඒක නිසායි මේ ප්‍රතිඵලය අත් වුණේ" කියලා. විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සිටින්නේ ආණ්ඩුව රැක ගැනීමේ ව්‍යාපෘතියේය කියලා එතුමන්ලාගේ කථා හරහා ඔප්පු කළා. ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ ඡන්දත් තමන්ගේ ගොඩට දමාගෙන එක්සත් ජාතික පක්ෂය කථා කරපු දේ නිවැරැදි නිසා විපක්ෂ නායකකම අපේ කණ්ඩායම් නායක මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලබා දිය යුතුයි කියන කාරණය යෝජනා කරමින් මම නිහඬ වනවා.

සියලු දෙනාටම තෙරුවන් සරණයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The Hon. (Dr.) Jayampathy Wickramaratne. You have seven minutes.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු (කලානිදි) ජූයම්පති වික්‍රමරත්න)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
Sir, I will not speak today.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මැතිතුමා. You have seven minutes.

[අ.භා. 6.08]

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

අද අපේ ගම්මන්පිල මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, "පුංචි ඡන්දය පැරදුණා" කියලා. පුංචි ඡන්දය ගැන තමුන්නාන්සේ කථා කළාට, ඉතිහාසයේ කවදාවත් පැරදුණේ නැති විධියට විධායක ජනාධිපතිවරයෙක් -මහින්ද රාජපක්ෂ මහත්තයා- අවුරුදු දෙකකට කලින් ගෙදර ඇරියේ මේ යහ පාලන ආණ්ඩුව කියලා මතක තියා ගන්න. ඒ කාරණය මතක් කරන ගමන්ම තමුන්නාන්සේට මේ කාරණයත් කියලා දෙන්න ඕනෑ. පුංචි ඡන්දය ගැන කථා කළ

[ගරු චන්දිම ගමගේ මහතා]

තමුන්නාන්සේලා එදා කරපු දේවල් අපි දැක්කා. තමුන්නාන්සේලා බොරු කියලා, කසිප්පු බෙදලා, ගංජා බෙදලා, කන්න දීලා, බොන්න දීලා, -ඔක්කොම කරලා- අපි දීපු නිදහස අවභාවිත කරලා, ඡන්ද ටිකක් අරගෙන උඩ පනින්න ලෑස්ති වෙන්න එපා.

එතුමා කියපු විධියට නිවාසාන්තර ක්‍රීඩා තරගය ගැන මමත් කියන්නම්.

තමුන්නාන්සේලා මේ පුංචි ඡන්දය දිනලා මොකක්ද කිව්වේ? ආණ්ඩුව පෙරළන්න කථා කළා. ගරු කථානායකතුමනි, මේක හරියට ක්‍රීඩකයෙක් පාසලක ක්‍රීඩා තරගයක් දිනලා "නිවාසාන්තර ක්‍රීඩා තරගයේ පදක්කම මට එපා. මට සමස්ත ලංකා පදක්කමක් ඕනෑ" කියලා කියනවා වාගේ වැඩක්. අන්න ඒ වාගේ විහිළුවක් තමයි මේ ඒකාබද්ධ විපක්ෂයේ අය කළේ. ඒකාබද්ධ විපක්ෂයේ අය හිතුවා, මේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් ප්‍රාදේශීය සභා කිහිපයක බලය ගත්තාම මේ ආණ්ඩුව පෙරළන්න පුළුවන් කියලා. ආණ්ඩුවට මොකද වුණේ? ආණ්ඩුව පෙරළන්න පුළුවන් කියලා කිව්වා. දැන් කියනවා, අපි එහෙම කිව්වේ නැහැ කියලා. අපි දැක්කා, ගාමිණී ලොකුගේ මැතිතුමා, ඒ වාගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා උඩ පැන පැන කථා කරනවා. මයික් එකක් ජේන්න බැහැ. උඩ පැන පැන මයික්වලට කිව්වා, "අපි 113 හදනවා. අපි ආණ්ඩුව පවත්වනවා" කියලා. ඔවුන් අද මේ සභාවේත් නැහැ. අද පරාජයට පත් වෙලා, නඟුට ගුද මාර්ගයේ ගහ ගත්තු සුනඛයන් වාගේ අද කට්ටියම මහ හැරලා ඉන්නවා. මේක තමයි අද පොහොට්ටුව වෙනුවෙන් කටයුතු කරන ඒකාබද්ධ විපක්ෂයේ තත්ත්වය.

ගරු කථානායකතුමනි, අද මේ අර්ථකථනය කිරීම සහ ගණනය කිරීම ගැන කථා කරනවා. අර්ථකථනය කිරීම කොහොම වෙතත් අද අපි කියන්නේ, එදා අපිත් එක්ක හිටපු ඔක්කෝම එකතු වුණාම මහින්ද මහත්තයාට විරුද්ධව සියයට 55ක් තිබෙනවාය කියන කාරණයයි. ඒ වාගේම අපි කියන්නේ, අපිත් එක්ක එදා හිටපු කට්ටියගේ පක්ෂවල එකතුව ගත්තාම, රාජපක්ෂ මහත්තයාගේ සියයට 47 සියයට 44 දක්වා අඩු වෙලා තිබෙනවාය කියන කාරණයයි. අද කවුරු මොනවා කිව්වත්; ඒකාබද්ධ විපක්ෂයේ අය මොනවා කිව්වත්, එදා යහපාලන ආණ්ඩුව පිහිටුවන්න අපිත් එක්ක හිටපු පක්ෂත් එක්ක එකතු වුණාම අපි තමුන්නාන්සේලාට වැඩිය ඉදිරියෙන් සිටින බව පැහැදිලිව කියන්නට ඕනෑ.

මේ කාරණයත් විශේෂයෙන් මතක් කරලා දෙන්නට ඕනෑ. මේ තරගය ප්‍රාදේශීය මට්ටමේ මැතිවරණයක් වුණාට, ප්‍රාදේශීය අපේක්ෂකයෝ කවුරුවත් පෝස්ටර් ගැහුවේ නැහැ. ගැහුවේ, මහින්ද මහත්මයාගේ පෝස්ටරය පමණයි. මහින්ද මහත්තයා තමයි මේ පළාත් පාලන මැතිවරණයේ දී පළාත් පාලන ආයතන 341හිම අපේක්ෂකයා බවට පත් වුණේ. හැබැයි, එම අපේක්ෂකයා එදා සමස්ත ලංකා තරගවලට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයෙක්; ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයෙක්. කනගාටුවෙන් හරි කියන්නට ඕනෑ, එතුමා ගම් මට්ටමේ ප්‍රාදේශීය සභා මැතිවරණයකටත් ඉදිරිපත් වුණාය කියන කාරණය. ඒ ප්‍රාදේශීය සභා මැතිවරණයට එදා හිටපු ජනාධිපතිවරයාගේ මුහුණ පෙන්නලා තමයි මේ ඡන්ද ටික හරි එකතු කර ගත්තේ. හැබැයි, ප්‍රතිඵලය මොකක්ද? රාජපක්ෂ මහත්මයාගේ මුහුණ පෙන්නුවාට ගමේ මැතිවරණ දිනලා තිබෙන්නේ කවුද? කසිප්පුකාරයෝ; ගංජාකාරයෝ; ස්ත්‍රී දූෂකයෝ; හොරු; වංචාකාරයෝ තමයි මේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් දිනලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ උදව්යට මේ කාරණය පැහැදිලිව කියන්නට ඕනෑ. ගම කන, ගම විනාශ කරන, ගමේ කාන්තාවන්ට ජීවත් වෙන්න බැරි පසුබිමක් නිර්මාණය කරන මන්ත්‍රීවරුන් ටිකක් තමයි අද මේ ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී පොහොට්ටුවෙන් පත් වෙලා තිබෙන්නේ. ගමේ-ගොඩේ කථාවක් තිබෙනවා, "නංගි පෙන්නලා අක්කා දුන්නා වාගේ" කියලා. පොහොට්ටුව පක්ෂයේ අය නංගි පෙන්නලා අක්කා නොවෙයි, නංගි පෙන්නලා ආව්වි තමයි දීලා තිබෙන්නේ. නංගි පෙන්නලා ආව්විව දීපු මැතිවරණයක් කියලා අපි තමුන්නාන්සේලාට මතක් කරලා දෙනවා.

මේ වෙන කොට විවිධ මතිමතාන්තර ගොඩනැඟිලා තිබුණත්, අද ඒකාබද්ධ විපක්ෂයේ උදව්යට, පොහොට්ටුවේ උදව්යට බැරි වුණා මන්ත්‍රීවරුන් 113ක් පෙන්වන්න. මන්ත්‍රීවරුන් 113ක් තියා අඩුම ගණනේ මන්ත්‍රීවරුන් 25ක්වත් පෙන්වන්න බැරි වුණා. කලින් ඉදිරිපත් කරපු යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ මන්ත්‍රීවරුන් 20යි. ඒ මන්ත්‍රීවරුන් 20 තියාගෙන තමයි පසු ගිය ටිකේ මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා ප්‍රකාශ කළේ. මේ ඒකාබද්ධ විපක්ෂයේ උදව්ය එදා ආණ්ඩු පක්ෂයේ සිටිද්දී ගුටි කාපු මාධ්‍යකාරයෝ තමයි මේක වැඩිපුරම පෙන්වන්නේ. උඩ පැන පැන පෙන්වුවා, අපට මන්ත්‍රීවරුන් 113ක් පෙන්වන්න පුළුවන් කියලා. අද මන්ත්‍රීවරුන් 113 නොවෙයි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අද පස්සා පැත්ත බිම ඇන ගන්නා තත්ත්වයක් ඒකාබද්ධ විපක්ෂයට උද්ගත වෙලා තිබෙනවා.

එදා පළාත් පාලන මැතිවරණය දිනලා, ඒ ජයග්‍රහණය අනුව කටයුතු කරන්නේ නැතිව ආණ්ඩුව පෙරළන්න හැදුවා. පළාත් පාලන මැතිවරණයෙන් පෙබරවාරි 11වැනි දා යම් කිසි ජයග්‍රහණයක් ලැබුවා වෙන්නට ඇති. හැබැයි, ආණ්ඩු පෙරළන්න ගිහිල්ලා ඒකාබද්ධ විපක්ෂය, එහෙම නැත්නම් පොහොට්ටුව පක්ෂය අද නන්නත්තාර වෙලා, පරාජය වෙලා තිබෙනවා කියන එක හොඳට මතක තබා ගන්න. මේ මැතිවරණයේ දී ආණ්ඩුවක් විධියට, එක්සත් ජාතික පක්ෂය විධියට අපි අඩු මන්ත්‍රී ධුර ප්‍රමාණයක් ගත්තා තමයි. හැබැයි, මේකත් හොඳට මතක තියා ගන්න. මේ පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ඇති වෙච්ව තත්ත්වය තුළ ආණ්ඩු පෙරළන්න ගත්තු උත්සාහය නිසා අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු අපේ යහ පාලන ආණ්ඩුව විශිෂ්ට ජයග්‍රහණයක් ලබා තිබෙනවා.

ඔවුන්ට අවශ්‍යතාව තිබුණා අගමැතිවරයා පන්නන්න; ඇමතිවරු පන්නන්න. ඒ වාගේම අවශ්‍යතාවක් තිබුණා, ඇමතිවරුන් මාරු කරන්න; එහෙම නැත්නම් ඔළුගෙඩි මාරුවක් කරන්න. හෙට අනිද්දා වනකොට ඔළුගෙඩි මාරුව සිද්ධ වේවි. ඒ ඔළුගෙඩි මාරුව සිද්ධ වුණාට පස්සේ අද පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑගහන, හිරේ ඉන්න ඕනෑ අයට හිරේට යන්න වෙනවායි කියන එකත් මතක තියා ගන්න. හොරකම් කරලා මෙච්චර කල් වැල්වටාරම් ගහපු, රවුම් ගහපු, වංගු ගහපු, හැංගිලා හිටපු ඔක්කෝටම මේ ඇති කරන වෙනසින් පසුව අනිවාර්යයෙන්ම හිරේ යන්න වෙනවායි කියන එක තේරුම් ගන්න ඕනෑ; මතක තියා ගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි, ගරු කථානායකතුමනි. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයේ අය ඔළුව බේරාගෙන ඉන්නේ නැතිව කරකවන්න ගිහිල්ලා, නැති සංදර්ශන මවන්න ගිහිල්ලා නුදුරු අනාගතයේ දී ඉතා ඉක්මනින්ම තමන් වළ පල්ලට යන ක්‍රියාදාමය ආරම්භ කරගෙන තිබෙනවාය කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා, බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.15]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණයත් එක්ක රටේ ඇති වෙලා තිබෙන දේශපාලන අර්බුදය සහ ආර්ථික අර්බුදය පිළිබඳවයි අපේ පැත්තෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළේ. ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂය මේ පරාජය භාර ගන්නේ නැත්තේ ඇයි කියන එක මම අහන්න කැමැතියි. ආණ්ඩුව පරාජය භාර ගන්න නිහතමානී වෙන්න ඕනෑ. පරාජය භාර ගත්තොත් විතරයි ඒ පරාජයට හේතු හොයන්න පුළුවන් වෙන්නේ. ගරු කථානායකතුමනි, දැන් කියනවා, "ඔක්කෝම එකතු කළාම සංඛ්‍යා ලේඛන අනුව අපට තමයි වැඩියෙන් ඡන්ද තිබෙන්නේ. ඊළඟ ජනාධිපතිවරණයේදීත් අපි තමයි ජයග්‍රහණය කරන්නේ" කියලා. දැන් මේක තමයි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන විග්‍රහය. මේකෙන් පෙනෙනවා, මේ මැතිවරණ ප්‍රතිඵල ගැන ආණ්ඩුවට කිසිම තක්සේරුවක් නැහැයි කියන එක. තක්සේරුවක් තිබුණා නම් මේ වන විට රට හමුවේ ස්වයං විවේචනයක් කරන්න ඕනෑ, "මේ, මේ හේතු නිසා අපි පැරදුණා" කියලා. ඒ නිසා කවදාවත් මේ අයට නිවැරදි වෙන්න බැහැ කියන එක මම කියන්න කැමැතියි. මොකද, යථාර්ථමය විධියට ප්‍රශ්නයක් දෙස බලන්නේ නැතිව වෙනත් විග්‍රහවලින් උත්තර දෙන්න ගියාම හරි උත්තරය එන්නේ නැහැ.

දැන් සමහර අය කියනවා, "අපි තමයි ආණ්ඩුව කරන්නේ. ඔයගොල්ලන්ට ආණ්ඩුව ආවත් ගෙන යන්න බැහැ" කියලා. මෙහෙම කථා කරන අය තමන්ගේ කොට්ඨාසය තුළත් පරාදයි. ඡන්දයෙන් පස්සේ ජනතාව හමු වෙන්න ඒ කොට්ඨාසය තුළ ඇවිද්දා නම්, පැරදුණු හේතුව මොකක්ද කියලා හොයා ගන්න පුළුවන්.

2015 ජනවාරි 08වැනිදා වුණු සමාජ වෙනසේ දී ආණ්ඩුව දීපු ප්‍රතිඥා එකක්වත් ඉස්සරහට ගෙන යන්න ආණ්ඩුවට බැරි වුණා. ඒ නිසා මේ වටා හිටපු සියලු සමාජ බලවේග ආණ්ඩුව අත්හැරියා. ඒක එක පැත්තක්. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ආණ්ඩුව ගෙන ගිය ඒ ආර්ථික ප්‍රතිපත්තිය නිසා රට වෙලා ගත්ත දිළිඳු බවයි, පීඩනයයි තුළ මිනිස්සු දැක්කා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පරාජය වීමේ හේතුව උඩ තමයි තමන් මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කියන එක. ඒක තමයි ඇත්ත. ඒ නිසා ඇති වුණු එම තත්ත්වය වෙනස් කිරීම සඳහා වුණු පෙළ ගැසීමේ ප්‍රතිඵලයක් තමයි මේ මැතිවරණ ප්‍රතිඵලය. දැන් මේකත් එක්ක මොකක්ද වෙලා තිබෙන්නේ? මේ මැතිවරණ ප්‍රතිඵලත් එක්ක බරපතළ දේශපාලන අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. සමහරුන් දැන් සංඛ්‍යා ලේඛන හොයනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනවා, "අපේ ආණ්ඩුවක් අපි හදනවා. අපට ටිකක් වැඩියෙන් තිබෙනවා" කියලා. ඒකාබද්ධ විපක්ෂයටත් ආරාධනා කරනවා, "තනි ආණ්ඩුවක් හදන්න අපේ ළඟ කෙළින් හිට ගන්න" කියලා. එක්සත් ජාතික පක්ෂය කියනවා, "අපට ආණ්ඩුවක් හදන්න පුළුවන්, අපේ ගොඩ වැඩියි" කියලා. දැන් මේ අර්බුදයට උත්තරයක් නැහැ. ඒ නිසා මේ ඇති වුණු දේශපාලන අර්බුදය අද සමාජ, ආර්ථික අර්බුදයකට හේතු වී තිබෙනවා. සියලු ක්ෂේත්‍ර කඩා වැටෙමින් තිබෙනවා. විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, කොටස් වෙළෙඳ පොළ බිඳ වැටී තිබෙනවා. ඒ ගැන අපි කවුරුත් දැන් කථා කළා. මහා ආර්ථික පරිහානියක් සිදු වෙලා තිබෙනවා. මේ කට්ටිය මේ සූදුව කෙළිවි.

මේකේ ප්‍රතිඵලය මේ සමාජයේ දුප්පත් මිනිස්සු මතයි පැටවෙන්නේ. ඒ නිසා මිනිසුන්ට දරා ගන්න බැරි ආර්ථික පීඩනයකට ඉදිරියේදී මේ රට පත් වෙනවා. ඒ නිසා තමයි ඒකාබද්ධ විපක්ෂයේ අපි සමාජය ගැන හිතලා, මේ රට ගැන හිතලා කිව්වේ, "හරි, අපි සහයෝගය දෙන්නම් තනතුරු භාර නොගෙන. මේ රට ගැන හිතලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හදාගෙන යන්න ක්‍රියා කරන්නය" කියලා. නමුත්, මේ වෙනකල් උත්තරයක් තිබෙනවාද? අපි මොනවා කථා කළත්, නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්න අද එක්සත් ජාතික පක්ෂය ගෙන යන ක්‍රියා මාර්ග ආපස්සට හරවන්න බැරි තැනට රට තල්ලු වෙලා ඉවරයි කියන කාරණය මම කියනවා. ඒක පිටිපස්සේ ඉන්න බටහිර බලවේග ලෙහෙසියෙන් මේක බිඳින්න ඉඩ දෙන්නේ නැහැ; වැටෙන්න ඉඩ දෙන්නේ නැහැ. කාගේ අභිලාෂයන් තිබුණත් අවසාන විග්‍රහය තමයි, මේක පුට්ටු කරගෙන අරගෙන යනවාය කියන කාරණය. මොකද, ඒකේ වැඩි වාසිය තිබෙන්නේ මේ රටේ ඉන්න මූල්‍ය ධනපති පන්තියට සහ විජාතික ධනපති පන්තියට. අපේ සම්පත් සූරාකන්න උත්සාහ කරන බටහිර ධනපති පන්තියේ අවශ්‍යතාව මේ ආණ්ඩුවෙන් ඉටුවෙන්න නම්, මේ ආණ්ඩුවේ බහුතර බලයක් ඇති ඒ සන්ධානය තවදුරටත් රැකෙන්න ඕනෑ. ඒ නිසා අපට හිතෙන ආකාරයට මෙය වෙනස් කරන්න බැරි වෙයි. එහෙම කරනවා නම්, ඒක ලොකු විප්ලවීය වැඩක්. පසුගිය කාලයේ ගෙන ගිය, මුළු ලෝකයම ප්‍රතික්ෂේප කළ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියේත් මේක පරාජයක් කියා මම කියන්න කැමැතියි. තවදුරටත් මේක ඉස්සරහට ගෙන යන්න බැහැ කියන එක අද රට හමුවේ ඔප්පු වෙලා තිබෙනවා. දැන් මොකක්ද මේකේ ප්‍රතිඵලය? අර මැදපෙරදිග රටවල ඉන්න මහාරාජාවරුන්ටත් වැඩිය ධන කුවේරයෝ මේ රටේ බිහි වෙලා. මහාරාජාවරු වාගේ මහා සම්පත් ඒක රාශී කරගත්ත මූල්‍ය ධනපති පන්තියක් බිහිවෙලා තිබෙනවා. ඒ ධනපති පන්තිය බිහි කරන්න තමයි අපේ මහ බැංකු මං කොල්ලය කළේ. ඒ මහ බැංකු මං කොල්ලයෙන් ගත්ත ධනය මේ රටේ ධනපති ක්‍රමයේ සීමිත කොටසක් ශක්තිමත් කරන්න ගත්ත උත්සාහයක එක්තරා ප්‍රතිඵලයක්.

මේ ආකාරයට කටයුතු කරන ආණ්ඩුවක් ලෙහෙසියෙන් බිඳ දමන්න බටහිර බලවේගවල ක්‍රියාකාරිත්වය ඉස්මතු වෙලා ඒවි කියා මම හිතන්නේ නැහැ; ඒක එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා රට හමුවේ ප්‍රධාන අභියෝගයක් තිබෙනවා. මේ මතු වෙන දේශපාලන අර්බුදය අද බරපතළ ආර්ථික අර්බුදයකට යොමු

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

කරලා තිබෙනවා. මේ ආර්ථික අර්බුදය නිසා මහා සමාජ ප්‍රශ්න වැලකට රට යොමු වෙමින් තිබෙනවා. ඒක නිසා තවදුරටත් රටට දරාගන්න බැරි පීඩනයක්, දරාගන්න බැරි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වේලාව අවසන් වේ ගෙන එනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, මමත්, තවත් මන්ත්‍රීවරු ගණනාවකුත් වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධව පිළිතුරු ලබාදෙන ලෙස මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටියා. නමුත් ගරු සභානායකතුමා ඒකට නිසි පරිදි පිළිතුරු ලබා දුන්නේ නැහැ. මේක ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, ඒ මොකක්ද? ජාතික ආණ්ඩුවක් කියලා පක්ෂ දෙක එකතු වී ආණ්ඩුවක් හදා ගත්තා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජාතික ආණ්ඩුවක් පවතිනවා නම් පමණයි අමාත්‍ය ධුර සංඛ්‍යාව 30ට වඩා වැඩිකරගත හැකි වන්නේ. මා ළඟ තිබෙනවා, 2015 සැප්තැම්බර් 01 වන අහඹරුවාදා පළමු පාර්ලිමේන්තු දිනයේ කථා බහ වුණු, එහිදී සාකච්ඡා වූ දේවල් ඇතුළත් හැන්සාඩ් වාර්තාව. එහි ඉතා පැහැදිලිව සඳහන් වී තිබෙනවා, මෙම ජාතික ආණ්ඩුව ගොඩ නඟා තිබෙන්නේ අවුරුදු දෙකකට බවත්, ඒ අවුරුදු දෙකෙන් පසුව නැවත සමාලෝචනයට ලක්කොට ඉදිරියට යනවාද නැද්ද කියලා තීරණය කරන බවත්. එතකොට ඒ අවුරුදු දෙකට අවශ්‍ය වන පරිදි තමයි අමාත්‍යවරු සංඛ්‍යාව 30 සිට 48 දක්වා වැඩි කර ගන්නත්, නියෝජ්‍ය සහ රාජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40 සිට 45 දක්වා වැඩි කර ගන්නත් මේ පාර්ලිමේන්තුව අනුමැතිය දුන්නේ. මොකද, වෙනදා වාගේ බැහැ ගරු කථානායකතුමනි. අමාත්‍යවරු 30ට වඩා වැඩි කර ගන්නවා නම්, නියෝජ්‍ය සහ රාජ්‍ය අමාත්‍යවරු 40ට වඩා වැඩි කර ගන්නවා නම් මේ පාර්ලිමේන්තුවෙන් අනුමැතියක් ගන්න ඕනෑ. හැබැයි, තමුන්නාන්සේලා ඒ අනුමැතිය ගත්තා, 2015 සැප්තැම්බර් 01 වෙනිදා. ඒ අනුමැතිය ගන්න වෙලාවේ ඔබතුමන්ලා ප්‍රකාශ කළා, අවුරුදු දෙකකට ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟෙන බවත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම් විසින් -මට මතක විධියට එදා හිටියේ විශ්වා වර්ණපාල මැතිතුමා- ඔබතුමාට දැනුම් දී තිබුණා, ජාතික ආණ්ඩුවක් ගොඩනඟන බව. මොකද, එවැනි දැනුම්දීමක් තිබුණේ නැත්නම් මේ පාර්ලිමේන්තුවේ මේක සාකච්ඡාවට බඳුන් කරන්න බැහැ. ඔබතුමා නිශ්චිත වශයෙන් කිව්වා, "ඔව්. ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟෙන බව ඒ පක්ෂ දැනුම් දී තිබෙනවා" කියලා. හැබැයි, එහි නිශ්චිත ලෙස සඳහන්කොට තිබුණා, එය අවුරුදු දෙකකට කියලා.

ගරු කථානායකතුමනි, අවුරුදු දෙක ඉක්මවා ගිය පසුව නැවත තවත් කාලයක් දීර්ඝ කරන්න ගිවිසුමක් අත්සන් කරලා මෙම අමාත්‍යවරු සංඛ්‍යාව වැඩි කර ගන්න පාර්ලිමේන්තුවෙන් නැවත අනුමැතියක් ගන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාට මේ ජාතික ආණ්ඩුව දීර්ඝ කරනවාද කියලා අඩුම තරමේ තවම ඒ පිළිබඳ දැනුම් දීමක් ලබා දීලා නැහැ. ඒ අනුව මේ පාර්ලිමේන්තුවේ අමාත්‍යවරු සංඛ්‍යාව වැඩි කර ගන්න අනුමැතියක් ලබා දීලත් නැහැ. තමුන්නාන්සේලාට අමාත්‍යවරු සංඛ්‍යාව වැඩි කර ගන්න පාර්ලිමේන්තුව ලබා දීලා තිබෙන අනුමැතිය අවසන්. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අමාත්‍යවරු සංඛ්‍යාව වැඩිකරලීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඕනෑ. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අමාත්‍යවරු සංඛ්‍යාව 30 සිට 48 දක්වා වැඩි කර ගන්න සැප්තැම්බර් මාසයේ පළමුවෙනිදා අනුමැතිය ලබා දීලා තිබෙන්නේ අවුරුදු තුනක් වලංගු වන ගිවිසුමකිනුයි. දැන් තමුන්නාන්සේලා කිසිදු තීරණයක් අරගෙන නැහැ. ගරු කථානායකතුමනි, අපි ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න අහනවා. මේ ඇමතිවරු වලංගු ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වලංගු නැති ඇමතිවරුන්ගෙන්, නිසි පරිදි ව්‍යවස්ථාවට අනුව කටයුතු කරලා නැති ඇමතිවරුන්ගෙන්, නිසි පරිදි ව්‍යවස්ථාවට අනුව වැඩ කරලා නැති ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න අහනවා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ වලංගු නැති ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න අහන්න හෝ ඔවුන්ගේ බලය පිළිගන්න අපි සූදානම් නැහැ. එම නිසා ගරු කථානායකතුමනි, එම තත්ත්වය බරපතළයි. මේක ව්‍යවස්ථාවත් එක්ක ගැටෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මේ ප්‍රශ්නය ගැන කවුරුන් හෝ විභාග කළොත් තමුන්නාන්සේලා මෙතෙක් ගනු ලබන හැම තීරණයක්ම වලංගු නොවන තීරණයක් බවට පත් වෙනවා. එම නිසා කරුණාකරලා මේ පිළිබඳ ආණ්ඩුව පැත්තෙන් පාර්ලිමේන්තුවට අදහස් ඉදිරිපත් කළ යුතුයි. අපි දැන ගත යුතුයි. "මේ ජාතික ආණ්ඩුව අපේ වැඩක්." කියලා කිව්වාට මේක තමුන්නාන්සේලාගේ වැඩක් නොවෙයි. මේක පාර්ලිමේන්තුවේ වැඩක්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව ප්‍රශ්නයක්ද, වෙනත් ප්‍රශ්නයක්ද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේ සම්බන්ධව ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා එකවර සභානායකතුමාට උත්තර දෙන්න පුළුවන්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු අනුර කුමාර දිසානායක විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මතු කරපු කාරණයට අදාළවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඊයේත් මතු කළා. නමුත් ඊයේ ඒක භාෂ්‍යයට ලක් කළා මිසක්, ආණ්ඩුව පැත්තෙන් එයට දේශපාලන පිළිතුරක් ලැබුණේ නැහැ.

ගරු සභානායකතුමනි, මම එතුමාගේ මුළු ප්‍රකාශයම අනුමත කරන අතරේ කියා සිටින්නේ, නීත්‍යානුකූල නොවන, ව්‍යවස්ථානුකූල නොවන ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු හා නියෝජ්‍ය ඇමතිවරු 24දෙනෙක් අද මේ රටේ සිටින බවයි. ඒ 24දෙනා කවුද කියන්න අපි දන්නේ නැහැ. ජාතික ආණ්ඩුවේ ගිවිසුම් කාලය ඉකුත් වෙලා දැනට මාසයකුත් දින 20ක් ගත වෙලා තිබෙනවා. ගරු සභානායකතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. මෙය දේශපාලන වශයෙන් එකිනෙකාට ඇඟිල්ල දික්කර ගන්නා විහිළුකාරී තත්ත්වයක් නොවෙයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය,- [බාධා කිරීම්] කරුණාකරලා නිහඬ වෙන්න. මෙතැන පෞද්ගලික කාරණයක් නොවෙයි විභාග වෙන්නේ.

ගරු කථානායකතුමනි, මේක ඔබතුමාගේ කීර්තියටත් සෘජුව බලපාන ප්‍රශ්නයක් හැටියට මතු වෙලා තිබෙනවා. සමස්ත රටේ දේශපාලන ස්ථාවරභාවය අර්බුදයට ලක් වෙලා තිබෙනවා. ඒ අර්බුදයෙන් -අපි මේ බොරදියේ මාළු බානවා වාගේ- අපේ කොටස වෙන් කර ගන්න, ඒක සමරන්න හදනවා නොවෙයි. පාර්ලිමේන්තුව මේකට නායකත්වය දෙන්නට ඕනෑ, ගරු සභානායකතුමනි. දේශපාලන වශයෙන් ශක්තිමත් පිළිතුරක් මේකට අවශ්‍යයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජාතික ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් ඉන් ඉවත් වෙලා නැහැ. The parties for all practical purposes in spirit and by law are part of the National Government. පාර්ශ්වකරුවන් ඉවත් වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මෙතැන මතු කරන අවුරුදු දෙකක අවසානය සම්බන්ධයෙන්- [බාධා කිරීමක්] Hon. Leader of the House, have you finished your explanation?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ජාතික ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් ජාතික ආණ්ඩුවෙන් ඉවත් වෙලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා පිළිතුරු ලබා දෙන්නේ පැහැදිලිවම ගත්තොත් මේ මොහොතේ මතු වී තිබෙන, "ඉන්නවාද, නැද්ද? යනවාද, නැද්ද?" කියන සාකච්ඡාවට. ඒක නොවෙයි, අපි මේ මතු කරන්නේ. තමුන්නාන්සේලා ජාතික ආණ්ඩුවේ හිටියත් ඒ බව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරලා නැහැ.

එදා 2015 සැප්තැම්බර් 1 වන දා තමුන්නාන්සේලා අමාත්‍යවරු සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා මේ පාර්ලිමේන්තුවෙන් අනුමැතියක් ගත්තා. ඒ අනුමැතිය ගන්නකොට ඔබතුමන්ලා පැහැදිලිව ප්‍රකාශ කළා, අවුරුදු දෙකකට තමයි ජාතික ආණ්ඩුව ගොඩ නැඟෙන්නේ කියලා. කථානායකවරයාට දැනුම් දීලා තිබුණා. දැන් අවුරුදු දෙක ඉක්මවා ගොස් තිබෙනවා. ඊයේ පෙරේදා ඇති වුණු, යනවාද-නැද්ද, වාඩි වෙනවාද-නැද්ද කියන කථාව ගැන නොවෙයි මම මේ කියන්නේ. ඒ නිසා පොදුවේ, ජාතික ආණ්ඩුව තවදුරටත් ඉදිරියට යනවාද, නැද්ද කියන එක පිළිබඳව කථානායකතුමා දැනුවත් කළ යුතුව තිබෙනවා; මේ පක්ෂ දෙකේ එකඟතාවක් තිබෙන ගිවිසුමක් හෝ, ලියවිල්ලක් හෝ දෙන්න ඕනෑ. එසේ නොදෙන තාක්කල්, තමුන්නාන්සේලාට එක විටෙක "ඉන්නවා" කියන්න පුළුවන්,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ගරු අග්‍රාමාත්‍යතුමාටත් දන්වලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතකොට ඒ ගැටලුව විසඳෙනවා. හොඳයි, බොහොම ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් කාලය ඉක්මවා යමිනුයි තිබෙන්නේ. ඒ නිසා අද පාර්ලිමේන්තුවේ අමාත්‍යවරු ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් අපට පිළිගත හැකිද? පාර්ලිමේන්තුවේ ඇමතිවරු හැටියට දෙන පිළිතුරු අපට පිළිගත හැකිද? එහෙම තත්ත්වයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට ඒ ගැන ප්‍රකාශ කරන්න. ගරු අගමැතිතුමාටත් දන්වන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා තමුන්නාන්සේලා ඒවා මහහැර යන්න නොවෙයි, වහාම පිළිතුරක් ලබා දෙන්න ඕනෑ; මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියන එක ගැන.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කලින් කිව්වා වාගේ පාර්ශ්වකරුවන් ඉවත් වෙලා නැහැ. ඉවත් වෙලා නැත්නම් තවම ඒක තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, දැන් මේ පාර්ශ්ව දෙක අතර ඇති වූ ගිවිසුමෙන් ඔවුනොවුන් ඉවත් වී නැහැයි කියන එක negative පිළිතුරක්. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව අනුමත කරපු කාලය ඉවරයි. එහෙම නම් නිසඟයෙන් -automatically- ඒ ගිවිසුම දීර්ඝ වෙනවාය කියලා අර්ථකථනයක් කරන්න බැහැ. අපට වුවමනායි, මේ පාර්ලිමේන්තුවේ බලය පැහැර ගැනීමෙන් වළක්වන්න. මෙච්චර ගණනකට වැඩියෙන් ඇමතිවරු ඉන්නවා නම්, "මෙන්න මේ විධියටයි වෙන්න ඕනෑ." කියලා පාර්ලිමේන්තුවටයි තීන්දු දෙන්න බලය තිබෙන්නේ. ඒ දුන්නා වූ බලය අද වනකොට තවදුරටත් වලංගුද, එහෙම නැත්නම් එය පැහැර ගත් බලයක් හැටියට මේ ආණ්ඩුව විසින් පරිහරණය කරන්න උත්සාහ කරනවාද? ගරු කථානායකතුමනි, ඒක ඔබතුමාගේත්, පාර්ලිමේන්තුවේත් බලය පැහැර ගැනීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභානායකතුමාත් ඒ ගැන සොයා බලනවා. මාත් ඒක අහලා බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මේකට ඔබතුමාට මේ ආකාරයෙන් මැදිහත් වන්න පුළුවන්. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු මහ ලේකම්තුමකු වූ විශ්වා වර්ණපාල මහතා ලිඛිතව ඔබතුමා දැනුවත් කරලා තිබෙනවා, වසර දෙකක කාලයකට මේ ජාතික සන්ධාන ආණ්ඩුව ගොඩ නහනවා කියලා. අද 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ 20 වෙනි දා. ගරු කථානායකතුමනි, අද දවසේ ඔබතුමා අපට කියන්න, ඒ වසර දෙකක කාලය ඉක්ම ගියාට පසුව එම කාලය දීර්ඝ කරන බව ඔබතුමාට මේ වනකොට දැනුම් දීලා තිබෙනවාද, නැද්ද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවම දැනුම් දීලා නැහැ. මම අද ඒ ගැන සොයා බලනවා. සභානායකතුමාත් ඒ ගැන සොයා බලනවා කිව්වා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
සභානායකතුමනි, එතකොට තත්ත්වය ඉතා පැහැදිලියි. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ අපි කථා කරන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සැප්තැම්බර් මාසයේ සිට මෙම කාරණය අපි කීප වතාවක් ඉදිරිපත් කළා. නමුත්, ඒ පිළිබඳව පැහැදිලි පිළිතුරක් නොදී කාලය ගත කෙරුණා. යළිත් අපි අහන එක කාරණාවක් මෙසේයි. අවුරුදු දෙකකට මේ ගිවිසුම වලංගු බව අභාවප්‍රාප්ත විශ්වා වර්ණපාල මැතිතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ එවකට හිටපු මහ ලේකම්වරයා හැටියට දැනුම් දුන්නා. අනුර දිසානායක මන්ත්‍රීතුමා සහ මම මේ කාරණය මතු කළාම සභානායකතුමා වන ලක්ෂ්මන් කිරිඇල්ල මහතා කිව්වා, "එය හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. හොඳයි, ඕනෑ නම් අපි යළිත් සභාවේ අනුමැතියට එන්නම්" කියලා. දැන් ප්‍රශ්නය වන්නේ මෙයයි. කථානායකතුමා හැටියට ඔබතුමා තීරණය කරන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ අය වැය විවාදය පැවැත්වුණු කාල සීමාව තුළ අපි අහපු ඒ ප්‍රශ්නයට පිළිතුර වශයෙන් සභානායකතුමා දුන් ඒ ප්‍රතිඥාව අනුව මේ ගිවිසුමේ කාලය දීර්ඝ කළත් යළිත් සභාවේ අනුමැතියක් ගත යුතුද, නැද්ද යන කාරණය. එහෙම නැත්නම් දැන් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ පරිදි කැබිනට් මණ්ඩලය 30ට බහිනවා; අනෙක් අමාත්‍යවරුන් සංඛ්‍යාව 40ට බහිනවා. ඒ ගැන ඔබතුමා ඉක්මන් තීරණයක් ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your point is taken, Hon. Member. I will raise this issue with the Government. මම හෙට ඒ ගැන තීරණයක් දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, give your decision on the matter.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
By tomorrow, I should be able to let you know my position. The Hon. Leader of the House is also going to raise the issue. So, give me some time till tomorrow. - [*Interruption.*] Hon. Dullas Alahapperuma, is this regarding another matter?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, අද "ලංකාදීප" පුවත් පත ඇතුළු ජාතික පුවත් පත් සියල්ලම වාර්තා කරලා තිබෙනවා, පක්ෂ නායකයන් ඒකමතිකව තීරණය කළා කියලා පළාත් පාලන ආයතන සඳහා තිබිය යුතු කාන්තා නියෝජනය නොසලකා හැරීමට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක වැරදියි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මෙම කාරණය ජනමාධ්‍ය හරහාත් විවිධ මුහුණුවරින් සාකච්ඡා වෙනවා. ගරු කථානායකතුමනි, මේ ප්‍රවෘත්තිය හරිද වැරදිද කියන එක නොවෙයි ප්‍රශ්නය.

දේශපාලන පක්ෂවලින්, විශේෂයෙන් ආණ්ඩුවට සම්බන්ධ පක්ෂවලින් ගරු සභානායකතුමනි, ඉල්ලීම් රාශියක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව තීරණයක් ගැනීමට පෙර ඉතාම කෙටියෙන් ඔබතුමාගේ අවධානයට කරුණු හතරක් යොමු කරන්නට මට අවස්ථාව දෙන්න.

පළමුවෙනි කාරණය තමයි, මහරගම සහ මහියංගනය ඇතුළුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නාම යෝජනා තුනක් ප්‍රතික්ෂේප වුණා, කාන්තාවන්ගේ නම් නියමිත ප්‍රමාණයට තිබුණේ නැහැයි කියලා. නියමිත ප්‍රමාණයට සඳහන් වෙලා තිබියදීත්, 'කාන්තා' කියන වචනය තිබුණේ නැහැයි කියලා නාම යෝජනා ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. එය නාම යෝජනා ප්‍රතික්ෂේප වීමට තරම් බරපතළ කාරණාවක් වෙලා ඒ මැතිවරණ භූමියේ සටනට වෙනත් මුහුණුවරක් ආව වෙලාවක මේ වාගේ තීන්දුවක් ගැනීම කිසිසේත්ම යුක්තිසහගත නැහැ; සදාචාරාත්මක නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඉන්න ගරු සභානායකතුමනි, තව කරුණු තුනක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. දෙවන කාරණය, ඔබතුමාට මතකයි, අගෝස්තු 23 වන දා මේ සංශෝධන ගෙනෙන වෙලාවේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාත්, සාමාජිකයිනුත් පැමිණියා. ඒ වාගේම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාත්, ලේකම්තුමාත් පැමිණියා. ඒ සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡාවක් පැවැත්වුවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාත් ඒ සාකච්ඡාවට සහභාගි වුණා. ඒ කරුණු බොහෝ දුරට විසඳා ගන්න පුළුවන් වුණා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, අපි ඉතාම හැඟීම්බරවයි ඔබතුමාට මේ කරුණු කියන්නේ.

දෙවන කාරණය මෙයයි. අවුරුදු 30කට ආසන්න කාලයක් පළාත් පාලන මැතිවරණයට අදාළව බලපැවැත්වූ සියයට තිහේ තරුණ නියෝජනය අයින් කරලා තමයි කාරක සභා අවස්ථාවේදී මේ යෝජනාව ඉදිරිපත් කළේ. අතිගරු ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේදී ඉදිරිපත් කරපු තරුණ නියෝජනය මුළුමනින්ම අහෝසි වුණා.

තුන්වන කාරණය මෙයයි. මම දන්නවා, අප නියෝජනය කරන කණ්ඩායම්වල හිටපු සභාපතිවරුන්, උපසභාපතිවරුන් වැනි අය ලැයිස්තුවට ඇතුළත් කළ බව. මාතර දෙවිනුවර ගත්තොත් කංචන මන්ත්‍රීතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් දෙදෙනකු පවා ලැයිස්තුවට ඇතුළත් කළා, කාන්තාවන්ට ඉඩ දීම සඳහා. දැන් ඔවුන් අසරණ වෙලා ඉන්නවා.

හතරවන කාරණය මෙයයි. ගරු සභානායකතුමනි, ඔබතුමන්ලාගේ මැතිවරණ ව්‍යාපාරය පුරාම ප්‍රධාන තේමාවක් වුණේ, කාන්තා නියෝජනය සියයට 25ක් බවට පත් කිරීම අතිශය දැවැන්ත දේශපාලන ජයග්‍රහණයක් බව. මැතිවරණ ව්‍යාපාරයේ ඡන්ද ලැබුණේ එහෙමයි. ක්‍රිකට් මැච් එකකින් පස්සේ කියන්න බැහැ නේ, "No-ball ලකුණු ටික දැන් එකතු කරන්න ඕනෑ" කියලා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Leader of the House reply. He was also there at the discussion.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] උත්තර දෙන කල් පොඩ්ඩක් ඉන්න. අපි ඊයේ සාකච්ඡා වුණේ, පවතින මැතිවරණ නීතිය අනුව සියයට විසිපහේ කාන්තා නියෝජනය පවත්වාගෙන යන්නයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. හැබැයි, සමහර සභාවල සියයට 25ක් හදන්න බැහැ. එම අවස්ථාවලට පසුව අවශ්‍ය සංශෝධන ගෙනෙන්න තමයි අපි ඊයේ තීරණය කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. That is what we agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කවදාවත් තීන්දු කළේ නැහැ, කාන්තා නියෝජනය අඩු කරන්න. ඒක වැරැදි මතයක්.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, may I also comment on that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, go ahead.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

I think what the Hon. Leader of the House says is correct. It was decided that the law will be implemented as it is. But, after that is done, if there is a situation where it is a case of impossibility, then Parliament will address that issue. There was no decision taken to act outside the law or to amend the law to deal with the situation that has already arisen.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, that is correct. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා ඊට සහභාගී වුණා. ඔබතුමාට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා, ප්‍රකාශයක් සම්බන්ධව විසඳුමකට ආවාය කියලා. සුමන්තිරන් මන්ත්‍රීතුමාත්, සභානායකතුමාත් කියපු කරුණට තමයි විසඳුම ලැබුණේ. වෙන විසඳුමක් ලැබුණේ නැහැ. තිබෙන නීති ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්නත්, impasse එකක් -කළ හැකි දෙයක් නැති අවස්ථාවක්- ඇති වුණොත් පමණක් ඒ පිළිබඳව විශේෂයෙන් සොයා බලා කටයුතු කිරීමක් ගැන තමයි සඳහන් වුණේ. [බාධා කිරීමක්] ඒක, පසුව. මූලික වශයෙන් දැන් මේ රටේ නීතිය මූලික නීතිය හැටියට පිළිගෙන කටයුතු කරන්න ඕනෑ. ඒක තමයි ගත්ත තීන්දුව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාටත් උපදෙස් ලබා දුන්නා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාත් ඒ තීන්දුවට එකඟ වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාත් ඊයේ ඒ තීන්දුවට එකඟ වුණා. ඒක සියලුම පක්ෂ නායකවරු සහභාගී වුණු අවස්ථාවක -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, ඔබතුමාත් ඒ කාරණය පිළිගන්නවානේ. [බාධා කිරීමක්] ඊළඟට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම ඒකට තව කොටසක් එකතු කරන්න ඕනෑ. යම්කිසි මන්ත්‍රී ප්‍රමාණයක් අඩු නම්, සියයට 50ට වැඩිව මන්ත්‍රී ප්‍රමාණයක් සිටිනවා නම් ඒ සභාව නීත්‍යානුකූලව පිහිටුවීමට පුළුවන් කියලා එහිදී මැතිවරණ කොමිසමේ සභාපති ඇතුළු සාමාජිකයන් ඉදිරියේ සාකච්ඡා වුණා. ඒක ප්‍රතික්ෂේප වුණේ නැහැ.

ඒකට බාධාවක් මේ ලැයිස්තුවෙන් හෝ වෙන ලැයිස්තුවකින් ආවාද, නැද්ද කියන එක නැහැ කියලා. සියයට 50ක් තිබෙනවා නම් සභාවේ නම ලැයිස්තුවට නම් කරලා එව්වත්, නැතත් ඒ සභාවේ කටයුතු පටන් ගන්න පුළුවන් කියලා තමයි තීරණය ගත්තේ. ගරු සභානායකතුමාත් ඒ ගැන පැහැදිලි කළා. වෙන නීතියක් වෙනස් කරන්න අපි කථා කළේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, පුවත් පත්වල තිබෙන ඒ වාර්තාව වැරදියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ඒක ඇත්ත.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ වරද නිවැරදි කරන්න කියලා පුවත් පත්වලට කිව යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම, අපේ මහ ලේකම්තුමාට උපදෙස් දෙන්නම්, ඔවුන්ව දැනුවත් කිරීමට.

ඊළඟට, සභාව කල් තැබීම. ගරු සභානායකතුමා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කල් තැබීමේ විවාදය.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Mr. Speaker -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, this is a continuation of the Adjournment Debate held on 06th February, 2018. I want to bring to the notice of the House that the PRECIFAC Report is available only in Sinhala even today. -[*Interruption.*] So, we will not be able to participate in this Debate, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We have asked for the translations. We were assured of that. We are sorry about that. I will check on that. Just give me a little time.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
They can speak on the Bond scam Report.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
If you speak once during an Adjournment Motion, you cannot speak again. So, do you want us to speak only on the Bond issue? Why are you restricting us to speak only on one report? Why are you worried about the PRECIFAC Report? I want to speak on that as well. -[*Interruption.*] You are too worried about my making references to the PRECIFAC Report.-[*Interruption.*] Earlier, you were Minister of National Languages and Social Integration. So, you should be protesting on this issue before the Debate begins. Any report must be available in both National Languages in the House. -[*Interruption.*] How can you suggest that we start the Debate and go on on one Report?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You are speaking unnecessarily.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No, I am not speaking unnecessarily, Sir. -[*Interruption.*] The Hon. Member is suggesting that we go on on one Report. Why should we go on on one Report? Why are you so worried about the PRECIFAC Report?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
What we are saying is, you can speak on the PRECIFAC Report as well as on the Bond Report.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I cannot speak on the PRECIFAC Report because it is only in Sinhala. - [*Interruption.*] After I speak once, I cannot speak again. Having been in Parliament since 1970, you do not seem to know even that. -[*Interruption.*] After I speak on that once, I cannot speak again. How can I speak again?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Do not speak now. Wait until the translations are available.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
So, what is the whole point? I cannot even understand if somebody refers to something in the Report. I cannot refer to the Report; I cannot follow it. Is that the way in which you want me to participate in a debate? That is why I took umbrage. Having been the former Minister of National Languages and Social Integration and having gone round the world saying all kinds of things, you are suggesting that I participate in a debate when things are referred to in a language that I do not understand and cannot read, that I should continue to sit here and do that. Shameful! - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let me explain, Hon. Members, please. -[*Interruption.*]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
But, Sir, on the Bond scam, they have come ready to speak. - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I must first apologize for not having the Tamil and the English translations ready. There are about 8,000 pages involved. So, we have asked the authorities to get those translated and they are working on that. They have requested the Department of Official Languages to provide the translations. Eight thousand pages is a lot. I think there is a point in what the Hon. Sumanthiran says. It is something that we have taken into consideration.

But, I will leave it to the House to decide. It is nothing but fair that he is also given the opportunity to speak. There is a point in what he says. Hon. Leader of the House, what do you suggest? If you all are to debate this, you must have it in both languages.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Then, we will postpone the Debate.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is up to you all. Then, shall we postpone the Debate? I will leave it to the House to decide. Does the House agree to postpone the Debate? - [*Interruption.*] ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, there is just one matter to raise before you decide to postpone. There was general agreement that even if it is not available in Sinhala or Tamil, if it is available in English, we accept to debate it. That was the original position held. You can take the Minute and read. - [*Interruption*.] I am not protesting on what you are raising, Hon. Sumanthiran, but the agreement was, if it is available in English and not in Sinhala or Tamil, that still we proceed. That was the decision taken and what is minuted here. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
But, this particular Report is not available even in English.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
This is only in Sinhala.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
It is not available even in the link language.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Report on Treasury Bonds is in English and the other Report is only in Sinhala.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
That is why I did not raise an issue on the Bond matter.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will leave it to the House to decide. There is a valid argument on both Sides.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, legally and technically there should be a Tamil translation. The English translation is also not available. So, we will postpone the Debate.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 1.38ට, 2018 පෙබරවාරි මස 21 වන බදාදා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 1.38 மணிக்கு பாராளுமன்றம், 2018 பெப்ருவரி 21, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 1.38 p.m. until 1.00 p.m. on Wednesday, 21st February, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

258 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 258 - இல. 7
Volume 258 - No. 7

2018 පෙබරවාරි 21වන බදාදා
2018 பெப்ருவரி 21, புதன்கிழமை
Wednesday, 21st February, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ජාතික ආණ්ඩුව :
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද:
ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා සිදු කළ හානිකර ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා] – පළමුවන වර කියවන ලදි.

පොතුවටවන මහා විහාරය පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා] – පළමුවන වර කියවන ලදි.

මෝටර් වාහන පනත :
නියෝගය

කල් තැබීමේ යෝජනාව:
රජයේ පාසල් වර්ග කිරීම

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தேசிய அரசாங்கம்:
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

சிறப்புரிமை:
மாண்புமிகு சிவசக்தி ஆனந்தனின் பாதகமான கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
டாக்டர் எஸ்.எஸ். குணவர்தன சுதேச ஆயுர்வேத அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது

பொத்துவடவன மகா விகாரை மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு நலின் பண்டார ஜயமஹ] - முதன்முறை மதிப்பிடப்பட்டது

மோட்டார் வாகனச் சட்டம்:
ஒழுங்குவிதி

ஒத்திவைப்புப் பிரேரணை:
அரச பாடசாலைகளைத் தரம் பிரித்தல்

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

NATIONAL GOVERNMENT:
Statement by Hon. Prime Minister

PRIVILEGE:
Adverse Statement made by Hon. Sivasakthi Ananthan

PRIVATE MEMBERS' BILLS:
Dr. S.S. Gunawardana Indigenous Ayurveda Development Foundation (Incorporation) – [The Hon. Anura Sidney Jayarathne] – Read the First time

Pothuwatawana Maha Viharaya Foundation (Incorporation) – [The Hon. Nalin Bandara Jayamaha] – Read the First time

MOTOR TRAFFIC ACT:
Regulation

ADJOURNMENT MOTION:
Classification of Government Schools

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 පෙබරවාරි 21වන බදාදා
2018 பெப்ருவரி 21, புதன்கிழமை
Wednesday, 21st February, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 පෙබරවාරි 21වන බදාදා, එනම් අද දින අපර භාග 3.00ට පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම අද දින අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වෙන බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීන් සියලු දෙනාට දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2015 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවෙන් 2013 සහ 2014 වර්ෂ සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ නියෝගය; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ වාර්තාව එකී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කටුවන, ගඟුලන්දෙනිය, උඩ අළුපොත්දෙනිය, ලක්මිනි ස්ටෝර්ස් යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්. සුනිල් රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තිස්සමහාරාම, මහා අකුරුගොඩ, අංක 23/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්. අජන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත අලුවිහාරේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, නුවරඑළිය තුරහ තරග පිටිය, ස්ථානභාර නිලධාරි ලෙස සේවය කරන ඒ.ජී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, පාදුක්ක, මලගල, අංක 182/7 දරන ස්ථානයෙහි පදිංචි ඩී.පී. ජේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-885/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2-1250/'16-(1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3-1428/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4-1660/'17-(1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 5-2002/'17-(1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 6-2010/'17-(1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-2114/'17-(1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2015 වසරේ උසස් පෙළ විභාගයෙන් වෛද්‍ය පීඨවලට සුදුසුකම් ලැබූ සිසුන්: බස්නාහිර පළාත

2015 உயர்தரப் பரீட்சை மூலம் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்ற மாணவர்கள்: மேல் மாகாணம்

STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES AT 2015 ADVANCED LEVEL EXAMINATION: WESTERN PROVINCE

2132/'17

8. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් කළුතර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) එම සංඛ්‍යාවෙන් වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் களுத்துறை, கொழும்பு மற்றும் கம்பஹா மாவட்டங்களிலிருந்து தோற்றியுள்ள மாணவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the GCE (A/L) Examination in the biology stream in 2015 from the Kalutara, Colombo and Gampaha Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ජෛව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව

කොළඹ දිස්ත්‍රික්කය	-	4941
ගම්පහ දිස්ත්‍රික්කය	-	3690
කළුතර දිස්ත්‍රික්කය	-	2790

(ii) විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ පිරිස හා ප්‍රතිශතය

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

	කොළඹ දිස්ත්‍රික්කය	-	3128	63.31%
	ගම්පහ දිස්ත්‍රික්කය	-	2170	58.80%
	කළුතර දිස්ත්‍රික්කය	-	1486	53.26%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා ප්‍රතිශතය.

	කොළඹ දිස්ත්‍රික්කය	-	203 -	4.11%
	ගම්පහ දිස්ත්‍රික්කය	-	118 -	3.20%
	කළුතර දිස්ත්‍රික්කය	-	70 -	2.51%

(iv) ඇමුණුම 1 යටතේ දක්වා ඇත.

ඇමුණුම 1

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරාගනු ලැබූ වෛද්‍ය
4130855	එච්.ඩී.පී.එම්. දයානන්ද	කොළඹ	කො/විශාකා බාලිකා	භෞතික විද්‍යාව	A	2.0235	කැලණිය වෛද්‍ය පීඨය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
4436148	එස්.එම්.ඒ.ජී.එම්. සෙව්වන්දි	ගම්පහ	*	භෞතික විද්‍යාව	B	1.8776	රජරට වෛද්‍ය පීඨය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	A		
4648390	කේ.ඩබ්.ඩී.එස්.පී. පෙරේරා	කළුතර	*	භෞතික විද්‍යාව	A	1.8636	රජරට වෛද්‍ය පීඨය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයේ (iv)වැනි කොටසට ලබාදුන් උත්තරය අනුව මෙම දිස්ත්‍රික්ක තුනෙන් වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවන්ගේ අවම සුදුසුකම බවට පත්වෙලා තිබෙන්නේ, එක දිස්ත්‍රික්කයක -මම හිතන විධියට කොළඹ දිස්ත්‍රික්කය වෙන්න ඇති- A සාමාර්ථ 3ක් ලබා ගැනීම.

ගම්පහ දිස්ත්‍රික්කයේ "A"1 සහ "B"2 යි. වෛද්‍ය පීඨවලට බඳවා ගන්නා 1,100 දෙනා අතරින් - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා අකුරුවලින් කිව්වා. එකක් "A" වලින් කිව්වා. අනෙක් එක "A"1 යි, "B"2 යි කියලා කිව්වා. Z-score එක වෙනම කිව්වා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)

It may be a very high "A" or a very low "A". Ultimately, it depends on the Z-score.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

කොහොම වුණත් "A" එකට range එකක් තිබෙනවා නේ. එහෙම තිබියදී දැන් වෛද්‍ය පීඨවලට බඳවා ගන්නා අවම සුදුසුකම පිළිබඳ සාකච්ඡාවක් යනවා. ඒකෙදී "S"3 යෝජනා කර තිබෙනවා. මේ වාගේ ඉතාම පහළ අගයක් ගන්න එක අසාධාරණයි නේද? ඒකේ කිසි පදනමක් නැහැ නේද? තමුන්නාන්සේලා SAITM වැනි ආයතන පිහිටුවනකොට කියන්නේ, - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, අපේ රටේ සුදුසුකම් සහිත දරුවන් ඕනෑ තරම් ඉන්නවා. වෛද්‍ය පීඨයකට බඳවා ගැනීමේ අවම ප්‍රමිතිය ලෙස අඩුම තරමින් ඔබතුමන්ලා "B"3 කියලා යෝජනා කරනවා නම්, ඒක සලකා බලන්න පුළුවන්. නමුත් ඊටත් වඩා පහළ අගයකට ගියාම වෛද්‍ය අධ්‍යාපනයේ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය තමයි බිඳ වැටෙන්නේ. ඒ නිසා මේ සංඛ්‍යා ලේඛන අනුව කිසි පදනමක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)

පසුගිය කාලයේ "S"3 ලබා ගත් වෛද්‍ය ශිෂ්‍යයන් හොඳ වෛද්‍යවරු වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට GMOA එකේ නිලධාරි මණ්ඩලය ගත්තොත්, බොහෝ නිලධාරීන් උසස් පෙළ විභාගයේ "S"3 තිබෙන අයයි. සම්මුඛ සාකච්ඡාවකදී ඒ අයගේ උසස් පෙළ ප්‍රතිඵල ඇහුවාම ඔවුන් කියන්න මැළි වුණා. ලොකුවට කථා කරපු එක්කෙනෙක් හිටියා, එතුමාට "S"3 යි තිබුණේ. ගරු කථානායකතුමනි, සම්මුඛ සාකච්ඡාවකදී එතුමාගේ උසස් පෙළ ප්‍රතිඵල පිළිබඳව ඇහුවාම කිව්වේ නැහැ. නමුත්, "S"3 ලබා ගත් අය හොඳ වෛද්‍යවරු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා මතු කරන තර්කයේ පදනමක් තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කරමු.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, යුද්ධය පැවති කාලයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු දරුවකුගේ සුදුසුකම අරගෙන තමයි මේ "S" සාමර්ථ තුන කියන එක අරගෙන තිබෙන්නේ. නමුත් කොළඹ හෝ ගම්පහ හෝ වෙන තැනක හෝ පහසුකම් තිබෙන අයටත් ඒ දරුවාගේ පදනම ආදේශ කළාට පසුව තවත් ඊට වඩා සුදුසුකම් තිබෙන අයට මොකද කරන්නේ? දැන් තමුන්නාන්සේලා ඔය මුදල් ප්‍රශ්නය සාකච්ඡාවට ගන්නේ. එහෙම ගන්න බැරි ගොඩක් තැන් තිබෙනවා. ඒ නිසා, මෙහෙම කළොත් ඊට වඩා හොඳයි නේද, ගරු ඇමතිතුමනි? තමුන්නාන්සේලා අවම සුදුසුකම විධියට අඩු තරමේ "B" සාමර්ථ තුනක්වත් ගන්නවා නම්, අඩු ගණනේ ශිෂ්‍යයන් 2,500ක් පමණ වෛද්‍ය පීඨවලට ඇතුළත් කර ගන්න අවස්ථාවක් හදන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කරන්න. අපි ඒ ගැන සලකා බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අපි කොයි තරම් යෝජනා ඉදිරිපත් කළත්, ඒ ගැන කනටවත් ගන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, "S" සාමර්ථ තුනෙන් ගන්න එපා, "B" සාමර්ථ තුනෙන් ගන්න කියා ඔබතුමා කියනවා නම්, ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සයිටම් ආයතනය සම්බන්ධයෙන් රටේ මහත් ආන්දෝලනයක් ඇති වෙලා, ඊට පසුව එම සටන යම් කිසි ආකාරයකට පසුගිය කාලයේ යටපත් වෙලා තිබෙනවා. නමුත් ඒ පොරොන්දු වුණු ආකාරයට, විශේෂයෙන්ම හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා ගිහින් පොරොන්දු වූ ආකාරයේ විසඳුමක් තවමත් ලැබී නැහැ. ඊයේත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, රජයේ වෛද්‍ය පීඨවල සිටින ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්, සයිටම් එකේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් එකතු වෙලා සාකච්ඡා කළා. ඒ පොරොන්දු වුණු ආකාරයට තමුන්නාන්සේලා විසඳුම ක්‍රියාත්මක කරන්න සූදානම්ද? දැන් දින වකවානු පහු වෙලා තියෙද්දිත් ඒකට ඇලිමැලි ගතියක් පෙන්නුම් කරන්නේ ඇයිද කියලායි මම අහන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා දන්නවා, එහි තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරගෙන යනවා.

Hon. Member, you know what the problem is. I do not have to tell you. Why must you tell the whole world what the problem is. You know what the problem is.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා තව දින කීපයක් කල් දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.
ප්‍රශ්න අංක 9 -2151/17- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 10 -2179/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -2202/'17- 1 ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 12 -2214/'17-(1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 2285/'17 - (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා -*[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 - 2300/'17 - (1), ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
දෙවන වටය.
ප්‍රශ්න අංක 1 - 885/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පානීය ජල සැපයුම : වවුනියාව දිස්ත්‍රික්කය
குடிநீர் விநியோகம் : வவுனியா மாவட்டம்
SUPPLY OF DRINKING WATER: VAVUNIYA DISTRICT

1250/'16

2. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (1):

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(අ) (i) 1983 වර්ෂය වනවිට වවුනියාව දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්ධය තත්ත්වය නිමවන තෙක් පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්ධය තත්ත්වය නිම වීමෙන් පසු, 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

නගරත් තිට්ටමිටල් මත්‍රුම් නීර්වලංගල් අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) 1983ආම් ආණ්ටලවිල් වවුණියා මාවට්ටත්තිල් තේසිය නීර් වලංගල් මත්‍රුම් වටිකාලමෙප්පුච් සපෙයිනාල් සුත්තිකරික්කප්පට්ට කුටිනීර් වලංගප් පට්ටිරුන්ත වීටුකළින් එණ්ණික්කෙ යාතු;

(ii) ඉන්‍රලවිල් සුත්තිකරික්කප්පට්ට කුටිනීර් වලංගප් පටුකින්‍ර වීටුකළින් එණ්ණික්කෙ යාතු;

(iii) 1983ආම් ආණ්ටින් පින්නර් යුත්ත නිලෙමෙ මුටිවටෙයුම් වරෙ කුටිනීර් වලංගුවතර්කාක ඔව්වෝර් ආණ්ටිර්කුම් අරසාංගම් ඔතුක්කිය මොත්තප් පණත්තොකෙ යාතු;

(iv) යුත්ත නිලෙමෙ මුටිවටෙන්ත පින්නර්, 2015ආම් ආණ්ටුවරෙ කුටිනීර් වලංගල් කරුත්තිට්ටඞ් කළුක්කාක අරසාංගම් ඔතුක්කිය මොත්තප් පණත්තොකෙ ආණ්ටු වාරියාක තනිත්තනියාක එව්වළවු;

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ අමාත්‍ය මණ්ඩලය කරන්න ඕනෑ මෙයයි. අද ඉඳලා නැවත එවැනි එකඟතාවකට එනවා නම්, අමාත්‍ය ධුර වැඩි කර ගන්න ඕනෑ කියලා අද ප්‍රකාශයක් කරලා, හෙට නැවත පාර්ලිමේන්තුවේදී ඒවැනි යෝජනාවක් සම්මත කර ගන්න. ඒක වෙනම දෙයක්. හැබැයි, තමුන්නාන්සේලාට අයිතියක් නැහැ සැප්තැම්බර් මාසයේ 02වැනි දා අවලංගු වූ එකකට, රික්තයක කාලයකුත් තියලා, 'අද ඉඳන් continue වෙනවා' කියලා කියන්න. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තුන්වැනි පාර්ශ්වයක් ගැන නොවෙයි, ව්‍යවස්ථාමය ප්‍රශ්නයක් තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. මම පාර්ශ්ව දෙකම කියපු කරුණු පිළිබඳව අවධානය යොමු කළා. ගරු අග්‍රාමාත්‍යතුමනි, පැහැදිලි කිරීමක් අවශ්‍යද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්. ගරු කථානායකතුමනි, මේ විවාදය පැවැත්වූ අවස්ථාවේ දී එක ලියවිල්ලයි මේ සභාවේ තිබුණේ. ඒ මම ඉදිරිපත් කරපු යෝජනාව. එය එක්සත් ජාතික පක්ෂය ගත යුතු පියවර පිළිබඳව ඉදිරිපත් කරපු යෝජනාව. වෙන කිසිම ලියවිල්ලක් මෙහි තිබුණේ නැහැ. ඒක මම කියන්නට ඕනෑ. මෙතැනට කිසිම ලියවිල්ලක් ඉදිරිපත් කළේ නැහැ; කිසිම ගිවිසුමක් ඉදිරිපත් කළේ නැහැ. කථාවල කියන්න ඇති ගිවිසුම් ගැන. එම ගිවිසුම ඉදිරිපත් කරන්න කියලා කිව්වාම මම කිව්වා, "ඉදිරිපත් කරන්න වුවමනාවක් නැහැ.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඔබතුමාට වුවමනා නම් ඒක පෙන්වන්නම්" කියලා. ඒ ගිවිසුම ලංකාවේ පළමුවැනි වතාවට සිදුවුණු දෙයක් නිසා ආරම්භයේ අපි කොහොමද වැඩ කටයුතු කරන්නේ කියන එක ගැන කරීකාවක් තිබුණා. මෙතැන පක්ෂ තුනක් තිබුණා. ආණ්ඩුව ඇති කළාට පස්සේ තුන්වැනි පක්ෂය එක්ක ඇති කර ගත්තු ගිවිසුමක් නැහැ. මෙතැන තිබෙන්නේ එකම එක යෝජනාවක් විතරයි. [බාධා කිරීමක්] මම ඒ වෙලාවේ කිව්වා. මොකද, මේ ආණ්ඩුව අවුරුද්දක් එකහමාරක් ගෙන යන්න බැහැ නේ. තවදුරට ගෙන යන්න බැහැ. ඉතින් ඉස්සෙල්ලාම - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට කථා කරන්න දෙන්න. ඔබතුමන්ලාට අවශ්‍ය නම් මම අවස්ථාව පසුව දෙන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ජාතික ආණ්ඩුවක් විධියට හරි මෙහෙම පක්ෂ එකතු වෙන අවස්ථාවලදී සම්ප්‍රදායයක් තිබෙනවා. ඒවා, කිසි විටෙක ලිඛිතව ඇති වුණේ නැහැ. ඔබතුමා මම මේ කියන දේ ගැන පොඩ්ඩක් බලන්න. 1916 එංගලන්තයේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඩේවිඩ් ලොයිඩ් ජෝජ් අගමැති වෙලා ඇති කරපු ජාතික ආණ්ඩුව ගැන කිසිම ලියවිල්ලක් නැහැ. [බාධා කිරීමක්] ඒකත් අවසන් කළාම මේ වාගේමයි කළේ. ඒක ව්‍යවස්ථාවේ එකක් නොවෙයි. 1931 - [බාධා කිරීම්] දන්නේ නැත්නම් වාඩි වෙන්න. 1931 රැම්සේ මැක්ඩොනල්ඩ් යටතේ තිබුණු ආණ්ඩුවේත් එහෙමයි. [බාධා කිරීම්] මෙතුමන්ලාට ඕනෑ නම්, එහි කොපියක් අරගෙන දෙන්න. 1940 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ වින්ස්ටන් චර්චිල් යටතේ ඇති වුණු සභාග ආණ්ඩුවට ඔක්කෝම පක්ෂ එකතු වුණා. මොකක්ද තිබුණේ කියලා බලන්න. මොන ලියවිල්ලක්වත් නැහැ. අපි අතර ගිවිසුමක් තිබුණා, ඒක අපි මේ සභාවට ඉදිරිපත් කළේ නැහැ. මොකද, ඒක පදනම් කරගෙන යන්නේ නැති නිසා. එවිවරයි අපි කිව්වේ. මේ සභාව තීරණය කළා, ඒ අනුවම යමු කියලා. ඉතිහාසය අනුවත් මෙවැනි ගිවිසුමක් ලිඛිතව තිබිලා නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා. [ඝෝෂා කිරීම්]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මහ ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන ලද අගමැතිතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරපු යෝජනාවේ 'එක්සත් ජාතික පක්ෂය ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇත' කියලා තිබෙනවා මිසක් 'ජාතික ආණ්ඩුවක් පිහිටුවූයේ කුමන පක්ෂයක් සමඟද' කියලා සඳහන් වෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒක නිසා - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි ඇත්ත කථා කරනකොට කටවිටිය භයද? [බාධා කිරීම්] ඔබතුමා සභාව නිහඬ කරලා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඉක්මනින් මෙය අවසන් කරන්න ඕනෑ. [බාධා කිරීම්] Order, please!

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ඒ නිසා අදාළ ගිවිසුම මෙතැනදී ඉදිරිපත් නොකළොත් අනාගතයේ දී සිද්ධ වෙන්නේ මොකක්ද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ කැබිනට් අමාත්‍යාධුර සංඛ්‍යාව 30කට සීමා කළා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. එම කරුණු ඉදිරිපත් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන්න තිබෙනවා. ඒ නිසා ඉක්මනින් අවසන් කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
එංගලන්තයේ එහෙම සීමාවක් නැහැ. ඒ නිසා එංගලන්තයේ ආදර්ශය මෙතැනට ගැලපෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මෙතැනදී ගිවිසුම ඉදිරිපත් කරන්නේ නැත්නම් අනාගත අගමැතිවරුන් මේක වැරදි පූර්වාදර්ශයක් කර ගන්නට ඉඩ තිබෙනවා. ජාතික ආණ්ඩුවක් තිබෙනවා කියා හුදු ප්‍රකාශයක් පමණක් කරලා, ඇමතිවරු 30දෙනෙක් වෙනුවට තමන්ට පාර්ලිමේන්තුව තුළ සාමාන්‍ය බහුතරය තිබෙන නිසා ඕනෑම ඇමතිවරුන් ගණනක් පත් කර ගැනීමට දැන් ලබාදෙන වැරදි අවස්ථාව පූර්වාදර්ශයක් කර ගැනීමේ අවදානමක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
මම කිව්වේ වෙන එකක්. එංගලන්තය ගැන කියලා කිව්වේ, ආදර්ශයක් හැටියට ලිඛිතව ක්‍රියා කරන්න වුවමනා නැහැ කියායි. ඒ කාලයේ අමාත්‍යාධුර එකසිය ගණනක් තිබුණා. මම ඒවා ගැන කථා කරන්නේ නැහැ. නමුත්, මෙවැනි ආණ්ඩුවක් ඇති කරන්න ලිඛිතව දැනුම් දෙන්න වුවමනා නැහැ. ඒ සම්ප්‍රදාය තමයි මෙතැනත් තිබෙන්නේ කියන එකයි ඉස්සෙල්ලා මම කිව්වේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, අපි දැන් මේක අවසන් කරන්න ඕනෑ. ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා මුල ඉඳලාම ඉල්ලපු නිසා අවස්ථාව ලබාදෙනවා. ඊට පස්සේ අපි ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. මේ කරුණ ගැනමද ඔබතුමා කථා කරන්නේ?

ගරු තාරක බාලසූරිය මහතා
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ඔව්, ගරු කථානායකතුමනි. අපි අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එංගලන්තයේ සම්ප්‍රදාය ගැන අපට කියාදීම පිළිබඳව. නමුත්, මෙතැන ගැටලුව විධියට තිබෙන්නේ මෙයයි. ගරු කථානායකතුමනි, මෙතැන ව්‍යාකූල තත්ත්වයක් තිබෙන නිසා තමයි අපි මේ ගැන අද තව දුරටත් සාකච්ඡා කරන්නේ. අවුරුදු 2ක් මේ ආණ්ඩුව පවත්වාගෙන යනවා කියලා තමයි කිව්වේ. "භය නැති අගමැති" නේ. ඒ නිසා ඔය ගිවිසුම නැවත අත්සන් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. මොකද, අපට ඒ සම්ප්‍රදාය කඩන්න ඕනෑ නැහැ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මෙම කාරණය පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාව දැනුවත් කරන්න කැමැතියි. මම ඊයේ පොරොන්දු වුණා, මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අදාළ විධියට පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනවා කියලා. ඒ අනුව මම ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයටත් කථා කළා. අද කරුණු පැහැදිලි කරන්න එතුමන්ලා එකඟ වුණා. මේ Agreement එක තව දුරටත් තිබෙනවා කියලා අදාළ පාර්ශ්වකරුවන් අද මේ සභාවේදී පැහැදිලි කළා. මේ පිළිබඳව තව ගැටලු තිබෙනවා නම් මට ඒවා ගැන සොයා බලන්න පුළුවන්. දැනට අදාළ පාර්ශ්ව තුනේම එකඟත්වයක් තිබෙනවා නම්, මට එතැනින් එහාට යන්න බැහැ. නමුත් මම සොයා බලන්නම්. ඔබතුමන්ලා කියපු කරුණු පිළිබඳවත් නීත්‍යානුකූලව මට යම් තීරණයක් ගන්න පුළුවන්ද කියලා මම සොයා බලන්නම්. බොහොම ස්තුතියි.

ඊළඟට, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු ඊ. සරවනපවන් මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා සිදුකළ හානිකර ප්‍රකාශය
சிறப்புரிமை: மாண்புமிகு சிவசக்தி ஆனந்தனின் பாதகமான கூற்று
PRIVILEGE: ADVERSE STATEMENT MADE BY HON. SIVASAKTHI ANANTHAN

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Hon. Speaker, during the Local Government Elections, the Hon. Sivasakthi Ananthan, Member of Parliament, made a statement that the TNA Members of Parliament have accepted a bribe of Rs. 20 million each from the Government in order to support the Budget of 2018. This was highlighted in all Tamil newspapers, electronic media, social media et cetera and all the parties made use of this statement for their election campaign, which resulted in adverse results substantially. So, since this is a Question of Privilege and further tarnishing the image of elected Members of Parliament, I kindly request you to take proper action against him. Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා, what is your point of Order?

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, that was a Privilege matter that the Hon.Saravanapavan raised. - [*Interruption*.] Sir, that was a Privilege matter.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will leave it at that. I cannot give you time. Under Standing Orders, he raised it. So, you cannot reply now.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please sit down. I asked you to sit down. Otherwise, I will get the mike disconnected.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please sit down! Otherwise, I will send you out.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[ඔලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Either you have to sit down or I will have to send you out of the Chamber. [*Interruption.*]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

[ඔලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Will you sit down? I am warning you for the third time. - [*Interruption.*] This is the third time I am telling you. Will you sit down or will you go out of the Chamber? [*Interruption.*] I am telling you, please sit down!

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Hon. Member raised a Question of Privilege. In that Question of Privilege, he made a complaint against another Member. Merely because he made a complaint, that Member cannot say that his name has been mentioned and start speaking. I am moving that whatever Hon. Sivasakthi Ananthan said in response to the Question of Privilege that was raised be expunged from Hansard.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, I will look into that.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
டாக்டர் எஸ்.எஸ். குணவர்தன சுதேச ஆயுர்வேத அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
DR. S.S. GUNAWARDANA INDIGENOUS AYURVEDA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சருக்கு அறிக்கை செய்யப்படு தற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Health, Nutrition and Indigenous Medicine for report.

පොතුවටවන මහා විහාරය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
பொத்துவடவன மகா விகாரை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
POTHUWATAWANA MAHA VIHARAYA FOUNDATION (INCORPORATION) BILL

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පොතුවටවන මහා විහාරය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයකින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

*විනා විවාදයකින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රශ්නය විමස

[ගරු කථානායකතුමා]

තත්ත්වයක් ඇති වෙනවා. මම ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් ඒ අවස්ථාවේ සඳහන් කළාම එතුමා ඒකට එකඟ වුණා. මුලින් අපි අදහස් කළේ මේ ඔක්කොම වාර්තා පරිවර්තනය කර ලැබෙයි කියා. නමුත් යම් හේතුවක් මත ඒ පරිවර්තනය ලැබීම ප්‍රමාද වුණා. ගරු ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් මේ පරිවර්තනය ලබා ගන්න ඊයේත් අපි කථා කළා. අඩු ගණනේ මූලික වාර්තාව හෝ පරිවර්තනය කර ඉක්මනින් ලබා දෙන්න එකඟ වුණා. එම නිසා අපි මෙතැනදී වාද විවාද කරන්නට අවශ්‍ය වෙන්නේ නැහැ. එතුමාට නීත්‍යානුකූල අයිතියක් තිබෙනවා, නොදන්නා භාෂාවෙන් තිබෙන වාර්තාවක් ගැන කථා නොකර සිටීමට.

ඒ වාගේම, මම නොවෙයි ඒ තීරණය ගත්තේ. මුළු සභාවම ඒකමතිකවයි ඒ තීරණය ගත්තේ. මේ විවාදය කල් දමන්නය කියා අණ්ඩු පක්ෂයෙන් මට කිසිම අවස්ථාවක බලපෑමක් කළේ නැත කියන එක මම වගකීමෙන් යුතුව මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි.

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී හදිසියේ කෙටි කාරණාවක් මතු කරන්නට කැමැතියි.

මේ වනවිට යාපනයේ සිට බණ්ඩාරවෙලට ගමන් කළ මගීන්ද ඇතුළුව, බණ්ඩාරවෙල සිට දියතලාවට ගමන් කළ බස් රථයක අභ්‍යන්තරයේ ඇති වුණු පිපිරීමක් නිසා එහි ගමන් ගත් සිංහල, මුස්ලිම්, දෙමළ ඇතුළු හැම ජන කොට්ඨාසයකටම අයත් මගීන් විශාල අනතුරකට භාජනය වී තිබෙනවා. යුද හමුදාවේත්, ගුවන් හමුදාවේත් අය එහි සිටි බව වාර්තා කරනවා. ප්‍රවෘත්ති රට පුරා ගමන් කරන නිසා, මේ බරපතළ තත්ත්වය ඇති වුණේ කොහොමද, කුමක් නිසාද කියන එක ගැන පැහැදිලි කරමින් රජය වහාම ප්‍රකාශයක් කරන ලෙස ඉල්ලා සිටිනවා. රට තුළ වැරදි ප්‍රචාරයක් ඇති වීම බලාගෙන ඉන්න එපා. එම නිසා දැනට මේ පිළිබඳව තිබෙන නිවැරදි තොරතුරු පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරන්නය කියා මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ඇහුම්කන් දීලායි මම මෙතැනට පැමිණියේ.

මේ සිද්ධියෙන් පස්සේ මම පළමුවෙන්ම නීතිය හා සාමය පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ඇහුවේ. කහගොල්ල අසළදී එම බස්රථයේ පිපිරීමක් ඇති වෙලා තිබුණා. ඒ අවස්ථාවේ සෝදිසි කර බලන විට සම්පූර්ණ පරීක්ෂණ අවසන් කර තිබුණේ නැහැ. ගරු ඇමතිතුමා මේ සභාවට ඇවිත් ඉන්නවා. යුද්ධ හමුදාවෙන් තමයි මූලික පරීක්ෂණ කර ගෙන ගියේත්. අන්තිමට වාර්තා වුණේ "ග්‍රෙනේඩ්" එකක් පුපුරා ඇති බවයි.

පසුව මම යුද හමුදාපති මහේෂ් සේනානායක මහත්මයාට කථා කළා. එතුමාත් කිව්වා, "ග්‍රෙනේඩ් එකක් කියලා තමයි හිතන්නේ, ඒ අනුව පරීක්ෂණ කටයුතු කරගෙන යනවා, යාපනයේ සිට පැමිණි කෙනෙකුගේ ගමන් මල්ලක තියෙන්න ඇති" කියලා. ඒ ගැන තවදුරටත් විභාග කරගෙන යනවා. ගරු නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාත් ඒ ගැන දැන් ඔබතුමන්ලා දැනුවත් කරාවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සාගල රත්නායක ඇමතිතුමා.

ගරු සාගල රත්නායක මහතා (තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - இளைஞர் அலுவல்கள், கருத்திட்ட முகாமைத்துவம் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Youth Affairs, Project Management and Southern Development)

ගරු කථානායකතුමනි, "ග්‍රෙනේඩ්" එකක් පිපිරිලා කියා තමයි ඒ සිදුවීම පිළිබඳ කළ මූලික පරීක්ෂණවලදී හෙළි වී තිබෙන්නේ. ඒ ගැන තවදුරටත් පරීක්ෂණ කරගෙන යනවා. රජයේ රස පරීක්ෂක ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා. එයින් පසුව ඊට වඩා අපිට ඒ ගැන ප්‍රතිඵල කියන්න පුළුවන් වෙයි. ඒ බස් එකේ ගමන් කළ මගියකුගේ ගමන් මල්ලක තිබුණු "ග්‍රෙනේඩ්" එකක් පිපිරිලා තමයි එහෙම දෙයක් වෙලා තිබෙන්නේ කියන එකයි දැනට විශ්වාස කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු යටතේ මෝටර් වාහන පනත යටතේ නියෝගය අනුමත කිරීම.

මෝටර් වාහන පනත: නියෝගය
மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதி
MOTOR TRAFFIC ACT: REGULATION

[2.02 pm]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Speaker, on behalf of the Minister of Transport and Civil Aviation, I move,

"That the Regulation made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Sections 21, 22, 23, 24 and 24A of the aforesaid Act and published in the Gazette Extraordinary No. 2032/36 of 18th August 2017, which was presented on 06.12.2017, be approved."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Ashok Abeysinghe, you may commence your speech.

[අ.භා. 2.03]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ ජනතාවට හා වාහන හිමියන්ට අවශ්‍ය සේවය ලබාදීම සඳහා ප්‍රකාශයට පත් කර ඇති 2017 අගෝස්තු 18 දිනැති අංක 2032/36 දරන නියෝගයට මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය අපි බලාපොරොත්තු **වනවා.** මෙයින් අපි බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම අපේ රටේ මෝටර් රථවාහන සඳහා තිබෙන අංක තහඩු සඳහා යම් නියාමනයක් ඇති කරලා, ඒ තුළින් මහ ජනතාවට අවශ්‍ය සේවය ලබාදීමයි. ලංකාවේ දැනට ලියා පදිංචි වාහන හැත්තෑඑක්ලක්ෂයක් පමණ තිබෙනවා. සාමාන්‍යයෙන් මෙම වාහන සඳහා දිනපතා අංක තහඩු විශාල ප්‍රමාණයක් නිකුත් කරනවා. 2017 වසරේ පමණක් මෙම අංක තහඩු 12,16,805ක් නිකුත් වී තිබෙනවා. සාමාන්‍යයෙන් මසකට අංක තහඩු ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් නිකුත් වෙනවා. මෙම අංක තහඩුවල යම්කිසි ප්‍රමිතියක් තිබෙනවා. 2013 ඔක්තෝබර් 24වැනි දින නිකුත් කරන ලද අංක 1833/27 දරන ගැසට් පත්‍රය මඟින් විශේෂයෙන්ම 280 mm x 180 mm හා 280 mm x 200 mm ප්‍රමාණයේ කහ පැහැති ප්‍රතිපුනරාවර්තන අංක තහඩු සඳහා යම්කිසි මිලක් නියම කර තිබුණා. නමුත්, සුදු පැහැති ඉදිරිපස අංක තහඩු සඳහා මිලක් නියම වෙලා තිබුණේ නැහැ. ඉදිරියෙන් එන වාහන පිළිබඳ දත්ත වාහනය තුළට ලබා ගැනීමට නවීන වාහනවල ඉදිරිපස සන්නිවේදක උපකරණ - sensors- තිබෙනවා. දැනට ඉදිරිපස සුදු පැහැති අංක තහඩුව මිලිමීටර 520 x 110 ප්‍රමාණයෙන් තමයි තිබෙන්නේ. එම අංක තහඩුව සවි කළාම නවීන වාහනවල සන්නිවේදක උපකරණය වැහෙනවා. එවිට අවශ්‍ය දත්ත වාහනය තුළට ලබා ගැනීමට හැකියාව ලැබෙන්නේ නැහැ. එම නිසා නවීන වාහනවල මිලිමීටර 280 x180 සහ මිලිමීටර 280 x 200 වැනි සුදු පැහැති ඉදිරිපස අංක තහඩු නිකුත් කරන ලෙස ඉල්ලීමක් තිබුණා. එසේ කිරීමෙන් එම වාහන හිමියන්ගේ අවශ්‍යතාව ඉටු වෙන බව සඳහන් කරලා තිබුණා. එම නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව එවැනි අංක තහඩු නිකුත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා තමයි අපි අද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නේ. සාමාන්‍යයෙන් එවැනි අංක තහඩුවක් රුපියල් 1,500 බැගින් මිල නියම කරලා තිබෙනවා. ඒ සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තු වෙනවා.

2013 වසරේ පිටු පස මිලිමීටර 280 x 180 ප්‍රමාණයේ සහ මිලිමීටර 280 x 200 ප්‍රමාණයේ අංක තහඩුවලට මිලක් නියම කරලා තිබුණත්, ඉදිරිපස අංක තහඩු සඳහා මිලක් නියම වෙලා තිබුණේ නැහැ. අපි අද මෝටර් වාහන පනත යටතේ නියෝගය අනුමත කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ඉදිරිපස අංක තහඩු සඳහා වන ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවේ අනුමත කිරීමයි. කෙසේ වෙතත්, අපි -මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව- මේ වන විට වැඩ කටයුතු රාශියක් කරගෙන යනවා. මෙම දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් වසරකට රුපියල් බිලියන 5ක වාගේ මුදලක් රජයේ භාණ්ඩාගාරයට ලබා දෙනවා. නව රජය බලයට පත් වුණාට පසුව, අපි 2016 වසරේදී "e-Motoring" ව්‍යාපෘතිය හරහා මෙම ආයතනයේ වැඩ කටයුතු යම් කිසි ක්‍රමානුකූලභාවයකට පත් කිරීමට ක්‍රියා කරලා තිබෙනවා. "e-Motoring" ව්‍යාපෘතිය තුළින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තිබෙන විශාල ලිපිගොනු ප්‍රමාණය අඩු කරලා, ඒ සියල්ල පරිගණකගත කරලා, පරිගණක තුළින් වාහන හිමියන්ට, පාරිභෝගිකයන්ට අවශ්‍ය සහන සලසන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා රුපියල් මිලියන 500කට වැඩි මුදලක් අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා.

2018 වසරේ මෙම "e-Motoring" ව්‍යාපෘතිය ආරම්භ කරලා, හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කරලා ඒ තුළින් ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අපි 2017 වසරේ ටෙන්ඩර් කැඳවීමක් කළා. ඒ වාගේම මේ මස අවසානයේ හෝ ලබන මාසයේ මුල් සතියේදී 2018 වසරේ දෙවැනි අදියරට ටෙන්ඩර් කැඳවන්න අපි බලාපොරොත්තු වෙනවා. එයින් අපි බලාපොරොත්තු වන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව තිබෙන සියලුම දත්ත පරිගණකගත කරලා, මේ රටේ ජනතාවට ප්‍රමාදයකින් තොරව තමන්ගේ අවශ්‍යතා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළින් ඉෂ්ට සිද්ධ කර දීමයි. ඒ වාගේම රියැදුරු බලපත්‍ර නවීකරණය කර නිකුත් කිරීමට අවශ්‍ය වෙලා තිබෙනවා. මම හිතන විධියට පැරණි රියැදුරු බලපත්‍රයේ කාලය 2017-2018 වන විට අවසන් වෙනවා. එය නැවත අලුත් කිරීම අවශ්‍ය වෙනවා. වෙනත් දියුණු රටවල තිබෙන පරිදි රියැදුරු බලපත්‍රයට අදාළව ලකුණු ක්‍රමයක් දීලා යම් කිසි වැරැද්දක් කළාම, එම ලකුණු අඩුවීමෙන් යන ක්‍රමයක් සකස් කරන්න අපි මෙවර බලාපොරොත්තු වෙනවා. එසේ නව රියැදුරු බලපත්‍රය හඳුන්වා දීමේ ක්‍රමවේදය ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගන්න අප බලාපොරොත්තු වෙනවා.

අද දින මෝටර් වාහන පනත යටතේ මෙම නියෝගය ඉදිරිපත් කිරීම තුළින් අපි බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම වාහන හිමියන්ගේ වාහනවල නොමිලර තහඩුවලට අවශ්‍ය ප්‍රමිතිය ලබා දීමයි. කෙසේ වෙතත්, අපේ රටේ සිටින හුඟාක් ජනතාවගේ අදහසක් තිබෙනවා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ විශාල අක්‍රමිකතා සිදු වෙනවා කියලා. මෙම අක්‍රමිකතා නැවැත්වීම සඳහා තමයි අපි "e-Motoring" ව්‍යාපෘතිය ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කරලා ජනතාවට අවශ්‍ය සේවය ලබා දීමට තමයි අප බලාපොරොත්තු වෙන්නේ.

අපේ රටේ දැනට සිටින සමස්ත පවුල් ප්‍රමාණය පනස්දෙලක්ෂයක් වෙනවා. නමුත් වාහන හැත්තෑඑක්ලක්ෂයක් ලියා පදිංචි කරලා තිබෙනවා. පවුල් පනස්දෙලක්ෂයක් සිටින මේ රටේ වාහන හැත්තෑඑක්ලක්ෂයක් ලියා පදිංචි කරලා තිබෙනවා. මෙයින් මෝටර්සයිකල් තිස්නවලක්ෂයක් තිබෙනවා. ත්‍රී-රෝද රථ එකොළොස්ලක්ෂ පනස්දහසක් තිබෙනවා. කුඩා මෝටර් රථ, සාමාන්‍ය මෝටර් රථ හත්ලක්ෂ පනස්දහසක් පමණ තිබෙනවා. ඒ වාගේම ද්විත්ව කාර්ය වාහන හාරලක්ෂයක් තිබෙනවා. ට්‍රැක්ටර්, ලොරි හාරලක්ෂයක් බැගින් තිබෙනවා. ඒ වාගේම ඩීසල් මෝටර් රථ දහතුන් ලක්ෂයක් තිබෙනවා. මේ විධියට තමයි අපේ රටේ තිබෙන වාහන හැත්තෑඑක්ලක්ෂයක ප්‍රමාණය සෑදී තිබෙන්නේ. ඒ නිසා මෝටර්සයිකල්වලට වෙනම අංක තහඩුත්, මෝටර් රථවලට වෙනම අංක තහඩුත් -යම් යම් මිලිමීටර ප්‍රමාණය අනුව- සකස් කළ යුතුව තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වනවා,

[ගරු අශෝක් අබේසිංහ මහතා]

මෝටර් රථ හිමියන්ට අවශ්‍ය ඒ සහනය සැලසීම සඳහා අප විසින් අද ඉදිරිපත් කරන ලද මෙම නියෝගය මේ උත්තරීතර පාර්ලිමේන්තුව අද දින අනුමත කරාවි කියා.

විශේෂයෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී අප රටේ මහ ජනතාවට සලසනු ලබන සේවය පහසු කිරීම සඳහා අප ආරම්භ කරන e-Motoring ව්‍යාපෘතිය හැකි ඉක්මනින් අවසන් කරලා මේ රටේ ජනතාවට ඒ පහසුකමත් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. මා මුලින් කිව්වා වාගේ රියදුරු බලපත්‍රය නවීකරණය කරලා, එය ලකුණු ලබා දීමේ ක්‍රමයට ඇතුළත් කරලා, ලෝකයේ දියුණු රටවල තිබෙන රියදුරු බලපත්‍රවලට සමාන රියදුරු බලපත්‍රයක් හඳුන්වා දීමත් මේ වසර තුළ කරන්න අප බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින්, අද මෙම නියෝගය සඳහා මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.12]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලද නියෝගයේ කරුණුවලට අමතරව වර්තමාන ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන්න මා කැමැතියි. ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කතාවේදීත් සඳහන් කළා, වර්තමානයේ ලංකාවේ මෝටර් රථ, මෝටර්සයිකල් ඇතුළුව වාහන 71,00,000ක් ලියා පදිංචි වෙලා තිබෙන බව. සෑම අතින්ම ගත්තාම ඉතාම විශාල වාහන ප්‍රමාණයක් මේ රටේ වාර්ෂිකව ලියා පදිංචි වෙනවා. කෝටි දෙකක ජනගහනය අත අද වාහන 71,00,000ක් තිබෙන මට්ටමට මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ යම් පමණක සාධනීය වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇතිවන දියුණුවත් එක්ක කොළඹ වාගේම, තදාසන්න ප්‍රදේශවල වාගේම අනෙක් ප්‍රදේශවලත් නාගරීකරණය හරහා ඇතිවන වාහන තදබදය පිළිබඳ ගැටලු ප්‍රමාණය උග්‍ර වෙමින් පවතින බව අප සෑම කෙනෙකුටම බොහොම පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ ඇතිවන වාහන තදබදය වළක්වා ලන්නට කටයුතු කිරීමට සෑම ආණ්ඩුවකටම වගකීමක් තිබෙනවා කියා. ඒ වාගේම මේ රටේ අධික වාහන සංඛ්‍යාවක් ලියා පදිංචි වීම හරහා අධික වාහන සංඛ්‍යාවක් මෙරටට ආනයනය කිරීම හරහා ඇතිවන මාර්ග අනතුරු වළක්වා ගෙන වඩාත් සාධනීය ප්‍රවාහන සේවයක් මේ රටේ ජනතාවට ලබා දීමට සෑම ආණ්ඩුවකටම වගකීමක් තිබෙනවා. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පසු ගිය කාලය පුරාවටම ඇති වූ වාහන තදබදය පිළිබඳව අපි සෑම කෙනෙක්ම බොහොම පැහැදිලිව දන්නවා. එක් පැත්තකින් පෞද්ගලික වාහන -රෝද 4 වාහනත් ඇතුළුව මෝටර්සයිකල්, ත්‍රී විලර් ආදී වාහන- විශාල සංඛ්‍යාවක් මේ රටේ ලියා පදිංචි කර පෞද්ගලික පරිහරණයට එකතු කර තිබෙනවා. ඒක සතුටට කරුණක්. හැබැයි අනෙක් පැත්තෙන් කනගාටුවට කාරණය තමයි, ඒ හා සමගාමීව පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි බොහොම පැහැදිලි අවගමනයක් දකින්න ලැබීම. මේ රටේ පොදු ප්‍රවාහන බස් රථ ප්‍රමාණය අඩු වෙනවා. දුම්රිය සේවාව මේ කාලයට අවශ්‍ය පරිදි දියුණු වන්නේ නැහැ. පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි ඇති වන මේ අවගමනය නිසා ජනතාව වැඩිවැඩියෙන් පෞද්ගලික වාහන පරිහරණයට කැමැත්ත දක්වනවා. මෙහිදී මතුවන ගැටලුව තමයි එක් පැත්තකින් දැඩි මාර්ග තදබදයක් ඇති වීම සහ අනෙක් පැත්තෙන් අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වීම.

පසුගිය කාලයේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ අප දැකපු වැදගත්ම වර්ධනය තමයි, අධිවේගී මාර්ගය ඇති වුණාට පසුව අධිවේගී මාර්ගවල විශාල බස් රථ ප්‍රමාණයක් ධාවනය වන්න පටන් ගැනීම. මේ නිසා ප්‍රධාන නගර අතර ගමන් කිරීමේදී ජනතාව තමන්ගේ පෞද්ගලික වාහනය තියලා අධිවේගී මාර්ගවල ධාවනය කෙරෙන බස්රථවල ගමන් කරන්න පටන් ගත්තා. අපි ඉතාම සන්තෝෂයෙන් සිහිපත් කරනවා, ගාල්ල කොළඹ අතර ගමන් -ගමන් කාලය පැයක වාගේ කාලයක් වීම තුළ- ඉතාම පහසු වූ බව. අපටත් අධිවේගී මාර්ග හරහා පොදු ප්‍රවාහන මාධ්‍ය පාවිච්චි කරන්න පුළුවන් මට්ටමේ ඉතාම හොඳ සේවාවක් ඇති වුණා. හැබැයි පසුගිය කාලය පුරාවටම අනෙකුත් මාර්ගවල, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ලංගම සහ අනෙකුත් සේවාවන්හි සාධනීය වර්ධනයක් සිදු වුණේ නැති බව බොහොම පැහැදිලියි. ඒ නිසා තමයි විශේෂයෙන්ම මොරටුව සරසවිය මුල් කරගෙන JICA ආයතනයේ ආධාර සහිතව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණේ. ව්‍යාපෘති වාර්තාවත් භාර දී තිබෙනවා. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන ඒ ව්‍යාපෘතිය ඉතාම ඉක්මනින් මේ රටේ ක්‍රියාවට නැංවිය යුතුයැයි අපි යෝජනා කරනවා. ඒ හරහා වසර 2020දී වාගේම, වසර 2025-2035 ද ඇතුළුව ඉදිරි වසර 20ක කාලය වෙනුවෙන් ලංකාවේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල - විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල- ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් බොහොම පැහැදිලි සැලසුම් කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා හරහා ඔවුන් යෝජනා කරන ප්‍රධානතම කාරණයක් තමයි අද කොළඹට කේන්ද්‍රගත වෙලා තිබෙන ආර්ථික මධ්‍යස්ථානය සහ කොළඹට කේන්ද්‍රගත වෙලා තිබෙන මේ රටේ පරිපාලන කේන්ද්‍රස්ථානය ඉක්මනින්ම වෙනස් ස්ථානවලට විස්ථාපනය කළ යුතුයි කියන එක. අපි දන්නවා, දැනට ඒ හරහා වැඩ කටයුතු කීපයක් සිදු වන බව.

ශ්‍රී ජයවර්ධනපුරකෝට්ටේ අග නගරයට කාර්යාල විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙනවා. හැබැයි, ඉන් පරිබාහිරව උපනගර දියුණු කිරීමේ වැඩසටහන ශක්තිමත්ව සිදු වන්නේ නැති බව අප සඳහන් කරන්න අවශ්‍යයි. අප දකින එකම දේ තමයි එය. අපේ ආණ්ඩුව කාලයේ ආරම්භ කරපු අධිවේගී මාර්ගය විවෘත කිරීමෙන් පසුව ගාල්ල-කොළඹ නගර ආශ්‍රිතව මේ රටේ ප්‍රධානම මධ්‍යස්ථානයක් හැටියට කොට්ටාව උපනගරය දියුණු කරන්න වැඩසටහනක් ක්‍රියාත්මක වුණා. එහි සිට දුම්රිය ස්ථානය, අධිවේගී මාර්ග පිවිසුම වාගේම ඉදිරියේදී ඇති කිරීමට යෝජිත Mass Rapid Transit System එක එහෙම නැත්නම් monorail system එක කොට්ටාව හරහා කොළඹ නගරයට ඇතුළු කරන්න ව්‍යාපෘති යෝජනාවක් තිබෙනවා. හැබැයි, අපට ඒවා පෙනෙන්නට නැහැ. අපි දැක්කා, පසුගිය කාලයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සඳහන් කරලා තිබෙනවා, උප නගර සංවර්ධන සැලැස්ම වාගේම කොළඹ නගරයේ තදාසන්න ප්‍රදේශවල සහ ප්‍රධාන උප නගර අතර මේ monorail system එක එහෙම නැත්නම් කුඩා දුම්රිය මාර්ග පද්ධතියක් සකස් කිරීම වැනි කාරණා. කැලණියෙන් වේවා, කොට්ටාවෙන් වේවා, මොරටුවෙන් වේවා, පානදුරෙන් වේවා ඒ එන ජනතාව කොළඹට යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන්නට අවශ්‍යයි. එහෙම නැත්නම් කොළඹ නගරයේ - අගනගරයේ- ඇතිවන වාහන තදබදය ඉතාම ඉක්මනින් ඉහළ යනවා.

පසුගිය කාල වකවානුව පුරාවට ප්‍රවාහන විශේෂඥයන් සඳහන් කරලා තිබුණා, මෝටර් රථයකින් කොළඹ නගරයේ ගමන් කිරීමේදී ධාවන වේගය පැයට කිලෝමීටර් 12, 13 දක්වා අඩුවෙලා තිබෙන බව. මේ තත්ත්වය ඉදිරියටත් පැවතුණොත්, ඊට විසඳුම් ලබා නොදුන්නොත් 2020 වර්ෂය වන විට කොළඹ ධාවනය වන වාහනයක වේගය පැයට කිලෝමීටර 8ක්, 6ක් දක්වා අඩුවෙන්නට පුළුවන් බව සඳහන් කරලා තිබෙනවා. ඒක ඉතාම නරක

තත්ත්වයක්. ගමන් කරන්නේ පැයට කිලෝමීටර 5ක්, 6ක් නම්, ඒ හරහා විශාල වශයෙන් කාලය සහ ශ්‍රමය අපතේ යාමක් සිදු වෙනවා; ඒ වාගේම ඉන්ධන පිරිවැය පැත්තෙන් බැලුවොත් අතිවිශාල ඉන්ධන ප්‍රමාණයක් දහනය වෙනවා. ඒ නිසා මාර්ග පුළුල් කිරීමේ ක්‍රමවේද අවශ්‍යයි. පසුගිය කාලයේ අපි දැක්කා, පොදු ප්‍රවාහන පද්ධතිය වෙනුවෙන් කරන කටයුත්තක්. උදේ වරුවේ සහ හවස් වරුවේ බස්රථ සඳහා පමණක් මාර්ගයේ කොටසක් වෙන් කරලා - Bus Lane - ප්‍රමුඛතාව ලබාදීලා තිබුණා. බස් රථ ධාවනය සඳහා ප්‍රමුඛතා මං තීරුවක් හදුන්වා දීලා තිබුණා. අපි ඒක අගය කරනවා. ඒක හොඳ කටයුත්තක්. අපි දැක්කා, ඒ කාල වේලාව තුළ බස් රථවල ගමනාගමනය කලින් තිබුණාට වඩා යම්කිසි ප්‍රමාණයකින් වේගයේ වැඩිවීමක් සිදුවෙලා තිබෙන බව. අවස්ථා කිහිපයකදී මේ වාගේ කටයුතු කිහිපයක් ආරම්භ කළා. අපි දැක්කා, මොරටුව නගරයෙන් ආරම්භ කරලා කොළඹ නගරයට ඇතුළුවීමට පොදු ප්‍රවාහන සැලැස්මක් තිබූ බව. කාර් රථ ගාල් කරලා - park - කරලා එතැන් සිට කොළඹට එන්න ප්‍රවාහන සේවා සැකසුවා. හැබැයි, අඛණ්ඩව මේවා ගැන පසුවිපරමක් තිබුණේ නැති නිසා වසරක් යනකොට ඒ වැඩසටහන් අක්‍රිය වුණා.

අද කොළඹට ඉදිරිපත් කරලා තිබෙන බස් ප්‍රමුඛතා මං තීරු ක්‍රමය තුළත් අපි දකිනවා, ඒ කටයුත්ත ආරම්භ කරපු අවස්ථාවේදී තිබුණු ජවය දැන් නැති බව. උදේ වරුවට පටන්ගත් මේ ප්‍රමුඛතා මං තීරු ක්‍රමය පළවෙනි මාස දෙකේ තිබුණා. හැබැයි, මාස කිහිපයක් ගතවන කොට ප්‍රමුඛතා මං තීරුවේ ගමන් කරන්නේ බස් රථ පමණක් නොවෙයි. කාර් රථ, ලොරි රථ සහ අනිකුත් සියලු රථ ප්‍රමුඛතා මං තීරුවේ ගමන් කරනවා. ඒ නිසා මේ වෙනුවෙන් අඛණ්ඩව කැප වෙන වැඩ පිළිවෙළක් සහ අඛණ්ඩව මේ පිළිබඳව පසු විපරම් කරන යන්ත්‍රණයක් අවශ්‍යයි කියා අපි යෝජනා කරනවා. එහෙම කළේ නැත්නම් ඊළඟ වසර වෙනකොට - ලංකාවේ දැනට වාහන ලියාපදිංචි කිරීමේ වේගයත් සමඟ- අතිවිශාල වාහන ප්‍රමාණයක් මේ රටට පැමිණීමත් සමඟ කොළඹ නගරයේ වාහන තදබදය ඉතා අධික ලෙස වැඩිවෙන බව කියන්නට අවශ්‍යයි.

මේ හා බැඳුණු ඉතාම වැදගත් කාරණය තමයි ලංකාවට ගෙනෙන මේ අතිවිශාල වාහන ප්‍රමාණයත් සමඟින් මාර්ග අනතුරුවල පැහැදිලි වැඩිවීමක් වුණා කියන කාරණය. සෑම දවසකම රූපවාහිනියේ සෑම channel එකකම වාගේ ප්‍රවෘත්තිවලින් අතිවිශාල ප්‍රමාණයක මාර්ග අනතුරු පිළිබඳව පෙන්වනවා. මේ මාර්ග අනතුරු නිසා අතිවිශාල ජීවිත සංඛ්‍යාවක් අපේ රටට අහිමි වෙනවා. ඒ සෑම ජීවිතයක්ම වටිනවා. නමුත් ඛේදනීයම කාරණය වන්නේ මාර්ග අනතුරුවලින් වැඩියෙන්ම අපේ රටට අහිමි වෙන්නේ රටේ ජීවනාලිය බඳු ඉතාම තරුණ සහ මැදි වයසේ ජීවිත වීම. පසුගිය කාල වකවානුව පුරා අපි දැක්කා, මේ අනතුරුවලින් මිය යන සහ සදාකාලික -පූර්ණකාලීන- ආබාධිත තත්ත්වයට පත්වුණු අතිවිශාල පිරිසක් ඉන්නා බව. හැබැයි, මේ අනතුරු පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙන කාරණය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනතුරුවලින් මිය යන සංඛ්‍යාව නාගරික ප්‍රදේශවල යම් පමණකට අඩුයි කියන එක. ඒකට හේතු දෙකක් තිබෙනවා. එකක් තමයි කොළඹ ඇතුළු නාගරික ප්‍රදේශවල වේගයෙන් වාහන ධාවනය කරන්න බැහැ. වේගයෙන් වාහන ධාවනය කරන්න බැරි නිසා සිදුවෙන අනතුරෙන් වන හානිය අඩුයි. වාහන වේගයෙන් යන්නේ නැති නිසා අනතුරුවලින් වෙන මරණීය අනතුරු ප්‍රමාණය සහ ඉතාම දරුණු අනතුරු ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා.

අනික් පැත්තෙන් බැලුවොත්, කොළඹ සහ නාගරික ප්‍රදේශවල අනතුර සිදුවුණාට පසු ගෙනියන්නට පුළුවන් රෝහල් තිබෙනවා; ඒ වාගේම එම ස්ථානවල හදිසි ප්‍රතිකාර ඒකක ඉතාම ශක්තිමත්ව තිබෙනවා. ඒ නිසා මාර්ග අනතුරු නිසා සිදුවන මරණ සංඛ්‍යාව සහ අනතුරු සංඛ්‍යාව පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව පෙනෙන කාරණය තමයි, නාගරික ප්‍රදේශවල දරුණු අනතුරු අඩුයි කියන කාරණය. සමහර විට ප්‍රවාහන අපහසුතා නිසා සහ ළඟ පහසුකම් සහිත රෝහලක් නොමැතිවීම කියන කරුණු නිසාත් ජීවිත හානි විශාල ප්‍රමාණයක් වෙනවා. ඒ නිසා මේ ප්‍රතිඵල හරහා අපට පෙන්වන කාරණය තමයි, නාගරික ප්‍රදේශවලින් පරිබාහිරව මෙවැනි අනතුරු වඩාත් සිදුවන ස්ථාන පිළිබඳ අවධානය යොමු කරලා, රෝහල් ආශ්‍රිතව හදිසි ප්‍රතිකාර ඒකක ඇති කරන්නට අවශ්‍යයි කියන කාරණය. එහෙම හදිසි ප්‍රතිකාර ඒකක ඇති කළොත්, ජීවිත විශාල ප්‍රමාණයක් බේරාගන්න පුළුවන් වනවා. ඒක අත් දැකීමෙන් අපි දන්නවා.

ගාල්ල ප්‍රදේශයේ කරාපිටිය රෝහලට අනුබද්ධිතව හදිසි ප්‍රතිකාර ඒකකයක් ස්ථාපනය කළා. ඒ හදිසි ප්‍රතිකාර ඒකකයට මාර්ග අනතුරුවලින් පමණක් නොවෙයි හෘදය අකරණීය සහ පාර්ශ්වික ආඝාතය වැනි හදිසියේ ඇතිවන ආබාධ තත්ත්වයන්ට ලක්වෙලා රෝගීන් දහස් ගණනක් ගෙන එනවා. මේ වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම හරහා ඒ රෝගීන් සියලුදෙනාගේම ජීවිත බේරා ගන්නට පුළුවන් පසුතලයක් සැකසුණා. ඒ නිසා අපි සමගාමීව එක් පැත්තකින් මාර්ග අනතුරු අඩු කර ගැනීම පිළිබඳ අවධානය යොමු කරන්න අවශ්‍යයි; අනෙක් පැත්තෙන් මාර්ග අනතුරු සිදු වෙන රෝගීන්ට හදිසි ප්‍රතිකාර ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කරන්න අවශ්‍යයි. ඒ අර්ථයෙන් ගත්තාම, පසුගිය කාලයේ තදාසන්න ප්‍රදේශවල -කොළඹ සහ අර්ධ නාගරික ප්‍රදේශවල- හදිසි ගිලන් රථ සේවාවක් ආරම්භ කළා. අප එය අගය කරන්න අවශ්‍යයි. ඒක හොඳ කාරණයක්. මේ ආණ්ඩුවෙන් විශාල ලෙස කරපු අකටයුතුකම්, මේ රටේ ආර්ථිකයට කරපු හානි විශාල ප්‍රමාණයක් තිබුණා. හැබැයි, මේ ආණ්ඩුව කරපු එක හොඳ කාරණයක් තමයි හදිසි අනතුරුවලින් සහ හදිසි ප්‍රතිකාර වෙනුවෙන් හදිසි ගිලන්රථ සේවාවක් - ambulance service - ආරම්භ කිරීම. ඒ හරහා රෝගී ජීවිත විශාල සංඛ්‍යාවක් බේරා ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මාර්ග තදබදය පිළිබඳ කාරණයේදී ආණ්ඩුව මේ සඳහා මීට වඩා සක්‍රීයව දායකත්වය ලබා දෙන්නට අවශ්‍යයි කියලා මම යෝජනා කරනවා. එහෙම නොවුණොත් අතිවිශාල ජීවිත ප්‍රමාණයක් අහිමි වෙන්න ඉඩ තිබෙනවා. ඊට අමතරව, මාර්ග තදබදය හරහා මේ රටේ ජනතාවට විශාල කාල ප්‍රමාණයක් අහිමි වනවා; ඉන්ධන පැත්තෙන් අතිවිශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. පසුගිය කාලයේ -අපේ ආණ්ඩුව කාලයේ- ප්‍රවාහන ක්ෂේත්‍රයට සමගාමීව මේ රටේ ඉතා සාධනීය වෙනස්කම් කිහිපයක් සිදු කළා. එහි ප්‍රධානම කාරණය, අධිවේගී මාර්ග පද්ධතියක් හරහා මේ රටේ විවිධ ප්‍රදේශ යා කරන්න උත්සාහ කිරීමයි. ඒ කාර්යය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නම් මේ අධිවේගී මාර්ග හා සම්බන්ධ කරලා මාර්ගයට ඉහළින් ගමන් කරන monorail system එකක්, එහෙම නැත්නම් පොදු ප්‍රවාහන පද්ධතියක් දියුණු කරන්න කියලා මම යෝජනා කරනවා. බස් වෙනුවෙන්, දුම්රිය වෙනුවෙන් කරන රජයේ ආයෝජනය සාධනීය නොවන බව බොහොම පැහැදිලියි. එම නිසා පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න අවශ්‍ය ආයෝජන කරන ලෙසට අපි ආණ්ඩුවට යෝජනා කරනවා. එහෙම කළොත් තමයි මේ රටේ ඇතිවන ප්‍රවාහන අර්බුදය ඉදිරි කාලයේදී නැති කරන්න පුළුවන් වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු අශෝක් අබේසිංහ මහතා
மாண்புமிகு அசோக் அபேசிங்க ர்)
(The Hon. Ashok Abeysinghe)

අපි දැනටමත් විදේශ ආයෝජකයන් සමඟ එකතු වෙලා එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න වැඩ පටන්ගෙන තිබෙනවා. මූලික වැඩකටයුතු අවසන් කරලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔබතුමන්ලා කරනවා නම් හොඳයි. හැබැයි, තවම කිසිවක් පෙනෙන්න නම් නැහැ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මාලබේ සිට කොල්ලුපිටිය දක්වා ආරම්භ කර තිබෙනවා. එය කරන්නේ විදේශ ආයෝජනයත් සමඟ.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මට හිතෙන්නේ අපට තමයි ඒවා විවෘත කරන්න වෙන්නේ. ඉක්මනින් කරන්න. නැත්නම් ඔබතුමන්ලාට මුල් ගල තියලා නිකම් ඉන්න වෙයි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔබතුමන්ලාට විවෘත කරන්න වෙන්නේ නැහැ. මොකද, මේක 2023දී විවෘත කරනවා. ඔබතුමන්ලාට 2035 වනතෙක් ඉන්න වෙනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඒ බව පෙනෙනවා, මැතිවරණ ප්‍රතිඵලවලින්.

[අ.භා. 2.24]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කර ඇති නියෝගය පිළිබඳව අද දින පැවැත්වෙන විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාවක් ලබා දීම ගැන සියලුදෙනාටම ස්තුතිවන්ත වනවා.

අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළ පරිදි අද නවීන තාක්ෂණයෙන් යුත් මෝටර් වාහනවලට සරිලන පරිදි 2000 ආරම්භ කරන ලද මෙම පනතට අලුත් වගන්ති ගෙනැල්ලා, මෝටර් රථ වාහන නියාමනය කිරීමට, ව්‍යාජ අංක තහඩු මඟින් කරන අපරාධ පාලනය කිරීමට සහ ඒ තුළින් ජනතාවට සහනයක් ලබා දීමට තමයි රජය බලාපොරොත්තු වෙන්නේ. මහාමාර්ග සහ ප්‍රවාහනය කියන්නේ අපේ රටේ ඉතාම වැදගත් අංශයක් බව අපි දන්නවා. මෙහි සමාජයීය හා ආර්ථික වශයෙන් ඇති වැදගත්කම හිතලා තමයි මේ ආණ්ඩුව මෙන්ම පසුගිය ආණ්ඩු මේ අංශය සඳහා විශාල මුදලක් ආයෝජනය කරලා, ඉස්සරහට අරගෙන ගිහිල්ලා තිබෙන්නේ. අධිවේගී මාර්ග, මහාමාර්ග මෙන්ම දුම්රිය, බස් රථ වැනි දේවල්වලට රජය විසින් වාර්ෂිකව විශාල මුදලක් ආයෝජනය කරනවා; වැය කරනවා. රජය ඒ තුළින් බලාපොරොත්තු වනවා, ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලබා දෙන්න. මේ රජය විතරක් නොවෙයි, පසුගිය රජයන් කීපයක්ම මේ අංශය පිළිබඳව අවධානය යොමු කරලා, ඉදිරියට ගෙන ගියා. නමුත් කනගාටුවට කරුණ තමයි, විනයක් නැති, වැඩිම මාර්ග අනතුරු සහිත, විශාල ප්‍රමාණයකින් මිනිස් ජීවිත නැති වන අංශයක් හැටියට අපේ ප්‍රවාහන සේවය අද වන කොට ලෝකයේම නම් දරලා තිබෙනවා. අපට මේ ප්‍රශ්නය මුදල් මතින් පමණක්ම විසඳන්න බැහැ.

අපි විශේෂයෙන්ම දේශපාලන වාසි පසෙකලා ජනතාව දැනුවත් කළ යුතුයි. අපි විනය ගරුක ජනතාවක් බිහි කරලා, රියැදුරන්ට පුහුණුවක් දීලා, මහාමාර්ගවල ගමන් කරන කොට ආත්මාර්ථකාමී වෙන්නේ නැතුව -තමන් ගැනම සිතන්නේ නැතුව - පොදු සමාජය ගැන සිතලා කටයුතු කළ යුතු බව දැනුවත් කළ යුතුයි. අපේ රට සමාජයීය සහ ආර්ථික වශයෙන් ඉස්සරහට යන්නට මාර්ග පද්ධතිය දියුණු කරනවා මෙන්ම, එය නියාමනය කිරීමට අවශ්‍ය බවත් මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රියැදුරන්ගේ විනය ආරක්ෂා කිරීම සඳහා අපි පසුගිය කාලයේ දඩ මුදල වැඩි කරන්නට යෝජනා කළා. එම දඩ මුදල ගැන මම තර්ක කරන්නේ නැහැ. නමුත්, ඒ වෙලාවේදී ඒකට විරුද්ධව පෙළපාළි ගියා. පෙළපාළි ගියේ, වැරදි නොකරන මිනිසුන්ට දඩ ගහන්න එපා කියලා නොවෙයි. වැරදි කළත් දඩ ගහන්න එපා කියලා. මාර්ග පද්ධතිය තුළ සිදු වන මරණ සංඛ්‍යාව බැලුවොත්, දවසකට මරණ 7 - 8ක් සිදු වන බව පෙනෙනවා.

මම හිතන විධියට අවුරුද්දකට අපේ මාර්ග පද්ධතියේ මරණ තුන්දහසකට වඩා සිද්ධ වෙනවා. ඒ වාගේම ඒ මාර්ග පද්ධතියේ සිද්ධ වන රිය අනතුරුවලින් තුවාල ලබන අයට රැකියාවක් කර ගන්න බැරුව යාම නිසා විනාශ වන මුදල, එහෙම නැත්නම් විනාශ වන කාලය ගැන බැලුවොත් අපගේ මාර්ග පද්ධතිය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ. මේ මාර්ග පද්ධතිය පිළිබඳව විග්‍රහ කිරීමේදී අපේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමාත් කිව්වා, වාහන ලක්ෂ හැත්තෑඑකක් ලියා පදිංචි කරලා තිබෙනවාය කියලා. ඒ වාහන ලක්ෂ හැත්තෑඑක ලියා පදිංචි කිරීම සම්බන්ධවත් අප සියලු දෙනාම වග කියන්න ඕනෑ. අපේ රටේ හොඳ පොදු ප්‍රවාහන පද්ධතියක් නැහැ. ජනතාවට කොහේ හරි යන්න, විශේෂයෙන්ම රාත්‍රී කාලයේ කොහේ හරි යන්න, නැත්නම් විවිධ වැඩ කටයුතු කර ගන්න ඕනෑ වුණාම අපේ ප්‍රවාහන පද්ධතිය පාවිච්චි කරලා ඒ වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස කර ගන්න බැහැ කියන පණිවුඩය තමයි ජනතාව දීලා තිබෙන්නේ. ඒ නිසා අවුරුදු ගණනාවක් තිස්සේ විශාල මුදලක් වියදම් කරලාත් අපේ ප්‍රවාහන පද්ධතිය සහ මාර්ග පද්ධතිය මේ තත්ත්වයට පත් වී තිබීම ගැන අප සියලු දෙනාම කනගාටු වෙන්න ඕනෑ. ඒ නිසා ජනතාවට යම් කිසි සහනයක් වන අයුරින් මේවාට විසඳුම් දෙන්න අප සියලු දෙනාම ඉදිරියේදී වැඩ කරන්න ඕනෑ.

අධිවේගී මාර්ග පද්ධතිය තුළින් අපේ විශාල නගර සම්බන්ධ කිරීම ඉතාම කාර්යක්ෂම වුණා කියන කාරණයට මා එකඟ වනවා. මේ වන විට මේ රටේ අධිවේගී මාර්ග පද්ධතිය විනයක් ඇතුව ක්‍රියාත්මක වනවා. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, අධිවේගී මාර්ගවලට ඉතා විශාල මුදලක් වියදම් කරන්න වීමයි. ආර්ථික වශයෙන් තවම දියුණු වෙමින් පවතින රටක් වන අපේ රටට අනෙක් රටවලට සාපේක්ෂව, අධිවේගී මාර්ග පද්ධතිය දියුණු කරන්න විශාල මුදලක් වැය කරන්න සිද්ධ වුණා. අපට නිදහස ලැබුණු දිනයේ පටන් හරි සැලසුමක් ඇතුව අපේ නගර නිර්මාණය -නිවාස ඉදිකිරීම්, නැත්නම් අනෙකුත් ඉදිකිරීම්- කරලා තිබුණේ නැහැ; අනෙකුත් දේවල් නිර්මාණය කරලා තිබුණේ නැහැ. ඒ නිසා අධිවේගී මාර්ග සංවර්ධනය කරන්න යනකොට ඒ ඉඩම් හිමියන්ට විශාල ලෙස වන්දි ගෙවන්න අපට සිදු වුණා. ඒ වාගේම සමහර වෙලාවට දුෂ්කර පැති හරහා අධිවේගී මාර්ග ඉදිකිරීම නිසා අධික වියදමක් දරන්න සිද්ධ වුණා. අධිවේගී මාර්ග

සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කරන කොට ඒ දුෂ්කරතා මඟ හැරලා ඒ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වනකොට වත්මන් රජය විධියට අපි ඉතාම සාධාරණ වියදමකින් මේ අධිවේගී මාර්ග පද්ධතිය සංවර්ධනය කර ගෙන යනවා. අපි ඒ කටයුතු නවත්වා නැහැ. විශේෂයෙන්ම හම්බන්තොට, ඒ වාගේම නුවර, රත්නපුරය වැනි විශාල නගරවලට කොළඹ සිට සම්බන්ධ වන්න පුළුවන් ආකාරයට අපි අධිවේගී මාර්ග පද්ධතිය මේ වනකොට සංවර්ධනය කර ගෙන යනවා.

අද මේ සභාවේ කථා කළා, monorail පද්ධතිය පිළිබඳව. පසුගිය රජය විසින් monorail පද්ධතිය සම්බන්ධයෙන් වාර්තා කැඳවා ඒ වැඩ කටයුතු යම් කිසි දුරකට කර ගෙන ගිහිල්ලා තිබුණා. නමුත්, monorail පද්ධතියේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ වියදම වැඩිවීමයි. එක මගියෙකුට දරන්න වන වියදමත්, ඒ වාගේම අපේ රටේ සිටින ජනගහනයට ඒ monorail පද්ධතිය ඔරොත්තු නොදීම නිසාත් අපේ ප්‍රවාහන ප්‍රශ්නය ඒ monorail පද්ධතිය තුළින් විසඳෙයිද කියන ප්‍රශ්නය පැන නැඟුවා. ඒ හින්දා තමයි වත්මන් රජය නැවත බලයට පැමිණි පසු සැහැල්ලු දුම්රිය පද්ධතියක් - light rail system එකක් - තුළින් අපට monorail පද්ධතියට වඩා විශාල මගීන් සංඛ්‍යාවක් ගෙන යන්න පුළුවන් කියන සාධකය සලකා බැලුවේ. ඒ අනුව මේ වනකොට ඒ සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ජපානයත් සමඟ එකතු වෙලා ඉතාම ඉක්මනින් ඒ වැඩ කටයුතු අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වනකොට අපි ඒ වැඩ කටයුතු පටන් ගෙන තිබෙනවා.

මාර්ග තදබදය අඩු කරන රාජගිරිය ගුවන් පාලම වැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කරන්නත් ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම කොළඹ සහ ඒ ආසන්න ප්‍රදේශවල මාර්ග දීර්ඝ කාලයක් තිස්සේ හරිහැටි සැලැස්මක් අනුව, ඒ වාගේම වැඩිවන වාහන සංඛ්‍යාව අනුව වෙනස් කරලා තිබුණේ නැහැ. ඒ හින්දා තමයි මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ එකතු වෙලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. මේවා ලෙහෙසියෙන් විසඳන්න පුළුවන් කාරණා නොවෙයි. මොකද, නගර සැලැසුම් නැතිව තමයි මේවා දීර්ඝ කාලයක් තිස්සේ ජනාකීර්ණ වෙලා තිබෙන්නේ. මේ පාරවල් හැදිලා තිබෙන්නේත් සැලැසුම් නැතිවයි. පංගුවක් වෙලාවට අනුමැතියක් නැතිව ගොඩනැඟිලිත් හැදිලා තිබෙනවා. අනුමැතියක් නැතිව තවත් නොයෙකුත් දේවල් වෙලා තිබෙනවා. ඒ හින්දා මේ රජයට පමණක් නොවෙයි, බලයට එන මොනම රජයකට වුණත් මේ ප්‍රශ්න විසඳන්න විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අනිවාර්යයෙන්ම computers භාවිතය මඟින් කාර්යක්ෂම කරන්න ඕනෑය කියන දැඩි මතයේ අපි ඉන්නවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදීත් අපි කිව්වා, මේ දෙපාර්තමේන්තුව කාර්යක්ෂම කළේ නැත්නම් විශාල අක්‍රමිකතා, ඒ වාගේම ජනතාවට අපහසුතාවට පත්වන්න සිද්ධ වනවා කියලා. නමුත්, අපි දන්නවා මේ රටේ සමහර නිලධාරීන් මේවා කාර්යක්ෂම වෙනවාට කැමැති නැති බව. සමහර නිලධාරීන් මේ තොරතුරු කොම්පියුටර්ගත වෙනවාට කැමැති නැත්තේ මොකද? ඒගොල්ලන්ට ඒ තුළින් වංචා හා දූෂණ කරන්නට බැරි වන නිසායි. එහෙම කළොත් ඒගොල්ලන්ට එදිනෙදා ලැබෙන ගතමනාව ලැබෙන්නේ නැහැ. එම නිසා සමහර නිලධාරීන් මේ ආයතනවලට තාක්ෂණය හඳුන්වා දීමට බාධා කරනවා. ඒ බව අපි කියන්නට ඕනෑ. "මේ දවසට මේක ඉවර කරලා මේ ටෙන්ඩර් එක දාන්න" කියා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් සහ අනෙක් කාරක සභාවලින් නියෝග දුන්නත් එහෙම කරන්නේ නැති නිලධාරීන් සිටියා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. එම නිසා ඒ නිලධාරීන් කෙරෙහි අවධානය යොමු කරලා ඒ නිලධාරීන් ඒ ස්ථානවලින් අයින් කරලා මේ ආයතනවලට තාක්ෂණය ගෙනැල්ලා, ඒ තුළින් අපේ ජනතාවට ඉතාම හොඳ සේවාවන්, වංචාවෙන් හා දූෂණයෙන් තොර සේවාවන්, අපේ ප්‍රවාහන පද්ධතිය නවීන ලෝකයට ගෙනයන්නට පුළුවන් සේවාවන් සකස් කරන්නට අපට සිද්ධ වෙනවා. ඒ සඳහා අපි සියලුදෙනාම සහයෝගය ලබාදෙනවා. ඒවා අපි මේ රටේ ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ.

අපි කළ යුත්තේ මේ රටේ තව තවත් වාහන වැඩි කරන එක නොවෙයි; කාර්යක්ෂම සහ ජනතාවට පහසුවෙන් වාගේම වැඩි වියදමකින් තොරව ලබා ගත හැකි පොදු ප්‍රවාහන සේවයක් ස්ථාපනය කිරීමයි. ආසියාවේ දියුණු රටවල් එවැනි ප්‍රවාහන පද්ධති ස්ථාපනය කර තිබෙනවා.

ආසියාවේ දියුණු රටවල ස්ථාපනය කර තිබෙන දියුණු පොදු ප්‍රවාහන පද්ධතිය හා සමාන පොදු ප්‍රවාහන පද්ධතියක් අපේ රටෙත් ස්ථාපනය කළ යුතුයි. නමුත්, මම දන්නවා අපට ඒ සඳහා බලපාන සංකීර්ණ ගැටලු තිබෙන බව. මොකද, දීර්ඝ කාලීන සැලසුම් අනුව නොවෙයි අපේ නගර සහ අනෙකුත් දේවල් බිහි වෙලා තිබෙන්නේ. නමුත්, ඒවා අබිබවා ගිහින් ජනතාවට අවශ්‍ය සහන ලබාදීලා අපි ඉස්සරහට යන්නට කටයුතු කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 2.35]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதி தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன். மிக முக்கியமாக இந்தச் சட்டத்தின் கீழான ஒழுங்குவிதியானது, இலங்கையின் பல்வேறு பகுதிகளிலுமுள்ள போக்குவரத்து நெரிசலைக் குறைத்து, மக்களுடைய போக்குவரத்தை இலகுபடுத்தும் வகையிலே முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்த ஒழுங்கு விதியை நிறைவேற்றுவதனூடாக, நாட்டில் போக்குவரத்துச் சேவைகள் இன்னும் மேன்மையடையும் என்று கருதப்படுகின்றது. இவ்வாறான ஒழுங்குவிதிகள் இச்சபையில் கொண்டுவரப்படுகின்றபொழுது, மோட்டார் வாகனச் சேவைகள், குறிப்பாக, இலங்கைப் போக்குவரத்துச் சபையினூடான பேருந்துச் சேவை மற்றும் அதனோடு இணைந்த ரயில் போக்குவரத்துச் சேவை என்பன இலங்கையிலே வாழ்கின்ற மக்களுக்குச் சரியான முறையில் கிடைக்கின்றனவா? அல்லது அவர்கள் சரியான முறையில் பயன்படுத்தக்கூடிய வகையில் அவை இருக்கின்றனவா? என்கிற விடயம் இந்த நாட்டிலே பல தடவைகள் கேள்விக்கு உட்படுத்தப்பட்டிருக்கிறது. இலங்கைப் போக்குவரத்துச் சபையானது -SLTB- தெற்கிலே ஒரு வகையான செயற்பாட்டுத் திட்டத்தை முன்னெடுத்துச் செல்கின்ற அதேநேரம், வடக்கிலும் கிழக்கிலும் இன்னுமொரு வகையான செயற்பாட்டுத் திட்டத்தை முன்னெடுத்துச் செல்கின்றது.

கடந்த காலங்களில் யுத்தத்தைக் காரணம் காட்டி, பல இடங்களில் இலங்கைப் போக்குவரத்துச் சபையின் சாலைகள் இயங்க முடியவில்லை. இப்பொழுது அந்தச் சாலைகளை இயக்குவதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டாலும் சாரதி, நடத்துநர் போன்ற பதவிகளுக்கு அந்தந்த மாவட்டங்களைச் சேர்ந்தவர்கள் நியமிக்கப்படாமல், வேறு

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

மாவட்டங்களைச் சேர்ந்தவர்கள் அங்கு பணியாற்றுகின்ற ஒரு சூழல் காணப்படுகின்றது. இதனால், அந்தச் சாலைகள் கேட்பாரற்ற நிலையில், அபிவிருத்தியடையாத நிலையில், பாதுகாப்பற்ற நிலையில் காணப்படுகின்றன என்பதை நான் இங்கு குறிப்பிட வேண்டும். குறிப்பாக இலங்கைப் போக்கு வரத்துச் சபையின் கிளிநொச்சி சாலையானது, 14 பேருந்து களுடன் ஒரு சுற்றுவட்டத்துக்குள் மட்டும் தன்னுடைய பணியைச் செய்கின்ற, வருமானத்துக்காக மட்டும் உழைக்கின்ற - வியாபார நோக்கத்தோடு செயற்படுகின்ற தாகக் காணப்படுகின்றது. கிளிநொச்சி மாவட்டத்தின் பல கிராமங்களைச் சேர்ந்த மக்கள் இப்பொழுதும் இந்தப் போக்கு வரத்துச் சேவையை எதிர்பார்த்திருக்கிறார்கள். குறிப்பாக, ஏழ்மையில் வாழுகின்ற அக்கிராமங்களைச் சேர்ந்த மக்கள் பல்வேறு இன்னல்களுக்கு மத்தியில் தங்களுடைய அன்றாடப் பணிகளை மேற்கொள்வதற்குக் கஷ்டப்படுகின்றார்கள். அதிலும் குறிப்பாக மாயவனூர், உதயநகர், விவேகானந்தநகர், கிருஷ்ணபுரம், பாரதிபுரம், மலையாளபுரம், பள்ளிக்குடா, வலைப்பாடு போன்ற கிராமங்களில் வாழுகின்ற மக்கள் தங்களுடைய அன்றாடப் பணிகளை மேற்கொள்வதற்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள்.

மேலும், ஒரேயொரு பேருந்தின்மூலம் இயங்குகின்ற யாழ்ப்பாணம் - ஸ்கந்தபுரத்துக்கான முட்கொம்பனூடான சேவையானது, பாடசாலை நடைபெறுகின்ற கிழமை நாட்களில் மட்டும்தான் இடம்பெறுகின்றது. ஏனைய நாட்களான சனி, ஞாயிற்றுக்கிழமைகளில் அந்தச் சேவையில்லாத காரணத்தினால், அங்கே விசேட வகுப்புகளுக்காகச் சென்றுவருகின்ற பள்ளி மாணவர்கள் தங்களுடைய கல்வி நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத அல்லது அன்றாட நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத ஒரு சூழலுக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். எனவே, இலங்கைப் போக்குவரத்துச் சபையினால் இதுவரை சரியான பணியை அவர்களுக்கு வழங்க முடியவில்லை என்பது துரதிஷ்டவசமானது. பல தடவைகள் நாங்கள் இந்த விடயம் தொடர்பாக இந்தச் சபையினூடாகக் குறிப்பிட்டிருக்கின்றோம். இதனைவிட, போக்குவரத்துச் சபையினுடைய தலைவருக்கும் போக்குவரத்து அமைச்சர் அவர்களுக்கும் எழுத்துமூலமான கோரிக்கை விடுக்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்தப் பணிகளிலே எந்தவிதமான முன்னேற்றமும் இதுவரை காணப்படவில்லை என்பதுதான் முக்கியமானது. பேருந்து களின் பல சேவைகள் இடம்பெறாமைக்கு, வீதிகள் சரியாக இல்லை; குறித்த வீதிகளைப் பயன்படுத்த முடியாமலிருக் கின்றது என்ற காரணங்கள் அவர்களால் சொல்லப்படுகின்றன. வீதிகள் சரியாக இல்லை என்பதற்காக ஒரு பகுதியிலே வாழ்கின்ற மக்களுக்கான போக்குவரத்துச் சேவையை ஒட்டுமொத்தமாக நிராகரிக்கக்கூடிய சூழலை நாங்கள் உருவாக்க முடியுமா? ஆகவே, இந்த விடயம் தொடர்பில் அதிகமான கவனம் செலுத்தப்பட வேண்டும்.

அத்துடன், பாதசாரிக் கடவைகளில் இடம்பெறுகின்ற விபத்துக்களில் 30 சதவீதமானவை கைத்தொலைபேசிப் பாவனை மூலமாக ஏற்படுவதாக இலங்கைத் தகவல் பொறியியல் பல்கலைக்கழகம் தகவல் வெளியிட்டிருக்கிறது. பாதசாரிகள், பாதசாரிக் கடவைகளைக் கடக்கின்றபோது கைத்தொலைபேசிகளைப் பயன்படுத்துவதாலும் வாகன சாரதிகள் வாகனங்களைச் செலுத்திக்கொண்டு பாதசாரிக் கடவைகளைக் கடக்கின்ற நிலையில் கைத்தொலைபேசியைப் பயன்படுத்துவதனாலும் இத்தகைய நிலை ஏற்படுவதாகத் தெரிய வந்துள்ளது.

இன்றும்கூட பல பொலிஸ் நிலையங்களில் வேகக் கட்டுப்பாட்டினை மீறுகின்ற வாகனங்களின் சாரதிகளைப் பிடிப்பதற்கான நவீன இயந்திர சாதனங்கள் இல்லாத நிலையும் பல பகுதிகளில் போக்குவரத்துப் பொலிஸாரின் பணிகள் அதிகாலை நேரங்களில் காணப்படாத நிலைமையும் காணப்படுகின்றது. குற்றங்கள் நிகழும்வரையில் மறைந்து பார்த்துக்கொண்டிருந்துவிட்டு, குற்றம் நிகழ்ந்த பின்னர் ஓடிச்சென்று பிடித்துத் தண்டப் பணம் அறவிடுவதைவிட, குறித்த குற்றச் செயல்கள் நிகழ முன்பதாக அவற்றைத் தடுக்கக்கூடிய பணிகளில் போக்குவரத்துப் பொலிஸார் அதிகளவில் ஈடுபடுத்தப்பட்டால் போதியளவு குற்றங்களைத் தடுக்க முடியுமென்பதை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

மேலும், திருத்த வேலைகள் நடைபெறுகின்ற பாதைகளிலும் பாதைத் திருத்தங்கள் காரணமாக மாற்றுப் பாதைகளைப் பயன்படுத்தவேண்டிய இடங்களிலும் பொதுவாகவே தமிழ் மொழியில் அறிவிப்புகள் குறிப்பிடப் படுவதில்லை. இவ்விடயம் தொடர்பிலும் கவனமெடுத்து, இத்தகைய இடங்களில் மும்மொழிகளிலும் அறிவிப்புகள் இடம்பெறும் வகையில் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்பதையும் இங்கு வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

அடுத்து, கொழும்பு-யாழ்ப்பாணம் தனியார் பேருந்துப் போக்குவரத்துச் சேவைக்கான வழித்தட அனுமதிக் கட்டணமானது, எமது நாட்டைப் பொறுத்தவரையில் மிகவும் அதிகமானதாகக் காணப்படுவதாலும் வழித்தட அனுமதிகளின் பங்கீடுகளில் முறைகேடுகள் இடம்பெறுவதாலும் சில பேருந்துகள் வழித்தட அனுமதியைப் பெறாமல் போக்கு வரத்துச் சேவையில் ஈடுபடுகின்ற நிலைமைகளும் இல்லாமலில்லை. அதேநேரம், வழித்தட அனுமதிக்குரிய எண்ணிக்கையினை மீறிய வகையில் முறைகேடாக வழங்கப்படுகின்ற வழித்தட அனுமதிகளும் இல்லாமலில்லை. இத்தகைய நிலைமைகள் காரணமாக போக்குவரத்துக்களின் போது பல்வேறு முறைகேடுகள், ஒழுங்குவிதி மீறல்கள் போன்றவை இடம்பெறுவது மட்டுமன்றி, எரிபொருள் மாற்றுப் பாவனைகளும் இடம்பெறுவதால் அதிகளவில் சூழல் மாசுறுகின்ற நிலைமையும் காணப்படுகின்றது. எனவே, போக்குவரத்து அமைச்சானது இத்தகைய நிலைமையினை அவதானத்திலெடுத்து உரிய நடவடிக்கைகளை மேற் கொள்வதோடு, மேற்படி வழித்தட அனுமதியின் கட்டணக் குறைப்புக்கும் வழித்தட அனுமதிப் பங்கீடுகளில் முறை கேடுகள் இடம்பெறாதிருப்பதற்கும் வழிகாண வேண்டும்.

அதுமட்டுமன்றி, வடக்கு மாகாணத்தைப் பொறுத்த வரையில் தனியார் பேருந்துப் போக்குவரத்துச் சேவை தொடர்பில் அரசு மாற்றாந்தாய் மனப்பான்மையுடனேயே இன்னமும் செயற்பட்டு வருவதாகத் தெரிய வருகின்றது. வடக்கு மாகாணப் போக்குவரத்து அதிகாரசபையினைச் செயற்படுத்துவதற்கு நிதி இல்லையெனத் தெரிவித்து, அதனைச் செயற்படுத்துவதற்கான நிதியைத் தனியார் பேருந்து உரிமையாளர்களிடம் கோருகின்ற நிலையில், வட மாகாண உள்ளூர்ப் போக்குவரத்தில் ஈடுபடுகின்ற பேருந்துகளுக்கான வழித்தட அனுமதிக் கட்டணம் மூவாயிரம் ரூபாயிலிருந்து பத்தாயிரம் ரூபாய்வரை திடீரென அதிகரிக்கப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது. பின்னர் இது ஏழாயிரத்து ஐந்நூறு ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளபோதிலும், அதனை ஐயாயிரம் ரூபாயாகக் குறைக்குமாறும் அதேபோன்று, மாதாந்த log sheet கட்டணமானது 200 ரூபாயிலிருந்து 1,000 ரூபாய்வரை அதிகரிக்கப்பட்டு, பின்னர் அது 750 ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளபோதிலும் அதனை 500 ரூபாய்வரை குறைக்குமாறும் தனியார் பேருந்து உரிமையாளர் சங்கத்தினர் கோரிக்கை விடுத்து வருகின்றனர். அவ்வாறே, பழைய பேருந்தினை விற்றுவிட்டுப் புதிய பேருந்து வாங்குவோருக்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

கான பதிவுக் கட்டணம் வடக்கில் மாத்திரம் 2,000 ரூபாயிலிருந்து 10,000 ரூபாயாக அதிகரிக்கப்பட்டுள்ளதாகவும் தெரிய வருகின்றது. எனவே, இத்தகைய நிலைமைகள் உடனடியாக மாற்றப்பட்டு, தென்னிலங்கையில் என்ன நியதியோ, அதே நியதியை வடக்கிலும் கடைப்பிடிப்பதற்கு இந்த அரசு நடவடிக்கை எடுக்கவேண்டுமென வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

எமது நாட்டில் குறிப்பாக வடக்கு நோக்கிய ரயில் கடவைகள் பலவும் பாதுகாப்பற்றனவாகவே இன்றும் இருந்து வருகின்றன. இதனால், அங்கு தொடர்ந்தும் பல விபத்துகள் ரயில் கடவைகளில் இடம்பெற்று வருகின்றன. வடக்கிற்கான ரயில் போக்குவரத்து மீள ஆரம்பிக்கப்பட்டதன் பின்னர், பொலிஸ் திணைக்களத்தினால் பாதுகாப்பற்ற ரயில் கடவைகளின் பாதுகாப்பிற்காக பணியாளர்கள் இணைத்துக் கொள்ளப்பட்டனர். எனினும், இதுவரையில் இவர்களது தொழில் ஒரு தொழிற்றுறையாக ஏற்றுக்கொள்ளப்படாமலும் நிரந்தரமாக்கப்படாமலும் இருக்கின்றது. அத்துடன், இவர்களுக்கான மாதாந்தக் கொடுப்பனவு என்பது இவர்களது வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்ள இயலாத வகையில் மிகவும் சொற்பமான ஒரு தொகையாகவே இருந்துவருவதுடன், இவர்களுக்கு விடுமுறைகள்கூட இல்லாத நிலை காணப்படு கின்றது. மேற்படி பாதுகாப்பற்ற ரயில் கடவைகளின் பாதுகாப்புப் பணியாளர்களின் பிரச்சினைகள் தொடர்பில் நான் பலமுறை இந்தச் சபையில் சுட்டிக்காட்டியிருக்கின்றேன். அதற்கு நடவடிக்கை எடுக்கப்படும் எனக் கூறப்பட்ட போதிலும், இதுவரையில் எவ்விதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டதாகத் தெரியவில்லை. எனவே, மேற்படி பணியாளர்களை இலங்கைப் புகையிரதத் திணைக்களத்துடன் இணைத்து, அவர்களது தொழிலை நிரந்தரமாக்குவதற்குப் போக்குவரத்து அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ரயில் சேவையினை மேலும் அதிகரித்தும் தரமுயர்த்தியும் விஸ்தரிப்பதனூடாக எமது நாட்டில் காணப்படுகின்ற வாகன நெரிசல்களுக்குப் போதியளவு தீர்வு காணலாமென எண்ணுகின்றேன். அந்த வகையில் வடக்கின் ரயில் சேவையில் பாரிய நெருக்கடிகள் காணப்படுவதால், இரண்டாவது தபால் ரயில் சேவையை ஆரம்பிப்பதற்கும் 'ரஜரட்ட ரெஜின' உள்ளிட்ட, நகரங்களுக்கிடையிலான ரயில் சேவைகளை வவுனியாவுக்கும் கிளிநொச்சிக்கும் இடையில் நடத்துவதற்கும் காங்கேசன்துறைக்கும் பளைக்கும் இடையில் அரச அதிகாரிகள் மற்றும் பாடசாலை மாணவர்களது வசதி கருதி விசேட ரயில் சேவையொன்றை மீண்டும் நடத்துவதற்கும் நடவடிக்கை எடுக்குமாறு வலியுறுத்த விரும்புகின்றேன். கடந்த காலங்களில் இந்தச் சேவை இருந்தது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோன்று மாகோவுக்கும் பொல்காவலைக்கும் இடையில் வடக்கு, கிழக்குப் பகுதிகளிலிருந்து எதிர்த்திசையில் பயணிக்கும் ரயில்கள் கடவைகளில் தாமதமடைவதால், அங்கு இருவழிப் பாதை அமைப்பதற்கும் யாழ்ப்பாணத்தை மையமாகக் கொண்டு உதவி எந்திரி அலுவலகம் ஒன்றை அமைப்பதற்கும் யாழ்-கொழும்பு 'உத்தரதேவி' ரயில் சேவை யைக் கல்கிசை வரையில் நீடிப்பதற்கும் குளிரூட்டப்பட்ட ரயில் சேவையில் ஈடுபடுகின்ற ரயில்களில் தினம், தேவை கருதி விசேட பெட்டிகளை இணைப்பதற்கும் ரயில்களின் ஆசனங்கள், மலசலகூடங்கள் உள்ளிட்டவற்றின் தரங்களை உயர்த்துவதற்கும் நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்வதோடு, வடக்கு, கிழக்கு மாகாணங்களுக்கான ரயில் சேவையில் போதியளவில் தமிழ்மொழி தெரிந்த அதிகாரிகள் மற்றும் பணியாளர்களை நியமிப்பதில் கூடிய கவனம் செலுத்துமாறும் மீண்டும் வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

மோட்டார் போக்குவரத்துத் திணைக்களமானது அதனது வினைத்திறன்களைக் கருத்தில்கொண்டு முழுமையாக கணினி மயப்படுத்தப்பட உள்ளதாகத் தகவல்கள் வெளிவந்திருக் கின்றன. இந்த ஏற்பாடுகள் தற்போது எந்த நிலையில் இருக்கின்றன? எனவும் அறிய விரும்புகின்றேன். கடந்த காலங்களில் ஊழல், மோசடிகள் தொடர்பில் ஊடகங்களால் பேசப்பட்ட துறைகளில் மோட்டார் போக்குவரத்துத் திணைக்களமும் முக்கிய இடத்தினை வகித்திருந்தது. இத்தகைய நிலைமைகளை ஒழிப்பதற்காகவே மேற்படி கணினிமயப்படுத்தல் கொண்டுவரப்படப் போவதாகக் கூறப் பட்டது. எனவே, அதனது தற்போதைய நிலைமைகள் குறித்தும் அறியத்தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்தில், இன்று அதிகாலை தியத்தலாவையில் நடந்த ஓர் அசம்பாவிதத்தில் பலர் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அந்தச் சம்பவம் கண்டிக்கப்பட வேண்டியது; மிகவும் வருத்தத்துக்குரியது. எனினும், பொறுப்புவாய்ந்தவர்கள் - ஊடகங்களாக இருக்கலாம், அரசியல்வாதிகளாக இருக்கலாம் - யாராக இருந்தாலும் தேசிய நல்லிணக்கத்துக்குப் பாதிப்பு ஏற்படாத வகையில் அது சம்பந்தமான செய்திகளை வெளியிடவேண்டும் என்பதையும் உண்மைகளை மறைத்துக் கொள்வதற்காக அப்பாவித் தமிழ் மக்கள்மீது அந்தப் பழியைச் சாட்டிவிடக்கூடாது என்பதையும் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருவதோடு, எனக்கு இங்கு உரையாற்றுவதற்கு நேரம் கொடுத்ததற்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මහතා.

[අ.භා. 3.46]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මෝටර් වාහන පනත යටතේ නියෝගය පිළිබඳවයි අපි සාකච්ඡා කරන්නේ. අද කවුරුත් නොකියන දෙයක් තමයි මේ නියෝගය මඟින් සිදු කරන්නේ. මෝටර් වාහන සඳහා අංක තහඩු ලබා ගනිද්දී අය කරන ගාස්තු සංශෝධනය කිරීමක් මෙයින් සිදු කරනවා. මේ රටේ ජනතාවට රුපියල් එක්දහස් පන්සියයකින් හෝ බර වැඩි කිරීමක්. රට ආර්ථික වශයෙන් විනාශ කරපු, රටේ ජනතාවට දවසින් දවස බදු බර පටවන, ජනතාව පීඩාවට පත් කරන ආණ්ඩුව තවදුරටත් මහා දේශපාලන සාකච්ඡාවන් කරන සභාවන් බවට පරිවර්තනය කරලාත් කථා කරන්නේ ගාස්තු වැඩි කිරීම ගැන. මේ ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් අපේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ. වෙනත් වැල්වටාරම් කථා කිරීම පමණයි සිද්ධ කරන්නේ. රුපියල් එක්දහස් පන්සියයකින් වෙන්නට පුළුවන්; විවිධ අයිතම්වලින් ලබා දෙන ගාස්තු වැඩි කිරීම් වෙන්නට පුළුවන්, ඒ සියලු දෙය මේ රටේ ජනතාවට මහ විශාල බරක්; වැය බරක්. මේ රටේ අහිංසක මිනිහාගේ pocket එකට ගහන, මේ රටේ අහිංසක මිනිසුන්ට රිදවන, මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදල්

සූරාකන, දේශද්‍රෝහී ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව දවසින් දවස පත් වෙනවා. ඇත්ත ගැසට් නිවේදනයේ කරුණු නොකියා බොරු පුරසාරම් දොඩනවා. ඒකයි සත්‍ය කථාව.

ඊළඟ කාරණය, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසයේ ප්‍රවාහනයත් එක්ක මුලින්ම බැඳෙන්නේ කරත්තයයි. අපි මුලින්ම ගමන් කළේ කරත්තයෙන්. මේ ආණ්ඩුවත් හරියට බරකරත්තයක් වාගෙයි. කඩා වැටෙන, ගරා වැටෙන කරත්තයක්. අද ආණ්ඩුව සභාග ගිවිසුම දීර්ඝ කරනවා අපි දැක්කා. ඒ කියන්නේ, පරණ කරත්තයම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

බැඳලා මේ දුෂ්කර ආර්ථික ගමන යන්න දැන් ආණ්ඩුව ලැහැස්ති වෙනවා. අපේ ප්‍රවාහන සේවයේ ආරම්භක දෙය පරණ කරත්තය. ඒ පරණ කරත්තය, ගරා වැටෙන කරත්තය, විනාශ වෙච්ච කරත්තය, කෑලි ගැලවෙන, ඇණ මුරිච්චි ගැලවෙන කරත්තය රටේ ආර්ථිකය බර කරලා, රටේ ආර්ථිකය විනාශ කරලා. අපේ මූල්‍ය වෙළඳපොළ කඩා වැටිලා. රට ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත් කරලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ බර කරත්තයේ බඳවා ගන්න තෝන්ලැල්ලේ බඳින්න දැන් පටන් අරගෙන, අද ඉඳන් ඔන්න ගමන යනවා. එම නිසා ප්‍රවාහනයට විතරක් නොවෙයි, මුළු රටටම සෙතක් නැති, අනාගතයක් පෙනෙන්නේ නැති රටක් බවට අපේ රට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ ගැන කිසිම සැකයක් ඇත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි පසුගිය මැතිවරණ කාලපරිච්ඡේදයේ දී අපේ ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, අවුරුදු තුනක් නිස්සේ මේ ආණ්ඩුව රට විනාශ කළා, මේ රටේ ජාතික ධනය එක්සත් ජාතික පක්ෂය සොරකම් කළාය කියලා. කවුද කිව්වේ? අපි නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි කිව්වේ. දැන් ඒ පරණ හොරුත් එක්කම, ඒ පරණ කණ්ඩායමත් එක්කම ලජ්ජා නැතිව නැවත ගමනක් ආරම්භ කරනවා. අපි නම් කිව්වා, බොරු සටන් පාඨ කියමින් මේ බොරු හුරතලයක් පෙන්වන්නේ කියලා. මේක තාවකාලික තරහවීමක්. පෙම්වතුන්ගේ දවස වෙනකොට මේ දෙන්නා සෙන්ට් - පවුඩර් දාලා ආයෙත් කසාද බඳිනවාය කියා අපි නම් මැතිවරණ වේදිකාවේ කිව්වා. අපේ කථාව මේ රටේ ජනතාව පිළිගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේවා කියන්නේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සංඛ්‍යා ලේඛන විජ්ජාවක් ගැන කථා කරපු නිසා. ජනාධිපතිවරණයේ දී ඡන්ද හැට දෙලක්ෂයකට වැඩියෙන් ලබා ගත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පක්ෂයට මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ලක්ෂ දහතුනට වඩා ඡන්ද අඩු වෙනවා. ඒ කියන්නේ ලක්ෂ පනහකට ආසන්න පිරිසක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වය රට තුළ ප්‍රතික්ෂේප කරනවා. ඡන්දදායකයන් සියයට පනහක්. එම නිසා මොන සංඛ්‍යා විජ්ජාව කළත්, මේ රටේ මහ පොළොවේ යථාර්ථය තමයි මේ ආණ්ඩුවට මේ දුෂ්කර ආර්ථික ගමන යන්න බැහැ කියන එක. ප්‍රවාහනය විතරක් නොවෙයි, රටේ සමස්ත ඉදිරි ගමන යන්න මේ ආණ්ඩුවට බැරි බව ඉතාම පැහැදිලිව පේනවා. ඒක තමයි යථාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ කට්ටිය ප්‍රවාහනය ගැන මහා දේශනා පවත්වනවා. මම හැමදාම එන්නේ කැලණිය, විද්‍යාලංකාර පිරිවෙන ඉදිරිපිට පාලමෙන්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව දවස් 61ක් ඇතුළත මේ පාලම හදලා අවසන් කළා. දැන් මේ පාලමේ එක පැත්තක් ගලවා දමා මාස හතක් ගත වෙනවා. මේ නිසා උදේට කිරිබත්ගොඩ සිට කොළඹට ඇතුළු වන සියලු වාහන මහා තදබදයක් එක්ක පැය ගණන් රස්තියාදු වෙනවා. අපි හදපු පාලමේ ඇණ ටික තද කරන්න බැරි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ලජ්ජා නැතිව තව කථා කරන්නත් එනවා. මේ පාලම ප්‍රතිසංස්කරණය කර ගන්න බැරිව මාස හතක් ගත වෙලා තිබෙනවා. මම ඒ ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක්. පාලමේ ඇණ ටික තද කර ගන්න බැරිව එහි එක පැත්තක් -මංතීරුවක්- වහලා තිබෙන්නේ. මොකක්ද මේ රට? මේ රට කොහේටද යන්නේ? මොනවාටද මේ පුරසාරම්? මේ රට නැති කරපු කණ්ඩායමද මේ කථා කරන්නේ? [බාධා කිරීමක්] ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙලාව වෙන් කර තිබෙනවා. ඒ වෙලාවේදී ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්. දැන් මගේ කථාවට බාධා කරන්න එපා. [බාධා කිරීමක්] රිදෙනවා නම් ගිහින් පාලම හදන්න. අසත්‍ය උත්තර දෙන්න එපා. ඔය අසත්‍ය උත්තර රටේ මිනිසුන්ට දැන් ඇති වෙලා තිබෙන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා දින 61කින් හදපු පාලමක් ගැන කිව්වා. ආර්.ආර්. සමරකෝන් මහත්මයා "කැලණි පාලම" කියා නාට්‍යයක් හැදුවා නේ. ඔබතුමා කියන්නේ ඒ නාට්‍යය ගැනද? එහෙම නැත්නම් දින 61කින් හදපු ඇත්තම පාලමක් එතැන තිබෙනවාද? ඔබතුමා කියන්නේ මොකක් ගැනද?

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ඔබතුමාත් අගමැතිතුමාගේ ගෝලයෙක් නිසා ඕනෑම ප්‍රශ්නයකට විහිළුවක් දමලා "ෂේප්" වෙන්න තමයි යන්නේ. අගමැතිතුමාගේ ගෝලයා නිසා ඔබතුමාට ඕනෑම දෙයක් විහිළුවක්. මේ රටේ සිටින ලක්ෂ ගණන් මිනිසුන්, උදේට පාසල්වලට යන්න එන දරුවෝ මහ පාරේ රස්තියාදු වෙනවා. කඩිනම්ව ක්‍රියාත්මක වෙලා, කොළඹට ඇතුළු වන ප්‍රධාන මාර්ගයේ මේ පාලම ඉක්මනින් හදන්න.

ඉස්සර, මෙහි දුම්රිය හරස් මාර්ගය නිසා උදේට විනාඩියෙන් විනාඩියට වාහන නැවැත්වීම නිසා මිනිසුන්ට ප්‍රවාහනයේ දී අපහසුකම් මතු වුණු බව අපි දන්නවා. අපේ ආණ්ඩුව ඒ ප්‍රශ්නය විසඳුවා. දැන් මේ පාලමේ එක මංතීරුවක් වසා දමලා අලුත්වැඩියා නොකර ඉන්නවා. ඔබතුමන්ලා ආර්.ආර්. සමරකෝන්ගේ අර පරණ "ජෝක්" එක දමන්න යනවා. ඔබතුමන්ලා අගමැතිතුමාගේම ගෝලයෝ තමයි. රටට වැඩක් නැහැ. විහිළු සපයන එක විතරයි කරන්නේ. ඔය විහිළුව දැන් මේ රටට ඇති. මේක ඔබ අප සියලුදෙනාගේම රටයි. මේවා මිනිසුන්ගේ ප්‍රශ්න. ඒවාට විසඳුම් දෙන්න. බැරි නම් ඔබතුමන්ලා අයින් වෙන්න. ඔබතුමන්ලා ප්‍රවාහන ඇමතිතුමාට, මහාමාර්ග ඇමතිතුමාට කථා කරලා කියන්න, මේ පාලම හදා දෙන්නය කියලා. ඒක මේ රටේ ජනතාවගේ ප්‍රශ්නයක්. ඒක කොළඹ නගරයට ඇතුළු වන ප්‍රධාන මාර්ගය.

මා ඊළඟට කියන්න යන කාරණය මමත් පෞද්ගලිකව අත් විඳින ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පස්වරු පහයි කාලට බම්බලපිටියේ සිට කිරිබත්ගොඩට එන්න පිටත් වුණොත්, රෑ අට වන තුරු අපි කිරිබත්ගොඩට එනවා. පාඨලී චම්පික රණවක ඇමතිතුමා අධිවේගී මාර්ගවලට සාප කරනවා මම දැක්කා. අපි ආරම්භ කළ කඩවත නුවර අධිවේගී මාර්ගය විවෘත කරන්න නියමිතව තිබුණේ 2020ට ඉස්සර වෙලායි. අද එහි තත්ත්වය මොකක්ද? තවම වන්දි ගෙවලාත් නැහැ. කඩවත ප්‍රදේශයේ අදත් උද්ඝෝෂණ. මිනිසුන් මැසිවිලි නඟනවා. ඒ මිනිසුන්ට මුදල් ටික දීලා නැහැ. ඉඩම් පවරා ගැනීම -අත්පත් කර ගැනීමේ කාර්යවත්- තවම නිමා කර නැහැ. කොහේටද මේ රට යන්නේ? කටුනායක - පැලියගොඩ අධිවේගී මාර්ගයේ මූලික සැලැස්මේ තිබුණේ මේ වර්ෂයේ මැයි මාසය **වන** විට එය කොළඹ වරාය දක්වා යන්නයි. අපි කැලණියේ ජීවත් වන අයයි. මහජන නියෝජිතයන් ලෙස මමත් මෙම මාර්ග සැලැස්ම සම්බන්ධ සාකච්ඡාවට සහභාගි වුණා. 2018 වන විට මෙම මාර්ගය කන්ටේනර් -බහලුම්- එක්ක වරායට ගමන් කරන්න තමයි සැලසුම් කර තිබුණේ. අද එය මේ රටේ සිද්ධ වෙනවාද? අද මේ රට කඩා වැටිලා නැද්ද? රට ආර්ථික වශයෙන් නැවතිලා නැද්ද?

මේ ඔක්කොම අස්සේ දැන් ආණ්ඩුව සැරසෙනවා, මැතිවරණය අවසන් වන තුරු නවත්වා තිබුණු බඩු මිල ඉහළ දැමීම ක්‍රියාත්මක කරන්න. ඩොලර් එක දවසින් දවස වැඩි වෙනවා. අද එහි විකුණුම් මිල රුපියල් 160ට ආසන්න වෙලායි තිබෙන්නේ. එහි මිල රුපියල් 157.17යි කියා අද පුවත් පත්වල පළ වී තිබෙනවා. අපි දන්නවා, මූල්‍ය වෙළෙඳ පොළේ ව්‍යාපාර ගනුදෙනු සිදු වන්නේ ඩොලරයේ අගය 160ට වඩා වැඩියෙන් බව. ඩොලර් එක වැඩි වෙනවා කියන්නේ, මේ රටේ සියලුම ආනයන වියදම් වැඩි වෙනවා කියන එකයි.

එහෙම නම් තමුන්නාන්සේලා තව මාස දෙකක් යන කොට තෙල් මිල වැඩි කරනවා. ඒක තමයි යථාර්ථය. ගෑස් මිල වැඩි කරන්න දැන්ම තීරණය කරලා ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පියල් නිශාන්ත මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි හතරක් ලබා දී තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ විනාඩි හතරක් එක්ක තමයි කාලය අවසන් වී තිබෙන්නේ.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා. එතුමා කථා කරන්නේ නැහැ. එතුමාගේ කාලයෙන් විනාඩි දෙකයි මම ගන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම් ඒ විනාඩි දෙක කථා කරන්න.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
හොඳමයි.

ඔබතුමන්ලා බඩු මිල වැඩි කරන්නයි යන්නේ; ඉන්ධන මිල වැඩි කරන්නයි යන්නේ. තමුන්නාන්සේලාට තිබෙන්නේ දුෂ්කර ගමනක්. මේ ආණ්ඩුව ක්‍රියාත්මක කර ගෙන යන ආර්ථික පිළිවෙතේ වැරැද්ද, රට දුවන්නේ නැතිකම, රටේ ආයෝජන නැතිකම, ව්‍යාපාර කඩාගෙන වැටීම, බඩු මිල වැඩිවීම, උද්ධමනය වැඩිවීම, දරාගන්න බැරි පීඩනය මේවා නිසා මේ රටේ මිනිස්සු නොසන්සුන් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ මනස සුවපත් නොකර මාර්ග අනතුරු සිද්ධ කරන්න එපා කියලා අපට කිසිම රියැදුරකුට කියන්න බැහැ; දේශනා පවත්වන්න බැහැ. අර එක මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමා මාර්ග අනතුරු වැළැක්වීම පිළිබඳ දේශනාවක් කළා. මිනිසාගේ මනස තමයි මාර්ග අනතුරු සිදුවීමට බලපාන ප්‍රශ්නය. මානසික වශයෙන් තිබෙන ව්‍යාකූලභාවය. නිරවුල් මනසකින් රිය පදවන මනුස්සයා අතින් අනතුරක් වන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නත් එක්ක, මේ පීඩනයත් එක්ක, මේ වාහන තදබදයත් - traffic jam එකත් - එක්ක, මේ බඩු මිලත් එක්ක, මේ ඉන්ධන මිලත් එක්ක; මේ සමාජය තුළ තිබෙන පීඩනයත් එක්ක මිනිහෙකුට නිරවුල් මනසකින් වාහනයක් එළවාගෙන යන්න බැහැ. ඇයි, මේ රට එළවන්නේ දුර්වල

නායකයෝ. රට ඉදිරියට ගෙන යන්නේ, රට නැමැති රථය අරගෙන යන්නේ දුර්වල නායකයෝ; වැඩ බැරි නායකයෝ; රට විනාශ කරපු නායකයෝ; රට පරාදීන කරපු නායකයෝ; රටේ ආර්ථිකය කඩා වට්ටපු නායකයෝ. ඒ නිසා කොහොමද, අනතුරු වළක්වන්න පුළුවන් වන්නේ? කොහොමද සමබරව ගමනක් යන්නේ? ගමනක් යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. අපට රට විනාශ වුණත්, ආර්ථිකය නැති වුණත් එක සැනසුමක් තිබුණා. ඒක තමයි රටේ බෝම්බ පුපුරන්නේ නැහැයි කියන එක. මම බොහොම සංවේගයෙන් කථා කරන්නේ. අපේ රටට, අපේ රටේ මිනිස්සුන්ට අබමල් රේණුවක හරි වරදක් වෙනවා නම් අපි ඒකට කැමැති නැහැ. හැබැයි, ඒ පෞද්ගලික සිද්ධිද, ආරක්ෂක සිද්ධිද කියලා මම දන්නේ නැහැ. රටේ ඉතිහාසයේ නොවූ විරූ සිද්ධි අද ආරම්භ වෙමින් පවතිනවා. මේවායේ නැවතීම කොතැනද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් එනවා. ඒ නිසා මුළු රටත්, සමස්ත ආර්ථිකයත්, රට තුළ පැවතුණු සාමකාමී වාතාවරණයත් මේ සියල්ල විනාශ කළ දේශද්‍රෝහී ගමන් මහක් තමයි මේ අවුරුදු තුනක කාල පරිච්ඡේදය තුළ ගෙන ගියේ. ඒකට අපේ රටේ ජනතාව නිසි උත්තරය දීලා තිබෙනවා. ඒ නිසා දැන් තිබෙන්නේ මේ පැදගෙන යන රථය නවත්වලා, පුළුවන් මිනිස්සුන්ට භාර දීලා ගෙදර යන එකයි කියලා මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි.

මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා. 3.59]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද, ඉතාමත් වැදගත් නියෝගයක් පිළිබඳව කථා කරන අවස්ථාව. හැබැයි, අපේ සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා නම් කථා කළේ මාතෘකාවට අදාළ නොවන වෙනත් දේවල් ගැනයි. පරණ කරත්තය,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

බැඳගෙන යනවා කියලා තමයි එතුමා කියන්නේ. අනේ, මම දන්නේ නැහැ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා තමයි එතුමා ඉස්සරවෙලාම ප්‍රකාශ කළේ. [බාධා කිරීමක්] මේ අවස්ථාවේ එතුමා පක්ෂයේ නායකයා වන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා අපහාස කළා. සදාචාරාත්මකව එහෙම කියන්න හොඳ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා චෝදනා කරනවා නම් ඒක ඉතාමත්ම බරපතළ වැරැද්දක්. හැබැයි, මම කියන්න කැමැතියි, තමුන්නාන්සේලාත් ඔය කරත්තයේ බඳින්න හරකෙක් ගෙනාවාය කියන එක. ඒ හරකා ගෙනැල්ලා බැඳගෙන කොහොම හරි 113 හදා ගෙන කරත්තයට නඟින්න හැදුවා. ඒක බැරි වුණාට පස්සේ තමයි තමුන්නාන්සේලාත් ඔය කරත්තයට ගරහන්නේ; හරකුන්ට ගරහන්නේ. තමුන්නාන්සේලා කියපු හරකා බැන්දා නම් තමුන්නාන්සේලාට බොහොම ලූන් එකට ඔය කරත්තයේ යන්න තිබුණා. ඒ නිසා කථා කරන කොට කරුණාකරලා පරිස්සමින් වචන කථා කළොත් හොඳයි. කරත්තය පරණයි තමයි; අපි ඒ කරත්තයේ ආපහු ගමන් ආරම්භ කරලා තිබෙනවා තමයි. නමුත් කරත්තයේ තිබුණු අඩු පාඩු විශාල ප්‍රමාණයක් නිවැරදි කර ගෙන තමයි දැන් අපි මේ ගමන යන්නේ කියන එක මතක තියා ගන්න. අර යකඩ පට්ටම් වෙනුවට අපි දැන් ඒකට රබර් පටි දමනවා. ඒ කරත්තයේ තිබුණු අලවංගු වාගේ දේවල් වෙනුවට රේසර් සවි කරලා, අපෙන් සිද්ධ වුණු වැරැදි, අඩු පාඩු මකා ගෙන තමයි අපි මේ කරත්තයේ ආපසු ගමන් ආරම්භ කරන්න සූදානම් වෙලා තිබෙන්නේ. ඇත්තටම අපි අපේ අඩු පාඩු පිළිගන්නවා. ඔව්වර ආඩම්බර වෙන්න එපා; ඔව්වර ලොකුකමට නටන්න එපා; තමුන්නාන්සේලාට පළාත් පාලන මැතිවරණයෙන් ජන වරමක් ලැබුණාය කියලා ඔව්වර නටන්න දෙයක් නැහැ.

රජයක් හැටියට අපෙන් ජනතාවට යම් යම් අඩු පාඩු සිදු වුණු නිසා ජනතාව අපට රිදෙන්න ටොක්කක් ඇන්නා. "උඹලාගේ වැරැදි හදා ගත්තේ නැත්නම් අපි උඹලාට දෙන දඬුවම මෙන්න" කියලා ජනතාව අපට පෙන්නුවා. අපි ඒක බොහොම නිහතමානීව පිළිගෙන වැරැදි හදා ගන්න එක අපේ වැඩක්.

දැන් අපි මෝටර් වාහන පනත යටතේ නියෝගය ගැන විවාද කරද්දී තමුන්නාන්සේ, තමුන්නාන්සේගේ මතවාදය ඒකේ පටවාගෙන ගියා. මෙය ඉතාම වැදගත් පනතක්. හැබැයි, තමුන්නාන්සේ ඒකේත් වැරැද්දක් දැක්කා. බදු අය කර ගන්න, number plates විකුණා ගන්න, රුපියල් 1,500 ගණනේ එකතු කර ගන්න හදනවා වාගේ තමයි කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන තදබදය කියන එක අද අපට බලපා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් කියන එක මම විශේෂයෙන් කියන්න ඕනෑ. [බාධා කිරීමක්] මට විනාඩි දහයක කාලයක් තිබෙන්නේ. කෑ ගහන්නේ නැතුව ඉන්න. දැන් සිසිර ජයකොඩි මන්ත්‍රීවරයා වාහන තදබදය ගැන කිව්වා. මේ වාහන තදබදය අවුරුදු තුනක කාලසීමාව තුළ අපි නිර්මාණය කරපු දෙයක්ද? මේකත් අපි නිර්මාණය කරපු දෙයක් විධියට තමයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් කියන්න ඕනෑ, අපි මේ වාහන තදබදය අවම කර ගැනීම සඳහා රාජගිරියේ ගුවන් පාලම හැදුවා. මේ පාලම විවෘත කරලා දවස් දෙකයි ගත වුණේ, ඒකට පුදුම විවේචන තමයි ආවේ. මේක කඩිමුඩියේ විවෘත කරන්න තිබුණු ප්‍රශ්නය මොකක්ද, මෙයින් මාර්ග තදබදය ඉවත් වුණාද කියලා ඇහුවා. එතුමා දවස් 62කින් හදාපු පාලමක් ගැන කථා කරනවා. කැලණි පාලම දවස් 62න් හැදුවා කියලා එතුමා කියනවා. ආර්.ආර්. සමරකෝන් මහත්මයා "කැලණි පාලම" කියලා වේදිකා නාට්‍යයක් හැදුවා නේ. මම අහන්නේ දවස් 62න් හැදුවා කිව්වේ ඒ "කැලණි පාලම" ගැනද කියලායි. දවස් 62කින් හදාපු කැලණි පාලමක් ගැන නම් අපි අහලා නැහැ. ආර්.ආර්. සමරකෝන් මහත්මයා ඒ වාගේ පාලමක් හදන්න ඇති.

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

අද සිදු වෙන රිය අනතුරු ප්‍රමාණය දිහා බැලුවාම, විශේෂයෙන් අවුරුදු 20ත් - 25ත් අතර තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් රිය අනතුරුවලින් මිය යනවා. රිය අනතුරු නිසා විශාල මිනිස් ජීවිත ප්‍රමාණයක් අද අපට අහිමි වෙනවා. පසුගිය යුද සමයේ රණවිරුවන් අපට අහිමි වුණාට පසුව, ගම්වල අපි ලබන භයානක අත් දැකීමක් තමයි තරුණ පිරිස් පුදුමාකාර විධියට රිය අනතුරුවලින් මිය යාම. අපි රියැදුරු පාසල් ආරම්භ කරලා විතරක් හරියන්නේ නැහැ. රියැදුරන්ට, යතුරු පැදිකරුවන්ට අවශ්‍ය වන නීති-රීති, උපදෙස් සම්බන්ධ විශාල වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියනවා.

ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා කිව්වා, වැලේ වැල් නැතිව හිටපු සූදු අන්තුවෙකුට ලොතරැයියක් ඇදුනා වාගේලු මේ ආණ්ඩුව ලැබුණ එක. අනේ ඉතින්, තමන්ගේ කථාව තමයි ඒ කියා ගත්තේ. වැලේ වැල් නැතිව හිටපු බඩු ටිකකට ලොතරැයියක් ඇදුනා වාගේ දෙයක් තමයි මේ පළාත් පාලන ඡන්දයෙන් සිදු වුණේ. මට මේ කරුණ විශේෂයෙන් කියන්න අවශ්‍යයි. යන්නේ කොහේද, කරන්නේ මොනවාද කියලා හිතා ගන්න බැරුව බලාගෙන හිටපු බඩු ටික, කලින් විදුලි පුටුවට ගෙන යනවා කියලා කෑගැහුවා වාගේ ජාතිවාදය විකුණලා, රට විකුණන්න හදනවා කියලා, මෙන්න ප්‍රජා අයිතිය අහිමි කරන්න යනවා, අපව අත් අඩංගුවට ගන්න හදනවා කියලා, මේ සේරම වපුරලා සභා කිහිපයක් දිනා ගත්තා. හැබැයි, මතක තියා ගන්න මේ පළාත් පාලන ආයතනවලින් 160ක සභා පිහිටුවීමේ බලය අපි සතුව තිබෙනවා. මේ පුංචි සිද්ධියක් අරගෙන ගෙම්බෙක් පනින උඩ. ඒක තමයි මට කියන්න තිබෙන්නේ.

මම ඒ එක්කම කියන්න ඕනෑ, ඒකාබද්ධ පොහොට්ටුව, පොහොට්ටු කණ්ඩායම සූදුවෙන් දිනුවා තමයි. හැබැයි, සූදු පොළේ -මැන්ඩියේ- සල්ලි නැති වේලාවේ තමයි සූදුවෙන් දිනුවේ. මැන්ඩියේ සල්ලි තිබෙන වේලාවේ නොවෙයි මේ අයට මේ සූදු පොළ දිනා ගන්න ලැබුණේ. සූදු පොළේ සල්ලි නැති වේලාවේ තමයි මේ අය දිනුවේ. සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඒක භාගේට කියන්න ඇවිත් නැවැත්තුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ බෝම්බ පුපුරනවාලු. දැන් ඒකත් මෙතුමන්ලාගේ වාසියට හරවා ගන්නයි හදන්නේ. අපි ප්‍රවාහනය ගැන කථා කරන මේ අවස්ථාව වෙනකොට බණ්ඩාරවෙල නගරයේ බස් රථයක් ඇතුළේ බෝම්බයක් පුපුරලා. මෙය ඉතාම කනගාටුදායක සිද්ධියක්. එහි යුද හමුදාවේ කිහිප දෙනෙක් ඉඳලා තිබෙනවා. බරපතළ තුවාල ලබපු සාමාන්‍ය මහින් රාශියක් හිටියා. මේ වන විට හමුදාපතිවරයා ප්‍රකාශ කරලා තිබෙනවා, බෑගයක් ඇතුළේ තිබුණු අත් බෝම්බයක් තමයි මේ ආකාරයට පිපිරිලා තිබිලා තිබෙන්නේ කියලා. හැබැයි, මතක තියා ගන්න, මේ බෝම්බය පිපිරුණු සිද්ධියෙනුත් මේ කණ්ඩායම ජාතිවාදය ගෙන යන බව.

මේ නිසා අපේ ආණ්ඩුවට -අපේ රජයට- ඇඟිල්ල දිගු කරනවා, "මෙන්න ආයෙත් රට පුරා බෝම්බ පිපිරෙන්න පටන් අරගෙන, එක්සත් ජාතික පක්ෂය මූලික කරගත් ආණ්ඩුවක් නිසා ඔන්න දැන් ආයෙත් උතුරේ බෝම්බ මෙහේ පිපිරෙනවා." කියලා. බස් එකක් තුළ බෝම්බයක් පිපිරී යෑම නිසා දැන් මේ ගොල්ලන් ඒ තුළින් ජාතිවාදය ගෙනෙන්න හදනවා. ඒ වාගේම හෙට වෙනකොට, එම කනගාටුදායක සිද්ධිය දඩ මීමා කරගෙන තමන්ට අවශ්‍ය වෙන මතයක් රට තුළ ඇති කරන්න හදනවා. සාලාව හමුදා කඳවුරේ ඉතාම හදිසියේ පිපිරීමක් වුණු ආකාරය අපි දැක්කා. එම සිදුවීම පිටුපස ඉන්නේ කවුද, එම සිදුවීම පිටුපස තිබෙන බලවේගය මොකක්ද කියන එක අපි වහාම සොයන්න ඕනෑ. බණ්ඩාරවෙල සිද්ධ වුණු කනගාටුදායක සිදුවීම සම්බන්ධව අපි රටක් හැටියට කනගාටු වෙනවා. එම සිදුවීමෙන් බරපතළ තුවාල ලැබූ අයට අපි සියලු දෙනා රටක් හැටියට එකතු වී ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්න ඕනෑ. එහෙම නැතුව මේ ගොල්ලන් -ඒකාබද්ධ විපක්ෂයේ උදවිය- එහෙම බස් රථයේ බෝම්බයක් පිපිරී සිදුවුණු අවාසනාවන්ත සිද්ධියෙන් පවා මේ රටේ ජාතිවාදය අවුස්සන්න හදනවා, එම සිදුවීම පාදක කරගෙන ආපසු උතුරේ බෝම්බ මෙහේ පිපිරෙනවා කියලා නැති මානෘකාවකට එන්න හදනවා. කරුණාකරලා ඒ කැත වැඩ, ඒ බාල වැඩ, ඒ නීච වැඩ කරන්න එපා කියන එක මම විශේෂයෙන් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ඊළඟට, බඩු මිල ගැන කථා කරනවා. බඩු මිල ගැන කථා කරන්න මේ ගොල්ලන්ට තිබෙන අයිතිය මොකක්ද? ගෑස් මිල රුපියල් 300කින් වැඩි වෙනවාලු. රුපියල් 2,450ට, රුපියල් 2,500ට තිබුණු ගෑස් මිල තමයි අපි 1,200ට, 1,300ට අඩු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියයට 50කින් මිල අඩු කළා. අපි ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල විශාල වශයෙන් අඩු කළා. මිල වැඩි කිරීමක් සිද්ධ වුණොත් ඒ රුපියල් 5කින්, 10කින් තමයි. හැබැයි, අපි රුපියල් 50, රුපියල් 100 වැනි ප්‍රමාණයෙන් මිල අඩු කරලා තිබෙනවා. අදටත් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය බඩු භාණ්ඩවල මිල ගණන් මීට අවුරුදු 3කට ඉස්සෙල්ලා -2015 ජනවාරි 08 වැනි දා- යහපාලන රජය පත් වුණාට පසුව පැවති මිල ගණන්වලට සාපේක්ෂවම පවතිනවා. දැන් පොල් ගැන කථා කරනවා, වී ගැන කථා කරනවා. අපි බරපතළ නියහයකට මුහුණ දීමේ ප්‍රතිඵලයක් හැටියට ඒවායේ මිල වැඩි වුණා. පොල් බෑයක් ගැන මේ ගොල්ලන් මහ ලොකුවට උඩ දමාගෙන කථා කරනවා. හැබැයි, ගන්නා බඩු මල්ල තුළ පොල් ගෙඩියකට වැය වන මිල වැඩි වුණාට, අනෙක් දේවල්වල මිල අඩු වී තිබෙනවා. රුපියල් 235ට, 240ට, 250ට ගත් සැමන්වල මිල අද රුපියල් 125යි, 130යි, 135යි. පොල්ම කාලා ජීවත් වෙන්න හදන මීයෝ ටිකක් වාගේ තමයි මේ අය කථා කරන්නේ. ඒ නිසා යහපාලන රජය තුළ අපි අඩු කරපු බඩු මිල මේ අයට කිට්ටු කරන්නවත් බැරි මට්ටමට තවම -අදටත්- අඩුයි කියන එක මම විශේෂයෙන් කියනවා.

ඒකාබද්ධ පොහොට්ටුවේ කණ්ඩායමට අර නන්නත්තාර වෙලා හිටපු සූදු අන්තුවෙකුට ලොතරැයියක් ඇදුණා වාගේ වැඩක් වුණේ. පසුගිය මැතිවරණය දිනලා දවස් දෙක ගත වෙනකොට, අපි ගම්වල කරපු සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව තිබුණු පුවරු සියල්ල ඒවායේ බටත් එක්කම නැහැ. බෝඩවත් නැහැ, මොනවත් නැහැ. සියල්ලම වීසි කරලා. මගේ ආසනයේ සිදුවුණු එවැනි සිදුවීමක් සම්බන්ධ photo එකක් මට viber කරලා එවා තිබුණා. මේ දවස් ටිකේ අපි කොළඹ තමයි ඉන්නේ. මගේ ආසනයේ කඳුබොඩ ආරණ්‍ය සේනාසනයක් තිබෙනවා. අපි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ගමට දුන් සල්ලිවලින් එම ආරණ්‍ය සේනාසනයට ජල ව්‍යාපෘතියක් ලබා දුන්නා. එයට අදාළ බෝඩ් එකේ ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ මුහුණු යොදා තිබුණා. අන්න, පොහොට්ටුවේ ඉන්නා පොල් ලෙලි කෑලි ටික එම ජල ව්‍යාපෘතියට අදාළ බෝඩ් එකත් කඩා වීසි කරලා. බන්දුල ගුණවර්ධන මහත්මයා ඇත්ත තමයි කිව්වේ. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැත්තෙන් ඡන්දයට ඉදිරිපත් කළේ, පොල් ලෙලි කෑලි ටිකක් කියලා කිව්වේ ඒක තමයි. එතුමාම කිව්වා. අපි අපේ පක්ෂවලින් උගතුන්, බුද්ධිමතුන්, වැදගත් මිනිසුන්, ගුණගරුක මිනිසුන් පුදුම අමාරුවකින් සොයා ගෙන, සම්මුඛ පරීක්ෂණවලට ලක් කරලා ඉදිරිපත් කරද්දී ඒකාබද්ධ විපක්ෂයෙන් ඉදිරිපත් කළේ කවුරුන්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගමේ හිටපු හොඳම කසිප්පුකාරයා, කසිප්පුකාරයාගේ පවුල, ගංජාකාරයා, ලීමෝල්කාරයා, වැලි, මැටි, පස් ජාවාරම් කරපු අය. මෙන්න, ඒ අය දිනලා. ඒක තමයි කිව්වේ. "අපි පොල් ලෙලි කෑල්ලක් දැම්මත් දිනනවා." කියලා කිව්වේ ඒකයි. ඒ පොල් ලෙලි කෑලි ටික තමයි දැන් මේ වැඩ ටික කරන්නේ. ඒ නිසා සමස්තයක් හැටියට ඡන්දය දුන් උගත්, බුද්ධිමත් මිනිසුන්ට බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා කළේ බරපතළ අපහාසයක්. ඒකාබද්ධ පොහොට්ටුවේ නියෝජිතයන් පත්වීම සඳහා ඡන්දය ලබා දුන් සියලු ඡන්ද දායකයින්ට බන්දුල ගුණවර්ධන මහත්මයා කළේ බරපතළ අපහාසයක්.

මේ රටේ සිටින වැදගත්, බුද්ධිමත් ජනතාව ඡන්දය දුන්නේ පොල් ලෙලි කෑලිවලටද කියන තර්කය මේ අවස්ථාවේදී මම මතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

[අ.භා. 4.11]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනතට අද ගෙන එන සංශෝධනය පිළිබඳව කතා කිරීමේදී කිව යුතුයි, මෙය සභානායකතුමා නොව, අපේ අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා නොව ප්‍රවාහන අමාත්‍යතුමා ඇවිල්ලා ඉදිරිපත් කරයි කියා මා බලාපොරොත්තු වූ බව. මා කල්පනා කර කර සිටියේ මේ සංශෝධනය අලුත් අගමැතිතුමා හැටියට එතුමා ඉදිරිපත් කරයිද, එහෙම නැත්නම් වෙනත් කෙනකු ඉදිරිපත් කරයිද කියලායි. කොහොම වුණත් පසු ගිය කාලයේ -විශේෂයෙන්ම පසු ගිය සතියේ- රූපවාහිනී ප්‍රවෘත්ති සහ breaking news දිහා බලාගෙන සිටියා නම් රටේ තිබෙන ප්‍රශ්නය මොකක්ද කියන එක ජනතාවට හඳුනාගන්න තිබුණා. මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රශ්නයක් තිබෙනවා ද කියා නොහිතෙන තරමටම ඒ ප්‍රවෘත්ති බලවත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දකින්න ඇති පළාත් පාලන මැතිවරණයෙන් පසුව මේ රටේ ඇති කරපු සෝෂාව. විජේරාමයේ, මහගමසේකර මාවතේ, සිරිකොත ළඟ, අරලියගහ මන්දිරය ළඟ කැමරා අටවා ගෙන මේ රටේ මාධ්‍යවලින් පෙන්වූ අතිසුඛෝපභෝගී වාහන ටික දැක්කාට පසුව, ඒවා දිහා බලාගෙන සිටි මේ රටේ ජනතාවට සිතෙන්න ඕනෑ, 'අනේ මේ අපේ බදු මුදල් නේද, අපේ බදු සල්ලිවලින් නේද මේවාට තෙල් ගහන්නේ?' කියා. එහෙම නිතෙන තරමට අතිසුඛෝපභෝගී වාහන double lights දාගෙන එහාට මෙහාට ගියා. අවසානයේදී වෙව්ව දෙයක් නැහැ. නටපු තොවිලෙකුත් නැති බෙරේ පළුවකුත් නැති තත්ත්වයකට තමයි පත් වී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රවාහන ප්‍රශ්නය අද ඉතාම බරපතළ අඩියකට වැටිලායි තිබෙන්නේ. එය තවත් උග්‍ර වෙමින් යනවා. ආණ්ඩුව හැටියට බලයේ සිටින කවර කණ්ඩායම හෝ ඒ කෙරේ අවධානය යොමු නොකළොත් අපේ රටේ ආර්ථිකයට ඊළඟ මරු පහර වදින්නේ ප්‍රවාහනයෙනුයි. ප්‍රවාහන ප්‍රශ්නය විසඳීම සඳහා පසු ගිය කාලය පුරාවට යම් හෝ වැඩපිළිවෙළක් අනුගමනය කරනවා කියා අපට පෙනුණේ නැහැ. පසුගිය ආණ්ඩුව කාලයේත් තිබුණු පාරවල් පුළුල් කළා හැර ප්‍රවාහන ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් යෝජනා කරන ලද, ක්‍රියාත්මක කරන ලද සැලසුම්සහගත විද්‍යාත්මක වැඩ පිළිවෙළක් අපි දැක්කේ නැහැ. එවැනි වැඩ පිළිවෙළක් මේ රටේ සාකච්ඡා නොකෙරුණා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් මා ඒ ගැන දන්නවා. අපේ මොරටුව විශ්වවිද්‍යාලයේ තිබෙනවා, ග්‍රාම හා නගර නිර්මාණ දෙපාර්තමේන්තුව. වසරකට උපාධිධාරීන් සියදෙනෙක් පමණ එයින් එළියට එනවා. දෙපාර්තමේන්තුවක් හැටියට එය අපේ රටට ඕනෑ කරන නව නගර සහ ග්‍රාම නිර්මාණ සැලැස්ම අවුරුදු ගණනාවක් තිස්සේ විටින් විට එළිදක්වා තිබෙනවා.

විශේෂයෙන්ම මහාචාර්ය අමල් කුමාරගේ මහතා ප්‍රවාහනයට සම්බන්ධ ගැටලු ගණනාවක් විශ්ලේෂණය කරලා අපේ රටේ මේ තිබෙන ආර්ථිකය තුළ ඒවාට ගත හැකි විසඳුම් යෝජනා කර තිබෙනවා. නමුත් ඒ කිසිදු විසඳුමක් පයිසයකට හෝ මායිම් කරන්නේ නැතිව තමයි අලුත් අලුත් වැඩ පිළිවෙළ සකස් වන්නේ. මහානගර අමාත්‍යාංශය වුණත් තමන්ගේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ වේලාවේ එකී විද්වතුන්ගේ, බුද්ධිමතුන්ගේ දායකත්වයක් ලබා ගත්තා ද කියන සැක සංකාව මට තිබෙනවා. කොහොම වුණත් ප්‍රවාහන ප්‍රශ්නය විසඳනවා නම් එය හුදු දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හෝ එහෙමත් නැත්නම් CTB එකේ හෝ ප්‍රශ්නයක් නොවෙයි. එය සමස්ත සමාජයත් එක්ක ගැට ගැසී තිබෙන ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටම පෙනෙනවා ඇති, පාසල් ආරම්භ වන වේලාවේත්; පාසල් අවසන් වන වේලාවේත් මේ රටේ තිබෙන වාහන තදබදය. දැනට නඩත්තු කරගෙන යමින් තිබෙන ජනප්‍රිය පාසල් වෙත බොහෝ ඈත ඉඳන් -දුර බැහැර ඉඳන් - එන පාසල් බස් රථ, වෑන් රථ ගමන ආරම්භ කරන්නේ සමහර විට උදේ 5.00ට හෝ 5.30ට යි. ඒ වාහනවල දරුවන් පටවාගෙන ඇවිත් ඒවා ඒ පාසල් ළඟ ගාල් කර තැබීමෙන් කොතරම් ප්‍රවාහන ප්‍රශ්නයක් ඇති වනවාද කියා ඔබතුමාට පෙනෙනවා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තවත් හේතුවක් තමයි, ප්‍රධාන නගරවල සවස් යාමයේ පැවැත්වෙන ටියුෂන් පන්ති. ඒවා ආශ්‍රිතව ඇති වී තිබෙන තදබදය ද තවත් ප්‍රශ්නයක්. වෙනදාට නම් ගත්තොත්, ටියුෂන් එක හවසට අවසන් වනවා; දරුවා ගෙදර යනවා. හැබැයි දැන් එහෙම නොවෙයි. දැන් ටියුෂන් එක රෑ 7.30, 8.00, 9.00 පමණ වන තුරු පැවැත්වෙනවා. ඒ නිසා දෙමව්පියන්ට සිද්ධ වනවා මෝටර්සයිකල් පැත්තක තියලා රෝද හතරක වාහනයක් අරගෙන ඇවිල්ලා තමන්ගේ දරුවා එන තුරු පෝලිමේ ඉන්න. ඒවාත් මේ ප්‍රවාහන ප්‍රශ්නයට බලපානවා.

මා හොඳටම දන්නා කාරණයක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඇමතිතුමනි, උදේට නුගේගොඩ, පැපිලියාන පැත්තේ සිට ඇතිවන වාහන තදබදයට බලපා තිබෙනවා කියලා කියන්නේ ඒ ආශ්‍රිතව තිබෙන ජාත්‍යන්තර යැයි කියා ගන්නා පෞද්ගලික පාසලක සැලැස්මකට අනුකූලව රථවාහන පෙළ ගැස්වීමත්, සමහර පාරවල් වහලා තිබෙන කාරණයයි. ඒ මත අපේ හොරණ සහ බණ්ඩාරගම පැත්තේ සිට එන ජනතාවට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය නිසා ඔවුන්ගේ ගමන් කාලයට වඩා අමතර පැයක් එකහමාරක් පාරට වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

මේ මාර්ග තදබදය, අධ්‍යාපනයත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; අපේ රටේ කර්මාන්ත ව්‍යාප්තියත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; අපේ රටේ වෙළඳ පොළත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; ඒ වාගේම අපේ රටේ රජයේ ආයතන ස්ථානගත වෙලා තිබෙන තැන් සමඟ ඇති වුණු ප්‍රශ්නයක්. ඒ නිසා පාරවල් පළල් කිරීමෙන් හෝ එහෙම නැත්නම් වාහනවලට බදු වැඩි කරලා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වාහන ආනයනය කිරීම සීමා කිරීමෙන් හෝ මේ ප්‍රශ්නය විසඳන්න හැකි යැයි කවුරු හෝ හිතනවා නම්, එය කළ හැකි වැඩක් නොවෙයි. රටට සම්පූර්ණ සැලැස්මක් අවශ්‍යයි. ඒ සැලැස්මේ කොටසක් තමයි ප්‍රවාහනය කියලා කියන්නේ. ඒ ඔස්සේ ප්‍රවාහන ප්‍රශ්නය විසඳනවා මිසක් තැන් තැන්වලින් අල්ලාගෙන කරන්න පුළුවන් වැඩක් නොවෙයි, මෙය. මම හිතනවා, මේකට තිබෙන ඉතාම සුදුසු සහ අපට ගැළපෙන විසඳුම පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම බව. පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කළ හැම රටකම ප්‍රවාහන ප්‍රශ්නය යම් තරමකට විසඳාගෙන තිබෙනවා. අපි හොයලා බලන්න ඕනෑකම තිබෙනවා, අපේ රටේ ජනතාව මේ පොදු ප්‍රවාහන සේවයෙන් දිනෙන් දින ඈත් වෙන්නේ ඇයි කියලා. දැන් ඒකට තමයි විසඳුම් සොයන්නට ඕනෑකම තිබෙන්නේ. යුරෝපයේ, එංගලන්තයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනතාව පොදු ප්‍රවාහනය කෙරෙහි යොමු වෙනවා නම්; කලට වෙලාවට බස් එක හෝ දුම්රිය එනවා නම්, එහි පහසුකම් ටික තිබෙනවා නම්, වගකීම එහි පාලන අධිකාරිය විසින් දරනවා නම් මම හිතනවා, අපේ රටේ ජනතාවත් පොදු ප්‍රවාහන සේවය කෙරෙහි ආසක්ත කරන්න පුළුවන්කම තිබෙන බව. ඒ නිසා පොදු ප්‍රවාහන ක්‍රමය දියුණු කරන්නේ නැතුව වාහන සංඛ්‍යාව අඩු කරන්නට හෝ ජනතාව මහ මහ රස්තියාදු වෙන එක වළක්වන්නට බැරි වේවි.

දැන් තමුන්නාන්සේලා රුපියල් 1,500ක් තවදුරටත් ජනතාවගෙන් අය කර ගන්නා වෙලාවේ මම අහන්නට කැමතියි, පසුගිය කාලයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ සිද්ධ වුණු වංචා දූෂණ වළක්වා ඒවායින් යම් මුදල් ප්‍රමාණයක් ඉතුරු කරගෙන ජනතාවට සහනයක් දෙන්න තමුන්නාන්සේලා කටයුතු කරනවාද කියලා. මොකද, ඊයේ කථා කරන්න නියමිතව තිබිලා නමුත් කථා කරන්න බැරි වුණු විවාදය ගැන බලන්න. මම දන්නේ නැහැ, ඇත්තටම දෙමළ භාෂා පරිවර්තනයේ ප්‍රශ්නයක් නිසාමද ඒ විවාදය නතර වුණේ කියලා. ඒක නතර වුණු ආකාරය හරිම ජුගුප්සාජනකයි. ජනාධිපතිතුමාට භාරදුන් බරපතළ වංචා දූෂණ සම්බන්ධ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව තිබෙන 15වන විමර්ශනය පිළිබඳව අවධානය යොමු කරන්න මා මේ අවස්ථාවේදී කැමැතියි. එය "නාවලපිටිය දුම්රිය ස්ථානයට අයත් රක්ෂිත ඉඩම බදු පදනම මත මහින්දානන්ද පදනම වෙත ලබාදීමේදී සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධ පෙත්සම" සම්බන්ධවයි.

පසුගිය මැතිවරණ වේදිකාවේ ජනාධිපතිතුමා බොහොම උජාරුවෙන් කිව්වා, "කඩුව අරගෙන හතර අතේ වනනවා. දැන් මේ කඩුවට කවුරු කවුරු අහුවෙයි ද දන්නේ නැහැ" කියලා. ජනාධිපතිතුමාට භාරදුන්නා, ඒ වාර්තාව. -මේ පරීක්ෂණ 34 සම්බන්ධයෙන් ඇති සම්පූර්ණ වාර්තාව නොවෙයි.- මේ මම කියන නාවලපිටිය දුම්රිය ස්ථානයට අයත් රක්ෂිත ඉඩම් මහින්දානන්ද අලුත්ගමගේ පදනමින් බදු අරගෙන වංචා කිරීම පිළිබඳ වාර්තාව භාරදුන්නේ 2017 ජුනි 01 වෙනිදා. මීට මාස හයකට කලින්. මේකේ පාර්ශ්වයන් හැටියට හඳුනාගෙන තිබෙනවා, මහින්දානන්ද අලුත්ගමගේ පාර්ලිමේන්තු මන්ත්‍රී, අංක 70, කින්සි පාර, කොළඹ 07; පාලිත ආරියරත්න, වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරි; විජය අමරතුංග, වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරි; ගාමිණි සෙනෙවිරත්න, වැඩ බලන නියෝජ්‍ය වාණිජ අධිකාරි සහ නාවලපිටිය නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක්. එතකොට දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් 2005 සිට 2009 වනතෙක් පස් අවුරුදු බදු පදනමකට අරගෙන ඊට පස්සේ 2010 ජනවාරි 01 වෙනිදා සිට 2015 ජනවාරි 10 දක්වා අවුරුදු පහක්, අර කලින් ගත්ත බදු පදනම මතම, ඒ බදු කොන්දේසි කිසිවක් සලකන්නේ නැතුව, කිසිදු බදු ගෙවීමකින් තොරව, ඒ බදු ඔප්පුව උල්ලංඝනය කරලා, මහල් තුනක ගොඩනැඟිල්ලක් හදලා, "මහින්දානන්ද පදනම සමිති ශාලාව" කියලා පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාත් මේ සිද්ධිය දන්නවා, නේද? එතකොට මම අහන්නේ මේ වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙද්දී, දුම්රිය දෙපාර්තමේන්තුවට සිදුවුණු මේ අලාභය විතරක් නොවෙයි, මෙහි සඳහන් වන විධියට නාවලපිටිය දුම්රිය ස්ථානාධිපතිට වෙන් කර තිබුණු රුපියල් 1,050,000ක් වටිනා අංක 33 දරන නිල නිවස සහ කණිෂ්ඨ නිලධාරීන්ගේ 1,480,000 ක් වටිනා නිල නිවාස 12ක් ඇතුළු රුපියල් ලක්ෂ 200ක් වටිනා ඉඩම හිස් භූමියක් හැටියට ව්‍යාජ තොරතුරු පෙන්වා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් මහින්දානන්ද පදනම කියන ගොඩනැඟිල්ල හදන්න අරගෙන තිබෙනවා.

මෙම වංචා, දූෂණ පිළිබඳ විමර්ශන වාර්තාව අපේ රටේ ඉන්න ඉතා කීර්තිමත් විනිශ්චයකාරවරු, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු, මහාධිකරණ විනිශ්චයකාරවරු මාස 6කට කලින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ඉදිරිපත් කරලා තිබෙන්නේ රටේ විධායකයට. හැබැයි, එතැනින් එහාට ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. විධායකයට ඉදිරිපත් කළාට පසුව මේ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ ජනාධිපතිතුමා ඇතුළුව මෙම අමාත්‍ය මණ්ඩලය වග කියන්න ඕනෑ. ඒ නිසා එවැනි දේවල්වලට ක්‍රියාමාර්ග ගන්නේ නැතිව තමුන්නාන්සේලා ජනතාව මත බදු පටවමින්, ජනතාව මත ගාස්තු වැඩි කරමින් මේ යන ක්‍රියාවලිය අපි කවුරුවත් අනුමත කරන්නේ නැහැ.

මේ රටේ ජනතාව 2015 ජනවාරි මාසයේදී තමුන්නාන්සේලාට හරිහමන් පාරක් පෙන්නුවා. ඒ පාර පෙන්වලා තමුන්නාන්සේලාට යන්න කිව්වා, හොරු අල්ලන පාරේ. හැබැයි, තමුන්නාන්සේලා ගියේ හොරු ආරක්ෂා කරන පාරේ. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට පෙන්නුවා, හොරකම් නොකරන පාරක්. හොරකම් නොකරන පාරක යන්න කියලා කිව්වා. හැබැයි, තමුන්නාන්සේලා ගියේ හොරු ආරක්ෂා කරනවා වාගේම හොරකම් කරන පාරේ. ඒ වාගේම තමුන්නාන්සේලාට පෙන්නුවා, නීතිය ශක්තිමත් කරන පාරේ යන්න කියලා. තමුන්නාන්සේලා ගියා, නීතිය නවන පාරේ. තමුන්නාන්සේලාට පෙන්නුවා, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන පාරේ යන්න කියලා. තමුන්නාන්සේලා දැන් යමින් ඉන්නේ විධායකය තවදුරටත් ශක්තිමත් කරන පාරක. තමුන්නාන්සේලාට ජනතාව පාරක් පෙන්වලා තිබෙද්දිත් තමුන්නාන්සේලා ඒ පාරේ නොයා බැදිවල ගමන් කරමින් ඉන්නවා. එසේ බැදිවල ගමන් කිරීමට ජනතාව දුන්නු හොඳ අතුල් පහරක්; කනේ පහරක් තමයි මේ 2018 පළාත් පාලන ආයතන මැතිවරණ ප්‍රතිඵලය. ඒක ඉලක්කම් විජ්ජාවලින් වෙන වෙන ආකාරයට විග්‍රහ කර ගත්තාට, ජනතාව දීපු ජනවරම තමුන්නාන්සේලා ආරක්ෂා නොකළාට, හොරු ආරක්ෂා කළාට, වෙන වෙන බැදිවල ජනතාවත් අරගෙන යන්න හදනකොට ජනතාව ඒකට හොඳ පහරක් දීලා තිබෙනවා. ඒ නිසා අපි කල්පනා කරනවා, තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂය හෝ ආණ්ඩුව කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ ඡන්ද පදනම අඩුවීමේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ කියලා. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනතාව තමන්ගේ ජීවිත අනතුරේ හෙළාගෙන, තමන්ගේ ළඟ්තීන්, තමන්ගේ පවුල් යනාදී සියල්ල අනතුරේ හෙළා ගෙන ගත් තීරණයක් තිබුණා. ඒ තීරණය ආපස්සට හැරවිය හැකි මට්ටමට ඒ ජනවරමට බාධාවන අයුරින් හැසිරිලා තිබෙන්නේ තමුන්නාන්සේලායි. එම නිසා අඩු තරමින් මේ අවස්ථාවවත් පාවිච්චි කරලා 2015 ජනවාරියේ මේ රටේ තීන්දුවක් ගත්ත ලක්ෂ 62ක ජනතාවට සාධාරණයක් කරයි කියලා අපි හිතනවා. ඒ ජනතාවට යුක්තිය ඉටු කරලා දෙන්න, ඒ ජනතාවගේ වරම ආරක්ෂා කරලා දෙන්න තමුන්නාන්සේලා අඩුම තරමින්

දැන්වත් කල්පනා කරයි කියලා හිතනවා. එහෙම නැත්නම් මේ සුනාමිය ඊටත් වඩා බරපතළ තත්ත්වයකට පත් වේවි. ඒ නිසා දැන් අපි මේ ජනවරම ආරක්ෂා කරන අතරේම, මම කලින් කිව්වා වාගේ රටේ ප්‍රවාහන ප්‍රශ්නය ඉලක්ක කර ගත් සැලැස්මක් අපට වුවමනා කරලා තිබෙනවා. ඒ සැලැස්මේ අපට කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන වැඩ පිළිවෙළවල් තිබේවි. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන ඇති පදමින් යොදවන්න සිදු වෙනවා. ඒ සඳහා අවධානය යොමු කරන්න. මේ ප්‍රවාහන ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් ලෙස අරගෙන ඉදිරියේදී රටේ ආර්ථිකයට මීට වඩා දැවැන්ත ආකාරයට බලපාන ප්‍රශ්නයක් විධියට තේරුම් අරගෙන එය විසඳීම සඳහා මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
ස්තූතියි.

මීළඟට, චන්දිම ගමගේ ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.25]

ගරු චන්දිම ගමගේ මහතා
(*மாண்புமிகு சந்திம கமகே*)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද 1951 මෝටර් වාහන (විවිධ) නියෝගය, එහි හතරවැනි උපලේඛනයේ 6 හා 7 අයිතමයන් ඉවත් කිරීමටයි එදා මෙම තීරණය අරගෙන තිබෙන්නේ. එයින් කියැවුණේ, තමන් විසින් සකස් කර ගත්ත අංක තහඩුවක් සවි කර ගත්ත කාල වකවානුවක වාහනයේ බොනට්ටුවට වැඩිය පහළ මට්ටමින් සවි කිරීම සහ එම අංක තහඩුවේ උස අහල් 5කට වැඩිය අඩු විය යුතුයි යන්නයි. ඒ වාගේම වාහනයේ පිටුපස windscreen එක මත අංක තහඩු සවි කිරීම තහනම්. ඒ අයිතමයන් දෙක ඉවත් කරලා 2013 අංක 1833/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබූ නියෝගයට තවදුරටත් වලංගුභාවය ලබා දීම තමයි අද කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා කිව්වා, අලුත් ආණ්ඩුවෙන් බදු අය කරනවා කියලා. එතුමාට මතක් කර දෙන්නට ඕනෑ, 2013 සිට අය කරන ගාස්තුවක් ගැන තමයි අද අපි විවාදයට අරගෙන තිබෙන්නේ කියන එක. 1951 මෝටර් වාහන (විවිධ) නියෝගය, එහි සතරවන උපලේඛනයේ අයිතමයන් දෙකක් ඉවත් කිරීම තමයි මෙම නියෝගයෙන් සිදු කරලා තිබෙන්නේ.

ඒක මතක් කරලා දෙන්නට ඕනෑ. මොකද, "මේ යහ පාලන ආණ්ඩුවෙන් බදු ගහනවා." කියලා සමහර මන්ත්‍රීවරු වැරදි අර්ථ කථනයක් දෙන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහනවල අංක තහඩු සවි කිරීම ගැන කථා කරද්දී මතක් කර දෙන්නට ඕනෑ, 1956දී අපේ රටේ "ශ්‍රී" අකුර සහිත වාහන අංක යොදා ගත්තා. ඒ අවස්ථාවේ රටේ හර්තාලයක් ඇති වෙලා උතුර ගිනි ගත්තා. දෙමළ ජනතාව ජීවත් වූ ප්‍රදේශවල "ශ්‍රී" අකුර දෙමළෙනුත්, දකුණ ඇතුළු සිංහල ජනතාව ජීවත් වුණු ප්‍රදේශවල එම අකුර සිංහලෙනුත් යොදන්නට ගිහිල්ලා ජාතිවාදය ඇවිස්සුණු පළමු සිද්ධිය එදා තමයි ඇති වුණේ. මේ අංක තහඩු ගැටලුව ජාතිවාදය ඇවිස්සුණු සිද්ධියක් බවට එදා පත් වුණා. ඊළඟට, අංක තහඩු නැති යුගයකුත් තිබුණා. ඒ තමයි 2015 ජනවාරි 08වැනි දා යහ පාලනය හරහා ජනාධිපතිවරයා පත් කරනතාක් කල් හිටපු රෙජීමය රජයේ යුගය. ඒ රජයේ හිටපු උදවියගේ හොර මැරකම් වසන් කර ගැනීමට එදා අංක තහඩු නැති, අංක තහඩු වෙනස් කළ සුදු පාට වෑන්වලින් ඇවිල්ලා ඒ රජයට විරෝධී පුද්ගලයන් පැහැරගෙන ගිහිල්ලා තර්ජනය කිරීම, පහර දීම, මරා දැමීම හා අතුරුදන් කිරීම සිදු කළා. විවිධ ගනුදෙනුවලින් උපයාගත් අයථා මුදල් සම්බන්ධයෙන් කරුණු හෙළි කිරීම වැළැක්වීමට මාධ්‍ය ආයතනවලට පහර දීමට, මාධ්‍ය ආයතන විනාශ කිරීමට, මාධ්‍ය ආයතන මර්දනය කිරීමට කටයුතු කළා. අංක තහඩු නැති වාහන පාවිච්චි කරලා රාජ්‍ය අනුග්‍රහයෙන් කෙරුණු මේ වාගේ මර්දනකාරී, මැර ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙච්ච යුගයක් තිබුණා. ඒ කාලයේ රටට මර බිය උදා කරලා ඒ රාජපක්ෂවරුන්ගේ පාලනයට විරුද්ධව කථා කරන ඕනෑම කෙනෙකුට දඬුවම් දෙන්න සුදු වෑන්, එහෙම නැත්නම් අංක තහඩු නොමැති, එහෙමත් නැත්නම් අංක තහඩු වෙනස් කළ වාහන යොදා ගැනීමට කටයුතු කළා. හැබැයි, ඒ පාලනයට හයේ එදා කට වහගෙන සිටි උදවිය, එදා නිහඬව සිටි උදවිය, එදා නිශ්ශබ්දව සිටි මාධ්‍ය ආයතන අද යහ පාලනයට විරුද්ධව කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටේ ඒ කාලයේ ගොදුරු බවට පත් වුණේ ඒ පැවැතුණු පාලනයට විරුද්ධ වුණ උදවියයි. ඒ කාලයේ පැවතුණු ආණ්ඩුවට, ඒ පාලනයට විරුද්ධ වුණු උදවියට මේ රටේ ජීවත් වීමට අයිතියක් නැහැ කියන බොහොම බරපතළ නරක පූර්වාදර්ශයක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු ජනාධිපති රාජපක්ෂ මැතිතුමාගේ කාර්ය මණ්ඩලීය ප්‍රධානී තමයි, ගාමිණී සෙනරත් මැතිතුමා. අපට මතකයි, 2014 අවුරුද්දේ අවසන් මාසවල එතුමාගේ ගෙදරට නිතර දෙවේලේ වාහන එන්න යන්න පටන් ගත්තා. ඒවා නිකම් නොවෙයි ආවේ. සල්ලි මලු පුරවාගෙන තමයි ආවේ. කළු සල්ලි කෝටි ප්‍රකෝටි ගණන් ප්‍රවාහනය කරන්න ඒ වාහන යොදා ගත්තා. මේ තොරතුරු අද වන කොට අපරාධ විමර්ශන කොට්ඨාසයට වාර්තා වෙලා තිබෙනවා. ඒ මුදල්වලට මොකද වුණේ කියලා ඉදිරියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නඩු විභාග කරයි කියලා අපි විශ්වාස කරනවා. 2014.11.19වන දා රාත්‍රී 12.30ට පමණ WP KL 1824 දරන කළු පාට ජීප් රථයෙන් මිලියන 43ක් ලෙස සඳහන් වූ කාඩ්බෝඩ් පෙට්ටි 4ක මුදල් ගෙනැල්ලා තිබුණා. ඒ වාගේම මිලියන 11ක මුදලක් තැන්පත් කරපු පෙට්ටියක්, මිලියන 20ක් තැන්පත් කරපු පෙට්ටියක් තිබුණා. මේ සෙනරත් මැතිතුමාගේ ගෙදරට සල්ලි ගෙනාපු වාහනයක්. මේ ඔක්කෝම අංක තහඩු තිබෙන වාහන.

ඊළඟට, WP LM 0522 වාහනයෙන් කිලෝ 50ක් බර ඇති මුදල් පුරවන ලද කාඩ්බෝඩ් පෙට්ටියක් ගෙනැවිත් තිබෙනවා. චීන ජාතික කාන්තාවන් දෙදෙනෙක් තමයි මේ සල්ලි ගෙනැල්ලා තිබෙන්නේ. මේක ගියේ සෙනරත් මැතිතුමාගේ නිවසට. ඊළඟට, KB 5610 වාහනයෙන් 2014.12.19වැනි දා රාත්‍රී 8.00ට පමණ අරලියගහ මන්දිරයේ සිට ලොකු travelling bags දෙකක තමයි සෙනරත් මැතිතුමා ඔහුගේ ගෙදරට මුදල් අරගෙන ගිහින් තිබෙන්නේ. ඊළඟට, KM 1424 වාහනය. 2013.11.20 උදේ 9.00ට පොහොර බෑග් දෙකක් පුරවලා මේ වාහනයෙන් තමයි සෙනරත් මැතිතුමාගේ නිවසට මුදල් රැගෙන ආවේ.

ඒ වාගේම KV 5270 දරන ජීප් රථයෙන්, ලොකු travelling bags දෙකකින්, 2014.04.28වන දා සෙනරත් මැතිතුමාගේ නිවසට මුදල් ගෙනැල්ලා තිබුණා. ඒ ඔක්කෝම අංක තහඩු සඳහන් වාහන. ඒ නිසා මේ "අංක තහඩු" කියන එක බොහොම වැදගත්. මේ වාගේ තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අදාළ කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. මෙතැනදී විවිධ උදවිය, විවිධ උපක්‍රම හරහා, වාහන අංක තහඩුවලට අදාළ නියෝගය පිළිබඳ මේ විවාදයට දේශපාලනය ඇදා ගන්න උත්සාහ කළා. පසුගිය මැතිවරණයේදී ජනතාව අපට අනතුරු ඇඟවීමක් සිදු කළා. අපි මොනවා කිව්වත්, හොරු අල්ලපු

[ගරු වන්දිම ගමගේ මහතා]

නැති ප්‍රශ්නය තිබෙනවා. අල්ලපු හොරුත් මාස දෙක-තුනක් බන්ධනාගාරයේ ඉඳලා ඇප අරගෙන එළියට ඇවිල්ලා, "අපි හොරකම් කළේ නැහැ, හොරු ඇල්ලුවාද?" කියලා අපෙන් අහනවා. එතකොට බලාගෙන ඉන්න මිනිස්සුත් හිතනවා, "මේ මිනිස්සු හොරකම් කරලා නැහැ, ඔය එළියේ ඉන්නේ!" කියලා. තමුන්නාන්සේලා දන්නවා, මාස තුනක් විතර බන්ධනාගාරය ඇතුළේ හිටියාට පසුව ඕනෑ කෙනෙකුට ඇප ලබා දෙන බව. අදාළ තොරතුරු විභාග කළාට පස්සේ ඇප ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. එහෙම ඇප අරගෙන ඇවිල්ලා විළිලජ්ජා නැතුව අහනවා, "හොරු ඇල්ලුවාද?" කියලා. ඒ වාගේම අල්ලපු නැති හොරු ටිකකුත් ඉන්නවා. ඒ බවත් අපි කියනවා. ඉදිරියේදී ඒ හොරු ඇල්ලීම තමයි මේ රජයේ, ඒ වාගේම අදාළ අමාත්‍යාංශවල, අදාළ බලධාරීන්ගේ වගකීම වන්නේ. හොරු ඇල්ලීම සහ බඩු මිල පිළිබඳව විතරක් නොවෙයි, තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

පසුගිය කාලයේ රජයක් විධියට අපි මේ රටේ සම්පත් අනවශ්‍ය විධියට ආරක්ෂා කරන්න උත්සාහ කළා. එදා බොරලු ටික, කළු ගල් ටික, වැලි ටික, ඒ වාගේම පස් ටික තොරතෝංචියක් නැතුව කපලා විනාශ කරනකොට අපි නීති රාමුවක් ගෙනැල්ලා, මතු පරම්පරාවට ඒ සම්පත් ආරක්ෂා කරලා දෙන්න අවශ්‍ය කටයුතු සිදු කළා. හැබැයි ඒකෙන් මොකක්ද වුණේ? රුපියල් 6,000ට-7,000ට තිබුණු වැලි කියුබ් එකක මිල රුපියල් 11,000 වෙනකල් ඉහළ ගියා. මා නියෝජනය කරන්නේ අනුරාධපුරය, කැකිරාව ආසනය. මනම්පිටියෙන් වැලි අරගෙන කැකිරාවට ගෙනෙනකොට කලින් රුපියල් 9,000ටයි අළෙවි වුණේ. ඒක දැන් රුපියල් 36,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කොළඹට එනකොට රුපියල් 59,000යි, කියුබ් තුනහමාරේ වැලි ලෝඩ් එක. මේ විධියට රත්තරන්වලට සමාන මිලක් වැලිවලට දීලා තිබෙනවා. බොරලුත් එහෙමයි; පසුත් එහෙමයි. අපි නීති රීති දමලා, මේ රටේ සම්පත් විනාශ වීම වළක්වලා, ඒ කටයුතු ක්‍රමවත් කරන්න ගියාම ඇති වුණු තත්ත්වය නිසා ජනතාව අප සමඟ උරණ වුණා.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගත්තාම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ රජ කාලේ ඉඳලා තිබෙන වැව් තිබෙනවා. තමුන්නාන්සේලා හැමෝම දන්නවා, කලා වැව ගැන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු වන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි.

ඒ වැව හදපු දවසේ ඉඳලාම ඒ ප්‍රදේශයේ ජනතාව මාළු කෑවේ වැවෙන් අල්ලාගෙන. අද මාළු අල්ලන්න බැහැ. මාළු ඇල්ලුවොත් අරගෙන ගිහිල්ලා හිරේ දමනවා. එහෙම නැත්නම් දඩ ගහනවා. වැව් පිටියට හරකෙක් වතුර බොන්න දක්කන්න බැහැ. හරක් දැක්කුවොත් නඩුවක් පවරලා හිරේ දමනවා. ඒ වාගේම වැව් පිටියට ගිහිල්ලා දර කැල්ලක් කපා ගන්න බැහැ. නීති විරෝධී දැව ජාවාරම් සිදු කරනවා කියලා හිරේ දමනවා. ඉණේ ගිනි පෙට්ටියක් තිබුණොත් කැලෑ ගිනි තිබ්බා කියලා හිරේ දමනවා. ඒ මොකද? මේ සම්පත් ආරක්ෂා කරන්නයි. ඒ වාගේම අද වැටකොලු, පතෝල, තක්කාලි වාගේ මැහි නිර්මාණය කරලා කරන වගා සඳහා ඉන්නක් කපා ගන්න බැහැ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නඩු පවරනවා. ජනතාවගේ මේ පීඩනය තමයි මැතිවරණය තුළින් ඉදිරියට ආවේ. ඔය විපක්ෂයේ උදවිය ජෝගි නැටුවාට, ඒ ගොල්ලන් කරපු හොඳ දෙයක් නිසා නොවෙයි එහෙම වුණේ. අපි රටේ සම්පත් ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් ඒ සම්පත් ආරක්ෂා කරන්න නීති රීති පනවනකොට මූලික වශයෙන් ජනතාව ආරක්ෂා වෙන්න ඕනෑ. ජනතාව ආරක්ෂා නොවන පරිදි සම්පත් ආරක්ෂා කරන්න ගියාම මේ ප්‍රතිඵලය ලැබෙනවා. ඒ නිසා කවුරු කවුරුත් දැන ගන්න ඕනෑ, සම්පත් ආරක්ෂා කරනවා වාගේම මොනවා කරන්නත් ඉස්සර වෙලා ජනතාවගේ ජීවන මට්ටම රැකෙන්න ඕනෑ කියලා. එහෙම නොවුණොත් මේ වාගේ මැතිවරණ ප්‍රතිඵල ලැබෙනවා. ඒක එහෙම වුණා කියලා ඔය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පසුගිය කාලයේ හොරකම් කරලා අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සිටියා නම් හොඳයි. ඇත්තටම අපි අද අමාත්‍යතුමා බලන්න ආසාවෙන් හිටියේ. නමුත්, අමාත්‍යතුමා නැහැ. නියෝජ්‍ය අමාත්‍යතුමා තමයි අද අපිත් එක්ක ඉන්නේ. අමාත්‍යතුමා විශේෂ කාරණයක් හැටියට වර්තමානයේ පවතින වාහනවල, ඒ වාගේම නවීන වාහනවල නොම්මර තහඩුව, ඒ ඒ වාහනවලට සරිලන විධියට සවි කිරීමට අවස්ථාව ලබාදී තිබෙනවා. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට තමයි අද අපට මෙම විශේෂ අවස්ථාව ලබාදී තිබෙන්නේ. නමුත් මේ අවස්ථාවේ බොහෝ දෙනෙක් කථා කළේ මේ සම්බන්ධව නොවෙයි. මේ ක්‍රමයේදී අපට යම් කිසි ආදායමක් ලැබෙනවා වෙන්නට පුළුවන්. හැබැයි, මේ රටේ වාහන පාවිච්චි කරන ජනතාව වෙනුවෙන් විශේෂ පහසුකමකුත් සලසනවා. වාහන පාවිච්චි කරන ජනතාව වෙනුවෙන් එම පහසුකම සලසද්දී, අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන දෙපාර්තමේන්තුව විසින් තමයි මෙම වැඩසටහන දියත් කරලා තිබෙන්නේ. මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව ආපස්සට ගිහිල්ලා කථා කළොත්, මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව රට තුළ ප්‍රශ්න රාශියක් තිබුණා. අපේ ගම්වල ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධ වුණු කඩ තිබෙනවා. ඒ කාලයේ ඒ කඩවල රෑට බොහෝ දෙනෙක් එකතුවෙලා ඉන්නවා අපි දකිනවා. ඒ කාලයේ විශාල ජාවාරම් සිද්ධ වුණා. හැබැයි, වර්තමානයේ ඒ තත්ත්වය නැති කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරද්දී එතුමා කිව්වා, දැන් ඒ වැඩ පිළිවෙළ විශාල ලෙස අඩු කරලා අමාත්‍යාංශය, ඒ වාගේම දෙපාර්තමේන්තුව අද හොඳ තත්ත්වයේ තිබෙනවා කියලා. ඒක අහන්න ලැබීම සතුටක්. මොකද, මගේම හිතවතුන් බොහෝ දෙනෙකුට ඒ හා සම්බන්ධ විශාල ප්‍රශ්න රාශියක් ඇතිවුණු අවස්ථා තිබුණා. ඒ පිළිබඳව අපි මෙතුමාත් එක්ක සාකච්ඡා කරලා මෑතකදීත් යම් ප්‍රශ්නයක් විසඳාගත්තා.

ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් එක්ක, අමාත්‍යාංශයත් එක්ක බැඳුණු ආයතන කිහිපයක් තිබෙනවා. මීට පෙර හිටපු අමාත්‍යවරු අමාත්‍යාංශයත් එක්ක කරපු ගනු දෙනු මොනවාද කියලා අපි දන්නවා. එදා දුම්රිය දෙපාර්තමේන්තුවට කම්කරුවෙක් හැටියට කාන්තාවක් බඳවාගෙන තිබුණා. නමුත් අද අපේ අමාත්‍යවරුන්ට රැකියාවක් දෙන්න බැහැ. රැකියා දෙන්නේ නැහැ කියලා අද රට තුළ විශාල ප්‍රශ්නයක් තිනෙවා. හැම කෙනාම ප්‍රශ්න නහනවා, "අපට රැකියාවක් නහැ, අපට රැකියාවක් නැහැ, අලුත් ආණ්ඩුවක් ආවා, ඒත් රැකියා නැහැ" කියලා. දුම්රිය දෙපාර්තමේන්තුවට කාන්තා කම්කරුවන් ගත්තාම, ඊට පස්සේ පිරිමි කම්කරුවන් ගන්නත් බැහැ, කාන්තා කම්කරුවන්ගෙන් ඒ වැඩේ කරගන්නත් බැහැ.

මම හිතන විධියට රටේ බොහෝ දෙපාර්තමේන්තුවල, අමාත්‍යාංශවල සහ අනෙකුත් ආයතනවල මෙවැනි අවස්ථා බොහොමයක් තිබෙනවා. අපි පසුගිය දා ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වුවා. විපක්ෂයේ බොහොමයක් දෙනා උඩ පැන පැන හැම තැනකම මහා උජාරුවට කෑ ගහන්න ගත්තා, "ආණ්ඩුව දැන් ඉවරයි; ආණ්ඩුවට දැන් එන්නේ වෙනත් අගමැතිවරයෙක්; වෙන ආණ්ඩුවක් තමයි දැන් පත් වෙන්නේ." කියලා. හැබැයි, උඩ පැන පැන හැම තැනකම කෑ ගහන මේ අයත් ඒ අයගේ පාලන කාලය තුළ මේ රට යම්කිසි සැලසුමකට හැදුවේ නැහැ. රටේ ප්‍රවාහනය වෙන්න පුළුවන්, අනෙකුත් කරුණු කාරණා වෙන්න පුළුවන් ඒ සම්බන්ධව නිවැරැදි ආකාරයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් හදලා, ජනතාවට තිබෙන ප්‍රශ්න අවම කරගෙන රටක් හැටියට ඉස්සරහට යමින් ඉදිරි අනාගත පරපුරට මේ රට නැවත නිර්මාණය කරලා දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ මේ කෑ ගහන අය සකස් කරලා තිබුණේ නැහැ. මම COPE කමිටුවේ ඉන්න සාමාජිකයෙක් හැටියට දන්නවා, ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධව සහ මේ කරුණු කාරණා සම්බන්ධව බොහෝ දේවල් COPE කමිටුව තුළ සාකච්ඡා කළ බව.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

විශේෂයෙන්ම අමාත්‍යාංශ සම්බන්ධව සහ සමහර මණ්ඩල, දෙපාර්තමේන්තු සම්බන්ධවත් නොයෙක් කරුණු කාරණා COPE කමිටුව තුළ සාකච්ඡා වුණා. ඒ අවස්ථාවේ දී අපට දැනගන්නට ලැබුණා, අමාත්‍යාංශවල තිබුණු මුදල් මේ අය නාස්ති කළේ කොහොමද කියලා. එදා තිබුණු ආණ්ඩුවේ ප්‍රවාහන අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාට තවත් එක එක ආයතන සම්බන්ධ කරලා තිබුණු බව අපි දන්නවා. එදා හිටපු ප්‍රවාහන අමාත්‍යවරයා බස් අලුත්වැඩියා කරන්න අවශ්‍ය කරන අමතර කොටස් මිලදී ගන්න කොට සිද්ධ කරපු වංචාවන් මොනවාද කියලා අපි දැක්කා. අද ඒවා ඔක්කෝම හැංගිලා තිබෙනවා. ඒවා තමයි එදා මේ රටේ තිබිච්ච විශාල ප්‍රශ්න. ඒ අමතර කොටස් ගෙන්වපු ආකාරය; බස් ගෙන්වපු ආකාරය; ඒවාවලින් හොරකම් කරපු විධිය; ඒවාවලින් වංචා කරපු විධිය සම්බන්ධව මේ වාර්තාවල සඳහන්ව තිබෙනවා. ඒවායේ පරීක්ෂණ කටයුතු අවසාන කරලාත් තිබෙනවා. විගණන වාර්තාත් තිබෙනවා. ඒ වාගේම, මම හිතන විධියට විශේෂ පරීක්ෂණ වාර්තාත් තිබෙනවා. FCID එකෙත් වාර්තා තිබෙනවා. හැබැයි, තවම මේ රටේ නියම හොරුන්ට දඬුවමක් දෙන්න බැරිව ගියා.

අපේ රටේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන බොහොමයක්ම විනාශ කළේ එදා ආණ්ඩුවේ හිටපු ඇමතිවරුයි. හැබැයි, ඒවා ඔක්කෝම යට ගිහිල්ලා. අපි දන්නේ නැහැ, මේ රටේ කොතැනද සාධාරණය ඉෂ්ට වෙන්නේ කියලා. මේ රටේ හොරු ටික පැත්තකින් ඉන්නවා. හොරු ටික ජයසෝෂා නහනවා. හොරු ටික මේ රටේ ඉඳගෙන සුරසැප විඳිනවා. හැබැයි, වෙන කණ්ඩායමකට හොරු කියලා මඩ ගහනවා.

ඒ විතරක් නොවෙයි, මාධ්‍යයත් එකතු කරගෙන ඒ අය හොරකම් කරපු මුදල් ටිකත් දැන් නැවත සමාජයට දාලා, සමාජයේ බොහෝ දේවල් මුදල්වලින් තමන්ගේ අතට අරගෙන අනෙක් අයට හොරුයි කියලා ඇඟිල්ල දිගු කරන සමාජයකයි අද අපි ඉන්නේ. අපි ආණ්ඩුවක් හැටියට මේ රටේ වැඩ කටයුතු කරද්දී අපි දීර්ඝ කාලීන වැඩසටහන් හැදුවේ. දීර්ඝ කාලීන වැඩසටහන් කියන්නේ මොනවාද? අපේ රටේ සියලුම ජනතාව ණය බරින් මිරිකලා තිබෙන රටකයි ජීවත් වෙන්නේ. තිබිච්ච ආණ්ඩු විදේශවලින් ණය ගත්තේ කිසිම සැලසුමක් නැතිවයි. ඒ නිසා අපටත්, අපේ දරුවන්ටත් විශාල වශයෙන් මේ ණය ටික ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම ගෙවන්න සිද්ධ වෙලා තිබෙන රටක අපි ආණ්ඩුව ගත්තාට පස්සේ අපි කළේ මොකක්ද? ඉදිරි අනාගතයේ අපේ දරු පරපුරට මේ රට ණයක් නැතිව, බරක් නැතිව හොඳින් සතුටින් ජීවත් වෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරන්න අපි සැලසුම් කළා. එහෙම ජීවත් වෙන්න අවශ්‍ය ඒ පරිසරය නිර්මාණය කරන්න නම් අපට බොහෝ දේවල් පරිත්‍යාග කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි අපි කණ්ඩායම් දෙකක් එකට එකතු වෙලා ආණ්ඩුවක් හදාගෙන, ඒ ආණ්ඩුව තුළින් අපේ රට ඉස්සරහට යන ගමන් මහට අවශ්‍ය සැලසුම් ටික හැදුවේ. අපි විදේශ රටවල් ටික මිත්‍ර කරගෙන ඒ අවශ්‍ය සැලසුම් හදාගත්තා. අපේ ගම්මානවල අඩු පාඩු ලෙස තිබෙන අධ්‍යාපනයත්, සෞඛ්‍යයත් වෙනුවෙන් අවශ්‍ය කරන පහසුකම් ටික සකස් කරන ගමන්ම, විශේෂයෙන්ම අපේ රටේ සංවර්ධන කටයුතු සැලසුම් සහගතව දීර්ඝ කාලීනව කරන්න තමයි අපි පියවර ගත්තේ. හැබැයි, කියන්න කනගාටුයි. එක පැත්තකින් රටේ ජනතාව මේකට හුරුවෙලා නැහැ. මේ රටේ ජනතාවට එදිනෙදා විසඳා ගැනීමට අවශ්‍ය ප්‍රශ්න ගොඩාක් තිබෙන බව අපි දකිනවා. ඒ ප්‍රශ්න ටික විසඳන්න කියන පණිවුඩය තමයි ජනතාව අපට මේ දුන්නේ.

මම දැක්කා, එහා පැත්තෙන් කථා කරපු සමහර මන්ත්‍රීවරුන් අද මේ විවාදයේ දී කථා කළේ මොනවාද කියලා. අද දින සාකච්ඡාවට නියමිතව තිබෙන්නේ, මෝටර් වාහන පනත යටතේ නියෝගය සම්බන්ධවයි. නමුත් එතුමන්ලා කථා කළේ පසුගියදා පැවැති ඡන්දය ගැනයි, වැඩි ඡන්ද ප්‍රමාණයක් ලැබුණු එක ගැනයි, ආණ්ඩුව ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කියන්න දෙයක් තිබෙනවා. අපි බොහෝ දේවල් කැප කරලා තමයි අද ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් හැටියට වාඩි වෙලා මේ වැඩ කටයුතු කරන්නේ. අපේ ගම්වල බොහෝ දුක් විඳින ජනතාව සිටිනවා. සමහර වෙලාවට අපි ඒ අයට පෞද්ගලිකව පහසුකම් නොදීපු නිසා වෙන්න ඇති, ඔවුන් තවමත් දුක් විඳිමින් සිටිනවා. එම ජනතාව රටේ අනාගතය ගැන හිතලා අපිත් එක්ක එකට අත්වැල් බැඳගෙන ඉන්නවා. හැබැයි, විපක්ෂයේ අය රටේ අනෙකුත් කොටස් ඒක රාශි කරගෙන විශේෂයෙන්ම ජාතිවාදය වපුරවමින් සිටිනවා.

රණවිරු දඩයම කියලා මහා පට්ටපල් බොරු ප්‍රචාර පතුරවමින් සියලු ජනතාව නොමඟ යවනවා. බුද්ධාගම ගැනත්, රටේ තිබෙන විශේෂ ආයතන සම්බන්ධවත් අපේ ආණ්ඩුව ගන්නා තීන්දු තීරණ වැරැදියි කියා ප්‍රකාශ කරමින් ජනතාවගේ ඔළුවලට විසබිජ කවලා මේ රටේ පැවැති ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී යම්කිසි වෙනස් කිරීම් ටිකක් කළා. හැබැයි, අපි මතක තබා ගත යුතු කාරණයක් තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලු දෙනා එකට එකතු වෙලා, එකට වාඩි වෙලා මේ රට හදනවා නම් අපි ජනප්‍රිය වැඩසටහන්වලට වඩා දිර්ඝකාලීනව මේ රට හදන වැඩසටහන්වලට යන්නට ඕනෑ. හැබැයි, වර්තමානයේ අපිට එහෙම කරන්න සිදු වෙයිද කියලා අපි දන්නේ නැහැ. මොකද ජනතාව බලාපොරොත්තු වන්නේ ජනප්‍රිය සහ කෙටි කාලීන වැඩසටහන් නම්, එවැනි වැඩසටහන් තුළින් ජනතාව සතුටු කරන්න අවශ්‍යයි කියන මතය රට පුරා තිබෙනවා නම්, ආණ්ඩුවක් හැටියට එවැනි වැඩ පිළිවෙළට යන්න අපටත් සිද්ධ වෙනවා. විශේෂයෙන්ම විපක්ෂයත් එක්ක වැඩ කටයුතු කරද්දී අපි මේ කාරණය දකිනවා. විපක්ෂය දැනගත යුතුයි, තමන් පට්ටපල් බොරු කියමින් රටේ ජනතාවගේ ඔළුව විකල් කරනවාට වඩා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒ අය කළ පාප ටික මකා ගන්න, ඒ අය සියලු දෙනා එකතු වෙලා මේ රට නැවත නිර්මාණය කරන්නට ඕනෑය කියා යම් කිසි විධියකින් කල්පනා කරනවා නම්, මේ රටට හොඳ අනාගතයක් නිර්මාණය කර ගන්නට හැකි වෙයි කියා මා හිතනවා. මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

රජයේ පාසල් වර්ග කිරීම
அரச பாடசாலைகளைத் தரம் பிரித்தல்
CLASSIFICATION OF GOVERNMENT SCHOOLS

[பி.ப. 5.55]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பின்வரும் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்:

"மாகாண ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக் கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப அரசாங்கப் பாடசாலைகள் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்ற அடிப்படையில் தரம் பிரிக்கப்படுகின்றன.

எனவே, இவ்வாறு மாகாண ரீதியில் புள்ளி வழங்கும்போது ஒப்பீட்டளவில் அம்மாகாணத்திலுள்ள ஒரு மாவட்டம் மற்றைய மாவட்டத்தை விடவும் மிகவும் பின்தங்கிய நிலையில் இருக்கலாம். அவ்வாறு பின்தங்கிய நிலையிலுள்ள மாவட்டத்தைச் சேர்ந்த பாடசாலைகளுக்கு மேற்படி புள்ளி வழங்கல் முறைமை ஊடாகத் தரம் பிரிக்கும்போது அநீதி ஏற்படுகின்றது.

எனவே, பாடசாலைகளைத் தரம் பிரிக்கும்போது மாகாண ரீதியில் தரம் பிரிப்பதற்குப் பதிலாக மாவட்ட ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக்கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்ற அடிப்படையில் தரம் பிரிப்பதற்கான முறையை அமுல்படுத்த வேண்டுமென இச்சபையில் பிரேரணை முன்வைக்கின்றேன்."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மத்திய கல்வி அமைச்சினால் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்று பாடசாலைகளைத் தரம் பிரிப்பதற்குச் சில அளவுகோல்கள் அல்லது பிரமாணங்கள் அனுப்பிவைக்கப்படு கின்றன. அதன்படி, குறித்த பாடசாலை அமைந்துள்ள இடத்திலே காணப்படுகின்ற மின்சார வசதி, தொலைபேசி வசதிகள், கணினி வசதிகள், வீதிப் போக்குவரத்து வசதிகள், வைத்தியசாலை அமைந்துள்ள தூரம், அந்தப் பாடசாலையை அண்மித்து நகரம் அமைந்துள்ள தூரம், புகையிரத நிலையம் அமைந்துள்ள தூரம், வங்கிச் சேவைகளினுடைய வசதிவாய்ப்புகள் என்பவற்றை அடிப்படையாகக் கொண்டு அந்தப் பாடசாலையைத் தரம் பிரிப்பதற்குப் புள்ளியிடல் வழங்கப்படுகின்றது. இவ்வாறு புள்ளியிடல் வழங்கப்படுகின்ற போது அந்தப் பாடசாலை அமைந்துள்ள இடம் போன்ற விடயங்கள் மட்டும் கருதப்படுகின்றது. ஆனால், அந்தப் பாடசாலையிலே கல்வி கற்கின்ற பிள்ளைகளது வசதி நிலைகள் - அவர்களது வருமானம், அவர்களுக்கு ஏற்படும் பாதிப்பு, அவர்களது போஷாக்கு - சம்பந்தமாகக் கருத்திற் கொள்ளப்படுவதில்லை.

நகரப்புறத்திலே அமைந்துள்ள பாடசாலைகளுக்கு உயர் கல்வியைக் கற்பதற்கு - க.பொ.த. சாதாரண தரமாகவோ அல்லது உயர் தரமாகவோ இருக்கலாம் - அதிதூரத்திலுள்ள கிராமப்புறங்களிலிருந்து பிள்ளைகள் வருகை தருகிறார்கள். அந்த வகையில் போக்குவரத்து வசதியற்ற அதிதூரக் கிராமப்புறங்களிலிருந்து பிள்ளைகள் பாடசாலைகளுக்கு வருகை தருகின்றார்கள், வருமானம் குறைந்த குடும்பங்களி லிருக்கும் பிள்ளைகள் இந்தப் பாடசாலைகளுக்கு வருகை தருகின்றார்கள், யுத்தத்திலே தகப்பனை, உழைக்கக்கூடிய சகோதரனை இழந்த பிள்ளைகள் அங்கு கல்வி கற்பதற்காக வருகை தருகின்றார்கள். ஆனால், இந்தப் பாடசாலைகளைத் தரம் பிரிக்கும்போது இந்தப் பிள்ளைகளது சூழல், அவர்களது பின்னணி என்பன கருத்திற்கொள்ளப்படுவதில்லை. அந்த வகையில் இத்தகைய பிள்ளைகள் கஷ்ட, அதிகஷ்டப் பாடசாலைகளுக்கு அரசினால் வழங்கப்படுகின்ற சப்பாத்து, சீருடை போன்ற மேலதிக வசதிகளை இழக்கின்றார்கள்.

அதிகஷ்டப் பாடசாலைகளில் கல்வி கற்பிக்கின்ற ஆசிரியர்களுக்கு மேலதிகக் கொடுப்பனவு உதவிகள் வழங்கப் படுகின்றன. அந்த வகையில் அதிகஷ்டப் பாடசாலைகளுக்கு 2,500 ரூபாய் மற்றும் கஷ்டப் பாடசாலைகளுக்கு 1,500 ரூபாய் என வழங்கப்படுகின்ற பொழுதும் அங்கு கல்வி கற்பிக்க வருவதற்கு ஆசிரியர்கள் மறுக்கின்றார்கள். இதற்குப் பல காரணங்கள் இருக்கின்றன. முக்கியமாக வெளி மாவட்டங் களிலிருந்து வந்து கற்பிக்கின்ற ஆசிரியர்களுக்கு குறிப்பாக, ஆசிரியைகளுக்கு ஒழுங்கான தங்குமிட வசதிகள்கூட கிராமப்புறங்களிலே இல்லை. அந்த ஆசிரியைகள் தங்கியிருக்கின்ற வதிவிடங்கள் வௌவால்கள் உறங்குகின்ற இடங்களாகவும் குரங்குகள் உட்புகுகின்ற இடங்களாகவும் காணப்படுகின்றன. இதனால்தான் இந்த ஆசிரியைகள் இங்கு வருகை தர மறுக்கின்றார்கள்.

தேசிய மட்டத்திலே எடுக்கப்படுகின்ற பிரமாணங்களுக்கு அமைவாக பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது, முப்பது வருட யுத்தத்திலே பாதிக்கப்பட்ட பிரதேசங்களிலே கல்வி கற்கின்ற எமது பிள்ளைகள் வசதிவாய்ப்புக்களை இழந்து போகின்றார்கள். உதாரணமாக, முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்ற Mullaitivu Hindu Board Tamil Mixed School என்ற பாடசாலை அதிவசதியான பாடசாலை என்ற தரத்தினுள் வகைப்படுத்தப்பட்டிருக்கின்றது. இருந்த போதிலும், அங்கு கல்வி கற்பதற்கு வருகின்ற கிராமப்புறப் பிள்ளைகள் பல கிலோமீற்றர் தூரத்தைத் தாண்டி வருகின்றார்கள். ஒரு துவிச்சக்கர வண்டிகூட இல்லாத குடும்பங்களைச் சார்ந்த பிள்ளைகளும் இங்கு கல்வி கற்க

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

வருகின்றார்கள். அதேநேரம், இந்தப் பாடசாலை அதிவசதியான பாடசாலையாக வகைப்படுத்தப்பட்டதனால் இந்தப் பிள்ளைகளுக்குரிய வசதிகள் மற்றும் ஏனைய உதவிகள் மறுக்கப்படுகின்றன. இது மோசமான ஒரு நிலைமையாகும். இது தொடர்பாக நான் வட மாகாண கல்வி அமைச்சோடு தொடர்பு கொண்டபொழுது, பாடசாலைகளைத் தரம் பிரித்தலை மீளாய்வு செய்கின்ற ஒரு நடைமுறை இருந்தாலும், கடந்த நான்கு வருடங்களாக இந்த மீளாய்வு நடைமுறைப்படுத்தப்படவில்லை என்பதை அறிய முடிந்தது.

மாகாண மட்டத்திலே பாடசாலைகளைத் தரம் பிரிப்பதற்குரிய மீளாய்வின்பொழுது சில கருத்துக்கள் கோரப்பட்டாலும், மத்திய மட்டத்திலே பாடசாலைகளுக்கென ஒரு quota system அறிமுகப்படுத்தப்பட்டு, அந்த வகைக்குள்ளே இந்தப் பாடசாலைகளை உள்ளடக்கப்பட வேண்டிய ஒரு நிலை காணப்படுகின்றது. எனவே, பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது - வகைப்படுத்துகின்றபொழுது வலயப் பணிமனை மட்டத்திலோ அல்லது பிரதேச செயலக மட்டத்திலோ குழுக்கள் அமைக்கப்பட்டு அவற்றுக்கூடாக பாடசாலைகள் வகைப்படுத்தப்படுகின்றபொழுது, பின்தங்கிய பாடசாலைகளும் மற்றும் பாதிக்கப்பட்ட பிள்ளைகளும் மேலும் வசதிகளைப் பெற்றுக்கொள்ள முடியும்.

கஷ்டமான பிள்ளைகள் எண்பது சதவீதம் கல்வி கற்கின்ற சில பாடசாலைகளும் வசதியான பாடசாலைகளென்று வகைப்படுத்தப்பட்டிருக்கின்றது. உதாரணமாக, ஏ - 9 வீதியை அண்டிய பாடசாலைகள், பிரதான வீதிகளை அண்டியிருக்கின்ற பாடசாலைகள் என்ற அடிப்படையிலும் வங்கி வசதி, போக்குவரத்து வசதி, தொலைபேசி வசதி போன்ற வசதிகளைக்கொண்ட பாடசாலைகள் என்ற அடிப்படையிலே சில பாடசாலைகள், "வசதியான பாடசாலைகள்" என்ற வகைப்படுத்தலுக்குள் சேர்கின்றன. ஆனால், குறித்த பாடசாலைகளில் கல்வி கற்கின்ற பிள்ளைகளது குடும்ப வருமானம், அவர்களுடைய குடும்ப நிலைமைகளைப் பார்த்தால், எண்பது சதவீதமான பிள்ளைகள் வறுமைக் கோட்டின்கீழ் வாழ்பவர்களாக இருப்பதைக் காணலாம்.

ஆகவே, பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது, அங்கிருக்கின்ற பிள்ளைகளுடைய பின்னணி மற்றும் அப்பாடசாலைகளுக்குக் கல்வி கற்க வருகின்ற பிள்ளைகள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளைக் கள நிலையிலிருந்து ஆய்வு செய்து, குறித்த பாடசாலைகளைத் தரம் பிரிக்கக்கூடிய ஒரு முறைமையை முன்வைக்க வேண்டுமென்று கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களிடம் மிகவும் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, இந்த ஒத்திவைப்புப் பிரேரணையை வழிமொழியுமாறு கௌரவ ஸ்ரீநேசன் அவர்களை அழைக்கின்றேன்.

[பி.ப. 6.03]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்களால் கொண்டுவரப்பட்ட "பாடசாலைகளை வகைப்படுத்தல்" தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிவதோடு, அவர் குறிப்பிட்ட விடயம் தொடர்பில் சில தெளிவுபடுத்தல்களையும் இந்த இடத்தில் கூறிவைக்க விரும்புகின்றேன். அதிவசதியான பாடசாலை, வசதியான பாடசாலை, கஷ்டப் பிரதேச பாடசாலை, அதிகஷ்டப் பிரதேச பாடசாலை என்று மாகாணத்தை மையமாகக் கொண்டு பாடசாலைகளை வகுதிப்படுத்துவதைவிட, மாவட்ட அடிப்படையில் அவற்றை வகுதிப்படுத்துவது அல்லது வகைப்படுத்துவதுதான் பொருத்தமானதாக இருக்கும் என்ற அடிப்படையிலே கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களது கருத்து அமைந்திருந்தது. உண்மையில் நாங்கள் வாழுகின்ற மாவட்டங்களை எடுத்துப்பார்த்தாலும், அங்கு பிரதேச செயலக மட்டங்களில் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்கள் அல்லது வசதியான, அதிவசதியான பிரதேசங்கள் என்று பிரதேசங்களை வகைப்படுத்தக்கூடியதாக இருக்கின்றது. எனவே, உண்மையில் பாடசாலைகளை வகைப்படுத்துகின்றபோது, மேலோட்டமான முறையில் வகைப்படுத்துவதற்கு இந்த மாகாண மட்ட அடிப்படையிலான பார்வை பொருத்தமானதாக இருக்கும். ஆனால், நுணுக்கமான முறையில் வகைப்படுத்துகின்றபோது, அவற்றை மாவட்ட மட்ட அடிப்படையில் பார்ப்பதிலும் பார்க்க பிரதேச செயலகப் பிரிவு மட்ட அடிப்படையில் பார்ப்பதுதான் மிகவும் பொருத்தமானதாக இருக்கும். குறைந்தபட்சம் மாவட்ட அடிப்படையிலாவது இந்தப் பாடசாலைகளை வகைப்படுத்து வதுதான் நன்றாக இருக்கும் என்று நான் நினைக்கின்றேன்.

கௌரவ சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்கள் வன்னி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், அவர் முல்லைத்தீவு, வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களை மையமாகக்கொண்ட தனது அவதானிப்பின் அடிப்படையில், பாடசாலைகளை மாகாண எல்லை அடிப்படையில் வகைப்படுத்தாது, மாவட்ட எல்லை அடிப்படையில் வகைப்படுத்த வேண்டும் என்று கூறுகின்றார். உண்மையில் மாவட்ட மட்டத்தில்கூட அதிவசதியான பாடசாலைகள், வசதியான பாடசாலைகள், கஷ்டப் பிரதேச பாடசாலைகள், அதிகஷ்டப் பிரதேச பாடசாலைகள் என்று வகுதிகள் இருக்கின்றன. ஐந்தாம் ஆண்டுப் புலமைப் பரிசில் பரீட்சையின் வெட்டுப்புள்ளிகளைத் தீர்மானிக்கின்றபோது, அல்லது அந்த மாவட்டத்தில் கற்கின்ற மாணவர்களது பரிசளிப்பு விழாக்களில் அவர்கள் சகல பாடங்களிலும் அதிவிசேட சித்திகளைப் பெற்றவர்கள் என்று எல்லாம் நாங்கள் வகைப்படுத்திப் பார்க்கின்றபோது, வசதியான, அதிவசதியான பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வசதிவாய்ப்புகளைவிட, கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் காணப்படுகின்ற பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வசதிவாய்ப்புகளில் வேறுபாடுகள் காணப்படுகின்றன. இந்த 21ஆம் நூற்றாண்டின் தகவல் தொழில்நுட்ப யுகத்தில்கூட, இந்த நிலைமை காணப்படுகின்றது.

உதாரணமாக மட்டக்களப்பு மாவட்டத்தில், வின்சன்ட் மகளிர் தேசிய பாடசாலையும் புனித மைக்கல் தேசிய பாடசாலையும் பிரபல்யமான, வசதியான பாடசாலைகளாக இருக்கின்றன. அதேநேரத்தில் இதே மாவட்டத்தில், மட்டக்களப்பு கிழக்குப் பகுதி, மட்டக்களப்பு மேற்குப் பகுதி என்று இரண்டு பிரதேசங்கள் இருக்கின்றன. மட்டக்களப்பு மேற்குப் பகுதியிலுள்ள வாகரைப் பிரதேச செயலகப் பிரிவு, வெல்லாவெளிப் பிரதேச செயலகப் பிரிவு, வவுணதீவு பிரதேச செயலகப் பிரிவு போன்றவற்றில் அதிகஷ்டமான, கஷ்டமான பாடசாலைகள் காணப்படுகின்றன. அங்குள்ள அந்தப் பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வரப்பிரசாதங்கள்

அல்லது சிறப்புரிமைகள் இன்றும்கூட மிகவும் கம்மியாகவே காணப்படுகின்றன. எனவே, பாடசாலைகளை மிகவும் கவனமாக பிரமாணங்கள், நியதிகளைப் பின்பற்றி வகுதிப்படுத்துகின்றபோதுதான் கஷ்டமான, அதிகஷ்டமான பாடசாலைகளுக்குக் கிடைக்கக்கூடிய வரப்பிரசாதங்களை அதிகரிப்பதற்கு வாய்ப்பு ஏற்படும்.

கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டதுபோன்று ஆசிரியர்கள்கூட வசதியான, அதிவசதியான பாடசாலைகளில் கற்பிப்பதற்குத்தான் கூடுதலாக விரும்புகின்றார்கள். அதிகஷ்டப் பிரதேசப் பாடசாலைகள் உள்ள இடங்களில் போக்குவரத்து வசதிகள், குடிநீர் வசதிகள் மிகவும் குறைவாகவே காணப்படுகின்றன. இதையும்விட, வறுமைக் கோட்டின்கீழ் வாழுகின்ற மக்களின் தொகை அதிகமாக இருக்கின்றது. எனவே, நுணுக்கமான ஓர் ஆய்வின் அடிப்படையில் பாடசாலைகளை வகைப்படுத்தி, அவற்றுக்கு உரிய வசதிவாய்ப்புக்களை அதிகமான அளவில் பெற்றுக் கொடுப்பதன்மூலம்தான் இந்தப் பாடசாலைகளுக்கு இடையில் சமநிலையை - சமத்துவமான தன்மையைப் பேணக்கூடியதாக இருக்கும். இன்று நான் கல்வி அமைச்சுக்குச் சென்றநேரத்தில், திரு. செந்தில்மாறன் என்ற ஓர் அதிகாரியிடம் குறிப்பிட்ட விடயத்தைக் கூறிவிட்டு வந்தேன்.

மட்டக்களப்பைப் பொறுத்தமட்டில், அங்கு ஐந்து கல்வி வலயங்கள் காணப்படுகின்றன. அவற்றில் ஒன்று புதிதாக உருவாக்கப்பட்ட மட்டக்களப்பு மேற்குக் கல்வி வலயமாகும். கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள் அந்தப் பகுதிக்கு எல்லாம் விஜயம் செய்து, அங்குள்ள பாடசாலைகளைப் பார்வையிட்டிருக்கின்றார். ஆனால், மட்டக்களப்பு மேற்குக் கல்வி வலயத்தில் ஆசிரியர்களைப் பயிற்றுவிக்கின்ற ஒரு மத்திய நிலையம் இன்னமும் வழங்கப்படாத நிலைமை காணப்படுகின்றது. ஆசிரியர்களை வாண்மைத் தேர்ச்சி - professional qualifications - உடையவர்களாக மாற்றுவதற்குரிய நிலையங்களாக இந்த ஆசிரியர் மத்திய நிலையங்கள் காணப்படுகின்றன. அங்கு நான்கு வலயங்களுக்கும் ஆசிரிய மத்திய நிலையங்கள் வழங்கப்பட்டிருக்கின்றன. 97 வலயங்களுள் மிகவும் பின்தங்கிய நிலையில் காணப்படுகின்ற மட்டக்களப்பு மேற்கு வலயத்திற்குரிய ஆசிரிய மத்திய நிலையம் வழங்கப்படாம லிருப்பது என்பது ஒரு குறைபாடாகவே காணப்படுகின்றது. எனவே, இந்த ஆசிரிய மத்திய நிலையத்திற்குரிய ஆளணியினரை மற்றும் ஆசிரிய மத்திய நிலைய முகாமையாளரை நியமித்து, அதற்குரிய வள நிலையத்தை உருவாக்கி, அங்குள்ள ஆசிரியர்களைச் சிறப்பான முறையில் பயிற்றுவிக்க வேண்டுமென்று கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களிடம் நான் தயவாகக் கேட்டுக் கொள்கின்றேன். அதன் மூலமாகத்தான் இப்படியான அதிகஷ்ட, கஷ்டப் பிரதேசங்களைக் கொண்டிருக்கின்ற வலயத்தில் காணப்படுகின்ற தொய்வுகளை, குறைபாடுகளைச் சீர்செய்யக்கூடியதாக இருக்கும்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, உங்களது பதவிக் காலத்தில் இந்த அதிகஷ்ட மற்றும் கஷ்டப் பாடசாலைகளை வசதியான நிலைக்கு, அதிவசதியான நிலைக்குக் கொண்டுவரக்கூடிய விதத்தில் அந்தப் பாடசாலைகளை நோக்கிக் கூடுதலான வளங்களை, கூடுதலான நிதியினை நீங்கள் நகர்த்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அண்மையில் கஷ்டப் பிரதேசத்தி லிருக்கின்ற கரடியனாறு மத்திய மகா வித்தியாலயத்திலிருந்து, அங்கு 28ஆம் திகதி நடைபெறவுள்ள விளையாட்டுப் போட்டிக்குரிய அழைப்பொன்று உங்களுக்கு விடுக்கப்பட்டி ருக்கின்றது. இப்படியான பாடசாலைகளை நீங்கள் நேரடியாகச் சென்று பார்வையிடுவதன் மூலமாக, உங்களுடைய தரிசிப்பானது ஓர் ஆய்வாக அமைந்து இந்தப் பாடசாலைகளில் காணப்படுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு வழிகோலும்.

மேலும், கௌரவ உறுப்பினர் குறிப்பிட்டதுபோன்று, பாடசாலைகளை வகைப்படுத்துவதில் மாகாணப் பார்வையை விட, மாவட்ட அடிப்படையிலான பார்வை, பிரதேச செயலக அடிப்படையிலான பார்வை உண்மையில் குறித்த பாடசாலைகளில் காணப்படுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு அதிகமாக உதவும் என்பதைக் கூறிக் கொள்வதுடன், கௌரவ கல்வி அமைச்சர் அவர்களது முன்னிலையில் இந்தக் கருத்துக்களை எடுத்துரைத்து, உங்களுடைய ஆக்கபூர்வமான சிபார்சினையும் ஆலோசனை களையும் வழங்கி, அதற்குரிய ஆக்கபூர்வமான செயற்பாடு களை முன்னெடுப்பீர்கள் என்ற நம்பிக்கையுடன் எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் வீ.எஸ். இராதாகிருஷ்ணன் அவர்கள்!

[பி.ப. 6.11]

ගරු වී.එස්. රාධාකෘෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை, "மாகாண ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக்கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப அரசாங்கப் பாடசாலைகள் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி எனத் தரம் பிரிக்கப்படுகின்ற தற்போதுள்ள முறைமையை மாற்றியமைத்து அவற்றை மாவட்ட ரீதியில் மேற்கொள்ள வேண்டும்" என்ற அடிப்படையில் வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்களினால் முன்வைக்கப் பட்டுள்ளது. அதற்குரிய விளக்கங்களை நான் பின்வருமாறு தருகின்றேன்.

அரச பாடசாலைகளில் ஆசிரியர் சேவையைப் பூர்த்தி செய்யும் நோக்கத்துடன் அடையாளங்காணப்பட்ட நியதிகளின் அடிப்படையில் அந்தந்த மாகாணப் பாடசாலைகள் தரம் பிரித்தலுக்கு உள்ளாக்கப்படுகின்றன. இங்கு இலங்கை ஆசிரியர் சேவைப் பிரமாணக் குறிப்பின் விதிமுறைகள் மற்றும் தேசிய ஆசிரியக் கொள்கைகளை நடைமுறைப்படுத்தும் தேவைக்காக "வசதிகள் மையப்படுத்தப் பட்ட பாடசாலைகள் வகைப்படுத்தல்" என 2005.01.18ஆம் திகதிய இலக்கம் 2005/ 01இற்குரிய சுற்றுநிருபமொன்று கல்வி அமைச்சினால் வெளியிடப்பட்டுள்ளது. இணைப்பு ஒன்றாக அதனை இங்கே சமர்ப்பிக்கின்றேன்.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වී.එස්. රාධකිෂ්ණන් මහතා]

අත්‌තුඩන්, කෂ්ට මත්‌රුම් අතිකෂ්ටප් පිරතේසංකළිල් අමෙන්‌තුළ්ළ පාටසාලෙකළිල් ආසිරියර් පත්‌රාක්‌කුරෙකළෙ නිරෙවු සෙය්වතත්‌රාක්‌කාක ආසිරියර්කළෙප් පකිර්න්‌තළිත්‌තල්, ඌක්‌කුවිත්‌තල් තොටර්පාක ඌක්‌කුවිප්පුක් කොටුප්පනවු නිතියොන්‌රෙ වළංකුවතත්‌රාක්‌කාක කෂ්ට මත්‌රුම් අතිකෂ්ටප් පිරතේස පාටසාලෙකළාක වකෙප්පටුත්‌තල් එන්‌ර පෙයරිල් ඉලක්‌කම් 2006/43ඉත්‌කුරිය සුත්‌රුනිරුපම් ඔන්‌රු 2006.11.24ආම් තිකති වෙළියිටප්පට්ටුළ්ළතු. ඉණෙප්පු 02 ආක අතනෙයුම් ඉංකේ සමර්ප්පික්කින්‌රේන්.*

සුත්‌රුනිරුප ඉලක්‌කම් 2005/01ඉන් නියතිකළුක්‌කමෙවාක නිති අමෙච්චින් උටන්පටික්කෙයින්පටි, අන්‌තන්‌තප් පාටසාලෙ වකෙකළුක්‌කාක අන්‌තන්‌ත මාකාණත්‌තිත්‌කු ඔතුක්‌කක්‌කූටිය පාටසාලෙකළුටෙය එණ්ණික්කෙ විකිතාසාර මුරෙයිල් අටෙයාළම් කාණප්පට්ටිරුක්කින්‌රතු. මාකාණංකළ් තොටර්පාක අන්‌තන්‌තප් පාටසාලෙ වකෙකළුක්‌කාක ඔතුක්‌කක්‌කූටිය විකිතාසාර මුරෙකළ් ඉන්‌තච් සුත්‌රුනිරුපත්‌තිල් උළ්ළ අට්ටවණෙයිල් කොටුක්‌කප්පට්ටිරුක්කින්‌රන. අතනෙ නාන් ඉංකු වාසික්කින්‌රේන්.

“වටක්කු, කිළක්කු මාකාණංකළිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් ආකක්‌කූටියතු 38, කෂ්ටප් පාටසාලෙකළ් ආකක්‌කූටියතු 14, වසතියට්ර පාටසාලෙකළ් 13, වසතිප් පාටසාලෙකළ් 19, අතිවසතිප් පාටසාලෙකළ් 16;

මත්තිය මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් ආකක්‌කූටියතු 07, කෂ්ටප්පාටසාලෙකළ් ආකක්‌කූටියතු 17, වසතියට්ර පාටසාලෙකළ් 30, වසතිප් පාටසාලෙකළ් 20, අතිවසතිප් පාටසාලෙකළ් 26;

සප්‌රකමුව මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් 04, කෂ්ටප් පාටසාලෙකළ් 25, වසතියට්ර පාටසාලෙකළ් 22, වසතිප් පාටසාලෙකළ් 25, අතිවසතිප් පාටසාලෙකළ් 24;

වටමත්තිය මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් 24, කෂ්ටප් පාටසාලෙකළ් 27, වසතියට්ර පාටසාලෙකළ් 13, වසතිප් පාටසාලෙකළ් 19, අතිවසතිප් පාටසාලෙකළ් 17;

වටමේල් මාකාණත්‌තිල් අතිකෂ්ටප් පාසාලෙකළ් 13, කෂ්ටප් පාටසාලෙකළ් 23, වසතියට්ර පාටසාලෙකළ් 21, වසතිප් පාටසාලෙකළ් 22, අතිවසතිප් පාටසාලෙකළ් 21;

ඌවා මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් 08, කෂ්ටප් පාටසාලෙකළ් 15, වසතියට්ර පාටසාලෙකළ් 37, වසතිප් පාටසාලෙකළ් 22, අතිවසතිප් පාටසාලෙකළ් 18;

මේල් මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙ 01, කෂ්ටප් පාටසාලෙකළ් ආකක්‌කූටියතු 04, වසතියට්ර පාටසාලෙකළ් 12, වසතිප් පාටසාලෙකළ් 28, අතිවසතිප් පාටසාලෙකළ් 55;

තෙන් මාකාණත්‌තිලේ අතිකෂ්ටප් පාටසාලෙකළ් 05, කෂ්ටප් පාටසාලෙකළ් 14, වසතියට්ර පාටසාලෙකළ් 17, වසතිප් පාටසාලෙකළ් 26, අතිවසතිප් පාටසාලෙකළ් 38 එන්‌ර වකෙයිල්තාන් ඉන්‌තප් පාටසාලෙකළ් තරම් පිරික්කප් පට්ටිරුක්කින්‌රන.

අත්‌තුඩන්, ඉන්‌ත ඉරණ්ටු සුත්‌රුනිරුපංකළින් නියතිකළුක්‌කු අමෙවාකවුම් මත්‌රුම් මාකාණත්‌තින් පිරතේස රීතියාන නියතිකළෙයුම් කවනත්‌තිත්‌කොණ්ටු, පාටසාලෙ වරෙයර්කළෙ මීර්ාත වකෙයිල්, පාටසාලෙ වසතිකළින් අටිප්පටෙයිල් අන්‌තන්‌ත මාකාණත්‌තින් පාටසාලෙ වකෙප්පටුත්‌තල් සෙයර්පාටානතු, ඉලක්‌කම් 2005/01 සුත්‌රුනිරුපම් මූලමාක මාකාණ අතිකාරිකළිටම් ඔප්පටෙක්‌කප් පට්ටුළ්ළතු. අතන් පිරකාරම් මාවට්ට සිරමංකළෙත් තනිප්පට්ට රීතියාකක් කවනිප්පතත්‌කුප් පතිලාක, අතත්‌කු මේලාකච් සත්‌රු ආළමාකප් පාටසාලෙ අමෙප්පු රීතියාන සිරමංකළෙක් කවනත්‌තිත්‌කු එටුප්පතනාල්, මාවට්ටච් සිරමංකළෙත් තනිප්පට්ට රීතියාක කවනත්‌තිත්‌කොළ්ළුම් අවසියම් ඒර්පටාතු.

මේලුම්, ඔට්ටුමොත්‌ත මාවට්ටත්‌තෙච් සිරමමාකක් කණිත්‌තු, පල්කලෙක්කළක නුළෙවින්පෝතු සම වාය්ප්පුක්කළෙ උරුතිප්පටුත්‌තුවතෙක් කවනත්‌තිල් එටුත්‌තාලුම්, පාටසාලෙක් කල්විච් සන්‌තර්ප්පංකළෙ වළංකුම් පෝතු, විසේටමාක අන්‌තන්‌තප් පාටසාලෙකළිල් නිලවුම් වසතිකළෙක් කවනත්‌තිල්කොණ්ටු උරිය වකෙප්පටුත්‌තල් මේර්කොළ්ළප්පටුම්. එනවේ, පිරතේස රීතියාන වසතිකළෙක් කවනත්‌තිල් කොණ්ටු පාටසාලෙකළ් වකෙප්පටුත්‌තුම් මුරෙමෙකළෙක් කොණ්ට සෙයර්පාටු ඉන්‌තච් සුත්‌රුනිරුප විතිමුරෙකළින් ඌටාක මාකාණත්‌තිත්‌කු වළංකප්පට්ටිරුප් පතනාල්, මීණ්ටුම් මාවට්ට රීතියාන වකෙප්පටුත්‌තල් අවසියප්පටාතු.

මාකාණ අමෙච්චුක්කළ් කල්වි වලයංකළුක්‌කූටාක පාටසාලෙකළුටෙය වසතිකළෙක් කරුත්‌තිර්කොණ්ටු අතිකෂ්ටප් පිරතේසම්, කෂ්ටප් පිරතේසම්, වසතියාන පිරතේසම්, අතිවසතියාන පිරතේසම් එන්‌ර තීර්මානම් එටුක්කින්‌ර සෙයර්පාටු අන්‌තන්‌ත මාකාණංකළුක්‌කුප් පකිර්න්‌තළික්කප්පට්ටිරුක්කින්‌රතු එන්පතුම් ඉංකු සොල්ලප් පට්ටිරුක්කින්‌රතු.

කෞරව උරුප්පිනර් අවර්කළේ! පොතුවාක ඔව්වොරු මාකාණත්‌තිර්කුම් ඉන්‌ත වාය්ප්පුකළ් අළික්කප්පට්ටිරුක් කින්‌රන. ආකවේ, මාකාණක් කල්විප් පණිප්පාළර්, වලයක් කල්විප් පණිප්පාළරුටන් ඉණෙන්‌තු පාටසාලෙකළින් තරම් පිරිත්‌තලෙච් සෙය්යවේණ්ටුම්. අතන්මූලමාක අවර්කළ් සෙය්යුම් සිපාරිසු මත්‌තිය අරසාන්‌කත්‌තිනාල් ඒර්‌රුක්කොළ්ළප් පට්ටු, නිතියමෙච්චු ඉතිල් සම්පන්‌තප්පට්ටිරුප්පතනාල්, අතනුටෙය අන්‌කීකාරත්‌තුටන් ඉන්‌තච් සෙයර්පාට්ටෙ මේර්කොළ්ළ මුටියුමෙන්‌රු නාන් ඉන්‌තච් සපෙක්‌කුත් තෙරිවිත්‌තුක්කොළ්ළ විරුම්පුකින්‌රේන්.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විඩුක්කප්පට්ටු ඒර්‌රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 6.18 ට, 2018 පෙබරවාරි මස 22 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.

අතන්පටි පි.ප. 6.18 මණික්කු පාරාළුමන්‌රම්, 2018 පෙප්‌රුවරි 22, වියාළක්කිළමෙ මු.ප. 10.30 මණිවරෙ ඔත්තිවෙක්කප්පට්ටතු.


Parliament adjourned accordingly at 6.18 p.m. until 10.30 a.m. on Thursday, 22nd February, 2018.

**** පුස්තකාලයේ තබා ඇත.***
** නූතනිලෙයත්තිල් වෙක්කප්පට්ටුළ්ළතු.*
** Placed in the Library.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

258 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 258 - இல. 8
Volume 258 - No. 8

2018 පෙබරවාරි 22වන බ්‍රහස්පතින්දා
2018 பெப்ருவரி 22, வியாழக்கிழமை
Thursday, 22nd February, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ශෝක ප්‍රකාශය:

ගරු (මහාචාර්ය) විශ්වා වර්ණපාල මහතා

ගරු ඊලියන් එම්. නානායක්කාර මහතා

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அனுதாபத் தீர்மானம் :

மாண்புமிகு (பேராசிரியர்) டபிள்யு.ஏ. விஸ்வா வர்ணபால

மாண்புமிகு ஈலியன் எம். நாணாயக்கார

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:

Hon. (Prof.) W.A. Wiswa Warnapala

Hon. Aelian M. Nanayakkara

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 පෙබරවාරි 22වන බ්‍රහස්පතින්දා
2018 பெப்ருவரி 22, வியாழக்கிழமை
Thursday, 22nd February, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය - විශේෂ විගණන වාර්තා - VI කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියම ඉදිරිපත් කරමි.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 22 දිනැති අංක 2046/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Mr. Speaker, I present the Annual Report of the Lanka Sathosa Limited for the years 2005/2006 and 2007.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Manufacturing and Services.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சரும் நீதி அமைச்சரும்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment and Minister of Justice)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, තුංකම, කදුරුගස්ආර බන්ධනාගාර වැඩ කඳවුරෙහි බන්ධනාගාර නියාමක ලෙස සේවය කරන ඒ.කේ. සෙනරත් කුමාර රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, නාකුළුගමුව, දිය ඇල, සුමේධ මාවත, බෝධිය ගෙදර යන ලිපිනයෙහි පදිංචි සුවද හැන්නදිගේ ආරියදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් පහ මම පිළිගන්වමි.

(1) මග්ගොන, මුංහේන පාර, අංක 40/බී දරන ස්ථානයෙහි පදිංචි රූපා වයලට් සිසිලියා සිල්වා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) මඩකළපුව, නාවටිකුඩා, පරණ කල්මුණේ පාර, අංක 265 දරන ස්ථානයෙහි පදිංචි සෝරණලිංගම් සුදානන්දන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ත්‍රිකුණාමලය, නිලාවේලි, කොටියාස අංක 2 යන ලිපිනයෙහි පදිංචි වේලුපිල්ලෙ විශ්වනාදන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ත්‍රිකුණාමලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාලයේ සේවය කරන ඩබ්ලිව්.ඒ. ලලිත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) තලාතුඔය, ගොවිජන සේවා පාර, අංක 82 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, රත්නපුර, පලාවෙල, දම්මේ යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.ඩබ්ලිව්. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

ගරු කථානායකතුමනි, මහරගම, වත්තේගෙදර පාර, සුරම්‍ය මාවත, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි විජය ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன)
(The Hon. Lakshman Ananda Wijemanne)

ගරු කථානායකතුමනි, මතුගම, නවුත්තුඩුව, අංක 43 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.ඩී. සුමිත් නන්දන ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම දෙක මම පිළිගන්වමි.

(1) ගාල්ල, මාඉටිපේ, දෙවන පටුමග, උඩුමුල්ල වත්ත, අංක 245/19 දරන ස්ථානයෙහි පදිංචි මනෝජ් නුවන් කුමාර මාඉටිපේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගාල්ල, ලබුදුව, සිරිධම්ම මාවත, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයෙහි සේවය කරන එන්.පී.කේ. ඉලේපෙරුම මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා - [සභා ගර්භය තුළ නැත.]

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යැවිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 112/'15-(3), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 931/'16-(7), ගරු චන්දිම ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 1043/'16-(5), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 1117/'16-(3), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 - 1191/'16-(3), ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 1278/'16-(6), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ජාතික සහ පළාත් පාසල්වල අනධ්‍යයන සේවකයන් : මාතර දිස්ත්‍රික්කය
தேசிய மற்றும் மாகாண பாடசாலைகளின் கல்விசாரா ஊழியர்கள்: மாத்தறை மாவட்டம்
NON-ACADEMIC EMPLOYEES IN NATIONAL AND PROVINCIAL SCHOOLS: MATARA DISTRICT

1298/'16

7. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, ජාතික සහ පළාත් පාසල්වල සේවය කරන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික සහ පළාත් පාසල්වල පවතින අනුමත අනධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සංඛ්‍යාව, ජාතික සහ පළාත් පාසල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் தேசிய மற்றும் மாகாண பாடசாலைகளில் பணியாற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த எண்ணிக்கையானது ஒவ்வொரு பதவிக் கமைய தனித்தனியாக யாது என்பதையும்;

(iii) மாத்தறை மாவட்டத்தின் தேசிய மற்றும் மாகாண பாடசாலைகளுக்கான அங்கீகரிக்கப் பட்ட கல்விசாரா பதவியணியில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அந்த வெற்றிடங்களின் எண்ணிக்கையானது தேசிய மற்றும் மாகாண பாடசாலைகளுக் கமைய தனித்தனியாக யாது என்பதையும்;

(v) மேற்படி (iv)இல் குறிப்பிடப்பட்ட வெற்றிடங் களுக்கு ஆட்சேர்ப்புச் செய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(vi) ஆமெனின், அதற்கு ஏற்புடையதான ஆட்சேர்ப்பு நடைமுறை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

asked the Minister of Education :

(a) Will he inform this House-

(i) the number of non-academic employees, employed in national and provincial schools of Matara District;

(ii) separately, the number of employees in terms of each post;

(iii) the number of vacancies available in the approved non-academic cadre, in the national and provincial schools of Matara District;

(iv) separately, aforesaid number of vacancies in terms of national and provincial schools;

(v) whether measures will be taken to recruit persons for the vacancies, mentioned in aforesaid (iv); and

(vi) if so, the respective recruitment procedure?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික පාසල්වල අනධ්‍යයන සේවක සංඛ්‍යාව - 236
පළාත් පාසල්වල අනධ්‍යයන සේවක සංඛ්‍යාව - 597

(ii) ජාතික පාසල්

	තනතුර	සේවක සංඛ්‍යාව
1	අරක්කැමි	13
2	පාසල් මුරකරු	36
3	පාසල් කම්කරු	94
4	සනීපාරක්ෂක කම්කරු	15
5	පුස්තකාල සේවක	29
6	රසායනාගාර සහකාර	08
7	රසායනාගාර සේවක	41
එකතුව		236

,,

පළාත් පාසල්

	තනතුර	සේවක සංඛ්‍යාව
1	රසායනාගාර සේවක	146
2	පාසල් මුරකරු	116
3	පුස්තකාල සේවක	50
4	සනීපාරක්ෂක කම්කරු	34
5	පාසල් කම්කරු	248
6	සැලසුම් හා මූල්‍ය සහකාර	03
එකතුව		597

(iii) ජාතික පාසල්වල පුරප්පාඩු - 251
පළාත් පාසල්වල පුරප්පාඩු - 206
457

(iv) ජාතික පාසල්වල පුරප්පාඩු - 251
පළාත් පාසල්වල පුරප්පාඩු - 206

(v) ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු මේ වනවිට සම්පූර්ණ කිරීම සඳහා පියවර ගනිමින් සිටී. පළාත් පාසල්වල සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේදී අදාළ පළාත් සභාව විසින් අවශ්‍යතාවය අනුව පියවර ගනී.

(vi) ඔව්.

1. ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ බඳවා ගැනීමේ පරිපාටිය - PL1
2. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ බඳවා ගැනීම් පරිපාටිය - PL2
3. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 ගණයේ බඳවා ගැනීමේ පරිපාටිය - MN1
4. අධ්‍යාපන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයට අයත් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - MN4

(ආ) අදාළ නොවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමතිතුමනි, ඔබතුමා හැම දාම ඉතා වගකීමෙන් උත්තර දෙන ඇමතිවරයෙක්. මෙම ප්‍රශ්නයට අදාළ නොවන, ජාතික මට්ටමේ වැදගත්කමකින් යුතු ප්‍රශ්න දෙකක් තිබෙනවා. ඒවා මතු කළාට කමක් නැද්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කමක් නැහැ, අහන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, හම්බන්තොට සුවී ජාතික පාසලේ විදුහල්පතිනිය නායකත්ව පුහුණු වැඩ මුළුවේදී මිය යෑම සම්බන්ධව මා එක ප්‍රශ්නයක් අසනවා. මම ඒ වරද ඔබතුමාට

ආරෝපණය කරනවා නොවෙයි. ගරු කථානායකතුමනි, මට මතක විධියට රද්දොළුවේ ශ්‍රී පඤ්ඤානන්ද ජාතික පාසලේද කොහේද විදුහල්පතිතුමා මීට කලින් පැවැති මෙවැනි වැඩසටහනකදී මිය ගියා. මේ, රෝහිණී කුමාරි අතපත්තු මැතිනිය කියන්නේ නායකත්ව පුහුණු වැඩසටහනකදී මිය ගිය දෙවැනි විදුහල්පතිනිය.

මා දැන් මේ කියන්න උත්සාහ ගන්නේ මේ ව්‍යාපෘතිය දුර්වල, අසාර්ථක, නොහොඹිනා, නොකටයුතු එකක් කියා නොවෙයි. නමුත් මේ කියන සිද්ධිය වෙලා තිබෙන බැහැරගත පුහුණු මධ්‍යස්ථානය පෞද්ගලික ආයතනයක් විසින් පාලනය කරනු ලබන එකක්. එහි ප්‍රමිතිය පිළිබඳව සමස්ත ගුරු ක්ෂේත්‍රයම දැඩි වික්ෂිප්තභාවයකට පත් වෙලා තිබෙනවා. අවුරුදු 53ක් වයස ඇති එම විදුහල්පතිනියගේ මරණය ඉණිමහකින් වැටී සිදු වූ දෙයක් විධියටයි රාජ්‍ය මාධ්‍ය වාර්තා කළේ, ගරු අමාත්‍යතුමනි. අනෙක් සියලුම මාධ්‍ය වාර්තා කළේ, එය කඹයකින් බහින්න ගිහින් වෙච්ච දෙයක් විධියටයි. කුමන ආකාරයෙන් සිදු වුණත් එය දිසාපාමොක් පරපුරේ ඇත්තන්ට අදාළ බරපතළ ප්‍රශ්නයක් විධියට සමාජගත වෙලා තිබෙන නිසා මෙහි සත්‍ය අසත්‍යතාවත්, මීන් පසුව මෙවැනි වැඩසටහන්වලදී අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳවත් දැනගන්න රට බලාපොරොත්තුවෙන් ඉන්නවා කියා මම හිතනවා, ගරු අමාත්‍යතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අමාත්‍යවරයා වශයෙන් මා මේ සම්බන්ධයෙන් ඉතාම කඩිනම් විමර්ශනයක් ඉල්ලා තිබෙනවා. එහි වාර්තාව ආවාට පසුව තමයි මට මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කරන්න සිදු වන්නේ. ඒ වාගේම මට දැනට ලැබී තිබෙන තොරතුරු අනුව සමහර මාධ්‍ය වාර්තා කර තිබෙන ඒවා සත්‍යම නොවෙයි. සමහර මාධ්‍ය එය අතිශයෝක්තියෙනුත් වාර්තා කර තිබෙනවා. අපි විදුහල්පතිවරුන් පුහුණු කිරීම් කළ යුතුව තිබෙනවා. පෞද්ගලික අංශයෙන් ටෙන්ඩර් කැඳවා තමයි සමහර පුහුණුවීම් ලබා දෙන්න තීරණය කර තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් යම් වරදක් සිදු වෙලා තිබෙනවා නම් ඊට අවශ්‍ය දැඩි ක්‍රියා මාර්ග ගන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම මට දැන ගන්න ලැබිලා තිබෙනවා, මේ විදුහල්පතිවරිය මීට පෙර cadetting කරපු විදුහල්පතිවරියක් බව. ඒ වාගේම මේ ක්‍රියාකාරකම අනිවාර්ය එකක් නොවෙයි. ඇය ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා කර ඇති බවට දැනට තොරතුරු ලැබී තිබෙනවා. බොහෝ විදුහල්පතිවරු මේ ක්‍රියාකාරකම කරලා නැහැ කියන එකත් දැන ගන්නට ලැබී තිබෙනවා. කොහොම වුණත්, මේ පිළිබඳව තොරතුරු වාර්තා වෙන්න පෙර හරියාකාර පිළිතුරක් දෙන්න බැහැ. මම ඒ ගැන කඩිනම් වාර්තාවක් ඉල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් වැරැද්දක් වෙලා තිබෙනවා නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකයි අහන්නේ. මගේ දෙවන අතුරු ප්‍රශ්නය අසන්නට පෙර මේ කාරණයට අදාළව යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සිද්ධිය ගැන සොයා බලන්න. නමුත් හමුදාවේ වුණත් නවක සොල්දාදුවෙකුට දෙන පුහුණුව ඒ ආකාරයෙන් කර්නල් නිලයේ හෝ බ්‍රිගේඩියර් නිලය දරන කෙනෙකුට දෙන්නේ නැහැ. වයස අනුව ඒක වෙනස් වෙනවා. මම හිතන්නේ මේ විදුහල්පතිනිය වයස අවුරුදු 53ක කෙනෙක්, ඇය දරුවන් හතර දෙනෙකුගේ මවක්. වයස අනුව පුහුණුවේ පරිමාවන් තීරණය කිරීම ඉතා වැදගත් වෙයි කියලා මා හිතනවා. මොකද, දැනට විදුහල්පති බිලි දෙකක් ගෙන තිබෙන වෙලාවක ඔබතුමා මේ කාරණය ගැන උනන්දුවෙන් කටයුතු කරාවි කියලා මම හිතනවා. තුන්වන ගුරු බිල්ල ගැනීමට ප්‍රථම මේ පිළිබඳව කිසියම් කළමනාකරණයක්, විධිමත් විද්‍යාත්මක පදනමක් සකස් කර ගැනීම අවශ්‍යයි කියන එකයි මා යෝජනා කරන්නේ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මීට පෙර - 2015ට පෙර- හමුදාව සම්බන්ධ කරගෙන තමයි සමහර විදුහල්පතිවරුන් පුහුණු කරනු ලැබුවේ. ඒ සමහර අයට හමුදාවේ කර්නල් තනතුරු පවා හිමිකර දී තිබුණා. නමුත් 2015න් පස්සේ ඒ තත්ත්වය වෙනස් කරලා, එහි තිබුණු බරපතළකම් අඩු කරලා තමයි මේ පාඨමාලාව සකස් කරලා තිබෙන්නේ. ඒ කොහොම වුණත් ඔබතුමා කියනවා වාගේ මේ සම්බන්ධයෙන් අපි තවදුරටත් සොයා බලා සමහර ක්‍රියාකාරකම් ඉවත් කරන්න ඕනෑ නම්, ඒ බාහිර ක්‍රියාකාරකම් ඉවත් කරන්නත් පුළුවන්කම තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඉදහිට හෝ මෙවැනි මේ සිද්ධීන් ඇතිවීම හරිම කනගාටුදායකයි.

පාසල්වල ළමයින් ක්‍රීඩා තරග සඳහා සහභාගිවීමේදී ඊට කලින් වෛද්‍ය පරීක්ෂාවක් කළ යුතුව තිබෙනවා. ලක්ෂ 42ක් විතර ළමයි ඉන්නකොට- සමහර අවස්ථාවලදී මෙම පරීක්ෂාව නිසා ගොඩාක් ළමයි ක්‍රීඩා තරගවලට පෙනී සිටීමට ඇති පෙළඹවීම අඩුවෙලා තිබෙනවා. තැනක දෙකක එවැනි සිදුවීම් එකක් දෙකක් පේනවා. මේවා සුළුකොට තකන්න බැහැ. නමුත් ඒ නිසාම අපි මේ පුහුණුවීම් නැවැත්විය යුතුද නැද්ද කියන එක සලකා බලන්න ඕනෑ. ඒක විදුහල්පතිවරුන්ට එද්දි වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ කොහොම වුණත් මේ පිළිබඳ ඔබතුමා කිව්වා වාගේ ඉදිරියේදී මේවා නොවෙන්න කටයුතු කරන්න ඕනෑ වනවා. මෙවැනි පුහුණුවීම් කිරීමේදී එක එක්කෙනාගේ ශරීරයේ තිබෙන ශක්තිමත්භාවය යනාදී සියල්ල පරීක්ෂා කර බලා මෙවැනි වැඩ පිළිවෙළකට සහභාගි වෙනවා නම් හොඳයි. මේ සිදුවීම මොකක්ද කියන එක ගැන මට කියන්න බැහැ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)

අකිල විරාජ් කාරියවසම් තරුණ ඇමතිතුමාට කඹයකින් බහින්න කිවුවොත් එතුමා සාර්ථකව බහියි. හැබැයි, ගරු කථානායකතුමනි, ඔබතුමාට කඹයකින් බහින්න කිව්වොත් ඒක බරපතළ අර්බුදයක් වෙයි.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ඉස්සර බැහැලා තිබෙනවා. දැන් ටිකක් අමාරුයි. මම හමුදාවේ ඉන්න කාලයේ බැහැලා තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමා, හොඳ හමුදා පුහුණුවක් තිබුණු කෙනෙක්.

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුවල තිබුණු ඉතාමත් බරපතළ කාරණාවක් තිබුණා. ඒ තමයි, උසස්පෙළ ශිෂ්‍යයන්ට "ටැබ්ස්" ලබාදීම සම්බන්ධයෙන්. ඊයේ "ලංකාදීප" පුවත් පත ඇතුළු සියලුම මාධ්‍ය වාර්තා කළා, මෙම ශිෂ්‍යයන්ට "ටැබ්ස්" ලබාදීම අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයකින් නැවතිලා කියලා. ඒ නිසා ශිෂ්‍ය ප්‍රජාව තුළ විශාල වික්ෂිප්තභාවයක් සහ කනස්සල්ලක් තිබෙනවා. මෙම වාර්තාවේ තිබෙන්නේ, ටෙන්ඩර් පටිපාටියේ තිබෙන ගැටලුවක් නිසාවෙන් නතර කළා කියලායි.

ගරු ඇමතිතුමනි, ඒ ගැන මම දන්නේ නැහැ. ඒක රටට පැහැදිලි කරන එක ඔබතුමාගේ වගකීම. කුමක් වුණත්, ශිෂ්‍ය ප්‍රජාව තුළ විශාල කනස්සල්ලක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට හීනයක් තිබුණා. එම "ටැබ්ස්" ලබා දීම නතර වුණේ ඇයි කියන කාරණාවත්, නැවත දෙන්න කටයුතු කරනවාද කියලාත් ඔබතුමා ගරු සභාව දැනුවත් කරයි කියා මා බලාපොරොත්තු වනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් අපි නියම ක්‍රියා පටිපාටිය අනුගමනය කළ බව මම කියන්න ඕනෑ. සමහර සමාගම් වංගු ගහගෙන එක එක විධියට එක එක්කෙනා අල්ලාගෙනත් එන්න උත්සාහ කළා. මම ඒක කෙළින්ම කියන්න ඕනෑ පාර්ලිමේන්තුවේ. හැබැයි, අමාත්‍යවරයා වශයෙන් මම අපේ අමාත්‍යාංශයට අවශ්‍ය නායකත්වය දීලා මෙය නිසියාකාරව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබුවා. ඒ නිසා මම විශ්වාස කරනවා, අවසාන අවස්ථාවට එන විට බිලියන දෙකකට ආසන්න මුදලක් ඉතුරු කර ගන්නත් පුළුවන් වුණා කියලා. ඒ වාගේම අභියාචනා මණ්ඩලයෙනුත් අභියාචනා ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් සමාගම් හතරක් නිර්දේශ කරනු ලැබුවා. මම නැවත කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලීමක් කළා, ඒ සමාගම් හතරෙනුත් හොඳ product එක මොකක්ද කියලා TEC එකෙන් නම් කරලා දෙන්න කියලා. ඒ අනුව තමයි අපි තීන්දු තීරණ ගනු ලැබුවේ. ඒකේ කිසිම සැකයක් නැහැ. ඒ සම්බන්ධයෙන් වග කීමක් ඇතිව, සියයට 500ක විශ්වාසයෙන් ඕනෑම ස්ථානයක මට කියන්න පුළුවන්.

කැබිනට් මණ්ඩලයට මෙය ඉදිරිපත් කළාම ඇත්ත වශයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේත් අදහස වුණේ, මීට වඩා අවශ්‍යතා සපුරන්න තිබෙන බවයි. ඒ වාගේම තවත් අයගේ අදහස් මත - කීපදෙනෙකුගේ අදහස් මත- මෙය තාවකාලිකව තමයි අත්හිටුවලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා වාගේ මෙය ඇත්තට කළ යුතු දෙයක්. අපි අනාගතයට යන්න ඕනෑ. අපි 1980 ගණන්වල හිතුවා නම් තවත් අඩු පාඩු සපුරලා පරිගණක භාවිත කරන්න ඕනෑ කියලා, එහෙම නම් අපේ රටේ අද පරිගණක නැහැ. ඒ නිසා ඇමතිවරයා විධියට මම බලාපොරොත්තු වනවා, අනාගතයේදී මෙය ක්‍රියාත්මක කරන්න කටයුතු කළ යුතුයි කියලා. දැනට ප්‍රමුඛතාව දිය යුතු විෂයන්වලට මුල් තැන දුන්නාට පස්සේ ඇත්ත වශයෙන්ම මේක කළ යුතු දෙයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 1376/'16 - (3), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මුද්‍රණය කරලා තිබෙන්නේ තුන්වන වතාවට. මේ ප්‍රශ්නය අහන්නේ, බීජ ගොවිපොළ පෞද්ගලීකරණය පිළිබඳව. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දීම දිනපතා කල් අරිනවා. පෞද්ගලීකරණය කරලා ඉවර වෙනකල්ම මේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ. දැන් තුන් වතාවක් අහලා තිබෙනවා. ඊළඟට අහන්නේ හතරවන වතාවට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න. මමත් හිතන විධියට තුන් වතාවක් ඇහුවා නම් ඊළඟ වතාවේවත් උත්තර ලබා දීම අවශ්‍යයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 1466/'16 - (3), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පී. සීතාදේවී මහත්මිය : වන්දි හා පාරිතෝෂික
திருமதி. பீ. சீத்தாதேவி : நட்டஈடு மற்றும் பணிக்கொடை
MRS. P. SEETHADEVI: COMPENSATION AND GRATUITY

1584/'17

10.ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) හොරණ, පෝරුවදණ්ඩ, වගවත්ත, පර්ත් නව නිවාස සංකීර්ණයේ අංක 39 දරන ලිපිනයේ පදිංචි පී. සීතාදේවී මහත්මිය, හොරණ, පර්ත් වත්තේ ළමා උයන් පාලිකාව ලෙස සේවයට බැඳුණු දිනය කවරේද;

(ii) ඇය සේවයෙන් අස්වූ දිනය කවරේද;

(iii) වසර 26ක සේවය අවසන් කිරීමේදී ඇයට ලැබිය යුතු වන්දි මුදල හා පාරිතෝෂික මුදල කොපමණද;

(iv) 2016.11.26 දින එම මුදල් ලබාදීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් නියම කර තිබේද;

(v) එසේ නම්, එම වන්දි හා පාරිතෝෂික මුදල් නොගෙවා සිටින්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයට්සිකළ් අපිවිරුත්ති අමෛච්සරෛක් කේට්ට වින්නා:

(අ) (i) ඉහාරණෙ, පෝරුවතණ්ඩ, වකවත්තෙ, පර්ත් පුතිය වීටමෛප්පුත් තොකුතියිල් 39ආම් ඉලක්ක මුකවරියිල් වතියුම් තිරුමති. පී. සීත්තාදේවි ඉහාරණෙ, පර්ත් තෝට්ටත්තින් සිරුවර් පූංකා නිරුවාකියාකච් සේවෙයිල් ඉණෛන්ත තිකති යාතෙන්පතෙයුම්;

(ii) ඉවර් සේවෙයිලිරුන්තු විලකිය තිකති යාතෙන්පතෙයුම්;

(iii) 26 වරුටකාල සේවෙයෙ මුටිවුරුත්තුම්පෝතු ඉවරුක්කුක් කිටෛක්ක වේණ්ටිය නට්ටෂ්ට්ටුත් තොකෛ මට්රුම් පණික්කොටෛත් තොකෛ එව්වළවෙන්පතෙයුම්;

(iv) අත්තොකෛයෛප් පෙට්රුක්කොටුප්පතර්කු තොළිල් තිණෛක්කළත්තිනාල් 2016.11.26ආම් තිකති කුරිත්තුරෛක්කප්පට්ටුල්ළතා එන්පතෙයුම්;

(v) ආමෙනිල්, අන්ත නට්ටෂ්ටු මට්රුම් පණික්කොටෛත් තොකෛ සෙලුත්තප්පටා තිරුප්පු ඒනෙන්පතෙයුම්;

අවර් ඉච්සෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House -

(i) the date of appointment of Mrs. P. Seethadevi residing at No. 39, Perth New Housing Complex, Wagawatta, Poruwadanda, Horana as garden keeper of the children's park of Perthwatta, Horana;

(ii) the date on which she resigned;

(iii) the amount of compensation and gratuity that she deserves at the end of the completion of a service period of 26 years;

(iv) whether it has been ordered by the Department of Labour on 26.11.2016 that the said amount be paid to her; and

(v) if so, as to why the aforesaid compensation and gratuity are not paid?

(b) If not, why?

ගරු කබීර් හාෂීම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1981.09.01.

(ii) 2007.08.31.

(iii) පාරිතෝෂික මුදල - රු.163,979.40යි.

අධි භාරය - රු.49,193.82යි.

(iv) ඔව්.

(v) අදාළ පාරිතෝෂිකය හා අධිභාරය වන රු.213,173.22ක මුදල රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් 2017.10.12 දින හොරණ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගෙවා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි. මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලැබෙයි කියා මා හිතනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මා අහන්නේ මේ ප්‍රශ්නයට අදාළව නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ශ්‍රීලන්කන් එයාර්ලයින් ආයතනය පිළිබඳව දැන් නැවත වතාවක් සාකච්ඡාවක් ආරම්භ වෙලා තිබෙනවා. ශ්‍රීලන්කන් එයාර්ලයින් ආයතනය සහ මිහින් ලංකා ආයතනය ගැන විමර්ශනය කිරීමට යළි ජනාධිපති විශේෂ විමර්ශන කොමිසමක් පත් කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, හැබැයි මීට කලිනුත් මේ ආණ්ඩුව බලයට පත් වූ ගමන් නීතිඥ ජේ.සී. වැලිඅමුණ මහතා මාර්ගයෙන් මේ සම්බන්ධයෙන් වාර්තාවක් ගෙන්වා ගත් බව ඔබතුමාට මතක ඇති. ඒකටත් රුපියල් ලක්ෂ 42කට වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් කළා. ඔබතුමාත් පසු ගිය අය වැය විවාද හැම එකකදීම මේ ආයතන භාර අමාත්‍යවරයා හැටියට මේ ආයතන ගැන කථා කළා. අපි COPE වාර්තාවලත් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකේ සිදු වූ අලාභය -පාඩුව- පිළිබඳව රටට වාර්තා කළා. නමුත්, දැන් බලාගෙන ඉන්නේ නැවත ජනාධිපති කොමිසමක් දමා ඒකේත් වාර්තාවක් ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා තෙක්ද, එහෙම නැත්නම් මේ තාක් සිදු වූ විමර්ශනවලින් සිදු වූ අලාභය අය කර ගැනීම සඳහා ඒ වූදිතයන්ට දඬුවම් පැමිණවීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේ නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, මූලික ප්‍රශ්නයට මෙම අතුරු ප්‍රශ්නය අදාළ නැති වුණත් ඔබතුමා කැමැති නම් පිළිතුරු දෙන්න.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, ඒක තමයි මා බැලුවේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම වැවිලි ක්ෂේත්‍රයට අදාළ වන්නේ කොහොමද කියලා. ජනතා විමුක්ති පෙරමුණට සමහර විට ඒ වාගේ පැටලෙන අවස්ථා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, මේ ආයතන ඔබතුමාට අයිති නිසායි මේ ප්‍රශ්නය මා ඇහුවේ.

ගරු කබීර් හාෂිම් මහතා
(*மாண்புமிகு கபீர் ஹாஷீம்*)
(The Hon. Kabir Hashim)

ගරු මන්ත්‍රීතුමනි, ඒ වුණත් ඔබතුමා ඇසූ ප්‍රශ්නයට මම පිළිතුරු දෙන්නම්. මේ ජනාධිපති කොමිසම පත් කිරීමේදී මම ජනාධිපතිතුමාව ලිඛිතව දැනුවත් කළා, ඒ කොමිසම පත් කරනවා නම්, වැලිඅමුණ වාර්තාව ඒකේ කොටසක් හැටියට ඇතුළත් කර ගන්න කියලා. මොකද, වැලිඅමුණ වාර්තාව හරි වැදගත් වාර්තාවක් කියලා මම පිළිගන්නවා. ඒ පරීක්ෂණය අපි හරියට ක්‍රියාත්මක කළේ නැහැ. එම නිසා ඒ වාර්තාව මෙම ජනාධිපති කොමිෂන් සභාවේ පරීක්ෂණවලට ඇතුළත් කරලා ඒක පදනම් කර ගෙන පසු ගිය කාලයේ සිද්ධ වූ දේවල්වල සිට ඔය පරීක්ෂණය විධිමත්ව කරන්න කියලා මම කිව්වා. ඊට අමතරව අභ්‍යන්තරව අපේ අමාත්‍යාංශයෙන් වැලිඅමුණ වාර්තාවේ සඳහන් ජේද බලා ඒවා හැකි ප්‍රමාණයෙන් ක්‍රියාත්මක කරන්නත් අපි කටයුතු කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ඒකටම අදාළ දෙවෙනි අතුරු ප්‍රශ්නය මම අහන්නම්. ප්‍රශ්නය මෙයයි ගරු ඇමතිතුමා. දැන් ආණ්ඩුව පත් වෙලා අවුරුදු තුනක් ගතවෙලා තිබෙනවා. මේ ආණ්ඩුව පත් වුණු හැටියේම තමයි වැලිඅමුණ වාර්තාව ආවේ. ඒ වාගේම, අපි විවාදයට බඳුන් කරන්නට නියමිත වෙලා තිබෙන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සඳහන් පැමිණිලි තිස්හතර තුළත් මේ ආයතනය සම්බන්ධයෙන් සඳහන් කරලා තිබෙනවා. මේ වාර්තා ඉදිරිපත් වෙනවා. මේ වාර්තා හඳුන්නට අපි රටේ ජනතාවගේ බදු මුදල් ලක්ෂ ගණන්, මිලියන ගණන් වියදම් කරනවා. ඒ වාර්තා ගැන පාර්ලිමේන්තුවේදී විවාද කරනවා, ඒකටත් මුදල් වියදම් කරනවා. හැබැයි, මේ අය සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. ඒ චූදිතයෝ, ඒ රාජපක්ෂ පවුලට සම්බන්ධ උදවිය නිදැල්ලේ හැසිරෙනවා. තමුන්නාන්සේලාත් ඇස් කන් පියාගෙන බලාගෙන ඉන්නවා. ජනතාව තමුන්නාන්සේලාට හොඳ කනේ පාරක් ගහලා එළියට ඇදලා දමනතුරු මේ වාර්තා කිහිල්ලේ ගහගෙන ඉන්නද තමුන්නාන්සේලා කල්පනා කරන්නේ?

ගරු කබීර් හාෂිම් මහතා
(*மாண்புமிகு கபீர் ஹாஷீம்*)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, අපේ පැත්තෙන් එම වාර්තාව හරහා පරීක්ෂණය කරන්නට කියලා FCID එකට බාර දුන්නා. අමාත්‍යාංශයක් හැටියට අපිට භාර යුතුකම්, වගකීම් ටික අපි හරියට ඉටු කරලා තිබෙනවා. එතැනින් එහාට පොලීසියේ පරීක්ෂණය හෝ FCID එකේ පරීක්ෂණය මට අදාළ නැහැ. එතැනින් එහාට ඒක ක්‍රියාත්මක කරවීම මම හිතන විධියට සියලුදෙනාගේම සාමූහික වගකීමක් වෙනවා. ඒක එක්සත් ජාතික පක්ෂයට විතරක් නොවෙයි, හැම දේශපාලන පක්ෂයකටම තිබෙන වගකීමක්. යම්කිසි අක්‍රමිකතාවක්, දූෂණයක් සිදු වෙලා තිබෙනවා නම් ඒ පරීක්ෂණය එතැනින් එහාට තල්ලු කරන්නට මේ පාර්ලිමේන්තුවේ හැම ගරු මන්ත්‍රීවරයෙක්ම බැඳී ඉන්නවා. COPE එකටත් පුළුවන්. ඇයි COPE එක ඒ වගකීම ගන්නේ නැත්තේ? වැලිඅමුණ වාර්තාව COPE එකට අරගෙන, -සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා තමයි ඒකේ සභාපතිතුමා- ඒ කටයුතු ඉදිරියට තල්ලු කරන්නට තිබුණා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා කියලා පිළිගන්නවා. නමුත්, තමුන්නාන්සේලා ආණ්ඩුව නේ. පොලීසිය භාර ඇමතිතුමා ඉන්නේ තමුන්නාන්සේලාත් එක්ක. ජනාධිපතිතුමා ඒක කරන්නේ නැත්නම්, ජනාධිපතිතුමා බාධා කරනවා නම් කැබිනට් මණ්ඩලය විධියට තමුන්නාන්සේලාට පීඩනයක් එල්ල කරන්නට පුළුවන්නේ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

හොඳයි. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(*மாண்புமிகு கபீர் ஹாஷீம்*)
(The Hon. Kabir Hashim)

එතුමා සූදානම් නම්, මා ලෑස්තියි, COPE එකට හෝ ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියට ගෙන යන්නට අපේ අමාත්‍යාංශය පැත්තෙන් උපරිම සහයෝගය ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 - 1595/'17 - (3), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 1601/'17 - (3), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

භූගත විදුලි සැපයුම් මාර්ගය: ප්‍රතිසංස්කරණය
நிலக்கீழ் மின்சார வழங்கல் மார்க்கம்: மீளமைத்தல்
UNDERGROUND POWER SUPPLY LINE: RESTORATION

1603/'17

13. ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) කොළඹ නගරයට විදුලිය සපයන ප්‍රධාන භූගත විදුලි සැපයුම් මාර්ගයක් වසර 03ක පමණ සිට අක්‍රීයව පවතින බව දන්නේද;

(ii) එම මාර්ගයේ විදුලි සැපයුම් ධාරිතාවය කොපමණද;

(iii) එකී සැපයුම් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(iv) එකී සැපයුම් මාර්ගය අලුත්වැඩියා කිරීම ප්‍රමාද වීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද;

(v) එම එක් එක් නිලධාරියාට එරෙහිව අමාත්‍යාංශය හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙතෙක් ගෙන ඇති විනයානුකූල පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) කොළඹ නගරයේ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு நகருக்கு மின்சாரத்தை வழங்கும் நிலக்கீழ் மின்சார வழங்கல் முறையொன்று சுமார் 03 வருட காலமாகச் செயலிழந்துள்ளமை பற்றி அறிவாரா;

(ii) மேற்படி மின்சார வழங்கல் முறையின் மின்சார வழங்கல் கொள்ளளவு யாது;

(iii) குறிப்பிட்ட வழங்கல் முறையை வழமை நிலைக்குக் கொண்டுவருவதற்கு நடவடிக்கை எடுத்தல் தாமதம் அடைவதற்கான காரணம் யாது;

(iv) மேற்படி வழங்கல் முறையானது திருத்திய மைத்தல் தாமதமாவது தொடர்பில் பொறுப்புக் கூறவேண்டிய உத்தியோகத்தர்கள் யார்;

(v) மேற்படி ஒவ்வொரு உத்தியோகத்தருக்கும் எதிராக அமைச்சு அல்லது இலங்கை மின்சார சபையினால் இதுவரையில் மேற்கொள்ளப் பட்டுள்ள ஒழுங்காற்று நடவடிக்கை வெவ் வேறாக யாது;

(vi) கொழும்பு நகரில் தொடர்ச்சியான மின்சார வழங்கலை உறுதிப்படுத்துமுகமாக மின் அனுப்பல் முறைமையினை இற்றைப்படுத்து வதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) whether he is aware that a main underground power supply line which provides electricity to the city of Colombo has been inactive for about 3 years;

(ii) the electricity capacity of the aforesaid supply line;

(iii) the reason for the delay in taking steps to restore the aforesaid supply line;

(iv) the officers who are responsible for the delay in repairing the aforesaid supply line;

(v) the disciplinary action that has been taken by the Ministry or Ceylon Electricity Board against each of the aforesaid officers by now, separately; and

(vi) whether action will be taken to modernize the national grid in order to ensure a continuous supply of electricity in the city of Colombo?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වසර තුනක කාලයක් අක්‍රියව පැවතියද, එම විදුලි සැපයුම් මාර්ගය මේ වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ ඇත.

(ii) එම විදුලි මාර්ගයේ සැපයුම් ධාරිතාව කිලෝවොට් 132 -132kv- මෙගාවොට් ඇම්පියර් 120 -120 MVA- වෙයි.

(iii) මෙම විදුලි මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීමේදී පහත සඳහන් හේතු නිසා ප්‍රමාදයන් සිදු වී ඇත.

01. පලුදු වූ ස්ථානය කිසිවෙකුටත් (විදේශීය විශේෂඥයින්ටත්) මූලික අදියරේදී සොයා ගැනීමට නොහැකි වීම.

02. කේබලය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය තෙල් ලබා ගැනීම සඳහා සන්ධි පිළිසකර කළ කොන්ත්‍රාත්කරුගේ සහාය ලබාගත් අතර ඔහු අතින් සිදු වූ ප්‍රමාදයක් නිසා ඇණවුම් කළ තෙල් ලැබීම පොරොන්දු වූ දිනට වඩා මාස 7ක් ප්‍රමාද වීම.

03. දෙවන ටෙන්ඩරයේ කොන්ත්‍රාත්කරු විසින් අලුත් කේබල් කොටසක් දමා සන්ධි දෙකකින් පලුදු වූ කොටස ඉවත් කළද, කේබලයේ විදුලි පරිවරණ දුර්වලතාවක් නිසා විදුලි කේබලය යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි වීම.

04. අලුතින් කේබල් පද්ධතිය සැලසුම් කිරීමට සිදු වූ නිසාත්, අදාළ කේබල් නිපදවීමට කාලයක් වැය වූ නිසාත් මේ සඳහා සම්පූර්ණ ලෙස මාස 10ක කාලයක් වැය වීම.

(iv) විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් අතින් ප්‍රමාදයක් සිදු වී නොමැත.

(v) අදාළ නොවේ.

(vi) ඔව්. ඒ සඳහා සුදුසු පියවර ගෙන ඇත.

මේ වනවිට කොළඹ නගරයේ අඛණ්ඩ විදුලි සැපයුමක් ස්ථාපිත කිරීම සඳහා බිඳ වැටීමකට පත් වූ කේබලය, වැඩි ධාරිතාවකින් සහ වැඩිදියුණු කළ සම්ප්‍රේෂණ පද්ධතියකින් ප්‍රතිස්ථාපනය කර ඇත.

තවද, "Greater Colombo Transmission and Distribution Loss Reduction" යන ව්‍යාපෘතිය ආරම්භ කර සම්ප්‍රේෂණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ වැඩකටයුතු ආරම්භ කර ඇත.

එපමණක්ද නොව, කොළඹ නගරයේ ප්‍රාථමික උපපොළවල් මධ්‍යම වෝල්ටීයතා කිලෝවොට් 11 -11kv- කේබල් පද්ධතියකින් ඒකාබද්ධ කිරීම

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ආරම්භ කරන ලදී. මෙහි ප්‍රාථමික උපපොළ "F" මේ වනවිට අවසන් කර ඇත.

ඉදිරියේදී මෙසේ සිදු විය හැකි හානි අවම කර ගැනීම සඳහා කිලෝවොට් 132 -132kv- කේබල් සහිත මාර්ග කැණීම සඳහා බලපත්‍ර නිකුත් කරන විට ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවට කොළඹ මහ නගර සභාවට දන්වා ඇත. කෙසේ වෙතත් පවතින තත්ත්වයන් යටතේ කේබලවල ආරක්ෂාව උපරිම අයුරින් සැලසීම සඳහා 132kv භූගත රැහැන් සහිත මාර්ග ඔස්සේ මුර සංචාර සිදු කිරීමද ආරම්භ කර ඇත.

එහිදී ලංකා විදුලිබල මණ්ඩලයේ කොළඹ නගර සීමාව තුළ ක්‍රියාත්මක වන මෙහෙයුම් ඒකකය හා නඩත්තු ඒකකය මඟින් සෑම දිනකම රාත්‍රී මුර සංචාරය සිදුකර ඊට පසු දින උදැසන ප්‍රධාන ඉංජිනේරු මෙහෙයුම් හා ප්‍රධාන ඉංජිනේරු නඩත්තු වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. ඒ අතුරු ප්‍රශ්න දෙක තාක්ෂණික ප්‍රශ්න දෙකක්. මම හිතන්නේ ඇමතිතුමාගෙන් අහලා පිළිතුරු,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අතුරු ප්‍රශ්න ඇමතිතුමාගෙන් ඇහුවොත් එතුමා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාට ඒවා යොමු කරයි. මීට පෙරත් එවැනි උත්තර ලබා දීලා තිබෙනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලෝකයේ දැන් මෙවැනි භූගත විදුලි සැපයුම් මාර්ග - ඒකට කියන්නේ "power-line communication" කියලා - අන්තර්ජාලය transmit කරන්න භාවිත කරනවා. ඒ තාක්ෂණය අලුතින් භූගත විදුලි රැහැන්වලට භාවිත කළා නම් මම හිතන්නේ අන්තර්ජාල පහසුකම් සඳහා අපිට මීට වඩා speed එකක් ලබා ගන්න පුළුවන්. ඒ සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද, ඒ ගැන හිතලා තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි මට අහන්න තිබෙන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ අතුරු ප්‍රශ්නය අපි ගරු ඇමතිතුමාට යොමු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

සෙවනගල සීනි කර්මාන්තශාලාව: උක් වගාව සඳහා වෙන් කර ඇති ඉඩම්
செவனகல சீனித் தொழிற்சாலை : கரும்புச் செய்கைக்கென ஒதுக்கிய காணிகள்
SEVANAGALA SUGAR FACTORY: LANDS ALLOCATED FOR SUGARCANE CULTIVATION

1622/'17

14. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ සීනි අවශ්‍යතාව සපුරාලීමේදී සෙවනගල සීනි කර්මාන්තශාලාව ඉතා වැදගත් වන බවත්;

(ii) එමඟින් වක්‍ර හා සෘජු රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් බිහිවී ඇති බවත්;

(iii) දැනට මෙම කර්මාන්තශාලාව ආශ්‍රිතව ලබා දී ඇති ඉඩම්වල ගොවීන් උක් වගා නොකර වෙනත් වගාවන් සඳහා යොමු වී ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගාව සඳහා ගොවීන් වෙත වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර් කොපමණද;

(ii) දැනට උක් වගාව සිදු කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර් කොපමණද;

(iii) දිනෙන් දින උක් ගොවියා වෙනත් වගාවන් සඳහා යොමු වීමෙන් එම කර්මාන්තශාලාවෙන් අපේක්ෂිත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි විය හැකි බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මෙම කර්මාන්තශාලාවෙන් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் சீனித் தேவையைப் பூர்த்தி செய்கையில் செவனகல சீனித் தொழிற்சாலை மிக முக்கியமானது என்பதையும்;

(ii) அதன் மூலம் பெருந்தொகையான நேரடி மற்றும் மறைமுக தொழில் வாய்ப்புக்கள் உருவாகி யுள்ளன என்பதையும்;

(iii) தற்போது இத்தொழிற்சாலையைச் சார்ந்ததாக வழங்கப்பட்டுள்ள காணிகளில் விவசாயிகள் கரும்புச் செய்கையை மேற்கொள்ளாது வேறு பயிர்ச் செய்கைகளில் ஈடுபட்டுள்ளனர் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) செவனகல சீனித் தொழிற்சாலை சார்ந்ததாக கரும்புச் செய்கைக்கென விவசாயிகளுக்கு ஒதுக்கப்பட்டுள்ள காணியின் ஹெக்டயார் பரப்பளவு எவ்வளவு;

(ii) தற்போது கரும்புச் செய்கை மேற்கொள்ளப் படுகின்ற காணியின் ஹெக்டயார் பரப்பளவு எவ்வளவு;

(iii) நாளுக்குநாள் கரும்பு விவசாயி வேறு பயிர்ச் செய்கைகளில் ஈடுபட்டுவருவதால் இத்தொழிற் சாலையிலிருந்து எதிர்பார்க்கப்படும் உற்பத்தி யைப் பெற்றுக்கொள்ள முடியாது போகலாம் என்பதை ஏற்றுக்கொள்வாரா;

(iv) ஆமெனில், இத்தொழிற்சாலையிலிருந்து அதிக உற்பத்தியைப் பெற்றுக்கொள்வதற்கு மேற் கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he admit that -

(i) the Sevanagala Sugar Factory is very important in fulfilling the sugar requirement of Sri Lanka;

(ii) it has generated a large number of direct and indirect employment opportunities; and

(iii) farmers have taken to other cultivations without cultivating sugarcane in lands allocated to them in the area around the factory?

(b) Will he inform this House-

(i) the number of hectares allocated to farmers for the cultivation of sugarcane in the area around the Sevanagala Sugar Factory;

(ii) the number of hectares currently being used for sugarcane cultivation;

(iii) whether he admits that the expected output cannot be procured as farmers resort to other cultivations day by day; and

(iv) if so, the measures taken to procure a greater output from this factory?

(c) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

(a) (i) Yes. Details are given in Annex I. Sir, I **table*** Annex I.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :
Annexes tabled:

Annex I

Sevanagala Sugar Factory plays a vital role in the supply of sugar requirement in Sri Lanka. Sevenagala institution has made significant contribution to the national economy by saving Rs. 4,698 million in the last five years. Details are given in the chart below:

No.	Description	Years					Total
		2012	2013	2014	2015	2016	
1.	Amount of imported sugar (MT)	569,000	548,000	520,000	624,000	651,000	2,912,000
2.	Amount spent to import (Rs. billion)	43.8	37.1	33.3	34.1	49.9	198
3.	Production of Sugar in Sevenagala (MT)	9,631	14,190	14,417	14,376	17,233	69,847
4.	Amount of foreign exchange saved by production of sugar in Sevanagala (Rs. million)	741	950	922	776	1,309	4,698
5.	Total indigenous sugar production (MT)	36,000	53,000	52,000	56,000	62,000	259,000
6.	The production contribution of Sevanagala Factory to total indigenous sugar production as a percentage.	26%	26%	27%	25%	27%	27%

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

(ii) Yes. Large numbers of direct and indirect job opportunities have been generated through the Sevenagala Sugar Factory and it is supported by the following facts:

The Sevenagala Sugar Factory is making a great contribution to the economy by providing livelihood to more than 3,900 farmer families and approximately 16,000 of their dependents. Direct job opportunities have been provided to more than 1,900 sugarcane harvesters and more than 200 transporters.

(iii) It cannot be accepted that the farmers cultivate other crops instead of sugarcane in the lands surrounding the factory.

The extent of lands allocated to the Sevanagala Sugar Factory for sugarcane cultivation is 4,100 hectares and the farmers are legally bound to plant sugarcane only in those lands. Although in the year 2011, about 2,000 hectares were in existence without being cultivated with sugarcane - 1,700 hectares for other types of crops and about 300 hectares as bare lands - the area for other crops and bare lands have been reduced to about 500 hectares by now. The total area of sugarcane-cultivated lands as at the end of 2017 is about 3,700 hectares.

According to the cycle of sugarcane cultivation, since land preparation is done in every five years, about 650 hectares of land are re-prepared for replanting annually.

Also, some farmers adapted to follow crop rotation with the purpose of raising the qualitative harvest of sugarcane and the quality of the soil by rehabilitating it through removing the infertility of the soil. This is limited for a short period of time and farmers turn to cultivation of sugarcane soon. This takes place as a cycle.

b) (i) 4,100 hectares.

(ii) The number of hectares being used for sugarcane cultivation is 3,354 as at 31.07.2017.

(iii) Not agreed.

Our main production is sugar and it is confirmed through the volume of production for the past four years.

Year	2013	2014	2015	2016
Sugar Production (MT)	14,190	14,417	14,376	17,233

(iv) There are many measures that have been taken to procure greater output from this Factory. The details are given in Annex II. Sir, I **table*** Annex II.

Annex II

The measures that have been taken to procure greater output from this factory.

The grinding of sugarcane was started under the Government in 2012.

The following amounts were spent to purchase new parts to the machinery and for maintenance.

Year	2013	2014	2015	2016
Amount Rs. (million)	107	94	80	131

- The amount paid to a sugarcane harvester for one ton of sugarcane is Rs. 1,500.
- The price of a ton of sugarcane has been increased up to Rs. 5,000.

Year	2012	2013	2014	2015	2016
Price of a ton of sugarcane .	4,000	4,200	4,200	4,500	5,000

- Incentives and financial benefits are provided every year based on the sugarcane supply by the farmers.
- The transport expenses of sugarcane are borne by the company and not by employees.
- A large sum of money is spent annually to repair rural roads and field roads.

Year	2013	2014	2015	2016
Amount Rs. (million)	3.7	19.6	12.2	16.5

Facilities provided to farmers for cultivation

- Irrigation systems running to the fields have been repaired completely with the assistance of the Mahaweli Authority.
- From clearance of land to preparation of plant beds are done by tractors and heavy machines of the institution at concessionary rates and charges are recovered in three years.
- Preliminary fertilizers, first surface fertilizers, second surface fertilizers and herbicides and good quality nursery plants are also supplied on credit basis and recovered from the final payment.
- Since sugarcane cultivation gives income once a year, an allowance of Rs. 3,500 is paid monthly to farmers who applied for it.
- Irrigation methods have been successfully implemented in 400 hectares out of 2,200 hectares in highland which depend on rainwater and it is planned to implement the irrigation method in the remaining land.

- An irrigation system has been designed to supply water to sugarcane lands located beyond 3 km away from water resources.

  Welfare for farmers

- Rs. 24,000.00 is given to the children of sugarcane farmers who enter university for education and Rs. 2,250.00 is paid annually for the children who have passed the Grade Five Scholarship Exam up to Advanced Level.
- Transport facilities have been provided to the children of sugarcane farmers to go to school.
- An amount of Rs. 42,715,481.00 is in the welfare fund of the sugarcane farmers and 82 per cent out of this fund has been contributed by the institution.
- Teams of good farmers are selected and given local and foreign training, sent to workshops and visits.
- Programmes are being implemented to give adequate knowledge to farmers and employees by the officers of the Sugarcane Research Institute.

(c) Does not arise.

ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරට අදාළ සියලු විස්තර අමුණා තිබෙනවා. ඔබතුමාට දෙන්න පුළුවන්.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. සෙවනගල සීනි කර්මාන්තශාලාව කියන්නේ මේ රටේ සීනි අවශ්‍යතාවෙන් වැඩි ප්‍රතිශතයක් සපුරන්න පුළුවන් ආයතනයක්. ඒ විතරක් නොවෙයි, ඒ ප්‍රදේශය විශාල වශයෙන් උක් වගා කරන ප්‍රදේශයක්. නමුත්, ගරු ඇමතිතුමා මේකට එකඟ නොවෙන ආකාරයේ පිළිතුරක් දුන්නාට ඒ ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයකු හැටියට මම වගකීමෙන් කියනවා, මේ වන විට උක් වගා කරපු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 30කට වැඩි ප්‍රමාණයක්- මහවැලි අධිකාරිය සතු ඉඩම් සියල්ලම වාගේ,- වැලි කැණීම් කටයුතු වාගේ ව්‍යාපෘති සඳහා යොදාගෙන තිබෙන බව. විශේෂයෙන් ඌව මහ ඇමතිතුමා ඉඩම් බෙදා දීලා තිබෙනවා, හෝටල් ව්‍යාපෘති සඳහායි කියලා.

එවැනි වෙනත් විශාල ව්‍යාපෘතිවලට සහ කෙසෙල් වගාව වැනි වගාවන්ට ඉඩම් වෙන් කර දී තිබෙනවා. එදා මේ ආයතනය පෞද්ගලික ආයතනයක් වශයෙන් ලබා දීපු සීනි ප්‍රමාණයෙන් සියයට පනහකට අඩු ප්‍රමාණයක් තමයි ඔබතුමන්ලා දැන් මෙයින් ලබා ගන්නේ. ඒකට හේතුව වෙන්නේ, පසු ගිය කාල සීමාව පුරාම මේ ඉඩම් ප්‍රමාණය ක්‍රමක්‍රමයෙන් වෙනත් වගාවන්ට සහ වෙනත් ව්‍යාපෘති සඳහා ලබා දී තිබීම. මෙය ඔබතුමා දැනුවත්ව ලබා දුන් එකක්ද, එහෙම නැත්නම් වෙනත් ක්‍රමවේදයක් ඔස්සේ මේ ඉඩම් භාවිත වෙනවාද කියා දැනගන්න කැමැතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, sugarcane cultivation සඳහා හෙක්ටයාර් 4,100ක් වෙන් කර තිබෙනවා. එයින් හෙක්ටයාර් 3,354ක් sugarcane cultivate කරන්න use වෙනවා කියලා තමයි 7වැනි මාසයේ 31 වැනිදා වාර්තා කර තිබෙන්නේ. ඉතිරි ඉඩම්වල වගා කෙරෙන්නේ නැහැ කියලා තමයි මෙතැනත් සඳහන්ව තිබෙන්නේ. අප අමාත්‍යාංශය හෝ අපේ සීනි කර්මාන්ත ආයතනය වෙනත් වගාවන් කිරීමට කාටවත් ඉඩම් දීලාත් නැහැ, වෙනත් දේශපාලඥයන්ට ඉඩම් දෙන්න අපි අවසර දීලාත් නැහැ. එහෙම ඉඩම් ලබා දුන් බවට කිසියම් තොරතුරු - details - ඔබතුමා සතුව තිබෙනවා නම්, ඒවා අපට ලබා දුන්නොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පසුගිය දිනවල රටේ සීනි අවශ්‍යතාව වෙනුවෙන් සීනි ආනයනය කිරීමේදී, අපිරිසිදු සීනි යම් ප්‍රමාණයක් රට තුළට ආ බව අපි දැක්කා. ඒ වාගේම, මේ ආනයනය කිරීම තුළ ලොකු ඒකාධිකාරයක් තිබෙනවා. මා දන්නා තරමින් මෙය සීනිවලට පමණක් නොවෙයි, පරිප්පු ආදී හැම එකටම තිබෙන දෙයක්. ඒ නිසා, මේ ඒකාධිකාරය නැති කරලා තරගකාරී විධියට සීනි ආනයනය කිරීමට තවත් ව්‍යාපාරිකයින්ට දෙන ක්‍රමවේදයක් සැදීමේ වැඩ පිළිවෙළක් ඔබතුමාගේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන්න කැමැති නැද්ද කියා ඔබතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

සීනි, පරිප්පු ආනයනය කරන එකට කිසිම බලපත්‍රයක් ඕනෑ නැහැ. ඕනෑම පුද්ගලයෙකුට, ඕනෑම ආයතනයකට, ඕනෑම අංශයකට ආනයනය කරන්න පුළුවන්. දැනට සීනි, පරිප්පු ආනයනය කරන ව්‍යාපාරිකයන් 100ක විතර ප්‍රමාණයක් ඉන්නවා. ආණ්ඩුවක් හැටියට අපි ඒවා ආනයනය කරන්නේ නැහැ. අපි ඒවා කරන්න open market එකට දීලායි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. දෙවැනි වටය.

තඹුත්තේගම රෝහලේ සායන ගොඩනැඟිල්ල : විස්තර

தம்புத்தேகம வைத்தியசாலையின் சிகிச்சைக்கூடக் கட்டிடம்: விபரம்

CLINIC BUILDING OF THAMBUTTEGAMA HOSPITAL: DETAILS

112/'15

1. ගරු හේෂාන් විතානගේ මහතා (බුද්ධික පතිරණ මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) තඹුත්තේගම රෝහලේ සායන ගොඩනැඟිල්ල සාදා නිම කර රෝහලට භාර දුන් දිනය කවරේද;

(ii) එම ගොඩනැඟිල්ල සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

[ගරු හේෂාන් විතානගේ මහතා]

(අ) (i) උක්ත ගොඩනැඟිල්ල ඉදි කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) අදාළ කොන්ත්‍රාත්කරුට සම්පූර්ණ මුදල ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවූ මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්කරුගේ මුදල් රඳවා ගෙන තිබේද;

(v) එසේ නම්, රඳවාගෙන ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම ගොඩනැඟිල්ලෙහි බිත්ති පුපුරා ගොස් ඇති බවත්;

(ii) මේ නිසා රෝගීන්ගේ හා රෝහල් කාර්ය මණ්ඩලයේ ජීවිතවලට තර්ජනයක් ඇති බවත්;

(iii) මේ වනතෙක් එම ගොඩනැඟිල්ල අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ඈ) (i) මෙම ගොඩනැඟිල්ල පිළිසකර කිරීමට පියවර ගත්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පිළිසකර කිරීම් කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புத்தேகம வைத்தியசாலையின் சிகிச்சைக் கூடக் கட்டிடத்தின் நிர்மாணப் பணிகள் பூர்த்தியாக்கப்பட்டு வைத்தியசாலைக்குக் கையளிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அக்கட்டிடத்திற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி கட்டிடத்தின் நிர்மாணப் பணிகளை மேற்கொண்ட ஒப்பந்ததாரரின் பெயர் யாதென்பதையும்;

(ii) சம்பந்தப்பட்ட ஒப்பந்ததாரருக்கு மொத்தப் பணத்தொகையும் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், செலுத்தப்பட்ட பணத்தொகை யாதென்பதையும்;

(iv) மேற்படி ஒப்பந்ததாரரின் ஏதேனும் பணத் தொகை நிறுத்தி வைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், நிறுத்தி வைக்கப்பட்டுள்ள பணத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி கட்டிடத்தின் சுவர்களில் வெடிப்பு ஏற்பட்டுள்ளதென்பதையும்;

(ii) இதனால் நோயாளிகளினதும் வைத்திய சாலையின் பணியாளர்களினதும் உயிர்களுக்கு அச்சுறுத்தல் ஏற்பட்டுள்ளதென்பதையும்;

(iii) இற்றைவரை இக்கட்டிடம் திருத்தப்படவில்லை யென்பதையும்;

அவர் அறிவாரா?

(ஈ) (i) மேற்படி கட்டிடத்தைத் திருத்தியமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்தேதி யாதென்பதையும்;

(iii) மேற்படி திருத்தப்பணிகளை மேற்கொள்ளும் ஒப்பந்ததாரரின் பெயர் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he state -

(i) the date on which the clinic building of the Thambuttegama Hospital was handed over to the hospital after completing the construction work; and

(ii) the amount of money spent on the aforesaid building?

(b) Will he inform this House -

(i) the name of the contractor who built the aforesaid building;

(ii) whether the payment has been made in full to the aforementioned contractor;

(iii) if so, the amount of money that was paid;

(iv) whether money of the aforesaid contractor has been retained; and

(v) if so, the amount of money that has been retained?

(c) Is he aware that -

(i) walls of the aforementioned building have cracked;

(ii) it poses a threat to the lives of patients and hospital staff; and

(iii) the said building has not been repaired up to now?

(d) Will he also inform this House -

(i) whether steps will be taken to repair the building;

(ii) if so, the date on which it will be done; and

(iii) the name of the contractor who will carry out the said repairs?

(e) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2013.08.01

(ii) 21,397,018.18 (විසිඑක් මිලියන තුන්සිය අනූහත්දහස් දහඅටයි ශත අටක්)

(ආ) (i) එස්.ඒ.ආර්.යූ. සුභසිංහ

(ii) ඔව්.

(iii) 21,397,018.18 (විසිඑක් මිලියන තුන්සිය අනූහත්දහස් දහඅටයි ශත අටක්)

(iv) රඳවාගත් මුදල් ගෙවා ඇත. (2016.08.29)

(v) රඳවාගෙන තිබූ මුදල 1,719,383.31 (එක්මිලියන හත්සිය දහනවදහස් තුන්සිය අසූතුනයි ශත තිස් එකක්)

(ඇ) (i) බිත්ති පුපුරා ගොස් තිබිණි.

(ii) අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති බැවින් තර්ජනයක් නොමැත.

(iii) මීට වසර දෙකකට පෙර අලුත්වැඩියා කිරීම් අවසන් කර ඇත.

(ඈ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ඉ) පැන නොනඟී.

ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීම : ප්‍රසම්පාදන පටිපාටිය

இலங்கை மின்சார சபை தனியாரிடம் மின்சாரக் கொள்வனவு :பெறுகை நடைமுறை

PURCHASE OF ELECTRICITY FROM PRIVATE SECTOR BY CEYLON ELECTRICITY BOARD: PROCUREMENT PROCEDURE

931/'16

2. ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (7):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතු බව විදුලිබල පනතේ සඳහන්ව ඇති බව දන්නේද;

(ii) මේ වනතෙක් සිදු කර ඇති විදුලිය මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර අවස්ථාවලදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபை, தனியார் துறையிட மிருந்து மின்சாரத்தைக் கொள்வனவு செய்கை யில், பெறுகை நடைமுறையைப் பின்பற்ற வேண்டுமென மின்சார சட்டத்தில் குறிப்பிடப் பட்டுள்ளமை குறித்து அறிவாரா;

(ii) இதுவரையில் மேற்கொள்ளப்பட்டுள்ள மின்சாரக் கொள்வனவுகளின்போது கேள்விப் பத்திர நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், அச்சந்தர்ப்பங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that the Ceylon Electricity Board should follow the procurement procedure according to the Electricity Act when purchasing electricity from the private sector;

(ii) whether the procurement procedure has been followed for the purchase of electricity to date; and

(iii) if so, the occasions?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. පුද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේදී ටෙන්ඩර් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු බව විදුලිබල පනතේ සඳහන්ව ඇත. විදුලිබල පනතේ 2013 අංක 13 දරන සංශෝධිත පනතේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් අනුමත කර ඇති මෙගාවොට 10ට වඩා අඩු පුනර්ජනනීය බලශක්ති සම්මත මිල ගණන් යටතේ හෝ ටෙන්ඩර් කාර්යය පටිපාටිය යටතේ මිලදී ගත හැකිය.

(ii) ඇතැම් අවස්ථාවලදී පමණි. විස්තරය ඇමුණුම** හි දක්වා ඇත.

(iii) විදුලිබල පනතේ 2013 අංක 13 දරන සංශෝධිත පනතේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් අනුමත කර ඇති මෙගාවොට 10ට වඩා අඩු පුනර්ජනනීය බලශක්ති සම්මත මිල ගණන් යටතේ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම් කරනු ලැබේ.

පනත යටතේ එසේ මිලදී ගැනීමේ හැකියාව පැවතුණත් විනිවිදභාවය, තරගකාරිත්වය හා ආර්ථික කාර්යක්ෂමතාව සලකා දැනට සූර්ය සහ සුළං විදුලි බලාගාර මඟින් නිපදවන විදුලිය ටෙන්ඩර් ක්‍රමය මඟින් මිලදී ගනු ලබයි.

එසේම, සූර්යබල සංග්‍රාමය වැඩ සටහන යටතේ ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) සහ නෙට් ප්ලස් (Net Plus) ක්‍රමවේද යටතේ සූර්ය විදුලි ජනනය සිදු කරනු ලබන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පාරිභෝගිකයින්ගේ විදුලි මිලදී ගැනීම ද සිදු කරනුයේ කරගකාරී මිල ගණන් කැඳවා නොවන අතර, මේ අවස්ථා දෙකේදීම අමාත්‍ය මණ්ඩල අනුමත සම්මත මිලදී ගැනීම් ගාස්තු යටතේ විදුලිය මිලදී ගනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 1117/'16 - (3), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුත්තලම දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම : වෙන් කළ මුදල

புத்தளம் மாவட்ட மின் விநியோகம்: ஒதுக்கிய பணத்தொகை

SUPPLY OF ELECTRICITY IN PUTTALAM DISTRICT: MONEY ALLOCATED

1191/'16

5. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේ යුද්ධය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் புத்தளம் மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென் பதையும்;

(iii) 1984 முதல் 2009ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;

(iv) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள காலகட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) the number of houses in the Puttalam District that have been provided with electricity by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity by now;

(iii) the amounts allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) the number of houses that have been provided with electricity up to year 2015 after the end of the war situation in year 2009, on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1983 වර්ෂය වන විට වයඹ පළාතට අයත් බෙදාහැරීම් පද්ධතියේ වැඩි ප්‍රමාණයක් අදාළ පළාත් පාලන ආයතන මඟින් පාලනය කරන ලැබූ බැවින් පුත්තලම දිස්ත්‍රික්කයට අදාළ නිවැරදි දත්ත ලංකා විදුලිබල මණ්ඩලය සතුව නොමැත.

(ii) මේ වන විට පුත්තලම් දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති මුළු නිවාස ප්‍රමාණය 253,825කි.

2015 වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරුන් මඟින් සිදුකරන ලද සංගණනය අනුව පුත්තලම දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබාගෙන නොමැති නිවාස ඒකක ගණන 17,049ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට අවශ්‍ය මූලික පියවර දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි - ජාතික විදුලි සක්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට රුපියල් 45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන 2016 වසර අවසානය දක්වා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ අතර එම වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී නිවාස ඒකක 13,475ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

2017 වර්ෂය අවසන් වන විට පුත්තලම දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 9,563ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

(iii) 1984 සිට 2009 දක්වා පුත්තලම දිස්ත්‍රික්කය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් නිවැරදිව වෙන් වෙන් වශයෙන් සොයා ගැනීමට නොහැක.

(iv) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පුත්තලම දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	අදාළ වර්ෂය තුළ දී ලබා දුන් නව සබඳතා සංඛ්‍යාව	වර්ෂය අවසාන වන විට විදුලිය පරිභෝජනය කරනු ලබන සම්පූර්ණ නිවාස සංඛ්‍යාව
2009.01.01-2009.12.31	10,837	143,383
2010.01.01-2010.12.31	11,592	154,975
2011.01.01-2011.12.31	11,910	166,885
2012.01.01-2012.12.31	12,342	179,227
2013.01.01-2013.12.31	11,856	191,083
2014.01.01-2014.12.31	11,047	202,130
2015.01.01-2015.12.31	13,635	215,765

(v) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පුත්තලම දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රුපියල් මිලියන)
2009.01.01-2009.12.31	124
2010.01.01-2010.12.31	91
2011.01.01-2011.12.31	68
2012.01.01-2012.12.31	40
2013.01.01-2013.12.31	217
2014.01.01-2014.12.31	256
2015.01.01-2015.12.31	298

(ආ) අදාළ නොවේ.

අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය : මූල්‍ය පාලනය විධිමත් කිරීම

கூட்டுறவு சிக்கன மற்றும் கடன் வழங்கும் சங்கம்: நிதி நிருவாகத்தை ஒழுங்குமுறைப்படுத்தல்

EDUCATION EMPLOYEES' CO-OPERATIVE CREDIT AND THRIFT SOCIETY: REGULATION OF FINANCIAL MANAGEMENT

1278/'16

6. ගරු හේෂාන් විතානගේ මහතා(ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. Nalin Bandara Jayamaha)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (6):

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථීර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතු ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

[ගරු හේෂාන් විතානගේ මහතා]

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.10.01ஆம் திகதியாகின்றபோது கல்விச் சேவை ஊழியர்களின் கூட்டுறவு சிக்கன மற்றும் கடன் வழங்கும் சங்கத்திற்குச் சொந்தமாக விருந்த மொத்தப் பணத்தொகை எவ்வளவென் பதையும்;

(ii) 2016.06.11ஆம் திகதியாகின்றபோது மேற்படி சங்கத்திற்குச் சொந்தமாகவிருந்த நிலையான வைப்புக்களின் அளவு எவ்வளவென்பதையும்;

(iii) தற்போது மேற்படி சங்கத்திலிருந்து கடன் பெறுவதற்காக விண்ணப்பித்துள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி கடன் விண்ணப்பதாரிகளில், கடன் அங்கீகரிக்கப்பட்டிருந்தும் இற்றைவரை கடன் தொகை விடுவிக்கப்படாதுள்ள விண்ணப்பதாரி களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) மேற்படி கடன் விண்ணப்பதாரிகளுக்குச் செலுத்த வேண்டியுள்ள மொத்தக் கடன் தொகை எவ்வளவென்பதையும்;

(vi) மேற்படி கடன் விண்ணப்பதாரிகளுக்கு கடன் விடுவிக்கப்படத் தாமதம் ஏற்பட்டுள்ளமைக்கான காரணம் யாதென்பதையும்;

(vii) மேற்படி சங்கம் தனது அங்கத்தவர்களுக்கு உரியவாறு கடன் தொகையை விடுவிக்க இயலாத நிலைக்குத் தள்ளப்பட்டுள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(viii) ஆமெனில், மேற்படி சங்கத்தின் நிதி நிருவாகத்தை ஒழுங்குமுறைப்படுத்துவதற்கு எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House -

(i) the total amount of money held by the Education Employees' Co-operative Credit and Thrift Society as at 01.10.2015;

(ii) the amount in fixed deposits with that Society by 11.06.2016;

(iii) the number of persons who have applied for loans from the said Society by now;

(iv) the number of members out of those loan applicants for whom loans have been approved, but money has not been released up to now;

(v) the total amount of loans to be paid to those loan applicants;

(vi) the reason for the delay in releasing money to those loan applicants;

(vii) whether he is aware of the fact that the said Society has been rendered to a state of not being able to release loans to its members properly; and

(viii) if so, the measures that will be taken in due course to regulate the financial management of that Society?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සම්පූර්ණ මුදල් ප්‍රමාණය - රුපියල් 1,569,068,600.24 (රුපියල් මිලියන එක්දහස් පන්සිය හැට නවයයි, හැට දහස් හයසියයයි, ශත විසි හතරයි)

(ii) 2016.06.11 දින වන විට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පත් ප්‍රමාණය - රුපියල් 1,565,905,989.04කි. (රුපියල් මිලියන එක්දහස් පන්සිය හැටපහයි, නව ලක්ෂ පන්දහස් නවසිය අසූ නවයයි, ශත හතරයි.)

(iii) සාමාජිකයන් 67,916කි.

(iv) සාමාජිකයන් 21,454කි.

(v) රුපියල් මිලියන 18,162කි.

(vi) * සමිතියේ පොලී අනුපාතය පහත දමා කෙටි කාලයක් තුළදී වෙළෙඳ පොළ පොලී අනුපාතය ශීඝ්‍රයෙන් ඉහළ යෑම නිසා මෙම අධික ණය ඉල්ලුම හට ගැනීම.

* සමිතියට ලැබෙන ආදායම මෙම අධික ණය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවීම.

* සමිතියේ ණය නිකුත් කිරීමේ හැකියාව රුපියල් මිලියන 900 පමණ වුවත් මාසික ණය ඉල්ලුම රුපියල් මිලියන 2,000 ඉක්මවීම.

(vii) ඇපකර ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් පමණක් ප්‍රමාදයකින් තොරව ණය නිකුත් කිරීමට හැකියාවක් නොමැත.

(viii) * සාමාජිකත්වය ලබා ඇති කාලය අනුව ලබාගත හැකි ණය මුදල හා වාරික ගණන සීමා කිරීම.

* පොරොත්තු ලේඛනය සකස් කර විධිමත් ලෙස මාසිකව ණය මුදාහැරීම වෙගවත් කිරීම.

* බාහිර මූල්‍ය ආයතනවලින් ණය ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

* සාමාජික තැන්පතු ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 1466/'16 - (3), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

යෝජිත පළාත් පාලන ආයතන : පුත්තලම දිස්ත්‍රික්කය
உத்தேசிக்கப்பட்ட உள்ளூராட்சி நிறுவனங்கள்: புத்தளம் மாவட்டம்
PROPOSED LOCAL GOVERNMENT INSTITUTIONS: PUTTALAM DISTRICT

1595/'17

11.ගරු හේෂාන් විතානගේ මහතා(ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. Ashoka Priyantha)
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනය මඟින් සේවා සපයනු ලබන ජන සංඛ්‍යාව, භූමි ප්‍රමාණය සහ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනතාවට වැඩි පහසුකම් සපයා දීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තුළ අලුතින් ස්ථාපිත කිරීමට යෝජිත පළාත් පාලන ආයතන කවරේද;

(v) එසේ යෝජනා වී ඇති පළාත් පාලන ආයතන කඩිනමින් පිහිටුවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் தற்சமயம் இயங்கிவரும் உள்ளூராட்சி நிறுவனங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வோர்உள்ளூராட்சி நிறுவனத்தின் ஊடாகச் சேவை வழங்கப்படும் மக்களின் எண்ணிக்கை, காணிப் பரப்பளவு மற்றும் கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை தனித் தனியே யாதென்பதையும்;

(iv) மக்களுக்கு கூடுதலான வசதிகளைப் பெற்றுக் கொடுப்பதற்காக புத்தளம் மாவட்டத்தில் புதிதாக நிறுவுவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள உள்ளூ ராட்சி நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) இவ்வாறு முன்மொழியப்பட்டுள்ள உள்ளூராட்சி நிறுவனங்களை விரைவாக நிறுவுவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of local government institutions functioning in the Puttalam District at present;

(ii) their names;

(iii) the number of people being served by each of those local government institutions along with the population, the extent of lands and the number of Grama Niladhari Divisions, separately;

(iv) the number of new local government institutions which are proposed to be set up anew in order to provide more facilities to the people in the Puttalam District; and

(v) the steps to be taken by the Ministry to expedite the setting up of the proposed local government institutions?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 12

(ii) 1. හලාවත නගර සභාව

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

2. හලාවත ප්‍රාදේශීය සභාව
3. පුත්තලම නගර සභාව
4. පුත්තලම ප්‍රාදේශීය සභාව
5. ආණමඩුව ප්‍රාදේශීය සභාව
6. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
7. කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව
8. නවගත්තේගම ප්‍රාදේශීය සභාව
9. නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව
10. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව
11. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව
12. කල්පිටිය ප්‍රාදේශීය සභාව

(iii)

අනු අංකය	පළාත් පාලන ආයතනය	ඇස්තමේන්තු ජන සංඛ්‍යාව (2016.12.31)	භූමි ප්‍රමාණය (ව.කි.මී)	ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව
01.	හලාවත නගර සභාව	51,750	6.4	13
02.	හලාවත ප්‍රාදේශීය සභාව	141,322	69.53	85
03.	පුත්තලම නගර සභාව	48,452	25.24	09
04.	පුත්තලම ප්‍රාදේශීය සභාව	52,465	240	22
05.	ආණමඩුව ප්‍රාදේශීය සභාව	88,332	479.7	74
06.	වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව	21,432	710.4	17
07.	කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව	28,547	490.4	26
08.	නවගත්තේගම ප්‍රාදේශීය සභාව	18,502	167	19
09.	නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව	128,386	168.28	94
10.	ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව	84,103	104	43
11.	වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව	146,181	212.73	99
12.	කල්පිටිය ප්‍රාදේශීය සභාව	98,126	223	45
එකතුව		907,598	2,896.68	546

(iv) මහවැව, ආඬිගම, දංකොටුව යනුවෙන් නව ප්‍රාදේශීය සභා තුනක් සංස්ථාපනය කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇත.

(v) සංස්ථාපනය/උත්ශ්‍රේණිගත කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. එමඟින් හඳුන්වා දී ඇති නිර්ණායක මත ඇගයීමට ලක් කර මා වෙත නිර්දේශ ලබා දීමට අදාළ පළාත් ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇති අතර, මෙතෙක් පළාත් කමිටු නිර්දේශ ලබා දී නැත. නිර්දේශ ලබා දුන් වහාම ඉදිරි කටයුතු සිදු කළ හැක.

(ආ) අදාළ නොවේ.

නව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය : විස්තර
புதிய தேசிய வலுசக்தி கொள்கை: விபரம்
NEW NATIONAL ENERGY POLICY: DETAILS

1601/'17

12. ගරු හේෂාන් විතානගේ මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. Thushara Indunil Amarasena)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යල් පැන ගොස් ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ කාලීන සහ අනාගත අපේක්ෂාවන් සඳහා ගැළපෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் தேசிய வலுசக்திக் கொள்கை காலங்கடந்துவிட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) இலங்கையின் சமகால மற்றும் எதிர்கால எதிர்பார்ப்புகளுக்கு பொருத்தமான தேசிய வலுசக்தி கொள்கையொன்று தேவை என்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி புதிய தேசிய வலுசக்தி கொள்கை பாராளுமன்றத்துக்கு சமர்ப்பிக்கப் படும் திகதி யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that the National Energy Policy of Sri Lanka is outdated;

(ii) whether he admits that a National Energy Policy which caters to Sri Lanka's current and future expectations is needed; and

(iii) if so, the date on which the new National Energy Policy will be presented to the Parliament?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ 2008 වර්ෂයේදී ය. කෙසේ නමුත් වර්තමාන බලශක්ති ක්ෂේත්‍රයේ නැමියාවන් සැලකිල්ලට ගෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. බලශක්ති ක්ෂේත්‍රයෙහි සියලු අංශ නියෝජනය කරන විශේෂඥයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් සලකා බැලීමෙන් පසු අලුතින් සකස් කරන ලද ජාතික බලශක්ති ප්‍රතිපත්තිය කෙටුම්පත මහජන අදහස් විමසීමට යොමු කළ අතර, ඒ අනුව මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති අදහස් හා යෝජනා මේ වන විට සලකා බලා ඇත. ඉන් පසුව අවසන් කෙටුම්පත සකස් කර ඇති අතර එය ත්‍රෛභාෂාවලට පරිවර්තනය කිරීමේ කටයුතුවල අවසන් අදියර මේ වන විට සිදු වේ.

(ii) ඔව්.

(iii) මේ වන විට ලැබී ඇති දහස් හා යෝජනා ජාතික බලශක්ති ප්‍රතිපත්තියට ඇතුළත් කිරීමට සලකා බැලීමෙන් අනතුරුව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, ඉන් අනතුරුව රජයේ ගැසට් පත්‍රයේ පළ කර 2018.03.31 දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අප නියෝජනය කරන පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී කණ්ඩායමෙන් බාහිර පක්ෂ ගණනාවක එකමුතුවක් බව ඔබතුමාට දැනුම් දී තිබෙනවා. ඔබතුමා විසින් එය පාර්ලිමේන්තුවට ප්‍රකාශ කර තිබෙනවා. එම කණ්ඩායමේ එක් පක්ෂයක් සමඟ -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ- ගිවිසුමක් අත්සන් කර තිබෙන බවටත්, එම ගිවිසුම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(5) ව්‍යවස්ථාව අනුව ජාතික ආණ්ඩුවක් හැදීමට පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළා. අනුර දිසානායක මන්ත්‍රීතුමා ඊයේත් මේ තර්කය නැඟුවා. නමුත් මේ කාරණයේ තවත් පැහැදිලි පියවරක් තිබෙන නිසායි මම නැවත ඔබතුමාගේ අවධානයට ගෙනෙන්නේ. ජාතික ආණ්ඩුවක් පිහිටුවීමට යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව පිළිබඳව පැහැදිලි කරමින් අගමැතිතුමාත්, ආණ්ඩුවත් කිව්වා, "අපි ගිවිසුමකට එළඹ තිබෙනවා" කියලා. එම ගිවිසුම පිළිබඳව තමයි ඉහත කී ව්‍යවස්ථාවෙන් කියන්නේ. ප්‍රධානත්වය ගන්නා පක්ෂය, අනෙකුත් අතිරේක පක්ෂ සමඟ එකඟතාවකට එනවා නම්, පාර්ලිමේන්තුවට පැමිණ දැනුම් දිය යුතුය හා අනුමැතියක් ගත යුතුය කියා එහි තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි අහන්නේ මෙයයි. මෙවැනි ලියවිල්ලක් තවම ඉදිරිපත් කරලා නැහැ. එවැනි ලියවිල්ලක් තිබෙනවා නම් තමයි මෙවැනි ආණ්ඩුවක් වලංගු වන්නේ. එවැනි ලියවිල්ලක් තිබෙනවා නම්, අදාළ ලේකම්වරයා හෝ ලේකම්වරු විසින් එම ලියවිල්ල ඔබතුමා හමුවට ඉදිරිපත් කළ යුතුයි. එහෙම නැතුව පාර්ලිමේන්තුව හමුවේ මන්ත්‍රීවරු 50කට කැබිනට් අමාත්‍යධුර සහ මන්ත්‍රීවරු 55කට නියෝජ්‍ය අමාත්‍යධුර දෙමින්, අනෙක් මන්ත්‍රීවරුන්ගේ අයිතියද අහෝසි කරමින් කටයුතු කිරීම ව්‍යවස්ථා විරෝධියි.

අපේ කණ්ඩායම 55ක මන්ත්‍රී කණ්ඩායමක්. මේ මන්ත්‍රී කණ්ඩායම නියෝජනය කරන, ඔබතුමා විසින් පිළිගෙන ඇති, එක්සත් ජනතා නිදහස් සන්ධානය නැමැති, මැතිවරණ ප්‍රකාශනයේ තිබෙන එකම පක්ෂය මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ අර පක්ෂ සියල්ලගෙන්ම සමන්විතවයි. මේ වාගේ තීරණයක් ගෙන තිබෙනවා නම්, එය සභාව හමුවට ගෙන ඒම හෝ එහි ඉතා රහස්‍යභාවයක් තිබෙනවා නම් ගරු කථානායකතුමා හමුවට ගෙනැවිත් එය දකින්න ඉල්ලා සිටින මන්ත්‍රීවරුනට පෙන්වාදීම පාර්ලිමේන්තුවේ උත්තරීතර බව ආරක්ෂා කිරීමක් වාගේම එය ගරු කථානායකතුමාගේ වගකීමක්. එහෙම නැත්නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් මේ ආණ්ඩුව ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, උප ඇමතිවරු පත් කරගෙන දිගටම ගමන් කරන ක්‍රමය පාර්ලිමේන්තුව හමුවේ තිබෙන බරපතළ ප්‍රශ්නයයි. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා වෙනත් දවසක මෙකට තීරණයක් දුන්නත් මට කමක් නැහැ. නමුත්, මේකට ඉතා පැහැදිලි තීරණයක් දෙන්න ඕනෑ, මේ දේශපාලනඥයන්ගේ තීරණය නොවෙයි. ඔබතුමා ගරු කථානායකතුමා හැටියට තීරණයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා ජාතික ආණ්ඩුව පිළිබඳව ඊයේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමාත් මේ ජාතික ආණ්ඩුව ගැන ප්‍රකාශයක් කළා. එම නිසා මේ ජාතික ආණ්ඩුව තිබෙනවා. මේක පාර්ලිමේන්තුව. අගමැතිතුමායි, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමායි කිව්වාම ඒක පිළිගන්න ඕනෑ. පුන පුනා, පුන පුනා මේ ප්‍රශ්නය මතු කිරීම අසාධාරණයි. ජාතික ආණ්ඩුවක් දැන් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඊයේ දවස පුරාම අපි හුහාක් වාද විවාද කළා.

ඒ ගැන කරුණු ඉදිරිපත් කළා. ඒ නිසා මම මේ ගැන නීති උපදෙස් ලැබුවා. ඊයේ මේක කසාදයකට සම කළා. නමුත් අදාළ පාර්ශ්ව දෙකම මේ ගරු සභාවේ කරුණු ඉදිරිපත් කළාට පසු, නැවත ඒ ගැන කරුණු ඉදිරිපත් කිරීම අනවශ්‍ය බව තමයි මට ලැබුණු උපදේශය. කථානායකවරයා වශයෙන් මට එය පිළිගැනීමට සිද්ධ වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, දිගින් දිගටම මතුවන මේ ප්‍රශ්නයේ මුහුණුවර කීපයක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. මේ ප්‍රශ්නයේ දේශපාලන මුහුණුවරක් තිබෙනවා; ව්‍යවස්ථාමය මුහුණුවරක් තිබෙනවා; සමාජමය මුහුණුවරක් තිබෙනවා. මේ දේශපාලන මුහුණුවර පිළිබඳව මෙතුමන්ලා දිගින් දිගටම උත්තර දෙනවා. ගරු කථානායකතුමනි, අපි මතු කරන්නේ ජාතික ආණ්ඩුව මෙතැනින් ඈවර කරන්න කියන කාරණය නොවෙයි. මෙතැන ව්‍යවස්ථාමය මුහුණුවර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නේ. මේ ව්‍යවස්ථාමය කාරණාව පදනම් වෙලා තිබෙන්නේ මේ තිබෙන ගිවිසුමට; පාර්ශ්වකරුවන්ට. අපේ ගරු මහින්ද අමරවීර මහ ලේකම්තුමා උත්තරයක් දුන්න එක ඇත්ත. හැබැයි ගරු කථානායකතුමනි, මහජන එක්සත් පෙරමුණේ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කියන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ උප සභාපතිවරයෙක්. එතුමාත් සන්ධානයේ පාර්ශ්වකරුවෙක්. එම නිසා මෙතැනදී මේ ව්‍යවස්ථාව අර්බුදයට ලක් වෙලා තිබෙනවා. දැන් ඇමතිවරු 20කට වැඩි සංඛ්‍යාවකගේ කල් ඉකුත් වෙලා තිබෙනවා. ඒකයි අපි කියන්නේ. ජාතික ආණ්ඩුව පිහිටුවන්න ඕනෑ නම් ඔබතුමන්ලා එය පිහිටුවාගන්න. හැබැයි ඔබතුමාගේ පැත්තෙන් අපි ඉල්ලන්නේ, එහෙම ලියවිල්ලක් තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න කියායි.

ගරු කථානායකතුමනි, ඔබතුමා Right to Information Act එක ගෙනෙන්න මේ ගරු සභාවේ වැඩියෙන්ම ක්‍රියා කළ නායකයායි. ඔබතුමාට ඒ ලියවිල්ල දෙන්න බැහැ කියනවා නම්, ඒ පිළිබඳව විශාල ගැටලුවක්, කුකුසක් මතු වෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කියන්නේ, ඒ ගිවිසුම් ලියවිල්ල කරුණාකර සභාගත කරන්න කියායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම අදාළ පාර්ශ්ව දැනුවත් කළා. නමුත් එය නීත්‍යානුකූලව පිළිගැනීමට ලෙස මට උපදෙස් ලැබී තිබෙනවා. අවශ්‍ය දේශපාලන නායකත්වයට මේ කරුණු කියලා, යම් පියවරක් ගන්න පුළුවන්ද බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, අද සමහර සාමාජ ජාල වෙබ් අඩවිවල සමහර ඇමතිවරුන්ගේ පිටෙ, "කල් ඉකුත් වූ" - expired- කියලා බෝඩ් එකක් එල්ලලා. මේක එහෙම සමච්චලයකට, විගඩමකට භාජන විය යුතු කාරණාවක් නොවෙයි. එම නිසා මේ ප්‍රශ්නය මෙතැනින් ඉවර කරන්න. ඔබතුමන්ලා ආණ්ඩුව ගෙන යන්න. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ ප්‍රශ්නයට උත්තරයක් ලෙස ආවේ, පාර්ලිමේන්තුවේ ප්‍රධාන පක්ෂ දෙකේ ප්‍රකාශ මේ සභාවට ඉදිරිපත් කළාය කියන එකයි.

මමත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරන, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ශ්වකරුවෙක්. මෙතැන අද කරන ප්‍රකාශ හෙට වෙනස් වෙනවා. ඒක අපි දන්නවා නේ. පසු ගිය යුගය ගැන අපි දන්නවා නේ. ඒ නිසා මේ පිළිබඳ පැහැදිලි ලිඛිත එකඟතාවක් තිබෙනවා නම් අපේ දැන ගැනීම සඳහා ඒක සභාගත වන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ඉල්ලීම ඉදිරිපත් කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එහෙම නොවුණොත් ඔබතුමාගේ කථානායක ධුරයත් වලංගු වන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට කමක් නැහැ. මම නීත්‍යානුකූලව සොයා බලන්නම්.

ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි ඔබතුමාට.

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන දේශපාලන කාරණය මෙකයි. මෙතුමන්ලා මීට සතියකට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක ආණ්ඩුවක් හදන්න උත්සාහ කළා. මේ ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම කිව්වා, අපි ඇමතිකම් ගන්නේ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අගමැති කරන්න උදව් කරනවා කියලා. ඒ දේශපාලන උප්පරවැට්ටිය පරාජය කළ නිසා තමයි අද එතුමන්ලා මේ කිඹුල් කඳුළු හළන්නේ. එදා එතුමන්ලා ජාතික ආණ්ඩුවට විරුද්ධව කළ කුමන්ත්‍රණය පරාජය වුණ නිසා, ඒක සාධාරණීකරණය කරන්න දවස ගානේ මේ පාර්ලිමේන්තුවේදී "ඇමති ධුර 93ක් ගත්තේ කොහොමද, ඒ සම්බන්ධයෙන් ගිවිසුමක් නැහැ"යි කියලා කියනවා. පැහැදිලිවම මේක එතුමන්ලාගේ දේශපාලන බංකොලොත්භාවය ප්‍රදර්ශනය කිරීමක්. ඒ නිසා ඔබතුමන්ලා කිඹුල් කඳුළු හළන්න එපා. මේ ජාතික ආණ්ඩුව තව අවුරුදු දෙකක් යනවා. ඕනෑ නම් ඔබතුමන්ලාටත් ඒකට එකතු වෙන්න පුළුවන්. මොකද, ඔබතුමන්ලා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සාමාජිකයන් නිසා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා. ඊට පස්සේ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, දැන් අපේ මත දැක්වීම වන්නේ 2015 සැප්තැම්බර් 03වැනි දා අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඇමතිවරු සංඛ්‍යාව වැඩි කර ගැනීම පිළිබඳ යෝජනාවට නොවෙයි. ඒ යෝජනාවට පදනම් වුණේ මේකයි. එදා ඔබතුමා පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා, ජාතික ආණ්ඩුවක් පිළිබඳව මේ පක්ෂ දෙක දැනුම් දුන්නා කියලා. ඒ දින වකවානු සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, ඔබතුමාට දැනුම් දෙන ලද ඒ ලියවිල්ල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙසයි. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා නම් අපට මේ ගැටලුව විසඳා ගන්න පුළුවන්. ඒ නිසා ඒ ලියැවිල්ල සභාගත කරන්න කියලායි අපි ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම කථා කරන්නේ මේ ප්‍රශ්නයට අදාළව නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ප්‍රශ්නයට තීරණයක් දීලා ඉන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය නොවෙයිද? එහෙම නම් අපි මේක ඉවර කරලා ඉදිමු.

ගරු කරුණාරත්න පරණවිතාන මැතිතුමා.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
The Hon. Karunarathna Paranawithana)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව හැටියට අපි මේ කරුණ හෝද හෝද මඩේ දමන්න අවශ්‍ය නැහැ. මේ වෙලාවේ ඔබතුමා බලන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දිහායි. මේ කටයුත්තේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිම ව්‍යවස්ථාවක් උල්ලංඝනය වෙලා නැහැ. ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුවයි වැඩ කරන්නේ. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයක් සහ දේශපාලන අර්බුදයක් ගැන. ඇත්තෙන්ම මෙතැන තිබෙන්නේ දේශපාලන ප්‍රශ්නයක්. ඒ දේශපාලන ප්‍රශ්නය ටිකක් හොඳට විසඳා ගත්තොත් හොඳයි. නමුත් ගරු කථානායකතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වැඩ කරන බවයි අපට පෙනෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මේ ජාතික ආණ්ඩුව තුළ ඔබතුමාගේ කථානායක ධුරයේත් වලංගුභාවයක් තිබෙනවා. නමුත් මන්ත්‍රීවරු ඉන්නේ මොන පැත්තේද, ආණ්ඩුව පැත්තේ ඉන්නවාද, විපක්ෂයේ ඉන්නවාද කියන එක දේශපාලනිකව බෙරා ගන්න ඕනෑ. ඒ නිසා අපි මේ කාරණය දිගට ඇද ගෙන යන එකේ තේරුමක් නැහැයි කියන එකයි අපේ අදහස.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම නීති උපදෙස් ලබා ගෙන තමයි එම තීරණය ලබා දුන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා කථා කරන්නේ වෙනත් කාරණයක් ගැනද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා කථා කරන්නේ වෙනත් ප්‍රශ්නයක් ගැන. ඒකට අවස්ථාව දෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සතිය තුළ මෙම ගරු සභාවට කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. මේ වන විට පාර්ලිමේන්තුව දැන ගත යුතු බරපතළ ප්‍රශ්නයක් එහි මතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව තමයි කොටස් වෙළඳ පොළ කටයුතු නියාමනය කරන්නේ. කොටස් වෙළඳ පොළේ ආයෝජනය කර තිබෙන ආයෝජකයන්ගේ ආරක්ෂාව සැලසීම පිළිබඳ වගකීම තිබෙන්නේ සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට. ඒ කොමිෂන් සභාව සාමාජිකයන් දසදෙනෙකුගෙන් යුතුව අවුරුදු තුනක කාලයකට තමයි පත් වෙන්නේ. 2015 වර්ෂයේ ජනවාරි මස 25වැනි දින පත් වූ එම කොමිසමේ කාලය 2018 ජනවාරි 26වැනි දිනෙන් අවසන් වුණා. ඒ නිසා දැන් සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවක් නැතිව තමයි මේ රටේ කොටස් වෙළඳ පොළ ක්‍රියාත්මක වෙන්නේ. කොටස් වෙළඳ පොළ කඩා වැටෙමින් තිබෙන තත්ත්වයක් තුළ, යුරෝපා ආර්ථික ප්‍රජාවේ පාර්ලිමේන්තුව විසින් ඡන්ද 357ක් දීලා ලංකාව අවදානම් සහිත රටක් ලෙස blacklist කර තිබෙන වේලාවක, සුරුකුම්පත් හා විනිමය කොමිසමේ සාමාජිකයන් ටික පත් කර ගන්න බැරි ආණ්ඩුවක් තිබෙනවාය කියන්නේ රට අරාජිකයි කියන එක නේ. ඒ කොමිසමේ වලංගු කාලය ඉවරයි. දැන් අලුතින් පත් කරන්න ඕනෑ. වෙන කාටවත් ඒ කටයුතු බලාගන්න බැහැ. ලංකාවේ අද තිබෙන කොටස් වෙළඳ පොළ නියාමනයෙන් තොර වුණාම ලක්ෂ සංඛ්‍යාත ආයෝජකයන්ට ආරක්ෂාවක් සැලසෙන්නේ නැහැ. ඒ නිසායි මම මේ කරුණ සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරවන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා වහාම මැදිහත් වෙලා මේ කටයුතු නීත්‍යානුකූල තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන්න කියලායි මම ඉල්ලා සිටින්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කර එය නිවැරදි තත්ත්වයට පත් කරන්න. මමත් ඒ කරුණ ඉදිරිපත් කරන්නම්.

අද ප්‍රධාන කාර්ය වශයෙන් තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා. පළමුවෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

ශෝක ප්‍රකාශය: ගරු (මහාචාර්ය) විශ්වා වර්ණපාල මහතා

அனுதாபத் தீர்மானம் : மாண்புமிகு (பேராசிரியர்) டபிள்யு.ஏ. விஸ்வா வர்ணபால

VOTE OF CONDOLENCE: HON. (PROF.) W.A. WISWA WARNAPALA

[පූ.භා. 11.15]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් වී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හා අමාත්‍යවරයෙකු වශයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ මහාචාර්ය විශ්වා වර්ණපාල මහතාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී මෙම ගරු සභාවට මම ඉදිරිපත් කරමි.

වටරැක ආරච්චිලාගේ එඩ්වින් වටරැක මහතාට සහ දයාවර්ධන මංචනායක ආරච්චිලාගේ පොඩි හාමිනේ මහත්මියට දාව 1936 වර්ෂයේ දෙසැම්බර් මස 26වැනි දින පිටිහුම, කෑගල්ලහිදී විශ්වා වර්ණපාල මැතිතුමා ජන්ම ලාභය ලැබුවේය.

කෑගල්ල බෞද්ධ, මිශ්‍ර විදුහලෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ වර්ණපාල මැතිතුමා වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා කෑගලු විද්‍යාලයට ඇතුළු විය.

එහිදී සාර්ථකව අධ්‍යාපන කටයුතු නිම කළ මෙතුමා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත්ව 1964 වසරේ දී ආර්ථික විද්‍යා (විශේෂ) උපාධිය දෙවෙනි පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව සමත් වී ඉන් අනතුරුව 1967 වර්ෂයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියාවේ පීටර්ස් බර්ග් විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඉන් පසුව එතුමා එක්සත් රාජධානියේ ලීඩ්ස් විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය නිමිකර ගැනීමට සමත් විය.

පසු කලෙක රානි වර්ණපාල මෙනෙවිය සමඟ යුග දිවි ගමන ඇරඹූ එතුමා, එම විවාහය තුළින් යජ්නි වර්ණපාල සහ කාංචනක්සි වර්ණපාල යන දියණියන් දෙදෙනා මෙළොවට දායාද කළේය. යජ්නි වර්ණපාල දියණිය ඇමෙරිකාවේ රොජර් විලියම්ස් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරියක වශයෙන් ද, කාංචනක්සි වර්ණපාල දියණිය විවෘත විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක ලෙසද සේවය කරමින් සිටිති.

එතුමා 1964 වර්ෂයේ සිට 1994 වසර තෙක් පුරා අවුරුදු තිහක් මුළුල්ලේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සරසවි සිසු සිසුවියන් හට තම දැනුම ලබා දී රටට වැඩදායක පිරිසක් බවට පත් කිරීමට කරන ලද සේවය අප මෙහිදී කෘතවේදීව සිහිපත් කළ යුතුය.

මෙතුමා 1994 වසරේ දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් වී අධ්‍යාපන හා උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේය. 1994 වසරේ සිට 2000 වසර දක්වා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ තේරීම් කාරක සභාවේ සභාපති, කාර්මික අධ්‍යාපන කාරක සභාවට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතන ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කොට වාර්තා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කාරක සභාවේ සභාපති, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ බලකායේ උප සභාපති ආදී වශයෙන් විවිධ වූ නිලතල දරමින් ඉතා නිහතමානී සේවාවක් රටට ලබාදුන් අයෙකු ලෙස මෙතුමා හැඳින්විය හැකිය.

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]

[At this stage, His Excellency President Maithripala Sirisena *entered the Chamber.]*

2001 වසරේ සිට 2002 වසර දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපති ලෙස කටයුතු කළ මෙතුමා නැවත 2004 වසරේ දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වී විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කළේය. මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන්ද කටයුතු කර ඇත. 2005 වසරේ දී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරයට මෙතුමා පත් විය. ඉන් පසුව 2007 වසරේ සිට 2010 වසර තෙක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලෙසද පත් වී සුවශේෂී මෙහෙවරක් මෙරට විශ්ව විද්‍යාලවල දියුණුව උදෙසා ඉටු කළේය.

දැරණියගල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු වශයෙන් එම ප්‍රදේශයේ මහමාර්ග, පාසල්, පන්සල් ආදිය ගොඩනැඟීමට, නවීකරණයට හා වැඩිදියුණු කිරීමට බොහෝ සෙයින් දායක වී ඇති මෙතුමා ඉංග්‍රීසි හා සිංහල භාෂාවන්ගෙන් කෘතීන් 25කට වැඩි සංඛ්‍යාවක් පළ කොට ඇති අතර, දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳ ලිපි 150කට වැඩි සංඛ්‍යාවක් පළ කර තම ලේඛන කලාව තුළින් ජනතාවට දැනුම ලබාදීමට කටයුතු කර ඇත.

පාකිස්ථානය, මාලදිවයින, නවදිල්ලිය, ජර්මනිය, කැනඩාව, චීනය, හංගේරියාව, පැරිසිය ආදී රටවල පැවැති විවිධ සමුළුවලදී පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඒවාට සහභාගි වී ඇති අතර, එයින් ලද අත්දැකීම් හා දැනුමද මෙරට ජනතාවට සේවය කිරීම පිණිස යොදා ගත්තේය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු ලෙසද, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකු ලෙසද, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම් ලෙසද, පොදු මහජනතාව වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කළ විශ්වා වර්ණපාල මැතිතුමා අවුරුදු 79ක් ආයු වළඳා, 2016 පෙබරවාරි මාසයේ 27 වෙනි දින මෙලොවින් සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1994 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වාද, නවැත 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ද අවුරුදු 12කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පොදු ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම උත්තරිතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

අතිගරු ජනාධිපතිතුමා.

[පූ.භා. 11.21]

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (ජනාධිපතිතුමා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා සහ ආරක්ෂක අමාත්‍යතුමා)
(மேதகு மைத்திரிபால சிறிசேன - ஜனாதிபதியும் மகாவலி அபிவிருத்தி, சுற்றாடல் அமைச்சரும் பாதுகாப்பு அமைச்சரும்)
(His Excellency Maithripala Sirisena - President, Minister of Mahaweli Development and Environment and Minister of Defence)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු මහාචාර්ය ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳව ශෝකය පළ කරමින් ඉදිරිපත් කරන ලද ගරු සභානායකතුමාගේ යෝජනාව ස්ථිර කරමින්, එතුමා පිළිබඳව කරුණු කිහිපයක් ඉතාම කෙටියෙන් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙනවා.

මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා මගේ ඉතාම හොඳ, දීර්ඝ කාලීන මිත්‍රයෙක්. එතුමා මේ රටේ වාමාංශික දේශපාලනය, ප්‍රගතිශීලී දේශපාලනය, විශේෂයෙන්ම එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ දේශපාලන දර්ශනය පිළිබඳව සිංහල හා ඉංග්‍රීසි පොත් පත් රාශියක් ලියපු කෙනෙක්. බණ්ඩාරනායක දර්ශනය පිළිබඳව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳව කෙනෙකුට යම් අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු පුස්තකාලයක් තුළ හෝ වෙනත් තොරතුරු මධ්‍යස්ථානයක සෙව්වොත්, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා විසින් ලියන ලද ඉංග්‍රීසි සහ සිංහල පොත් රාශියක් සොයා ගැනීමට හැකි වෙනවා. එතුමා ප්‍රධාන වශයෙන්ම දේශපාලනයට පිවිසි මුල් අවස්ථාවේ සිටම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කළ කාලවලදීත්, රාජ්‍ය සේවයේ තනතුරු රාශියක් දැරූ සෑම අවස්ථාවකමත් එම වගකීම ඉතාම ඉහළින් ඉටු කළා. ඒ වාගේම, අවංකභාවය පිළිබඳව, පිරිසිදුකම පිළිබඳව, කරන කාර්යයේ ගුණාත්මකභාවය පිළිබඳව, තමන් කරන කාර්යයේ ප්‍රමිතිය පිළිබඳව ඉතාම ඉහළ අගයක් සමාජය තුළ ලැබූ පුද්ගලයෙක් තමයි මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා.

දේශපාලනඥයකු විධියට එතුමාගේ අවංකකම, එතුමාගේ ආදර්ශය, එතුමාගේ චරිතය, එතුමාගේ බුද්ධිය, එතුමාගේ උගත්කම, එතුමාගේ පරිණතභාවය, එතුමාගේ පාණ්ඩිත්වය එදා එතුමා ජීවත්ව සිටි කාලය තුළ වාගේම අද දවසේත් සෑම කෙනෙකුම අගය කරනු ලබනවා. විශ්වා වර්ණපාල මැතිතුමා, එතුමාට පැවරූ කාර්යයන් ඉටු කිරීමේදී - එම වගකීම් දරන විට- සිය දැනුම සහ බුද්ධිය මුල් කර ගනිමින් ඉතාම දක්ෂ ලෙස වාද - විවාද කළ කෙනෙක්.

එතුමාට පවරනු ලැබූ සියලු වගකීම් ඉටු කිරීමේ දී එතුමාගේ බුද්ධිය සහ දැනුමත්, පරිණතභාවයත් වඩාත්ම උසස් ලෙස පෙන්නුම් කරනු ලැබුවා. දේශපාලනය කරන විට දේශපාලනඥයකු වූවා මෙන්ම, උගතකු, බුද්ධිමතකු විධියට යම් යම් වගකීම් පැවරූ සෑම අවස්ථාවකදී ම දේශපාලන පක්ෂ භේදයෙන් තොරව සැබෑ මානවවාදියකු ලෙස එතුමා කටයුතු කරනු ලැබුවා. එතුමා තුළ තිබූ ඒ සැබෑ මානවවාදී ගුණාංගය සෑම කෙනකු විසින්ම ඉතාම ඉහළින් අගය කරනු ලැබුවා. ඒ නිසාම එතුමාට හොඳ සමාජ පිළිගැනීමක් තිබුණා. ජාතික වශයෙන් වාගේම අන්තර්ජාතික වශයෙනුත් එතුමා පෙනී සිටි සෑම තැනකදීම එතුමාට තිබුණු පිළිගැනීමත්, එතුමාගේ දක්ෂතාවත්, එතුමාගේ දැනුමත් නිසා එතුමා මුලසුන ගත්තා වූ, මෙහෙයවූ, කළමනාකරණය කළා වූ සියලු ස්ථානවල දී එතුමාට අවශ්‍ය නායකත්වය ලැබුණා. එතුමා නායකත්වය සොයා ගිය කෙනෙක් නොවෙයි. එතුමා දැරූ තනතුරුවලදී එතුමා කළ කැපවීම, එතුමාගේ දක්ෂතාව, එතුමා තුළ තිබුණු අවංකභාවය සහ යහපත් චරිත ලක්ෂණ නිසා මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාව සමාජය පිළිගත්තේ උගතකු, බුද්ධිමතකු, සැබෑ මානවවාදියකු විධියටයි. ඒ නිසා මේ රටේ උගතුන්ට, බුද්ධිමතුන්ට, ඒ වාගේම දේශපාලන ක්ෂේත්‍රයේ සෑම කෙනකුටම, මේ රටේ විවිධ සමාජ සේවාවන්හි යෙදෙන අයට, මේ රටේ සාමාන්‍ය ජනතාවට එතුමාගේ චරිතය ඉතාම ආදර්ශවත් චරිතයක්.

අද දේශපාලනය පිළිබඳව කතා කරන විට "දේශපාලනඥයා" කියන වචනය සමඟ එන "දූෂණය" කියන වචනය සැබෑ ලෙසම ප්‍රතික්ෂේප කරපු කෙනෙක්, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා. එතුමා විසින් කරනු ලැබූ කටයුතුවලදීත්, එතුමාට පවරනු ලැබූ වගකීම්වලදීත් කිසිම දවසක සමාජයෙන්, එතුමා ඇසුරු කරන්නන්ගෙන්, එතුමාගේ ආයතනවල කාර්ය මණ්ඩලවලින් "දූෂිතයෙක්" කියන වචනය කිසිදු අවස්ථාවක එතුමාට ලැබුණේ නැහැ. උගතකු, බුද්ධිමතකු විධියට, අවංක පුද්ගලයකු විධියට මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට ලැබුණේ සෑම විටම ඉහළ පිළිගැනීමක්.

එතුමාගේ අභාවය පිළිබඳව අප කනගාටු වන මේ අවස්ථාවේ මට කිව හැකි දෙයක් තිබෙනවා. එතුමාගේ උගත්කමට සහ එතුමාගේ දැනුමට, එතුමාගේ දක්ෂතාවන්ට නිසි තැනක් අපේ සමාජය තුළින්, එදා පැවැති අපේ රජයන් තුළින් ලැබුණාද කියන ප්‍රශ්නය සැබෑ ලෙසම මගේ මතකයට නැඟෙනවා.

එතුමාගේ දැන උගත්කමට සහ දක්ෂතාවට අනුව සුදුසු තනතුරක් දිය යුතුය කියා එදා මා යෝජනා කළ බොහෝ අවස්ථාවන්වලදී, ඒ යෝජනා ප්‍රතික්ෂේප වූ විට මගේ සිතෙහි දැඩි වේදනාවක් ඇති වුණා, විශ්වා වර්ණපාල වැන්නෙකුට, එතුමාගේ දැන උගත්කමට සුදුසු තනතුරක් දෙන්නට වගකිවයුත්තන් කටයුතු නොකිරීම පිළිබඳව. එහෙත් සැබෑ මානව වාදියෙක් ලෙස, සැබෑ මිනිසෙක් ලෙස මිනිසෙක් විසින් සමාජයට කළ යුතු මිනිස්කම ප්‍රමුඛ වූ කාර්යයන් සමාජයට විදහා දැක්වීමේදී එතුමා මහා ප්‍රදීපස්ථම්භයක් විධියට ක්‍රියා කළා. මනුෂ්‍යත්වය තුළ තිබිය යුතු ගුණාත්මකභාවය, කරන කාර්යයන් තුළ තිබිය යුතු ප්‍රමිතිය එතුමා සෑම විටම සිය චරිත ලක්ෂණ තුළින්, කථාවට වඩා ආදර්ශයෙන් පෙන්නුම් කරනු ලැබුවා. එතුමා අවවාදයට වඩා ආදර්ශය පෙන්නුම් කළ කෙනෙක්.

එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයෙක්. එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා විධියටත් කටයුතු කළා. පොත පත ලිවීමට තිබූ දක්ෂතාව පෙන්නුම් කිරීමේදී එතුමා අපේ රටේ ජනතාව අතර පමණක් නොව විශේෂයෙන්ම ඉංග්‍රීසි බසින් පොත්පත් ලියා අන්තර්ජාතික වශයෙන්ද ඉතා ඉහළ ඇගයීමකට ලක්වූවා.

මහාචාර්ය විශ්වා වර්ණපාල වැන්නෙක් මේ ගරු සභාව නියෝජනය කළා වාගේම-මේ උත්තරීතර සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වාගේම- ඉන් බාහිරව ජාතික වශයෙන්, අන්තර්ජාතික වශයෙන් මුළුමහත් සමාජයට - මුළුමහත් ප්‍රජාවට- ඉමහත් සේවයක් කරනු ලැබුවෙක්. එතුමා විසින් කරනු ලැබූ එම සේවය ඉතාම අගය කළ යුතු වෙනවා. ප්‍රභූ

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

පවුලකින් නොව සාමාන්‍ය පවුලක උපන්, සාමාන්‍ය පොදු ජනතාව අතරින් බිහිවෙච්ච සැබෑ මිනිසෙක් වූ එතුමාගේ වටිනාකම් පිළිබඳව අද වාගේ දවසක හෝ කථා කිරීම යුතුකමක් කොට මා සලකනවා. මේ සියලු කාර්යයන් පිළිබඳව කථා කිරීමේදී එතුමා තුළ තිබූ ඒ දක්ෂතාවන්, හැකියාවන්, විශේෂයෙන් එතුමාට තිබුණු විචක්ෂණභාවය, බුද්ධිය යන ඒ සියල්ල අපේ සමාජයට ඉමහත් ආදර්ශයක් කියන එක මගේ මතකයේ තිබෙනවා. මිනිසුන් මියගියද ඒ මිනිසුන් විසින් සමාජයට, සිය මිනිසුන් වෙනුවෙන් කරන ලද සේවාව වාගේම ඒ පෙන්නුම් කරන ලද ආදර්ශයන් මිනිස් සමාජය තුළ කිසිවිටෙකත් අමතක නොවන බව අපි සෑම කෙනෙක්ම දන්නා කාරණයක්.

මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන මේ අවස්ථාවේ මම පෞද්ගලිකවත්, ජනාධිපතිවරයා විධියටත්, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපතිවරයා විධියටත් මගේ ශෝකය හා කනගාටුවත්, මෙම උත්තරීතර සභාවේ සියලු දෙනාගේ ශෝකයත් එම මැතිනිය හා දරුවන් වෙත පළ කර සිටිනවා. ඒ වාගේම බෞද්ධයින් විධියට අපි එතුමාට නිවන්සුව අත් වේවායි ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.31]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்*)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දැවැන්ත සේවාවක් කරමින් සිට අභාවප්‍රාප්ත වූ මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ ශෝක යෝජනාව පිළිබඳ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳ පළමුවෙන්ම ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා හුදෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් හා දේශපාලනඥයෙක් පමණක් නොවෙයි. එතුමා මේ රටේ ප්‍රතිරූපය ඉතාම උච්ච ස්ථානයකට, ජාත්‍යන්තරයට ගෙන ගිය උගතෙක්, බුද්ධිමතෙක්, විචාරකයෙක්. මොකද, එතුමා සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් හැසිරවීම පිළිබඳ තිබුණු දක්ෂතාව, ඒ වාගේම ලිවීමේ තිබුණු දක්ෂතාව යනාදී මේ සෑම කටයුත්තකදීම කැපී පෙනුණා. විශේෂයෙන්ම එතුමා අර්ථ ශාස්ත්‍රය ප්‍රගුණ කළා පමණක් නොවෙයි, විවිධ රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කළා. ඒ විතරක් නොවෙයි, ඒ පිළිබඳ විචාරාත්මක පොත්පත් ලියූ, ලේඛන ලියූ ලේඛකයෙක් බවට පත් වුණා. එතුමා තමන්ගේ දේශපාලන ජීවිතය ආරම්භ කළේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කරන ලද සේවය අගයමින් 1980දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කළා. ඒ වාගේම අද අතිගරු ජනාධිපතිතුමා කියන ලද පරිදි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බණ්ඩාරනායක දර්ශනය පිළිබඳ මෙන්ම එවකට පැවති බමුණුකුල බිඳ වැටීමත් සමඟම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ඇති කරන ලද දැවැන්ත සමාජ පරිවර්තනය පිළිබඳ සුවිශේෂී වශයෙන් විග්‍රහ කරලා ලිපි සහ පොත් ලියූ ලේඛකයෙක් වෙනවා නම් ඒ වෙන කිසිවෙක් නොවෙයි, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමායි.

එතුමා රටේ දේශපාලනය එක්ක, කාලීන ප්‍රශ්න එක්ක ඒවා ඒකාබද්ධ කරමින් ඉතා හොඳ විවරණ රාශියක් ලබා දෙමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා බණ්ඩාරනායක දර්ශනය පිළිබඳ ගැඹුරු අරුතක් මේ රටේ දේශපාලනයට මුහුණ දුන්නා. එතුමා ඉතාම චාම් ජීවිතයක් ගත කරපු නිරහන්කාර දේශපාලනඥයෙක් මෙන්ම උගතෙක්, බුද්ධිමතෙක්. එතුමා අපත් සමඟ බිම් මට්ටමින් දේශපාලනය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දැවැන්ත ශක්තියක් බවට පත් වුණා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හා අපගේ ආශිර්වාදයෙන් එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා වශයෙන් පත් වෙලා සිය ජීවිතයේ අවසාන කාලයේ පක්ෂය වෙනුවෙන් කළ යුතුකම් හා වගකීම් අමතක කළ නොහැක. හැම විටම නායකත්වයට නිස නමමින් නායකත්වය අපහසුතාවට පත් නොවන ආකාරයට කටයුතු කරමින් එතුමා සේවය කළ බව කියන්න ඕනෑ.

එතුමා බදුල්ල ප්‍රදේශයෙන් තමයි විවාහ වුණේ. විශේෂයෙන්ම එතුමාත් මාත් අතර දීර්ඝ කාලීන පෞද්ගලික මෙන්ම දේශපාලන සබඳතාවක් පැවතුණා. එපමණක් නොවෙයි. මගේ 35 වසරක දේශපාලන ජීවිතය පිළිබඳව පොත් පිංචක් ලියා, මගේ 35 වසරක දේශපාලන ගමන පිළිබඳව පැවැති උත්සවයේදී කථාව පැවැත්වීමේ වගකීම එතුමා භාර ගත්තා. එතුමා නොපැකිළිව කිව්වා, "නිමල්, මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් කියන හැඟීමෙන් මේක ඉතාම සතුටින් භාර ගන්නේ. මොකද, නිමල් පක්ෂයට කරපු සේවය නිසා." කියලා. එතුමාගේ හදවත තුළ හැම වෙලාවේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳව ගැඹුරු හැඟීමක්, ඇල්මක්, ආදරයක් තිබුණු බව මා ප්‍රකාශ කරන්නට ඕනෑ.

එතුමාගේ අභාවය ශ්‍රී ලාංකික දේශපාලනයට සිදු වුණු බලවත් පාඩුවක්. මේ රටට උගතෙක්, බුද්ධිමතෙක්, ජාත්‍යන්තර කීර්තියක් දිනූ බුද්ධිමතෙක් නැති වුණා පමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල පාඩුවක් සිදු වුණා. එතුමාගේ අභාවය පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මම මේ අවස්ථාවේදී අපේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.36]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(*மாண்புமிகு தினேஷ் குணவர்தன*)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක යෝජනාවට ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මේ අවස්ථාවේදී එක් වෙමින්, අපේ රටේ දේශපාලන විද්‍යාවට, දේශපාලන යන්ත්‍රණයට මහඟු සේවාවක් හා අලුත් අදහස් රාශියක් ඉදිරිපත් කිරීමෙහිලා මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා ඉටු කළ සේවය මා පළමුකොට ඉතාම ගෞරවයෙන් අගය කරනවා. අතිගරු ජනාධිපතිතුමා සඳහන් කළ විධියට එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්වරයා හැටියට කෙටි කාලයකට කටයුතු කළා. කුමන දේශපාලන මතභේද පැවැතියද එතුමා අප සමඟ ඉතාම මිත්‍රත්වයෙන් කරුණු සාකච්ඡා කිරීමට කටයුතු කළේ, එතුමා දීර්ඝ කාලයක් තිස්සේ ලංකා දේශපාලනයේ නිරත වෙමින්, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන්, ඉන් පසු චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන්, ඒ වාගේම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් යුතු අපේ දේශපාලන බලවේගයන්ගේ එකමුතුවේ ප්‍රධාන ක්‍රියාකරුවෙක් හැටියට කටයුතු කරමින් ලත් අත් දැකීම් නිසයි. මහාචාර්ය විශ්වා

වර්ණපාල මැතිතුමා කියන්නේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය පරම්පරා ගණනාවකට ප්‍රබුද්ධ දැනුම ඉතාම නිහතමානීව දායාද කළ මහාචාර්යවරයෙක්. ඔහු විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට එක් වුණේ, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ මහත් දේශපාලන අභියෝගයන්, න්‍යායයන්, දර්ශනයන් පිළිබඳ වාද හා ගැටුම් ලෝකය හරහා ගමන් කරන අවධියේදීයි; ලංකාව හරහා ගමන් කරන අවධියේදීයි. ඒ නිසාම 1956 මහා පෙරළියට විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රධානියෙක් හැටියට එක් වුණු ආකාරය ගැන එතුමා වරෙක කිව්වා, මට මතකයි. ඒ අත් දැකීම් සම්භාරය මැද, විශ්වවිද්‍යාල වසා දැමුණු, විශ්වවිද්‍යාල භීෂණයට ලක් වුණු කාල පරිච්ඡේදයේදීද දේශපාලනයත්, විශ්වවිද්‍යාලයත් අතර තිබෙන සම්බන්ධය අවබෝධ කර ගනිමින් කටයුතු කළ මහාචාර්යවරයෙක් හැටියට එතුමා කාගේත් ගෞරවය දිනා ගත්තා. එතුමාගේ වියෝවෙන් අපට සිදු වන පාඩුව ලෙහෙසියෙන් මකන්න පුළුවන්කමක් නැහැ.

එතුමා විසින් ප්‍රකාශිත ග්‍රන්ථයේ මෑත කාලයේ ලංකාවේ දේශපාලන තොරතුරු රාශියක් ඇතුළත් වනවා. අලුතෙන් දේශපාලන ක්ෂේත්‍රයට පිවිස ඇති කාටත් එය හොඳ අත් පොතක්. එම පොත කියවන අයට එයින් බුක්ති විඳිය හැක්කේ දැනුම පිළිබඳ කරුණු අත් දැකීම පමණක් නොවෙයි. කරුණු විශ්ලේෂණය කිරීම හා කරුණු අතර තිබෙන විවිධ සම්බන්ධයන් පිළිබඳව ඇතිවන ගටිටනයන් අතර ඉතාම හොඳ දේශපාලන ගවේෂණයක් දායාද කරලායි එතුමා දෙනෙත් පියා ගත්තේ.

එතුමා කලක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට කටයුතු කළා. ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හැටියටත් කටයුතු කළා. කලක් මා නියෝජනය කළ පළාත වූ සබරගමුව පළාතේ මන්ත්‍රීවරයෙකු හැටියටත් එතුමා කටයුතු කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයෙකු හැටියටත් එතුමා කටයුතු කළා.

මට මතකයි, අපට අමාරු කාලයේ අපේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව බොහොම සුළු ප්‍රමාණයකට පහළ බැහැලා තිබුණ බව. අපි 8දෙනෙකු පමණක් විරුද්ධ පක්ෂයේ සිටින කාලයේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය හා සම්බන්ධ දේවල් හා වෙනත් විවිධ දේවල්වලට අවශ්‍ය කරුණු සොයා ගන්න මම විශ්වා වර්ණපාල මැතිතුමාගේ ගෙදර ගිහිල්ලා, එතුමාගෙන් කරුණු අහගෙන ඇවිල්ලා, එතුමාගේ උපදෙස් මත පාර්ලිමේන්තුවේ කථා කළා. වර්ණපාල මැතිතුමා සම්බන්ධයෙන් එවැනි අත් දැකීම් සම්භාරයක් අපට තිබෙනවා. ප්‍රගතිශීලී ව්‍යාපාරය වෙනුවෙන් අප කාටත් දුන් දායාදයට අප යළිත් අපේ ගෞරවය එතුමාට එක් කරනවා.

එතුමා ජීවත් වුණේ මහරගම මැතිවරණ කොට්ඨාසයේ මාදිවෙල ප්‍රදේශයේ. තමන් නියෝජනය කරන කොට්ඨාසය නොවුණත්, ඒ ප්‍රදේශයේ එතුමාට උදව් වන්න පුළුවන් හැම දේකටම උදව් වෙමින් තම මන්ත්‍රී ධුරයෙන්, ඇමති ධුරයෙන් වෙන් වන විමධ්‍යගත මුදල් පවා ජාතික මන්ත්‍රීවරයෙකු හැටියට අපේ පළාතේ අසරණ අයට, අපේ පළාතේ විද්‍යාලවලට ලබා දෙමින් එතුමා දුන් සහයෝගය මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ජීවත් වීමේ වටිනාකමේ දායාදය එකතු කරමින් දෙනෙත් පියා ගන්නා මොහොත දක්වා අඛණ්ඩව කටයුතු කළ එතුමන්ට නිවන් සුව ලැබේවා!යි මා ප්‍රාර්ථනා කරනවා.

[ම.ප. 11.42]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩක්ලස් දේවානන්දා)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, மறைந்த முன்னாள் நாடாளுமன்ற உறுப்பினர்களான கௌரவ ஈலியன் எம். நாணாயக்கார, கௌரவ விஸ்வா வர்ணபால ஆகியோர் தொடர்பிலான அனுதாபத் தீர்மானம்மீது எனது கருத்துக் களையும் தெரிவிப்பதற்குச் சந்தர்ப்பம் வழங்கியமையையிட்டு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

எமது நாட்டின் இடதுசாரிக் கொள்கை சார்ந்த முன்னணி அரசியல்வாதிகளாக கௌரவ ஈலியன் எம். நாணாயக்கார அவர்களையும் கௌரவ விஸ்வா வர்ணபால அவர்களையும் குறிப்பிட இயலும். கௌரவ ஈலியன் எம். நாணாயக்கார அவர்கள், தான் வகுத்துக்கொண்ட கொள்கைக்கு அமைவாகத் தனது அரசியல் களத்திலும் அயராது செயற்பட்டவர். பேராசிரியர் வட்டரெக்கே ஆராச்சிலாகே விஸ்வா வர்ணபால அவர்கள் என்னுடன் சமகாலத்தில் நாடாளுமன்ற உறுப்பினராகவும் அமைச்சராகவும் இருந்தவர். பேராதனைப் பல்கலைக்கழகத்தில் பொருளியல் இளங்கலைப் பட்டம், அமெரிக்க பிட்ஸ்பேர்க் பல்கலைக்கழகத்தில் முதுகலைப் பட்டம், இங்கிலாந்து லீட்ஸ் பல்கலைக்கழகத்தில் கலாநிதிப் பட்டம் எனப் பல கல்வித் தகைமைகளைக் கொண்டிருந்த பேராசிரியர் விஸ்வா வர்ணபால அவர்கள், பேராதனைப் பல்கலைக்கழகத்தில் அரசறிவியல் விரிவுரையாளராகவும் அரசறிவியல் துறைத் தலைவராகவும் பணியாற்றியிருந்த நிலையிலேயே அரசியல் பிரவேசம் கண்டவர்.

அந்தவகையில், 1980களில் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியின் மத்திய குழு உறுப்பினரான இவர், 2004ஆம் வருடம் ஐக்கிய மக்கள் சுதந்திர முன்னணி சார்பில் தேசியப் பட்டியலில் நாடாளுமன்றப் பிரவேசம் கண்டவர். பின்வந்த காலங்களில் பிரதி வெளிவிவகார அமைச்சராகவும் நாடாளுமன்ற அலுவல்கள் அமைச்சராகவும் உயர் கல்வி அமைச்சராகவும் கடமைகளைப் பொறுப்பேற்றிருந்த அன்னார், ஐக்கிய மக்கள் சுதந்திர முன்னணியின் பொதுச் செயலாளராகவும் பதவி வகித்திருந்தார். அவர் உயர் கல்வி அமைச்சராகக் கடமைகளைப் பொறுப்பேற்றிருந்த காலத்தில் பல்கலைக் கழகக் கல்வி சார்ந்தும் மாணவர்களது வசதிகள் சார்ந்தும் சிறந்த பல பணிகளை முன்னெடுத்திருந்தார். அக்கால கட்டத்தில் எனது கோரிக்கையை ஏற்றிருந்த அவர், யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் பட்டப் பின்படிப்புக் கல்விப் பீடத்திற்கென மூன்று மாடிகள் கொண்ட புதிய கட்டிடமொன்றை அமைப்பதற்கு நடவடிக்கை எடுத்திருந்தார். அதேபோன்று கொழும்புப் பல்கலைக்கழகத்தில் தமிழ்த்துறை ஒன்றில்லாதிருந்த குறையினைத் தீர்க்கும் வகையில், அங்கு தமிழ்த்துறையினை உருவாக்குமாறு நான் முன்வைத்திருந்த கோரிக்கையையும் அவர் ஏற்றிருந்தார். இருந்தும், அந்தக் காலகட்டத்தில் அது சாத்தியமாக்கப்படாமல் விடப்பட்டது. எல்லோருடனும் நன்கு பழகுகின்ற தன்மையும் எல்லோரையும் அனுசரித்துப்போகின்ற குணமும் கொண்ட அமரர் விஸ்வா வர்ணபால அவர்களது சேவைகள் என்றுமே எமது நாட்டில் மறக்கப்பட இயலாதவை.

அதேபோன்று ஈலியன் எம். நாணாயக்கார அவர்களும் சிறந்த மனிதப் பண்புகள் கொண்ட ஒருவராகத் தனது வாழ்க்கையை ஏனையவர்களுக்கு ஒரு முன்னுதாரணமாகக் கொண்டு வாழ்ந்தவர். எனது தந்தையார் ஏற்றிருந்த இடதுசாரிக் கட்சியின் கொள்கைகளை இறுதிவரையில் ஏற்றிருந்தவர். கௌரவ ஈலியன் எம். நாணாயக்கார அவர்கள் இடதுசாரிக் கொள்கை சார்ந்த எனது குடும்பத்தில் ஒருவராக இணைந்திருந்தவர். அந்த வகையில் பதவிகள் தமக்கான கௌரவத்திற்கு உரியவை அல்ல; பதவிகள் எமது மக்களின் நலன்சார்ந்து செயலாற்ற வேண்டிய கடமைகள் கொண்டவை என்பதை இந்த இருவருமே தங்களது செயற்பாடுகளினூடாக நிரூபித்தவர்கள். ஆகவே, இந்த இருவரையும் நினைவு கூர்வதில் நான் பெருமிதமடைகின்றேன். இந்த இருவரையும்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

නිනෙවුකූර්කින්ර ඉන්නාලිල්, ඉවර්කළදු පණිකළෙයුම් කුණනලන්කළෙයුම් එමදු එදිර්කාලච් චන්දදික්කු එටුත්දුක් කාට්ටුකින්ර වකෙයිලාන එර්පාටුකළෙ මුන්නෙටුප්පදර්කු ඉන්ද අරසු මුන්වරවේණ්ටුමෙනක් කේට්ටුක්කොණ්ටු, කෙළරව විස්වා වර්ණපාල අවර්කළිනදුම් කෙළරව ඉලියන් එම්. නාණායක්කාර අවර්කළිනදුම් කුටුම්පත්තිනර්, උදවිනර්කළ්, නණ්පර්කළ් උට්පට අනෙවරුක්කුම් එමදු මක්කළ් චාර්පාක එන්නුටෙය අනුදාපත්තෙප් පකිර්න්දු කොණ්ටු විටෙපෙදුකින්රේන්. නන්දි!

[පූ.භා. 11.47]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු (කලානිධි) ජයම්පති වික්‍රමරත්න)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුවේ කීර්තිමත් මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කළ මහාචාර්ය ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් පෞද්ගලිකව මාගෙත්, මා නියෝජනය කරන එක්සත් වාමාංශික පෙරමුණෙත් ශෝකය එතුමාගේ පවුලේ සාමාජිකයන් වෙත ප්‍රකාශ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු කථානායකතුමනි, එතුමා මගේ ගුරුවරයෙක්ද වූවා. එතුමා කෑගල්ල ප්‍රදේශයේ උපත ලැබ තරුණ කාලයේ සිටම දේශපාලනයට සම්බන්ධ වුණා. එසේ සම්බන්ධ වුණේ එතුමාගේ කිට්ටු මිතුරෙකු වූ අධිනීතිඥ තිස්ස විජේරත්න මැතිතුමාගේ බලපෑම නිසායි. එතුමා තිස්ස විජේරත්න මැතිතුමාට ඉතාමත් කිට්ටුවෙන් සිටියා.

තිස්ස විජේරත්න මැතිතුමා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරිකයෙක්. 1960 මාර්තු මැතිවරණයේදී තිස්ස විජේරත්න මැතිතුමා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් කෑගල්ල ආසනයට තරග කළ අවස්ථාවේදී එතුමාට ඉතාමත්ම ක්‍රියාශීලීව සහාය දීමට ඉදිරිපත් වුණු කෙනෙක් තමයි විශ්වා වර්ණපාල මැතිතුමා. ඉන් පසුව විශ්වා වර්ණපාල මැතිතුමා පේරාදෙනිය විශ්වවිද්‍යාලයට ඇතුළු වී පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ලංකා කොමියුනිස්ට් පක්ෂ කණ්ඩායමේ ඉතාමත්ම ක්‍රියාකාරී සාමාජිකයෙක් වුණා. එතුමා දේශපාලන විද්‍යාව හැදෑරුවා. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ කථාවක් තිබුණා, "පිටින් ඇවිල්ලා දේශපාලනය ගැන කථා කළ කිසිම කථිකයෙකුට විශ්වා වර්ණපාල මැතිතුමාගේ ප්‍රශ්න කිරීමකට ලක් නොවී යන්න බැරි වුණා" කියලා. ඒ කියන්නේ එතුමා ඒ එන කථිකයන්ට වද දුන්නා, ප්‍රශ්න අහලා. එතුමාට ඒ කාලයේ ඉඳන්ම දේශපාලනය පිළිබඳව ඉතාමත්ම හොඳ දැනුමක් තිබුණා වාගේම එතුමා පේරාදෙනිය විශ්වවිද්‍යාලය තුළ ඉතාමත්ම හොඳ වාමාංශිකයෙක් විධියට කටයුතු කළා. පසුව එතුමා ආචාර්ය උපාධිය ලබාගෙන පේරාදෙනිය විශ්වවිද්‍යාලයේම ඉගැන්වූවා

. ගරු කථානායකතුමනි, එතුමා දේශපාලන ග්‍රන්ථ ගණනාවක්ම සම්පාදනය කළා. ඒවායේ නම් කිහිපයක් කියන්න මම කැමැතියි. එක පොතක් තමයි, "Parliament and Public Accountability in Sri Lanka." එය එතුමාගේ පාර්ලිමේන්තු අත්දැකීම් අනුව ලියපු පොතක්. මුල්ම කාලයේ, "Local Politics in Sri Lanka: An Analysis of the Local Government Election of May 1991, The Sri Lankan Political Scene" කියන පොත් ලිව්වා. ඊළඟට ජන වාර්ගික ගැටලුව පිළිබඳව, "Ethnic Strife and Politics in Sri Lanka: An Investigation into Demands and Responses," "Provincial Politics in Sri Lanka : An Analysis of the Southern Provincial Council Election, 1994," "Politics In Sri Lanka: A Collection Of Essays On Personalities And Issues" කියන පොත් ලිව්වා. 1982 පැවති කුප්‍රකට ජනමත විචාරණය පිළිබඳව එතුමා ලියපු පොත එතුමාගේ විරුද්ධවාදීන් පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයෙන් බැහැර කිරීමට පවා උත්සාහ දැරුවා. නමුත් එය සාර්ථක වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, ඉන් පසුව එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වුණා. අවසානයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් ධුරය පවා දරන්නට එතුමාට අවස්ථාව ලැබුණා. 1960 ගණන්වල එතුමා රුසියාවේ, මොස්කව් නුවර ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයේ Consul හැටියට කටයුතු කළා. මට මතක හැටියට ඉන්පසු 1969 දී හෝ 1970 දී තමයි එතුමා ආපසු ලංකාවට පැමිණියේ.

ගරු කථානායකතුමනි, 1994 මැතිවරණය සඳහා ජාතික ලැයිස්තුවෙන් එතුමා නම් කළා. ඒ වෙලාවේ එතුමා පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු වශයෙන් සේවය කළා. එතුමා සමඟ උගන්වන අය, එතුමාගෙන් ඉගෙන ගත් අය, ඉගෙන ගන්නා අය එතුමාගෙන් ඉල්ලීමක් කළා, යන්න එපාය කියලා. මොකද, එතුමාට ලැබෙන්න නියමිතව තිබුණේ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමති ධුරයයි. මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ පුද්ගලයකුට කෙළින්ම ලැබිය යුතුව තිබුණේ ඇමති ධුරයක්. නමුත් එදා තිබුණු තත්ත්වය අනුව එතුමාට නියෝජ්‍ය ඇමති ධුරයක් තමයි ලැබෙන්නට ගියේ. එතුමා එවකට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වශයෙන් පත්වෙලා සිටියේ නැහැ. එහෙත් එතුමා, "මම යනවා"යි කියලා 1994 දී පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමා පාර්ලිමේන්තුවට පැමිණීමෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරය ලැබීමට තිබුණු අවස්ථාව දේශපාලනය වෙනුවෙන් නැති කර ගත්තා. එතුමා පාර්ලිමේන්තුවට පැමිණීම නිසා එතුමාට, "සම්මානනීය මහාචාර්ය" - "emeritus professor" - නමැති ගෞරව තනතුර ලබා ගැනීමට තිබුණු අවස්ථාවත් එතුමා නැති කර ගත්තා. නමුත් එතුමා වඩා වැදගත් ලෙස හිතුවේ, පාර්ලිමේන්තුවට ගිහිල්ලා සේවයක් කිරීමයි. One could say that he sacrificed his academic career to come to Parliament.

ඔබතුමා මට අවසර ලබා දෙනවා නම් මම එතුමා ගැන පෞද්ගලික සඳහනක් කරන්නම්. එතුමා මගේ ගුරුවරයෙක්. මම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ, විද්‍යාපති පශ්චාත් උපාධිය - Master of Public Administration (MPA) - කරන වෙලාවේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් පරිපාලනය - "District Administration" - කියන course unit එකට අපේ ශිෂ්‍යයන් දෙදෙනායි හිටියේ. "විශ්වා වර්ණපාල මැතිතුමා අපට අල්ලලා දෙන්න" කියලා අපි මහාචාර්ය ගුණපාල නානායක්කාර මැතිතුමාට කිව්වා. බොහොම අමාරුවෙන් විශ්වා වර්ණපාල මැතිතුමා ඊට කැමැති වුණා. හැබැයි, එතුමා කොන්දේසියක් දැම්මා, "මට නම් ජයවර්ධනපුරට එන්න බැහැ. ඔය ළමයි දෙන්නා පේරාදෙනියට එනවා නම් මම උගන්වන්නම්" කියලා. අපි දෙදෙනා පේරාදෙනියට ගියා. සමහර දවස්වලට දේශපාලන විද්‍යා අංශයේ එතුමාගේ කාර්යාලයේදී අපට පාඩම් කියලා දුන්නා. සමහර දවස්වලට එතුමා කිව්වා, "හවසට ගෙදර එන්න" කියලා. එතුමා ජීවත් වුණේ රාමනාදන් ශාලාව සහ හිල්ඩා ඔබේසේකර ශාලාව අතර තිබූ 'රාමනාදන් හිල්' එකේ. සමහර දවසට අපි එතුමාගේ ගෙදරට ගියා. ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව කෙසේ වෙතත් හිතවතෙකු හැටියට තමයි එතුමා අපට ඉගැන්නුවේ කියන කාරණය මම ඉතාම කෘතඥ පූර්වකව මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

පසු කලෙක -මම එහි ආචාර්ය උපාධිය කරනකොට- එතුමා දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ Head of Department හැටියට හිටියා. මගේ ආචාර්ය උපාධිය supervise කළේ ආචාර්ය කේ.එච්. ජයසිංහ මැතිතුමායි. ජයසිංහ මැතිතුමා මට කිව්වා, "මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගෙනුත් උපදෙස් ගන්න" කියලා. මූලික අයිතිවාසිකම් පිළිබඳව තමයි මම මගේ පොත ලිව්වේ. ඒ මූලික අයිතිවාසිකම්වල දේශපාලන විද්‍යා පැත්ත පිළිබඳව මට ඉතාම හොඳට ගුරුහරුකම් දුන්නු කෙනෙකු තමයි විශ්වා වර්ණපාල මැතිතුමා. එම නිසා මම විශේෂයෙන්ම එතුමාව මේ අවස්ථාවේදී කෘතඥ පූර්වකව මතක් කරන්න කැමැතියි. මා ලියපු පොත දැන් වුණත් නීති ශිෂ්‍යයන් පාවිච්චි කරනවා. නමුත් ඒ පොත සාර්ථක කෘතියක් වීමට මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා මට ලබා දුන් ගුරුහරුකම් විශේෂයෙන්ම හේතු වුණා කියන කාරණය මම ඉතාමත්ම කෘතඥ පූර්වකව සඳහන් කරන්න කැමැතියි.

එතුමාගේ 'වර්ණපාල' නම වාගේම එතුමාත් වර්ණවත් චරිතයක්. එතුමාගේ නම විශ්වා වර්ණපාල නිසා ඒ දවස්වල ශිෂ්‍යයන් ඒ නම ඉංග්‍රීසියට හරවලා "Universal Colour Controller" කියලා කිව්වා. එතුමා බොහොම සතුටින් හිනාවෙලා එය භාර ගත්තා.

එතුමා පිළිබඳව විශ්වවිද්‍යාලයේ නොයෙකුත් කථාන්දර - yarns - තිබුණා. මා හිතන හැටියට එතුමාගේ පවුලේ අය ඒවා දන්නවා. දවසක් එතුමා තරුණ කථිකාචාර්යවරයකුට කිව්වා, "මම දේශපාලන විද්‍යාව ගැන උගන්වන ඒවා විතරක් නොවෙයි, මගේ අනෙක් ක්‍රම පිළිබඳවත් ඉගෙන ගන්න" කියලා. එතුමා ඒ කාලයේ, එතුමාට ඒ තිබුණු yarns පවා බොහොම සතුටින් භාරගෙන හිටපු ඉතාමත් ජනප්‍රිය තරුණ සහකාර කථිකාචාර්යවරයෙක්. ඊට පස්සේ එතුමා මහාචාර්යවරයකු හැටියටත් ඉතාම ජනප්‍රිය වුණා; ගුරුවරුන් අතරත් ජනප්‍රිය වුණා. මුළු විශ්වවිද්‍යාල ප්‍රජාව අතරම එතුමා ජනප්‍රිය වුණා.

පසුව එතුමා මේ පාර්ලිමේන්තුවේ සිටින කාලය තුළ තවත් සේවයක් කළා. ඒ පිළිබඳවත් සඳහනක් කරන්න ඕනෑ. 2006දී ගරු මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා සභාපතිත්වය දැරූ සර්වපාක්ෂික කමිටුවේ සාමාජිකයකු හැටියටත් එතුමා කටයුතු කළා. ඒ තුළින් එතුමා විශාල සේවයක් කළා. එතුමාගේ දේශපාලන විද්‍යාව පිළිබඳ දැනුම එම කමිටුවේ වාර්තාව සාර්ථක කර ගැනීමටද විශාල හේතුවක් වුණා.

මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ වන රානි වර්ණපාල මැතිනියටත්, දරුවන් දෙදෙනා ඇතුළු පවුලේ සියලු දෙනාටමත් මගේත්, එක්සත් ජාතික පක්ෂයේ සහ එක්සත් ජාතික පක්ෂයේ ශෝකය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.57]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)

(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)

(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු කථානායකතුමනි, ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම එතුමාගේ දයාබර බිරිඳ, දුදරුවන් ඇතුළු පවුලේ සියලු දෙනා වෙත මගේ පෞද්ගලික ශෝකය පළ කර සිටින අතරේ, මගෙන් පසුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් ධුරය දැරූ එතුමාට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ශෝකයත් පළ කරමින් එතුමාට නිවන් සුව ලැබේවා! යි ප්‍රාර්ථනා කරනවා.

ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමන් මට මුණ ගැසුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන කටයුතුවල යෙදෙන අවස්ථාවේදීයි. එතුමාගේ අධ්‍යාපනික කටයුතු ගැන කථා කරන විට ඇමෙරිකාවේ පීටර්ස් බර්ග් විශ්වවිද්‍යාලයේ සහ එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාලයේ එතුමාගේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙනුත්, පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳව මහාචාර්යවරයකු හැටියට කටයුතු කරන අවධියේ එතුමා කළ කටයුතු සම්බන්ධයෙනුත් මෙම ගරු සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ අයගේ පෞද්ගලික මත ඉදිරිපත් කළා වාගේම දැනුම අනුව ප්‍රකාශයන් කරනු ලැබුවා.

මට මතකයි, ඒ කාලයේ එක්තරා ශිෂ්‍යත්වයක් සඳහා අයදුම් කිරීමේදී අපේ රටේ විශ්වවිද්‍යාලයක සිටින කීර්තිමත් මහාචාර්යවරයකුගේ නිර්දේශය ලබා ගන්න අපට අවශ්‍ය වුණා. මම තෝරා ගත්තේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමන්. මම අදාළ ලියවිලිත් සමඟ එතුමා මුණ ගැහෙන්න ගියාම ඒ ක්ෂණයේම කිසිදු පැකිලීමකින් තොරව එතුමා එතුමාගේ එකඟතාව පළ කළායි කියන එක ඉතාම කෘතඥතා පූර්වකව මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු වෙනවා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්හැර නොගොස් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ සිටම පක්ෂයේ සෑම නායකයකු සමඟම ලෙන්ගතුව කටයුතු කළ බවත් මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුයි.

අපි විපක්ෂයේ සිටින කාලය තුළදී, -1977-1994 කාල සීමාව තුළදී- එක්තරා අවධියක කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකවරයා හැටියට එතුමා කටයුතු කළා මට මතකයි. ඒ අවස්ථාවේදී පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු සඳහා මම එතුමා මුණ ගැහෙන්න දැරණියගලට ගියා. ඒ ප්‍රදේශය දුෂ්කර මාර්ග සහිත ඉතාම දුෂ්කර ප්‍රදේශයක්. රබර් වතු මැදින් ගිහිල්ලා තමයි ඒ අවස්ථාවේදී මම එතුමා මුණ ගැහුණේ. එතුමා පක්ෂයේ සංවිධායකවරයෙක් හැටියට, ඒ වාගේම ආසන සංවිධායකවරයෙක් හැටියට කටයුතු කළා විතරක් නොවෙයි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පත් වෙලා, පසු කාලයක, -මගේ මතකයේ හැටියට 2006-2007 වකවානුව කාලයේ- එතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියටත් කටයුතු කළා. කැබිනට් අමාත්‍යවරයෙක්වීම සඳහා එතුමා සියලුම සුදුසුකම් සපුරා තිබුණා. එතුමා පක්ෂයේ පැරණි සාමාජිකයෙක්; විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක්. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ලබා තිබෙන්නා වූ අත් දැකීම්, ඒ වාගේම පක්ෂයේ ප්‍රතිපත්තිත් සමඟ සමගාමීව අදහස් ප්‍රකාශ කිරීම, මත ප්‍රකාශ කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම කියන මේ සෑම සුදුසුකමක්ම එතුමා සතුව තිබුණා.

ගරු කථානායකතුමනි, එතුමා විසින් ලියන ලද ග්‍රන්ථ ගැනත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. එතුමා ඉංග්‍රීසි භාෂාවෙන් ලියූ ග්‍රන්ථ කිහිපයක්ම සිංහල භාෂාවට පරිවර්තනය කරලා තිබෙනවා. අපේ පාර්ලිමේන්තු පුස්තකාලයේ පවා ඒ ග්‍රන්ථ තිබෙනවා. විශේෂයෙන්ම දේශපාලන විද්‍යාව පිළිබඳව, ඒ වාගේම ආණ්ඩුක්‍රම පිළිබඳව, පළාත් සභා පිළිබඳව, පළාත් පාලන ආයතන පිළිබඳව එතුමා ලියා තිබෙන ග්‍රන්ථ, කුමන තලයක සිටින කෙනකුට වුවත් යම් දැනුමක් ලබා ගැනීම සඳහා ඉවහල් වෙනවාය කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, එතුමා පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළදී පොදු ව්‍යාපාර පිළිබඳව කාරක සභාවේත් කටයුතු කළා. එයින් ලැබූ අත් දැකීම්, ඒ වාගේම Public Accounts Committee එකෙන් ලැබූ අත් දැකීම් තුළින් ඒ ග්‍රන්ථ නිර්මාණය කිරීම සඳහා ප්‍රායෝගික අත් දැකීම් ලබා ගැනීමට එතුමාට අවස්ථාවක් ලැබුණාය කියා මා හිතනවා. පාර්ලිමේන්තුවට පිවිසෙන නවක

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මන්ත්‍රීවරුන් ඒ ග්‍රන්ථ පරිශීලනය කිරීම ඉතාම වැදගත් කියා මම හිතනවා. ස්ථාවර නියෝග යටතේ කටයුතු කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නා වූ ප්‍රතිපාදන අනුව ක්‍රියා කිරීම, අපේ පාර්ලිමේන්තුව තුළ මූල්‍ය කටයුතු පිළිබඳව තිබෙන්නා වූ ප්‍රතිපාදන, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත්, ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත් කාර්යයන්වල තිබෙන්නා වූ වැදගත්කම අන් කවරදාකටත් වඩා අද ඉතාම වැදගත් කියන කාරණය එතුමාගේ ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් ඉතාම පැහැදිලිව අපට බලාගන්න පුළුවන්.

එතුමා විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක් හැටියට, ගුරුවරයෙක් හැටියට, ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් අත් දැකීම් ලැබූ පුද්ගලයෙක් හැටියට ප්‍රසිද්ධියට පත් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉතා දීර්ඝ කාලයක් ප්‍රතිපත්තිමය වෙනස්කමකට භාජනය නොකර, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා එතුමා පෙනී සිටියා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්බන්ධයෙනුත් එක් ග්‍රන්ථයක් පළකර තිබෙනවා. එතුමා අප අතර නැති වුණත්, රටේ දේශපාලන ඉතිහාසය පිළිබඳව, පක්ෂවල දේශපාලන ඉතිහාසය පිළිබඳව, ආණ්ඩු ක්‍රම පිළිබඳව, දේශපාලන විද්‍යාව පිළිබඳව එතුමා කරන ලද ග්‍රන්ථකරණය තුළින් අපට පුළුල් දැනුමක් ලබාගන්න පුළුවන්ය කියන එකත්, අපට ඒ අත් දැකීම් ලබාගන්න පුළුවන්ය කියන එකත් මේ අවස්ථාවේදී මෙනෙහි කරන්නට අවශ්‍යයි. අධ්‍යාපනික වශයෙන්, සමාජයීය වශයෙන් සහ දේශපාලනමය වශයෙන් මේ සා විශාල වූ සේවාවක් සිදු කළ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය මීට ටික කලකට පෙරයි සිදු වුණේ. ඒ අවස්ථාවේ අපි ඒ කටයුතුවලට සම්බන්ධ වුණා.

ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා සමඟ දීර්ඝ කාලයක් ඉතා කිට්ටු සම්බන්ධතාවක් තිබුණු බව වර්තමාන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කථාවේදී පැහැදිලි කළා. එතුමා සෑම නායකයෙක් සමඟම එසේ කටයුතු කළ බව සිහිපත් කරමින්, එතුමා විසින් කරන ලද සියලු සේවාවන් පිළිබඳව මේ අවස්ථාවේදී කෘතවේදීත්වයෙන් යුතුව මෙනෙහි කරමින්, එතුමාට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.04]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත හිටපු උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමන් පිළිබඳ වූ ශෝක යෝජනාවට අදහස් කිහිපයක් එකතු කරන්නට මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දේශපාලනඥයෙක් හැටියට වඩා මුල් කාලයේදී -අපි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේදී- එතුමා ප්‍රසිද්ධියට පත්වෙලා තිබුණේ දේශපාලන දර්ශනය පිළිබඳ මහාචාර්යවරයෙක්, ඒ වාගේම ආණ්ඩු ක්‍රමය පිළිබඳ විශාරදයෙක් වාගේම, ආර්ථික විද්‍යාව පිළිබඳව වැදගත් අදහස් පළ කළ විද්‍යාර්ථියෙක් විධියටයි. අපට මතකයි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේදී එතුමා පිළිබඳව බොහොම පැහැදිළි චර්ණවත් චිත්‍රයක් විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ මැවිලා තිබුණා. එතුමාගේ අධ්‍යාපනික පසුතලය වාගේම එතුමා අනුගමනය කළ විවිධ ක්‍රියාමාර්ග හරහා එතුමා පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව අතරේ -ශිෂ්‍යයින් අතරේ- විශාල පැහැදීමක් ඒ කාලයේ තිබුණු බව අප සෑම කෙනෙක්ම දන්නවා. ඒ වාගේ විශාල ප්‍රසිද්ධියක් තිබුණු, ආණ්ඩු ක්‍රමය පිළිබඳව විශාල දැනුමක් තිබුණු, මේ රටේ පක්ෂ දේශපාලනය පිළිබඳව විශාරද දැනුමක් තිබුණු වර්ණපාල මැතිතුමා අපට පෞද්ගලිකව ඇසුරු කරන්න, දැන හඳුනාගන්න අවස්ථාව ලැබුණේ 1994දී පොදුජන එක්සත් පෙරමුණ මේ රටේ ආණ්ඩුවක් පිහිටුවූවාට පසුවයි.

ඊට පෙර එතුමා දේශපාලනමය වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්, වාමාංශික දේශපාලනය වෙනුවෙන් මාහැඟි මෙහෙවරක් සිදු කළ බව අපි සෑම කෙනෙක්ම දන්නවා. 1980 මුල් කාලයේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි වෙලා දේශපාලනය කරන්න වරම් නැතිව ඉන්න කොට, එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධව ගොඩ නැගුණු ජනතා බලය සමඟ එතුමා එකතු වෙලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඉදිරියට එන්න විශාල දායකත්වයක් ලබා දුන්නා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විධායක සභාවේ සාමාජිකයකු හැටියට දීර්ඝ කාලයක් එතුමාගේ දැනුමෙන් පක්ෂයට සේවය කළා.

තීරණාත්මක මොහොතක, 1993 කාලයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලන ප්‍රවාහයට ප්‍රවිෂ්ට වූ අවස්ථාවේ සක්‍රීය ලෙස සහයෝගය දක්වලා එතුමියට මේ රටේ අගමැති ධුරයට පත් වෙන්නත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආණ්ඩුව හදන්නත් එතුමාගෙන් ලැබුණු දායකත්වය කැපී පෙනෙන ස්ථානයක තිබූ බව අපි සෑම කෙනෙක්ම දන්නවා. ඒ සේවයට ගරු කිරීමක් හැටියට එතුමා පොදුජන එක්සත් පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් කරලා, උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් කළා. මම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා, එතුමා උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළේ දිවංගත මගේ පියාණන් වූ ආචාර්ය රිවර්ඩ් පතිරණ ඇමතිතුමා සමඟ බව. රිවර්ඩ් පතිරණ ඇමතිතුමා පිළිබඳව මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගොඩනැගී තිබෙන මතවාදය කවර මට්ටමක තිබෙනවා ද, ඒ හොඳ නම රිවර්ඩ් පතිරණ ඇමතිතුමාට හිමිකර ගන්නට අතිවිශාල දායකත්වයක් දැක්වූයේ මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාය කියන එක මම ඉතා ගෞරවයෙන් මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ වාගේම, පසු කලෙක අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට සිටි ගරු රිවර්ඩ් පතිරණ මැතිතුමාට අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රතිපත්ති, තීන්දු තීරණ ගන්න අවශ්‍ය පිටුබලය, ශක්තිය ලබා දුන්නේ එවකට අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ දෙකේම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට සිටි මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමායි. ඒ නිසා තමයි එතුමාගේ කාලයේදී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රමාණය වර්ධනය වුණේ.

ඒ කාලයේ අග්නිදිග විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය ඇලුතින් ආරම්භ කරලා ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට එකතු කළා. ඒ විශ්වවිද්‍යාලවල පීඨ විශාල සංඛ්‍යාවක් පිහිටුවලා මේ රටේ උසස් අධ්‍යාපනය ලබන දරුවන්ට විශාල මෙහෙවරක් කරන්නට ඒ හරහා වරම් ලැබුණා. ඒ ගරුත්වය, ඒ කීර්තිය අපේ ආණ්ඩුවටත්, රිවර්ඩ් පතිරණ ඇමතිතුමාටත් කොපමණ ප්‍රමාණයකින් හිමි වෙනවාද, ඒ ගරුත්වය නොඅඩුවම මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාටත් හිමි විය යුතුයි කියන කාරණය අපි බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව අපි ඉතාම ගෞරව පූර්වකව සිහිපත් කරනවා. ඒ වාගේම එතුමාගේ දේශපාලන

දර්ශනය තවත් පරම්පරා ගණනාවකටම පරිශීලනය කරන්න හැකි වන පරිදි ග්‍රන්ථකරණයට ලක් කරලා මේ රටේ ඉදිරි පරපුර වෙනුවෙන් මාහැඟි මෙහෙවරක් ඉටු කළා. එහි ප්‍රතිඵල හැටියට එතුමා ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් ග්‍රන්ථ රාශියක් වාගේම පර්යේෂණ ලිපි රාශියකුත් නිකුත් කරලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එහි අතීතය සහ දේශපාලන දර්ශනය ගැන එතුමා ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථය එතෙක් මෙතෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳව ඉතාම ගැඹුරින් කරන ලද විග්‍රහයක් කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේ බොහොම පැහැදිලි, විශිෂ්ට මෙහෙවරක් එතුමා දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය වෙනුවෙන් ඉෂ්ට කළා. ඒ මෙහෙවර තවත් ඉදිරියට ගෙන යන්න එතුමාට හැකියාව ලැබුණා. 2007 වර්ෂයේදී උසස් අධ්‍යාපන කැබිනට් ඇමතිවරයා වශයෙන් පත් වෙලා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ 2010 ආණ්ඩුව අවසන් වනතුරුම එතුමා කැබිනට් ඇමතිවරයකු හැටියට එතුමාගේ වගකීම් ප්‍රමාණය ඉතාම ඉහළ මට්ටමින් ඉෂ්ට කළා.

ගරු කථානායකතුමනි, එතුමා බොහොම නිහතමානී මනුෂ්‍යයෙක්. දේශපාලන තනතුරු දරන කාලයේත්, ඒවා නොදරන කාලයේත් මහ පොළොවේ පය ගසා හිටපු දේශපාලනඥයකු හැටියට තමයි එතුමා කටයුතු කළේ. ඉතාම නිරහංකාරව, විනිවිද පෙනෙනසුලු භාවයෙන්, ගෞරවාන්විතව එතුමා කටයුතු කළා. අද මේ රටේ විවිධ ස්ථානවල සිදුවන වංචා, දූෂණ පිළිබඳව කථා වෙනවා. මා හිතන විධියට සෑම කෙනෙකුටම ආදර්ශයට ගන්න පුළුවන් විධියට විශිෂ්ට ආකාරයෙන්, විනිවිද පෙනෙනසුලු භාවයෙන් ඉතාම අවංකව කටයුතු කළ දේශපාලනඥයෙක් තමයි විශ්වා වර්ණපාල මැතිතුමා කියන්නේ. එතුමා වැනි දේශපාලනඥයන්ගේ අඩුව අදටත්, ඉදිරි කාලයටත්, මතු මත්තටත් වඩ වඩාත් දැනෙන වාතාවරණයක් තමයි අපේ රටේ මතු වෙමින් තිබෙන්නේ. එතුමා නිකුත් කළ ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන්, එතුමා විසින් කරන්න යෙදුණු විවිධ පර්යේෂණ පිළිබඳව නැවත විමසා බැලීමෙන්, මේ රටේ දේශපාලනය යහපත් මාර්ගයකට හසුරුවා ගන්නේ කොහොමද, වඩාත් හොඳ ආණ්ඩු ක්‍රමයක් මේ රටේ ස්ථාපනය කරන්නේ කොහොමද, වඩාත් හොඳ දේශපාලන ධාරාවක් අපේ මතු දවස වෙනුවෙන් මේ භූමියේ ස්ථාපනය කරන්නේ කොහොමද කියන කරුණු කාරණා පිළිබඳව අපට බොහොම පැහැදිලි වැටහීමක් ලබාගන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. එතුමාගේ ජීවන චරිතය පිළිබඳව, එතුමා කළ කටයුතු පිළිබඳව පසු විපරම් කිරීමෙන් අපට එම ආදර්ශ ලබාගන්න පුළුවන්.

අමාත්‍ය ධුරය දරනවාට අමතරව එතුමා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඇතුළු විවිධ කාරක සභා රාශියක සභාපති ධුරය ඇතුළු ඉහළ තනතුරු දරමින් මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඉතාම ඉහළ මට්ටමින්, නවමු මහකට යොමු කරන්න අවශ්‍ය කටයුතු කළා. ඒ පිළිබඳවත් අපි ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

එතුමාගේ දේශපාලන ජීවිතය පුරාවටම එතුමාට විශාල ශක්තියක් ලබාදුන් ගරු වර්ණපාල මැතිනිය, එම දරුවන් ඇතුළු සියලුදෙනාම එතුමාගේ ජීවිතයේ පශ්චිම භාගය ඉතාම සතුටින් ගත කරන්න අවශ්‍ය ශක්තිය ලබාදී තිබුණා. එතුමාගේ ජීවිතයේ අපි දුටු වැදගත්ම ලක්ෂණය මෙකයි. එතුමා ඉතාම සෘජුව කටයුතු කරන කෙනෙක්. කරන්න අවශ්‍ය දේ කෙළින් කරන, කියන්න අවශ්‍ය දේ කෙළින් කියන, හරි දේට ප්‍රශංසා කරන, වැරැදි දේට, "මේ කරුණ වැරැදියි" කියා කියන්න පුළුවන් මට්ටමේ ආත්ම ශක්තියක් තිබුණු කෙනෙක්. ඒ ආත්ම ශක්තියත් එක්ක තමයි එතුමා සදාකාලිකවම ජීවත් වුණේ.

එතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේ, අපි අදහන බුදු දහම අනුව එතුමාට අජරාමර නිවන් සුව අත්කර ගැනීමට හේතු වාසනා ලැබේවා! යි ප්‍රාර්ථනා කරමින්, එම මැතිනියටත්, දරුවන් ඇතුළු ඥාතීන් සියලුදෙනාටත් අපේ බලවත් සංවේගය පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 12.11]

ගරු ටී. බී. ඒකනායක මහතා (ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - காணி இராஜாங்க அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - State Minister of Lands)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ, එතුමා සතුවූ විශිෂ්ට ගුණාංග කීපයක් පිළිබඳව මතක් කරන්න මා කැමැතියි. 1936 වසරේ දෙසැම්බර් 26වැනි දා උපත ලැබූ එතුමා කෑගල්ල බෞද්ධ මිශ්‍ර විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා, වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා කෑගලු විද්‍යාලයට ඇතුළත් වුණා. එහිදී අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කළ එතුමා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත්ව 1964දී ආර්ථික විද්‍යා (විශේෂ) උපාධිය ලබාගත්තා. ඉන් අනතුරුව 1967 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියාවේ පීටර්ස් බර්ග් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා එක්සත් රාජධානියේ ලීඩස් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියද හිමිකර ගත්තා.

1964 වසරේ සිට 1994 දක්වා -පුරා අවුරුදු 30ක් මුළුල්ලේ- පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කරන්න මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට අවස්ථාව ලැබුණා. එතුමා 1994 වසරේදී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පිවිස, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළා.

එතුමා 1994 සිට 2000 වසර දක්වා කාලය තුළ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ තේරීම් කාරක සභාවේ, කාර්මික අධ්‍යාපන කාරක සභාවට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතන ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කොට වාර්තා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කාරක සභාවේ සභාපති ධුරය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ බලකායේ උප සභාපති ධුරය ආදී විවිධ වූ නිලතල රාශියක් දැරුවා. ඒ වාගේම 2001 සිට 2002 වසර දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිවරයා ලෙසත් එතුමා කටයුතු කළා.

විශේෂයෙන් අපි විපක්ෂයේ සිටින කාලයේ එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දැරණියගල මැතිවරණ කොට්ඨාසයේ සංවිධායකවරයා ලෙස කටයුතු කළා. ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් අධ්‍යාපන අංශයෙන් රට පුරා සම්මන්ත්‍රණ පවත්වාගෙන යෑමේදී එතුමා සිය කැමැත්තෙන් හැම මැතිවරණ කොට්ඨාසයකටම ගොස් "පංචමහා බලවේගය කොයිබටද?" කියන කාරණය පිළිබඳව පාක්ෂිකයන් දැනුවත් කළා. ඒ වාගේම,

[ගරු ටී. බී. ඒකනායක මහතා]

දේශපාලන ව්‍යාපාරය තුළ රටේ ආර්ථිකය හැඩගැසිය යුතු ආකාරය පිළිබඳව කිසිම ලේඛනයක් බලන්නේ නැතිව අඛණ්ඩව ඉතා ප්‍රියමනාප ලෙස ඉතා විචිත්‍ර වූ, හරබර වූ දේශන පවත්වමින් ඒ සම්මන්ත්‍රණවලට සහභාගිවෙලා වැඩ කටයුතු කළ කෙනෙක්. මට මතකයි, අපි විපක්ෂයේ ඉන්න කාලයේ මා නියෝජනය කරන යාපහුව මැතිවරණ කොට්ඨාසයේ රැස්වීම් ශාලා තිබුණේ නැහැ. සුජාතා චිත්‍රපට ශාලාවේ පැවැත්වූ සම්මන්ත්‍රණයකදී එතුමා පැය දෙකක දේශනයක් කළා. ඒ පැමිණි අය කිසිම හැලහොල්මනක් නැතිව ඒ විචිත්‍ර දේශනය අසා ගෙන සිටි ආකාරය මට මතකයි.

එතුමා තුළ කොච්චර දැන උගත්කමක් තිබුණත් පාර්ලිමේන්තුවේ සිටි නවක මන්ත්‍රීවරුන් සමඟ නිහතමානීව කථා කරමින්, ඔවුන්ගේ විවිධ පැහැදිලි කර ගැනීම් සඳහා උදව් වෙමින් කටයුතු කළ යුගය අපට මතක් වෙනවා.

විශේෂයෙන්ම පකිස්තානය, මාලදිවයින, නව දිල්ලිය, ජර්මනිය, කැනඩාව, චීනය, හංගේරියාව, පැරිසිය ආදී රටවල පැවැති විවිධ සමුළුවලදී ව්‍යක්ත ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් ඒ සමුළු අමතද්දී, ඉතිහාස පුරාවෘත්ත අරගෙන, ආර්ථිකයේ විවිධ හැඩතල අරගෙන, ඒ සමුළුවට සහභාගි වුණු ආයතනවල මුල්ම ඉතිහාසය අරගෙන කථා කළ ආකාරය එතුමා සමඟ ඒ සමුළුවලට සහභාගි වුණු නිලධාරීන් අපත් සමඟ සාකච්ඡා කර තිබෙනවා. ඒ දේශන අවසාන වුණාට පසු ඒ අය එතුමා ළඟට ඇවිල්ලා ප්‍රශංසා කළ ආකාරය, එතුමා පැසසුමට ලක් වූ ආකාරය ඒ සම්මන්ත්‍රණවලදී එතුමා දැක්වූ ශක්ති සම්පන්නභාවය පිළිබඳව ඒවාට සහභාගි වූ වෙනත් අයගෙන් අපට දැන ගන්න ලැබුණා.

ඒ විතරක් නොවෙයි, එතුමා ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලින් කෘති 25කට වැඩි සංඛ්‍යාවක්ද, විශේෂයෙන් දේශපාලන අර්බුද සහිත අවස්ථාවලදී තර්කානුකූලව ලියූ දේශපාලන ලිපි 150කට වැඩි සංඛ්‍යාවක්ද තිබෙනවා. විවිධ තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා ඒවා පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ තබා තිබෙනවා. එතුමා පාර්ලිමේන්තු සභා ගර්භයේ නොමැති අවස්ථාවල නිරන්තරයෙන් පාර්ලිමේන්තු පුස්තකාලය පරිහරණය කළා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු පුස්තකාලයේ තිබෙන ඉංග්‍රීසි භාෂාවෙන් පළ වුණු පොත්පත් තමයි වැඩියෙන්ම එතුමා පරිහරණය කළේ. ලෝකයේ අලුතින් නිකුත් වුණු පොත්පත් පිළිබඳව හැදෑරීම් කරලා, ඒවායේ සමහර කොටස් ඡායාරූපගත කර ගෙන, එහෙම නැත්නම් ඒවායින් සටහන් තබා ගෙන තමන්ගේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කළා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයකු, ඒ වාගේම ජාතික ලැයිස්තුවෙන් පත් වුණු මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය ඇමතිවරයකු, උසස් අධ්‍යාපන අමාත්‍යවරයකු විධියට පාර්ලිමේන්තුවේ කටයුතු කළ එතුමා, විශේෂයෙන්ම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්වරයා විධියටත්, අවසාන කාලයේ කොළඹ මහවැලි කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා විධියටත් කටයුතු කළා.

විශේෂයෙන් වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, එතුමා යටතේ පවතින ආයතනයක ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස පත් කරමින් එතුමාගේ දැනුම ලබා ගැනීම සඳහා කටයුතු කළා.

අවුරුදු 79ක් ආයු වළඳා 2016.02.27වැනි දින මෙලොවින් සමුගත් මෙතුමා පුරා වසර 12ක කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කළ සේවයත්, ඊට පෙර විශ්වවිද්‍යාල තුළ සහ ඉන් බාහිර විවිධ ආයතනවල තනතුරු දරමින් කරපු බුද්ධිමය සේවයත්, එතුමාගේ මැතිවරණ කොට්ඨාසයට කළ මහජන සේවයත්, මේ රටේ විවිධ ප්‍රශ්න මතු වූ අවස්ථාවල ඒවා නිවැරදි කිරීමේ කාර්යයන්ට දැක්වූ විචක්ෂණභාවය පිළිබඳවත් මේ රටේ හුඟක්දෙනා දැනුවත් වෙලා තිබෙනවා.

මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මම මේ අවස්ථාවේ එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත මාගේ සාතිශය ශෝකය දැනුම් දෙමින් එතුමාට නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.20]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව නියෝජනය කළ මහාචාර්ය විශ්ව වර්ණපාල මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝක යෝජනාව ගෙනෙන මේ අවස්ථාවේ අපට හුඟක් ළඟැඳිව සිටි විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳ වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම භාග්‍යයක් හැටියට මා සලකනවා.

විශ්වා වර්ණපාල මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙන්න කලින් ඔහු දැරූ දේශපාලන මතය ඉතාම ගැඹුරු වාමවාදී මතයක්. කෑගල්ලේ ගමේ පාසලේ අධ්‍යාපනය ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ පසුව ගමේදී ඔහුට ලැබුණු පන්නරය, වාමවාදී අදහස්, වාමවාදී චින්තනය, වාමවාදී සංවිධාන ස්වරූපය ඔහු සරසවිය තුළත් ගෙන ගියා. සරසවිය තුළ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ශිෂ්‍ය ව්‍යාපාරයට සම්බන්ධ වී මේ ලෝකය වෙනස් කිරීමට අලුත් මහක් අධ්‍යයනය කරපු, ඒ වෙනුවෙන් කැප වුණු කෙනෙක් තමයි විශ්වා වර්ණපාල මැතිතුමා. එතුමා නිකම්ම නිකම් බුද්ධිමතෙක් නොවෙයි. ගැඹුරු අදහස් තිබුණු, සමාජ පරිවර්තනය පිළිබඳ නිවැරදි දැක්මක් ඇතිව එම වෙනස්කම් සඳහා කැප වූ චරිතයක්. දොස්තර වික්‍රමසිංහ මැතිතුමා පිළිබඳව; පීටර් කෙනමන් මැතිතුමා පිළිබඳව; අපේ පුරෝගාමියෙකු වූ උඩකැන්දවල සිරිසරණංකර හිමියන් පිළිබඳව එතුමා ඉතා විශාල බැඳීමකින් හිටියා. එතුමා මේ සියලුදෙනාගේම ගුරුහරුකම්, ආදර්ශයන් ලබා ගත් කෙනෙක්.

මම පාර්ලිමේන්තුවට පැමිණි පළමුවැනි අවස්ථාවේම මට නියෝජ්‍ය ඇමැති පදවියක් ලැබුණා. මම ඒ වේලාවේ තනතුරු ගැන හිතුවේ නැහැ. ගරු කථානායකතුමනි, විශ්වා වර්ණපාල මැතිතුමා, ඒ.වී. සුරවීර මැතිතුමා යන දෙදෙනා මේ පාර්ලිමේන්තුවේ මගේ දෙපැත්තේ වාඩි වී සිටි අය. මේ දෙදෙනාම ඇවිදින පුස්තකාල වාගේ. විශ්වා වර්ණපාල මැතිතුමාට තිබුණු දේශපාලන දැනීම, විවිධ ක්ෂේත්‍ර පිළිබඳ තිබුණු පිරුණු බව උපයෝගී කරගෙන එතුමා පාර්ලිමේන්තුව තුළ සිටින කෙටි වේලාව තුළ අපේ දැනුම මුවහත් කෙරුවා. එතුමා මට කිව්වේ, "මම පාර්ලිමේන්තු එන්න බලාගෙන දේශපාලනය කරපු කෙනෙක් නොවෙයි. සමාජ වෙනස්කම් පිළිබඳ පර්යේෂණාත්මකව ක්‍රියා කරමින් අනාගත පරම්පරාව වෙනුවෙන් යහපත් සමාජයක් නිර්මාණය කරන්නයි මම මගේ දේශපාලන දැක්ම පරිවර්තනය කළේ. කොමියුනිස්ට් පක්ෂයෙන් උකහා ගත් දේ සමාජගත කරන්නයි මම බලාපොරොත්තු වන්නේ. නමුත්, අප බලාපොරොත්තු වන තැනට මේ සමාජය ගෙන යන එක ලෙහෙසි නැහැ" කියන එකයි. එතුමා තනතුරු සඳහා දේශපාලනය කරපු කෙනෙක් නොවෙයි. එතුමා දේශපාලනය කිරීම සඳහා තනතුරු පාවිච්චි කරපු කෙනෙක්.

ඒකට එක හේතුවක් තිබෙනවා. එතුමා ලියපු කෘති අරගෙන බැලුවොත්, ඇත්ත වශයෙන්ම ඒවා තුළ තිබෙන ගැඹුර හා පර්යේෂණාත්මක ස්වභාවය ඉතා ඉහළයි. දේශපාලනයට යොමු වී පාර්ලිමේන්තුවට එන්න අදහසක් තිබුණා නම්, ඒ තරම් කාලයක් එතුමාට ඒ සඳහා යොමු කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

විශ්වා වර්ණපාල මැතිතුමා අවසාන වශයෙන් උඩකැන්දවල සිරි සරණංකර හාමුදුරුවන් ගැන පොතක් ලිව්වා. එය, ඉතාම කුඩා පොතක්. "අධිරාජ්‍ය විරෝධී අරගළය හා භික්ෂු දේශපාලනය" නම් ඒ පොතෙහි උඩකැන්දවල සිරි සරණංකර හිමියන්ගේ කාර්ය භාරය ගැන තමයි සඳහන් වෙන්නේ. එය, ඉතාම කුඩා පොතක්. අවසාන කාලයේ තමයි එය ලිව්වේ. එතුමා තුළ තිබුණු අධිරාජ්‍ය විරෝධී හැඟීම් සහ ඒ වෙනුවෙන් කැප වුණු සමාජ නායකයන් පිළිබඳව විශ්ලේෂණාත්මක ඇගයීමක් සිදු කළ යුතුය කියන මතය තුළ ඉඳිමින්, සිරි සරණංකර හාමුදුරුවන් පිළිබඳව අගය කිරීමක් කරලා කවුරුවත් එහෙම සාර්ථක පොතක් ලියා නැහැ කියලා තමයි එතුමා එම පොත් පිංච ලියා තිබෙන්නේ. එම පොත පාර්ලිමේන්තු පුස්තකාලයේත් තිබෙනවා.

එතුමා භාර ගත් හැම විෂයක්ම ඉටු කරන්න පුළුවන් නායකයෙක් කියා මා කියන්න කැමැතියි. එතුමා වගකීම් රාශියක් මේ පාර්ලිමේන්තුවේ දැරුවා; අමාත්‍ය ධුර රාශියක් හෙබවුවා. ඒ අමාත්‍ය ධුර රාශිය හොබවන අවස්ථාවේ එතුමාට පුළුවන් උපරිම කැපවීමකින් එතුමා එම කටයුතු ඉටු කළා. ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ අගය කළ හැකි චරිත ලක්ෂණ තිබුණු, විනයගරුක දේශපාලනඥයකු විධියට හැසිරුණු, තමන්ගේ පිරුණු අදහස් මේ පාර්ලිමේන්තුව තුළ සංවාදයට ලක් කරපු, මෑත යුගයේ බිහි වුණු අහඹු දේශපාලන චරිතයක් විධියට එතුමාව හඳුන්වන්න පුළුවන්. එහෙම දේශපාලන චරිත අපට සොයා ගන්න හරි අමාරුයි. එතුමා යම් කථාවක් කළොත්, අපට ඒ තුළ ඉගෙන ගැනීමට හුඟාක් දේ තිබුණා. එවැනි නායකයකුගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේ පෞද්ගලිකව මාගේත්, අපේ පක්ෂයේත් ශෝකය පළ කරනවා.

විශ්වා වර්ණපාල මැතිතුමාට කරන්න තිබෙන ගෞරවය නම් එතුමා මේ පාර්ලිමේන්තුවේ ගෙන ගිය ඒ ඓතිහාසික වැදගත්කමින් යුත් මතවාදයන් සමාජගත කරන එකයි. ඒ වාගේම දිය සෙලවෙන්නේ නැති පිරුණු කළයක් වාගේ කොපමණ දැනුම තිබුණත් ආඩම්බර නොවී ඉතා නිහතමානීව මහාචාර්යවරයෙක් විධියට ඔහු කරපු සේවාව ඇත්ත වශයෙන්ම අනෙක් අයගෙනුත් ඉටු වෙනවා නම්, එයත් ඔහුට කරන ගෞරවයක් හැටියට සලකමින් එතුමාගේ අභාවය වෙනුවෙන් මගේ ශෝකය එතුමාගේ පවුලේ සියලු දෙනාටම දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද අමරවීර මැතිතුමා. එතුමාගේ කථාවට අවස්ථාව ලබා දීමට ප්‍රථම, යම් කරුණක් සම්බන්ධව ගරු සභාවේ අදහස් විමසන්නට මා කැමැතියි. මෙතුමාගේ කථාවෙන් පසුව තව කථිකයන් තිදෙනෙකුගේ නම් කථික ලැයිස්තුවේ තිබෙනවා. ගරු සභානායකතුමාත්, ගරු සභාවත් එකඟ නම්, අපට ඒ කථිකයන් තිදෙනාට අවස්ථාව ලබා දීමෙන් පසුව දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත් නිටුවන්න පුළුවන්. එහෙම නැත්නම් ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ කථාවෙන් පසුව දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත් නිටුවන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අනෙක් කථිකයන් තිදෙනාටත් අවස්ථාව දෙමින් අපි දිගටම සභාවේ කටයුතු පවත්වා ගෙන යමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මහින්ද අමරවීර මැතිතුමා.

[අ.භා. 12.27]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, මහාචාර්ය ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳව බොහෝ කරුණු-කාරණා කිව යුතුව තිබුණත්, කිව හැකිව තිබුණත් මම ඒ සඳහා වැඩි වේලාවක් ගන්න යන්නේ නැහැ. මොකද, අතිගරු ජනාධිපතිතුමාත්, අපේ අමාත්‍යවරුත්, මන්ත්‍රීවරුත් එතුමා පිළිබඳව කරුණු-කාරණා රාශියක් ඉදිරිපත් කළා.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු මිය ගියාම, අපි සම්ප්‍රදායක් විධියට සාමාන්‍යයෙන් මේ වාගේ ශෝක යෝජනා ගෙනෙනවා. සමහර දේශපාලනඥයන් මිය යෑමට ආසන්න කාලය වෙන කොට, නැත්නම් ඊට පෙර තමන්ගේ කාලය තුළ අසාර්ථක වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම බොහෝ අවස්ථාවන්වල වෝදනාවලට ලක් වෙලා තිබෙනවා. බොහෝ අවස්ථාවන්වල වැරදිකාරයන් බවට පත් වුණු අයත් ඉන්නවා. අපේ ස්වාමීන් වහන්සේලා සෑම කෙනෙකුගේම අවසාන මොහොතේ -පාංශුකූල අවස්ථාවේදී- නරක දේවල් කියන්නේ නැතුව හොඳ දේවල් විතරක් දේශනා කරනවා. ඒ වාගේම අපි පාර්ලිමේන්තුවේදීත් සාමාන්‍යයෙන් නරක දේවල් ටික අත හැරලා හොඳ දේවල් පිළිබඳව තමයි බොහෝ වේලාවට කථා කරලා තිබෙන්නේ. නමුත් මට නොබියව කියන්න පුළුවන්, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා පිළිබඳව අපට කිසිම චකිතයක් නැතුව, කිසිම සැකයක් නැතුව කථා කරන්න පුළුවන් බව. එතුමා මහත්මයෙක්, ගෞරවනීය කෙනෙක් වාගේම හොඳ දේශපාලනඥයෙක් කියලා අපට බය නැතුව කියන්න හැකියාව තිබෙනවා.

මා එතුමා දැනහැඳින ගත්තේ, මට එතුමා දකින්න ලැබුණේ බලය තිබෙන වෙලාවේ නොවෙයි, අපට බලය නැති වෙලාවල. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපි තරුණයන් විධියට දේශපාලනය

[ගරු මහින්ද අමරවීර මහතා]

ආරම්භ කරන මොහොතේ අපව දැනුවත් කරන වැඩසටහන් රාශියකට එතුමා ඇවිල්ලා, දේශන කළා. තරුණයන් විධියට දේශපාලනයේ හැසිරෙන විධිය, ජාතික දේශපාලනය, ඒ වාගේම ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳව බොහෝ කරුණු කාරණා එතුමාගේ දේශනවල සඳහන් වුණා. ඒ වාගේම එතුමාගේ මතයක් තිබුණා. ඒ තමයි එතුමා වමේ දේශපාලනය නියෝජනය කිරීම. එතුමා ඒ දේශපාලනය වෙනුවෙන් ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න සූදානමින් හිටපු නායකයෙක්. එතුමා තනතුරු, වරප්‍රසාද පසුපස ගිය කෙනෙක් නොවෙයි. එතුමාට අමාත්‍යාංශ කිහිපයක කටයුතු කරන්න ලැබුණා, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට. ඒ වාගේම එක කාලයක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විධියට කටයුතු කළා. විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ, ඒ කාල පරාසය තුළ එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයට ඇවිල්ලා තංගල්ලේ උසස් තාක්ෂණ ආයතනය බිහි කළා. විශාල පිරිසක් අදටත් ඒ ආයතනයෙන් විශාල සේවාවක් ලබන බව අපි හොඳටම දන්නවා. ඒ වාගේම වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කටයුතු කරන්න ලැබුණු හැම අවස්ථාවකම එතුමා ඒ වෙනුවෙන් ඉතා පැහැදිලි සැලැස්මක් සහිතව එතුමාගේ දක්ෂතාව, දැනුම උපයෝගී කරගෙන තමයි ඒ කටයුතුවලට මැදිහත්වීම කළේ.

ඒ වාගේම ඒ කාලපරාසය තුළ එතුමා විශ්වවිද්‍යාල ජීවිතය ගැන බොහොම රස කථා අපට කියලා තිබෙනවා. එතුමා පාර්ලිමේන්තුවට ආවාම ලොබියේ තිබෙන ආසනයක ඉඳගන්නවා. අපි ගිහිල්ලා එතුමා ළඟින් වාඩි වෙනවා. "කොහොමද, සර්?" කියලා ඇහුවාම බොහොම මිත්‍රශීලීව අපේ අතින් අල්ලා ගන්න ගතියක් එතුමාට තිබුණා. අපි ආධුනිකයන් වශයෙන් සිටියත් විශ්වා වර්ණපාල මැතිතුමා ගැන බොහොම කුළුපග බවක් අපට තිබුණා. එතුමා විශ්වවිද්‍යාල ජීවිතයේ රස කථා, සිදුවීම් සහ පොත පත කියවීමෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ලබාගත් තොරතුරු පිළිබඳ කරුණු බොහොමයක් අප ඉදිරියේ ප්‍රකාශ කරන්නට කැමැති වුණා. එතුමා එහා පැත්තේ ලොබියේ තිබෙන පුටු සෙටියේ වාඩි වෙනවා. මට තවමත් මතකයි, දැනුත් අපි එතැන ඉඳලා ආවේ. එතුමා වැඩිපුරම සිටින පුටුවක් තිබෙනවා. එතැන තමයි එතුමා ඉන්නේ. ඒ වටේට අපි කණ්ඩායම වාඩි වෙන්න තිබෙන අසුන්වල වාඩි වෙනවා. ඉඩ නැත්නම් හිටගෙන ඉන්නවා. එහෙම ඉඳගෙන බොහොම විහිළු තහළු කරමින් ඉතාම කුළුපගව කතාබහ කරනවා. එතැනදී එතුමා මහාචාර්යවරයෙක් විධියට හැසිරුණේ නැහැ. එතැනදී අනික් අයත් එක්ක බොහොම මිත්‍රශීලීව හැසිරෙමින් සුන්දර මනුෂ්‍යයෙක් විධියට එතුමා කළ ඒ කාර්යයන් පිළිබඳව අදත් අපේ හිත්වල පැලපදියම් වෙලා තිබෙනවා.

එතුමාගේ දේශපාලන ජීවිතයේ අවසාන භාගය වෙනකොට එතුමා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක්ක බොහොම සුහදව සිටියා. මුල් කාලයේ ඉඳලාම එතුමා අපේ ජනාධිපතිතුමාත් එක්ක බොහොම සමීප බවක් තිබුණා; හිතවත්කමක් තිබුණා; ළෙන්ගතුකමක් තිබුණා. ඒ නිසාම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් ධුරය -ඒ වෙලාවේ යම් අර්බුදකාරී තත්ත්වයක් තිබුණු වෙලාවක්- එතුමාට පිරිනැමුවා. සාමාන්‍යයෙන් අපි දන්නවා, විශ්වාසවන්තම කෙනෙකුට තමයි එම තනතුර ලබාදිය යුතු වෙන්නේ කියලා. මොකද, ඒ වෙලාවේ අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනාගේ පත්කිරීම්, ඉවත් කිරීම් පිළිබඳ තීන්දු තීරණ ගන්නා තනතුර තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් ධුරය. ජනාධිපතිතුමා එතුමාට සිටි විශ්වාසවන්ත පුද්ගලයා විධියට මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට තමයි ඒ ලේකම් ධුරය ලබා දුන්නේ. ලේකම් ධුරය ලබා දුන් අවස්ථාවේ එතුමා ඒ ධුරයේ කටයුතු කළ කාලය තුළ ඉතාමත් අවංකව, ඉතාමත් කැපවීමෙන් හා වගකීමෙන් ඒ කාර්යයන් ඉටු කළා. ඒ සියලු දේවල් සාර්ථක කර ගන්න එතුමාට පුළුවන්කම ලැබුණා. එතුමාගේ එක හොඳ ලක්ෂණයක් මා දන්නවා. ඕනෑම නායකයෙක්ගේ වැරැද්දක් මුහුණට කියන්නට තරම් ශක්තියකින් යුතුව එතුමා කටයුතු කළා. ප්‍රසිද්ධියේ නොවෙයි, ප්‍රශ්න ඇතිවුණු වෙලාවල එතුමා ඒ විධියට කටයුතු කළා. මම දන්නවා, එතුමා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් එක්ක ළඟින් කටයුතු කළ අවස්ථා ගැන. ඊටපසුව ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟත්, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟත් ළඟින් කටයුතු කළා. ඒ බොහෝ අවස්ථාවල එම නායකයන් ළඟට ගිහිල්ලා, එතුමාගේ දැනීම අනුව කටයුතු කළා. මොකද, රටේ තොටේ වෙන දේ පිළිබඳව අවබෝධයක්, ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව වැටහීමක් එතුමාට තිබුණු නිසා.

විශේෂයෙන්ම උගත්, බුද්ධිමත් සමාජයේ අදහස එතුමා ඒ නායකයන්ට හැම වෙලාවේම ප්‍රකාශ කළ බව අපි දන්නවා. ඒවා පිළිපැද්දා ද, නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්. නමුත්, ඒ අදහස් ඉදිරිපත් කළා. මොකද, මමත් ඒ අවස්ථාවල හිටියා. එතුමා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට එසේ ඉදිරිපත් කළ සමහර කාරණා සම්බන්ධව අවධානය යොමු කරලා ක්ෂණික තීන්දු ගත් අවස්ථා තිබෙන බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපේ රටේ දේශපාලනඥයා -මා පෙර කී පරිදිම- මිය ගියාට පසුව සාමාන්‍යයෙන් සම්ප්‍රදාය තමයි "ශෝක ප්‍රකාශයක්" නිකුත් කිරීම. මා විශ්වාස කරන දෙයක් තමයි අවංකව, හිතට එකඟව අද අපට එතුමා පිළිබඳ කියන්න ලැබුණා. එතුමා ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක් විධියට අනෙක් අයටත් ආදර්ශයක් ගන්න පුළුවන් විධියේ යමක් ඉතිරි කරලායි මිය ගියේ.

මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට කවුරුවත් කියන්නේ නැහැ, "හොරෙක්" කියලා. මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට කවුරුවත් කියන්නේ නැහැ, "අදක්ෂයෙක්" කියලා. එතුමාට කියන්නේ නැහැ, "එතුමා අමාත්‍ය ධුර දරන කාලයේ අකාර්යක්ෂම කෙනෙක්" කියලා. එතුමාට කියන්නේ නැහැ, "එතුමා තනතුරු දරන කාලයේ අසාර්ථක වුණු පුද්ගලයෙක්" කියලා. ඒවා තමයි දේශපාලනඥයෙක් විධියට ලබන්න පුළුවන් දේවල්. අපේ සමහර අය කල්පනා කරනවා, තමන්ගේ දේශපාලනය අවසන් වන විට බොහෝ ධනස්කන්දයක් රැස් කර ගෙන තිබෙන්න ඕනෑ කියලා. ඒක තමයි සමහර වෙලාවට හිතන්නේ. ඊට එක් හේතුවක් මේ ඡන්ද ක්‍රමය වෙන්න පුළුවන්. ඡන්දයට ඉදිරිපත් වෙනකොට විශාල මුදලක් වැය කරන්න ඕනෑ. එතකොට හිතනවා, ඒ මුදල වැය කරලා බලයට ආවාම, තනතුරුවලට ආවාම පළමුවෙන්ම කරන්නේ වියදම් කළ මුදල හොයා ගන්න වැඩ පිළිවෙළවල් සකස් කිරීමයි. තමන්ට මැතිවරණයට ගිය වියදම හොයා ගන්න අමාත්‍යාංශ තුළ සැලසුම් සකස් කරනවා. ඊටපසුව මොකක්ද වෙන්නේ? ඒක සැලසුම් වුණාට පසුව හිතනවා, ඊළඟ සැරෙත් මැතිවරණයක් එනවා, ඒකටත් හරියන්න සල්ලි හොයා ගන්න ඕනෑ කියලා. ඒකට තමයි ඊළඟට මහන්සි වෙන්නේ. ඒකත් අවසන් වුණාම හිතන දේ තමයි දැන් මේ තනතුරෙන් පැරදුණොත් ඊළඟට මම ජීවත් වෙන්නේ කොහොමද කියලා. අන්තිමටම බැලුවාම හුඟාක් දේශපාලනඥයන් බොහොමයකට අද චෝදනා එල්ල වෙන්න හේතු වුණු කාරණයක් තමයි, මුළු කාලයේම තමන්ගේ පැවැත්ම වෙනුවෙන් යම් යම් දේවල් ඉතිරි කර ගන්න උත්සාහ දැරීම. හැබැයි, එහෙම තත්ත්වයක් තුළ ඒ අය රටට කරන කාර්යයන් බොහොම අඩු වෙනවා. නමුත් විශ්වා වර්ණපාල මැතිතුමා ගැන මට නොබියව කියන්න පුළුවන් එතුමා ලබා ගත් දැනුමෙන් එතුමා හරිහම්බ කර ගත් දේවල් හැරුණාම එතුමා ඡන්දයක් කරන්න ඉතිරි කළෙත් නැහැ, ඒ වාගේම ඡන්දයෙන් පසුව ජීවත් වෙන ආකාරය පිළිබඳ තමන්ගේ තනතුරු උපයෝගී කරගෙන හරිහම්බ

කර ගත්තෙත් නැහැ කියලා. දේශපාලනඥයෙක් විධියට කිසිම වංචාවකට, දූෂණයකට සම්බන්ධ වෙන්න අකමැති වෙච්ච කෙනෙක් විධියට කිසිම දෙයක් හොයා ගත්තු නැති කෙනෙක් විධියට තමයි මම විශ්වා වර්ණපාල මැතිතුමා දකින්නේ. එම නිසා එතුමා අපට, අපේ පක්ෂයට මහත් ආඩම්බරයක්; ඒ වාගේ පුද්ගලයන් සිටීම අපේ සන්ධානයට මහත් ආඩම්බරයක්.

මම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වර්තමාන ලේකම්වරයා විධියට කියන්න ඕනෑ, එතුමා වාගේ ඉහළ, උගත්, බුද්ධිමත්, පරිණත වාගේම රටට ආදරය කළ, අපේ පක්ෂයට ආදරය කළ නායකයකුගේ පුටුවේ මට ඉඳ ගන්න ලැබීම මහත් ආඩම්බරයක් විධියට මම සඳහන් කරන්න කැමැතියි. එතුමාගේ අභාවය පිළිබඳ එම මැතිනියට, එම දරුවන්ට, ඒ වාගේම ඒ පවුලේ සියලුම දෙනාට අපේ ශෝකය පළ කරන අතර එතුමාට අමා මහ නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

[අ.භා. 12.37]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, සබරගමු ප්‍රදේශයෙන් අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, දේශපාලන ක්ෂේත්‍රයටත් අනුපමේය සේවාවක් ඉටු කළ මහාචාර්ය විශ්වා වාර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ගෙනා ශෝක යෝජනාවට එකතු වන්නේ දැඩි හැඟීමකින් යුතුවයි. මක්නිසාදයත්, එතුමා සාමාන්‍ය පවුලක අති දක්ෂ දරුවෙක් ලෙස ඉපදිලා, බහුවිධ කුසලතා රාශියක් නිර්මාණය කරගෙන විද්වතෙක් ලෙස, ග්‍රන්ථ කර්තෘවරයෙක් ලෙස, දේශකයෙක් ලෙස, ගුරුවරයෙක් ලෙස හා දේශපාලනඥයෙක් ලෙස විවිධ භූමිකාවන්හි, අපේ රටේ ඉතිහාසයේ ගමන් මග වෙනස් වෙන අවස්ථාවලදී හෘද සාක්ෂියට එකඟවත්, අවංකවත් ස්වකීය මෙහෙවර ඉටු කරන ලද නායකයෙක් විධියට අපි දකින නිසයි. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන අවධියේ අපේ රටේ ඉතාමත් ප්‍රබුද්ධ දේශපාලන සංවාද ඇතිවෙන වටපිටාවක් ලංකාවේ ප්‍රථම විශ්වවිද්‍යාලය වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ නිර්මාණය වෙලා තිබුණා.

නාට්‍ය කලාව ඇතුළු සංස්කෘතික ක්ෂේත්‍රවලත්, දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රවලත් විවිධ ප්‍රවාහයන් පිළිබඳ ප්‍රබුද්ධ සංවාද මණ්ඩපයක් බවට වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලය පරිවර්තනය වෙලා තිබුණා. ඒ නිසා ලංකාවේ සෑම දේශපාලන නායකයෙකුටම දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිදහසේ කථා කරන්න, සාකච්ඡා කරන්න, සම්මන්ත්‍රණ තියන්න පුළුවන්කම ලැබීමෙන් ප්‍රබුද්ධ සංවාද මණ්ඩපයක් බවට විශ්වවිද්‍යාලය පත් වෙලා තිබුණා. පසු කාලයේදී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තමන් දරන දේශපාලන මතය හැර වෙන මතයක් දරන සියලු ආචාර්යවරු, සියලු ශිෂ්‍යයන් ඇතුළු අනෙකුත් සියලුදෙනාත් තර්ජනයට, ගර්ජනයට පමණක් නොවෙයි, මරණයටත් ලක් වීමේ අප්‍රබුද්ධ දේශපාලනයක් විශ්වවිද්‍යාල තුළ ක්‍රියාත්මක වුණා. එම නිසා එවැනි විද්වතුන් පසු කාලයේදී බිහි වුණේ නැහැ. හැබැයි, ප්‍රබුද්ධ දේශපාලන සංවාද ඇති වන පේරාදෙණියෙන් බිහි වෙලා ඒ විශ්වවිද්‍යාලයේම ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව කියන විෂයයන් දෙකේම ප්‍රාමාණික බුද්ධිමතෙක් ලෙස ඉතා ඉහළ දායකත්වයක් සපයන්නට විශ්වා වර්ණපාල මැතිතුමාට පුළුවන්කම ලැබුණා.

අද දවසේ දේශපාලන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව විෂයයන් දෙකක් ලෙස හැදෑරෙනවා. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය ප්‍රචලිත වූ කාලයේ දේශපාලන ආර්ථික විද්‍යාව කියන්නේ, එක විෂයයක්. අද එය එක විෂයයක් නොවීම නිසා, දේශපාලනය වෙනමත් ආර්ථික විද්‍යාව වෙනමත් දැකීමෙන් සමාජ ප්‍රශ්න විසඳීම සඳහා වන උත්සාහයේදී ද්වි ගට්ටනයක් තිබෙනවා. මොකද, දේශපාලන විද්‍යාව හදාරපු අය දේශපාලන කෝණයෙන් පමණයි ප්‍රශ්න දකින්නේ. ආර්ථික විද්‍යාව හදාරපු අය ආර්ථික විද්‍යා කෝණයෙන් පමණයි ප්‍රශ්න දකින්නේ. නමුත්, විශ්වා වර්ණපාල මැතිතුමා මේ අංශ දෙක පිළිබඳවම ප්‍රාමාණික උගතෙක් ලෙස -ආර්ථික විද්‍යාව පිළිබඳවත්, දේශපාලන විද්‍යාව පිළිබඳවත් ප්‍රාමාණික උගතෙක් ලෙස- විවිධ පතපොත නිර්මාණය කරලා, එතුමාගේ අදහස් ලෝකයට බෙදා දෙන්නත්, ඒ අදහස් අනාගත පරම්පරාවට ප්‍රයෝජනයට ගැනීම සඳහා දැනුම් ගබඩාවක් ලෙස ගබඩා කර තබන්නත් උත්සාහයක් දැරුවා. හොඳ දේශකවරයෙක්, ශිෂ්‍යයන්ගේ ආදරය දිනා ගත්ත දේශකවරයෙක්, සාර්ථක දේශපාලනඥයෙක් නොවන්නට පුළුවන්. සාර්ථක දේශපාලනඥයෙක් වේදිකා කථිකයෙක්, පාර්ලිමේන්තු කථිකයෙක් නොවන්න පුළුවන්. එවැනි කථිකයෙක් ග්‍රන්ථකරණයේ යෙදෙන තැනැත්තෙක් නොවන්න පුළුවන්. එවැනි එකිනෙකට වෙනස් භූමිකාවන් තුළ ඉතාම විශිෂ්ට ගණයේ ආදර්ශයක් දෙන නායකයෙක් ලෙස එතුමා අපටත්, රටටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, ප්‍රගතිශීලී ව්‍යාපාරයටත්, ලංකාවේ පාර්ලිමේන්තුවටත් ඉමහත් සේවාවක් ඉෂ්ට කළා. ඒ කාලපරිච්ඡේදයන් තුළදී පෞද්ගලික පිරිවැය, පෞද්ගලික ප්‍රතිලාභ ගැන කිසිම තැකීමකින් තොරව, වෙනත් පෞද්ගලික වාසියක් වෙනුවෙන් තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළ අබ මල් රේණුවක තරමින්වත් වෙනස් නොකළ නායකයෙක් ලෙස තමයි අපි එතුමාට ගරු කරන්නේ.

1989 මම පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේදී එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් ඒ අවධියේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ හිටියා. ඒ කාලයේදී අපි පාර්ලිමේන්තු විවාදවලට සහභාගි වුණේ බලගතු එක්සත් ජාතික පක්ෂ රජයක් එක්ක. කරුණු හොයාගෙන, කරුණු හදාරලා, කරුණු හා දත්ත සටහන් සහිතව තමයි ඇවිල්ලා කථා කළේ. පාර්ලිමේන්තුවේ නැති, එළියේ සිටින බුද්ධිමතෙක් ලෙස එතුමා මට දුරකථනයෙන් කථා කරලා නිතරම කියූ දෙයක් තමයි, "ඔබතුමා සූදානම් වෙලා ඇවිල්ලා ඒ කියන කරුණු සාධාරණ ලෙස ඉදිරිපත් කරනවා. ඒ කරන කථා පොතක් විධියට මුද්‍රණය කරන්න." කියලා. මෑත ඉතිහාසයේ පාර්ලිමේන්තු තුළ අපි එහෙම විවාදයක් අහලා නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් එකඟ වනවා ඇති, 1980 ගණන්වල ඉතාම ප්‍රබුද්ධ විවාද මණ්ඩපයක් බවට මේ පාර්ලිමේන්තුව පත් වෙලා තිබුණා. ඒ කාලයේ අපට විවිධ දේ පිළිබඳව උපදෙස් ලබා දුන්නා. රටේ අනාගත පරපුරට ප්‍රයෝජනවත් වන ලෙස හැන්සාඩ් වාර්තාවකට ඇතුළත් වෙන්න ඕනෑ වැදගත් කරුණු වඩා හොඳින් කථා කරන්න කියන උපදෙස් දීම එතුමා කළා. එතුමා හොඳ ගුරුවරයෙක්. එතුමා අපටත් ගුරුවරයෙක් වුණා; රටටත් ගුරුවරයෙක් වුණා; පාර්ලිමේන්තුවටත් ගුරුවරයෙක් වුණා. ඒ ආදී වශයෙන් විශාල බුද්ධිමය දායකත්වයක් සපයලා, ඒ වෙනුවෙන් පෞද්ගලික ආර්ථික වාසි නොලබා, රට වෙනුවෙන් සේවය කර දිවංගත වූ උතුම් මිනිසෙකුට අපගේ ගෞරවය හා ප්‍රණාමය පුද කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුලේ දුවා දරුවන්ට අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, මාගේ වචන කිහිපය අවසන් කරනවා.

[12.44p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Bismillahir Rahmanir Raheem.

Hon. Speaker, sometimes intellectuals entering politics is very hazardous, but their contribution in assemblies is something that all of us appreciate. Although they belong to some party or the other, their observations most of the time are bereft of politics; they speak of ideal political utopian systems.

The late Hon. Prof. W.A. Wiswa Warnapala was a towering intellectual who entered this House way back in 1994. I had the privilege of entering politics or entering this Parliament in the same year and we all benefited from such personalities who were professors. We had Prof. A.V. Suraweera along with Wiswa and also Prof. G.L. Peiris. Their contribution in the House in every Debate, if you can go back to the Hansard and look at what they have said, you will find that they are very worthy of reading. This is what my learned Friend, the Hon. Bandula Gunawardane, said a while ago. Let me also give him my advanced wishes for getting his doctorate in a month's time. We are adding to the long list of intellectuals in the House another learned Colleague, the Hon. Bandula Gunawardane, who himself has a string of students in the country, whom he has coached and taught Economics. So, we are benefited by the contributions of all these people.

The late Hon. Prof. Wiswa Warnapala was a multifaceted individual. He simply did not stick to his own political ideology. He studied the way in which Left politics impacted in the social reformation of our country and its national politics. We know, during the imperialist times, it was the labour movement that was virtually turned into political parties. Then, after Independence, we had the birth of Mahajana Eksath Paramuna originally and thereafter the Sri Lanka Freedom Party. Everybody knew Prof. Wiswa Warnapala as a dedicated party man. Having entered the Sri Lanka Freedom Party in the mid 1960's, he had been a faithful of the party, who had gone through all the ups and downs of the party's fortunes in the national politics. But, he had the good fortune of entering Parliament in 1994, when President Chandrika Bandaranaike Kumaratunga recognized his contribution both to the intellectual domain of this country as well as to the party itself and appointed him through the National List.

We have several of them who have written many books, manuals and articles, but when you look at Wiswa's contribution, I do not think anybody else could claim that they are much better than he is, because he has written in such different, multifaceted areas.

Particularly, I observed his contribution in the Committee on Public Accounts of Parliament. As a Member and the Chairman of the Committee on Public Accounts, he was somebody who had studied very deeply the oversight functions of Parliament and the need to improve the Parliamentary oversight of public finance. I believe, he, in fact, he even wrote a book on the role of Public Accounts Committee of Parliament and how things should be introduced to improve its oversight functions.

He also looked at the civil service in the country and wrote books on the improvement of civil service and its contribution to the administration of the country. He contrasted our civil administration with that of the civil service during the imperialist times. He looked at it from a regional perspective and contrasted it with civil service in the rest of the regions. So, we had almost a bird's-eye view of every subject when we read his writings, his books and his researches.

So, we have, in fact, in losing the Hon. (Prof.) Wiswa Warnapala, a big void in this House. His knowledge was such that he dealt with even personalities. I remember he once wrote about Dr. N.M. Perera, a towering left politician this country had produced, and his personality was studied in depth. He also looked at certain other revolutionary leaders as well. His contribution in looking at "Udakendawela Siri Saranakara Himi" was an assessment of his role in anti-imperialist struggle in Sri Lanka. He was looking at the imperialist struggle and the contribution of the Buddhist clergy in the country in order to raise the nationalist awareness. So, being part of the Left of Centre Politics, he looked at every different angle in which this country came to be impacted at different times: during the colonial times and during the post-Independence period and thereafter the way in which our different administrations embraced different ideologies.

We talked about capitalism, socialism and neoliberalism. Now, we are talking about the social market economy. This Government is now talking about social market economy. These are all variations of different ideologies, but to fit the times and the needs of the country's economic policies. So, people of the Hon. (Prof.) Wiswa Warnapala's calibre were able to critically look at both good and the bad in the different systems and talk about the reality and the way in which the application of such ideologies impact on the social fabric and politics of the country.

I believe his loss is indeed a big void that have been created. In keeping with the faith that he adhered to and according to the Buddhist principles, I wish him *Nivan Suwa*! Also, I would convey my condolence to his family members.

Thank you.

[பி.ப. 12.52]

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

கௌரவ சபாநாயகர் அவர்களே, காலஞ்சென்ற முன்னாள் கௌரவ அமைச்சர் பேராசிரியர் விஸ்வா வர்ணபால அவர்கள் 1994ஆம் ஆண்டு இந்தப் பாராளுமன்றத்துக்கு உறுப்பினராக வந்தபோது, எனக்கும் இந்தப் பாராளுமன்றத்துக்கு உறுப்பினராக வருவதற்கான ஒரு சந்தர்ப்பம் கிடைத்தது. அரசியலிலும் கல்வியிலும் அவருடைய திறமையை அறிந்து கொண்ட அன்றைய ஜனாதிபதி அவர்கள், அவரைத் தேசியப் பட்டியல்மூலம் இந்த உயரிய சபையின் ஓர் உறுப்பினராக நியமித்திருந்தார். அவருடன் பழகுவதற்கான சந்தர்ப்பங்கள் எனக்கு நிறையவே கிடைத்தன. இனப் பிரச்சினைக்குத் தீர்வு காண்பதற்காக நியமிக்கப்பட்ட பாராளுமன்றத் தெரிகுழுவிலே அவர் ஓர் அங்கத்தவராக இருந்தார். அவர் அடிப்படையில் இடதுசாரிக் கொள்கையைக் கொண்டிருந்தபடியால், தமிழ் மக்களுடைய தேசியப் பிரச்சினைக்கு நியாயமான ஒரு தீர்வைக் காணவேண்டும் என்பதில் மிகவும் அக்கறை காட்டியிருந்தார். அதிகாரப் பரவலாக்கல் சம்பந்தமான அவருடைய கருத்துக்கள், அவர் பெற்ற கல்வியின் உயரிய தன்மையைக் காட்டியிருந்தன. அவருடன் பல நாடுகளுக்குப் பிரயாணம் செய்யக்கூடிய சந்தர்ப்பங்களும் எனக்குக் கிடைத்திருந்தன. அந்த நேரங்களில் தனிப்பட்ட முறையில் அவருடன் கதைக்கின்ற வாய்ப்பும் எனக்குக் கிடைத்தது. அவருடைய தெளிவான அறிவைப் பார்த்து நான் வியந்திருக்கின்றேன். அப்படியான மிகப் பெரிய கல்விமான்கள் இந்த உயரிய சபையிலே இருந்தார்கள். அவ்வாறானவர்கள் இப்போதும் இருக்கின்றார்கள். அதேபோன்று இனப் பிரச்சினைக்கு ஒரு நியாயமான தீர்வைக் காணவேண்டும் என்று கருதுகின்றவர்களும் இந்த உயரிய சபையிலே இருந்திருக்கிறார்கள்.

மறைந்த கௌரவ பேராசிரியர் விஸ்வா வர்ணபால அவர்கள் மிக நேர்மையானவர். அவரிடம் நாங்கள் ஒரு கோரிக்கையை விடுக்கும்போது, அதற்கு அவர் 'செய்வேன்' என்று சொல்வாராயின், அது நிச்சயமாகச் செய்யப்பட்ட தாகவே இருக்கும். அவர் உயர் கல்விப் பிரதியமைச்சராக இருந்தபோது காலஞ்சென்ற கௌரவ றிச்சட் பத்திரண அவர்கள் அந்த விடயத்திற்கான அமைச்சராக இருந்தார். இவர்கள் இருவரும் மிக நேர்மையானவர்களாக, சொன்னதைச் செய்கின்ற அமைச்சர்களாக இருந்ததை நான் பார்த்தேன். கௌரவ பேராசிரியர் விஸ்வா வர்ணபால அவர்கள் மிகப் பெரிய ஒரு கல்விமானாக இருந்தும்கூட, அவர் சாதாரண மக்களுடன் மிக இனிமையாகவும் பண்பாகவும் பழகியதை நான் பார்த்திருக்கின்றேன்.

அன்னாரின் மரணச் சடங்கில் நானும் கலந்துகொண்டேன். அதில் கலந்துகொண்ட மக்களின் எண்ணிக்கை யைப் பார்த்தபொழுது, அவர் பதவியில் இல்லாதிருந்தாலும் அவருக்கு மக்கள் மத்தியில் இருந்த செல்வாக்கை என்னால் கணிப்பிடக்கூடியதாக இருந்தது. அப்படிப்பட்ட மிகப் பெரிய கல்விமானை, நேர்மையான ஓர் அரசியல்வாதியை நாம் இழந்திருக்கின்றோம். அவரைப்போன்று இன்னும் பலர் இந்த உயரிய சபைக்கு வரவேண்டும். அவ்வாறு சிறந்த கல்வி மான்கள் இந்தச் சபைக்கு வந்து செயற்படுவதன்மூலம் இந்த நாட்டின் சிறப்பு உயர வேண்டும் என்பதே அவருடைய விருப்பமாக இருந்தது. அதையே நாங்களும் விரும்புகின்றோம்.

இறுதியாக, அவருடைய குடும்பத்தினருக்கு எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக்கொண்டு என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, අද දිවා භෝජනයට පෙර අවසන් කතාව. ගරු ඩිලාන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.56]

ගරු ඩිලාන් පෙරේරා මහතා (මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - நெடுஞ்சாலைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilan Perera - State Minister of Highways)

ගරු කථානායකතුමනි, අද දින අප ශෝකය පළ කරන්නේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙනුයි. එතුමා කාලයක් තිස්සේ මාත් දන්නා හඳුනන විද්වතෙක්; මහාචාර්යවරයෙක්; ලේඛකයෙක්. ඒ විතරක් නොවෙයි. එතුමා අපේ පක්ෂය දුර්වල වූ අවස්ථාවලදී බොහෝ විට බොහෝ කැප කිරීම් කරපු කෙනෙක්. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අද තිබෙනවා වාගේම භේදයක් අනුර බණ්ඩාරනායක මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ආදි අය ඒ යුගයේ ඇති කරපු වෙලාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට පක්ෂයේ මධ්‍යම කාරක සභාවට එන්න පාර කැපුවේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමායි. එතුමා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් ඉල්ලා අස් වෙලා ඒ ස්ථානය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට ලබා දෙන්න අවශ්‍ය කරන වටාපිටාව සැකසුවේ. එහෙම බලද්දී එක්සත් ජාතික පක්ෂයේ රජය අවුරුදු 17කට පසුව පෙරළීම සඳහා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට අවශ්‍ය කරන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ප්‍රවේශ වීමේ දොරටුව විවර කර දුන්නේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමායි. එතුමා පක්ෂය දුර්වල වූ අවස්ථාවලදී හැම දාම පක්ෂය වෙනුවෙන් කැප කිරීම් කරපු කෙනෙක්. බණ්ඩාරනායක මැතිනිය එතුමාව දැක්කේ troubleshooter කෙනකු හැටියටයි. පක්ෂයේ ප්‍රශ්න ආ වෙලාවලදී ඒ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා හැම දාම බණ්ඩාරනායක මැතිනිය සහය ඉල්ලුවේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගෙන්. මෑතකදීත් - අවසාන පාර්ලිමේන්තු මැතිවරණයේදීත්- අපේ පක්ෂය අර්බුදයට මුහුණ දුන් වෙලාවේ වර්තමාන ජනාධිපතිතුමාත් එතුමාව අපේ සන්ධානයේ ලේකම් කරලා තමයි ඒ අර්බුදය සඳහා විසඳුම් සොයාගන්න කල්පනා කළේ.

ගරු කථානායකතුමනි, ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා මා ජීවත් වන බදුල්ල දිස්ත්‍රික්කයටත් සම්බන්ධයි. මොකද, එතුමා විවාහ වුණේ බදුල්ලේ අපේ නිවසේ ඉඳලා අඩි 400ක්, 500ක් දුරින් පිහිටි පුවක්ගොඩමුල්ල කියන ප්‍රදේශයෙනුයි. එතුමා විවාහ වුණේත් දේශපාලන පවුලකින්. මහින්ද අමරවීර අමාත්‍යතුමා කිව්වා වාගේම ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා කියන්නේ, නායකයාද කියා බලන්නේ නැතිව කියන්න තිබෙන දේ කියපු කෙනෙක්; යමක් වැරැදි නම් එය වැරැදියි කියා එවේලේම කියන්න පසුබට නොවුණු කෙනෙක්. එතුමා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකුව සිටි කාලයේ අපට බොහෝ සෙයින්ම මිත්‍රයකුව සිටි, වරාය අධිකාරියේ සභාපතිතුමා එම කමිටුවට කැඳවූ වෙලාවේ ඔහුගේ උපාධිය පිළිබඳව දිගින් දිගටම ප්‍රශ්න කරන්න ගත්තා මට මතකයි. ඒ උපාධියේ හරි වැරැද්ද පිළිබඳව, ඒ උපාධිය ඇත්ත

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

එකක් ද නැද්ද කියන එක පිළිබඳව එතුමා ප්‍රශ්න කළා. ඒ වෙලාවේ අප, අපේ මිත්‍රයා වෙනුවෙන් පෙනී සිටි වෙලාවේ එතුමා මට කිව්වා මතකයි, "ඩිලාන්, ආචාර්ය උපාධියක් කියන එක ලෙහෙසියෙන් ගන්න පුළුවන් එකක් නොවෙයි. හරියාකාරව ගත්තොත් තමයි එය හරි ආචාර්ය උපාධියක් වන්නේ" කියා. ඒ විධියට එතුමා, තමන්ට භාර දුන් වගකීම් ඉෂ්ට කිරීමේදී පක්ෂග්‍රාහීව ඒවා ඉෂ්ට කළේ නැහැ.

නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ දේශපාලන දිවියේ 30වන වසර සැමරූ උත්සවය BMICH එකේ පැවැත්වුවා. ඒ වෙලාවේදී අපේ හිටපු කථානායක වමල් රාජපක්ෂ මැතිතුමා ඉස්සරහා තියාගෙන, සමහර අවස්ථාවලදී රාජපක්ෂ පවුලෙන් එතුමාට වෙච්ච සමහර සිදුවීම් පිළිබඳව ඒ මහා සභාවේදී මූණටම කිව්වා. එතුමාගේ අඩුව අද දිනයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපට ඉතාම දැඩිව දැනෙනවා. එතුමා සිටියා නම් අද අපේ පක්ෂයේ තිබෙන අර්බුදය විසඳන්නට මීට වඩා සක්‍රියව දායක වෙලා කටයුතු කරනවා ස්ථිරයි කියා අපි දන්නවා. එතුමා මේ රටේ සිටි මහාචාර්යවරයෙක්; විද්වතෙක්; ලේඛකයෙක්; දේශපාලනඥයෙක්. ඒ වාගේම සිංහල සහ ඉංග්‍රීසි කියන භාෂා දෙකම ඉතාම හොඳින් හැසිරවීමේ හැකියාව එතුමාට තිබුණා. එතුමා සිංහල භාෂාවෙන් චතුර කථිකයෙක්; ඉංග්‍රීසි භාෂාවෙන් ඊටත් වඩා චතුර කථිකයෙක්. මේ අනුව, විශ්වා වර්ණපාල මැතිතුමා අග්‍ර ගණයේ මනුෂ්‍යයෙක්.

ගරු කථානායකතුමනි, එතුමා මහාචාර්යවරයකු වුණාට අපත් එක්ක සතුටු සාමීචියේ යෙදුණු අවස්ථාවලදී ඉතාම සුන්දර මිනිහෙක් වුණා. එතුමා අපත් එක්ක කතා කරන කොට විවිධ රස කතා, දේශපාලන ක්ෂේත්‍රයේ වෙච්ච දේවල් බොහොම සුන්දරව කිව්වා. එතුමා විනෝදයට කැමැති, ඉතාම සුන්දර ගති පැවතුම් තිබුණු කෙනෙක්.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා කිව්වා වාගේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා, අද යුගයේ දේශපාලනඥයන්ට ඉතාම ආදර්ශවත් චරිතයක්. මොකද, එතුමා දේශපාලනයෙන් හම්බ කර ගත්ත කිසිම දෙයක් නැහැ. එතුමා හැමදාම තමන්ට පැවරුණු රාජකාරි කටයුත්ත අවංකව ඉටු කළා. ඒ වාගේම එතුමා සමහර වේලාවට පක්ෂය වෙනුවෙන් තනතුරු කැප කළා. පක්ෂය තමන්ට දුන්නු තනතුරු එතුමා ආභරණයක් කර ගත්තේ නැහැ. එතුමා ඒ තනතුරු හරහා පක්ෂයට සේවයක් කරන්නට, හැම දාම පක්ෂය ඉස්සරහින් තියාගෙන වැඩ කළා. මම කලින් කිව්වා වාගේ ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ ආදරණීය බිරිඳ බදුල්ල ප්‍රදේශයේ කාන්තාවක්. ඒ පවුල අපටත් බොහොම හිතවත්. එතුමාට අමාත්‍ය ධුර ලැබුණු අවස්ථාවේදී බදුල්ල ප්‍රදේශයේ ජනතාවට උදවු උපකාර කිරීමට එතුමා පසුබට වුණේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම බදුල්ල ප්‍රදේශයේ ජනතාවටත් එතුමාගේ අභාවය මහත් වූ කම්පනයක් ගෙන දෙන කාරණයක් වුණා.

ගරු කථානායකතුමනි, පක්ෂය හැටියට බැලුවත් එතුමා නැති පාඩුව අපට දැනෙනවා; මේ ව්‍යවස්ථාදායක සභාව හැටියට ගත්තත් එතුමා නැති පාඩුව අපට දැනෙනවා. අනිවාර්යයෙන්ම පේරාදෙනිය විශ්වවිද්‍යාලයට සහ විශ්වවිද්‍යාල පද්ධතියටම එතුමා නැති පාඩුව දැනෙනවා. ලේඛකයෙක් හැටියට ගත්තත් එතුමා නැති පාඩුව අපට දැනෙනවා. සිංහල සහ ඉංග්‍රීසි භාෂාව ඉතාම චතුරව හසුරුවන්නට පුළුවන් කෙනෙක් හැටියට එතුමා වාගේ අයගේ අඩුව මේ යුගයේ පාර්ලිමේන්තුව තුළ පුරවන්නට ඉතාම අමාරුයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු යෝධ යුග පුරුෂයෙක් වුණු ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව මාගේත්, මාගේ පවුලේත්, බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනාගේත් ශෝකය එම මැතිනියටත්, පවුලේ සියලු දෙනාටත් මේ වෙලාවේදී පුද කරන්නට කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු මහාචාර්ය ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන ලද ශෝක යෝජනා මම අනුමත කරන්නට කැමැත්තෙමි. එතුමා පෞද්ගලිකව මම බොහොම ගරු කරපු දේශපාලනඥයෙක්; ආදර්ශවත් දේශපාලනඥයෙක්; දැන පිරිසිදු දේශපාලනඥයෙක්. මම ප්‍රාර්ථනා කරනවා එවැනි චරිත විශේෂයෙන් අපේ තරුණ දේශපාලනඥයින්ට ආදර්ශයක් වේවා කියලා.

මේ අවස්ථාවේදී අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

පාර්ලිමේන්තුව දිවා භෝජනය සඳහා අත්හිටුවා සවස 2.00ට නැවත රැස්වෙනු ඇත.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 2.00ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 2.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2.00 p.m. and then resumed.

ශෝක ප්‍රකාශය:
ගරු ඊලියන් එම්. නානායක්කාර මහතා
அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு ஈலியன் எம். நாணாயக்கார
VOTE OF CONDOLENCE:
HON. AELIAN M. NANAYAKKARA

[අ.භා. 2.00]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின்
முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ආසනයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ගරු ඊලියන් එම්. නානායක්කාර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

1927 සැප්තැම්බර් මස 18වන දින මෙලොව එළිය දුටු ඊලියන් නානායක්කාර මැතිතුමාගේ දයාබර දෙමාපියන් වූයේ, ජේම්ස්

නානායක්කාර මැනිදුන් සහ ඇලන් ඩයනා අබේගුණවර්ධන මැතිනියයි. එතුමා චිත්‍රා ආරියශීලා ගුණතිලක මහත්මිය සමඟ විවාහ වූ අතර එම විවාහයෙන් අනුෂා සහ සේනානි නමින් දියණියන් දෙදෙනෙක් මෙලොවට දායාද කරන ලදී. එම මැතිනියගේ අභාවයෙන් පසු ඊලියන් නානායක්කාර මැතිතුමා ඉන්දුමතී මොහොට්ටි මහත්මිය සමඟ නැවත විවාහ විය.

ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ ඊලියන් නානායක්කාර මැතිතුමා පසුව කොළඹ ආනන්ද විදුහලෙන් ද්විතීයික අධ්‍යාපනය හදාරා, 1946 වර්ෂයේදී නීති විද්‍යාලයට ඇතුළත් විය. 1949 වර්ෂයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දුන් එතුමා මාතර අධිකරණයේ නීතිඥ වෘත්තියේ නියැලෙමින් එම ප්‍රදේශවල ජනතාවට නීතිමය ක්ෂේත්‍රයෙන් විශාල සේවයක් සලසා දුන්නේ, විශේෂයෙන් අපරාධ නඩු සම්බන්ධව අතිදක්ෂ නීතිඥවරයෙකු ලෙස පෙනී සිටිමිනි.

1952 වසරේදී කොමියුනිස්ට් පක්ෂයට බැඳුණු නානායක්කාර මහතා 1960 වසරේ පැවැති මහ මැතිවරණයේදී දෙවිනුවර ආසනයට තරග කළ අතර, ඉන් ජයග්‍රහණයක් ලබා ගැනීමට නොහැකි විය. 1970 වසරේදී පැවැති මැතිවරණයේදී කඹුරුපිටිය ආසනය නියෝජනය කරමින් තරග කළ නානායක්කාර මැතිදුන් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ භාග්‍යය උදා කර ගන්නා ලදී.

ඉන් පසුව පළාත් සභා ආරම්භ කර, දකුණු පළාත් සභාව සඳහා පැවැත්වූ ප්‍රථම පළාත් සභා මැතිවරණයෙන් දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස එතුමා පත් විය. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත්, පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙසත් පොදු මහජනතාව වෙනුවෙන් එතුමා විසින් කරන ලද සේවය ඉතා අගයකොට සැලකිය යුතුය.

කඹුරුපිටිය ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් විශාල වශයෙන් කැප වූ එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙනුත් කටයුතු කළේය. ගමනාගමන, සෞඛ්‍ය, මං මාවත් යන ක්ෂේත්‍ර සංවර්ධනය කරමින්, ගොඩනැඟිලි ඉදිකරමින්, විදුලිය ලබා දෙමින් කඹුරුපිටිය ප්‍රදේශවාසීන්ට සුවිශේෂී සේවා රැසක් අත්පත් කර දුන්නේය.

එතුමා ශාසනයට කළ සේවය, කඹුරුපිටිය විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් භික්ෂු උපෝසථාරාමයක් ඉදි කරවා පූජා කිරීම තුළින් මනාව පිළිබිඹු වේ. සඟලින් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ සිතෙහි රඳවා ගනිමින් මාතර දිස්ත්‍රික්කයට තුන්මස් වී හඳුන්වා දීමේදී පුරෝගාමියකු ලෙස කටයුතු කළ එතුමා දෙනියාය ප්‍රදේශයේ උඩරට එළවලු වගා කිරීම හඳුන්වා දෙමින්, කෘෂිකර්මාන්තයේ නියැළි ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය වශයෙන් විශාල වාසියක් ලබා ගැනීමට සැලැස්වීමට කටයුතු කර ඇති අතර, එය රටේ කෘෂිකාර්මික සංවර්ධනයටද ඉමහත් පිටුවහලක් විය.

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරමින් සිටි කාල වකවානුව තුළ මහා බ්‍රිතාන්‍යය සහ කියුබාව වැනි රටවල සංචාරය කළ අතර, ඒවායින් ලද අත් දැකීම්ද පොදු මහජනයාගේ යහපත පිණිස යොදා ගැනීමට අමතක නොකළේය. මෙසේ විශාල ජනතා මෙහෙවරක් කළ එතුමා 2015 ඔක්තෝබර් මස හත්වන දින දකුණු පළාතේ ජනතාවට සෝ සුසුම් ගෙන දෙමින් මෙලොව හැර ගියේය.

ගරු කථානායකතුමනි, 1970 වර්ෂයේ සිට 1977 වසර දක්වා වසර හතකට ආසන්න කාලයක් පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට අමිල මෙහෙවරක් ඉටු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව, දියණියන් දෙදෙනා ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

[අ.භා. 2.05]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් කරනු ලැබූ ශෝක ප්‍රකාශ යෝජනාව ස්ථිර කිරීම මා සලකන්නේ යුතුකමකට වඩා වගකීමක් විධියටයි.

ගරු කථානායකතුමනි, අද පෙරවරුවේ අපේ පාර්ලිමේන්තුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේ නායකයකු වූ මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳව වූ ශෝක යෝජනාව වෙනුවෙනුත්, ඒ වාගේම අද සවස් වරුව දේශපාලන ලකුණක්, අනන්‍යතාවක් ජාතික මට්ටමට ගෙනා කීර්තිධර පුද්ගලයකු වූ කඹුරුපිටියේ ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය පිළිබඳව වූ ශෝක යෝජනාව වෙනුවෙනුත් ඔබතුමා වෙන් කරලා තිබෙනවා.

මේ දෙදෙනා පිළිබඳවම බොහෝ සමානකම් තිබෙනවා, ගරු කථානායකතුමනි. පළමුව ගත්තාම මේ දෙදෙනාම වෘත්තිකයෝ. එක් අයෙක් මහාචාර්යවරයෙක්. අනෙක් කෙනා නීතිඥයෙක්. ගරු කථානායකතුමනි, අනෙක් පැත්තෙන් ගත්තාම, මේ දෙදෙනාම හෘදය සාක්ෂියේ දේශපාලනය වෙනුවෙන් පෙනී හිටපු අය.

මේ දෙදෙනා කිසි දවසක කිසි විටක වැඩිම ඉල්ලුමට, ඉහළම ලංසුවට තමන්ගේ දේශපාලනය අළෙවි කරන්න සූදානම් වුණු දේශපාලනඥයන් දෙදෙනෙකු නොවෙයි. ඒ දෙවෙනි කාරණය.

ගරු කථානායකතුමනි, තුන්වෙනි කාරණය ගත්තොත්, මේ දෙදෙනාම මහජන මන්ත්‍රී ධුරය කිසි ලෙසක තමන්ගේ පෞද්ගලික දියුණුව වෙනුවෙන් උපයෝගි කර ගත්තේ නැති පිරිසිදු දේශපාලනඥයන් දෙදෙනකු ලෙස සලකනවා.

හතරවෙනි කාරණය මෙයයි. ගරු කථානායකතුමනි, මේ දෙදෙනාම තමන්ගේ දශක පහකට ආසන්න දේශපාලන ජීවිතය පුරාවට කිසිම දවසක චෞරයන් ලෙස විරුදාවලිය ලැබූ, සම්මානයට පාත්‍ර වූ අය නොවෙයි.

පස්වෙනි කාරණය වන්නේ, මේ දෙදෙනාම දේශපාලන වශයෙන් ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන් බෞතීස්ම ලබා ගත් දේශපාලන නායකයන් දෙදෙනෙක් වීමයි.

ගරු කථානායකතුමනි, මේ කාරණා පහම එකට තබා බැලුවාම මොකක්ද පෙනෙන්නේ? ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාත්, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාත් කියන දෙදෙනාම වඳ විය යන දේශපාලන සත්ව විශේෂයක සාමාජිකයන් දෙපළක්. ගරු කථානායකතුමනි, එයට ඔබතුමා මාත් එක්ක එකඟ වේවි. එම නිසා මේ සභාවේ අද ප්‍රාර්ථනාව වන්නට ඕනෑ, අද මේ සභාවේ විශ්වාසය වන්නට ඕනෑ, මේ ශ්‍රේෂ්ඨ දේශපාලන චරිත දෙක විසින්, මේ දේශපාලන යෝධයන් දෙදෙනා විසින් අපේ සමාජයට ලබා දුන් ඒ පරමාදර්ශ ශත වර්ෂ ගණනාවක් මේ බිම මත පවතීවා

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

යන්නයි. මේ ප්‍රාර්ථනාව ඒ දෙපළට නිවන් සුව ප්‍රාර්ථනා කරනවාට වඩා ප්‍රබල ප්‍රායෝගික යථාර්ථවාදී ප්‍රාර්ථනාවක් කියලා මා විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් පෙළ ගැසෙන මේ සභාවේ සියලු සාමාජිකයන් එක්ක ඒකාබද්ධ විපක්ෂය විධියටත්, කඹුරුපිටිය බිම නියෝජනය කරන, නිල්වලා නිම්නය නියෝජනය කරන දේශපාලනඥයන් විධියටත් මා මේ මොහොතේ අත් වැල් බැඳ ගන්නවාය කියන එක ඊලියන් නානායක්කාර මැතිතුමාගේ පවුලේ සියලුදෙනා වෙනත්, විශ්වා වර්ණපාල මැතිතුමාගේ පවුලේ සියලුදෙනා වෙනත් පළ කරන්න මා මේ අවස්ථාව පාවිච්චි කරනවා.

ගරු කථානායකතුමනි, ඊලියන් එම්. නානායක්කාර මැතිතුමා පිළිබඳ ඉතිහාසය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා සැකෙවින් සඳහන් කළා. ඊලියන් නානායක්කාර මහත්මයා 1970දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට කඹුරුපිටියේ දේශපාලන ලකුණ ශ්‍රී ලාංකීය දේශපාලන සිතියමේ ඉහළින් ඔසවා තැබුවා. "ඊළුන්" කියන දේශපාලන ලකුණ කඹුරුපිටියේ ලකුණක් පමණක් නොවෙයි. 1970දී එතුමා කඹුරුපිටියේ මන්ත්‍රීවරයා බවට පත් වන විට අපි පාසලේ හතරවෙනි වසරේ ශිෂ්‍යයෝ.

නමුත් අපි ඒ ආභාෂයන්, එතුමාගේ පරම්පරාවේ සාමාජිකයන්ගෙන් ලබා ගත් දැනීම, එතුමා විසින් ඒ බිම මත ස්ථාපනය කරනු ලැබූ පුරුෂාර්ථයන් පිළිබඳව ලොකු අධ්‍යයනයක් කළා. කඹුරුපිටියේ වම් ඉවුරේ ප්‍රගතිශීලී කඳවුරේ දේශපාලනයට නායකත්වය දෙන අවස්ථාවේ කඹුරුපිටිය භූමිය තුළදී මේ ඊලියන් ලකුණ අමරණීය කර ගන්නේ කොහොමද කියලා මා කල්පනා කළා. අපි ඒ වෙනුවෙන් කැප වුණා. මාතර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසය පුරාවට ඊලියන් අනුගාමිකයන්, ඊලියන් සහෝදරයන්, ඊලියන් ප්‍රේමීන්, ඊලියන් විශ්වාස කරපු දේශපාලන සතුරන් පවා එකට එකතුවෙලා, මේ ලකුණ මිය යන්නට නොදී කඹුරුපිටිය භූමියේ හැම දාම ඒ ධජය ඉහළින් ඔසවා තබා ගන්නට පුළුවන් හැම උත්සාහයක්ම දරා තිබෙනවා, ගරු කථානායකතුමනි.

පෙබරවාරි 10 වන දා තිබුණු පළාත් පාලන මැතිවරණයේදී පවා ලංකාවේ විශිෂ්ටතම, ඉහළම ඡන්ද ප්‍රතිශතය ලබාගෙන, ඊලියන් නානායක්කාර මැතිතුමා නියෝජනය කරපු මතවාදය කඹුරුපිටිය භූමියේ ඔසවා තබන්නට ඊලියන් ප්‍රේමීන්ට පුළුවන්කමක් ලැබුණු එක ගැන මා ආඩම්බර වනවා. මා හිතනවා, ඊලියන් නානායක්කාර නම් වූ පරමාදර්ශී චරිතයට කඹුරුපිටියේ මිනිසුන්ට කරන්න පුළුවන් ලොකුම ගෞරවය ඒකයි කියලා. මාතර අධිකරණයට, මාතර පුරවරයට වඩා කඹුරුපිටිය භූමිය පුරාවට කඹුරුපිටියේ භෞතික දියුණුව වෙනුවෙන්, කඹුරුපිටියට නූතනත්වයක් කැඳවාගෙන ඒම සඳහා ඊලියන් නානායක්කාර මැතිතුමා ගෙන තිබෙන වෙහෙස කියා නිම කරන්නට බැහැ. කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසයේ සීමාව එක පැත්තකින්, බෙලිඅත්ත ආසනයේ කෙළවර ගංගොඩගම - පොත්තෙවෙල දක්වා දිවෙනවා. තව පැත්තකින්, කොහුලියැද්ද දක්වා හක්මණ කෙළවරට දිවෙනවා. අනික් පැත්තෙන්, මාතර - අකුරැස්ස පාරෙන් එපිට උනැල්ල - පාලටුව දක්වා ඒ බිම්කඩ පැතිර යනවා, ගරු කථානායකතුමනි. ඒ බිම්කඩ පුරාවට තිබෙන පාසල්, රෝහල්, මං මාවත් යන කුමන දර්ශකයක් අරගෙන බැලුවත්, මේ කුමන කාරණය දර්ශකයක් ලෙස අරගෙන බැලුවත්, ඊලියන් නානායක්කාර මැතිතුමා මන්ත්‍රී ධුරය දැරූ වසර හතකට ආසන්න කාල සීමාව තුළදී එතුමා කඹුරුපිටිය පුරවරයට නූතනත්වය කැඳවා ගෙන ඇවිත් තිබෙන බව ඒ තුළින් පෙනෙනවා. එතුමාගේ පරම්පරාවේ වයෝවෘද්ධ සාමාජිකයන් රාශියක් ඉන්නවා. ජීව විද්‍යාත්මකව ශාරීරික වශයෙන් කිසියම් ආකාරයක පිරිහීමක් තිබුණත්, දේශපාලනිකව යෞවනයේ පන්නරය ඇතිව ඊලියන් මහ යන මිනිස්සු රාශියක් ඉන්නවා.

ගරු කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කඹුරුපිටිය පුරවරය වෙනුවෙන් එතුමාත් එක්ක සමීපව කටයුතු කරපු, ඒ පක්ෂය නියෝජනය කරන එතුමාගේ ආදරණීය සගයෙක් වන අපේ චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා ඒ පිළිබඳව වැඩිදුරටත් කථා කරන්න ඉන්නවා. කඹුරුපිටිය පුරවරය වෙනුවෙන් ඊලියන් නානායක්කාර මැතිතුමා ලබා දීපු නායකත්වය, ලබා දීපු දායකත්වය, කරපු මහ පෙන්වීම පිළිබඳවත්, කඹුරුපිටිය පුරවරයට කැන්දාගෙන ආපු ඒ නූතනත්වයේ සියලු ලකුණු පිළිබඳවත් කඹුරුපිටියේ මිනිසුන් වෙනුවෙන් මේ සභාව තුළ නැවත නැවතත් කෘතවේදිත්වය පළ කරමින්, ඊලියන් පරමාදර්ශය ශත වර්ෂ ගණනාවක් ඒ ඓතිහාසික කඹුරුපිටිය අරගළ භූමිය තුළ පවතීවා! කියා මේ මොහොතේදී දෙවන වතාවටත් මා ප්‍රාර්ථනා කරනවා. බොහොමත්ම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.15]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, 1970 සිට 1977 දක්වා මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ, අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයකු වූ ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේ දී එයට මගේ ශෝකයත් එකතු කරන්න මා කැමැතියි.

ඊලියන් නානායක්කාර මැතිතුමා දක්ෂ නීතිඥවරයෙක්. ඇත්ත වශයෙන්ම එතුමා තුළ තිබුණු දක්ෂකම හැම විටම එතුමා අධිකරණය තුළ ඉතා මැනවින් නිරූපණය කළා. ඕනෑම නඩුවකදී විනිසුරුවරුන් පවා ඊලියන් නානායක්කාර මැතිතුමාගෙන් තොරතුරු විමසන තත්ත්වයකට ඔහු නීතියේ පිරුණු බව ඇත්ත වශයෙන්ම ප්‍රකාශ කරන්න පුළුවන් දැනුමකින් යුක්තව හිටියා. ඒ වාගේම එතුමා තමන්ගේ සේවා දායකයන් වෙනුවෙන් අධිකරණයේදී එඩිතරව ක්‍රියා කළා. එතුමා තමන්ගේ අදහස අධිකරණයේදී ප්‍රකාශ කරන්නත්, අධිකරණය තුළදී විනිශ්චයකාරතුමා අතින් වැරැදි දෙයක් සිදු වුණත්, එය වැරැදියි කියලා කියන්නත් පුළුවන් ආත්ම විශ්වාසයකින් සහ ආත්ම ශක්තියකින් හෙබි කෙනෙක්. මම ඒ ලක්ෂණ එතුමා තුළින් දැක්කා වාගේම ඒවා අගය කළා.

තරුණ අවධියේදීම එතුමා දිස්ත්‍රික්කයේ තරුණ ව්‍යාපාරයේ නායකයා විධියට දේශපාලනයට ප්‍රවේශ වෙලා, මාතර නගර සභාවේ - එතකොට මාතර මහා නගර සභාව නොවෙයි- මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වුණා. ඉන් අනතුරුව එතුමා භීෂණ සමයේදී දකුණු පළාත් සභාවේ පළාත් සභිකයෙකු ලෙස ප්‍රවේශ වුණා. එපමණක් නොවෙයි, එතුමා මේ පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළදී කඹුරුපිටිය ප්‍රදේශය සංවර්ධනය කරන්න කටයුතු කළා. එහිදී එතුමා ප්‍රධාන කරුණු දෙකක් කෙරෙහි අවධානය යොමු කළා.

ඉන් එක් කරුණක් තමයි, නිවැරැදි අධ්‍යාපනයක් තමන්ගේ බල ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන්න විද්‍යා අධ්‍යාපනය දියුණු කළ යුතුය කියන මතයේ ඉදගෙන පාසල් පද්ධතිය තුළ විද්‍යාගාර ආරම්භ කරන්න, ක්‍රීඩාංගණ සකස් කරන්න, ඒවාට අවශ්‍ය වූ විදුලිය වැනි යටිතල පහසුකම් නිර්මාණය කරන්න ප්‍රමුඛත්වය ගැනීම. ඒ අනුව ඇත්ත වශයෙන්ම පසු ගිය කාලය තුළ උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් කඹුරුපිටිය බල ප්‍රදේශයෙන් සමාජයට එක් වුණා. අධ්‍යාපනය පිළිබඳව එතුමා තුළ තිබුණු දැක්ම යටතේ අධ්‍යාපනය මේ සමාජ සංවර්ධනයේ වැදගත් අංගයක් හැටියට සැලකුවා.

අපේ රටේ කෘෂි කාර්මික සංවර්ධනය ප්‍රමුඛ කර ගත යුතු ඉලක්කයක් හැටියට සලකා, කෘෂි කර්මය දියුණු කිරීමේ අරමුණ ඇතිව එතුමා විශාල වැඩ කොටසක් මෙහෙය වූවා. මීට කලින් එතුමා පිළිබඳව ගුණ කථනය කරපු මන්ත්‍රීවරුන්ගේ කථාවන්වලදී එතුමා තුළ තිබුණු කෘෂි කාර්මික දැනීම සහ හැඟීම ගැන ප්‍රකාශ වුණා. යටියන බල ප්‍රදේශයේ මැද උයන්ගොඩ තුන්මස් වී වගා කිරීමේ කලාපයක් හැටියට හඳුන්වා දෙමින්, කෙටි කාලීන වී වගාව කරන්න ජනතාව මෙහෙය වූ ආකාරය අපිට මතකයි. ඒ තුළින් එම ප්‍රදේශය ඉතාම ජනප්‍රිය තත්ත්වයකට පත් වුණා. ඒ වාගේම ගොවි ජනතාව අතර අලුත් අත් හදා බැලීම් සිදු කරමින්, ඒ සඳහා අවශ්‍ය වාරිමාර්ග විධි ක්‍රම සැලසුම් කරමින්, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ ඉහළම වැඩ කොටසක් කරන්න කැප වුණු නායකයෙක් තමයි ඊලියන් නානායක්කාර මැතිතුමා. ඒ ලක්ෂණය එතුමාට ආවේ දොස්තර වික්‍රමසිංහ මැතිතුමාගේ ආභාසයෙනුයි. දොස්තර වික්‍රමසිංහ මැතිතුමා කෘෂි කර්මය පිළිබඳ හසළ දැනුමක් ඇති පුද්ගලයකු වශයෙන් නිල්වලා යෝජනා ක්‍රමය, කිරම ආර ආදී වාරි කර්මාන්තය කරන ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී සැලසුම්සහගත වැඩ පිළිවෙළක් නිරන්තරයෙන් සමාජගත කළා. ඒ පිළිබඳව "ඉදිරි මහ" පොතේ පැහැදිලිව සඳහන් වනවා. එතුමා මේ පාර්ලිමේන්තුව තුළදී කරන ලද දේශන වාගේම එතුමා පිළිබඳ සඳහන් ලියවිලි අපට ඕනෑ තරම් කියවන්නට පුළුවන්. ඒ දැක්ම -ඒ ආභාසය- ඔස්සේ ඊලියන් නානායක්කාර මැතිතුමා අධ්‍යාපනය ප්‍රමුඛ වශයෙන් සලකමින්, ඒ වාගේම සමාජ ආර්ථික සංවර්ධනයේදී කෘෂි කර්මාන්තයට ප්‍රබල තැනක් හිමි විය යුතුයි කියන උපකල්පනය උඩ කෘෂි කාර්මික කලාපයක් හැටියට කඹුරුපිටිය සංවර්ධනය කරන්නත්, විවිධ බෝග වර්ග වගා කිරීම සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය කරන්නත් කැපවෙලා ක්‍රියා කළා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණා ටිකත් කියන්නට ඕනෑ. එතුමා ඉතාම හොඳ සමුපකාරිකයෙක්. කඹුරුපිටිය සමූපකාරය, අකුරැස්ස සමුපකාරය වාගේ සමුපකාර ජාතික මට්ටමේ ඉහළ තැනකට ගේන්න එතුමා විශාල කැපකිරීමක් කළා. අකුරැස්ස සමුපකාර ව්‍යාපාරයට නායකත්වය දුන්නේ දොස්තර වික්‍රමසිංහ මැතිතුමා. එය මේ රටේ ජනප්‍රියම සමුපකාරය බවට පත් වුණා විතරක් නොවෙයි, එය ව්‍යාපාරයක් බවටත් පත් වුණා. කෘෂි සමුපකාර ව්‍යාපාරය, වතු සමුපකාර ව්‍යාපාරය, විවිධ සේවා සමුපකාර ව්‍යාපාරය වැනි ව්‍යාපාර ඉස්මතු කරමින්, වැවිලිකරයේ වැඩ කරන කම්කරු පන්තියේ හිමිකම් ලබා දිය හැකි, ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කළ හැකි ලෙස ඒ සමුපකාර ව්‍යාපාරය හසුරුවන්නට එතුමා කළ මෙහෙය ඉතිහාස ගත වී තිබෙනවා. ඒ වාගේම විවිධ ක්ෂේත්‍ර තුළ තමන්ගේ දක්ෂතා පෙන් වූ, ඒවා අවංකව හදවතේ අභිලාෂයන් මත මෙහෙය වූ ව්‍යාපෘති මිසක් පෞද්ගලිකව දේශපාලන වාසි ලබා ගැනීමට කරපු ක්‍රියා නොවෙයි.

ගරු කථානායකතුමනි, මම මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. එය නොකියාම බැහැ. අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් අවශ්‍යයි කියන මතයේ ඉදගෙන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය ගෙනා වෙලාවේ, "අපි මේ විසඳුමට බාධා නොකළ යුතුය" කියන මතයේ ඉදගෙන පළාත් සභාවට තරග කළා. පළාත් සභාවට තරග කරනකොට එදා "ඡන්දය ඉල්ලන්නන්ට දඬුවම මරණයයි, ඡන්දය දෙන්නන්ටත් දඬුවම මරණයයි " කියන අභියෝගය තිබුණා. එහෙම තිබෙද්දී- දක්ෂ නීතිඥවරයෙකු වූ ඊලියන් නානායක්කාර මැතිතුමා තමයි ඒ කාලයේ මාතර අධිකරණයේ ප්‍රමුඛයා හැටියට කීර්තියක් ලබා ගෙන හිටියේ. එතුමා මරණය හමුවේ නොබියව, මරණයේ සෙවනැල්ල මත ඉඳගෙන, ඊනියා දේශප්‍රේමී ව්‍යාපාරය එකිනෙකා මරා දමද්දී ඒ පළාත් සභා මැතිවරණයට එකතු වුණා. එහෙම එකතුවෙලා පළමුවෙනි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට තේරී පත් වුණා. ජාතික වශයෙන් ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ඕනෑය කියන පක්ෂ ස්ථාවරය කිසි ලෙසකින් පැහැර නොහැර ඕනෑම අභියෝගයක් මැද ඒ වෙනුවෙන් පෙනී සිටිනවාය කියන වගකීම සිතේ දරා ගෙන ක්‍රියා කළ ඊලියන් නානායක්කාර මැතිතුමා වැනි මානවවාදියෙක්, ජාති හිතෛෂියෙක් අපට මේ යුගයේ නැති වීම බරපතළ පාඩුවක්.

ගරු කථානායකතුමනි, ඊලියන් නානායක්කාර මැතිතුමා අපේම පක්ෂයේ නායකයෙක් නිසා මම මේ අවස්ථාවේ ඒ ගැන වැඩිදුර කථා කරන්නට ඕනෑ නැහැ. මට එතුමා කෙරෙහි පෞද්ගලික ගෞරවයක් තිබෙනවා. එතුමා ඕනෑම අවස්ථාවක ඕනෑම අභියෝගයක් භාර ගන්න පුළුවන් ඍජුකමක් තිබුණු නායකයෙක්. අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙක් හැටියට අපටත් නායකත්වය දුන් ජ්‍යෙෂ්ඨයෙක්. එතුමාගෙන් ලබා ගත් ගුරුහරුකම් රැසක් තිබෙනවා. ඒවා මේ සභාවට අදාළ ඒවා නොවෙයි. එවැනි ශ්‍රේෂ්ඨ නායකයෙකු අපට අහිමි වීම, විශේෂයෙන් මෙවැනි යුගයක මේ පාර්ලිමේන්තුවේ සිටිය යුතු නායකයෙකු අහිමි වීම ඇත්ත වශයෙන්ම පිරිමැසිය නොහැකි පාඩුවක්. අවශ්‍ය යුගයක, අවශ්‍ය නායකයෝ අහිමි වීමෙන් ලද බරපතළ පාඩු ලෙහෙසියෙන් මකා ගන්නට පුළුවන්කමක් නැහැ. එවැනි නායකයෙකුගේ අභාවය වෙනුවෙන් මම මගේ සොව පළ කරමින්, එම ශෝකය පවුලේ ඇත්තන්ට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර මැතිතුමා.

[අ.භා. 2.25]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයකු වාගේම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයකු වන ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් නියෝජනය කරමින් අපේ ශෝකය මේ අවස්ථාවේ පළ කරනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු ඊලියන් නානායක්කාර මැතිතුමා පිළිබඳව අපි හොඳින් අසා තිබුණා; දැනගෙන තිබුණා. නමුත්, අපට එතුමාව ළඟින් ඇසුරු කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. 1993 දෙවැනි පළාත් සභාවට මන්ත්‍රීවරයකු විධියට පත් වෙලා ගිය වෙලාවේත්, ඉන්පසුව නැවතත් 1994 තිබුණු අතුරු මැතිවරණයේදී පළාත් සභාවට මන්ත්‍රීවරයකු විධියට පත් වුණු වෙලාවේත් අපට අහන්න ලැබුණා, ඊට පෙර තිබුණු පළාත් සභාවල තත්ත්වයන් පිළිබඳව. ඒ පළාත් සභාවලට තරග කළේ, ජීවිත තර්ජන මධ්‍යයේයි. ඒවායින් ජයග්‍රහණය කළ පිරිස වාගේම ඒ මැතිවරණ ව්‍යාපාරය නිසා විශාල පිරිසක් ජීවිත අහිමි කර ගත්ත බවත් අපි දන්නවා. ඒ ජයග්‍රහණය කළ අය අතරින් තේරී පත් වුණු ඉතාම කෘත හස්ත, බුද්ධිමත්, වමේ දේශපාලනය නියෝජනය කරන, කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරන නායකයකු විධියටයි අපි ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාව දැන ගෙන හිටියේ. නීතිඥයකු විධියට සිටිමින් ඒ ක්ෂේත්‍රය තුළ ප්‍රවීණයකු වාගේම එම ප්‍රදේශයේ ජනතාවගේ ආදරය දිනා ගත්තු නායකයකු විධියටයි එතුමා මුල් වතාවට පාර්ලිමේන්තුවට එන්න ජයග්‍රහණයක් ලබා තිබුණේ.

1970 මැතිවරණයේදී කඹුරුපිටිය කොට්ඨාසය නියෝජනය කරමින් එතුමා වැනි කෙනකුට එන්න අවස්ථාව ලැබුණේ එදා තිබුණු ඒ ඡන්ද ක්‍රමයත් එක්කය කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මනාප ඡන්ද ක්‍රමයකින් සමහර වෙලාවට මේ වාගේ කෙනකුට ඡන්දයක් ජයග්‍රහණය කරන එක එතරම් ලෙහෙසි වන්නේ නැහැ. නමුත්, එතුමාට ඒ අවස්ථාව උදා වුණා වාගේම 1970 - 1977 කාල පරිච්ඡේදය තුළ ඒ කරපු කාර්යයන් නිසා - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අග්‍රාමාත්‍ය ධුරය දැරුවෙත් එම රජය තුළයි- කඹුරුපිටිය ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, දකුණු පළාතේමත්, රට පුරාත් එතුමාගේ නාමය ප්‍රචලිත වුණායි කියන එක ඉතාම නිවැරදියි.

එතුමාට දේශපාලන දර්ශනයක් තිබුණා; දේශපාලන පන්නරයක් තිබුණා. ඒ සියල්ලම එතුමා පාවිච්චි කළේ රටේ පොදු ජනතාව වෙනුවෙනුයි. එතුමා පිළිබඳව අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාත්, ගරු ඩලස් අලහප්පෙරුම, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමන්ලාත් බොහෝ කරුණු ඉදිරිපත් කළා. ඒ කරුණු සියල්ලම අපි අනුමත කරන අතරේ අපි මීට කලින් සඳහන් කළ පරිදි ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා, ගරු ඊලියන් නානායක්කාර මැතිතුමා වැනි අය දේශපාලන කරලියේ මෙවන් යුගයකට අවශ්‍ය පුද්ගලයින් බව විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන් ගරු ඊලියන් නානායක්කාර මැතිතුමා වැනි දේශපාලනඥයන්, මේ රටේ ජාතික ප්‍රශ්නයක් තිබෙන බව හඳුනා ගනිමින්, මේ රටේ ප්‍රශ්නවලට ජාතිවාදයෙන් තොරව සාමකාමීව විසඳුම් ලබා දිය යුතුයි කියන මතයේ සිටිමින්, ඒ වෙනුවෙන් සහයෝගය ලබා දී කටයුතු කළ, යම් බලය බෙදීමක් පිළිබඳව පවා අදහස් තිබුණු දේශපාලනඥයින්. එවැනි දේශපාලනඥයන් ගෙනා යෝජනා, අදහස් සහ ඒ අයගේ දැනුම විවිධ අවස්ථාවලදී රජයන් විසින් පාවිච්චි කළා නම්, සමහර විට මේ රටේ කුරිරු යුද්ධයක් ඇති නොවන්නට ඉඩ තිබුණා. මෙවන් යුග පුරුෂයන් නොමැති වීම මෙන්ම, අපි ජාතිවාදයෙන් පෙළෙමින්, ජාතිවාදීව කථා කරමින්, ජාතිවාදීව හැසිරීම නිසයි එවැනි යුද්ධය තත්ත්වයන්ට ප්‍රවේශ වෙන්න, අපේම රටේ ජාතීන් අතර මරා ගන්න, අවිශ්වාසය ගොඩ නැහෙන්න හේතු වුණේ. මා දිගින් දිගට කථා කරන්න අවශ්‍ය වන්නේ නැහැ. බොහෝ කරුණු කාරණා මේ පාර්ලිමේන්තුව තුළ සඳහන් වුණා වාගේම විශේෂයෙන් කඹුරුපිටිය, මාතර ඇතුළු දකුණේ ජනතාව වාගේම මේ රටේ සමස්ත වාමවාදී ජනතාව එතුමා පිළිබඳව හොඳින් දන්නවා; එතුමා කළ කාර්යයන් අගයනවා. අපිත් එම කාර්යයන් සියල්ල අගය කරමින් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයකු වන, පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයකු වන ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාට නිවන් සුව අත් වේවා,යි! ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.31]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමයේ සභාපතිවරයා මෙන්ම, මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළා වූ ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ මොහොතේ, එම ප්‍රදේශයේ පුරවැසියෙකු හැටියට; ඒ පළාතේ උපන් කෙනෙකු හැටියට එතුමා පිළිබඳව අදහස් පළ කිරීම එක අතකින් මගේ යුතුකමක් කියා මා නිතනවා. ඊටත් වඩා, මේ රටේ සමාජ ප්‍රගමනය අරබයා ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයක් නියෝජනය කළ එතුමා පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කිරීම ඉතාම සුදුසුයි කියා මා කල්පනා කරනවා.

ඊලියන් නානායක්කාර මැතිතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ 1970 පාර්ලිමේන්තු නියෝජනයක් ලබා ගනිමිනුයි. කඹුරුපිටිය ආසනයෙන් එතුමා ඒ ජයග්‍රහණය ලබා ගන්නා අවස්ථාවේ, තේරෙන නොතේරෙන වයසේ සිටි මමත් ඒ ආසන්නයේ අතුරලිය කියන ගමේ ජීවත් වුණු පාසල් ශිෂ්‍යයෙක්. අතුරලිය කියන ගමේ තමයි එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත් ඉපදුණේ, හැදුණේ, වැඩුණේ, ජීවත් වුණේ. එතුමාගේ ආසනය අකුරැස්ස. එතුමාගේ ගේ ළඟින් තමයි අපේ ගෙදරට හැරෙන පාරත් තිබෙන්නේ. ඒ නිසා කොමියුනිස්ට් පක්ෂය අතුරලිය, කඹුරුපිටිය ආදී ආසනවලටත්, මාතර ආසනයටත් සෑහෙන බලපෑමක් කළා. ඒ වාගේම, ලංකා සමසමාජ ව්‍යාපාරය මුළු මුහුදුකරයටම විශාල බලපෑමක් කළ ව්‍යාපාරයක්.

මුළු ලෝකයේම කොමියුනිස්ට් පක්ෂ බිහිවීමේ ප්‍රවණතාව පටන් ගත්තේ සෝවියට් විප්ලවයත් සමඟයි. 1920 දශකයේ මුල් භාගයේ තමයි චීන කොමියුනිස්ට් පක්ෂය ඇති වුණේ. ලෝකයේම ඇති වූ කොමියුනිස්ට් පක්ෂ දිහා බැලුවාම, යම් කිසි ඉංග්‍රීසි අධ්‍යාපනයක් තිබුණු ප්‍රභූ පිරිස් විසිනුයි මේ කොමියුනිස්ට් පක්ෂ බිහි කළේ. චීනයේත් එහෙමයි. ඉන්දියාව ඇතුළු බොහෝ රටවලත්, මුළු ලෝකයේමත්, ඒ ප්‍රවණතාව ඒ විධියටම දකින්න තිබෙනවා. කොමියුනිස්ට් පක්ෂයට හෝ ලංකා සමසමාජ පක්ෂයට ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලය ලබා ගන්න බැරි වුණේ ඇයි? ඔවුන් 1964 සභාග ආණ්ඩුවට එකතු වෙලා, සභාග ආණ්ඩුව තුළින් මේ රටේ සෑහෙන ප්‍රගතිශීලී කාර්ය භාරයකට උර දුන්නා. ඒ වාගේම, ඇමති ධුර දරලා තිබෙනවා. නමුත්, රාජ්‍ය බලය ලබා ගන්න ලංකාවේ වමේ ව්‍යාපාරයට නොහැකි වෙලා තිබෙනවා. අපේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික පරිසරයත් එක්ක හරියටම අනුගත වුණා නම්, සමහර වෙලාවට 1948 නිදහස ලබා ගැනීමේ සටනේ පුරෝගාමී කාර්ය භාරය කරන්න වෙන්නේ ලංකාවේ වාමාංශික ව්‍යාපාරයට කියායි මගේ අදහස. ලංකා සමසමාජ පක්ෂයෙන් කැඩිලා, 1943 තමයි දේශපාලන පක්ෂයක් හැටියට කොමියුනිස්ට් පක්ෂය බිහි වුණේ. අනෙක් අය හිටියේ ස්වාධීන අපේක්ෂකයින් විධියටයි. ඒ වන විට එක්සත් ජාතික පක්ෂය බිහි වෙලා තිබුණේත් නැහැ. මුල්ම පක්ෂය වුණේ ලංකා සමසමාජ පක්ෂයයි. නමුත්, ඒ රාජ්‍ය බලය ලබා ගෙන, රජය හසුරුවා ගැනීමේ හැකියාව ලංකාවේ සමසමාජ පක්ෂයට හෝ කොමියුනිස්ට් පක්ෂයට ලැබුණේ නැහැ. ඒ පිළිබඳ විවරණයක් කිරීමට මෙය අවස්ථාවක්

නොවන නිසා ඒ ගැන වැඩිදුර කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

කෙසේ වුණත්, වාමාංශික ව්‍යාපාර විසින් ලංකාවේ සමාජ ශුභසාධන කටයුතු අරබයා- අද තිබෙන අධ්‍යාපන ජයග්‍රහණ, කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ජයග්‍රහණ, ඒ වාගේම ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම, එහි ප්‍රගතිශීලී සමුපකාර අණ පනත් සම්මතවීම, ඒවා තහවුරුවීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ජයග්‍රහණ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජයග්‍රහණ ඉදිරියට ගියේ ලංකාවේ ප්‍රගතිශීලී වාමාංශික නායකයින් ගත්ත ඉදිරි පියවරයන් නිසායි.

අද අපි චීනය, ඒ වාගේම ලෝකයේ අනෙක් බොහෝ සමාජවාදී හා ආසන්න රටවල් එක්ක, යුරෝපයේ රටවල් එක්ක අරගෙන බැලුවොත්, අපේ සෞඛ්‍ය සේවය, අපේ අධ්‍යාපන සේවය මේ තරම් ඉදිරියට ගියේ ඒ වාමාංශික ප්‍රගතිශීලී මිනිසුන් විසින් දරන ලද උත්සාහයන් නිසාය කියා පෙනෙනවා. ඒ අනුව ඊලියන් නානායක්කාර මැතිතුමා පිළිබඳ අපි විවරණය කළ යුතු වන්නේ, ඔහු හුදු තනි පුද්ගලයෙක් හැටියට නොවෙයි, එ කල ලෝකයේ තිබුණු සමාජවාදී කඳවුරේ හා ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලී ව්‍යාපාරයේ විශේෂ කොටසක් හැටියටයි.

එතුමා කොමියුනිස්ට් පක්ෂයේ නාගරික මන්ත්‍රීවරයෙක් හැටියටත්, තරුණ සංගමයේ නායකයෙක් හැටියටත් ජාත්‍යන්තර සමාජවාදී අත් දැකීම් ලබාගෙන විශාල කාර්ය භාරයක් සිදු කළා. මේ පාර්ලිමේන්තුව අද දිනය එතුමා වෙනුවෙන් ශෝක දිනයක් හැටියට ප්‍රකාශ කරලා අපි මේ අදහස් පළ කරන මොහොතක්. ඊලියන් නානායක්කාර මැතිතුමා මාතර ප්‍රදේශයේ විශේෂයෙන් කඹුරුපිටිය, අකුරැස්ස වාගේ ප්‍රදේශවලට විශාල සේවයක් කළා.

අපේ ගජදීර මැතිතුමා ප්‍රකාශ කළා වාගේ ඒ පළාතේ සමුපකාර ව්‍යාපාරය ඉතා ඉහළ තැනකට ගෙන එන්න ඊලියන් නානායක්කාර මැතිතුමාගේ ව්‍යාපාරය නිසා පුළුවන් වුණා. 76 දශකයේ විශේෂයෙන් කෘෂි කර්මාන්තයේ විශාල පිබිදීමක් ඒ පළාතේ ඇති කරන්න පුළුවන්කම ලැබුණේ ඊලියන් නානායක්කාර මැතිතුමා වැනි කැපකිරීම් කරපු අය නිසයි. අද දවසේදී මගේ ශෝකය එතුමා වෙනුවෙන් ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අද දිනයේදී ඒ හා සමානවම අපි විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ පළ කළා. ඇත්ත වශයෙන්ම වෙනත් කටයුත්තකට ගිය නිසා මට ඒ අවස්ථාවේ පාර්ලිමේන්තුවට එන්න බැරි වුණා. විශ්වා වර්ණපාල මැතිතුමා සහ ඊලියන් නානායක්කාර මැතිතුමා එක යුගයක ලෝක දේශපාලනය මහා ප්‍රවාහය ඇතුළට තමයි අයිති වෙන්නේ. ඊලියන් නානායක්කාර මැතිතුමා වාගේම මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාත් විශිෂ්ට දේශපාලනඥයෙක්. ඇත්ත වශයෙන්ම විශ්වා වර්ණපාල මැතිතුමා අපේ ගුරුවරයෙක්. මම විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී අපට ඉගැන්වූවා. මම ශිෂ්‍යයෙක් වෙලා හිටියා. එතුමාට ගෞරවයක් හැටියට මම මේ අවස්ථාවේ එතුමා ලියපු පොත්වල නම් ප්‍රමාණයක් සභාගත කරන්නම්. මම කැමති නැහැ, මේ වෙලාවේ ඒ පොත්වල නම් කියවමින් ඒ සඳහා කාලය යොමු කරන්න. අද දේශපාලන විද්‍යාවේ ලියවෙන සියලුම ව්‍යාකරණානුකූල පොත් සහ සියලුම ජාත්‍යන්තර දේශපාලනයට අදාළව ලියපු බොහෝ පොත් රචනා කළේ විශ්වා වර්ණපාල මැතිතුමා. ඉතාම ප්‍රියශීලී, ශිෂ්‍යයන්ට සමීප ඒ වාගේම ලංකාවේ ව්‍යවස්ථා කටයුතු පිළිබඳව විශාල වග කීමක් දරපු, තානාපතිවරයෙක් හැටියට විශාල කාර්ය භාරයක් කරපු එතුමාටත් මාගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා. එතුමා ලියපු පොත් තමයි එතුමාගෙන් අපට ඉතුරු වෙලා තිබෙන දායාදය. එතුමාට ගෞරවයක් හැටියට එතුමාගේ ශිෂ්‍යයෙක් හැටියට ඒ සියලුම පොත් ලැයිස්තුව මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

උදේ කාලයේ මට ගම්පහ රැස්වීමක් තිබුණු නිසා ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ගෙනා ඒ ශෝක ප්‍රකාශ යෝජනාව සාකච්ඡා කළ අවස්ථාවට සහභාගී වෙන්න බැරි වුණා.

ගරු කථානායකතුමනි, ඊලියන් නානායක්කාර මැතිතුමා බෞද්ධයෙක්. සමහර අය හිතනවා, කොමියුනිස්ට්කාරයන්ට බෞද්ධයන් වෙන්න බැහැ කියලා. එතුමා ආගමික කටයුතු වෙනුවෙන් විශාල දායකත්වයක් දක්වපු කෙනෙක්. පොහොය සීමා ඇති කිරීමට එතුමා විශාල කැපකිරීමක් කළා. පන්සල් සඳහා එතුමා විශාල වැඩ කොටසක් කළා. ලංකාවේ කොමියුනිස්ට් පක්ෂ වාගේ නොවෙයි, ලෝකයේ තිබෙන කොමියුනිස්ට් පක්ෂ. අපි ගත්තොත් ලාඕසයේ කොමියුනිස්ට් පක්ෂයේ මිනිස්සු ඒ පක්ෂයෙන් විශ්‍රාම ගියාට පස්සේ ගිහිල්ලා මහණ වෙනවා. එහේ සංඝරාජ හාමුදුරුවෝ ඉන්නවා. භික්ෂූන් වහන්සේලා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෝ. භික්ෂූන් වහන්සේලා කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයන් හැටියට ආණ්ඩුව නියෝජනය කරනවා. ලාඕසය වාගේ රටවල් විශේෂ අත්දැකීමක්. මමත් පැවිදි වෙච්ච භික්ෂූන් වහන්සේ කෙනෙක්. කුඩා කාලයේ පැවිදි දිවියට පත් වෙලා අපේ ගම් බිම්වලින් ඈත් වෙච්ච කෙනෙක්. අපි ශාසනික ජීවිතයේ කරගත්තු යහපත් කුසලයන් අනුමෝදන් කරමින් එතුමාටත් උතුම් අමාමහ නිවන් සැප ලැබේවා! කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ අයටත් ශෝකය ප්‍රකාශ කරමින් මගේ කතාව අවසාන කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජනාධිපති නීතිඥ (ආචාර්ය) ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා.

[අ.භා. 2.39]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය පිළිබඳව අද දින ශෝක ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මමත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමාගෙන් අපේ සමාජයට සිදු වෙච්ච සේවාව පිළිබඳව මීට පෙර කථා කරපු ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා සඳහන් කරන්නට යෙදුණා. අපි පාසල් අධ්‍යාපනය ලබන සමයේ -1970 මැතිවරණය පවත්වන යුගයේ- ශ්‍රී ලංකා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය තුන් හවුලක් විධියට එකතු වෙලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් මෙහෙයවපු ඒ මැතිවරණයේදී, ඉතාම කැපී පෙනෙන විශිෂ්ට කාර්ය භාරයක් ඉටු කරපු දේශපාලන නායකයෙක් තමයි ඊලියන් නානායක්කාර මැතිතුමා.

එතුමා අපේ වෘත්තියට අයිති නීතිඥ වෘත්තියේ දීර්ඝ කාලයක් කටයුතු කළා. ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා සඳහන් කළා වාගේ එතුමන්ලාගේ මාතර අධිකරණයේ නිටපු ජ්‍යෙෂ්ඨතම දැවැන්ත නායකයෙක් විධියට නීති ක්ෂේත්‍රය තුළ එතුමා පිළිගැනීමට ලක් වුණා.

අපි අහලා තිබෙන විධියට එතුමා බොහොම කාරුණික හදවතක් තිබෙන නීතිඥවරයෙක්. සේවාදායකයන් පිළිබඳව බොහොම අනුකම්පා සහගතව සහ කරුණාවෙන් යුතුව කටයුතු කළ නීතිඥ වෘත්තිකයෙක් හැටියට අපි ඔහු හඳුනාගෙන තිබෙනවා. දේශපාලනඥයෙක් වශයෙන් ගත්තාමත් එතුමා ඒ ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන, ඉතා විශිෂ්ට චරිතයක් බව පෙනෙනවා. අද වාගේ කාලයක දේශපාලනයට සිටිය යුතු ආදර්ශවත් චරිතයක් තිබුණු නායකයෙක් විධියට අපට එතුමා හඳුන්වා දෙන්නට පුළුවන්. එතුමා ප්‍රතිපත්ති මත තමයි හැමදාම දේශපාලනයේ සිටියේ. එදා වමේ දේශපාලනය තුළ එතුමා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායක වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාගේ දකුණු අත වගේ ඉඳගෙන ඒ පක්ෂයට විශාල ශක්තියක් දුන් නායකයෙක්. අපේ ගිරුවාපත්තුවේ මායිමක පිහිටි කඹුරුපිටිය ආසනය එතුමා නියෝජනය කළත්, මුළු රුහුණු පළාතම නියෝජනය කරන දේශපාලන නායකයෙක් විධියට එතුමා දීර්ඝ කාලයක් කටයුතු කළා. එතුමා කවදාවත් දේශපාලනයේදී තම ප්‍රතිපත්ති පාවා දුන්නේ නැහැ. තනතුරුවලට, මීල මුදල්වලට, වරප්‍රසාදවලට යටත් නොවී, තම හෘදය සාක්ෂියට එකඟව පමණක් දේශපාලන කටයුතුවලදී මෙන්ම ජාතික කටයුතුවලදීත් තීන්දු තීරණ ගත් නායකයෙක් වුණු එතුමාගේ අභාවය අපේ රටට විශාල පාඩුවක්. එතුමා හොඳ බෞද්ධ නායකයෙක්. මීට කලින් සඳහන් කළා වගේ දේශපාලනික ප්‍රතිපත්ති පිළිබඳව වාගේම ආගමික කරුණු කාරණා පිළිබඳවත් පැහැදිලි අවබෝධයකින් කටයුතු කළ දේශපාලන නායකයෙක් විධියට අපි එතුමා හඳුනාගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, එතුමා පිළිබඳව දීර්ඝව කරුණු සඳහන් කරන්නට යෙදුණු නිසා මම මගේ කථාව දීර්ඝ කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමා මේ රටට ඉටු කරපු සේවය සහ එතුමාගේ ජීවිත කාලයේ එතුමා කළ බොහෝ පින් දහම්, කුසල් හේතුවෙන් එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ අභාවය පිළිබඳවත් මගේ කනගාටුව සහ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එතුමා අපේ රටේ දේශපාලන විද්‍යා මහාචාර්යවරයෙක් වශයෙන් ශාස්ත්‍රීය පොත් විශාල සංඛ්‍යාවක් රචනා කළ න්‍යායාචාර්යවරයෙක් විධියට කටයුතු කළා. ඒ වාගේම අපේ රටේ දේශපාලනයේ ගමන් මහ නිවැරදි දිශානතියකට ගෙනයෑම සඳහා එතුමා විශාල උත්සාහයක් දැරුවා. අපේ හදවත් තුළ එතුමා පිළිබඳ ගෞරවය නිරන්තරයෙන්ම රැඳී පවතිනවාය කියන කාරණය සඳහන් කරමින්, එතුමාටත් නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 2.44]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළ ගරු ඊලියන් එම්. නානායක්කාර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ, එතුමා මේ සභාවට කරන ලද සේවයත්, ඒ වාගේම පොදුවේ රටට, ප්‍රතිපත්තිමය වශයෙන් සහ පෞද්ගලික වශයෙන් කරපු සේවයත් අගය කිරීම අප කාගේත් වගකීමක් සහ යුතුකමක් කියා මම විශ්වාස කරනවා.

ඊලියන් එම්. නානායක්කාර මැතිතුමා ප්‍රදේශයේ වැදගත් පවුලක උත්පත්තිය ලැබූ කෙනෙක්. එතුමා නීතිඥ වෘත්තිය හරහා ඉතාමත් කීර්තිමත් සේවයක් ඉෂ්ට කළා. එතුමා තම ශක්ති ප්‍රමාණයෙන් දැවැන්ත මහජන සේවයක් ඉෂ්ට කර තිබෙනවා.

අදත් අපේ පළාත්වල උදවිය එතුමා අගය කරන්නේ රටට, ගමට, හිතවතුන්ට සහ ඥාතීන් වන මේ සියලුදෙනාටම එතුමාගේ සේවය නො අඩුව, නොමසුරුව ලබා දුන්නු නායකයෙක් හැටියටයි. ඒ නිසාම එතුමා අපි කාටත් අමතක කරන්න බැරි චරිතයක්. එතුමා මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට විතරක් නොවෙයි, මුළු රටටම අවශ්‍ය වූ, අද වගේ වෙලාවක ජීවත්ව සිටිය යුතුව තිබූ නායකයෙක් හැටියටයි මම දකින්නේ. මොකද, එතුමා සෑම දාම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් මේ ගරු සභාවේ පෙනී සිටි කෙනෙක්. 1970 පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු දිනයේ සිට කිසිම අවස්ථාවක මේ සභාවේ ගෞරවයට හානි වන විධියට එතුමා කටයුතු කළේ නැහැ. එතුමා මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, මේ සභාවේ ගෞරවය වෙනුවෙන් දැවැන්ත කැපවීමකින් කටයුතු කරපු කෙනෙක්. එතුමා කිසිම කාලෙක දේශපාලන කුමන්ත්‍රණවලට සහභාගි වුණේ නැහැ; ඒවා අනුමත කළේ නැහැ; ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එදා ඉඳලා තම ශක්ති ප්‍රමාණයෙන් කැප වුණු පුද්ගලයෙක්. මම හිතනවා, ඒ අගය කිරීම අපි මේ වෙලාවේ එතුමා වෙනුවෙන් කළ යුතුයි කියලා. රටේ ව්‍යාකූල අවස්ථාවලදීත්, ප්‍රශ්න නැඟුණු අවස්ථාවලදීත් එතුමා සෑම වෙලාවේම යුතුකම වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් පෙනී සිටි නායකයෙක්. අද එතුමා මේ සභාවේ හිටියා නම් හොඳ ආදර්ශවත් නායකයෙකු හැටියට තමයි අපි එතුමාට ගරු කරන්නේ.

එතුමා මට මුණ ගැසුණේ අපි පාසල් යන කාලයේ. ඒ කාලයේ පවා එතුමා අපි සියලුදෙනාටම ආදර්ශවත් අන්දමට කටයුතු කරපු පුද්ගලයෙක්. මට පෞද්ගලිකව ඥාති සම්බන්ධකම් තිබුණත්, එතුමා හැම වෙලාවේම අපි සියලුදෙනාම මේ රටේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන පුරවැසියන් හැටියට සලකා සියලුදෙනාටම එක හා සමානව සැලකුවා. දේශපාලන මතිමතාන්තර මත එතුමාට ඒ තරම් ගැටලු, ප්‍රශ්න වුණේ නැහැ. එතුමා හැම වෙලාවේම කටයුතු කළේ යුතුකම වෙනුවෙන්; වැදගත්කම වෙනුවෙන්; රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්; ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්. එහෙම කටයුතු කරපු නායකයෙක් හැටියට තමයි එතුමා කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසය එදා නියෝජනය කළේ. ඒ සේවය අදත් ජනතාව අගය කරන්නේ ඒ නිසයි. එතුමාට ඒ ශක්තිය ලැබුණේ එතුමාගේ උගත්කමින් හා හැදිවඩිවකමින්. එතුමාගේ අභාවය තුළින් එවැනි

මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවට නැතිවීම අපට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න බැරි තරම් දැවැන්ත පාඩුවක්.

එතුමාගේ ශ්‍රේෂ්ඨ ක්‍රියාවලිය තුළ එතුමාට පක්ෂ භේදයක් තිබුණේ නැහැ. හැම වෙලාවේම එතුමා යුතුකම වෙනුවෙන් පෙනී සිටියා; කළ යුතු දේ නොබියව ඉෂ්ට කළා. එතුමා කොතැනකදීවත් අයුක්තිය ඉදිරියේ පසුබෑවේ නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා එතුමාගේ අභාවය දිස්ත්‍රික්කයක් වශයෙනුත්, ආශ්‍රය කරපු උදවිය වශයෙනුත් අප කාටත් දැරිය නොහැකි පාඩුවක්; අපි සියලුදෙනාම කම්පා වුණු සිද්ධියක්. එතුමා අසනීපයෙන් සිටියදී මම එතුමා බලන්න ගිය වෙලාවේත් එතුමා අපට දුන්නු උපදේශය වුණේ හැමවෙලාවේම යුක්තිය සහ සාධාරණය වෙනුවෙන් කෙළින් කටයුතු කරන්න කියන එකයි. ඒ වාගේ උපදේශයක්, ඒ වාගේ මහපෙන්වීමක් එතුමාගෙන් අපට ලැබුණා. ඒ නිසා එතුමාගේ අභාවය ගැන අපගේ ශෝකය පවුලේ සියලුම ඥාතීන්ට, හිතවතුන්ට මේ අවස්ථාවේ පළ කරන අතර, අනර්ඝ මන්ත්‍රීවරයෙක් හැටියටත්, ප්‍රවීණ දේශපාලනඥයෙක් හැටියටත් එතුමාගෙන් මේ රටට සිදු වූ සේවය අභිමිවීම ගැන මේ අවස්ථාවේදී අපේ කනගාටුව පළ කරමින් එතුමාට නිවන් සුව අත්වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මම අවසාන කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි ගරු මන්ත්‍රීවරුනි, නිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු ඊලියන් නානායක්කාර මැතිතුමාගේ අභාවය පිළිබඳ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මම ද ඒ සමඟ එකතුවීමට කැමැත්තෙමි. මේ සියලුදෙනාම සඳහන් කළ ආකාරයට එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඉතාමත්ම ආදර්ශවත්, චරිතවත් මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළා. එතුමා කෙරෙහි අපේ පෞද්ගලික ගෞරවයක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් මම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මේ අවස්ථාවේදී නියෝග කරනවා.

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2018 මාර්තු මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ.භා. 2.51ට, අද දින සභා සම්මතිය අනුව 2018 මාර්තු 06 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 2.51 மணிக்குப் பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2018 மார்ச் 06, செவ்வாய்க் கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 2.51 p.m. until 1.00 p.m. on Tuesday, 06th March, 2018 pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.